

PEOPLE'S BANK
Pride of the Nation
නව
පරිච්ඡේදයක්
සමඟ තවදුරටත්
ඉදිරියට
වාර්ෂික වාර්තාව 2025
PEOPLE'S BANK


PEOPLE'S BANK



නව පරිච්ඡේදයක් සමඟ තවදුරටත් ඉදිරියට

බිම් මට්ටමෙන් ආරම්භ වී දශක හයකටත් අධික කාලයක් පුරා ශ්‍රී ලංකාවේ සංවර්ධනයට සමගාමීව ඉදිරියට පිය නැඟූ මහජන බැංකුව අද දින දිවයින පුරා විහිදී ගිය දැවැන්ත මූල්‍ය ආයතනයකි. 2025 වර්ෂය තුළ නව පරිච්ඡේදයක් සනිටුහන් කරන මහජන බැංකු මූලස්ථානය (People's Tower) ජාතික සේවය සිය පදනම කරගනිමින් ද විශ්වසනීයත්වය හා නම්‍යශීලීභාවය විදහාපාමින් ද, අසමසම ව්‍යාප්තියකින් මෙන්ම වේගවත් ඩිජිටල්කරණයක් ද සමඟින්, දිවයින පුරා පුද්ගලයින්, ව්‍යාපාර සහ රජය සවිබල ගන්වමින් සිටියි. ශ්‍රී ලංකාවේ උන්නතිය අරමුණ කරගනිමින්, විශිෂ්ඨ ශක්‍යතා ළඟාකර ගැනීම සඳහා අප සිදු කරන අඛණ්ඩ කැපවීම "රට වෙනුවෙන් නැඟී සිටිමු" අපගේ උද්‍යෝග පාඨය පිළිබිඹු කරයි.

පටුන

04
අපගේ ඒකාබද්ධ වාර්තාව පිළිබඳ හැඳින්වීමක්

09
බැංකුව පිළිබඳව

10 අපගේ බැංකුව

12 අපගේ සමූහය

14 සුවිශේෂී මංසළකුණු

18 සම්මාන

20 අප සිදුකරන සමාජ ආර්ථික බලපෑම

- 20 විශේෂ කරුණු – මූල්‍යමය
- 22 විශේෂ කරුණු – මූල්‍යමය නොවන

25
විධායක සමාලෝචන

26 සභාපතිතුමාගේ පණිවිඩය

32 ප්‍රධාන විධායක නිලධාරිතුමා/ සාමාන්‍යාධිකාරිතුමාගේ සමාලෝචනය

36 අධ්‍යක්ෂ මණ්ඩලය

44 ආයතනික කළමනාකරණය

54 විධායක කළමනාකරණය

57 ප්‍රධාන කළමනාකරුවන්

65
උපායමාර්ග සහ වටිනාකම් නිර්මාණය

66 අපගේ මෙහෙයුම් පරිසරය

74 පාර්ශ්වකාර සහභාගිත්වය

80 ප්‍රමාණාත්මකතාවය

86 උපායමාර්ග

92 අපගේ වටිනාකම නිර්මාණය කිරීමේ ආකෘතිය

94 අපගේ පාරිසරික, සමාජීය සහ පාලන (ESG) අවධානය

96 එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක (UN SDG) වෙනුවෙන් අපගේ කැපවීම



101

කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණය

102 ව්‍යාපාරික ක්ෂේත්‍ර සමාලෝචනය

103 පුද්ගල කේන්ද්‍රිය බැංකුකරණය

109 වාණිජ ණය

112 සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය සහ ක්ෂුද්‍ර මූල්‍ය

116 ආයතනික බැංකුකරණය

118 භාණ්ඩාගාරය සහ ආයෝජන බැංකුකරණය

122 චිතෙර පාරිභෝගික සේවා

125 ජාත්‍යන්තර බැංකු කටයුතු

127 තොරතුරු තාක්ෂණය සහ ඩිජිටල් බැංකුකරණය

132 ණයපත්

134 අයකරගැනීම්

136 අලෙවිකරණය

138 ශාඛා මෙහෙයුම් කළමනාකරණය

142 මූල්‍ය ප්‍රාග්ධනය

150 නිෂ්පාදිත ප්‍රාග්ධනය

156 බුද්ධිමය ප්‍රාග්ධනය

162 මානව ප්‍රාග්ධනය

180 සමාජීය සහ සම්බන්ධතා ප්‍රාග්ධනය

183 ගනුදෙනුකාර ප්‍රාග්ධනය

189 ව්‍යාපාරික හවුල්කාර ප්‍රාග්ධනය

192 ප්‍රජා ප්‍රාග්ධනය

196 ආයෝජක ප්‍රාග්ධනය

198 ස්වභාවික සම්පත් ප්‍රාග්ධනය

207

පාලනය

208 අවදානම් කළමනාකරණ වාර්තාව

260 ආයතනික පාලනය

298 අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව

299 අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටු වාර්තාව

300 අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව

301 අධ්‍යක්ෂ මණ්ඩල විධායක ණය කමිටු වාර්තාව

302 අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා සහ පාලන කමිටු වාර්තාව

303 අධ්‍යක්ෂ මණ්ඩල ආයෝජන බැංකුකරණ කමිටු වාර්තාව

304 අධ්‍යක්ෂ මණ්ඩල උපායමාර්ගික සැලසුම් සමාලෝචන කමිටු වාර්තාව

305 සම්බන්ධිත පාර්ශ්වීය ගනුදෙනු සමාලෝචන කමිටු වාර්තාව

306 මූල්‍ය වාර්තාකරණය කෙරෙහි අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය

308 අභ්‍යන්තර පාලනයන් පිළිබඳ විගණකාධිපතිවරයාගේ සහතික කිරීමේ වාර්තාව

311

මූල්‍ය වාර්තා

312 මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

313 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව

316 ආදායම් ප්‍රකාශය

317 විස්තීර්ණ ආදායම් පිළිබඳ ප්‍රකාශය

318 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

320 ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශය – බැංකුව

322 ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශය – සමූහය

324 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

325 මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

443

අතිරේක තොරතුරු

444 ආදායම් ප්‍රකාශය (වික්සත් ජනපද ඩොලර්)

445 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය (වික්සත් ජනපද ඩොලර්)

446 දස වර්ෂ සාරාංශය – බැංකුව

447 දස වර්ෂ සාරාංශය – සමූහය

448 බාසල් III ස්ථර III යටතේ වෙළෙඳපොල විනය හෙලිදරව් කිරීමේ අවශ්‍යතාව

467 තිරසාරත්ව වාර්තාව පිළිබඳ බාහිර සහතිකය

469 GRI අන්තර්ගත දර්ශක

475 ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්

480 ශාඛා කළමනාකරුවන්

486 මූල්‍ය/බැංකුකරණ යෙදුම් පාරිභාෂික ශබ්ද මාලාව

අපගේ ඒකාබද්ධ වාර්තාව පිළිබඳ හැඳින්වීමක්



2025 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා වූ අපගේ ඒකාබද්ධ වාර්ෂික වාර්තාව වන මෙම වාර්තාව උපායමාර්ගික ප්‍රමුඛතා සාක්ෂාත් කර ගැනීමේ දී අප ලබාගත් ප්‍රගතිය පිළිබඳව සමබර සමාලෝචනයක් ඉදිරිපත් කරයි. එපමණක් නොව, මහජන බැංකුවේ ශක්තිමත් මූල්‍ය පදනම උපයෝගී කරගනිමින් සම්පත් බෙදාහැරීමටත් ඒ හරහා නිපුණත්වයෙන් යුතුව අපගේ පාර්ශ්වකරුවන්හට වටිනාකමක් ලබාදීමටත්, අපගේ පිරිස බලගැන්වූ ආකාරය එමගින් ඉදිරිපත් කෙරේ.

ඒ හා සමගාමීව, පසුගිය මූල්‍ය වර්ෂයේදී අප අත්කර ගත් සාර්ථකත්වය පදනම් කරගනිමින් ජාතිය ප්‍රතිසංස්කරණ මාර්ගයට අප ලබාදුන් සහාය පිළිබඳව ද මෙමගින් විස්තර කෙරේ. අවසාන වශයෙන්, අපගේ මෙහෙයුම් පරිසරය, පාලන ක්‍රම, පාර්ශ්වකරුවන් සඳහා අගය නිර්මාණය, කාර්ය සාධන මට්ටම, සහ වෙළඳපොළේ සිදුවන විකසන ප්‍රවණතාවලට අපගේ ප්‍රතිචාර පිළිබඳවද සාධාරණ හා පැහැදිළි ඇගැයීමක් මෙහි දක්වා ඇත.

විෂය පථය සහ සීමාව

GRI 2-2, 2-3

2025 ජනවාරි 1 දින සිට 2025 දෙසැම්බර් 31 දක්වා කාල සීමාව තුළ මහජන බැංකුව සහ අපගේ අනුබද්ධ සමාගම් වන පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී සහ පීපල්ස් ට්‍රැවල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, සිදු කළ ක්‍රියාකාරකම් මෙම වාර්තාව මඟින් ආවරණය කර ඇත. මෙම ආයතන සියල්ල එක්ව ගත්කළ "සමූහය" ලෙස හඳුන්වනු ලබන අතර, සමූහයේ මව් බැංකුව ලෙස මහජන බැංකුව කටයුතු කරයි. 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමූහයේ මූල්‍ය කාර්ය සාධනය ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශය මඟින් ඉදිරිපත් කරනු ලැබේ. වෙනත් ආකාරයකින් නිශ්චිතව දක්වා නොමැති අවස්ථාවලදී, මූල්‍ය නොවන, අවදානම් කළමනාකරණ සහ ආයතනික පාලන තොරතුරු ඉදිරිපත් කර ඇත්තේ මහජන බැංකුවට පමණක් අදාළවය.

තොරතුරු නැවත ප්‍රකාශ කිරීම

GRI 2-4

බැංකුව වාර්ෂික වාර්තාකරණ චක්‍රයක් අනුගමනය කරන අතර, වෙනත් ආකාරයකින් සඳහන් කර නොමැති අවස්ථාවල දී, ප්‍රධාන මූල්‍යමය හෝ මූල්‍යමය නොවන තොරතුරු නැවත ප්‍රකාශයට පත් කර නැත. අවසන් වරට නිකුත් කළ වාර්ෂික වාර්තාව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මාස 12ක කාලය ආවරණය කරන අතර, එය මහජන බැංකුවේ වෙබ් අඩවිය www.peoplesbank.com ඔස්සේ ලබාගත හැක.

වාර්තාකරණයට අපගේ ප්‍රවේශය

GRI 2-14

ඒකාබද්ධ චින්තනය, සහයෝගීතාව සහ විනිවිදභාවය අවධාරණය කරමින් මනා සංවිධානයකින් සිදුකළ ක්‍රියාදාමයක ප්‍රතිඵලයක් ලෙස අපගේ මෙම ඒකාබද්ධ වාර්තාව හැඳින්වීමට හැකි අතර අධ්‍යක්ෂ මණ්ඩලය සහ කළමනාකරණ කමිටුව විසින් මෙහෙයවනු ලබන පාලන රාමුවක් හරහා වාර්තාවේ නිරවද්‍යතාවය සහතික කර ඇත. අදාළ සියලු අංශයන්ගෙන් ලැබෙන දත්ත සහ තොරතුරු සැලකිල්ලෙන් එක්රැස් කරගෙන, ඒකාබද්ධ සහතික කිරීමේ ක්‍රමවේදයක් යොදාගනිමින් වාර්තාව තහවුරු කර ඇත. ඒ හරහා අපගේ අගනා පාර්ශ්වකරුවන් වෙත විශ්වසනීය සහ අංගසම්පූර්ණ තොරතුරු සැපයීමක් සිදු කළ හැකිව තිබේ. පිටු 101 සිට 205 දක්වා ඇති කළමනාකරණ විශ්ලේෂණය කොටස තුළ විස්තර කර ඇත්තේ කාර්යසාධනයට බලපාන කරුණු මඟින් ලාභදායිතාවය, සමාජීය අගය නිර්මාණය සහ පාරිසරික කාර්ය සාධනය අතර සම්බන්ධතාවය ඇති කරමින් අගය නිර්මාණය සඳහා ඒකාබද්ධ ප්‍රවේශයක් සපයන ආකාරයයි.

බාහිර සහතික කිරීම

GRI 2-5

මෙම වාර්තාවේ පිටු 313 සිට 315 දක්වා ඇති මූල්‍ය ප්‍රකාශයන් සඳහා ශ්‍රී ලංකා විගණකාධිපතිවරයාගේ සහතිකය ලබාදී ඇති අතර "මූල්‍ය වාර්තා සකස්කිරීමේ අභ්‍යන්තර පාලන ක්‍රම පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රකාශය" ද ශ්‍රී ලංකා සහතික කිරීමේ ප්‍රමිතීන් (SLASE 3050 – සංශෝධිත) අනුව විගණකාධිපතිවරයා විසින් සහතික කර ඇත. මෙම සහතික කිරීමේ වාර්තාව පිටු 308 සහ 309 දක්වා ඇතුළත් වේ.

රාජ්‍ය ආයතන විගණනය කිරීමේ නීතිමය බලය ශ්‍රී ලංකා විගණකාධිපති දෙපාර්තමේන්තුව සතු වේ. මහජන බැංකුවේ මූල්‍ය ප්‍රකාශයන් සහ "මූල්‍ය වාර්තා සකස්කිරීමේ අභ්‍යන්තර පාලන ක්‍රම පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රකාශය" වාර්ෂිකව විගණකාධිපතිවරයා විසින් හෝ විගණකාධිපතිවරයා විසින් පත් කරන ලද විගණන සමාගමක් මඟින් විගණනය කර ඇත.

මෙම වාර්තාවේ තිරසර වාර්තාකරණ කොටස ශ්‍රී ලංකා සහතික කිරීමේ ප්‍රමිතීන් (SLSAE 3000) අනුව Messrs Ernst and Young විගණන ආයතනය විසින් සහතික කර ඇති අතර, අදාළ වාර්තාව පිටු 467 සහ 468 දක්වා ඇතුළත් වේ. මෙහිදී, මූල්‍ය කාර්යසාධනය සම්බන්ධ තොරතුරු සඳහා සාධාරණ සහතිකවීමක් ලබා දී ඇති අතර, අනෙක් තොරතුරු සඳහා සීමිත සහතිකවීමක් ලබා දී ඇත. සියලු තොරතුරු පිළියෙල කර ඇත්තේ 2021 GRI ප්‍රමිතීන්ට අනුකූලවය.

අගය නිර්මාණය

GRI 2-6

ආර්ථිකය ගොඩනඟා ගනිමින්මින් ප්‍රතිසාධනය කරා ශ්‍රී ලංකාව යන ගමනේ දී, ප්‍රමුඛ බැංකුවක් වශයෙන් සමාජයේ විශාල ප්‍රජා කොටසකට මූල්‍ය සේවා ලබා දෙමින්, වැදගත් භූමිකාවක් ඉටු කිරීමට මහජන බැංකුවට හැකිව තිබේ. ගනුදෙනුකරුවන් සහ අනෙකුත් පාර්ශ්වකරුවන්ට කාලෝචිත නිෂ්පාදන සහ සේවා ලබා දීමට නිරන්තරවම කැපවූ අපි, ප්‍රේෂණ සේවා මඟින් විදේශ විනිමය තැන්පතු ශක්තිමත් කිරීම සඳහා ඉමහත් දායකත්වයක් ලබා දුනිමු. ප්‍රශංසනීය සටහනකින් මූල්‍ය වර්ෂය අවසන් කළ මහජන බැංකුව, සියලුම පාර්ශ්වකරුවන්ගේ අගය නිර්මාණය සැලකිය යුතු ලෙස වැඩිදියුණුකිරීමට කටයුතු කර ඇත. එසේම, ශක්තිමත් මූල්‍ය හා තිරසාර සාර්ව ආර්ථික මූලධර්ම පදනම කරගනිමින්, රට යථා තත්ත්වයට පත් කිරීම සඳහා ශ්‍රී ලංකා රජය ක්‍රියාත්මක කළ මුලපිරීම් ගණනාවට උරදී ඇත. අපගේ පුළුල් ජාතික ජාලය උපයෝගී කරගෙන සම්බන්ධීකරණ මූල්‍ය හා බැංකු සේවා සැපයීම හරහා දිට්වා සුළි කුණාටුවෙන් පසු රට නැවත ගොඩනැගීමේ රජයේ ප්‍රයත්නයන් සඳහා සහාය ලබාදීමටද අපට හැකිවිය. අගය නිර්මාණය කිරීමේ ආකෘතිය 92-93 පිටුවල නිරූපණය කර ඇත.



පූර්ව ආරක්ෂණ මූලධර්මය

GRI 2-23

සමාජ හා පාරිසරික තිරසාරත්වය පිළිබඳ තීරණ ගැනීමේදී පූර්ව සුරක්ෂිතතා මූලධර්මය (Precautionary Principle) මිනුම් ආධාරකයක් ලෙස භාවිතා කරන අප, අපගේ ක්‍රියාකාරකම් සමාජයටත් පරිසරයටත් සමස්ත වශයෙන් ධනාත්මක බලපෑමක් ඇති කරන බව දැන සිටින අතර, යම්කිසි අයහපත් බලපෑමක් නිසා ඇතිවිය හැකි අවදානම් අවම කිරීම සඳහා අවශ්‍ය සෑම පියවරක්ම ගැනීමට අවශ්‍ය කටයුතු ගෙන ඇත. මෙම පියවර පිටු 166 සහ 187 හි විස්තර කර ඇත.

ප්‍රමාණාත්මකතාවය

මෙම වාර්තාව පුරාම, අපි "ප්‍රමාණාත්මකතාවය" (Materiality) යන සංකල්පයට ප්‍රමුඛතාව ලබාදී, ආර්ථික, පාරිසරික හා සමාජීය වශයෙන් වැඩිම බලපෑමක් ඇති කරනු ලබන කරුණු වෙත අපගේ අවධානය යොමු කර ඇත. මෙම කරුණු කෙටි කාලීන, මධ්‍ය කාලීන සහ දිගු කාලීන වශයෙන් අපගේ අගය නිර්මාණය කිරීමේ හැකියාවට සැලකිය යුතු බලපෑමක් සිදුකරනු ඇත. අපගේ "ප්‍රමාණාත්මකතාවය" (Materiality) ඇගයීමේ ක්‍රියාවලි පිටු 81-83 විස්තරාත්මකව ඉදිරිපත් කර ඇත. තවද, අපගේ සියලු වාර්තා වල මූලික ලක්ෂණයක් ලෙස වාර්තාකරණයේ නිරවද්‍යතාවය සහ විශ්වාසනීයත්වය පවත්වාගෙන යන ලද අතර, මෙම වාර්තාව පුරාම දක්නට ලැබෙන, වාර්තාකරණයේ ගුණාත්මකභාවය, අදාළත්වය සහ කියවීමට පහසුභාවය ඉහළ නැංවීම සඳහා අපි කැපවී සිටිමු.

වාර්තාකරණ රාමුව

ඒකාබද්ධ වාර්තාකරණය	මූල්‍ය, නියාමන සහ ආයතනික පාලනය	පාරිසරික, සමාජීය හා ආයතනික පාලනය (ESG) සහ තිරසාරත්ව වාර්තාකරණය
ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (IFRS) පදනම මඟින් ඉදිරිපත් කර ඇති ඒකාබද්ධ වාර්තාකරණ රාමුව.	ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්	ගෝලීය වාර්තාකරණ මුලපිරීම (GRI) ප්‍රමිති - ගෝලීය තිරසාරභාවය පිළිබඳ ප්‍රමිති මණ්ඩලය විසින් නිකුත් කරන ලද "GRI ප්‍රමිතීන්ට අනුකූලව"
	1961 අංක 30 දරන මහජන බැංකු පනත හා සියලු සංශෝධන	එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක (UN SDGs)
	1988 අංක 29 දරන බැංකු පනත හා සියලු සංශෝධන	බලපත්‍රලාභී බැංකුවල පිළිබඳ තිරසාර මූල්‍ය කටයුතු පිළිබඳ 2022 අංක 5 දරන බැංකු පනතේ උපදෙස්
	ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන උපදෙස්	SLFRS S1 තිරසරභාවයට අදාළ මූල්‍ය තොරතුරු හෙළිදරව් කිරීම
	1953 අංක 24 දරන විනිමය පාලන පනත	SLFRS S2 තිරසරභාවයට අදාළ මූල්‍ය තොරතුරු හෙළිදරව් කිරීම
	2006 අංක 6 දරන මූල්‍ය ගනුදෙනු වාර්තාකරණ පනත	ISO 14064-1:2018 ආයතන මට්ටමින් හරිතාගාර වායු (GHG) විමෝචනය සහ ඉවත් කිරීම් ගණනය කිරීම, නිරීක්ෂණය කිරීම සහ වාර්තා කිරීම
	2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත	
	2023 දෙසැම්බර් මාසයේදී ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කළ ආයතනික පාලනය පිළිබඳ මනා පරිචයන් සංග්‍රහය (Code of Best Practice on Corporate Governance 2023)	
	2025 ජනවාරි 1 දින සිට බලපැවැත්වෙන, 2024 අංක 5 දරන බලපත්‍රලාභී බැංකු සඳහා ආයතනික යහපාලනය යන බැංකු පනත් විධාන	

නියාමක මූලධර්ම

2025 වසර අවසානයේ අපගේ කාර්ය සාධනය පිළිබඳ විශ්වාසනීය සමාලෝචනයක් සැපයීම සහතික කිරීම සඳහා පහත සඳහන් මාර්ගෝපදේශක මූලධර්මවලට අනුකූලව වාර්තාව සකස් කරන ලදී.

තොරතුරු සබැඳි

තොරතුරු ප්‍රවාහය පහත අයිතමයන් යොදා ගනිමින් ඉදිරිපත් කර ඇත:

ප්‍රාග්ධන

- මූල්‍ය ප්‍රාග්ධනය
- මානව ප්‍රාග්ධනය
- නිෂ්පාදිත ප්‍රාග්ධනය
- බුද්ධිමය ප්‍රාග්ධනය
- සමාජ සබඳතා ප්‍රාග්ධනය
- ස්වභාවික ප්‍රාග්ධනය

පාර්ශ්වකරුවන්

- සේවා
- ගනුදෙනුකරුවන්
- ව්‍යාපාරික හවුල්කරුවන්
- ප්‍රජාව
- ආයෝජකයන්
- නියාමකයන්

ප්‍රධාන උපාය මාර්ගික අංශ

- ඩිජිටල් ප්‍රමුඛතාවය
- වර්ධනය ප්‍රවර්ධනය කිරීම
- පුළුල් ව්‍යාප්තිය

නිරවද්‍ය නිරූපණය: අපගේ කාර්යසාධනය පිළිබඳ ධනාත්මක, මධ්‍යස්ථ සහ ඍණාත්මක කරුණු සියල්ල සලකා බැලූ සමානුපාතික සමාලෝචනයක් ඉදිරිපත් කර ඇත.

අනුකූලතාව සහ සංසන්දනාත්මක බව: හැකි සෑම තැනකම වාර්තාකරණ රාමු සහ ක්ෂේත්‍රයේ ප්‍රමිතීන්ට අනුකූලව මිනුම් සඳහා දර්ශක පෙළගස්වා ඇති අතර එමඟින් සංසන්දනාත්මක බව පහසු කරයි.

විශ්වසනීයත්වය: මූල්‍ය හා මූල්‍ය නොවන යන දෙවර්ගයේම තොරතුරුවල විශ්වාසනීය බවට සහතික කිරීම සඳහා අභ්‍යන්තර ක්‍රියාමාර්ගයන් සහ පාලන ක්‍රම ස්ථාපිත කර ඇත.

සංක්ෂිප්තබව: සංක්ෂිප්ත තොරතුරු මඟින් මෙම වාර්තාව පරිශීලනය කරන්නන් වෙත තීරණාත්මක කරුණු සන්නිවේදනය කිරීම අපගේ ප්‍රධාන අරමුණක් වී ඇත. වාර්තාවේ නිරවද්‍යතාවය සහ විනිවිදභාවය වෙනුවෙන් අවශ්‍ය අවස්ථාවලදී වැඩිදුර තොරතුරු සපයා ඇත.

ප්‍රවේශය සහ ප්‍රතිචාර

GRI 2-3

අපගේ වෙබ් අඩවියෙන් බාගත හැක:
www.peoplesbank.lk/last financial-result/

මෙම වාර්තාව පිළිබඳ ඔබගේ ප්‍රතිචාර ලබාදීම සඳහා:

මූල්‍ය ප්‍රධානී,
මූල්‍ය හා කළමනාකරණ ගිණුම්කරණ දෙපාර්තමේන්තුව,
පීපල්ස් ටවර්,
අංක 374, ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා මාවත,
කොළඹ 02
+94 11 374 0740
(දිගුව. 0600)
info@peoplesbank.lk
www.peoplesbank.lk




PEOPLE'S TOWER

බැංකුව පිළිබඳව



10
අපගේ බැංකුව

12
අපගේ සමූහය

14
සුවිශේෂී මංසළකුණු

18
සම්මාන

20
අප සිදුකරන
සමාජ ආර්ථික බලපෑම



අපගේ බැංකුව



1961 අංක 29 දරන මහජන බැංකු පනත මගින් සංස්ථාගත කරන ලද මහජන බැංකුව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දේශීය පද්ධතිමය වශයෙන් වැදගත් බැංකුවක් (D-SIB) ලෙස නම් කර තිබේ. දිවයින් පුරා මිලියන 15.2ක් වූ ගනුදෙනුකාර භවතුන්ට සේවා සපයමින් බැංකු ක්ෂේත්‍රයේ විශාලතම ශාඛා ජාලය ක්‍රියාත්මක කරන අපගේ කාර්යමණ්ඩලය ශාඛා 746 ක් පුරා තම දායකත්වය සවිබල ගන්වනු ලබයි.

බදු පසු ලාභය රුපියල් බිලියන 40.2ක් ද වත්කම් වටිනාකම රුපියල් ට්‍රිලියන 3.7ක් ද වශයෙන් 2025 වර්ෂය තුළ අප ලබා ඇත්තේ වසර 64ක් වූ අපගේ බැංකු ඉතිහාසයේ හොඳම කාර්ය සාධනයයි.

අපගේ මූලික වගකීම මහජන සුභසාධන වන අතර රටපුරා විහිදුණු අපගේ සේවාවන් මඟින් සංස්ථාගත අංශය, රාජ්‍ය අංශය, පුද්ගලික ගනුදෙනුකරුවන්, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර (SME), ක්ෂුද්‍ර මූල්‍ය සේවා ගනුදෙනුකරුවන් සහ ව්‍යාපෘති මූල්‍යකරණය වැනි විවිධ ගනුදෙනුකරුවන් සමූහයකට සේවා සපයනු ලැබේ. ජනගහනයේ සියලුම කොටස් සඳහා මූල්‍ය සේවා ලබාගැනීම පහසු කිරීම අපගේ ප්‍රමුඛ අරමුණක් වන අතර, නාගරික හා ග්‍රාමීය ප්‍රදේශ පුරා විහිදෙන අපගේ බැංකු සේවා මඟින් ජාතික මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වයට අපි වැදගත් දායකත්වයක් ලබා දෙමු. ලාභ ලැබීම සහ මහජන සුභසාධනය සරලව ඒකාබද්ධ කරගනිමින්, ශ්‍රී ලංකා රජය ආර්ථික වශයෙන් අවාසි සහගත සමාජ කණ්ඩායම් තුළ තිරසාර සංවර්ධනය ඉදිරියට ගෙන යාම සඳහා දරන උත්සාහයන්ට අපි සහාය දක්වමු. 2025 වසරේදී ඩිජිටල් පරිවර්තනය සැලකිය යුතු ලෙස වේගවත් කරමින්, දිවයිනේ බැංකු කර්මාන්තය තුළ ඉහළ පෙළේ ඩිජිටල් සේවා සපයන්නෙකු ලෙස බැංකුව ස්ථාපිත කිරීමට අපි සමත් වුණෙමු.

අපගේ දැක්ම

පරිවර්තනීය වර්ධනයක් කරා ජාතිය පෙළඹවීම.

මෙහවර ප්‍රකාශය

දැරිය හැකි, ප්‍රවේශ විය හැකි අයුරින් කාර්යක්ෂමව සැපයෙන විසඳුම් තුලින් දිවි සැරියේ ගුණාත්මකතාව සහ ව්‍යාපාර ප්‍රවර්ධනය කෙරෙහි දායක වන මූල්‍ය සේවා සපයනු ලබන ව්‍යාපාරයක අපි නිරත වන්නෙමු.

අපගේ ගනුදෙනුකරුවන් කෙරෙහි සැලකිලිමත් වෙමින් ඔවුන් ආරක්ෂා කර ගැනීමට හැකිවන අයුරින් අපි අපගේ මානව සම්පත බලගන්වමින් උත්ප්‍රේරණය කරන්නෙමු.

තරඟකාරිත්වය තුළ ලාභ ලබන අතරතුර ජාතික ආර්ථිකය සංවර්ධනයකිරීමට ද අපගේ දායකත්වය ලබා දෙමු.

අපගේ ව්‍යාපාර පරිචයන් තුළ තිරසාර වෙමින්ම, අපගේ මෙහෙයුම් දියත් කරනු ලැබ ඇති සමාජය වෙත “අගය ප්‍රතිදානය” කිරීම පිළිබඳව අපි විශ්වාස කරමු.

අපගේ වටිනාකම් ප්‍රකාශයන්

ජාතියේ අභිමානය බවට පත්වීම

පාරිභෝගික කේන්ද්‍රීයත්වය සහ නම්‍යශීලීභාවය

අවංකභාවය සහ වගකීම් සහගත බව

අඛණ්ඩ ඉගෙනුම් සංස්කෘතිය සහ කණ්ඩායම් හැඟීම

සවිබලගැන්වීම සහ විවිධත්වය

පුළුල් චින්තනයකට සහ දිගුකාලීන සාර්ථකත්වයක් නිර්මාණය කිරීමට ඉවහල් වන බලවේගයන් (BHAG)

බැංකු කර්මාන්තයේ ඉහළම සේවක තෘප්තිමත්භාවය සහ ගනුදෙනුකරුවන්ගේ වැඩිම ආකර්ශණය සහිත බැංකුව බවට පත්වීම.

අපගේ සමූහය

PEOPLE'S BANK
Pride of the Nation

ආරම්භය

1961

ගනුදෙනුකාර කාණ්ඩ

පුද්ගල ගනුදෙනුකරුවන්

ක්ෂුද්‍ර මූල්‍ය සේවා ගනුදෙනුකරුවන්

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර (SME)

රාජ්‍ය සහ රජය සතු ආයතන

සංස්ථාගත ආයතන

ප්‍රධාන නිපැයුම් හා සේවා

පුද්ගල බැංකුකරණය

භාණ්ඩාගාර සහ ආයෝජන බැංකුකරණය

ජාත්‍යන්තර බැංකුකරණය

ණයපත්

වාණිජ ණය

ආයතනික බැංකු කටයුතු

කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර සහ සංවර්ධන බැංකුකරණය

විදේශීය පාරිභෝගික සේවා

කාර්යසාධන විශේෂ කරුණු - 2025

වත්කම්
රුපියල් බිලියන
3,708.4

බදු පසු ලාභය
රුපියල් බිලියන
40.2

කාර්ය මණ්ඩල සවිය

8,122

ශාඛා

746



75%
හිමිකාරිත්වය

ආරම්භක වර්ෂය

1995

ගනුදෙනුකරු කාණ්ඩ

පුද්ගල ගනුදෙනුකරුවන්

ක්ෂුද්‍ර ව්‍යවසාය

කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර

සංස්ථාගත ආයතන

ප්‍රධාන නිපැයුම් සහ සේවා

ලීසිං සහ වාරික පදනම මත මිලදී ගැනීම්

ක්ෂුද්‍ර මූල්‍ය

තැන්පතු

ණය

2025 කාර්ය සාධනයේ විශේෂ අවධානයට

වත්කම්	බදු පසු ලාභය
රුපියල් බිලියන 280.1	රුපියල් බිලියන 4.5

කාර්ය මණ්ඩල සවිය	ශාඛා
3,237	112

99%
හිමිකාරිත්වය

ආරම්භක වර්ෂය

1993

ගනුදෙනුකරු කාණ්ඩ

පුද්ගල ගනුදෙනුකරුවන්

සංස්ථාගත ආයතන

කණ්ඩායම් සංචාරකයෝ

අන්තර්ජාතික ආගමන සංචාරකයින්

ප්‍රධාන නියැපුම් සහ සේවා

ආගමන සංචාර

නික්ම යාමේ සංචාර

ගමනාන්ත කළමනාකරණය

2025 කාර්ය සාධනයේ විශේෂ අවධානයට

වත්කම්	බදු පසු ලාභය
රුපියල් මිලියන 245.0	රුපියල් මිලියන 56.7

කාර්ය මණ්ඩල සවිය	වෙළෙඳ හවුල්කරුවන් ගණන
19	2

සුවිශේෂී මංසලකුණු



1961 සිට 1969 දක්වා

1961 ජූලි මස 1 වැනිදා උත්සවාකාරයෙන් ආරම්භ වීම.

කොළඹ ඩියුක් වීදියෙහි පළමු ශාඛාව විවෘත කිරීම.

උකස් සේවාව ආරම්භ කිරීම.

සමුපකාර ග්‍රාමීය බැංකු ක්‍රමය සහ නව කෘෂිකාර්මික ණය යෝජනා ක්‍රමය ආරම්භ කරමින්, සුළු කෘෂිකාර්මික වගාකරුවන්ට පුරෝගාමී ණය සපයන්නා බවට පත්විය.

1970 සිට 1979 දක්වා

අවිධිමත් අංශයේ ආර්ථික කටයුතු සඳහා මුදල් සැපයීම සඳහා "අතමාරු" ණය යෝජනා ක්‍රමය හඳුන්වා දීම.

100 වන ශාඛාව ලෙස මරඳගහමුල ශාඛාව විවෘත කිරීම.

සේවක සංඛ්‍යාව 5,000 දක්වා ළඟා වීම.

කොරලවැල්ලේදී පළමු ධීවර බැංකුව විවෘත කරන ලදී.

1980 සිට 1989 දක්වා

විස්තීරණ බාලයවයස්කාර ඉතුරු යෝජනා ක්‍රමය දියත් කිරීම.

300 වන ශාඛාව ලෙස ඉංගිරිය ශාඛාව විවෘත කිරීම.

සේවක සංඛ්‍යාව 10,000 දක්වා ළඟා වීම.

බැංකුවේ අනුබද්ධිත ආයතනයක් ලෙස පීපල්ස් මර්චන්ට් බැංකුව ස්ථාපිත කිරීම.

පරිගණකගත කිරීමේ ක්‍රියාවලිය අපගේ ප්‍රධාන කාර්යාලයෙන් සහ තෝරාගත් නාගරික ශාඛාවලින් ආරම්භ කිරීම සහ, අදිසි ආලෝක Black Light ක්‍රමයක් හඳුන්වා දීම මගින් ගනුදෙනුකරු සේවා සැපයීමට ගතවන කාලය අවම කිරීම.

1990 සිට 1999 දක්වා

ප්‍රථම ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රය ප්‍රධාන කාර්යාලයේ ස්ථාපිත කිරීම.

රජයේ ඇඟලුම් කම්හල් 200 වැඩසටහනට සහය විය.

ශාඛා 160ක් පරිගණකගත කිරීම.

"වනිතා වසනා" සහ "ඉසුරු උදාන" සුරැකුම් යෝජනා, "සුරතුර" ණය යෝජනා ක්‍රමය සහ "විදේශිකා" තැන්පතු යෝජනා ක්‍රම ආරම්භ කිරීම.

2000 සිට 2009 දක්වා

"ජන ජය" ඉතුරුම් සහ ණය යෝජනාක්‍රමය දියත් කිරීම.

මධ්‍ය ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර හුවමාරුව හඳුන්වාදීම.

මුළු ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සංඛ්‍යාව 90 දක්වා වැඩිකිරීම.

PBAS හි ස්වයංක්‍රීයකරණය කළ ශාඛා සංඛ්‍යාව 218 දක්වා ඉහළ නැංවීම සහ ශාඛා 119ක් මධ්‍ය ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර හුවමරුවට සම්බන්ධ කිරීම.

භාණ්ඩාගාර ස්වයංක්‍රීයකරණ පැකේජයක් ක්‍රියාත්මක කිරීම.

අති නවීන මධ්‍ය බැංකුකරණ පද්ධතියක් සහ වෙළඳ සේවා විසඳුම් ස්ථාපිත කිරීම සඳහා මලයාසියාවේ සිලව ලේක් සිස්ටම් SDV BUD සමග ගිවිසුම්ගතවීම.

මුල් වරට බැංකුව විසින් BBB+ පොදු තත්වාගණනය ෆිච් රේටිංස් ලංකා වෙතින් ලබා ගැනීම.

මධ්‍ය බැංකුකරණ ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක කිරීම.

රජය, ආසියානු සංවර්ධන බැංකුව සහ මහජන බැංකුව අතර අත්සන් තබනලද ගිවිසුමකට අනුකූලව ශ්‍රී ලංකා රජය වෙතින් බැංකුවේ සාමාන්‍ය කොටස් ප්‍රාග්ධන ආයෝජන ප්‍රථම වාරිකය ලෙස රුපියල් බිලියන 2ක් ද, ප්‍රාග්ධන ආයෝජන දෙවන වාරිකය ලෙස රුපියල් බිලියන 1ක් ද, ප්‍රාග්ධන ආයෝජන තෙවන වාරිකය ලෙස රුපියල් බිලියන 1.5ක් ද හිමිවීම.

ප්‍රථම වතාවට බැංකුවේ 2008 වාර්ෂික වාර්තාව වෙනුවෙන් දකුණු ආසියානු ගණකාධිකාරී සම්මේලනයේ SAFA සම්මානය හිමිවීම.

2010 සිට 2019 දක්වා

බැංකුවේ 2011 වාර්ෂික වාර්තාව සඳහා 2012 ජාත්‍යන්තර ARC සම්මාන උළෙලේදී ජාතික කාණ්ඩයේ ගෘන්ඩ් සම්මානයක් සහ රන් සම්මාන තුනක් දිනා ගැනීම.

දිවයින පුරා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය මධ්‍යස්ථාන 23ක් ස්ථාපිත කිරීම. ජාතික පොදු ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ස්විචයට සම්බන්ධ වූ මුල්ම බැංකුව බවට පත්වීම.

ක්ෂේත්‍රයේ දෙවැනි විශාලතම බැංකුව ලෙස බැංකුවේ වත්කම් පදනම රුපියල් ට්‍රිලියනය ඉක්මවීම.

යුරෝපීය ගෝලීය බැංකුකරණ හා මූල්‍ය සම්මාන - ශ්‍රී ලංකාව 2014 ප්‍රධානයේ දී "2014 වසරේ බැංකුව" සම්මානය මෙන්ම 2014 ලෝක මූල්‍ය බැංකුකරණ සම්මාන ප්‍රධානයේ දී "ශ්‍රී ලංකාවේ විශිෂ්ටතම බැංකුකරණ සමූහය" හා "ශ්‍රී ලංකාවේ වඩාත්ම තිරසාර බැංකුව" යන ත්‍රිත්ව ගෞරව සම්මාන හිමිකරගැනීම. සිය තිරසාරභාවය පිළිබඳ කැපවීම් ප්‍රදර්ශනය කරමින් බැංකුව විසින් හරිත බැංකුකරණ සංකල්පයක් දියත් කිරීම.

සම්පූර්ණයෙන්ම ඩිජිටල්කරණය කළ ශ්‍රී ලංකාවේ ප්‍රථම බැංකු ශාඛාව කොළඹ නගරයේ විවෘත කරමින් තොරතුරු ආරක්ෂණ කළමනාකරණය සඳහා කීර්තිමත් ISO/IEC 27001: 2013 ප්‍රමිති සහතිකය දිනා ගනිමින් එම සහතිකය දිනූ දිවයිනේ ප්‍රථම රාජ්‍ය බැංකුව බවට පත්වීම.

"පීපල්ස් වේව්" යෙදුම ශ්‍රී ලංකාවේ වැඩියෙන්ම බාගත කළ මුල්‍ය යෙදුම්වලින් එකක් බවට පත්වීම.

පාර්ලිමේන්තුවේදී සම්මත වූ මහජන බැංකු (සංශෝධන) පනතින් පසු ණයකර නිකුතුවක් තුළින් බැංකුව රුපියල් බිලියන 10.0ක් රැස්කරගැනීම. ස්වයං බැංකු ඒකක ප්‍රමාණය වසර තුනක් තුල 239 දක්වා ළඟා වීම.

මහජන බැංකුව මේ දක්වා ශ්‍රී ලංකාවේ වාණිජ බැංකුවක් විසින් ලබාගෙන ඇති විශාලතම හා දීර්ඝතම ද්විපාර්ශ්වික අරමුදල් පහසුකමට අත්සන් තැබීම.



2020

කොවිඩ්-19 වසංගතයෙන් පසු, බැංකුව ජාතියට, ගනුදෙනුකරුවන්ට සහ පොදු ජනතාවට අසමසම සහයක් ලබාදීම. අද දක්වා ක්ෂේත්‍රයේ ඉහළම අගය වන දෙවන පෙළ ස්ථර ණයකර රු.බි. 20.0ක් සාර්ථකව රැස්කිරීම.

ඉහළම ආයතන 3 අතර රැඳෙමින්, සන්නාම වටිනාකම තුළ ධනාත්මක ඉහළයාමක් ඇති කරගත් එකම රාජ්‍ය බැංකුව බවට පත් වීම.

2021

"ජාතියේ අභිමානය" යන ආදර්ශ පාඨය සමඟ බැංකුවේ 60 වැනි සංවත්සරය සැමරීම.

People's Wave, මිලියනයකට අධික සක්‍රීය පරිශීලකයින් සිටින රටේ වැඩිපුරම බාගත කරන ලද බැංකු යෙදුම බවට පත්වීම. බැංකුව විසින් Peoplezs Pay Wallet යෙදුම හඳුන්වා දීම.

2022

අධිමිල වෙළඳපොළ අංශයේ අවශ්‍යතා සපුරාලීම සඳහා, Excelsior සහ Elegance නම් නව සන්නාම දෙකක් දියත් කිරීම.

අපගේ ආයතනික සමාජ වගකීම් වැඩසටහන යටතේ "මහජන මෙහෙවර" හඳුන්වා දීම.

2022-2024 උපායමාර්ගික සැලසුම් සාර්ථකව දියත් කිරීම.

ලබාගත් සම්මාන සහ ඇගයීම්

- Banker Magazine විසින් ලොව හොඳම බැංකු 1,000 අතරට මහජන බැංකුව නම් කිරීම.
- Asian Banker සඟරාව විසින් Asian Bankers Top Banks 500 අතරට අපගේ බැංකුව ඇතුළත් කිරීම.
- 2022 ජාත්‍යන්තර ARC සම්මාන උළෙලේදී රන් සම්මාන දෙකක් ද ඇතුළුව සම්මාන හතරක් හිමිකරගැනීම.
- CMA විශිෂ්ටතා ඒකාබද්ධ වාර්තාකරණ සම්මාන 2022 හි හොඳම ඒකාබද්ධ වාර්ෂික වාර්තා දහයට බැංකුවේ 2021 වාර්ෂික වාර්තාව ඇතුළත්වීම.
- දකුණු ආසියානු ගණකාධිකාරී සම්මේලන (SAFA) සම්මාන උළෙලේ රාජ්‍ය අංශයේ බැංකු කාණ්ඩයේ ඒකාබද්ධ ලෝකඩ ජයග්‍රාහකයා බවට පත්වීම.
- 2022 TAGS සම්මාන උළෙලේදී රාජ්‍ය අංශය සඳහා ලෝකඩ සම්මානය දිනාගැනීම.
- WFWP සම්මාන 2022 හි දී කාන්තාවන් සඳහා ශ්‍රී ලංකාවේ විශිෂ්ටතම සේවා ස්ථානය ලෙස බැංකුව පිළිගැනීම.



2023

වැඩිදියුණු කළ බැංකු සේවා සැපයීම සඳහා මහජන බැංකුව ඉන්දීය HDFC බැංකුව සමඟ අත්වැල් බැඳගැනීම.

දේශීය බැංකු ඒකකවල වෙළෙඳ මූල්‍ය ව්‍යාපාර කළඹ ශක්තිමත් කිරීමේ අරමුණින් අපනයන අංශයේ විශේෂිත කුඩා හා මාධ්‍ය පරිමාණ මධ්‍යස්ථාන (අපනයන මධ්‍යස්ථාන) 2023 ජූලි මාසයේ සිට කලාප හතක ස්ථාපිත කිරීම.

People's FX Future Plus විදේශ මුදල් ස්ථාවර තැන්පතු ගිණුම 2023 ජුනි මාසයේදී හඳුන්වා දීම.

ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර මූල්‍ය අංශයට සහය නඟා සිටුවීම සඳහා බැංකුව විසින් 2023 ජූලි මාසයේදී People's Power ණය යෝජනා ක්‍රමය හඳුන්වාදීම.

2023 සැප්තැම්බර් මාසයේදී බැංකුව විසින් නව කාර්ය මණ්ඩල සාමාජිකයින් 500ක කණ්ඩායමක් බඳවා ගැනීම.

2024

රුපියල් බිලියන 25.1ක ඉතිහාසයේ ඉහළම බදු පසු ලාභයක් සමඟ වාර්තාගත කාර්ය සාධනයක් අත්කර ගැනීම

රාජ්‍ය ව්‍යවසායන් (SOEs) සඳහා නිරාවරණය සැලකිය යුතු ලෙස අඩු කරමින්, පුද්ගලික අංශයේ ණය දීම ව්‍යාප්ත කිරීම.

නව ආයතනික බැංකු ගනුදෙනුකරුවන් 100ක් සම්බන්ධ කර ගැනීම.

ඩිජිටල් විසඳුම් ලියාපදිංචි කිරීම් මිලියන 4.4ක් කරා ළඟා වීම.

තොරතුරු ආරක්ෂණ කළමනාකරණ පද්ධති (ISMS) සඳහා නවතම ISO 27001:2022 ප්‍රමිතිය යටතේ සහතික කළ පළමු දේශීය පද්ධතිය වශයෙන් වැදගත් ශ්‍රී ලාංකික බැංකුව බවට පත්වීම.

2025

ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති ආචාර්ය පී. නන්දලාල් වීරසිංහ සහ භාණ්ඩාගාර ලේකම් සහ මුදල්, සැලසුම් සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් ආචාර්ය හර්ෂණ සූරියප්පෙරුම යන මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් මහජන බැංකුවේ නව මූලස්ථාන ගොඩනැගිල්ල, "පීපල්ස් ටවර්", 2025 ඔක්තෝබර් 7 වන දින කොළඹ 02, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මාවතේ අංක 374 දරන ස්ථානයේ දී නිල වශයෙන් විවෘත කිරීම.

ඉතිහාසගත ඉහළම බදුපසු ලාභය ලෙස රු. බිලියන 40.2ක් බැංකුව ස්වාධීන ඒකකයක් ලෙස වාර්තා කිරීම. සමූහ වත්කම් රු. ට්‍රිලියන 4.0 ඉක්මවා වර්ධනය වීම

ශ්‍රී ලංකාවේ කාර්මික සංවර්ධන මණ්ඩලය (IDB) එක්ව තරුණ ව්‍යවසායකයින් සවිබල ගැන්වීම.

"Pay Digital" වැඩසටහන සාර්ථකව සහය දක්වමින් බැංකුවේ ඩිජිටල් බැංකුකරණ වේදිකා භාවිතය හා අවබෝධය වැඩි කර, ඩිජිටල් විසඳුම් ලියාපදිංචි සංඛ්‍යාව මිලියන 5.3 ඉක්මවීම.

"Sri Lanka's Most Outstanding Women-Friendly Workplace Award 2025" සහ "Best Talent Acquisition Organization Award 2025" ඇතුළු ජාතික හා ජාත්‍යන්තර සම්මාන කිහිපයක් හිමිකර ගැනීම.



සම්මාන



BestWeb 2025 සම්මාන

01. ජනප්‍රියතම බැංකු සහ මූල්‍ය වෙබ් අඩවිය – රන් සම්මානය
02. හොඳම බැංකු සහ මූල්‍ය වෙබ් අඩවිය – රිදී සම්මානය

ලෝක ව්‍යාපාර සම්මේලනයේ The Bizz worldcob/Beyond Success 2025

03. ව්‍යාපාර කළමනාකරණ විශිෂ්ටතා සම්මානය

කාන්තා හිතකාමී සේවා ස්ථාන සම්මාන 2025

04. ශ්‍රී ලංකාවේ වඩාත්ම කැපීපෙනෙන කාන්තා හිතකාමී සේවා ස්ථාන සම්මානය

CPM හොඳම කළමනාකරණ පරිචයන් සඳහා වන සම්මාන

05. විවිධත්වය, සමානාත්මතාවය සහ අන්තර්ගතභාවය (DEI) කාණ්ඩය – රන් සම්මානය
06. විශිෂ්ට සමාගම් විස්ස අතරට තේරී පත් වීම
07. බැංකු (රාජ්‍ය) කාණ්ඩය ජයග්‍රාහකයා
08. ආයතනික සමාජ පත්කර CSR කාණ්ඩය – ලෝකඩ සම්මානය
09. 2025 හොඳම කළමනාකරණ පරිචයන් සඳහා වන ආයතනික සම්මාන – කුසලතා සම්මානය
10. ඩිජිටල් සාක්ෂරතා කාණ්ඩය කුසලතා සම්මානය

LANKA PAY තාක්ෂණ නවෝත්පාදන සම්මාන

11. වර්ෂයේ හොඳම ඩිජිටල් ගෙවීම් උපායමාර්ගය සඳහා වසරේ මූල්‍ය ආයතනය – රිදී සම්මානය
12. ජනප්‍රියම ඩිජිටල් ගෙවීම් නිෂ්පාදන (රාජ්‍ය බැංකු කාණ්ඩය – අන්තර්ජාල හා ජංගම බැංකුකරණය) – රන් සම්මානය

Great HR Awards සම්මාන උළෙල 2025

13. 2025 වසරේ හොඳම කුසලතා බඳවා ගැනීමේ ආයතනය

2025 දකුණු ආසියානු ව්‍යාපාර විශිෂ්ටතා සම්මාන (SAPS)

14. රාජ්‍ය බැංකු අංශයේ හොඳම බැංකුව
15. රාජ්‍ය බැංකු අංශයේ වසරේ තිරසාර බැංකුව

ජාතික ව්‍යාපාර විශිෂ්ටතා සම්මාන (NBEA) 2025

16. බැංකු අංශය – ශූරතාවය
17. අති විශාල කාණ්ඩය – අනුශූරතාවය
18. දේශීය වෙළඳපොළ – ජයග්‍රාහී සම්මානය
19. සමස්ත විශිෂ්ටත්වය සඳහා ලෝකඩ සම්මානය
20. ධාරිතා ගොඩනැගීමේ විශිෂ්ටත්වය සඳහා ජයග්‍රාහී සම්මානය



ගෝලීය ව්‍යාපාර සමාලෝචන සඟරා සම්මාන 2025 –

21. වසරේ ශ්‍රී ලාංකීය බැංකු සේවා සැපයුම්කරු 2025
22. 2025 වසර සඳහා හොඳම ශ්‍රී ලාංකික පාරිභෝගික ඩිජිටල් බැංකුව
23. 2025 වසර සඳහා හොඳම ක්‍රෙඩිට් කාඩ්පත් පිරිනැමීම් ශ්‍රී ලාංකීය බැංකුව
24. වසරේ හොඳම ශ්‍රී ලාංකීය ඩිජිටල් බැංකු විසඳුම් සැපයුම්කරු 2025
25. හොඳම ශ්‍රී ලාංකික ඩිජිටල් පසුම්බි යෙදුම People's Pay
26. ශ්‍රී ලාංකික හොඳම මූල්‍ය අන්තර්කරණ වැඩසටහන 2025
27. ශ්‍රී ලාංකික හොඳම නව්‍ය ක්‍රෙඩිට් කාඩ් සේවා 2025
28. ශ්‍රී ලාංකීය කාන්තාවන් සඳහා වඩාත්ම කැපීපෙනෙන සේවා ස්ථාන 2025
29. වඩාත්ම ප්‍රතිචාරාත්මක ශ්‍රී ලාංකීය බැංකුව 2025
30. 2025 වර්ෂය සඳහා ලංකාවේ වඩාත්ම තිරසාර බැංකුව

AICPA සහ CIMA – JXG Pinnacle සම්මාන 2025

31. රන් සම්මානය – 2025 වසරේ ඩිජිටල් පරිවර්තන ව්‍යාපෘතිය

TAGS සම්මාන 2025

32. රාජ්‍ය බැංකු අංශය – ලෝකඩ සම්මානය

දත්ත කළමනාකරණය හා අනුකූලතා ඇගයීම් සම්මාන 2025

33. ඉහළම වලංගුතාවය පවත්වා ගැනීමේ හොඳම කාර්යසාධනය (දත්ත යැවීම් 1,000,000 කට අධික)
34. දත්ත යාවත්කාලීන කිරීමේ හොඳම කාර්යසාධනය (දත්ත යැවීම් 1,000,000 ට අධික)

CMA ඒකාබද්ධ වාර්තාකරණ විශිෂ්ටතා සම්මාන – 2025

35. හොඳම ඒකාබද්ධ වාර්තාව (රාජ්‍ය බැංකු අංශය) – අනුශූරතාව

Euromoney සම්මාන – 2025

36. ශ්‍රී ලාංකික හොඳම ඩිජිටල් බැංකුව
37. විවිධත්වය සහ අන්තර්ගතභාවය සඳහා හොඳම බැංකුව


අප සිදුකරන සමාජ ආර්ථික බලපෑම

විශේෂ කරුණු - මූල්‍යමය

	බැංකුව			සමූහය		
	2025	2024	වෙනස %	2025	2024	වෙනස %
මෙහෙයුම් කාර්යසාධනය (රු. බිලියන)						
පොලී ආදායම	356.7	349.3	2.1	395.1	377.0	4.8
ශුද්ධ පොලී ආදායම	142.4	107.2	32.8	164.7	122.9	34.0
දළ ආදායම	382.0	368.0	3.8	424.0	400.0	6.0
මූල්‍ය සේවා මත බදු පෙර මෙහෙයුම් ලාභය	83.4	56.8	46.9	93.0	65.0	43.1
බදු පෙර ලාභය	64.4	41.6	54.9	71.1	47.6	49.4
ආදායම් බදු	24.2	16.5	46.6	27.6	18.8	46.7
බදු පසු ලාභය	40.2	25.1	60.4	43.5	28.8	51.1
මූල්‍ය තත්වය (රු. බිලියන)						
මුළු වත්කම්	3,708.4	3,297.8	12.5	4,010.2	3,471.7	15.5
දළ ණය සහ ලැබිය යුතු දේ	1,887.8	1,671.2	13.0	2,164.9	1,824.1	18.7
මුළු තැන්පතු	3,229.9	2,854.7	13.1	3,380.3	2,947.9	14.7
කොටස් හිමියන්ගේ අරමුදල්	219.0	182.0	20.4	270.1	230.0	17.5
කාර්යසාධන අනුපාත (%)						
සාමාන්‍ය වත්කම් මත ඉපයීම (බදු පෙර)	1.8	1.3		1.9	1.4	
ස්කන්ධ මත ඉපයීම	20.1	14.7		17.4	13.2	
ශුද්ධ පොලී ආන්තිකය	4.1	3.4		4.4	3.7	
ආදායම් පිරිවැය අනුපාතය	40.1	50.3		43.1	52.2	
වත්කම් ගුණාත්මකතා අනුපාතය (%)						
හානිකරණය කරන ලද ණය (අදියර 3) අනුපාතය	7.7	10.3		6.9	9.7	
හානිකරණය කරන ලද ණය මත හානිකරණ ප්‍රතිපාදන (අදියර 3) අනුපාතය	48.4	41.5		48.7	42.4	
ද්‍රවශීලතා ආවරණ අනුපාත (%)						
ද්‍රවශීලතා ආවරණ අනුපාතය - රුපියල්	263.3	353.9				
ද්‍රවශීලතා ආවරණ අනුපාතය - සියලු ව්‍යවහාර මුදල්	218.5	279.5				
ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතය	162.4	178.9				
නියාමන ප්‍රාග්ධන අනුපාතය (%)						
පොදු ස්කන්ධ ස්ථර 1 ප්‍රාග්ධනය (අවම අවශ්‍යතාව 8.0%)	11.8	10.4		12.8	12.2	
පළමු පෙළ ප්‍රාග්ධනය (රු. අවම අවශ්‍යතාව 9.5%)	12.2	10.9		13.1	12.6	
මුළු ප්‍රාග්ධනය (අවම අවශ්‍යතාව 13.5%)	16.5	16.5		16.8	17.7	
කොටස් හිමිකාර අනුපාත (රු.)						
කොටසක ඉපැයුම්	40,230	25,088	60.4	43,484	27,559	57.8
කොටසක ශුද්ධ වත්කම් අගය	219,038	181,998	20.4	270,114	229,952	17.5

බදු පෙර ලාභය


රු.බි.



2025 රු.බි. 64.4 වර්ධනය 54.9%

බදු පසු ලාභය


රු.බි.



2025 රු.බි. 40.2 වර්ධනය 60.4%

දළ ණය සහ අත්තිකාරම්


රු.බි.



2025 රු.බි. 1,887.8 වර්ධනය 13.0%

මුළු තැන්පතු


රු.බි.



2025 රු.බි. 3,229.9 වර්ධනය 13.1%

ශුද්ධ පොලී ආදායම


රු.බි.



2025 රු.බි. 142.4 වර්ධනය 32.8%

අරමුදල් නොවන මුළු ආදායම

රු.බි.



2025 රු.බි. 23.4 වර්ධනය 30.7%

විශේෂ කරුණු - මූල්‍යමය නොවන

ඩිජිටල් පාරිභෝගික විසඳුම් සඳහා ලියාපදිංචිකිරීම්	**මිලියන 5.3**
2025 වසර සඳහා නව ගනුදෙනුකරුවෝ	**540,740**
ගනුදෙනුකරු පැමිණිලි නිරාකරණය	**90%**
සේවා නියුක්තිය	**8,122**
සේවකයින් සඳහා ගෙවූ ප්‍රතිලාභ සහ වැටුප්	**රු. බිලියන 38.2**
සේවක පුහුණු පැය	**27** එක් සේවකයෙකුට පැය 27 (ආසන්න වශයෙන්)
සේවක පුහුණු කිරීම් සඳහා ආයෝජනය	**රු. මිලියන 190.3**
සේවකයින් රඳවාගැනීමේ අනුපාතය	**97%**





කාන්තා සේවා නියුක්තිය	4,818
විදෙස් පුහුණුවීම් ලද සේවකයින් සංඛ්‍යාව	72
හරිත ශාඛා	141
ආයතනික සමාජ වගකීම් (CSR) වැඩසටහන් සඳහා ආයෝජනය	රු. මිලියන 26.9



විධායක සමාලෝචන



26
සභාපතිතුමාගේ පණිවිඩය

32
ප්‍රධාන විධායක නිලධාරීතුමා/ සාමාන්‍යාධිකාරීතුමාගේ සමාලෝචනය

36
අධ්‍යක්ෂ මණ්ඩලය

44
ආයතනික කළමනාකරණය

54
විධායක කළමනාකරණය

57
ප්‍රධාන කළමනාකරුවන්



සභාපතිතුමාගේ පණිවිඩය

GRI 2-22

දිගින් දිගටම මුහුණපෑමට සිදුවූ සාර්ව ආර්ථික අභියෝග මධ්‍යයේ වුවද, නොසැලෙන අවධානය, අභියෝග ජයගැනීමේ හැකියාව සහ පැහැදිළි උපායමාර්ග සමඟින්, මහජන බැංකුව 2025 වසර තුළද එහි ශක්තිමත් කාර්යසාධනය අඛණ්ඩව පවත්වාගෙන යාමට මහජන බැංකුවට හැකිවිය. එහි ප්‍රතිඵලයක් ලෙස, බදු පසු ලාභය රු. බිලියන 40.2ක් සහ සමස්ත වත්කම් රු. ට්‍රිලියන 3.7ක් ලෙස වාර්තා කිරීමට සමත් විය.





වර්ෂය තුළ අප අත්පත්කරගත් ජයග්‍රහණයන් සවිස්තරාත්මකව ඉදිරිපත් කරමින්, 2025 වර්ෂය සඳහා මහජන බැංකුවේ මෙම ඒකාබද්ධ වාර්ෂික වාර්තාව, අපගේ පාර්ශ්වකරුවන් වෙත ඉදිරිපත් කරනුයේ හද පිරි සතුටිනි.

දිගින් දිගටම මුහුණපෑමට සිදුවූ සාර්ව ආර්ථික අභියෝග මධ්‍යයේ වුවද, නොසැලෙන අවධානය, අභියෝග ජයගැනීමේ හැකියාව සහ පැහැදි උපායමාර්ග සමඟ, 2025 වසර තුළද සිය ශක්තිමත් කාර්යසාධනය අඛණ්ඩව පවත්වාගෙන යාමට මහජන බැංකුවට හැකිවිය. ප්‍රතිඵලයක් ලෙස, බැංකුවේ බදු පසු ලාභය රු. බිලියන 40.2ක් ද සමස්ත වත්කම් රු. ට්‍රිලියන 3.7ක් ද වශයෙන් වාර්තා කිරීමට සමත් විය. විනයගරුක පිරිවැය කළමනාකරණය, අවදානම් කළමනාකරණය, ප්‍රාග්ධන කළමනාකරණය සහ ඉලක්කගත ආදායම් විවිධාංගීකරණය ඒකාබද්ධ කරමින් සිය ගමනතාව පවත්වාගෙන යන මහජන බැංකුව ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියේ සැලකිය යුතු බරක් උසුලන අතර දේශයේ ඩිජිටල් පරිවර්තනය සඳහා ද තෝතැන්නක් වේ. පාරිභෝගිකයන් කේන්ද්‍ර කරගනිමින් ඩිජිටල් සේවා වේගවත් කිරීම, මූල්‍ය තාක්ෂණික හවුල්කාරිත්වයන් සවිමත් කිරීම සහ ආරක්ෂිත මෙන්ම ව්‍යාප්ත කළ හැකි තාක්ෂණික මෘදුකාංගවල ආයෝජනය කිරීම මගින්, තිරසාර ආර්ථික වර්ධනයට සහාය වෙන අතරතුර බැංකුව සිය තරඟකාරිබව තවදුරටත් ශක්තිමත් කළේය. අපගේ මූල්‍ය විචක්ෂණභාවය සහ අනාගතයට ගැළපෙන ආයෝජන මෙන්ම, අඛණ්ඩව සිදු කෙරෙන සේවක පුහුණුව සහ කුසලතා වර්ධනය කිරීම් හරහා, ශ්‍රී ලංකාවේ ඩිජිටල් බැංකුකරණ අනාගතයේ විශ්වාසනීය සක්‍රීයකරුවෙකු ලෙස බැංකුවේ භූමිකාව තවදුරටත් තහවුරු විය.

මූල්‍යමය අභියෝග ජයගැනීම සහ වර්ධනය වේගවත් කිරීම

මහජන බැංකුවට මෙම වසර අඛණ්ඩ ස්ථාවරත්වයක් සහ ශක්තිමත් වර්ධනයක් සනිටුහන් කළ වසරක් විය. විපර්යාසකාරී වෙළඳපොළ තත්ත්වයන් මධ්‍යයේ වුවද, තම ප්‍රාග්ධන ස්ථාවරත්වය සුරක්ෂිත කර ගැනීමටත්, මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නැංවීමටත්, ප්‍රධාන ව්‍යාපාරික අංශයන්හි ස්ථාවර වර්ධනයක් පවත්වා ගැනීමටත් බැංකුව සමත් විය. මෙම ප්‍රතිඵල මගින් බැංකුවේ බාධක ජයගැනීමේ හැකියාව සහ දිගුකාලීන තිරසාර වටිනාකම් උත්පාදනය උදෙසා වූ උපායමාර්ගික අවධානය මැනවින් පිළිබිඹු වේ.

ශක්තිමත් මූලික කාර්ය සාධනයක් පෙන්නුම් කරමින් බැංකුව රුපියල් බිලියන 142.4ක ශුද්ධ පොලී ආදායමක් වාර්තා කළ අතර, එය අපගේ ලාභදායිතාව ඉහළ නැංවීමට මූලික විය. අපගේ ආදායම් විවිධාංගීකරණයේ සාර්ථකත්වය විදහා දක්වමින්, ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම රුපියල් බිලියන 16.4 දක්වා වර්ධනය වූ අතර එය පොලී නොවන ආදායම් සඳහා කැපී පෙනෙන දායකත්වයක් ලබා දුන්නේය. 4.1%ක ශුද්ධ පොලී ආන්තිකයක් සහ 40.1%ක පිරිවැය-ආදායම් අනුපාතයක් පවත්වා ගැනීමට හැකි වීම, අපගේ සවිමත් ආදායම් වර්ධනය මෙන්ම විනයගරුක පිරිවැය කළමනාකරණය මැනවින් පිළිබිඹු කරන්නකි. ඩිජිටල් නාලිකා වෙත පාරිභෝගිකයින් යොමු කිරීම, ශාඛා පද්ධතිය ප්‍රශස්තකරණය, ක්‍රමවත් ප්‍රසම්පාදන ක්‍රියාවලිය සහ කාර්යක්ෂම මානව ප්‍රාග්ධන කළමනාකරණය හරහා හිමි වූ පැහැදිලි ප්‍රතිලාභ මෙම ප්‍රතිඵල මගින් සනාථ වේ. බැංකුවේ තිරසාර ප්‍රගතිය මෙවැනි උපායමාර්ගික භාවිතයන් මත තීරණය වන බැවින්, අපගේ ඩිජිටල් පරිවර්තන ගමන අඛණ්ඩව ඉදිරියට ගෙන යාමට අපි කැපවී සිටිමු.

විනයගරුක ශේෂ පත්‍ර කළමනාකරණය සහ ඉහළ පොලී ආන්තිකයන් මඟින් බලගැන්වුණු, මහජන බැංකුවට ශක්තිමත් ලාභදායිතාවයක් හා වැඩිදියුණු වූ ප්‍රතිලාභ ලබා දීමට හැකි විය. සමස්තයක් වශයෙන්, මෙම දර්ශක සමතුලිත හා සවිමත් ආදායම් සංයෝජනයක් පෙන්වා දෙයි. පොලී ආදායම තවදුරටත් ප්‍රධාන ආදායම් මූලාශ්‍රය ලෙස ක්‍රියා කරන අතර, ගාස්තු ආදායම පොලී අනුපාත වෙනස්වීම් වලට වඩාත් වැදගත් ස්ථායීකාරකයක් බවට වර්ධනයවෙමින් පවතින අතර කොටසකට ඉපැයීම් ඉහළ අගයක් වාර්තා කිරීම මගින් ප්‍රශස්ථ පිරිවැය පාලනය සහ ප්‍රාග්ධන භාවිතය පෙන්වයි.

නියාමන අවම මට්ටම්වලට වඩා බෙහෙවින් ඉහළ 16.5%ක ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතයක් (Capital Adequacy Ratio) වාර්තා කරමින්, බැංකුව ශක්තිමත් ප්‍රාග්ධන පදනමක් සහිතව වසර අවසන් කළේය. මෙය අපගේ ණය ලබාදීමේ ධාරිතාව අඛණ්ඩව පවත්වා ගැනීමට මහත් ශක්තියක් විය. එමෙන්ම, විචක්ෂණශීලී සීමාවන් ඉක්මවා යන උසස් තත්ත්වයේ ද්‍රවශීල වත්කම් සංචිත පවත්වා ගනිමින් බැංකුව ඉහළ ද්‍රවශීලතාවක් තහවුරු කළේය.මෙම ශක්තීන් 2025 වසර පුරා බැංකුවේ ඔරොත්තු දීමේ හැකියාව බලගැන්වූ අතර, බැංකුවේ ස්ථාවරත්වයට හානියක් නොවන පරිදි ඉහළ ආදායම් ලබා දෙන ණය අංශයන්හි තෝරාගත් ක්ෂේත්‍රයන්හි වර්ධනයක් අත්පත් කර ගැනීමට ද මග පාදා දුන්නේය.

පිරිවැය අඩු කරමින් සිදු කළ මනා කළමනාකරණය සහ ඩිජිටල් ක්‍රම භාවිතය නිසා බැංකුවේ මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමට හැකිවූ අතර ශාඛා සම්පත් කාර්ක්ෂමව භාවිතා කිරීමෙන් පෞද්ගලික අංශය සඳහා හොඳ සේවාවක් ලබා දීමට හැකි විය. එසේම, බැංකුවේ වර්ධනයට වඩාත් අර්ථවත් ලෙස දායක වන, ඉහළ වටිනාකමකින් යුත් කාර්යයන් සඳහා කාර්ය මණ්ඩලය වැඩි වශයෙන් යොමු වනු දක්නට ලැබිණි.

සවිමත් අවදානම් පාලනය

බැංකුවේ ඩිජිටල් පරිවර්තනය නිසා දත්ත මත පදනම්ව වඩා ක්‍රියාශීලීව ණය කළමනාකරණය සිදු කළ හැකි වූ අතර, එමඟින් වත්කම්වල ගුණාත්මකභාවය වැඩිදියුණු කර අවදානම් පාලනය ශක්තිමත් කිරීමද සිදු විය. පූර්ව දැනුම්දීමේ ක්‍රියාවලිය මඟින් මනා ලෙස ණය පිළිබඳ ඇගයීමක් සිදුකිරීමට හා නිරීක්ෂණයකිරීමට හැකි වූ අතර, ඒ මඟින් නිසි කලට සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට හැකි විය. ණය ආපසු අයකරගැනීමේ කටයුතු වැඩි කිරීමෙන් ණය කළමනාකරණය ශක්තිමත් විය. ණය ලබාදීමේ දැඩි නීති නිසා නව ණය අවදානම් අඩු විය. පූර්ව දැනුම්දීමේ මඟින් ණය හොඳින් ඇගයීමට හා නිරීක්ෂණයට හැකි වූ අතර, කාලෝචිත ක්‍රියාමාර්ග ගැනීමට එමඟින් හැකිවිය. ණය ආපසු ලබා ගැනීම සඳහා වන ප්‍රවේශයන් වැඩිදියුණු කිරීමෙන් ණය කළමනාකරණය ශක්තිමත් විය. පැහැදිලි අවදානම් සීමා, දැඩි පීඩන පරීක්ෂණ සහ සවිමත් පාලනය නිසා සමස්ත ණය කළඹ තුළ විනිවිදභාවය සහ වගකීම වැඩි විය.

රජයේ සහයෝගය සහ සන්නාම විශ්වාසය ඇතුළුව අපගේ උපායමාර්ගික අභියෝග ජයගැනීමේ හැකියාව මෙන්ම මෙහෙයුම් කාර්යක්ෂමතාවයට ද පාදක වන ව්‍යුහාත්මක ශක්තීන්ගේ එකතුවක්, 2025 දී අපගේ උපායමාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අධිෂ්ඨානශීලීව ඉදිරියට යන ගමනේදී අපට මහඟෝපකාරී විය. ආයතනික විශ්වසනීයත්වය, තැන්පත්කරුවන්ගේ විශ්වාසය සහ අපගේ පුළුල් ශාඛා සහ ATM ජාලය නිසා නාගරික සහ ග්‍රාමීය ප්‍රදේශවල වෙළඳපලට හොඳින් ප්‍රවේශ වීමටත්, වැඩි පිරිසකට මූල්‍ය සේවා ලබා දීමටත් හැකි විය.

පැහැදිලි නිල නියෝග, වැඩිදියුණු කළ වාර්තාකරණ ක්‍රමවේද සහ අවදානම් තත්ව හා කාර්ය සාධනය පිළිබඳ නිරන්තර සමාලෝචන හරහා බැංකුව සිය අධ්‍යක්ෂ මණ්ඩල කමිටුවල කාර්යක්ෂමතාව වැඩිදියුණු කළ අතර මෙමඟින් ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය, වත්කම්වල ගුණාත්මකභාවය, ද්‍රවශීලතාවය සහ උපායමාර්ගික ප්‍රවේශයන්පිළිබඳ ශක්තිමත් අධීක්ෂණයක් සහතික විය. ඉහළ ගිය නියාමන අපේක්ෂාවන්ට ප්‍රතිචාර වශයෙන්, අභ්‍යන්තර පාලන යාන්ත්‍රණ සහ අනුකූලතා නිරීක්ෂණ ක්‍රියාවලීන් තවදුරටත් ශක්තිමත් කරන ලදී. නියාමන වාර්තාකරණයේ නිරවද්‍යතාවය, මුදල් විශුද්ධිකරණ වැලැක්වීම (AML) පාලනය සහ හැසිරීම් අවදානම් කළමනාකරණය කෙරෙහි අමතර අවධානයක් යොමු කරන ලදී.

ශක්තිමත් තැන්පතු පදනම සහ ද්‍රවශීලතාවය මඟින් අඩු වියදම් අරමුදල් සපයමින් ණය වර්ධනයට සහාය වූ අතර, ශක්තිමත් ප්‍රාග්ධනය සහ නියාමන අනුකූලතාව ආර්ථික කම්පන හමුවේ දරාගැනීමේ හැකියාව වැඩි කළේය. විවිධාංගීකරණය වූ පාරිභෝගික හා නිෂ්පාදන කළඹ හේතුවෙන්, ඒකරාශීවූ අවදානම පාලනය කරගත හැකි වූ අතර, සිල්ලර, කුඩා හා මධ්‍ය පරිමාන ව්‍යාපාර, ආයතනික සහ රාජ්‍ය අංශවලින් ආදායම් උත්පාදනය කළ හැකි විය.

විශිෂ්ට පාරිභෝගික සේවාව

සාර්ථකත්වය කරා අප යන ගමනේ දී අප ලබාදෙන විශිෂ්ඨ පාරිභෝගික සේවාව මූලිකත්වය ගනු ලබයි. ඩිජිටල් පරිවර්තනය අපගේ මෙම කැපවීමට සඳහා සවියක් වන අතරම ඒමඟින් අපට බාධවකින් තොරව විශ්වසනීය හා පහසු සේවා සැපයුමක් සිදුකිරීමට හැකි වේ. එතෙකුදු නොව ගනුදෙනුකරුවන්ට සිය මූල්‍ය කළමනාකරණයේදී වඩාත් දැනුම්වත් වූ තීරණ ගැනීමට හැකියාව ලබා දී, එමඟින් මූල්‍ය ඇතුළත්කරණය සඳහා බැංකුව දරන උත්සාහයේ ගුණාත්මකභාවය සහ ප්‍රවේශය වැඩිදියුණු කිරීමට අපගේ ස්වයං සේවා වේදිකා ද රුකුලක් විය.

පාරිභෝගික කේන්ද්‍රීයභාවය මහජන බැංකුවේ ඉහළ ප්‍රමුඛතාවයකි. වේගවත් ඩිජිටල් පරිවර්තන ප්‍රවේශයන් සමඟ ඒකාබද්ධවී මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නංවන අතර, උසස් පාරිභෝගික අත්දැකීමක් ලබා දීමට එමඟින් අපට ඉඩකඩ සැලසුණි. ස්ථිර හා මන්දගාමී වර්ධනයක් හඹා ගිය නිසා අපට මූල්‍ය ස්ථාවරත්වය රැකගැනීමට හැකි වූ අතර, අපගේ ශක්තීන් තිරසාර තරග වාසියක් බවට පත් කරගතහැකි විය.

අපගේ නිෂ්පාදන සංවර්ධනය සහ මෙහෙයුම් ආකෘතිය තුළ නවෝත්පාදනය මූලික භූමිකාවක් ඉටු කරයි. එසේම දේශීය හා ජාත්‍යන්තර උපායමාර්ගික හවුල්කාරිත්වයන් මඟින් අපගේ සන්නාම වටිනාකම සහ පාරිභෝගික ප්‍රතිලාභ වැඩි විය.

අපගේ අභ්‍යන්තර නිර්මාණශීලිත්වය සහ පාරිභෝගික වටිනාකම් පිරිනැමීම (Value Proposition) තවදුරටත් ඉහළ නංවන බාහිර සහයෝගීතාවන් අතර මනා සමතුලිතතාවක් පවත්වා ගැනීම හරහා, ප්‍රජාවන් උදෙසා සමාජීය හා ආර්ථික වටිනාකම් උත්පාදනය කිරීමටත්, මූල්‍ය අන්තර්ග්‍රහණය (Financial Inclusion) සඳහා නව මංපෙත් විවෘත කිරීමටත් අපට හැකි විය. අභ්‍යන්තර පරිවර්තනය, ඉලක්කගත හවුල්කාරිත්වයන් සහ විවිධාංගීකරණය වූ නිෂ්පාදන හා සේවා කළඹක එකතුවක් හරහා, පාරිභෝගිකයන්ට මෙන්ම සමස්ත ප්‍රජාවටම එකසේ ප්‍රතිලාභ සැලසෙන තිරසාර, තාක්ෂණිකව සවිමත් කල මූල්‍ය සේවාවන් සැපයීමට අපට හැකි විය.

ඩිජිටල් පරිවර්තනය

ඩිජිටල් පරිවර්තනය යනු බැංකුව අනාගතයට ගැළපෙන පරිදි සන්නද්ධ කිරීම සහ ජාතික ඩිජිටල්කරණ ක්‍රියාවලියේ ප්‍රමුඛ ගාමක බලවේගයක් ලෙස අපගේ භූමිකාව තවදුරටත් තහවුරු කිරීම උදෙසා ක්‍රියාවට නැංවූ උපායමාර්ගික මෙහෙයුමකි. පාරිභෝගික අත්දැකීම්, මෙහෙයුම් නවීකරණය සහ නවෝත්පාදන සක්‍රිය කිරීම මත පදනම්ව, අපි සියලුම අංශවල ව්‍යාපාර කිරීමේ වඩාත් කඩිනම් ක්‍රම අනුගමනය කළ අතර, අංශ අතර සහයෝගීතාව වැඩිදියුණු කර සේවා සැපයීම වේගවත් කළෙමු.

පහසුව, පුද්ගලීකරණය සහ විශ්වසනීයත්වය සඳහා ප්‍රමුඛත්වය ලබා දුන් අපගේ ඩිජිටල්-පළමු නාලිකා උපාය මාර්ගය පාරිභෝගික අත්දැකීම ප්‍රතිනිර්මාණය කළේය. Omnichannel පාරිභෝගික සහාය පුද්ගල හා ආයතනික පාරිභෝගික මගෙහි ඇති බාධා අඩු කළ අතර, පළමු සම්බන්ධතාවයේදීම ගැටලු විසඳීම වැඩිදියුණු කර දත්ත මත පදනම් වූ නිෂ්පාදන නිර්දේශ සක්‍රිය කළේය. ඩිජිටල්කරණයට අනුගත කරවා ගනිමි, ගෙවීම් සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරික බැංකුකරණ මෙවලම් සඳහා ඉලක්කගත වැඩිදියුණු කිරීම් මඟින් සහාය ලැබූ අපි, 2025 අවසන් වන විට අපගේ ඩිජිටල් පාරිභෝගික පදනම මිලියන 4 ඉක්මවා පුළුල් කළෙමු.

ජාතික සංවර්ධනය උදෙසා අපගේ දායකත්වය

කෘෂිකර්මාන්තය, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය (SME), අපනයන සහ යටිතල පහසුකම් වැනි ප්‍රමුඛතා අංශ වෙත ඉලක්කගත මූල්‍ය පහසුකම් සැපයීම මගින් ජාතික සංවර්ධන ක්‍රියාවලියේදී ශ්‍රී ලංකා රජයේ ප්‍රමුඛ හවුල්කරුවෙකු ලෙස අපි කටයුතු කළෙමු. ඒ හරහා ආර්ථික ක්‍රියාකාරකම් දිරිමත් කිරීමටත්, නව රැකියා අවස්ථා උත්පාදනයටත්, ප්‍රාදේශීය වර්ධනය වේගවත් කිරීමටත් අපට හැකි විය. රජයේ මූල්‍ය අන්තර්කරණ වැඩසටහන් සහ සමාජ සුභසාධන ප්‍රවේශයන් හරහා අර්ධ නාගරික සහ ග්‍රාමීය ප්‍රජාවන් වෙත ළඟා වීමට අපට හැකි විය. හරිත මූල්‍ය සඳහා අපගේ සහයෝගය තුලින් පුනර්ජනනීය බලශක්ති සංවර්ධනයට දායක වූ අතර, ජාතික ජාලය මත අධික ලෙස යැපීම අඩු කිරීමට උපකාර විය.විනයගරුක මූල්‍ය කළමනාකරණය සහ පද්ධතිමය ස්ථාවරත්වයෙන් සහාය ලැබූ බැංකුව කෙරෙහි තැන්පත්කරුවන්ගේ විශ්වාසය වර්ධනය වීම, වාණිජ තිරසාරභාවය සහ රාජ්‍ය සේවය පිළිබඳ අපගේ ද්විත්ව කාර්යභාරය තවදුරටත් ශක්තිමත් කළේය.

මහජන සුභසාධනය සහ සහන කටයුතු

ආපදාවට ලක් වූ පුද්ගලයින්ට සහ කුඩා ව්‍යාපාරවලට ඔවුන්ගේ ජීවිත සහ ජීවනෝපායන් නැවත ගොඩනඟා ගැනීමට සහාය වීම සඳහා කැපවෙමින් මහජන බැංකුව විසින් දිට්වා ආපදා සහන වැඩසටහනක් දියත් කරන ලදී. පීඩාවට පත් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් (MSME) සඳහා සහනදායී පොලී අනුපාත යටතේ (ආසන්න වශයෙන් 3%ක් වැනි) විශේෂ ණය පහසුකම් සැලසීම මෙම වැඩසටහන් යටතට අයත් වේ. එහිදී, ඔවුන්ගේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සහ ව්‍යාපාර යළි නගාසිටුවීමේ අවශ්‍යතාවලට ගැළපෙන පරිදි සකස් කරන ලද ණය පහසුකම් ලබා දීමට ද පියවර ගනු ලැබීය. ව්‍යාපාරවල මෙහෙයුම් යථා තත්ත්වයට පත් කිරීමට, රැකියා පවත්වා ගැනීමට සහ ව්‍යසනයෙන් පසු ආර්ථික ස්ථාවරත්වයක් ලබා ගැනීමට උපකාර කිරීම අරමුණු කර ගෙන මෙම ණය ලබාදී ඇත. ප්‍රායෝගිකව අපගේ ඉක්මන් සහාය පෙන්නුම් කරමින්, සුළි කුණාටුවෙන් බලපෑමට ලක් වූ MSME ආයතනයකට පළමු පුනරුත්ථාපන ණය ලබා දීමට හැකිවීම පිළිබඳව අපි සතුටු වෙමු.

සුළි කුණාටුවෙන් බලපෑමට ලක් වූ ණය ගැතියන්ට, නියාමන මාර්ගෝපදේශයන්ට අනුකූලව, මූල්‍ය සහන ලබා දීමටද අපි කටයුතු කළෙමු. මෙම පියවරයන් ක්ෂණික මූල්‍ය ආතතිය සමනය කිරීම සඳහා නිර්මාණය කර ඇති අතර, සුදුසුකම් ලත් ණය ගැතියන් සඳහා ණය මූලික සහ පොලී ආපසු ගෙවීම් තාවකාලිකව අත්හිටුවීම, දඩ මුදල් අයකිරීම්, ප්‍රමාද ගාස්තු සහ ප්‍රතිව්‍යුහගත කිරීමේ වියදම් අත්හැරීම මෙන්ම, ආපදාවෙන් ආදායම් අහිමි වූ පුද්ගලයින් සහ ව්‍යාපාර සඳහා සහන කාල සීමාවන් සහිත නව ණය පහසුකම් සඳහා පහසුකම් සැලසීම ද ඇතුළත් විය. හදිසි සහන සහ පුනරුත්ථාපනය සඳහා මහජන සහ ඩයස්පෝරා පරිත්‍යාග එකතු කිරීම සහ යොමු කිරීම සඳහා අපි විශේෂ ගිණුම් ද ස්ථාපිත කළ අතර, එමඟින් පුළුල් ජාතික සහන කටයුතු සඳහා සහාය ලබා දුනිමු.

මහජන සුභසාධනය සහ වාණිජ තිරසාරභාවය යන දෙක පිළිබඳවම අප අබණ්ඩව ලබා දෙන විශ්වාසය, මහජන බැංකුවේ සෑම තීරණයක්ම මෙහෙයවන විනයගරුක සහ දූරදර්ශී ප්‍රවේශයට සාක්ෂියකි.

අපගේ සේවක පිරිස

අප සතු ශ්‍රේෂ්ඨතම වත්කම අපගේ සේවක පිරිසයි. අපගේ සාර්ථකත්වයේ සෑම අංශයක්ම මෙහෙයවනු ලබන්නේ, කැපවූ, වෘත්තීයමය සහ පාරිභෝගික කේන්ද්‍රීය ශ්‍රම බලකායක් වශයෙන් විශිෂ්ටත්වය වෙනුවෙන් ඔවුන් සිදුකරන කැපවීම මගිනි. ඔවුන් සතු පුළුල් ප්‍රාදේශීය දැනුම සහ නොසැලෙන සේවා ආචාර ධර්ම නාගරික සහ ග්‍රාමීය ප්‍රජාවන් හරහා මූල්‍ය විසඳුම් විශ්වාසදායක ලෙස ලබා දීම සහතික කරන අතර, ඔවුන්ගේ කඩිසරකම සහ නවෝත්පාදනය සඳහා ඇති රුචිය නිසා ඩිජිටල් භාවිතය සහ ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම් වේගවත්වී ඇත.

අභියෝගාත්මක වෙළඳපල තත්ත්වයන් යටතේ පවා, අවදානම් පිළිබඳ විනයගරුක දැනුවත්භාවය, ශක්තිමත් අනුකූලතා සංස්කෘතිය සහ අඛණ්ඩ කුසලතා ඉහළ නැංවීම තුළ, අපගේ කාර්ය මණ්ඩලය විශ්වාසය සහ අභියෝග ජයගැනීමේ ශක්‍යතාව සාක්ෂාත් කර තිබේ. ඔවුන්ගේ ප්‍රජා කේන්ද්‍රීය ප්‍රවේශයන්සහ සංවේදී පාරිභෝගික සම්බන්ධතාවය බැංකුවේ සමාජීය බලපෑම තවදුරටත් වැඩි කළ අතර, ඔවුන් ඵලදායී බැංකුකරුවන් පමණක් නොව ශ්‍රී ලංකාවේ සංවර්ධන ගමනේ විශ්වාසදායක හවුල්කරුවන් බවටද පත් ව ඇත.

පාරිසරික, සමාජීය හා පාලන (ESG) ක්ෂේත්‍රයන් පිළිබඳ අපගේ අවධානය

මහජන බැංකුවේ ESG (පරිසර, සමාජ සහ පාලන) අවධානය සහ තිරසාර උපායමාර්ගය; වගකීම් සහගත බැංකුකරණය, පාරිසරික කළමනාකරණය සහ අන්තර්ග්‍රහණය වූ ආර්ථික සංවර්ධනය යන මූලධර්ම මත පදනම් වී ඇත. බැංකුව ESG මූලධර්ම තම මූලික ව්‍යාපාර මෙහෙයුම්වලට ඒකාබද්ධ කරමින්, මූල්‍ය වර්ධනය දිගුකාලීන පාරිසරික හා සමාජ වගකීම් සමඟ සමගාමීව පවත්වාගෙන යන බවට සහතික වෙයි. මූල්‍ය ආයතනයක් ලෙස, අපි හරිත මූල්‍යකරණය ප්‍රවර්ධනය කරමින්, පාරිසරික හා සමාජ අවදානම් තක්සේරු කිරීම ණය ක්‍රියාදාමයන් තුළට ඇතුළත් කළෙමු. එමෙන්ම, ප්‍රජා සංවර්ධනය හරහා මූල්‍ය ඇතුළත් කිරීම වැඩි දියුණු කර, වගකිවයුතු පිළිවෙත් සහ ඩිජිටල්කරණය මඟින් බැංකුවේ මෙහෙයුම් පියසටහන අඩු කළෙමු.

ඉදිරි වසර තුළ තිරසාරභාවය බැංකුවේ උපායමාර්ගික ප්‍රමුඛතාවයක් ලෙස පවතිනු ඇති අතර, ESG සලකා බැලීම් මූලික ව්‍යාපාර මෙහෙයුම් තුළට තවදුරටත් ඇතුළත් කෙරනු ඇත. මේ වන විට, ණය කළඹ තුළ සංක්‍රාන්ති සහ භෞතික අවදානම් දෙකම කාර්යක්ෂමව කළමනාකරණය කිරීම සඳහා දේශගුණික අවදානම් රාමුව තවදුරටත් ශක්තිමත් කරමින් පවතී. ඒ සමඟම, වැඩිදියුණු කරන ලද හරිත මූල්‍යකරණය හරහා ජාතික හා ගෝලීය දේශගුණික ඉලක්කවලට අනුකූල වන ලෙස ණය ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග පෙළගස්වමින් ඇත.



අභියෝග ජයගැනීම

2025 වර්ෂය තුළ මහජන බැංකුව ක්‍රියාත්මක වූයේ සීමිත වර්ධනය, ණයගැණුම්කරුවන්ගේ ආපසු ගෙවීමේ ධාරිතාව මත ඇති වූ පීඩනය සහ නියාමන අපේක්ෂාවන් ඉහළ යාම වැනි කරුණු වලින් සමන්විත සංකීර්ණ වූ හා නොකඩවා වෙනස් වන ආර්ථික පරිසරයක් යටතේය. මෙම අභියෝගාත්මක සාර්ව ආර්ථික තත්ත්වයන් හේතුවෙන් ඇතැම් ණය ගැතියන් අංශවල පීඩනය වැඩිවී, වත්කම් ගුණාත්මකභාවයට ඇති විය හැකි අවදානම් ඉහළ ගියේය. එයට ප්‍රතිචාර වශයෙන්, අපි ණය නිරීක්ෂණ ක්‍රම ශක්තිමත් කර, ණය ආපසු ලබා ගැනීමේ කටයුතු වේගවත් කර, ප්‍රතිපාදන සංචිත වැඩි කරමින් නව ණය ලබාදීමේදී විචක්ෂණශීලී ප්‍රමිතීන් අනුගමනය කළෙමු.

නියාමන අධීක්ෂණය දැඩි වීමත් සමඟ, බැංකුවේ පාලන සහ අනුකූලතා රාමු අබණ්ඩව ශක්තිමත් කිරීමට පියවර ගැනිණි. ඒ අනුව, නියාමන ප්‍රමිතීන්ට පූර්ණ අනුකූලත්වය සහතික කිරීම සඳහා බැංකුව අභ්‍යන්තර පාලන, අවදානම් පාලන ව්‍යුහ සහ අනුකූලතා අධීක්ෂණ පද්ධති තවදුරටත් ශක්තිමත් කළේය. අවදානම් මත බර තැබූ වත්කම්වල වර්ධනය හමුවේ ශක්තිමත් නියාමන අවරෝධක පවත්වා ගැනීම සඳහා ප්‍රවේශම් සහගත ප්‍රාග්ධන කළමනාකරණය අවශ්‍ය වූ බැවින්, බැංකුව විසින් කාර්යක්ෂම ලෙස ශේෂ පත්‍රය කළමනාකරණය කරමින්, ප්‍රශස්ත වත්කම් වෙන් කිරීම් සිදු කරමින්, ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය සතුටුදායක මට්ටමක පවත්වා ගැනීම සඳහා විනයගරුක ණය වර්ධනයක් අනුගමනය කරන ලදී.

පොලී අනුපාත උච්චාවචනයන් සහ තරඟකාරී වෙළඳපොළ ගතිකත්වයන් ශුද්ධ පොලී ආන්තික මත පීඩනයක් ඇති කළේය. එයට ප්‍රතිචාර වශයෙන්, බැංකුව වත්කම්-වගකීම් කළමනාකරණ පිළිවෙත් වැඩිදියුණු කර, ආදායම් මූලාශ්‍ර විවිධාංගීකරණය කර, ණය සහ තැන්පතු කළඹ හරහා මිලකරණ විනය ශක්තිමත් කළේය. ඉහළ යන මෙහෙයුම් පිරිවැය පාලනය කිරීම සහ පිරිවැය-ආදායම් අනුපාතය සාර්ථකව පාලනය කිරීම සඳහා පිරිවැය තාර්කිකකරණ ප්‍රවේශයන් ක්‍රියාත්මක කළේය.

2026 සහ ඉන් ඔබ්බට අපගේ වර්ධන ඉලක්ක

අපගේ ඉදිරි ක්‍රියාකාරකම් ලෙස, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්, ග්‍රාමීය ප්‍රජාවන්, කාන්තා ව්‍යවසායකයින් සහ අනෙකුත් අඩු සේවා ලාභී කණ්ඩායම් සඳහා මූල්‍ය ප්‍රවේශය පුළුල් කිරීම, ධාරිතා වර්ධනය සමඟ ණය දීම සහ ඩිජිටල් පරිවර්තනය, සමාජ තිරසාරභාවය සහ පාරිභෝගික සේවා විශිෂ්ටත්වය ඒකාබද්ධ කිරීම අපි නොකඩවා කරගෙන යන්නෙමු.ප්‍රවේශ්‍යතාව සහ ප්‍රතිචාරශීලීභාවය තහවුරු කරමින්, ප්‍රජා ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම සහ දීරඝකාලීන ආර්ථික වර්ධනයට දායක වීම සඳහා, මෙම ප්‍රවේශයන්පැහැදිලි සමාජ හා පාරිසරික ප්‍රමිතීන් අනුව ඇගයීමට බඳුන් කෙරෙනු ඇත.

මගේ කෘතඥතාව

මම මෙහිදී මුලින්ම අපගේ ගනුදෙනුකරුවන්වෙත මගේ හෘදයාංගම කෘතඥතාව පළ කරමි. ඔබගේ විශ්වාසය සහ විශ්වාසනීයත්වය අපගේ සේවා විශිෂ්ටත්වය සහ නවෝත්පාදනය අඛණ්ඩව ඉහළ නැංවීමට ඔවුන් දායක වූ අතර, අප හා එක්ව, අපි මූල්‍ය අන්තර්කරණය පුළුල් කර, සේවා විශ්වසනීයත්වය තවදුරටත් ශක්තිමත් කර, ජාතිය පුරා ප්‍රවේශය වැඩි කරන ඩිජිටල් ප්‍රවේශයන් වේගවත් කළෙමු. එමඟින් ශ්‍රී ලංකාව සංවර්ධනය කරා යන ගමනේ විශ්වාසදායක හවුල්කරුවෙකු ලෙස අපගේ භූමිකාව තවදුරටත් ශක්තිමත් කළෙමු.


මුදල් අමාත්‍යවරයා, මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යවරයා සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යවරයා ලබාදුන් දූරදර්ශී මගපෙන්වීම, නායකත්වය සහ ඔවුන්ගේ නොසැලෙන කැපවීම වෙනුවෙන් ඔවුන් වෙත මගේ කෘතඥතාව පළ කරමි.

වසර පුරා අපට ලබාදුන් අඛණ්ඩ සහයෝගය, මහඟු උපදෙස් සහ කැපවීම වෙනුවෙන් භාණ්ඩාගාර ලේකම්වරයා සහ මුදල් අමාත්‍යංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට මගේ අවංක කෘතඥතාව පළ කරමි. නියාමන කටයුතු සම්බන්ධයෙන් ලබා දුන් විචක්ෂණශීලී උපදෙස් සහ වටිනා මඟපෙන්වීම වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට ද මම හද පිරි ස්තූතිය පුදු කරමි.

එසේම අධ්‍යක්ෂ මණ්ඩලය ලබා දුන් අතිරේක සහයෝගය සහ විශිෂ්ට නායකත්වය වෙනුවෙන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට මගේ හෘදයාංගම කෘතඥතාව පළ කරමි. 2025 වර්ෂයේ දී අපගේ සාර්ථකත්වයට දායක වූ ජවය පවත්වා ගැනීම සඳහා බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරීවරයා වන ක්ලයිව් ෆොන්සේකා මහතා සහ ඔහුගේ මෙහෙයවීම මත කළමනාකරණ කණ්ඩායම දැරූ නොපසුබට උත්සාහය වෙනුවෙන් මම අවංකවම ස්තූතිවන්ත වෙමි.

අපගේ ජයග්‍රහණ පිටුපස ප්‍රධාන බලවේගය වූ වෘත්තීයභාවය සහ පාරිභෝගිකයා ප්‍රමුඛ කරගත් ආකල්පය වෙනුවෙන් ඇපකැපවූ මහජන බැංකුවේ සෑම සේවකයෙකුටම ද එකමුතුකමින් සවිමත් සේවා ස්ථානයක් පෝෂණය කිරීම සඳහා බැංකුවේ උත්සාහයන්ට අත්වැලක් වෙමින් ලබාදුන් අඛණ්ඩ සහයෝගීතාවය සහ ඵලදායී සංවාදය වෙනුවෙන් වෘත්තීය සමිතිවලටද මම මගේ අවංක කෘතඥතාව පළ කරමි.

අපගේ වර්ධනයේ සහ පරිවර්තනයේ මීළඟ අදියර කරා අප පියනගන්නේ, දැඩි විනයක් මෙන්ම සියලුම පාර්ශ්වකරුවන් වෙනුවෙන් උපරිම වටිනාකමක් අත්පත් කර දීමේ නොසැලෙන කැපවීමක් ද සහිතවය. තාක්ෂණය, මානව සම්පත සහ තිරසාර මූල්‍යකරණය වෙනුවෙන් අඛණ්ඩව ආයෝජනය කරන මහජන බැංකුව, සියලු දෙනා ඇතුළත් කරගත් ආර්ථික ප්‍රගතියක් උදෙසා පෙරමුණ ගනු ඇත. එමෙන්ම, "ජාතියේ අභිමානය" ලෙස ඩිජිටල් තාක්ෂණයෙන් සවිමත් වෙවින්, අභියෝග ජයගැනීමේ හැකියාවෙන් යුත් ශ්‍රී ලංකාවක් ගොඩනැගීමට අපි කැපවී සිටිමු.



මහාචාර්ය නාරද ප්‍රනාන්දු
සභාපති
2026 පෙබරවාරි 25



ප්‍රධාන විධායක නිලධාරීතුමා/ සාමාන්‍යාධිකාරීතුමාගේ සමාලෝචනය

ඒකාබද්ධ හා ඉදිරි දැක්මක් සහිත උපායමාර්ග හරහා, උද්ධමන පීඩන කළමනාකරණය කරමින්, අපි අපගේ ප්‍රාග්ධනය, මුල්‍ය තත්ත්වය සහ ද්‍රවශීලතාව සවිමත් කළෙමු. අපගේ විනයගරුක ප්‍රාග්ධන වෙන් කිරීම්, ව්‍යාපාර අංශ හරහා ප්‍රශස්තකරණය, සහ ශක්තිමත් සංචිත නිසා, ආර්ථික සහ දේශගුණික ව්‍යසන වලදී ඉහළ ස්ථාවරත්වයක් රැකගැනීමට අපට හැකිවිය.



"ජාතියේ අභිමානය" යන විරුදාවලිය දරමින් මව්බිමට සේවා සපයන මහජන බැංකුව මහජන වගකීම සහ වාණිජ ශක්තිය අතර සූක්ෂම සමතුලිතතාවයක් පවත්වා ගනිමින්ද අභියෝගයන්ට මුහුණ දීමේ හැකියාව සහ පැහැදිලි අරමුණ අඛණ්ඩව මූර්තිමත් කරමින්ද මේ සනිටුහන් කරන්නේ අපගේ මහජන සේවයේ 64 වන වසරයි. බැංකුව සිය ඉතිහාසයේ ඉහළම බදු පසු ලාභය වන රුපියල් බිලියන 40.2ක් වාර්තා කරමින් සමස්ත වත්කම් රුපියල් ට්‍රිලියන 3.7ක් දක්වා ළඟා කරගැනීමට සමත් විය. 2025 වසර දෙස ආපසු හැරී බැලීමේදී මා එය දකින්නේ නවෝත්පාදනයේ වසරක් ලෙසය.

අප සතු විශිෂ්ට කළමනාකාරිත්වය සහ සැලසුම්ගත ක්‍රියාකාරිත්වය පිළිබඳව මෙම කාර්ය සාධන වාර්තාව සාක්ෂි දරයි. ශක්තිමත් ප්‍රාග්ධන පදනමක් පවත්වාගෙන යමින් පිරිවැය කළමනාකරණ මනාව සිදුකළ අපිට නියාමන සීමාවන් ඉක්මවූ ද්‍රවශීලතාවයක් පවත්වා ගැනීමට පහසුවෙන්ම හැකිවිය. අප සතු ශක්තිමත් පාලන පද්ධතිය සහ තිරසාරභාවය හා වර්ධනයට කැපවූ වගකීමෙන් යුතු මඟපෙන්වීමත් නිසා තැන්පත්කරුවන්ගේ විශ්වාසය රැකගනිමින්, ශ්‍රී ලංකාවේ විශ්වාසදායකම මූල්‍ය ආයතන අතර අප සිටින ස්ථානය යලි යලිත් තහවුරු කිරීමට අපට හැකිවිය.

අප ගමන්ගන්නේ චක්‍රාකාරව හමුවන අභියෝග සහ අවස්ථා මඟින් ද මහජන විශ්වාසය රැකගැනීමේ වගකීමේන් ද, ඩිජිටල් නවෝත්පාදනය සහ ඇතුළත් මූල්‍යකරණය හරහා ප්‍රවේශය පුළුල් කිරීමට ඇති අපගේ අභිලාෂයෙන්ද හැඩගැන්වුණු දුෂ්කර වුවත් උද්‍යෝගයෙන් පිරි මාවතකය. ආර්ථික පීඩා සහ දේශගුණික අස්ථාවරතා වලදී වටිනාකම් ජනනය කර, ප්‍රජාවන්ට අත දී සමෘද්ධිය ළඟාකර දීමට අප අපගේ අරමුණ සහ අභියෝග ජයගැනීමේ හැකියාව උපයෝගීකරගතිමු. එසේම ජාතික ප්‍රමුඛතා ඉදිරියට ගෙන යාම, භෞතික හා ඩිජිටල් ප්‍රවේශය හරහා මූල්‍ය සේවා සඳහා ඇතුළත් කිරීම පුළුල් කිරීම සහ තිරසාර ජීවනෝපායන් ගොඩනැගීම සඳහා කාන්තා ව්‍යවසායකයින්ට සහාය ලබාදීම සඳහා දිගින් දිගටම ශ්‍රී ලංකා රජය සමඟ අපි කටයුතු කළෙමු.

මූලික දැක්ම

සෑම දෙනා වෙතම මූල්‍ය ප්‍රවේශය පුළුල් කරමින් තිරසාර ආර්ථික වර්ධනයක් ඉදිරියට ගෙන යන, අභියෝග ජයගැනීමේ මේ හැකියාව ඇති, වගකීම් සහගත සහ ජාතික වශයෙන් කැපවූ මූල්‍ය ආයතනයක් බවට පත් වීමේ පැහැදිලි සහ ස්ථාවර දැක්මක් අපට තිබේ. මෙම අභිලාෂය ඉටු කර ගැනීම සඳහා ඩිජිටල් පරිවර්තනය ප්‍රධාන සක්‍රීයකාරකයක් ලෙස අඛණ්ඩ කාර්යභාරයක් ඉටු කරන අතර, රටේ සෑම අස්සක් මුල්ලක් නෑරම ළඟා වන බහු - නාලිකා පැවැත්ම එය තවදුරටත් ශක්තිමත් කරයි. පරිවර්තනයකට බඳුන් වෙමින් පවතින භෝලීය හා දේශීය පසුබිමක, ආර්ථික ප්‍රතිසාධනය සහ සංවර්ධනය සඳහා අර්ථවත් දායකත්වයක් ලබා දෙන අතරම මූල්‍ය ස්ථාවරත්වය ආරක්ෂා කර ගැනීම කෙරෙහි අපගේ අඛණ්ඩව අවධානය යොමුව තිබේ. බුද්ධිමත් අවදානම් කළමනාකරණය, විනයගරුක මූල්‍ය කළමනාකරණය සහ සමානුපාතික වර්ධනය මඟින්, අපි අවිනිශ්චිතතාව විශ්වාසයෙන් ජයගෙන දිගුකාලීන තිරසාරභාවය ආරක්ෂා කරගතිමු.



මාර්ගෝපදේශක මූලධර්ම

සමාලෝචිත වසර තුළ අපගේ ක්‍රියාවන් මෙහෙයවන ලද්දේ, විචක්ෂණභාවය, වගවීම, අභියෝගවලට මුහුණදීමේ හැකියාව සහ ජාතික වගකීම පිළිබඳ ගැඹුරු හැඟීම යන කරුණු පදනම්කරගෙනය. විනයගරුක සහ අනාගතය ඉලක්ක කරගත් අවදානම් කළමනාකරණ රාමුවකින් සවිමත් වූ අපගේ ප්‍රවේශයේ මූලික අරමුණ වූයේ ප්‍රාග්ධනය සුරක්ෂිත කිරීම සහ ද්‍රවශීලතාව තහවුරුකිරීමයි. විනිවිදභාවය සහ වගවීම මත පදනම් වූ පාලන ප්‍රතිපත්ති, පාර්ශ්වකරුවන් වෙත දැක්වූ දැඩි හිතිගරුකභාවය සහ විවෘත සම්බන්ධතාවය මගින් තවත් ශක්තිමත් විය. ජාතික මෙන්ම ගෝලීය වශයෙන් වූ අභියෝග සඳහා දූරදර්ශී ක්ෂණික ප්‍රතිචාර දැක්වීමට ආයතනික උරුමයේ ශක්තිය උකහාගනිමින් නවීන ශක්‍යතා සමග අත්වැල් බැඳගත් අපට හැකිවිය. ජාතික සංවර්ධනයට කැපවෙමින්, දිශානතිය හැඩගස්වාගත් ප්‍රමුඛ රාජ්‍ය බැංකුවක් වශයෙන් වාණිජ විනය සමඟ සමතුලිතව කටයුතු කරමින්, තිරසාර ප්‍රතිඵල ලබා ගැනීමට අපට හැකිවිය.

ප්‍රධාන ජයග්‍රහණ

වසර තුළ අප පුළුල් පරාසයක් ආවරණය වන පරිදි ලබාගත් වැදගත් ජයග්‍රහණ පිළිබඳ සවිස්තරාත්මක විශ්ලේෂණය ඉදිරි පිටුවල ඉදිරිපත් කර ඇත. ඒ අතරින් සුවිශේෂී සන්ධිස්ථාන කිහිපයක් මෙහිදී කෙටියෙන් අවධාරණය කිරීමට කැමැත්තෙමි.

අවදානම් මත බර තැබූ වත්කම්වල වැඩිවීමක් සහ ඩිජිටල් පරිවර්තනයේ අඛණ්ඩ ආයෝජන තිබියදීත්, ස්ථාවර හා සතුටුදායක ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතයක් අපට පවත්වා ගත හැකිවිය. අපගේ විනයගරුක ණය වර්ධනය සහ විචක්ෂණශීලී මූල්‍ය කළමනාකරණය මින් පිළිබිඹුවේ. ශක්තිමත් කරන ලද ණය අධීක්ෂණය, පූර්ව සූදානම් ප්‍රතිසාධන ක්‍රියාමාර්ග සහ වැඩිදියුණු කළ ප්‍රතිරක්ෂණ භාවිතයන් ණය අවදානම කළමනාකරණය කිරීමේදී අභියෝගවලට මුහුණදීමේ හැකියාව සහතික කළ අතර, වත්කම් ගුණාත්මක දර්ශකවල ස්ථාවරත්වය මගින් අපගේ පාලන රාමුවේ ශක්තිය තවදුරටත් තහවුරු විය.

ඩිජිටල් වේදිකා සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සඳහා අප සිදුකළ අඛණ්ඩ ආයෝජනය, ආයතනික ශක්තිය තවදුරටත් ශක්තිමත් කළ අතර ව්‍යාපාර අඛණ්ඩතා අවශ්‍යතා (Business Continuity Needs) සහ දේශගුණික බාධාවන්ට අපගේ ක්ෂණික ප්‍රතිචාර තුළින් මෙය පැහැදිලි වේ. එම අවස්ථාවලදී, අපගේ ප්‍රතිසාධන හැකියාවන් පරීක්ෂාවට බඳුන්වූ අතර ඒවායේ සාර්ථක බව තහවුරු විය.

ගනුදෙනුකරු කේන්ද්‍රගත ව්‍යාපාරය

සවිමත් මූල්‍ය පදනමක් මත ගොඩනැගී, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් (SME), කෘෂිකර්මාන්තය, අපනයන සහ රාජ්‍ය අංශයේ සංවර්ධනය ඇතුළු ප්‍රමුඛතා අංශ සඳහා මූල්‍යකරණය සඳහා ඉලක්කගත මුලපිරීම් ඉදිරියට ගෙන ගිය මහජන බැංකුවේ අපි ශ්‍රී ලංකාව පුරා ශාඛා සහ සේවා අලෙවිසැල් 746ක ජාලයක් හරහා මිලියන 15.2කට අධික ගනුදෙනුකරුවන්ට සේවය කළෙමු. පුළුල් වන ඩිජිටල් ශක්‍යතා සහ උපායමාර්ගික හවුල්කාරිත්වයන් මගින් මෙම ප්‍රවේශය සපුරාලමින්, අපගේ ගනුදෙනුකරුවන්ගේ විවිධ අවශ්‍යතා සපුරාලන සම්පූර්ණ මූල්‍ය සේවා සපයන්නෙකු බවට අපි පරිණාමය වෙමින් සිටිමු.

වේගයෙන් වර්ධනය වන ඩිජිටල් පරිසර පද්ධතියකින් සවිමත්ව ඇති මෙම විස්තීරණ පැවැත්ම පිළිබිඹු කරන්නේ ජාතිය පුරා මූල්‍ය ප්‍රවේශය සවිමත් කිරීමට අප දරන උත්සාහයේ සාර්ථකත්වයයි. පහසු කොන්දේසි යටතේ අප ලබාදුන් ණය නිසා ජීවනෝපායන් පවත්වා ගනිමින්, රැකියා ආරක්ෂා කර, ප්‍රජා ස්ථිරත්වය ශක්තිමත් විය. ඩිජිටල් බැංකුකරණයේ ව්‍යාප්තිය මගින් පහසුකම් සහ ප්‍රවේශය වැඩිදියුණු කරද්දී ස්වයංක්‍රීයකරණය මගින් අභ්‍යන්තර පාලන ශක්තිමත් කරමින්, අවදානම් අධීක්ෂණය වැඩිදියුණු කර, උසස් සේවා සැපයීමක් සිදු කළේය.

උපදේශන සහ ධාරිතා ගොඩනැගීමේ සහාය සමඟ ගැලපෙන මූල්‍යකරණය ඒකාබද්ධ කරමින් ජාතික කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර (SME) න්‍යාය පත්‍රය ඉදිරියට ගෙනගිය අපි ව්‍යාපාරවල අභියෝග ජයගැනීමේ හැකියාව සහ මූල්‍ය ශක්‍යතා වඩාත් ශක්තිමත් කළෙමු. අපගේ සර්ව නාලිකා ප්‍රවේශය නාගරික, ග්‍රාමීය සහ අර්ධ නාගරික ප්‍රජාවන් සඳහා බාධාවකින් තොරව සේවා සැපයීම සහතික කළේය.

දිට්වා සුළි කුණාටුවෙන් පීඩිත ප්‍රජාවන්ට තීරණාත්මක ද්‍රවශීලතා සහාය ලබාදීමට කටයුතු කළ අපි, නම්‍යශීලී ආපසු ගෙවීමේ විධිවිධාන සහ ප්‍රතිව්‍යුහගත කිරීමේ පියවරයන් හරහා ඔවුන් යථා තත්ත්වයට පත්කිරීමට කටයුතු කළෙමු.

සාර්ව ආර්ථික අභියෝග ජය ගැනීම

ඒකාබද්ධ හා ඉදිරි දැක්මක් සහිත උපායමාර්ග හරහා, උද්ධමන පීඩන කළමනාකරණය කරමින්, අපි අපගේ ප්‍රාග්ධනය, මූල්‍ය තත්ත්වය සහ ද්‍රවශීලතාව සවිමත් කළ අතර අපගේ විනයගරුක ප්‍රාග්ධන වෙන් කිරීම්, ව්‍යාපාර අංශ හරහා ප්‍රශස්තකරණය, සහ ශක්තිමත් සංචිත නිසා, ආර්ථික සහ දේශගුණික ව්‍යසන වලදී ඉහළ ස්ථාවරත්වයක් රැකගැනීමට අපට හැකිවිය.

අපගේ තැන්පතු පදනම විවිධාංගීකරණය කළ අපි ද්‍රවශීලතා සංචිත ශක්තිමත්ව පවත්වාගනිමින් මුදල් ප්‍රවාහ සක්‍රීය අධීක්ෂණය සහතික කළෙමු. සකස්කළ මිලකරණය (Calibrated repricing), අවදානම් පාදක ණය අනුමතකිරීමේ ක්‍රියාවලිය සහ ඉලක්කගත කාර්යක්ෂමතා පියවර මඟින්, ගනුදෙනුකරුට දැරිය හැකි මට්ටමක් පවත්වා ගනිමින් උද්ධමන පීඩන කළමනාකරණය කළෙමු.

පාලනය, අවදානම් කළමනාකරණය, විගණනය සහ සහතික කිරීම අපගේ මූලික ස්ථරයන් වේ. අප විසින් අඛණ්ඩව පවත්වාගෙන යන ලද විනිවිදභාවයෙන් යුතු හෙළිදරව් කිරීම්වලින් සහාය ලබන අවංක වගවීමේ සංස්කෘතිය මගින් ඉහළම ප්‍රමිතීන්වලට අපගේ අනුකූලත්වය සහතික වූ අතර පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය සවිමත් විය.

විචක්ෂණශීලී අක්‍රිය ණය පාලනය

2024 වර්ෂයේදී වාර්තා කල වූ 5.1% සමඟ සංසන්දනය කරන විට අක්‍රිය ණය අනුපාතය මූල්‍ය වර්ෂය අවසානය වන විට 4.3% දක්වා වැඩි දියුණු වීමක් පෙන්නුම්කරයි. ව්‍යුහගත සහ සක්‍රීය ප්‍රවේශයක් හරහා, නොපමාව සිදුකළ මැදිහත්වීම්, ප්‍රතිව්‍යුහගත කිරීම සහ සහනදායක සහාය ඒකාබද්ධ කළ අපි ආපදා බලපෑමට ලක් වූ ණය කළඹ ඇතුළුව අක්‍රීය ණය සාර්ථකව පාලනය කළෙමු.

වැඩිදියුණු කළ ණය අධීක්ෂණය නිසා අවදානම් කල්තියා හඳුනා ගැනීමටත්, ණය ගැණුම්කරුවන් සමඟ ක්‍රියාශීලී සම්බන්ධතාවයක් ඇති කර ගැනීමටත් හැකි විය. ශක්තිමත් ප්‍රාග්ධන සහ වෙන්කිරීමේ සංචිත වල සහය ලබාගත් අපට ප්‍රතිසාධනය හරහා ගනුදෙනුකරුවන්ට අඛණ්ඩව සහායක් ලබාදෙන අතරම වත්කම්වල ගුණාත්මකභාවය රැකගැනීමටද හැකිවිය.

අපගේ කණ්ඩායම

පාරිභෝගික කේන්ද්‍රීය කැපවීමෙන් කටයුතු කරන අපගේ කණ්ඩායම අප අත්කරගත් සාර්ථකත්වය පිටුපස සිටින ප්‍රධාන ශක්තිය වන අතර, බැංකුවේ කාර්ය සාධනය හැඩගැසෙන්නේ ඔවුන්ගේ වෘත්තීයභාවය සහ ස්ථාවරත්වය අනුව වේ.

අඛණ්ඩ අධ්‍යන කටයුතු, විශේෂඥ පුහුණුව සහ ව්‍යුහගත ධාරිතා සංවර්ධනය අපගේ ආයතන සංස්කෘතියේ අනිවාර්ය අංගයකි. මෙම කැපවීම ආයතනික කාර්යක්ෂමතාව පෝෂණය කර ඇති අතර, තාක්ෂණික ශක්‍යතා සහිත සහ අපගේ සමාජ අරමුණට ගැලපෙන ශක්තිමත් ශ්‍රම බලකායක් නිර්මාණය කර ඇත.

පරිසරය සඳහා බලපෑම අඩුකිරීම සඳහා තිරසාරභාවය

ස්වභාවික ප්‍රාග්ධන සලකා බැලීම් අපගේ මෙහෙයුම් සහ ප්‍රජා මුලපිරීම් තුළට වඩාත් ගැඹුරින් ඇතුළත් කිරීම ඔස්සේ පාරිසරික කළමනාකාරිත්වය සඳහා අපගේ කැපවීම අපි යලි යලිත් තහවුරු කර තිබේ. The People's Green Pulse මුලපිරීම අපගේ පාරිසරික බලපෑම අඩු කිරීම සහ සම්පත් සංරක්ෂණය කිරීම සඳහා අර්ථවත් පියවරක් සනිටුහන් කර ඇත.

හරිත මූල්‍යකරණය පුනර්ජනනීය බලශක්තියට සහාය වූ අතර ප්‍රජා මුලපිරීම් දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව සහ සමාජ යහපැවැත්ම ශක්තිමත් කළේය. ඩිජිටල් පරිවර්තනය සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව තිරසාරභාවය පෙළගැස්වීම අප සිදුකරන ප්‍රයත්නය ශ්‍රී ලංකාවේ "2050 කාබන් ශූන්‍ය ඉලක්කය කරා වූ මාර්ග සිතියම" සඳහා දායකත්වය ලබා දෙයි.

අඛණ්ඩව ඉදිරියේදීත්, අපි පුනර්ජනනීය බලශක්තියට සහාය වීම, ඩිජිටල් පරිවර්තනය ඉදිරියට ගෙන යාම සහ ජාතික දේශගුණික ප්‍රමුඛතා සමඟ සමීපව පෙළගැසීමට අපි කටයුතු කරමු.

සේවා සැපයීම, පාලනය, නවෝත්පාදනය සහ තිරසාරභාවය යන අංශ හරහා විශිෂ්ටත්වය පිළිබිඹු කළ මහජන බැංකුව, ජාතික හා ජාත්‍යන්තර සම්මානයට පාත්‍ර වෙමින් අඛණ්ඩ පිළිගැනීමට ලක් විය. සුරක්ෂිත සහ ප්‍රවේශයට පහසු බැංකුකරණයක් සහතික කරන අතරම මූල්‍ය ශක්තිය ලබා දීම සඳහා වන අපගේ කැපවීම අපි ස්ථාවරව පවත්වාගනිමු. වාණිජ කාර්ය සාධනය, ජාතික වගකීම සමඟ සමතුලිත කර ගනිමින්, තිරසාර වර්ධනයක් ගොඩනැගීමේදී ප්‍රමුඛතා අංශවලට සහාය ලබාදීම අපි නොකඩවා සිදු කරමු.

තුති පිදීම

මනා වූ අනුවර්තනය වීමේ සහ විශිෂ්ටත්වයට පත්වීමේ හැකියාවකින් පිරිපුන් අපගේ කණ්ඩායම අත්පත් කරගත් ජයග්‍රහණ තුලින් පිළිබිඹුකරන්නේ අපගේ කණ්ඩායමේ කැපවීම සහ බැඳීමයි. ඔවුන්ගේ උත්සාහයන් වල ප්‍රථිපලයක් ලෙස බැංකුවට තරඟකාරී පරිසරයක් තුළ ශක්තිමත්ව කටයුතු කිරීමට හැකිවූ අතර අවසානයේදී සෞඛ්‍ය සේවා, අධ්‍යාපනය, යටිතල පහසුකම් සහ මහජන සුභසාධනය සඳහා ලාභ නැවත ආයෝජනය කරමින් ජාතික සංවර්ධනයට දායක වීමට හැකිව විය.

අපගේ සභාපතිතුමා, අධ්‍යක්ෂ මණ්ඩලය, භාණ්ඩාගාර ලේකම් සහ මුදල් අමාත්‍යාංශයේ නිලධාරීන්, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිතුමා සහ නිලධාරීන්, ආයතනික සහ විධායක කළමනාකරණ මඬුල්ල, අපගේ කාර්ය මණ්ඩලය සහ දැඩි විශ්වාසයකින් සහ පක්ෂපාතිත්වයකින් යුතුව අපව නොකඩවා දිරිමත් කරන අපට ඉතා වැදගත් අපගේ ගනුදෙනුකරුවන්ට මෙහිදී මම මගේ අවංක කෘතඥතාව පළ කරමි.

ශක්තිමත් ආයතනයක් ගොඩනැගීම සහ ශ්‍රී ලංකාවේ ප්‍රගතියට අර්ථවත් ලෙස දායක වීම යන අරමුණ දරමින් අපි ඉදිරියට යමු.



ක්ලයිව් ෆොන්සේකා
ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී
2026 පෙබරවාරි 25

අධ්‍යක්ෂ මණ්ඩලය

අසමසම කැපවීමකින් යුත් අපගේ අධ්‍යක්ෂ මණ්ඩලය







මහාචාර්ය නාරද ප්‍රනාන්දු මහතා
සභාපති

මහාචාර්ය පී එන් ඩී ප්‍රනාන්දු මහතා වසර 25 කට වැඩි කාලයක් පුරා මූල්‍ය, බැංකු සහ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයන්හි පැතිර ගිය පුළුල් වෘත්තීය පරිචයක් සහිත පළපුරුදු මූල්‍ය අධ්‍යයන ශාස්ත්‍රඥයෙකි. 2024 නොවැම්බර් මාසයේදී මහජන බැංකුවේ සභාපති ලෙස වැඩ භාරගත් ඔහු ගේ සම්ප්‍රාප්තියත් සමග, නායකත්වය, උපායමාර්ගික සැලසුම්කරණය සහ මූල්‍ය කළමනාකරණය පිළිබඳ අත්දැකීම් සම්භාරයක් බැංකුවට හිමි විය.

මධ්‍යම චීන විශ්වවිද්‍යාලයෙන් රජයේ ආර්ථික විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධියක් ලබා ඇති මහාචාර්ය ප්‍රනාන්දු, එහි සිය පර්යේෂණයේදී අවධානය යොමු කර ඇත්තේ නැගී එන ශ්‍රී ලංකා කොටස් වෙළඳපොළේ වෙළඳපල කාර්යක්ෂමතාව සහ තාක්ෂණික වෙළඳ උපාය මාර්ග කෙරෙහි ය. “Prestigious Colombo Plan” ශිෂ්‍යත්ව ක්‍රමය යටතේ ශිෂ්‍යත්වයක් ලබා බටහිර බෙංගාල තාක්ෂණ විශ්වවිද්‍යාලයෙන් MBA උපාධිය ලබා ගත් ඔහු කැලණිය විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර කළමනාකරණය (හිණුම්කරණය) පිළිබඳ සිය උපාධි අධ්‍යයනය සම්පූර්ණ කර ඇත.

අධ්‍යාපනඥයෙකු ලෙස මහාචාර්ය ප්‍රනාන්දු ශ්‍රී ලංකාවේ අධ්‍යයන ක්ෂේත්‍රයට සුවිශේෂී හා ප්‍රබල දායකත්වයක් ලබා දී ඇත. වසර 27කට අධික ඉගැන්වීමේ පළපුරුද්දකින් සමන්විත ඔහු, කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨයේ පීඨාධිපති ලෙසත්, මූල්‍ය දෙපාර්තමේන්තුවේ මහාචාර්යවරයෙකු ලෙසත් ඇතුළු ප්‍රමුඛ තනතුරු රැසක් දරා ඇත.

ඔහුගේ දක්ෂ නායකත්වය යටතේ, චිම පීඨය “World Bank AHEAD” ප්‍රදානය හිමිකර ගැනීම, MBA වැඩසටහන සඳහා, SO 21001 සහතිකය ලබා ගැනීම සහ මධ්‍ය ව්‍යාපාර පෙරවැඩුම් මධ්‍යස්ථාන (Central Business Incubator) වැනි නවෝත්පාදන වැඩසටහන් ආරම්භ කිරීම ඇතුළු වැදගත් සන්ධිස්ථාන රැසක් ළඟා කරගෙන ඇත.

මහාචාර්ය ප්‍රනාන්දු කොළඹ කොටස් හුවමාරුව සහ ශ්‍රී ලංකාවේ සුරැකුම්පත් හා විනිමය කොමිසම වැනි ජාතික මූල්‍ය ආයතන සඳහා උපදේශකයෙකු, ඇගයුම්කරුවෙකු සහ සම්පත් පුද්ගලයෙකු ලෙස ද වැදගත් කාර්යභාරයක් ඉටු කර ඇත. වෙළෙඳපල හැසිරීම සහ ආයෝජන උපාය මාර්ග කෙරෙහි අවධානය යොමු කරමින් කීර්තිමත් සඟරාවල පළ වන පර්යේෂණ ප්‍රකාශන රාශියකට ඔහුගේ දායකත්වය ලබා දී ඇත.



ජයන්ත තිලකරත්න මහතා
අධ්‍යක්ෂ

ජයන්ත තිලකරත්න මහතා ජාතික සහ බහුජාතික සංවිධානවල වසර 25කට අධික ජ්‍යෙෂ්ඨ කළමනාකරණ පළපුරුද්දක් සහිත, ඉතා කීර්තිමත් නීති හා මානව සම්පත් වෘත්තිකයෙකි. උපායමාර්ගික මානව සම්පත් කළමනාකරණය, නීති උපදේශන, වෙනස්වීම් කළමනාකරණය, ආයතනික සංස්කෘතික සංවර්ධනය සහ මූල්‍ය සැලසුම්කරණය යන ක්ෂේත්‍රයන්හි ඔහු ප්‍රවීණයෙකි.

කොළඹ විශ්වවිද්‍යාලයෙන් LLB සහ LLM උපාධි ලබා ඇති නීතිඥයෙකු වන තිලකරත්න මහතා, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙන් (SLIDA) රාජ්‍ය කළමනාකරණය (මානව සම්පත්) පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ද හිමි කරගෙන ඇත. තවද, ඔහු පිරිස් කළමනාකරණ ආයතනයේ (CIPM) වරලත් සාමාජිකයෙකු වන අතර රාජ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ද දරයි.

තිලකරත්න මහතා සිය කීර්තිමත් වෘත්තීය ජීවිතය තුළ ටාජ් හොටෙල්ස් හි මානව සම්පත් අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා ටෙලිකොම් හි ප්‍රධාන මානව සම්පත් නිලධාරී සහ මැලිබන් බිස්කට් නිෂ්පාදන ආයතනයේ සමූහ සාමාන්‍යාධිකාරී ඇතුළු පරිපාලන තනතුරු කිහිපයක්ම හොබවා ඇත. ඔහුගේ දූරදර්ශී නායකත්වය චිම ආයතනයන්ට “Grate Place to Work” සම්මානය හිමිකර ගැනීම සහ ප්‍රමුඛතම ආයතනයන් හි නව්‍ය මානව සම්පත් උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම වැනි ජයග්‍රහණ රැසක් ලබාගැනීමට උපකාරී වී ඇත.

ආයතනික අංශයේ අත්පත් කරගත් ජයග්‍රහණයන්ට අමතරව, තිලකරත්න මහතා ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ විශ්වවිද්‍යාලයන් වල බාහිර කථිකාචාර්යවරයකු ලෙස සේවය කරන අතර, CIPM හා ශ්‍රී ලංකා නීතිඥ සංගමය වැනි වෘත්තීය ආයතනයන් සමඟ ක්‍රියාකාරීව සම්බන්ධ වෙමින් ශාස්ත්‍රීය කටයුතු සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇත.



කේ ඒ විමලේන්තිරාජා මහතා
අධ්‍යක්ෂ

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියෙක් වශයෙන් රාජ්‍ය සේවයේ වසර 30කට වැඩි පළපුරුද්දක් ඇති කේ ඒ විමලේන්තිරාජා මහතා මේ වන විට වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් ලෙස සේවය කරයි. ඔහු නීතිඥවරයෙක් ද වේ.

විමලේන්තිරාජා මහතා යාපනය විශ්වවිද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ විශේෂ උපාධියක්, පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ දර්ශනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක්, මොරටුව විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් සහ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයෙන් නීති උපාධියක් ලබා ඇත. ඔහු සංවර්ධන අධ්‍යයන සහ රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක්, ජාත්‍යන්තර සබඳතා පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක්, මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාවක්, ඊ-රාජ්‍ය ඩිප්ලෝමාවක් සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා ඇත. ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයේ සෙයිඩ් ව්‍යාපාරික පාසල විසින් පවත්වන ඔක්ස්ෆර්ඩ් ෆින්ටෙක් වැඩසටහන, හාවඩ් කෙනඩි රජයේ පාසලේ වෙළඳ ප්‍රතිපත්තිය: විධායක අධ්‍යාපන වැඩසටහන සහ ඕස්ට්‍රේලියානු පරිගණක සංගමයේ තොරතුරු තාක්ෂණය පිළිබඳ සහතිකය ද ඔහු සම්පූර්ණ කර ඇත.

වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් ධුරයට පත්වීමට පෙර, ඔහු රාජ්‍ය සේවයේ විවිධ තනතුරු දරා ඇති අතර, වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්, මහා භාණ්ඩාගාරයේ මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්, පරිපාලන ප්‍රතිසංස්කරණ භාර ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රධාන තොරතුරු නිලධාරී, චීනයේ බීජිං හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ අමාත්‍ය උපදේශක යන තනතුරු ද ඔහු හොබවා ඇත.



චන්දන ගුණියන්ගොඩ මහතා

අධ්‍යක්ෂ

(ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂ – 2025 නොවැම්බර් සිට)

විමලේන්තිරාජා මහතා වර්තමානයේ මහපොළ භාරකාර ශිෂ්‍යත්ව භාර අරමුදලේ භාරකාර මණ්ඩලයේ සාමාජිකයෙකි.

ඔහු අපනයන සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු විය; ඩි ලා රූ ලංකා කරන්සි ඇන්ඩ් සිකියුරිටි ප්‍රින්ට් සමාගම (Messrs De La Rue Lanka Currency and Security Print Ltd), කොළඹ වරාය නගර ආර්ථික කොමිසමේ කොමසාරිස්, ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නිර්ක්ෂක. ලංකා බැංකුව, මහජන බැංකුව, ශ්‍රී ලංකා ටෙලිකොම් පීඑල්සී, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය, ලංකා බනිජ තෙල් සංස්ථාව සහ කොළඹ විශ්වවිද්‍යාලයේ මානව සම්පත් දියුණුව පිළිබඳ ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු සහ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති/අධ්‍යක්ෂ ලෙසද කටයුතු කළේය. ඔහු සාර්ක් සංවර්ධන අරමුදලේ ශ්‍රී ලංකා අධ්‍යක්ෂවරයා සහ පොදුරාජ්‍ය මණ්ඩලීය කුඩා රාජ්‍ය වෙළඳ මූල්‍ය පහසුකම (CTFF) සඳහා අධීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙසද කටයුතු කරයි.

විමලේන්තිරාජා මහතා කොළඹ විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා දෙපාර්තමේන්තුවේ සහ උපාධි අධ්‍යයන පීඨයේ පශ්චාත් උපාධි වැඩසටහන් සඳහා බාහිර කථිකාචාර්යවරයෙකු ද වේ.

චන්දන ගුනයන්ගොඩ මහතා කීර්තිමත් මූල්‍ය වෘත්තිකයෙක් වන අතර, ශ්‍රී ලංකා චරලත් ගණකාධිකාරී ආයතනයෙන් අධි සාමාජිකත්වය (FCA) සහ ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයෙන් අධි සාමාජිකත්වය (FCMA) ලබා ඇත. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයෙන් (PIM) බැංකුකරණය සහ මූල්‍ය විද්‍යාව පිළිබඳ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් (MBA) සහ කොළඹ විශ්වවිද්‍යාලයෙන් මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ කලා ශාස්ත්‍රපති උපාධියක් (MAFE) ඇතුළු පුළුල් ශාස්ත්‍රීය පසුබිමක් ඔහු සතුව ඇත. මීට අමතරව, ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය (විශේෂ) පිළිබඳ උපාධියක් සහ Institute of Bankers & IFS (London) ආයතනයෙන් බැංකුකරණය සහ මූල්‍ය විද්‍යාව පිළිබඳ උසස් සහතිකයක් (ACBF) ලබා ඇත.

වාණිජ බැංකුකරණයේ වසර 19ක් ඇතුළුව වසර 26කට වැඩි වෘත්තීය පළපුරුද්දක් ඇති ගුණියන්ගොඩ මහතා, වෘත්තීය සහ ශාස්ත්‍රීය ක්ෂේත්‍රයන් දෙකෙහිම කැපී පෙනෙන ජයග්‍රහණ ලබා ඇත. ඔහු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික, පිරිස් කළමනාකරණය, කර්මාන්ත විශේෂඥ සහ වත්කම් හා වගකීම් කමිටු නිලධාරී වැනි විවිධ භූමිකාවන්හි නිරත වී ඇති අතර, වත්කම් සහ වගකීම් කළමනාකරණය පිළිබඳ ලොව විශිෂ්ටතම කණ්ඩායමකද සාමාජිකයෙකු ලෙස කටයුතු කර ඇත.ඔහුගේ විශේෂඥතාව මූල්‍ය, උපායමාර්ගික සැලසුම්කරණය, ව්‍යාපාර පරිවර්තනය, ක්‍රියාවලිකරණය, පිරිවැය ප්‍රශස්තිකරණය, මානව සම්පත් කළමනාකරණය, වත්කම් සහ වගකීම් කළමනාකරණය, අවදානම් කළමනාකරණය සහ නියාමන වාර්තාකරණය යන ක්ෂේත්‍ර රැසක් ඔස්සේ පැතිර තිබේ.

ඔහුගේ වෘත්තීය ජීවිතය තුළ, ගුණියන්ගොඩ මහතා NDB බැංකුවේ මූල්‍ය, උපායමාර්ගික සැලසුම් සහ ව්‍යාපාර සහාය සහකාර උප සභාපති සහ NDB බැංකුව සහ අපනයන සංවර්ධන මණ්ඩලය අතර ඒකාබද්ධ ව්‍යාපාරයක් වන සංවර්ධන හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගමේ අධ්‍යක්ෂ ඇතුළු ප්‍රධාන කළමනාකරණ තනතුරු දරා ඇත. ඔහු සම්පත් බැංකුවේ වත්කම් හා වගකීම් නිලධාරියෙකු සහ මූල්‍ය හා සැලසුම් පිළිබඳ ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරියෙකු ලෙස කටයුතු කළ අතර, එයිටිකන් ස්පෙන්ස් PLC හි පුහුණු උපාධිධාරියෙකු ලෙස සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළේය. මෑතකදී ඔහු ලෝක බැංකුවේ කෘෂිකර්ම නවීකරණ ව්‍යාපෘතිය යටතේ සහ කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ රටේ කෘෂිකර්මාන්තය සහ වැවිලි අංශ තුළ ආයතනික සැකසුම් ප්‍රතිව්‍යුහගත කිරීම සම්බන්ධයෙන් මූල්‍ය හා පරිපාලන විශේෂඥයෙකු ලෙස විශේෂඥ මග පෙන්වීමක් ලබා දුන්නේය.

වර්තමානයේ, ගුණියන්ගොඩ මහතා MG සමාගම් සමූහයේ සමූහ ප්‍රධාන මූල්‍ය නිලධාරී (GCFO), නිවි විතානකන්ද තේ කර්මාන්ත ශාලා පුද්ගලික සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික සහ CCPI Management Holdings (පුද්ගලික) සමාගමේ විධායක නොවන සභාපති ලෙස සේවය කරයි. එමෙන්ම ඔහු CA Sri Lanka SAB Campus හි කළමනාකරණ මණ්ඩලයේ ගෞරවනීය සාමාජිකත්වය උසුලයි.



ගිලියන් එඩිවර්ඩිස් මහත්මිය

අධ්‍යක්ෂ

ගිලියන් එඩිවර්ඩිස් මහත්මිය, ශ්‍රී ලංකිය බැංකු ක්ෂේත්‍රයේ වසර 36කට අධික පළපුරුද්දක් ඇති වෘත්තීය බැංකුකරුවෙකි. DFCC බැංකුවේ සහ සෙලාන් බැංකුවේ සේවයේ නිරතවී ඇති ඇය, දශකයකට අධික කාලයක් පුරා ජ්‍යෙෂ්ඨ ආයතනික කළමනාකරණ තලයේ කටයුතු කරයි. විශේෂයෙන් පුද්ගල කේන්ද්‍රිය බැංකුකරණය සම්බන්ධව වසර ගණනාවක් කටයුතු කර ඇත.

1988 දී සෙලාන් බැංකුවට සම්බන්ධ වූ ඇය, එහි පුරෝගාමී සාමාජිකාවක් වූ අතර, මෙම බැංකුවේ මෙහෙයුම් ආරම්භ කළ කණ්ඩායමේ සමාජිකයෙක් විය. පුද්ගල කේන්ද්‍රිය බැංකුකරණය, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය (SME) සහ ක්ෂුද්‍ර කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය (MSME) යන සියලු ක්ෂේත්‍රවල වසර ගණනාවක පුළුල් අත්දැකීම් ඇය සතුය. සෙලාන් බැංකුවේ සේවය කරන කාලය තුළ, ඇය ශාඛා කළමනාකාරිනී, ප්‍රාදේශීය කළමනාකාරිනී, ප්‍රාදේශීය ප්‍රධානී සහ සහකාර සාමාන්‍යාධිකාරී (පුද්ගලික බැංකුකරණ) යන තනතුරුවල කටයුතු කරන ලදි.

2011 අගෝස්තු මාසයේදී ඇය DFCC වර්ධන බැංකුවේ පුද්ගල කේන්ද්‍රිය මූල්‍ය සම්පාදන ප්‍රධානී ලෙස සම්බන්ධ විය. මෙහිදී ඇයගේ ප්‍රධාන වගකීම වූයේ පුද්ගල කේන්ද්‍රිය මූල්‍ය සේවා හා පුද්ගල කේන්ද්‍රිය බැංකු කටයුතු විය. DFCC බැංකුව සහ DFCC වර්ධන බැංකුව ඒකාබද්ධ වීමෙන් අනතුරුව, ඇය ජ්‍යෙෂ්ඨ උප සභාපති පාරිභෝගික බැංකු කටයුතු ලෙස පත් කරනු ලැබූ අතර, 2021 මාර්තු මස දක්වා එම තනතුරු දැරුවාය.

ගිලියන් එඩිවර්ඩිස් මහත්මිය ඕස්ට්‍රේලියාවේ දකුණු ක්වීන්ස්ලන්ත විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා ඇති අතර, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයෙන් බැංකු කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි විධායක ඩිප්ලෝමාවක් ලබා ඇත. එමෙන්ම ඇය ඕස්ට්‍රේලියාවේ සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ සහකාර සාමාජිකාවකි. ඇය ශ්‍රී ලංකාවේ ලීසිං බැංකුකරුවන්ගේ කවුන්සිලයේ සභාපති ධුරය ද දැරූ අතර, බැංකු අංශයේ ඇයගේ ජයග්‍රහණ වෙනුවෙන් “Top 50 Professional and Career Women Awards Sri Lanka and Maldives, 2020” තුලින් ගෞරවයට පාත්‍ර විය.

ඇය දැනට කොමර්ෂල් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී, සෙලාන් ඩිවලොප්මන්ට් පීඑල්සී සහ මහවැලි පොල් වගාකිරීමේ සමාගම යන ආයතනවල ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරියක් ලෙස සේවය කරයි. ඇය ශ්‍රී ලංකාවේ පරිසරය සංරක්ෂණය කිරීම සඳහා සහයෝගීව කටයුතු කරන ලාභ නොලබන පාරිසරික සංවිධානයක් වන “The Federation of Environmental Organizations” හි භාරකාරිනියක්/භාණ්ඩාගාරිකවරියක් ලෙසද කටයුතු කරයි.



සංජය බණ්ඩාර මහතා

අධ්‍යක්ෂ

සංජය බණ්ඩාර මහතා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (CA Sri Lanka) අධි සාමාජිකයෙක් වන අතර, ගිණුම්කරණය, විගණනය, පාලනය සහ නායකත්වය යන ක්ෂේත්‍රවල වසර 27කට වැඩි වෘත්තීය විශිෂ්ටත්වයක් ලබා ඇත. ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ගණකාධිකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධියක් සහ කොළඹ විශ්වවිද්‍යාලයෙන් MBA උපාධියක් ලබා ඇත.

ඔහු ප්‍රධාන නායකත්ව තනතුරු කිහිපයක් දරා ඇති අතර, විශේෂයෙන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (CA Sri Lanka) (2022/23) සභාපති ලෙස සේවය කරන ලදි. එහිදී, දේශීයව වෘත්තිය ශක්තිමත් කිරීමට සහ ගෝලීය වශයෙන් වන පිළිගැනීම වැඩි දියුණු කිරීම සඳහා වන පරිවර්තනීය මූලපිරීම්වලට නායකත්වය ලබා දුන්නේය. ආසියානු සහ පැසිෆික් ගණකාධිකාරී සම්මේලනයේ (CAPA) (2019-2023) සහ දකුණු ආසියානු ගණකාධිකාරී සම්මේලනයේ (SAFA) (2022-2023) මණ්ඩල සාමාජිකයෙකු ලෙස ශ්‍රී ලංකාව නියෝජනය කළ ඔහු, එමඟින් කලාපය පුරා වෘත්තියේ අනාගතය හැඩගැස්වීමට සුවිශේෂ කාර්ය භාරයක නිරත විය.

බණ්ඩාර මහතා ප්‍රධාන නියාමන සහ පාලන භූමිකාවල ද කටයුතු කරයි. ඔහු ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ කොමසාරිස්වරයෙකු (2022-2023), AAT ශ්‍රී ලංකා හි කවුන්සිල සාමාජිකයෙකු (2020-2021) සහ කැලණිය විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩල සාමාජිකයෙකු ලෙස (2020-2023) සේවය කළේය. මීට අමතරව, ඔහු ශ්‍රී ලංකා මහ බැංකුවේ කොටස්කරුවන්ගේ සහභාගීත්ව උපදේශන කමිටුවේ (Stakeholder Engagement Consultative Committee) සාමාජිකයෙකු ලෙස මූල්‍ය අංශයේ ප්‍රතිපත්ති කතිකාවතට දායක වී ඇත.

අධ්‍යාපනය සහ දැනුම බෙදා ගැනීම සඳහා ගැඹුරින් කැපවී සිටින බණ්ඩාර මහතා, අනාගත පරම්පරාවේ මූල්‍ය හා ගිණුම්කරණ වෘත්තිකයන්ට දැනුම ලබාදෙමින් වසර 15 කට අධික කාලයක් ප්‍රමුඛ පෙළේ රාජ්‍ය විශ්ව විද්‍යාලවල බාහිර උපදේශකයෙකු ලෙස කටයුතු කර ඇත.

ඔහු B.R. De Silva & Co (Chartered Accountants, a member firm of Nexia International) හි හවුල්කරුවෙකි., එමෙන්ම ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ කවුන්සිල සාමාජිකයෙකු, ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති අධීක්ෂණ මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු, විගණන ප්‍රමිති කමිටුවේ සාමාජිකයෙකු සහ ආසියානු-සාගර ප්‍රමිති සකසන්නන්ගේ කණ්ඩායමට (AOSSG) දායකයෙකු ලෙසද සේවය කරයි.



දීප්ති ලොකුආරච්චි මහතා

අධ්‍යක්ෂ

වසර 32 කට අධික වෘත්තීය සේවා කාලයක් හිමි දීප්ති ලොකුආරච්චි මහතා කොළඹ විශ්වවිද්‍යාලයෙන් නීතිවේදී (LLB) උපාධිය ලබා ඇති අතර, 1995 දී නීතිඥවරයෙකු ලෙස දිවුරුම් දුන්නේය. තවද, ඔහු එක්සත් රාජධානියේ වරලත් රක්ෂණ ආයතනයෙන් වරලත් රක්ෂණ අවදානම් කළමනාකරුවෙකු ලෙස වෘත්තීය සුදුසුකම් ලබා ඇත.

2020 සිට 2025 දක්වා ලංකා හොස්පිට්ල්ස් කෝපරේෂන් හි සමූහ ප්‍රධාන විධායක නිලධාරී ලෙස සේවය කළ ලොකුආරච්චි මහතා 2025 ජූලි මාසයේදී එහි ආයතනික, විධායක භූමිකාවන්ගෙන් සමුගත්තේය. මෙම කාල පරිච්ඡේදය ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සේවා ඉතිහාසයේ වඩාත්ම අභියෝගාත්මකම කාල පරිච්ඡේදයක් වූයේ, කොවිඩ් වසංගතය සහ මූල්‍ය අර්බුදයේ බලපෑම හේතුවෙනි. එහෙත් මෙම අවදියේදී රෝහලේ වේගවත් පරිවර්තනයක් සිදු වූ අතර, එමඟින් සියලුම කොටස්කරුවන්ට ප්‍රතිලාභ හිමිවිය. ලංකා හොස්පිට්ල්ස් හි ඔහුගේ නායකත්වය යටතේ දියත් කරන ලද මෙම මුලපිරීම, කොටස් හිමියන්ට ඉහළ වටිනාකමක් ලබා දීම, තිරසාර සන්නාම අගයක් ගොඩනැගීම සහ විශේෂ සත්කාර අවශ්‍ය රෝගීන් කළමනාකරණය කිරීමට සුදුසුම තේරීමක් ලෙස රෝහල ස්ථානගත කිරීම සහ අති නවීන ගෝලීය වෛද්‍ය තාක්ෂණයන් සහ කුසලතා ඇති වෘත්තිකයන් බඳවා ගැනීම යන අංශවලින් රෝහල කැපී පෙනෙන දියුණුවක් පෙන්නුම් කළේය. මෙම පරිවර්තනීය මුලපිරීම් හේතුවෙන්, ලංකා හොස්පිට්ල්ස් රෝහල ශ්‍රී ලංකාවේ සියලුම ලැයිස්තුගත රෝහල් සමාගම් අතරින් හොඳම ක්‍රියාකාරී රෝහල ලෙස තේරී පත් වූ අතර, 2022 වසරේදී HealthCare ප්‍රධාන විධායක නිලධාරියා ලෙස ලොකුආරච්චි මහතා තේරී පත් විය.

සෞඛ්‍ය සේවා අංශයට සම්බන්ධ වීමට පෙර ලොකුආරච්චි මහතා රක්ෂණ ක්ෂේත්‍රයේ වසර 27ක් සේවය කර ඇත. මෙම අංශයේ අවසන් වරට ඔහු HNB ඇෂුවරන්ස් PLC සහ HNB ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ් හි කළමනාකාර අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී ලෙස කටයුතු කළේය. වසර 27ක වෘත්තීය ජීවිතය තුළ ඔහු ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් (SLIC) හි ප්‍රධාන විධායක නිලධාරී ලෙස ද සේවය කර ඇත. එමෙන්ම ශ්‍රී ලංකා රක්ෂණ සංගමයේ සභාපති, ශ්‍රී ලංකා රක්ෂණ ආයතනයේ (SLII) සභාපති සහ වරලත් රක්ෂණ වෘත්තිකයන්ගේ සංගමයේ (ACIP) සභාපති ලෙස රක්ෂණ ක්ෂේත්‍රයේ නායකත්ව තනතුරු ද දරා ඇත.

ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තයට ඔහු කළ කැපී පෙනෙන දායකත්වය වෙනුවෙන් ලොකුආරච්චි මහතා ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ආයතනයේ Hall of Fame වෙත ද ඇතුළත් කර ඇත. තවද, ඔහුගේ ප්‍රශංසනීය දායකත්වය සහ ජයග්‍රහණ අගයමින්, 2019 දී කොළඹ විශ්වවිද්‍යාලයේ හිටපු උපාධිධාරීන් සඳහා පිරිනමන වාර්ෂික පිළිගැනීම් පහෙන් එකකින්ද ඔහු ඇගයීමට පාත්‍ර කරනු ලැබීය.



නිෂාන් වල්ගම්පාය මහතා

අධ්‍යක්ෂ

නිෂාන් වල්ගම්පාය මහතා වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (එක්සත් රාජධානිය) සාමාජිකයෙකු වන අතර, මූල්‍ය, උපායමාර්ගික සැලසුම්කරණය සහ ව්‍යවසාය පරිවර්තනය පිළිබඳ වසර 25 කට වැඩි පළපුරුද්දක් ඇත.

ඔහු බැන්ගෝර් හි වේල්ස් විශ්වවිද්‍යාලයෙන් පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා ඇති අතර, කෙන්ටුකි (ඇමරිකා එක්සත් ජනපදය) විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ සහ සිංගප්පූරු ජාතික විශ්වවිද්‍යාලයේ විධායක අධ්‍යාපනය සම්පූර්ණ කර ඇත.

මේ වන විට, වල්ගම්පාය මහතා ගෝලීය ඇඟලුම්-තාක්ෂණ සමූහ ව්‍යාපාරයක් වන MAS හෝල්ඩින්ග්ස් පුද්ගලික සමාගමේ ව්‍යවසාය ක්‍රියාවලි සැලසුම් සහ පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරයා ලෙස සේවය කරයි. ඔහු මීට පෙර MAS හෝල්ඩින්ග්ස් හි සමූහ මූල්‍ය මෙහෙයුම් අධ්‍යක්ෂ ඇතුළු ජ්‍යෙෂ්ඨ නායකත්ව භූමිකාවන් දරා ඇති අතර, එහිදී ඔහු ව්‍යවසායකත්ව උපායමාර්ගික මුලපිරීම් සහ පරිවර්තන ව්‍යාපෘතීන් මෙහෙයවීය.

ප්‍රංශ, ජර්මානු, චීන මෙන්ම සිංගප්පූරුව පදනම් වූ ආයතන ඇතුළු විවිධ සංස්කෘතික හා අන්තර්ජාතික ආයතනික හා සම්බන්ධ ව්කාබද්ධ ව්‍යාපාර හවුල්කරුවන් සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් සමඟ කටයුතු කිරීමේ පුළුල් අත්දැකීම් වල්ගම්පාය මහතාට ඇත.

ඔහුගේ මූල්‍ය විශේෂඥතාවයට අමතරව, ලීන් නිෂ්පාදන මූලධර්ම සහ භාවිතයන් යෙදීම සම්බන්ධයෙන් වල්ගම්පාය මහතාට ගැඹුරු අධ්‍යයනයක් සහ ප්‍රායෝගික අත්දැකීම් තිබේ. MAS හෝල්ඩින්ග්ස් හි රෙදිපිළි අංශය තුළ තාක්ෂණික සංවිධානයට උපායමාර්ගික මඟ පෙන්වීම් ලබා දී ඇති ඔහුගේ නායකත්වය, සැපයුම් සහ තාක්ෂණික අංශය දක්වා විහිදේ.

වල්ගම්පාය මහතා සිය වෘත්තීය ජීවිතය KPMG Sri Lanka විගණන ආයතනයෙන් ආරම්භ කළ අතර, පසුව ආයතනික මූල්‍ය අංශයේ මූල්‍ය පාලනය, ආයෝජන උපාය මාර්ග සහ ව්‍යවසාය-පුළුල් ක්‍රියාවලි නිර්මාණය පිළිබඳ ශක්තිමත් පදනමක් ඇති කළේය.



සබ්රි ගවුස් මහතා

අධ්‍යක්ෂ

සබ්රි ගවුස් මහතාගේ ජාත්‍යන්තර බැංකු දිවිය වසර 30කට අධිකය. එමෙන්ම විදේශ මූල්‍ය වෙළෙඳපොළ තුළ වසර 10කට අධික අත්දැකීම් ඇත.

සබ්රි මහතාගේ පළපුරුද්ද මැදපෙරදිග, ASEAN කලාපය සහ ශ්‍රී ලංකාව පුරා විහිදී පවතී. ඔහු ඒ ඒ වෙළඳපලවල ව්‍යාපාර ආරම්භක අවධීන්හිදී මෙන්ම වර්ධන අවධීන්හිදී පාරිභෝගික සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාවසාය (SME), බැංකුකරණ ක්ෂේත්‍රයන්හි සේවය කර ඇත.

ඔහු ඇමරිකානු එක්ස්ප්‍රස් බැංකුව, ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව සහ සෞදි අරාබියේ අල් රාජ්හි බැංකු සහ ආයෝජන සංස්ථාවේ සේවය කර ඇති අතර, මෙම සියලුම බැංකු වල පුද්ගල කේන්ද්‍රිය බැංකුකරණය, අනුබද්ධ මෙහෙයුම් සහ උපාය මාර්ග සැකසීම සඳහා පෙරමුණ ගත්තේය. 2006 දී සෞදි අරාබියේ අල් රාජ්හි බැංකු සහ ආයෝජන සංස්ථාව විසින් මැලේසියානු වෙළඳපොළට ඇතුල්වීමෙන් අනතුරුව පුද්ගල කේන්ද්‍රිය බැංකුකරණ ආකෘතියක් සංවර්ධනය කිරීම සහ මෙහෙයුම් ස්ථාපිත කිරීම සඳහා මැලේසියාවේ අල් රාජ්හි බැංකුවේ පුද්ගල කේන්ද්‍රිය බැංකු අංශයේ ප්‍රධානියා ලෙස ඔහු බඳවා ගන්නා ලදී.

ගවුස් මහතා ශ්‍රී ලංකාවේ ණය තොරතුරු කාර්යාංශයේ (CRIB) හිටපු අධ්‍යක්ෂවරයෙකි. ඔහු 2021 අගෝස්තු දක්වා යුනියන් බෑන්ක් ඔෆ් කලම්බු පීවිල්සී හි නියෝජ්‍ය සභාපතිවරයා විය. දැනට ඔහු මූල්‍ය සමාගමක සභාපතිවරයා වේ.

ඔහු එක්සත් රාජධානියේ London Business School හි විධායක නායකත්ව වැඩසටහන් සඳහා සහභාගී වී ඇති අතර, ඕස්ට්‍රේලියාවේ බටහිර සිඩ්නි විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධියක් (MBA) ලබා ඇත.

මැලේසියාවේ අල්රාජ්හි බැංකුවේ පුද්ගල කේන්ද්‍රිය බැංකු ඒකක පිහිටුවීමේදී මෙන්ම, මැලේසියාවේ අල්රාජ්හි බැංකුවේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය (SME) ඒකකය පිහිටුවීමේදී සබ්රි මහතා තීරණාත්මක කාර්යභාරයක නිරතවිය. මෙය එරට කුඩා ව්‍යාපාරවල නියැලී සිටි විශාල පිරිසකට සහාය විය. මෙය මැලේසියානු මහ බැංකුවේ (BNM) ඇපකර වැඩසටහන සමඟ සම්බන්ධ විය. එමෙන්ම මැලේසියාවේ ආර්ථික දියුණුවට සම්බන්ධ ප්‍රජාවේ විශාල කොටසක් නඟා සිටුවීමට මෙය හේතුවිය. මෙය කලාපීය ප්‍රදේශවල හඳුනාගෙන ව්‍යවසායන් සඳහා සහාය වීමට අනුගමනය කළ යුතු ආදර්ශ වැඩසටහනක් බවට පත් කරන ලදී.



චන්දි ධර්මරත්න මහත්මිය

අධ්‍යක්ෂ

චන්දි ධර්මරත්න මහත්මිය, මානව ප්‍රාග්ධන කළමනාකරණය, ආයතනික පරිවර්තනය සහ ඩිජිටල් උපාය මාර්ග පිළිබඳ වසර 25කට වැඩි පළපුරුද්දක් ඇති ජ්‍යෙෂ්ඨ ව්‍යාපාරික නායිකාවකි. ඇය 1995 දී නිව්යෝර්ක් හි සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළ අතර, 2001 දී MAS හෝල්ඩින්ග්ස් හි සමූහ ඉගෙනුම් සහ සංවර්ධන ප්‍රධානියා ලෙස ශ්‍රී ලංකාවට පැමිණියාය.

පසුව ඇය Virtusa හි උප සභාපති(මානව සම්පත්) ලෙස සම්බන්ධ වූ අතර, එහිදී ඇය ශ්‍රී ලංකාව සඳහා ATC ප්‍රධානියා, ගෝලීය ව්‍යාපාර ඒකකයේ මානව සම්පත් ප්‍රධානියා සහ මානව සම්පත් ඩිජිටල්කරණය පිළිබඳ ගෝලීය ප්‍රධානියා ඇතුළු දේශීය සහ ගෝලීය නායකත්ව භූමිකාවන් කිහිපයක් ඉටු කළාය. එතැන් සිට චන්දි මහත්මිය ශ්‍රී ලංකාව, මැලේසියාව, ඉන්දුනීසියාව, ඕස්ට්‍රේලියාව, පිලිපීනය සහ ඉන්දියාව යන රටවල Chief People Officer Chief Growth Officer වැනි විධායක මට්ටමේ (C-suite) තනතුරු කිහිපයක් දරා ඇත. මෙම භූමිකාවන්හිදී, ඇය විසින් මානව සම්පත්, ප්‍රධාන ව්‍යාපාර මෙහෙයුම් සමඟ ඒකාබද්ධ කරන ලද අතර තාක්ෂණය හරහා කුසලතා සංවර්ධනය කරන ලද අතර, සංවිධානය පුරා වර්ධන පරිවර්තනයන් මෙහෙය වන ලදී. එමෙන්ම ඇය ආදායම් උත්පාදන ප්‍රවේශයන්හි ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළාය. ඇයගේ ප්‍රවේශය සැමවිටම "මිනිසුන් මුල් කරගත්" (People-first) එකක් වන අතර, එමඟින් තිරසාර මෙන්ම අඛණ්ඩ වැඩිදියුණු කිරීම් මත පදනම් වූ වෙනසක් ඇති කිරීමට සමත් විය.

ශ්‍රී ලංකා රජය සමඟ උපදේශන කටයුතු හරහා ජාතික ඩිජිටල් සහ ශ්‍රම බලකා ප්‍රතිපත්තියට චන්දි මහත්මිය දායක වී ඇත. Lankan Angel Network ජාලයේ හිටපු සභාපතිනිය ලෙස ඇය ව්‍යවසායක පරිසර පද්ධතියට ගැඹුරින් සම්බන්ධ වී සිටින අතර, ඇමරිකානු වාණිජ මණ්ඩලය ශ්‍රී ලංකා ආයතනය, SLASSCOM සහ මානව සම්පත් වෘත්තිකයන්ගේ සංගමයේ මණ්ඩලවල සේවය කර ඇත.

2021 දී, ඇය ආයතනික පරිවර්තනය සහ කුසලතා උපාය මාර්ග කෙරෙහි අවධානය යොමු කළ උපදේශන ආයතනයක් වන Prism Global Solutions ආරම්භ කළාය. ඇය දැනට Connect to Care Consulting, Sri Lanka ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකාවක් ලෙස සේවය කරයි. ශ්‍රී ලංකාවේ සහ සිංගප්පූරුවේ මෙහෙයුම් සිදුකරන සංවිධානයක් වන ඇය මහා පරිමාණ බලපෑම් සහිත විසඳුම් හරහා ප්‍රජාවන් සවිබල ගැන්වීම සඳහා දායක වන බිල් සහ මෙලින්ඩා ගේට්ස් පදනම ඇතුළු හවුල්කරුවන් සමඟ ගෝලීයව කටයුතු කිරීමට ඇය සමත් වී ඇත.

Echelon හි ශ්‍රී ලංකාවේ බලවත්ම කාන්තාවන් 50 දෙනා සහ නව ආයතන 100 අතර පිළිගැනීමට ලක් වූ චන්දි මහත්මිය, මානව සම්පත් නායකත්වය සහ නවෝත්පාදනය සඳහා ගෝලීය සහ දේශීය සම්මාන කිහිපයක් ලබා ඇත. ඇය INSEAD වෙතින් ව්‍යාපාර පරිපාලනය සහ ආර්ථික විද්‍යාව පිළිබඳ උපාධියක්, MBA උපාධියක් සහ විධායක අධ්‍යාපන සහතික ලබා ඇත.

චන්දි මහත්මිය ජනතා කේන්ද්‍රීය පරිවර්තනය සහ අරමුණු මත පදනම් වූ වර්ධනය අඛණ්ඩව පවත්වාගෙන යන අතර, සංවිධාන හැඩගැස්වීමට, ප්‍රජාවන් නඟා සිටුවීමට සහ මිළඟ පරම්පරාවේ නායකයින් දිරිමත් කිරීමට මානව විභවයන් සමඟ ව්‍යාපාර උපාය මාර්ග පෙළගැස්වීමට කටයුතු කරනු ලබයි.



ආචාර්ය ඒ ජී ඉලංගකෝන් මහතා

අධ්‍යක්ෂ

ආචාර්ය ගිෂාන් ඉලංගකෝන් මහතා, ශ්‍රී ලංකාව, මැදපෙරදිග සහ පැසිෆික් කලාපය පුරා දශක තුනකට අධික නායකත්ව පළපුරුද්දක් ඇති ජ්‍යෙෂ්ඨ බැංකු සහ මූල්‍ය වෘත්තිකයෙකි. ඔහු හැටන් නැෂනල් බැංකුව, Barclays Bank, MCB බැංකුව සහ එක්සත් අරාබි බැංකුව (UAE) ඇතුළු ප්‍රමුඛ මූල්‍ය ආයතනවල ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරු දරා ඇති අතර, සොලමන් දූපත් වල POB බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරියා ලෙස සේවය කර ඇත.

ආයතනික සහ අක්වෙරළ බැංකු ප්‍රධානියා, ප්‍රධාන අවදානම් නිලධාරී සහ කළඹ කළමනාකරණ ප්‍රධානියා යන තනතුරු ඔහු දරා ඇති අතර, එමඟින් ව්‍යාපාර, අවදානම් සහ පාලන කාර්යයන් හරහා ඔහුට පුළුල් අත්දැකීම් සහිතය. ඔහු පුද්ගල කේන්ද්‍රීය බැංකු කටයුතු, කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර, ආයතනික බැංකුකරණය, අවදානම් කළමනාකරණය, දේශගුණ සහ තිරසාර මූල්‍ය යන ක්ෂේත්‍රවල ගැඹුරු විශේෂඥතාවයක් ලබා ඇති අතර පාලනය, නියාමන අනුකූලතාව සහ තිරසාර වටිනාකම් නිර්මාණය කෙරෙහි දැඩි අවධානයක් යොමු කරයි. මීට අමතරව, ආචාර්ය ඉලංග කෝන් පකිස්ථානයේ MCB බැංකුවේ සේවය කළ කාලය තුළ ඉස්ලාමීය බැංකුකරණය පිළිබඳ මනා අවබෝධයක් ලබා ගන්නා ලදි.

ආචාර්ය ඉලංගකෝන් මහතා මැලේසියාවේ කළමනාකරණ හා විද්‍යා විශ්වවිද්‍යාලයෙන් කළමනාකරණය පිළිබඳ ආචාර්ය උපාධියක් ද, වේල්ස් විශ්වවිද්‍යාලයෙන් මූල්‍ය පිළිබඳ MBA උපාධියක් ද, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයෙන් ව්‍යාපාර හා මූල්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය ද ලබා ඇත. ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ සහ වරලත් වෘත්තීය කළමනාකරුවන්ගේ ආයතනයේ සාමාජිකයෙකු වන අතර, වෘත්තීය බැංකුකරුවන්ගේ සංගමයේ, ශ්‍රී ලංකා අධ්‍යක්ෂවරුන්ගේ ආයතනයේ සහ අලෙවිකරණ ආයතනයේ සාමාජිකයෙකි. ණය දීම සහ තිරසාර මූල්‍ය කටයුතු පිළිබඳ MCIM (UK) සහ අනෙකුත් ජාත්‍යන්තර වෘත්තීය සහතික ද ඔහු ලබා ඇති අතර, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ සහ විශ්ව විද්‍යාල කිහිපයක සම්පත්දායකයෙකු ලෙස සේවය කරයි. ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ CRO සංසදයේ විධායක කමිටු සාමාජිකයෙකු සහ බැංකු අංශයේ අවදානම් කළමනාකරණ වෘත්තිකයන්ගේ සංගමයේ උප සභාපතිවරයෙකු ලෙසද ඔහු අවදානම් කළමනාකරණ ප්‍රමිතීන් ශක්තිමත් කිරීමට දායක වී ඇත.

සම්මානලාභී කර්මාන්ත වෘත්තිකයෙකු, ශාස්ත්‍රීය, පර්යේෂකයෙකු සහ කතුවරයෙකු වන ආචාර්ය ඉලංගකෝන් මහතා, බැංකුකරණය, අවදානම් කළමනාකරණය සහ කාලීන කටයුතු පිළිබඳ ජාත්‍යන්තර සහ දේශීය සඟරා සහ ජාතික ව්‍යාපාරික පුවත්පත් සඳහා පුළුල් ලෙස දායක වී ඇත. ඔහු දැනට ලැයිස්තුගත මූල්‍ය සමාගමක ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කරන අතර අවදානම් කළමනාකරණය, MSME සංවර්ධනය, ආයතනික සහ ආයෝජන බැංකුකරණය පිළිබඳ උපදේශන විශේෂඥතාව සපයයි. ඔහු සිය ධාරිතාවයෙන්, උපායමාර්ගික, පාලනය සහ මූල්‍ය මුලපිරීම් සඳහා සහාය වීම සඳහා ප්‍රමුඛ උපදේශන සමාගම් සහ මූල්‍ය ආයතන සමඟ සමීපව කටයුතු කරයි. ආචාර්ය ඉලංගකෝන් යනු පුරෝගාමී "ABCDE" නායකත්ව රාමුවේ නිර්මාතෘ වන අතර, ඉන් ඔහුගේ කාර්ය සාධන විශිෂ්ටත්වය සහ ඵලදායී නායකත්වය පිළිබඳ දර්ශනය පිළිඹිබු කරයි.



ආචාර්ය ඒ ඒ කදිරගාමර් මහතා

අධ්‍යක්ෂ

ආචාර්ය අහිලන් කදිරගාමර් මහතා ඉංජිනේරු, පර්යේෂණ සහ ශාස්ත්‍රීය ක්ෂේත්‍ර පිළිබඳ විශේෂඥයෙකි. 2024 නොවැම්බර් මාසයේ දී මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලද ඔහු කීර්තිමත් පසුබිමක් ඇති, විවිධ විෂයන් පිළිබඳ පුළුල් ගෝලීය අත්දැකීම් සමුදායක් ඇති අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකි.

ආචාර්ය කදිරගාමර් මහතා මානව විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධියක් ද, ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ද, City University of New York හි පශ්චාත් උපාධි අංශයෙන් ලබාගෙන ඇති අතර Georgia Institute of Technology ආයතනයෙන් විදුලි ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපාධියද ලබා ඇත. වසර 12කට අධික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ඔහුගේ වෘත්තීය දිවිය තුළ ඔහු ජපානයේ ටෝකියෝ සහ ඇමරිකා එක්සත් ජනපදයේ නිව්යෝර්ක් යන නගර වල සේවය කළ අතර,එහිදි ඔහුගේ තාක්ෂණික නවෝත්පාදන සහ ගැටලු විසඳීමේ කුසලතාවන් වැඩිදියුණු කරගැනීමට හැකියාව ලැබිණි.

පර්යේෂණ සහ ශාස්ත්‍රීය ක්ෂේත්‍රයට අවතීර්ණ වෙමින්, ආචාර්ය කදිරගාමර් මහතා පුළුල් ජාත්‍යන්තර ව්‍යාපෘති සමඟ සම්බන්ධව කටයුතු කර ඇති අතර, ධීවර කර්මාන්තය, කෘෂිකාර්මික වෙනස්වීම්, සමුපකාර, ණය ප්‍රතිව්‍යුහගත කිරීම සහ ආර්ථික විකල්ප වැනි තීරණාත්මක මාතෘකා පිළිබඳව විවිධ ප්‍රකාශනයන් පළකර ඇත. ආර්ථික පද්ධති සහ සංවර්ධනය පිළිබඳ ඔහුගේ දැනුම හා අවබෝධය, සමාජ-ආර්ථික අභියෝග පිළිබඳව ඔහුගේ මතවාදහේතුවෙන් කදිරගාමර් මහතා මතවාදී නායකයෙකු ලෙසද ස්ථානගතවී ඇත.

2018 වසරේ දී යාපනය විශ්ව විද්‍යාලයට සමාජ විද්‍යා අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු ලෙස සම්බන්ධ වූ ඔහු, එහිදී විචාරාත්මක චින්තනය සහ විෂයාන්තර දැනුම වැඩිදියුණු කිරීමට ද මූලික වී ඇත.

ආයතනික කළමනාකරණය

ජනතා හද ගැස්ම හඳුණන ආයතනික කළමනාකාරිත්වය







ක්ලයිව් ෆොන්සේකා මහතා

ප්‍රධාන විධායක නිලධාරී/ සාමාන්‍යාධිකාරී

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයෙන් MBA උපාධියක් හිමි ෆොන්සේකා මහතා ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ අධි සාමාජිකත්වය හිමිකරගෙන ඇත. ඔහු ඕස්ට්‍රේලියාවේ කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (CMA) සහතිකලත් සාමාජිකයෙකි.

ඔහු 2018 සිට 2020 දක්වා කාලසීමාව තුළ, ප්‍රාථමික ගනුදෙනුකරුවන්ගේ සංගමයේ සභාපති ලෙස කටයුතු කළේය.

පීපල්ස් ලීසින් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී ආයතනයේ ස්වාධීන නොවන හා විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ලෙස වර්තමානයේ කටයුතු කරන ක්ලයිව් මහතා ඊට අමතරව ශ්‍රී ලංකා බැංකු සංගමයේ සහ ලංකාපේ (පුද්ගලික) සමාගමේ අධ්‍යක්ෂ ධූර හොබවන අතර ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ පාලක මණ්ඩලයේ සාමාජිකයෙකු ද වේ.

ඔහුගේ වත්මන් පත්කිරීම්වලට පෙර, ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ IABF/DABF විභාගවල ප්‍රධාන පරීක්ෂක ලෙස කටයුතු කර ඇත.

2002 දී, මහජන බැංකුවට සම්බන්ධ වූ ෆොන්සේකා මහතා, 2011 නොවැම්බර් මස පටන් ආයතනික කළමනාකරණ කණ්ඩායමේ සාමාජිකයෙකු ලෙස නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තනතුර දැරිය.මෙම කාර්යභාරය තුළ, ඔහු, විදේශ විනිමය මෙහෙයුම්, ප්‍රාථමික වෙළෙඳ ඒකකයේ කටයුතු, ආයෝජන බැංකුකරණ ඒකකය සහ මුදල් වෙළෙඳපොල මෙහෙයුම් පාලන කටයුතු සිදු කළේ දේශීය සහ විදේශීය වාණිජ බැංකු සහ මූල්‍ය ආයතන සමඟ සම්බන්ධතා කළමනාකරණය කිරීමට අමතරවය. ඔහුගේ පුළුල් වෘත්තීය අත්දැකීම් අතර ඇමරිකන් එක්ස්ප්‍රස් බැංකුව සහ ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුවේ ජ්‍යෙෂ්ඨ තනතුරු ද ඇතුළත් වේ.

2023 ජනවාරි 1 වැනිදා, ෆොන්සේකා මහතා මහජන බැංකුවේ වැඩබලන ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී ලෙස පත් කරන ලද අතර, ඔහු 2023 අගෝස්තු 1 වන දින ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී තනතුර නිල වශයෙන් භාර ගත්තේය.



ඊ ඒ එම් දිසානායක මහතා

ප්‍රධාන අභ්‍යන්තර විගණක

ඊ ඒ එම් දිසානායක මහතා මහජන බැංකුවේ ප්‍රධාන අභ්‍යන්තර විගණක ලෙස සේවය කරයි. ශාඛා බැංකුකරණය සහ අභ්‍යන්තර විගණනය පිළිබඳ වසර 35කට වැඩි පළපුරුද්දක් ඇති ඔහු පාලනය, අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලන පිළිවෙත් ශක්තිමත් කිරීම සම්බන්ධයෙන් බැංකුව සමඟ කටයුතු කරයි.

අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධානියා ලෙස, අදාළ නියාමන අවශ්‍යතා සහ වෘත්තීය ප්‍රමිතීන්ට අනුව අධ්‍යක්ෂ මණ්ඩලයට සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයට ස්වාධීන හා පක්ෂපාතී නොවන සහතිකයක් ලබා දීම සඳහා ඔහු නායකත්වය සපයයි. බැංකුව පුරා ඵලදායී පාලනය, අනුකූලතාව සහ අභ්‍යන්තර පාලන ක්‍රියාවලීන් ශක්තිමත් කිරීම අභ්‍යන්තර විගණන කාර්යය මගින් සිදුවේ.

අභ්‍යන්තර විගණනය සහ මූල්‍ය පාලනයේ නව ප්‍රවණතා පිළිබඳ දැනුම ලබා ගැනීම සඳහා වෘත්තීය පුහුණු වැඩසටහන් සහ විදේශීය පුහුණුවලට සහභාගී වී ඇති දිසානායක මහතා විගණන කටයුතුවලදී වෘත්තීය ප්‍රමිතීන්, සදාචාරාත්මක හැසිරීම සහ වගකීම ඉතා වැදගත් බව විශේෂයෙන් අවධාරණය කරයි.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අධි සාමාජිකයෙකු (FCA) වන දිසානායක මහතා වරලත් සහතිකකළ ගණකාධිකාරී සංගමයේ (ACCA - UK) සාමාජිකයෙකු හා ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකි (AIB). ඔහු කොළඹ විශ්වවිද්‍යාලයෙන් MBA උපාධියක්, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් රාජ්‍ය පරිපාලනය පිළිබඳ B.Sc. උපාධියක් සහ CA Sri Lanka විසින් CA ඉන්දියාව සමඟ සහයෝගයෙන් ප්‍රදානය කරන ලද තොරතුරු පද්ධති, ආරක්ෂක පාලනය සහ විගණනය පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා ඇත.



වික්‍රම නාරායන මහතා

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – සුළු, මධ්‍යපරිමාණ ව්‍යාපාර, සංවර්ධන මූල්‍ය හා ක්ෂුද්‍ර මූල්‍ය බැංකුකරණය

1994 දී කළමනාකරණ අභ්‍යාසලාභියෙකු ලෙස මහජන බැංකුවට සම්බන්ධ වූ වික්‍රම නාරායන මහතා, ශාඛා බැංකුකරණය, ආයතනික සහ අක්වෙරළ බැංකුකරණය මෙන්ම උපායමාර්ගික සැලසුම්කරණය වැනි බැංකුකරණයේ විවිධ අංශවල වසර 31 කට වැඩි පළපුරුද්දක් ඇති අයෙකි.

කුඩා ව්‍යාපාර ණය දීම, ව්‍යාපෘති මූල්‍යකරණය, ව්‍යවසායකත්ව සංවර්ධනය, ව්‍යාපාර පුනර්ජීවනය සහ පුනරුත්ථාපනය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ණය දීම පිළිබඳ ඔහුගේ විශේෂඥතාව වසර 20කට වැඩි කාලයක් පුරා විහිදේ. වර්තමානයේ ඔහු මහජන බැංකුවේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර, සංවර්ධන සහ ක්ෂුද්‍ර මූල්‍ය දෙපාර්තමේන්තු මෙහෙයවයි.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී උපාධියක් ලබා ගත් නාරායන මහතා, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී උපාධියක් ලබා ගත් අතර, පසුව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයෙන් බැංකුකරණය සහ මූල්‍ය පිළිබඳ MBA උපාධියක් සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් කළමනාකරණය පිළිබඳ MSc උපාධියක් ලබා ගත්තේය. ඊට අමතරව, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ අධි සාමාජිකයෙක් වන ඔහු හාවර්ඩ් ජාත්‍යන්තරයෙන් ව්‍යාපෘති තක්සේරු කිරීම් සහ අවදානම් විශ්ලේෂණය පිළිබඳ ඉහළ මට්ටමේ පුහුණුවක් ද ඇතුළුව දේශීය හා විදේශීය පුහුණු රාශියක් ලබා ඇත.

ඔහු දැනට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය (IBSL) සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) බැංකු අධ්‍යයන මධ්‍යස්ථානය යන ආයතන වල දේශන පවත්වයි. එපමණක් නොව, 2023 ජනවාරි සිට 2024 නොවැම්බර් දක්වා කාලසීමාව තුළ ඔහු ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ (RDB) අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කළේය. වර්තමානයේ ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ පාලක මණ්ඩලයේ සාමාජිකයෙකු සහ පීපල්ස් ට්‍රැවල්ස් පුද්ගලික සමාගමේ අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කරයි.



නිල්මිණි ප්‍රේමලාල් මහත්මිය

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී වැඩබලන මූල්‍ය ප්‍රධානි

මහජන බැංකුවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී වැඩබලන මූල්‍ය ප්‍රධානි ලෙස වර්තමානයේ කටයුතු කරන්නේ නිල්මිණි ප්‍රේමලාල් මහත්මියයි. 2002 වර්ෂයේදී කළමනාකරණ අභ්‍යාසලාභියෙකු ලෙස මහජන බැංකුව සමඟ එක්වූ එතුමිය, මේ වනවිට මූල්‍ය අංශයේ වසර 18කට වැඩි පළපුරුද්දක් ද, උපායමාර්ගික සැලසුම්කරණය, කාර්යසාධන කළමනාකරණය සහ පර්යේෂණ දෙපාර්තමේන්තුවේ වසර 2ක කාලයක් ද, ක්‍රියාවලි කළමනාකරණය සහ ගුණාත්මකභාවය සහතික කිරීමේ දෙපාර්තමේන්තුව සහ මහජන කාඩ්පත් මධ්‍යස්ථානයේ වසර තුනක පමණ පළපුරුද්දක් ද සහිතව බැංකුවේ වසර 24ක පලපුරුද්දකට හිමිකම් කියයි.

මූල්‍ය දෙපාර්තමේන්තුවේ සේවා කාලය තුළ ඇය නියෝජ්‍ය මූල්‍ය ප්‍රධානියා ලෙස බැංකුවේ කාර්ය සාධනය වැඩි කිරීමට දායක වූ සුවිශේෂ කාර්යයන් රැසක් ඉටු කර ඇත. සහකාර සාමාන්‍යාධිකාරිවරිය ලෙස, උපායමාර්ගික සැලසුම්කරණය, කාර්ය සාධන කළමනාකරණය සහ පර්යේෂණ දෙපාර්තමේන්තුවේ සේවා කාලය තුළ බැංකුවේ උපායමාර්ගික සැලැස්ම නිර්මාණය කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා ඇය ඵලදායී ලෙස කටයුතු කළාය. ක්‍රියාවලි කළමනාකරණය සහ තත්ත්ව සහතික කිරීමේ දෙපාර්තමේන්තුවේ ඇයගේ සේවා කාලය තුළ ඇය ලීන් කළමනාකරණය පිළිබඳ සුදුසුකම් ලබා ඇති අතර ක්‍රියාවලි වැඩිදියුණු කිරීම් සංවර්ධනය කිරීම සහ තත්ත්ව සහතිකය පවත්වා ගැනීම සඳහා ලීන් කළමනාකරණ (ලීන් ශ්‍රීන් බෙල්ට්) පුහුණු වැඩසටහන් පැවැත්වීම මගින් බැංකුවට සේවය කර ඇත. තවද සිය සේවා කාලය තුළ පීපල්ස් කාඩ් මධ්‍යස්ථානයේ සංවර්ධනය සහ එහි ණය කළඹ වර්ධනය සඳහා ද ඇය කටයුතු කර ඇත. ප්‍රවර්ධන ව්‍යාපාර, ප්‍රවර්ධන වැඩසටහන් සහ පුහුණු සැසි ආදී ක්‍රියාකාරකම් මගින්, පීපල්ස් කාඩ් මධ්‍යස්ථානයේ කාර්ය සාධනයට නව සම්මතයක් ඇය නිර්මාණය කර ඇත.

නිල්මිණි ප්‍රේමලාල් මහත්මිය දෙවන පංතියේ ඉහළ (Second Class Upper) ගෞරව සාමාර්ථයක් සමඟ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ B.Sc. විශේෂ උපාධියක් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ලබා ඇති අතර, කැලණිය විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ MBA උපාධියක්ද හිමි කරගෙන ඇත.

ඇය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සහ ශ්‍රී ලංකා කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ අධි සාමාජිකාවකි. 2009 සිට ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ (IBSL) ආශ්‍රිත සාමාජිකාවක් වූ ඇය, පසුගිය වසරේදී ජ්‍යෙෂ්ඨ අධි සාමාජිකාව ලෙස ගෞරවයට පාත්‍ර විය. ඇය ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ බාහිර දේශන පවත්වමින් බැංකුකරුවන්ට දැනුම බෙදා දීමට දායක වී ඇත. එමෙන්ම, Institute of Lean Management (ILM) විසින් පිරිනමන Lean Green Belt සහතික පාඨමාලාව ඇය සාර්ථකව සම්පූර්ණ කර ඇත.ඇය ශ්‍රී ලංකා වෘත්තීය බැංකුකරුවන්ගේ සංගමයේ සාමාජිකාවක් වන අතර, CIMA (UK) පාඨමාලාව අර්ධ වශයෙන් සම්පූර්ණ කර ඇත.

ඇය මීන් පෙර Peoples Merchant බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකාවක් ලෙස සේවය කර ඇති අතර, එම කාලය තුළම එහි අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ සභාපතිනිය ලෙසද කටයුතු කර ඇත. වර්තමානයේ, ඇය People's Micro-Commerce Ltd හි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකාවක් ලෙස සේවය කරන අතර, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ පාලක මණ්ඩලය සඳහා විකල්ප අධ්‍යක්ෂවරියක් ලෙසද කටයුතු කරයි.



ටී එම් ඩබ්ලිව් චන්ද්‍රකුමාර මහතා

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – පද්ධති කළමනාකරණය හා තත්ත්ව සහතික

චන්ද්‍රකුමාර මහතා 1994 වසරේ මහජන බැංකුවේ කළමනාකරණ අභ්‍යාසලාභියෙකු ලෙස සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළ අතර,මේ වන විට බැංකු ක්ෂේත්‍රයේ වසර 31කට අධික පළපුරුද්දක් ලබා ඇත. ඔහු දැනට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – ක්‍රියාවලි කළමනාකරණය හා තත්ත්ව සහතිකය ලෙස සේවය කරයි.

සිය වෘත්තීය ගමන පුරාවට, දේශීය සහ ජාත්‍යන්තර මට්ටමින් පැවැති පුහුණු වැඩසටහන් රැසකට සහභාගී වී ඇති අතර, ව්‍යාපාර බැංකු කළමනාකරණ පිළිවෙත් පිළිබඳ පුළුල් හා ගැඹුරු දැනුමක් අත්කරගෙන ඇත. 2018 සිට 2020 අවසානය දක්වා, චන්ද්‍ර කුමාර මහතා සැපයුම්, ප්‍රවාහනය, ආරක්ෂාව, ඉංජිනේරුකරණ නඩත්තුව, ගොඩනැගිලි ඉංජිනේරුකරණය, සහ ප්‍රකාශයට පත් කිරීම යන දෙපාර්තමේන්තු හය පාලනය කරමින් සහකාර සාමාන්‍යාධිකාරී (බැංකු සහය සේවා) තනතුර දැරීය. මෙම කාලසීමාව තුළ, ප්‍රවාහනය සහ ආරක්ෂක ක්‍රියාපටිපාටිවලට අමතරව ප්‍රසම්පාදනය, ඉදිකිරීම් සහ නඩත්තුව, ගබඩා සහ තොග පාලනය පිළිබඳ මනා පළපුරුද්දක් ලබාගෙන ඇත.

2020 සිට 2023 දක්වා, ඔහු සහකාර සාමාන්‍යාධිකාරී (තොරතුරු තාක්ෂණ පරිපාලනය හා ව්‍යාපාර සහාය) සහ සහකාර සාමාන්‍යාධිකාරී (බෙදාහැරීම් නාලිකා කළමනාකරණය) ලෙස කටයුතු කළේය. මෙම භූමිකාවන් තුළ, ශාඛා ජාලය පුරා 5S පද්ධතිය ක්‍රියාත්මක කිරීම සහ CEFT මෙහෙයුම් කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් මනා පළපුරුද්දක් ඔහු අත්කරගෙන ඇත.

චන්ද්‍රකුමාර මහතා කැලණිය විශ්වවිද්‍යාලයෙන් BCom (විශේෂ) පිළිබඳ දෙවන පන්තියේ ඉහළ අංශයේ උපාධියක් සහ සැපයුම් දාම කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර ඩිප්ලෝමාවක් (ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානය/WTO (UNCTAD), ජිනීවා, ස්විට්සර්ලන්තය) ලබා ඇත. ඔහු ඕස්ට්‍රේලියාවේ සහතික කළ කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ (CMA), ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (LICA) බලපත්‍රලාභියෙකි, තවද ශ්‍රී ලංකාවේ ගිණුම්කරණ කාර්මිකයන්ගේ (MAAT) සාමාජිකයෙකි. ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ (AIB) සාමාජිකයෙකි. මීට අමතරව, ඔහු ශ්‍රී ලංකා සැපයුම් සහ ද්‍රව්‍ය කළමනාකරණ ආයතනයේ (MISMM) ආයතනික සාමාජිකයෙකි.

චන්ද්‍රකුමාර මහතා 2022 දෙසැම්බර් මාසයේ සිට ATM, CDM, CRM සහ KIOSK වලින් සමන්විත ශාඛා ජාලයේ නියාමන ඒකක 743ක් ඇතුළත් සේවා බෙදා හැරීමේ නාලිකා භාරව සිටී. වර්තමානයේ දී, ඔහු ක්‍රියාවලි සංවර්ධනයට සහ බැංකු සේවාවන්ගේ ගුණාත්මකභාවය උසස් කිරීම සඳහා සක්‍රීයව දායක වෙමින් සිටියි.



සමන්ති සේනානායක මහත්මිය

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – අනුකූලතා

සමන්ති සේනානායක මහත්මිය නීතීඥවරියක ලෙස වසර 30ක පළපුරුද්දක් ඇති නීති වෘත්තිකයෙකි. ඇය ඉන්දියාවේ දිල්ලි විශ්වවිද්‍යාලයෙන් නීතිපති උපාධියක් ද (LL.M) ලබා ඇත. ඊට අමතරව, ඇය අනුකූලතා අංශයන්හි වෘත්තීය සුදුසුකම් සාර්ථකව සම්පූර්ණ කර ඇති අතර මැන්චෙස්ටර් විශ්ව විද්‍යාලය සමඟ සහයෝගයෙන් ජාත්‍යන්තර අනුකූලතා සංගමය මගින් ජාත්‍යන්තර අනුකූලතා ඩිප්ලෝමාවද ඇයට ප්‍රදානය කර ඇත.

සමාගම් ලේකම්වරියක් ලෙස සිය නීති වෘත්තිය ආරම්භ කළ සේනානායක මහත්මිය එතැන් සිට තනි පුද්ගල වෘත්තිකයෙකු ලෙස සහ ආයතනික අංශයේ සාමාජිකාවක් ලෙස දශක 3කට වැඩි පළපුරුද්දක් ලබා ඇත. 2001 දී සහකාර නීති නිලධාරිනියක් ලෙස මහජන බැංකුවට සම්බන්ධ වූ ඇය වසර 9ක් නීති නිලධාරිනියක් ලෙස සිය රාජකාරී ඉටු කළාය.

2009 මාර්තු 3 දින, සේනානායක මහත්මිය බැංකුවේ අනුකූලතා නිලධාරී තනතුර භාරගත් අතර පසුව ඇය නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – අනුකූලතා ලෙස 2023 අප්‍රේල් 28 දින උසස් කරන ලදී.

ඇය ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාලය (CRIB) වෙත බැංකුවේ අනුකූලතා නිලධාරිනිය ලෙස කටයුතු කරන අතර, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත යටතේ ස්ථාපිත කර ඇති තොරතුරු කමිටුවේ සාමාජිකාවක් ද වේ. ඇය CRIB හි අධ්‍යක්ෂවරියක් ද වන අතර ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ (IBSL) ආදේශක අධ්‍යක්ෂවරියක් ලෙස තවදුරටත් කටයුතු කරයි. අනුකූලතා සංගමයේ (බැංකු නිලධාරීන්ගේ) විධායක සාමාජිකාවක් ද වන අතර CRIB හි උපදේශක කමිටුවේ සභාපතිනිය ද වේ.



ෂමීලා සේනාරත්න ලොකු කලුගේ මහත්මිය

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී –
භාණ්ඩාගාර, ජාත්‍යන්තර සහ ආයෝජන

ෂමීලා සේනාරත්න ලොකු කලුගේ මිය 2002 වසරේදී කළමනාකරණ අභ්‍යාසලාභියෙකු ලෙස මහජන බැංකුවට එක්වෙමින් සිය වෘත්තිය ආරම්භ කළාය. බැංකුවේ භාණ්ඩාගාර ඒකකය තුළ වසර 24කට වැඩි අත්දැකීම් හිමි ඇය, භාණ්ඩාගාර ඉදිරි කාර්යාලයේ (TFO) සියලුම ක්ෂේත්‍රවල පුළුල් දැනුමක් සහ විශාල අත්දැකීම් ලබාගෙන ඇත. 2011 සිට 2022 දක්වා කාලය තුළ, ඇය ප්‍රාථමික වෙළෙඳ ඒකකය (PDU) ඇතුළු TFO හි විවිධ අංශවල නියෝජිතවරියක් ලෙස සේවය කළාය. 2017 සිට ඇය භාණ්ඩාගාර ඒකකය සහ PDU හි සමස්ත කාර්යයන් අධීක්ෂණය කරමින් කටයුතු කර ඇත.

2023 වසරේදී භාණ්ඩාගාරය, ආයෝජන බැංකු සහ මූල්‍ය ආයතන සඳහා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරිය ලෙස රාජකාරී භාරගත් ඇය එම භූමිකාවේදී, විදේශ විනිමය, මුදල් වෙළඳපොළ, ප්‍රාථමික වෙළෙඳ ඒකකය සහ ආයෝජන බැංකු ඒකකයේ මෙහෙයුම් නායකත්වය දරමින්, සමගාමීව දේශීය හා ජාත්‍යන්තර මූල්‍ය ආයතන සමඟ බැංකුවේ සබඳතා කළමනාකරණය කරන මූල්‍ය ආයතන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා ලෙසද වගකීම් ඉටු කළාය.

ලොකු කළුගේ මහත්මිය බැංකුව නියෝජනය කරන අභ්‍යන්තර හා බාහිර කමිටු කිහිපයක ප්‍රධාන සාමාජිකාවක් වන අතර නායකත්වය සංවර්ධනය, භාණ්ඩාගාර මෙහෙයුම්, ආයෝජන බැංකුකරණය, වාර්තාකරු බැංකුකරණය සහ ජාත්‍යන්තර වෙළඳ මූල්‍ය වැනි ක්ෂේත්‍ර රාශියක් ආවරණය වන පරිදි දේශීය හා විදේශීය සම්මන්ත්‍රණ, වැඩමුළු සහ සම්මන්ත්‍රණවලට මෙන්ම බැංකුවේ දේශීය හා විදේශීය වාර්තාකරු නියෝජිතයන් සමඟ ව්‍යාපාරික රැස්වීම්වලට සහභාගී වී ඇත.

ඇය කැලණිය විශ්වවිද්‍යාලයෙන් දෙවන පන්තිය ඉහළ සමාර්ථයක් සමඟ ජීව විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය සහ කොළඹ විශ්වවිද්‍යාලයෙන් පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය මෙන්ම එක්සත් රාජධානියේ කාර්ඩිෆ් මෙට්‍රොපොලිටන් විශ්වවිද්‍යාලයෙන් ගෞරවය සහිත ව්‍යාපාර පරිපාලනවේදී (මූල්‍ය) උපාධිය ලබාගෙන ඇත. ඊට අමතරව, ඇය ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයෙන් භාණ්ඩාගාරය, ආයෝජනය සහ අවදානම් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව සහ ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා ඇති අතර එහි ජ්‍යෙෂ්ඨ අධි සාමාජිකාවකි. ඇය ACI Dealing Certificate හි විශිෂ්ටත්වයක් ලබා ඇති අතර, ප්‍රංශයේ ACI Financial Markets Association විසින් ප්‍රදානය කරන ACI Online FX Global Code සහතිකපත්‍රය ද ලබාගෙන ඇත.

ලොකු කළුගේ මහත්මිය 2017 දී ප්‍රාථමික අලෙවිකරුවන්ගේ සංගමයේ (Association of Primary Dealers – APD) අධ්‍යක්ෂවරියක් ලෙස පත් කරන ලදී. 2020 සිට APD හි ලේකම්වරිය ලෙසත්, 2023 සිට උප සභාපතිනිය ලෙසත් සේවය කළ ඇය, වර්තමානයේ APD හි සභාපතිනියයි. ඇය ශ්‍රී ලංකා විදේශ විනිමය සංගමය, බැංකුකරුවන්ගේ වෙළඳ මූල්‍ය සංගමය සහ වෘත්තීය බැංකුකරුවන්ගේ සංගමය යන සංවිධානවල සාමාජිකත්වය දරයි. එසේම, ඇය ජාත්‍යන්තර වාණිජ මණ්ඩලයේ ශ්‍රී ලංකා ශාඛාවේ (International Chamber of Commerce Sri Lanka – ICCSL) බැංකු කමිටුවේ සාමාජිකාවක් වන අතර, බැංකුවේ ප්‍රධාන නියෝජිතවරිය ලෙසද කටයුතු කරයි. ඇය 2025 පෙබරවාරි මාසයේ සිට People's Leasing & Finance PLC හි අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරියක් ලෙස සේවය කරයි. මීට පෙර, 2024 අගෝස්තු සිට දෙසැම්බර් දක්වා කාලය තුළ People's Travels (Pvt) Ltd හි අධ්‍යක්ෂවරියක් ලෙස ද කටයුතු කළාය.



එන් එච් විජයවර්ධන මහතා

අලෙවිකරණ ප්‍රධානී

නාලක මහතා ශ්‍රී ලංකාවේ සහ කැනඩාවේ බැංකු ක්ෂේත්‍රවල වසර 30කට වැඩි පළපුරුද්දක් ඇති අලෙවිකරණ විශේෂඥයෙකි. ඔහුගේ බැංකු ජීවිතය තුළ ඔහු උපාය මාර්ගික අලෙවිකරණ සැලසුම්කරණය, සන්නාම කළමනාකරණය, ආයතනික රූප ගොඩනැගීම, ක්‍රෙඩිට් කාඩ් අලෙවිකරණය සහ ව්‍යාපාර බැංකුකරණ නිෂ්පාදන කළමනාකරණය වැනි ක්ෂේත්‍රවල විශේෂීකරණ දැනුමක් ලබාගෙන ඇත.

මහජන බැංකුවට සම්බන්ධ වීමට පෙර, ඔහු Pan Asia Banking Corporation හි නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – අලෙවිකරණය සහ පුද්ගලික බැංකුකරණය හෙබවූ අතර Pan Asia බැංකු සංස්ථාවේ ප්‍රධාන අලෙවි නිලධාරී තනතුර සහ ටොරොන්ටෝහි Canadian Imperial Bank of Commerce (CIBC) හි මුදල් කළමනාකරණ සේවා සඳහා නිෂ්පාදන කළමනාකරු වැනි ප්‍රධාන තනතුරු හෙබවීය. වල. ඔහු මීට පෙර Sampath Bank PLC හි ජ්‍යෙෂ්ඨ අලෙවි නිලධාරියෙකු ලෙස ද සේවය කර ඇත. ඔහු එක්සත් රාජධානියේ වරලත් අලෙවිකරණ ආයතනයේ (FCIM) අධි සාමාජිකයෙකි.



නලීන් පතිරණගේ මහතා

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – ශාඛා කටයුතු කළමනාකරණය

නලීන් පතිරණගේ මහතා 2023 වසරේ සිට මහජන බැංකුවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – ශාඛා කටයුතු කළමනාකරණය, ලෙස සේවය කරයි. මෙම භූමිකාවේදී, ඔහු ශ්‍රී ලංකාවේ විශාලතම බැංකු ජාලයන් සඳහා උපායමාර්ගික නායකත්වය හා මෙහෙයුම් අධීක්ෂණය සපයයි.

ඔහු දිවයින පුරා පිහිටි ATM යන්ත්‍ර 844ක්, CDM/CRM යන්ත්‍ර 337 ක් සහ ස්වයං බැංකු ඒකක 307 ක් (Self-Banking Units – SBUs) යන ශක්තිමත් ස්වයං-සේවා යටිතල පහසුකම් මගින් සහාය ලබන ශාඛා සහ සේවා මධ්‍යස්ථාන 742 කින් සමන්විත වන බැංකුවේ සමස්ත පුළුල් බෙදාහැරීමේ ජාලය කළමනාකරණය කරයි. ඔහුගේ වගකීම් ක්ෂේත්‍රයට මෙහෙයුම් පාලනය, සේවා උත්කෘෂ්ටත්වය, බෙදාහැරීම් නාලිකා උපරිමකරණය සහ දේශය පුරා ව්‍යාපාර කාර්යසාධන කළමනාකරණය ඇතුළත් වේ.

මහජන බැංකුවේ වසර 24කට වැඩි කාලයක් ඇතුළුව,බැංකු ක්ෂේත්‍රයේ වසර 25කට වැඩි පළපුරුද්දක් ඇති පතිරණගේ මහතා, 2002 දී කළමනාකරණ අභ්‍යාසලාභියෙකු ලෙස සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළේය. වසර ගණනාවක් පුරා ඔහු ශාඛා බැංකුකරණය, නිෂ්පාදන සංවර්ධනය සහ ණය කළඹ කළමනාකරණය යන ක්ෂේත්‍රවල විවිධ නායකත්ව භූමිකාවන් ඉටු කර ඇති අතර, පුද්ගල කේන්ද්‍රගත මෙහෙයුම් සහ උපායමාර්ගික ව්‍යාපාර සංවර්ධනය පිළිබඳ ගැඹුරු දැනුමක් හා විශේෂඥතාවයක් ලබාගෙන ඇත.

පතිරණගේ මහතා මාතලේ සහ ගම්පහ කලාප සඳහා ප්‍රාදේශීය කළමනාකරු ලෙස වසර පහකට වැඩි කාලයක් සේවය කර ඇති අතර, එහිදී ඔහු ව්‍යාපාර වර්ධනය සාර්ථකව මෙහෙයවීමට, වෙළඳපල ස්ථානගත කිරීම ශක්තිමත් කිරීමට සහ නව්‍ය හා කාර්ය සාධනය මත පදනම් වූ මූලපිරීම් හරහා මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමට සමත් විය.

මහජන බැංකුවේ සිය විධායක වගකීම්වලට අමතරව, පතිරණගේ මහතා මහජන බැංකුවේ අනුබද්ධිත ආයතනයක් වන පීපල්ස් ලීසිං හැවිලොක් ප්‍රොපර්ටීස් ලිමිටඩ් හි සභාපතිවරයා ලෙස කටයුතු කරන අතර උපායමාර්ගික නායකත්වය සහ පාලන අධීක්ෂණය සපයයි. 2026 ජනවාරි 29 වන දින සිට ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාශයේ (CRIB) අධ්‍යක්ෂ මණ්ඩලයේ විකල්ප අධ්‍යක්ෂවරයා ලෙස ද ඔහු පත් කරන ලද අතර, එමඟින් පුළුල් මූල්‍ය සේවා අංශයට සහ ජාතික ණය යටිතල පහසුකම් සඳහා ඔහුගේ දායකත්වය පුළුල් කර ඇත.

පතිරණගේ මහතා කොළඹ විශ්වවිද්‍යාලයෙන් BSc (ගෞරව) - දෙවන පන්තියේ ඉහළ අංශයෙන් උපාධියක් සහ එක්සත් රාජධානියේ බෙඩ්ෆර්ඩ්ෂයර් විශ්වවිද්‍යාලයෙන් අලෙවිකරණය පිළිබඳ MBA උපාධියක් ලබා ඇත. ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ (FMIBSL) සාමාජිකයෙකි.

ඔහුගේ ආයතනික වගකීම්වලට අමතරව, ඔහු පුහුණුකරුවෙකු, අභිප්‍රේරකයෙකු සහ සම්පත්දායකයෙකු ලෙස ක්‍රියාකාරීව දායක වන අතර, බැංකුවේ උපායමාර්ගික දැක්මට අනුකූලව ක්‍රියාශීලී, ගතික සහ ඉහළ කාර්යසාධනයක් සහිත ශාඛා ජාලයක් ශ්‍රම බලකායක් සංවර්ධනය කිරීමේදී ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි.



තුෂාරි හේවාවසම් මහත්මිය

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – වාණිජ ණය

තුෂාරි හේවාවසම් මහත්මිය වර්තමානයේ මහජන බැංකුවේ වාණිජ ණය පිළිබඳ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරිය ලෙස සේවය කරයි. මෙම පත්වීමට පෙර, ඇය ජාත්‍යන්තර බැංකුකරණය පිළිබඳ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තනතුර දැරුවාය.

2002 දී කළමනාකරණ අභ්‍යාසලාභිනියක් ලෙස මහජන බැංකුවේ සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළ ඇය, එතැන් සිට ණය, ශාඛා බැංකුකරණය, ආයතනික බැංකුකරණය සහ ජාත්‍යන්තර බැංකුකරණය ඇතුළු ප්‍රධාන ක්‍රියාකාරී ක්ෂේත්‍ර හරහා වසර 23 කට වැඩි පුළුල් බැංකුකරණ අත්දැකීම් ලබා ඇත. ආයතනික හා ව්‍යාපාර ණය දීමේ ක්ෂේත්‍රයේ ඇයගේ වෘත්තීය ප්‍රවීණතාවය දශක දෙකකට වැඩි කාලයක් පුරා විහිදෙන අතර, ගැඹුරු තාක්ෂණික දැනුමක් සහ ශක්තිමත් නායකත්ව හැකියාවක් පිළිබිඹු කරයි. 2015 සිට, හේවාවසම් මහත්මිය ණය සහ වෙළඳ මූල්‍ය පුහුණුව සඳහා අභ්‍යන්තර සම්පත්දායකවරියක් ලෙසද සේවය කර ඇති අතර, බැංකුව තුළ ධාරිතා වර්ධනය සහ කාර්ය මණ්ඩල සංවර්ධනය සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇත.

හේවාවසම් මහත්මිය පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධියක් (දෙවන පන්තියේ ඉහළ අංශ ගෞරව) සහ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයෙන් MBA උපාධියක් ලබා ඇත. ඇය වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (FCMA), එක්සත් රාජධානිය සහ වරලත් ගෝලීය කළමනාකරණ ගණකාධිකාරිවරුන්ගේ (CGMA) සාමාජිකාවක් වන අතර ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ (BSL)සාමාජිකාවකි.

ඇගේ විධායක වගකීම් වලට අමතරව, දැනට පීපල්ස් ඉන්ෂුවරන්ස් පීවිල්සී, පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් ලිමිටඩ් සහ ලංකා මූල්‍ය සේවා කාර්යාංශයේ අධ්‍යක්ෂවරියක ලෙස ද සේවය කරයි. වෘත්තීය නායකත්වය සහ පාලනය කෙරෙහි දැඩි කැපවීමක් පෙන්නුම් කරමින්, හේවාවසම් මහත්මිය වෘත්තීය බැංකුකරුවන්ගේ සංගමයේ (APB) කවුන්සිල සාමාජිකාවක් සහ ශ්‍රී ලංකා ජාත්‍යන්තර වාණිජ මණ්ඩලයේ (ICC ශ්‍රී ලංකා) හිටපු මණ්ඩල සාමාජිකාවක් ලෙස ද කටයුතු කරයි.



අනුර පෙරේරා මහතා

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී –
අවදානම් කළමනාකරණ

බැංකුවේ වර්තමාන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – අවදානම් කළමනාකරණ ලෙස සේවය කරන අනුර පෙරේරා මහතා පළපුරුදු බැංකුකරණ වෘත්තිකයෙකි. 1991 දී සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළ ඔහු ශාඛා බැංකුකරණය, ප්‍රාදේශීය පරිපාලනය, භාණ්ඩාගාර මෙහෙයුම්, අවදානම් කළමනාකරණය සහ ණය පාලනය පිළිබඳ පුළුල් අත්දැකීම් වලට හිමිකම් කියයි.

තවද, අනුර පෙරේරා මහතා බංග්ලාදේශයේ People's Leasing & Finance PLC (PLFPLC) සහ Alliance Finance PLC (AFPLC) හි අධ්‍යක්ෂවරයෙකු ලෙස සහ People's Leasing Fleet Management Ltd. හි සභාපති ලෙස සේවය කරයි. අවදානම් කළමනාකරණය, ණය කළමනාකරණය සහ භාණ්ඩාගාර මෙහෙයුම් පිළිබඳ ඔහුගේ විශේෂඥතාව උපයෝගී කරගනිමින්, ඔහු AFPLC හි මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ (BIRMC) සභාපති ලෙස සහ PLFPLC හි BIRMC සාමාජිකයෙකු ලෙස සේවය කරයි. ඊට අමතරව, ඔහු ආයෝජන කමිටුවේ, අධ්‍යක්ෂ මණ්ඩලයේ තිරසාර කමිටුවේ සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ කමිටුවේ සාමාජිකයෙකු ලෙස කටයුතු කරයි.

පෙරේරා මහතා කැලණිය විශ්වවිද්‍යාලයෙන් කළමනාකරණ උපාධියක් සහ කොළඹ විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර අධ්‍යයන ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇත.

ඔහු පැරිසියේ මූල්‍ය වෙළඳපොළ සංගමය විසින් ප්‍රදානය කරන ලද ACI–Operations සහතිකය විශිෂ්ට සාමාර්ථයක් සමඟ ලබාගෙන ඇති අතර,ACI Online FX Global Code සහතිකයද හිමි කරගෙන ඇත. තවද, ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ අධි සාමාජිකයෙකි.

ඔහු නායකත්ව සංවර්ධනය, අවදානම් කළමනාකරණය, භාණ්ඩාගාර මෙහෙයුම් සහ ණය කළමනාකරණය ආවරණය වන පරිදි දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු රාශියකට සහභාගී වී ඇත. 2024 දී, පෙරේරා මහතා සිංගප්පූරුවේ ජාතික විශ්වවිද්‍යාලය විසින් පවත්වන ලද නායකත්ව සංවර්ධන වැඩසටහන සාර්ථකව නිම කළ අතර, 2025 දී, ඔහු ජර්මනියේ කාල්ස්රුහි පැවති වාර්ෂික ගෝලීය තිරසාර මූල්‍ය සමුළුවට සහභාගී විය. එය තිරසාර සංවර්ධනය සඳහා වූ යුරෝපීය සංවිධානය විසින් සංවිධානය කරන ලද්දකි. ඔහු බැංකු අංශයේ අවදානම් වෘත්තිකයන්ගේ සංගමය (Association of Banking Sector Risk Professionals), ශ්‍රී ලංකා විදේශ විනිමය සංගමය සහ වෘත්තීය බැංකුකරුවන්ගේ සංගමය යන ආයතනවල සාමාජිකත්වය ද දරයි.



ඒ යූ ඒ අන්සාර් මහතා

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
ණය අයකරගැනීම්

අහමඩ් අන්සාර් මහතා 1993 දී බැංකුවේ මාණ්ඩලික සහකාරවරයෙකු ලෙස සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළ අතර ශාඛා බැංකුකරණය, ප්‍රාදේශීය කළමනාකරණය, අලෙවිකරණය, බෙදාහැරීම් නාලිකා කළමනාකරණය, ණය සමාලෝචනය සහ අයකර ගැනීම් යන ක්ෂේත්‍රවල වසර 30කට වැඩි පළපුරුද්දක් ලබා ඇත. ඔහු බෙදාහැරීම් නාලිකා කළමනාකරණය සහ අලෙවිකරණය පිළිබඳ ද විශිෂ්ඨ කුසලතා පෙන්නුම් කර ඇත.

අන්සාර් මහතා ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයෙන් භෞතික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධියක් ලබා ඇති අතර ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ සහකාර සාමාජිකයෙකි. තවද ඔහු බැංකුවට සම්බන්ධ වීමට පෙර කැලණිය විශ්වවිද්‍යාලයේ සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සහකාර කථිකාචාර්යවරයෙකු ලෙස කටයුතු කළේය. ඔහු ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ බැංකුකරණය සහ මූල්‍ය පිළිබඳ අවසන් වසරේ සිසුන් සඳහා ආරාධිත කථිකාචාර්යවරයෙකු ලෙසද දේශන පැවැත්වීය.

මීට අමතරව ඔහු ඉන්දියාව, ජපානය, මැලේසියාව, එක්සත් අරාබි එමීර් රාජ්‍යය සහ මාලදිවයින යන රටවල විදේශ පුහුණු හා වෘත්තීය අත්දැකීම් වැඩසටහන් රැසකට සහභාගී වී ඇත. ඔහු මහජන බැංකුවේ අනුබද්ධිත පීපල්ස් ට්‍රැවල්ස් (පුද්ගලික) සමාගමේ අධ්‍යක්ෂවරයෙකු ලෙසද සේවය කරයි.



ඩී එම් මංජුල දිසානායක මහතා

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – මානව සම්පත්

මහජන බැංකුවේ මානව සම්පත් පිළිබඳ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ලෙස දැනට සේවය කරන දිසානායක මහතා, බැංකු මෙහෙයුම් ක්ෂේත්‍රයේ වසර 34කට වැඩි පළපුරුද්දක් සහ ගැඹුරු දැනුමක් ලබා ඇත්තෙකි.

1990 දී බැංකුවට සම්බන්ධ වූ දා සිට, ඔහු ශාඛා බැංකුකරණය, තොරතුරු තාක්ෂණය සහ මානව සම්පත් ඇතුළු බහු ක්‍රියාකාරී ක්ෂේත්‍ර හරහා සේවය කර ඇත. මහජන බැංකුවේ ශාඛා ජාලයේ ඔහුගේ වෘත්තීය ගමන් මඟ, ශාඛා කළමනාකරුවෙකු ලෙස ආරම්භ වී ප්‍රාදේශීය කළමනාකරු දක්වා සහ පසුව ප්‍රධාන කාර්යාල මට්ටමින් සහකාර සාමාන්‍යාධිකාරී සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී යන විධායක තනතුරු දක්වා පියවරෙන් පියවර උසස් වූ වෘත්තීය ගමන් මඟක් පෙන්නුම් කරයි. සහකාර සාමාන්‍යාධිකාරී (මානව සම්පත්) ලෙස සේවා කාලයෙන් පසුව දිසානායක මහතා 2024 මැයි මාසයේදී නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – මානව සම්පත් තනතුරට පත් විය, ඔහු ආයතනයේ පුළුල් මානව සම්පත් පරිපාලන කටයුතු අධීක්ෂණය කළේය.

කැපී පෙනෙන සුදුසුකම් වලින් සමන්විත ඔහුගේ වෘත්තීය පසුබිමතුළ , නෝර්තැම්ප්ටන් විශ්වවිද්‍යාලයෙන් මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් (MAHRM), බෙඩ්ෆෝර්ඩ්ෂයර් විශ්වවිද්‍යාලයෙන් අලෙවිකරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් (MBA) සහ කොළඹ විශ්වවිද්‍යාලයෙන් සේවා කළමනාකරණය පිළිබඳ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් (MSc) අන්තර්ගත අතර ඊට අමතරව, ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ සාමාජිකයෙකි.



ඩබ්ලිව් ඩී ඒ බී ලියනගුණවර්ධන මහත්මිය

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී පුද්ගල කේන්ද්‍ර බැංකුකරණය සහ එතෙර ගනුදෙනුකාර සේවා

අරුණි ලියනගුණවර්ධන මහත්මිය මහජන බැංකුවේ පුද්ගල කේන්ද්‍ර බැංකුකරණය සහ විදෙස් පාරිභෝගික සේවා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරිය ලෙස සේවය කරයි පුද්ගල කේන්ද්‍ර බැංකු මෙහෙයුම් සහ නිෂ්පාදන සංවර්ධනය සඳහා උපායමාර්ගික නායකත්වය සපයන අතර, පාරිභෝගික කේන්ද්‍රීය වර්ධනය, නිෂ්පාදන නවෝත්පාදනය සහ තිරසාර පුද්ගල කේන්ද්‍ර ව්‍යාපාර ව්‍යාප්තිය කෙරෙහි දැඩි අවධානයක් යොමු කරයි.

2002 දී කළමනාකරණ අභ්‍යාසලාභියෙකු ලෙස ඇය බැංකුවට සම්බන්ධ වූ අතර විදේශ ප්‍රේෂණ, Vostro වාර්තාකරණ සබඳතා, බෙදාහැරීම් නාලිකා සහ ශාඛා කළමනාකරණය, තොරතුරු තාක්ෂණ ව්‍යාපාර සහාය සහ පරිපාලනය සහ පුද්ගල කේන්ද්‍රීය ණය කළඹ උපායමාර්ගිකව පුළුල් කිරීම සහ අධීක්ෂණය ඇතුළු ප්‍රධාන බැංකු කාර්යයන් හරහා වසර 24කට ආසන්න අත්දැකීම් ලබා ඇත. ජාත්‍යන්තර ප්‍රේෂණ, ප්‍රේෂණ පද්ධති සහ මූලික බැංකුකරණ වේදිකා පිළිබඳ දශක දෙකකට අධික විශේෂඥ දැනුමක් ඇති ඇය, බැංකුවේ සේවා විශිෂ්ටත්වය වැඩිදියුණු කිරීමට සහ විදේශීය පාරිභෝගික අංශය සඳහා එහි වටිනාකම් යෝජනාව ශක්තිමත් කිරීමට වැදගත් කාර්යභාරයක් ඉටු කර ඇත.

ලියනගුණවර්ධන මහත්මිය ඉන්දියාවේ ඔස්මානියා විශ්වවිද්‍යාලයෙන් පළමු පන්තියේ විද්‍යාවේදී උපාධියක්, ශ්‍රී ලංකාවේ කැලණිය විශ්වවිද්‍යාලයෙන් විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් සහ එක්සත් රාජධානියේ නෝර්තැම්ප්ටන් විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් විශිෂ්ටත්වයක් සහිතව ලබා ඇත. ඇය ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකාවක් ද වේ.

People's Leasing Property Development Limited හි සභාපතිනිය ලෙසද කටයුතු කරන ලියනගුණවර්ධන මහත්මිය සිය වෘත්තීය වගකීම්වලට අමතරව, විවිධ කළමනාකරණ සහ මෙහෙයුම් කමිටු සහ වෘත්තීය සංවිධානවල සහභාගිත්වය තුළින් බැංකුවට සහ බැංකු කර්මාන්තයට ක්‍රියාකාරිව දායක වේ. ඇය ශ්‍රී ලංකා වෘත්තීය සංගම් සංවිධානය (OPA) පොදු සංසදයේ සාමාජිකාවක් ලෙස සහ වෘත්තීය බැංකුකරුවන්ගේ සංගමය (APB) කවුන්සිල සාමාජිකාවක් ලෙසද කටයුතු කරයි.







සධානා පෙරේරා මහත්මිය

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී –
ආයතනික බැංකුකරණය

මහජන බැංකුවේ ආයතනික බැංකු අංශයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ලෙස කටයුතු කරන සධානා පෙරේරා මහත්මිය බැංකු හා ආයතනික අංශවල වසර 23කට අධික වෘත්තීය පළපුරුද්දක් ලබා ඇත. කළමනාකරණ අභ්‍යාසලාභිනියක් ලෙස 2002 දී මහජන බැංකුවට සම්බන්ධ වූ ඇය එතැන් සිට ජ්‍යෙෂ්ඨ නායකත්ව භූමිකාවන් හරහා ඉදිරියට ගමන්කර, ශාඛා මෙහෙයුම්, ජාත්‍යන්තර වෙළඳ මූල්‍ය, අක්වෙරළ බැංකුකරණය සහ ප්‍රමුඛ ආයතනික සේවාදායකයින් සහ රජය සතු ව්‍යවසායන් සමඟ සබඳතා කළමනාකරණය පිළිබඳ ගැඹුරු විශේෂඥතාවයක් ලබා ඇත.

ඇය සිය වෘත්තීය ජීවිතය තුළ, බැංකුවේ ආයතනික හා ජාත්‍යන්තර බැංකු කළඹවල වර්ධනයට සහ කාර්ය සාධනයට සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇත. පෙරේරා මහත්මිය ආයතනික බැංකුකරණය, වාණිජ බැංකුකරණය සහ අක්වෙරළ බැංකුකරණ අංශ හරහා ආයතනික ගනුදෙනුකරුවන් 750කට වැඩි සංඛ්‍යාවක විවිධාංගීකරණය වූ ආයෝජන කළඹක් සාර්ථකව කළමනාකරණය කර ඇති අතර, ශක්තිමත් නායකත්වය සහ උපායමාර්ගික සම්බන්ධතා කළමනාකරණ හැකියාවන් පෙන්නුම් කරයි.

මහජන බැංකුවට සම්බන්ධ වීමට පෙර, පෙරේරා මහත්මිය ඇඟලුම්, නිෂ්පාදන, සේවා සහ තොරතුරු තාක්ෂණ ඇතුළු විවිධ ව්‍යාපාර අංශවල වටිනා අත්දැකීම් ලබා ගත් අතර, එහිදී ඇය විධායක තනතුරු දැරුවාය. මෙම විවිධ පසුබිම සියලු අංශයන්ගෙන් සමන්විත කුසලතා ඇති කිරීමට දායක වී ඇති අතර, සංකීර්ණ බැංකු මෙහෙයුම් කළමනාකරණය කිරීමට සහ ආයතනික සේවාදායකයින් සමඟ ශක්තිමත් සබඳතා වර්ධනය කිරීමට ඇති හැකියාව වැඩි දියුණු කිරීමට දායක වී විය.

පෙරේරා මහත්මිය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් මානව සම්පත් කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධියක් ලබා ඇති අතර, එහිදී ඇය දෙවන පන්තියේ ඉහළ අංශ සාමාර්ථයක් සමඟ උපාධිය ලබා ගත්තාය. ඇය එක්සත් රාජධානියේ කාඩිෆ් මෙට්‍රොපොලිටන් විශ්වවිද්‍යාලයෙන් කුසලතා සහිත ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ද ලබා ගත්තාය. ඊට අමතරව, ඇය ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ අධි සාමාජිකත්වය සහ වෘත්තීය බැංකුකරුවන්ගේ සංගමයේ සාමාජිකාවක් ද වේ.

ඇයගේ විධායක වගකීම් වලට අමතරව, පෙරේරා මහත්මිය වර්තමානයේ පීපල්ස් මයික්‍රෝ කොමර්ස් ලිමිටඩ් හි අධ්‍යක්ෂවරියක් ලෙස සේවය කරන අතර, මූල්‍ය සේවා අංශයට නායකත්වය ලබාදෙමින් පාලනය සඳහා තවදුරටත් දායක වේ.



ඉඳුමිණි රත්නායක මහත්මිය

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී –
බැංකු සහාය සේවා

ඉඳුමිණි රත්නායක මහත්මිය දැනට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිනි – බැංකු සහාය සේවා ලෙස සේවය කරන අතර මෙම තනතුරට පෙර, ඇය 2022 සිට සහකාර සාමාන්‍යාධිකාරිනියක් ලෙස සේවය කරමින්, උපායමාර්ගික සැලසුම් කාර්ය සාධනය සහ පර්යේෂණ, පුද්ගලික බැංකුකරණය සහ බෙදාහැරීම් නාලිකා කළමනාකරණය වැනි ක්ෂේත්‍ර අධීක්ෂණය කළාය.

රත්නායක මහත්මිය 1990 දී බැංකුවෙන් සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළ අතර, සහකාර සාමාන්‍යාධිකාරී තනතුරට පත්වීමට පෙර ශාඛා කළමනාකරු, සහකාර ප්‍රාදේශීය කළමනාකරු සහ ප්‍රාදේශීය කළමනාකරු ඇතුළු විවිධ කළමනාකරණ භූමිකාවන් වල වසර 35කට වැඩි පළපුරුද්දක් ඇත.


ඇය කැලණිය විශ්වවිද්‍යාලයෙන් විද්‍යාවේදී උපාධියක් (B.Sc.), එක්සත් රාජධානියේ බෙඩ්ෆර්ඩ්ෂයර් විශ්වවිද්‍යාලයෙන් මානව සම්පත් කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධියක් (MSc) සහ රජරට විශ්වවිද්‍යාලයෙන් MBA උපාධියක් ලබා ඇත. ඒමෙන්ම ඇය බැංකු හා මූල්‍ය ඩිප්ලෝමාව (DBF) සුදුසුකම් ද ලබා ඇත.

විධායක කළමනාකරණය

ජන සවිබලගැන්වීම උදෙසා සුසැදි, ප්‍රතිභාපූර්ණ කුසලතා සංචිතයක්







01. **ජේ ඒ ඩයස් මහතා**
කාඩ් ප්‍රධානි

02. **කේ ජී පී එම් කාරියවසම් මහතා**
ප්‍රධාන ඩිජිටල් නිලධාරී

03. **ආර් රවිකරන් මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී
(ශාඛා කළමනාකරණ)

04. **එන ඒ වී මුණසිංහ මහත්මිය**
සහකාර සාමාන්‍යාධිකාරිනී
(වාණිජ බැංකුකරණය)

05. **ඩබ්ලිව් එන් ටී පෙරේරා මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී
පුද්ගල කේන්ද්‍රීය බැංකුකරණය
(වත්කම් නිමැවුම්)

06. **වයි කේ රාජපක්ෂ මහතා**
ඉංජිනේරු සේවා ප්‍රධානි

07. **ටී එන් රූබසිංහ මිය**
නියෝජ්‍ය ප්‍රධාන නීති නිලධාරී

08. **එස් ඩී එන් ප්‍රේමදාස මිය**
නියෝජ්‍ය ප්‍රධාන නීති නිලධාරී

09. **ඒ එස් කේ ගඟබඩගේ මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී
(මධ්‍යගත පසුපෙළ කාර්යාලය)

10. **අයි කේ ජී සී කේ බී ඉහළකෝරාළ මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී
(කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර)

11. **අයි කේ ඉන්දික මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී
(ශාඛා කළමනාකරණ)

12. **ඒ ජී ජයසේන මහත්මිය**
සහකාර සාමාන්‍යාධිකාරිනී
(මූල්‍ය)

13. **සී වී එබනීසර් මහත්මිය**
සහකාර සාමාන්‍යාධිකාරිනී
(භාණ්ඩාගාර)

14. **ඩබ්ලිව් ඩබ්ලිව් ටී ආර් ප්‍රනාන්දු මහත්මිය**
සහකාර සාමාන්‍යාධිකාරිනී
(ආයෝජන බැංකුකරණය)

15. **ජී එච් යූ එස් ගුණරත්න මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී
(මානව සම්පත් සංවර්ධන)

16. **ඩී එම් ඩී දිසානායක මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී
(විමර්ශන හා පරීක්ෂණ)

17. **පී ඒ පී ආර් එස් පෙරේරා මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී
(ආයතනික බැංකුකරණ සම්බන්ධතා I)

18. **එල් එන් තේනුවර මහතා**
ප්‍රධාන තොරතුරු ආරක්ෂක නිලධාරී

19. **ඊ පී ඒ සිසිර කුමාර මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී
(බෙදාහැරීම් නාලිකා කළමනාකරණ)

20. **එස් එච් විජේකෝන් මහත්මිය**
සහකාර සාමාන්‍යාධිකාරිනී
(අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්)

21. **එම් ජී අයි ලක්මාල් මහතා**
ව්‍යාපෘති කළමනාකරණ කාර්යාල ප්‍රධානී

22. **බී එස් රණතුංගගේ මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී
(විතෙර ගනුදෙනු සේවාව)

23. **ජී ඒ ඒ රණසිංහ මහත්මිය**
සහකාර සාමාන්‍යාධිකාරිනී
(මානව සම්පත්)

24. **ඒ එම් වී ඩී එල් අධිකාරි මහත්මිය**
සහකාර සාමාන්‍යාධිකාරිනී
(ආයතනික බැංකුකරණ සම්බන්ධතා II)

25. **එම් එස් කනක්කහේවගේ මහතා**
සහායක සාමාන්‍යාධිකාරී
(ව්‍යාපාර පුනර්ජීවන සහ පුනරුත්ථාපනය)

26. **එල් එන් ඒ එන් කේ නිශ්ශංක මෙනෙවිය**
සහායක සාමාන්‍යාධිකාරී
(වාණිජ ණය)

27. **එන් කේ විමලසිරි මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී
(ණය කලාප 2)

28. **එස් එල් එ ඒ එස් සමරතුංග මහතා**
සහායක සාමාන්‍යාධිකාරී
(අයකරගැනීම්)

29. **ඩබ්ලිව් ඩී පී ඩී බුද්ධිකා මහත්මිය**
සහායක සාමාන්‍යාධිකාරිනී
(ණය කලාප 1)

30. **පී ජී එන් පී ලියනගේ මහත්මිය**
සහායක සාමාන්‍යාධිකාරී
(සංවර්ධන හා ක්ෂුද්‍ර මූල්‍ය)

31. **එම් එස් සී පී ටී මාරසිංහ මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී
(ක්‍රියාවලි කළමනාකරණය සහ තත්ත්ව ආරක්ෂණ)

32. **බී එම් ඩී පී බී බස්නායක මහතා**
පද්ධති යෙදවුම් ප්‍රධානි

33. **ඊ ජී එස් ඒ කුලරත්න මහතා**
යටිතල පහසුකම් සහ මෙහෙයුම් ප්‍රධානී

ප්‍රධාන කළමනාකරුවන්



ඒ ජයසිත් මයා

ප්‍රාදේශීය කළමනාකරු
ත්‍රිකුණාමලය ප්‍රාදේශීය
ප්‍රධාන කාර්යාලය



වයි කේ අතාවුද මිය

ජ්‍යෙෂ්ඨ නීති නිලධාරිනී
ගම්පහ ප්‍රාදේශීය
ප්‍රධාන කාර්යාලය



පී ආර් කේ එන් ප්‍රනාන්දු මිය

ජ්‍යෙෂ්ඨ නීති නිලධාරිනී
නීති දෙපාර්තමේන්තුව



එස් එම් ඩී කුමාරි මිය

ජ්‍යෙෂ්ඨ නීති නිලධාරිනී
අනුරාධපුර ප්‍රාදේශීය
ප්‍රධාන කාර්යාලය



වී පී අබේරත්න මෙය

ප්‍රධාන කළමනාකාරිනී
ජාත්‍යන්තර බැංකු අංශය



එච් සී කේ ගුණවර්ධන මයා

ප්‍රධාන නඩත්තු ඉංජිනේරු
නඩත්තු දෙපාර්තමේන්තුව



පී ආර් එස් කෝදාගොඩ මයා

ප්‍රධාන කළමනාකරු
සැපයුම් දෙපාර්තමේන්තුව



වී ජී කනගසබෙයි මෙය

ප්‍රධාන කළමනාකාරිනී
ණය අයකිරීමේ දෙපාර්තමේන්තුව



එන් ශ්‍රීකාන්ත මයා

ප්‍රධාන කළමනාකරු
මධ්‍යගත පසු පෙල කාර්යාලය



ආර් එල් ජේ පීරිස් මයා

ප්‍රාදේශීය කළමනාකරු
කොළඹ නැගෙනහිර ප්‍රාදේශීය
ප්‍රධාන කාර්යාලය



කේ කෝඩීස්වරන් මයා

ප්‍රාදේශීය කළමනාකරු
මඩකලපුව ප්‍රාදේශීය
ප්‍රධාන කාර්යාලය



එච් එම් යූ එච් හේරත් මයා

ප්‍රාදේශීය කළමනාකරු
බදුල්ල ප්‍රාදේශීය
ප්‍රධාන කාර්යාලය



ඩී ඊ එච් විරසූරිය මිය

ප්‍රධාන අළෙවිකාරිනී
භාණ්ඩාගාර ඒකකය



ඩී එස් ලෝරන්ස් මිය

ජ්‍යෙෂ්ඨ නීති නිලධාරිනී
ජාත්‍යන්තර බැංකු අංශය



ජේ ජේ ජයවර්ධන මයා

ජ්‍යෙෂ්ඨ නීති නිලධාරී
කොළඹ බටහිර ප්‍රාදේශීය
ප්‍රධාන කාර්යාලය



වී කේ සුබසිංහ මිය

ජ්‍යෙෂ්ඨ නීති නිලධාරිනී
නීති දෙපාර්තමේන්තුව



කේ ඒ ඒ එස් පීරිස් මිය

ප්‍රාදේශීය කළමනාකාරිනී
පොළොන්නරුව ප්‍රාදේශීය
ප්‍රධාන කාර්යාලය



ඩී එස් පී එන් රත්නායක මයා

ප්‍රධාන කළමනාකරු
ශාඛා කළමනාකරණ
දෙපාර්තමේන්තුව



ඒ එම් එම් එස් එම් රුවයිස් මයා

ප්‍රධාන කළමනාකරු
සේවක සුභසාධන සහ
සේවක ණය දෙපාර්තමේන්තුව



පී ඩී එන් එල් පොත්තේවෙල මයා

ප්‍රාදේශීය කළමනාකරු
මහනුවර ප්‍රාදේශීය
ප්‍රධාන කාර්යාලය



ඒ ධනවලවිතාන මයා

ප්‍රධාන කළමනාකරු
පුද්ගල බැංකුකරණ
දෙපාර්තමේන්තුව



එස් එම් ඒ ආර් සේනානායක මයා

ප්‍රධාන කළමනාකරු
සේවක සුභසාධන සහ
සේවක ණය දෙපාර්තමේන්තුව



ආර් එම් එන් පී ගුණතිලක මයා

ප්‍රධාන කළමනාකරු
ඉංජිනේරු සේවා
දෙපාර්තමේන්තුව



එච් ජී එන් අරෝහන මයා

ප්‍රාදේශීය කළමනාකරු
බටහිර කොළඹ ප්‍රාදේශීය
ප්‍රධාන කාර්යාලය



එම් එම් ඒ අමරසිරි මිය

ප්‍රාදේශීය කළමනාකාරිනී
මොණරාගල ප්‍රාදේශීය
ප්‍රධාන කාර්යාලය



එම් වී ඩී පෙරේරා මිය

ප්‍රධාන කළමනාකාරිනී
අවදානම් කළමනාකරණ සහ
ණය පාලන දෙපාර්තමේන්තුව



කේ චන්ද්‍රකුමාර් මයා

ප්‍රධාන කළමනාකරු
පීපල්ස් කාඩ්පත් මධ්‍යස්ථානය



එස් එම් ඩී නන්දනී මිය

ප්‍රධාන කළමනාකාරිනී
අභ්‍යන්තර විගණන
දෙපාර්තමේන්තුව



එම් ජී සී කේ සිරිවීර මිය

ප්‍රධාන කළමනාකාරිනී
තොරතුරු තාක්ෂණ
දෙපාර්තමේන්තුව



එස් ඒ එම් ඒ සූරියප්පෙරුම මිය

ප්‍රාදේශීය කළමනාකාරිනී
කළුතර ප්‍රාදේශීය
ප්‍රධාන කාර්යාලය



යූ ජී ඒ ඩී ආර් කරුණානායක මයා

ප්‍රාදේශීය කළමනාකරු
ගම්පහ ප්‍රාදේශීය
ප්‍රධාන කාර්යාලය



ඩබ්ලිව් ඒ පී එස් රත්නසිරි මිය

ප්‍රාදේශීය කළමනාකාරිනී
රත්නපුර ප්‍රාදේශීය
ප්‍රධාන කාර්යාලය



යූ ජී ටී එස් බී තෙන්නකෝන් මයා

ප්‍රාදේශීය කළමනාකරු
අනුරාධපුර ප්‍රාදේශීය
ප්‍රධාන කාර්යාලය



එන් අරුඩ්සෙල්වන් මයා

ප්‍රධාන කළමනාකරු
චිතෙර ගනුදෙනු ඒකකය



ඒ ඒ එස් සෙනෙවිරත්න මයා

ප්‍රධාන කළමනාකරු
අභ්‍යන්තර විගණන
දෙපාර්තමේන්තුව



ඩී එම් ටී එස් දිසානායක මිය

ප්‍රධාන කළමනාකාරිනී
වාණිජ බැංකු අංශය



ආර් එච් සමරවික්‍රම මිය

ප්‍රධාන කළමනාකාරිනී
ප්‍රධාන විධායක නිලධාරී/
සාමාන්‍යාධිකාරී දෙපාර්තමේන්තුව



ඩබ් එම් ඒ සංජීවනී මිය

ප්‍රාදේශීය කළමනාකාරිනී
උතුරු කොළඹ ප්‍රාදේශීය
ප්‍රධාන කාර්යාලය



ඩී සී ඉඳුරුව මිය

ජ්‍යෙෂ්ඨ නීති නිලධාරිනී
දකුණු කොළඹ ප්‍රාදේශීය
ප්‍රධාන කාර්යාලය



ආර් ඒ එස් දසනායක මිය

ජ්‍යෙෂ්ඨ නීති නිලධාරිනී
නීති දෙපාර්තමේන්තුව



එස් ඒ ඩබ් සමරවීර මිය

ජ්‍යෙෂ්ඨ නීති නිලධාරිනී
අනුකූලතා දෙපාර්තමේන්තුව



එන් වයි ප්‍රනාන්දු මිය

සහකාර ප්‍රධාන අභ්‍යන්තර විගණක
අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව



එස් ඩී ජයසිංහ මයා

නියෝජ්‍ය ප්‍රධාන මූල්‍ය නිලධාරී
මූල්‍ය හා කළමනාකරණ ගිණුම්
දෙපාර්තමේන්තුව



එච් පී කේ එස් ගුණවර්ධන මිය

නියෝජ්‍ය අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්
සභාපති කාර්යාලය සහ ලේකම්
දෙපාර්තමේන්තුව



එම් එම් ඒ පී රත්නායක මයා

ප්‍රධාන කළමනාකරු
සේවක සුභසාධන සහ
සේවක ණය දෙපාර්තමේන්තුව



ටී සුදාගර් මයා

ප්‍රධාන කළමනාකරු
ජාත්‍යන්තර බැංකු අංශය



ජේ ඩී ආර් ඥානතිලක මයා

ප්‍රාදේශීය කළමනාකරු
කෑගල්ල ප්‍රාදේශීය
ප්‍රධාන කාර්යාලය



ඩී ඩී කේ හෙට්ටිආරච්චි මිය

ප්‍රධාන කළමනාකාරිනී
මානව සම්පත් දෙපාර්තමේන්තුව



කේ ඒ එම් එන් පෙරේරා මිය

ප්‍රධාන කළමනාකාරිනී
විමර්ශන සහ විමසීම්
දෙපාර්තමේන්තුව



එස් ඩී ඩබ්ලිව් රාජපක්ෂ මිය

ප්‍රධාන කළමනාකාරිනී
අවදානම් කළමනාකරණ සහ
ණය පාලන දෙපාර්තමේන්තුව



එම් මතියලගන් මයා

ප්‍රාදේශීය කළමනාකරු
යාපනය ප්‍රාදේශීය
ප්‍රධාන කාර්යාලය



එච් අබයවික්‍රම මිය

ප්‍රාදේශීය කළමනාකාරිනී
කොළඹ දකුණ ප්‍රාදේශීය
ප්‍රධාන කාර්යාලය



කේ සී එස් පෙරේරා මිය

ප්‍රධාන කළමනාකාරිනී
කුඩා හා මධ්‍ය පරිමාණ
ව්‍යවසාය දෙපාර්තමේන්තුව



ඩබ්ලිව් එම් ඩී ගංගා මිය

ප්‍රධාන කළමනාකාරිනී
ව්‍යාපාර පුනර්ජීවන ඒකකය



එම් ඒ එන් එන් ප්‍රීතිකුමාරි මිය

ප්‍රධාන කළමනාකාරිනී
අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව



ඩබ්ලිව් පී අයි පී සී කොස්ගොල්ලවත්ත මයා

ප්‍රධාන කළමනාකරු
භාණ්ඩාගාර ඒකකය



ඒ ඩී ආර් ප්‍රියන්ත මයා

ප්‍රධාන කළමනාකරු
තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව



ඊ ඒ වී වර්ණකුල මයා

ප්‍රධාන කළමනාකරු
තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව



එස් ඊ වික්‍රමරත්න මිය

ප්‍රධාන කළමනාකාරිනී
තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව



කේ එස් ජේ කොඩිප්පිලි මයා

ප්‍රධාන කළමනාකරු
තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව



එස් කාරියවසම් මයා

ප්‍රධාන කළමනාකරු
තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව



ඩබ්ලිව් ජී ජී දමයන්ති මිය

ප්‍රාදේශීය කළමනාකාරිනී
හම්බන්තොට ප්‍රාදේශීය
ප්‍රධාන කාර්යාලය



පී එන් කහංගමගේ මිය

ප්‍රධාන කළමනාකාරිනී
අවදානම් කළමනාකරණය සහ
ණය පාලන දෙපාර්තමේන්තුව



කේ එම් පී පී කුලතුංග මයා

ප්‍රාදේශීය කළමනාකරු
අම්පාර ප්‍රාදේශීය
ප්‍රධාන කාර්යාලය



කේ ඩී ජයතිස්ස මිය

ප්‍රධාන කළමනාකාරිනී
ශාඛා කළමනාකරණය
දෙපාර්තමේන්තුව



ජේ ඒ ඩී ටී ඒ උඩුවාවල මිය

ප්‍රාදේශීය කළමනාකාරිනී
මාතලේ ප්‍රාදේශීය
ප්‍රධාන කාර්යාලය



කේ ඒ එස් අයි කුමාරපේලි මයා

ප්‍රාදේශීය කළමනාකරු
ගාල්ල ප්‍රාදේශීය
ප්‍රධාන කාර්යාලය



ඩී එස් පී ජයසිංහ මයා

ප්‍රාදේශීය කළමනාකරු
නුවරඑළිය ප්‍රාදේශීය
ප්‍රධාන කාර්යාලය



ඒ එල් සී පී අබේසිංහ මයා

ප්‍රාදේශීය කළමනාකරු
මාතර ප්‍රාදේශීය
ප්‍රධාන කාර්යාලය



එස් ඩබ්ලිව් ඩබ්ලිව් දේවනාරායන මිය

ප්‍රධාන කළමනාකාරිනී
ඩිජිටල්කරණ දෙපාර්තමේන්තුව



ආර් පී එස් දංගල්ල මිය

ප්‍රධාන කළමනාකාරිනී
සංවර්ධන හා ක්ෂුද්‍ර මූල්‍ය
දෙපාර්තමේන්තුව



ඩබ්ලිව් ඩී එස් ජයන්තිකා මිය

ප්‍රාදේශීය කළමනාකාරිනී
කුරුණෑගල ප්‍රාදේශීය
ප්‍රධාන කාර්යාලය



ඩී එච් එන් විජේමාන්න මයා

ප්‍රධාන කළමනාකරු
විමර්ශන සහ විමසීම්
දෙපාර්තමේන්තුව



කේ පී විතාන මයා

ප්‍රධාන කළමනාකරු
අභ්‍යන්තර විගණන
දෙපාර්තමේන්තුව



එච් එම් කරුණා හේරත් මිය

ප්‍රාදේශීය කළමනාකාරිනී
පුත්තලම ප්‍රාදේශීය
ප්‍රධාන කාර්යාලය



ඩබ්ලිව් ඒ කේ සී පී ජයවර්ධන මිය

ප්‍රධාන කළමනාකාරිනී
අවදානම් කළමනාකරණය සහ
ණය පාලන දෙපාර්තමේන්තුව



කේ බීෂ්මන් මිය

ප්‍රාදේශීය කළමනාකාරිනී
වන්නි ප්‍රාදේශීය
ප්‍රධාන කාර්යාලය



පී කේ ආර් ආර් පෙරේරා මයා

ප්‍රධාන කළමනාකරු
පුද්ගල බැංකුකරණ
දෙපාර්තමේන්තුව



එස් එම් ඒ පී කේ සමරකෝන් මයා

ප්‍රධාන කළමනාකාරු
මූල්‍ය හා කළමනාකරණ
ගිණුම්කරණ දෙපාර්තමේන්තුව



එස් කේ උඩගෙආරච්චි මිය

ප්‍රධාන කළමනාකාරිනී
වාණිජ ණය දෙපාර්තමේන්තුව



එල් ඒ එස් සජීවනී මිය

ප්‍රධාන කළමනාකාරිනී
වේතන සහ විශ්‍රාම වැටුප්
දෙපාර්තමේන්තුව



වයි වී ඒ ඩී මිහිරාණි මිය

ප්‍රධාන කළමනාකාරිනී
අක්වෙරළ බැංකු ඒකකය



ඩබ්ලිව් ටී ඩබ්ලිව් ජී ඉහළගේ මයා

ප්‍රධාන ආරක්ෂක අධිකාරී
ආරක්ෂක දෙපාර්තමේන්තුව



සී ඩී කරුණාරත්න මයා

නියෝජ්‍ය අලෙවිකරණ ප්‍රධානී
අලෙවිකරණ දෙපාර්තමේන්තුව



ඩී සමරනායක මයා

ප්‍රධාන කළමනාකරු
තොරතුරු ආරක්ෂණ
දෙපාර්තමේන්තුව



ජේ එස් ඩබ්ලිව් අතුකෝරල මයා

ප්‍රධාන කළමනාකරු
තොරතුරු සුරැකුම් යටිතල පහසුකම්
සහ මෙහෙයුම් තොරතුරු තාක්ෂණ
දෙපාර්තමේන්තුව


PEOPLE'S
BANK
Pride of the Nation
Bank Smarter
Digital tools
for life
on the go
Welcome
to the


EXIT

උපායමාර්ග සහ වටිනාකම් නිර්මාණය



66
අපගේ මෙහෙයුම් පරිසරය

74
පාර්ශ්වකාර සහභාගිත්වය

80
ප්‍රමාණාත්මකතාවය

86
උපායමාර්ග

92
අපගේ වටිනාකම නිර්මාණය කිරීමේ ආකෘතිය

94
අපගේ පාරිසරික, සමාජීය සහ පාලන (ESG) අවධානය

96
එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක (UN SDG) වෙනුවෙන් අපගේ කැපවීම

අපගේ මෙහෙයුම් පරිසරය



ගෝලීය ආර්ථිකය

අවිනිශ්චිත බාධක ජයගැනීමේ හැකියාවකින් යුත් ගෝලීය ආර්ථිකය, 2024 වසරේ වාර්තා වූ 3.3% වර්ධනයට සමානව 2025 වසරේදී ද 3.3% මට්ටමක පවතිනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත[1]. විසංගතයට පෙර පැවති සාමාන්‍ය වර්ධන වේගයට වඩා අඩු වර්ධන වේගයක් තවමත් පැවතිය ද, සැපයුම්දාම වලට සිදුවූ බාධා, බලශක්ති මිල ඉහළයාම, සහ වෙළඳ යුද්ධ මගින් ඇතිවූ අබණ්ඩ ගෝලීය උද්ධමනය හේතුවෙන් ලෝකය පුරා බැංකු දැඩි (hawkish) මුදල් ප්‍රතිපත්ති අනුගමනය කිරීමට පෙළඹුණි. එමගින් ප්‍රාග්ධන ප්‍රවාහයන්ට සහ ණය ගැනීමේ පිරිවැයට සෘජු බලපෑමක් ඇති විය. ධනාත්මක නමුත් අවිනිශ්චිත තත්ත්වයක පැවති ගෝලීය ආර්ථික පසුබිම තුළ, සංවර්ධිත ආර්ථිකයන්හි වර්ධනය මන්දගාමී වූ අතර, නැගී එන ආර්ථිකයන් මිශ්‍ර කාර්යසාධනයක් පෙන්නුම් කළේය. එම ආර්ථිකයන් මුදල් අවප්‍රමාණය, ඉහළ ආනයන පිරිවැය සහ බාහිර කම්පනවලට නිරාවරණය වීමේ අවදානමට මුහුණ පෑවේය[2]. මේ අතර, භූ-දේශපාලන ආතතිය සහ ආරක්ෂණවාදී ප්‍රවණතා හේතුවෙන් භූ-ආර්ථික බණ්ඩනය වර්ධනය වී, තරඟකාරී ආර්ථික කණ්ඩායම් බිහිවීමත් සමඟ පූර්ණ ආර්ථික කාර්යක්ෂමතාවයට බාධා ඇති විය.

2025 වසර සඳහා ඉස්මතු වූ ප්‍රධාන අවදානම් අතරට ඉහළ ගෝලීය තීරුබදු සහ වෙළඳාම බණ්ඩනය, ඉහළ භූ-දේශපාලනික ආතතීන්, දියුණු ආර්ථිකයන්හි ඉහළ ණය මට්ටම්, නැගී එන ආර්ථිකයන් වෙත ලැබෙන විදේශ සෘජු ආයෝජන ප්‍රවාහය, එසේම නැගී එන ආර්ථිකයන්හි මුදල් හා භාණ්ඩ වෙළඳපොළවල අවදානම් ඇතුළත් වේ. මෙම සියලු කරුණු ගෝලීය ආර්ථිකයේ ස්ථාවරත්වයට අභියෝගයක් එල්ල කරයි.[3]


කෙසේ වෙතත්, යුරෝපය සහ චීන්සත් ජනපදය අභිබවා, ඉන්දියාව වේගයෙන්ම වර්ධනය වන ප්‍රධාන ආර්ථිකය ලෙස කැපී පෙනුණි.

2025 දී දකුණු ආසියාව 6.6% ක වර්ධන වේගයක් අත්කර ගත් නමුත්, ඉන්දියාවේ අපේක්ෂිත ප්‍රමාණයට වඩා ඉහළ රාජ්‍ය ආයෝජන මෙන්ම ශ්‍රී ලංකාවේ පවතින පුළුල් ආර්ථික පුනරුදය මධ්‍යයේ, 2026 දී එය 5.8% දක්වා මන්දගාමී වනු ඇතැයි පුරෝකථනය කර ඇත. ආර්ථික මන්දගාමීත්වය මධ්‍යයේ වුවද, අනෙකුත් නැගී එන සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්ට (EMDEs) සාපේක්ෂව දකුණු ආසියාවේ වර්ධනය වඩාත් ස්ථාවර වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ කලාපීය රටවල් සාර්ව ආර්ථික අසමතුලිතතාවයන්, විශේෂයෙන් ජංගම ගිණුම් හිඟයන් විසඳීම සඳහා ලබා ඇති ප්‍රගතිය හේතුවෙන්, අනෙකුත් නැගී එන වෙළඳපොළවල් සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්ට (EMDEs) සාපේක්ෂව එම වර්ධනය වඩාත් ස්ථාවර වනු ඇතැයි අපේක්ෂා කෙරේ. තවද, කලාපයේ උද්ධමනය ස්ථාවර වීම හෝ පහළ යන ප්‍රවණතාවක් පෙන්නුම් කිරීම සමඟ, මහ බැංකු විසින් සිය මුදල් ප්‍රතිපත්ති සැලකිල්ලෙන් යුතුව ලිහිල් කරනු ලැබීය.

2024 වසරට සාපේක්ෂව වර්ධන වේගය මඳක් වේගවත් කරමින්, චීනය 5% ක වර්ධනයක් අත්කර ගැනීම සඳහා අපනයන අංශය සැලකිය යුතු දායකත්වයක් ලබා දුන්නේය. එමෙන්ම පසුගිය වසර තුන පුරා පසුබෑමකට ලක්ව තිබූ දේපළ වෙළඳපොළ, රාජ්‍ය මූල්‍ය සහාය (Fiscal support) සහ එය ස්ථාවර කිරීමේ ක්‍රියාමාර්ග හේතුවෙන් යථා තත්ත්වයට පත්වීමේ සලකුණු පෙන්නුම් කළේය.

දකුණු ආසියානු රටවල වර්ධනය

%



මූලාශ්‍රය: World Bank Macro Poverty Outlook – ලෝක බැංකුව


සටහන්: ඉන්දියාව සඳහා, "2025", "2026" සහ "2027" යන්න පිළිවෙළින් FY25/26, FY26/27 සහ FY27/28 ලෙස සඳහන්ය. දින දර්ශන වර්ෂ වෙනුවට මූල්‍ය වර්ෂය භාවිතා කරන අනෙකුත් රටවල් සඳහා, "2025", "2026" සහ "2027" යන වසර පිළිවෙළින් FY24/25, FY24/25 සහ FY26/27 ලෙස පෙන්වයි.

ශ්‍රී ලංකාවේ ආර්ථිකය

අර්බුදයෙන් පසු මූල්‍ය ඒකාබද්ධතාවය (Fiscal Consolidation), ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ, ශක්තිමත් බදු පද්ධතියක් සහ විනයගරුක රාජ්‍ය වියදම් කළමනාකරණය සමඟින් ඇති වූ ක්‍රමානුකූල ප්‍රකෘතිමත් වීම, 2024 වසරේදී 5% ක ආර්ථික වර්ධනයක් අත්කර ගැනීමට මංපෙත් විවර කළේය. මෙය 2025 වසර සඳහා ස්ථාවර මෙන්ම ශක්තිමත් ආරම්භයක් ලබා ගැනීමට අවශ්‍ය පදනම සකස් කරන ලදී. ජාත්‍යන්තර ආධාර වැඩසටහන් යටතේ ප්‍රතිසංස්කරණ අඛණ්ඩව ක්‍රියාත්මක වන අතර, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) සම්බන්ධීකරණය යටතේ, අනාගත මූල්‍ය හා ණය තිරසාරභාවය සහතික කිරීම සඳහා වන ප්‍රතිපත්තිමය මඟපෙන්වීම් ද ඇතුළත්, ඉතා සංකීර්ණ බහු-අදියර සහ බහු-ණයහිමි රජයේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියක් ද සිදුවෙමින් පවතී. ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලයේ ප්‍රධාන වාර්ෂික සමුළුව වන "ශ්‍රී ලංකා ආර්ථික සමුළුව 2025" (Sri Lanka Economic Forum 2025) මඟින් ණය අර්බුදයෙන් පසු ප්‍රකෘතිමත් වීම, ස්ථාවරත්වය යළි ගොඩනැගීම සහ ආයෝජක විශ්වාසය තහවුරු කිරීම ජාතික න්‍යාය පත්‍රය ලෙස හඳුනාගත් අතර, රටේ ආර්ථික ස්ථාවරත්වය සඳහා ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ඇති වැදගත්කම එහිදී අවධාරණය කෙරිණි.

ශීඝ්‍ර ආර්ථික ක්‍රියාකාරකම් මධ්‍යයේ, සාර්ව ආර්ථික ක්ෂේත්‍රයේ ඇති වී තිබෙන යහපත් ප්‍රවණතාවන් සහ ඩිජිටල් පරිවර්තනය තුළින් උදාවෙමින් පවතින නව අවස්ථාවන් දැකගත හැකි වීම සතුටට කරුණකි. කෙසේ වෙතත්, බාහිර කම්පනයන්ට ගොදුරු විය හැකි බිඳෙනසුලු ආර්ථිකයක් පවතින පසුබිමක, මෙම සුබවාදී බලාපොරොත්තු ප්‍රවේශමෙන් යුතුව කළමනාකරණය කළ යුතුව ඇත.

දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය %



මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL) මූල්‍ය ප්‍රතිපත්ති රාමුව – 2025

නම්‍යශීලී උද්ධමන ඉලක්කගත (Flexible Inflation Targeting – FIT) මූල්‍ය ප්‍රතිපත්ති රාමුව යටතේ, දේශීය මිල ස්ථායිතාව කරා ළඟාවීම සහ එය පවත්වා ගැනීම ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන වගකීම වේ. මෙය, උද්ධමන අරමුණු සමඟ සරිලන ලෙස කෙටි කාලීන පොලී අනුපාත මෙහෙයවීම හා මූල්‍ය පද්ධතිය ස්ථාවර කිරීම සමඟ ඒකාබද්ධව ක්‍රියාත්මක වේ. මෙම රාමුව යටතේ, ශ්‍රී ලංකා මහ බැංකුව ස්ථාවර ද්විත්ව ප්‍රතිපත්ති අනුපාත පද්ධතිය (Standing Deposit Facility Rate – SDFR – Standing Lending Facility Rate – SLFR) අත්හැර, නව තනි ප්‍රතිපත්ති පොලී අනුපාතය ලෙස එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය (Overnight Policy Rate – OPR) හඳුන්වා දෙන ලදී. දේශීය මිල ස්ථායිතාව සහ මූල්‍ය පද්ධති ස්ථායිතාව යන නිශ්චිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා 2025 දී ශ්‍රී ලංකා මහ බැංකුවේ මූලික ප්‍රතිපත්ති මෙවලම මෙය විය.[4]

2025 වසර සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපත්තිමය ස්ථාවරය මඟින් ප්‍රධාන වශයෙන් පිළිබිඹු වූයේ, උද්ධමනය ඉලක්කගත මට්ටමක පවත්වා ගනිමින් ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීම සඳහා සහය වන ප්‍රතිපත්තියකි. ධනාත්මක සැබෑ පොලී අනුපාත පවත්වා ගැනීම සහ බාහිර සංචිත නැවත ගොඩනැගීම කෙරෙහි අවධානය යොමු කරමින්, විකාශනය වන දේශීය හා ගෝලීය අවදානම් පදනම් කරගෙන මෙම ප්‍රතිපත්තිමය ගැලපීම් ක්‍රියාත්මක කරන ලදී.

තැන්පතු සහ ණය පොලී අනුපාත


2025 වසර අවසානයේදී සාමාන්‍ය බරිත තැන්පතු අනුපාතිකය (AWDR) 6.79% දක්වා පහත වැටුණු අතර, සාමාන්‍ය බරිත නව තැන්පතු අනුපාතිකය (AWNDR) 5.94% ක් විය. නව ණය සඳහා වන පොලී අනුපාත 10.46% දක්වා අඩු වූ අතර, එමඟින් වෙළඳපොළ තුළ ණය පිරිවැය දැරිය හැකි මට්ටම (Credit Affordability) ඉහළ ගොස් ඇති බව පෙන්නුම් කරයි. බලපත්‍රලාභී වාණිජ බැංකු මඟින් පෞද්ගලික අංශයට ලබා දුන් ණය ප්‍රමාණය 15.2% කින් වර්ධනය වී රුපියල් බිලියන 87ක් වූ අතර, 2025 අප්‍රේල් වන විට කාලීන සහ ඉතිරි කිරීමේ තැන්පතු රුපියල් බිලියන 147ක අගයක් දක්වා ළඟා විය.[5]

1. 2026 ජනවාරි යාවත්කාලීන කළ IMF World Economic Outlook
2. Global Economic Outlook, Deloitte Insights – www.deloitte.com
3. 2025 ජූලි යාවත්කාලීන කළ Global Economic Prospects World Bank Group/World Economic Outlook
4. ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙළඳපොළ මෙහෙයුම් වාර්තාව 2025 ජූනි – CBSL
5. PowerPoint ඉදිරිපත්කිරීම.

තැන්පතු අනුපාත

සාමාන්‍ය බරිත තැන්පතු අනුපාතිකය සහ සාමාන්‍ය බරිත ස්ථාවර තැන්පතු අනුපාතිකය (AWDR and AWFDR)

%




සාමාන්‍ය බරිත තැන්පතු අනුපාතිකය (AWDR)

සාමාන්‍ය බරිත ස්ථාවර තැන්පතු අනුපාතිකය (AWFDR)

සාමාන්‍ය බරිත නව තැන්පතු අනුපාතය සහ සාමාන්‍ය බරිත නව ස්ථාවර තැන්පතු අනුපාතය

%



සතිපතා සාමාන්‍ය බරිත නව තැන්පතු අනුපාතය

සාමාන්‍ය බරිත නව ස්ථාවර තැන්පතු අනුපාතය

ණය අනුපාත


සතිපතා සාමාන්‍ය බරිත ප්‍රමුඛ ණය අනුපාතය

%



සාමාන්‍ය බරිත ණය අනුපාතය සහ සතිපතා සාමාන්‍ය බරිත නව ණය අනුපාතය

%



සාමාන්‍ය බරිත ණය අනුපාතය (AWLR)

සාමාන්‍ය බරිත නව ණය අනුපාතය (AWNLR)

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව, මුදල්, ණය සහ පොලී අනුපාත වර්ධනයන්, 2025 මැයි.


ණය ලබාගැනීමේ හැකියාව වර්ධනය වීම හේතුවෙන් කාරක ප්‍රාග්ධනය වැඩි වී, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර, ආයතනික අංශය, අපනයන අංශය සහ පාරිභෝගික වියදම් කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති විය. ඉදිකිරීම් අංශය නැවත සක්‍රීය වී ඇති අතර, සංචාරක කර්මාන්තය පැමිණීම්වල සැලකිය යුතු වර්ධනයක් අත්විඳින ලදී. කෙසේ වෙතත්, සංචාරක ඉපැයීම්වල වර්ධනය සංචාරක පැමිණීම්වල වර්ධනයට වඩා සැලකිය යුතු තරමකින් පසුගාමී විය. තැන්පතු අනුපාත අඩු වුවද, කාලීන සහ ඉතිරිකිරීමේ තැන්පතු රුපියල් බිලියන 147 කින් වර්ධනය වී, බැංකු අංශයේ ද්‍රවශීලතාවය වැඩිදියුණුවීමෙන්, බැංකු පද්ධතිය කෙරෙහි ආයෝජක විශ්වාසය තවදුරටත් පිළිබිඹු විය.

උද්ධමන ප්‍රවණතාවය

බලශක්ති මිල ගණන් තියුණු ලෙස පහත වැටීම, රුපියලේ අගය ශක්තිමත් වීම, බලශක්ති ක්ෂේත්‍රයේ සිදුකළ පරිපාලනමය මිල සංශෝධන, ඉල්ලුම අඩුවීම හේතුවෙන් 2024 වසරේ අගභාගයේ සහ 2025 වසරේ මුල් භාගයේදී ශ්‍රී ලංකා ආර්ථිකය තුළ දුර්ලභ "අවධමන" (Deflation) තත්ත්වයක් දක්නට ලැබුණි. මෙහි අවම අගය 2025 පෙබරවාරි මාසයේදී -4.2% ක් ලෙස වාර්තා විය. මෙම කාලසීමාව තුළ ආහාර උද්ධමනය සැලකිය යුතු ලෙස පහත වැටුණු අතර, ආහාර නොවන උද්ධමනය ද පාලිත මට්ටමක පැවතුණි. මේ අනුව, ප්‍රධාන උද්ධමනය (Headline Inflation) සහ මූලික උද්ධමනය (Core Inflation) යන දෙකම 2025 වසර පුරාම මහ බැංකුවේ 5% ක ඉලක්කයට වඩා බෙහෙවින් පහළ මට්ටමක පවත්වා ගැනීමට හැකි විය. මහ බැංකුව මීට පෙර අනුගමනය කළ දැඩි මුදල් ප්‍රතිපත්තිය, ගෝලීය වශයෙන් උද්ධමනය පහළ යාම, ලෝක වෙළඳපොළේ පාරිභෝගික ද්‍රව්‍ය මිල අඩුවීම සහ රුපියලේ අගය සාපේක්ෂව ස්ථාවර මට්ටමක පැවතීම 2025 වසර පුරා උද්ධමනය මැනවින් කළමනාකරණය කිරීමට සහ පාලනය කිරීමට ප්‍රධාන වශයෙන් දායක විය. කෙසේ වෙතත්, මෙම අඩු උද්ධමන මට්ටම කෙරෙහි ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග පමණක් නොව, දේශීය ඉල්ලුම දුර්වල වීම සහ ආර්ථිකය යථා තත්ත්වයට පත්වීමේ මන්දගාමී වේගය ද අර්ධ වශයෙන් හේතු විය.

ශ්‍රී ලංකාවේ උද්ධමනය 2026 වසරේදී ක්‍රමයෙන් ඉහළ යනු ඇතැයි පුරෝකථනය කර ඇති අතර, එම වසරේ දෙවන භාගය වන විට එය මහ බැංකුවේ 5% ඉලක්කය කරා ළඟා වනු ඇත. එසේ වුවද, එම වේගය තීරණය වන්නේ ගෝලීය වෙළඳ භාණ්ඩ මිල වෙනස්වීම් (බලශක්ති පිරිවැය ආදී), බාහිර ආර්ථික තත්ත්වයන් සහ දේශීය ඉල්ලුමේ ශක්තිමත්භාවය මතය.

උද්ධමන අනුපාතය
(CCPI හි වසරින් වසර වෙනස) %



ශ්‍රී ලංකා මහ බැංකුව

ගෙවුම් ශේෂය (BoP)

ආර්ථිකය අර්බුදයෙන් පසු යථා තත්ත්වයට පත්වීමත් සමඟ, 2025 වසරේදී ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂ (BoP) තත්ත්වය මගින් බාහිර අංශයේ ස්ථාවරත්වයේ කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කෙරිණි. වසර පුරාම ජංගම ගිණුම අබණ්ඩව අතිරික්තයන් වාර්තා කළ අතර, ඒ සඳහා ශක්තිමත් සේවක ප්‍රේෂණ, ඉහළ සංචාරක ලැබීම් සහ වෙළඳ හිඟය පියවා ගැනීමට දායක වූ ශුද්ධ සේවා ගලා ඒම් හේතු විය. ඒ අනුව, 2025 වසරේ තුන්වන කාර්තුවේදී ඇමරිකානු ඩොලර් මිලියන 399.6 ක ජංගම ගිණුම් අතිරික්තයක් වාර්තා විය.

ජංගම සහ ප්‍රාග්ධන ගිණුම්වල කාර්තුමය දත්ත වලට අනුව, 2025 වසරේ වාර්තා වූ බොහෝ කාලසීමාවන් තුළ එම ඒකාබද්ධ ශේෂයන් ධන අගයක් ගෙන ඇත. මින් පෙන්නුම් කෙරෙන්නේ අතීත සාමාන්‍ය තත්ත්වයන් හා සසඳන විට බාහිර අංශය වඩාත් යහපත් මට්ටමක පවතින බවත්, තිරසාර ගලා ඒම් අබණ්ඩව සිදුවන බවත්ය. සම්පූර්ණ වර්ෂය සඳහා වූ විස්තීර්ණ වාර්ෂික ගෙවුම් ශේෂ (BoP) දත්ත ප්‍රකාශයට පත් කිරීමේ දී සාමාන්‍යයෙන් යම් ප්‍රමාදයක් සිදු වුවද, මෙම කාර්තුමය ප්‍රතිඵල මගින් 2025 වසරේ සමස්ත ශුද්ධ ශේෂය අතිරික්ත මට්ටමක පවතිනු ඇති බව පෙන්නුම් කෙරේ.

බාහිර ස්ථාවරත්වයේ ප්‍රධාන දර්ශකයක් වන දළ හිල විදේශ විනිමය සංචිත, 2025 දෙසැම්බර් වන විට ඇමරිකානු ඩොලර් බිලියන 6.8ක් දක්වා ඉහළ ගියේය. මෙය ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදයෙන් පසු වාර්තා වූ ඉහළම මට්ටම වන අතර, එමඟින් රටේ බාහිර ආරක්ෂිත සංචිත (external buffers) තවදුරටත් ශක්තිමත් විය. ඉලක්කගත විදේශ විනිමය වෙළෙඳපොළ මැදිහත්වීම් සහ දැනට ක්‍රියාත්මක සාර්ව ආර්ථික සහාය රාමු යටතේ ලැබුණු බාහිර මූල්‍ය පහසුකම් මෙම සංචිත වර්ධනයට සහාය විය.

සමස්තයක් වශයෙන්, වෙළඳ හිඟය සහ බාහිර බැඳීම් වැනි අභියෝග මධ්‍යයේ වුවද, 2025 වසර අවසානයේ ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂ තත්ත්වය මගින් ශක්තිමත් විදේශ සංචිත සහ ජංගම ගිණුම් අතිරික්තයක් කරා වූ තිරසාර මාරුවීමක් සමඟ ඉහළ බාහිර ඔරොත්තු දීමේ හැකියාවක් පෙන්නුම් කළේය.

බැංකු අංශය

බැංකු පද්ධතියේ ප්‍රාග්ධන ආරක්ෂක සංචිත නැවත ශක්තිමත් වීමත් සමඟ, 2025 වසරේදී බැංකු ස්ථායීතා දර්ශකය ධනාත්මක වර්ධනයක් පෙන්නුම් කළ අතර, ක්ෂේත්‍රයේ ඔරොත්තු දීමේ හැකියාව සහ ණය වර්ධනය තවදුරටත් ඉහළ නැඟ ඇති බව එයින් මැනවින් පිළිඹිබු විය.[6]

සමාලෝචිත වර්ෂය තුළ ශ්‍රී ලංකාවේ බැංකු ක්ෂේත්‍රය තුළ ස්ථාවරත්වයක් සහ ක්‍රමානුකූලව යථා තත්ත්වයට පත්වීමක් දක්නට ලැබුණි. වේගයෙන් වෙනස් වන ආර්ථික සහ නීතිමය වටපිටාවක වුවද, මූල්‍ය ස්ථාවරත්වය සහ පාරිභෝගික සුරක්ෂිතභාවය තහවුරු කිරීමේ ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපත්තිවලට අනුකූලව මෙම බැංකු ක්ෂේත්‍රය කටයුතු කළේය. මෙම ජාතික වැඩපිළිවෙළට සහාය වෙමින් සහ අඩු වූ තැන්පතු පොළී අනුපාතවලින් ප්‍රතිලාභ ලබමින් බැංකු පද්ධතිය ශක්තිමත් වූ නමුත්, පෙර පැවති වත්කම්වල ගුණාත්මකභාවය පිළිබඳ ගැටලු සහ බාහිර කම්පන හේතුවෙන් පැන නගින සැලකිය යුතු අවදානම්වලට තවදුරටත් මුහුණ දෙමින් සිටියේය.

6. ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ස්ථායීතා සමාලෝචනය 2025 හි සාරාංශය.

ණය වර්ධනය මගින් ආර්ථික ප්‍රකෘතිමත් භාවයේ ලක්ෂණ පෙන්නුම් කළ අතර, ආයතනික, සුළු හා මධ්‍ය පරිමාණ සහ අනෙකුත් කර්මාන්ත අංශයන්හි ව්‍යාපාරික කටයුතු වේගවත් වීමත් සමඟ බැංකු සේවා සඳහා වූ ඉල්ලුම ඉහළ ගියේය. දේශීය අවශ්‍යතා සපුරාලීමට බැංකු පද්ධතිය සතු රුපියල් ද්‍රවශීලතාව ප්‍රමාණවත් වුවද, විදේශීය බැඳීම් (External obligations) පියවීම සඳහා අවශ්‍ය විදේශ විනිමය (FX) ද්‍රවශීලතාවය සපයා ගැනීමේදී බැංකු පද්ධතිය යම් සීමාවන්ට මුහුණ දුන්නේය.එමෙන්ම, වසර කිහිපයකට පෙර පැවති ආර්ථික අර්බුදයට සාපේක්ෂව අක්‍රීය ණය (NPL) අනුපාතයන් යහපත් අතට හැරී තිබුණද, එය තවදුරටත් ප්‍රධාන අභියෝගයක් ලෙස පවතී.

බැංකු පද්ධතියේ ද්‍රවශීලතා මට්ටම් නියාමන අවම අවශ්‍යතාවලට වඩා බෙහෙවින් ඉහළ මට්ටමක පැවති අතර, එමඟින් අබණ්ඩ ආර්ථික ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය ණය වර්ධනයට (credit growth) මනා සහායක් ලැබුණි. තවද, ශුද්ධ පොලී ආදායම ඉහළ යාම හේතුවෙන් 2025 වසරේ පළමු භාගය තුළ බැංකු ක්ෂේත්‍රයේ ලාභදායීතාව කැපී පෙනෙන ලෙස වර්ධනය විය.

ණය වර්ධනය ප්‍රකෘතිමත් වීම, ලාභදායීතාවය ශක්තිමත්වීම සහ ප්‍රාග්ධන ආරක්ෂක සංචිත ක්‍රමයෙන් වර්ධනය වීම මගින් බැංකු අංශයේ පද්ධතිමය ඔරොත්තු දීමේ හැකියාව ඉහළ ගොස් ඇති බව පෙනී යයි. මෙය ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු සවිමත්භාවය පිළිබඳ දර්ශකය (Banking Soundness Index) මගින් ද තහවුරු වේ. එසේ වුවද, වත්කම්වල ගුණාත්මකභාවය පිළිබඳ ගැටලු සහ විදේශ විනිමය අරමුදල් සපයා ගැනීමේ අවදානම 2025 වසර පුරාම පැවතුණි. කෙසේ වෙතත්, ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය පිළිබිඹු කරමින්, තෙවන අදියරේ (Stage 3) අක්‍රීය ණය ප්‍රමාණයන් පහළ යාමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය.

දේශපාලන හා පාලන පරිසරය

2022 වසරේ ආර්ථික බිඳවැටීමෙන් සහ ණය පැහැර හැරීමෙන් පසුව, වගවීම, පිරිසිදු පාලනයක් සහ විශ්වසනීය ආර්ථික කළමනාකරණයක් සඳහා වූ ප්‍රබල මහජන ඉල්ලුම හමුවේ ශ්‍රී ලංකාවේ දේශපාලන භූ දර්ශනය නව මාවතකට යොමු වී ඇත. 2024 මැතිවරණය මෙම වෙනස තවදුරටත් වේගවත් කළ අතර, දූෂණ විරෝධය, විනිවිදභාවය සහ ප්‍රතිසංස්කරණ කේන්ද්‍ර කරගත් නව පාලන වරමක් ඒ හරහා නිර්මාණය විය. මේ සමඟ වඩාත් ස්ථාවර ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සහ රාජ්‍ය කාර්ය සාධනය ඉහළ නැංවීම පිළිබඳ අපේක්ෂාවන් ද දැඩි විය. මීට සමාන්තරව, රටේ ආර්ථික ප්‍රකෘතිමත් වීමේ වැඩපිළිවෙළ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) මූල්‍ය හා පාලන ප්‍රතිසංස්කරණ සමඟ සමීපව බැඳී පවතී. විශේෂයෙන්ම, රාජ්‍ය මූල්‍ය කළමනාකරණය දැඩි කිරීම, රාජ්‍ය ආයතන රාජ්‍ය ව්‍යවසාය (SOEs) කෙරෙහි ශක්තිමත් අධීක්ෂණයක් පවත්වා ගැනීම සහ මහජන පීඩනයට ප්‍රතිචාර වශයෙන් දේශපාලන වරප්‍රසාද කප්පාදු කිරීම මෙහිදී කැපී පෙනේ. මෙම සමස්ත ක්‍රියාවලිය තුළින් නියාමන පද්ධති නවීකරණය කිරීම, නීතිය ක්‍රියාත්මක කිරීම ශක්තිමත් කිරීම සහ විනිවිදභාවයකින් යුත් පාලනයක් හරහා මහජන විශ්වාසය සහ නීතියේ ආධිපත්‍යය තහවුරු කිරීමේ අවශ්‍යතාව අවධාරණය කෙරේ.

දේශගුණික විපර්යාසවල බලපෑම

දිට්වා සුළි කුණාටුව ශ්‍රී ලංකාවේ දැනටමත් අස්ථාවරව පවතින ආර්ථිකයට දැඩි පහරක් එල්ල කළ අතර, සියලුම පළාත් පුරා ඇස්තමේන්තුගත රුපියල් බිලියන 320ක හානියක් සිදු කළේය. පැතිරගිය ගංවතුර, නායයෑම් මෙන්ම ජීවිත, දේපළ සහ ජීවනෝපායන් බේදජනක ලෙස අහිමි වීම සැලකිය යුතු සමාජීය හා ආර්ථික පීඩනයක් ඇති කර තිබේ. ඊට ප්‍රතිචාර වශයෙන්, හානිය පාලනය කිරීමට, සහන මෙහෙයුම් ක්‍රියාත්මක කිරීමට සහ ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කිරීමට රජය ක්ෂණික පියවර ගෙන ඇත. කෙටි කාලීනව, මූල්‍ය ප්‍රමුඛතාවන් හදිසි ප්‍රතිචාර සහ ප්‍රතිසංස්කරණ කටයුතු වෙත යොමු වනු ඇතැයි ද, ඒ හේතුවෙන් සැලසුම් කළ ප්‍රාග්ධන සහ සංවර්ධන ව්‍යාපෘති ප්‍රමාද වනු ඇතැයි ද අපේක්ෂා කෙරේ.

මෙම ව්‍යසනය හේතුවෙන් පුළුල් පරාසයක ආර්ථික ප්‍රතිවිපාක ඇතිවීමේ ඉඩකඩ පවතී. කෘෂිකර්මාන්තය සහ ආහාර සුරක්ෂිතතාව අඩාල වී ඇති අතර, වර්ධනය වෙමින් පවතින සංචාරක අංශය, ධීවර කර්මාන්තය සහ වෙරළබඩ ජීවනෝපායන් ද දැඩි පසුබෑමකට ලක්ව ඇත. තීරණාත්මක දුම්රිය හා මාර්ග යටිතල පහසුකම්වලට සිදුව ඇති හානිය මෙම අභියෝග තවදුරටත් සංකීර්ණ කරයි. බලපෑමට ලක්වූ පළාත්වල දේශීය ආදායම් අහිමි වීම සහ ණය ගැතියන් පත්ව ඇති පීඩනය හේතුවෙන් අක්‍රීය ණය (NPL) ප්‍රමාණය ඉහළ යා හැකි අතර, එය ණය පියවීමේ ක්‍රියාවලියට අමතර බරක් එක් කරමින් බැංකු පද්ධතියේ ස්ථාවරත්වය පරීක්ෂාවට ලක් කරනු ඇත. එබැවින්, ඉදිරි මාස කිහිපය තුළ ඉතා විචක්ෂණශීලී රාජ්‍ය මූල්‍ය සහ මූල්‍ය අංශ කළමනාකරණය පවත්වාගෙන යාම අත්‍යවශ්‍ය වනු ඇත.

සාධක	ප්‍රධාන ප්‍රවණතා	පවතින අවදානම්	බැංකු ක්ෂේත්‍රය සඳහා හිමිවන අවස්ථා	මහජන බැංකුවට ඇති බලපෑම්
දේශපාලන පරිසරය	සාර්ථක ස්වෛරී ණය ප්‍රතිව්‍යුහගත කිරීමක් සාක්ෂාත් කර ගැනීම සඳහා රටේ ස්ථාවරත්වය, ප්‍රතිසංස්කරණ වේගය සහ විකාශනය වෙමින් පවතින රාජ්‍ය යාන්ත්‍රණය මනා ලෙස ඒකාබද්ධ විය. රාජ්‍ය මූල්‍ය ඒකාබද්ධ කිරීම, ප්‍රභල දූෂණ විරෝධී ක්‍රියාවලිය සහ ජාත්‍යන්තර ගිවිසුම්වලට අනුකූල වීම හේතුවෙන් ජාත්‍යන්තර ප්‍රජාව තුළ විශ්වාසය තහවුරු විය. එම විශ්වාසය, දේශගුණික ක්‍රියාමාර්ග සහ තිරසාර මූල්‍ය කැපවීම්වලට ප්‍රමුඛත්වය ලබා දෙන තිරසාර ජාතික සංවර්ධන න්‍යාය පත්‍රයක් සඳහා අවශ්‍ය සහාය ලබා ගැනීමට ඉවහල් විය.	දේශගුණික සහ ආර්ථික ප්‍රතිසංස්කරණ, නියාමන මැදිහත්වීම්, බදුකරණය මෙන්ම රජය විසින් නියම කරනු ලබන ණය දීමේ පිළිවෙත්වල (Mandated lending practices) සිදුවන වෙනස්වීම් සම්බන්ධයෙන් පවතින ප්‍රතිපත්තිමය අබණ්ඩතාව (Policy continuity) පිළිබඳ අවිනිශ්චිතතාවය, බැංකු ක්ෂේත්‍රයේ අවදානම් කළමනාකරණ රාමුවලට පීඩනයක් එල්ල කළ හැකි අභියෝගාත්මක අවදානමක් ලෙස හඳුනාගෙන ඇත. තවද, භූ-දේශපාලනික ආතතීන් රටේ අපනයනවලට සහ විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීමේ ධාරිතාවට දැඩි පීඩනයක් එල්ල කරන අතර, එමඟින් දේශසීමාන්තර ක්‍රියාකාරකම් කෙරෙහි ද බාධා පමුණුවයි.	කලාපයේ ප්‍රථම වතාවට හඳුන්වා දුන් ජාතික දේශගුණික මූල්‍ය උපායමාර්ගය (2025-2030), තිරසාර මූල්‍යකරණය සහ හරිත බැංකුකරණය සඳහා නව මංපෙත් විවර කරයි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) වැඩසටහන සහ ඒ හා බැඳුණු ප්‍රතිසංස්කරණ මගින් සාර්ව ආර්ථික ස්ථාවරත්වයක් ලබා දෙන අතර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් (SME) සවිබල ගැන්වීම හරහා මූල්‍ය අන්තර්ගතකරණය කෙරෙහි රජය දක්වන අවධානය, වෙළඳපොළේ වත්කම් සහ වගකීම් යන නිර්මිත ද්විත්වය සඳහාම ණය දීමේ අවස්ථා සහ පාරිභෝගික මූල්‍ය අවකාශය (wallet space) පුළුල් කරයි.	මූල්‍ය ප්‍රතිපත්තියෙන් ණය කළමනාකරණය වෙන් කිරීම මගින් පද්ධතිමය අවදානම අවම වී ඇති අතර ප්‍රතිපත්තිමය විනිවිදභාවයක් ඇති වී තිබේ. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් නගාසිටුවීම සඳහා වූ රජයේ නියමය, මූල්‍යමය අන්තර්කරණය කිරීම් සඳහා වන බැංකුවේ න්‍යාය පත්‍රය සමඟ මනාව අනුකූල වේ. ප්‍රතිපත්ති සම්පාදකයින් සමඟ ක්‍රියාකාරීව සම්බන්ධ වීම ජාතික සංවර්ධන අරමුණු සමඟ හවුල්කාරිත්වයන් ඇති කර ගැනීමට අවස්ථාව සලසා දුන් අතර, එය බැංකුවේ තිරසාරභාවය සඳහා අත්‍යවශ්‍ය සාධකයකි.

සාධක	ප්‍රධාන ප්‍රවණතා	පවතින අවදානම්	බැංකු ක්ෂේත්‍රය සඳහා හිමිවන අවස්ථා	මහජන බැංකුවට ඇති බලපෑම්
ආර්ථික පරිසරය	ශ්‍රී ලංකා ආර්ථිකය මන්දගාමී වර්ධන අවධියක පවතින අතර, 2025 වසරේ තුන්වන කාර්තුවේදී දළ දේශීය නිෂ්පාදිතය (GDP) 5.4%ක වර්ධනයක් වාර්තා කළේය. වසර අවසානය වන විට සංචාරකයින් මිලියන 2.4ක පැමිණීමත් සමඟ සංචාරක ක්ෂේත්‍රය සුවිශේෂී සන්ධිස්ථානයක් අත්කර ගත්තේය. ඉදිකිරීම් සහ කර්මාන්ත අංශ ධනාත්මක ගමන්තාවක් පවත්වා ගත් අතර, වැඩිදියුණු වූ ආයෝජන අවස්ථා, ආනයන මූල්‍ය පහසුකම් සහ අඩු පොලී අනුපාත හේතුවෙන් නිෂ්පාදන අංශය සහ වෙළඳ අංශයන් ප්‍රතිලාභ ලැබීය. රුපියලේ අගය මධ්‍යස්ථව අවප්‍රමාණය වෙමින් ස්ථාවර මට්ටමක පැවති අතර, ප්‍රධාන වශයෙන් පෞද්ගලික අංශය කේන්ද්‍ර කර ගනිමින් ණය වර්ධනය වේගවත් විය.	මුදල අවප්‍රමාණය වීම, ගෝලීය වෙළඳ භාණ්ඩ මිලවල අස්ථාවරත්වය සහ වේගවත් ණය ප්‍රසාරණය "විශේෂයෙන්ම රන් සුරැකුම් ණය සහ වාහන ආනයන මූල්‍යකරණය හරහා "බැංකු අංශයේ ණය බෙදීයාම සීමිත ක්ෂේත්‍ර කිහිපයකට කේන්ද්‍රගත වීමේ (ආංශික සාන්ද්‍රණය) අවදානම ඉස්මතු කරයි.ආපදා සහන සහ ප්‍රතිසංස්කරණ කටයුතු හේතුවෙන් රාජ්‍ය මූල්‍ය හිඟය පුළුල් විය හැකිය. එමෙන්ම, ආපදා හේතුවෙන් සැපයුම් දාමයට විල්ල වන බාධා නිසා කෙටි කාලීනව ප්‍රධාන උද්ධමනය (Headline inflation) ඉහළ යාමට ඉඩ ඇත.	ණය ප්‍රසාරණයත් සමඟ ණය වර්ධනය සහ ආදායම් විවිධාංගීකරණය යහපත් ප්‍රගතියක් පෙන්නුම් කළේය. වෙළඳ මූල්‍යකරණය (Trade finance), ඩිජිටල් ගනුදෙනු සහ ප්‍රේෂණ ඉහළ යාම හේතුවෙන් ගාස්තු මත පදනම් වූ ආදායම (Fee-based income) වර්ධනය විය. හරිත මූල්‍යකරණය (Green finance) පිළිබඳ රජයේ ස්ථාවරය, හරිත බැඳුම්කර, ණය සහ රක්ෂණ නිර්මිත ආශ්‍රිත තිරසාර ආයෝජන සඳහා නව අවස්ථා උදා කර දුන්නේය. බැංකු සේවා අවම වශයෙන් ව්‍යාප්ත වී ඇති ක්ෂේත්‍රයන්හි (Under-banked segments) කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සහ ක්ෂුද්‍ර මූල්‍ය අංශ බලගැන්වීමේ වැඩපිළිවෙළ හරහා බැංකුවල වෙළඳපොළ ව්‍යාප්තිය තවදුරටත් පුළුල් විය.	වර්ධනය, නවෝත්පාදනය සහ අවදානම්-ගැලපුම් මූල්‍ය ශක්තිය හේතුවෙන්, ණය දීම පුළුල් කිරීමට, ආදායම් ප්‍රවාහ විවිධාංගීකරණය කිරීමට සහ ස්ථාවර සාර්ව ආර්ථික පරිසරය මඟින් සහාය ලබන ඩිජිටල් පරිවර්තන ආයෝජන අබණ්ඩව ඉදිරියට ගෙන යාමට මහජන බැංකුවට හැකියාව ලැබිණි.
සමාජ පරිසරය	මිලියන 21.9ක ඇස්තමේන්තුගත ජනගහනයක් සහ -0.6%ක සෘණ වර්ධන වේගයක් සහිතව, 2024 අවසානය වන විට ශ්‍රී ලංකාවේ සාක්ෂරතා අනුපාතය 98.3%ක් විය. ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය 47.4%ක් වන අතර විරැකියා අනුපාතය 4.4%කි. මානව සංවර්ධන දර්ශකය 0.774ක් වන අතර, එය මධ්‍යස්ථ සමාජ සංවර්ධනයක් පිළිබිඹු කරයි. ජාතික මට්ටමින් ජනගහන දරිද්‍රතා අනුපාතය 3.2% දක්වා පහත වැටී ඇති අතර, ප්‍රාදේශීය විෂමතා තවමත් පවතී.[7] ජනගහනය වයස්ගත වෙමින් පවතින බැවින් විශ්‍රාම වැටුප් ප්‍රතිපාදන, සෞඛ්‍ය සහ සහන පියවරයන් ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ. රටේ තිරසාර සංවර්ධනය සඳහා තරුණ සංවර්ධනය තවදුරටත් තීරණාත්මක සාධකයකි. ජාතික මූල්‍ය ඇතුළත් කිරීමේ උපායමාර්ගය (II වන අදියර) යටතේ වන නියාමන අවශ්‍යතා සමඟ, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර, කාන්තාවන්, තරුණයින් සහ ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් සාම්ප්‍රදායික බැංකු පද්ධතියේ ප්‍රධාන ධාරාවට එක් කිරීමත් සමඟ මූල්‍ය ඇතුළත් කර ගැනීම සැලකිය යුතු ලෙස වැඩිදියුණු වී ඇත.	දිවිවා සුළි කුණාටුව මිලියන 2කට ආසන්න පිරිසකට බලපෑම් සිදු කළ අතර, එමඟින් විශාල පරිමාණයේ අවහැන්වීම්, ජීවිත හා ජීවනෝපායන් අහිමිවීම් සහ විශාල දේපළ හානි ඇති විය. කාන්තාවන්, ළමයින් සහ වැඩිහිටියන් විශේෂයෙන් පීඩාවට පත් වූ අතර, ඉලක්කගත සහන ලබාදීම සහ නැවත ගොඩනැගීමේ පියවර ක්‍රියාත්මක කිරීම අවශ්‍ය විය.	මූල්‍යමය අන්තර්කරණය, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර (SMEs), කාන්තා සවිබල ගැන්වීම සහ ග්‍රාමීය සංවර්ධනය සඳහා ණය ප්‍රවේශය, ඉතිරි කිරීම සහ රක්ෂණ සේවාවන් පුළුල් කිරීමට නව මංපෙත් විවර කරයි. කෘෂිකර්මාන්තය, ධීවර, සංචාරක සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා උචිත ආපදා අවදානම් රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දීම, දේශගුණික විපර්යාස හමුවේ ඔරොත්තු දීමටත්, ඉන් පසු නැවත යථා තත්ත්වයට පත්වීමටත් මෙන්ම මූල්‍යමය වශයෙන් ලාභදායී වීමටත් හේතු විය හැක. මූල්‍ය සාක්ෂරතා දැනුම සහ ඩිජිටල් තාක්ෂණය පිළිබඳව ජනතාව දැනුවත් කිරීමට කරන ආයෝජන මඟින්, මෙතෙක් බැංකු සේවා ලබා නොගත් පිරිස් තුළ බැංකු පද්ධතිය කෙරෙහි විශ්වාසයක් ඇති වේ. එමඟින් ඔවුන්ව ප්‍රධාන ධාරාවේ බැංකුකරණ පද්ධතිය වෙත යොමුකර ගැනීමට මඟ පෑදේ. විශ්වවිද්‍යාල මඟින් මෙහෙයවන තරුණ වැඩසටහන් හරහා, අනාගතයේදී රටේ සංවර්ධන ව්‍යවසායකත්වයන් සඳහා දායක විය හැකි විශිෂ්ටතම දක්ෂතාවලින් පිරිපුන් තරුණ පිරිසක් අබණ්ඩව බිහි කරනු ඇත.	රටේ පවතින සමාජ අවශ්‍යතා සලකා බැලීමේදී, මූල්‍ය සේවාවන් සැමට සමානව ලබා දීම සහ දුර බැහැර ප්‍රදේශවල සිටින ජනතාව වෙත සමීප වීම මහජන බැංකුවේ ප්‍රධාන ඉලක්කයකි. බැංකුවේ ඇති විසිරුණු ශාඛා ජාලය සහ ඩිජිටල්-භෞතික සම්මිශ්‍රිත බැංකුකරණ මාදිලිය (Hybrid Mode), රජයේ මූල්‍ය ඇතුළත් කිරීමේ වැඩපිළිවෙළ සාර්ථක කර ගැනීමට විශාල ශක්තියක් ලබා දෙයි. බැංකුව සතු ජ්‍යෙෂ්ඨ පුරවැසි පාරිභෝගික දත්ත විශ්ලේෂණය කිරීමෙන්, වයස්ගත වන ජනගහනයක අවශ්‍යතා සහ බලාපොරොත්තු පිළිබඳව මනා අවබෝධයක් ලබාගත හැකිය. එමඟින් ඔවුන් මුහුණ දෙන ගැටලු කල්තියා හඳුනාගෙන ඒවාට නිසි විසඳුම් ලබා දීමට බැංකුවට හැකියාව ලැබෙනු ඇත.

7. Statistics.gov.lk

සාධක	ප්‍රධාන ප්‍රවණතා	පවතින අවදානම්	බැංකු ක්ෂේත්‍රය සඳහා හිමිවන අවස්ථා	මහජන බැංකුවට ඇති බලපෑම්
තාක්ෂණික පරිසරය	ප්‍රතිපත්තිමය සහාය සහ පාරිභෝගික අපේක්ෂාවන් මඟින් මෙහෙයවනු ලබන වේගවත් ඩිජිටල් පරිවර්තනය බැංකු අංශයේ නවෝත්පාදනය සහ පරිමාණ හැකියාව වැඩි කරයි. 2025 ශ්‍රී ලංකාවේ සමාරම්භක ෆින්ටෙක් සමුළුවේ අරමුණ වන්නේ 2028 වන විට ෆින්ටෙක් ආයතන 200 කට අධික සංඛ්‍යාවක් ස්ථාපිත කිරීම සහ ජාතික දළ දේශීය නිෂ්පාදිතයට 3% ක දායකත්වයක් ලබා දීමයි.[8] ග්‍රාමීය සහ බැංකු පහසුකම් අවම ප්‍රදේශවල නියෝජිත බැංකුකරණය වේගයෙන් ව්‍යාප්ත වීමත් සමඟ ඩිජිටල් ගනුදෙනු ඉහළ ගොස් තිබේ.	වේගවත් වෙමින් පවතින ඩිජිටල් පරිවර්තනයත් සමඟ සයිබර් ආරක්ෂණ තර්ජනවලට ගොදුරු වීමේ අවදානම ඉහළ ගොස් ඇත. මෙම අංශය සඳහා කෙරෙන ආයෝජන සීමා සහිත වුවහොත්, බැංකු මූල්‍යමය පාඩුවලට මෙන්ම සිය කීර්ති නාමය පළුදු වීමේ අවදානමකට ද ලක් විය හැකිය. ඩිජිටල් සාක්ෂරතාවය අවම වීම සහ ජනතාව තවදුරටත් සාම්ප්‍රදායික බැංකු ක්‍රමවේදයන්ටම ප්‍රමුඛතාවය දීම හේතුවෙන් සමාජය තුළ "ඩිජිටල් බෙදුමක්" නිර්මාණය වීමේ ඉඩකඩ පවතී. එමෙන්ම, පද්ධති බිඳවැටීම්, විවිධ තාක්ෂණික පද්ධති ඒකාබද්ධ කිරීමේදී ඇතිවන බාධා සහ බාහිර පාර්ශවීය සේවාවන් මත ඕනෑවට වඩා යැපීම හේතුවෙන් බැංකු සේවාවන්හි අඛණ්ඩතාව ගිලිහී යා හැකිය.	ඩිජිටල් නවෝත්පාදන, ෆින්ටෙක් (FinTech) හවුල්කාරිත්වයන්, කෘත්‍රිම බුද්ධිය (AI) සහ දත්ත විශ්ලේෂණ උපයෝගී කරගනිමින් මෙරට බැංකු ක්ෂේත්‍රය ගෝලීය මට්ටමේ තරඟකාරිත්වයකට ඔසවා තැබිය හැකිය. නවෝත්පාදන සඳහා ලැබෙන නියාමන සහයෝගය (Regulatory support), තිරසාර ආර්ථිකයක් සඳහා ඩිජිටල්කරණය ප්‍රධාන සාධකයක් වන බවට ලැබෙන මනා ඉඟියකි.	මහජන බැංකුව සම්බන්ධයෙන් ගත්කල, තාක්ෂණික නවෝත්පාදනය සහ ඩිජිටල්කරණය යනු උපායමාර්ගික අවශ්‍යතාවයක් මෙන්ම බැංකුවේ අනන්‍යතාව විඳහා දක්වන ප්‍රධාන සාධක වේ. මෙම අංශයෙන් දේශීය හා ජාත්‍යන්තර වශයෙන් සම්මාන රැසක් දිනා ඇති මහජන බැංකුව, ඩිජිටල් බැංකුකරණයේ ප්‍රතිලාභ ග්‍රාමීය සහ මෙතෙක් බැංකු පහසුකම් නිසි ලෙස ලබා නොගත් ජන කොටස් වෙත සමීප කරවීමේ පෙරමුණ ගෙන සිටී. මෙය රජයේ මූල්‍ය ඇතුළත් කිරීමේ (Financial Inclusivity) වැඩපිළිවෙළ සමඟ මනාව අනුකූල වන අතර, එමඟින් බැංකුවේ මූලික පරමාර්ථය වන මහජන සුභසාධනය තවදුරටත් තහවුරු වේ.
පාරිසරික පසුබිම	ගෝලීය දේශගුණික අවදානම් දර්ශකයේ (Global Climate Risk Index) දේශගුණික විපර්යාස හේතුවෙන් ඇතිවන ආන්තික කාලගුණික රටාවන්ට ගොදුරු වීමේ වැඩි අවදානමක් පවතින රටවල් දහය අතර ශ්‍රී ලංකාව අඛණ්ඩව ශ්‍රේණිගත වී ඇත. මෙහි ආසන්නතම සහ දරුණුතම බලපෑම වූයේ 2025 නොවැම්බර් මාසයේදී ඇති වූ "දිට්වා" (Ditwah) සුළි කුණාටුවයි. එමඟින් සිදු වූ භෞතික හානියේ ඇස්තමේන්තුගත පිරිවැය ඇමරිකානු ඩොලර් බිලියන 4.1ක් පමණ වේ. රට තුළ තිරන්තරයෙන් සිදුවන ගංවතුර, නායයෑම් සහ වෙරළ බාදනය වැනි ස්වභාවික ආපදාවලට අදාළව අවදානමට නිරාවරණය වීමේ ස්වභාවය මෙම සුළි කුණාටුවෙන් යළිත් තහවුරු වූ අතර, මෙහිදී වඩාත් දරුණුතම බලපෑමට ලක් වූයේ අවදානමට ලක්විය හැකි පහළ මට්ටමේ ප්‍රජාවන්ය. එසේ වුවද, රජය පැරිස් ගිවිසුමට (Paris Agreement) අනුකූල වෙමින් දේශගුණික විපර්යාසයන්ට එරෙහිව ක්‍රියා කිරීමට සිය දැඩි කැපවීම පෙන්නුම් කර ඇති අතර, ඒ වෙනුවෙන් "ජාතික දේශගුණික මූල්‍ය උපායමාර්ගය 2025-2030" (National Climate Finance Strategy) හඳුන්වා දී ඇත. මෙහි ප්‍රධාන ඉලක්කය වන්නේ ආපදා අවදානම් රක්ෂණය, හරිත බැඳුම්කර (Green Bonds), රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් සහ ස්වභාවික ප්‍රාග්ධන ගිණුම්කරණය වැනි මූල්‍ය මෙවලම් හරහා, අවදානම් අවම කිරීමට සහ අනුවර්තනය වීමට අවශ්‍ය සම්පත් බලමුලු ගැන්වීමයි.	භෞතික අවදානම් (Physical risks) අතරට දේශගුණික කම්පනයන්හි (climate related shocks) පවතින වර්ධනය වන අවිනිශ්චිතභාවය ඇතුළත් වන අතර, එමඟින් සංවර්ධන අරමුදල් ආපදා සහන කටයුතු වෙත යොමු කිරීමට සිදු වේ. කාබන් උදාසීනත්වය කරා ක්‍රමයෙන් මාරුවීමත් සමඟ පොසිල ඉන්ධන මත යැපෙන කර්මාන්ත පසුබෑමකට ලක්විය හැකි බැවින්, බැංකු විසින් සිය ණය දීමේ උපායමාර්ග ඇගයීමට ලක් කිරීම සහ කෙටි කාලීන සහන පියවර හඳුන්වා දීම අත්‍යවශ්‍ය වේ. දිනෙන් දින වෙනස් වන පාරිසරික නියාමන, තොරතුරු හෙළිදරව් කිරීමේ අවශ්‍යතා සහ හරිත වර්ගීකරණ (Green Taxonomy) ප්‍රමිතීන්ට අනුකූල වීම සඳහා අඛණ්ඩ අනුකූලතාව සහ ධාරිතාව ගොඩනැගීම අවශ්‍ය වේ.	හරිත මූල්‍යකරණය සඳහා පවතින වර්ධනය වන ඉල්ලුම, මූල්‍ය ක්ෂේත්‍රයේ තිරසාරභාවය උදෙසා නව ආදායම් මාර්ග පුළුල් කිරීමට උපකාරී වේ. බැංකු-රක්ෂණ සේවාවන් ඔස්සේ ආපදා අවදානම් කළමනාකරණයට අදාළ නව මූල්‍ය විසඳුම් හඳුන්වා දීමේ හැකියාව පවතී. බැංකු මෙහෙයුම් සඳහා තිරසාර ක්‍රමවේදයන් ඇතුළත් කිරීම මඟින් පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය තහවුරු වන අතර, එය පිරිවැය ප්‍රශස්තිකරණයට සහ වගකිවයුතු ආයතනික පුරවැසියෙකු ලෙස බැංකුවේ සන්නාම ප්‍රතිරූපය ඉහළ නැංවීමට දායක වේ. රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයතන සමඟ නව හවුල්කාරිත්වයන් ඇති කර ගැනීම, දේශගුණික ක්‍රියාමාර්ග සහ තිරසාර සංවර්ධනය සඳහා අවශ්‍ය සම්පත් කාර්යක්ෂමව උපයෝගී කර ගැනීමට මඟ පාදයි.	බැංකුව දිනා ඇති සම්මාන සහ එහි පවතින විවිධ නව්‍ය නිර්මිත මඟින් තහවුරු වන පරිදි, සිය හරිත මූල්‍යකරණ වැඩපිළිවෙළෙහි ප්‍රතිලාභ අත්පත් කර ගැනීමට බැංකුව මේ වන විට ප්‍රමුඛස්ථානයක පසුවේ. ආයතනයේ දිගුකාලීන තිරසාරභාවය උදෙසා, ශක්තිමත් අවදානම් කළමනාකරණ ක්‍රියාවලියක්, විධිමත් ණය ඇගයීමක් සහ ජාතික සංවර්ධන ඉලක්කයන්ට අනුකූල වූ ආපදා සූදානමක් පවත්වා ගැනීම අත්‍යවශ්‍ය සාධක වේ.

8. Ceylongtoday.lk

සාධක	ප්‍රධාන ප්‍රවණතා	පවතින අවදානම්	බැංකු ක්ෂේත්‍රය සඳහා හිමිවන අවස්ථා	මහජන බැංකුවට ඇති බලපෑම්
නෛතික පරිසරය	2025 වසරේදී ශ්‍රී ලංකාවේ නීතිමය සහ නියාමන වටපිටාව සැලකිය යුතු වෙනස්කම් රැසකට භාජනය විය. එහිදී දූෂණ විරෝධී ක්‍රියාවලිය මූලික කරගනිමින්, අවදානම් කළමනාකරණය, අනුකූලතාවය (Compliance) සහ ආයතනික පාලනය කෙරෙහි සූක්ෂ්ම අවධානයක් යොමු කෙරිණි. ආයතනික පාලන ප්‍රතිසංස්කරණ, BASEL III ක්‍රියාවට නැංවීම, සාර්ව-විචක්ෂණ ප්‍රතිපත්ති, මූල්‍ය විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මූල්‍යමය ආධාර සැපයීම මැඩපැවැත්වීමේ (AML/CFT) වැඩිදියුණු කිරීම්, තාක්ෂණික අවදානම් කළමනාකරණය, බදුකරණය සහ පාරිභෝගික ආරක්ෂණ විධිවිධාන ක්‍රියාත්මක කරන ලදී. මේවා සඳහා දැඩි අනුකූලතාවයක් අනිවාර්ය කර ඇති අතර, නියමිත රෙගුලාසි උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් දැඩි දඬුවම් පනවා ඇත.	මෙම නීතිරීතිවල සිදුවන ඕනෑම ආකාරයක උල්ලංඝනය වීමක් හේතුවෙන් බැංකුව නඩු පැවරීමේ අවදානමකට (Litigation risk) නිරාවරණය වීමේ සහ ඉහළ පිරිවැයකට ලක්වීමේ අවදානමක් පවතී. එමෙන්ම ඒ සඳහා මූල්‍යමය මෙන්ම මානව සම්පත් ද විශාල වශයෙන් යෙදවීමට සිදුවනු ඇත.	මෙම දැඩි ප්‍රතිසංස්කරණ මගින් විචක්ෂණශීලී විනිවිදභාවය, නියාමන නවෝත්පාදනය මෙන්ම බහුවිධ අංශයන් ඔස්සේ නිෂ්පාදන නවෝත්පාදන හඳුන්වා දීම සඳහා අවශ්‍ය පසුබිම සකස් කිරීමට රජය දක්වන කැපවීම මනාව පැහැදිලි වේ.	විනිවිදභාවය සහ යහපාලන ක්ෂේත්‍රය තුළසම්මාන රැසක් දිනා ඇති මහජන බැංකුව මේ වන විට ශක්තිමත් මූල්‍ය ස්ථාවරත්වයක පසුවේ. කෙසේ වුවද, තරඟකාරී වෙළඳපොළේ ඉදිරියෙන්ම සිටීම සඳහා ක්‍රියාකාරී අවදානම් කළමනාකරණයක්, අනුකූලතා යටිතල පහසුකම් සඳහා අඛණ්ඩ ආයෝජනයක් සහ සේවක කුසලතා වර්ධනය කිරීම අත්‍යවශ්‍ය වේ.

2026 සඳහා ආර්ථික දැක්ම

2026 සඳහා ශ්‍රී ලංකාවේ ආර්ථික දැක්ම ප්‍රවේශම් සහගත ශුභවාදී මට්ටමක පවතින අතර, ආර්ථික අර්බුදයේ උච්චතම අවස්ථාවේ සිට ක්‍රියාත්මක කරන ලද අඛණ්ඩ මූල්‍ය ඒකාබද්ධ කිරීම සහ සාර්ව ආර්ථික ස්ථායීකරණ පියවර මගින් එය තහවුරු වේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) වැඩසටහන මගින් සහාය දක්වන ලද අඛණ්ඩ ප්‍රතිසංස්කරණ, උද්ධමන පීඩනය ලිහිල් කිරීමට, විනිමය අනුපාතය ස්ථාවර කිරීමට, බාහිර ශේෂයන් ශක්තිමත් කිරීමට සහ ආයෝජක විශ්වාසය යම් මට්ටමකට යථා තත්ත්වයට පත් කිරීමට දායක වී ඇත. 2026 වසරේ වර්ධනය ප්‍රධාන වශයෙන් පුද්ගලික පරිභෝජනය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීම, සංචාරක ඉපැයීම්වල තිරසාර පුනර්ජීවනයක් සහ නොසැලෙන සේවක ප්‍රේෂණ මගින් මෙහෙයවනු ඇතැයි අපේක්ෂා කෙරේ; මේ සියල්ල 2022-2023 ආර්ථික සංකෝචන අවධියෙන් පසු ස්ථාවර දියුණුවක් පෙන්නුම් කර ඇත. කෙසේ වෙතත්, අර්බුදයට පූර්ව දළ දේශීය නිෂ්පාදිතය සහ ඒක පුද්ගල ආදායම් මට්ටම් වෙත වේගවත් ප්‍රවේශයක් ලබා ගැනීම රඳා පවතින්නේ ශක්තිමත් පෞද්ගලික අංශයේ ආයෝජන, ඵලදායිතා වර්ධනයන් සහ සාම්ප්‍රදායික අංශවලින් ඔබ්බට ගිය අර්ථවත් අපනයන විවිධාංගීකරණය මත ය.

මෙම ගමන්තාව තිරසාර කර ගැනීම සඳහා අඛණ්ඩ ප්‍රතිපත්ති විශ්වසනීයත්වය, වැඩිදියුණු කළ ආදායම් බලමුලු ගැන්වීම සහ විනයගරුක රාජ්‍ය මූල්‍ය කළමනාකරණය අවශ්‍ය වේ. ණය තිරසාරභාවය සහ සාර්ව ආර්ථික ස්ථාවරත්වය සහතික කිරීම සඳහා විශේෂයෙන් බදුකරණය, රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිව්‍යුහගත කිරීම සහ පාලනය යන අංශවල ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ යන සාධක කේන්ද්‍රීය වේ. එමෙන්ම, යටිතල පහසුකම් නැවත ගොඩනැගීම, ජීවනෝපායන් යථා තත්ත්වයට පත් කිරීම සහ අවතැන් වූ ප්‍රජාවන් නැවත පදිංචි කිරීම සඳහා සම්පත් යොමු කිරීමට සිදු විය හැකි බැවින්, දිට්වා (Ditwah) සුළි කුණාටුවෙන් යථා තත්ත්වයට පත්වීමේ ක්‍රියාවලිය රජයේ මූල්‍ය ප්‍රමුඛතා කෙරෙහි බලපෑම් කිරීමට ඉඩ ඇත. "ශ්‍රී ලංකාව නැවත ගොඩනැගීමේ" අරමුදල පිහිටුවීම සහ ඉහළ මට්ටමේ රාජ්‍ය-පෞද්ගලික කමිටුවක් පත් කිරීම මගින් සම්බන්ධීකරණ ප්‍රතිසංස්කරණ සහාය බලමුලු ගැන්වීමේ උත්සාහයන් පිළිබිඹු වේ. සමස්තයක් වශයෙන්, ශ්‍රී ලංකාවේ 2026 දැක්ම ක්‍රමානුකූල නමුත් ස්ථාවර වර්ධනයක් පෙන්නුම් කරන අතර, එයට යහපත් මූල්‍ය කළමනාකරණය, ආයතනික ප්‍රතිසංස්කරණ සහ මධ්‍ය කාලීන ආර්ථික ප්‍රකෘතියක් උදෙසා සන්නද්ධ වූ අභියෝග ජය ගැනීම සඳහා පෞද්ගලික අංශයක් සහාය වේ.

පාර්ශ්වකාර සහභාගිත්වය



බලපත්‍රලාභී රාජ්‍ය වාණිජ බැංකුවක් වශයෙන් මහජන සුභසිද්ධිය තහවුරු කිරීම පිණිස සන්නිවේදනය, සහයෝගිත්වය සහ ශක්තිමත් සබඳතාවය පෝෂණය කරන දූරදර්ශී තීරණ ගැනීමේ ක්‍රියාවලිය සඳහා අපගේ පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වයට ගනුදෙනුකාරභවතුන්, බැංකු සේවකයන්, නියාමකවරුන් සහ ප්‍රජා කොටස් ඇතුළත් වේ. මෙම වැදගත් හවුල් සබඳතාව තුළින් පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා සහ අවස්ථා ආමන්ත්‍රණය කිරීමට, අවදානම් අඩු කිරීමට සහ වටිනාකමක් ලබා දීමට මෙන් ම ලබා ගැනීමට අපගේ උපායමාර්ග පෙළ ගස්වා ඇත.

කළමනාකරණ ප්‍රවේශය

GRI 2-29


අපි අපගේ ප්‍රධාන සබඳතා ස්ථාවර ආකාරයකට කළමනාකරණය කරන්නෙමු. පාර්ශ්වකරුවන් කෙරෙහි දශක හයක් මුළුල්ලහි අප දක්වා ඇති සැළකිලිමත් බව යහපත් කාලවකවානුවල දී මෙන් ම අර්බුදකාරී අවස්ථාවල දී ද දැයේ විවිධ සමාජ ආර්ථික කණ්ඩායම් තුළ බැංකුව සිදු කළ ආයෝජනවලට ප්‍රමාණවත් සාක්ෂියකි. ව්‍යුහගත ප්‍රවේශයක් තුළින් පාර්ශ්වකරුවන් හඳුනාගනු ලබන අතර එම ප්‍රවේශයේ දී බැංකුවට සිය උපායමාර්ග ක්‍රියාත්මක කර තමන්ගේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට ඇති හැකියාවට වැදගත් බලපෑමක් එල්ල කළ හැකිවන්නේ කාගේ ක්‍රියාකාරකම්වලින් ද යන්න සළකා බලනු ලැබේ. ඒ අනුව, පාර්ශ්වකාර කණ්ඩායම් හඳුනාගැනීමේ ක්‍රියාවලිය ප්‍රධාන කරුණු තුනක් මත පදනම් වේ.

බැංකුවේ අයිතිය, අරමුණු සහ ක්‍රියාකාරකම්වල විෂය පථය නියම කරන මහජන බැංකු පනත	බැංකු බලපත්‍රය අඛණ්ඩව පවත්වාගෙන යාම තහවුරු කිරීම පිණිස සියළුම ක්‍රියාකාරකම් තුළ නියාමන අනුකූලතාවය රැකීම	රාජ්‍ය බැංකුවක් වශයෙන් ශ්‍රී ලාංකේය ජනතාව වෙත පිරිනමන බැංකුවේ උපායමාර්ගික ව්‍යාපාරික අරමුණු

පාර්ශ්වකරුවන් ප්‍රමුඛතාගත කිරීම

අපේක්ෂිත ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීම තහවුරු කිරීම පිණිස බැංකුව සහ පාර්ශ්වකරුවන් අතර දෙපසට ම තොරතුරු හුවමාරුව සිදු වන මනාව අර්ථ දක්වන ලද පරිචයන් සමූහයක් ක්‍රියාත්මක කරනු ලැබේ. තීරණ ගැනීමේ ක්‍රියාවලියේ දී අපගේ පාර්ශ්වකාර කණ්ඩායම්වල අභිලාෂයන් අතිශයින් වැදගත් බැවින් අපි එම කණ්ඩායම් අපගේ ව්‍යාපාරය මත ඇති කරන බලපෑම තක්සේරු කිරීම සඳහා පියවර සතකින් යුත් ක්‍රමවේදයක් භාවිත කරන්නෙමු.

අරමුණ සහ විෂය පථය නිර්වචනය කිරීම	පාර්ශ්වකරුවන් හඳුනා ගැනීම	ප්‍රභේදගත කිරීම	බලපෑම තක්සේරු කිරීම	සහභාගි වන ක්‍රමය	සන්නිවේදනය සහ වාර්තා කිරීම	සමාලෝචනය සහ යාවත්කාලීන කිරීම



අදාළ සංසද සහ කමිටුවලට පාර්ශ්වකරුවන්ගේ ප්‍රතිචාර ලැබේ. මෙම ප්‍රතිචාර ඉන් අනතුරුව අදාළ තීරණ ගැනීමේ දී සළකා බැලීම පිණිස ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය වෙත සන්නිවේදනය කරනු ලැබේ.

අපගේ පාර්ශ්වකරුවෝ

GRI 2-29, 207-3



ශ්‍රී ලංකා රජය

අප වටිනාකම නිර්මාණය කරන අයුරු

අපගේ ප්‍රමුඛතම කොටස්හිමිකරු සහ පාර්ශ්වකරු වන්නේ ශ්‍රී ලංකා රජය යි; එයට නිකුත් කරන ලද කොටස් ප්‍රාග්ධනයෙන් 92.27%ක කොටස් හිමිකාරිත්වයක් ඇත. ශ්‍රී ලංකා රජය විසින් සිදු කරනු ලබන බොහෝ ජාතික සංවර්ධන ව්‍යාපෘතිවලට සහාය දැක්වීම මගින් අපි අපගේ වටිනාකම නිර්මාණය කරගන්නෙමු.

අපගේ සේවාව	අපගේ වටිනාකම දායාද කිරීම	ප්‍රතිඵලය
අපි ශ්‍රී ලංකා රජයේ ජාතික සංවර්ධන න්‍යාය පත්‍රය ක්‍රියාවට නැංවීම පිණිස නන් අයුරින් සහයෝගය දක්වන්නෙමු. • දැයේ ආර්ථික ක්‍රියාකාරකම් උත්තේජනය කරන පුළුල් පරාසයක ව්‍යාපාර සඳහා මූල්‍ය පහසුකම් ලබා දීම. • සංවර්ධනය සඳහා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට මෙන්ම ක්ෂුද්‍රමූල්‍ය අංශවල අරමුදල් ලබා දීම. • බලශක්ති පරිභෝජනය අඩු කිරීම පිණිස අපගේ ඩිජිටල් වේදිකා පහසුකම් ඉහළ නැංවීම. • යටිතලය යළි ගොඩනැංවීම පිණිස වන ව්‍යාපෘති සඳහා මූල්‍ය පහසුකම් ලබා දීම. • අනලස් බව සහ නිසි සැලකිල්ලක් දක්වමින් බැංකුවේ සන්නාමය ඉහළ දෘශ්‍යතාවයකින් යුතුව කළමනාකරණය කර ගැනීම. **අප සහභාගිවන ආකාරය** ජාතික සංවර්ධනයට අදාළ තොරතුරු සන්නිවේදනය කිරීම, මාර්ගෝපදේශ ලබා ගැනීම සහ සහාය දැක්වීම පිණිස මුදල් අමාත්‍යාංශය සහ රජයේ අධිකාරීන් සමග නිරන්තර සබඳතා පවත්වන්නෙමු.	• ශක්තිමත් ප්‍රාග්ධනයක් සහ ද්‍රවශීලතා තත්ත්වයක් පවත්වා ගැනීම. • රාජ්‍ය බැංකුවක් වශයෙන් අභියෝගාත්මක ආර්ථික වාතාවරණයක් තුළ ගනුදෙනුකරුවන්ගේ විශ්වාසය ඉහළ නංවා ගැනීම. • ඉහළ මට්ටමේ සයිබර් ආරක්ෂණයක් තුළින් මෙහෙයුම් ක්‍රියාවලිය ඔරොත්තු දිය හැකි අයුරින් පවත්වා ගෙන යාම. • බලශක්ති පරිහරණය සඳහා ජාතික විදුලිබල පද්ධතිය මත පැටවෙන බර අඩු කිරීමට අඛණ්ඩව කටයුතු කිරීම. • බැංකුවේ උපායමාර්ග/ක්‍රියාමාර්ග රජයේ සංවර්ධන වැඩසටහන් සහ දරිද්‍රතාවය තුරන් කිරීමේ ප්‍රතිපත්ති සමග ගැලපීම. • ශ්‍රී ලංකා රජයෙන් පිරිනමනු ලබන සහනදායී ණය ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායන් (MSMEs) සහ කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායන් (SMEs) වෙත යොමු කිරීම. • විශ්ව විද්‍යාල සිසුන්ට සහ අදාළ ප්‍රදේශයේ සිසුන්ට පුහුණු පහසුකම් සහ රැකියා ලබාදීම.	නියාමන දඩ නොමැත රජයට ලබා දුන් මුළු දායකත්වය (බදු සහ අය කිරීම්) රුපියල් බිලියන 49.0 පුද්ගලයින් 8122ට රැකියා ලබා දීම හිමිකම් මත ප්‍රතිලාභ 20.1% කොටසකට ඉපැයීම් රුපියල් 40,230 කොටසකට ශුද්ධ වත්කම් වටිනාකම රුපියල් 219,038



අනෙකුත් කොටස් හිමියෝ: සමූපකාර සමාගම්

අප වටිනාකම නිර්මාණය කරන අයුරු

නිකුත් කරන ලද කොටස් ප්‍රාග්ධනයෙන් සමූපකාර සමිතිවලට 7.73%ක කොටස් හිමිකාරිත්වයක් ඇත. මෙම අංශයේ දියුණුව බැංකු වෙත ප්‍රවේශය රහිත හෝ ඌන ප්‍රවේශය සහිත කොටස්වලට මූල්‍ය පද්ධතිය වෙත ප්‍රවේශය ලබාගැනීමට (මූල්‍ය අන්තර්කරණය) ඉවහල් වේ.

අපගේ සේවාව	අපගේ සහභාගිත්වය	අපගේ වටිනාකම දායාද කිරීම	ප්‍රතිඵලය
• ග්‍රාමීය මට්ටමෙන් ආර්ථිකයේ ඔරොත්තු දීමේ හැකියාව තහවුරු කිරීම පිණිස පුහුණුව ලබාදීම මගින් පාලනය සහ තිරසාරබව ශක්තිමත් කිරීම • එමගින් දැයේ සංවර්ධනයට අර්ථාන්විතව දායකත්වය දැක්වීම • මණ්ඩලයේ නියෝජිත අධ්‍යක්ෂ සමග අදහස් හුවමාරු කර අදාළ අංශය සමග අපගේ ක්‍රියාත්මකව පවත්නා ක්‍රියාවලිය පිළිබඳව ඔහුව දැනුවත් කිරීම	• සමූපකාර නියෝජිතයන් සමග අවශ්‍යතා මත පදනම් වූ අදහස් හුවමාරු කර ගැනීම්	• විශේෂිත ණය ලබාදීම • බැංකුව සමග තැන්පතු පවත්වාගෙන යාම වෙනුවෙන් විශේෂ පොළී අනුපාතික ලබාදීම • මූල්‍ය උපදේශනය ලබා දීම • කෘෂිකර්මාන්තයට, ධීවර කර්මාන්තයට සහ පාරිභෝගික වෙළඳාමට මුදල් ලබාදීම මගින් සමූපකාර සමිතිවලට සහාය දැක්වීම	



ශ්‍රී ලංකා මහ බැංකුව

අප වටිනාකම නිර්මාණය කරන අයුරු

ප්‍රමුඛතම නියාමක වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ රෙගුලාසි සහ විධාන වෙත අප දක්වන අනුකූලතාව නොවෙනස්ව පවතී. රටේ නියාමන සහ නෛතික රාමුව තුළ සදාචාර සම්පන්න බැංකුකරණයක් ක්‍රියාත්මක කිරීමට අප දක්වන කැපවීම ප්‍රදර්ශනය කරමින් සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ අපට එරෙහිව දණ්ඩන පැනවීමක් සිදු වී නොමැත.

අපගේ සේවාව	අපගේ සහභාගිත්වය	අපගේ වටිනාකම දායාද කිරීම	ප්‍රතිඵලය
• රාජ්‍ය බැංකුවක් වශයෙන් බැංකුකරණයට සහ පාලනයට ආදර්ශවත් වීම තුළින් ප්‍රමුඛත්වය ගැනීම • නිෂ්පාදන හා සේවාවන් අතර බැඳීම් ඇති කරන රෙගුලාසි ක්‍රියාත්මක කිරීම • ශ්‍රී ලංකා මහ බැංකුවේ ඩිජිටල් විධාන සහ දේශගුණික විපර්යාසවලට අනුවර්තනය වීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම • යම් සැක කටයුතු ගනුදෙනු හෝ බැංකු ක්‍රියාකාරකම් ඒ ඒ අවස්ථාවේ දී වාර්තා කිරීම • බැංකු ක්ෂේත්‍රය තුළ ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීම සඳහා අපගේ විශේෂඥ දැනුම බෙදාහදා දෙමින් විවිධ සම්මේලනවලට සහභාගි වීම	• ශ්‍රී ලංකා මහ බැංකුව සමග කර්මාන්ත හා සම්බන්ධ සම්මේලනවලට සහභාගිවීම • ශ්‍රී ලංකා මහ බැංකුවේ අදාළ දෙපාර්තමේන්තු සමග සෘජුව සාකච්ඡා පැවැත්වීම • බරපතල ගැටළුවලදී අප්‍රමාදීව අවශ්‍ය මාර්ගෝපදේශ ලබා ගැනීම • ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන විධාන සහ රෙගුලාසි දැඩිව අනුගමනය කිරීම • නිසි වේලාවට වාර්තා කිරීම සහ අනාවරණය කිරීම • ජාතික සංවර්ධන මූලපිරිම් සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව සමග හවුල්කරුවකු ලෙස කටයුතු කිරීම	• අඛණ්ඩව විවිධ ආර්ථික තත්ත්වයන්ට ඔරොත්තු දිය හැකි බැංකුවක් වීම සහ ශක්තිමත් සන්නාමයක් රට තුළ පවත්වා ගැනීම • බැංකු වෙත ඌන ප්‍රවේශය සහිත හෝ ප්‍රවේශය රහිත කොටස්වලට මූල්‍ය පද්ධතිය වෙත ප්‍රවේශය ලබාදීම (මූල්‍ය අන්තර්කරණය) සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියෝග කරනු ලබන බොහෝ මූලපිරිම් ක්‍රියාත්මක කිරීම • ශ්‍රී ලංකා මහ බැංකුවේ මූලපිරිමක් වන දේශගුණික විපර්යාසවලට අනුවර්තනය වීමේ වැඩසටහනට සහාය දැක්වීමක් වශයෙන් හරිත ණය ක්‍රමය (Green lending) මෙහෙයවීමට අඛණ්ඩව කටයුතු කිරීම • තිරසාර බව සඳහා සදාචාර සම්පන්න පාලනය සහ අවදානම් මනාව අවම කළ ලාභදායී ව්‍යාපාරයක් මෙහෙය වීමට අඛණ්ඩව කටයුතු කිරීම	ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවන ලද දඩ නොමැත ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද සියළුම විධාන ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම



සැපයුම්කරුවෝ

අප වටිනාකම නිර්මාණය කරන අයුරු

බැංකුවේ ආවේනික වටිනාකම් වන සදාචාරාත්මක මූලාශ්‍රකරණය (sourcing) සහ යහපාලනය පිළිබඳ බැංකුවේ ආවේනික වටිනාකම් සිතට කා වද්දමින් අප අපගේ සැපයුම්කරුවන් සමග හවුලේ කටයුතු කිරීම.

අපගේ සේවාව	අපගේ සහභාගිත්වය	අපගේ වටිනාකම දායාද කිරීම	ප්‍රතිඵලය
• විවිධාකාරයේ සැපයුම්කරුවන් ගෙන් සමන්විත කණ්ඩායම්වලට සහාය දැක්වීම මගින් අන්‍යෝන්‍ය වශයෙන් ඵලදායී සම්බන්ධතා ගොඩනඟා ගැනීම • විනිවිදභාවයෙන් යුතු ප්‍රසම්පාදන ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීම • නිසි වේලාවට ගෙවීම් කිරීම	• ටෙන්ඩර් ක්‍රියාවලියේ සිට සැපයුම්කරු බැංකුවට සම්බන්ධ කර ගන්නා අදියර දක්වා • වැඩබිම් වෙත සංචාරය කිරීම සහ අවශ්‍ය අවස්ථාවලදී එකිනෙකා හමු වී සාකච්ඡා පැවැත්වීම	• අපගේ පසෙකින් සිට කටයුතු කිරීමට අවස්ථා සැලසීම • ඔවුන්ගේ මූල්‍ය ශක්තිමත්භාවය තහවුරු කිරීම • සදාචාරාත්මක මූලාශ්‍රකරණ මූලධර්ම අවශෝෂණය කර ගැනීම • ඔවුන්ගේ ව්‍යාපාරික ස්ථාන තුළ යහපාලනය පවත්වාගෙන යාමට අනුබල සැපයීම සවිස්තරාත්මක සටහනක් සඳහා කරුණාකර අංක 189 සිට 191 දක්වා පිටුවල ඇති සමාජීය ප්‍රාග්ධනය පිළිබඳ විස්තරය පරිශීලනය කරන්න.	සැපයුම්කරුවන් වෙත රුපියල් බිලියන 23.2ක් ගෙවීම e-Gp මගින් සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම ගෙවීම් පැහැර හැරීම් නොමැති වීම සැපයුම්කරුවන්ගේ මූල්‍ය ශක්තිමත්භාවය



ගනුදෙනුකරුවෝ

අප වටිනාකම නිර්මාණය කරන අයුරු

වඩාත්ම පුළුල් ජාලය සහිත ප්‍රමුඛතම රාජ්‍ය බැංකුව වශයෙන් අපගේ ගනුදෙනුකාර ප්‍රජාවට රජය, සංස්ථා, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර, ව්‍යවසායකයින්, පුද්ගලයින් සහ විදේශ සේවා නියුක්තිකයින් ඇතුළත් වේ.

අපගේ සේවාව	අපගේ සහභාගිත්වය	අපගේ වටිනාකම දායාද කිරීම	ප්‍රතිඵලය
• මූල්‍ය අන්තර්කරණය ප්‍රවර්ධනය කිරීම • විවිධත්වයෙන් යුතු ගනුදෙනුකරුවන් ගෙන් සමන්විත පදනමක් පවත්වාගෙන යාම • ව්‍යාපෘති සඳහා මුදල් සම්පාදනය, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වෙත මුදල් සම්පාදනය සහ ක්ෂුද්‍ර මූල්‍යකරණය • දිවයින පුරා පිහිටි ශාඛා ජාලය • කාන්තා ව්‍යවසායකයින් සවිබල ගැන්වීම • ගනුදෙනුකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා ආයෝජනය කිරීම • අඩු වයසේ සිට ඉතිරි කිරීමට තරුණ පරපුර පුහුණු කිරීම • ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට සහාය වීම • විදේශ සේවා නියුක්තිකයින් සඳහා වැඩිදියුණු කළ ප්‍රේෂණ පහසුකම් ලබාදීම • පහසු බැංකුකරණයක් සඳහා ඉහළම තත්ත්වයේ ඩිජිටල් හැකියාවන් • දත්තවල ආරක්ෂාව සහ සයිබර් ආරක්ෂාව අපගේ ව්‍යාපාරික සේවා වකතුව පිළිබඳ වැඩි විස්තර සඳහා කරුණාකර අංක 102 සිට 141 දක්වා පිටු පරිශීලනය කරන්න.	• සමාජ මාධ්‍ය • අවශ්‍ය අවස්ථාවන්හි දී සම්ප්‍රදායික මාධ්‍ය • මූල්‍ය සාක්ෂරතාව පිළිබඳ සංසද • සේවා ලබා ගැනීමට පියවර නගන ගනුදෙනුකරුවන් සඳහා ශාඛා ජාලය • එකිනෙකා සමග කථා කර සේවා නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම සඳහා මනා පුහුණුවක් ලත් විකිණුම් කාර්ය මණ්ඩලයක්	• ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා මත පදනම් වූ නිෂ්පාදන සහ සේවාවන් • අවදානම් සහගත කණ්ඩායම් සඳහා විශේෂිත සේවාවන් • තරඟකාරී අනුපාත සහ ගාස්තු සඳහා ඉඩහසර සලසන පිරිවැය අනුව කාර්යක්ෂම නිෂ්පාදන නවෝත්පාදනය • යහපාලනය සහ නියාමන අනුකූලතාවය තහවුරු කිරීම • සන්නාම වටිනාකම සහ ගනුදෙනුකාර භවතුන්ගේ විශ්වාසය ශක්තිමත් කිරීම පාරිභෝගික ප්‍රාග්ධනය පිළිබඳ සවිස්තරාත්මක සටහනක් සඳහා කරුණාකර අංක 183 සිට 188 දක්වා පිටු පරිශීලනය කරන්න.	මුළු ගනුදෙනුකරුවන් සංඛ්‍යාව මිලියන 15.2 සම්බන්ධ කර ගත් නව ගනුදෙනුකරුවන් සංඛ්‍යාව 540,740 රුපියල් බිලියන 981.3ක ණය බෙදාහැරීම ශාඛා සංඛ්‍යාව 746 ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATMs), මුදල් තැන්පත් කිරීමේ යන්ත්‍ර(CDMs)/ මුදල් ප්‍රතිචක්‍රීකරණ යන්ත්‍ර (CRMs) 1182



වෘත්තීය සමිති

අප වටිනාකම නිර්මාණය කරන අයුරු

අපි වෘත්තීය සමිති ප්‍රධාන පාර්ශ්වකරුවන් ලෙස රාමුගත කරන අතර අදාළ සාමූහික ගිවිසුම් පදනම් කර ගනිමින් ව්‍යුහමය මෙන්ම ලේඛනගත සම්බන්ධතා පවත්වාගෙන යන්නෙමු. සේවක සුභසාධනය පිණිස බැංකුව සමග පාර්ශ්වකරුවන් ලෙස එවැනි වෘත්තීය සමිති හයක් කටයුතු කරති.

අපගේ සේවාව	අපගේ සහභාගිත්වය	අපගේ වටිනාකම දායාද කිරීම	ප්‍රතිඵලය
• සේවක සංවර්ධනය කෙරෙහි බැංකුව දක්වන කැපවීමෙන් මගපෙන්වීමලත් අප, අපගේ සේවා නියුක්තිකයන්ට බලපාන මාතෘකා සම්බන්ධයෙන් විනිවිදභාවයෙන් යුතුව තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා නිතිපතා උපදේශන සංසද ලබා දෙන්නෙමු. • අසමතුලිත ලෙස නොසලකන සේවායෝජකයකු වශයෙන් සාධාරණ සේවා නියුක්තික පරිචයන් භාවිත කරන්නෙමු.	• සාමූහික කතිකාවතකට බැංකුවේ සහාය දැක්වමින් ඒ සඳහා විධිමත්ව සහභාගිවීමට අවස්ථාව සලසමින් සංසද පැවැත්වීම • සේවක සුභසාධන යෝජනාක්‍රම ක්‍රියාත්මක කිරීම • කාර්ය සාධනය සහ ඵලදායිතාව පිළිබඳ සාකච්ඡා පැවැත්වීම	• බැංකුවේ කාර්ය මණ්ඩලය සහ ව්‍යුහය අතර සුහද සම්බන්ධතා ඇති කර ගැනීම පිණිස වෘත්තීය සමිති ප්‍රයෝජනයට ගැනීම • බැංකුවේ ක්‍රමවත් ක්‍රියාකාරිත්වය තහවුරු කරමින් නායකත්වය සහ වෘත්තීය සමිති අතර සහජීවනය පවත්වා ගැනීම • අන්තර් සබඳතා සහ ක්‍රියාවන් තුළ විනිවිදභාවය පවත්වා ගැනීම • කාලානුරූපීව දුක්ගැනවිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම සහ ගැටළු විසඳීම වැඩි විස්තර සඳහා කරුණාකර මානව ප්‍රාග්ධනය පිළිබඳ විස්තර ඇතුළත් අංක 162 සිට 179 දක්වා පිටු පරිශීලනය කරන්න.	• දෙපාර්ශ්වය අතර සහයෝගිත්වයෙන් සිදුවන සංවාදය • අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රතිලාභී ප්‍රතිඵල ලබාදෙන අයුරින් ගැටළු විසඳීම • තිරසාර මෙහෙයුම් • අපගේ සියළුම පාර්ශ්වකරුවන්ට අඛණ්ඩව වටිනාකම් ලබා දීම • වැඩ වර්ජන නොමැති වීම



සේවකයින්

අප වටිනාකම නිර්මාණය කරන අයුරු

විශිෂ්ට සේවාවක් ලබා දෙමින් ඉහළ කාර්ය සාධනයක් සහ ඵලදායිතාවක් කරා මෙහෙයවීම පිණිස විවිධ විශේෂඥ දැනුමෙන් සුපෝෂිත පුහුණු ශ්‍රම බලකායක් සේවයෙහි යොදවන්නෙමු.

අපගේ සේවාව	අපගේ සහභාගිත්වය	අපගේ වටිනාකම දායාද කිරීම	ප්‍රතිඵලය
• නවෝත්පාදන එළි දැක්වීම සඳහා වෘත්තීය දියුණුව සැලසීම. • ප්‍රායෝගික පුහුණුව සහ දැනුම බෙදාහදා ගැනීම සඳහා අවස්ථා සලසා දීම • තරඟකාරී ප්‍රතිලාභ පැකේජ හඳුන්වා දීම • දුක්ගැනවිලි විසඳාලීම සඳහා ව්‍යුහාත්මක ක්‍රියාවලියක් • ප්‍රසන්න වැඩ පරිසරයක් • මානසික සෞඛ්‍ය සම්බන්ධයෙන් උපකාර වීම සඳහා ප්‍රවේශය ලබා දීම • රැකියාව සහ සාමාන්‍ය ජීවිතය අතර සමබරතාව පවත්වා ගැනීම පිළිබඳ අවධාරණය කිරීම	• විවිධ මට්ටමේ කාර්යාල කණ්ඩායම් රැස්වීම් (දෛනික/සතිපතා/මාසික පදනමින්) පැවැත්වීම • දුක්ගැනවිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා යාන්ත්‍රණයක් පවත්වාගෙන යාම • අවශ්‍ය අවස්ථාවන්හි දී පෞද්ගලිකව උපදේශනය ලබාදීම • වාර්ෂික කාර්ය සාධන ඇගයීම • වෘත්තීය සමිති සමඟ රැස්වීම් පැවැත්වීම • ඉහළ මට්ටමේ නායකයන්ගෙන් පහළ මට්ටමේ අය වෙත පණිවිඩ හරහා තොරතුරු බෙදාහැරීම • සේවකයින්ගේ තෘප්තිමත්භාවය පිළිබඳ සමීක්ෂණය කිරීම	• ව්‍යුහාත්මක පුහුණුව සහ කුසලතා වර්ධනය තුළින් වෘත්තීය වර්ධනය සඳහා අවස්ථා නිර්මාණය කිරීම • පෞද්ගලික අභිලාෂයන් සාක්ෂාත් කරමින් තරඟකාරී පැකේජ ලබා දීම • වෙළඳපොළේ පවතින විශිෂ්ටතම දිරිගැන්වීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම • ඩිජිටල් දැනුම බෙදාහදා ගැනීම ඇතුළත් අනාගත වැඩ පරිසරය • මානසික සෞඛ්‍යය පිළිබඳ විශේෂඥ දැනුම වෙත ප්‍රවේශය ලබා දීම • මූල්‍ය යහපැවැත්ම වෙත ප්‍රවේශය ලබාදීම වැඩි විස්තර සඳහා කරුණාකර මානව ප්‍රාග්ධනය පිළිබඳ විස්තර ඇතුළත් අංක 162 සිට 179 දක්වා පිටු පරිශීලනය කරන්න.	මනාව අභිප්‍රේරණය වූ සේවයට කැප වූ ශ්‍රම බලකායක් සේවා නියුක්තිකයන් වෙත රුපියල් බිලියන 38.2ක වන්දි ප්‍රදානය පුහුණු කිරීම් සඳහා රුපියල් මිලියන 190.3ක් ආයෝජනය කිරීම උසස්වීම් 685ක් 4,818ක කාන්තා ශ්‍රම බලකායක් නව බඳවා ගැනීම් 755ක්



ප්‍රජාව/මහජනතාව

අප වටිනාකම නිර්මාණය කරන අයුරු

මහජන සුභසිද්ධිය මූලික කරගත් රාජ්‍ය බැංකුවක් වශයෙන් අප අපගේ මහජනතාව සඳහා නන් අයුරින වටිනාකම් නිර්මාණය කරමු.

අපගේ සේවාව	අපගේ සහභාගිත්වය	අපගේ වටිනාකම දායාද කිරීම	ප්‍රතිඵලය
• සියළුම වයස් කණ්ඩායම්වලට ඉතිරි කිරීමේ පුරුද්ද ඇති කර ගැනීමට දිරි දීම • කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්/කාන්තා ව්‍යවසායිකාවන් සඳහා මූල්‍ය සාක්ෂරතාව පිළිබඳ වැඩසටහන් පැවැත්වීම • උපායමාර්ගික ආයතනික සමාජ වගකීම (CSR) ඉටු කිරීමේ ව්‍යාපෘති තුළින් මහජනතාවට සේවාවන් ලබා දීම සඳහා ආයෝජනය කිරීම	• සමාජ මාධ්‍ය • සම්ප්‍රදායික ක්‍රම තුළින් බැංකුවේ සන්නාමය පෙනෙන්නට සැලැස්වීම • ආයතනික සමාජ වගකීම (CSR) ඉටු කිරීමේ ක්‍රියාකාරකම් තුළින් බාහිර කටයුතුවලට ක්‍රියාකාරිව සම්බන්ධ වීම	• රැකියා අවස්ථා නිර්මාණය කිරීම • අර්බුදකාරී අවස්ථාවල සහාය දැක්වීම • තරුණ ප්‍රජාව තුළ ඉතිරි කිරීමේ පුරුද්ද ඇති කිරීම • ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට මූල්‍ය ස්වාධීනත්වය අත්පත් කර ගැනීමට සහාය වීම • නියාමන දණ්ඩන වළක්වා ගනිමින් නියාමන අනුකූලතාව තහවුරු කිරීම • රටේ සංවර්ධන කටයුතුවලදී සියළු දෙනාගේ යහපත පිණිස රජයට සහාය වීම වැඩි විස්තර සඳහා කරුණාකර සමාජ ප්‍රාග්ධනය පිළිබඳ විස්තර ඇතුළත් අංක 192 සිට 195 දක්වා පිටු පරිශීලනය කරන්න.	• බැංකුවේ ඉදිරි මෙහෙයුම් කටයුතු කර ගෙන යාම සඳහා සමාජයෙන් ශක්තිමත් අනුමැතියක් සහ විශ්වාසයක් ලැබීම • ඉහළ සන්නාම දෘශ්‍යතාව • මහජන විශ්වාසය • අර්බුදකාරී අවස්ථාවන්හිදී මහජනතාව විශ්වාසයෙන් යුතුව පිය නගන බැංකුව වීම • CSR ආයෝජනය රුපියල් මිලියන 26.9 • විශ්‍රාම අරමුදල වෙත ලබා දුන් වාර්ෂික දායකත්වය රුපියල් බිලියන 2.5

ප්‍රමාණාත්මකතාවය



මහජන බැංකුවට වැදගත් වන කරුණු තීරණය කිරීමේදී බැංකුව ප්‍රමාණාත්මකතාවය පිළිබඳ ද්විත්ව ප්‍රවේශයක් අනුගමනය කරයි. මෙයින් අදහස් කරන්නේ බැංකුවට සිය ව්‍යාපාරය සඳහා වටිනාකම් නිර්මාණය කිරීමට ඇති හැකියාව කෙරෙහි එම කරුණු වලින් වන බලපෑම සහ ඒවායින් බාහිර පරිසරය හා පාර්ශ්වකරුවන් වෙත ඇති කරන ප්‍රතිවිපාකය පිළිබඳව බැංකුව තක්සේරු කරන බව ය.

වැදගත් යනුවෙන් හඳුනාගනු ලබන කළමනාකරණ ප්‍රවේශ කරුණු, GRI ප්‍රමිතීන් සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්වල අවශ්‍යතා අනුව ගළපනු ලැබේ. එවැනි කරුණුවලට අපගේ ව්‍යාපාරයේ තිරසාරභාවයට කැපී පෙනෙන බලපෑමක් එල්ල කළ හැකි ය. මෙය බැංකුවේ විවිධ අංශ සම්බන්ධ වන සාමූහික ප්‍රයත්නයක් වන අතර බැංකුවේ ප්‍රධාන පාර්ශ්වකාර කණ්ඩායම් සමග ක්‍රියාශීලීව කටයුතු කිරීමකි. අපගේ පාර්ශ්වකරුවන් වෙත වටිනාකම් දායාද කරන අතර ම ශක්තිමත් මෙන් ම අනාගතයට සූදානම් සංවිධානයක් වශයෙන් රැඳී සිටීම තහවුරු කිරීම පිණිස වාර්ෂික උපායමාර්ගික සැලසුම් සකස් කිරීමේ ක්‍රියාවලිය තුළ සාකච්ඡාවට සහ ක්‍රමානුකූල සළකා බැලීමට බඳුන් කරන්නා වූ ප්‍රධාන කරුණු වැදගත් මාතෘකා වේ.

වැදගත් මාතෘකා තීරණය කිරීම

GRI 3-1

අවශ්‍යතාව	පදනම	අන්තර්ගතය	වාර්තාකරණය
මහජන බැංකුව 1961 අංක 29 දරන පනතින් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් ලෙස සංස්ථාගත කරන ලදී. බැංකුවේ මූලික අරමුණ වූයේ ග්‍රාමීය ඉතිරි කිරීම් එක් රැස් කිරීම ය. කෙසේ වුව ද, නොයෙක් පරාසයේ මූල්‍ය විසඳුම් ආවරණය කිරීමට සහ ජාතික ආර්ථිකය දියුණු කිරීමේ කර්තව්‍යයේ දී ශ්‍රී ලංකා රජය සමග කොටස්කරුවකු ලෙස කටයුතු කිරීමට එතැන් පටන් බැංකු ව්‍යාපාරය කැපී පෙනෙන ලෙස විකසනය වී ඇත. මෙම ප්‍රධාන තේමාව වටා රැඳෙමින් අප ඔවුන්ගේ පාර්ශ්වකාර කණ්ඩායම්වල අභිලාෂයන් වන අරමුදල් ලබා දීමේ අවශ්‍යතාව සහ අතිශයින් තරඟකාරී වෙළඳපලක් තුළ ව්‍යාපාරවල තිරසාරබව සහතික කිරීම කෙරෙහි බෙහෙවින් අවධානය යොමු කරන්නෙමු.	බැංකුව සිය ව්‍යාපාරයට බෙහෙවින් බලපෑ හැකි විමෙන්ම වටිනාකම නිර්මාණය කිරීමට හෝ වටිනාකම ක්ෂය වීමට බලපෑමක් විල්ල කළ හැකි ඉදිරි අවදානම් හෝ අවස්ථා හඳුනා ගැනීම පිණිස මෙම ක්‍රියාවලියේ යෙදී සිටී.	ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPIs) බැංකුවේ උපායමාර්ග සමග ගැලපෙන පරිදි ස්ථාපනය කරනු පිණිස කාර්යසාධනයට තීරණාත්මක වන බලපෑම් ප්‍රමුඛතාගත කරනු ලැබේ.	වාර්ෂික ඇගයීම්වලට යටත්ව වැදගත් කරුණු වාර්තා කරනු ලැබේ.

මහජන සුභසිද්ධිය ප්‍රමුඛස්ථානයෙහි ලා තබා ගනිමින් දැයේ ප්‍රගතිය සාක්ෂාත් කර ගැනීමේ දී, මූලිකත්ව තක්සේරුව මගින් ජාතික සංවර්ධනය සහ ශ්‍රී ලංකා රජය සමග හවුලේ කටයුතු කිරීම ප්‍රමුඛතා ගත කරයි. මෙය මනාව සිතා බලා සකස් කරන ලද කරුණු සයකින් සමන්විත වේ.

මහජන බැංකුවේ නෛතික විධානය හා ජාතික බැඳීම	පාර්ලිමේන්තු පනතක් මගින් බැංකුව වෙත පවරන ලද මූලික අරමුණ මහජන සුභසාධනය කෙරෙහි එයට ඇති වගකීම වන බැවින් උපායමාර්ගික තීරණ මගින් එම අදහස සහ ලාභදායිත්වය සඳහා ඇති අවශ්‍යතාව යන කරුණු ද්විත්වයම පිළිබිඹු කරයි.
ශ්‍රී ලංකා රජයේ ආර්ථික සහ සමාජමය ප්‍රතිපත්ති	දරිද්‍රතාවය තුරන් කිරීම, ආර්ථික සහ සාමාජීය සුභසාධනය මෙන් ම ශ්‍රී ලංකා රජයේ ප්‍රමුඛතා වන බැවින් වඩාත් පුළුල් අයුරින් ගනුදෙනුකරුවන් වෙත සමීප වී ශක්තිමත් සමාජමය බලපෑමක් ඇති කරමින් ඒ සඳහා වඩා ඉහළ පිරිවැයක් දැරීමට බැංකුව නැඹුරු වේ.
උපායමාර්ගික ප්‍රමුඛතා	තිරසාර වර්ධනය සඳහා වන ප්‍රමුඛතා ක්‍රියාත්මක කිරීම පිණිස බැංකුව පැහැදිලිව නිර්වචනය කරන ලද උපායමාර්ගික සැලසුමක් මත මෙහෙයුම් කටයුතු සිදු කරනු ලැබේ.
මෙහෙයුම් සන්දර්භය	බැංකුවේ මූලික බැඳීම මහජන සුභසාධනය වන බැවින් ජාතික ආර්ථිකය ප්‍රකෘතිමත් තත්ත්වයට ගෙන ඒම සඳහා සැළකිය යුතු ලෙස දායකත්වය දැක්වීම එහි ප්‍රධාන ප්‍රමුඛතාවයක් වේ.
පාර්ශ්වකරුවන්ගේ ප්‍රතිචාරය සහ අභිමතාර්ථ	මහජන සුභසාධනය බැඳීමක් ලෙස තබා ගනිමින් තිරසාර ව්‍යාපාරයක් වශයෙන් ක්‍රියාත්මක වන අතර ම සේවා උත්කෘෂ්ටභාවය සහ තරඟකාරී බැංකු රටාවක් තුළ මූල්‍ය විසඳුම් කරා එළැඹීමේ දී තාක්ෂණික හා ඩිජිටල් පහසුකම ඉල්ලා සිටින අනෙකුත් පාර්ශ්වකරුවන් වෙත ඇති සිය වගකීම පිළිබඳව බැංකුව දැනුවත් ය.
තිරසාරභාවය	ජාතියේ ආර්ථික ස්ථාවරත්වය පවත්වා ගැනීමට සහ රට පුරා ශ්‍රී ලංකා රජයේ සුභසාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට බැංකුවේ තිරසාරභාවය අතිශයින් වැදගත් වේ.


වැදගත් මාතෘකා

GRI 3-2

අ. අං.	මාතෘකාව	ප්‍රමුඛතාගත කිරීමේ පරාමිතිය	E1/E2/S/G ප්‍රභේදය	බැංකුවට ඇති වැදගත්කම	පාර්ශ්වකරුවන්ට ඇති වැදගත්කම	GRI යොමුව
1.	සේවකයන්ගේ මානසික යහපැවැත්ම.	රැකියාව සහ සාමාන්‍ය ජීවිතය අතර සමබරතාව සාක්ෂාත් කර ගැනීමට සහ ගනුදෙනුකරුවන් සම්බන්ධයෙන් ඉහළ රඳවා ගැනීමේ අනුපාතිකයක් පවත්වා ගැනීම සඳහා අපගේ මානව ප්‍රාග්ධනයේ මානසික යහපැවැත්ම තහවුරු කිරීම.	S	ඉහළ	මධ්‍යම	GRI 401, GRI 404, GRI 406
2.	දක්ෂතා කළමනාකරණය පුහුණුව, සංවර්ධනය සහ කුසලතා වැඩි දියුණු කිරීම.	වෙළඳපල නායකත්වය, ගනුදෙනුකරුවන් රඳවා ගැනීම සහ ඔවුන් වෙත සුපිරි සේවාවක් ලබා දීම තහවුරු කිරීම. සාම්ප්‍රදායික ගනුදෙනුකරුවන්ගේ මෙන්ම නැගී එන අවශ්‍යතා සපුරාලීම. පහසු ක්‍රම මෙන්ම ලගා වීමෙන් තොරව බැංකු සේවා වෙත පිවිසීමේ ක්‍රමවේදයන් ගවේෂණය කරමින් Gen-Z ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා සපුරාලීම.	S, G	ඉහළ	මධ්‍යම	GRI 401, GRI 402, GRI 404, GRI 405, GRI 406, GRI 408, GRI 409
3.	සේවක ඵලදායිතාව.	දැඩි ලෙස තරඟකාරී ව්‍යාපාරික වාතාවරණයක් තුළ ඉතා ඉහළ මට්ටමේ සේවා නියුක්තික ඵලදායිතාවක් අත්පත් කර ගැනීම අනිවාර්ය වන අතර තිරසාර ව්‍යාපාරයක් සඳහා එය ප්‍රධාන කාර්යසාධක (KPIs) වලින් මනිනු ලැබේ.	E1	ඉහළ	ඉහළ	GRI 401
4.	ගනුදෙනුකරුවන්ගේ අත්දැකීම.	දැනට පවත්නා ප්‍රශස්තතම වටිනාකම් පිරිනැමීම, පහසු ඩිජිටල් වේදිකා සහ පහසුවෙන් පිවිසිය හැකි ශාඛා ජාලයක් ලබා දීම.	S	ඉහළ	ඉහළ	GRI 418, GRI 417, GRI 411
5.	වගකීමක් සහිතව ණය ප්‍රදානය කිරීම.	ද්‍රවශීලතාව කළමනාකරණය කිරීම මඟින් ව්‍යාපාරවලට සහ ජාතික සංවර්ධනයට සහාය වීම මෙන්ම, 03 වන අදියර වෙත මාරුවීම් අවම කරමින් ඉහළ ගුණාත්වයකින් යුත් ණය දීම් පවත්වා ගැනීම.	E1	ඉහළ	ඉහළ	-
6.	සැපයුම්කරුවන් සඳහා වටිනාකම් නිර්මාණය කිරීම.	අබණ්ඩ ව්‍යාපාරික ක්‍රියාවලියක් සහතික කිරීම සඳහා මූලාශ්‍රගත කිරීම, ගිවිසුම්ගත වීම සහ නියමිත වේලාවට ගෙවීම් කිරීම මඟින් ආර්ථික සවිබල ගැන්වීම තහවුරු කිරීම.	E1	මධ්‍යම	අවම	GRI 204, GRI 308, GRI 414
7.	අවදානම සහ පාලනය.	ශක්තිමත් ලෙස අවදානම් අවම කිරීම සහ සදාචාරාත්මක පාලනය තුළින් සන්නාම වටිනාකම සහ නියාමකගේ විශ්වාසය රඳවා පවත්වා ගැනීම	G	ඉහළ	ඉහළ	GRI 201, GRI 205, GRI 206, GRI 207
8.	පාරිසරික බලපෑම.	පරිසර හිතකාමී තිරසාර ව්‍යාපාරික පරිචයන් තුළින් තිරසාර හරිත පරිසරයක් පවත්වා ගැනීම.	E2	ඉහළ	මධ්‍යම	GRI 302, GRI 303, GRI 305

අ. අං.	මාතෘකාව	ප්‍රමුඛතාගත කිරීමේ පරාමිතිය	E1/E2/S/G ප්‍රභේදය	බැංකුවට ඇති වැදගත්කම	පාර්ශ්වකරුවන්ට ඇති වැදගත්කම	GRI යොමුව
9.	සමාජ ආර්ථික බලපෑම.	සවිබල ගැන්වුනු ආර්ථිකයක් නිර්මාණය කිරීම සඳහා ජාතික ප්‍රමුඛතාවන් සමග ගැලපීම.	E1. S	මධ්‍යම	මධ්‍යම	GRI 202, GRI 203, GRI 413
10.	සෞඛ්‍යය සහ ආරක්ෂාව.	සේවා නියුක්තිකයන් සඳහා ආරක්ෂිත සේවා ස්ථානයක් ලබා දීම සහ ගනුදෙනුකරුවන් සම්බන්ධයෙන් බැංකු කොටස්කරුවකු වශයෙන් කටයුතු කිරීම තහවුරු කිරීම.	S, G	ඉහළ	ඉහළ	GRI 403, GRI 416
11.	ඩිජිටල් නායකත්වය.	ගනුදෙනුකරුවන්ගේ අපේක්ෂා වෙළඳපල පවත්නා පරිවර්තන තාක්ෂණය සහ ඩිජිටල් හැකියාවන් සමග විකසනය වෙමින් පවතී.	E2	මධ්‍යම	ඉහළ	-

E1 – ආර්ථිකය, E2 – පරිසරය, S – සමාජයීය, G – පාලනය



ප්‍රමාණාත්මක මාතෘකා කළමනාකරණය කිරීම

GRI 3-3

2025 වර්ෂය සඳහා ප්‍රමාණාත්මක මාතෘකා නිර්වචනය කිරීමේ දී සියල්ල ආවරණය කරන තේමාවන් වශයෙන් අපි පහත සඳහන් තේමාවන් හඳුනා ගත්තෙමු.

පළමුවන තේමාව – අනාගතය සඳහා සූදානම් මානව ප්‍රාග්ධනය

අපගේ ව්‍යාපාරයේ තිරසාරභාවය සඳහා වැදගත් ව්‍යාපාරික වටපිටාවකට අනුවර්තනය විය හැකි, දැඩි උනන්දුවකින් යුතුව ඉගෙන ගන්නා අයගෙන් සමන්විත වීමෙන්ම අරමුණ සාක්ෂාත් කර ගැනීමේ අදිටනින් කටයුතු කරන කණ්ඩායමක් අත්‍යවශ්‍ය වේ. බැංකුව යහපත් ඉගෙනුම් අත්දැකීමක් අන්තර්ගත නිපුණතා සංවර්ධනය ප්‍රමුඛතාගත කරන අතර එමඟින් දීර්ඝ කාලීනව බැංකුවේ විවිධ අංශවල කාර්යයන් මෘදුකාංග භාවිතයෙන් සම්බන්ධ කර අනෙකුත් අංශවල අයටත් එම කාර්යයන්හි නියැළීමට අවස්ථාව සැලැස්වීම (හරස් කාර්යන් සම්බන්ධිත යෙදුම් – cross functional application), කාර්ය මාරුව, සහ නායකත්ව සංවර්ධනය සඳහා මංපෙත් විවර කරයි.

ප්‍රමාණාත්මක මාතෘකාව	අදාලත්වය	අපගේ ප්‍රතිචාර	බලපෑමලත් ප්‍රාග්ධනය	එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන අරමුණු (SDGs) සමඟ ගැලපීම
1. සේවකයින්ගේ මානසික යහපැවැත්ම 2. දක්ෂතා කළමනාකරණය, පුහුණුව, සංවර්ධනය සහ කුසලතා වැඩිදියුණු කිරීම 3. සේවක ඵලදායිතාවය	ඉගෙන ගන්නා කරුණු අවශෝෂණය කර ගැනීමේ දී සේවා නියුක්තිකයන්ගේ මානසික යහපැවැත්ම තීරණාත්මක සාධකයක් වන අතර එය බැංකුවේ ප්‍රතිදානයේ දී ඵලදායිතාවයක් ලෙස පිළිබිඹු වේ. මෙමඟින් අනාගතයට සූදානම් සේවක කණ්ඩායමක් තැනීම හා පෝෂණය කිරීම සිදු වන අතර ම බැංකුවට උපායමාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීමට මහෝපකාරී වේ.	මෙම ප්‍රමාණාත්මක මාතෘකා ක්‍රියාවට නැංවීම, අධීක්ෂණය කිරීම, වාර්තා කිරීම සහ කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් මානව සම්පත් දෙපාර්තමේන්තුව වගකීම දරනු ලැබේ.	අංක 162 සිට 179 දක්වා පිටුවල ඇති මානව ප්‍රාග්ධනය පිළිබඳ පරිච්ඡේදය අංක 180 සිට 197 දක්වා පිටුවල ඇති සමාජ ප්‍රාග්ධනය පිළිබඳ පරිච්ඡේදය	3 GOOD HEALTH AND WELL-BEING, 5 GENDER EQUALITY, 8 DECENT WORK AND ECONOMIC GROWTH

දෙවන තේමාව – සාමාජීය වගකීම

සදාචාරාත්මක මිලකරණය, සන්නිවේදනය, බෙදා හැරීම, වගකීම් සහගත ණය ප්‍රදාන පරිචයන් සහ නියමිත වේලාවට සේවා සඳහා ගෙවීම් කිරීම සම්බන්ධයෙන් අප දක්වන උනන්දුව හේතුවෙන් බාහිර පාර්ශ්වකරුවන්ට සිය අභිලාෂයන් සාක්ෂාත් කර ගනිමින් ජාතික ආර්ථිකයට ධනාත්මකව දායකත්වය දැක්විය හැකි වී ඇත. සමාජයේ එක් හරස්කඩකට සිය ජීවනෝපාය දියුණු කර ගැනීමට සහාය දීම සහ සවිබල ගැන්වීම මඟින් අප ඔවුන්ට අබණ්ඩව ආර්ථිකය තුළ වටිනාකම නියම කරන්නන් වීමට සහාය වන්නෙමු.

ප්‍රමාණාත්මක මාතෘකාව	අදාලත්වය	අපගේ ප්‍රතිචාර	බලපෑමලත් ප්‍රාග්ධනය	එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන අරමුණු (SDGs) සමඟ ගැලපීම
4. ගනුදෙනුකරුවන්ගේ අත්දැකීම් 5. වගකීමක් සහිතව ණය ප්‍රදානය කිරීම 6. සැපයුම්කරුවන් සඳහා වටිනාකම් නිර්මාණය කිරීම	සැපයුම්කරුවන් අබණ්ඩව ක්‍රියාත්මක වීම තහවුරු කරමින් අපි ගනුදෙනුකරු කේන්ද්‍රීය ව්‍යාපාරයක් වශයෙන් මෙහෙයුම් කටයුතුවල නියැලෙන්නෙමු. වගකීමක් සහිතව ණය ප්‍රදානය කිරීම සිදු කරමින් බැංකුව මූල්‍ය අන්තර්කරණය ප්‍රවර්ධනය කර දීර්ඝ කාලීනව තිරසාර ව්‍යාපාරයක් මෙහෙයවයි.	බැංකුවේ ව්‍යාපාර ඒකක සහ ප්‍රසම්පාදන කාර්ය පටිපාටි, එවැනි ව්‍යාපාර මෙහෙයුමට ම ආවේනික වූ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි මඟින් පාලනය වේ. මේවා බැංකුවේ අවදානම් රුචිකත්ව සහ අවදානම් අවම කර ගැනීමේ ක්‍රියාවලි මෙන්ම වටිනාකම් ලබා දීමේ දී සහ බැංකුවේ පාර්ශ්වකරුවන් ගෙන් වටිනාකම් ලබා ගැනීමේ දී අනුගමනය කළ යුතු නියාමන අනුකූලතාව පැහැදිලිව නිර්වචනය කරයි.	අංක 180 සිට 197 දක්වා පිටුවල ඇති සමාජ ප්‍රාග්ධනය පිළිබඳ පරිච්ඡේදය අංක 183 සිට 188 දක්වා පිටුවල ඇති ගනුදෙනුකරුවන් පිළිබඳ කොටස අංක 189 සිට 191 දක්වා පිටුවල ඇති ව්‍යාපාරික හවුල්කරුවෝ පිළිබඳ කොටස	1 NO POVERTY, 10 REDUCED INEQUALITIES, 17 PARTNERSHIPS FOR THE GOALS

තුන්වන තේමාව – ජාතික බලපෑම සඳහා සදාචාරාත්මක පාලනය

ශ්‍රී ලංකා රජයට සිය ජාතික සංවර්ධන උපායමාර්ග සඳහා සහාය වන හවුල්කරුවකු වශයෙන් දීර්ඝ කාලීනව දැයට බලපෑමක් එල්ල කළ හැකි සදාචාරාත්මක පාලනය, ශක්තිමත් අවදානම් පාලනය සහ පාරිසරික සංරක්ෂණය තහවුරු කිරීමට අපි කැප වීමෙන් කටයුතු කරමු.

ප්‍රමාණාත්මක මාතෘකාව	අදාලත්වය	අපගේ ප්‍රතිචාර	බලපෑමලත් ප්‍රාග්ධනය	එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන අරමුණු (SDGs) සමග ගැලපීම
7. අවදානම සහ පාලනය 8. පාරිසරික බලපෑම 9. සමාජ ආර්ථික බලපෑම	තිරසාරභාවය පදනම් වන්නේ සදාචාරාත්මක පාලනය, නියමිත වේලාවට අවදානම් අවම කිරීම සහ ශක්තිමත් අභ්‍යන්තර පාලන ක්‍රම ක්‍රියාත්මක කිරීම මත ය.	බැංකුවේ ආයතනික පාලනය හා අවදානම් කළමනාකරණ රාමුව සහ බැංකුවේ තිරසාරභාවය පිළිබඳ ප්‍රතිපත්තිය වන ජනතා හරිත ස්පන්දය (People's Green Pulse) මෙම ප්‍රමාණාත්මක මාතෘකා පාලනය කරයි. කාලානුරූපී පදනම මත අඛණ්ඩ අධීක්ෂණය සහ වාර්තාකරණය සිදු කරනු ලැබේ. හඳුනාගනු ලබන අඩුපාඩු කඩිනමින් විසඳා ප්‍රතිකර්ම යොදනු ලැබේ.	අංක 90 පිටුවේ ඇති තිරසාරභාවය පිළිබඳ ප්‍රකාශය අංක 260 සිට 309 දක්වා පිටුවල ඇති ආයතනික පාලන වාර්තාව අංක 208 සිට 259 දක්වා පිටුවල ඇති ව්‍යවසාය අවදානම් කළමනාකරණ වාර්තාව අංක 198 සිට 205 දක්වා පිටුවල ඇති ස්වාභාවික ප්‍රාග්ධනය පිළිබඳ පරිච්ඡේදය	

හතරවන තේමාව – ආරක්ෂාව සහ පහසුව

අපගේ ඩිජිටල් හැකියාවන් ඉහළ නංවනු ලබන්නේ පුළුල්ව පැතිරුණු ගනුදෙනුකාර පදනමක් සඳහා පහසු බැංකුකරණයක් ලබා දීම පිණිස ය. පරිවර්තනීය තාක්ෂණය යොදා ගනිමින් බැංකුව ගනුදෙනුකරුවන් වෙත වේගවත්බව, නිරවද්‍යභාවය, සහ විශ්වාසවන්තභාවය ලබා දීමට කටයුතු කරයි. එමෙන්ම බැංකු පරිශ්‍ර මගින් සියළුම පාර්ශ්වකරුවන් වෙත ආරක්ෂාකාරී මෙන්ම පහසු පරිසරයක් ලබා දේ.

ප්‍රමාණාත්මක මාතෘකාව	අදාලත්වය	අපගේ ප්‍රතිචාර	බලපෑමලත් ප්‍රාග්ධනය	එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන අරමුණු (SDGs) සමග ගැලපීම
10. සෞඛ්‍යය සහ ආරක්ෂාව 11. ඩිජිටල් නායකත්වය	පුළුල්තම ශාඛා ජාලය සහ ආයතනවල සිට තනි පුද්ගලයින් දක්වා විහිදෙන ගනුදෙනුකාර පදනමකින් සමන්විත බැංකුවක් වශයෙන් අපගේ සියළුම කාර්යාල හා ශාඛා මෙන්ම පද්ධති තුළින් ආරක්ෂාව සැලසීම අපගේ යුතුකම යි.	මානව සම්පත් ප්‍රතිපත්ති සහ කාර්ය පටිපාටිවලට සෞඛ්‍යය සහ ආරක්ෂාව විස්තීර්ණ වශයෙන් අන්තර්ගත වන අතර ව්‍යාපාර අඛණ්ඩතා පෙරහුරු සහ පුහුණු සැසි කලින් කල සිදු කරනු ලැබේ. බැංකුවෙන් ලබා දෙන සියළුම පහසුකම්වල ඩිජිටල් පිය සටහන පුළුල් කිරීම එහි තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්ති හා කාර්ය පටිපාටිවල මෙන් ම ඩිජිටල් ප්‍රතිපත්ති හා කාර්ය පටිපාටිවල බෙහෙවින් සඳහන් කර ඇත.	නිෂ්පාදිත ප්‍රාග්ධනය මානව ප්‍රාග්ධනය අංක 127 සිට 131 දක්වා පිටුවල ඇති තොරතුරු තාක්ෂණය සහ ඩිජිටල් බැංකුකරණය පිළිබඳ පරිච්ඡේදය	

කළමනාකාරීත්වය විසින් ප්‍රමාණාත්මක මාතෘකාවල සිදු වන ඕනෑම වෙනසක් පිළිබඳව සාකච්ඡා කර අවශ්‍ය තැන්හිදී ක්‍රියාමාර්ග ගනු ලැබේ.

උපායමාර්ග

GRI 2-22, 23, 24



ශ්‍රී ලංකාව පුරා තිරසාර වර්ධනයක් ඇති කරමින් විශ්වාසවන්ත මූල්‍ය කොටස්කරුවකු වශයෙන් අපගේ කාර්යභාරය ශක්තිමත් කර අපගේ ගනුදෙනුකරුවන්ට, පාර්ශ්වකරුවන්ට සහ අප සේවය කරන වඩා පුළුල් ජන ප්‍රජාවට වටිනාකම් ලබා දීම සඳහා අපි අපගේ පරිවර්තනීය චාරිකාවෙහි අඛණ්ඩව යෙදුනෙමු.

අවධානය

අපගේ මෙහෙයුම් ක්‍රියාවලියේ සෑම පැතිකඩකටම ඩිජිටල් තාක්ෂණය ව්‍යාප්ත කරමින්, මූල්‍ය අන්තර්කරණය ප්‍රවර්ධනය කරමින් හා තිරසාරභාවය ඇතුළත් කරමින් නවෝත්පාදන කිරීම, දරාගැනීම සහ ගනුදෙනුකරු කේන්ද්‍රීයතාව වෙත අවධානය යොමු කළෙමු. පොදු යහපත උදා කිරීම සඳහා අප වෙත ඇති වරම උපයෝගී කරගනිමින් රජයේ ජාතික සංවර්ධන ප්‍රමුඛතාවන්ට සහාය දැක්වූ අතර සම්මතයක් වශයෙන් තීරණ ගැනීමෙහි සිට ශාඛා හරහා වීම තීරණ ගනුදෙනුකරුවන් වෙත ලබාදෙන තෙක් ගෝලීය ප්‍රශස්ත පරිචයන් යොදා ගත්තෙමු.

උපායමාර්ගික අරමුණු

අපි උපායමාර්ගික අරමුණු තුනක් නිර්මාණය කර වීම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පැහැදිලි මාවතක් සකස් කර ගැනීම පිණිස අපගේ සම්පත් පෙළ ගැස්වූවෙමු.

විශිෂ්ටත්වය කරා මෙහෙයවීම	ගනුදෙනුකරු කේන්ද්‍රීයතාව ගොඩ නැංවීම	අනාගතයට සූදානම්ව සිටීම

ඉලක්ක සපුරා ගැනීමේ ප්‍රවේශය

අපගේ උපායමාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා අන්තර් සබඳතා සහිත කරුණු කිහියක් එක් කරන ලදී. මෙම කරුණු අතරින් ප්‍රධාන කරුණ වන්නේ නවෝත්පාදන සහ ඩිජිටල් නායකත්වය කෙරෙහි අප දක්වන බාධා රහිත අවධානය සහ අඛණ්ඩ ප්‍රයත්නයයි. අපි අතිනවීන තාක්ෂණය, පැරණි පද්ධති ඉවත් කර තාක්ෂණික යටිතලය නව්‍යකරණය කිරීම, ඩිජිටල් ක්‍රියාවලි වෙත සීමා මායිම් රහිතව මාරු වීම, ගනුදෙනුකරුවන් සවි බල ගැන්වීම සඳහා බැංකු ශාඛා ජාලය තාර්කිකකරණය කිරීම තුළ ආයෝජනය කර පිරිවැය අවම කිරීම සහ විචක්ෂණශීලී ආයෝජන තුළින් තිරසාර බව අතපත් කර ගැනීම උදෙසා කටයුතු කළෙමු.

අප ක්‍රියාත්මක කළ මූලපිරීම් අරමුණු සාක්ෂාත් කර ගැනීමෙහිලා සාර්ථක ලෙස දායකත්වය දක්වන ලදී.

උපායමාර්ගික අවධානය යොමුවන ක්ෂේත්‍ර	විශිෂ්ටත්වය කරා මෙහෙයවීම	ගනුදෙනුකරු කේන්ද්‍රියතාව ගොඩ නැංවීම	අනාගතයට සූදානම්ව සිටීම
	අරපරෙස්සම් සහිත නම්‍යශීලී මානසිකත්වයක්	දත්ත පදනම් කර ගත් මානසිකත්වයක්	වර්ධන මානසිකත්වය
ජනතාව සහ ක්‍රියාවලි ප්‍රවර්ධනය තුළින් සේවා විශිෂ්ටත්වය	✓	✓	
මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ පිරිවැය නායකත්වය	✓		✓
සේවා සංස්කෘතිය මත පදනම් වූ ගනුදෙනුකාර අත්දැකීම්		✓	
ශක්තිමත් කරන ලද ණය ප්‍රදාන ක්‍රියාවලි සහ සේවා කළඹේ ගුණාත්වය	✓		✓
ජාතික ආර්ථික සංවර්ධන ප්‍රමුඛතා සමග පෙළ ගැස්වීම		✓	✓
ඩිජිටල් හැකියාව ප්‍රමුඛ කර ගත් ව්‍යාපාරික වර්ධනය	✓	✓	✓
උපාය මාර්ගික වශයෙන් වැදගත් සහ නව උද්ගත වෙළඳ/අංශ කොටස් වෙත සම්බන්ධ වීම		✓	✓
ශක්තිමත් ආයතනික පාලනය සහ පාර්ශ්වකරුවන්ගේ ආරක්ෂාව	✓		✓
සමතුලිත සහ ස්ථායී සංවර්ධන මූලධර්මය	✓	✓	✓



නිමැවුම

අතිවිශේෂ නිමැවුමක් ප්‍රතිඵල ලෙස ලබා දෙමින් අනෙක්නය පරායත්ත අවධානය සීමා රහිතව ව්‍යාපාරය කෙරෙහි යොමු විය. එම ඒකාබද්ධ ප්‍රවේශය අපගේ සියළුම ව්‍යාපාර තුළින් අතිවිශිෂ්ට වටිනාකම් ගනුදෙනුකරුවන් වෙත ලබා දීම පිණිස අපගේ ප්‍රධාන ව්‍යාපාරය ශක්තිමත් කරමින් ද නවෝත්පාදන වැඩි දියුණු කරමින් ද ඔරොත්තු දීමේ හැකියාව අතිවර්ධනය කර විශිෂ්ට පාරිභෝගික අගය ලබා දීමට උපකාර කළේය.

උපායමාර්ගික අවධාන ක්ෂේත්‍රය	**ක්‍රියාත්මක කළ හැකි** උපායමාර්ගික මූලපිරීම උපායමාර්ගික අවධාන ක්ෂේත්‍ර සමග ගැලපෙන පරිදි සකස් කරන ලදී.	**නිමැවුම** උපායමාර්ගික අවධාන ක්ෂේත්‍රවල ප්‍රගතිය පිළිබිඹු කිරීමට KPIs ගණනාවක් හඳුන්වා දෙන ලදී.
ජනතාව සහ ක්‍රියාවලි ප්‍රවර්ධනය තුළින් සේවා විශිෂ්ටත්වය	උපායමාර්ගික අවධාන ක්ෂේත්‍ර ආවරණය කිරීම සඳහා භෞතික සාක්ෂි සහ යටිතලය වැඩි දියුණු කිරීම, පුහුණුව සහ සංවර්ධනය, ක්‍රියාවලි වැඩි දියුණුව, ණය දීමේ සහ අය කර ගැනීමේ ක්‍රියාවලි ශක්තිමත් කිරීම වැනි මූලපිරීම් 13ක්	32
මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ පිරිවැය නායකත්වය	සාධාරණීකරණය, ක්‍රියාවලි සරල කිරීම්, ක්‍රියාවලි සහ ක්‍රියාපටිපාටිවල ඒකාකාරිත්වය, පිරිවැය ප්‍රතිලාභ සහ ශක්‍යතා විශ්ලේෂණය, සහ විද්‍යාත්මක ධාරිතාව සැලසුම් කිරීම වැනි මූලපිරීම් 8ක්	18
සේවා සංස්කෘතිය මත පදනම් වූ ගනුදෙනුකාර අත්දැකීම්	ඵලදායී ලෙස සේවා නියුක්තිකයන් සහභාගි කර ගැනීම, ගනුදෙනුකරු කේන්ද්‍ර කොට ගත් නිෂ්පාදන සහ නව වැඩිදියුණු කිරීම් වැනි මූලපිරීම් 12ක්	21
ශක්තිමත් කරන ලද ණය ප්‍රදාන ක්‍රියාවලි සහ සේවා කළඹේ ගුණාත්වය	යහපත් ණය කළඹක් සහ වේගවත් අය කර ගැනීමේ ක්‍රියාවලියක් පවත්වා ගැනීම, කාර්යයට කැප වූ ණය දීමේ නිලධාරීන් නිර්මාණය කිරීම වැනි මූලපිරීම් 7ක්	24
ජාතික ආර්ථික සංවර්ධන ප්‍රමුඛතා සමග පෙළ ගැස්වීම	ව්‍යවසායකයින් ධෛර්යමත් කිරීම, කාන්තාවන් විසින් මෙහෙයවනු ලබන ව්‍යාපාර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්, කාර්මික අංශයේ වැඩි දියුණු කිරීම්, විදේශ ව්‍යවහාර මුදල් සහ ප්‍රේෂණ ඉහළ නැංවීම වැනි මූලපිරීම් 7ක්	14
ඩිජිටල් හැකියාව ප්‍රමුඛ කර ගත් ව්‍යාපාරික වර්ධනය	ඩිජිටල් නාලිකාවේ නව වැඩිදියුණු කිරීම්, කළමනාකාරිත්වයට වාර්තා කිරීම්, වැඩි දියුණු කිරීම, සහ පරිසරය ඩිජිටල්කරණය කිරීම තුළින් ගනුදෙනුකරුවන්ගේ අවබෝධය ඉහළ නැංවීම වැනි මූලපිරීම් 10ක්	20
උපාය මාර්ගික වශයෙන් වැදගත් මතුවන ජන කොටස් වෙත ළඟාවීම	ආයතනික ස්ථානගත කිරීම සහ සන්නාමකරණය, රාජ්‍ය නොවන ව්‍යාපාරවල ක්‍රමානුකූල වර්ධනය, නව්‍ය සිල්ලර නිෂ්පාදන වැඩි දියුණු කිරීම වැනි මූලපිරීම් 15ක්	11
ශක්තිමත් ආයතනික පාලනය සහ පාර්ශ්වකරුවන්ගේ ආරක්ෂාව	මූල්‍ය රෙගුලාසිවල බාහිර වැඩිදියුණු කිරීම් අධීක්ෂණය, බැංකුවේ විගණන සහ නෛතික පැතිකඩ ප්‍රවර්ධනය, තොරතුරු තාක්ෂණ පාලනයට සහ ශ්‍රී ලංකා මහ බැංකුවට අනුකූල වීම, ශක්තිමත් තොරතුරු ආරක්ෂණ අවදානම් කළමනාකරණයක් ගොඩ නැංවීම වැනි මූලපිරීම් 31ක්	12
සමබර තිරසාර වර්ධනය දෙසට දිශාගත වීම	ආයතනික බැංකුකරණය ඉහළ නැංවීම, ඵලදායී මුදල් කළමනාකරණය, උපායමාර්ගික සැලසුම් සකස් කිරීම සහ කාර්ය සාධන ඇගයීම, ජාත්‍යන්තරකරණය වැනි මූලපිරීම් 11ක්	6


ව්‍යාපාරික ආකෘතියේ වෙනසක්

2025 වසරේ දී, අපි රාජ්‍ය බැංකුවක් වශයෙන් අප සතු වූ සාම්ප්‍රදායික පෙනුම වෙනස් කරමින් පෞද්ගලික අංශයේ ව්‍යාපාර සමග ආක්‍රමණශීලී ලෙස කටයුතුවල නියැළෙන ආයතනයක් ලෙස උපායමාර්ගික වෙනසක් සිදු කළෙමු. මෙම පරිවර්තනය, ගාස්තු පදනම් කොටගත් ආදායම හා පොළී ආදායම කැපී පෙනෙන ලෙස වර්ධනය වීමට සහ ප්‍රදානය කරන ණය කළඹේ ප්‍රසාරණයට සැලකිය යුතු දායකත්වයක් දැක්වීය.

රජයේ ප්‍රතිපත්ති හා සමීපව ගැළපීමේ දී, අපි කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සහ ක්ෂුද්‍ර මූල්‍ය අංශ මෙන්ම පුළුල් කරන ලද සංවර්ධන ණය පහසුකම් ශක්තිමත් කිරීමට උපායමාර්ගික මූලපිරීම් ඇතුළත් කිරීම මගින් ජාතික සංවර්ධනයට සහාය වීමේ අපගේ කාර්යභාරය යළි බල ගැන්වූයෙමු. අපගේ ගනුදෙනුකරුවන්ට සහ පාර්ශ්වකරුවන්ට වටිනාකමක් ලබා දෙමින් පිරිවැය අවමකරණය වෙත ඇති අප අවධානය තියුණු කර මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ තිරසාර ලාභදායිත්වය තහවුරු කළෙමු.

කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සඳහා පියවර

අපගේ උපායමාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස කෙටිකාලීන මූලපිරීම්වල සිට මධ්‍ය කාලීන මූලපිරීම් දක්වා ප්‍රධාන මූලපිරීම් කිහිපයක් ක්‍රියාත්මක කළෙමු.



කෙටිකාලීන	මධ්‍යකාලීන
මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ පිරිවැය නායකත්වය	ජනතාව සහ ක්‍රියාවලි ප්‍රවර්ධනය තුළින් සේවා විශිෂ්ටත්වය
ශක්තිමත් කරන ලද ණය ප්‍රදාන ක්‍රියාවලි සහ සේවා කළඹේ ගුණාත්වය	සේවා සංස්කෘතිය මත පදනම් වූ ගනුදෙනුකාර අත්දැකීම්
ඩිජිටල් හැකියාව ප්‍රමුඛ කර ගත් ව්‍යාපාරික වර්ධනය	ජාතික ආර්ථික සංවර්ධන ප්‍රමුඛතා සමඟ පෙළ ගැස්වීම
උපාය මාර්ගික වශයෙන් වැදගත් සහ නව ගනුදෙනුකාර කොටස් වෙත ලඟා ළඟාවීම	ශක්තිමත් ආයතනික පාලනය සහ පාර්ශ්වකරුවන්ගේ ආරක්ෂාව
	සමබර තිරසාර වර්ධනය දෙසට දිශාගත වීම



තිරසාරබව පිළිබඳ ප්‍රකාශය

GRI 2-22

තිරසාරභාවය අපගේ උපායමාර්ග සහ මෙහෙයුම් කේන්ද්‍රීය කොට ඇත. මිනිය හැකි අභිමතාර්ථ සහ විනිවිද පෙනෙන සුළු වාර්තාකරණය තුළින් වටිනාකම් වෙතට මග පෙන්වීමලත් අපගේ දීර්ඝකාලීන කැපවීම පාරිසරික භාරකාරත්වයට, සමාජ වගකීමට සහ අපගේ ව්‍යාපාරය පුරා ශක්තිමත් පාලනයක් (ESG) ඇති කිරීමට ගන්නා වූ ප්‍රවේශය තුළින් දිස් වේ.


ESG වෙත අපගේ කැපවීම වැරගැන්වූ තිරසාර මූල්‍ය ප්‍රතිපත්ති සහ කාර්යපටිපාටික මාර්ගෝපදේශ 2025 වසරේ දී හඳුන්වා දී ක්‍රියාත්මක කළෙමු. මෙහිදී තිරසාරභාවය සහ සමාජ වගකීම ප්‍රවර්ධනය කළ මූලපිරීම්වලට සහාය දැක්වීමට අපට හැකියාව ඇති කළ ණය ප්‍රදානය කිරීම හා සම්බන්ධ ප්‍රතිපත්තිය, ආයෝජන සහ අවදානම් කළමනාකරණ පරිචයන් මගින් අපව මෙහෙයවන ලදී. මෙමගින් ජාතික සංවර්ධනයට බලපාන ප්‍රමුඛ අංශ හඳුනාගනු ලබන හරිත මූල්‍ය වර්ගීකරණය පිළිබඳ නියාමන අවශ්‍යතාවලට අනුකූලවීමට අප දක්වන කැපවීම දිස් වේ. ESG වෙත අප දක්වන අවධානය පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් පිටු අංක 94 සිට 95 දක්වා දී ඇත.

තිරසාරභාවයට කැපවීම

GRI 2-23

තිරසාර මූල්‍ය ප්‍රතිපත්ති සහ කාර්ය පටිපාටික මාර්ගෝපදේශ (ප්‍රතිපත්තිය) සම්පූර්ණ ව්‍යාපාරයම ආවරණය කරන වියන වන අතර එක් එක් ක්ෂේත්‍රයේ පාලනයට සහ මෙහෙයුම්වලට අදාළ විශේෂිත ප්‍රතිපත්ති සහ කාර්ය පටිපාටිවලින් අපගේ ව්‍යාපාරය පාලනය වේ. මේවා මෙම වාර්තාවේ වී වී පරිච්ඡේදවල විස්තර කර ඇති අතර එම පරිච්ඡේද ව්‍යාපාරයේ එක් එක් ක්ෂේත්‍රය වෙනුවෙන් වෙන් කර ඇත.

බැංකුව පාරිසරික වගකීම, සමාජ සමානාත්මතාවය සහ යහපත් පාලනය රැක ගනිමින් සිය ප්‍රධාන ව්‍යාපාරික පරිචයන් තුළට තිරසාරභාවය ඇතුළත් කිරීමට කැප වී සිටී. සියළු ව්‍යාපෘතිවලට මුදල් යෙදවීම දැඩි පාරිසරික සහ සමාජ වගකීම පිළිබඳ පෙරහනට යටත් කර අපි ණය ප්‍රදානය කිරීම තිරසාරභාවයේ කාචය තුළින් ඇගයීමට ලක් කරන්නෙමු. ව්‍යාපෘතියේ වර්ගීකරණය අනුව සමාජයට ධනාත්මකව දායක වන එමෙන්ම පරිසරයට හානියක් නොවන මූලපිරීම්වලට පමණක් මුදල් ලබා දෙනු ලැබේ.



2026 සඳහා ඉදිරි දැක්ම

තිරසාරභාවය ප්‍රමුඛස්ථානයෙහි ලා තබා ගනිමින්, සදාචාරාත්මක පාලනයට සහ ශක්තිමත් අවදානම් කළමනාකරණයට අචල කැපවීමක් සහිතව අපගේ උපායමාර්ගික අරමුණු අපගේ බැංකුව මූල්‍යමය වශයෙන් යහපත්, සමාජීය වශයෙන් සාධාරණ සහ පාරිසරික වශයෙන් යහපත් ආයතනයක් බවට පත් කිරීමට සහ ශක්තිමත් කිරීමට අඛණ්ඩව කටයුතු කරයි. එම අපේක්ෂිත ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීම සඳහා අපි ප්‍රධාන මුලපිරීම් කිහිපයක් වෙත අවධානය යොමු කරමු.

තිරසාර ව්‍යාපාර වර්ධනය	ගනුදෙනුකරුවන්ගේ තෘප්තිමත්භාවය සහ කාර්යක්ෂම සේවාවක් ලබා දීම	ඩිජිටල් නායකත්වය	සේවා නියුක්තිකයන්ගේ සහභාගිත්වය සහ තෘප්තිමත්භාවය
පාර්ශ්වකරුවන්ට සහ අප සේවය කරන ප්‍රජාවට දීර්ඝකාලීන වටිනාකම් නිර්මාණය කිරීම තහවුරු කරමින් අපගේ මෙහෙයුම් ක්‍රියාවලියේ සෑම පැතිකඩකටම තිරසාරභාවය ඇතුළත් කර ඔරොත්තු දිය හැකි වර්ධනයක් සාක්ෂාත් කර ගැනීමට අපි අඛණ්ඩව කටයුතු කරමු.	අපගේ සේවය කෙරෙහි විශ්වාසවන්තභාවය සහ ලැදියාව ඉහළ නැංවෙන පරිදි පුද්ගල බද්ධ විසඳුම්, සීමා රහිත සේවාව සහ ප්‍රතිචාර දැක්වීමේ සංස්කෘතියක් තුළින් ගනුදෙනුකරුවන්ගේ කෘතහස්තභාවය වැඩි දියුණු කිරීම මත අපගේ අවධානය රඳා පවතී.	අතිනවීන තාක්ෂණයේ බලය යොදා ගැනීම මගින් බැංකු සේවා භාවිත කිරීමේ පහසුව සහ එම සේවා වෙත පිවිසීමේ පහසුව ප්‍රතිනිර්වචනය කරන නව්‍ය වේදිකා සහ ආරක්ෂාකාරී විසඳුම් පිරිනමමින් ඩිජිටල් නායකයා ලෙස අපගේ ස්ථානය ශක්තිමත් කර ගැනීමට අපි ඉලක්ක කරමු.	කාර්ය මණ්ඩල පුහුණු විද්‍යාලය තුළින් අඛණ්ඩව ලබා දෙන ව්‍යුහගත පුහුණුව, ප්‍රායෝගිකව වෘත්තීය කටයුතුවල නියැලීමට අවස්ථාව සලසමින් ලබා දෙන පුහුණුව සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ දැනුම ලබා දෙන සැසි. අවශ්‍ය තැන්හි දී විදේශ පුහුණුව ලබා දෙනු ඇත.
	පාලනය සහ වගකිවයුතු බව	**විවිධාංගීකරණය සහ නව්‍යකරණය**	**පිරිවැය නායකත්වය**
	විනිවිදභාවය, සදාචාරාත්මක හැසිරීම සහ ගෝලීය ප්‍රශස්ත පරිචයන්වලට අනුකූලවීම තහවුරු කරමින් ශක්තිමත් පාලන රාමු අපගේ තීරණවලට මගපෙන්වීමට අඛණ්ඩව කටයුතු කරනු ලබයි.	අපගේ සේවා කළඹ නව වෙළඳපොළ සහ නිෂ්පාදන හරහා ව්‍යාප්ත කිරීම තුළින් දරාගැනීම ප්‍රවර්ධනය වන අතර වඩාත් වේගවත්ව විකසනය වන මූල්‍ය භූදර්ශනයක් තුළ නවෝත්පාදන මගින් අනුවර්තනය වීමේ හැකියාව මෙහෙයවනු ලැබේ.	විනයානුකූල පිරිවැය අවමකරණය සහ මෙහෙයුම් විශිෂ්ටත්වය තුළින් අපි කාර්යක්ෂමතාව පවත්වාගෙන යමින්, ලාභදායීත්වය ශක්තිමත් කරමින්, තිරසාර ආපසු ලැබීම් ලබා දීමට හැකි වනු ඇත.

අපගේ වටිනාකම නිර්මාණය කිරීමේ ආකෘතිය

යෙදවුම්

මූල්‍ය ප්‍රාග්ධනය

පිටු 142 සිට 149 දක්වා

තැන්පතු
රු.බි. 3,229.9

බැංකු සහ අනෙකුත් ආයතනවලින් ගත් ණය
රු.බි. 126.0

ප්‍රමුඛතාවෙන් අඩු වාරික ණය
රු.බි. 40.6

නිෂ්පාදිත ප්‍රාග්ධනය

පිටු 150 සිට 155 දක්වා

දේපළ, පිරියත හා උපකරණ
රු.බි. 60.7

දිවයින පුරා පිහිටි ශාඛා ජාලය
746

ATMs, CDMs, සහ CRMs (සංඛ්‍යාව)
1,181

මානව ප්‍රාග්ධනය

පිටු 162 සිට 179 දක්වා

සේවා නියුක්තික සංඛ්‍යාව **8,122**

පුහුණු සහ සංවර්ධන කටයුතු තුළ ආයෝජනය
රු.මි. 190.3

සේවක පඩිනඩි සහ ප්‍රතිලාභ
රු.බි. 38.2

බුද්ධිමය ප්‍රාග්ධනය

පිටු 156 සිට 161 දක්වා

සන්නාම හිමිකාරිත්ව දර්ශකය **4.0**

ගනුදෙනුවලින් 83%කට වඩා ඩිජිටල් මාධ්‍යයෙන් සිදු කිරීම

තොරතුරු තාක්ෂණය තුළ සිදු කළ නව ආයෝජන
රු.බි. 1.4

ෆිච් ලංකා ණය ශ්‍රේණිගත කිරීම
AA–(LKA)

සමාජ සහ සබඳතා ප්‍රාග්ධනය

පිටු 180 සිට 197 දක්වා

ආයෝජකයෝ

කොටස්හිමියන් සතු අරමුදල
රු.බි. 219.0

ව්‍යාපාරික හවුල්කරුවෝ

සැපයුම්කරුවන් ලියාපදිංචිය e-GP මඟින්

සම්බන්ධිත බැංකු සංඛ්‍යාව **42**

Vostro නියෝජිතයින් සංඛ්‍යාව **94**

පාරිභෝගිකයෝ

පාරිභෝගිකයින් සංඛ්‍යාව මිලියන 15.2

නව ගනුදෙනුකරුවන් සංඛ්‍යාව **540,740**

ATMs, CDM, සහ CRM සංඛ්‍යාව
1,182

මහජනතාව

CSR ව්‍යාපෘතිවල ආයෝජනය **රු.මි. 26.9**

ප්‍රජා පාදක සංවර්ධන ණය ප්‍රදාන
රු.බි. 15.8

සේවාස්ථ පුහුණුව හරහා ප්‍රතිලාභ ලද මුළු විශ්ව විද්‍යාල සිසුන් සංඛ්‍යාව
713

ස්වභාවික ප්‍රාග්ධනය

පිටු 198 සිට 205 දක්වා

බලශක්ති පරිහරණය
ගි.ජූ. 10,168.4

ජල පරිහරණය
මෙ.ලී. 11

හරිත ණය ප්‍රදානය
රු.බි. 6.9

මුළු වායු විමෝචනය කාබන් ඩයොක්සයිඩ් සමාන ටොන්
1,901.7

ක්‍රියාවලිය

ව්‍යාපාරික ක්‍රියාකාරකම් සහ සහාය

ව්‍යාපාරික ක්‍රියාකාරකම්
සිල්ලර බැංකුකරණය, ආයතනික බැංකුකරණය, වාණිජ ණය, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සහ සංවර්ධන බැංකුකරණය, විදේශ ගනුදෙනුකාර සේවා, ජාත්‍යන්තර බැංකුකරණය, භාණ්ඩාගාරය, ආයෝජන බැංකුකරණය, ණයපත්

සහාය සේවා
මානව සම්පත්, තොරතුරු තාක්ෂණය සහ ඩිජිටල් බැංකුකරණය, ප්‍රසම්පාදනය, පරිපාලනය, මූල්‍ය හා කළමනාකරණ ගිණුම්කරණය, අලෙවිකරණය සහ සන්නිවේදනය, අවදානම් කළමනාකරණය සහ අනුකූලතාව, උපායමාර්ගික සැලසුම්කරණය, මූල්‍ය කළමනාකරණය, ප්‍රාග්ධන කළමනාකරණය, සේවා බෙදාහැරීමේ මාර්ග කළමනාකරණය

පිරිවැය මෙහෙයවන්නන්
පොලී වියදම, යටිත තාක්ෂණය, මානව සම්පත්, පරිපාලන පිරිවැය, අලෙවිකරණ පිරිවැයි

ආදායම මෙහෙයවන්නන්
සිල්ලර බැංකුකරණය, ආයතනික බැංකුකරණය, වාණිජ ණය, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය හා සංවර්ධන බැංකුකරණය, විදේශ ගනුදෙනුකාර සේවා, ජාත්‍යන්තර බැංකුකරණය, භාණ්ඩාගාරය, ආයෝජන බැංකුකරණය, ණයපත්

ප්‍රධාන අවදානම්
ණය අවදානම, විදේශ විනිමය අවදානම, ද්‍රවශීලතා අවදානම, කේන්ද්‍රගත අවදානම, තාක්ෂණික අවදානම, වෙළඳපළ අවදානම, මෙහෙයුම් අවදානම, කීර්තිනාම අවදානම, අනුකූලතා අවදානම, වංචා අවදානම, දක්ෂතා අවදානම, දේශගුණික අවදානම, දේශපාලනික අවදානම.



නිමැවුම්

මූල්‍ය ප්‍රාග්ධනය
පිටු 142 සිට 149 දක්වා
- බදු පෙර ලාභය **රු.බි. 64.4**
- බදු පසු ලාභය **රු.බි. 40.2 Bn.**
- වත්කම් මත ප්‍රතිලාභ (බදු පෙර) **1.8%**
- හිමිකම මත ප්‍රතිලාභ (බදු පසු) **20.1%**

නිෂ්පාදිත ප්‍රාග්ධනය
පිටු 150 සිට 154 දක්වා
- දේපළ, පිරියත හා උපකරණවලට එකතු කිරීම් **රු.බි. 12.7**
- ATMs, සහ CRM කළ සංඛ්‍යාව CDMs, හරහා සිදු ගනුදෙනු **රු.ට්‍රි. 2.4**
- සියළුම පාර්ශ්වකරුවන්ගේ සෞඛ්‍යය හා ආරක්ෂාව

මානව ප්‍රාග්ධනය
පිටු 162 සිට 179 දක්වා
- නව බඳවා ගැනීම් **755**
- ස්ත්‍රී පුරුෂභාව අනුපාතිකය (පුරුෂ: ස්ත්‍රී) **2:3**
- උපස්වීම් **685**
- රඳවාගැනීම **97%**

බුද්ධිමය ප්‍රාග්ධනය
පිටු 156 සිට 161 දක්වා
- සමස්ත ගනුදෙනුකාර තෘප්තිමත්භාවය **93%**
- ඩිජිටල් විසඳුම් සඳහා ලියාපදිංචිය **මිලියන 5.2**
- සම්මාන සහ ගෞරව පිළිගැනීම් **37**
- මාර්ගකත/ජංගම දුරකථනය හරහා සිදු කළ ගනුදෙනු සංඛ්‍යාව **බිලියන 200.0ට ආසන්න වේ.**
- ක්‍රියාවලි ස්වයංක්‍රීයකරණය කර ඇත.

සමාජ සහ සබඳතා ප්‍රාග්ධනය
පිටු 180 සිට 197 දක්වා

ආයෝජකයෝ
- කොටසකට ඉපැයීම් **රු.මි. 40.2**
- කොටසකට ශුද්ධ වත්කම් **රු.මි. 219**

ව්‍යාපාරික හවුල්කරුවෝ
- දේශීය මිලදී ගැනීම්වල මුළු වටිනාකම **රු.බි. 27.2**
- විදේශ මිලදී ගැනීම්වල මුළු වටිනාකම **රු.බි. 1.1**
- නව වොස්ට්‍රෝ (Vostro) නියෝජිත සබඳතා සංඛ්‍යාව **6**

ගනුදෙනුකරුවෝ
- NPL අනුපාතිකය **4.3%**
- ඩිජිටල් ගනුදෙනු සංඛ්‍යාව **මිලියන 197**
- ඩිජිටල් ගනුදෙනුවල වටිනාකම **රු.ට්‍රි. 1.73**
- ගනුදෙනුකරුවන් ගෙන් ලද පැමිණිලි විසඳීම **89.7%**

ප්‍රජාව
- වසර තුළ සිදු කළ CSR ව්‍යාපෘති සංඛ්‍යාව **19**
- ප්‍රජා පාදක සංවර්ධන ණය ප්‍රදාන ක්‍රමය යටතේ ප්‍රදානය කළ ණය සංඛ්‍යාව **25,747**
- සේවාස්ථ පුහුණුව සාර්ථකව අවසන් කළ උපාධි අපේක්ෂකයින් සංඛ්‍යාව **499**

ස්වභාවික ප්‍රාග්ධනය
පිටු 190 සිට 205 දක්වා
- සූර්ය බලශක්තිය උපයෝගී කර ජනනය කරන ලදී. **මෙ.වොා. 4.9**
- හරිත මූල්‍යකරණය යටතේ නව පහසුකම් සැලසීම **රු.බි. 3.6**
- හරිතාගාර වායු විමෝචනය අඩු වීම කාබන් ඩයොක්සයිඩ් සමාන **ටොන් 3.0**
- ප්‍රතිචක්‍රීකරණය කරන ලද කඩදාසි ප්‍රමාණය **කි.ග්‍රෑ. 5,459**

නිමැවුම්

කොටස්හිමිකරුවෝ
- ආයෝජන මත ප්‍රතිලාභ
- සම්පත් වෙන් කිරීම් පිළිබඳව අනාගතයේ අවධානය යොමු කිරීම
- ජාතික සංවර්ධන අභිමතාර්ථවල දී හවුලේ කටයුතු කිරීම

ගනුදෙනුකරුවෝ
- නව්‍ය මූල්‍ය නිෂ්පාදන සහ සේවා වෙත ප්‍රවේශය
- තරඟකාරී අනුපාතික සහ ගාස්තු
- ආරක්ෂාව සහ විශ්වාසවන්තභාවය
- ඩිජිටල් පහසුකම්

සේවා නියුක්තිකයෝ
- රැකියාවේ සුරක්ෂිතභාවය සහ වෘත්තීය වර්ධනය
- තරඟකාරී වන්දි සහ ප්‍රතිලාභ
- ධනාත්මක වැඩ පරිසරය
- රැකියාව සහ සාමාන්‍ය ජීවිතය අතර සමබරතාව වැඩි දියුණු කිරීම

ව්‍යාපාරික ගනුදෙනුකරුවෝ
- නියමිත වෙලාවට ගෙවීම් කිරීම
- ශක්තිමත් සහ විශ්වාසදායක හවුල්කාරිත්වයක
- වගකීම් සහගත ව්‍යාපාරික පරිචයන්

ප්‍රජාව
- මූල්‍ය අන්තර්කරණය
- ව්‍යාපාර වර්ධනය
- සමාජ අනුමැතිය

නියමනකරුවෝ
- මනාව ස්ථාපිත පලනය සහ පාලන ක්‍රම
- මූල්‍ය ස්ථාවරත්වය
- ගනුදෙනුකරුවන්ගේ ආරක්ෂාව/දත්තවල ආරක්ෂාව

මහජන සුභසාධනය - ශක්තිමත් පාලන ව්‍යුහය - දැඩි අවදානම් කළමනාකරණය - ව්‍යාපාරික ආචාර ධර්ම - පුනර්ජනනීය - නිරපරාධීව

සහාය ලබන්නේ



අපගේ අගය නිර්මාණය කිරීමේ ආකෘතිය මගින් තිරසාර ව්‍යාපාරයක් පවත්වාගෙන යන අතරතුර, අපගේ කොටස්කරුවන්ට අර්ථවත් වටිනාකමක් ලබා දෙන ආකාරය නිර්වචනය කරයි. එමගින් අපගේ ඒකාබද්ධ උත්සාහයන්හි සම්පූර්ණ පරාසය සහ අප සතු සුවිශේෂී වටිනාකම් පිරිනැමීම මැනවින් නිරූපණය කරන අතරම, ආර්ථික, සමාජීය සහ පාරිසරික වටිනාකම් ජනනය කිරීම සඳහා දැනුවත් තීරණ ගැනීමට අපට උපකාරී වේ. ජාතික සංවර්ධනය උදෙසා පුළුල් දායකත්වයක් සපයන විශ්වාසනීය හවුල්කරුවෙකු ලෙස අපගේ අනන්‍යතාවය ශක්තිමත් කිරීම සඳහා මෙම ආදර්ශනය තීරණාත්මක අංගයකි.

අපගේ පාරිසරික, සමාජීය සහ පාලන (ESG) අවධානය

පාරිසරික, සමාජීය සහ පාලන (ESG) මූලධර්ම අපගේ සියලුම ව්‍යාපාරික ක්‍රියාකාරකම්වල මූලික පදනම වේ. මෙය නියාමන ප්‍රමුඛතාවයක් ලෙස සලකා, නියාමකයා විසින් හඳුන්වා දෙන ලද හරිත වර්ගීකරණයට (Green Taxonomy) අනුකූල වීම සහතික කිරීම සඳහා අපි පියවර කිහිපයක් ගෙන ඇත්තෙමු. විශේෂයෙන්ම අරමුදල් සම්පාදනය සහ ණය ලබා දීමේ ක්‍රියාවලීන්හිදී මෙම මූලධර්ම අනුගමනය කිරීමට අපි ප්‍රමුඛත්වය ලබා දී ඇත.

අපගේ ප්‍රමුඛතාව

අපගේ තිරසාරත්ව ගමන්මඟ 2016 වසරේ දී ආයතනික තිරසාරත්ව ප්‍රතිපත්තිය හඳුන්වා දීමත් සමඟ ආරම්භ වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස 2025 වසරේදී තිරසාර මූල්‍ය ප්‍රතිපත්ති සහ කාර්ය පටිපාටි මාර්ගෝපදේශ හඳුන්වා දීමට අපට හැකි විය.

අපගේ උපායමාර්ගය

අපගේ උපාය මාර්ගයෙහි මූලික අවධානය යොමු වී ඇත්තේ සියලුම ව්‍යාපාරික ක්‍රියාකාරකම් තුළ පාරිසරික, සමාජීය සහ පාලන (ESG) මූලධර්ම අන්තර්ගත කිරීම කෙරෙහි ය. මෙම අගයයන් අනාගතය සඳහා ද ශක්තිමත්ව පවත්වා ගෙන යාම සහතික කරනු පිණිස, විවිධ මූලපිරීම් හරහා අපගේ අභ්‍යන්තර මෙහෙයුම් ධාරිතාවන් තවදුරටත් සක්‍රීය කර ඇත.

ධාරිතා වර්ධන මූලපිරීම්

පාරිසරික, සමාජීය සහ පාලන (ESG) මූලධර්ම සහ ක්‍රියාකාරකම් පිළිබඳ මනා අවබෝධයක් ඇති කිරීම වෙනුවෙන් පුළුල් ESG පුහුණු වැඩසටහන් පවත්වමින් අපි අපගේ සේවකයින් වෙනුවෙන් ආයෝජනය කළෙමු. මෙම මූලපිරීමේ කොටසක් ලෙස, නම් කරන ලද ණය අනුමත කිරීමේ බලධාරීන් විසින් සියලුම ණය සහ ආයෝජන තීරණ සඳහා ESG මූලධර්ම අන්තර්ගත කිරීම අනිවාර්ය කරන ලදී.

ණය ලබා දීමේ ක්‍රියාවලීන් සඳහා ESG කරුණු ක්‍රියාකාරිව සම්බන්ධ කර ගැනීම වෙනුවෙන් තිරසාර මූල්‍ය කම්පුව සහ හරිත මූල්‍ය ඇගයීම් කම්පුව ස්ථාපිත කරන ලදී. මෙම ඇගයීම් ජාත්‍යන්තරව පිළිගත් ESG ප්‍රමිතීන් මත පදනම් වන අතර ශ්‍රී ලංකාවේ හරිත වර්ගීකරණ විධානයන්ට අනුකූල වේ.

සංස්ථාපිත තිරසාරත්ව ප්‍රතිපත්තියට අමතරව, පරිසර සංරක්ෂණය සහතික කෙරෙන විශේෂිත අංශ වෙත යොමු කළ හරිත ණය මූලපිරීම් ද ඇතුළත් කරමින්, වඩාත් ශක්තිමත් තිරසාර මූල්‍ය ප්‍රතිපත්ති සහ කාර්ය පටිපාටි මාර්ගෝපදේශ අපි ක්‍රියාත්මක කළෙමු. මෙම රාමුව වගකිවයුතු බැංකුකරණය සහ තිරසාරත්වය සඳහා වූ අපගේ කැපවීමට පැහැදිලි පදනමක් සපයයි.

ESG සම්බන්ධ කාර්යභාරයන්, වගකීම් සහ කර්තව්‍යයන් අප පැහැදිලිව නිර්වචනය කර ඇති අතර, පාලන ප්‍රතිපත්ති සහ කාර්ය පටිපාටි හඳුන්වා දීමේ ඉහළම ආයතනය (Apex body) ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කරයි. එවැනි සියලුම ණය ලබා දීම් සඳහා ESG මූලධර්ම පදනම් කර ගැනීම සහතික කිරීමේ සමස්ත සම්බන්ධීකරණ වගකීම සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර (SME) දෙපාර්තමේන්තුව වෙත පවරා ඇත. අධීක්ෂණය, කළමනාකරණ සහ වාර්තාකරණය පිළිබඳ වගවීම තහවුරු කිරීම සඳහා ESරුණු අදාළ අවදානම් කළමනාකරණ මෙවලම් ද හඳුන්වා දෙන ලදී.

ප්‍රතිඵල

පාරිසරික

- කඩදාසි භාවිතය සහ කාබන් පියසටහන අවම කිරීම සඳහා ඩිජිටල් බැංකු සේවා පුළුල් කිරීම.
- 2025 වසරේදී ශ්‍රී ලංකාවේ හොඳම ඩිජිටල් බැංකුව ලෙස නම් කිරීම.
- LankaPay Technnovation සම්මාන උළෙලේදී වඩාත් ජනප්‍රිය ඩිජිටල් ගෙවීම් නිෂ්පාදනය සඳහා වන රන් සම්මානය දිනා ගැනීම.
- බලශක්ති සහ ජල සංරක්ෂණය කෙරෙහි අවධානය යොමු කරමින්, ශාඛා පද්ධතිය පුරා සම්පත් කාර්යක්ෂමතා වැඩසටහන් ශක්තිමත් කිරීම.
- මේ පිළිබඳ වැඩිදුර තොරතුරු ස්වභාවික ප්‍රාග්ධනය (පිටු 198-205), නිෂ්පාදිත ප්‍රාග්ධනය (පිටු 150-155) සහ තොරතුරු තාක්ෂණ හා ඩිජිටල් බැංකුකරණය (පිටු 127-131) යන පරිච්ඡේදවල විස්තර කර ඇත.

සමාජීය

- 2025 Euromoney විශිෂ්ටතා සම්මාන උළෙලේදී විවිධත්වය සහ අන්තර්ගතබව සඳහා වන ශ්‍රී ලංකාවේ හොඳම බැංකුව ලෙස ඇගයීමට ලක්වීම.
- ළමා සංවර්ධනය, උරුමයන් සුරැකීම සහ මූල්‍ය සාක්ෂරතාවය ඉහළ නැංවීමේ වැඩසටහන් ඇතුළත් ප්‍රජා සත්කාරක ව්‍යාපෘති සඳහා අඛණ්ඩව ආයෝජනය කිරීම.
- ජංගම සහ ඩිජිටල් වේදිකා හරහා බැංකු සේවා නිසි පරිදි නොලැබෙන ප්‍රජාවන් සඳහා සේවාවන් ලබා ගැනීමේ පහසුවවැඩි දියුණු කිරීම.
- මේ පිළිබඳ වැඩිදුර තොරතුරු මානව ප්‍රාග්ධනය (පිටු 162-179), සමාජීය සහ සබඳතා ප්‍රාග්ධනය (පිටු 180-197) සහ ප්‍රජා ප්‍රාග්ධනය (පිටු 192-195) යන පරිච්ඡේදවල විස්තර කර ඇත.

පාලනය

- පාලන විශිෂ්ටත්වය සහ මෙහෙයුම්වල විනිවිදභාවය වෙනුවෙන් සම්මාන ලැබීම.
- අවදානම් කළමනාකරණය සහ උපායමාර්ගික තීරණ ගැනීමේ ක්‍රියාවලිය සඳහා ESG (පාරිසරික, සමාජීය සහ පාලන) සාධක ඒකාබද්ධ කිරීම ශක්තිමත් කිරීම.
- ශක්තිමත් අනුකූලතාවය සහ සදාචාරාත්මක ප්‍රමිතීන් පිළිබිඹු කරමින් ජාතික සහ ජාත්‍යන්තර ඇගයීම් රැසක් දිනා ගැනීම.

සුරක්ෂිත ලොවක් උදෙසා අපගේ දායකත්වය

පරිසරය සුරැකීම සහ අපගේ පාරිසරික අඩිසටහන (Ecological Footprint) අවම කිරීම වෙනුවෙන් ඩිජිටල්කරණය හරහා ඉලක්කගත තිරසාර මුලපිරීම් රැසක් අප ආරම්භ කළ අතර, එමඟින් ග්‍රහලොව සුරක්ෂිත කිරීමෙහිලා බැංකුව සතු කාර්යභාරය තවදුරටත් ශක්තිමත් කරන ලදී.

විවෘත කරන ලද කඩදාසි රහිත ගිණුම්	මිලියන 6.0කට ආසන්න	ඩිජිටල් ගනුදෙනු	මිලියන 200කට ආසන්න
විද්‍යුත් ප්‍රකාශන ගිණුම්	මිලියන 0.6කට ආසන්න	ඩිජිටල් ගනුදෙනුවල වටිනාකම	ශ්‍රී.ල.රු. ට්‍රිලියන 1.7 අධික
ඩිජිටල් ක්‍රමයට නිකුත් කරන ලද ණය	මිලියන 0.3කට ආසන්න	වසර තුළ ලබා දී ඇති මුළු හරිත ණය (Green Loan) වටිනාකම	ශ්‍රී.ල.රු. මිලියන 3.6
මුළු ඩිජිටල් බැංකු පරිශීලකයින් සංඛ්‍යාව	මිලියන 4.2	වසර තුළ සිදු කරන ලද මුළු සිල්ලර අන්තර්ජාල බැංකුකරණ (RIB) සහ සිල්ලර ජංගම බැංකුකරණ (RMB) ලියාපදිංචි කිරීම්	මිලියන 0.5
මුළු ගනුදෙනු සංඛ්‍යාව – සිල්ලර අන්තර්ජාල බැංකුකරණය (RIB) සහ සිල්ලර ජංගම බැංකුකරණය (RMB)	මිලියන 24.1	මුළු ගනුදෙනු වටිනාකම – RIB සහ RMB	ශ්‍රී.ල.රු. බිලියන 662.6

එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක (UN SDG) වෙනුවෙන් අපගේ කැපවීම

තිරසාර සංවර්ධනය සඳහා වූ එක්සත් ජාතීන්ගේ 2030 න්‍යාය පත්‍රය සකස් කරන ලද්දේ සියලු ආකාරයේ දරිද්‍රතාවය අවසන් කිරීමටත්, පෘථිවිය සුරැකීමටත්, අනාගත පරපුර සඳහා සමෘද්ධිය සහ තිරසාර පරිසරයක් සහතික කිරීමටත්ය. මානව යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම සහ පෘථිවියේ සෞඛ්‍යය ආරක්ෂා කිරීම සඳහා අත්‍යවශ්‍ය වූ විශ්වීය අරමුණු ලෙස තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) 17ක් නිර්වචනය කරමින් මෙම ක්‍රියාකාරී සැලැස්ම සකස් කරන ලදී. අපගේ සියලුම මෙහෙයුම් සහ වේදිකාවන් හරහා තිරසාරත්වය සහතික කිරීම සඳහා, අපගේ වත්පිළිවෙත් වෙනස් කිරීම සහ සංවිධානයේ සෑම අංශයක් පුරාම තිරසාර සංවර්ධන ඉලක්කයන්හි (SDG) වටිනාකම් ඇතුළත් කිරීම අත්‍යවශ්‍ය වේ.

ඒකාබද්ධ වාර්තාකරණය

මෙම වාර්ෂික වාර්තාවේ (වාර්තාව) ඈඳංගු අනාවරණයන් මගින් අපගේ මෙහෙයුම්වල මූල්‍ය සහ මූල්‍ය නොවන අංශයන්හි එකතුවක් නිරූපණය කරන අතර, එය බැංකුව පුරා මූල්‍යමය ක්‍රියාකාරිත්වය සහ පාරිසරික, සමාජීය සහ පාලන (ESG) ක්‍රියාකාරිත්වය ඒකාබද්ධ කරයි. වාණිජමය වශයෙන් ලාභදායී ව්‍යවසායයක් ලෙස ක්‍රියාත්මක වන අතරම, පරිසරය පෝෂණය කිරීමට සහ ස්වභාවික ප්‍රාග්ධනය සුරැකීමට අප අනුගමනය කරන ප්‍රවේශය පිළිබඳව මෙම වාර්තාව සවිස්තරාත්මකව දක්වයි. තවද, අපද්‍රව්‍ය, කාබන් ඩයොක්සයිඩ් සහ අනෙකුත් දූෂක වැනි අහිතකර බලපෑම් සම්බන්ධයෙන්, බැංකුව විසින් පිටකිරීම් සහ විමෝචනයන් (effluents and emissions) පිළිබඳ පුළුල් අනාවරණයක් සපයයි. කෙසේ වෙතත්, බැංකුවේ සෑම ක්‍රියාවක්ම තිරසාරත්වයේ ආචාර ධර්ම මගින් මෙහෙයවනු ලබන අතර, එමගින් විශිෂ්ටතම වත්පිළිවෙත් සඳහා ආදර්ශමත් පරිසරයක් වගා කරයි.

ප්‍රතිපත්ති රාමුව සහ අධීක්ෂණය

බැංකුවේ 2025 තිරසාර මූල්‍ය ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි මාර්ගෝපදේශය (Sustainable Finance Policy and Procedure Guideline), තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) තුළ අන්තර්ගත වටිනාකම් පුළුල් ලෙස ඇතුළත් කරන අතර, එය 2016 දී නිකුත් කරන ලද ආයතනික තිරසාර ප්‍රතිපත්තිය (Corporate Sustainability Policy) තවදුරටත් ගොඩනංවනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තිරසාරත්ව මූලපිරීම් අධීක්ෂණය කරනු ලබන අතර, ඒවා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීමේ වගකීම ඒ වෙනුවෙන්ම කැපවූ තිරසාරත්ව අංශය වෙත පැවරී ඇත.

ක්‍රියාකාරී සැලැස්ම

බැංකුවේ ක්‍රියාකාරිත්වයට සහාය වන ප්‍රාග්ධන සංචිතය (Capital suite), නිශ්චිත තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) සමඟ අනුගත කර ඇති අතර, ඒ ඔස්සේ ජනිත වන වත්පිළිවෙත් අපගේ බැංකු මෙහෙයුම් තුළ ගැඹුරින් ස්ථාපිත කර ඇත.



බලපෑම් තක්සේරු කිරීම

බැංකුවේ ව්‍යාපාරික ක්‍රියාකාරකම් මගින් තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) කෙරෙහි ඇති කරන බලපෑම මැන බැලීම සඳහා බැංකුව විසින් මිනුම් දණ්ඩ සහ උපකරණ ස්ථාපිත කර ඇත. මන්දයත් මෙම ක්‍රියාවන් අවසානයේදී ප්‍රජාවන් කෙරෙහි සෘජුවම බලපාන බැවිනි. තම පාරිසරික, සමාජීය සහ පාලන (ESG) අනාවරණයන් මෙහෙයවීම සඳහා බැංකුව ගෝලීය වාර්තාකරණ මූලපිරීම (GRI) වැනි ජාත්‍යන්තර ප්‍රමිතීන් සමඟ අනුගත වී කටයුතු කරයි. එමගින් පාලන ව්‍යුහයන්, අවදානම් සහ අවස්ථාවන් වාර්තා කිරීම සඳහා ස්ථාවර සහ සැසඳිය හැකි මිනුම් දණ්ඩ සපයන අතර, එමගින් වාර්තාවේ විනිවිදභාවය තවදුරටත් ඉහළ නංවයි. මෙම රාමු ඒකාබද්ධව භාවිතා කිරීම මගින් බැංකුවේ ධනාත්මක දායකත්වයන් මෙන්ම අදහස් නොකළ අහිතකර බලපෑම් ද මැන බැලීමටත්, පැහැදිලි සහ සාක්ෂි සහිත වාර්තා ඉදිරිපත් කිරීම සඳහා පිළියම් යෙදීමටත් බැංකුවට හැකියාව ලැබී ඇත.

තිරසාර ව්‍යාපෘති සඳහා දරනු ලබන උත්සාහයන්ට ප්‍රමාණවත් ප්‍රසිද්ධියක් සහ පිළිගැනීමක් ලැබෙන බව සහතික කරමින්, දේශීය හා ජාත්‍යන්තර මට්ටමින් රජයේ ආයතන සහ අදාළ පාර්ශ්වකරුවන් සමඟ පවතින සහයෝගීතාව අපි තවදුරටත් ශක්තිමත් කළෙමු. අපගේ ව්‍යාපාරික කටයුතු විවිධ මට්ටම්වලින් සහ විවිධ ප්‍රමාණයන්ගෙන් තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) කෙරෙහි බලපෑම් කරන අතර, බැංකුව සමඟ සෘජුව හෝ වක්‍රව සම්බන්ධ වන සියලු දෙනාගේ ජීවිත කෙරෙහි ද බලපෑම් ඇති කරයි.

පාරිසරික මිනුම්: කාබන් විමෝචනය, බලශක්ති පරිභෝජනය, ජල පරිභෝජනය, අපද්‍රව්‍ය උත්පාදනය

සමාජීය මිනුම්: ශ්‍රම පුහුණුව, ප්‍රජා දායකත්වය, විවිධත්වය සහ ඇතුළත් කර ගැනීම

පාලන මිනුම්: අධ්‍යක්ෂ මණ්ඩලයේ විවිධත්වය, විධායක නිලධාරී පාරිශ්‍රමිකයන්, ව්‍යාපාරික ආචාර ධර්ම

අවදානම් සහ අවදානමට ලක්විය හැකි දුර්වලතා

පාරිසරික, සමාජීය සහ පාලන (ESG) ප්‍රතිඵල නිරීක්ෂණය කිරීම සහ වාර්තා කිරීම සඳහා අපි අබණ්ඩව GRI මාර්ගෝපදේශවලට අනුගත වූ අතර අපගේ අවදානම් කළමනාකරණ රාමුව ක්‍රියාත්මක කළෙමු. එමගින්, අදහස් නොකළ ක්‍රියාකාරකමක් හේතුවෙන් සිදුවිය හැකි විභව හානියක බර අවම කර ගැනීම සඳහා උපාය මාර්ග සකස් කිරීමට අපට හැකි විය. බැංකුව පුරා තිරසාර මූලධර්ම ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කුසලතාවලින් සහ දැනුමෙන් තිරසාරත්ව අංශය (Sustainability Department) මැනවින් සන්නද්ධ වී ඇත. විශේෂයෙන්ම, ESG ප්‍රතිඵල මගින් ආයෝජකයින් සහ පාරිභෝගිකයින් අතර බැංකුවේ කීර්තිනාමයට සැලකිය යුතු බලපෑමක් ඇති කළ හැකි බැවිනි. බැංකුව හුදෙක් නියාමන අනුකූලතාවය කෙරෙහි පමණක් අවධානය යොමු නොකරන අතර, තම කීර්තිනාමය සහ සන්නාමය ශක්තිමත් කරමින් පරිපූර්ණ ප්‍රජාවක් ගොඩනැගීම සඳහා වූ මූලික කටයුතු අබණ්ඩව වැඩිදියුණු කරමින් ESG ආශ්‍රිත විශිෂ්ටතම වත්පිළිවෙත් ප්‍රවර්ධනය කරයි. එබැවින්, තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) වෙනුවෙන් වූ කැපවීම අපගේ උපායමාර්ගික න්‍යාය පත්‍රයේ ප්‍රමුඛතාවයකි.

හරිත මූල්‍යකරණය

පුනර්ජනනීය බලශක්තිය වෙත සංක්‍රමණය වීම පහසු කිරීම සඳහා අපි හරිත මූල්‍යකරණයෙහි නිරත වූ අතර, දිගුකාලීන ප්‍රාග්ධනය ආකර්ෂණය කර ගැනීම සඳහා හරිත බැඳුම්කර (Green Bonds) නිකුත් කිරීමට අපේක්ෂා කරමු. මෙහි අරමුණ වන්නේ අපගේ පාරිසරික පියසටහන (environmental footprint) වැඩිදියුණු කිරීමට සහ මහා පරිමාණ තිරසාර ව්‍යාපෘති සඳහා සහාය වීමට අවශ්‍ය ආයෝජන ප්‍රවාහයක් නිර්මාණය කිරීමයි.

ප්‍රමුඛතාවන් හඳුනාගැනීම

ඩිජිටල් පරිවර්තනය වේගවත් කිරීම තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) සමඟ අනුගත වීමේ ප්‍රධාන අංගයක් වන අතර, එය කඩදාසි භාවිතයෙන් තොර හෝ කඩදාසි භාවිතය අවම කළ (paper-reduced) සංවිධානයක් බවට පත්වීම සඳහා අප ගන්නා උත්සාහයට සහාය වේ. කෙසේ වෙතත්, මෙම තාක්ෂණයන්හි පවතින අඩු විමෝචන සාධක (lower emission factors) පිළිබඳව අප අවබෝධයෙන් පසුවන අතර, පරිසරයට අවම හානියක් පමුණුවන තාක්ෂණයන් අත්පත් කර ගැනීම සඳහා අපි සැලකිය යුතු ලෙස ආයෝජනය කර ඇත්තෙමු. හරිත ගොඩනැගිලි (Green buildings) මගින් දහවල් කාලයේ ස්වභාවික ආලෝකය උපරිම ලෙස භාවිත කිරීමට අවස්ථාව සැලසුණු අතර, ශාඛා කිහිපයකම බලශක්ති අවශ්‍යතා සඳහා පුනර්ජනනීය බලශක්තිය වෙත සංක්‍රමණය වීම ජාතික විදුලි බල පද්ධතිය මත අපගේ යැපීම අවම කිරීමට උපකාරී විය.

මානව ප්‍රාග්ධන සංවර්ධනය

අපගේ මෙහෙයුම් තිරසාර සංවර්ධන ඉලක්ක (SDG) මූලධර්ම සමඟ අනුගත කිරීම සඳහා දරනු ලබන අබණ්ඩ උත්සාහයේ කොටසක් ලෙස, තිරසාරත්වය පිළිබඳ සංස්කෘතියක් (culture of sustainability) ඇති කිරීම සඳහා පුහුණු කිරීම්, දැනුවත් කිරීමේ වැඩසටහන් මෙන්ම පාරිසරික හා ජෛව විවිධත්ව ව්‍යාපෘති හරහා අපි අපගේ මානව ප්‍රාග්ධනය වෙනුවෙන් ආයෝජනය කළෙමු.

අපගේ ව්‍යාපාර සහ මෙහෙයුම් පුරා තිරසාරත්වය ළඟා කර ගැනීම සඳහා ආර්ථික සමෘද්ධිය සහ පාරිසරික වගකීම අතර සමබරතාවයක් අවශ්‍ය වේ. මෙම අංගයන්හි පවතින අන්තර් සම්බන්ධිතභාවය හඳුනා ගැනීම මගින්, අපගේ සියලුම පාර්ශ්වකරුවන් වෙනුවෙන් තිරසාර ව්‍යාපාරයක් ඔරොත්තු දීමේ හැකියාව ඇති අනාගතයක් කරා යන මාවතක් සකස් කර ගැනීම පිළිබඳ අපි සහතික වන්නෙමු.




Banking
Redefined,
Just for You



කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණය



102
ව්‍යාපාරික ක්ෂේත්‍ර සමාලෝචනය

- 103 පුද්ගල කේන්ද්‍රිය බැංකුකරණය
- 109 වාණිජ ණය
- 112 සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය සහ ක්ෂුද්‍ර මූල්‍ය
- 116 ආයතනික බැංකුකරණය
- 118 භාණ්ඩාගාරය සහ ආයෝජන බැංකුකරණය
- 122 චිතෙර පාරිභෝගික සේවා
- 125 ජාත්‍යන්තර බැංකු කටයුතු
- 127 තොරතුරු තාක්ෂණය සහ ඩිජිටල් බැංකුකරණය
- 132 ණයපත්
- 134 අයකරගැනීම්
- 136 අලෙවිකරණය
- 138 ශාඛා මෙහෙයුම් කළමනාකරණය

142
මූල්‍ය ප්‍රාග්ධනය

150
නිෂ්පාදිත ප්‍රාග්ධනය

156
බුද්ධිමය ප්‍රාග්ධනය

162
මානව ප්‍රාග්ධනය

180
සමාජීය සහ සම්බන්ධතා ප්‍රාග්ධනය

- 183 ගනුදෙනුකාර ප්‍රාග්ධනය
- 189 ව්‍යාපාරික හවුල්කාර ප්‍රාග්ධනය
- 192 ප්‍රජා ප්‍රාග්ධනය
- 196 ආයෝජක ප්‍රාග්ධනය

198
ස්වභාවික සම්පත් ප්‍රාග්ධනය

ව්‍යාපාරික ක්ෂේත්‍ර සමාලෝචනය

විවිධ අවශ්‍යතා සඳහා වන විවිධත්වයෙන් යුත් නිෂ්පාදන එකතුවක්



පුද්ගල කේන්ද්‍රිය බැංකුකරණය

බැංකුවේ ගනුදෙනුකාර නිෂ්පාදන කළඹ කළමනාකරණය කිරීමේ වගකීම පුද්ගල කේන්ද්‍රිය බැංකුකරණ අංශය වෙත පැවරී ඇත. මෙයට නිෂ්පාදන සැලසුම් කිරීමේ සිට ඒවා ගනුදෙනුකරු වෙත සමීප කරවීම දක්වා වූ ක්‍රියාවලිය මෙන්ම, වෙනස් වන ගනුදෙනුකාර අවශ්‍යතාවලට අනුකූල වෙමින් ගනුදෙනුකරු කේන්ද්‍ර කරගත් විසඳුම් යාවත්කාලීන කිරීම ද ඇතුළත් වේ.

අපගේ අවධානය

පුද්ගලික අංශයට ණය ලබාදීම ඉහළ නැංවීම, තැන්පතු රැස් කර ගැනීම සහ ශාඛා ප්‍රශස්තකරණය හරහා ගනුදෙනුකාර ප්‍රවේශය පුළුල් කිරීම මගින් ශේෂ පත්‍රය ශක්තිමත් කිරීම කෙරෙහි බැංකුව විසින් අවධානය යොමු කරන ලදී. බැංකුවේ ඩිජිටල් පරිවර්තනය මෙන්ම ශාඛා සහ සේවා මධ්‍යස්ථාන 746කින් සමන්විත ජාලය මෙම උත්සාහයන් සඳහා මනා සහයෝගයක් ලබා දෙන ලදී. මෙම බෙදාහැරීමේ මාර්ගවල එකතුවත් සමඟ, අපගේ ගනුදෙනුකාර පොරොන්දුව ඉටු කිරීමටත්, එමගින් ශක්තිමත් ශේෂ පත්‍රයක් පවත්වා ගැනීමේ උපායමාර්ගික ප්‍රවේශය සාක්ෂාත් කර ගැනීමටත් අපි සන්නද්ධව සිටියෙමු.

අපගේ උපායමාර්ගය

නිෂ්පාදන නවෝත්පාදනය, මූල්‍ය ඇතුළත් කිරීම සහ සේවා විශිෂ්ටත්වය පදනම් කර ගනිමින්, ශ්‍රී ලංකා රුපියල් සහ විදේශ මුදල් යන දෙවර්ගයෙන්ම තැන්පතු පදනම වර්ධනය කර ගැනීම සඳහා අපි වෙළෙඳපොළ වෙත ප්‍රවේශ වීමු. උපතේ සිට ජ්‍යෙෂ්ඨ පුරවැසි විය දක්වා වූ පුද්ගලයන් වෙත ළඟා වෙමින් අපි දැඩි තැන්පතු රැස් කර ගැනීමේ වැඩසටහන් ක්‍රියාත්මක කළෙමු.

වත්කම් නිෂ්පාදන විවිධ ක්‍රම ඔස්සේ හඳුන්වා දුන් අතර, එමගින් ණය පොත (loan book) පුළුල් කිරීමට සහ ප්‍රජාවන් සවිබල ගැන්වීමට සහාය දක්වන ලදී. විදේශගතව සිටින ශ්‍රී ලාංකිකයන් සඳහා ඔවුන්ගේ විදේශ ගමන් ආරම්භයේ සිට නැවත මෙරට පදිංචි වීමෙන් පසු කාලය දක්වා සේවය සැලසීම සඳහා කැපවූ විදේශගත ණය ඒකකයක් (Expat Loans Unit) ස්ථාපිත කරන ලදී.



උපායමාර්ගය

- තැන්පතු
- උසස් උකස් ක්‍රමවේද
- විදේශගතව සේවය කරන්නන් සඳහා වන ණය ඒකකය
- සහයෝගී හවුල්කාරිත්වයන්
- තරුණ පරපුර ඉලක්ක කරගත් බැංකුකරණය
- වත්කම් නිෂ්පාදන

විශේෂිත කරුණු

ගනුදෙනුකාර තැන්පතු
රුපියල් ට්‍රිලියන 2.8
ඉක්මවයි.

ගනුදෙනුකරුවන්ගේ ණය
රුපියල් බිලියන 500

උකස් ණය කළඹ
රුපියල් බිලියන 386.4

ගනුදෙනුකාර ණය සඳහා අක්‍රිය ණය අනුපාතය
1.8%

තැන්පතු රැස් කිරීම

විවිධ ජනකොටස් අතර ඉතුරුම් සංස්කෘතියක් පෝෂණය කිරීමෙහිලා බැංකුවේ තැන්පතු නිෂ්පාදන දායකත්වය ප්‍රධාන භූමිකාවක් ඉටු කරයි. අවශ්‍යතා මත පදනම් වූවා පමණක් නොව, නාගරිකයේ සිට ග්‍රාමීය සහ අර්ධ ග්‍රාමීය දක්වා වූ විවිධ ජීවන තලයන්ට ගැළපෙන බහුවිධ නිෂ්පාදන පෙළක් අපි පිරිනමන්නෙමු. අපගේ දිවයින පුරා විහිදුණු ප්‍රවේශය සහ දියුණු ඩිජිටල් හැකියාවන් සමඟ, මෙම විසඳුම් පහසුවෙන් ලබාගත හැකි අතර ඉතා පහසුවෙන් පාරිභෝගිකයා වෙත සමීප කරවනු ලබයි. ගනුදෙනුකරුවෙකුගේ ජීවිත කාලයෙහි සෑම අදියරකදීම ධනය ගොඩනැගීමට සහ සහය වීමට අපි "ජීවන චක්‍ර බැංකු ප්‍රවේශයක්" (life cycle banking approach) අනුගමනය කරන්නෙමු.

එය ඉතුරුම් හෝ ආයෝජන වේවා, විශ්‍රාමකාලීන අරමුදලක් හෝ තරුණ සංවර්ධනය වේවා, අපගේ නිෂ්පාදන සකස් කර ඇත්තේ විනයගරුක ඉතුරුම් පුරුද්දක් ඇති කිරීම සඳහා ය. මූල්‍ය ඇතුළත් කිරීම (financial inclusion) වේගවත් කිරීම සඳහා පූර්ණ ණය පහසුකම් පරාසයක්, අගය එකතු කළ ප්‍රතිලාභ සහ ඩිජිටල් බැංකු මෙවලම් මගින් මෙයට සහය ලබා දේ. තැන්පතු යනු බැංකුවේ අරමුදල් සැපයීමේ මූලික පදනම වන අතර, කෘෂිකර්මාන්තය, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය (SME), නිවාස සහ පුද්ගලික මූල්‍ය වැනි ප්‍රමුඛතා අංශයන් වෙත වගකීම් සහගත ලෙස ණය ලබා දීම සඳහා එය ස්ථාවර පදනමක් සපයයි. අපගේ තැන්පතු පදනමේ ශක්තිය මගින් පෙන්නුම් කරන්නේ, පොදු සුභසාධනය කේන්ද්‍ර කරගත්, විශ්වාසදායක සහ ආරක්ෂිත බැංකුවක් ලෙස මිලියන සංඛ්‍යාත පාරිභෝගිකයන් අප කෙරෙහි තබා ඇති විශ්වාසයයි.

ඉතුරුම් නිෂ්පාදන

අපගේ නිෂ්පාදන පිරිනැමීම, ශ්‍රී ලංකාවේ හෝ විදේශයන්හි පදිංචි අපගේ පාරිභෝගිකයන්ගේ අභිලාෂයන් සපුරාලීම සඳහා සකස් කර ඇත.

ළමා

"ඉසුරු උදාන" ඉතුරුම් ගිණුම උපතේ සිට වයස අවුරුදු පහ දක්වා දරුවන් සඳහා නිර්මාණය කර ඇති අතර, ජීවිතයේ මුල් අවධියේ සිටම ඉතුරුම් සංස්කෘතියක් පෝෂණය කිරීම එහි අරමුණයි. තැන්පතු සහ විශේෂයෙන් නිර්මාණය කරන ලද තෑගි වවුචර් මගින් දරුවෙකුගේ මූල්‍ය අනාගතය සඳහා දායක වීමට දෙමාපියන්, ඥාතීන් සහ හිතවතුන් දිරිමත් කරනු ලබන අතර, මෙම වවුචර් නව ගිණුම් ආරම්භ කිරීමට හෝ පවතින ගිණුම්වලට මුදල් බැර කිරීමට භාවිතා කළ හැකිය.

දරුවාට වයස අවුරුදු පහ සම්පූර්ණ වූ පසු, මෙම ගිණුම ස්වයංක්‍රීයව "සිසු උදාන" ඉතුරුම් ගිණුම බවට පරිවර්තනය වන අතර, එමගින් දරුවාගේ අධ්‍යාපනික සහ සංවර්ධන අභිලාෂයන්ට සහය වෙමින් ඉතුරුම් අඛණ්ඩතාව සහතික කෙරේ. මෙම මුලපිරීම හරහා බැංකුව තරුණ පරම්පරාව අතර දිගුකාලීන මූල්‍ය දැනුවත්භාවයක් ගොඩනැගීමට දායක වේ.

තරුණ පරපුර

"YES" (Youth Empowerment Savings) ගිණුම මගින් තරුණ පරපුර ඉලක්ක කර ගන්නා අතර, ඔවුන්ගේ අධ්‍යාපනික සහ වෘත්තීය අභිලාෂයන් හඹා යාමේදී තරුණ පුද්ගලයන් හට සහයෝගය දක්වයි. මෙම නිෂ්පාදනය පුළුල් පරාසයක බැංකු සේවා සපයන අතරම, උසස් අධ්‍යාපනය, ව්‍යවසායකත්වය, නිවාස, වාහන, උපකරණ, පරිගණක සහ අනෙකුත් පාරිභෝගික අවශ්‍යතා සඳහා සහය වන මූල්‍ය පහසුකම් සඳහා ප්‍රවේශය ද ලබා දෙයි. තරුණ පාරිභෝගිකයන් හට ඔවුන්ගේ වෘත්තීය ජීවිතයේ මුල් අවධියේදීම මූල්‍ය විසඳුම් ලබා ගැනීමට ඉඩ සැලසීම හරහා, මූල්‍යමය වශයෙන් වගකිවයුතු සහ ආර්ථිකමය වශයෙන් ක්‍රියාශීලී තරුණ පරපුරක් බිහිකිරීමට බැංකුව සහයෝගය දක්වයි.

YES Biz Teen Challenge Trophy 2025

ව්‍යවසායකත්වය පෝෂණය කිරීම සහ අනාගත පරම්පරාවන් සවිබල ගැන්වීම සඳහා වන සිය අඛණ්ඩ කැපවීමෙහි කොටසක් ලෙස, මහජන බැංකුව "YES Biz Teen Challenge Trophy 2025" සාර්ථකව දියත් කරන ලදී. මෙම මුලපිරීම විශේෂයෙන්ම සැලසුම් කර ඇත්තේ පාසල් දරුවන් අතර ව්‍යවසායකත්ව චින්තනය, නිර්මාණශීලිත්වය සහ නවෝත්පාදනය පෝෂණය කිරීම සඳහා වන අතර, එමගින් ඔවුන්ගේ ජීවිතයේ මුල් අවධියේදීම ව්‍යාපාරික අදහස් වර්ධනය කර ගැනීමට ඔවුන්ට අවස්ථාව සලසා දෙයි.

තිරසාර ජාතික සංවර්ධනය ව්‍යවසායකත්වයේ වර්ධනය සමඟ සමීපව බැඳී පවතින බව හඳුනා ගනිමින්, තරුණ මනස අනාගත ව්‍යාපාරික නායකයින් වීමට දිරිමත් කරන වේදිකාවක් ලෙස බැංකුව මෙම වැඩසටහන උපායමාර්ගික ලෙස ස්ථානගත කරන ලදී. තරුණයින් අතර ව්‍යවසායකත්ව සංස්කෘතියක් වර්ධනය කිරීම මගින් ශ්‍රී ලංකාවේ සමාජ-ආර්ථික ප්‍රගතියට දායක වීමේ බැංකුවේ පුළුල් දැක්ම මෙම මුලපිරීම මගින් පිළිබිඹු වේ.

මෙම වැඩසටහන කාර්මික සංවර්ධන මණ්ඩලය (IDB) සමඟ සහයෝග යෙන් ක්‍රියාත්මක කරන ලද අතර, එමගින් දිවයින පුරා පුළුල් ව්‍යාප්තියක් සහ බලපෑමක් සහතික කරන ලදී. දිවයිනේ සියලුම දිස්ත්‍රික්ක ආවරණය කරමින් පවත්වන ලද මෙම තරඟය සඳහා බිම් මට්ටමේ පාසල් ප්‍රජාවන් සම්බන්ධ කර ගත් අතර, නව්‍ය සහ ප්‍රායෝගික ව්‍යාපාරික අදහස් ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දුන්නේය. ව්‍යුහගත ඇගයීම් ක්‍රියාවලියක් හරහා වඩාත් බලාපොරොත්තු සහගත අදහස් පාසල්, දිස්ත්‍රික් සහ ජාතික මට්ටමින් හඳුනා ගන්නා ලදී.

තරඟයට ඔබ්බෙන් යමින්, මෙම වැඩසටහන හරහා ජනනය වූ වඩාත් ප්‍රායෝගික ව්‍යාපාරික සංකල්ප තවදුරටත් වර්ධනය කිරීම සහ ඒවාට සහය වීම කෙරෙහි අවධානය යොමු කරමින් මෙම මුලපිරීමේ මීළඟ අදියර සැලසුම් කිරීමේ කටයුතු බැංකුව මේ වන විට සිදු කරමින් පවතී. මෙම අදහස් තිරසාර ව්‍යාපාර බවට පරිවර්තනය කිරීම සඳහා උපදේශනය, මූල්‍ය සාක්ෂරතාව සහ විභව අරමුදල් සහය ලබා දීම සඳහා වූ මාර්ග ගවේෂණය කිරීම මෙයට ඇතුළත් වේ.

ජාතිය ගොඩනැගීමට කැපවූ වගකිවයුතු මූල්‍ය ආයතනයක් ලෙස සිය කාර්යභාරය තහවුරු කරමින්, ඉදිරි වසරවලදී ද මෙම ප්‍රමුඛතම මුලපිරීම අඛණ්ඩව පවත්වාගෙන යාමට මහජන බැංකුව අදහස් කරයි. තරුණ ව්‍යවසායකත්වය වෙනුවෙන් ආයෝජනය කිරීමෙන් රටේ ආර්ථික වර්ධනය, නවෝත්පාදනය සහ දිගුකාලීන සංවර්ධනය සඳහා අර්ථවත් ලෙස දායක වීම බැංකුවේ අරමුණයි.

කාන්තා

වනිතා වාසනා ඉතුරුම් ගිණුම විශේෂයෙන්ම නිර්මාණය කර ඇත්තේ කාන්තාවන්ගේ මූල්‍ය අභිලාෂයන් සහ ආර්ථික සවිබල ගැන්වීම් ආමන්ත්‍රණය කිරීම සඳහා ය. ආර්ථිකය සඳහා කාන්තාවන්ගේ දායකත්වය වැඩි වෙමින් පවතින බව හඳුනා ගනිමින්, සකස් කරන ලද මූල්‍ය සේවාවන් වෙත ප්‍රවේශ වන අතරම මූල්‍ය සුරක්ෂිතතාව ගොඩනඟා ගැනීමට මෙම නිෂ්පාදනය කාන්තාවන්ට අවස්ථාව සලසා දෙයි.

ස්වයං රැකියා මූල්‍ය පහසුකම්, නිවාස හා ඉඩම් මිලදී ගැනීමේ ණය, විවාහ මංගල්‍යයන් සඳහා මූල්‍ය ආධාර සහ දරුවන්ගේ උසස් අධ්‍යාපනය සඳහා වන මූල්‍ය සහය ඇතුළු සුවිශේෂී ණය පහසුකම්වලින් ගිණුම් හිමියෝ ප්‍රතිලාභ ලබති. මෙම නිෂ්පාදනය හරහා, කාන්තා ව්‍යවසායිකාවන්ට සහය වීමට සහ නාගරික මෙන්ම ග්‍රාමීය ප්‍රජාවන්හි කාන්තාවන් අතර මූල්‍ය ඇතුළත් කිරීම් ඉහළ නැංවීමට බැංකුව දිගින් දිගටම සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කරයි.

ජ්‍යෙෂ්ඨ පුරවැසියන්

පරිණත ඉතුරුම් ගිණුම වයස අවුරුදු 55 සහ ඊට වැඩි ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා සැලසුම් කර ඇති අතර, විශ්‍රාම කාලය තුළ මූල්‍ය පහසුව සහ සුරක්ෂිතතාව සහතික කරන ඉහළ ප්‍රතිලාභ රැසක් පිරිනමයි. මෙම ගිණුම මගින් සාමාන්‍ය ඉතුරුම් ගිණුම්වලට වඩා වැඩි අභිරුචි පොලී අනුපාත ලබා දෙන අතර, බැංකු සේවාවන් වෙත පහසුවෙන් ප්‍රවේශ විය හැකි පරිදි විශේෂිත වූ VISA ඩෙබිට් කාඩ්පත් පහසුකමක් ද සපයයි. අගය එකතු කළ විශේෂාංග සහ පුද්ගලීකරණය කළ බැංකු සේවා පිරිනැමීම හරහා, බැංකුව සිය ජ්‍යෙෂ්ඨ පාරිභෝගිකයන්ගේ මූල්‍ය යහපැවැත්ම සහ ස්වාධීනත්වය ඉහළ නැංවීමට අපේක්ෂා කරයි.

කාලීන තැන්පතු

ඉතුරුම් ගිණුම්වලට අමතරව, මහජන බැංකුව පාරිභෝගිකයන් වෙත ආරක්ෂිත ආයෝජන අවස්ථාවන් සහ ආකර්ෂණීය ප්‍රතිලාභ ලබා දෙන පුළුල් කාලීන තැන්පතු නිෂ්පාදන කළඹක් පිරිනමයි. මෙම තැන්පතු ක්‍රමවේදයන් තරඟකාරී පොලී අනුපාත සහ නම්‍යශීලී කල් පිරීමේ කාලසීමාවන් ලබා දීම මගින් විවිධ මූල්‍ය අරමුණු සපුරාලීම සඳහා ව්‍යුහගත කර ඇත.

බැංකුවේ කාලීන තැන්පතු නිෂ්පාදන, විශ්වාසදායක ආයෝජන විකල්පයන් සොයන පුද්ගලයන්, ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සහ ආයතනික සේවාදායකයන් ඇතුළු පුළුල් පරාසයක පාරිභෝගිකයන්ගේ අවශ්‍යතා සපුරාලයි. නම්‍යශීලී කාලසීමාවන් සහ පහසු පොලී ගෙවීමේ විකල්පයන් සමඟින්, මෙම නිෂ්පාදන මගින් පාරිභෝගිකයන්ට ඔවුන්ගේ ද්‍රවශීලතා අවශ්‍යතා (liquidity requirements) ඵලදායී ලෙස කළමනාකරණය කරන අතරතුර, සිය ඉතුරුම් වර්ධනය කර ගැනීමට ස්ථාවර මාර්ගයක් සලසා දෙයි.

Business Elegance ජංගම ගිණුම

People's Elegance Business Current Account යනු විචක්ෂණශීලී පවතින පාරිභෝගිකයන් හඳුනාගෙන රඳවා ගැනීමට සහ ඉහළ වටිනාකමකින් යුත් නව ව්‍යාපාරික සේවාදායකයන් ආකර්ෂණය කර ගැනීම සඳහා ශ්‍රී ලංකා මහජන බැංකුව විසින් හඳුන්වා දෙන ලද වාරික (premium) ව්‍යාපාරික ජංගම ගිණුමකි. ශක්තිමත් මූල්‍ය වින්‍යාසයක් සහ ඉහළ ගනුදෙනු පරිමාවක් පවත්වාගෙන යන පාරිභෝගිකයන් වෙත ඉහළ නැංවූ බැංකු වරප්‍රසාද සහ පිළිගැනීමක් ලබා දීම සඳහා මෙම ගිණුම සැලසුම් කර ඇත. විශේෂ ප්‍රතිලාභ සහ පිළිගැනීමක් පිරිනමමින්, සක්‍රීය බැංකු සබඳතා පවත්වා ගැනීමටත්, ව්‍යාපාරික පහසුව ඉහළ නැංවීමටත් පාරිභෝගිකයන් දිරිමත් කරන මෙම ගිණුම, ඉහළ වටිනාකමකින් යුත් ව්‍යාපාරික පාරිභෝගිකයන් සඳහා වඩාත් කැමති සහකරු ලෙස බැංකුව ස්ථානගත කරයි.

ප්‍රජා සහභාගිත්වය

දිවයින පුරා විහිදුණු ශාඛා ජාලය තැන්පතු ඒකරාශි කිරීම් සඳහා අත්‍යවශ්‍ය අංගයක් වූ අතර, එහිදී බැංකු කාර්ය මණ්ඩලය විවිධ තරාතිරම්වල ජනතාව ආවරණය වන පරිදි විවිධ ස්ථානයන්හි ප්‍රජා සහභාගිත්ව ක්‍රියාකාරකම් (community engagement activities) උද්‍යෝගිමත් ලෙස සිදු කරමින්, දැනුවත්භාවය ඇති කිරීමට සහ පාරිභෝගික ප්‍රවේශය පුළුල් කිරීමට කටයුතු කළහ. පාරිභෝගික බැංකුකරණ (Retail Banking) ව්‍යාපාරය තුළ අප අත්පත් කර ගෙන ඇති සාර්ථකත්වයට බෙහෙවින්ම හේතු වී ඇත්තේ අපගේ ශාඛා කාර්ය මණ්ඩලයේ සහ සහායක සේවාවන්හි කැපවීම, විශේෂඥ දැනුම, නිර්මාණශීලිත්වය සහ කැපවීමයි.



ඉතිරි කිරීමේ පුරුද්ද සහ ආයෝජන දිරිමත් කිරීම සඳහා වන ප්‍රජා සමාජීය වගකීම් ක්‍රියාකාරකම්

78 වන නිදහස් දිනය සැමරීම නිමිත්තෙන් ඉසුරු උදාන බාල වයස්කාර ගිණුම ප්‍රවර්ධනය කිරීම සඳහා වූ "නිදහසේ උපත" (Birth of Freedom) ප්‍රාදේශීය ව්‍යාපාරය.

ඔක්තෝබර් 01 වන දිනට යෙදෙන ජ්‍යෙෂ්ඨ පුරවැසි දිනය සැමරීම වෙනුවෙන්, පරිණත ගිණුම් හිමියන් සඳහා සෞඛ්‍ය සහ වෛද්‍ය අවශ්‍යතාවලදී වට්ටම් සහිත ප්‍රතිලාභ පිරිනැමීම.

තරුණයන්ගේ ව්‍යාපාරික අදහස් දිරිමත් කිරීම සඳහා කර්මාන්ත සංවර්ධන මණ්ඩලය හා ඒකාබද්ධව ක්‍රියාත්මක කළ තරුණ ව්‍යවසායකත්ව මෙහෙයුම සහ YES Teens ගිණුම නැවත හඳුන්වා දීම.

පොල්ගොල්ල ගුරු අභ්‍යාස විද්‍යාලය හා ඒකාබද්ධව මහනුවර දී පවත්වන ලද ජාත්‍යන්තර කාන්තා දින සැමරුම.

පළමු ශ්‍රේණියට ඇතුළත් වන සියලුම සිසුන් වෙනුවෙන් සියලුම පාසල්වල පවත්වන ලද "පළමු දින – පළමු පාඩම" වැඩසටහන – මෙහිදී සිසුන්ට තෑගි පිරිනැමීම සහ සිසු උදාන ගිණුම ප්‍රවර්ධනය කිරීම සිදු කරන ලදී.

ඔක්තෝබර් 1 සිට දෙසැම්බර් 31 දක්වා ක්‍රියාත්මක කරන ලද ලෝක ළමා දින ක්‍රියා මාලාව.

වත්කම් නිෂ්පාදන ලබාදීම

වැටුප් ලබන සේවකයින්, වෘත්තිකයන්, ව්‍යවසායකයින් සහ ගෘහ ඒකක සඳහා දැරිය හැකි සහ පහසුවෙන් ලබාගත හැකි ණය පහසුකම් රැසක් පිරිනමමින් බැංකුව ජාතික ආර්ථිකය පුනර්ජීවනය කිරීම සඳහා දායක විය. අපගේ ණය මෙවලම් මිශ්‍රණය පාරිභෝගික අවශ්‍යතා අනුව සකස් කරන ලද අතර, ශක්තිමත් ණය සහ අවදානම් කළමනාකරණ රාමුවකට යටත්ව ණය වර්ධනය සහ කළඹ විවිධාංගීකරණය (Portfolio diversification) සඳහා අපි කටයුතු කළෙමු. තිරසාර ආර්ථික සංවර්ධනයක් සහතික කිරීම සඳහා නිෂ්පාදන අංශ වෙත මෙහිදී ප්‍රමුඛතාවය ලබා දෙන ලදී. වසර තුළ වත්කම් වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන්ම බලපෑවේ පාරිභෝගික ණය (Retail lending) පහසුකම් ලබාදීමයි.

ණය කළඹ

විවිධ ආදායම් මට්ටම් සහ විවිධ වෘත්තීය පසුබිම් සහිත පාරිභෝගිකයන්ට ගැළපෙන පරිදි සකස් කරන ලද පුළුල් පරාසයක පුද්ගලික ණය නිෂ්පාදන පිරිනැමීමට බැංකුව අඛණ්ඩව කටයුතු කළේය.

වැටුප් ලබන්නන් සඳහා වන ණයි

සේවයේ නියුතු වෘත්තිකයන් සඳහා – රාජ්‍ය සහ පෞද්ගලික යන දෙඅංශයේම සේවකයින්ට තම පුද්ගලික මූල්‍ය අවශ්‍යතා සපුරා ගැනීම සඳහා පහසුවෙන් පුද්ගලික ණය පහසුකම් ලබා ගැනීමට මෙම නිෂ්පාදනය හරහා අඛණ්ඩව අවස්ථාව සලසා දෙන ලදී. එමගින් ක්‍රමවත් ආපසු ගෙවීමේ සැලසුම් යටතේ පාරිභෝගිකයන්ට තම පුද්ගලික සහ පවුලේ මූල්‍ය අවශ්‍යතා සපුරා ගැනීමට හැකි විය. යහපත් ආපසු ගෙවීමේ ඉතිහාසයක් සහිත දැනට සිටින පාරිභෝගිකයින් දිරිමත් කිරීම සඳහා බැංකුව විසින් අතිරේක ණය පහසුකම් (Loan Top-Up Facilities) ලබා දෙන ලදී. එමගින් පවතින ණය සැකසුම්වල අඛණ්ඩතාව පවත්වා ගනිමින්, අවම ලේඛන ප්‍රමාණයක් භාවිත කර අතිරේක අරමුදල් ලබා ගැනීමට ණය ගැතියන්ට අවස්ථාව හිමි විය.

රථ වාහන ණය

රථ වාහන ණය බොහෝ ගෘහ ඒකකවල ප්‍රධාන අපේක්ෂාවක් ලෙස වාහන හිමිකාරිත්වය පවතින බැවින්, බැංකුවේ වාහන ණය කළඹ සඳහා ස්ථාවර ඉල්ලුමක් අඛණ්ඩව පෙන්නුම් කරන ලදී. තරගකාරී පොලී අනුපාත සහ නම්‍යශීලී ආපසු ගෙවීමේ ක්‍රමවේදයන් හේතුවෙන් පාරිභෝගිකයින්ට තම මූල්‍ය ශක්තියට ගැළපෙන පරිදි මූල්‍ය පහසුකම් ලබා ගැනීමට හැකි විය. වාහන මූල්‍යකරණය සඳහා පවතින ඉහළ ඉල්ලුමට ප්‍රතිචාරයක් ලෙස, ටොයෝටා (Toyota) වාහන මිලදී ගන්නා පාරිභෝගිකයින්ට මනාප මූල්‍ය විකල්ප (Preferential financing options) පිරිනැමීම සඳහා බැංකුව ටොයෝටා ලංකා ආයතනය සමඟ පවතින සහයෝගිතාව තවදුරටත් ශක්තිමත් කළේය.

ශිෂ්‍ය ණය

ශ්‍රී ලංකා අධ්‍යාපන අමාත්‍යාංශය හා ඒකාබද්ධව ක්‍රියාත්මක කරනු ලබන ශිෂ්‍ය ණය පහසුකම් හරහා මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරීම සඳහා බැංකුව අඛණ්ඩව දායක විය. මෙම පොලී රහිත ණය යෝජනා ක්‍රම මගින් උසස් අධ්‍යාපන අවස්ථා හඹා යන සිසුන්ට මූල්‍ය ආධාර සපයන අතර, එමගින් ජාතික සංවර්ධනයට සහ සමාජ ප්‍රගමනයට දායකත්වයක් ලබා දෙයි.

මහජන නිවාස ණය

බැංකුවේ සිල්ලර ණය කළඹ තුළ නිවාස මූල්‍යකරණය විශේෂයෙන්ම වැදගත් සහ ප්‍රමුඛ ලෙස අඛණ්ඩව පැවතිණි. "මහජන නිවාස ණය" සහ "ජය නිවස නිවාස ණය" වැනි නිෂ්පාදන හරහා නේවාසික දේපළ ඉදිකිරීම, මිලදී ගැනීම සහ අලුත්වැඩියා කිරීම සඳහා දිගුකාලීන මූල්‍ය පහසුකම් සලසමින් නිවාස හිමිකාරිත්වය සඳහා බැංකුව අඛණ්ඩව සහාය විය. මෙම නිෂ්පාදන විශේෂයෙන්ම තරුණ වෘත්තිකයන් සහ මධ්‍යම ආදායම් ලබන්නන් ඉලක්ක කර ගනිමින් වසර 25ක් දක්වා දීර්ඝ කළ හැකි ආපසු ගෙවීමේ කාලසීමාවන් පිරිනමයි.

C-Suite විධායක ණය

මීට අමතරව, ජ්‍යෙෂ්ඨ ආයතනික වෘත්තිකයන් ඉලක්ක කර ගනිමින් බැංකුව "C-Suite Executive Loan" යෝජනා ක්‍රම හඳුන්වා දෙන ලදී. මෙම පහසුකම් මගින් සරල කරන ලද ඇපකර අවශ්‍යතා යටතේ ඉහළ ණය වටිනාකම් ලබා දෙන අතර, සේවා යෝජක හවුල්කාරිත්වයන් හරහා අමතර සේවා ප්‍රවර්ධන (Cross-selling) අවස්ථාවන් ද ලබා දෙයි.

විශේෂිත වෘත්තීය ණය යෝජනා ක්‍රම

විවිධ වෘත්තීය කණ්ඩායම්වල සුවිශේෂී මූල්‍ය අවශ්‍යතා හඳුනා ගනිමින් ගුරුවරුන්, රජයේ වෛද්‍ය නිලධාරීන්, අවිධාරිත හමුදා සාමාජිකයින් සහ අනෙකුත් වෘත්තීය අංශ සඳහා විශේෂිත වූ ණය යෝජනා ක්‍රම බැංකුව විසින් පිරිනමනු ලබයි. සහනදායී පොලී අනුපාත, දීර්ඝ කරන ලද ආපසු ගෙවීමේ කාලසීමාවන් සහ සරල කරන ලද ණය ක්‍රියාවලීන්ගෙන් සමන්විත මෙම යෝජනා ක්‍රම මගින්, පුද්ගලික ඇපකර මත පදනම්ව මූල්‍ය පහසුකම් ලබා ගැනීමට වෘත්තිකයන්ට අවස්ථාව සලසන අතරම ඔවුන්ගේ පුද්ගලික සහ වෘත්තීය දියුණුව සඳහා ද සහාය වේ.

විදේශගත ශ්‍රමික ණය සැකසුම් ඒකකය

විදේශගත වීමේ ක්‍රියාවලීන් විධිමත් කිරීම සඳහා අපි විශේෂිත ඒකකයක් ස්ථාපිත කළෙමු. එමගින් විදේශගත වීමට පෙර සම්පූර්ණ කළ යුතු විධිවිධානවල සිට විදේශගත වීමෙන් පසු අවශ්‍ය වන සහයෝගය දක්වා කටයුතු සම්බන්ධීකරණය කරන අතරම, ශ්‍රී ලංකාවේ සිටින ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ට මෙරටට ලැබෙන ප්‍රේෂණ විචක්ෂණශීලී ලෙස ආයෝජනය කිරීමට සහාය ලබා දෙයි.

පෞද්ගලික අංශයේ සහයෝගීතාව

වාහන මූල්‍ය අවශ්‍යතාවලට ප්‍රතිචාර දැක්වීමක් වශයෙන්, අපි ටොයෝටා ලංකා ආයතනය සමඟ ක්‍රමෝපායී හවුල්කාරිත්වයක් ඇති කර ගත්තෙමු. ඒ හරහා ටොයෝටා නිෂ්පාදන සඳහා මනාප පොලී අනුපාත යටතේ ණය ලබා දුන් අතර, එය සිල්ලර ණය ගැතියන් අතර බෙහෙවින් ජනප්‍රිය විය.

උකස් සේවා

රන් භාණ්ඩ ඇපයට තබා ලබා ගන්නා ණය පහසුකම්, "ස්වර්ණ ප්‍රදීප" උකස් අත්තිකාරම් යෝජනා ක්‍රමය යටතේ ප්‍රධාන පාරිභෝගික ණය මාර්ගයක් ලෙස අඛණ්ඩව ක්‍රියාත්මක වූ අතර, එමගින් හදිසි මූල්‍ය අවශ්‍යතා සපුරා ගැනීම සඳහා පාරිභෝගිකයින්ට වේගවත් හා විශ්වාසදායී අරමුදල් ප්‍රවේශයක් ලබා දෙන ලදී. තරගකාරී මිල ගණන්, ඉහළ පාරිභෝගික ඉල්ලුම සහ විධිමත් සැකසුම් ක්‍රියාවලිය හේතුවෙන් මෙම යෝජනා ක්‍රමය 2025 වසරේදී ශක්තිමත් ප්‍රගතියක් පවත්වා ගත් අතර, එය බැංකුවේ සමස්ත ණය කළඹ සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබා දුන්නේය. විශේෂයෙන්ම, ග්‍රාමීය මෙන්ම නාගරික අංශ දෙකෙහිම මෙම නිෂ්පාදනය සඳහා පුළුල් පිළිගැනීමක් වාර්තා විය.

පාරිභෝගික පහසුව සහ ගනුදෙනුවල ආරක්ෂාව ඉහළ නැංවීම සඳහා, බැංකුව විසින් සෘජුවම ගිණුමට මුදල් බැර කිරීමේ පහසුකම (Direct account credit facility) හඳුන්වා දුන් අතර, එමගින් බාධාවකින් තොරව අරමුදල් නිකුත් කිරීමට අවස්ථාව සැලසිණි. අවිධිමත් ණය ලබා ගැනීමේ ක්‍රමවේද වෙනුවට පාරිභෝගිකයින්ට ආරක්ෂිත, විධිමත් විකල්පයක් ලබා දීම හරහා මෙම පියවර මූල්‍ය අන්තර්කරණය ශක්තිමත් කළ අතර, එමගින් බැංකු පද්ධතිය තුළ විශ්වාසය සහ ප්‍රවේශය තවදුරටත් තහවුරු විය.

ව්‍යාජ භාණ්ඩ හඳුනා ගැනීම සඳහා ශාඛා සේවකයින් 1,000කට අධික සංඛ්‍යාවකගේ කුසලතා සහ දැනුම ඉහළ නැංවීමට බැංකුව සැලකිය යුතු ආයෝජනයක් සිදු කළේය. මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය සමඟ සහයෝගයෙන් ක්‍රියාත්මක කරන ලද මෙම පුහුණුව බෙහෙවින් ප්‍රයෝජනවත් වූ අතර, එමගින් නොදැනුවත්ව මෙවැනි ව්‍යාජ භාණ්ඩ භාර ගැනීම සැලකිය යුතු ලෙස අඩු කර ගැනීමට හැකි විය. තවද, මේවා හඳුනා ගැනීමට අවශ්‍ය උසස් තාක්ෂණික මෙවලම් ලබා දීම සඳහා ද අපි ආයෝජනය කළෙමු.

ඩිජිටල් පරිවර්තනය

අපගේ පාරිභෝගික බැංකු සේවාවන් පුරා ජංගම (Mobile) සහ අන්තර්ජාල බැංකුකරණය ඇතුළත් කිරීම මගින් අපි ඩිජිටල් පරිවර්තනය ඉදිරියට ගෙන ගිය අතර, එමගින් පහසුව සහ ප්‍රවේශය වැඩි දියුණු කළෙමු. තාක්ෂණය මත පදනම් වූ පාරිභෝගික අත්දැකීම් අපගේ සේවා විශිෂ්ටත්වය ඉහළ නැංවූ අතර, දුරස්ථ හා ග්‍රාමීය ප්‍රජාවන් කරා ළඟා වෙමින් මූල්‍ය අන්තර්කරණය සැලකිය යුතු ලෙස පුළුල් කළේය. මෙහි ප්‍රතිඵලයක් ලෙස, බැංකු සබඳතා නොමැති පුද්ගලයින්ට අවිධිමත් මූල්‍ය මාර්ගවලින් බැහැරව, සාම්ප්‍රදායික බැංකුකරණයට ප්‍රවේශ වීමටත් මූල්‍ය පද්ධතියට දායක වීමටත් අවස්ථාව ලැබිණි.

අභියෝග

අතිරික්ත ද්‍රවශීලතාව කළමනාකරණය කිරීම සහ තරගකාරී ස්ථාවර තැන්පතු පොලී අනුපාත සහ තිරසාර ණය ප්‍රතිලාභ අතර පවතින පරස්පරතාව (Trade-off) සමබරව පවත්වා ගැනීම, ශුද්ධ පොලී ආදායම් අනුපාතයන් කෙරෙහි බලපාන ප්‍රධාන අභියෝගයකි. අතිරික්ත ද්‍රවශීලතා තත්ත්වයකින් පැන නැගිය හැකි ඕනෑම අවදානමක් කළමනාකරණය කිරීම සහ අවම කිරීම සඳහා, අපි පෞද්ගලික අංශයට, විශේෂයෙන්ම බැංකු හා මූල්‍ය අංශ වෙත ණය ලබාදීම ඉතා උදෙග්ගිමත් ලෙස අඛණ්ඩව සිදු කරන්නෙමු.

භූ-දේශපාලනික වාතාවරණය තුළ පවතින අවිනිශ්චිතතාවන් හේතුවෙන් රජයේ සුරැකුම්පත් අනුපාතවල (Sovereign rates) අස්ථාවරත්වයක් ඇති වී තිබෙන අතර, ඒ නිසා ණය අවදානම් කළමනාකරණය සඳහා ශක්තිමත් ප්‍රවේශයක අවශ්‍යතාව මතු වී ඇත. බැංකුව මෙහිදී ගතානුගතික "ණය සහ වටිනාකම අතර අනුපාත" (LTV ratios) භාවිත කිරීම ඇතුළු විචක්ෂණශීලී අවදානම් පිළිවෙත් අනුගමනය කරයි.

භූ-දේශපාලනික වාතාවරණය තුළ පවතින අවිනිශ්චිතතාවන් හේතුවෙන් රජයේ සුරැකුම්පත් අනුපාතවල (Sovereign rates) අස්ථාවරත්වයක් ඇති වී තිබෙන අතර, ඒ නිසා ණය අවදානම් කළමනාකරණය සඳහා ශක්තිමත් ප්‍රවේශයක අවශ්‍යතාව මතු වී ඇත. බැංකුව මෙහිදී ගතානුගතික "ණය සහ වටිනාකම අතර අනුපාත" (LTV ratios) භාවිත කිරීම ඇතුළු විචක්ෂණශීලී අවදානම් පිළිවෙත් අනුගමනය කරයි.

ප්‍රධාන ධාරාවේ බැංකු කටයුතු සමඟ තරග කරන නිෂ්පාදනවලින් වෙළඳපොළ අද වන විට පිරී පවතී. කොටස් වෙළඳපොළ ආයෝජන, ව්‍යුත්පන්න මෙවලම් (Derivative instruments), රක්ෂණ සහ රත්තරන් වැනි අංශයන්හි ආයෝජනය කිරීම සඳහා තැන්පතු මුදල් ඉල්ලා අස්කර ගැනීම මෙහිදී දක්නට ලැබෙන ප්‍රවණතාවයකි.

ණය ලබාදීම සඳහා පවතින මෙහෙයුම් පරිසරය තවදුරටත් සංකීර්ණ හා අභියෝගාත්මකව පවතී. ශුද්ධ පොලී ආදායම් ආන්තිකයන් සුරක්ෂිත කර ගැනීම සඳහා සුපරීක්ෂාකාරී ද්‍රවශීලතා කළමනාකරණය සහ තිරසාර ණය ප්‍රතිලාභවලට සාපේක්ෂව තැන්පතු මිල නියම කිරීමේ ක්‍රමෝපායී ක්‍රමාංකනයක් සිදු කිරීම ප්‍රමුඛතාවයකි. භූ-දේශපාලනික ආතතීන් සහ රජයේ සුරැකුම්පත් වෙළඳපොළ අස්ථාවරත්වය මගින් ඉහළ ණය අවදානම් පාලනයක (Credit risk governance) අවශ්‍යතාව අවධාරණය කරයි. බැංකුව තුළ, ගතානුගතික "ණය සහ වටිනාකම අතර අනුපාත" (LTV) පරාමිතීන් සහ ක්‍රමවත් ආතති පරීක්ෂණ මගින් අහිතකර තත්ත්වයන් යටතේ වුවද ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කරයි. "ඩිට්වා" (Ditwah) සුළි කුණාටුවෙන් පීඩාවට පත් ප්‍රදේශවල පදිංචි ණය ගැතියන් 300,000ක් පමණ වෙනුවෙන් අපි සහන පියවර සහ සහන කාලසීමාවන් ලබා දුන්නෙමු.

2026 සඳහා ඉදිරි දැක්ම

දේශීය ඉතිරි කිරීම් බලමුලු ගැන්වීමෙහිලා පුද්ගලික බැංකු තැන්පතු කළඹ තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරන අතර, එමගින් ජාතික ආර්ථික සංවර්ධනයට දායක වන ණය ලබාදීමේ කටයුතු සඳහා සහයෝගය ලැබේ. මෙම අරමුදල් ආර්ථිකයේ නිෂ්පාදන අංශ වෙත යොමු කිරීම මගින්, ශ්‍රී ලංකාවේ ව්‍යවසායකත්වය, රැකියා උත්පාදනය සහ තිරසාර ආර්ථික ප්‍රගතිය සඳහා බැංකුව අඛණ්ඩව දායකත්වය සපයයි.

පාරිභෝගිකයා කේන්ද්‍ර කරගත් බැංකුකරණය, මූල්‍ය අන්තර්කරණය සහ තාක්ෂණික නවෝත්පාදනයන් කෙරෙහි දක්වන දැඩි කැපවීම තුළින්, මහජන බැංකුව පාරිභෝගිකයින්ට සහ පුළුල් ආර්ථිකයට තිරසාර වටිනාකමක් ලබා දෙන අතරම, මෙරට වඩාත්ම විශ්වාසදායී මූල්‍ය ආයතනයක් ලෙස සිය ස්ථානය තවදුරටත් ශක්තිමත් කර ගනී.

සාර්ව ආර්ථික විද්‍යා (Macroeconomic) ස්ථාවරත්වය සහ ව්‍යාපාරික විශ්වාසය වර්ධනය වීමත් සමඟ ණය ඉල්ලුම ක්‍රමයෙන් ඉහළ යනු ඇතැයි අපි අපේක්ෂා කරන අතර, සිල්ලර ණය ව්‍යාප්තිය සඳහා වූ ක්‍රමානුකූල වර්ධනඋපායමාර්ගයක් මගින් එම අවශ්‍යතා සපුරාලීමට කටයුතු කරන්නෙමු. අඛණ්ඩව ණය කළඹ නිරීක්ෂණය කිරීම, විවිධාංගීකරණය වූ ණය ලබාදීම සහ පූර්ව ක්‍රියාකාරී අවදානම් අවම කිරීමේ පියවර හරහා වත්කම්වල ගුණාත්මකභාවය ආරක්ෂා කරමින්, වගකීම් සහගත ලෙස ණය ලබාදීම සහතික කිරීමට අපි පියවර ගන්නෙමු.

වාණිජ ණය

වර්ධනය වෙමින් පවතින ණය ඉල්ලුම සපුරාලීම සඳහා සහ නම්‍යශීලී කොන්දේසි යටතේ සකස් කරන ලද ණය විසඳුම් මගින් වාණිජ ගනුදෙනු සඳහා මූල්‍ය පහසුකම් සැලසීම වෙනුවෙන්, වාණිජ ණය දෙපාර්තමේන්තුවක් පිහිටුවීමට 2025 වසරේදී ප්‍රතිපත්තිමය තීරණයක් ගන්නා ලදී.

අපගේ අවධානය

දිවයින පුරා විහිදුණු ශාඛා ජාලය හරහා ව්‍යාපාරික වර්ධනය සඳහා පහසුකම් සැලසීම අපගේ මූලික අරමුණයි. වත්කම්වල ගුණාත්මකභාවය තිරසාර ලෙස ආරක්ෂා කර ගැනීම සඳහා ණය අවදානම් කළමනාකරණය කරන අතරතුර, ව්‍යාපාරවල මෙහෙයුම් ප්‍රාග්ධන අවශ්‍යතා (Working capital requirements) සහ ව්‍යාපෘති හා වෙළඳ මූල්‍යකරණය ඇතුළු දිගුකාලීන ආයෝජන සඳහා වන ව්‍යාපාරික ණය යෝජනා අපි ඇගයීමට ලක් කර අනුමත කරන්නෙමු. බැංකු ඇපකර සහ වෙළඳ මූල්‍යකරණය ඇතුළුව අප පිරිනමන විවිධ පහසුකම්, අපනයන සහ ආනයන ක්ෂේත්‍රවල වර්ධනයට ප්‍රබල උත්තේජනයක් සපයන අතර, එමගින් ආර්ථික පුනර්ජීවනය සඳහා දායක වේ.

අපගේ උපායමාර්ගය

රුපියල් බිලියන 1 ඉක්මවන වාර්ෂික පිරිවැටුමක් සහිත පාරිභෝගිකයින්ට හෝ වෙළඳ මූල්‍ය කටයුතු, වෙළඳ ව්‍යාපාර සහ ඉදිකිරීම් ව්‍යාපෘතිවල නිරතව සිටින පාරිභෝගිකයින්ට වාණිජ ණය යටතේ පහසුකම් ලබා ගැනීමට සුදුසුකම් ඇත. පාරිභෝගිකයින්ට අපගේ වෙබ් ද්වාරය (Web portal) හරහා මාර්ගගතව හෝ ළඟම ඇති ශාඛාව වෙත පැමිණ අයදුම්පත් ඉදිරිපත් කළ හැකිය. මීට අමතරව, 2024 වසරේදී දිවයින පුරා ප්‍රාදේශීය මට්ටමින් ස්ථාපිත කරන ලද අපනයන අංශයට විශේෂිත වූ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය මධ්‍යස්ථාන (Export Hubs) පහ මගින්, අපනයනය ඉලක්ක කරගත් කර්මාන්ත සඳහා අප පිරිනමන මූල්‍ය සහ මූල්‍ය නොවන සේවාවන් සපුරා ගැනීමට පහසුකම් සලසා දී ඇත. එම මධ්‍යස්ථානවල සාර්ථකත්වය මත පදනම්ව, කොළඹ නගර සීමාව තුළ පවතින ආනයන වෙළඳ ව්‍යාපාරවලින් සැලකිය යුතු කොටසක් අත්පත් කර ගැනීම සඳහා 2026 වසර අවසානයට පෙර ප්‍රමුඛ ස්ථානයන්හි නව වෙළඳ මධ්‍යස්ථාන (Trade Hubs) පිහිටුවීමට අපි සැලසුම් කර ඇත්තෙමු.




වාණිජ ණය සඳහා වූ ජයග්‍රාහී උපායමාර්ගය

- ප්‍රාදේශීය ණය චීකක සහ අපනයන මෙහෙයුම් සාර්ථකව ක්‍රියාත්මක කිරීම
- යෝජිත පිටකොටුව ආනයන මධ්‍යස්ථානය
- ව්‍යාපාරික පාරිභෝගිකයන් සඳහා වන පුද්ගලික ණය
- බැංකු සහ මූල්‍ය අංශයේ පාරිභෝගිකයන්
- පෞද්ගලික අංශයට ණය ලබාදීම ඉහළ නැංවීම
- ණයවර ලිපි සහ බැංකු ඇපකර

ව්‍යාපාරික මූල්‍ය පහසුකම්වලට අමතරව, ව්‍යාපාරික පාරිභෝගිකයින්ගේ පුද්ගලික මූල්‍ය අවශ්‍යතා සපුරා ගැනීම සඳහා ඔවුන් වෙත පුද්ගලික ණය පහසුකම් ද පිරිනමන ලදී.

2025 වසර තුළදී, අපගේ ණය කළඹ උපායමාර්ගික ලෙස යළි සමබර කිරීම හරහා රුපියල් බිලියන 50 ඉක්මවූ සැලකිය යුතු වර්ධනයක් අත්පත් කර ගැනීමට අපට හැකි විය. එහිදී බැංකුවේ සමස්ත ණය කළඹ තුළ පවතින ඒකරාශී වීමේ අවදානම (Concentration risk) අවම කිරීම සඳහා රජය සතු ව්‍යවසායයන් වෙත පවතින නිරාවරණය අඩු කළ අතර, යහපත් ද්‍රවශීලතා අවශ්‍යතා සහිත ලාභදායී මූල්‍ය සමාගම් වෙත වැඩි අවධානයක් යොමු කරන ලදී. රටේ ආර්ථික පුනර්ජීවනය සහ ස්ථාවරත්වය මෙන්ම, අපනයනය කේන්ද්‍ර කරගත් ආර්ථිකයක් සඳහා රජයෙන් ලැබෙන සහයෝගය ද කාර්මික අංශය වෙත ණය ලබා දීමේ අවස්ථා විවෘත කළ අතර, එමගින් අපගේ කර්මාන්ත පාදක ණය කළඹ තිරසාරව පවත්වා ගැනීමට හැකි විය.

2025 වර්ෂය තුළ ක්ෂේත්‍රය අනුව ලබාදුන් ණය



ක්ෂේත්‍රය	2025 වර්ෂය තුළ ප්‍රදානය කරන ලද මුළු ණය ප්‍රමාණය (රුපියල් මිලියන)	%
කෘෂිකර්මය	9,977.9	4
සේවාවන්	9,012.2	4
කර්මාන්ත	143,211.2	60
වෙනත්	74,897.5	32
එකතුව	237,098.8	100

සෘජු ණය පහසුකම්වලට අමතරව, අපගේ වටිනා ගනුදෙනුකරුවන් වෙත බැංකු ඇපකර සහ ණයවර ලිපි මගින් රුපියල් බිලියන 28.6ක පමණ අරමුදල් නොවන පහසුකම් (non-funded facilities) සපයන ලදී. මහාමාර්ග සංවර්ධන කටයුතු සහ “දිට්වා” (Ditwah) සුළි කුණාටුවෙන් පසු සිදුකෙරෙන යටිතල පහසුකම් ව්‍යාපෘති මගින් ව්‍යාපාරික අවස්ථාවන් තවදුරටත් උත්තේජනය වනු ඇති බවත්, එමගින් අරමුදල් නොවන පහසුකම් කළඹ තවදුරටත් වර්ධනය වනු ඇති බවත් අපේක්ෂා කෙරේ.

ණය ඇගයීම

සේවා කාර්යක්ෂමතාව සඳහා අවම කාලයකින් කාර්යය නිම කිරීම සහතික කරමින්, අපගේ ණය ඇගයීමේ ක්‍රියාවලීන් කෙරෙහි වගවීම පවත්වා ගන්නා අතරම, බැංකුවේ ණය ප්‍රතිපත්ති මාර්ගෝපදේශ සහ නියාමන උපදෙස්වලට අපි දැඩි ලෙස අනුකූල වන්නෙමු. මෙම ප්‍රමිතීන් පිළිපැදීම අප විසින් නිරන්තරයෙන් අධීක්ෂණය කරනු ලබයි.

පූර්ව තීරණය කරන ලද ක්ෂේත්‍ර නිරාවරණ සීමාවන්ට අනුකූල වෙමින්, අපි ඒකරාශී වීමේ අවදානම (concentration risk) කෙරෙහි අවධානය යොමු කළෙමු. පරිසර, සමාජ සහ පාලන (ESG) පරීක්ෂාව බැංකුවේ ණය ප්‍රතිපත්තිය තුළ අන්තර්ගත කර ඇති අතර, එක් එක් පහසුකමෙහි ණය ඇගයීම ESG රාමුවට අනුකූලතාවය මත මනිනු ලැබේ. ESG අනුකූලතාව බැංකුවට ප්‍රමුඛතාවයක් වන අතර, එහිදී නිෂ්පාදන ගුණාත්මකභාවය, නිෂ්පාදන ආරක්ෂාව, ණය ගැනුම්කරුගේ ක්‍රියාවලීන් සහ ණය ගැනුම්කරුගේ ව්‍යාපාරික කටයුතු සම්බන්ධයෙන් සමාජ ප්‍රතිරෝධයක් නොමැති වීම කෙරෙහි අපි අවධානය යොමු කළෙමු.

ඩිජිටල් ණය පහසුකම්

අපගේ අතිනවීන ඩිජිටල් හැකියාවන්ගෙන් ප්‍රයෝජන ගනිමින්, ආයතනික ණය සම්භව පද්ධතිය (CLOS) හරහා ණය සැකසීම සිදු වූ අතර, පහසුකම්වලින් දළ වශයෙන් 60%–70%ක් පමණ ඩිජිටල් ලෙස සකස් කරන ලදී. තෝරාගත් පහසුකම් සමූහයක් සඳහා දැනට පවතින අත්පොත ක්‍රමය (manual system) යාවත්කාලීන කිරීමටත්, කෘතිම බුද්ධිය (AI) මත පදනම් වූ CLOS පද්ධතියක් සඳහා පවතින අවස්ථා ගවේෂණය කිරීමටත් සැලසුම් සකස් කරමින් පවතී.

අවදානම් සහ අවස්ථා

පොලී අනුපාත සහ විනිමය අනුපාතවල උච්චාවචනය වීම් ලාභදායීතාවයට ඇති ලොකුම අවදානම වේ. "දිට්වා" (Ditwah) සුළි කුණාටුව ජාතික බේදවාචකයක් වුව ද, එහි ප්‍රතිඵලයක් ලෙස නැවත ගොඩනැඟීමේ සහ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ඉදිකිරීම් ක්ෂේත්‍රයට ලබාදෙන ණය පහසුකම් සැලකිය යුතු ලෙස ඉහළ යා හැකිය.

2026 සඳහා ඉදිරි දැක්ම

අපගේ ප්‍රමුඛතාවයන් ආර්ථික ප්‍රකෘතිමත් වීම සහ සංවර්ධනය සඳහා වූ ජාතික ප්‍රමුඛතාවයන් සමඟ සමීපව බැඳී පවතින බැවින්, ශක්තිමත් ණය ඇගයීම් සහ අවදානම් කළමනාකරණ ක්‍රියාවලීන්ට දැඩි ලෙස අනුගත වෙමින්, කාරක ප්‍රාග්ධන ණය ලබාදීම, වෙළඳ මූල්‍යකරණය සහ ආයතනික බැංකු විසඳුම් ශක්තිමත් කිරීම සඳහා අපි කටයුතු කරන්නෙමු. එමෙන්ම, තෝරාගත් පහසුකම් සමූහයක් සඳහා ණය මුදා හැරීමේ ක්‍රියාවලිය ඩිජිටල්කරණය කිරීමේ ක්‍රමවේදයන් ද අපි සොයා බලන්නෙමු.

විශේෂිත කරුණු

දේශීය මුදල් ණය කළඹ

රුපියල් බිලියන 167.3

විදේශ මුදල් ණය කළඹ

ඇමරිකානු ඩොලර් මිලියන 28.3

මුළු අක්‍රිය ණය

රුපියල් බිලියන 8.4

අක්‍රිය ණය අනුපාතය

4.55%

නිකුත් කරන ලද බැංකු ඇපකර

රුපියල් බිලියන 20.8

ශාඛා ජාලය හරහා සිදුකළ ණයවර ලිපි නිකුත් කිරීම්

රුපියල් බිලියන 88.5

බැංකුවේ සමස්ත කළඹෙන් 38% ක ප්‍රතිශතයකි)

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය සහ ක්ෂුද්‍ර මූල්‍ය

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය (SMEs) සහ ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාරවල සංවර්ධනය සඳහා සහය වීම වසර තුළ බැංකුවේ උපායමාර්ගික ප්‍රමුඛතාවයක් ලෙස පැවතුණි. රජයේ ජාතික සංවර්ධන න්‍යාය පත්‍රයට අනුකූලව, දිවයින පුරා සිටින ව්‍යවසායකයින් සඳහා මූල්‍ය පහසුකම් ලබා ගැනීමට ඇති අවස්ථා පුළුල් කරමින්, බැංකුව සිය ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය (MSME) කළඹ තවදුරටත් ව්‍යාප්ත කරන ලදී. දැනට සිටින ගනුදෙනුකරුවන් සමඟ සබඳතා ශක්තිමත් කර ගැනීම සහ නව ව්‍යාපාර ක්‍රියාකාරීව සම්බන්ධ කර ගැනීම මගින් මූල්‍ය ඇතුළත් කිරීම් (financial inclusion) ඉහළ නැංවීමටත්, ප්‍රාදේශීය ආර්ථික ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීමටත්, නැගී එන ව්‍යවසායයන්ගේ වර්ධනයට සහය වීමටත් බැංකුව දායක විය.

අපගේ අවධානය

ආර්ථික ප්‍රකෘතිමත් වීම සහ රැකියා උත්පාදනය කිරීමෙහිලා ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් (MSMEs) ඉටුකරන තීරණාත්මක කාර්යභාරය හඳුනාගනිමින්, ඉලක්කගත ණය ලබාදීම සහ උපදේශන සහය හරහා මෙම අංශය ශක්තිමත් කිරීම කෙරෙහි බැංකුව අවධානය යොමු කළේය. එහිදී, ශක්තිමත් වර්ධන විභවයක් සහිත ව්‍යාපාර හඳුනාගැනීම සඳහා විශේෂ අවධාරණයක් ලබාදුන් අතර, නැගී එන ව්‍යවසායයන් වඩා විශාල වාණිජ හා ආයතනික අංශ දක්වා සංක්‍රමණය කරවීම සඳහා ඒවා පෝෂණය කිරීමට ද කටයුතු කරන ලදී.

ව්‍යවසායකයින් සහ ව්‍යාපාර සමඟ ක්‍රියාකාරීව සම්බන්ධ වීම තුළින්, බැංකුව සිය MSME ගනුදෙනුකාර පදනම සාර්ථකව පුළුල් කරගත් අතර, ගනුදෙනුකරුවන් සංඛ්‍යාව සහ ව්‍යාපාරික පිරිවැටුම යන අංශ දෙකෙන්ම 2025 වසරේදී මෙම අංශය තුළ වාර්තාගත ඉහළම වර්ධනය අත්පත් කර ගැනීමට සමත් විය.

මීට අමතරව, දිවයින පුරා සහනදායී මූල්‍ය වැඩසටහන් සහ ඇපකර මත පදනම් වූ ණය ක්‍රම ක්‍රියාත්මක කිරීම මගින් ජාතික සංවර්ධන මුලපිරීම් සඳහා සහය වීමට ද බැංකුව අඛණ්ඩව කටයුතු කළේය.

අපගේ උපායමාර්ගය

රජයට අයත් ආයතනයක් ලෙස, ආර්ථික ප්‍රකෘතිමත් වීම සඳහා වූ ජාතික ප්‍රමුඛතාවයන් සමඟ අපගේ උපායමාර්ගය අනුගත කරමින් තෙවැදෑරුම් ප්‍රවේශයක් (three-pronged approach) අනුගමනය කළෙමු.



සුදුසුකම් ලත් ගනුදෙනුකරුවන් සංඛ්‍යාව සහ ව්‍යාපාරික පිරිවැටුම ඉහළ නැංවීම සඳහා ගනුදෙනුකාර පදනම පුළුල් කිරීම.

ගුණාත්මක වෙළඳපල පර්යේෂණ සහ ප්‍රමාණාත්මක බැංකු දත්ත විශ්ලේෂණයන් සිදු කිරීම මගින්, විභව ගනුදෙනුකරුවන් සහ බැංකු සේවා නොලබන පුද්ගලයින් (unbanked) වෙත ගොස් ඔවුන් බැංකුව සමඟ සම්බන්ධ කර ගැනීම.

ගනුදෙනුකාර සබඳතා කළමනාකරුවන් (Customer Relationship Managers) ලෙස කටයුතු කිරීම සඳහා සහ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය (MSME) නිෂ්පාදන පෙළ ක්‍රියාකාරීව ප්‍රවර්ධනය කිරීම සඳහා ශාඛා කළමනාකරුවන් පුහුණු කිරීම සහ ඔවුන්ගේ කුසලතා වර්ධනය කිරීම.

ප්‍රවේශය

බැංකුව සිය ගනුදෙනුකාර පදනම සහ ව්‍යාපාරික පිරිවැටුම යන අංශ දෙකම පුළුල් කර ගැනීම සඳහා ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය (MSME) අංශය වෙත ප්‍රවේශ විය. මෙය සාක්ෂාත් කර ගැනීම සඳහා, ගනුදෙනුකරුවන් සමඟ ක්‍රියාකාරිව සම්බන්ධ වීමට ශාඛා කළමනාකරුවන්ගේ ආකල්පමය වෙනසක් ඇති කිරීම අවශ්‍ය විය. මෙයට හේතුව වූයේ, මූල්‍යමය හැකියාව තිබියදීත් ඇතැම් විභව ගනුදෙනුකාර කොටස් බැංකුව වෙත පැමිණීමට මැලිකමක් දැක්වීමයි. එවැනි අවස්ථාවලදී, බැංකු පද්ධතිය සහ එහි ඇති බොහෝ ප්‍රතිලාභ පිළිබඳව ඔවුන් දැනුවත් කිරීම අවශ්‍ය වූ අතර, එය ඔවුන්ගේ MSME ව්‍යාපාරික උත්සාහයන් සඳහා සහයක් විය. මෙම උපායමාර්ගය හරහා, විභව ගනුදෙනුකරුවන් ක්ෂුද්‍ර මට්ටමේ සිට සුළු හා මධ්‍ය පරිමාණ, ආයතනික සහ වාණිජ යන ඉහළ මට්ටම් කරා ඔසවා තැබීමට අපට හැකි විය.

දිවයින පුරා ප්‍රාදේශීය වර්ධනය ප්‍රවර්ධනය කිරීමේ අපගේ ප්‍රයත්නයේ කොටසක් ලෙස, ජාතික ණය සුරැකුම් ආයතනය (National Credit Guarantee Institution Limited) මඟින් ලබාදෙන සහයෝගය ඇතිව, රජයේ සහනදායී සහ ප්‍රතිමූල්‍ය ණය ලබා දීම සඳහා මෙම ව්‍යාප්ත වූ ගනුදෙනුකාර පදනම අපි යොදා ගත්තෙමු. මෙම මූලපිරීම් මඟින් ප්‍රාදේශීය මධ්‍යස්ථාන සහ ප්‍රාදේශීය ධාරිතාවන් ශක්තිමත් විය.

වසර අවසානයේදී, ගනුදෙනුකරුවන් සංඛ්‍යාව සහ ව්‍යාපාර ප්‍රමාණය යන අංශ දෙකෙන්ම බැංකුව වාර්තා කළ ඉහළම වර්ධනය මෙම කළඹ මඟින් අත්පත් කරගත් අතර, එය මෙම උපායමාර්ගයේ සාර්ථකත්වය මැනවින් පෙන්නුම් කරයි.

ජාතික ප්‍රමුඛතාවයන් සමඟ අනුගත වීම

ජාතික ආර්ථික සංවර්ධනය සඳහා තීරණාත්මක වන ප්‍රධාන ක්ෂේත්‍ර වෙත මූල්‍ය සහය ලබා දීමට බැංකුව ප්‍රමුඛතාවය ලබා දුන්නේය. එම ක්ෂේත්‍ර අතරට පහත ඒවා ඇතුළත් විය:

- කෘෂිකර්මාන්තය සහ කෘෂි ව්‍යාපාර
- නිෂ්පාදනය, අගය වැඩි කරන නිෂ්පාදන ඇතුළුව
- පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති
- වෙළඳ සහ සේවා අංශය
- සංචාරක සහ ඒ ආශ්‍රිත කර්මාන්ත

මෙහි ප්‍රතිලාභීන්ගෙන් සැලකිය යුතු පිරිසක් අලුතින් ආරම්භ කළ ව්‍යාපාර (start-ups), තරුණ ව්‍යවසායකයින්, ක්ෂුද්‍ර ව්‍යවසායන් සහ කාන්තාවන් විසින් මෙහෙයවනු ලබන ව්‍යාපාර වූ අතර, එමඟින් ඇතුළත් කරගත් ආර්ථික සංවර්ධනයක් (inclusive economic development) සඳහා බැංකුවේ ඇති කැපවීම මැනවින් විදහා දක්වයි.

කාන්තා ව්‍යවසායකයින්ගේ ව්‍යාපාරික හැකියාවන් ශක්තිමත් කිරීම අරමුණු කරගත් විශේෂිත ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රම සහ මූල්‍ය සාක්ෂරතා වැඩසටහන් හරහා ඔවුන්ට තවදුරටත් සහය ලබා දෙන ලදී.



විශේෂිත කරුණු

ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ගනුදෙනුකාර පදනමේ වර්ධනය

15.2%

ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ව්‍යාපාරික පිරිවැටුමේ වර්ධනය

රුපියල් බිලියන 20.8

ප්‍රදානය කරන ලද හරිත බලශක්ති ණය මුදල

රුපියල් බිලියන 6.9

"මහජන බලය" ණය යෝජනා ක්‍රමය ආරම්භ කර වසරක් ඇතුළත ලබාගත් සැලකිය යුතු වර්ධනය

74.6%

තිරසර ව්‍යාපෘති

තිරසර මූල්‍යකරණය සඳහා බැංකුවේ ඇති කැපවීමට අනුකූලව, පරිසර හිතකාමී ආයෝජනයන් සඳහා සහය වීම පිණිස "මහජන බැංකු හරිත බලශක්ති (Green Power) ණය යෝජනා ක්‍රමය" හඳුන්වා දෙන ලදී. මෙම නිෂ්පාදනය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද "ශ්‍රී ලංකා හරිත මූල්‍ය වර්ගීකරණයට" (Sri Lanka Green Finance Taxonomy) පූර්ණ ලෙස අනුකූල වන පරිදි සකස් කර ඇති අතර, එය නියාමකයාගේ සමාලෝචනයට ද ලක් විය.

මෙම වැඩසටහන බැංකු ක්ෂේත්‍රය තුළ හඳුන්වා දුන් ප්‍රථම ව්‍යුහගත හරිත මූල්‍ය නිෂ්පාදනවලින් එකක් ලෙස සැලකේ.

තිරසර මූල්‍ය රාමුව යටතේ ණය ඇගයීම සහ ණය මුදා හැරීම අධීක්ෂණය කිරීම සඳහා ප්‍රාදේශීය මට්ටමින් කැප වූ විශේෂ කාර්ය මණ්ඩලයක් පිහිටුවන ලදී. ඒ යටතේ භූමියේ ස්ථාපිත කරන ලද සහ වහල මත ස්ථාපිත කරන ලද සූර්ය බලශක්ති ව්‍යාපෘති කිහිපයකට මූල්‍ය පහසුකම් ලබා දුන් අතර, කුඩා පරිමාණ ජල විදුලි ව්‍යාපෘති සහ අනෙකුත් තිරසර ව්‍යාපෘති ඉදිරියේදී ක්‍රියාත්මක කිරීම සඳහා දැනට ඇගයීමට ලක් කරමින් පවතී.

ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය (MSME) නිෂ්පාදන කළඹ

ව්‍යාපාරික ජීවන චක්‍රයේ විවිධ අවධීන්හි පසුවන MSME ව්‍යවසායන් සඳහා සහය වීමට සැලසුම් කරන ලද පුළුල් මූල්‍ය විසඳුම් පෙළක් බැංකුව විසින් ලබා දෙනු ලබයි. ඒවාට පහත දෑ ඇතුළත් වේ:

- කාරක ප්‍රාග්ධන මූල්‍යකරණය
- කාලීන ණය පහසුකම්
- වත්කම් මූල්‍යකරණ විසඳුම්
- විශේෂිත අවශ්‍යතා සඳහා සකස් කළ ක්ෂුද්‍ර මූල්‍ය නිෂ්පාදන

නම්‍යශීලී මූල්‍ය ව්‍යුහයන්, විධිමත් කළ ණය අනුමත කිරීමේ ක්‍රියාවලීන් සහ තරඟකාරී කාලසීමාවන් (turnaround times) මගින් මෙම පහසුකම් තවදුරටත් ශක්තිමත් කර ඇත.

ඩිජිටල් බැංකු වේදිකාවන් හරහා ණය සේවා සහ ආපසු ගෙවීමේ ක්‍රමවේදයන් වෙත බාධාවකින් තොරව ප්‍රවේශ වීමට ඉඩ සැලසීමෙන් ගනුදෙනුකරුවන්ගේ පහසුව තවදුරටත් ඉහළ නංවයි.

මූල්‍ය සේවාවන්ට අමතරව, මූල්‍ය ඇතුළත් කිරීම් (financial inclusion) ශක්තිමත් කිරීමේ සහ බැංකු සේවා නොලබන ව්‍යවසායකයින් විධිමත් බැංකු පද්ධතියට ඒකාබද්ධ කිරීමේ අරමුණින් බැංකුව විසින් උපදේශන සහ මූල්‍ය සාක්ෂරතා වැඩසටහන් ද පවත්වනු ලබයි.

කාන්තා සවිබල ගැන්වීම

කාන්තා ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කිරීම බැංකුවේ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය (MSME) සංවර්ධන න්‍යාය පත්‍රයේ ප්‍රධාන අංගයක් ලෙස පවතී. කාන්තා ව්‍යවසායකයින්ට ඔවුන්ගේ ව්‍යාපාර ආරම්භ කිරීමට සහ ව්‍යාප්ත කිරීමට සහය වීම සඳහා විශේෂිත ණය නිෂ්පාදන, ක්ෂුද්‍ර මූල්‍ය විසඳුම් සහ ඉතුරුම් යෝජනා ක්‍රම පිරිනමනු ලැබේ.

කාන්තාවන්ගේ මූල්‍ය ස්වාධීනත්වය ඉහළ නැංවීමට සහ ආර්ථික වර්ධනයට දායක වීමට ඔවුන්ට හැකි වන පරිදි මූල්‍ය සාක්ෂරතාවය, ව්‍යාපාර කළමනාකරණය සහ ව්‍යවසායකත්ව සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කළ පුහුණු වැඩසටහන් ද බැංකුව විසින් පවත්වනු ලබයි.

ආසියානු සංවර්ධන බැංකුව සමඟ සහයෝගයෙන්, කාන්තා ව්‍යවසායකයින් සඳහා ධාරිතා වර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ඩෙලොයිට් (Deloitte) ආයතනය මහජන බැංකුවට අඛණ්ඩව සහය ලබා දුන්නේය.

ක්ෂුද්‍ර මූල්‍ය

අඩු පහසුකම් සහිත ප්‍රජාවන් අතර මූල්‍ය ඇතුළත් කිරීම් ව්‍යාප්ත කිරීමේදී ක්ෂුද්‍ර මූල්‍ය අංශය අඛණ්ඩව වැදගත් කාර්යභාරයක් ඉටු කළේය. එහිදී බැංකුව "ග්‍රාමීය බැංකු ආකෘතියක්" (village banking model) අනුග මනය කළ අතර, එහිදී ගනුදෙනුකරුවන් කණ්ඩායම් වශයෙන් හඳුනාගෙන ඔවුන්ට සුදුසු මූල්‍ය විසඳුම් සමඟ මූල්‍ය උපදේශන සේවාවන් ද ලබා දෙන ලදී.

මෙම ප්‍රවේශය හරහා, පුද්ගලයන්ට සහ ක්ෂුද්‍ර ව්‍යවසායයන්ට විධිමත් මූල්‍ය පද්ධතිය තුළ බැංකු පහසුකම් ලැබිය හැකි ගනුදෙනුකරුවන් බවට පත්වීමට සහය ලබා දෙන ලදී.

කාන්තාවන් විසින් මෙහෙයවනු ලබන ව්‍යවසායයන් සඳහා "වනිතා සවිය" ණය යෝජනා ක්‍රමය යටතේ එක් ගනුදෙනුකරුවකුට රුපියල් මිලියන 25ක් දක්වා මූල්‍ය පහසුකම් ලබා ගැනීමට සුදුසුකම් ලැබූ අතර, එය කුඩා පරිමාණ ව්‍යාපාර ව්‍යාප්ත කිරීම සඳහා විශාල සහයෝගයක් විය.

People's Power ණය යෝජනා ක්‍රමය		ගොවීන් සඳහා වූ නව විස්තීර්ණ ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය		වී සහ බඩඉරිඟු අස්වනු නෙලීම සහ ගබඩා කිරීම සඳහා වූ ඇපකර ණය පහසුකම	
සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන (SMED) ණය යෝජනා ක්‍රමය	අලුතින් ආරම්භ කළ ව්‍යාපාර සඳහා වූ "People's Spark" ණය යෝජනා ක්‍රමය	"වනිතා සවිය" ණය යෝජනා ක්‍රමය	"Business Power" ණය යෝජනා ක්‍රමය	"අස්වැන්න" ණය යෝජනා ක්‍රමය	"හරිත සවිය" ණය යෝජනා ක්‍රමය

සංවර්ධන මූල්‍යකරණය

බැංකුවේ ග්‍රාමීය සංවර්ධන විධානයෙහි (mandate) කොටසක් ලෙස, ප්‍රධාන වශයෙන් කෘෂිකාර්මික අංශය කෙරෙහි අවධානය යොමු කරමින් සංවර්ධන ණය යෝජනා ක්‍රම මාලාවක් බැංකුව විසින් පිරිනමනු ලබයි.

කප්රුක ආයෝජන ණය යෝජනා ක්‍රමය	පොල් වගා කිරීමේ මණ්ඩලය (CCB) මහජන බැංකුව සමඟ ඒකාබද්ධව පිරිනමනු ලබන මෙම සහනදායී මූල්‍ය ආධාර යෝජනා ක්‍රමය මගින් පොල් ඉඩම් සංවර්ධනය සඳහා අවශ්‍ය ප්‍රාග්ධනය සපයනු ලබයි. මෙම යෝජනා ක්‍රමයේ මූලික පරමාර්ථය වන්නේ, ඉහළ ඵලදායීතාවයක් අත්පත් කර ගැනීම සඳහා ඒකාබද්ධ ගොවිපළ පද්ධතීන් දිරිමත් කරමින්, පොල් ඉඩම් සම්පූර්ණ ගොවිපළ ඒකක ලෙස සංවර්ධනය කිරීමට පහසුකම් සැලසීමයි.
"අස්වැන්න" ණය යෝජනා ක්‍රමය	මෙම යෝජනා ක්‍රමය මගින් ක්ෂුද්‍ර හා කුඩා පරිමාණ ගොවීන්, කෘෂිකාර්මික යෙදවුම් සපයන්නන්, කෘෂි සැකසුම්කරුවන් මෙන්ම කෘෂිකර්මාන්තයට අදාළ බොහෝ කර්මාන්ත සඳහා සේවය කරන කෘෂි නිෂ්පාදන එකතු කරන්නන් සහ අතරමැදියන් සඳහා මූල්‍ය පහසුකම් සපයනු ලැබේ.
වී ඇපකර (Paddy Pledge) ණය යෝජනා ක්‍රමය	වී මෝල් හිමියන්ට සහ වී එකතු කරන්නන්ට වී මිලදී ගැනීම සඳහා මෙම ණය යෝජනා ක්‍රමය හරහා සහය ලබා දෙන අතර, එමගින් වී මෝල් අඛණ්ඩව පවත්වාගෙන යාම සහ වෙළඳපොළට ස්ථාවර සැපයුමක් සහතික කෙරේ.
SEPI-II ණය යෝජනා ක්‍රමය (ස්වයං රැකියා ප්‍රවර්ධන වැඩසටහන – II අදියර)	රට තුළ තරුණ ව්‍යවසායකයින් බිහි කිරීමේ රජයේ දැක්මට සහය වෙමින්, වෘත්තීය පුහුණුව ලැබූ තරුණ තරුණියන්ට ස්වයං රැකියා ආරම්භ කිරීම සඳහා සහය වීමට මෙම ණය යෝජනා ක්‍රමය සැලසුම් කර ඇත.
නව විස්තීර්ණ ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය (NCRCS)	කෙටි කාලීන හෝග වගා කරන ක්ෂුද්‍ර පරිමාණ ගොවීන් සහ ඔවුන්ගේ තවාන්, ගෙවතු වගාවන් සහ ගබඩා මූල්‍යකරණය (warehouse financing) ඉලක්ක කර ගනිමින් මුදල් අමාත්‍යාංශය මගින් මෙම යෝජනා ක්‍රමය කළමනාකරණය කරනු ලබයි. එමගින් ඔවුන්ගේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරා ගැනීම සඳහා අඩු පිරිවැය මූල්‍ය පහසුකම් සපයනු ලැබේ.

ණය ඇගයීම සහ අවදානම් කළමනාකරණය

ණය ඇගයීම සඳහා වූ අපගේ ප්‍රවේශය අවදානම් ශ්‍රේණිගත කිරීම මත පදනම් වේ. ශාඛා මට්ටමින් පාර්ශ්වගික සබඳතා කළමනාකරුවන් විසින් ගුණාත්මක සහ ප්‍රමාණාත්මක දත්ත රැස් කිරීමෙන් අනතුරුව, සුදුසුකම් ලත් ගනුදෙනුකරුවන් සම්බන්ධ කර ගැනීම (onboard) සඳහා බැංකුව විසින් එම දත්ත ඇගයීමට ලක් කරනු ලබයි.

ප්‍රාදේශීය ණය ඒකක මගින් මූලික ඇගයීම් කටයුතු සිදු කරන ලද අතර, ගනුදෙනුකාර පදනම සහ ව්‍යාපාරික පිරිවැටුම පුළුල් කරමින් 2025 වසරේ බැංකුවේ සාර්ථකත්වයට එම ඒකක විශාල දායකත්වයක් ලබා දුන්නේය. අලුතින් නිකුත් කරන ලද ණය සඳහා වූ ණය සේවාකරණය (debt servicing) ඉතා ඉහළ මට්ටමක පැවති අතර, අකර්මණ්‍ය ණය (NPL) අනුපාතය 3.0% කට වඩා අඩු මට්ටමක පවත්වා ගැනීමට හැකි විය.

පුද්ගලික මට්ටමින් පවත්වාගෙන ගිය සබඳතා හරහා ගනුදෙනුකරුවන්ගේ ව්‍යාපාර සහ ඔවුන්ගේ සුවිශේෂී දිගුකාලීන මූල්‍ය අවශ්‍යතා අවබෝධ කර ගැනීමට හැකි වූ බැවින්, මෙම ප්‍රවේශය ක්ෂුද්‍ර මට්ටමේ ගනුදෙනුකරුවන් සුළු හා මධ්‍ය පරිමාණ (SME) සහ අනෙකුත් අංශ වෙත සංක්‍රමණය කරවීමට මනා පිටුවහලක් විය.

2026 සඳහා ඉදිරි දැක්ම

අනාගතය දෙස බලන කල, පහත සඳහන් ඉහළ විභවතාවන් සහිත අංශ කෙරෙහි අවධානය යොමු කරමින් සිය ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය (MSME) ණය කළඹ තවදුරටත් ශක්තිමත් කිරීමට බැංකුව අදහස් කරයි:

- සුහුරු කෘෂිකර්මාන්තය සහ කෘෂි ව්‍යාපාර
- නවක (Start-up) ව්‍යවසායන්
- තිරසර කර්මාන්ත
- සංචාරක අංශයේ සංවර්ධනය

මීට අමතරව, ශ්‍රී ලංකාව සතු ප්‍රබල තරඟකාරී වාසි සහිත කුළුබඩු නිෂ්පාදනය සහ අත්කම් නිර්මාණ වැනි කර්මාන්තවල නියුතු අපනයන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා ලබා දෙන සහයෝගයද බැංකුව විසින් පුළුල් කරනු ඇත.

තවද, නැගී එන ව්‍යවසායකයින්ට මගපෙන්වීම සඳහා මූල්‍ය සාක්ෂරතා වැඩසටහන් සහ උපදේශන සේවාවන් අඛණ්ඩව වැඩිදියුණු කිරීමට බැංකුව කටයුතු කරන අතර, එවා ක්‍රියාත්මක කිරීමේ සවිස්තරාත්මක සැලසුම් 2026 වසර තුළදී දියත් කිරීමට නියමිතය.

ආයතනික බැංකුකරණය

ආයතනික බැංකු අංශය (Corporate Banking Division) 2025 වසරේදී ද බැංකුවේ මුළු ණය පොතෙන් 1/3 කට වඩා වැඩි දායකත්වයක් අඛණ්ඩව පවත්වාගෙන ගිය අතර, එහිදී ගනුදෙනුකරුවන් වෙත ප්‍රවේශ වන ක්‍රමවේදයන් ප්‍රතිනිර්මාණය කිරීම සහ කාර්ය මණ්ඩලයේ කුසලතා වර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලදී.

අපගේ අවධානය

2025 වසරේදී, ආයතනික බැංකු අංශය (CBD) පෞද්ගලික අංශයේ ණය ලබාදීමේ අවස්ථාවන් සක්‍රීයව ගවේෂණය කිරීම මගින්, බැංකුවේ මුළු ණය පොතෙහි (loan book) තම අංශයේ දායකත්වය ඉහළ නංවා ගැනීම කෙරෙහි අවධානය යොමු කළේය.

අපගේ උපායමාර්ගය

පෞද්ගලික අංශය වෙත ව්‍යාප්ත වීම

නව ගනුදෙනුකරුවන් දිනා ගැනීම සහ පවතින ගනුදෙනුකරුවන් රඳවා ගැනීම මෙහිදී ප්‍රමුඛතාවක් ලෙස සලකන ලදී. මෙම ඉලක්කය සපුරා ගැනීම සඳහා, ආයතනික බැංකු අංශය විසින් කැප වූ පාරිභෝගික සබඳතා කළමනාකරුවන් (CRMs) සහ පාරිභෝගික සබඳතා නිලධාරීන් (CROs) පත් කිරීමේ සංකල්පය අඛණ්ඩව ක්‍රියාත්මක කළ අතර, විශේෂිත ඉලක්කයන් සපුරා ගැනීම සඳහා ඔවුන් වෙත විශේෂිත ගනුදෙනුකාර කළඹන් (customer portfolios) පවරන ලදී. එම අංශය සඳහා නියමිත ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPIs) 12ක් සමීපව නිරීක්ෂණය කරන අතරතුර, අපගේ සියලුම ඉලක්කයන් පාහේ සපුරා ගැනීමට ලැබුණු විශිෂ්ට සාර්ථකත්වයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ මෙම ප්‍රවේශය සහ පාරිභෝගික සබඳතා කළමනාකරුවන් හා නිලධාරීන් සඳහා ලබා දුන් විශේෂිත දේශීය හා විදේශීය පුහුණුවයි.

එක් එක් ගනුදෙනුකරුවාගේ ගැටලු තනි තනිව සලකා බලා සහන සැලසීම මගින් වත්කම්වල ගුණාත්මකභාවය (asset quality) ආරක්ෂා කර ගත් අතර, අවශ්‍යතා මත පදනම් වූ විසඳුම් ලබා දීම සඳහා මුහුණට මුහුණ හමුවීම් (one-to-one meetings) පවත්වන ලදී. මෙය නව ගනුදෙනුකරුවන් සම්බන්ධ කර ගැනීම (onboarding) ඉහළ නැංවීමට සහ ණය කළඹ ව්‍යාප්ත කිරීමට මනා සහයක් විය.

විශේෂිත කරුණු

මුළු ආයතනික ණය කළඹ **රුපියල් බිලියන 600**	බැංකුවේ මුළු ණය පොත සඳහා ලබා දුන් දායකත්වය **34%**	පෞද්ගලික අංශයේ ආයතනික ණය **රුපියල් බිලියන 286**
පෞද්ගලික අංශයේ ණය වර්ධනය **35%**	නව ආයතනික ගනුදෙනුකරුවන් සම්බන්ධ කර ගැනීමේ වර්ධනය **88**	

වැදගත් මාතෘකා සහ තේමාවන් පිළිබඳ සවිස්තරාත්මක විශ්ලේෂණයක් සඳහා කරුණාකර පිටු 80–85 බලන්න.

බැංකු සහ මූල්‍ය අංශ

ඉදිකිරීම් සහ නිෂ්පාදන අංශවල අපේක්ෂිත පිබිදීම මන්දගාමී වූ අතර, අපනයන සහ ඇඟලුම් කර්මාන්ත අංශවල වර්ධනයද අඩාල විය. මෝටර් රථ ආනයන තහනම ඉවත් කිරීමත් සමඟ ඇති වූ ඉහළ ණය ඉල්ලුම හේතුවෙන් මෙම අංශ කෙරෙහි දැඩි අවධානයකින් යුතුව කටයුතු කිරීමට අපට සිදු විය. කෙසේ වෙතත්, අනෙකුත් අංශවල ස්වභාවික වර්ධනයක් පවත්වා ගන්නා අතරතුර, නියමිත මාර්ගෝපදේශයන්ට යටත්ව කුලී පදනම මත මිලදී ගැනීම් සහ කල්බදු ව්‍යාපාරවල සැලකිය යුතු දියුණුවක් පෙන්නුම් කළ මූල්‍ය අංශය වෙත අපගේ අවධානය යොමු කළෙමු. බැංකුව සතු අතිරික්ත ද්‍රවශීලතාවය මෙම අංශයට ප්‍රබල ලෙස අරමුදල් සැපයීමට අවස්ථාව ලබා දුන් අතර, එය ණය පොතේ සැලකිය යුතු වර්ධනයකට මග පාදනු ලැබීය.

ශක්තිමත් අවදානම් ඇගයීම සහ අධීක්ෂණය


අකර්මන්‍ය ණය (NPL) කළඹ පාලනය කිරීම සඳහා, ආයතනික බැංකු අංශය (CBD) විසින් දැඩි අවදානම් ඇගයීම් සහ කළමනාකරණ ක්‍රියාවලියක් අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. වසර තුළ අකර්මන්‍ය ණය කළඹ 3% කින් අඩු කර ගැනීමට සහ වත්කම්වල ගුණාත්මකභාවය යහපත් මට්ටමක පවත්වා ගැනීමට එම අංශය සමත් විය. මූල්‍ය අපහසුතා අත්විඳින ගනුදෙනුකරුවන්ට සහය වීම සඳහා, ඔවුන් මුහුණ දෙන ගැටලු විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව තනි තනිව සලකා බලා සහන සැලසීමට කටයුතු කරන ලදී.

බලගැන්වූ කණ්ඩායමක්

පෞද්ගලික අංශය, පෞද්ගලික බැංකු සහ මූල්‍ය ආයතන සමඟ ගනුදෙනු කිරීම සඳහා මනා නිපුණතාවයකින් යුත් තරුණ කණ්ඩායමක් යොමු කරන ලදී. බැංකුවේ ණය කළඹ ව්‍යාප්ත කිරීම සඳහා මෙම කණ්ඩායම ඉහළ මට්ටමේ අවශ්‍යතා සහිත ගනුදෙනුකරුවන් වෙත ප්‍රවේශ විය. විශේෂඥයින්ගේ මගපෙන්වීම යටතේ ලබා දුන් උසස් දේශීය හා ජාත්‍යන්තර පුහුණුව මගින්, අනාගතයට ගැළපෙන ආයතනික බැංකු අංශයේ කණ්ඩායමක් ගොඩනැගීමට අප දක්වන කැපවීම 2025 වසරේ මෙම සාර්ථකත්වයට තීරණාත්මක ලෙස බලපෑවේය.

2026 සඳහා ඉදිරි දැක්ම

රුපියල් බිලියන 59ක අතිරේක වර්ධනයක් අත්කර ගනිමින් 33%ක සමස්ත වර්ධනයක් ළඟා කර ගැනීමේ අරමුණින්, ආයතනික බැංකු අංශය (CBD) පෞද්ගලික අංශයේ ව්‍යාපාර කෙරෙහි අඛණ්ඩව අවධානය යොමු කරනු ඇත. කලාප පහක් යටතේ කැපවූ සහ උද්යෝගිමත් විකුණුම් කණ්ඩායමක් ගොඩනැගීමේ අරමුණින් දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් සැලසුම් කර ඇත. විකාශනය වෙමින් පවතින ආයතනික බැංකු ක්ෂේත්‍රයේ අවශ්‍යතා සපුරාලන නිෂ්පාදන සහ පාරිභෝගික සේවා පුහුණුව සඳහා විශේෂඥ සම්පත් අඛණ්ඩව වෙන් කිරීමට අප මානව සම්පත් දෙපාර්තමේන්තුව සමඟ සමීපව කටයුතු කරමින් සිටිමු.



භාණ්ඩාගාරය සහ ආයෝජන බැංකුකරණය

බැංකුවේ මූල්‍ය සාර්ථකත්වය සැලකිය යුතු ලෙස ඉහළ නැංවීමට සහ විශිෂ්ට පාරිභෝගික සේවාවක් සැපයීමට කැපවී සිටින භාණ්ඩාගාර සහ ආයෝජන බැංකු ඒකකය, ද්‍රවශීලතාවය, ආයෝජන, ප්‍රාග්ධන වෙන්කිරීම් සහ දේශසීමා අතර ගනුදෙනු බාධාවකින් තොරව කළමනාකරණය කිරීම සඳහා ඒකාබද්ධව ක්‍රියා කරයි. එමගින් බැංකුවේ මෙහෙයුම් කාර්යක්ෂමතාවය පවත්වා ගැනීමෙහිලා මෙම ඒකකය තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි.

භාණ්ඩාගාරය

අපගේ අවධානය

පොලී අනුපාතික පහළ යාම, විදේශ විනිමය උච්චාවචනයන් සහ බැංකු ක්ෂේත්‍රය තුළ පවතින දැඩි තරඟකාරීත්වය වැනි ගතික මෙහෙයුම් පරිසරයක් පැවතිය ද, භාණ්ඩාගාර ඒකකය 2025 වසරේ දී ස්ථාවර කාර්යසාධනයක් පෙන්නුම් කරමින් බැංකුවේ ආදායමට සහ ලාභාන්තිකය (margin) ඉහළ නැංවීමට සැලකිය යුතු දායකත්වයක් ලබා දුන්නේය. විචක්ෂණශීලී ද්‍රවශීලතා කළමනාකරණය, විදේශ විනිමය මෙහෙයුම් සහ උපායමාර්ගික ආයෝජන ක්‍රියාකාරකම් හරහා බැංකුවේ මූල්‍ය කාර්ය සාධනය ශක්තිමත් කිරීමෙහිලා මෙම ඒකකය අඛණ්ඩව තීරණාත්මක කාර්යභාරයක් ඉටු කළේය.

අපගේ උපායමාර්ගය

වසර තුළ භාණ්ඩාගාරයේ උපායමාර්ගික ප්‍රමුඛතා, මූල්‍ය ස්ථාවරත්වය පවත්වා ගැනීම සහ තිරසාර ලාභදායිත්වයක් ළඟා කර ගැනීම යන බැංකුවේ පුළුල් අරමුණු සමඟ සමීපව අනුකූල විය. වෙළඳ කටයුතුවල නිරත ගනුදෙනුකරුවන්ට අවශ්‍ය විදේශ විනිමය නියමිත වේලාවට ලබා දීම සහතික කිරීම මගින් වාහන, අත්‍යවශ්‍ය භාණ්ඩ සහ අනෙකුත් තීරණාත්මක ද්‍රව්‍ය ආනයනය කිරීමට පහසුකම් සැලසීම මෙහි මූලික අවධානයක් විය. රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ බැංකු වෙතින් එල්ල වූ දැඩි තරඟකාරීත්වය සහ ආක්‍රමණශීලී අලෙවිකරණ ව්‍යාපාර මධ්‍යයේ ගනුදෙනුකරුවන් රඳවා ගැනීම 2025 වසරේ බැංකුව දැඩි ලෙස අවධානය යොමු කළ තවත් උපායමාර්ගික ප්‍රමුඛතාවයකි. ඒ සමඟම, ශක්තිමත් රාජ්‍ය ආයතන රඳවා ගන්නා අතරතුර පෞද්ගලික අංශය වෙත ප්‍රවේශ වීමටද බැංකුව අවධානය යොමු කළේය. ගනුදෙනු පරිමාවන් (volumes) වැඩි කර ගැනීම සඳහා ගනුදෙනුකරුවන්ගේ ගනුදෙනු මත ලාභාන්තිකයන් (margins) සීමා කිරීමටද අප පියවර ගත්තෙමු.

ද්‍රවශීලතා කළමනාකරණය

2025 වසර පුරා භාණ්ඩාගාර ඒකකයේ මූලික කාර්යය වූයේ ද්‍රවශීලතාවය කළමනාකරණය කිරීමයි. බැංකුවේ ශේෂ පත්‍රයේ ස්ථායීතාවය තහවුරු කළ බැංකුවේ ද්‍රවශීලතා කළමනාකරණ රාමුව තුළින් විනයගරුක සහ ඉදිරි දැක්මක් සහිත ප්‍රවේශයක් පිළිබිඹු විය. නියාමන අවශ්‍යතාවලට වඩා ඉහළ මට්ටමක පවත්වා ගනිමින්, භාණ්ඩාගාර සහ වත්කම් හා බැරකම් කළමනාකරණ (ALM) අංශ මගින් විවිධාංගීකරණය වූ අරමුදල් මූලාශ්‍ර, විචක්ෂණශීලී කාලසීමාවන් සහිත මූල්‍ය පහසුකම් සහ උපායමාර්ගික කෙටි කාලීන රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කිරීම හරහා ද්‍රවශීලතාවය සක්‍රීයව කළමනාකරණය කරන ලදී. මෙය ප්‍රති-ආයෝජන සඳහා ඉහළ පොලී අනුපාතික අපේක්ෂාවෙන් සහ 2026 වසරේ අපේක්ෂිත ණය වර්ධනයට සූදානම් වීමේ පියවරක් ලෙස සිදු කරන ලදී. වැඩි දියුණු වූ විදේශ විනිමය ලැබීම් සහ දේශීය මුදල් අරමුදල් මනා ලෙස කළමනාකරණය කිරීම හේතුවෙන්, රුපියල් සහ අනෙකුත් විදේශ මුදල් යන දෙවර්ගයෙන්ම සතුටුදායක ද්‍රවශීලතා මට්ටමක් පවත්වා ගැනීමට බැංකුව සමත් විය.

අන්තර් විකිණීම් අවස්ථා

අනෙකුත් ව්‍යාපාරික ඒකක සමඟ සමීප සහයෝගීතාවයෙන් කටයුතු කරමින්, බැංකුවේ නිෂ්පාදන පෙළ පුරා සහසම්බන්ධිත විකුණුම් අවස්ථා ප්‍රවර්ධනය කිරීමටත්, ඒකාබද්ධ බැංකු විසඳුම් ලබා දීමටත් භාණ්ඩාගාරය සහය විය. ගනුදෙනුකරුවන් සමඟ නිරන්තරයෙන් සම්බන්ධ වීම හරහා ඔවුන්ගේ අවශ්‍යතා වඩා හොඳින් අවබෝධ කර ගැනීමටත්, භාණ්ඩාගාර කටයුතුවලට අදාළ නිෂ්පාදන සහ විසඳුම් ලබා දීමටත් භාණ්ඩාගාර කණ්ඩායමට හැකි විය.

කාර්ය මණ්ඩලයේ කුසලතා වර්ධනය කිරීම

ගනුදෙනුකරුවන් සමඟ සම්බන්ධ වන ප්‍රධාන මධ්‍යස්ථානය ශාඛා කාර්ය මණ්ඩලය බැවින්, සුවිශේෂී සේවාවක් සැපයීමට සහ පාරිභෝගික විශ්වාසය හා පක්ෂපාතීත්වය තහවුරු කිරීමට සේවකයින් බලගැන්වීම සඳහා දැනුම සහ කුසලතා සංවර්ධනය කිරීමේ වැඩසටහන් කෙරෙහි භාණ්ඩාගාරය ප්‍රමුඛතාවයක් ලබා දෙන ලදී.

විකුණුම් කණ්ඩායම

සලකා බලනු ලබන වසර තුළ දී, භාණ්ඩාගාරය පාරිභෝගික අවශ්‍යතා සහ බැංකුවේ උපායමාර්ගික ප්‍රමුඛතා යන දෙඅංශයටම අනුකූලව මූලපිරීම් කිහිපයක් සිදු කරන ලදී. අපගේ කැපවූ විකුණුම් කණ්ඩායම්, සක්‍රීය පාරිභෝගික සම්බන්ධතා සහ ක්‍රමවත් ක්ෂේත්‍ර චාරිකා මඟින් නව ව්‍යාපාර අත්පත් කර ගැනීම, පාරිභෝගිකයින් රඳවා ගැනීම සහ සබඳතා ශක්තිමත් කිරීමේ ගතිකතාව පවත්වා ගනිමින් වගවීම සහතික කළහ.

අභියෝග මධ්‍යයේ මෙහෙයුම් සිදු කිරීම

සාම්ප්‍රදායික බැංකුකරණය සහ නවීන මූල්‍ය තාක්ෂණ (FinTech) ආයතන වෙතින් විල්ලු වන දැඩි වෙළඳපොළ තරඟකාරිත්වය අඛණ්ඩව ඉහළ යමින් පවතී. එබැවින්, අඩුවන ලාභාන්තිකයන් (margins) සහ ඉහළ අස්ථාවරත්වයකින් යුත් පරිසරයක් තුළ කටයුතු කිරීම අත්‍යවශ්‍ය වේ. අපහැදිලි වෙළඳපොළ ප්‍රවණතා සහ අවිනිශ්චිත තත්ත්වයන් මධ්‍යයේ, විකල්ප තෝරා ගැනීමේදී වඩාත් වරණාත්මක වෙමින් සහ ප්‍රශස්ත මට්ටමේ සුරැකුම්පත් හා මුදල් ප්‍රමාණයන් පවත්වා ගනිමින් අපගේ අවදානම් නිරාවරණය (exposure) සමතුලිත කිරීමට අපි අවධානය යොමු කළෙමු.

රාජ්‍ය ආයතනයක් ලෙස, නියාමන සහ අනුකූලතා අවශ්‍යතා රාශියක් අතරින් ඒක පුද්ගල ණය සීමාවන් (single-borrower limit) සහ සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු රාමු තුළ කටයුතු කිරීම අතිශයින් වැදගත් වේ. මෙහිදී ව්‍යාපාර අතර පවතින අන්තර් සම්බන්ධිත ස්ථර වෙන්කර හඳුනා ගැනීම කාලය වැය වන කාර්යයකි. මේ අතර, මූල්‍ය තාක්ෂණ ආයතන විසින් පිරිනමනු ලබන අර්ධ-භාණ්ඩාගාර (quasi-treasury) නිෂ්පාදන අඛණ්ඩව ව්‍යාප්ත වන පරිසරයක් තුළ, එම පීඩනයන් කළමනාකරණය කරමින්, පටු වන ලාභාන්තිකයන් මධ්‍යයේ වුවද අතිරික්ත ද්‍රවශීලතාවය පාලනය කිරීමට සහ අපගේ ඉලක්ක සපුරා ගැනීමට අපි විචක්ෂණශීලීව සහ නිවැරදි තීරණාත්මක විනිශ්චයන් සහිතව කටයුතු කළෙමු.

2026 සඳහා ඉදිරි දැක්ම

නියාමන අනුකූලතාවයන් දැඩි ලෙස අනුගමනය කරමින් ද්‍රවශීලතාවය කළමනාකරණය කිරීම, වාර්ෂික අයවැය ඉලක්ක සපුරා ගැනීම සහ විදේශ විනිමය හා පොලී අනුපාතික අවදානම් නිරාවරණයන් ප්‍රශස්ත මට්ටමක පවත්වා ගැනීම කෙරෙහි කණ්ඩායම අඛණ්ඩව අවධානය යොමු කරනු ඇත.

අනාගතය දෙස බලන කල, ගනුදෙනු උපායමාර්ග ශක්තිමත් කිරීම, විදේශ විනිමය ව්‍යාපාර පරිමාවන් ව්‍යාප්ත කිරීම සහ ඵලදායී ද්‍රවශීලතා කළමනාකරණ පිළිවෙත් පවත්වාගෙන යාම මඟින් බැංකුව වෙත ලබා දෙන දායකත්වය ඉහළ නැංවීමට භාණ්ඩාගාරය අපේක්ෂා කරයි.

එළඹෙන වසර සඳහා වන ප්‍රධාන ප්‍රමුඛතාවලට ප්‍රධාන ආයතනික සහ ආයතනික ගනුදෙනුකරුවන් සමඟ සබඳතා ශක්තිමත් කිරීම, උපායමාර්ගික ආයෝජන ක්‍රියාකාරකම් හරහා ලාභදායිත්වය වැඩි දියුණු කිරීම සහ විකාශනය වන නියාමන අනුකූලතාවන් හා වෙළඳපොළ වර්ධනයන්ට අනුකූලව හැඩගැසීම ඇතුළත් වේ.

ප්‍රාථමික අලෙවි නියෝජිත ඒකකය

අපගේ අවධානය

වෙළඳපොළ තුළ පැවති යහපත් ප්‍රවණතා සහ ශක්තිමත් ද්‍රවශීලතා තත්ත්වයන්ගේ සහය ඇතිව, 2025 වසරේ දී ප්‍රාථමික අලෙවි නියෝජිත ඒකකය (PDU) ප්‍රාථමික හා ද්විතීයික රජයේ සුරැකුම්පත් වෙළඳපොළ තුළ සිය භූමිකාව තවදුරටත් ශක්තිමත් කළේය. විකාශනය වන වෙළඳපොළ පරිසරය තුළ බැංකුව දැක්වූ ක්‍රියාකාරී දායකත්වය සහ උපායමාර්ගික ස්ථානගත වීම පිළිබිඹු කරමින්, බැංකුවේ රජයේ සුරැකුම්පත් කළඹ පෙර වසරට සාපේක්ෂව 46% කින් වර්ධනය වී ඇත.

රජයේ සුරැකුම්පත් වෙන්දේසි කිරීමේ ක්‍රියාවලිය, ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ සිට රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය (PDMO) වෙත සංක්‍රමණය වීම වසර තුළ සිදු වූ ප්‍රධාන මෙහෙයුම් සන්ධිස්ථානයකි.

අපගේ උපායමාර්ගය

2025 වසරේදී, ප්‍රාථමික අලෙවි නියෝජිත ඒකකය සිය වෙළඳපොළ නියෝජනය ව්‍යාප්ත කිරීම සහ සුරැකුම්පත් කළඹේ කාර්ය සාධනය ප්‍රශස්ත කිරීම අරමුණු කරගත් ඉලක්කගත උපායමාර්ගයක් අනුගමනය කළේය. හිතකර වෙළඳපොළ තත්ත්වයන්ගෙන් උපරිම ප්‍රයෝජන ගැනීමට සහ ප්‍රතිලාභ ඉහළ නංවා ගැනීම සඳහා ප්‍රාථමික හා ද්විතීයික රජයේ සුරැකුම්පත් වෙළඳපොළවල් දෙකෙහිම ක්‍රියාකාරිත්ව සම්බන්ධ වීම මෙයට ඇතුළත් විය. ඒ සමඟම, පොලී අනුපාතික සහ ද්‍රවශීලතා අවදානම් අවම කර ගැනීම සඳහා විවිධ කල්පිරීමේ කාලසීමාවන් සහ මූල්‍ය උපකරණ හරහා සුරැකුම්පත් විවිධාංගීකරණය කරමින්, අවදානම් කළමනාකරණය සඳහා විනයගරුක ප්‍රවේශයක් පවත්වා ගැනීමට ප්‍රාථමික අලෙවි නියෝජිත ඒකකය කටයුතු කළේය. මෙය තිරසාර වර්ධනයක් සහ වෙළඳපොළ ස්ථාවරත්වය ඇති කිරීමේ බැංකුවේ පුළුල් අරමුණු සඳහා ද දායක වන ලදී.

2026 සඳහා ඉදිරි දැක්ම

2026 වසරේදී, ප්‍රාථමික අලෙවි නියෝජිත ඒකකය (PDU) සිය වෙළඳපොළ නියෝජනය ශක්තිමත් කිරීම සහ සුරැකුම්පත් කළඹේ කාර්ය සාධනය ප්‍රශස්ත කිරීම කෙරෙහි අවධානය යොමු කරනු ඇත. එමෙන්ම, බැංකුවේ ද්‍රවශීලතා සහ තිරසාර වර්ධන අරමුණු සඳහා සහය වීම පිණිස විනයගරුක අවදානම් කළමනාකරණ පිළිවෙත් අඛණ්ඩව පවත්වා ගැනීමට ද කටයුතු කරනු ඇත.

ආයෝජන බැංකුකරණය

අපගේ අවධානය

අඩු අවදානම් සහිත, ඉහළ ගුණාත්මකභාවයකින් යුත් නිකුත් කරන්නන් සහ රජයේ අනුග්‍රහය ලබන ආයතන වෙත බැංකුව ක්‍රමයෙන් සිය අවධානය යොමු කළ අතර, එමඟින් ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලැබෙන ගාස්තු සහ කොමිස් ආදායම ඉහළ නංවා ගැනීමටත්, ක්‍රියාත්මක කරන ලද නියෝගවල (mandates) අගය ශක්තිමත් කිරීමටත් පියවර ගත්තේය. නව ගනුදෙනුකරුවන් අත්පත් කර ගැනීම සහ පවතින ගනුදෙනුකරුවන් රඳවා ගැනීම අඛණ්ඩ ප්‍රමුඛතාවයක් ලෙස පැවති අතර, එය විශ්වාසදායී ආයෝජන උපදේශකයෙකු ලෙස බැංකුවේ ස්ථානගත වීම තවදුරටත් තහවුරු කරන ලදී.

අපගේ උපායමාර්ගය

විවිධ අරමුදල් අවශ්‍යතා සපුරාලීම සඳහා ණයකර (debentures), බැඳුම්කර (bonds) සහ කාලීන මූල්‍ය විසඳුම් ලබා දෙමින් අපි ණය උපකරණ ක්ෂේත්‍රයේ සක්‍රීයව නිරත වූවෙමු. ප්‍රාග්ධන වෙළඳපොළ පිළිබඳ අප සතු විශේෂඥ දැනුම උපයෝගී කර ගනිමින්, ප්‍රාග්ධන සම්පාදන මුලපිරීම් මාලාවක කළමනාකරුවන්, සංවිධායකයින්, උපදේශකයින් සහ නියෝජිතයින් ලෙස අපි කටයුතු කළෙමු. මෙමඟින් අපගේ වෙළඳපොළ ස්ථානගත වීම ශක්තිමත් වූ අතර ආයෝජක විශ්වාසය තහවුරු විය. මෙම ක්‍රියාකාරකම් හරහා බැංකුව සිදු කරන මූල්‍ය අන්තර්කරණය, ජාතික සංවර්ධන ප්‍රමුඛතාවයන් සඳහා අඛණ්ඩව අර්ථවත් දායකත්වයක් ලබා දෙන ලදී.

ප්‍රාග්ධන වෙළඳපොළ මෙහෙයුම්

සමාගම් ණයපත් නිකුත් කිරීමේ සැලසුම්, නියාමයන් සකස් කිරීම සහ ඒවා ආයෝජකයන්ට බෙදාහැරීමේ ක්‍රියාවලියෙහි මෙම ඒකකය නිරත විය. තවද, මූලික කොටස් නිකුතු (IPO) උපදේශන සේවාවන් සැපයීම සහ මහා පරිමාණ ගනුදෙනු සඳහා දේශීය හා ජාත්‍යන්තර ආයෝජකයින් සම්බන්ධීකරණය කරමින් "බුක්-රන්නින්" (book-running) කටයුතුවල ද එය නිරත විය.

සමාගම් ඒකාබද්ධ කිරීම් සහ අත්පත් කර ගැනීම් පිළිබඳ උපදේශනය

උචිත ව්‍යාපාරික පිරික්සුම් (due diligence) සම්බන්ධීකරණය සහ ගනුදෙනු ව්‍යුහගත කිරීම (deal structuring) ඇතුළුව, සමාගම් ඒකාබද්ධ කිරීම් සහ අත්පත් කර ගැනීම් සම්බන්ධ උපදේශන සේවාවන් සැපයීමට බැංකුව කටයුතු කළේය.

2026 සඳහා ඉදිරි දැක්ම

ආයෝජන බැංකු ඒකකය ප්‍රාග්ධන වෙළඳපොළ සහ කොටස් වෙළඳාම සම්බන්ධ සිය උපදේශන හැකියාවන් තවදුරටත් ශක්තිමත් කරන අතරම, සිය ක්‍රියාකාරකම් ජාතික සංවර්ධන ප්‍රමුඛතාවයන් සමඟ උපායමාර්ගිකව අනුකූල කරනු ඇත. මෙහිදී යටිතල පහසුකම් සංවර්ධනයට සහය වීම සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය (SME) අංශය බලගැන්වීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන අතර, එමඟින් තිරසර ආර්ථික වර්ධනයක් සඳහා දායක වීමට අපේක්ෂා කෙරේ.

ව්‍යුහගත සහ සම්මිලිත ණය

අරමුදල් මූලාශ්‍ර විවිධාංගීකරණය කිරීම සහ අවදානම් හුවමාරු කිරීම සඳහා, මෙම ඒකකය සුරුකුම්පත්කරණය (securitisations) සහ වත්කම් මත පදනම් වූ මූල්‍ය පහසුකම් (asset-backed facilities) ක්‍රියාත්මක කරන ලදී. සංකීර්ණ ප්‍රාග්ධන වෙළඳපොළ ගනුදෙනුවලදී විශ්වාසදායී හවුල්කරුවෙකු ලෙස සිය වර්ධනය වන පිළිගැනීම මනාව විදහා දක්වමින්, ආයෝජන බැංකු ඒකකය 2025 වසරේදී කීර්තිමත් ආයතනික මූල්‍ය උපදේශක (CFA) බලපත්‍රය දිනා ගැනීමට සමත් වූ අතර, එය ආයෝජන බැංකු ක්ෂේත්‍රයේ සිය නායකත්වය තවදුරටත් තහවුරු කිරීමට හේතු විය.

මෙම ප්‍රගතියත් සමඟම, 2025 Global Banking and Finance Review සම්මාන උළෙලේදී "ශ්‍රී ලංකාවේ හොඳම ආයෝජන බැංකුව" (Best Investment Bank Sri Lanka) සහ "The Next 100 Global Awards - Investment Banking" යන ජාත්‍යන්තර සම්මාන ද්විත්වයකින් මෙම ඒකකය පිදුම් ලැබීය. මෙම ජයග්‍රහණ තුළින් පාරිභෝගික කේන්ද්‍රීය ප්‍රවේශයක් පවත්වා ගනිමින් විශිෂ්ටත්වය සහ මූල්‍ය නායකත්වය උදෙසා මහජන බැංකුව දක්වන නොසැලෙන කැපවීම පිළිබිඹු වේ.

ගැඹුරු තාක්ෂණික විශේෂඥතාව, උපායමාර්ගික ඉදිරි දැක්ම සහ උසස් ඩිජිටල් හැකියාවන්ගෙන් සමන්විත ශක්තිමත් උපදේශන වේදිකාවක සහය ඇතිව, ජාතික සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා හවුල්කරුවෙකු වෙමින් ශ්‍රී ලංකාවේ ආයෝජන බැංකු ක්ෂේත්‍රයේ සිය තරඟකාරිත්වය තවදුරටත් ශක්තිමත් කිරීමට බැංකුව කටයුතු කරයි.

මීට අමතරව, People's Web App හරහා කොටස් ආයෝජන හැකියාවන් ලබා දීම මඟින් බැංකුවේ පුළුල් ඩිජිටල්කරණ වැඩසටහන සඳහාද මෙම ඒකකය සහය විය. මෙය ආයෝජකයින්ට පහසුවෙන් ප්‍රවේශ විය හැකි සේවාවක් වූ අතර, ඩිජිටල් නවෝත්පාදනය උදෙසා බැංකුව සතු කැපවීම සමඟ ද මනාව අනුකූල වේ.

මූල්‍ය ආයතන

අපගේ අවධානය


බැංකුවේ ජාත්‍යන්තර සබඳතා ශක්තිමත් කිරීමෙහිලා සහ දේශසීමා අතර බැංකු මෙහෙයුම් බාධාවකින් තොරව පවත්වාගෙන යාමෙහිලා මූල්‍ය ආයතන (FI) දෙපාර්තමේන්තුව තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. මූල්‍ය ආයතන දෙපාර්තමේන්තුව ලොව පුරා පවතින අනුරූපී බැංකු (correspondent banks) සමඟ ණය සහ වෙළඳ පහසුකම් (trade lines) පිළිබඳ සාකච්ඡා පවත්වයි. මෙම විධිවිධාන හරහා විදේශ විනිමය, මුදල් වෙළඳපොළ සහ අනෙකුත් මූල්‍ය ගනුදෙනුවලදී ජාත්‍යන්තර පාර්ශ්වයන් සමඟ සම්බන්ධ වීමට අවස්ථාව සැලසීම මගින් බැංකුවේ භාණ්ඩාගාර මෙහෙයුම් සඳහා සහය ලබා දෙයි. දැනට, මහජන බැංකුව ලොව පුරා අනුරූපී බැංකු සබඳතා 573ක් පවත්වාගෙන යන අතර, එමගින් පුළුල් ගෝලීය ප්‍රවේශයක් ලබා දෙයි. මීට අමතරව, බැංකුව දැනට රටවල් 20ක ප්‍රධාන මුදල් වර්ග 16ක් යටතේ "නොස්ට්‍රෝ" (nostro) ගිණුම් 37ක් පවත්වාගෙන යන අතර, එමගින් ජාත්‍යන්තර ගනුදෙනු ඉක්මනින් හා කාර්යක්ෂමව සිදු කිරීමට හැකියාව ලැබේ.

අපගේ උපායමාර්ගය

දැඩි වන නියාමන විමර්ශන සහ අනුකූලතා අවශ්‍යතා මධ්‍යයේ ගෝලීය අනුරූපී බැංකු ක්ෂේත්‍රය අඛණ්ඩව විකාශනය වෙමින් පවතී. විශේෂයෙන්ම, ජාත්‍යන්තර සම්බාධක පැනවීම් දැඩි වීම සහ ගෝලීය මූල්‍ය ආයතනවලින් අපේක්ෂා කරන ඉහළ මට්ටමේ ව්‍යාපාරික පිරික්සුම් (due diligence) හේතුවෙන්, දේශසීමා අතර වෙළඳපොළවල් තුළ ක්‍රියාත්මක වන බැංකු සඳහා වැඩිවන අභියෝග විල්ල වී ඇත. සක්‍රීය සබඳතා කළමනාකරණය, උපායමාර්ගික ණය පහසුකම් සැලසීම සහ ශක්තිමත් අනුරූපී බැංකු ජාලයන් හරහා, ජාත්‍යන්තර වෙළඳාම, භාණ්ඩාගාර මෙහෙයුම් සහ ගෝලීය මූල්‍ය සම්බන්ධතාවන් (financial connectivity) සඳහා සහය වීමට බැංකුව සතු හැකියාව කෙරෙහි මූල්‍ය ආයතන දෙපාර්තමේන්තුව සැලකිය යුතු දායකත්වයක් ලබා දෙයි.

2026 සඳහා ඉදිරි දැක්ම

2026 වසරේදී ද, බැංකුවේ වර්ධනය වන ජාත්‍යන්තර ව්‍යාපාර කටයුතු සහ දේශසීමා අතර සිදු කෙරෙන ගනුදෙනු හැකියාවන් සඳහා සහය වීම පිණිස මහජන බැංකුවේ ගෝලීය අනුරූපී බැංකු ජාලය තවදුරටත් ශක්තිමත් කිරීමට මූල්‍ය ආයතන දෙපාර්තමේන්තුව කටයුතු කරනු ඇත. එමෙන්ම, ප්‍රධාන මුදල් වර්ග හරහා කාර්යක්ෂම ගෙවීම් පියවීමේ හැකියාව සහතික කිරීම සහ මෙහෙයුම් ඔරොත්තු දීමේ හැකියාව පවත්වා ගැනීම සඳහා බැංකුවේ "නොස්ට්‍රෝ" (nostro) ගිණුම් ජාලය අඛණ්ඩව සමාලෝචනය කිරීමට සහ ප්‍රශස්ත කිරීමට ද මෙම ඒකකය පියවර ගනු ඇත.



එතෙර පාරිභෝගික සේවා

එතෙර පාරිභෝගික සේවා ඒකකය (OCS), විදේශීය ප්‍රේෂණ ගලා ඒම දිරිමත් කිරීම සහ පහසුකම් සැලසීම සඳහා වන බැංකුවේ මධ්‍යස්ථානය ලෙස ක්‍රියා කරන අතර, විදේශයන්හි වෙසෙන ගනුදෙනුකරුවන් සඳහා විදේශ මුදල් ගිණුම් පිළිබඳ මගපෙන්වීම සහ විශේෂඥ දැනුම ලබා දෙයි.

අපගේ අවධානය

ගෝලීය වශයෙන් "වොස්ට්‍රෝ" (Vostro) අනුරූපී ප්‍රේෂණ සබඳතා ව්‍යාප්ත කිරීම මගින් විදේශ මුදල් තැන්පතු ඉහළ නැංවීමට සහ විදේශ ශ්‍රමික ප්‍රේෂණ බාධාවකින් තොරව ගලා ඒමට පහසුකම් සැලසීම කෙරෙහි අපගේ අවධානය යොමු වී ඇත. එමගින් ගනුදෙනුකරුවන්ට වඩාත් වේගවත්, ආරක්ෂිත සහ පහසු ජාත්‍යන්තර ගනුදෙනු අත්දැකීමක් ලබා දෙන අතරම, ශ්‍රී ලංකාවේ සිටින ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් සහ හිතවතුන් වෙනුවෙන් විශ්වාසදායී ඉතුරුම් විකල්ප සහ බාධාවකින් තොර අරමුදල් හුවමාරු කිරීමේ පහසුකම් සහතික කෙරේ.

අපගේ උපායමාර්ගය

විදේශ පාරිභෝගික සේවා අංශය සඳහා වන උපායමාර්ග ලෙස විදේශ මුදල් (FCY) තැන්පතු ඉහළ නැංවීම, විදේශ ශ්‍රමික ප්‍රේෂණ බාධාවකින් තොරව ගලා ඒමට පහසුකම් සැලසීම සහ ලොව පුරා නව "වොස්ට්‍රෝ" (Vostro) අනුරූපී ප්‍රේෂණ සබඳතා ඇති කර ගැනීම තීරණය කර ඇත.



විදේශ මුදල් තැන්පතු රැස් කිරීම

නව වොස්ට්‍රෝ (Vostro) ප්‍රේෂණ අනුරූපී සබඳතා

විදේශ ශ්‍රමික ප්‍රේෂණ

එතෙර පාරිභෝගික සේවා

විදේශ විනිමය තැන්පතු බලමුලු ගැන්වීම

ගනුදෙනුතරුවන් ආකර්ෂණය කර ගැනීම සහ රඳවා තබා ගැනීම ඉලක්ක කරගත් උපාය මාර්ග ඔස්සේ, එතෙර ගනුදෙනු වී්කකය (OCS) ව්‍යාපාරික සහ පුද්ගලික බැංකු අංශ යන දෙඅංශයේම විදේශ විනිමය (FCY) තැන්පතු බලමුලු ගැන්වීම සඳහා සක්‍රියව දායක වේ. බැංකුව විදේශ විනිමය තැන්පතු සඳහා තරඟකාරී පොලී අනුපාත පිරිනමන අතර, ඊට අමතරව අනතුරු, ගමන් මලු සහ වෛද්‍ය වියදම් ආවරණය වන පරිදි පුළුල් රක්ෂණ පැකේජ වැනි අගය වර්ධිත සේවා ද ලබා දෙයි. මීට අමතරව, පුද්ගලික විදේශ විනිමය ගිණුම් හිමියන් සඳහා සහනදායී පොලී අනුපාත යටතේ උකස් පහසුකම්, විවිධ ණය පහසුකම් සහ මාර්ගගත අරමුදල් හුවමාරු පහසුකම් සඳහා ප්‍රවේශය ලබා දී ඇති අතර, එමඟින් ගනුදෙනුකරුවන්ට පිරිනමන වටිනාකම සහ මූල්‍ය පහසුව තවදුරටත් ඉහළ නංවයි.

PFCA	**එතෙර ඉසුර පුද්ගලික විදේශ මුදල් ගිණුම** විදේශ විනිමය ඉපැයීම් සුරක්ෂිතව කළමනාකරණය කිරීම සඳහා වේ. අරමුදල් වෙත පහසුවෙන් ප්‍රවේශ වීමේ හැකියාව සහිතව බාධාවකින් තොර ප්‍රේෂණ සඳහා ඉඩ සලසයි. **එතෙර ඉසුර ප්‍රිමියර් ගිණුම** ඉහළ වටිනාකමකින් යුත් ගනුදෙනුකරුවන් සඳහා වන සුවිශේෂී ගිණුමකි. එහි ප්‍රධාන වාරික ප්‍රතිලාභය ලෙස වගකීම් සහිත සහනදායී අනුපාත පිරිනමයි.
PCFA බාලවයස්කාර	**එතෙර උදාන බාලවයස්කාර විදේශ විනිමය ගිණුම** දූ දරුවන්ගේ අනාගතය වෙනුවෙන් විදේශ විනිමය සුරක්ෂිතව ඉතිරි කිරීමට දෙමාපියන් සවිබල ගන්වයි.
BFCA	**ව්‍යාපාරික විදේශ මුදල් ගිණුම** ජාත්‍යන්තර ගනුදෙනුවල නිරත ව්‍යාපාර සඳහා නිර්මාණය කර ඇත. කාර්යක්ෂම අරමුදල් කළමනාකරණය සහ ද්‍රවශීලතාවය සඳහා සහාය වේ.
IIA	**ආමුඛ ආයෝජන ගිණුම** විදේශ ආයෝජන සඳහා වන සුරක්ෂිත මාධ්‍යයකි. විනිවිදභාවයෙන් යුත් සහ අනුකූල අරමුදල් ප්‍රවාහයන් සහතික කරයි.
DFCA	**රාජ්‍ය තාන්ත්‍රික විදේශ විනිමය/රාජ්‍ය තාන්ත්‍රික රුපියල් ගිණුම** රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩල සඳහා විශේෂයෙන් සැකසූවකි.
VPFCA	**වීසා වැඩසටහන් විශේෂ ගිණුම** දේශීය පදිංචිය අපේක්ෂා කරන විදේශිකයන් සඳහා වේ. වීසා බලපත්‍ර ආශ්‍රිත මූල්‍ය අවශ්‍යතා සුරක්ෂිත සහ අනුකූල ආකාරයෙන් ඉටු කිරීමට සහාය වේ.
FXFP	**FX Future Plus** ප්‍රේෂණ ආදායම් සඳහා වන ඉහළ පලදායී ස්ථාවර තැන්පතුවකි, පහසුවෙන් ඉහළ ප්‍රතිලාභ ලබා දෙයි.

සංක්‍රමණ ගිණුම්

CTRA	ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම
ERIA	විගාමිකයන්ගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුම
NRRA	අනේවාසික රුපියල් ගිණුම
DRA	රාජ්‍ය තාන්ත්‍රික රුපියල් ගිණුම

නව වොස්ට්‍රෝ (Vostro) ප්‍රේෂණ සම්බන්ධතා

සලකා බලනු ලබන වසර තුළ, අපි පෝර්දානය, මැලේසියාව සහ රුමේනියාව යන රටවල නව වොස්ට්‍රෝ සම්බන්ධතා සාර්ථකව ස්ථාපිත කළ අතර එක්සත් රාජධානිය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය සහ සිංගප්පූරුව යන රටවල අපගේ පැවැත්ම තවදුරටත් ශක්තිමත් කළෙමු. මෙම උපායමාර්ගික ව්‍යාප්ත කිරීම් මගින් අපගේ ගෝලීය ජාලය ඉහළ නංවා ඇති අතර දේශසීමා ගනුදෙනු කාර්යක්ෂමව සිදු කිරීමට ඇති හැකියාව තහවුරු කර ඇත.

වෙස්ටර්න් යූනියන් (Western Union) සහ රියා මනි ට්‍රාන්ස්ෆර් (RIA Money Transfer) වැනි ප්‍රමුඛ පෙළේ ගෝලීය ප්‍රේෂණ ජාලයන් සමඟ ඇති අපගේ උපායමාර්ගික සබඳතා මගින් අපගේ ජාත්‍යන්තර ප්‍රවේශය සැලකිය යුතු ලෙස පුළුල් කර ඇත. ඔවුන්ගේ පුළුල් ලෝක ව්‍යාප්ත වේදිකාවන් උපයෝගී කර ගනිමින්, අපගේ දේශසීමා හැකියාවන් වැඩිකර ඇති අතර ගනුදෙනුකරුවන් සඳහා වන සේවා ප්‍රවේශය වැඩිදියුණු කර ඇත.

බැංකුවේ API පද්ධති හරහා දියුණු හවුල්කාර තාක්ෂණයන් සමඟ ඒකාබද්ධ වීමෙන් ජාත්‍යන්තර ගෙවීම් මාර්ග (corridors) රැසකට ප්‍රවේශය ලබා දෙන අතර, එමඟින් ප්‍රේෂණ ගලා ඒම විධිමත් කර ගෝලීය ගෙවීම් පද්ධති වෙත ප්‍රවේශ වීම වේගවත් කරයි.

මීට අමතරව, අපගේ සුවිශේෂී ඩිජිටල් විසඳුම් වන People's WebRemit සහ People's InstantRemit මගින් ක්ෂණික අරමුදල් හුවමාරු කිරීමට ඉඩ සලසන අතර, එමඟින් වේගය, පහසුව සහ සමස්ත ගනුදෙනුකාර අත්දැකීම ඉහළ නංවයි.

විදේශීය ශ්‍රමික ප්‍රේෂණ සහ විදේශ විනිමය තැන්පතු

බැංකුවේ ප්‍රධාන ප්‍රවර්ධන වැඩසටහන ලෙස "පීපල්ස් රෙමිටන්ස් වාසි කෝටියයි" දිනුම් ඇදීම අඛණ්ඩව ක්‍රියාත්මක වූ අතර, එමඟින් බැංකුවේ සන්නාම ප්‍රතිරූපය සහ ගනුදෙනුකාර සම්බන්ධතාවය සැලකිය යුතු ලෙස ඉහළ නැංවීමටත්, මහජන බැංකු ගිණුම් වෙත ප්‍රේෂණ ආකර්ෂණය කර ගැනීමටත් ප්‍රබල ප්‍රතිඵල ලබා දෙන ලදී.

2025 වර්ෂය තුළ, බැංකුව "දොළොස් මහේ වාසි චක්‍රය" හරහා උපායමාර්ගික ප්‍රවර්ධන වැඩසටහන් මාලාවක් දියත් කළ අතර, එහි අරමුණ වූයේ නව විදේශ විනිමය තැන්පතු ආකර්ෂණය කර ගැනීම, විදේශීය ශ්‍රමික ප්‍රේෂණ සෘජුවම මහජන බැංකු ගිණුම් වෙත යොමු කිරීම ප්‍රවර්ධනය කිරීම සහ දැනට සිටින ගනුදෙනුකරුවන් රඳවා තබා ගැනීමයි. එමඟින් බැංකුවේ විදේශ විනිමය තැන්පතු පදනම සහ විදේශ ප්‍රේෂණ වෙළඳපල කොටසෙහි වර්ධනයට සහාය විය.



ප්‍රේෂණ ගලා ඒමට සහාය වීම

අපගේ නියෝජිතයින් හරහා දකුණු කොරියාව, මැදපෙරදිග සහ ඉතාලිය වැනි රටවල සිටින ගනුදෙනුකරුවන් වෙත අපගේ විශේෂඥ සේවාවන් පිරිනමනු ලැබේ. විදේශගත ශ්‍රමිකයින්ට ඔවුන්ගේ ණය අයදුම්පත් සැකසීමට සහ e-KYC හරහා ගිණුම් විවෘත කිරීමට සහාය වීම සඳහා බැංකුව සතුව දැනට ලොව පුරා ස්ථාපිත නියෝජිතයින් 16 දෙනෙකු සිටී. විදේශගත වීමට පෙර, පුහුණු වැඩසටහන් අතරතුර ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ (SLBFE) නිලධාරීන් සහ බැංකු නිලධාරීන්ගෙන් මූල්‍ය සහාය, පූර්ව පිටත්වීමේ ණය සහ මගපෙන්වීම් විදේශගත වන්නන් වෙත හිමිවේ.

වොස්ට්‍රෝ (Vostro) ප්‍රේෂණ සම්බන්ධතා සඳහා නව මාර්ග හඳුනාගැනීම

වැඩිදියුණු කළ විශේෂාංග සහ ප්‍රතිලාභ සහිත නව විදේශ විනිමය (FCY) නිෂ්පාදන

අනුපූරක නිෂ්පාදන අලෙවිය

මාසය	විශේෂ ප්‍රවර්ධන වැඩසටහන්
ජනවාරි	උත්සව සමයේ ප්‍රවර්ධනය “රන් කාසි වාසි”
පෙබරවාරි	නිදහස් සතිය “නිදහස් ප්‍රණාම”
මාර්තු	ජාත්‍යන්තර කාන්තා දිනය “වනිතා ප්‍රණාම”
අප්‍රේල්	සිංහල සහ දෙමළ අලුත් අවුරුද්ද “කලින් අවුරුදු වාසි”
මැයි	කම්කරු දිනය “ශ්‍රම හරසර”
ජූලි	මහජන බැංකුවේ 64 වන සංවත්සරය “සංවත්සර ප්‍රණාම”
ඔක්තෝබර්	ළමා දිනය “දූ දරු ප්‍රණාම”

2026 සඳහා ඉදිරි දැක්ම

බටහිර යුරෝපය සහ අනෙකුත් ඉහළ අවස්ථා සහිත ගමනාන්තයන් කෙරෙහි ප්‍රමුඛත්වය ලබා දෙමින් ප්‍රේෂණ සේවා සඳහා නව මාවත් හඳුනාගැනීමට අපි සක්‍රීයව කටයුතු කරන්නෙමු. මෙම ව්‍යාප්තිය මගින් ශ්‍රම වෙළඳපොළේ නැගී එන ප්‍රවණතාවල අවශ්‍යතා සපුරාලන අතර විවිධ බැංකු විසඳුම් සමඟ ගනුදෙනුකරුවන්ට පහසුකම් සලසනු ඇත.

ශ්‍රී ලාංකික විදේශගත ශ්‍රමිකයන් ජාතික ආර්ථිකයට ලබා දෙන අගනා දායකත්වය අගයමින්, බැංකුව විසින් “පීපල්ස් රෙමිටන්ස් වාසි කෝටියයි” සහ “දොළොස් මහේ වාසි චක්‍රය” යන විශේෂ ප්‍රවර්ධන වැඩසටහන් පිළිවෙළින් පස්වන සහ දෙවන අඛණ්ඩ වසර සඳහා සාර්ථකව දියත් කරන ලදී.

ගනුදෙනුකරුවන්ගේ විකාශනය වන අවශ්‍යතා වඩාත් හොඳින් සපුරාලීම සඳහා වැඩිදියුණු කළ විශේෂාංග සහ අගය එකතු කළ ප්‍රතිලාභ සහිත නව විදේශ විනිමය නිෂ්පාදන හඳුන්වා දීමට බැංකුව සැලසුම් කරයි. මෙම දිමනා සඳහා ප්‍රවේශය වැඩි කිරීමට සහ බැංකුවේ විදේශ විනිමය සේවා භාවිතය දිරිමත් කිරීම සඳහා ඉලක්කගත අනුපූරක නිෂ්පාදන අලෙවි (cross-selling) වැඩසටහන් ද ක්‍රියාත්මක කරනු ඇත. මීට අමතරව, නිතිපතා ප්‍රේෂණ සිදු කරන ගනුදෙනුකරුවන් ඉලක්ක කරගත් පක්ෂපාතිත්ව සහ ප්‍රතිලාභ වැඩසටහන් මගින් අමතර ප්‍රතිලාභ සහ ඇගයීම් ලබා දෙන අතරම, විදේශ විනිමය තැන්පතු වර්ධනයට සහ මෙම අංශය තුළ බැංකුවේ වෙළඳපල පැවැත්ම ශක්තිමත් කිරීමට ද සහාය වනු ඇත.



ජාත්‍යන්තර බැංකු කටයුතු

ගෝලීය වෙළඳාමට සහාය වීම සඳහා බැංකුවේ ඇති කැපවීම විදහා දක්වමින්, විශේෂඥ උපදේශන සේවා සහ පුළුල් වෙළඳ මූල්‍ය විසඳුම් ලබා දීම මගින් බාධාවකින් තොර දේශසීමා ගනුදෙනු සඳහා පහසුකම් සැලසීමට ජාත්‍යන්තර බැංකු අංශය නිරන්තරයෙන් කැපවී සිටී. එමඟින් දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය වෙළඳපොළවල් තුළ සාර්ථකව කටයුතු කිරීමට ගනුදෙනුකරුවන්ට අවස්ථාව සැලසේ.

අපගේ අවධානය

බැංකු ක්ෂේත්‍රයේ පුළුල් ම ව්‍යාප්තියක් සහිත සහ සදාචාරාත්මක බැංකු පිළිවෙත් ගැඹුරින් අනුගමනය කරන ප්‍රමුඛයා ලෙස, අභ්‍යන්තර පාලනයන් සහ විශේෂඥභාවය ශක්තිමත් කරන අතරම, තිරසාර දේශසීමා වෙළඳාමට ඉඩ සැලසීම, විශේෂඥ වෙළඳ මූල්‍ය විසඳුම් ලබා දීම සහ ධාරිතා වර්ධන මූලපිරීම් කෙරෙහි 2025 වසරේදී අපි අඛණ්ඩව අවධානය යොමු කළෙමු.

අපගේ උපායමාර්ගය

පුළුල් වෙළඳ මූල්‍ය විසඳුම් ලබා දෙන අතරම සහ ගනුදෙනුකරුවන්ගේ හැකියාවන් වර්ධනය කරන අතරම, ජාත්‍යන්තර වෙළඳාම සහ බැංකු මෙහෙයුම් පිළිබඳ විශේෂිත පුහුණු වැඩසටහන් පවත්වමින් අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය හරහා අපගේ අභ්‍යන්තර විශේෂඥභාවය අපි ඉහළ නැංවූවෙමු. මෙම වෙළඳපල අංශය තුළ අත්‍යවශ්‍ය වන ජාත්‍යන්තර වෙළඳාම හා සම්බන්ධ විකාශනය වන නියාමන රාමුව සහ ගෝලීය හොඳම පිළිවෙත් පිළිබඳව ගනුදෙනුකරුවන් සහ සේවකයින් මනා අවබෝධයකින් පසුවන බව අපි සහතික කළෙමු.

ගනුදෙනුකාර සම්බන්ධතාවය සහ ආයතනික ධාරිතාවය යන දෙඅංශය කෙරෙහිම මෙලෙස අවධානය යොමු කිරීම මගින්, ජාත්‍යන්තර වාණිජ්‍යයේ විශ්වාසදායක මූල්‍ය හවුල්කරුවෙකු ලෙස බැංකුවේ ස්ථානය ශක්තිමත් කරන අතරම, බාධාවකින් තොර, සුරක්ෂිත සහ කාර්යක්ෂම දේශසීමා ගනුදෙනු සඳහා සහාය වීමට බැංකුවට හැකියාව ලැබී ඇත.

උපායමාර්ගික මූලපිරීම්

අපගේ උපායමාර්ගික මූලපිරීම් අපනයන පරිමාව සැලකිය යුතු ලෙස ඉහළ නැංවීම සහ බැංකුවේ ආනයන මූල්‍ය පහසුකම් භාවිතය වැඩි කිරීම කෙරෙහි අවධානය යොමු විය. මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා, අපි වෙළඳ මූල්‍ය කටයුතු පුළුල් කිරීම, අපනයන කාර්යසාධනය ශක්තිමත් කිරීම සහ ජාත්‍යන්තර වෙළඳාමට සම්බන්ධ හැකියාව ඇති අංශවලට ඇතුල්වීමේ කටයුතු කළෙමු.

වෙළඳ මූල්‍ය කටයුතු ශක්තිමත් කිරීම

ජාත්‍යන්තර වෙළඳාමේ නිරත ව්‍යාපාර සඳහා ප්‍රවේශය වැඩිදියුණු කිරීමට සහ විශේෂිත සහායක් ලබා දීමට, බැංකු ජාලය පුරා තෝරාගත් ශාඛාවල ස්ථාපිත වෙළඳ මූල්‍ය කවුළු (Trade Finance Desks) බැංකුව විසින් ශක්තිමත් කරන ලදී. වසරේ මුල් භාගයේදී වාහන ආනයන සීමාවන් ලිහිල් කිරීමත් සමඟ, රට තුළ ආනයන සඳහා, විශේෂයෙන්ම වාහන සඳහා වන ඉල්ලුමේ සැලකිය යුතු වර්ධනයක් දක්නට ලැබුණි. මේ සම්බන්ධයෙන්, ක්‍රියාවලීන් විධිමත් කරමින් සහ කඩිනම් සේවාවක් ලබා දීම සඳහා ප්‍රතිචාර දැක්වීමේ හැකියාව වැඩිදියුණු කරමින්, වෙළඳාම හා සම්බන්ධ ගනුදෙනු, විශේෂයෙන් වාහන ආනයනය පිළිබඳ විශේෂඥ මගපෙන්වීම් ලබා දීමට ශාඛා ජාලයේ කාර්ය මණ්ඩලය පුහුණු කර සන්නද්ධ කරන ලදී. විශේෂඥ දැනුම ගනුදෙනුකරුවන්ට සමීප කිරීම මගින්, බැංකුව සිය සේවා කාර්යක්ෂමතාව ඉහළ නංවන අතර ප්‍රධාන වාණිජ කලාප හරහා අපනයනකරුවන්ට සහ ආනයනකරුවන්ට සහාය වීමේ හැකියාව ශක්තිමත් කරයි.

ප්‍රාදේශීය අපනයන මධ්‍යස්ථාන ශක්තිමත් කිරීම

ජාතික අපනයන වර්ධනය උදෙසා ප්‍රාදේශීය මධ්‍යස්ථානවල ඇති වැදගත්කම හඳුනා ගනිමින් සහ එය ජාතික අවධානය සමඟ අනුගත විය යුතු අත්‍යවශ්‍ය පියවරක් ලෙස සලකමින්, අපනයන ආශ්‍රිත මෙහෙයුම් හසුරුවන කාර්ය මණ්ඩලයේ ධාරිතා සංවර්ධනය සඳහා බැංකුව ප්‍රමුඛත්වය ලබා දුන්නේය. ක්‍රමවත් පුහුණු වැඩසටහන්, වැඩමුළු සහ අඛණ්ඩ වෘත්තීය සංවර්ධන මූලපිරීම් හරහා, අපනයන මූල්‍යකරණය, නියාමන අනුකූලතාව සහ ජාත්‍යන්තර වෙළඳ පිළිවෙත් පිළිබඳ වැඩි දියුණු කළ දැනුමෙන් සේවකයින් සන්නද්ධ කරන ලදී.

මෙම මූලපිරීම් මගින් ව්‍යාපාර සඳහා කාර්යක්ෂම අපනයන මූල්‍ය විසඳුම් ලබා දෙන අතරම, නිවැරදි තොරතුරු මත පදනම් වූ උපදේශන සේවා සැපයීමට බැංකුවට ඇති හැකියාව ශක්තිමත් කර ඇත.

වෙළඳ මූල්‍ය ව්‍යාපාරය ව්‍යාප්ත කිරීම

වෙළඳ මූල්‍ය කටයුතු පුළුල් කිරීම සහ නව ව්‍යාපාරික අවස්ථා හඳුනා ගැනීම අරමුණු කරගත් ඉලෙක්කගත අලෙවිකරණ මුලපිරීම් සහ වැඩිදියුණු කළ සේවක දිරිගැන්වීමේ රාමුව අබණ්ඩව පවත්වාගෙන යාම කෙරෙහි බැංකුව අවධානය යොමු කළේය.

ක්‍රියාකාරී ගනුදෙනුකාර සම්බන්ධතාවය, උපායමාර්ගික හවුල්කාරිත්වයන් සහ ගැලපෙන මූල්‍ය විසඳුම් හරහා, ජාත්‍යන්තර ව්‍යාපාරික ගනුදෙනුවල වර්ධනයට සහාය වන අතරම, වෙළඳ මූල්‍ය වෙළඳපොළ තුළ සිය පැවැත්ම ශක්තිමත් කිරීමට මෙම අංශය අබණ්ඩව කටයුතු කළේය.

ප්‍රධාන ජයග්‍රහණ

විශිෂ්ට සේවා සැපයීම, මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ ආයතනික සංවර්ධනය සඳහා වූ සිය කැපවීම විදහා දක්වමින්, 2025 වසර තුළ ජාත්‍යන්තර බැංකු අංශය සුවිශේෂී සන්ධිස්ථාන කිහිපයක් සපුරා ගැනීමට සමත් විය.

විශිෂ්ට සේවා සැපයීම සහ ව්‍යාපාරික පරිමාව ඉහළ නැංවීම

කාලීන, කාර්යක්ෂම සහ ගැලපෙන බැංකු විසඳුම් ලබා දීමේ අරමුණින්, ක්‍රියාවලීන් වැඩිදියුණු කිරීම සහ ගනුදෙනුකරුවන් කේන්ද්‍ර කරගත් මූලපිරීම් හරහා සේවා ප්‍රමිතීන් ඉහළ නැංවීමට මෙම අංශය අබණ්ඩව කටයුතු කළේය. ස්ථාපිත කරන ලද උසස් සේවා ගුණාත්මකභාවය සහ සේවා සැපයුම් ස්ථානවල වැඩිදියුණු කළ සේවාවන් සමඟින්, විශේෂයෙන්ම එක් දිනක් තුළ ණයවර ලිපි (LC) නිකුත් කිරීමේ පහසුකම හඳුන්වා දීම හේතුවෙන්, එම වසරේ වාහන ආනයන මෙන්ම අනෙකුත් ආනයන සඳහා වූ වෙළඳපල කොටසෙහි සැලකිය යුතු දායකත්වයක් ලබා දීමට බැංකුවට හැකි විය.

අභ්‍යන්තර ධාරිතා වර්ධනය

ශාඛා මට්ටමින් වෙළඳ මූල්‍ය විශේෂඥභාවය ශක්තිමත් කිරීමේ කැපවීමට අනුකූලව, බැංකුවේ සියලුම කලාපවල ශාඛා ජාලය පුරා සිටින විශාල සේවක පිරිසක් සඳහා සේවාස්ථ පුහුණු වැඩසටහන් (on-the-job training) මෙම අංශය විසින් පවත්වන ලදී. එමඟින් වෙළඳ මූල්‍ය නිෂ්පාදන, ජාත්‍යන්තර බැංකු පටිපාටි සහ නියාමන අවශ්‍යතා පිළිබඳව ඔවුන් සතු දැනුම ඉහළ නැංවීමට කටයුතු කරන ලදී.

ISO 9001:2015 ප්‍රති-සහතිකකරණය

ජාත්‍යන්තර ගුණත්ව ප්‍රමිතීන් සහ මෙහෙයුම් විශිෂ්ටත්වය සඳහා වන සිය අබණ්ඩ අනුකූලතාව විදහා දක්වමින්, ජාත්‍යන්තර බැංකු අංශය සිය වෙළඳ සේවා සඳහා වන වාර්ෂික සත්‍යාපනය හරහා ISO 9001:2015 ප්‍රති-සහතිකකරණය සාර්ථකව ලබා ගැනීමට සමත් විය. ගෝලීය වශයෙන් පිළිගත් මෙම සහතිකය මඟින් ශක්තිමත් ගුණත්ව කළමනාකරණ පද්ධති, මෙහෙයුම් විශිෂ්ටත්වය සහ ඉහළ මට්ටමේ ගනුදෙනුකාර සේවාවන් පවත්වාගෙන යාම සඳහා එම අංශයේ ඇති කැපවීම නැවත තහවුරු කරයි. එමෙන්ම සේවා සැපයීමේදී සහ ක්‍රියාවලි කළමනාකරණයේදී ගෝලීය හොඳම පිළිවෙත් අනුගමනය කිරීමට බැංකුව සතු අභිප්‍රාය මෙයින් නැවතත් සහතික කෙරේ.

අභියෝග ජය ගනිමින් ශක්තිමත් වීම

තීව්‍ර වන තරඟකාරිත්වය, දැඩි නියාමන අවශ්‍යතා සහ සාර්ව ආර්ථිකයට බලපෑ දේශීය හා ජාත්‍යන්තර බාධාවන් මධ්‍යයේ වුවද, ජාත්‍යන්තර බැංකු අංශය සිය මෙහෙයුම් ඔරොත්තු දීමේ හැකියාව සහ විශ්වාසදායක කාර්යසාධනය ඉතා ශක්තිමත් මට්ටමක පවත්වා ගැනීමට සමත් විය. මෙම අංශය මූල්‍යමය වශයෙන් මෙන්ම දැනුම බෙදාහදා ගැනීම මඟින් ද ගනුදෙනුකරුවන් සන්නද්ධ කිරීමට අබණ්ඩව කටයුතු කළ අතර, ජාතික ආර්ථිකයට ද අර්ථවත් දායකත්වයක් ලබා දුන්නේය.

විදේශ විනිමය අස්ථාවරත්වය, විකාශනය වන නියාමන රාමු, ගෝලීය වෙළඳ ගැටලු, භූ-දේශපාලනික අවිනිශ්චිතතාවන්, ශ්‍රම හිඟය සහ ප්‍රධාන වරායවල් හා සැපයුම් මධ්‍යස්ථානවල මෙහෙයුම් කටයුතු අඩාල වීම ඇතුළු බාහිර බලපෑම් රැසක් මඟින් ජාත්‍යන්තර බැංකු ක්ෂේත්‍රයේ ස්වභාවය තීරණය වේ. මෙම සාධක ක්ෂේත්‍රය පුරා වෙළඳ ගලා ඒම සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව කෙරෙහි අබණ්ඩව බලපෑම් කරයි.

මහා පරිමාණ විදේශ සංක්‍රමණ හේතුවෙන් සම්පත්වල සැලකිය යුතු අඩුවීමක් පැවතියද, ජාත්‍යන්තර බැංකු අංශය ඉහළ සේවා ප්‍රමිතීන් පවත්වා ගනිමින්, අර්බුදයට පෙර පැවති මට්ටමට සමාන ගනුදෙනු ප්‍රමාණයක් සාර්ථකව කළමනාකරණය කළේය. අපගේ කාර්ය මණ්ඩලයේ නොපසුබට උත්සාහය නිසා මෙම දුෂ්කර කාර්යය ගනුදෙනුකරුවන් තෘප්තිමත් කරන ප්‍රයත්නයක් බවට පත් කිරීමට හැකි විය.

ක්‍රියාවලීන් ප්‍රතිනිර්මාණය කිරීම මඟින්, මෙහෙයුම් විධිමත් කිරීමට සහ ඉහළ සේවා ප්‍රමිතීන් පවත්වා ගැනීමට අනෙකුත් ඒකක සමඟ එක්ව කාලානුරූපී පරාමිතීන් (time-bound parameters) මෙම අංශය විසින් සකස් කරන ලදී. සිදුවන වෙනස්කම් සහ ඒවාට බලපාන මූලික හේතු (root cause analysis) අබණ්ඩව විශ්ලේෂණය කිරීම හරහා, ලැබෙන සහ යවනු ලබන සියලුම ගනුදෙනුවල ගුණාත්මකභාවය සහ කාලීන බව වැඩිදියුණු කිරීම සඳහා ජාත්‍යන්තර බැංකු අංශය සිය ක්‍රියාවලීන් තවදුරටත් පිරිපහදු කළේය.

2026 සඳහා ඉදිරි දැක්ම

ගෝලීය වාණිජ්‍යයේ නිරත ව්‍යාපාරවල විකාශනය වන අවශ්‍යතා සපුරාලීම් සඳහා වෙළඳ මූල්‍ය හැකියාවන් ශක්තිමත් කිරීම, මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සහ තරඟකාරී මෙන්ම ගැලපෙන මූල්‍ය විසඳුම් ලබා දීම කෙරෙහි බැංකුව අබණ්ඩව අවධානය යොමු කරනු ඇත.

ඩිජිටල් පරිවර්තනය හරහා ක්‍රියාවලීන් ප්‍රශස්ත කිරීමටත්, බැංකුවේ සේවා සැපයීම සැලකිය යුතු ලෙස ශක්තිමත් කිරීම සඳහා ක්‍රියාකාරීව ගනුදෙනුකරුවන් සම්බන්ධ කර ගැනීමටත් මෙම අංශය කටයුතු කරනු ඇත. ඒ සමඟම, මැනිය හැකි කාර්යක්ෂමතා ප්‍රතිලාභ අත්පත් කර ගැනීමටත්, මෙහෙයුම්, පාලනය සහ ගනුදෙනුකාර අත්දැකීම් හරහා ජාත්‍යන්තර හොඳම පිළිවෙත් ඉතා උද්‍යෝගයෙන් අන්තර්ගත කිරීමටත් අපි පියවර ගන්නෙමු.

යහපත් වෙමින් පවතින සාර්ව ආර්ථික තත්ත්වයන්, ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ සහ වර්ධනය වන ආයෝජක විශ්වාසය යන සාධකවල සහාය ඇතිව, ජාත්‍යන්තර වෙළඳාමේ තිරසාර වර්ධනයට පහසුකම් සලසන අතරම ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට සහාය වීම සඳහා අර්ථවත් කාර්යභාරයක් ඉටු කිරීමට මහජන බැංකුව සූදානම්න් සිටී.

තොරතුරු තාක්ෂණය සහ ඩිජිටල් බැංකුකරණය

බැංකුවේ පරිවර්තනීය ගමනේ පදනම වන්නේ තාක්ෂණයයි. එමඟින් අපගේ සියලුම පාර්ශ්වකරුවන්ට තිරසාර වටිනාකමක් ලබා දීම සඳහා ව්‍යාපාරික මෙන්ම මෙහෙයුම් කාර්යයන් සක්‍රීය කරයි. බාධාවකින් තොර, සුරක්ෂිත සහ පහසුවෙන් ප්‍රවේශ විය හැකි බැංකු සේවාවක් ලබා දීම සඳහාත්, ගනුදෙනුකාර අත්දැකීම අලුතින් අර්ථකථනය කරමින් විශිෂ්ටත්වය සලකුණු කිරීම සඳහාත් අපි අතිනවීන තාක්ෂණය සහ ඩිජිටල් වේදිකාවන් වෙනුවෙන් ආයෝජනය කළෙමු.

අපගේ අවධානය

ඩිජිටල් පදනම ශක්තිමත් කිරීම, අනුකූලතාව ඉහළ නැංවීම සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම කෙරෙහි අපි අවධානය යොමු කළෙමු. සියලුම තාක්ෂණික මුලපිරීම් හරහා ශක්තිමත් පාලන සංස්කෘතියක් ඇති කිරීම සඳහා කැපවූ ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලයක් (PMO) පිහිටුවන ලදී. විනයගරුක ක්‍රියාත්මක කිරීම, ශක්තිමත් අවදානම් කළමනාකරණය සහ උපායමාර්ගික අරමුණු සමඟ අනුගත වීම යන කරුණුවලදී ප්‍රධාන ගාමක බලවේගයක් ලෙස නැඟී එමින්, දැඩි මුදල් විශුද්ධිකරණ විරෝධී (AML) පද්ධතියක් ඇතුළු අනුකූලතා සහ අවදානම් කළමනාකරණ ව්‍යාපෘති කිහිපයක් සාර්ථකව නිම කිරීමට බැංකුවට හැකි විය. ගෝලීය හොඳම පිළිවෙත්වලට අනුකූලව සහ නියාමන කාලසීමාවන්ට බොහෝ කලකට පෙර SWIFT MX පණිවිඩ ප්‍රමිතීන් සමඟ බැංකුව කලින්ම අනුගත වීම සඳහා අප සතු සහජ තාක්ෂණික විශිෂ්ටත්වය මග පෙන්වන ලදී.

අපගේ උපායමාර්ගය

තාක්ෂණික සහ ඩිජිටල් විශිෂ්ටත්වය සඳහා වූ අපගේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා, අපි ප්‍රධාන මුලපිරීම් තුනක් ක්‍රියාත්මක කළෙමු.



මූලික ගෙවීම් යටිතල පහසුකම් නවීකරණය කිරීම

ඩිජිටල් පරිවර්තනය සහ කාර්ය ප්‍රවාහ ස්වයංක්‍රියකරණය වේගවත් කිරීම

තොරතුරු තාක්ෂණය සහ ඩිජිටල් බැංකුකරණය

ශක්තිමත් මානව ප්‍රාග්ධන කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම


යටිතල පහසුකම් නවීකරණය කිරීම

යටිතල පහසුකම් නවීකරණය කිරීම ප්‍රධාන උපායමාර්ගික අරමුණක් ලෙස පවතින අතර, එහි පරිමාණය (scalability), ආරක්ෂාව සහ මෙහෙයුම් ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම සඳහා සන්ධිස්ථාන කිහිපයක් සපුරා ගන්නා ලදී. තිරසාර වර්ධනය, වේගවත් සේවා සැපයීම, වැඩිදියුණු කළ ආරක්ෂාව සහ ක්ලවුඩ් කම්පියුටින් (cloud computing) හා කෘතිම බුද්ධිය මත පදනම් වූ විශ්ලේෂණ (AI-driven analytics) වැනි නැගී එන තාක්ෂණයන් සමඟ ඒකාබද්ධ වීම සඳහා බැංකුව මනා ස්ථාපිත මට්ටමක පවතී.

SD-WAN	වැඩිදියුණු කළ ගනුදෙනුකාර අත්දැකීමක් සඳහා ක්ලවුඩ් සේවාවන් වෙත බාධාවකින් තොරව ප්‍රවේශ වීම.
අතථ්‍යකරණ (Virtualisation) පරාසය පුළුල් කරමින් කන්ටේනරයිස්ඩ් (Containerized) යටිතල පහසුකම් ස්ථාපිත කිරීම	නවෝත්පාදනය සහ වෙළඳපොළට හඳුන්වා දීමේ කාලය (time-to-market) සඳහා තීරණාත්මක වන මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ වේගවත් ක්‍රියාත්මක කිරීමේ චක්‍ර ලබා දීම.
අතිනවීන ආරක්ෂක මෙහෙයුම් මධ්‍යස්ථානය (SOC) සහ ජාල මෙහෙයුම් මධ්‍යස්ථානය (NOC)	තථ්‍ය කාලීන නිරීක්ෂණය, තර්ජන හඳුනා ගැනීම සහ සක්‍රීය ජාල සෞඛ්‍ය කළමනාකරණය හරහා ව්‍යාපාරික අඛණ්ඩතාව සහ නියාමන අනුකූලතාව සහතික කිරීම. SOC මගින් සයිබර් අවදානම් අවම කිරීමට උසස් විශ්ලේෂණ සහ තර්ජන බුද්ධිය භාවිතා කරන අතර, භධක මගින් ප්‍රශස්ත ජාල ක්‍රියාකාරිත්වය සහ පවතින බව සහතික කරයි.
දත්ත මධ්‍යස්ථාන යටිතල පහසුකම් යාවත්කාලීන කිරීම	උසස් තර්ජන හඳුනා ගැනීම සහ වංචා වැළැක්වීම හරහා ගනුදෙනුකාර දත්ත සහ ගනුදෙනු ආරක්ෂා කිරීම. ජාල විභාජනය සහ (zero-trust) ව්‍යුහය මගින් ප්‍රශ්නකාරී අවස්ථා අවම කිරීම.
Lanka GovPay වේදිකාව සමඟ ඒකාබද්ධ වීම	රජයේ ගෙවීම් කටයුතු සඳහා.
QR කේත ගෙවීම් ක්‍රියාකාරිත්වය	සෘජු සම්බන්ධතාවයකින් තොර (contactless) ගෙවීම් අත්දැකීමක් සඳහා.
දත්ත ආරක්ෂාව ඉහළ නැංවීම	උසස් සංකේතනය (encryption) සහ බහු-සාධක සත්‍යාපනය (multi-factor authentication).
අනාවැකි විශ්ලේෂණ මත පදනම් වූ දර්ශක පුවරු	පුද්ගලීකරණය කළ අවබෝධයන්, මූල්‍ය ලකුණු සහ සක්‍රීය අනතුරු ඇඟවීම් ලබා දීම මගින් තම මූල්‍ය තත්වය පිළිබඳව නිවැරදි තීරණ ගැනීමට ගනුදෙනුකරුවන්ට සහාය වීම.

අවදානම් කළමනාකරණය සඳහා වන මෙවලම්

ඵලදායී අවදානම් කළමනාකරණයක මූලික පදනම බවට වේගයෙන් පත්වෙමින් පවතින උසස් විශ්ලේෂණ (advanced analytics), තථ්‍ය කාලීන බුද්ධිය සහ ක්ලවුඩ් ආශ්‍රිත ව්‍යුහයන්, දත්ත මත පදනම් වූ තීරණ ගැනීමටත්, විකාශනය වන නියාමන ප්‍රමිතීන්ට අනුකූල වීම සඳහා නැගී එන තර්ජන වඩාත් නිවැරදිව හා වේගයෙන් හඳුනා ගැනීමටත් බැංකුවට සහාය විය. සංකීර්ණ අවස්ථාවන්හිදී නිවැරදිභාවය ළඟා කර ගැනීමටත්, ඒ හරහා ඔරොත්තු දීමේ හැකියාව ඇති කර ගනිමින් සයිබර් තර්ජන වළක්වා ගැනීමටත් අපි මෙවලම් කිහිපයක් ක්‍රියාත්මක කළෙමු. තොරතුරු මත පදනම් වූ තීරණ ගැනීම සඳහා උසස් තත්ත්වයේ දත්ත කට්ටල ලබා දෙන උසස් දත්ත විශ්ලේෂණ සහ ශක්තිමත් දත්ත ගබඩා කිරීමේ (data warehousing) පද්ධති ස්ථාපිත කිරීමේදී අපි සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇත්තෙමු.



ඩිජිටල් සලකුණ ව්‍යාප්ත කිරීම

ශ්‍රී ලංකා මහ බැංකුවේ ඩිජිටල් බැංකුකරණ මගපෙන්වීම්වලට පූර්ණ ලෙස අනුගත වෙමින්, ජාතික ඩිජිටල් ආර්ථිකය සහ මුදල් රහිත ගෙවීම් මුලපිරීම් සඳහා සහාය දක්වමින්, බැංකුවේ ඩිජිටල් බැංකුකරණ උපායමාර්ගය ප්‍රධාන සේවා සැපයුම් මාර්ගයක් ලෙස අපි ප්‍රතිස්ථාපනය කළෙමු. බැංකුවේ ඩිජිටල් දැක්ම ඉදිරියට ගෙනයාම සඳහාත්, එහි ඩිජිටල් සලකුණ ව්‍යාප්ත කරමින් නවෝත්පාදන විසඳුම් ලබා දීම සඳහාත් ඩිජිටල්කරණ දෙපාර්තමේන්තුව පිහිටුවන ලදී. ජංගම දුරකථන මූලික කරගත් (mobile-first), කඩදාසි රහිත සහ ශාඛා මගින් සහාය දක්වන ඩිජිටල් ආකෘතීන් සඳහා ප්‍රමුඛත්වය ලබා දෙමින්, විවිධ මට්ටම්වල ඩිජිටල් සාක්ෂරතාවක් සහිත අපගේ ගනුදෙනුකාර පදනමට ප්‍රවේශය සහතික කිරීම සඳහා අපි අපගේ සේවාවන් පුළුල් කළෙමු. සුරක්ෂිත, විශ්වසනීය සහ පරිශීලක-හිතකාමී ඩිජිටල් වේදිකාවන් හරය කර ගනිමින්, 2025 වසරේදී සමස්ත ගනුදෙනුකාර අත්දැකීම සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව අපි ඉහළ නැංවූයෙමු.

ඩිජිටල්කරණය යනු මූල්‍ය අන්තර්කරණයේ අත්‍යවශ්‍ය අංගයක් වන අතර, එය රජයේ ප්‍රමුඛතාවයක් වන බැවින් බැංකුවේ ද උපායමාර්ගික ප්‍රමුඛතාවයක් වේ. සන්නිවේදන සම්බන්ධතා සඳහා පවතින බාධක ජය ගැනීමටත්, දිවයින පුරා ජනතාවගේ ජීවිත සහ ජීවනෝපායන් ස්පර්ශ කරමින් අපගේ සේවාවන් ව්‍යාප්ත කිරීමටත් අපි බහුවිධ ප්‍රවේශයක් අනුගමනය කළෙමු.



ස්ථාවරත්වය, පරිමාණය කළ හැකි බව (Scalability) සහ 24/7 ඩිජිටල් බැංකු සේවා පවතින බව සහතික කිරීම

- සියලුම ඩිජිටල් බැංකු පද්ධති සඳහා ඉහළ කාර්යක්ෂමතාවයකින් යුතු (high-availability) යටිතල පහසුකම් ක්‍රියාත්මක කිරීම.
- 24/7 සේවා පවතින බව සහතික කිරීම සඳහා අඛණ්ඩ පද්ධති සහ ගනුදෙනු නිරීක්ෂණය.
- ගනුදෙනුකරුවන්ට සිදුවන බලපෑම අවම කිරීම සඳහා පාලනය කරන ලද වෙනස්කම් සහ පද්ධති නිකුත් කිරීම් කළමනාකරණය.
- ඩිජිටල් සේවා මාර්ග සඳහා ආපදා ප්‍රතිසාධන (disaster recovery) විධිවිධාන ශක්තිමත් කිරීම.

සන්ධිස්ථාන


- People's Wave (ජංගම බැංකුකරණය) සහ People's Web (අන්තර්ජාල බැංකුකරණය) සේවාවන් ව්‍යාප්ත කිරීම.
- ක්ෂණික ගෙවීම්, QR ගනුදෙනු සහ වෙළඳ ගෙවීම් පිළිගැනීම සඳහා People's Pay සේවාව ශක්තිමත් කිරීම.
- ඩිජිටල් ක්‍රමයට ගනුදෙනුකරුවන් ලියාපදිංචි කිරීම (digital onboarding), e-KYC සහ අන්තර්ජාලය හරහා සේවා ඉල්ලීම් කිරීමේ පහසුකම් හඳුන්වා දීම.
- ඩිජිටල් සම්බන්ධතාව සහ ගනුදෙනුකාර අන්තර්ක්‍රියා සඳහා People's Wyn සේවාව අඛණ්ඩව වැඩිදියුණු කිරීම.
- ජාතික ගෙවීම් සහ පියවීම් පද්ධති සමඟ අන්තර් ක්‍රියාකාරිත්වය ඉහළ නැංවීම.

ගනුදෙනුකරුවන් සේවාවන් වැළඳ ගැනීමේ ප්‍රවණතාව

ඩිජිටල් බැංකුකරණය සඳහා ලියාපදිංචි වූ සහ ක්‍රියාකාරී පරිශීලකයින් සංඛ්‍යාව ස්ථාවර වර්ධනයක් වාර්තා කළ අතර, ඒ හේතුවෙන් මුදල් හුවමාරු කිරීම්, බිල්පත් ගෙවීම් සහ QR ගෙවීම් යන අංශවල ගනුදෙනු සංඛ්‍යාව සහ වාර ගණන ඉහළ ගියේය. මෙම වර්ධනය සිල්ලර, වැටුප් ලබන, විශ්‍රාමික සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක (SME) පරිශීලකයින් අතර පැහැදිලිව දක්නට ලැබුණු අතර, ශාඛා මගින් ලබා දුන් ලියාපදිංචි කිරීමේ සහාය හේතුවෙන් ග්‍රාමීය සහ අර්ධ නාගරික ප්‍රදේශවලට වඩාත් පුළුල් ලෙස මෙම සේවාවන් ව්‍යාප්ත කිරීමට හැකි විය. මෙය ශාඛා මගින් සිදු කරන ගනුදෙනු වෙනුවට ඩිජිටල් බැංකු ස්වයං-සේවා වෙත යොමුවීමේ වෙනසක් පෙන්නුම් කරන අතර, මෙම වේදිකාවන්හි ව්‍යාප්තිය සහ අදාළත්වය තවදුරටත් තහවුරු කරයි.

ඩිජිටල් තාක්ෂණයෙන් සක්‍රීය කළ නිෂ්පාදන, සේවා සහ පහසුකම්

සියලුම ගනුදෙනුකාර සේවා මධ්‍යස්ථාන හරහා ලබා ගත හැකි, ඩිජිටල් ලෙස ප්‍රවේශ විය හැකි නිෂ්පාදන සමූහයක් අපි ලබා දුන්නෙමු.



කාර්ය ප්‍රවාහ ස්වයංක්‍රීයකරණය

ගිණුම් ආරම්භ කිරීම, සේවා ඉල්ලීම් සහ මෙහෙයුම් තහවුරු කිරීම් ස්වයංක්‍රීය කිරීම හරහා අපි ඩිජිටල් බැංකු මෙහෙයුම් විධිමත් කළෙමු. එමඟින් ස්වයංක්‍රීය නොවන ක්‍රියාවලීන් සහ භෞතික ලේඛන අවශ්‍යතාවය සැලකිය යුතු ලෙස අඩු විය. මෙම ස්වයංක්‍රීයකරණයන් මඟින් සේවා සැපයීමට ගතවන කාලය (turnaround times) අවම වූ අතර සේවාවේ ඒකාකාරී බව පවත්වා ගැනීමට පහසු විය. පද්ධතිමය පාලනයන් හරහා විගණන පථ (audit trails) ශක්තිමත් වූ අතර එය පාලන ප්‍රමිතීන් තවදුරටත් තහවුරු කළේය. මේ සියල්ලේ ඒකාබද්ධ ප්‍රතිඵලයක් ලෙස සියලුම ඩිජිටල් බැංකු ක්‍රියාවලීන්හි මෙහෙයුම් අවදානම අවම වූ අතර කාර්යක්ෂමතාව සහ විශ්වසනීයත්වය ඉහළ නැංවීමට හැකි විය.

ඩිජිටල් වංචා කළමනාකරණය

අපගේ ඩිජිටල් බැංකු පද්ධතියේ (ecosystem) සුරක්ෂිතතාව සහ ඔරොත්තු දීමේ හැකියාව හරහා තථ්‍ය කාලීන ගනුදෙනු නිරීක්ෂණය, වැඩිදියුණු කළ වංචා හඳුනා ගැනීම සහ සිදුවීම්වලට ප්‍රතිචාර දැක්වීමේ යාන්ත්‍රණයන් ශක්තිමත් කරන ලදී. නිතිපතා සිදුකරන පද්ධති සමාලෝචන සහ විස්තීර්ණ සයිබර් ආරක්ෂණ ඇගයීම් මඟින් පද්ධතිවල විශ්වසනීයත්වය තවදුරටත් ඉහළ නැංවීය. ඉලක්කගත ගනුදෙනුකාර දැනුවත් කිරීමේ වැඩසටහන් මඟින් ආරක්ෂිත ඩිජිටල් බැංකුකරණ පුරුදු ප්‍රවර්ධනය කරන ලදී.

දත්ත විශ්ලේෂණය සහ පාලනය

2025 වසරේදී අප ක්‍රියාත්මක කළ බොහෝ වැඩිදියුණු කිරීම් මඟින් දත්ත මත පදනම් වූ තීරණ ගැනීම සඳහා අප සතු හැකියාවන් ශක්තිමත් විය. ගනුදෙනුකාර හැසිරීම් සහ ප්‍රවණතා අඛණ්ඩව නිරීක්ෂණය කිරීම සහ විශ්ලේෂණය කිරීම මඟින් මෙහෙයුම් අවබෝධයන් (operational insights) ජනනය වූ අතර, එය මතු වන සහ විකාශනය වන ගනුදෙනුකාර අවශ්‍යතා සඳහා නිෂ්පාදන සහ සේවා සංවර්ධනය කිරීමට සහාය විය.

ගනුදෙනුකාර දත්ත ආරක්ෂා කිරීම අපගේ ව්‍යවස්ථාපිත වගකීමක් ලෙස සලකා, දත්ත පරිශීලනය සඳහා දැඩි පාලනයන් සහ පෞද්ගලිකත්ව ආරක්ෂණ විධිවිධාන ස්ථාපිත කරන ලදී. එමඟින් ගනුදෙනුකාර තොරතුරු සදාචාරාත්මක සහ වගකීම් සහගත ලෙස හැසිරවීම සහතික කෙරේ.

කුසලතා වර්ධනය සහ පුහුණුව

ගනුදෙනුකරුවන් සඳහා වන ඩිජිටල් සේවාවන් ඉහළ නංවන අතරම, අපගේ මානව ප්‍රාග්ධනය සඳහා විස්තීර්ණ පුහුණුවක් ලබා දීම හරහා අභ්‍යන්තර හැකියාවන් ශක්තිමත් කිරීමට ද අපි කටයුතු කළෙමු. එමඟින් ඔවුන් ඵලදායී ඩිජිටල් මැදිහත්කරුවන් ලෙස බලගන්වන ලද අතර, ගනුදෙනුකරුවන්ට මඟ පෙන්වීමට සහ බැංකුවේ "ඩිජිටල්-පළමුව" (digital-first) සංස්කෘතිය තවදුරටත් තහවුරු කිරීමට ඔවුහු දායක වෙති.

අභියෝග



ඩිජිටල්කරණය යනු විවාදයකින් තොරව අත්‍යවශ්‍ය සාධකයක් වන අතර, තාක්ෂණික විපර්යාසයන් සමඟ එය තවදුරටත් විකාශනය වනු ඇත. එබැවින්, වර්තමාන සහ අනාගත බැංකු ක්ෂේත්‍රය තුළ ඒ හා බැඳුණු සහජ අවදානම් සහ අභියෝග ඉහළ යාමට නියමිතය.


සයිබර් ආරක්ෂණ තර්ජන, විශේෂයෙන්ම zero-day සහ advanced persistent threats (APTs), තීරණාත්මක තර්ජන ලෙස අපි හඳුනා ගන්නා අතර ඒවා අවම කිරීම සඳහා සක්‍රීය උපායමාර්ග අවශ්‍ය වේ. බැංකුවේ තීරණාත්මක යටිතල පහසුකම් ආරක්ෂා කර ගැනීම සඳහා අඛණ්ඩ නිරීක්ෂණය, වේගවත් ප්‍රතිචාර දැක්වීමේ හැකියාවන් සහ උසස් තර්ජන බුද්ධිය (advanced threat intelligence) අත්‍යවශ්‍ය වේ.

මූල්‍ය ආයතන ඉලක්ක කරගනිමින් සිදුකරන ransomware සහ phishing (වංචනික ලෙස තොරතුරු ලබා ගැනීම) ප්‍රහාර ප්‍රධාන වශයෙන් ඉහළ ගොස් ඇත.

සයිබර් ආරක්ෂණ සහ ක්ලවුඩ් වෘත්තිකයන්ගේ හෝලිය හිඟය හේතුවෙන් පවතින ගැටලු තවත් උග්‍ර වී ඇති අතර, එය බැංකුවේ සුරක්ෂිත පද්ධති පුළුල් කිරීමේ හැකියාවට ද බාධාවක් වී ඇත. දක්ෂ තොරතුරු තාක්ෂණ කාර්ය මණ්ඩලයක් රඳවා තබා ගැනීම ඉහළ පිරිවැයක් සහිත ආයෝජනයක් වුවද, එය අනිවාර්ය අවශ්‍යතාවයකි. පූර්ණ රාජ්‍ය සතු ආයතනයක් ලෙස බැංකුවට ලබා දිය හැකි පාරිශ්‍රමික පැකේජයන්හි (remuneration packages) සීමාවක් පවතී.

යල් පැන ගිය පද්ධති (legacy systems) අකාර්යක්ෂම හෝ අනාරක්ෂිත වීම නිසා තාක්ෂණය අභාවයට යාමේ (obsolescence) ගැටලුව මතු වන අතර, තරඟකාරිව රැඳී සිටීම සඳහා බැංකුව අවම පිරිවැයකින් සිය නවීකරණ කටයුතු අඛණ්ඩව කරගෙන යා යුතුය.

මූල්‍ය අන්තර්කරණය සහ ග්‍රාමීය ප්‍රජාවන් වෙත බැංකු සේවා ව්‍යාප්ත කිරීමත් සමඟ ප්‍රහාරයන්ට නිරාවරණය විය හැකි පරාසය (attack surface) සැලකිය යුතු ලෙස ඉහළ යන බැවින්, පද්ධතියේ ඔරොත්තු දීමේ හැකියාව සහ ගනුදෙනුකාර දත්තවල ආරක්ෂාව සහතික කිරීම සඳහා අන්ත ලක්ෂ්‍ය ආරක්ෂාව (endpoint protection) සහ විසිරුණු පරිසරයන් පුරා තථ්‍ය කාලීන නිරීක්ෂණ යාන්ත්‍රණයන් අවශ්‍ය වේ.



2026 සඳහා ඉදිරි දැක්ම

බැංකුවේ තාක්ෂණික සහ ඩිජිටල් පරිවර්තනය තවදුරටත් වේගවත් කිරීමට සහ මෙම ක්ෂේත්‍රයේ බැංකු අංශය තුළ එහි නායකත්වය තහවුරු කිරීම සඳහා, 2026 වසරේදී ක්‍රියාත්මක කිරීමට නියමිත උපායමාර්ගික අරමුණු සමූහයක් අපි සකස් කර ඇත්තෙමු. මෙම අරමුණු, මූල්‍ය අන්තර්කරණය සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය (SME) සංවර්ධනය සම්බන්ධයෙන් වන රජයේ වැඩපිළිවෙළට සහාය වන අතරම, උසස් ගනුදෙනුකාර අත්දැකීමක් ලබා දීමේ බැංකුවේ දැක්ම සමඟ සමීපව බැඳී පවතී.

අපගේ ඩිජිටල් ණය පහසුකම් තවදුරටත් පුළුල් කිරීමටත්, ජංගම බැංකුකරණය කෙරෙහි අවධානය යොමු කරමින් අන්තර්ජාල බැංකු සේවා අත්දැකීම ශක්තිමත් කිරීමටත් අපි සැලසුම් කර ඇත්තෙමු. මෙම උත්සාහයන් ජාතික ඩිජිටල් අනන්‍යතාව සහ ගෙවීම් පද්ධති (payment ecosystems) සමඟ ශක්තිමත්ව ඒකාබද්ධ වනු ඇත.

තවද, මෙම පද්ධතිය වඩාත් ශක්තිමත්, අනාගතයට සූදානම් මෙන්ම විකාශනය වන ගනුදෙනුකාර අවශ්‍යතා සහ නියාමන අපේක්ෂාවන් සමඟ අනුකූල වන බව සහතික කිරීම සඳහා අපි සයිබර් ආරක්ෂණය, මෙහෙයුම් ඔරොත්තු දීමේ හැකියාව සහ ඩිජිටල් නවෝත්පාදන සඳහා අඛණ්ඩව ආයෝජනය කරන්නෙමු.

ණයපත්

ණයපත් භාවිතයේ දක්නට ලැබෙන ශීඝ්‍ර වර්ධනය මගින් මුදල් රහිත ගනුදෙනු සඳහා සමාජයේ ඇති වෙමින් පවතින වැඩි කැමැත්ත සහ පහසුවෙන් මුදල් ලබාගැනීමේ අවශ්‍යතාවය තවදුරටත් තහවුරු වේ.

අපගේ අවධානය

වර්තමාන බැංකු ක්ෂේත්‍රය තුළ ඉලෙක්ට්‍රොනික ගනුදෙනු ප්‍රමුඛස්ථානයක් ගන්නා අතර, එහිදී ණයපත් සහ හරපත් පෙරමුණේ පසුවෙයි. පාරිභෝගික වියදම් සඳහා පහසුකම් සැලසීම, ව්‍යාපාරික මුදල් ප්‍රවාහයන් වැඩිදියුණු කිරීම සහ තාක්ෂණික නවෝත්පාදනයන් මෙහෙයවීම මගින් මේවා වෙළඳාමට පවතින බාධක ඉවත් කරමින් වෙළඳපොළවල් සහ ව්‍යාපාර විකිනෙකා හා සම්බන්ධ කරයි. බැංකුවේ පවතින දිවයින පුරා විහිදුණු ජාලය සහ උසස් ඩිජිටල් මෙවලම් භාවිත කරමින්, බැංකුවේ ණයපත් මධ්‍යස්ථානය මූල්‍ය අන්තර්කරණය සඳහා වන මෙහෙයුමේ අත්‍යවශ්‍ය කොටසක් ලෙස ක්‍රියා කළේය.

අපගේ අවධානය සහ උපායමාර්ගය

නිකුත් කරන ලද ණයපත් සංඛ්‍යාව ඉහළ නැංවීමට සහ වෙළඳපොළේ අනෙකුත් තරඟකරුවන් සමඟ සාර්ථකව තරඟ කරමින් වෙළඳපොළ කොටස වර්ධනය කර ගැනීම සඳහා ණයපත් මධ්‍යස්ථානය සිය ශාඛා ජාලය පදනම් කරගත් විකුණුම් උපායමාර්ගයක් අනුගමනය කරයි. ආයෝජන කළඹ වර්ධනය කිරීමේ උපායමාර්ගයේ කොටසක් ලෙස, සාමාන්‍ය ණයපත් දීමනාවලට අමතරව අධ්‍යාපනය, සෞඛ්‍ය සේවා සහ රක්ෂණ වැනි ප්‍රධාන වියදම් කාණ්ඩ සඳහා වසර පුරා ක්‍රියාත්මක වන වාරික ගෙවීමේ ක්‍රම බැංකුව විසින් ලබා දෙයි. එමගින් ගනුදෙනුකරුවන් නිරන්තරයෙන් මහජන බැංකු ණයපත් භාවිත කිරීමට දිරිමත් කරනු ලබයි. ආයෝජන කළඹේ වර්ධනය සහ ණයපත් භාවිතය තවදුරටත් ඉහළ නැංවීම සඳහා බැංකුව "ඕනෑම තැනකින් ඕනෑම දෙයක් මිලදී ගන්න" (Buy Anything Anywhere) උපායමාර්ගය අනුගමනය කර ඇත. එමඟින් ගනුදෙනුකරුවන්ට පුළුල් පරාසයක වෙළඳ ආයතන හරහා තම කාඩ්පත් භාවිතා කිරීමට අවස්ථාව සැලසෙන අතරම වෙළඳපොළ තුළ බැංකුවේ පවතින ස්ථානය තවදුරටත් ශක්තිමත් වේ. සන්නාමකරණ සහ අලෙවිකරණ දෘෂ්ටිකෝණයෙන් බලන කල, පීපල්ස් කාඩ් වෙළඳපොළ දැනුවත්භාවය වැඩි කිරීමටත්, ඉහළ ආදායම් ලබන ගනුදෙනුකාර කොටස් අතර සන්නාමය උපායමාර්ගිකව ස්ථාපිත කිරීමටත් සාප්පු සංකීර්ණ ආශ්‍රිත ප්‍රවර්ධන වැඩසටහන් සහ වෙළඳ ව්‍යාපාරික ප්‍රචාරණ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යනු ලබයි.

ප්‍රධාන විශේෂතා

ණයපත් කළඹ **23%** කින් ව්‍යාප්ත විය

ණයපත් ගනුදෙනු **33%** කින් ඉහළ ගියේය

දෙසැම්බර් 31 දිනට	2025	2024	2023	2022	2021
හිඟ ණයපත් ශේෂයන් (රුපියල් මිලියන)	10,805.0	8,812.2	6,576.7	5,539.6	4,303.4

නිෂ්පාදන පරාසය

බැංකුවේ නිෂ්පාදන පරාසය සකස් කර ඇත්තේ වගකීම් සහගත ණය දීම පදනම් කරගනිමින්, සහනදායී ණය පහසුකම් ලබා දීම සඳහාය. සම්ප්‍රදායික අලෙවිකරණ කටයුතුවලට අමතරව, බැංකුවේ ඩිජිටල් නවෝත්පාදනයන් හරහා සිදුකළ විස්තීර්ණ අලෙවිකරණ (through-the-line/TTL) ප්‍රයත්නයන් මේ සඳහා තවදුරටත් සහායක් විය.

පීපල්ස් වීසා ක්ලැසික්/මාස්ටර් කාඩ් ක්ලැසික් ණයපත	රුපියල් 99,000 දක්වා වූ උපරිම ණය සීමාවක් ලබා දෙයි.
මහජන බැංකු වීසා ගෝල්ඩ්/මාස්ටර් කාඩ් ගෝල්ඩ් ණයපත	රුපියල් 100,000 – රුපියල් 199,000 අතර ණය සීමාවක් ලබා දෙයි.
පීපල්ස් වීසා ප්ලැටිනම්/මාස්ටර් කාඩ් ප්ලැටිනම්	රුපියල් 200,000 – රුපියල් 595,000ක ණය පහසුකමක් ලබා දෙයි.
පීපල්ස් වීසා සිග්නේචර්/මාස්ටර් කාඩ් වර්ල්ඩ් කාඩ්	දේශීය හා ජාත්‍යන්තර වශයෙන් විවිධ ප්‍රතිලාභ රාශියක් පිරිනමන අතර, අවම වශයෙන් රුපියල් 600,000ක ණය පහසුකමක් සහිත වේ.
මහජන බැංකු එලිගන්ස් වීසා ඉන්ෆිනිටි ණයපත	ප්‍රිමියම් ගමන් බිමන් ආශ්‍රිත ප්‍රතිලාභ සමඟ පුද්ගලීකරණය කළ සේවාවන්හි නව ප්‍රමිතියක් ස්ථාපිත කරයි. මෙම නිෂ්පාදනයේ ආයතනික ණයපත් සංස්කරණය මඟින් ව්‍යාපාරික වියදම් සම්බන්ධ මිණුම්දණ්ඩක් ලෙස ක්‍රියා කරමින්, ආයතනික වියදම් පාලනය කිරීමට සහ තථ්‍ය කාලීනව වියදම් කළමනාකරණය කිරීමට සමාගම්වලට අවස්ථාව සලසා දෙයි.

නව නිෂ්පාදන හඳුන්වා දීම්

1. මාර්තු මාසයේ යෙදෙන ජාත්‍යන්තර කාන්තා දින සැමරුමට සමගාමීව වනිතා වාසනා ණයපත හඳුන්වා දීම.
2. ජූනි මාසයේ යෙදෙන ජාත්‍යන්තර සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක දින සැමරුමට සමගාමීව SME ව්‍යාපාරික ණයපත හඳුන්වා දීම.

ප්‍රවර්ධන වැඩසටහන්

ප්‍රවර්ධන අන්තර්ගතයන් සහ සමූහ අලෙවිකරණ ව්‍යාපාරයන් (mass-marketing campaigns) තථ්‍ය කාලීනව ව්‍යාප්ත කිරීම මඟින් කාලෝචිත, පුළුල් පරාසයක සම්බන්ධතාවක් ඇති කර ගැනීමට සහ ප්‍රවර්ධන වැඩසටහන් සඳහා වන ප්‍රතිචාරාත්මක බව වැඩිදියුණු කිරීමට හැකි විය.

මාසය	විශේෂ ප්‍රවර්ධන වැඩසටහන්
මාර්තු	වනිතා වාසනා ණයපත හඳුන්වා දීමේ ප්‍රවර්ධන වැඩසටහන
මාර්තු	හැව්ලොක් සිටි මෝල් ප්‍රවර්ධන වැඩසටහන
මාර්තු-අප්‍රේල්	අලුත් අවුරුදු ප්‍රවර්ධන වැඩසටහන
මැයි	මව්වරුන්ගේ දින ප්‍රවර්ධන වැඩසටහන
ජූලි-අගෝස්තු	කැන්ඩි සිටි සෙන්ටර් ප්‍රවර්ධන වැඩසටහන
අගෝස්තු	ලිබර්ටි ප්ලාසා ප්‍රවර්ධන වැඩසටහන – Mini POS හඳුන්වා දීම
ඔක්තෝබර්	හැව්ලොක් සිටි මෝල් – HCM 2 වන සංවත්සර ප්‍රවර්ධන වැඩසටහන
දෙසැම්බර්	උත්සව සමය වෙනුවෙන් වූ ප්‍රවර්ධන වැඩසටහන්

වෙළඳ ගනුදෙනු පියවීමේ ව්‍යාපාරය

අපගේ ව්‍යාපාරික හවුල්කාර ප්‍රජාවට සහාය වීම සඳහා, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරික (SME) ප්‍රජාවගේ මූල්‍ය අන්තර්කරණය ශක්තිමත් කිරීමේ අරමුණින් අපි Mini POS වෙළඳ විසඳුමක් හඳුන්වා දුන්නෙමු.

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සවිබල ගැන්වීම සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය (SME) සහ ක්ෂුද්‍ර මූල්‍ය අංශ සංවර්ධනය කිරීමේ රජයේ වැඩපිළිවෙළට සහාය වීම මෙහි අරමුණයි.

2026 සඳහා ඉදිරි දැක්ම

ශ්‍රී ලංකාවේ පුළුල් ඩිජිටල්කරණ වැඩපිළිවෙළට සහාය වෙමින් සහ පුරවැසියන් අතර මූල්‍ය අන්තර්කරණය ප්‍රවර්ධනය කරමින්, පීපල්ස් කාඩ් සිය ණයපත් ව්‍යාපාරය ප්‍රාදේශීය වෙළඳපොළවල් දක්වා ව්‍යාප්ත කිරීමට අපේක්ෂා කරයි. මෙම ප්‍රවේශය ජනතාවගේ මූල්‍ය සාක්ෂරතාවය ඉහළ නැංවීමටද දායක වනු ඇත.

වර්ධනය වේගවත් කිරීම සඳහාම වෙන් වූ ණයපත් විකුණුම් කණ්ඩායමක් යෙදවීම හරහා බැංකුව සිය ණයපත් කළඹ ශක්තිමත් කිරීමට සැලසුම් කරයි. මෙම උපායමාර්ගය මඟින් වඩාත් ඉහළ ආදායම් ලබන ගනුදෙනුකාර කොටස් ආකර්ෂණය කර ගැනීමටත්, සමස්ත කාඩ්පත් හිමියන්ගේ සංඛ්‍යාව තවදුරටත් වර්ධනය කිරීමටත් බලාපොරොත්තු වේ.

මීට අමතරව, බාධාවකින් තොර සහ උසස් ගනුදෙනුකාර අත්දැකීමක් සහතික කරමින්, නවතම තාක්ෂණික නවෝත්පාදනයන් පීපල්ස් ණයපත් සහ ගෙවීම් පද්ධති සමඟ ඒකාබද්ධ කිරීමට බැංකුව අවධානය යොමු කරනු ඇත.

නව යොවුන් වියේ පසුවන්නන්ගේ සහ තරුණ පරම්පරාවේ රුචිකත්වයන්, හැසිරීම් සහ මූල්‍ය අවශ්‍යතා හඳුනාගෙන, ඒ අනුව සකස් කළ නිෂ්පාදන සහ සේවාවන් මඟින් ඔවුන්ව බැංකුව වෙත ආකර්ෂණය කර ගැනීමට විශේෂ අවධානයක් යොමු කෙරෙනු ඇත.

අයකරගැනීම්

විනයගරුක හා විධිමත් ක්‍රියාවලියක් ඔස්සේ මෙහෙයවනු ලබන බැංකුවේ අයකිරීම් අංශය (Recoveries Department), බැංකුවේ වත්කම්වල ගුණාත්මකභාවය පවත්වා ගැනීමේ අවශ්‍යතාවය සහ ණය අයකර ගැනීමේදී අනුගමනය කළ යුතු මානුෂීය ප්‍රවේශය මැනවින් ඒකාබද්ධ කරයි. බැංකුවේ ඩිජිටල් පරිවර්තනය මෙම අයකිරීම් ක්‍රියාවලියේ අත්‍යවශ්‍ය අංගයක් වන අතර, දත්ත පදනම් කරගත් ප්‍රමුඛතා හඳුනාගැනීම (Data-driven prioritisation) මඟින් ගනුදෙනුකරුවන් සමඟ කල්තියා සම්බන්ධ වීමට අවස්ථාව සැලසේ. මෙය තිරසාර ණය ලබාදීම සම්බන්ධ අපගේ කැපවීම තහවුරු කරන අතරම, මූල්‍ය අන්තර්ගතභාවය (Financial Inclusion) යන අරමුණ සාක්ෂාත් කර ගැනීමට ද මහඟු පිටිවහලක් වේ.

අපගේ අවධානය

කලාප 25ක් පුරා විසිරී ඇති හිඟ ශේෂයන් අවම කිරීම සහ බැංකුවේ දළ අක්‍රිය ණය (NPL) ශේෂය අඩු කිරීම කෙරෙහි බැංකුව සිය අවධානය යොමු කළේය.

උපායමාර්ග

බැංකුව විසින් ක්‍රියාත්මක කළ ණය අයකර ගැනීමේ වැඩපිළිවෙළේදී රුපියල් මිලියන 25ට අඩු ණය සාකච්ඡා කර බේරුම් කිරීමට කටයුතු කෙරිණි. එම ණය මුදල් වෙනුවෙන් සිදුකරන දේපළ වෙන්දේසි කිරීම් 2025 දෙසැම්බර් 31 දක්වා නතර කළ අතර, මිලියන 25ට වැඩි ණය ගැන වෙන වෙනම සලකා බලා පියවර ගන්නා ලදී. එමෙන්ම "දිට්වා" සුළි කුණාටුවෙන් පීඩාවට පත් ජනතාවට සහනයක් ලෙස ඔවුන්ගේ ණය ගෙවීමට ලබාදෙන කාලය වැඩි කිරීමටත්, ණය වාරික අලුතින් සකස් කර දීමටත් බැංකුව පියවර ගත්තේය

විශේෂ කරුණු

අක්‍රිය ණය (NPL) අඩු කිරීම – ශාඛා ජාලය	ඉලක්කය ඉක්මවා ගිය කපා හරින ලද ණය අයකර ගැනීම්	අක්‍රිය ණය (NPL) අඩු කිරීම – සමස්ත බැංකුව
රු. බිලියන 1.3	**රු. මිලියන 39**	**රු. බිලියන 2.4**

පැරණි ණය අයකර ගැනීමේ (Legacy loan) සැලකිය යුතු ප්‍රගතියක් ඇත.

2025 වසර පුරා අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලද ණය ප්‍රතිසාධන ප්‍රයත්නයන් හේතුවෙන් ණය කළඹේ ගුණාත්මකභාවය (Portfolio quality) සැලකිය යුතු ලෙස වර්ධනය විය. බැංකුවේ මෙහෙයුම් දිවයින පුරා ව්‍යාප්තව පවතින පසුබිමක, කලාප 25න් 18කම පවතින ණය ශේෂයන් රුපියල් බිලියන 1.3කින් අඩු කර ගැනීමට හැකි වීම විශේෂත්වයකි. එය වසර ආරම්භයේ පැවති ශේෂයන්ට සාපේක්ෂව 6%ක අඩුවීමකි. එමෙන්ම, ශාඛා ජාලයේ සහ ආයතනික බැංකු අංශයේ (Corporate Banking Division) සාමූහික කැපවීම මත දළ අක්‍රිය ණය (Gross NPL) ශේෂය රුපියල් බිලියන 2.4කින් (3%කින්) අවම කර ගැනීමට හැකි වීම කැපී පෙනෙන ජයග්‍රහණයකි."

අර්බුද හමුවේ පාරිභෝගික කේන්ද්‍රීයභාවය

බැංකුවේ මූල්‍ය ස්ථාවරත්වයට දායක වීම අප අංශයේ මූලික අරමුණ වුවද, සුළි කුණාටුවෙන් පසු උදා වූ දුෂ්කර කාලසීමාව තුළ අපගේ පාරිභෝගිකයන්ට කාලෝචිත සහන සැලසීමට එය බාධාවක් නොවීය. එහිදී, ණය ආපසු ගෙවීමේ කාලය දීර්ඝ කිරීම ඇතුළු ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ පහසුකම් සංයුක්ත පොලියකින් (Compound Interest) තොරව ලබා දීමට අපි කටයුතු කළෙමු.

දෙසැම්බර් 31 දක්වා රුපියල් මිලියන 25 ට අඩු ණය සඳහා Parate ක්‍රියාමාර්ගය ක්‍රියාත්මක කිරීමට අවස්ථාව නොතිබුණද, අයකර ගැනීමේ බලපෑම අවම කරනු පිණිස බැංකුව විසින් සාකච්ඡාමය එකඟතාවන් සහ අනෙකුත් සහන පිරිනමන ලදී.

2026 සඳහා ඉදිරි දැක්ම

අප අංශයේ මූලික ඉලක්කය වන්නේ සුහදශීලී හා ඵලදායී ලෙස ණය පියවීමේ ක්‍රියාවලියේදී පාරිභෝගිකයාට අවශ්‍ය සහාය ලබා දීමයි. ඒ අනුව, අයකර ගැනීමේ කාර්යයන් ස්වයංක්‍රීය කිරීමට සහ වාර්තාකරණ පහසුකම් හඳුන්වා දීම සඳහා ණය ප්‍රතිසාධන පද්ධතිය (Debt Recovery Module) වැඩිදියුණු කිරීමට සැලසුම් කර ඇත.

එමෙන්ම, ණය පියවීම් පැහැර හරින අතිශය දුෂ්කර අවස්ථාවන්හිදී (Non-debt-servicing), ඇපයට තබා ඇති චංචල හෝ නිශ්චල දේපළවල වටිනාකම මුදල් බවට පත් කර ගැනීමේ හැකියාව (Realisability) පිළිබඳව අවධානයක් යොමු කරමින්, ණය අනුමත කරන බලධාරීන් සමඟ සමීප සම්බන්ධීකරණයෙන් කටයුතු කිරීමට ද අපේක්ෂිතය.



අලෙවිකරණය

බැංකුව, ගනුදෙනුකරුවන් සහ අනෙකුත් පාර්ශ්වකරුවන් (Stakeholders) සමඟ සම්බන්ධ කිරීමේ වගකීම අලෙවිකරණ අංශය සතු වන අතර, එහිදී සම්බන්ධතාවයට ගැලපෙන ආකාරයෙන් වෙළඳ නාමයේ දැක්ම ගොඩනැගීමට ප්‍රමුඛතාවයක් ලබා දෙයි. අංශයේ මෙම කැපවීම බැංකුවේ සෑම අංශයක් කරාම විහිදී පවතින අතර, එය තිරසාර මූල්‍ය ක්‍රියාකාරීත්වයක් අත්කර ගැනීම සඳහා සුවිශේෂී දායකත්වයක් සපයයි.


අපගේ අවධානය

අපගේ අලෙවිකරණ පණිවිඩ සියලුම තරාතිරම්වල පාරිභෝගිකයන්ට තේරුම් ගත හැකි සහ ඔවුන්ට සමීප වන අයුරින් ඉදිරිපත් කිරීමට අපි කටයුතු කළෙමු. බැංකුව පිළිබඳ නාමය පාරිභෝගිකයාගේ මතකයේ රැඳෙන ප්‍රධානතම සන්නාමය බවට පත් කරන අතරම, දිගුකාලීන පැවැත්මක් සඳහා වෙළඳපල අවශ්‍යතා අනුව අපගේ සන්නාමයේ ලක්ෂණ වෙනස් කිරීමට අපි පියවර ගත්තෙමු.

උපායමාර්ග

2025 වසරේදී, මහජන බැංකුවේ පුළුල් පරිවර්තන ක්‍රියාවලියට (Transformation agenda) ශක්තියක් වෙමින්, විපර්යාසයට ලක්වන වෙළඳපල ප්‍රවණතා හා පාරිභෝගික අපේක්ෂාවන්ට අනුකූලව සන්නාමය ප්‍රතිස්ථාපනය (Repositioning) කිරීමට අලෙවිකරණ අංශය සුවිශේෂී දායකත්වයක් ලබා දුන්නේය. දැඩි තරඟකාරී වාතාවරණයක් තුළ, බැංකුවේ දිගුකාලීන වර්ධනය, ඩිජිටල් ප්‍රවේශය සහ ගනුදෙනු වටිනාකම ඉහළ නැංවීමේ ප්‍රධාන බලවේගය වන වයස 18-45 කාණ්ඩය අතර බැංකුවේ සන්නාම සබඳතාව ශක්තිමත් කිරීම කෙරෙහි අපගේ මූලික අවධානය යොමු විය.

තාක්ෂණික නායකත්වය (Technological Leadership), ජාතිකත්වය පිළිබඳ අවධාරණය (Nation-Mindedness), විශිෂ්ට පාරිභෝගික අත්දැකීම (Superior Customer Experience) යන ප්‍රධාන සන්නාම කුළුණු (Brand pillars) තුනක් මත පදනම් වූ මෙම උපායමාර්ගික අවධානය මඟින් සියලුම අලෙවිකරණ වැඩසටහන් මෙහෙයවමින් සන්නාමයේ පැහැදිලිකම, ස්ථාවරත්වය සහ දිගුකාලීන අනන්‍යතාවය (Brand differentiation) සහතික කරන ලදී.



අදාලත්වය

ඒකාබද්ධ අලෙවිකරණය හරහා ඉහළ බලපෑමක් ඇති කිරීම

පාරිභෝගික මනසේ ප්‍රමුඛතම සන්නාමය බවට පත්වීම

සන්නාමයේ විශ්වාසය සහ ආයතනික ගෞරවය ශක්තිමත් කිරීම

ඉලක්කගත සන්නිවේදනය හරහා සන්නාම වටිනාකම ඉහළ නැංවීම

දත්ත මත පදනම් වූ තීරණ ගැනීම සහ වෙළඳපල බුද්ධි තොරතුරු භාවිතය

අලෙවිකරණ විශිෂ්ටත්වය සඳහා තාක්ෂණය උපයෝගී කර ගැනීම

පාරිභෝගික මනසේ ප්‍රමුඛතම සන්නාමය බවට පත්වීම

2025 වසරේදී ද පාරිභෝගික මනසේ ප්‍රමුඛතම සන්නාමය (Top-of-mind) ලෙස පවතින දැනුවත්භාවය ශක්තිමත් කිරීම අපගේ මූලික අරමුණක් විය. සාම්ප්‍රදායික මෙන්ම ඩිජිටල් මාධ්‍යයන් ද ඇතුළත් ඒකාබද්ධ බහු-නාලිකා ප්‍රචාරණ මෙහෙයුම් හරහා දිවයින පුරා ඉහළ සන්නාම දෘශ්‍යතාවක් (Brand visibility) පවත්වා ගැනීමට බැංකුව සමත් විය.

මෙම ප්‍රයත්නයන් හේතුවෙන් පුළුල් පරාසයක විහිදුණු පාරිභෝගිකයන්ගේ මූල්‍ය තේරීම් අතර මුල්තැන ලෙස මහජන බැංකුව අඛණ්ඩව රැඳී සිටි අතර, ශ්‍රී ලංකාවේ වඩාත්ම විශ්වාසදායක සහ හඳුනාගත හැකි සන්නාමයක් ලෙස බැංකුව සතු ස්ථානය තවදුරටත් තහවුරු විය.

ඉලක්කගත සන්නිවේදනය හරහා සන්නාම සබඳතාව ශක්තිමත් කිරීම

සන්නාමයේ දෘශ්‍යතාව (Visibility) තහවුරු කිරීමට පමණක් සීමා නොවී, නිශ්චිත පාරිභෝගික කාණ්ඩයන්ට ගැලපෙන අර්ථවත් සහ කාලෝචිත සන්නිවේදනයක් ලබා දීමට අංශය ප්‍රමුඛත්වය ලබා දුන්නේය. පාරිභෝගික ජීවන රටාවන්, අභිලාෂයන් සහ මූල්‍ය අවශ්‍යතා සමඟ සමීපව ගැලපෙන පරිදි අලෙවිකරණ ව්‍යාපාර සැලසුම් කළ අතර, එමඟින් පාරිභෝගික සබඳතා ශක්තිමත් කරමින් සේවාවන් ලබාගැනීමේ ප්‍රතිඵල (Conversion outcomes) ඉහළ නංවා ගැනීමට හැකි විය.

පාරිභෝගිකයන් සමඟ පවතින චිත්තවේගීය බැඳීම තවදුරටත් ගැඹුරු කිරීම සඳහා බැංකුවේ සමාජ වගකීම් (CSR) සහ ප්‍රජා සත්කාරක වැඩසටහන් උපායමාර්ගිකව යොදාගත් අතර, ඒ හරහා සාමූහික වර්ධනය සහ සමාජ ප්‍රගතිය උදෙසා කැපවුණු "ජාතිකත්වය අඟයන" මූල්‍ය ආයතනයක් ලෙස බැංකුවේ අනන්‍යතාවය තහවුරු විය.

අලෙවිකරණ විශිෂ්ටත්වය උදෙසා තාක්ෂණය උපයෝගී කර ගැනීම

වසර පුරා අලෙවිකරණ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා තාක්ෂණය ප්‍රධාන මෙවලමක් ලෙස භාවිත කරන ලදී. නිර්මාණශීලීත්වය, ඉලක්කගත නිරවද්‍යතාව, ප්‍රචාරණ මෙහෙයුම් ප්‍රශස්ත කිරීම සහ එක් එක් පාරිභෝගිකයාට ගැලපෙන සේවාවන් සැලසීම (Personalisation) උදෙසා අංශය විසින් ඩිජිටල් පද්ධති, දත්ත විශ්ලේෂණ සහ නවීන සන්නිවේදන මෙවලම් භාවිත කරන ලදී.

මෙම ප්‍රයත්නයන් අලෙවිකරණ ප්‍රතිඵල වර්ධනය කළා පමණක් නොව, පොදු වෙළඳපල තුළ ඩිජිටල් බැංකු විසඳුම් සඳහා පාරිභෝගික නැඹුරුව ඉහළ නැංවීම හරහා බැංකුවේ පුළුල් ඩිජිටල් පරිවර්තන ක්‍රියාවලියට ද සුවිශේෂී ශක්තියක් ලබා දුන්නේය

දත්ත පදනම් කරගත් තීරණගැනීම් සහ වෙළඳපල තීක්ෂණ අවබෝධය

විධිමත් පර්යේෂණ, සමීක්ෂණ සහ ප්‍රතිපෝෂණ ක්‍රමවේද (Feedback mechanisms) හරහා වෙනස් වන වෙළඳපල ප්‍රවණතා සහ පාරිභෝගික හැසිරීම් අවබෝධ කර ගැනීම කෙරෙහි දැඩි අවධානයක් යොමු කරන ලදී. මෙමගින් උකහා ගත් තීක්ෂණ අවබෝධය (Insights), වෙළඳපල තත්ත්වයන්ට අනුකූලව උපායමාර්ග ක්ෂණිකව වෙනස් කිරීමටත් (Agile), වඩාත් ක්‍රියාශීලී ලෙස ප්‍රතිචාර දැක්වීමටත් අංශයට ශක්තියක් විය.

මෙම දත්ත මත පදනම් වූ ප්‍රවේශය හේතුවෙන්, අලෙවිකරණ තීරණ හුදු උපකල්පන මත නොව නිශ්චිත සාක්ෂි හා අවබෝධය මත පදනම්ව ලබා ගැනීමට හැකි වූ අතර, එමඟින් කාර්යක්ෂමතාව මෙන්ම ඵලදායීතාව ද ඉහළ නැංවිණි.

ආයතනික සන්නාමය සහ ආයතනික විශ්වාසය ශක්තිමත් කිරීම

මූල්‍ය සේවාවන්හි දිගුකාලීන සාර්ථකත්වය රඳා පවතින්නේ විශ්වාසය සහ විශ්වසනීයත්වය (Trust and credibility) මත බව හඳුනා ගනිමින්, බැංකුවේ ආයතනික ප්‍රතිරූපය සහ සමස්ත සන්නාම ප්‍රතිරූපය (Brand perception) ඉහළ නැංවීම කෙරෙහි අංශය සිය අවධානය දැඩි ලෙස යොමු කළේය. නිෂ්පාදන පදනම් කරගත් ප්‍රචාරණ මෙහෙයුම්වලට අමතරව, බැංකුවේ සාරධර්ම, ස්ථාවරත්වය සහ ජාතික මෙහෙවර පිළිබඳ සන්නිවේදනය කිරීමට මෙහිදී වැඩි ප්‍රමුඛතාවක් ලබා දෙන ලදී.

මෙම ප්‍රවේශය හරහා මහජන බැංකුව යනු ශක්තිමත්, වගකිවයුතු සහ අනාගතයට ගැළපෙන ආයතනයක් ලෙස පවතින පිළිගැනීම තහවුරු වූ අතර, එය ගනුදෙනුකරුවන්, නියාමන ආයතන සහ පොදු ජනතාව ඇතුළු සියලුම පාර්ශ්වකරුවන්ගේ (Stakeholders) විශ්වාසය තවදුරටත් ශක්තිමත් කිරීමට හේතු විය.

ඒකාබද්ධ අලෙවිකරණය හරහා සුවිශේෂී බලපෑමක් ඇති කිරීම

ඒකාබද්ධ හා උපායමාර්ගිකව පෙළගැස්වූ ප්‍රවේශයක් අනුගමනය කරමින්, බැංකුවේ පරිවර්තනීය ගමන්මග සාර්ථක කර ගැනීමට අලෙවිකරණ අංශය සුවිශේෂී දායකත්වයක් ලබා දුන්නේය. එහිදී සන්නාමයේ දෘශ්‍යතාව ඉහළ නැංවීම, පාරිභෝගික සබඳතා ශක්තිමත් කිරීම, විශ්වසනීයත්වය තහවුරු කිරීම සහ ඩිජිටල් බැංකු සේවාවන් පුළුල් ලෙස ව්‍යාප්ත කිරීම (Digital adoption at scale) කෙරෙහි මූලික අවධානය යොමු විය.

මෙම ප්‍රයත්නයන් වෙළඳපල ප්‍රමුඛයෙකු, මූල්‍ය අන්තර්කරණයෙහි (Financial inclusion) පුරෝගාමියෙකු සහ ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රගතියේ විශ්වාසනීය හවුල්කරුවෙකු ලෙස මහජන බැංකුවේ ස්ථාවරය තවදුරටත් තහවුරු කළේය. එමෙන්ම, එය බැංකුවේ කාර්යසාධනය මෙන්ම උදාර පරමාර්ථයන්හි විශිෂ්ටත්වය ද මැනවින් විදහා දැක්වීමට සමත් විය.

අභියෝග

ඕනෑම ආකාරයක අස්ථාවරත්වයක් අලෙවිකරණ මෙහෙයුම් සඳහා අහිතකර ලෙස බලපෑ හැකිය. එමෙන්ම, විවිධ මාධ්‍යයන් තුළ පවතින තොරතුරු බහුලත්වය (Content-clutter) සහ එම මාධ්‍යයන් පිළිබඳව ඇති විය හැකි සෘණාත්මක ආකල්ප හේතුවෙන් බැංකුවේ සන්නිවේදන කටයුතුවල සඵලතාවය අඩුවීමට (Dilute) ඉඩ ඇත.

දිවයින පුරා විහිදුණු ශාඛා සහ සේවා මධ්‍යස්ථාන 746ක් පවතින පසුබිමක, ඕනෑම එක් ස්ථානයක ඇති වන සේවා ගැටලුවක් වුවද සමාජ මාධ්‍ය හරහා ඉතා ඉක්මනින් ප්‍රචලිත වීමේ අවදානමක් පවතී.

2026 සඳහා ඉදිරි දැක්ම

අපගේ පාරිභෝගික කළඹෙහි (Customer portfolio) සෑම තරාතිරමකටම ගැළපෙන සහ අදාළ වන පැහැදිලි පණිවිඩයක් ස්ථාවරව සන්නිවේදනය කිරීමට අපි කැපවී සිටින්නෙමු. බැංකුවේ සන්නිවේදන උපායමාර්ගයන්ට අනුකූල වන පරිදි ආයතනික සමාජ වගකීම් (CSR) ක්‍රියාකාරකම් ද වඩාත් විධිමත කිරීමද එහිදී තවදුරටත් සිදු කරනු ලැබේ. පරිශීලක හිතකාමී වෙබ් අඩවි සහ ජංගම යෙදුම් (Mobile app) හරහා පාරිභෝගික සබඳතා ශක්තිමත් කිරීම සඳහා කෘතිම බුද්ධිය (AI) උපරිම ලෙස උපයෝගී කර ගැනීමට අපේක්ෂිතය. සන්නාම දෘශ්‍යතාව ඉහළ නංවන අතරම, මෙම ප්‍රයත්නයන් පිරිවැය කළමනාකරණයට සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව (Operational efficiencies) වර්ධනය කිරීමට ද සෘජුවම දායක වනු ඇත.

ශාඛා මෙහෙයුම් කළමනාකරණය

අංගසම්පූර්ණ ශාඛා 352කින්, සේවා මධ්‍යස්ථාන 391කින් සහ පාරිභෝගික පහසුව සලසන විවිධ ඩිජිටල් නාලිකාවලින් සමන්විත බැංකුවේ ශාඛා ජාලය අධීක්ෂණය කිරීමේ වගකීම ශාඛා කළමනාකරණ අංශය (CMD) සතු වේ. ණය සහ අත්තිකාරම්, උකස් සේවා (Pawning) මෙන්ම තැන්පතු කළඹ ද මෙම අංශයේ ව්‍යාපාර විෂය පථයට ඇතුළත් වන අතර, ශක්තිමත් අවදානම් කළමනාකරණ රාමුවක් (Risk mitigated framework) තුළ විගණන සහ නියාමන අනුකූලතාවය සහතික කිරීමේ වගකීම ද එය ඉටුකරනු ලබයි.

අපගේ අවධානය

වේගවත් ඩිජිටල් පරිවර්තනය සහ ඩිජිටල් සන්ධිස්ථානය (Digital footprint) පුළුල් කරමින් බහු නාලිකාමය (Omni-channel) පාරිභෝගික අත්දැකීමක් නිර්මාණය කිරීමට අපි ප්‍රමුඛත්වය ලබා දුන්නෙමු. එමෙන්ම මූල්‍ය අන්තර්ගතභාවය (Financial inclusion) ශක්තිමත් කරනු පිණිස ශාඛා සහ නියෝජිතායතන ජාලය නවීකරණය කරන ලදී. ගුණාත්මක ණය සහ අත්තිකාරම් නිකුත් කිරීම සඳහා දියත් කළ දැඩි ප්‍රචාරණ මෙහෙයුම් හරහා 2025 වසරේ පැවති අතිරික්ත ද්‍රවශීලතාව කළමනාකරණය කරමින් ශක්තිමත් මූල්‍ය ස්ථාවරත්වයක් සහතික කිරීමට අපට හැකි විය.

උපායමාර්ග

විනයගරුක සහ ශක්තිමත් අවදානම් පාලන රාමුවක් (Risk governance framework) යටතේ, පවතින අතිරික්ත ද්‍රවශීලතාව ඉහළ ගුණාත්මකභාවයකින් යුත් ණය සහ අත්තිකාරම් සඳහා උපායමාර්ගිකව යෙදවීමට අපි ශාඛා ජාලය මෙහෙයවූවෙමු. නිෂ්පාදන සහ සේවා පිළිබඳ දැනුවත්භාවය ඉහළ නැංවීම සඳහා හඳුන්වා දුන් ඉලෙක්ට්‍රොනික අධ්‍යාපන පද්ධති හරහා සේවක සහභාගීත්වය සහ ගාස්තු පදනම් කරගත් ආදායම (Fee income) වර්ධනය වූ අතර, එය ශක්තිමත් ශේෂ පත්‍රයක් සහ අනාගතයට සූදානම් කණ්ඩායමක් ගොඩනැගීමට දායක විය. මීට අමතරව, ඉහළ ශුද්ධ වටිනාකමක් සහිත පාරිභෝගිකයන් (HNIs) වෙනුවෙන් ශාඛා මට්ටමින් කැපවූ සම්බන්ධතා නිලධාරීන්ගේ සේවය ලබා දීම හරහා හරස් විකුණුම් (Cross-sell) සාර්ථකත්වය සහ සේවා විශිෂ්ටත්වය තවදුරටත් වර්ධනය විය.



සේවා ගුණාත්මකභාවය සහ හැකියාව ඉහළනැංවීම

ගුණාත්මක ණය පහසුකම් හරහා ව්‍යාපාරික වර්ධනය

මෙහෙයුම් විශිෂ්ටත්වය සහ පාලන ව්‍යුහය ශක්තිමත් කිරීම

සේවා ගුණාත්මකභාවය සහ ඩිජිටල් පරිවර්තනය

සේවා තත්වය

මූල්‍ය අන්තර්කරණය

උපායමාර්ගික ප්‍රවේශයන්

පාරිභෝගික විශ්වාසය තහවුරු කිරීමට සහ මෙහෙයුම් අනාගතයට ගැළපෙන අයුරින් සකස් කිරීම සඳහා (future-proof), මූල්‍ය ඇතුළත් කිරීම්, ඩිජිටල් පරිවර්තනය සහ සේවා ප්‍රවේශ්‍යතාව ඒකාබද්ධ කළ අපගේ උපායමාර්ගික ඉලක්ක සපුරා ගැනීමට ප්‍රධාන මූලපිරීම් කිහිපයක් ක්‍රියාත්මක කෙරිණි.

ගුණාත්මක ණය දීම තුළින් ව්‍යාපාර වර්ධනය

ශාඛා මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් ගුණාත්මක ණය දීම සඳහා වූ අභිප්‍රේරණ වැඩසටහන ක්‍රියාත්මක කරන ලද අතර, එහි ප්‍රතිඵලයක් ලෙස අත්තිකාරම්වල රුපියල් බිලියන 156.5 ක ශුද්ධ වර්ධනයක් අත්කර ගැනීමට හැකි විය. මෙය පසුගිය වසරට සාපේක්ෂව 26.3% ක වර්ධනයකි. මෙහිදී ඉහළ කාර්යසාධනයක් සහිත ශාඛා ඇගයීමට ලක් කෙරුණු අතර, ණය ගුණාත්මකභාවය සහ ණය කළඹේ කාර්ය සාධනය ඉහළ නැංවීම සඳහා අඩු කාර්යසාධනයක් සහිත ඒකක වෙනුවෙන් ව්‍යුහගත පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.

මූල්‍ය ඇතුළත්කරණය

"අස්වැසුම" වැඩසටහන යටතේ බැංකුව ගිණුම් 115,000ක් විවෘත කළ අතර එය දිවයින පුරා සිටින සමස්ත ප්‍රතිලාභීන්ගෙන් 48%කට වැඩි වෙළඳපල කොටසක් නියෝජනය කරයි. 2023 දී වැඩසටහන ආරම්භ කළ දා සිට, බැංකුව දිවයින පුරා ඇති මුළු ගිණුම් 1,500,000න් ගිණුම් 843,518ක් විවෘත කර ඇති අතර, එමඟින් 56.23%ක වෙළඳපල කොටසක් ලබාගෙන ඇත. මෙම ප්‍රතිඵල මඟින් බැංකුවේ මෙහෙයුම් පරිමාණය සහ රට පුරා මූල්‍ය ඇතුළත් කිරීමේ ඉලක්ක ඉදිරියට ගෙන යාම සඳහා ඇති නොසැලෙන කැපවීම පෙන්නුම් කෙරේ

ඩිජිටල් පරිවර්තනය

ශ්‍රී ලංකාවේ බැංකු අංශයේ ඉහළම අගය සහිටුහන් කරමින්, ඩිජිටල් පාරිභෝගික විසඳුම් සඳහා වූ ලියාපදිංචිය මිලියන 5.3 ක සීමාව ඉක්මවා යන ලදී. අපගේ නිෂ්පාදන පෙළගැස්මට පුද්ගලික සහ ආයතනික ගනුදෙනුකරුවන් සඳහා ජංගම සහ අන්තර්ජාල බැංකුකරණය, ජංගම වොලට් යෙදුම (Mobile Wallet), කඩදාසි රහිතව (Paperless) ගිණුම් විවෘත කිරීම මෙන්ම මූලික බැංකු කටයුතු, ඩිජිටල් ගෙවීම්, වොලට් කළමනාකරණය සහ ඩිජිටල් පාරිභෝගික බඳවා ගැනීම් (Digital onboarding) ඇතුළත් වේ.

GOVPAY පද්ධතිය වැඩි වශයෙන් භාවිතයට ගැනීම තුළින් කාර්ය මණ්ඩල මැදිහත්වීම අවම වූ අතර, එය මෙහෙයුම් පිරිවැය ප්‍රශස්ත කරමින් මූල්‍යමය වාසියක් අත්කර ගැනීමට මග පෑදීය. සමස්තයක් වශයෙන්, මෙම ඩිජිටල් පරිවර්තනය මඟින් පාරිභෝගික තොරතුරුවල විනිවිදභාවය, නිරවද්‍යතාව, වේගය සහ ප්‍රවේශ්‍යතාව ඉහළ නංවන ලදී.

සේවා ප්‍රවේශය

GOVPAY පද්ධතිය හඳුන්වා දීම, චෙක්පත් තැන්පතු යන්ත්‍ර 76ක් අලුතින් ස්ථාපනය කිරීම සහ ATM ස්විචය නවීකරණය කිරීම යන පියවරයන් ඔස්සේ ගනුදෙනුවල වේගය, පහසුව, කාලෝචිතභාවය සහ සේවාවේ විශ්වසනීයත්වය විශාල වශයෙන් ඉහළ නැංවීමට හැකි විය.

මෙහෙයුම් විශිෂ්ටත්වය සහ පාලන තත්ත්වය ශක්තිමත් කිරීම

"සාමාන්‍යය ඉක්මවූ විශිෂ්ටත්වය" (Excellence Beyond Average) වැඩසටහන යටතේ, විගණන නිලධාරීන් සහ ශාඛා කාර්ය මණ්ඩලයේ ධාරිතාව වර්ධනය කිරීම මඟින් ශාඛා ජාලය පුරා විගණන ප්‍රමිතීන් සහ ක්‍රියා පටිපාටි ඉහළ නැංවීමට කටයුතු කෙරිණි. මීට සමගාමීව ක්‍රියාත්මක වූ "Streamline 2025" ප්‍රවේශය හරහා තොග කළමනාකරණය ප්‍රශස්ත බවට පත් කිරීම සහ භෞතික සම්පත් භාවිතය විධිමත් කිරීම සිදු වූ අතර, එමඟින් තවදුරටත් පිරිවැය කාර්යක්ෂමතාව මෙන්ම මෙහෙයුම් විශිෂ්ටත්වය ද වර්ධනය විය.

සේවා ගුණාත්මකභාවය සහ ශක්‍යතා ඉහළනැංවීම

සේවා අඩුපාඩු හඳුනා ගැනීම සඳහා හඬ සමීක්ෂණ (Voice Surveys) සහ අප්‍රකට පාරිභෝගික සමීක්ෂණ (Mystery Customer Surveys) පවත්වන ලදී. මෙමඟින් ලද අවබෝධය, සේවා වැඩිදියුණු කිරීම් අවශ්‍ය වූ ක්ෂේත්‍ර සඳහා විශේෂිත පුහුණු වැඩසටහන් පැවැත්වීමට රුකුලක් විය.

ශක්තිමත් වූ පාලනය, ඉහළ නැංවූ සේවා විශිෂ්ටත්වය සහ වේගවත් ඩිජිටල්කරණය තුළින් 2025 වසර ශාඛා මෙහෙයුම් දෙපාර්තමේන්තුවට සුවිශේෂී සන්ධිස්ථානයක් සනිටුහන් කළ වසරක් බවට පත් විය.

විශේෂ කරුණු

ඩිජිටල් පාරිභෝගික විසඳුම් ලියාපදිංචිය
මිලියන 5.3

අස්වැසුම ගිණුම් (2025 වන විට) (56.23% ක වෙළඳපොළ පංගුවක්)
843,518

2025 වසරේ විවෘත කළ නව අස්වැසුම ගිණුම්
115,000

ණය සහ අත්තිකාරම්වල පසුගිය වසරට සාපේක්ෂව (Y-o-Y) 26.3% ක වර්ධනයක් වාර්තාවේ.
රු. බිලියන 156.5

පාරිභෝගික සේවා සහායකයින් ලෙස බඳවාගත් නවක පිරිස
683

ගාස්තු ආදායම් වර්ධනය
21.3%

ශාඛා 352 සහ සේවා මධ්‍යස්ථාන 391

(CBD, OCS සහ ව්‍යාපාර පුනර්ජීවන ඒකක හැර)



තැන්පතු	ණය අත්තිකාරම් සහ වෙනත්
106% ඉල්ලුම්	උකස් 104%
110% ඉතිරිකිරීම්	නොපියවූ ණය (NPL) 100%
113% කාලීන	වෙනත් අත්තිකාරම් 112%
120% විදේශ විණිමය	ගාස්තු ආදායම 162%

මුළු වාර්ෂික ලාභදායීතාව (පැවරුම් මිලකරණයෙන් පසු) 113%

ඉතා කෙටි කාලයක් තුළ, සියලුම ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPIs) හි වාර්ෂික ඉලක්ක ඉක්මවා යාමට ශාඛා මෙහෙයුම් කළමනාකරණ අංශය සමත් විය.

ගනුදෙනුකරු කේන්ද්‍රීයභාවය

ඩිජිටල් තාක්ෂණයේ පහසුව සහ පුද්ගලීකරණය කළ සේවාවන්හි සුසංයෝගයෙන්, අපගේ ගනුදෙනුකරුවන් සමඟ අඛණ්ඩ සබඳතාවක් පවත්වා ගැනීමට අපි පියවර ගත්තෙමු. මේ සඳහා කැපවූ සම්බන්ධතා කළමනාකරුවන්, සෘජු අලෙවිකරණ ඇමතුම්, දක්ෂ ශාඛා නිලධාරීන්ගේ සේවය සහ සමාජ මාධ්‍ය ජාලයන් උපයෝගී කර ගැනුණි. බිළිඳු වියේ සිට ජ්‍යෙෂ්ඨ පුරවැසි විය දක්වා වූ සෑම වයස් කාණ්ඩයකටම අයත් ගනුදෙනුකරුවන්ගේ අනන්‍ය අවශ්‍යතා හඳුනා ගනිමින්, ඔවුන්ට වඩාත් සමීප වන සන්නිවේදන උපක්‍රම සහ මාධ්‍යයන් භාවිත කිරීමට අපි සැමවිටම උත්සුක වූවෙමු.

ඩිජිටල් ප්‍රවේශයට මුල්තැන (Digital First)

අපගේ විචක්ෂණශීලී සහ සහකම්පනයෙන් යුත් තීරණ ගැනීමේ හැකියාව "දිට්වා" (Ditwah) සුළි කුණාටුවෙන් පසු ඇති වූ තත්ත්වයේදී මනාව විදහා දැක්විණි. එහිදී විනාශයට පත් ප්‍රදේශවල පාරිභෝගිකයන් වෙත කඩිනමින් ළඟා වීම සඳහා අපි "ඩිජිටල් තාක්ෂණයට මුල්තැන දෙන" ප්‍රවේශයක් අනුගමනය කළෙමු. ශාඛා ජාලයේ සහාය ද ඇතිව, බලපෑමට ලක් වූ ප්‍රදේශ තුළ කාර්යක්ෂම සන්නිවේදනයක් පවත්වා ගැනීම සහ පංගම බැංකුකරණ පහසුකම් සැලසීම හරහා අත්‍යවශ්‍ය බැංකු සේවාවන්හි අඛණ්ඩ පැවැත්ම තහවුරු කිරීමට අපට හැකි විය. මෙය මහජන බැංකුව පිළිබඳ පාරිභෝගික විශ්වාසය තවදුරටත් ශක්තිමත් කළ අතර අපගේ විශ්වසනීයත්වය යළිත් වරක් තහවුරු කිරීමට සමත් විය.

නැවත ගොඩනැගීම උදෙසා කඩිනම් ණය පහසුකම්

සුළි කුණාටුවෙන් පසු සහන සැලසීමේ පියවරක් ලෙස, හානියට පත් දේපළ යළි ගොඩනැගීම සඳහා 3% ක සහන පොලී අනුපාතයක් යටතේ කඩිනම් ණය පහසුකම් පිරිනැමීමට අපි කටයුතු කළෙමු. විපතට පත් පාරිභෝගිකයින් දිරිමත් කිරීමටත්, රජයේ සහන වැඩපිළිවෙළවල් සමඟ අත්වැල් බැඳ ගැනීමටත් අවශ්‍ය තොරතුරු සහ දැනුවත් කිරීමේ පණිවිඩ බැංකුවේ නිල ෆේස්බුක් පිටුව ඇතුළු අනෙකුත් සමාජ මාධ්‍ය ජාල ඔස්සේ අඛණ්ඩව ප්‍රචාරය කරන ලදී.

පැමිණිලි කළමනාකරණ ක්‍රමවේදය

407
ලැබුණු පැමිණිලි

42
විසඳීම සඳහා පවතින පැමිණිලි

365
විසඳා අවසන් කළ පැමිණිලි

බැංකුවේ මධ්‍යගත පැමිණිලි කළමනාකරණ පද්ධතිය (CM) හරහා ලැබුණු පැමිණිලිවලට අදාළව "මූලික හේතු විශ්ලේෂණයන්" (Root-cause analysis) සිදු කිරීම මගින් අවශ්‍ය නිවැරදි කිරීමේ පියවර ගැනීමට සහාය විය. එමෙන්ම, පාරිභෝගික ප්‍රතිපෝෂණ ඔස්සේ ලබාගත් අවබෝධය, සේවා සපයන මාර්ග (Channels) වැඩිදියුණු කිරීමට, බැංකු නිෂ්පාදන සැලසුම් කිරීමට සහ සේවා ගුණාත්මකභාවය ඉහළ නැංවීමට ක්‍රමානුකූලව යොදා ගැනුණි.

පැමිණිලි කළමනාකරණය සහ ඒවා විසඳීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමන අවශ්‍යතා බැංකුව දැඩි ලෙස අනුගමනය කරයි. එම අවශ්‍යතා බැංකුවේ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටිවලට මනාව ඇතුළත් කර ඇති අතර, පැමිණිලි විසඳීමේ ප්‍රගතිය පිළිබඳ මාසික තත්ත්ව වාර්තාවක් අවදානම් කළමනාකරණ කමිටුව වෙත නිතිපතා ඉදිරිපත් කරනු ලැබේ.



පාරිභෝගික දත්ත සහ අවදානම් පාලනය

පාරිභෝගික දත්තවල රහස්‍යභාවය සුරක්ෂිත කිරීම සහ පාරිභෝගිකයින්ගේ නවීන අවශ්‍යතා සපුරාලීම වෙනුවෙන්, බැංකුවේ "දත්ත ආරක්ෂණ ප්‍රතිපත්තියට" අනුකූලව ජාල පද්ධති යාවත්කාලීන කිරීම, ඩිජිටල් පරිවර්තනය සහ කාර්ය මණ්ඩල පුහුණුව සඳහා ප්‍රමුඛතාවය ලබා දෙන ලදී. තොරතුරු තාක්ෂණ සහ තොරතුරු ආරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් තොරතුරු ආරක්ෂණ ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කළ අතර, එමගින් බැංකුවේ විශ්වසනීයත්වය පිළිබඳ පාරිභෝගික විශ්වාසය ඉහළ නැංවීමට හැකි විය. මීට අමතරව, ශක්තිමත් ද්විත්ව පාලන යාන්ත්‍රණ (Dual control mechanisms), දෑඩි විගණන ක්‍රියා පටිපාටි සහ නීතිපතා සිදුකරන පසු විපරම් හරහා ඵලදායී වංචා අවදානම් කළමනාකරණයක්, තත්‍ය කාලීන වාර්තාකරණයක් සහ ගැටලුවලට කඩිනම් විසඳුම් ලබා දීමක් තහවුරු කරන ලදී. 2025 වසරේදී දත්ත රහස්‍යභංග සිදුවීම් කිසිවක් වාර්තා වී නොමැත.

පාරිභෝගික සෞඛ්‍යය සහ ආරක්ෂාව

නියමිත ආරක්ෂක ප්‍රමිතීන්ට අනුකූල වීම සහතික කරමින්, මුළු ශාඛා ජාලය පුරාම නීතිපතා ආරක්ෂක විගණන සිදු කිරීම, ප්‍රමාණවත් සන්නද්ධ ආරක්ෂක සේවාවක් සහ CCTV ආරක්ෂක ආවරණයක් පවත්වාගෙන යාමට බැංකුව පියවර ගත්තේය.

අභියෝගාත්මක තත්ත්වයන් හමුවේ මෙහෙයුම් පවත්වා ගැනීම

2025 වසරේදී ඇති වූ "දිට්වා" (Ditwah) සුළි කුණාටුව හේතුවෙන් බැංකුවේ මෙහෙයුම් කටයුතුවලට දැඩි බාධා එල්ල විය. එසේ වුවද, බලපෑමට ලක් වූ ප්‍රදේශවල පැය 24 පුරා ක්‍රියාත්මක ශාඛා සේවා සහ ජංගම බැංකු ඒකක ස්ථාපිත කරමින්, සාමාන්‍ය බැංකු සේවා යථා තත්ත්වයට පත් කළ මුල්ම බැංකුව බවට පත්වීමට මහජන බැංකුවට හැකි වූ බව අපි සතුටින් දන්වා සිටිමු. අප සතු ප්‍රබල ඩිජිටල් තාක්ෂණික හැකියාවන් උපයෝගී කරගනිමින්, සුළි කුණාටුවෙන් පීඩාවට පත් පාරිභෝගිකයන් හට පහසුකම් සැලසීම සඳහා ඩිජිටල් පද්ධති සහ ATM සේවාවන් කඩිනමින් යළි ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නා ලදී.

2026 සඳහා ඉදිරි දැක්ම

ශුද්ධ ණය වර්ධනය (Net Loan Growth) කෙරෙහි අවධානය යොමු කරමින් උසස් තත්ත්වයේ ණය පහසුකම් පිරිනැමීම අපගේ ප්‍රමුඛතාවය වන අතර, ශාඛා මට්ටමේ අක්‍රිය ණය (NPL) අනුපාතය 2% ට වඩා අඩු මට්ටමක පවත්වා ගැනීමට අපේක්ෂා කෙරේ. මෙහෙයුම් කාර්යක්ෂමතාව තහවුරු කිරීම සඳහා විගණන, අවදානම් කළමනාකරණ සහ නියාමන අනුකූලතා ක්‍රියාවලීන් අඛණ්ඩව ඉහළ මට්ටමකින් පවත්වාගෙන යනු ඇත. පාරිභෝගික සේවාව තවදුරටත් ඉහළ නැංවීම සඳහා ශාඛා නවීකරණය, ඩිජිටල් සේවා මාර්ග පුළුල් කිරීම සහ ATM ස්වයං-සේවා පහසුකම් වඩාත් ප්‍රශස්ත කිරීම 2026 වසරේදී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

2025 වසරේදී බැංකුව වෙනුවෙන් විශිෂ්ට සේවාවක් ඉටුකළ, අප සතු මානව සම්පත දිරිමත් කිරීම සහ රඳවා ගැනීම වෙනුවෙන් "Achievers Awards" සම්මාන හඳුන්වා දීමටත්, කාර්ය මණ්ඩල පුහුණු හා කුසලතා සංවර්ධන වැඩසටහන් සඳහා සහාය වීමටත් ආයතනික කළමනාකාරිත්වය (CMD) කැපවී සිටියි.

මූල්‍ය ප්‍රාග්ධනය



ශ්‍රී ලංකාවේ දෙවන විශාලතම වාණිජ බැංකුව සහ රාජ්‍ය අංශයේ ප්‍රමුඛතම මූල්‍ය ආයතනයක් ලෙස, මහජන බැංකුවේ තිරසාර ඉදිරි ගමන තීරණය කරන ප්‍රධානතම සාධකය වන්නේ අප සතු "මූල්‍ය ප්‍රාග්ධනය වේ". 2025 වසරේදී, ක්‍රමවත් ශේෂ පත්‍ර කළමනාකරණය, ශක්තිමත් තැන්පතු පදනම, විචක්ෂණශීලී ණය ප්‍රතිපත්ති සහ ඉපැයීම්වල ගුණාත්මකභාවය අඛණ්ඩව වර්ධනය කර ගැනීම හරහා අපගේ මූල්‍ය ස්ථාවරත්වය තවදුරටත් ඉහළ නැංවීමට අපට හැකි විය. ජාතික මූල්‍ය පද්ධතියේ ප්‍රධාන පාර්ශ්වකරුවෙකු ලෙස, දේශීය ඉතුරුම් රැස්කිරීම සහ ඒවා රටේ සංවර්ධනයට දායක වන ඵලදායී අංශ වෙත යොමු කිරීමේ වගකීම අප ඉහළින්ම ඉටු කළෙමු. අපගේ මූල්‍ය ප්‍රාග්ධන උපායමාර්ගය ප්‍රධාන වශයෙන් පදනම් වී ඇත්තේ ප්‍රමාණවත් ප්‍රාග්ධන සංචිත පවත්වා ගැනීම සහ විවිධාංගීකරණය වූ අරමුදල් මූලාශ්‍ර හරහා ද්‍රවශීලතාව තහවුරු කිරීම මතය. මෙම සියලු ක්‍රියාවලීන් ශ්‍රී ලංකා මහ බැංකුවේ නීතිරීතිවලට සහ ජාත්‍යන්තර මූල්‍ය ප්‍රමිතීන්ට අනුකූලව ඉතාමත් විනිවිදභාවයකින් යුතුව සිදු කෙරේ. මෙවැනි ශක්තිමත් මූල්‍ය පදනමක් පවත්වා ගැනීම නිසා, ඕනෑම ආර්ථික අස්ථාවරත්වයකට සාර්ථකව මුහුණ දීමටත්, ජාතික ප්‍රමුඛතා සඳහා මූල්‍ය සහාය ලබා දෙමින් අපගේ ගනුදෙනුකරුවන්ට සහ කොටස් හිමියන්ට ඉහළ වටිනාකමක් ලබා දීමටත් බැංකුවට හැකි වී තිබේ.

අපගේ ප්‍රමුඛතාවය

විචක්ෂණශීලී මූල්‍ය කළමනාකරණය, ඵලදායී අවදානම් පාලනය, ප්‍රාග්ධන ප්‍රශස්තිකරණය සහ තිරසාර බැංකුකරණ පිළිවෙත් මගින් මූල්‍ය ප්‍රාග්ධනය ආරක්ෂා කිරීම සහ ශක්තිමත් කිරීම කෙරෙහි බැංකුව නිරන්තර අවධානය යොමු කරයි. මෙමගින් දිගුකාලීන ආයතනික ස්ථාවරත්වය පවත්වා ගැනීමටත්, ව්‍යාපාරික වර්ධනයට අඛණ්ඩව සහාය වෙමින් සියලු පාර්ශ්වකරුවන් වෙත ඉහළ වටිනාකමක් ලබා දීමටත් බැංකුවට හැකියාව ලැබේ.

උපායමාර්ග

2025 වසර තුළ බැංකුවේ උපායමාර්ගය ප්‍රධාන වශයෙන් යොමු වූයේ ශේෂ පත්‍රය ශක්තිමත් කිරීම, ඉහළ ලාභදායීතාවයක් හරහා රඳවා ගත් ඉපැයීම් (Retained earnings) වර්ධනය කර ගැනීම, අවදානම් ඒකරාශීවීම (Concentration risk) අවම කිරීම සහ ශක්තිමත් ප්‍රාග්ධන හා ද්‍රවශීලතා සංචිත පවත්වා ගැනීම කෙරෙහි ය. මෙම ප්‍රවේශය මගින් පෞද්ගලික අංශයේ ණය ලබා දීම පුළුල් කිරීමටත්, අවිනිශ්චිතතාවයන් හමුවේ ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීමටත්, තිරසාර වර්ධනයක් උදෙසා මූල්‍ය දායකත්වය සැපයීමට බැංකුව සතු ධාරිතාව වර්ධනය කිරීමටත් හැකි විය.

විශේෂ කරුණු

ඉහළ ලාභදායිත්වය

බදු පෙර ලාභය:	රු. බිලියන 64.4
බදු පසු ලාභය:	රු. බිලියන 40.2

ශක්තිමත්භාවය සහ ස්ථාවරත්වය

මුළු වත්කම්:	රු. ට්‍රිලියන 3.7
මුළු ප්‍රාග්ධන ප්‍රමාණත්ව අනුපාතය (CAR):	16.5%

නිවැරදි ද්‍රවශීලතාව සහ අරමුදල් තත්ත්වය

ද්‍රවශීලතා ආවරණ අනුපාතය (LCR):	රුපියල්:	263.3%
	සියලුම විදේශ ව්‍යවහාර මුදල්:	218.5%
ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතය (NSFR):		162.4%

ගුණාත්මක වත්කම් පදනම

අදියර 3 (Stage 3) ණය අනුපාතය (රාජ්‍ය ව්‍යවසායන් – SOEs හැර):	5.2%
අදියර 3 (Stage 3) හානිකරණ ආවරණ අනුපාතය (රාජ්‍ය ව්‍යවසායන් – SOEs හැර):	62.2%



මූල්‍ය කාර්ය සාධනය

සමූහ මූල්‍ය කාර්ය සාධනය

2025 වසරේදී සමූහය ශක්තිමත් මූල්‍ය කාර්ය සාධනයක් වාර්තා කළ අතර, එහි ඒකාබද්ධ බදු පෙර ලාභය (PBT) රුපියල් බිලියන 71.1ක් සහ බදු පසු ලාභය (PAT) රුපියල් බිලියන 43.5ක් විය. මෙය 2024 වසරට සාපේක්ෂව බදු පෙර ලාභයේ 49.4%ක සහ බදු පසු ලාභයේ 51.2% ක සැලකිය යුතු වර්ධනයක් වන අතර, එමගින් මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ යාම, ප්‍රධාන ආදායම් මාර්ග ශක්තිමත් වීම සහ සමූහය පුරා ක්‍රියාත්මක වූ විනයගරුක කළමනාකරණය මනාව පිළිඹිබු වේ. වසර අවසානයේදී සමූහයේ මුළු වත්කම් පදනම රුපියල් ට්‍රිලියන 4.0 සීමාව ඉක්මවමින් සුවිශේෂී සන්ධිස්ථානයක් සනිටුහන් කළේය. එහිදී ශුද්ධ ණය සහ අත්තිකාරම් රුපියල් ට්‍රිලියන 2.0ක් සහ තැන්පතු රුපියල් ට්‍රිලියන 3.4ක් ලෙස වාර්තා විය. මෙය ණය සහ අත්තිකාරම්වල 20.1%ක සහ තැන්පතුවල 14.7%ක වාර්ෂික වර්ධනයක් පෙන්නුම් කරන අතර, එමගින් සමූහයේ අඛණ්ඩ ව්‍යාප්තිය මෙන්ම ගනුදෙනුකරුවන් ඇතුළු අනෙකුත් පාර්ශ්වකරුවන් සමූහය කෙරෙහි තබා ඇති විශ්වාසය තවදුරටත් තහවුරු වේ.

බැංකුවේ මූල්‍ය කාර්ය සාධනය

දළ ආදායම


බැංකුවේ දළ ආදායම රුපියල් බිලියන 382.0 දක්වා වර්ධනය වූ අතර, එය පෙර වසරට සාපේක්ෂව 3.8%ක වර්ධනයකි. මෙම වර්ධනය සඳහා අරමුදල් පාදක (Funded) සහ අරමුදල් පාදක නොවන (Non-funded) යන ආදායම් මාර්ග දෙකම දායක විය. විශේෂයෙන්ම පුද්ගල කේන්ද්‍රීය (Retail), කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය (SME) සහ ආයතනික (Corporate) යන අංශයන්හි ණය කළඹ ව්‍යාප්ත වීම නිසා පොලී ආදායම ඉහළ ගිය අතර, වෙළඳ මූල්‍ය (Trade finance), ප්‍රේෂණ (Remittances), කාඩ්පත් සහ ඩිජිටල් බැංකු සේවාවන්හි ක්‍රියාකාරිත්වය වැඩි වීම අරමුදල් පාදක නොවන ආදායම් ඉහළ යාමට හේතු විය. මෙලෙස විවිධාංගීකරණය වූ මාර්ග ඔස්සේ ආදායම් වර්ධනයක් අත්පත් කර ගැනීමට බැංකුවට ඇති හැකියාව මගින් එහි ව්‍යාපාරික ශක්තිය (Business franchise) මෙන්ම, ගනුදෙනු බැංකුකරණය සහ ගාස්තු පාදක සේවාවන්ගෙන් (Fee-based services) සමස්ත ආදායමට ලැබෙන දායකත්වය ඉහළ ගොස් ඇති බව මනාව පිළිඹිබු වේ.

ශුද්ධ පොලී ආදායම

බැංකුවේ ශුද්ධ පොලී ආදායම (NII) රුපියල් බිලියන 142.4 දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, එය පෙර වසරට සාපේක්ෂව 32.8% ක ප්‍රබල වර්ධනයකි. මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ වෙළඳපොළ පොලී අනුපාත පහත වැටීමට අනුකූලව, ඉහළ පිරිවැයක් සහිත ස්ථාවර තැන්පතු අඩු පොලී අනුපාත යටතේ නැවත මිල නියම වීම (Repricing) නිසා පොලී වියදම් සැලකිය යුතු ලෙස පහළ යාමයි.

එමෙන්ම, ණය කළඹේ වර්ධනය සහ එහි සංයුතියේ ඇති වූ හිතකර වෙනස්වීම්, විශේෂයෙන්ම සිල්ලර හා කුඩා හා මධ්‍ය පරිමාණ (SME) ණය අංශයන්ගෙන් ලැබුණු ඉහළ දායකත්වය හේතුවෙන් ඉපැයීම් වත්කම් මත ප්‍රශස්ත ආදායමක් (Yield) පවත්වා ගැනීමට බැංකුව සමත් විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස, 2024 වසරේ වාර්තා වූ 3.4% ක ශුද්ධ පොලී ආන්තිකය (NIM) 4.1% දක්වා ඉහළ ගිය අතර, එමගින් මූලික බැංකු මෙහෙයුම් ඉපැයීම්වල ගුණාත්මකභාවය සහ තිරසාරභාවය තවදුරටත් ශක්තිමත් විය.


ශුද්ධ පොලී ආදායම



අරමුදල් පාදක නොවන ආදායම (Non-funded income)

බැංකුවේ මුළු අරමුදල් පාදක නොවන ආදායම 30.7% කින් ඉහළ ගොස් රුපියල් බිලියන 23.4 ක් ලෙස වාර්තා විය. සාම්ප්‍රදායික ණය දීමේ ක්‍රියාවලියෙන් ඔබ්බට යමින් ආදායම් මාර්ග විවිධාංගීකරණය කිරීමට සහ ගාස්තු පාදක ආදායම් ප්‍රවාහයන් (Fee-based income streams) ශක්තිමත් කිරීමට බැංකුව දක්වන අඛණ්ඩ උත්සාහය මෙයින් මනාව පිළිබිඹු වේ. මුළු අරමුදල් පාදක නොවන ආදායමෙන් 70.0% කට වඩා වැඩි ප්‍රමාණයක් උත්පාදනය වූයේ "ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම" (Net Fee and Commission Income) හරහා වන අතර, එය 2025 වසරේදී 15.8% ක වර්ධනයක් සනිටුහන් කළේය. පාරිභෝගිකයින් සමඟ පවතින සබඳතා තවදුරටත් ශක්තිමත් වීම සහ ගනුදෙනු පාදක ක්‍රියාකාරකම් ඉහළ යාම හේතුවෙන් වෙළඳ මූල්‍ය, කාඩ්පත් ගනුදෙනු, ප්‍රේෂණ සහ ඩිජිටල් බැංකු සේවාවල පරිමාවන් වැඩි වීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් දායක විය. මෙලෙස පොලී ආන්තිකය (Margin-based earningss) මත පමණක් රඳා නොසිට, ගාස්තු සහ සේවා ගාස්තු මගින් වඩාත් ස්ථාවර සහ පුනරාවර්තන (Recurring) ආදායමක් උපයා ගැනීමට බැංකුව ලබා ඇති ප්‍රගතිය මෙයින් පැහැදිලි වේ.

අරමුදල් පාදන නොවන ආදයම




මුළු මෙහෙයුම් ආදායම


බැංකුවේ මුළු මෙහෙයුම් ආදායම 32.5%ක සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කළ අතර, එය 2024 වසරේ වාර්තා වූ රුපියල් බිලියන 125.2ක සිට 2025 වසරේදී රුපියල් බිලියන 165.8 දක්වා ඉහළ ගියේය. මෙම ප්‍රබල කාර්ය සාධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ, ප්‍රශස්ත පොලී ආන්තික (Margins) මගින් ශක්තිමත් වූ "ශුද්ධ පොලී ආදායම" ඉහළ යාම සහ "ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම" අඛණ්ඩව වර්ධනය වීමයි. මෙහෙයුම් ආදායම මෙලෙස ව්‍යාප්ත වීම මගින්, ව්‍යාපාරික පරිමාවන් ක්‍රමවත්ව වර්ධනය කරන අතරම ආදායම්වල ගුණාත්මකභාවය ඉහළ නැංවීමට බැංකුව සතු හැකියාව මනාව පිළිඹිබු වේ.

කෙසේ වෙතත්, ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර (ISBs) ප්‍රතිව්‍යුහගත කිරීමෙන් අනතුරුව 2024 වසරේදී රුපියල් බිලියන 8.8ක එක් වරක් පමණක් සිදුවන අගය හීනවීම් ප්‍රතිලෝම කිරීම (One-off impairment reversal) වාර්තා විය. මෙම සුවිශේෂී අයිතමය බැහැර කළහොත්, 2025 වසරේ හානිකරණ අලාභ සඳහා වෙන්කිරීම් වල මූලික වැඩිවීම රුපියල් බිලියන 1.8ක මධ්‍යස්ථ අගයක් ගනී. එමගින් පෙන්නුම් කරන්නේ වසරින් වසර වාර්තා වන දළ දත්තවලට වඩා ස්ථාවර මට්ටමක පවතින ණය පිරිවැය ප්‍රවණතාවයකි. බැංකුවේ විචක්ෂණශීලී අවදානම් කළමනාකරණ ප්‍රවේශය සහ ප්‍රමාණවත් ප්‍රතිපාදන ස්වාරක්ෂක (Provisioning buffers) පවත්වා ගැනීමට ඇති කැපවීම මෙයින් මනාව පිළිඹිබු වේ.

මුළු මෙහෙයුම් ආදායම



මුළු හානිකරණ අලාභ/වියදම්



හානිකරණ අලාභ/වියදම් (Impairment Charges)


2024 වසරේ වාර්තා වූ රුපියල් බිලියන 5.5ක අගය හා සසඳන විට, 2025 වසර සඳහා වූ මුළු හානිකරණ අලාභය රුපියල් බිලියන 16.0ක් දක්වා ඉහළ ගියේය. මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ "දිට්වා" (Ditwah) සුළි කුණාටුවේ බලපෑම සඳහා වෙන් කළ අතිරේක ප්‍රතිපාදන, පවතින ආර්ථික තත්ත්වයන් මත කළමනාකාරිත්වය විසින් සිදුකළ අතිරේක ප්‍රතිපාදන වෙන් කිරීම් (Management overlays), සහ සිල්ලර හා පෞද්ගලික ආයතනික අංශවල වේගවත් ණය වර්ධනය හේතුවෙන් ඉහළ ගිය "අපේක්ෂිත ණය අලාභ" (ECL) ප්‍රතිපාදනයි. වර්ෂය තුළ ණය සහ අත්තිකාරම් සඳහා වූ හානිකරණ අලාභ සඳහා වෙන්කිරීම් රුපියල් බිලියන 16.3ක් වූ අතර, එය 2024 වසරේදී රුපියල් බිලියන 12.8ක් ලෙස වාර්තා වී තිබුණි.

මුළු මෙහෙයුම් වියදම්

ව්‍යාපාරික ව්‍යාප්තිය මධ්‍යයේ වුවද පිරිවැය වැඩිවීම මනාව පාලනය කර ඇති බව පසක් කරමින්, 2025 වර්ෂයේදී බැංකුවේ මුළු මෙහෙයුම් වියදම් වර්ධනය 5.5% ක සීමාවක රඳවා ගැනීමට හැකි විය. ප්‍රධාන ව්‍යාපාරික අංශයන්හි ප්‍රගතිය තවදුරටත් ශක්තිමත් කිරීම සහ සේවා විශිෂ්ටත්වය ඉහළ නැංවීම අරමුණු කරගනිමින් සිදුකළ නව බඳවා ගැනීම් මෙන්ම ධාරිතා සංවර්ධන වැඩසටහන් හේතුවෙන් සේවක මණ්ඩල පිරිවැය (Personnel costs) 6.7%කින් ඉහළ ගියේය. මීට අමතරව, තාක්ෂණය, ඩිජිටල් යටිතල පහසුකම් සහ ශාඛා ජාලය නවීකරණය කිරීම වෙනුවෙන් අඛණ්ඩව සිදුකරන ලද ප්‍රාග්ධන ආයෝජනයන් හේතුවෙන්, ක්ෂයවීම් සහ අනෙකුත් පරිපාලන පිරිවැය 3.9%ක ඉහළ යාමක් පෙන්නුම් කළේය.

මේ ආකාරයට වියදම් ඉහළ ගියද, බැංකුව විසින් පෙන්නුම් කරන ලද ශක්තිමත් පිරිවැය විනය (Cost discipline) මනාව පිළිබිඹු කරමින් බැංකුවේ පිරිවැය-ආදායම් අනුපාතය (Cost-to-Income Ratio) 2024 වසරේ පැවති 50.3% සිට 2025 වසරේදී 40.1% දක්වා කැපී පෙනෙන ලෙස පහත වැටී ඇත. මෙම යහපත් ප්‍රවණතාව සඳහා ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ මුළු මෙහෙයුම් ආදායම ශක්තිමත් ලෙස වර්ධනය වීම වන අතර, එමඟින් බැංකුවේ මෙහෙයුම් කාර්යක්ෂමතාව (Operating leverage and efficiency) ඉහළ ගොස් ඇති බව මනාව පැහැදිලි වේ.

මෙහෙයුම් වියදම්




ලාභදායිතාව

2025 වර්ෂයේදී බැංකුව ඉතා ශක්තිමත් මූල්‍ය කාර්ය සාධනයක් අත්පත් කරගත් අතර, එහි බදු පෙර ලාභය (Profit Before Tax) රුපියල් බිලියන 64.4 දක්වා ඉහළ ගියේය. මෙය පෙර වසරට සාපේක්ෂව 54.9%ක වාර්ෂික වර්ධනයකි. මෙහෙයුම් ආදායමෙහි, විශේෂයෙන්ම ශුද්ධ පොලී ආදායමෙහි (Net Interest Income) දක්නට ලැබුණු කැපී පෙනෙන වර්ධනය මීට ප්‍රධාන වශයෙන්ම හේතු වූ අතර, ශක්තිමත් අරමුදල් නොවන ආදායම් මාර්ග (Non-funded income streams) සහ විනයගරුක පිරිවැය කළමනාකරණයද ඊට මනා රුකුලක් විය.

බදු පසු ලාභය (Profit After Tax) රුපියල් බිලියන 40.2 දක්වා ඉහළ ගොස් ඇති අතර, එය 60.4%ක වාර්ෂික වර්ධනයක් සනිටුහන් කරයි. මෙම ප්‍රබල ලාභදායිත්ව වර්ධනය මඟින් පෙන්නුම් කරන්නේ, ඉහළ හානිකරණ අලාභ (Impairment charges) දරාගනිමින් සහ සියලුම බදු බැඳීම් සපුරාලමින් තිරසාර ඉපැයීම් ජනනය කිරීමට බැංකුව සතු පරිණත හැකියාවයි. සමස්තයක් ලෙස ගත් කල, බදු පෙර සහ පසු ලාභය යන ද්විත්වයෙහිම දක්නට ලැබෙන මෙම සැලකිය යුතු ප්‍රගතිය මඟින් මහජන බැංකුවේ ශක්තිමත් මූල්‍ය ස්ථාවරත්වය, උසස් ඉපැයීම් ගුණාත්මකභාවය මෙන්ම බැංකුවේ වර්ධනය, කාර්යක්ෂමතාව සහ දිගුකාලීන වටිනාකම් නිර්මාණය කිරීම කෙරෙහි පවතින අඛණ්ඩ අවධානය මනාව පිළිබිඹු වේ.


ලාභදායිතාව



මූල්‍ය තත්වය

මුළු වත්කම්

2025 වර්ෂය අවසානය වන විට බැංකුවේ මුළු වත්කම් ප්‍රමාණය රුපියල් ට්‍රිලියන 3.7ක් දක්වා ඉහළ ගිය අතර, එය පෙර වසරට සාපේක්ෂව සියයට 12.5ක සැලකිය යුතු වාර්ෂික වර්ධනයකි. මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ ශුද්ධ ණය සහ අත්තිකාරම්වල (Net loans and advances) ඉහළ යාම මෙන්ම ආයෝජන කළඹ (Investment portfolio) පුළුල් වීමයි. ඒ අනුව ශුද්ධ ණය සහ අත්තිකාරම් රුපියල් බිලියන 208.7 කින්ද, මුළු ආයෝජනයන් රුපියල් බිලියන 163.2 කින්ද වර්ධනය විය. මෙය ණය දීමේ ක්‍රියාවලිය සහ ද්‍රවශීල ආදායම් උපයන වත්කම් (Liquid earning assets) යන ද්විත්වයෙහිම සමබර ප්‍රගතියක් විදහා දක්වයි. බැංකුවේ ශේෂ පත්‍රය (Balance sheet) මෙලෙස අඛණ්ඩව පුළුල් වීම මඟින් මූල්‍ය ස්ථාවරත්වය සුරකිමින් ව්‍යාපාරිකව ඉදිරියට යාමට බැංකුව සතු හැකියාව මනාව තහවුරු වේ.




ණය සහ අත්තිකාරම්

බැංකුවේ දළ ණය සහ අත්තිකාරම් ප්‍රමාණය 2025 වසරේදී 13.0%කින් වර්ධනය වූ අතර වසර අවසානයේදී එය රුපියල් ට්‍රිලියන 1.9ක් ලෙස වාර්තා විය. රාජ්‍ය ව්‍යවසායන් (SOEs) සඳහා වූ ණය නිරාවරණය හැරුණු විට, දළ ණය සහ අත්තිකාරම්වල 27.5%ක ප්‍රබල වර්ධනයක් පෙන්නුම් කරයි. වෙළඳ මූල්‍ය, උකස් ණය සහ දිගුකාලීන ණය පහසුකම් සඳහා පැවති ඉහළ ඉල්ලුම මෙම වර්ධනයට මූලික විය. එමඟින් සමස්ත ආර්ථිකයේ කෙටිකාලීන ද්‍රවශීලතා අවශ්‍යතා සහ දිගුකාලීන ආයෝජන ඉල්ලුම යන දෙඅංශයටම සක්‍රීයව දායක වීමට බැංකුව සතු හැකියාව මනාව පිළිඹිබු වේ.


ණය කළඹ ප්‍රතිසමතුලිත කිරීමේ (Rebalancing) උපායමාර්ගික අරමුණ යටතේ, රාජ්‍ය ව්‍යවසායන් සඳහා වූ නිරාවරණය 2024 වසර අවසානයේ පැවති 28.7%ක මට්ටමේ සිට 2025 වසර අවසානය වන විට 19.6% දක්වා අඩු කිරීමට බැංකුව පියවර ගත්තේය. මෙම සැලසුම් සහගත වෙනස හරහා පෞද්ගලික අංශයේ ණය ලබා දීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කර ඇති අතර, එමඟින් ණය කළඹේ විවිධාංගීකරණය වැඩිදියුණු කරමින් අවදානම් ඒකරාශී වීම (Concentration risk) අවම කර ඇත.

පුද්ගල කේන්ද්‍රීය ණය ප්‍රදාන පද්ධතිය (RLO) සහ ආයතනික ණය ප්‍රදාන පද්ධතිය (CLO) මඟින් ශක්තිමත් වූ ණය අනුමත කිරීමේ සහ අධීක්ෂණ ක්‍රියාවලීන් නිසා සේවාවන් සැපයීමේ කාලය (Turnaround times) අවම කිරීමටත්, ණය ඇගයීමේ ප්‍රමිතීන් සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නැංවීමටත් බැංකුවට හැකි විය. මෙම ක්‍රියාමාර්ග වසර පුරා පුද්ගල කේන්ද්‍රීය, ආයතනික, වාණිජ, කුඩා හා මධ්‍ය පරිමාණ සහ සංවර්ධන මූල්‍ය යන සියලුම අංශයන්හි ව්‍යාපාරික වර්ධනය සඳහා මනා පිටිවහලක් විය.


දළ ණය සහ අත්තිකාරම්



දළ ණය සහ අත්තිකාරම් – ආංශික විශ්ලේෂණයි



දළ ණය සහ අත්තිකාරම් – නිෂ්පාදන අනුව විශ්ලේෂණයි



මුළු තැන්පතු


විකාශනය වන වෙළඳපොළ තත්ත්වයන් මධ්‍යයේ බැංකුවේ අරමුදල් පදනමේ ස්ථාවර වර්ධනයක් පෙන්නුම් කරමින්, පාරිභෝගික තැන්පතු ප්‍රමාණය 2024 වසර අවසානයේ පැවති රුපියල් ට්‍රිලියන 2.9ක සිට 2025 වසර අවසානය වන විට රුපියල් ට්‍රිලියන 3.2 දක්වා 13.1%කින් ඉහළ ගියේය. බැංකුවේ මුළු අරමුදල් සම්පාදනයෙන් 87.1%ක්ම තැන්පතු මගින් ආවරණය වන අතර, එමගින් බැංකුවේ මූලික අරමුදල් ව්‍යුහයේ (Core funding structure) ශක්තිමත්භාවය සහ ස්ථාවරත්වය මනාව පිළිඹිබු වේ.

ක්ෂේත්‍රයේ විශාලතම ශාඛා ජාලය හිමි බැංකුව ලෙස, නාගරික, අර්ධ නාගරික මෙන්ම ග්‍රාමීය වෙළඳපොළවල් කරා සාර්ථකව විහිදී යමින් පාරිභෝගිකයින් සමඟ සමීප හා තිරසාර සබඳතා පවත්වා ගැනීමට හැකි වීම මෙම වර්ධනයට ප්‍රධාන පිටිවහලක් විය. අඩු පොලී අනුපාත පවතින වටපිටාවක වුවද, බැංකුව සිය අඩු පිරිවැය තැන්පතු පදනම (Low-cost deposit base) තවදුරටත් ශක්තිමත් කර ගත් අතර, ජංගම සහ ඉතුරුම් ගිණුම් (CASA) අනුපාතය 2024 වසරේ පැවති 34.4% සිට 2025 වසරේදී 34.6% දක්වා ඉහළ නැංවීමට සමත් විය. මෙමගින් තැන්පතු බලමුලු ගැන්වීමේ සාර්ථකත්වය මෙන්ම අරමුදල් කළමනාකරණයේ කාර්යක්ෂමතාවය ද තහවුරු වන අතර, එය ශුද්ධ පොලී ආන්තිකය (NIM) කෙරෙහි ද ධනාත්මකව බලපෑමක් සිදුකර ඇත.

මුළු තැන්පතු ප්‍රමාණයෙන් 86.7%ක්ම දේශීය මුදල් තැන්පතු වූ අතර, එමගින් විනිමය අනුපාතික උච්චාවචනයන්ගෙන් ඇති විය හැකි බලපෑම් අවම කරමින් ශේෂ පත්‍රයේ ස්ථාවරත්වය තහවුරු කිරීමට පිටිවහලක් විය. විදේශ මුදල් තැන්පතු 2024 වසරේ පැවති 11.1% සිට 13.3% දක්වා ඉහළ ගිය අතර, එය බැංකුව වෙත ලැබෙන විදේශ මුදල් ප්‍රමාණය වර්ධනය වීම සහ අපගේ විදේශ මුදල් සේවාවන් කෙරෙහි පාරිභෝගිකයින් තබා ඇති විශ්වාසය මනාව පිළිඹිබු කරයි.

පුද්ගල කේන්ද්‍රීය, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර, ආයතනික සහ ආයතනමය අංශ පුරා විහිදුණු බැංකුවේ පුළුල් තැන්පතු පදනම, අරමුදල් සම්පාදනයේ අභියෝග ජය ගැනීමේ හැකියාව (Resilience) තවදුරටත් ශක්තිමත් කළ අතර අවදානම් ඒකරාශී වීම (Concentration risk) අවම කිරීමට දායක විය. ඩිජිටල් සේවා මාර්ග සහ පාරිභෝගික අවශ්‍යතාවලට ගැළපෙන තැන්පතු නිෂ්පාදන කෙරෙහි දැක්වූ අඛණ්ඩ අවධානය, තැන්පතු රැස්කිරීමට මෙන්ම ගනුදෙනුකරුවන් රඳවා ගැනීමට මහත් සේ උපකාරී විය.

මුළු තැන්පතු




මුළු හිමිකම

2024 වසර අවසානයේ රුපියල් බිලියන 182.0ක් වූ බැංකුවේ මුළු හිමිකම (Total equity) , 2025 වසර අවසානය වන විට රුපියල් බිලියන 219.0 දක්වා 20.4% කින් වර්ධනය විය. රුපියල් බිලියන 40.2ක බදු පසු ලාභය මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. එය ගෙවන ලද ලාභාංශ සහ ශ්‍රී ලංකා රජය වෙත ගෙවූ රුපියල් බිලියන 3.6ක විශේෂ බදු/ලාභාංශ අඩු කිරීමෙන් පසු ශුද්ධ අගයකි.

බැංකුව සතු සාපේක්ෂව සීමිත කොටස් ප්‍රාග්ධන ව්‍යුහය සැලකිල්ලට ගනිමින්, ප්‍රාග්ධන පදනම ශක්තිමත් කිරීම උදෙසා ලාභ රඳවා ගැනීමට බැංකුව විචක්ෂණශීලී ප්‍රවේශයක් අනුගමනය කළේය. මෙලෙස ඉපැයීම්වලින් වැඩි ප්‍රතිශතයක් රඳවා ගැනීම හරහා නියාමන ප්‍රාග්ධන අවශ්‍යතාවලට අනුකූල වෙමින් ව්‍යාපාරික වර්ධනයට අවශ්‍ය සහාය ලබා දීමට හැකි විය. මෙලෙස හිමිකම් වර්ධනය වීම බැංකුව සතු අභියෝග ජයගැනීමේ හැකියාව වැඩිකරගැනීමට සහය විය. එපමණක් නොව අනාගතයේදී වත්කම් ප්‍රසාරණය කිරීමට අවශ්‍ය ශක්තිය ද එමගින් තහවුරු විය.

මුළු හිමිකම





ප්‍රාග්ධනය සහ ද්‍රවශීලතා කළමනාකරණය

පද්ධතිමය වැදගත්කමක් සහිත දේශීය බැංකුවක් (D-SIB) ලෙස, මහජන බැංකුව සිය CET 1, පළමු පෙළ (Tier 1) සහ මුළු ප්‍රාග්ධනය සඳහා පිළිවෙලින් 8.0%, 9.5% සහ 13.5%ක අවම නියාමන ප්‍රාග්ධන අනුපාත පවත්වා ගත යුතුය. විචක්ෂණශීලී ශේෂ පත්‍ර කළමනාකරණය සහ රජයේ සුරැකුම්පත් හා ණය දීමේ ක්‍රියාකාරකම් අතර උපායමාර්ගිකව අරමුදල් ප්‍රතිව්‍යුහගත කිරීම හරහා, 2025 වසර පුරා නියාමන සීමාවන්ට වඩා ඉහළ මට්ටමක ශක්තිමත් ප්‍රාග්ධන සහ ද්‍රවශීලතා මට්ටමක් පවත්වා ගැනීමට බැංකුව සමත් විය. මෙම ප්‍රවේශය බැංකුවේ ලාභදායීත්වයට රුකුලක් වූ අතරම, නිසි ප්‍රාග්ධන භාවිතය සහ අවදානම් නිරාවරණයන් ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සහතික කළේය.

2025 දෙසැම්බර් 31 දිනට බැංකුව වාර්තා කළ අනුපාතයන් මෙසේය:

- CET 1 අනුපාතය: 11.8%
- පළමු පෙළ (Tier 1) ප්‍රාග්ධන අනුපාතය: 12.2%
- මුළු ප්‍රාග්ධන අනුපාතය: 16.5%

මෙම අනුපාතයන් අවම අවශ්‍යතාවලට වඩා ඉහළ සංචිත (buffer) මට්ටමක් පෙන්නුම් කරන අතර, විමඟින් විශේෂයෙන්ම පෞද්ගලික අංශයේ ණය ලබා දීම් වැනි අනාගත ව්‍යාපාරික වර්ධනයන් සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් අලාභ දරා ගැනීමේ හැකියාව බැංකුවට සපයයි.

බැංකුවේ ශක්තිමත් අරමුදල් පදනම සහ විචක්ෂණශීලී ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ පිළිවෙත් හේතුවෙන්, වසර පුරා ද්‍රවශීලතා මට්ටම් ද ශක්තිමත්ව පැවතුනි. 2025 දෙසැම්බර් 31 වන විට, සියලුම ව්‍යවහාර මුදල් ද්‍රවශීලතා ආවරණ අනුපාතය (LCR) 218.5%ක් ලෙසත්, රුපියල් ද්‍රවශීලතා ආවරණ අනුපාතය 263.3%ක් ලෙසත් වාර්තා වූ අතර, එම අගයන් දෙකම නියාමන අවම අවශ්‍යතාවය වන 100.0% ට වඩා සැලකිය යුතු ලෙස ඉහළ මට්ටමක පවතී. මීට අමතරව, ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතය (NSFR) 162.4%ක් වූ අතර, විමඟින් බැංකුවේ වත්කම් පදනම සඳහා ප්‍රමාණවත් දිගුකාලීන ස්ථාවර අරමුදල් සහිත ශක්තිමත් අරමුදල් ව්‍යුහයක් පවතින බව පිළිබිඹු වේ.

සමස්තයක් ලෙස ගත් කල, බැංකුව සතු ඉහළ ප්‍රාග්ධනය සහ ද්‍රවශීලතාවය මඟින් එහි මූල්‍ය ශක්තිය සහ යහපත් අවදානම් කළමනාකරණය මැනවින් නිරූපණය වේ. එමෙන්ම ඕනෑම ආර්ථික අවිනිශ්චිතතාවයකට මුහුණ දෙමින් අනාගත ව්‍යාපාරික වර්ධනය අඛණ්ඩව පවත්වා ගැනීමට බැංකුව සතු ශක්තිය මෙයින් මනාව පැහැදිලි කෙරේ.

2025 වසරේදී මහජන බැංකුවේ වටිනාකම් උත්පාදනය උදෙසා මූල්‍ය ප්‍රාග්ධනය ප්‍රධාන සක්‍රීයකාරකයක් ලෙස පැවතුණි. ශක්තිමත් ලාභදායීතාවය, ස්ථාවර ශේෂ පත්‍ර වර්ධනය, යහපත් වත්කම් ගුණාත්මකභාවය, ඉහළ මෙහෙයුම් කාර්යක්ෂමතාව මෙන්ම ශක්තිමත් ප්‍රාග්ධන සහ ද්‍රවශීලතා සංචිත (buffers), එක්ව බැංකුවේ මූල්‍ය ප්‍රත්‍යාස්ථතාව (resilience) තහවුරු කළේය. මෙම ශක්තීන් හේතුවෙන් ගනුදෙනුකරුවන්ට සහාය වීමට සහ ආර්ථික ක්‍රියාකාරකම් මූල්‍යකරණය කිරීමට පමණක් නොව, විශ්වාසය සුරැකීමට, තිරසාර වර්ධනයක් අත්කර ගැනීමට සහ ජාතියට සේවය කරන පද්ධතිමය වැදගත්කමකින් යුත් රාජ්‍ය බැංකුවක් ලෙස සිය කාර්යභාරය අඛණ්ඩව ඉටු කිරීමට ද බැංකුවට හැකි විය.

නිෂ්පාදිත ප්‍රාග්ධනය



මහජන බැංකුව සිය නිෂ්පාදිත ප්‍රාග්ධනය ලෙස සලකනු ලබන සේවා මධ්‍යස්ථාන, ස්වයං බැංකුකරණ ඒකක, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATM) සහ මුදල් තැන්පතු යන්ත්‍ර (CDM) ඇතුළත් ශාඛා සහ පාරිභෝගික සේවා මධ්‍යස්ථාන ජාලයක් දිවයින පුරා පවත්වාගෙන යයි. ඩිජිටල් බැංකුකරණය තවමත් ප්‍රචලිත වෙමින් පවතින දුෂ්කර ග්‍රාමීය ප්‍රදේශවල අපගේ බැංකු පැවැත්ම, එම ප්‍රදේශවල තිරසාර ආර්ථික ක්‍රියාකාරකම් දිරිගැන්වීමට හේතු වේ. එමෙන්ම එමඟින් මූල්‍ය අන්තර්කරණය (Financial Inclusivity) ප්‍රවර්ධනය වන අතර කුඩා හා මධ්‍ය පරිමාණ (SME) සහ ක්ෂුද්‍ර මූල්‍ය අංශවල වර්ධනයට ද මනා පිටිවහලක් එමඟින් ලැබේ.

අපගේ ප්‍රමුඛතාවය

අපගේ යටිතල පහසුකම් නවීකරණය කිරීම සහ පාරිභෝගික සේවා මධ්‍යස්ථාන ජාලය පුළුල් කිරීම කෙරෙහි අපි අවධානය යොමු කළෙමු. එසේම, සැලසුම් සහගත ප්‍රාග්ධන වියදම් (Capital expenditure) සඳහා පහසුකම් සැපයූ බැංකුවේ ශක්තිමත් මූල්‍ය තත්ත්වය උපයෝගී කරගනිමින්, තොරතුරු තාක්ෂණ සහ ඩිජිටල් ක්ෂේත්‍රයේ දියුණුව වෙනුවෙන් අපි ආයෝජනය කළෙමු.

අපගේ උපායමාර්ග

2025 වසර අවසානය වන විට, එනම් මහජන බැංකුව සිය 65 වන වසරට පා තබද්දී, ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම මූල්‍ය ආයතනය ලෙස සමූහ වත්කම් සීමාව රුපියල් ට්‍රිලියන 4 අඛ්බවා යමින්, අපගේ සියලු මෙහෙයුම් කටයුතු කොළඹ පිහිටි "පීපල්ස් ටවර්" (Peoples Tower) නව ප්‍රධාන කාර්යාල පරිශ්‍රය වෙත කේන්ද්‍රගත කළෙමු. බැංකුව දිවයින පුරා විසිරුණු 740කට අධික ශාඛා සහ සේවා මධ්‍යස්ථාන ජාලයක් හරහා මිලියන 15.2කට අධික ගනුදෙනුකරුවන්ට සේවය සලසන්නේ 8,000කට අධික කාර්ය මණ්ඩලයක් සේවයේ යොදවාගනිමිනි. අපගේ යටිතල පහසුකම් ව්‍යුහයේ උච්චතම සංකේතය ලෙස සැලකෙන පීපල්ස් ටවර් ගොඩනැගිල්ල, බැංකුවේ පාරිසරික තිරසාරත්ව ප්‍රතිපත්තියට අනුකූලව සම්පූර්ණයෙන්ම "හරිත ගොඩනැගිලි" (Green Building) සංකල්පයට අනුව නිමවා ඇත. බැංකුවේ මාණ්ඩලික පුහුණු විද්‍යාලය ද එහි පිහිටා ඇති බැවින්, එය දූරදර්ශී කළමනාකරණයටත්, සුරක්ෂිත හා සෞඛ්‍ය සම්පන්න සේවා පරිසරයකටත්, මානව ප්‍රාග්ධනය අඛණ්ඩව සංවර්ධනය කිරීමටත් ඇති කැපවීම විදහාපාන කදිම නිදසුනකි.

ජාල තාර්කිකකරණය (Network rationalisation) සහ නවීකරණය යන ක්‍රියාවලීන් එකවර ක්‍රියාත්මක කළ අපි එහිදී ශාඛා පද්ධතිය සහ ස්වයං-සේවා නාලිකා (Self-service channels) වැඩිදියුණු කිරීමට කටයුතු කළෙමු. එමෙන්ම, ඩිජිටල් බැංකුකරණය සහ කුඩා හා මධ්‍ය පරිමාණ (SME) සේවාවන් සඳහා ප්‍රමුඛත්වය ලබා දෙන පරිදි අපගේ ව්‍යාපාරික ආකෘතිය (Business model) ප්‍රතිසංස්කරණය කරන ලදී.

ප්‍රමුඛ කරුණු

ශාඛා සහ සේවා මධ්‍යස්ථානි	746
ස්වයං බැංකුකරණ ඒකක	307
හරිත ගොඩනැගිලි	141
භාවිතයේ පවතින කාඩ්පත්	4.4 මිලියන
ATM, CDM සහ CRM හරහා සිදුකළ ගනුදෙනුවල වටිනාකම	රු. බිලියන 2,406
ලබා දී ඇති ඩිජිටල් ණය ප්‍රමාණය	රු. බිලියන 217.9
නව ඩිජිටල් ගිණුම්	1.0 මිලියන

පාරිභෝගික කළඹ

65.6%
ජනගහනයෙන්



දායකත්වය ලබාදුන් වූ ප්‍රමුඛ තේමා

සුරක්ෂිතභාවය සහ පහසුව

දිවයිනේ පුළුල්ම ශාඛා ජාලයකට හිමිකම් කියන, මහා පරිමාණ සමාගම්වල සිට තනි පුද්ගලයන් දක්වා විහිදුණු පාරිභෝගික පදනමක් සහිත බැංකුවක් ලෙස, අපගේ පරිශ්‍රයන් තුළ මෙන්ම අපගේ පද්ධති හරහා ද උපරිම සුරක්ෂිතභාවය සැපයීම අපගේ පරම වගකීමක් ලෙස සලකමු.



සෞඛ්‍යය සහ සුරක්ෂිතභාවය



ඩිජිටල් නායකත්වය

N O I S E

අවශ්‍යතා NEEDS

ජාල ආවරණයේ සමතුලිතතාවය – වෙනස්වන ගනුදෙනු රටාවන්ට අනුකූල වන පරිදි නාගරික බැංකු ජාලය ප්‍රශස්ත කරන අතරම, ග්‍රාමීය සහ අවම පහසුකම් සහිත ප්‍රදේශවල භෞතික ප්‍රවේශය අඛණ්ඩව පවත්වා ගැනීම.

ශක්තිමත් මූලික පද්ධත – වර්ධනය වන ඩිජිටල් ගනුදෙනු ප්‍රමාණයට සහ මධ්‍යගත මෙහෙයුම් කටයුතුවලට අනුකූල වන පරිදි මූලික බැංකු පද්ධතිය (Core Banking), සයිබර් ආරක්ෂණය සහ ව්‍යාපාර අඛණ්ඩතාව සහතික කිරීම

මෙහෙයුම් ඒකාබද්ධ කිරීමේ සහාය – සේවා බාධාවකින් තොරව පීපල්ස් ටවර් (Peoples Tower) මධ්‍යගත කිරීමේ කටයුතු සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය පහසුකම්, සැපයුම් (Logistics) සහ කාර්ය මණ්ඩලය යලි ස්ථානගත කිරීම.

අවස්ථාවන් OPPORTUNITIES

කේන්ද්‍රස්ථානයක් ලෙස පීපල්ස් ටවර් (Peoples Tower) යොදා ගැනීම – පීපල්ස් ටවර් මූලස්ථානය ප්‍රධාන මධ්‍යස්ථානයක් ලෙස යොදාගනිමින් සැලසුම් කටයුතු, පුහුණුවීම් සහ පරිපාලන කටයුතු එකම වහලක් යටට ගෙන ඒම මඟින් එකම කාර්යය දෙවරක් සිදුවීම වැළැක්වීමටත්, මෙහෙයුම් පිරිවැය අඩු කරමින් තීරණ ගැනීමේ වේගය වැඩි කිරීමටත් බැංකුවට හැකියාව ලැබේ.

ස්වයං-සේවා ජාලය පුළුල් කිරීම – විදිනෙදා සිදුකරන සාමාන්‍ය ගනුදෙනු ශාඛා පරිශ්‍රයන්ගෙන් බැහැර කර පාරිභෝගික පහසුව වැඩිදියුණු කිරීම සඳහා ATM, CDM සහ ස්වයං-බැංකු ඒකක SBUs පුළුල් කිරීම සහ නවීකරණය කිරීම.

අතිරික්ත නිශ්චල දේපළවලින් ආදායම් උත්පාදනය කිරීම සහ ශාඛා ජාලය ප්‍රශස්ත කිරීම – අවම භාවිතයක් සහිත ශාඛා, උපදේශන/SME මධ්‍යස්ථාන හෝ පොදු ප්‍රජා අවකාශයන් බවට පරිවර්තනය කිරීම මඟින් එක් එක් පරිශ්‍රයෙන් ලැබෙන වටිනාකම ඉහළ නැංවීම.

වැඩිදියුණු කිරීම් IMPROVEMENTS

අතිරික්ත නිශ්චල දේපළවලින් ආදායම් උත්පාදනය කිරීම සහ ශාඛා ජාලය ප්‍රශස්ත කිරීම – අවම භාවිතයක් සහිත ශාඛා, උපදේශන/SME මධ්‍යස්ථාන හෝ පොදු ප්‍රජා අවකාශයන් බවට පරිවර්තනය කිරීම මඟින් එක් එක් පරිශ්‍රයෙන් ලැබෙන වටිනාකම ඉහළ නැංවීම.

ආපදා ප්‍රතිසාධනය (Disaster Recovery) සහ පද්ධති අතිරික්තතාව ශක්තිමත් කිරීම – මධ්‍යගත මෙහෙයුම් සුරක්ෂිත කිරීම සඳහා භූගෝලීය වශයෙන් විවිධ ස්ථානවල පිහිටුවා ඇති දත්ත උපස්ථ (Backups) සහ වඩාත් ශක්තිමත් කළ දත්ත මධ්‍යස්ථාන සබඳතා සඳහා ආයෝජනය කිරීම.

ශ්‍රම බලකාය අදියර වශයෙන් නවීකරණය කිරීම – සේවා නියුක්තිය සුරක්ෂිත කරන අතරම බැංකුවේ සේවා විවිධාංගීකරණය (service mix) වැඩිදියුණු කිරීම සඳහා, ශාඛා කාර්ය මණ්ඩලය උපදේශන, SME සම්බන්ධතා සහ ඩිජිටල් සහායක භූමිකාවන් වෙනුවෙන් නැවත පුහුණු කිරීම.

ශක්තීන් STRENGTHS

ප්‍රාග්ධන වියදම් (Capex) සඳහා ශක්තිමත් මූල්‍ය දායකත්වය – 2025 වසරේ වැඩිදියුණු වූ මූල්‍ය ප්‍රතිඵල සහ ප්‍රාග්ධන අනුපාත හේතුවෙන්, නෂ්පාදිත වත්කම් (manufactured assets) වෙනුවෙන් ඉහළ ආයෝජනයක් කිරීමට බැංකුවට හැකි විය.

ප්‍රතිභාපූර්ණ ජාතික පැවැත්ම – බැංකුවේ පුළුල් ශාඛා ජාලය සහ නව පීපල්ස් ටවර් (Peoples Tower) මූලස්ථානය, විශේෂයෙන්ම ග්‍රාමීය වෙළෙඳපොළ තුළ සන්නාම විශ්වාසය සහ භෞතික සේවා ප්‍රවේශ්‍යතාව තහවුරු කරයි.

පැහැදිලි උපායමාර්ගික දිශානතිය – ශාඛා නවීකරණය, ස්වයං-සේවා නාලිකා ව්‍යාප්ත කිරීම සහ සහායක මෙහෙයුම් මධ්‍යගත කිරීම කෙරෙහි එකවර අවධානය යොමු කිරීම හරහා පැහැදිලි හා සහසම්බන්ධිත ආයෝජන ප්‍රමුඛතාවන් ලබා දීම.

ව්‍යතිරේකයන් EXCEPTIONS

ඒකාබද්ධ කිරීමේදී ඇතිවිය හැකි සේවා බාධා පිළිබඳ අවදානම – පසුපෙල කාර්යාල (back-office) කටයුතු මධ්‍යගත කිරීමේදී එම ක්‍රියාවලිය අධික ලෙස කඩිනම් කළහොත්, සේවා සැපයීමේදී හෝ දත්ත සැකසීමේදී තාවකාලික බාධක (bottlenecks) මතු විය හැකිය.

ග්‍රාමීය ප්‍රදේශවල ඩිජිටල් පරතරය – භෞතික සේවා ප්‍රවේශය නිසි ලෙස පවත්වා නොගතහොත්, ස්වයං-සේවා සහ ඩිජිටල් නාලිකා වෙත පමණක් දැඩි ලෙස යොමු වීම හරහා අන්තර්ජාල පහසුකම් අවම ප්‍රදේශවල ගනුදෙනුකරුවන් මගහැරීමේ අවදානමක් පවතී.

කේන්ද්‍රගත වීමේ අවදානම (Concentration risk) – බැංකුවේ ප්‍රධාන මෙහෙයුම් සියල්ල පීපල්ස් ටවර් වෙත එක්රැස් කිරීම නිසා, කිසියම් භෞතික හානියකදී හෝ සයිබර් ප්‍රහාරයකදී මුළු බැංකුවටම බලපෑම් ඇතිවීමේ වැඩි අවදානමක් පවතී. මෙය වළක්වා ගැනීමට නම්, ප්‍රධාන මධ්‍යස්ථානයට බාහිරව අමතර පද්ධති (redundancy) පවත්වා ගැනීම අත්‍යවශ්‍ය වේ.

එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන අරමුණු සඳහා බැංකුවේ දායකත්වය



සමස්ත ප්‍රජාවම ආවරණය වන පරිදි ආර්ථික ප්‍රගතියක් සහ නව රැකියා අවස්ථා උත්පාදනය කිරීම උදෙසා බැංකුව සිය භෞතික මෙන්ම තාක්ෂණික ව්‍යුහය දියුණු කරන ලදී. එමඟින් පාරිභෝගිකයාට වඩාත් සම්පත සේවාවන් සලසමින් උසස් වටිනාකමක් අත්පත් කර දීමට බැංකුව සමත් විය.



බැංකුවේ කඩිනම් ඩිජිටල් පරිවර්තනය නව නිෂ්පාදන සහ සේවා හඳුන්වා දීමට මග පෑදූ අතර, මූලික බැංකු පද්ධතිය (Core Banking) නවීකරණය කිරීම හරහා පාරිභෝගික ගනුදෙනුවල විශ්වාසනීයත්වය සහ සුරක්ෂිත බව තහවුරු කෙරිණි.



සමස්ත ලංකාවම ආවරණය වන පරිදි ව්‍යාප්ත වූ සේවා මධ්‍යස්ථාන හරහා මූල්‍ය සේවා ලබා ගැනීමේදී පවතින සමාජ විෂමතා අවම කිරීමට බැංකුව පියවර ගත්තේය. මෙලෙස මූල්‍ය ඇතුළත්භාවය (Financial Inclusion) දිරිගැන්වීම සමාජ සමානත්වය තහවුරු කිරීමේ ප්‍රමුඛ මාර්ගයක් ලෙස බැංකුව හඳුනාගෙන ඇත.



නිරන්තර ඩිජිටල්කරණය, පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සහ හරිත මූල්‍යකරණ (Green Finance) ප්‍රවර්ධනය මඟින් සම්පත් පිරිමැසීමට බැංකුව ක්‍රියා කරයි. තවද, ස්වාභාවික සම්පත් වගකීමෙන් යුතුව භාවිත කිරීමේ වැදගත්කම පිළිබඳව ජනතාව දැනුවත් කිරීමට ද බැංකුව නිරත වේ.




තමන් සතු භෞතික මෙන්ම තාක්ෂණික සම්පත් කළමනාකරණයේදී පරිසර හිතකාමී පිළිවෙත් (Climate-conscious practices) අනුගමනය කරමින්, දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දෙන තිරසාර යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට සහ දිගුකාලීන පාරිසරික ප්‍රතිලාභ ජනිත කිරීමට බැංකුව අවධානය යොමු කර ඇත.

දේපළ පිරියත සහ උපකරණ


හරිත ගොඩනැගිලි සංකල්පය සහ බලශක්ති කාර්යක්ෂමතාව වෙනුවෙන් වූ අපගේ කැපවීම විදහා දක්වමින්, දේපළ, පරිශ්‍ර සහ උපකරණ විෂයයෙහි සුවිශේෂී ආයෝජන මාලාවක් අපි සිදු කළෙමු. අපගේ අභිමානය වන "පීපල්ස් ටවර්" (People's Tower) ගොඩනැගිල්ල නිම කිරීමට අමතරව, සමස්ත ශාඛා ජාලයේම තාක්ෂණික සහ ආරක්ෂක යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට ද පියවර ගත්තෙමු. මෙම ප්‍රයත්නයන් අපගේ සන්නාමයේ ප්‍රමුඛත්වය, භෞතික ව්‍යාප්තිය සහ ඩිජිටල් සපලතාව තහවුරු කළ අතර, හරිත ගොඩනැගිලි සහ ඩිජිටල් නවෝත්පාදනයේ ගෝලීය ප්‍රමිතීන්ට අනුව බැංකුව පෙළගැස්වීමට ද ඉවහල් විය.

2025 වර්ෂයේ දේපළ, පිරියත සහ උපකරණ සඳහා වූ නව එක් කිරීම්

රු.බි.



දේපළ, පිරියත සහ උපකරණ 2025



අපගේ නිෂ්පාදිත ප්‍රාග්ධනය ශක්තිමත් කිරීම

පීපල්ස් ටවර් (People's Tower)

තිරසාරභාවය සහ නවීන සේවා ස්ථාන ප්‍රමිතීන් මූර්තිමත් කරමින්, අතිනවීන හරිත ගොඩනැගිලි සංකල්පයට අනුව නිම කළ කොළඹ පිහිටි අපගේ අභිමානවත් "පීපල්ස් ටවර්" ප්‍රධාන කාර්යාලය විවෘත කිරීම වසරේ සුවිශේෂීම සන්ධිස්ථානය යි.

මෙම සුවිශේෂී ජයග්‍රහණයට සමගාමීව, අපි රුපියල් බිලියන 9.2ක ආයෝජනයක් සහිතව අපගේ ශාඛා ජාලය පුරා ප්‍රධාන ප්‍රතිසංස්කරණ කටයුතු රැසක් ද ක්‍රියාවට නැංවූවෙමු.

ශාඛා ජාලයේ ආරක්ෂාව සහ සුරක්ෂිතභාවය තහවුරු කිරීම


සියලුම පාරිභෝගික සේවා මධ්‍යස්ථානයන්හි පහසුකම් ඉහළ නැංවීම

දත්ත මධ්‍යස්ථාන, දෘඩාංග සහ ආරක්ෂක යටිතල පහසුකම් සඳහා සුවිශේෂී නවීකරණයන් සිදුකිරීම

මෙහෙයුම් සහ ඩිජිටල් සූදානම තහවුරු කිරීම

නවීන ගොඩනැගිලි ඉංජිනේරු තාක්ෂණය සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICT) යටිතල පහසුකම් ඒකාබද්ධ කිරීම හරහා, මාර්ගගත (Online) සහ ජංගම බැංකුකරණ සේවා සඳහා පද්ධති ක්‍රියාකාරී කාලය (Uptime), ප්‍රතිචාර කාලය සහ ප්‍රථම සබඳතාවයේදීම ගැටලු විසඳීමේ (First-contact resolution) කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට අපට හැකි විය. අපගේ දත්ත මධ්‍යස්ථාන සඳහා හඳුන්වා දුන් ද්විත්ව බල සැපයුම් පද්ධති (UPS) සහ නවීන සිසිලන පද්ධති (HVAC) හරහා තාක්ෂණික බාධාවන් අවම කර ගැනීමටත්, පද්ධතිවල ක්‍රියාකාරිත්වය (Platform availability) උපරිම මට්ටමක පවත්වා ගැනීමටත් අපට හැකි විය. එමෙන්ම, කෘතිම බුද්ධිය මඟින් ඇමතුම් හැසිරවීමේ (Call routing) පහසුකම් සහිත IP පාදක උසස් අභ්‍යන්තර සන්නිවේදන පද්ධතිය (PABX) මඟින් ප්‍රතිචාර දැක්වීමේ වේගය ප්‍රශස්ත කරන ලදී. තොරතුරු තාක්ෂණ, ඉංජිනේරු සහ ආරක්ෂක කණ්ඩායම් අතර සහයෝගීතාව වර්ධනය කිරීම මෙන්ම ප්‍රවේශ පාලන (Access control) සහ CCTV පද්ධති නවීකරණය කිරීම හරහා බැංකුවේ මෙහෙයුම් සුරක්ෂිතතාව තහවුරු කෙරිණි. පීපල්ස් ටවර් පරිශ්‍රයේ ඇති උසස් යටිතල පහසුකම් ව්‍යාපාර අඛණ්ඩතාව සහ ආපදා කළමනාකරණය සඳහා මනා පිටිවහලක් සපයයි.

තවද, ප්‍රධාන පෙළේ ආපදා තත්ත්වයකදී බැංකුවේ තීරණාත්මක කාර්යයන් සහ ක්‍රියාවලීන් සුරක්ෂිතව පවත්වා ගැනීම සඳහා, කඩවත පිහිටි ආපදා ප්‍රතිසාධන මධ්‍යස්ථානයේ (Disaster Recovery site) විධිමත් ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණ පද්ධතියක් (BCMS) ස්ථාපිත කර ඇත.



පුනර්ජනනීය බලශක්ති ඒකාබද්ධතාව

අපගේ නව ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල සහ ශාඛා 66ක් ආවරණය වන පරිදි මෙගාවොට් 2.28ක ධාරිතාවයකින් යුත් සූර්ය බලශක්ති (Solar PV) පද්ධති ව්‍යාප්ත කිරීමට අපි පියවර ගත්තෙමු. බලශක්ති කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ අරමුණින්, ප්‍රධාන කාර්යාලය සහ ශාඛා ජාලය පුරා බලශක්ති පිරිමැසුම්දායක ඉන්වර්ටර් (Inverter) වායුසමීකරණ පද්ධති සහ ඉහළ කාර්යක්ෂමතාවකින් යුත් LED ආලෝක පද්ධති ස්ථාපනය කරන ලදී. බලශක්ති පරිභෝජනය සහ එහි තීව්‍රතාවය පිළිබඳ වැඩිදුර තොරතුරු 198-205 පිටුවල "ස්වාභාවික ප්‍රාග්ධනය" පරිච්ඡේදයේ දක්වා ඇත.

තිරසාරභාවය උදෙසා හරිත ගොඩනැගිලි සංකල්පය

පීපල්ස් ටවර් ගොඩනැගිල්ල සඳහා හරිත ගොඩනැගිලි පිළිවෙත් සහ බලශක්ති කාර්යක්ෂමතා ක්‍රමවේද අනුගමනය කිරීම හරහා, බැංකුවේ තිරසාරභාවය මෙන්ම ජාතික බලශක්ති මිණුම් දඬු (Energy Benchmarking) රෙගුලාසිවලට අනුකූල වීම තවදුරටත් ශක්තිමත් විය. විශේෂයෙන්ම, ස්වාභාවික දිවා ආලෝකය උපරිම ලෙස ලබා ගැනීම සඳහා අඩු විමෝචක (Low-E) වීදුරු කවුළු පද්ධති භාවිත කිරීම මගින් බලශක්ති පරිභෝජනය සහ කාබන් විමෝචනය අවම කිරීමටත්, ගෘහස්ථ පාරිසරික ගුණාත්මකභාවය ඉහළ නැංවීමටත් අපට හැකි විය.

ක්‍රියාවලි ඩිජිටල්කරණය


බැංකුවේ කඩිනම් ඩිජිටල්කරණ වැඩපිළිවෙළ යටතේ සැපයුම් අංශය සඳහා විද්‍යුත් ප්‍රසම්පාදන (e-Procurement) පද්ධතියක් හඳුන්වා දුන් අතර, එමගින් විනිවිදභාවය, අවම කාර්යයන් නිම කිරීමේ කාලය (Turnaround time) සහ පිරිවැය පාලනය සැලකිය යුතු ලෙස ඉහළ නැංවීමට හැකි විය. මීට අමතරව, ස්ථාවර වත්කම් කළමනාකරණ (FAM) පද්ධතියේ නඩත්තු මොඩියුල හරහා පැමිණිලි විසඳීම සහ වාර්තාකරණය ක්‍රමවත් කරමින් නඩත්තු කටයුතු ප්‍රශස්ත කරන ලදී. එමෙන්ම, අන්තර්ජාලය ඔස්සේ වාහන වෙන්කරවා ගැනීමේ පද්ධතියක් හඳුන්වා දීම හරහා පිරිවැය සහ ධාවන මාර්ග ප්‍රශස්ත කිරීමටත්, පූර්ව නඩත්තු කාලසටහන් (Preventive maintenance) විධිමත් කිරීමටත් අපට හැකි විය.

2025 වසරේ සිදු කරන ලද නිෂ්පාදිත ප්‍රාග්ධන ආයෝජන මගින් තිරසාරභාවය, ඩිජිටල් පරිවර්තනය සහ පාරිභෝගික කේන්ද්‍රීය වර්ධනය උදෙසා වූ බැංකුවේ උපායමාර්ගික දැක්ම විදහා දක්වයි. නිෂ්පාදිත ප්‍රාග්ධනය කෙරෙහි අප අනුගමනය කළ පරිසර හිතකාමී ප්‍රවේශය සහ තාක්ෂණික යටිතල පහසුකම් ශක්තිමත් කිරීම, මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට පමණක් නොව, පාරිසරික වගවීම සහ නවෝත්පාදනය සඳහා වූ අපගේ කැපවීම ද සනාථ කරයි.

මෙම භෞතික සහ තාක්ෂණික වත්කම්, අපගේ විවිධ වූ පාර්ශ්වකරුවන් වෙනුවෙන් දිගුකාලීන වටිනාකම් උත්පාදනය කිරීමේදී තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි.

අපගේ භෞතික ව්‍යාප්තිය

GRI 2-6



උතුරු	
ශාඛා	22
ATM	49
CDM/CRM	15
SBU	15

උතුරු මැද	
ශාඛා	26
ATM	61
CDM/CRM	25
SBU	23

මධ්‍යම	
ශාඛා	44
ATM	106
CDM/CRM	44
SBU	41

වයඹ	
ශාඛා	32
ATM	83
CDM/CRM	30
SBU	26

ඌව	
ශාඛා	26
ATM	57
CDM/CRM	19
SBU	19

බස්නාහිර	
ශාඛා	102
ATM	261
CDM/CRM	126
SBU	110


නැගෙනහිර	
ශාඛා	30
ATM	64
CDM/CRM	20
SBU	19

දකුණු	
ශාඛා	41
ATM	101
CDM/CRM	32
SBU	31

සබරගමුව	
ශාඛා	32
ATM	62
CDM/CRM	26
SBU	23

2026 ඉදිරි දැක්ම

අපගේ "ශුද්ධ ශූන්‍ය" (Net-Zero) ඉලක්ක සහ සේවා අඛණ්ඩතාව තහවුරු කිරීමේ අරමුණු පෙරදැරි කරගත් තිරසාර වැඩපිළිවෙළක්, 2026 වසරේදී ද නව මුලපිරීම් රැසක් සමඟින් ඉදිරියට ගෙන යාමට අප කැපවී සිටිමු.



ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූල වීම

සැපයුම්කරුවන් තෝරා ගැනීම සහ ගිවිසුම්ගත වීමේදී ජාතික ප්‍රසම්පාදන නීතිවලට පූර්ණ ලෙස අනුකූල වන අතර, එහිදී සහතික කළ දේශීය හරිත සැපයුම්කරුවන්ට ප්‍රමුඛතාව ලබා දෙනු ඇත. සියලුම සේවා ප්‍රසම්පාදනයන්හි විනිවිදභාවය තහවුරු කිරීම සඳහා ජීවන චක්‍ර පිරිවැය සහ මෙහෙයුම් ස්ථාවරත්වය පිළිබඳ දැඩි නිර්ණායකයන් අනුගමනය කිරීමට බැංකුව කැපවී සිටී

සින්නක්කර වත්කම් පුරා සූර්ය බලශක්ති පද්ධති තවදුරටත් ව්‍යාප්ත කිරීම

ජාතික විදුලිබල පද්ධතිය මත යැපීම අවම කිරීමට සහ පිරිවැය ප්‍රශස්තකරණය උදෙසා සූර්ය බලශක්ති උත්පාදන ව්‍යාපෘති අඛණ්ඩව ක්‍රියාවට නැංවීමට පියවර ගැනේ.

මෙහෙයුම් අඛණ්ඩතාව සහ යටිතල පහසුකම් ප්‍රශස්තකරණය

අතිරික්ත බල සැපයුම්, ජාල සහ සිසිලන පද්ධති වෙනුවෙන් අපි ආයෝජනය කරන්නෙමු. එසේම, ආපදා ප්‍රතිසාධන (Disaster Recovery) හැකියාවන් පුළුල් කරන අතර, පද්ධති යථා තත්ත්වයට පත් කිරීමේ කාලය අවම කිරීමට සහ බාධා කිරීම් හමුවේ තීරණාත්මක බැංකු සේවා අඛණ්ඩව පවත්වා ගැනීමට "පුරෝකථන නඩත්තු" (Predictive maintenance) සහ අංශ අතර සම්බන්ධීකරණය කෙරෙන හදිසි මෙහෙයුම් සැලසුම් (Incident playbooks) ක්‍රියාවට නංවන්නෙමු

ඉහල නංවන ලද බලශක්ති සහ සම්පත් කළමනාකරණය

බලශක්ති කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා ගොඩනැගිලි බලශක්ති කළමනාකරණ පද්ධති (BEMS), උප-මිනුම්කරණ ඒකක (Sub-metering) සහ තත් කාලීන දත්ත විශ්ලේෂණ පුවරු (Real-time dashboards) භාවිත කිරීමට අපි අපේක්ෂා කරමු. එමඟින් බලශක්ති තීව්‍රතාවය, ජල භාවිතය සහ අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය සඳහා වූ මැනිය හැකි ඉලක්කයන් සපුරා ගැනීමටත්, වැසි ජලය රැස්කිරීම සහ බලශක්ති ඉතිරිකිරීමේ නවීකරණයන් (Energy retrofits) අඛණ්ඩව ක්‍රියාවට නැංවීමටත් අපට හැකි වනු ඇත.

හරිත ශාඛා සංවර්ධනය

පාරිභෝගිකයින්ට විශිෂ්ට සේවා අත්දැකීමක් ලබා දෙන අතරම, ස්වාභාවික දිවා ආලෝකය, කාර්යක්ෂම වායුසමීකරණ (HVAC) පද්ධති, ජලය සුරැකීමේ උපකරණ, අපද්‍රව්‍ය වෙන්කිරීම සහ ප්‍රතිචක්‍රීකරණය මෙන්ම විද්‍යුත් වාහන (EV) ආරෝපණ පද්ධතිවලින් සමන්විත අඩු කාබන් ශාඛා සැලසුම් ක්‍රියාවට නැංවීමට අපි කැපවී සිටිමු. එමෙන්ම, ඩිජිටල් නාලිකා ප්‍රවර්ධනය හරහා පාරිභෝගිකයින් ශාඛා වෙත පැමිණීමේ අවශ්‍යතාව (Branch footfall) අවම කර පාරිසරික බලපෑම අඩු කිරීමට ද අපි පියවර ගන්නෙමු.

බුද්ධිමය ප්‍රාග්ධනය



අපගේ බුද්ධිමය ප්‍රාග්ධනය බැංකුවේ ස්ථාවරත්වයට සහ තරඟකාරිත්වයට ප්‍රබල අත්තිවාරමක් වේ. තීරණාත්මක අස්පෘශ්‍ය වත්කමක් (Intangible asset) වන මෙය, මූල්‍ය හා භෞතික ප්‍රාග්ධනයන්ට නොදෙවැනි වන අතර, අඛණ්ඩ වටිනාකම් උත්පාදනයට, පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය දිනා ගැනීමට සහ තිරසාර වර්ධනයට මනා සහායක් ලබා දෙයි.

අපේ ප්‍රමුඛතාවය

සේවක දැනුම සහ කුසලතා ඉහළ නැංවීම, නායකත්ව සංවර්ධනය සහ ඩිජිටල් සාක්ෂරතාවය වෙනුවෙන් ආයෝජනය කිරීම කෙරෙහි අපි සුවිශේෂී අවධානයක් යොමු කළෙමු. ශක්තිමත් ආයතනික ඉගෙනුම් සංස්කෘතියක් (Organisational learning culture) තුළින් නවෝත්පාදනය, අඛණ්ඩ ඩිජිටල් පරිවර්තනය සහ AI (කෘත්‍රිම බුද්ධිය) පාදක කරගත් පාරිභෝගික සේවාවන් තවදුරටත් බලගැන්වීය. මූල්‍ය අන්තර්ග්‍රහණය (Financial inclusion) ඉලක්ක කරගනිමින්, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය (SME) සහ ක්ෂුද්‍ර මූල්‍ය අංශ සංවර්ධනය සඳහා අප රජය සමඟ හවුල්කාරිත්වයෙන් කටයුතු කිරීමේදී මෙම උපායමාර්ගික නවීකරණයන් අත්‍යවශ්‍ය විය.

අපගේ උපායමාර්ග

ඩිජිටල් කුසලතා, නියාමන අනුකූලතාවය සහ විශිෂ්ට පාරිභෝගික සේවාවක් උදෙසා වූ ව්‍යුහගත පුහුණු වැඩසටහන් අපගේ සමස්ත ශාඛා ජාලය පුරාම ක්‍රියාවට නැංවිණි. බැංකුව සතු තීරණාත්මක විශේෂඥ දැනුම රඳවා ගැනීමටත්, උපායමාර්ගික භූමිකාවන් සඳහා මීළඟ පරම්පරාවේ නායකයින් සූදානම් කිරීමටත් විධිමත් නායකත්ව පුහුණු සහ අනුප්‍රාප්තික සැලසුම් (Succession planning) ක්‍රියාවට නංවන ලදී. එමෙන්ම, නවෝත්පාදන විද්‍යාගාර සහ පර්යේෂණ ව්‍යාපෘති හරහා කෘත්‍රිම බුද්ධිය (AI) සහ දත්ත විශ්ලේෂණය (Data analytics) කේන්ද්‍ර කරගත් ප්‍රායෝගික නිෂ්පාදන සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කරන ලදී. බැංකුව තුළ වටිනාකම් උත්පාදනය කර රඳවා ගැනීම සඳහා අපි විශ්වවිද්‍යාල, වෘත්තීය ආයතන සහ සහතික කිරීමේ ආයතන සමඟ ශක්තිමත් හවුල්කාරිත්වයන් ගොඩනගා ගත්තෙමු. මේ සියලු ප්‍රයත්නයන්හි ප්‍රතිඵලයක් ලෙස, මූල්‍යමය වශයෙන් මෙන්ම ආයතනික කීර්තිනාමය අතින් ද සුවිශේෂී සාර්ථකත්වයක් අත්පත් කරගත් තවත් වසරක් සනිටුහන් කිරීමට අපට හැකි විය.

විශේෂ කරුණු

පුහුණු වැඩසටහන් 607ක් පවත්වා ඇත. ආයෝජනය

රු. මිලියන 190.3

ඩිජිටල් සහ තාක්ෂණික යාවත්කාලීන කිරීම් සඳහා ආයෝජනය

රු. මිලියන 769

ISO 27001:2022 සහතිකකරණය

2017 වසරේ සිට අඛණ්ඩව

බැංකු හා මුදල් විෂයයෙහි වෘත්තීය සුදුසුකම් ලත් සේවකයින් සංඛ්‍යාව

1,966

බැංකුව සතු ප්‍රායෝගික විශේෂඥ දැනුම (Tacit knowledge) විදහා දක්වන, බහුතර කාර්ය මණ්ඩලයක් අයත් පරිණත වයස් කාණ්ඩය

වයස 36-45 අතර

ක්‍රියාවට නංවා ඇති නවෝත්පාදන ව්‍යාපෘති ආයෝජනය

රු. මිලියන 19.3

මාර්ග ගත (Online) සහ කාඩ්පත (Card-based) මගින් සිදුවූ සමස්ත පාරිභෝගික ගනුදෙනු

83.7%



දායකත්වය ලබාදුන් වූ ප්‍රමුඛ තේමා

නිපුණතා කළමනාකරණය, පුහුණුව, සංවර්ධනය හා කුසලතා ඔප්නැංවීම සහ ඩිජිටල් නායකත්වය



නිපුණතා කළමනාකරණය



පුහුණුව, සංවර්ධනය සහ කුසලතා ඔප්නැංවීම



ඩිජිටල් නායකත්වය

N O I S E

අවශ්‍යතා NEEDS	අවස්ථාවන් OPPORTUNITIES	වැඩිදියුණු කිරීම් IMPROVEMENTS	ශක්තීන් STRENGTHS	ව්‍යතිරේකයන් EXCEPTIONS
ශ්‍රම බලකායේ ඩිජිටල් කුසලතා – දැනුම රඳවා ගැනීම; අස්පෘශ්‍ය (නොපෙනෙන) සම්පත් පාලනයි	**ඩිජිටල් නිර්මිත නවෝත්පාදනය** – හවුල්කාරිත්වයන්, දත්ත මත පදනම් වූ සේවාවන් මඟින් ආදායම් උත්පාදනය	**ප්‍රගතිය මැනීම – දිරිගැන්වීම් සහ දැනුම ග්‍රහණය කරගැනීමේ ක්‍රියාවලි**	**සන්නාම ප්‍රවේශය; සම්මාන** – පාරිභෝගික පදනමේ විශාලත්වය	**තාක්ෂණික වේදිකා** – දත්ත පාලනය; සම්පත් රඳවා ගැනීම

එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන අරමුණු සඳහා බැංකුවේ දායකත්වය



බැංකුව විසින් නවීන ඩිජිටල් නිෂ්පාදන, දෘඩාංග සහ ව්‍යාපාරික පද්ධති නවීකරණය සඳහා අඛණ්ඩව යොදවන ප්‍රාග්ධනය, මුළුමහත් ක්ෂේත්‍රයේම නව නිපැයුම් හා යටිතල පහසුකම් ප්‍රගමනයට ප්‍රබල දායකත්වයක් සපයයි.



පද්ධති සහ ක්‍රියාවලීන් නවීකරණය කිරීම හරහා මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ යන අතර විදුලිය, ජලය ඇතුළු අනෙකුත් සම්පත් සංරක්ෂණය දිරිමත් කෙරේ.



විශ්වවිද්‍යාල සහ අනෙකුත් ආයතන සමඟ පවත්වන සහයෝගීතාවය මත ව්‍යාපාරයේ තිරසාරභාවය උදෙසා දක්ෂතා පිරි ශ්‍රම බලකායක් සහ දැනුම බෙදාහදා ගන්නා වේදිකා නිර්මාණය කිරීමට මග පාදයි.

බුද්ධිමය ප්‍රාග්ධන සංචිතය

බැංකුව යනු විවිධ විෂය පථයන් නියෝජනය කරන විශේෂඥයින්ගේ සාමූහික බුද්ධිමය ශක්තිය කේන්ද්‍රගත වූ මධ්‍යස්ථානයකි. එමඟින් අපගේ සියලුම කොටස්කරුවන් වෙත අසමසම වටිනාකමක් ලබා දීමට අපට හැකියාව ලැබී ඇත. වසර 60කට අධික අත්දැකීම් සහ ප්‍රබල සංස්කෘතික සබඳතා සහිත මෙරට ප්‍රමුඛතම බැංකුව ලෙස, අප සතු බුද්ධිමය සම්පත සාම්ප්‍රදායික බැංකුකරණයේ සිට නූතන ඩිජිටල් බැංකුකරණය දක්වා වූ පරම්පරා ගණනාවක දැනුමෙන් පෝෂණය වී ඇත.

වෘත්තිමය සුදුසුකම්

පශ්චාත් උපාධි (MSc/MBA/ Postgraduate)
898

උපාධි (BA/BSc)
1,601

මූල්‍ය හා ගණකාධිකරණ වෘත්තීය සුදුසුකම් (CIMA/CFA/CMA/ CA Sri Lanka)
166

බැංකු සහ රක්ෂණ ක්ෂේත්‍රයේ සුදුසුකම්
1,966

නීතිවේදී උපාධි (LLB)
91

සිවිල්/යාන්ත්‍රික/විදුලි ඉංජිනේරුවන්
19

නීතීඥවරුන්
79

ගෘහ නිර්මාණ ශිල්පය (Architecture)
01

ප්‍රමාණ සමීක්ෂකවරුන් (Quantity Surveyors)
02

මෘදුකාංග සංවර්ධනය සහ තොරතුරු තාක්ෂණය (IT)
230

ඩිප්ලෝමාධාරීන්
360

සහතික පත්‍ර ධාරීන්
3,622

2025 වර්ෂය තුළ සිදුකළ බඳවා ගැනීම්

තනතුර	සමාන්තර ශ්‍රේණිය	සංඛ්‍යාව
ප්‍රධානී – යෙදුම් පද්ධති (Head of Application System)	සහකාර සාමාන්‍යාධිකාරී (AGM)	1
ප්‍රධානී – තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සහ මෙහෙයුම්	සහකාර සාමාන්‍යාධිකාරී (AGM)	1
ප්‍රධාන කළමනාකරු – තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සහ මෙහෙයුම්	I ශ්‍රේණිය (GR I)	1
ප්‍රධාන කළමනාකරු – තොරතුරු ආරක්ෂණය (Information Security)	I ශ්‍රේණිය (GR I)	1
විධායක සහකාර	3-II ශ්‍රේණිය	1
ව්‍යාපෘති කළමනාකරු	3-II ශ්‍රේණිය	1
කාඩ්පත් අලෙවි කළමනාකරු	3-III ශ්‍රේණිය	1
සහකාර නීති නිලධාරී	3-III ශ්‍රේණිය	2
තාක්ෂණික අවදානම් විශ්ලේෂක (Technology Risk Analyst)	3-III ශ්‍රේණිය	1
පුහුණු ලේකම් සහකාර		1
පාරිභෝගික සේවා සහකාර		683
එකතුව		694

ඩිජිටල්කරණය


බැංකුවේ ඩිජිටල් පරිවර්තන න්‍යාය පත්‍රය යනු ශ්‍රම බලකායේ විශේෂඥතාව, දැනුම සහ නවෝත්පාදන හැකියාවන් ඒකාබද්ධ කෙරෙන ප්‍රධාන උපායමාර්ගික අරමුණකි. බැංකුව විසින් මෙතෙක් පැවති අතින් සිදුකළ (Manual) ක්‍රියාවලීන් රැසක් ඩිජිටල්කරණය කිරීමටත්, පරිශීලක-හිතකාමී පාරිභෝගික ප්‍රවේශ ද්වාර (Onboarding portals) සහ ආරම්භයේ සිට අවසානය දක්වා වූ කඩදාසි රහිත කාර්ය ප්‍රවාහයන් (Paperless workflows) ක්‍රියාවට නැංවීමටත් අඛණ්ඩව කටයුතු කරන ලදී. මෙහි ප්‍රතිඵලයක් ලෙස පාරිභෝගික දත්ත ගලායාම වඩාත් වේගවත් හා නිවැරදි වූ අතර, මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නැංවීම තුළින් සේවකයින්ට වැඩි වටිනාකමක් සහිත සේවාවන් සඳහා යොමු වීමට අවස්ථාව සැලසුණි. අපි 2025 වසරේදී සුවිශේෂී ඩිජිටල් විසඳුම් කට්ටලයක් හඳුන්වා දුන්නෙමු.

මෙම නවෝත්පාදනයන් පාරිභෝගික පහසුව, කාර්යක්ෂමතාව සහ අත්දැකීම් නැවත අර්ථ දැක්වීය. සුරක්ෂිත හා තත්‍ය කාලීන පාරිභෝගික සත්‍යාපන ක්‍රමවේද (Customer verification) හරහා සේවා ලබාගැනීමේ ක්‍රියාවලිය වේගවත් වූ අතර, ඩිජිටල්කරණය වූ ණය අයදුම් කිරීමේ සහ සැකසීමේ පද්ධතිය හරහා කඩිනමින් ණය මුදා හැරීමට මග පෑදුණි. මෙය විධිමත් බැංකු පද්ධතියක් භාවිතා නොකරන පිරිස් වෙත මූල්‍ය පහසුකම් සලසමින් මූල්‍ය ඇතුළත් කිරීම් (Financial inclusion) දිරිමත් කළේය.

ශක්තිමත් ජංගම සහ මාර්ගගත බැංකුකරණ වේදිකා මගින් ඕනෑම තැනක සිට, ඕනෑම වේලාවක විවිධ බැංකු සේවා ලබා ගැනීමට ඉඩ සැලසීම තුළින්, ශාඛා වෙත පාරිභෝගිකයින් පැමිණීම අවම වූ අතර අපගේ පාරිභෝගික කේන්ද්‍රීය ඩිජිටල් පරිසර පද්ධතිය හරහා උපරිම පහසුව තහවුරු විය.

මෙම මූලපිරීම් රජයේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර (SME) සහ ක්ෂුද්‍ර මූල්‍ය සංවර්ධන සැලසුම් සඳහා උත්ප්‍රේරකයක් වූ අතර, කුඩා ව්‍යාපාරිකයින් සහ ක්ෂුද්‍ර ව්‍යවසායකයින් අතර පළමු වරට බැංකු ගිණුම් භාවිතා කරන්නන්ගේ වැඩිවීමක් මගින් මෙය සනාථ වේ.

2025 වසර අවසානය වන විට පාරිභෝගිකයින් මිලියන 4.2ක් අන්තර්ජාල සහ ජංගම බැංකුකරණ විසඳුම් සඳහා ලියාපදිංචි වී ඇති බවත්, ඩිජිටල් ගිණුම් මිලියන 6කට ආසන්න ප්‍රමාණයක් ගනුදෙනුකරුවන් විසින් පවත්වාගෙන යනු ලබන බවත් අපි වාර්තා කරන්නේ සාඩම්බරයෙනි.



තොරතුරු තාක්ෂණ සහ ඩිජිටල්කරණ සේවාවන් පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු 127-131 පිටුවල ඇතුළත් කර ඇත.

තොරතුරු ආරක්ෂණ කළමනාකරණය

ඩිජිටල් විශ්වාසය (Digital Trust) තහවුරු කිරීම උදෙසා අප සතු කැපවීමේ පදනම වන්නේ අපගේ තොරතුරු ආරක්ෂණ කණ්ඩායම සතු සුවිශේෂී දැනුමයි. සංකීර්ණ සයිබර් තර්ජන පවතින වර්තමාන වකවානුවක, අපගේ වෘත්තිකයන් සතු සාමූහික විශේෂඥතාව සහ කුසලතා පූර්ණ මානව ප්‍රාග්ධනය, අතිශය වැදගත් උපායමාර්ගික සම්පතක් බව අපි අවබෝධ කරගෙන සිටිමු. අපගේ තොරතුරු ආරක්ෂණ දෙපාර්තමේන්තුව ලොව පිළිගත් ඉහළම සහතික ලත් විශේෂඥයින්ගෙන් සමන්විත වේ.

ISO 27001:2022 ජාත්‍යන්තර සහතිකය ලබාගත් ශ්‍රී ලංකාවේ ප්‍රථම "දේශීය ක්‍රියාකාරී වැදගත්කමක් සහිත බැංකුව" (D-SIB) බවට පත්වෙමින්, අපි ශ්‍රී ලාංකීය බැංකු ක්ෂේත්‍රය තුළ නව මිණුම් ලකුණක් (Benchmark) සනිටුහන් කළෙමු. තොරතුරු ආරක්ෂාව සහ අවදානම් කළමනාකරණය සඳහා වන ඉහළම ගෝලීය ප්‍රමිතීන් අප ක්‍රියාවට නංවා ඇති බව මෙම සහතික කිරීම මගින් සනාථ වේ. අපගේ තොරතුරු ආරක්ෂණ කළමනාකරණ පද්ධතිය; පුද්ගලයින්, ක්‍රියාවලීන් සහ තාක්ෂණය යන අංශ ආවරණය කරමින් සංවේදී දත්තවල රහස්‍යභාවය (Confidentiality), අඛණ්ඩතාව (Integrity) සහ පවතින බව (Availability) සම්බන්ධ ඉහළම ජාත්‍යන්තර ප්‍රමිතීන් තහවුරු කිරීම සඳහා මෙම රාමුවට දැඩි ලෙස අනුගත වේ. තොරතුරු ආරක්ෂණ පද්ධති ශක්තිමත් කිරීම සහ සයිබර් ආරක්ෂණ තර්ජන අවම කිරීම සඳහා 2025 වසරේදී විශේෂ ප්‍රවේශයන් කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී.

ආරක්ෂණ උපායමාර්ගික සංක්‍රාන්තිය

ආරක්ෂක මෙහෙයුම් මධ්‍යස්ථානයක් (Security Operation Centre – SOC) ස්ථාපනය කිරීම හරහා, බැංකුව සිදුවීමකින් පසු ප්‍රතිචාර දැක්වීමේ (Reactive) ක්‍රමවේදයෙන් බැහැර වී, සිදුවීමට පෙර ක්‍රියාත්මක වන පුරෝකථන ආරක්ෂණ (Proactive) ආකෘතියක් වෙත සාර්ථකව සංක්‍රමණය විය. කළමනාකරණය කරන ලද හඳුනාගැනීමේ සහ ප්‍රතිචාර දැක්වීමේ (Managed Detection and Response) පද්ධතියක් මගින් මූලික බැංකු පද්ධතිය (Core Banking) ඇතුළු සියලුම තීරණාත්මක ඩිජිටල් වත්කම් දවසේ පැය 24 පුරාම අඛණ්ඩ නිරීක්ෂණයට ලක් කෙරේ.

ගෝලීය තර්ජන පිළිබඳ තොරතුරු (Global Threat Intelligence), මධ්‍යගත ආරක්ෂක තොරතුරු සහ සිදුවීම් කළමනාකරණ (SIEM) පද්ධතියක් සමඟ ඒකාබද්ධ කිරීම මගින් බැංකුවේ තර්ජන හඳුනාගැනීමේ හැකියාව SOC මගින් තවදුරටත් ශක්තිමත් කරන ලදී. මෙම නවීකරණය හරහා තත්‍ය කාලීන දත්ත විශ්ලේෂණය (Real-time data correlation) සහ නැගී එන සයිබර් තර්ජනවලට එරෙහිව පූර්ව ආරක්ෂණ පියවර ගැනීම සඳහා අවස්ථාව සැලසේ.

ආරක්ෂණ පරීක්ෂණ සහ තක්සේරු කිරීම්

තොරතුරු ආරක්ෂණ දෙපාර්තමේන්තුව, ක්ෂේත්‍රයේ ප්‍රමුඛ ආරක්ෂක උපදේශකයින් සමඟ එක්ව පුළුල් ආරක්ෂණ පරීක්ෂණ සහ ජාත්‍යන්තර අනුකූලතා විගණන (Compliance Audits) පවත්වනු ලබයි. මෙයට වාර්ෂික ISO 27001:2022 නිරීක්ෂණ විගණන, නියාමන පරීක්ෂණ සහ විවිධ තාක්ෂණික ආරක්ෂණ තක්සේරු කිරීම් ඇතුළත් වේ. මීට අමතරව, පද්ධතිවල පවතින දුර්වලතා හඳුනා ගැනීම සඳහා මහජනතාව වෙත විවෘත කර ඇති (Public-facing) ඩිජිටල් වත්කම් සම්බන්ධයෙන් බාහිර අවදානම් පරීක්ෂණ (External Vulnerability Testing) සිදු කිරීමට බැංකුව පියවර ගත්තේය. එමෙන්ම, අභ්‍යන්තර සේවාදායක පද්ධති (Servers), මූලික බැංකු පද්ධතිය (Core-banking) සහ ශාඛා ජාලය තුළ ඇති විය හැකි අවදානම් හඳුනාගෙන ඒවා මර්දනය කිරීම සඳහා අභ්‍යන්තර අවදානම් තක්සේරු කිරීම් ද පවත්වන ලදී. අප සතු මිනිස් සම්පත, ක්‍රියාවලීන් සහ තාක්ෂණික අභියෝග වලට මුහුණදීමේ හැකියාව (Resilience) පරීක්ෂා කිරීම සඳහා, සැබෑ සයිබර් ප්‍රහාර අනුකරණය කරමින් සිදු කරනු ලබන ඉලක්කගත "රෙඩ් ටීමින්" (Red Teaming) තක්සේරු කිරීම් ද මෙම ආරක්ෂණ පරීක්ෂණවලට ඇතුළත් විය.

විනිවිද යාමේ පරීක්ෂාව

බැංකුවේ තීරණාත්මක තොරතුරු පද්ධතිවල ආරක්ෂාව තහවුරු කිරීම සඳහා වාර්ෂිකව විනිවිද යාමේ පරීක්ෂණ (Penetration Testing) පවත්වන ලදී. මීට අමතරව, කාර්ය මණ්ඩලය ඉලක්ක කර ගනිමින් ව්‍යාජ තතුබෑම් අත්හදා බැලීම් (Phishing simulations) සිදු කළ අතර, එම උත්සාහයන් හඳුනා ගැනීම, වාර්තා කිරීම සහ ඒවා වළක්වා ගැනීම සඳහා අවශ්‍ය විශේෂිත පුහුණු වැඩසටහන් ද පවත්වන ලදී. බැංකු ක්ෂේත්‍රයේ සැබෑ අත්දැකීම් පාදක කර ගනිමින්, ස්වාධීන බාහිර පාර්ශවයන් මගින් වරින් වර මෙම තක්සේරු කිරීම් සිදු කරනු ලැබේ. මෙහිදී ලබාගත් දත්ත සහ විශ්ලේෂණයන් (Insights) නිවැරදි තීරණ ගැනීම සඳහා උපයෝගී කරගත් අතර, පද්ධතිවල පවතින අඩුපාඩු හඳුනාගත් අවස්ථාවන්හිදී සේවකයින්ට අවශ්‍ය අතිරේක පුහුණුව ලබා දීමට ද පියවර ගන්නා ලදී.

තෙවන පාර්ශවීය අවදානම් කළමනාකරණය

අපගේ මූල්‍ය තාක්ෂණික (FinTech) හවුල්කරුවන් සහ සේවා සපයන්නන්, බැංකුවේ දැඩි සයිබර් ආරක්ෂණ ප්‍රමිතීන් (Benchmarks) අනුගමනය කරන බව සහතික කරමින්, අපි තෙවන පාර්ශවීය අවදානම් කළමනාකරණ ක්‍රියාවලියක් ඉතා දැඩි ලෙස ක්‍රියාත්මක කරමු.

ආපදා ප්‍රතිසාධනය

"දිට්වා" (Ditwah) සුළි කුණාටු තත්ත්වයේදී බැංකුව ක්‍රියා කළ ආකාරය, ආපදා ප්‍රතිසාධනයට (Disaster Recovery) අප සතු සුවිශේෂී හැකියාව මැනවින් පිළිබිඹු කළේය. එවැනි මහා පරිමාණ ව්‍යසනයකදී පවා අත්‍යවශ්‍ය බැංකු සේවාවන් අඛණ්ඩව පවත්වාගෙන යාම සහතික කරමින්, බලපෑමට ලක්වූ ප්‍රදේශවල සේවාවන් පැය 24ක් වැනි කෙටි කාලයක් තුළ යථා තත්ත්වයට පත් කිරීමට අපට හැකි විය. පාරිභෝගික බැංකු අවශ්‍යතා හා බැඳුණු ඩිජිටල් සේවාවන්හි පවතින බව (Availability) පාරිභෝගික අත්දැකීම් කෙරෙහි සෘජුවම බලපාන බැවින්, අපගේ ආපදා කළමනාකරණ සැලසුම් වරින් වර දැඩි පරීක්ෂාවට (Testing) ලක් කරනු ලබයි.

පර්යේෂණ සහ සංවර්ධන

බැංකු ඉතිහාසයේ තවත් සුවිශේෂී සන්ධිස්ථානයක් සනිටුහන් කරමින්, අපගේ "නවෝත්පාදන මධ්‍යස්ථානය" (Innovation Centre) හරහා මූල්‍ය තාක්ෂණික (FinTech) හවුල්කරුවන් සමඟ එක්ව නව්‍යකරණයේ පුරෝගාමියා ලෙස කටයුතු කිරීමට අපි පියවර ගත්තෙමු. තිරසාර ව්‍යාපාරික ආකෘතියක් තුළ මහජන සුභසාධනය වෙනුවෙන් පෙනී සිටින අප, රටේ දුරස්ථ ප්‍රදේශවල වෙසෙන අවම පහසුකම් සහිත ප්‍රජාවන් වෙත ස්පර්ශ්‍ය (Tangible) වටිනාකමක් ලබා දීමට කටයුතු කළෙමු. එමගින් මූල්‍ය ඇතුළත් කිරීම් (Financial Inclusion) ප්‍රවර්ධනය කිරීමටත්, පොදු ආර්ථික වර්ධනයේ උත්ප්‍රේරකයක් ලෙස අපගේ භූමිකාව තහවුරු කිරීමටත් අපට හැකි විය.

නියාමන අනුකූලතාව

ගෝලීය ප්‍රමිතීන්ට සහ දේශීය රෙගුලාසිවලට අනුකූලව, අපගේ මූලික තාක්ෂණික ප්‍රතිපත්තිය ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමන අවශ්‍යතා, විශේෂයෙන් 2021 අංක 16 දරන විධානය සහ එහි සංශෝධන මගින් පාලනය වේ. එම විධානයන්ට අනුව තාක්ෂණික අභියෝගවලට මුහුණ දීමේ හැකියාව (Technology resilience), සිදුවීම් වාර්තා කිරීම සහ අවදානම් තක්සේරුව යන අංශයන් අපි දැඩි ලෙස අනුගමනය කරන්නෙමු. සයිබර් ප්‍රහාරවලට සාර්ථකව මුහුණ දීමට සහ එවැනි අවස්ථාවකදී පද්ධති යථා තත්ත්වයට පත් කිරීමට අප සතු හැකියාව අපි තහවුරු කර ඇත්තෙමු. තවද, 2022 අංක 9 දරන පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත මගින් පාරිභෝගිකයන්ගේ පෞද්ගලික සහ මූල්‍ය දත්ත ගබඩා කිරීම සහ පරිශීලනය කිරීම සම්බන්ධයෙන් අප සතු වගකීම සහ වගවීම තවදුරටත් තහවුරු කර ඇති අතර, එම කටයුතු කිසිදු බාධාවකින් තොරව ඉටු කිරීමට අප සමත්ව සිටිමු.

අනාගත ඉලක්ක සපුරා ගැනීම සඳහා වූ පුහුණු වැඩසටහන් සහ ක්‍රියාකාරකම්

2026 පුහුණු සැලැස්මට අනුව, උපායමාර්ගික පෙළගැස්ම, අරමුණු සහගත කුසලතා සංවර්ධනය, දිගුකාලීන උපායමාර්ගික දැක්ම, සේවක වර්ධනය හා සම්බන්ධ වීම සහ අඛණ්ඩ ඉගෙනීම යන කරුණු කෙරෙහි ප්‍රධාන වශයෙන් අවධානය යොමු කෙරේ. ඉහත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා තාක්ෂණික හැකියාවන් සහ චර්යාත්මක විශිෂ්ටත්වය (Behavioral excellence) අතර සමතුලිත සංවර්ධනයක් ඇති කිරීම මෙම පුහුණු ක්‍රියාවලියේ මූලික ලක්ෂණයයි.

බැංකුවේ උපායමාර්ගික ප්‍රවේශයන්ට අනුකූලව, කාර්ය මණ්ඩලයේ ණය විශ්ලේෂණ තාක්ෂණික නිපුණතා (Credit technical competencies) ඉහළ නැංවීම හරහා බැංකුවේ ණය කළඹ ශක්තිමත් කිරීම සඳහා විශේෂිත පුහුණු වැඩසටහන් මාලාවක් සැලසුම් කර ඇත. මීට අමතරව, බැංකුවේ විදේශ ප්‍රේෂණ කළඹ (Foreign currency remittances portfolio) පුළුල් කිරීම ඉලක්ක කරගත් තවත් වැඩසටහන් රැසක් ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට නියමිතය.

තවද, බැංකුවේ පාරිභෝගික සේවා විශිෂ්ටත්වය ඉහළ නැංවීම සඳහා ඩිජිටල්කරණය පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන් මෙන්ම, පාරිභෝගික කේන්ද්‍රීයභාවය (Customer-centricity) සහ පාරිභෝගික සේවා වැඩිදියුණු කිරීම වැනි මෘදු කුසලතා (Soft skills) සංවර්ධන වැඩසටහන් රැසක් සැලසුම් කර ඇත.

අරමුණු කරගත් කුසලතා සංවර්ධන වැඩපිළිවෙළ යටතේ, නිශ්චිත රැකියා භූමිකාවන් (Specific job roles) සහ පුහුණු අවශ්‍යතා සමීක්ෂණ මගින් හඳුනාගත් කුසලතා හිඩැස් (Skill gaps) පියවීම කෙරෙහි අවධානය යොමු කරමින් තවත් වැඩසටහන් රැසක් සකස් කර තිබේ. මීට අමතරව, නව බඳවා ගැනීම් සහ උසස්වීම් ඉලක්ක කරගත් විශේෂිත පුහුණු වැඩසටහන් ද 2026 පුහුණු සැලැස්මට ඇතුළත් වේ.

බැංකුවේ දිගුකාලීන උපායමාර්ගික දැක්මට අනුකූලව, ව්‍යාපාරික ලේඛනකරණය සහ ඉදිරිපත් කිරීමේ කුසලතා (Business writing and presentation skills) ඇතුළත් ආයතනික සන්නිවේදන කුසලතා වර්ධනය කිරීමේ වැඩසටහන් 2026 වසර සඳහා සැලසුම් කර ඇත. එමෙන්ම, බැංකු මෙහෙයුම්වල ඵලදායිතාව ඉහළ නැංවීම සහ දෛනික රාජකාරීන් සරල කරගැනීම සඳහා කෘතිම බුද්ධි (AI) මෙවලම් භාවිතය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් බැංකුවේ සමස්ත කාර්ය මණ්ඩලය වෙනුවෙන්ම ක්‍රියාත්මක කිරීමට නියමිතය.

ඩිජිටල් දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කිරීමට නියමිත වැඩසටහන්

2026 වසරේදී මහජන බැංකුව සිය උපායමාර්ගික මූලපිරිම් රැසක් හරහා ඩිජිටල් පරිවර්තන ක්‍රියාවලිය තවදුරටත් වේගවත් කිරීමට අපේක්ෂා කරයි. මෙහි ප්‍රධාන වැඩසටහන් ලෙස පාරිභෝගික අත්දැකීම් (User Experience) සහ උසස් ආරක්ෂක විශේෂාංගවලින් සමන්විත ජංගම සහ අන්තර්ජාල බැංකුකරණ වේදිකා වැඩිදියුණු කිරීම, ඩිජිටල් පාරිභෝගික ප්‍රවේශය (Digital Onboarding) සහ e-KYC පහසුකම් පුළුල් කිරීම මෙන්ම ඩිජිටල් පරිසර පද්ධතිය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා මූල්‍ය තාක්ෂණික (FinTech) හවුල්කාරිත්වයන් ඒකාබද්ධ කිරීම හැඳින්විය හැකිය.

තවද, බුද්ධිමත් කාර්ය ප්‍රවාහ විසඳුම් (Intelligent workflow solutions) හරහා ක්‍රියාවලි ස්වයංක්‍රීයකරණය (Process automation) ශක්තිමත් කිරීමටත්, ශාඛා ජාලය පුරා ස්වයං සේවා බැංකු නාලිකා ව්‍යාප්ත කිරීමටත් බැංකුව සැලසුම් කරයි. මීට අමතරව, පාරිභෝගිකයන් අඛණ්ඩ, කාර්යක්ෂම සහ සුරක්ෂිත ඩිජිටල් බැංකු අත්දැකීමක් සහතික කිරීම උදෙසා, දත්ත මත පදනම් වූ තීරණ ගැනීමේ ක්‍රමවේද සහ වඩාත් දියුණු සයිබර් ආරක්ෂණ රාමුවක් හඳුන්වා දීමට ද කටයුතු කරනු ඇත.

2026 සඳහා ඉදිරි දැක්ම

නව්‍යකරණය, පාරිභෝගික විශ්වාසය සහ මෙහෙයුම් විශිෂ්ටත්වය පෙරදැරි කරගත් අපගේ බුද්ධිමය ප්‍රාග්ධනය, තිරසාර වටිනාකම් ජනනය කිරීමේ ප්‍රධාන පදනම ලෙස ඉදිරියටත් පවතිනු ඇත.

දැනුම ක්‍රමවත්ව එක්රැස් කිරීම, කුසලතා නවීකරණය උදෙසා ආයෝජනය කිරීම සහ සහයෝගී හවුල්කාරිත්වයන් ගොඩනැගීම හරහා අප සතු විශේෂඥතාව සාර්ථක ප්‍රතිඵල බවට පත් කිරීමට අපි අඛණ්ඩව කැපවී සිටිමු.

මානව ප්‍රාග්ධනය



අපගේ සාර්ථකත්වයේ පදනම මෙන්ම අප සතු ප්‍රබලතම තරඟකාරී ශක්තිය වන්නේ අපගේ සේවක මණ්ඩලයයි. ඔවුන්ගේ නොපසුබට උත්සාහය සහ නව්‍යකරණයට ඇති උනන්දුව නිසාම, ඕනෑම ජාතික අර්බුදකාලීන තත්වයකදී නොසැලී සිටීමටත්, රටට සහ පාරිභෝගිකයාට උපරිම සේවාවක් සැලසීමටත් අපට හැකි විය.

අපේ ප්‍රමුඛතාවය

අපගේ දිගුකාලීන දැක්ම සාක්ෂාත් කරගැනීම උදෙසා, බැංකු ක්ෂේත්‍රයේ සිදුවන වෙනස්කම්වලට ඉක්මනින් හැඩගැසිය හැකි, අනාගතයට සූදානම්, කඩිසර (Agile) ශ්‍රම බලකායක් ගොඩනැගීමට අපි කැපවී සිටියෙමු. එම කැපවීමේ පදනම වූයේ කාර්යක්ෂමතාව, විනිවිදභාවය සහ නිරවද්‍යතාවය අගය කරන ආයතනික සංස්කෘතියක් නිර්මාණය කිරීමයි. එමඟින් පාරිභෝගික සේවා විශිෂ්ටත්වය ළඟා කර ගැනීමටත් අපගේ උපායමාර්ගික අරමුණු ජය ගැනීමටත් අපට හැකි විය.

අඛණ්ඩව නවෝත්පාදනයන් හඳුන්වා දෙමින්, වෘත්තීය සංවර්ධන අවස්ථා උදා කළ අපි මනා සහයෝගීතාවයකින් යුත් ශක්තිමත් කණ්ඩායමක් පෝෂණය කළෙමු. බැංකුවේ අරමුණු හා සමපාත වන අයුරින් සේවකයින්ගේ පෞද්ගලික වර්ධනය කෙරෙහි අවධානය යොමු කරමින්, ඔවුන්ගේ වෘත්තීය අභිලාෂයන් සපුරාලන අතරම ආයතනික සාර්ථකත්වයට අර්ථවත් ලෙස දායක වීමට අවශ්‍ය බලගැන්වීම (Empowerment) අපි සිදු කළෙමු.

අපගේ උපායමාර්ග

පූර්ණ හා ඒකාබද්ධ වැඩපිළිවෙළක් මත ගොඩනැගුණු අපගේ උපායමාර්ගය මඟින් මානව සම්පත් සංවර්ධනය හා ආයතනික අභිවෘද්ධිය අතර පවතින අවියෝජනීය සබැඳියාව අවධාරණය කරයි. සේවකයෙකු බඳවා ගැනීමේ සිට විශ්‍රාම ගැන්වීම දක්වා වූ සමස්ත වෘත්තීය ගමන ආවරණය වන පරිදි සැකසූ උපායමාර්ගික පියවර හතක් හරහා අපගේ ශ්‍රම බලකායේ ධාරිතාව ඉහළ නැංවීමට අපි කටයුතු කරමු. එමඟින් දක්ෂතා හඳුනාගෙන ඔවුන් පෝෂණය කරන අතරම, අපගේ සේවක මණ්ඩලය බැංකුවේ අනාගත දැක්ම සහ සාරධර්ම සමඟ මනා ලෙස ඒකාබද්ධ කරනු ලබයි.

නිපුණතා පදනම් කරගත් බඳවා ගැනීම්

බඳවා ගැනීම් විවිධත්වය

ශ්‍රම බලකා සැලසුම්කරණය

සේවක සහසම්බන්ධතාව සහ කැපවීම වර්ධනය කිරීම

ඩිජිටල්කරණය වූ කාර්යසාධන කළමනාකරණය

ඩිජිටල් ඉගෙනුම් සහ සංවර්ධන ක්‍රියාවලි

මානසික සුවය සහ යහපැවැත්ම තහවුරු කිරීමේ විශ්වාසනීය ක්‍රමවේදය

සීඝ්‍රයෙන් වෙනස් වන බැංකු ක්ෂේත්‍රය තුළ, නවෝත්පාදනය සහ නොසැලෙන ස්ථාවරත්වය ප්‍රවර්ධනය කරන ප්‍රධාන උපායමාර්ගික නියමුවා ලෙස අපි අපගේ මානව ප්‍රාග්ධනය හඳුනා ගෙන සිටිමු. අප සතු තරඟකාරී වාසිය පදනම් වී ඇත්තේ ද මෙම සුවිශේෂී මානව ශක්තිය මතය.

ස්වයංක්‍රීයකරණය සහ ඩිජිටල්කරණය

2025 වසරේදී නව මානව සම්පත් තොරතුරු පද්ධතිය (HRIS) හරහා ස්වයංක්‍රීය කාර්යසාධන කළමනාකරණ පද්ධතියක් හඳුන්වා දීම මඟින් විධිමත් සහ විනිවිදභාවයෙන් යුත් කාර්යසාධන කළමනාකරණ ක්‍රියාවලියක් ස්ථාපිත කිරීමට හැකි විය. මෙහිදී සේවකයින් විසින් සිදු කරනු ලබන මූලික ස්වයං-ඇගයීමකින් (Self-assessment) අනතුරුව අධීක්ෂණ මට්ටමේ තක්සේරුවක් සිදු කෙරෙන අතර, එමඟින් බැංකුව පුරා සාධාරණත්වය, වගවීම සහ ඒකාකාරී බව සහතික කෙරේ.

මීට සමගාමීව, මානව සම්පත් දෙපාර්තමේන්තුව (HRD) බඳවා ගැනීමේ මෙතෙක් පැවති අත්පුරු (Manual) ක්‍රමවේදයෙන් බැහැර වී සේවක ඇතුළත් කිරීම (On boarding) HRIS පද්ධතිය වෙත සංක්‍රමණය කිරීම සිදු විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස, බඳවා ගැනීමේ ක්‍රියාවලිය සඳහා ගතවන සාමාන්‍ය කාලය මාස 18 සිට මාස 3 දක්වා සැලකිය යුතු ලෙස අඩු කර ගැනීමට අපට හැකි විය. එමඟින් ඉහළ ගිය මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ පිරිවැය කළමනාකරණය පෙන්නුම් කළඳ, දක්ෂ සේවකයින් කඩිනමින් බඳවා ගැනීම හරහා ඔවුන්ගේ ඵලදායී දායකත්වය ඉතා කෙටි කාලයකදී බැංකුව වෙත ලබා ගැනීමට අවස්ථාව සැලසුණි.



ඩිජිටල් තාක්ෂණය ඔස්සේ සේවක කාර්යසාධනය ඇගයීම සහ උසස්වීම්/ප්‍රතිලාභ ලබාදීමේ ක්‍රියාවලිය ස්වයංක්‍රීය කිරීම.

අඛණ්ඩ ඉගෙනුම දිරිමත් කරන ඩිජිටල් ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය

පැමිණීමේ ලේඛන 850ක් සඳහා ඇඟිලි සලකුණු (Fingerprint) යන්ත්‍ර භාවිතය හඳුන්වා දීම

බැංකුවේ ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය (LMS) මඟින් සේවක පුහුණුව සහ සංවර්ධනය වඩාත් නම්‍යශීලී කර ඇති අතර, එමඟින් දෛනික රාජකාරිවලට හෝ පාරිභෝගික සේවා සැපයීමට අවම බාධාවක් වන පරිදි තම කාලසටහනට අනුව ඉගෙනුම් කටයුතුවල නිරත වීමට සේවකයින්ට අවස්ථාව සැලසේ. සේවක පැමිණීම සහ කාර්යසාධන කළමනාකරණ පද්ධති ද සම්පූර්ණයෙන්ම ස්වයංක්‍රීය කිරීමට බැංකුව පියවර ගෙන ඇත.

මානව ප්‍රාග්ධන කළමනාකරණය තුළ ඩිජිටල් පරිවර්තනය සහ හරිත මානව සම්පත් (Green HR) භාවිතයන් ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරන අතර, එමඟින් ආයතනයේ කාබන් පියසටහන (Carbon footprint) සහ බලශක්ති පරිභෝජනය අවම කිරීමට දායක වේ. මෙහි සුවිශේෂී පියවරක් ලෙස, මෙතෙක් පැවති පැමිණීමේ ලේඛන 850ක් වෙනුවට ඇඟිලි සලකුණු (Fingerprint) යන්ත්‍ර භාවිතය හඳුන්වා දුන් අතර, වැටුප් ගෙවීමේ පද්ධතිය (Payroll System) ද ස්වයංක්‍රීය කිරීමට මේ වන විට සැලසුම් කර ඇත.

විශේෂ කරුණු

සේවක සංඛ්‍යාව
8,122

ස්ත්‍රී - පුරුෂ අනුපාතය
2:3

සේවක රඳවා ගැනීමේ ප්‍රතිශතය
97.0%

සේවකයෙකුට ලාභය
රු. මිලියන 5.0

ඩිජිටල්කරණය වූ කාර්යසාධන කළමනාකරණය
100% සම්පූර්ණයි

වැටුප් සහ ප්‍රතිලාභ ගෙවීම්
රු. බිලියන 38.2

විදේශ පුහුණුව ලැබූ සේවකයින් සංඛ්‍යාව
72

උසස්වීම් ලැබූ සේවකයින් සංඛ්‍යාව
685

සේවක සහභාගීත්ව සමීක්ෂණය
76% ක සහභාගීත්වයක්

සේවක තෘප්තිමත්භාවය පිළිබඳ සමීක්ෂණය
69% ක් සේවායෝජකයෙකු ලෙස බැංකුව පිළිබඳ තෘප්තිමත් වේ

මුළු පුහුණු පැය ගණන
පැය 220,638

සේවකයෙකු සඳහා සාමාන්‍ය පුහුණු කාලය
ආසන්න වශයෙන් පැය 27

ස්ථානීය පුහුණු වැඩසටහන්
568

මාර්ගගත පුහුණු වැඩසටහන්
39

දායකත්වය ලබාදුන් ප්‍රමුඛ තේමා

අනාගතයට සූදානම් මානව ප්‍රාග්ධනය

අපගේ දිගුකාලීන සාර්ථකත්වය සහ තිරසාරභාවය රඳා පවතින්නේ අනාගතයට සූදානම් (Future-ready) ශ්‍රම බලකායක් මතය. මන්ද, අපගේ පාරිභෝගිකයින්, කොටස් හිමියන් සහ ප්‍රජාවන් වෙනුවෙන් වටිනාකම් උත්පාදනය කරනු ලබන්නේ ඔවුන් විසිනි. මෙහි දැක්වෙන්නේ අපගේ මානව ප්‍රාග්ධන කළමනාකරණයට (Human Capital Management) අදාළ මූලික හා වැදගත් තේමාවන්ය.

මානසික සුවතාව සහ යහපැවැත්ම

නිපුණතා කළමනාකරණය

පුහුණුව, සංවර්ධනය සහ කුසලතා ඔප්නැංවීම

සුරක්ෂිතතාව සහ පහසුව

අපගේ සියලුම පරිශ්‍රයන් තුළ, මානව ප්‍රාග්ධනයේ කායික මෙන්ම මානසික සෞඛ්‍යය සහ සුරක්ෂිතතාව (Health and Safety) තහවුරු කිරීම අපගේ ප්‍රමුඛතාවයකි. එලෙසම, අපගේ ඩිජිටල් හැකියාවන් පුළුල් කිරීම හරහා පාරිභෝගිකයින්ට කඩිනම් විසඳුම් ලබා දීමටත්, නම්‍යශීලී ලෙස පුහුණු හා සංවර්ධන කටයුතු (Learning and development) වෙත ප්‍රවේශ වීමටත් අපගේ සේවකයින් බලගන්වා ඇත.

සෞඛ්‍ය සහ සුරක්ෂිතතාව

ඩිජිටල් නායකත්වය

N O I S E

අවශ්‍යතා NEEDS	අවස්ථාවන් OPPORTUNITIES	වැඩිදියුණු කිරීම් IMPROVEMENTS	ශක්තීන් STRENGTHS	ව්‍යතිරේකයන් EXCEPTIONS
ඩිජිටල්කරණය හමුවේ සේවක කුසලතා අඛණ්ඩව යාවත්කාලීන කිරීම	බැංකුවේ ශක්තිමත් මූල්‍ය ස්ථාවරත්වය, උපායමාර්ගික පර්යේෂණ හා තොරතුරු තාක්ෂණ අංශවල විශේෂඥ වෘත්තිකයින් ආකර්ෂණය කර ගැනීමට ඉවහල් විය	ඩිජිටල් ඉගෙනුම් වේදිකා (Online Learning) හරහා පවතින පුහුණු පරතරය පියවා ගැනීම	ශක්තිමත් වෙළඳපොළ ස්ථාවරත්වය	දැඩි වෙළඳපොළ තරඟකාරිත්වය හමුවේ නව නිර්මිත කඩිනම්න් හඳුන්වා දීමේ අවශ්‍යතාව සහ විවිධ වයස් කාණ්ඩවල සේවකයින්ගේ කුසලතා අඛණ්ඩව යාවත්කාලීන කිරීමේ අවශ්‍යතාව
දක්ෂයින් රඳවා ගැනීම සඳහා වෙළඳපොළ සමඟ සැසඳිය හැකි තරඟකාරී වැටුප් පැකේජ සැකසීම	වෘත්තීය මට්ටම්න් ගොඩනැගුණු සන්නාම වටිනාකම හේතුවෙන්, කළමනාකරණ පුහුණුලාභීන් බඳවා ගැනීම සහ ඉලක්කගත සමාන්තර බඳවා ගැනීම් සාර්ථකව සිදු කිරීමට අපට හැකි විය	මානව සම්පත් තොරතුරු පද්ධතිය (HRIS) ක්‍රියාත්මක කිරීම නිසා කාලය ඉතිරි කරගනිමින් වඩාත් කාර්යක්ෂම ලෙස මානව සම්පත් කළමනාකරණය සිදු කිරීමට අවස්ථාව සැලසුණි	දිවයින පුරා විහිදුණු පුළුල් ශාඛා ජාලය සහ සේවා මධ්‍යස්ථාන පද්ධතිය	වැටුප් සහ දීමනා පැකේජ (Compensation packages) ඉහළ නැංවීමේදී පවතින සීමා
උපායමාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීමට හැකිවන පරිදි කාර්යසාධන කළමනාකරණය හැඩගැස්වීම	පුහුණුව හා සංවර්ධනය මෙන්ම මාර්ගගත පුහුණු වේදිකා (Online training platforms) ස්ථාපිත කිරීම උදෙසා වෙන් කළ අයවැය ප්‍රතිපාදන, බැංකුවට සාර්ථක මූල්‍ය ප්‍රතිඵල අත්කර ගැනීමට මනා පිටිවහලක් විය	කලාපීය මට්ටමින් උපදේශන සේවාවන් ස්ථාපිත කිරීම හරහා සේවක මානසික සෞඛ්‍යය සහ යහපැවැත්ම නංවාලීමට පියවර ගැනුණි	ශක්තිමත් මූල්‍ය ස්ථාවරත්වය හේතුවෙන් සේවක පුහුණුව, කුසලතා වර්ධනය සහ නවෝත්පාදන කටයුතු සඳහා පහසුවෙන් අයවැය ප්‍රතිපාදන වෙන් කිරීමට හැකි වීම	බඳවා ගැනීම් කඩිනම් කිරීම නිසා ආයතනික සංස්කෘතිය පිරිහීමට සහ පාලනය කළ නොහැකි වියදම් ඇතිවීමට ඉඩතිබේ
අවශ්‍ය කුසලතා පූර්ණ සහ සුදුසුකම් ලත් දක්ෂයින් ආයතනයට සම්බන්ධ කර ගැනීම නිරන්තර අභියෝගයක්ව පවතී	විචල්‍ය වැටුප් ක්‍රමවේද (Variable pay) සහ නායකත්ව සංවර්ධන වැඩසටහන්, 97%ක ඉහළ සේවක රඳවා ගැනීමේ ප්‍රතිශතයක් පවත්වා ගැනීමට දායක විය	බැංකුවේ ප්‍රබල සහ කැපී පෙනෙන සන්නාම ප්‍රතිරූපය, දක්ෂ මෙන්ම ඉහළ සුදුසුකම් සහිත නව සේවකයින් ආකර්ෂණය කර ගැනීමට මහත් රුකුලක් විය	ක්ෂේත්‍රයේ පවතින ඉහළම මට්ටමේ (Best-in-class) ඩිජිටල් හැකියාවන් හරහා තරුණ පරම්පරාවේ පාරිභෝගිකයින් ආකර්ෂණය කර ගැනීම	සඳහා Agile පුහුණුව සමඟ අඛණ්ඩ වෘත්තීය වර්ධන අවස්ථා ද ලබා දිය යුතුය
				තාක්ෂණය වෙනුවෙන් කරන ආයෝජන සාර්ථක වීමට නම්, විවිධ පසුබිම් සහිත සේවක මණ්ඩලයක් තුළ ඇතිවන ආකල්පමය වෙනස්කම් නිවැරදිව කළමනාකරණය කිරීම අත්‍යවශ්‍ය වේ
				තොරතුරු තාක්ෂණ, අවදානම් කළමනාකරණ, පාලන, අනුකූලතා සහ මූල්‍ය වැනි ක්ෂේත්‍ර සඳහා දක්ෂ වෘත්තිකයන් බඳවා ගැනීමේදී දැඩි අභියෝගයන්ට මුහුණ දීමට සිදුවේ

එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන අරමුණු සඳහා බැංකුවේ දායකත්වය




සියලුම පාරිභෝගික කාණ්ඩ සඳහා ණය පහසුකම් ලබා ගැනීමේ අවස්ථාව පුළුල් කිරීම මගින් දරිද්‍රතාවය පිටුදැකීම අරමුණු කරගනිමින්; මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරික ණය ලබා දීම සහ ප්‍රජා සංවර්ධන වැඩසටහන් සඳහා ආයෝජනය කිරීම මගින් බැංකුව මෙය සාක්ෂාත් කර ගැනීමට කටයුතු කරයි.



මූල්‍යකරණය, ප්‍රජා සෞඛ්‍ය ප්‍රවේශයන් සහ පාරිසරික සමාජීය සහ පාලන අනුබද්ධ (ESG) වැඩසටහන් හරහා සෞඛ්‍ය සේවා ප්‍රවේශය සඳහා සහාය වූ බැංකුව, එමඟින් සෞඛ්‍ය යටිතල පහසුකම් සලසා දීමටත්, සේවකයින් සහ ප්‍රජාවන් අතර සුවතාවය (Wellness) ප්‍රවර්ධනය කිරීමටත් කටයුතු කර ඇත.



අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන් අතර අධ්‍යාපනික අසමානතාවය අවම කිරීම අරමුණු කරගනිමින්, බැංකුව විසින් ශිෂ්‍යත්ව වැඩසටහන් දියත් කිරීම, අධ්‍යාපනික යටිතල පහසුකම් සඳහා සහාය වීම සහ මූල්‍ය සාක්ෂරතාවය ප්‍රවර්ධනය කිරීම සිදු කරන ලදී.



මූල්‍ය අන්තර්ගතභාවය පුළුල් කිරීම, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා සහාය වීම සහ ඩිජිටල් පරිවර්තනය උදෙසා ආයෝජනය කිරීම මගින්; ආර්ථික වර්ධනය දිරිමත් කිරීම, රැකියා උත්පාදනය සහ දිවයින පුරා මූල්‍ය සේවාවන් සඳහා සාධාරණ ප්‍රවේශයක් සහතික කිරීම බැංකුවේ අරමුණ විය.



මූල්‍ය අන්තර්ගතභාවය පුළුල් කිරීම, අර්ධ-නාගරික (උප-ග්‍රාමීය) ප්‍රජාවන්ට සහාය වීම සහ ආයතනික පාලනයට මෙන්ම ශ්‍රම බලකායට විවිධත්වය සහ සාධාරණත්වය අනුගත කිරීම මගින්; ආර්ථික සහ සමාජීය විෂමතා අවම කිරීමට බැංකුවේ උත්සාහය.

මානව සම්පත් පාලනය

GRI 2-23,24

මානව ප්‍රාග්ධන පාලනය (Human Capital Governance) නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයෙකුගේ විෂය පථයට අයත් වන අතර, ඔහු/ඇය සෘජුවම ප්‍රධාන විධායක නිලධාරියා වෙත වාර්තා කරමින්, අධ්‍යක්ෂ මණ්ඩලය, පාරිශ්‍රමික කමිටුව (Remuneration Committee) සහ මානව ප්‍රාග්ධනයට බලපාන අනෙකුත් අදාළ කමිටු සමඟ සම්පව සහයෝගයෙන් කටයුතු කරයි. අදාළ සියලුම කම්කරු නීති සහ නියාමන උපදෙස් වලට අනුකූල වීම සහතික කිරීම සහ බැංකුවේ ප්‍රතිපත්ති රාමුව තුළ මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරීම සඳහා උචිත මානව සම්පත් කළමනාකරණ උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම මානව සම්පත් දෙපාර්තමේන්තුවේ (HRD) වගකීමකි. අපගේ ශ්‍රම බලකායේ මූල්‍ය හා මූල්‍ය නොවන තිරසාරභාවය පිළිබඳ විනිවිද පෙනෙන වාර්තාකරණයක් සහතික කරනු වස්, S1 සහ S2 ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට (SLFRS) අනුකූලව ESG මූලධර්ම මානව ප්‍රාග්ධන කළමනාකරණයට ඒකාබද්ධ කිරීමට 2026 වසර සඳහා සැලසුම් කර ඇත.

- විනය රීති සංග්‍රහය
- විෂමාචාර සන්නිවේදන ප්‍රතිපත්තිය
- ආයතනික පාලනය
- ආචාර ධර්ම සංග්‍රහය

පැහැදිලි වගවීම සහ ශක්තිමත් අධීක්ෂණය මානව ප්‍රාග්ධන උපාය මාර්ගයේ පදනම වේ. දක්ෂතා හඳුනා ගැනීම සහ කළමනාකරණය අපගේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සහ දිගුකාලීන වටිනාකම් නිර්මාණය කිරීම මත පදනම් වේ. අපගේ මානව ප්‍රාග්ධනය ගොඩනැගීමේදී අනෙකුත් ප්‍රාග්ධන (Capitals) සමඟ අප සිදු කරන සමතුලිත කිරීම් (Trade-off), සදාචාරාත්මක ප්‍රමිතීන් සුරැකීම, විවිධත්වය ඇති කිරීම සහ විනිවිද පෙනෙන වාර්තාකරණය යන කරුණු මත පදනම් වේ.

නව බඳවා ගැනීම් ක්‍රියාවලියක ප්‍රමුඛතම අංශ ලෙස සලකා, උසස්වීම්, බඳවා ගැනීම් සහ පාරිශ්‍රමික ප්‍රතිපත්ති රාමුව 2025 වර්ෂයේදී සමාලෝචනයට ලක් විය. ක්‍රමානුකූල පරතර විශ්ලේෂණයක් (Gap Analysis) මගින් සකස් කළ මෙම යෝජිත රාමුව, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබුණු පසු 2026 වසරේදී බලාත්මක කිරීමට නියමිතය.

මෙහෙයුම් පරතරයන් (Operational gaps) හඳුනා ගැනීමට සහ පාලන ප්‍රතිපත්ති මෙන්ම නියාමන අවශ්‍යතා අනුගමනය කරන බව සහතික කරනු පිණිස, මානව සම්පත් විගණනයක් පැවැත්වීම සඳහා අපි ලංකා සේව්‍ය සම්මේලනය (EFC) සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹුණෙමු. මෙය 2026 වසරේදී ක්‍රියාත්මක කිරීමට නියමිතය.

සේවකයින්ගේ යහපත් වෘත්තීය සහ පෞද්ගලික ජීවන සමබරතාවය (Work-life balance) තහවුරු කරන අපගේ සමස්ත කළමනාකරණ ක්‍රියාවලිය සඳහා මානව සම්පත් පාලන ප්‍රතිපත්ති මාලාවක් මඟ පෙන්වනු ලබයි

දුක්ගැනවිලි කළමනාකරණය

GRI 2-16, 25

සේවක ගැටලු විසඳීම සඳහා වූ දුක්ගැනවිලි කළමනාකරණ යාන්ත්‍රණය (Grievance Handling mechanism) අපි අඛණ්ඩව ක්‍රියාත්මක කළෙමු. එහිදී සේවකයින්ට තමන්ගේ ගැටලු, පැමිණිලි සහ දුක්ගැනවිලි ඉදිරිපත් කිරීමට මෙන්ම ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය වෙත යෝජනා සහ නිර්දේශ ඉදිරිපත් කිරීමටද අවස්ථාව සැලසේ. විවිධ මාධ්‍යයන් ඔස්සේ ලැබෙන පැමිණිලි විශේෂ කමිටුවක් වෙත යොමු කෙරෙන අතර, ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ නිලධාරීන් විසින් ඒවා විමර්ශනය කර වැඩිදුර ක්‍රියාමාර්ග සඳහා ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී වෙත වාර්තා කරනු ලබයි.

මීට අමතරව, සේවකයින්ට තම ගැටලු සෘජුවම සහකාර සාමාන්‍යාධිකාරී (මානව සම්පත්) වෙත ඉදිරිපත් කළ හැකි, මානව සම්පත් තොරතුරු පද්ධතිය (HRIS) හා සම්බන්ධිත "Voice of Yours" (ඔබේ හඬ) නමැති චැට් (Chat) පහසුකම සහිත වේදිකාවක්ද ක්‍රියාත්මක වේ.

සාමූහික කේවල් කිරීමේ ගිවිසුම්

GRI 2-30

බැංකුව සේවක සංගම් හයක් සමඟ විධිමත් සාමූහික කේවල් කිරීමේ ගිවිසුම් පවත්වාගෙන යන අතර, සේවක ප්‍රතිපෝෂණ සඳහා "විවෘත ද්වාර" (Open-door) ප්‍රතිපත්තියක් ද අනුගමනය කරයි. මෙම ගිවිසුම් මගින් මුළු ශ්‍රම බලකායෙන් 99% ක් නියෝජනය කරමින්, ප්‍රධාන කළමනාකාර මට්ටම දක්වා වූ සියලුම සේවකයින් ආවරණය කෙරේ.

සංගමයේ නිදහස සහ සාමූහික කේවල් කිරීම සම්බන්ධයෙන් බැංකුවේ මෙහෙයුම් තුළ කිසිදු බාධාවක් හෝ සීමා කිරීමක් හඳුනාගෙන නොමැත. දැනට ක්‍රියාත්මක වන සාමූහික කේවල් කිරීමේ ගිවිසුම 2024 ජනවාරි 1 වන දින සිට වසර තුනක කාලයක් සඳහා අලුත් කරන ලදී.

සේවක සංගමය	සේවකයින් සංඛ්‍යාව
මහජන බැංකු නිලධාරීන්ගේ සංගමය	233
ජාතික සේවක සංගමය	94
ලංකා බැංකු සේවක සංගමය	5,948
ශ්‍රී ලංකා නිදහස් බැංකු සේවක සංගමය	23
සමස්ත ලංකා බැංකු සේවක සංගමය	30
ප්‍රගති බැංකු සේවක සංගමය	856
එකතුව	7,184

විෂමාචාර සන්නිවේදන ප්‍රතිපත්තිය

GRI 2-26

බැංකුවේ තිරසාරභාවයට තර්ජනයක් විය හැකි සිදුවීම්, "විෂමාචාර සන්නිවේදන" (Whistleblowing) ප්‍රතිපත්තිය යටතේ කළමනාකාරිත්වය වෙත යොමු කළ හැකිය. එවැනි වාර්තා කිරීම් තොරතුරු හෙළිදරව් කරන්නාගේ (Whistleblowing) ආරක්ෂාව තහවුරු කරමින් දැඩි රහස්‍යභාවයකින් යුතුව හසුරුවනු ලබන අතර, ගැටලු විසඳීමට සහ බැංකුවේ කීර්තිනාමය ආරක්ෂා කිරීමට බැංකුව කඩිනම් පියවර ගනු ලබයි.

පහත ආකාරයේ පැමිණිලි ආසන්න ප්‍රධානියා (Immediate supervisor) වෙත හෝ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව වෙත යොමු කළ හැකිය:

i. විනය රීති සංග්‍රහය උල්ලංඝනය කිරීම
ii. නීතිමය හෝ නියාමන බැඳීම්වලට අනුකූල වීමට අපොහොසත් වීම
iii. යුක්තිය පසිඳලීමේදී සිදුවන වැරදි (Miscarriage of Justice)
iv. මූල්‍ය අවභාවිතයන්

දූෂණ විරෝධී රාමුව

GRI 205-2, 3

දූෂණය සහ අල්ලස් සම්බන්ධයෙන් බැංකුව "ශූන්‍ය ඉවසීමේ" (Zero-tolerance) ස්ථාවරයක් පවත්වාගෙන යයි. දූෂිත හැසිරීම් පිළිබඳ පැහැදිලි නිර්වචනයන් සහ එවැනි කරුණු තහවුරු වූ අවස්ථාවන්හිදී ක්‍රියාත්මක කරනු ලබන කඩිනම් මෙන්ම දැඩි විනය පියවරයන් ඇතුළත් විස්තීර්ණ පුහුණු වැඩසටහන් මානව සම්පත් දෙපාර්තමේන්තුව (HRD) විසින් මෙහෙයවනු ලබයි. ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් (KMPs), ආයතනික කළමනාකාරිත්වය සහ අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා දූෂණ විරෝධී පිළිවෙත් සහ නියාමන අනුකූලතාවය පිළිබඳ පුහුණු වැඩසටහන් පුළුල් කිරීම 2026 වසරේදී සිදු කිරීමට නියමිතය.

දූෂණ විරෝධී පුහුණුව පිළිබඳ දත්ත

සන්නිවේදනය කරන ලද ප්‍රතිපත්තිය:	ප්‍රතිශතය (%)	සංඛ්‍යාව
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්	100	10
සියලුම සේවකයින්	100	සියලුම සේවකයින්
පුහුණුව ලැබූ සේවකයින්	53	4,314
2025 වර්ෂය සඳහා දූෂණ සිදුවීම්	0.7	59
විනය ක්‍රියාමාර්ග/සේවයෙන් පහ කිරීම්	0.8	69

කුසලතා කළමනාකරණ ක්‍රියාවලිය

GRI 2-7

අපගේ ස්ථිර සේවක සංඛ්‍යාව 6,599ක් වන අතර, තවත් සේවකයින් 1,523ක් පූර්ණ කාලීන පදනම මත කොන්ත්‍රාත් සේවකයන් වශයෙන් සේවය කරති. විවිධ දක්ෂතා, කුසලතා සහ වෘත්තීය නැඹුරුවාවන්ගෙන් හෙබි මෙම පිරිස, අනාගතයට ගැළපෙන (Future fit) කණ්ඩායමක් නිර්මාණය කිරීම සඳහා මනා සංකලනයක් එක් කරයි. වෙනස් වන වෙළෙඳපොළ අවශ්‍යතා සහ ව්‍යාපාරික ගතිකත්වයන්ට අනුකූල වන පරිදි අපගේ සේවකයින්ගේ කුසලතා ඉහළ නැංවීමට (Upskill) අපි අඛණ්ඩව කටයුතු කරන්නෙමු.



කුසලතා අත්පත් කර ගැනීම සහ සේවක පිරිවැටුම

GRI 401-1

දිවයින පුරා ව්‍යාප්ත වූ ගුණාත්මක රැකියා අවස්ථා නිර්මාණය කිරීම අපගේ ප්‍රමුඛතාවයකි. බැංකුවේ ශක්තිමත් බඳවා ගැනීමේ ප්‍රතිපත්ති රාමුව තුළ, අපගේ මෙහෙයුම් සහ සේවා අවශ්‍යතාවලට මැනවින් ගැළපෙන දක්ෂතා ඇති පිරිසක් බඳවා ගැනීමට අපි නිරන්තරයෙන් උත්සාහ කරන්නෙමු. බැංකුවේ පුළුල් ශාඛා සහ සේවා මධ්‍යස්ථාන ජාලය, තම ප්‍රජාවන් පිළිබඳ මනා අවබෝධයක් ඇති සහ එම ප්‍රදේශවලම සේවය කිරීමට කැමැත්තක් දක්වන දක්ෂයින් ආකර්ෂණය කර ගැනීමට සහ රඳවා ගැනීමට හැකි "අද්විතීය වටිනාකම් පිරිනැමීමක" (Unique Selling Proposition) වේ. මීට අමතරව, අනාගත බැංකුකරුවන් ලෙස ගොඩනැංවීම සඳහා අපගේ අවශ්‍යතාවලට වඩාත් උචිත කළමනාකරණ පුහුණුවන්නන් (Management Trainees) බඳවා ගැනීමට ද අපි සක්‍රීයව කටයුතු කරන්නෙමු.

පිරිවැය ප්‍රශස්ත කිරීම සඳහා "කුසලතා හඳුනාගැනීම, විශ්ලේෂණය හා ගැලපීම" (Talent mapping) මඟින් සේවකයින්ගේ කුසලතා පරතරයන් හඳුනාගෙන ඒවා පුහුණු වැඩසටහන් මඟින් විසඳනු ලැබේ. අයදුම්පත් අත්හුරු ක්‍රමයට එකතු කිරීමේ සිට මාර්ගගත ප්‍රවේශ විභාග පැවැත්වීම දක්වා ක්‍රියාවලීන් ඩිජිටල්කරණය කිරීම, පිරිවැය ප්‍රශස්තකරණය (Cost optimization) සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබා දෙයි.

ස්ත්‍රී පුරුෂ භාවය සහ පළාත අනුව කුසලතා අත්පත් කර ගැනීම (බඳවා ගැනීම්)

පළාත	18-25 වයස		26-35 වයස		36-45 වයස		46-55 වයස		>56 වයස		මුළු එකතුව		මුළු එකතුව %	
	පුරුෂ	ස්ත්‍රී	පුරුෂ	ස්ත්‍රී	පුරුෂ	ස්ත්‍රී	පුරුෂ	ස්ත්‍රී	පුරුෂ	ස්ත්‍රී	පුරුෂ	ස්ත්‍රී	පුරුෂ	ස්ත්‍රී
බස්නාහිර	140	123	1	1	3	1	2				146	125	53.9	46.1
දකුණ	36	8									36	8	81.8	18.2
මධ්‍යම	90	28		2							90	30	75.0	25.0
වයඹ	29	16									29	16	64.4	35.6
ඌව	55	6									55	6	90.2	9.8
උතුර	22	22									22	22	50.0	50.0
සබරගමුව	56	14		1							56	15	78.9	21.1
නැගෙනහිර	37	7									37	7	84.1	15.9
උතුරු මැද	45	10									45	10	81.8	18.2
එකතුව	510	234	1	4	3	1	2	0	0	0	516	239	68.3	31.7
ප්‍රතිශතය %	68.5	31.5	20.0	80.0	75.0	25.0	100.0	0	0	0	68.3	31.7		

ප්‍රධාන දක්ෂතා ආකර්ෂණය කර ගැනීම මෙන්ම ක්ෂේත්‍ර කණ්ඩායම් රඳවා ගැනීම අභියෝගයක්ව පවතී. මෙය ජය ගැනීම සඳහා, එම විශේෂඥ කුසලතා වෙනුවෙන් අපි තරඟකාරී පාරිශ්‍රමිකයක් (Competitive compensation) පිරිනමන්නෙමු. කෙසේ වෙතත්, පාරිශ්‍රමික සහ ප්‍රතිලාභ සම්බන්ධයෙන් පවතින ව්‍යවස්ථාපිත සීමාවන්ට අනුකූල වීමට බැංකුව බැඳී සිටින අතර, එම බාධාවන් ජය ගැනීමට අපි නිරන්තරයෙන් උත්සාහ කරමු. තොරතුරු තාක්ෂණ (IT), අවදානම් කළමනාකරණය සහ අනුකූලතාවය (Compliance) වැනි ක්ෂේත්‍ර සඳහා විශේෂඥ කුසලතා සපයා ගැනීම තවදුරටත් අභියෝගයක්ව පවතී.

ස්ත්‍රී පුරුෂ භාවය සහ පළාත අනුව සේවක පිරිවැටුම

පළාත	18-25 වයස		26-35 වයස		36-45 වයස		46-55 වයස		>56 වයස		මුළු එකතුව		මුළු එකතුව %	
	පුරුෂ	ස්ත්‍රී	පුරුෂ	ස්ත්‍රී	පුරුෂ	ස්ත්‍රී	පුරුෂ	ස්ත්‍රී	පුරුෂ	ස්ත්‍රී	පුරුෂ	ස්ත්‍රී	පුරුෂ	ස්ත්‍රී
බස්නාහිර	5	2	4	15	13	25	5	6	25	36	52	84	38.2	61.8
දකුණ			1	6	2	2		3	5	4	8	15	34.8	65.2
මධ්‍යම	1	1		3	1	2		2	3	7	5	15	25.0	75.0
වයඹ						1	3	1	7	7	10	9	52.6	47.4
ඌව	1	1			1	1	1	1	6	1	9	4	69.2	30.8
උතුර		1	1		1		1		3	2	6	3	66.7	33.3
සබරගමුව				2				2	1	5	1	9	10.0	90.0
නැගෙනහිර				1	1		2	1	1	1	4	3	57.1	42.9
උතුරු මැද			1	1	4	2			1	1	6	4	60.0	40.0
එකතුව	7	5	7	28	23	33	12	16	52	64	101	146	40.9	59.1
ප්‍රතිශතය %	58.3	41.7	20.0	80.0	41.1	58.9	42.9	57.1	44.8	55.2	40.9	59.1		

සේවක පිරිවැටුම් අනුපාත සංසන්දනය

	2025	2024	2023
මුළු සේවක පිරිවැටුම	247	304	293
පිරිවැටුම් අනුපාතය %	3	4	4
ස්වේච්ඡා සේවක පිරිවැටුම	89	121	147
ස්වේච්ඡා සේවක පිරිවැටුම අනුපාතය %	1	2	2

කණ්ඩායම් සංයුතිය

GRI 2-7

ස්ත්‍රී පුරුෂ භාවය සහ පළාත අනුව මුළු සේවක සංඛ්‍යාව (ස්ථිර සහ අනෙකුත් සේවකයින්)

පළාත	පුරුෂ	ස්ත්‍රී	එකතුව	මුළු එකතුව %
බස්නාහිර	1,223	2,005	3,228	40
දකුණ	302	519	821	10
මධ්‍යම	368	502	870	11
වයඹ	239	401	640	8
ඌව	232	247	479	6
උතුර	181	236	417	5
සබරගමුව	243	323	566	7
නැගෙනහිර	280	286	566	7
උතුරු මැද	236	299	535	7
එකතුව	3,304	4,818	8,122	100

ස්ත්‍රී පුරුෂ භාවය සහ පළාත අනුව ස්ථිර සේවකයින්

පළාත	පුරුෂ	ස්ත්‍රී	එකතුව	මුළු එකතුව %
බස්නාහිර	992	1,724	2,716	41
දකුණ	238	438	676	10
මධ්‍යම	250	408	658	10
වයඹ	191	350	541	8
ඌව	155	205	360	5
උතුර	147	186	333	5
සබරගමුව	156	277	433	7
නැගෙනහිර	227	250	477	7
උතුරු මැද	164	241	405	6
එකතුව	2,520	4,079	6,599	100

වයස සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව මුළු සේවක සංඛ්‍යාව

වයස් කාණ්ඩය	පුරුෂ	ස්ත්‍රී
18-25	650	521
26-35	516	1,049
36-45	1,291	2,602
46-55	601	370
>56	246	276
එකතුව	3,304	4,818

ස්ත්‍රී පුරුෂ භාවය සහ පළාත අනුව ස්ථිර නොවන සේවකයින්

පළාත	පුරුෂ	ස්ත්‍රී	එකතුව	මුළු එකතුව %
බස්නාහිර	231	281	512	34
දකුණ	64	81	145	10
මධ්‍යම	118	94	212	14
වයඹ	48	51	99	7
ඌව	77	42	119	8
උතුර	34	50	84	6
සබරගමුව	87	46	133	9
නැගෙනහිර	53	36	89	6
උතුරු මැද	72	58	130	9
එකතුව	784	739	1,523	100

විවිධත්වය, සමානාත්මතාවය සහ අන්තර්ගතභාවය

GRI 405-1

සමාන අවස්ථා පිරිනමන සේවා යෝජකයෙකු ලෙස, බැංකුව කිසිදු ආකාරයක වෙනස්කොට සැලකීමකින් තොරව සාධාරණ සහ විනිවිදභාවයෙන් යුතු බඳවා ගැනීමේ සහ උසස්වීම් ලබා දීමේ පිළිවෙත් අනුගමනය කරයි. දිවයින පුරා විහිදුණු අපගේ මෙහෙයුම් ජාලය තුළ, අන්‍යෝන්‍ය ගෞරවය සහිත සංස්කෘතියක් යටතේ සේවය කරන උද්යෝගිමත් සහ විවිධත්වයෙන් යුත් ශ්‍රම බලකායක් අප සතුය. වෙනස්කොට සැලකීම හෝ හානිකර හැසිරීම් කිසිසේත් ඉවසනු නොලැබෙන අතර, එවැනි ක්‍රියාවන් සඳහා විනයානුකූල ක්‍රියාමාර්ග ගනු ලැබේ.

වයස	ආයතනික කළමනාකාරිත්වය		විධායක කළමනාකාරිත්වය		නිලධාරීන් (3-III සිට I ශ්‍රේණිය දක්වා)		මාණ්ඩලික සහකාරක ශ්‍රේණි	
	පුරුෂ	ස්ත්‍රී	පුරුෂ	ස්ත්‍රී	පුරුෂ	ස්ත්‍රී	පුරුෂ	ස්ත්‍රී
18-25					1			
26-45				2	882	1,946	439	1,203
46-55	4	5	16	8	281	289	34	8
56 ට වැඩි	5	2	5	2	150	222	13	2
එකතුව	9	7	21	12	1,314	2,457	486	1,213
ප්‍රතිශතය %	56.3	43.8	63.6	36.4	34.8	65.2	28.6	71.4

ව්‍යාපාරික ඒකකය සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව මුළු සේවක සංඛ්‍යාව

ව්‍යාපාරික ඒකකය	පුරුෂ	ස්ත්‍රී	එකතුව
ශාඛා	2,217	3,758	5,975
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාල	465	407	872
භාණ්ඩාගාර සහ ප්‍රාථමික වෙළඳ ඒකකය (PDU)	13	24	37
ආයතනික සහ අත්වෙරළ බැංකු ඒකකය (OSBU)	43	110	153
එතෙර ගණුදෙනු ඒකකය	37	46	83
කාඩ්පත් මධ්‍යස්ථානය	33	36	69
ප්‍රධාන කාර්යාලය	494	431	925
ව්‍යාපාර පුනර්ජීවන ඒකකය	2	6	8
එකතුව	3,304	4,818	8,122

සේවකයන් නොවන ශ්‍රමිකයින්

GRI 2-8

බැංකුව සිය මෙහෙයුම් කටයුතු සඳහා සහාය ලබා ගැනීමට සේවකයින් නොවන ශ්‍රමික කාණ්ඩ දෙකක් සම්බන්ධ කර ගනී. එහි පළමු කාණ්ඩය වන්නේ අවසාන වසරේ විශ්වවිද්‍යාල සිසුන් සහ කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් සේවකයින් වන අතර, ඔවුන්ට බැංකු ක්ෂේත්‍රය පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබා ගැනීම සඳහා සීමාවාසික පුහුණුව හා වෙනත් පුහුණු අවස්ථා ලබා දී ඇත.

දෙවන කාණ්ඩය වන්නේ බාහිර සේවා සපයන ආයතන (Outsourcing companies) හරහා ලබා ගන්නා ආරක්ෂක නිලධාරීන් සහ රියදුරන් වැනි සහායක සේවක පිරිසයි. ඔවුන් බැංකුවේ ස්ථිර සේවකයින් නොවන නමුත්, බැංකුවේ ප්‍රධාන මෙහෙයුම්වලට සෘජුවම සම්බන්ධ නොවන, එහෙත් පර්යන්ත සේවාවන් පවත්වාගෙන යාම සඳහා අත්‍යවශ්‍ය වන කාර්යයන් ඉටු කරනු ලබයි.

කාණ්ඩය	මුළු එකතුව
විශ්වවිද්‍යාල තේරීම්ලාභීන්	1,290
බාහිර ආරක්ෂක නිලධාරීන්	1,346
බාහිර රියදුරන්	19
සේවකයින් නොවන මුළු ශ්‍රමික සංඛ්‍යාව	2,655

කුසලතා පූර්ණ සේවක රැඳවා ගැනීම

අපගේ සාර්ථකත්වයට අතිශයින්ම තීරණාත්මක සාධකයක් වන "කුසලතා පූර්ණ සේවක රැඳවා ගැනීම", 2025 වසර පුරා අභියෝගාත්මක කාර්යයක් විය. බාහිරව, පුද්ගලික බැංකු සහ මූල්‍ය තාක්ෂණ (Fintech) සමාගම් විසින් ඉතා තරඟකාරී වැටුප් පැකේජ ලබා දෙමින් සේවකයින් ආකර්ෂණය කර ගැනීමත්, අභ්‍යන්තරව පවතින සීමිත ව්‍යාප්තීය ගමන් මඟ (Limited lateral mobility) වැනි පෞරාණික ගැටලු නිසාත්, තාක්ෂණික දැනුමෙන් සන්නද්ධ පළපුරුදු මධ්‍යම මට්ටමේ සේවකයින් ඉවත් වීම සිදු වේ. මෙය කෙටි කාලීනව පිරවීමට අපහසු සේවක හිඩැසක් නිර්මාණය කරයි. මීට අමතරව, මෙම තත්ත්වය බඳවා ගැනීමේ පිරිවැය ඉහළ නැංවීමට සහ දිගුකාලීනව, තීරණාත්මක තනතුරු සඳහා වන අනුප්‍රාප්තික සැලසුම් දුර්වල කිරීමට ද හේතු වේ.

විවෘත සන්නිවේදනය ශක්තිමත් කිරීම සඳහා, සේවකයින්ට තම ව්‍යාප්තීය සංවර්ධන ගැටලු ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සමඟ සාකච්ඡා කළ හැකි "සේවක සහාය වැඩසටහන්" (Employee Assistance Programmes – EAPs) ස්ථාපිත කිරීමට අපි සැලසුම් කරමින් සිටිමු. බොහෝ අභියෝග මධ්‍යයේ වුවද, වසර අවසානයේදී බැංකුව 97% ක සමස්ත සේවක රැඳවා ගැනීමේ ප්‍රතිශතයක් වාර්තා කළ අතර, ආයතනික සහ විධායක කළමනාකාරිත්වය අතර 94% ක රැඳවා ගැනීමේ ප්‍රතිශතයක් පවත්වා ගැනීමට සමත් වීම දිරිගන්වන සුළු කරුණකි.

	කළමනාකරණ පුහුණුවන්නන්		ගණුදෙනුකාර සේවා සහායකයින්		අනෙකුත් සේවක කාණ්ඩ		වෙනත් කොන්ත්‍රාත් සේවකයින්		මුළු එකතුව		මුළු එකතුව %	
	පුරුෂ	ස්ත්‍රී	පුරුෂ	ස්ත්‍රී	පුරුෂ	ස්ත්‍රී	පුරුෂ	ස්ත්‍රී	පුරුෂ	ස්ත්‍රී	පුරුෂ	ස්ත්‍රී
			652	525				1	653	526	55.4	44.6
	2	4	96	186	372	295	13	15	1,804	3,651	33.1	66.9
					269	60			604	370	62.0	38.0
					70	43			243	271	47.3	52.7
	2	4	748	711	711	398	13	16	3,304	4,818	40.7	59.3
	33.3	66.7	51.3	48.7	64.1	35.9	44.8	55.2	40.7	59.3		

ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය

සමාන අවස්ථා ලබාදීම සඳහා වන අපගේ කැපවීම, ආයතනය තුළ විවිධත්වය, සමානාත්මතාවය සහ අන්තර්ගතභාවය (Inclusion) පෝෂණය කරන ආකාරය මගින් මනාව පිළිබිඹු වේ. අපගේ සේවක සංයුති දර්ශකය අනුව සමස්ත සේවක මණ්ඩලයෙන් 59%ක් කාන්තාවන් වන අතර, ඔවුන්ගෙන් 39%ක් ප්‍රධාන කළමනාකාරිත්ව තනතුරු ද, 59% ක් ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයෙන් ඉහළ තනතුරු ද හොබවති. ඉන් බොහොමයක් පිරිසක් අයකරීම් සහ මූල්‍ය වැනි ක්ෂේත්‍රවල සේවය කරන අතර, ඔවුන්ගේ වෘත්තීය වර්ධනය උදෙසා එම ක්ෂේත්‍රවලට අදාළ විශේෂඥ කුසලතා තවදුරටත් වර්ධනය කිරීමට බැංකුව කටයුතු කරයි. තවද, විශේෂ අවශ්‍යතා සහිත සේවකයින් වෙනුවෙන් අවශ්‍ය අනුබද්ධ සේවාවන් සපයන අතර, සේවක යහපැවැත්ම ප්‍රධාන නිර්ණායකයක් කරගත් සියලු දෙනාටම විවෘත සේවා පරිසරයක් (Inclusive Workplace) අප විසින් නිර්මාණය කර ඇත.

ලිංගික හිරිහැර සහ එවැනි උල්ලංඝනයන් සම්බන්ධයෙන් බැංකුව දැඩි (Zero Tolerance) ප්‍රතිපත්තියක් අනුගමනය කරයි. සේවකයින් පීඩාවට පත් කරන ඕනෑම අසතුටුදායක තත්ත්වයකින් ඔවුන් ආරක්ෂා කිරීම සඳහා ස්ථාපිත කර ඇති විශේෂ ප්‍රතිපත්ති මගින් එවැනි ක්‍රියාවන්ට එරෙහිව දැඩි පියවර ගනු ලැබේ.

ස්ත්‍රී පුරුෂ භාවය අනුව ප්‍රාදේශීය ව්‍යාප්තිය

ප්‍රාදේශිකය	පුරුෂ	ස්ත්‍රී
අම්පාර	126	112
අනුරාධපුරය	139	177
බදුල්ල	154	164
මඩකලපුව	79	106
කොළඹ උතුර	89	164
කොළඹ නැගෙනහිර	78	185
කොළඹ බටහිර	75	214
කොළඹ දකුණ	96	230
ගාල්ල	99	195
ගම්පහ	171	375
හම්බන්තොට	103	135
යාපනය	95	135
කළුතර	92	184
මහනුවර	151	277
කෑගල්ල	92	175
කුරුණෑගල	156	294
මාතලේ	81	100
මාතර	100	189
මොනරාගල	78	83
නුවරඑළිය	136	125
පොළොන්නරුව	97	122
පුත්තලම	83	107
රත්නපුර	151	148
වන්නි	86	101
ත්‍රිකුණාමලය	75	68
ප්‍රධාන කාර්යාලය	622	653
මුළු එකතුව	3,304	4,818

වයස් අනුව ප්‍රාදේශීය ව්‍යාප්තිය

පළාත	18-25 වයස් කාණ්ඩය		26-35 වයස් කාණ්ඩය		36-45 වයස් කාණ්ඩය		46-55 වයස් කාණ්ඩය		> 56 වයස් කාණ්ඩය	
	පුරුෂ	ස්ත්‍රී	පුරුෂ	ස්ත්‍රී	පුරුෂ	ස්ත්‍රී	පුරුෂ	ස්ත්‍රී	පුරුෂ	ස්ත්‍රී
බස්නාහිර	176	205	223	406	443	1,078	266	172	115	144
දකුණ	50	44	52	134	138	281	49	31	13	29
මධ්‍යම	109	67	48	115	134	270	49	34	28	16
වයඹ	42	39	26	79	117	225	41	34	13	24
ඌව	70	27	29	65	85	122	34	18	14	15
උතුර	26	41	29	35	79	133	37	23	10	4
සබරගමුව	72	36	48	85	73	170	35	13	15	19
නැගෙනහිර	49	26	29	63	113	164	65	26	24	7
උතුරු මැද	59	41	32	67	109	159	25	19	11	13
එකතුව	653	526	516	1,049	1,291	2,602	601	370	243	271

රැකියා කාණ්ඩ අනුව ස්ත්‍රී පුරුෂ නියෝජනය

රැකියා කාණ්ඩය	පුරුෂ	ස්ත්‍රී
ආයතනික කළමනාකාරිත්වය	9	7
විධායක කළමනාකාරිත්වය	21	12
නිලධාරීන් (3 - III ශ්‍රේණිය - I ශ්‍රේණිය)	1,314	2,457
මාණ්ඩලික සහකාර ශ්‍රේණි	486	1,213
ගණුදෙනුකාර සේවා සහායක	748	711
කළමනාකරණ පුහුණුවන්නන්/ තොරතුරු තාක්ෂණ උපාධිධාරීන්	2	4
රියදුරන්	117	
ආරක්ෂක අංශ	96	
ලේකම්වරුන්	21	243
පහළ ශ්‍රේණි	490	171
මුළු එකතුව	3,304	4,818

වැටුප් ගෙවීමේදී ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාවය

GRI 405-2

පිරිමි සහ ගැහැණු යන දෙපාර්ශ්වයේම සේවකයින් සඳහා ප්‍රතිලාභ සහ දීමනා පිරිනැමීමේදී "පූර්ණ වැටුප් සමානාත්මතාවය" මූලික පදනම ලෙස සැලකේ. වැටුප්වල යම් විෂමතාවයක් පවතී නම්, එය සේවා කාලයෙහි වෙනස්කම්, විශේෂිත කුසලතා හෝ වෘත්තීය අවශ්‍යතා මත පදනම් වූවක් මිස ස්ත්‍රී-පුරුෂ පක්ෂග්‍රාහීත්වයක් මත සිදු වන්නක් නොවේ.

බැංකුව සියලුම රැකියා කාණ්ඩ සහ ප්‍රධාන මෙහෙයුම් මධ්‍යස්ථාන හරහා, කාන්තාවන් සහ පිරිමින් අතර මූලික වැටුප සහ සමස්ත වන්දි ප්‍රතිලාභ 1:1 අනුපාතයකින් (සමාන මට්ටමක) පවත්වාගෙන යනු ලබයි. අපගේ ප්‍රතිපත්තිය මගින් කිසිදු වෙනස්කම් කිරීමකින් තොරව සියලුම සේවකයින්ට සමාන ලෙස සැලකීම සහතික කරයි. කෙසේ වෙතත්, සේවා කාලය හෝ වැටුප් ශ්‍රේණිවල පවතින වෙනස්කම් හේතුවෙන් සුළු විචල්‍යතාවයන් පැවතිය හැකිය.

සේවක කාණ්ඩය	සාමාන්‍ය මූලික වැටුප		මූලික වැටුප් අනුපාතය	
	පුරුෂ	ස්ත්‍රී	පුරුෂ	ස්ත්‍රී
ආයතනික කළමනාකාරිත්වය	362,000.00	357,230.00	1.0	0.99
විධායක කළමනාකාරිත්වය	289,480.29	288,474.09	1.0	1.00
නිලධාරීන් (3 - III ශ්‍රේණිය - I ශ්‍රේණිය)	125,287.25	126,500.25	1.0	1.01
මාණ්ඩලික සහකාර	74,137.84	74,424.45	1.0	1.00
අනෙකුත් කාණ්ඩ	59,216.26	55,379.76	1.0	0.94

දේශීය ප්‍රජාවගෙන් බඳවා ගැන්නා ලද ජ්‍යෙෂ්ඨ කළමණාකාරීත්ව අනුපාතය

GRI 202-2

බැංකුවේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය, කිසිදු වෙනස්කමකින් තොරව මූල්‍ය, අවදානම් කළමනාකරණය, නිෂ්පාදන සහ සේවා නවෝත්පාදන, අලෙවිකරණය සහ සන්නාමකරණය, පාලනය, විගණනය මෙන්ම නීතිවේදී සහ අනුකූලතා වැනි විවිධ විෂය ක්ෂේත්‍රයන් නියෝජනය කරන නිපුණතාවන්ගෙන් සමන්විත වේ. බැංකුව සිය සම්පූර්ණ සේවක මණ්ඩලයම දේශීය ප්‍රජාවෙන් බඳවා ගන්නා අතර, ඔවුන් බොහෝ දුරට අදාළ ප්‍රදේශවලින්ම තෝරා ගැනීමට කටයුතු කරයි. එමඟින් ප්‍රාදේශීය ප්‍රජාවන්ගේ අභිලාෂයන් මැනවින් තේරුම් ගැනීමටත්, පාරිභෝගිකයින් සමඟ සමීප සබඳතා පවත්වමින් ඔවුන්ගේ අවශ්‍යතා වඩාත් හොඳින් සපුරාලීමටත් සේවකයින්ට හැකියාව ලැබේ. මෙම ක්‍රියාවලිය දේශීය ප්‍රජාවන් සමඟ පවතින සබඳතා තවදුරටත් ශක්තිමත් කරන අතරම, ආගමික, සංස්කෘතික සහ ජනවාර්ගික විවිධත්වය කෙරෙහි අප දක්වන කැපවීම ද වඩාත් තහවුරු කරයි.

සේවක පුහුණුව සහ සංවර්ධනය

GRI 404-1,2

බැංකුව සිය උපායමාර්ගික අරමුණුවලට අනුකූලව, වසර ආරම්භයේදී පවත්වනු ලබන පුහුණු අවශ්‍යතා සමීක්ෂණයකට අනුව සකස් කළ වාර්ෂික පුහුණු දින දර්ශනයකට අනුව සේවක පුහුණු කටයුතු සිදු කරයි. ඉලක්කගත සංවර්ධනයක් සහතික කිරීම සඳහා, හඳුනාගත් කුසලතා පරතරයන් (Skill gaps) පියවීමට අවශ්‍ය පරිදි පුහුණු පැය වෙන් කරනු ලැබේ. බැංකු මෙහෙයුම්, අවදානම් කළමනාකරණය, දූෂණ විරෝධී පියවර, වෘත්තීය සෞඛ්‍ය හා ආරක්ෂාව මෙන්ම විවිධ මෘදු කුසලතා (Soft skills) ආවරණය වන පරිදි ව්‍යුහගත පුහුණු වැඩසටහන් මාලාවක් වසර පුරා ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව, වසර තුළ සෑම සේවකයෙකුම ආසන්න වශයෙන් පැය 27ක පුහුණුවක් ලබා ඇති අතර, ඒ සඳහා සිදු කළ මුළු ආයෝජනය රුපියල් මිලියන 190.3කි. සේවක පුහුණුව සහ සංවර්ධනය, වැටුප් වර්ධක, උසස්වීම් සහ අනෙකුත් ප්‍රතිලාභ ලබා දීමේදී ප්‍රමුඛ සාධකයක් වන අතරම, එය සේවක අභිප්‍රේරණය සහ පුරෝගාමීත්වය වර්ධනය කිරීමට ද ඉවහල් වේ.

පුහුණු වැඩසටහන් පිළිබඳ සාරාංශය

පුහුණු වැඩසටහන් වර්ගය	වැඩසටහන් සංඛ්‍යාව	සහභාගී වූ පිරිස	මුළු පුහුණු පැය ගණන
අභ්‍යන්තර පුහුණුව	491	27710	211,933
බාහිර පුහුණුව	96	474	6,122
විදේශීය පුහුණුව	20	72	2,583
එකතුව	607	28,256	220,638

විස්තරය	2025	2024	2023
පුහුණු පිරිවැය (රුපියල් මිලියන)	190.3	121.5	96.6
මුළු පුහුණු පැය ගණන	220,638	196,755	190,671
එක සේවකයෙකුට සාමාන්‍ය පුහුණු පැය ගණන	ආසන්න වශයෙන් පැය 27	ආසන්න වශයෙන් පැය 26	ආසන්න වශයෙන් පැය 25
ඩිජිටල් පුහුණු පැය ගණන	39,072	35,287	29,468
මාර්ගගත පුහුණු වැඩසටහන් සංඛ්‍යාව	39	27	25

ස්ත්‍රී පුරුෂ භාවය අනුව සාමාන්‍ය පුහුණු පැය ගණන

පිරිමි **ආසන්න වශයෙන් පැය 24**

ගැහැණු **ආසන්න වශයෙන් පැය 29**

වසර තුළ සේවක පුහුණුව පිළිබඳ අවධානය සහ ක්‍රියාත්මක කිරීම	2025	2024	2023
සැලසුම් කළ පුහුණු වැඩසටහන් සංඛ්‍යාව	525	475	375
ක්‍රියාත්මක කළ පුහුණු වැඩසටහන් සංඛ්‍යාව	607	591	511

අභ්‍යන්තර සම්පත්දායකයින් යනු අදාළ තාක්ෂණික පුහුණු වැඩසටහන්වලට අදාළ විෂයයන් පිළිබඳ මනා නිපුණතාවයක් සහිත කාර්ය මණ්ඩල සාමාජිකයින් වන අතර, 2025 වසර තුළ එවැනි අභ්‍යන්තර සම්පත්දායකයින් 150කට අධික පිරිසක් තම සේවය ලබා දී ඇත.

සේවක පුහුණුව සහ සංවර්ධන ක්‍රියාවලිය



තවත් සන්ධිස්ථානයක් සනිටුහන් කරමින්, විවිධ ක්ෂේත්‍ර ඔස්සේ පවත්වන ලද සෘජු පුහුණු වැඩසටහන්වලට අමතරව, ඩිජිටල්කරණය කරන ලද ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය (LMS) මගිනක් ඩිජිටල් පුහුණු පැය 39,000ක් සාර්ථකව නිම කරන ලදී. 2026 මැද භාගය වන විට මෙම LMS පද්ධතියේ පූර්ණ ක්‍රියාකාරිත්වය අපේක්ෂා කෙරේ. සියලුම දෙපාර්තමේන්තු ආවරණය වන පරිදි සකස් කළ ව්‍යුහගත වැඩසටහනක් යටතේ, වෘත්තීය නිපුණතා වර්ධනය කිරීමට සහ කණ්ඩායම් සහජීවනය ඇති කිරීම සඳහා අපි, භූමිකාව සහ කාර්යය පදනම් කරගත් (role-based and function-based) පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කළෙමු.

විධායක කළමනාකාරිත්වය සහ ආයතනික කළමනාකාරිත්වය සඳහා විදේශීය පුහුණුව ඇතුළත් වෘත්තීය සංවර්ධන වැඩසටහන් බාහිර සම්පත්දායකයින්ගේ සහභාගිත්වයෙන් සැලසුම් කරන ලද අතර, එමඟින් අපගේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ අතිරේක සේවක ශක්තිය (bench-strength) සවිබල ගැන්විණි.

රැකියා කාණ්ඩය අනුව සේවක පුහුණුව

රැකියා කාණ්ඩය	සාමාන්‍ය පුහුණු පැය	
	පුරුෂ	ස්ත්‍රී
ආයතනික කළමනාකාරිත්වය	69	93
විධායක කළමනාකාරිත්වය	42	85
නිලධාරීන් (III ශ්‍රේණිය – I ශ්‍රේණිය)	35	31
මාණ්ඩලික සහාකාරවරුන්	27	26
ගණුදෙනුකාර සේවා සහායකයින්	17	33
කළමනාකරණ පුහුණුවන්නන්/තොරතුරු තාක්ෂණ උපාධිධාරීන්	20	79
වෙනත්	9	20

LMS පද්ධතියට අමතරව, අපගේ මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලය විසින් පුද්ගල සංවර්ධනය, පාරිභෝගික කේන්ද්‍රීයභාවය සහ විශේෂඥ දැනුම හුවමාරු කර ගැනීම වැනි මාතෘකා ඔස්සේ මෘදු කුසලතා (soft skills) සහ පුද්ගල සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කරමින් පුහුණු වැඩසටහන්ද අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී.

නායකත්ව අනුප්‍රාප්තික ධාරාව (leadership pipeline) ශක්තිමත් කිරීම සහ කළමනාකරණ හැකියාවන් ඉහළ නැංවීම සඳහා බැංකුව වසර පුරා සිය "ව්‍යුහගත නායකත්ව සංවර්ධන වැඩසටහන" අඛණ්ඩව පවත්වාගෙන ගියේය. ආයතනයේ දිගුකාලීන අරමුණු සමඟ සමපාත වන පරිදි උපායමාර්ගික චින්තනය, පුද්ගල කළමනාකරණය සහ තීරණ ගැනීමේ කුසලතාවලින් නවක සහ වත්මන් නායකයින් සන්නද්ධ කිරීම සඳහා මෙම වැඩසටහන සැලසුම් කර ඇත.

පුහුණු වැඩසටහන	ඉලක්කගත කණ්ඩායම	වැඩසටහන් සංඛ්‍යාව	සහභාගී වූ සංඛ්‍යාව
නායකත්ව සංවර්ධන – විදේශ	ආයතනික කළමනාකාරිත්වය	2	9
වෙනස්වීම් කළමනාකරණය සහ විවිධත්වය තුළ පුද්ගල කළමනාකරණය	ශාඛා/දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය	10	332
වඩා හොඳ රැකියා සබඳතා සඳහා ඵලදායී පුහුණු කිරීම, මග පෙන්වීම	ශාඛා කළමනාකරුවන්	2	72
නායකත්ව කුසලතා සංවර්ධනය	ශාඛා කළමනාකරුවන්, ශාඛා/දෙපාර්තමේන්තු/ප්‍රාදේශීය කාර්ය මණ්ඩලය	8	207
නායකත්ව අනුප්‍රාප්තික පෙළගැස්ම	ශාඛා/දෙපාර්තමේන්තු/ප්‍රාදේශීය කාර්ය මණ්ඩලය	2	66
කාර්යයන් ප්‍රමුඛකරණය සහ රැකියාව හා පෞද්ගලික ජීවිතය අතර සමබරතාවය	ශාඛා/දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය	12	465
ඉහළ කාර්යසාධනයක් සඳහා කණ්ඩායම් ගොඩනැගීම සහ කණ්ඩායම් සහයෝගිතාවය	ශාඛා/දෙපාර්තමේන්තු/ප්‍රාදේශීය කාර්ය මණ්ඩලය සහ ප්‍රාදේශීය අනුකූලතා නිලධාරීන්	4	124
එකතුව		40	1,275

වේතන සහ ප්‍රතිලාභ

GRI 401-2

සේවක කාණ්ඩය, කුසලතා මට්ටම සහ තාක්ෂණික ප්‍රවීණතාව මත පදනම් වූ පුළුල් මූල්‍යමය හා මූල්‍යමය නොවන ප්‍රතිලාභ පද්ධතියක් බැංකුව සියලුම ස්ථිර සේවකයින් වෙත පිරිනමයි. කිසිදු වෙනස්කොට සැලකීමකින් තොරව සමානාත්මතාව අගයන සේවා යෝජකයෙකු ලෙස, අපගේ සේවක මණ්ඩලයේ වෘත්තීය සහ පෞද්ගලික ජීවිතය අතර මනා සමතුලිතභාවය අගයන (work-life balance) තහවුරු කිරීමට නිරන්තරයෙන් කැපවී සිටින්නෙමු. එසේම, සේවකයින්ගේ දැනුම යාවත්කාලීන කිරීම සහ කුසලතා ඔප්නැංවීම (reskilling) උදෙසා සැලකිය යුතු ආයෝජනයක් සිදුකරන අතරම, ජ්‍යෙෂ්ඨ සේවකයින් වෙනුවෙන් සුරක්ෂිත විශ්‍රාම ප්‍රතිලාභ සහතික කිරීමට ද අපි පියවර ගෙන ඇත්තෙමු.

බැංකුවේ සමස්ත සේවක මණ්ඩලයෙන් 99%ක්ම ආවරණය වන පරිදි ක්‍රියාත්මක වන සාමූහික ගිවිසුම (Collective Bargaining Agreement), සෑම වසර තුනකට වරක්ම අලුත් කරනු ලබන අතර, එමඟින් සියලුම වේතන සහ ප්‍රතිලාභ වැඩිවීම් විධිමත්ව තහවුරු කෙරේ. ඒ අනුව, 2024 ජනවාරි මස අලුත් කරන ලද වත්මන් ගිවිසුම 2026 දෙසැම්බර් 31 දක්වා වලංගු වේ.

තවද, පවත්නා නීති රෙගුලාසිවලට අනුකූලව පාරිතෝෂික (Gratuity), සේවක අර්ථසාධක අරමුදල (EPF) සහ සේවක භාර අරමුදල (ETF) සඳහා වන සියලු හිමිකම් සේවකයින් වෙත සහතික කර ඇත. 2025 මූල්‍ය වර්ෂය සඳහා පමණක් බැංකුව විසින් ETF සඳහා රුපියල් මිලියන 526.6ක් සහ EPF සඳහා රුපියල් මිලියන 2,106.3ක් බැගින් දායකත්වය ලබා දී තිබේ.

ප්‍රසූත නිවාඩු

GRI 401-3

විස්තරය	2025	2024
මාපිය නිවාඩු සඳහා හිමිකම් ඇති සේවක සංඛ්‍යාව	4,818	4,736
ප්‍රසූත නිවාඩු ලබාගත් සේවක සංඛ්‍යාව	227	655
නිවාඩු අවසානයේ වාර්තාකරණ කාලය තුළ නැවත සේවයට වාර්තා කළ සේවක සංඛ්‍යාව	115	511
ප්‍රසූති නිවාඩුවෙන් පසුව නැවත සේවයට පැමිණ, මාස 12ක් තුළ සේවයෙන් ඉවත් නොවී සිටි සේවිකාවන් සංඛ්‍යාව	115	511
සේවයට වාර්තා කිරීමේ ප්‍රතිශතය (%)	50.7	78.0
සේවක රඳවා ගැනීමේ ප්‍රතිශතය (%)	100	100

ප්‍රතිලාභය	විස්තරය
ජීවිත රක්ෂණය	පුද්ගලික අනතුරු රක්ෂණ සැලසුම
සෞඛ්‍ය ආරක්ෂණය	ශල්‍යකර්ම සහ රෝහල්ගතවීම් ආවරණය වන වෛද්‍ය ප්‍රතිලාභ සහ මරණ පාරිතෝෂික දීමනා
ආබාධිත සහ ගිලන්වීමේ ආවරණය	හිමිකම් පවතී
කොටස් හිමිකාරිත්වය	හිමිකම් නොමැත
විශ්‍රාම ප්‍රතිපාදන	හිමිකම් පවතී
අනෙකුත් ප්‍රතිලාභ	වාර්ෂික ප්‍රසාද දීමනා සහ අනෙකුත් දීමනා, ඇතැම් ශ්‍රේණි සඳහා ප්‍රවාහන දීමනා, නිවාඩු නිකේතන පහසුකම්, සේවක ණය, පුස්තකාල පහසුකම්, ඇඟයීම් සහ සම්මාන වැඩසටහන්, වසර 25ක සේවා ප්‍රණාම සම්මාන ප්‍රදානය, පිට පළාත් සේවකයින් සඳහා නවාතැන් පහසුකම්
මාපිය නිවාඩු	ප්‍රසූත නිවාඩු පමණක් පිරිනමනු ලැබේ

අවම වැටුප් අවශ්‍යතා


GRI 202-1

බැංකු ක්ෂේත්‍රය තුළ ප්‍රවේශ මට්ටමේ සේවකයින් (Entry-level) සඳහා ස්ත්‍රී-පුරුෂ භාවය මත පදනම් වූ නීතිමය අවම වැටුප් සීමාවක් නියම කර නොමැත. කෙසේ වෙතත්, බැංකුව විසින් පිරිනමනු ලබන ප්‍රවේශ මට්ටමේ ආරම්භක වැටුප්, දේශීය අවම වැටුප් අවශ්‍යතාවලට වඩා ඉහළ මට්ටමක පවතී.

මෙහෙයුම් වෙනස්කම් පිළිබඳ අවම දැනුම් දීමේ කාලසීමාව

GRI 402-1

මෙහෙයුම් වෙනස්කම්, සේවා මාරුවීම් සහ රැකියා භ්‍රමණයන් (job rotations) සිදු කිරීමේදී, අදාළ සේවකයින්ට ඒ සඳහා අවශ්‍ය සූදානම් වීම් පහසුවෙන් කර ගැනීමට හැකි වන පරිදි ප්‍රමාණවත් කාලයක් ලබා දෙමින් ඒ පිළිබඳව දැනුම් දෙනු ලැබේ. දැනුම් දිය යුතු අවම කාලසීමාව සහ ඒ සම්බන්ධ උපදේශන හා සාකච්ඡා පිළිබඳ විධිවිධාන, දැනට බලාත්මකව පවතින සාමූහික ගිවිසුම් තුළ පැහැදිලිව සඳහන් කර ඇත.



වෘත්තීය සෞඛ්‍ය සහ ආරක්ෂාව

GRI 403-2, 3, 4, 5, 6, 7, 9, 10

බැංකුව සිය සේවකයින්, ගනුදෙනුකරුවන් සහ අනෙකුත් පාර්ශ්වකරුවන් සඳහා ආරක්ෂිත මෙන්ම සෞඛ්‍ය සම්පන්න සේවා ස්ථානයක් පවත්වාගෙන යාමට කැපවී සිටී. සියලු මෙහෙයුම් කටයුතුවලදී සෞඛ්‍ය හා ආරක්ෂණ ගැටළු කෙරෙහි අවධානය යොමු කරමින් සහ අදාළ ආරක්ෂණ ප්‍රමිතීන්ට අනුකූල වෙමින්, සුරක්ෂිත සේවා පරිසරයක් සහතික කිරීමට බැංකුව පියවර ගෙන ඇත. ශක්තිමත් ආරක්ෂණ සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම සහ උපද්‍රවවලින් තොර සේවා ස්ථානයක් පවත්වා ගැනීම සඳහා විධිමත් සෞඛ්‍ය හා ආරක්ෂණ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක වේ. එමෙන්ම, සිදුවිය හැකි අනතුරු සඳහා සේවකයින් සූදානම් කරවීමේ අරමුණින් දැනුවත් කිරීමේ වැඩසටහන් සහ පුහුණු සැසි ද අඛණ්ඩව ශක්තිමත් කරනු ලැබේ. 2025 වසර තුළ රාජකාර්මය කටයුතුවලට අදාළ කිසිදු සේවක මරණයක් වාර්තා වී නොමැත.

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – බැංකු සහාය සේවා, යටතේ ක්‍රියාත්මක "ගිනි සහ ආපදා කළමණාකරණ ඒකකය" (Fire and Disaster Recovery Unit) මඟින් බැංකුවේ ආරක්ෂක ක්‍රියාවලීන් අධීක්ෂණය කරනු ලබයි. ප්‍රධාන කාර්යාලයේ මෙන්ම ශාඛා ජාලයේ සේවක පිරිස ප්‍රාදේශීය සම්බන්ධීකාරකවරුන් ලෙස කටයුතු කරන අතර, ඔවුන්ට අදාළ ආරක්ෂණ පියවරයන් පිළිබඳ විධිමත් පුහුණුවක් ලබා දී ඇත. උපද්‍රව හඳුනා ගැනීම, අවදානම් තක්සේරු කිරීම සහ අනතුරු පිළිබඳ විමර්ශනය කිරීමේ වගකීම භාර නිලධාරියා (Officer in Charge) වෙත පැවරේ. බැංකුවේ සෑම දෙපාර්තමේන්තුවක් සඳහාම ආපදා කළමණාකරණ සැලැස්මක් ස්ථාපිත කර ඇති අතර, 2025 වසරේදී ද කොළඹ ගිනි නිවන සේවා දෙපාර්තමේන්තුව හා ඒකාබද්ධව වාර්ෂික ගිනි හා ආපදා පෙරහුරුවක් පවත්වන ලදී.

මීට අමතරව, හදිසි අවස්ථාවකදී පූර්ව සූදානම තහවුරු කිරීම සඳහා ප්‍රධාන කාර්යාලයේ සහ ප්‍රාදේශීය කාර්යාලවල ප්‍රථමාධාර පෙරහුරු ඇතුළු පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කෙරිණි. 2025 වසර තුළ රාජකාර්මය කටයුතුවලට අදාළ තුවාලවීම් 15ක් වාර්තා වූ අතර, රාජකාරියට සම්බන්ධ වෘත්තීය රෝගාබාධ (Work-related illnesses) කිසිවක් වාර්තා වී නොමැත.

අපගේ සේවකයින්ගේ මානසික යහපැවැත්ම, ඔවුන්ගේ පෞද්ගලික මෙන්ම වෘත්තීය සංවර්ධනය සඳහා ද අත්‍යවශ්‍ය සාධකයක් ලෙස බැංකුව හඳුනාගෙන ඇත. ඒ අනුව, මානසික සුවතාවය ඉහළ නැංවීම සඳහා සහාය අවශ්‍ය සේවකයින් වෙනුවෙන් සුදුසුකම් ලත් වෘත්තිකයෙකුගේ උපදේශන සේවාවන් සහිත "ස්වයං සුවතා මධ්‍යස්ථානයක්" (Self Wellness Centre) බැංකුව විසින් ස්ථාපිත කර ඇත. මෙම ගැටලු නිරාකරණය කිරීමේදී 100%ක රහස්‍යභාවය සුරැකෙන සහ සේවකයාට කිසිදු පීඩනයක් විල්ල නොවන පරිසරයක් සහතික කිරීමට මානව සම්පත් දෙපාර්තමේන්තුව කටයුතු කරයි. ක්ෂේත්‍රයේ ප්‍රථම වතාවට මෙම සේවාව සේවකයින්ගේ දරුවන් සඳහා ද ව්‍යාප්ත කර ඇති අතර, එමඟින් සේවකයින් වෙත මනා සහයෝගයක් ද හිමිවේ. සේවකයින්ගේ ශාරීරික හා මානසික සුවතාව තවදුරටත් වර්ධනය කිරීම සඳහා ප්‍රධාන කාර්යාලයේදී යෝග (Yoga) සහ ඇරොබික් (Aerobic) ව්‍යායාම සැසි නොමිලේ පවත්වනු ලැබේ. එසේම, සේවක සෞඛ්‍ය පහසුකම් පුළුල් කරමින් පැරණි ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ නවලෝක වෛද්‍ය මධ්‍යස්ථානයක් ද ස්ථාපිත කර ඇත.

සේවකයින්ගේ දෛනික ජීවිතයට සිදුවන බාධා අවම කරමින්, වෘත්තීය සහ පෞද්ගලික ජීවිතය අතර සමතුලිතතාව (Work-life balance) රැකගැනීම සඳහා ප්‍රාදේශීය පදනම මත බඳවා ගැනීම් සහ ස්ථානගත කිරීම් සිදු කිරීමට ප්‍රමුඛත්වය ලබා දී ඇත.

තවද, යන්ත්‍ර සූත්‍ර භාවිතයේදී ශරීරයට සිදුවිය හැකි දිගුකාලීන බලපෑම් සලකා බලා, සුවපහසු සහ ආරක්ෂිත සේවා පරිසරයක් සහතික වන පරිදි අපගේ සේවා ස්ථාන නියමිත කායික විද්‍යාත්මක ප්‍රමිතීන්ට (Ergonomically) අනුකූලව නිර්මාණය කර ඇත

සෞඛ්‍ය හා ආරක්ෂාව සම්බන්ධව 2025 වසර තුළ දරන ලද වියදම්

විස්තරය	රු.මි.
වෛද්‍ය වියදම්	2,804.6
ගිනි සහ ආරක්ෂක වියදම්	88.4
එකතුව	2,893.0

වෘත්තීය සෞඛ්‍ය සහ ආරක්ෂාව පිළිබඳ පුහුණුව

වැඩසටහන	වැඩසටහන් සංඛ්‍යාව	සහභාගී වූ සංඛ්‍යාව
මහජන බැංකුවේ ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්ම (BCP), ආපදා කළමනාකරණ සැලැස්ම සහ වෘත්තීය සෞඛ්‍ය හා ආරක්ෂාව	30	1,745
ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණ පද්ධතිය (BCMS)	1	127
සේවා ස්ථානයේ ගිනි ආරක්ෂණය සහ සුරක්ෂිතතාව පිළිබඳ සම්මන්ත්‍රණය	2	69
එකතුව	33	1,941

කාර්ය සාධන කළමනාකරණය

GRI 404-3

බැංකුව සියලුම සේවකයින් සඳහා පූර්ව නිශ්චිත ඇගයීම් නිර්ණායකයන්ට අනුකූලව වාර්ෂික කාර්ය සාධන ඇගයීම් සිදු කරයි. මෙය සේවකයා සහ අධීක්ෂකවරයා අතර අන්‍යෝන්‍ය ප්‍රතිපෝෂණ (Mutual feedback) හුවමාරු කරගත හැකි ද්වි-මාර්ග කාර්ය සාධන කළමනාකරණ පද්ධතියක් (Two-way performance management system) හරහා ක්‍රියාත්මක වේ.

ඵලදායිතාව සහ ප්‍රතිලාභ ඇගයීමේ මෙම නව ක්‍රමවේදයට සේවකයින් ක්‍රමයෙන් හුරුවීමත් සමඟ, මාර්ගගත ද්වි-මාර්ග කාර්ය සාධන කළමනාකරණ පද්ධතිය තවදුරටත් සාර්ථකව ඉදිරියට ගෙන යන ලදී. ස්වයං-ඇගයීම (Self-evaluation) මඟින් තම ඵලදායිතාව පිළිබඳව සේවකයා තුළ දැනුවත්භාවයක් ඇති කිරීමත්, අනතුරුව ද්විතීයික අධීක්ෂකවරයා විසින් සිදුකරන ඇගයීමත් හරහා අර්ථවත් සංවාද ගොඩනැගීමටත්, කුසලතා පරතරය හඳුනා ගැනීමටත් සහ උචිත ඉගෙනුම් හා සංවර්ධන කටයුතුවල නිරත වීමටත් මෙමඟින් මග පෑදිණි. 2025 වසරේදී බැංකුවේ සියලුම සේවකයින් (100%) වාර්ෂික කාර්ය සාධන ඇගයීමට භාජනය වූ බව සහතික කරන ලද අතර, එමඟින් සෑම මට්ටමකම සේවකයින්ගේ වෘත්තීය අභිවර්ධනය, කුසලතා ඇගයීම සහ සංවර්ධනය තහවුරු විය.

උසස්වීම් සහ ස්ථාන මාරුවීම්

සියලුම මට්ටම්වල සේවකයින් සඳහා සංවර්ධන අවස්ථා පුළුල් කරමින්, ඔවුන්ගේ සිරස් සහ පාර්ශ්වීය වෘත්තීය අභිවර්ධනය (Vertical and lateral career growth) සහතික වන පරිදි බැංකුවේ උසස්වීම් සහ ස්ථාන මාරුවීම් ප්‍රතිපත්ති සකස් කර ඇත. මෙම ප්‍රතිපත්ති විනිවිදභාවයකින් යුක්ත වන අතර, එක් එක් ශ්‍රේණියට අදාළව ව්‍යුහගත කර ඇති බැවින් වෘත්තීය ප්‍රගමනයේදී සාධාරණත්වය සහ පැහැදිලිභාවය තහවුරු වේ.


ජ්‍යෙෂ්ඨ කළමනාකාර මට්ටම දක්වා උසස්වීම් ලිඛිත විභාගයක් සහ වාචික පරීක්ෂණයක් (Viva) පදනම් කරගෙන සිදුවන අතර, විධායක හා ආයතනික කළමනාකාරිත්වයේ තනතුරු සඳහා පත්වීම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මුඛ පරීක්ෂණ ක්‍රියාවලියක් හරහා අනුමත කරනු ලැබේ. පුරප්පාඩු පිරවීමේ ක්‍රියාවලිය හරහා සේවකයින්ට තම වෘත්තීය මට්ටම ඉහළ නංවා ගැනීමට අවස්ථාව ලැබෙන අතර, එමඟින් සේවකයින්ගේ වෘත්තීය අභිවර්ධනය සඳහා විධිමත් මාවතක් සැලසේ.

ව්‍යාපාරික අවශ්‍යතාවලට අනුකූලව සිදුකරනු ලබන සේවා ස්ථාන මාරුවීම්වලදී, සේවකයාට ගමන් කිරීමට සිදුවන දුර පිළිබඳව ද අවධානය යොමු කෙරේ. මාරුවීම් සම්බන්ධයෙන් වන යම් අතෘප්තිමත්භාවයක් පවතී නම්, ස්ථාන මාරුවීම් ප්‍රතිපත්තිය යටතේ ස්ථාපිත කර ඇති අභියාචනා කමිටුව (Appeals Committee) වෙත යොමු කිරීමේ හැකියාව පවතී.

අනුප්‍රාප්තික සැලසුම්කරණය

විධායක සහ ආයතනික කළමනාකරණ මට්ටම්වල මෙහෙයුම් කටයුතු කිසිදු බාධාවකින් තොරව අඛණ්ඩව පවත්වාගෙන යාම සහතික කිරීම සඳහා, උපායමාර්ගිකව සකස් කරන ලද සහ අනුමත කරන ලද අනුප්‍රාප්තික සැලැස්මක් (Succession Plan) ක්‍රියාත්මක වේ. ව්‍යාපාරයේ තිරසාරභාවය උදෙසා මෙය අතිශයින් වැදගත් වන අතර, කළමනාකරණ කාණ්ඩය සඳහා වන අනුමත සේවක මණ්ඩල සැලැස්ම (Cadre Plan) මඟින් ද ඊට අවශ්‍ය සහාය ලබා දෙයි.

අනාගතයේදී ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් (Key Management Persons – KMP) ලෙස වගකීම් දැරීමට තරුණ බැංකුකරුවන් සන්නද්ධ කිරීමේ අරමුණින්, විධායක සංවර්ධන සහ නායකත්ව කුසලතා වර්ධනය කිරීමේ විශේෂ වැඩසටහන් බැංකුව විසින් පවත්වනු ලබයි.



සේවක සහභාගිත්ව ක්‍රියාකාරකම්

ගල් විහාර පුදබිමේදී පැවැත්වූ දානමය පිංකම සහ සීල සමාදාන වැඩසටහන





47 වන වාර්ෂික නත්තල් කැරොල් ගී ප්‍රසංගය





පොසොන් පුන් පොහෝ දින නිමිත්තෙන් පැවැත්වූ බැතිගී සරණිය සහ පුණ්‍ය මහෝත්සවය



21 වන වාර්ෂික අන්තර් ශාඛා දැනුම මිනුම තරඟය



විවිධ ක්‍රීඩා උත්සව







සක්‍රීය දායකත්වයක් දක්වන සේවක මණ්ඩලය යනු සහයෝගීතාව, නවෝත්පාදන සහ සියලු දෙනා ඇතුළත් කරන ලද (Inclusivity) සංස්කෘතියක් පෝෂණය කරන බලවේගයකි. සේවකයින් අතර සුහදශීලී අන්තර්ක්‍රියාකාරිත්වයක් ඇති කිරීම සඳහා අපි සැලසුම්කරන ලද සේවක සහභාගිත්ව ක්‍රියාකාරකම් මාලාවක් ක්‍රියාත්මක කළෙමු. බාහිර සමාජ සුබසාධන කටයුතු, ක්‍රීඩා උත්සව සහ අභ්‍යන්තර සාකච්ඡා මණ්ඩප (Dialogue forums) මෙයට ඇතුළත් වූ අතර, ඒමඟින් සේවක අපේක්ෂාවන් ආයතනික අරමුණු සමඟ සමපාත කිරීමටත්, ඵලදායී මෙන්ම අභියෝගයන්ට මුහුණදියහැකි අනාගතයට සූදානම් කණ්ඩායමක් ගොඩනැගීමටත් අවස්ථාව සැලසිණි.

විෂමතා සිදුවීම් සහ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග

GRI 406-1

ක්ෂේත්‍රයේ වැඩිම කාන්තා සේවක නියෝජනයක් සහිත බැංකුව වීම, මහජන බැංකුවේ අපක්ෂපාතී (Non-discriminatory) ප්‍රතිපත්තිය මැනවින් පිළිබිඹු කරන්නකි. 59%ක කාන්තා සේවක ප්‍රතිශතයක් සහිත දිවයින පුරා විහිදුණු ආයතනයක් ලෙස, බැංකුව සිය කාන්තා සේවා නියුක්තිකයන්ගේ වෘත්තීය සහ පෞද්ගලික ජීවිතය අතර සමතුලිතතාවය (Work-life balance) රැකගැනීම සඳහා අවශ්‍ය පහසුකම් සලසා දෙයි. ඕනෑම ආකාරයක ශාරීරික හෝ මානසික හිරිහැර සිදු කිරීම් සපුරා තහනම් වන අතර, එවැනි උත්සාහයකදී වුවද දැඩි විනය ක්‍රියාමාර්ග ගනු ලැබේ. බැංකුවේ මෙහෙයුම් කටයුතු ඩිජිටල් තාක්ෂණය ඔස්සේ නවීකරණය වීමත් සමඟ, මෙම විනය ක්‍රියාමාර්ග භෞතික සේවා පරිසරයට මෙන්ම ඩිජිටල් මාධ්‍ය ඔස්සේ සිදුවන සන්නිවේදනයන්ට ද එකලෙස බලපැවැත්වේ.

2025 වසරේදී බැංකුවේ සියලුම ශාඛා සහ ප්‍රධාන කාර්යාලය තුළ කිසිදු වෙනස්කොට සැලකීමක් හෝ හිරිහැර කිරීමක් පිළිබඳ පැමිණිල්ලක් වාර්තා වී නොමැති අතර, එය අපගේ සේවක සුබසාධනය උදෙසා වන නොසැලෙන කැපවීම විදහා දක්වන්නකි.

මානව හිමිකම්, ළමා ශ්‍රමය සහ බලහත්කාර ශ්‍රමය

GRI 408-1, 409-1

අප රටේ මානව හිමිකම් සුරකින උත්තරීතර නීතිය වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට මෙන්ම, බාහිර සාධක නොසලකා සෑම පුද්ගලයෙකුටම හිමි අහිමි කළ නොහැකි මූලික මානව අයිතිවාසිකම් ප්‍රකාශයට පත් කරමින් 1948 දී එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් සම්මත කරන ලද මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයට (UDHR) අපි දැඩි ලෙස අනුකූල වන්නෙමු.

සියලු පාර්ශ්වයන්ගේ අයිතිවාසිකම් සුරැකෙන පරිදි ව්‍යාපාරික කටයුතු මෙහෙයවන අපි මානව හිමිකම් සුරැකීම පිළිබඳව සහතික වන්නෙමු. මෙම වාර්තාකරණ කාලසීමාව තුළ, ළමා ශ්‍රමය, බලහත්කාර ශ්‍රමය හෝ අනිවාර්ය ශ්‍රමය (compulsory labour) සම්බන්ධයෙන් සැලකිය යුතු අවදානමක් සහිත කිසිදු සැපයුම්කරුවෙකු හෝ මෙහෙයුම් ක්‍රියාවලියක් හඳුනාගෙන නොමැති බව සහතික කරන්නෙමු.

"දිට්වා" සුළි කුණාටුවට වෙනුවෙන් සිදුකළ සේවක සුභසාධන වැඩපිළිවෙළ

"දිට්වා" සුළි කුණාටුව හමුවේ, බැංකුව දිවයින පුරා විපතට පත් සේවකයින් සඳහා මූල්‍යමය මෙන්ම ක්‍රියාකාරී දායකත්වය ලබාදීම සිදු කෙරුණි. සුළි කුණාටුවෙන් පීඩාවට පත් වූ සේවකයින් 261 දෙනෙකුට ක්ෂණික මූල්‍ය ආධාර ලෙස රුපියල් 20,000 බැගින් ද, සේවකයින් 135 දෙනෙකුට "මහජන මෙහෙවර සෙනෙහස" වැඩසටහන යටතේ රුපියල් 10,000 බැගින් ද ප්‍රදානය කරන ලදී. රුපියල් මිලියන 1ක උපරිම සීමාවක් සහිත "දිට්වා" විශේෂ ණය පහසුකම ද මීට සමගාමීව හඳුන්වා දෙන ලදී. මීට අමතරව, කොළඹ ඇතුළු බලපෑමට ලක් වූ ප්‍රදේශවල පිරිසිදු කිරීමේ සහ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ආයතනික කළමනාකාරිත්වය සහ කාර්ය මණ්ඩලය ස්වේච්ඡාවෙන් සහාය විය.

අභියෝගය

අපගේ තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව සඳහා අවශ්‍ය මානව සම්පත් සපුරා ගැනීමේදී, පළපුරුදු, දැනුමැති සහ දක්ෂ තොරතුරු තාක්ෂණ වෘත්තිකයන් බඳවා ගැනීම අපට මුහුණ දීමට සිදුව ඇති අභියෝගයකි. ක්ෂේත්‍රයේ සිටින වෘත්තිකයන් අපේක්ෂා කරන ප්‍රතිලාභ පැකේජයන්, රාජ්‍ය ආයතනයක් ලෙස සපුරාලීමට ඇති සීමාවන් මීට ප්‍රධාන හේතුවයි.

2026 සඳහා ඉදිරි දැක්ම

ඩිජිටල්කරණය කරන ලද ඉගෙනුම් හා සංවර්ධන ක්‍රියාවලියක සහාය ඇතිව, ප්‍රතිසංස්කරණය කරන ලද උසස්වීම්, බඳවා ගැනීම් සහ පාර්ශ්වික සැලසුම් ක්‍රියාත්මක කරමින්, වෙළඳපොළේ වත්මන් ඉල්ලුමට ගැලපෙන පරිදි අපගේ වැඩසටහන් ව්‍යාප්ත කිරීමට කටයුතු යොදමින් පවතී. බැංකුවේ උපායමාර්ගික අරමුණු සමඟ බද්ධ වී ඇති මානව සම්පත් උපායමාර්ගය, එම අරමුණු සාක්ෂාත් කර ගැනීමට සහ අපගේ සාර්ථක කාර්ය සාධනයට පදනම සපයයි.

අප අභියෝගවලට මුහුණ දුන්නද, අපගේ සේවක මණ්ඩලයේ පවතින පුරප්පාඩු පිරවීම සඳහා වෙළඳපොළෙන් නිපුනත්වයෙන් යුතු විශේෂඥයින් සොයා ගැනීම සඳහා අපි නොකඩවා වෙහෙස වන්නෙමු.

සමාජීය සහ සම්බන්ධතා ප්‍රාග්ධනය



සමාජීය සහ සම්බන්ධතා ප්‍රාග්ධනය ගොඩනැගීම මෙන්ම පෝෂණය කිරීම අපගේ තිරසාර වර්ධනයේ පදනමයි. බැංකුවේ උපායමාර්ගික ඉදිරි දැක්මෙහි මූලික පදනමක් ලෙස, හුදෙක් ගනුදෙනු මත පදනම් වූ බැංකුකරණයෙන් ඔබ්බට යමින්; ගනුදෙනුකරුවන්, ව්‍යාපාරික හවුල්කරුවන්, ආයෝජකයින්, ප්‍රජාවන් සහ නියාමන ආයතන සමඟ ගැඹුරු සබඳතාවක් පවත්වා ගැනීම අත්‍යවශ්‍ය වේ.

අපගේ ප්‍රමුඛතාවය

සියලු දෙනා ඇතුළත් කරගත් (inclusive) ඩිජිටල් වේදිකා සහ ප්‍රජාව බලගන්වන වැඩසටහන් අඛණ්ඩව සංවර්ධනය කිරීමට අපි අවධානය යොමු කළෙමු. එමෙන්ම, අපගේ ශාඛා ජාලය හරහා දිවයින පුරා පවතින පුළුල් සබඳතාව තවදුරටත් ශක්තිමත් කළෙමු. මහජන සුභසාධනය මූලික අරමුණක් කරගත් විශ්වාසනීය මූල්‍ය සහකරු ලෙස, පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය තහවුරු කිරීමටත්, ශ්‍රී ලංකාවේ සමාජ-ආර්ථික සංවර්ධනය උදෙසා අර්ථවත් දායකත්වයක් ලබා දීමටත් අපි නොකඩවා කැපවූයෙමු.

අපගේ උපායමාර්ග

සමාජීය සහ සම්බන්ධතා ප්‍රාග්ධනය උපායමාර්ගික වත්කමක් ලෙස බැංකුව විසින් සලකනු ලබන අතර, විවිධ පාර්ශ්වකරුවන් සමඟ විශ්වාසය මත පදනම් වූ හවුල්කාරිත්වයන් ගොඩනැගීමට ප්‍රමුඛතාව ලබා දෙයි. අපගේ පුළුල් ශාඛා ජාලය සහ ඩිජිටල් වේදිකා උපයෝගී කරගනිමින්, විවිධ සමාජ ස්ථරයන් (demographic segments) කරා සමීප වෙමින් එම සබඳතා තවදුරටත් තහවුරු කිරීමට අපි පියවර ගත්තෙමු. ගනුදෙනුකරුවන් කේන්ද්‍ර කරගත් නවෝත්පාදන, විනිවිදභාවයෙන් යුතු සැපයුම්කාර සම්බන්ධතා සහ වගකීම් සහගත පාලන රාමුවක් තුළින් ශ්‍රී ලංකාවේ සමාජ-ආර්ථික වර්ධනයේ විශ්වාසනීය හවුල්කරුවෙකු ලෙස අප සතු ස්ථානය තවදුරටත් ශක්තිමත් කළෙමු.

විශේෂ කරුණු

2025 වසරේ එක්වූ නව ගනුදෙනුකරුවන් සංඛ්‍යාව	**540,740**
ඩිජිටල් ගනුදෙනු සංඛ්‍යාව	**ආසන්න වශයෙන් බිලියන 200**
නියෝජිත බැංකු සහ වොස්ට්‍රෝ (Vostro) නියෝජිතයින් සංඛ්‍යාව	**136**
සමාජ සත්කාරක (CSR) ව්‍යාපෘති සඳහා ආයෝජනය	**රු. මිලියන 26.9**
රජය වෙත ලබාදුන් දායකත්වය	**රු. බිලියන 49.0**
ගනුදෙනුකාර පැමිණිලි විසඳීමේ ප්‍රතිශතය	**89.7%**
ඩිජිටල් ගනුදෙනුවල මුළු වටිනාකම	**රු. ට්‍රිලියන 1.7**
දේශීය සැපයුම්කරුවන් වෙත කරන ලද ගෙවීම්	**96.1%**
ප්‍රජා මූලික සංවර්ධන ණය ප්‍රදානය	**රු. බිලියන 15.8**
හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය (ROE)	**20.1%**

දායකත්වය ලබාදුන් ප්‍රමුඛ තේමා

ගනුදෙනුකරු කේන්ද්‍ර කරගත් ව්‍යාපාරික පිළිවෙතක් අනුගමනය කරන අපගේ බැංකුවේ අඛණ්ඩ ක්‍රියාකාරිත්වය සහතික කිරීමෙහිලා සැපයුම්කරුවන් සුවිශේෂී දායකත්වයක් ලබා දෙයි. වගකීම් සහගත ණය ලබාදීමේ ක්‍රමවේදයන් ඔස්සේ මූල්‍ය අන්තර්ගතකරණය (Financial Inclusivity) ප්‍රවර්ධනය කිරීමට කැපවන බැංකුව, දිගුකාලීන පදනමක් සහිත තිරසාර ව්‍යාපාරික මෙහෙයුම් සහතික කරයි.

- ගනුදෙනුකාර තෘප්තිය
- ගනුදෙනුකාර දත්ත ආරක්ෂණය
- වගකීම් සහිත ණය ලබාදීම
- සැපයුම්කරුගේ වටිනාකම් දාමය
- සෞඛ්‍යය සහ ආරක්ෂාව
- ඩිජිටල් නායකත්වය

N	O	I	S	E
අවශ්‍යතා NEEDS	**අවස්ථාවන්** OPPORTUNITIES	**වැඩිදියුණු කිරීම්** IMPROVEMENTS	**ශක්තීන්** STRENGTHS	**ව්‍යතිරේකයන්** EXCEPTIONS
පාර්ශ්වකරුවන්, විශේෂයෙන්ම නියාමන ආයතන සහ ප්‍රජාව සමඟ පවතින විශ්වාසය හා විනිවිදභාවය තවදුරටත් තහවුරු කිරීම.	ප්‍රජා සබඳතා වඩාත් සමීප කිරීම සඳහා බැංකුවේ පුළුල් ශාඛා පද්ධතිය සහ ඩිජිටල් ජාලය උපයෝගී කරගන්නා ලදී.	ගනුදෙනුකරුවන්ට වඩාත් සමීප පුද්ගලානුබද්ධ සේවාවක් ලබාදීම සඳහා උසස් ගනුදෙනුකාර සබඳතා කළමනාකරණ (CRM) පද්ධති වෙනුවෙන් ආයෝජනය කරන ලදී.	විශ්වාසනීය රාජ්‍ය මූල්‍ය ආයතනයක් ලෙස ශක්තිමත් සන්නාම කීර්තියක් හිමිවීම.	විකල්ප සහ නව්‍ය ඩිජිටල් විසඳුම් ඉදිරිපත් කරන පුද්ගලික බැංකු හා මූල්‍ය තාක්ෂණ (Fintech) ආයතනවලින් වැල්ල වන ඉහළ යන තරගකාරිත්වය.
අඩු පහසුකම් සහිත ජන කොටස් වෙත සමීප වෙමින් මූල්‍ය අන්තර්ගත භාවයක් සහිත සේවාවන් වඩාත් පුළුල් කිරීම.	මූල්‍ය අන්තර්ගතභාවය සහ ඉතිරිකිරීමේ සංස්කෘතිය ප්‍රවර්ධනය කිරීමෙහිලා ජාතික මට්ටමේ ප්‍රමුඛයා ලෙස ස්ථානගතව සිටීම.	ඩිජිටල් පරිවර්තනය උදෙසා අඛණ්ඩව ආයෝජනය කරන ලදී. සංවාද වැඩසටහන් සම්ක්ෂණ සහ ප්‍රජා වැඩසටහන් මඟින් පාර්ශ්වකරුවන් සමඟ පවතින සන්නිවේදනය සහ අදහස් හුවමාරුව ශක්තිමත් කිරීම.	විවිධ සමාජ ස්ථරයන්ට පහසුවෙන් ප්‍රවේශ විය හැකි පුළුල් ශාඛා ජාලයක් සහ ඩිජිටල් වේදිකා සතු වීම.	සේවා ගුණාත්මකභාවය හෝ විනිවිදභාවය පිරිහීමකට ලක් වුවහොත් ආයතනික කීර්ති නාමයට වැල්ල විය හැකි අවදානම්
ගනුදෙනුකරුගේ විකාශනය වෙමින් පවතින අපේක්ෂාවන් සපුරාලීම සඳහා ඩිජිටල් සබඳතා තවදුරටත් ශක්තිමත් කිරීම.	සමාජ-ආර්ථික සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී රජය සහ රාජ්‍ය නොවන සංවිධාන සමඟ සහයෝගීතාවයෙන් කටයුතු කරන ලදී.	වගවීම සහ සමාජීය බලපෑම මැනවින් විදහා දැක්වීම සඳහා පාරිසරික, සමාජීය සහ පාලන (ESG) වාර්තාකරණය වැඩි දියුණු කිරීම.	ඉතිරිකිරීම් සහ මූල්‍ය සාක්ෂරතාව ප්‍රවර්ධනය කිරීමේදී දීර්ඝ කාලීන ප්‍රජා සබඳතාව සහ විශ්වසනීයත්වය. ව්‍යාපාර කටයුතු කිරීමට සමාජයෙන් ලැබී ඇති ශක්තිමත් පිළිගැනීම.	පාරිභෝගික විශ්වාසයට සහ සබඳතාවල ස්ථාවරත්වයට බලපාන ආර්ථික අස්ථාවරත්වය. නව බඳවා ගැනීම් වලදී වැල්ල විය හැකි අභියෝග.

එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන අරමුණු සඳහා බැංකුවේ දායකත්වය



දිවයින පුරා විහිදී ඇති බැංකුවේ ශාඛා සහ සේවා මධ්‍යස්ථාන ජාලය, අඩු පහසුකම් සහිත ප්‍රජාවන් වෙත සමීප වෙමින් මූල්‍ය අන්තර්ගතකරණ වැඩපිළිවෙළ සාර්ථක කර ගැනීමට මනා පිටිවහලක් සපයයි. එක් එක් ගනුදෙනුකාර කාණ්ඩයට ගැළපෙන පරිදි විවිධාංගීකරණය වූ නිෂ්පාදන සහ සේවා ලබා දීම මඟින් දරිද්‍රතාව අවම කිරීමත්, ආර්ථික වර්ධනය සඳහා අවස්ථාවන් උදා කිරීමත් අපගේ අරමුණයි.



ගනුදෙනුකරුවන් වෙත පිරිනමන විවිධාංගීකරණය වූ නිෂ්පාදන තුළින් මෙන්ම, ක්‍රියාවලීන් ප්‍රතිනිර්මාණය කරමින් (process reimagining) වෙළඳපොළ වෙත කඩිනම් සේවාවක් සැපයීමට ඉවහල් වන පූර්ණ ඩිජිටල්කරණය තුළින්,බැංකුව සතු නවෝත්පාදන හැකියාව මනාව පිළිබිඹු වේ. මෙම කඩිනම් ඩිජිටල්කරණ මෙහෙයුම, අදාළ අවශ්‍යතාවන් තම ව්‍යාපාරික ක්‍රියාවලියට අඛණ්ඩව අනුගත කිරීමට බැංකුව දක්වන කැපවීම පිළිබඳ මනා සාක්ෂියකි.



මහජන සුභසාධනය සහ මූල්‍ය ස්ථාවරත්වය යන කරුණු ද්විත්වයම ඒකාබද්ධ වූ බැංකුවේ උපායමාර්ගික ප්‍රවේශය, පුළුල් පරාසයක විහිදුණු ජන කොට්ඨාසයක් තම ගනුදෙනුකාර පදනමකට ඇතුළත් කර ගැනීමට කදිම වේදිකාවක් සපයයි. එමඟින් සමාජීය අසමානතාවන් අවම කිරීම උදෙසා අර්ථවත් දායකත්වයක් ලබා දීමට බැංකුවට හැකියාව ලැබී ඇත.



දශක ගණනාවක වගවීම මත පදනම් වූ අර්ථවත් ESG (පාරිසරික, සමාජීය සහ පාලන) ප්‍රවේශයක් සහිතව, බැංකුව සිය ජාතික සංවර්ධන මෙහෙවර ඉටු කරයි. එහිදී හිඟ සම්පත් වගකීම් සහගත ලෙස පරිභෝජනය කිරීමටත්, විනාශ වී යාමේ තර්ජනයට ලක්ව ඇති මිහිතලය සුරැකීම උදෙසා කටයුතු කිරීමටත් බැංකුව කැපවී සිටියි.



වටිනාකම් මත පදනම් වූ හවුල්කාරිත්වයන ගොඩනැගීම මඟින්, දේශීය මෙන්ම ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළ සිය කීර්ති නාමය තවදුරටත් ශක්තිමත් කරගන්නා බැංකුව, සමාන අරමුණු සහිත පද්ධතීන් සමඟ එක්ව ගනුදෙනුකරුවන් වෙත විශිෂ්ට සේවාවක් සැපයීමට කටයුතු කරයි.

ගනුදෙනුකාර ප්‍රාග්ධනය

අපගේ තිරසාරභාවයේ පදනම වන්නේ ගනුදෙනුකරුවන් සමඟ පවත්නා දීර්ඝකාලීන සබඳතාවයි. විවිධ වූ ගනුදෙනුකාර කාණ්ඩ සමඟ සමීප සබඳතා ගොඩනැගීමේදී, වේගවත් ඩිජිටල් පරිවර්තනය මෙන්ම සෑම සේවා ස්ථානයකදීම (point of contact) ලබාදෙන විශිෂ්ට සේවාව අතිශය තීරණාත්මක වේ.

අපගේ ගනුදෙනුකාර වටිනාකම් ප්‍රදානය

GRI 2-6

අපගේ පාරිභෝගික වටිනාකම් ප්‍රදානය මූලික වශයෙන් ජාතික මහජන සුභසාධනය පදනම් කර ගත්තකි. එය අපගේ ගනුදෙනුකරුවන් වසර 65ක් පුරා අප කෙරෙහි තැබූ නොසැලෙන විශ්වාසය මත ගොඩනැගී ඇත. සැලසුම්කරණ ක්‍රියාවලියේදී සහ නිෂ්පාදන සංවර්ධනයේදී පාරිභෝගික තෘප්තිය කෙරෙහි මූලික අවධානය යොමු කරන අප, එමඟින් බාධාවකින් තොර සහ පහසුවෙන් ප්‍රවේශ විය හැකි බැංකුකරණ අත්දැකීමක් ලබා දීමට කටයුතු කරන්නෙමු. ව්‍යාපාර මෙහෙයවීම සඳහා වන සමාජීය පිළිගැනීමෙන් (social license) ඔබ්බට යමින්, ග්‍රාමීය සහ අඩු පහසුකම් සහිත ප්‍රජාවන්ගේ අවශ්‍යතාවන්ට ගැළපෙන නිෂ්පාදන සහ සේවා සමඟින් අපි ඔවුන් වෙත සමීප වන්නෙමු. එමෙන්ම, ධනය නිර්මාණය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා ඔවුන් බලගැන්වීමේ අරමුණින් මූල්‍ය සාක්ෂරතාව පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් ද පවත්වන්නෙමු. පහසුවෙන් භාවිත කළ හැකි (user-friendly) ඩිජිටල් වේදිකා අප සතු අතර, අපි නිරන්තරයෙන් ගනුදෙනුකාර අපේක්ෂාවන් ඉක්මවා යමින් මූල්‍ය සාර්ථකත්වයේ සහ තිරසාර සංවර්ධනයේ විශ්වාසනීය හවුල්කරු ලෙස අපගේ සන්නාමය තවදුරටත් ශක්තිමත් කරන්නෙමු.

උසස් ඩිජිටල් හැකියාවන් සහ සේවා විශිෂ්ටත්වය ලබා දීම සඳහා වන අඛණ්ඩ කැපවීමේ එකතුවෙන් අපගේ ගනුදෙනුකාර පදනම තවදුරටත් පුළුල් කිරීමටත් පෞද්ගලික අංශය සමඟ අපගේ සබඳතා වර්ධනය කිරීමට ඉඩ සලසයි. වසර පුරා ශාඛා මූලික බැංකුකරණය අඩුවෙමින් තිබියදී, ජංගම සහ අන්තර්ජාල බැංකුකරණ මොඩියුලයන් ගනුදෙනුකරුවන් අතර වඩාත් ප්‍රිය වූවක් විය. බැංකුකරණයේ පහසුව උදෙසා පවතින ඉල්ලුම ඉහළ යාමත් සමඟ, අපි ඩිජිටල් පරිවර්තනය වේගවත් කළ අතර ගනුදෙනුකාර කේන්ද්‍රීය නවෝත්පාදන සහ මෙහෙයුම් පද්ධති හඳුන්වා දුන්නෙමු.


ඒ අනුව, 2025 වසර අවසානය වන විට බැංකුව ඩිජිටල් ගනුදෙනුකාර විසඳුම් සංඛ්‍යාව මිලියන 5 සීමාව ඉක්මවා ගියේය. මාර්ගගත (online) සහ ජංගම බැංකුකරණ පහසුකම් ඔස්සේ, ශක්තිමත් සයිබර් ආරක්ෂණයකින් සහ ඉහළ මෙහෙයුම් කාර්යක්ෂමතාවයකින් යුතු මූල්‍ය අන්තර්ග්‍රහණ සේවා සැපයීමට අපි පියවර ගත්තෙමු. අපගේ ඩිජිටල් ව්‍යාප්තිය හරහා, මෙතෙක් බැංකු සේවා නිසි ලෙස නොලැබුණු ග්‍රාමීය ප්‍රජාවන් සක්‍රීය ගනුදෙනුකරුවන් බවට පත් කිරීමටත්, ඔවුන්ගේ ආර්ථික කටයුතු සඳහා අර්ථවත් දායකත්වයක් ලබා දීමටත් අපට හැකියාව ලැබුණි.

සුවිශේෂී ද්විත්ව ස්වභාවය

විශ්වාසනීය උරුමය සහ වේගවත් නවීකරණය යන අංශ ද්විත්වයම මනාව සමපාත කරන මහජන බැංකුව, ඩිජිටල් තාක්ෂණයට හුරු නාගරික තරුණ ප්‍රජාවගේ සිට ගතානුගතික ග්‍රාමීය මෙන්ම ජ්‍යෙෂ්ඨ පුරවැසියන් දක්වා වූ පුළුල් පරාසයක ගනුදෙනුකරුවන් ආවරණය කරන ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම මූල්‍ය ආයතනයයි. මූල්‍ය අන්තර්ගතභාවය (financial inclusion) සහ ඩිජිටල් පරිවර්තනය යන අංශයන්හි ජාතික ප්‍රමුඛයා ලෙස බැංකුව ස්ථානගත කිරීමට, මෙම සුවිශේෂී ද්විත්ව භාවය, සමත්ව ඇත.

ජන විකාශන පැතිකඩ

ගනුදෙනුකාර වයස් පැතිකඩ



අවුරුදු 18-30 කාණ්ඩය

වේගයෙන්ම වර්ධනය වන ගනුදෙනුකාර කාණ්ඩයයි.

ජංගම බැංකුකරණය, ශිෂ්‍ය ණය සහ ඩිජිටල් පසුම්බි යෙදවුම් (digital wallets) භාවිතයට බෙහෙවින් හුරු වී ඇත.

ක්ෂණික ගෙවීම් ක්‍රම සහ නව්‍ය මූල්‍ය තාක්ෂණික සේවාවන් සඳහා පවතින ඉල්ලුම මෙහෙයවනු ලබන්නේ මෙම කාණ්ඩයයි.

අවුරුදු 31-50 කාණ්ඩය

ණය කළඹ සඳහා ඉහළම දායකත්වය සපයන්නන්ය.

නිවාස ණය, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර (SME) මූල්‍යකරණය සහ ආයෝජන කෙරෙහි වැඩි අවධානයක් යොමු කරයි.

බැංකුව සමඟ දීර්ඝකාලීන සබඳතා පවත්වන ස්ථාවර හා ඉහළ වටිනාකමකින් යුතු පාරිභෝගික පිරිසකි.

අවුරුදු 50 ට වැඩි කාණ්ඩය


ස්ථාවරවූ තැන්පතු පදනමක් සහිතය.

ස්ථාවර තැන්පතු, විශ්‍රාම වැටුප් ආශ්‍රිත සේවා සහ සාම්ප්‍රදායික ශාඛා බැංකුකරණය මත වැඩි වශයෙන් විශ්වාසය තබයි.

බැංකුව කෙරෙහි පවතින ඉහළ විශ්වාසය තහවුරු කරමින්, මොවුන් අතර ද ඩිජිටල් සේවා භාවිතය වර්ධනය වෙමින් පවතී.

භූගෝලීය ව්‍යාප්තිය

ගනුදෙනුකාර භූගෝලීය පැතිකඩ



නාගරික (Urban)

ඩිජිටල් සේවා, ණය පත් (credit cards) සහ ආයතනික බැංකුකරණය සඳහා ඉහළ ඉල්ලුමක් පවතී.

පුද්ගලික බැංකු සහ මූල්‍ය තාක්ෂණ ආයතනවලින් එල්ල වන දැඩි තරගකාරිත්වයට මුහුණ දෙයි.

අර්ධ නාගරික සහ ග්‍රාමීය (Semi-urban and rural)

ක්ෂුද්‍ර මූල්‍ය, කෘෂිකාර්මික ණය සහ සමුපකාර බැංකුකරණය මත යැපීමක් දක්නට ලැබේ.

මූල්‍ය අන්තර්ගතභාවය සඳහා වන රජයේ වැඩසටහන් සමඟ ශක්තිමත් සබඳතාවක් පවත්වා ගනී.

විදේශීය (Overseas)

විශේෂයෙන් මැදපෙරදිග කලාපයෙන් සැලකිය යුතු විදේශ ප්‍රේෂණ (remittances) ගලා ඒමක් දක්නට ලැබේ.

මෙය විදේශ විනිමය ඉපයීමට සහ ගෘහස්ථ පරිභෝජනයට තීරණාත්මක ලෙස දායක වේ.

නිමැවුම් අනුව ගනුදෙනුකාර කාණ්ඩකරණය

ගනුදෙනුකාර කාණ්ඩය	ප්‍රධාන නිමැවුම්	2025 වර්ධන ප්‍රවණතාව
පුද්ගල	ඉතුරුම්, නිවාස ණය, ණය කාඩ්පත් (Credit Cards)	ඉහළ ගොස් ඇත – ඩිජිටල් සේවා භාවිතය ඉහළ යාම හේතුවෙන්
කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර (SME)	වෙළෙඳ මූල්‍යකරණය, කාරක ප්‍රාග්ධන ණය (Working Capital Loans)	මධ්‍යස්ථයි – SME සංවර්ධන වැඩසටහන් මගින් ලැබුණු දායකත්වය මත
ආයතනික ගනුදෙනුකරුවන් (Corporate)	භාණ්ඩාගාර සේවා, ආයෝජන බැංකුකරණය	ස්ථාවරයි – ආයතනික විශ්වාසය සහ පක්ෂපාතීත්වය මත
ග්‍රාමීය/කෘෂිකාර්මික	ක්ෂුද්‍ර මූල්‍ය, සමුපකාර ණය පහසුකම්	වර්ධනය වෙමින් පවතී – මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කිරීමේ වැඩපිළිවෙළ හේතුවෙන්

සියලුම නිමැවුම් සහ ඊට අදාල විස්තර පිළිබඳව 102 පිටුවෙන් ආරම්භ වන ව්‍යාපාර සමාලෝචන කොටසේ සවිස්තරාත්මකව ඉදිරිපත් කර ඇත.

ගනුදෙනුකාර තෘප්තිය නැංවීමේ මූලික ලීවර

ඩිජිටල් පරිවර්තනය

අපගේ ගනුදෙනුකරුවන් සඳහා බැංකු පහසුකම් වැඩි දියුණු කිරීමේදී දිගින් දිගටම අපි ඩිජිටල් පරිවර්තනය කෙරෙහි අවධානය යොමු කළෙමු. ජංගම සහ අන්තර්ජාල සේවා පුළුල් කරමින්, නැගී එන ගනුදෙනුකාර අවශ්‍යතා සපුරාලීම සඳහා මූලික පද්ධති නවීකරණය කළ අපි දත්ත මත පදනම් වූ පුද්ගලීකරණය හඳුන්වා දුන්නෙමු. වේගවත් හා කඩිසර මෙන්ම විශ්වසනීය සේවාවක් මගින් අපි ගනුදෙනුකාර පක්ෂපාතිත්වය සහ හරස් විකුණුම් අවස්ථා තවදුරටත් වර්ධනය කළෙමු.

- 127 වන පිටුවෙන් ආරම්භ වන තොරතුරු තාක්ෂණ සහ ඩිජිටල් බැංකුකරණ අංශය.

ගනුදෙනුකාර තෘප්තිය නැංවීමේ මූලික ලීවර

- ඩිජිටල් පරිවර්තනය
- සේවා විශිෂ්ටත්වය
- සේවයට කැපවූ ගනුදෙනුකාර සම්බන්ධතා කළමනාකරුවන්
- මූල්‍ය සාක්ෂරතා සංවාද වැඩසටහන්
- කාන්තා සවිබල ගැන්වීම
- ගනුදෙනුකාර විශ්වාසනීයත්වය සහ බැඳීම

සේවා විශිෂ්ටත්වය

ගනුදෙනුකාර සේවා විශිෂ්ටත්වය අපගේ ප්‍රධාන මෙහෙයුම් මූලධර්මයක් (way of life) බවට පත් කරගනිමින්, නිමැවුම් පිළිබඳ දැනුම, සේවා මූලධර්ම, මෘදු කුසලතා සංවර්ධනය සහ පැමිණිලි කළමනාකරණය යන අංශයන්හි නිපුණතා වර්ධනය වන පරිදි ව්‍යුහගත ආකාරයකින් අපි අපගේ කාර්ය මණ්ඩලය පුහුණු කළෙමු. ඒ අනුව 2025 වසර තුළ නිෂ්පාදන දැනුම පිළිබඳ පුහුණු වැඩසටහන් 192 ක් පවත්වා ඇත. මිනුම් දර්ශක (metrics) සහ අඛණ්ඩ ඉගෙනීම මත පදනම් වෙමින්, අඛණ්ඩව විශිෂ්ට සේවාවක් සැපයිය හැකි අනාගතයට සූදානම් කණ්ඩායමක් ගොඩනැගීමට අපි කැපවී සිටිමු. බහුවිධ නාලිකා (Omnichannel) හරහා සේවා සැපයීම නිසා විවිධ ගනුදෙනුකාර කණ්ඩායම්වලට තමන්ට වඩාත් ගැලපෙන ක්‍රමය ඔස්සේ බැංකු සේවා ලබා ගැනීමට අවස්ථාව ලැබුණු අතර, එමඟින් මූල්‍ය අන්තර්ගතකරණය (inclusivity) තවදුරටත් පුළුල් විය.

- (පිළිවෙලින් 103 සහ 150 පිටුවලින් ආරම්භ වන පුද්ගල කේන්ද්‍ර බැංකු අංශය සහ නිෂ්පාදිත ප්‍රාග්ධන අංශය බලන්න.)

> ව්‍යවස්ථාපිත ගෙවීම් පහසු කිරීම සඳහා "People's Pay" ඩිජිටල් ජංගම දුරකථන යෙදුම හරහා GovPay පද්ධතිය සමඟ අත්වැල් බැඳගන්නා ලදී.

සේවයට කැපවූ ගනුදෙනුකාර සම්බන්ධතා කළමනාකරුවන්

සේවයට කැපවූ එක් එක් සම්බන්ධතා කළමනාකරුවන්, ගනුදෙනුකරුගේ එකම සම්බන්ධතා ලක්ෂ්‍යය ලෙස ක්‍රියා කරමින් පුද්ගල (Retail), කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර (SME) සහ ආයතනික (Corporate) ගනුදෙනුකරුවන් සඳහා මූල්‍ය උපදේශන සහ සහාය ලබා දුනි. විවිධ නිෂ්පාදන සහ සේවාවන් ඔස්සේ සිදුකළ මෙම සම්බන්ධීකරණ උත්සාහයන් සහ ක්‍රියාශීලී උපදෙස්, ගනුදෙනුකාර සබඳතා තවදුරටත් ගැඹුරු කිරීමටත්, හරස් විකුණුම් (cross-sell) අවස්ථා පුළුල් කිරීමටත් සහ ගනුදෙනුකරුවන් රඳවා තබා ගැනීමටත් බෙහෙවින් උපකාරී විය.

- 116 පිටුවෙන් ආරම්භ වන ආයතනික බැංකු අංශය.

මූල්‍ය සාක්ෂරතා සංවාද වැඩසටහන්

වැඩමුළු, අන්තර්ජාල සම්මන්ත්‍රණ (webinars) සහ ඩිජිටල් අන්තර්ගතයන් ඔස්සේ ක්‍රියාත්මක කරන ලද බැංකුවේ මූල්‍ය සාක්ෂරතා සංවාද වැඩසටහන් මඟින් ධනය උත්පාදනය කිරීම හා කළමනාකරණය, ණය කළමනාකරණය සහ තිරසාර මූල්‍ය විකල්ප ආවරණය කරන ලදී. අපගේ ගනුදෙනුකරුවන් මෙලෙස සවිබල ගැන්වීම මඟින් ඔවුන්ට දැනුවත්භාවයකින් යුතු මූල්‍ය තීරණ ගැනීමට හැකි වූ අතර, එය දිගුකාලීනව මූල්‍ය ස්ථායීතාව හා ඔරොත්තු දීමේ හැකියාවට මඟ පාදයි.

- පුද්ගල කේන්ද්‍රීය බැංකුකරණය සහ ආයතනික බැංකු අංශ පිළිවෙලින් 103 පිටුවෙන් සහ 116 පිටුවෙන් ආරම්භ වේ.

ගනුදෙනුකාර සබඳතා වර්ධනය කිරීම සහ සේවක සංවර්ධනය වෙනුවෙන්ම වෙන්වූ විශේෂ රූපවාහිනී නාලිකාවක් PEO TV ඔස්සේ ආරම්භ කරන ලදී.

කාන්තා සවිබල ගැන්වීම

පුද්ගල කේන්ද්‍රීය බැංකුකරණය, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර, ක්ෂුද්‍ර මූල්‍ය සහ ප්‍රජා වැඩසටහන් ඔස්සේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය කේන්ද්‍ර කරගත් ප්‍රතිපත්ති ඇතුළත් කරමින්, කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම සඳහා වන අපගේ උත්සාහයන් අපි තවදුරටත් පුළුල් කළෙමු. කාන්තා ව්‍යවසායකයින් වෙනුවෙන්ම විශේෂිත දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වමින්, ඔවුන්ට මූල්‍ය ස්වාධීනත්වය ළඟා කර ගැනීම සඳහා අවශ්‍ය මඟපෙන්වීම් ලබා දෙන ලදී. සිවිල් සමාජය සහ ක්ෂේත්‍රයේ විවිධ පාර්ශ්වකරුවන් සමඟ සම්බන්ධ වෙමින්, තිරසාර සමාජීය බලපෑමක් ඇති කරනු වස් කාන්තාවන්ගේ කුසලතා හා හැකියාවන් වර්ධනය කෙරෙහි බැංකුව සිය අවධානය යොමු කළේය.

ගනුදෙනුකාර ස්ත්‍රී-පුරුෂ භාවය පිළිබඳ පැතිකඩ



කාන්තා පුරුෂ

- වාණිජ ණය, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ ක්ෂුද්‍ර මූල්‍ය සංවර්ධන අංශ පිළිවෙලින් 109 සහ 112 වන පිටුවලින් ආරම්භ වේ.

ගනුදෙනුකාර විශ්වාසනීයත්වය සහ බැඳීම වර්ධනය කිරීම

අපි අපගේ සියලුම ව්‍යාපාරික අංශයන් සඳහා විශේෂිත නිෂ්පාදන කට්ටල, ඩිජිටල් ප්‍රවර්ධන වැඩසටහන් සහ කාලීන ප්‍රවර්ධන වැඩසටහන් සමඟින් විවිධ ත්‍යාග පිරිනැමීමේ වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කළෙමු. ගනුදෙනුකාර අදහස් ලබා ගැනීමේ ක්‍රමවේද සහ විශ්ලේෂණ දත්ත භාවිතයෙන්, ඔවුන් බැංකුව සමඟ දිගටම රැඳී සිටීම සහ අප හරහා සිදුකරන ගනුදෙනු ප්‍රමාණය පිළිබඳව සොයා බලන ලදී. මීට අමතරව, අපගේ හවුල්කාර ආයතන සමඟ එක්ව කළ ප්‍රවර්ධන වැඩසටහන් මඟින් ගනුදෙනුකරුවන්ගේ එදිනෙදා ජීවිතයට ප්‍රයෝජනවත් වන දෑ ලබා දීමටද කටයුතු කළෙමු.

වැඩිම විදේශ ප්‍රේෂණ ලබාගත් ගනුදෙනුකරුවන් වෙනුවෙන් – “රන් කාසි වාසි” දිනුම් ඇදීම	වැඩිම විදේශ ප්‍රේෂණ ප්‍රමාණයක් ලබාගත් කාන්තා ගිණුම් හිමිකාරියන් 10 දෙනෙකු වෙනුවෙන් – “වනිතා ප්‍රණාම”
“වාසි කෝටියයි 2025” ඔස්සේ විදේශ ප්‍රේෂණ වෙනුවෙන් ක්‍රියාත්මක කළ විශේෂ ප්‍රවර්ධන වැඩසටහන	People’s Biz Teen Challenge 2025 – තරුණ ව්‍යවසායකයින් දිරිමත් කිරීම සඳහා පැවැත්වූ තරඟාවලිය.
ලෝක සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර දිනය නිමිත්තෙන් “SME ව්‍යාපාරික ණය කාඩ්පත” (Business Credit Card) හඳුන්වා දීම.	“ගෙදරටම තෑගි” – පීපල්ස් හර කාඩ්පත් හිමියන් වෙනුවෙන් පැවැත්වූ ප්‍රවර්ධන වැඩසටහන.
ඩිජිටල් බැංකුකරණ දැනුවත් කිරීමේ ප්‍රවර්ධන වැඩසටහන් පුළුල් කිරීම (People’s Pay, අන්තර්ජාල බැංකුකරණය සහ ජංගම බැංකුකරණය).	ෆෙස්බුක්, ඉන්ස්ටග්‍රෑම්, ටික්ටොක්, යූටියුබ් සහ ලින්ක්ඩ්ඉන් (LinkedIn) හරහා ක්‍රියාත්මක කාර්යසාධනය මූලික කරගත් සමාජ මාධ්‍ය ප්‍රචාරණ වැඩසටහන
ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව පවත්වන ලද කාන්තා ව්‍යවසායකත්ව ප්‍රවර්ධන වැඩසටහන.	සිසු උදාන ඉතුරුම් ගිණුම යටතේ පවත්වනු ලබන පහ වසර ශිෂ්‍යත්ව සම්මන්ත්‍රණ මාලාව
ක්ෂුද්‍ර මූල්‍ය දැනුවත් කිරීම සහ ප්‍රජාව වෙත සමීප වීමේ සන්නිවේදන කටයුතු	ණය කාඩ්පත් ජීවන රටාව හා සම්බන්ධ කර ප්‍රවර්ධනය කිරීමේ ප්‍රචාරණ වැඩසටහන (හැවිලොක් මෝල් සහ මහනුවර සිටි සෙන්ටර් හිදී)
හර කාඩ්පත් භාවිතය වේගවත් කිරීමේ ප්‍රවර්ධන වැඩසටහන්	වීඩියෝ ප්‍රමුඛ අන්තර්ගත උපායමාර්ගය
අපනයන සංවර්ධන මණ්ඩලය හා ඒකාබද්ධව ක්‍රියාත්මක කෙරෙන ජාතික අපනයන සවිබල ගැන්වීමේ මුලපිරීම	

ගනුදෙනුකාර තෘප්තිමත්භාවය

ලැබුණු මුළු ගනුදෙනුකාර පැමිණිලි සංඛ්‍යාව **407**	විසඳන ලද පැමිණිලි සංඛ්‍යාව **365**
ශ්‍රී ලංකා මහ බැංකුව මඟින් යොමු කරන ලද ගනුදෙනුකාර පැමිණිලි සංඛ්‍යාව **193**	2025 දෙසැම්බර් 31 දිනට විසඳීමට ඉතිරිව ඇති ගනුදෙනුකාර පැමිණිලි සංඛ්‍යාව **42**
මූල්‍ය ඔම්බුඩ්ස්මන් (ගනුදෙනුකාර බැඳියාවන් සුරැකීමේ නිලධාරී) මඟින් යොමු කරන ලද ගනුදෙනුකාර පැමිණිලි සංඛ්‍යාව **37**	

සදාචාරාත්මක බැංකුකරණ පිළිවෙත්

GRI 206-1

ශක්තිමත් පාලන සහ අවදානම් කළමනාකරණ රාමුවක් තුළ හිඳිමින්, බැංකුව සිය නිමැවුම් සංවර්ධනයේ සිට සේවා සැපයීම සහ පැමිණිලි කළමනාකරණය දක්වා වූ සියලුම ක්‍රියාකාරකම්වලදී, වගකීම් සහගත සහ වගවීමෙන් යුතු ආකාරයකින් ඉහළම සදාචාරාත්මක ප්‍රමිතීන් ආරක්ෂා කරනු ලබයි.

පැහැදිලි සන්නිවේදනය

අපගේ ගනුදෙනුකාර වටිනාකම් ප්‍රදානය (Customer value proposition) භාෂා තුනෙන්ම සන්නිවේදනය කෙරෙන අතර, එහි විශ්වාසදායී සහ නිවැරදි තොරතුරු අඩංගු වේ. අවශ්‍ය තොරතුරු, පොලී අනුපාත සහ ගාස්තු අපගේ ශාඛාවල පැහැදිලිව ප්‍රදර්ශනය කර ඇති අතර අපගේ වෙබ් අඩවිය හරහාද ඒවාට පිවිසිය හැකිය. සෑම නිෂ්පාදනයක් හෝ සේවාවක් සඳහාම පැහැදිලි සහ නිරවද්‍ය නියමයන් සහ කොන්දේසි ඇතුළත් කර ඇති අතර, එමඟින් අපගේ ගනුදෙනුකරුවන්ට මනා අවබෝධයකින් යුතුව නිවැරදි බැංකු තීරණ ගැනීමට මඟ පෑදේ. හොඳින් පුහුණු වූ කාර්ය මණ්ඩලයකින් සමන්විත අංගසම්පූර්ණ සම්බන්ධතා මධ්‍යස්ථානයක් (Contact Centre) මඟින් ගනුදෙනුකාර විමසීම්වලට පිළිතුරු සැපයීම, පැමිණිලි සටහන් කර ගැනීම සහ ලැබෙන ප්‍රතිපෝෂණ සම්බන්ධයෙන් කටයුතු කිරීම සිදු කරනු ලබයි.

සේවක කුසලතා ඔප් නැංවීම

ගනුදෙනුකරුවන්ට නිවැරදි තොරතුරු සැපයීමට, විසඳුම් ලබා දීමට සහ අවශ්‍ය අවස්ථාවලදී මූල්‍ය උපදෙස් දීමට හැකි වන පරිදි, දැනුවත් මෙන්ම දක්ෂ සේවක මණ්ඩලයක් සඳහා කුසලතා තවදුරටත් ඉහළ නැංවීමට අපි අඛණ්ඩව කටයුතු කරන්නෙමු.

මහජන සුභසාධනය

රජය සමඟ සහයෝගීතාවයෙන් යුතුව, සවිබල ගැන්වූ සමාජයක් සහ පුනර්ජීවනය වූ ආර්ථිකයක් බිහි කිරීමේ අපගේ දායකත්වය වශයෙන් ජාතික සංවර්ධන මුලපිරීම් ක්‍රියාත්මක කිරීමට අපි සහාය වන්නෙමු.

අහිතකර තරඟකාරී හැසිරීම්, ඒකාධිකාර විරෝධී නීති, සහ ඒකාධිකාරී ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් 2025 වර්ෂය සඳහා කිසිදු සිද්ධියක් වාර්තා වී නොමැත.

ගනුදෙනුකාර සෞඛ්‍ය සහ ආරක්ෂාව

GRI 416-1

දිවයිනේ පුළුල්ම ශාඛා ජාලයකට මෙන්ම, ආයතනික ගනුදෙනුකරුවන්ගේ සිට සාමාන්‍ය පුද්ගලයන් දක්වා විහිදෙන ගනුදෙනුකාර පදනමකට හිමිකම් කියන බැංකුවක් ලෙස, අපගේ සියලුම කාර්යාල සහ ශාඛා පරිශ්‍රයන් තුළ ශක්තිමත් පද්ධති හරහා උපරිම ආරක්ෂාව සැලසීම අපගේ වගකීමකි.

අපගේ සියලුම ශාඛාවන් සැලසුම් කර ඇත්තේ ගනුදෙනුකාර සහ සේවක සෞඛ්‍ය මෙන්ම ආරක්ෂාවද සහතික වන පරිදිය. එහිදී හොඳින් වාතාශ්‍රය ලැබෙන සේ මෙන්ම සමහර අවස්ථාවලදී ස්වාභාවික දිවා ආලෝකය උපරිමයෙන් ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඒවා සකස් කර ඇත. සෑම ස්ථානයකම ගිනි නිවන උපකරණ සහ ප්‍රථමාධාර කට්ටල සපයා ඇති අතර, හදිසි අනපේක්ෂිත සිදුවීමක් කළමනාකරණය කිරීම සඳහා තෝරාගත් කාර්ය මණ්ඩලය වෙත ආරක්ෂාව සහ හදිසි අවස්ථාවකදී ආරක්ෂිතව ඉවත් වීමේ (Evacuation) පුහුණුව ලබා දී ඇත.

> ගනුදෙනුකාර පහසුව උදෙසා කෑගල්ලේ ඉදිවූ අතිනවීන බැංකු සංකීර්ණය

අලෙවිකරණ සන්නිවේදනය, නිමැවුම් හා සේවා තොරතුරු සහ ලේබල්කරණය

GRI 417-1, 2, 3

අපගේ සියලුම අලෙවිකරණ අන්තර්ගතයන් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන්ම ඉතා පැහැදිලි, නිරවද්‍ය මෙන්ම විස්තීර්ණ අයුරින් ඉදිරිපත් කිරීමට අපි කටයුතු කළෙමු. එහිදී ගනුදෙනුකරුවන්ට හිමිවන ප්‍රතිලාභ මෙන්ම අදාළ නියමයන් සහ කොන්දේසි පිළිබඳවද පූර්ණ හෙළිදරව් කිරීමක් සිදු කරමින් ඔවුන් සවිබල ගැන්වීමට අපි පියවර ගත්තෙමු. අපගේ සේවාවන් සහ පිරිනැමීම් සැමවිටම විනිවිදභාවයකින් යුතුව ඉදිරිපත් කරන අතර, ඒ සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) ප්‍රචාරණ සහ අලෙවිකරණ රෙගුලාසිද අපි දැඩිව පිළිපදින්නෙමු. තවද, පාරිසරික තිරසාරභාවය සුරැකීම අරමුණු කරගනිමින් සකස් කළ හරිත මූල්‍යකරණ නිෂ්පාදන (Green financing products) සහ පුනර්ජනනීය බලශක්ති පිරිනැමීම් මෙන්ම, එම ණය පහසුකම් ලබා ගැනීම සඳහා සුදුසුකම් සපුරාලිය යුතු ආකාරය පිළිබඳ රාමුවද අපගේ අලෙවිකරණ අන්තර්ගතයන්හි ඉතා පැහැදිලිව ඉදිරිපත් කර ඇත.

අලෙවිකරණ සන්නිවේදනයන්, නිෂ්පාදන සේවා තොරතුරු සහ ලේබල්කරණය සම්බන්ධයෙන් රෙගුලාසිවලට අනුකූල නොවීම් පිළිබඳ කිසිදු සිද්ධියක් 2025 වසරේදී වාර්තා වී නැත.



ගනුදෙනුකාර දත්ත ආරක්ෂණය සහ රහස්‍යභාවය

GRI 418-1

යටිතල පහසුකම් නවීකරණය කිරීම අඛණ්ඩව සිදුකළ අපි, ඒ සඳහා නූතන තොරතුරු ආරක්ෂණ තාක්ෂණයන් යොදාගනිමින් අපගේ සමස්ත මෙහෙයුම් පද්ධතිය පුරාම සයිබර් ආරක්ෂණ පාලන ක්‍රම (Cybersecurity controls) ශක්තිමත් කිරීමට කටයුතු කළෙමු. බැංකුවේ පුළුල් ඩිජිටල් පරිවර්තන න්‍යාය පත්‍රයට (Digital transformation agend) ඒකාබද්ධ කර ඇති මෙම ආයෝජනයන් මඟින් අපගේ පද්ධතිවල ඔරොත්තු දීමේ හැකියාව (Resilience) සහ දත්ත ආරක්ෂාව තවදුරටත් ඉහළ නංවා ඇත. 2025 වර්ෂය තුළදී, ගනුදෙනුකාර රහස්‍යතාව උල්ලංඝනය වීමක් හෝ ගනුදෙනුකාර දත්ත අහිමි වීමක් සම්බන්ධයෙන් කිසිදු සිද්ධියක් වාර්තා වී නොමැත.

2026 සඳහා ඉදිරි දැක්ම

වර්තමාන බැංකු ක්ෂේත්‍රයේ ජවසම්පන්න මෙන්ම ඉදිරි දැක්මක් ඇති ආයතනයක් ලෙස, ලොව පුරා සිදුවන තාක්ෂණික වෙනස්කම්වලට අනුකූලව හැඩගැසෙමින් සහ ශ්‍රී ලංකාවේ පුළුල් ආර්ථික සංවර්ධනය සඳහා දායක වෙමින්, තිරසාර වර්ධනයක් කරා ගමන් කිරීමට අපි අඛණ්ඩව කැපවී සිටින්නෙමු. මෙම ගමනේ අප සතු ප්‍රබලතම උපායමාර්ගික අංගයක් වන්නේ ඩිජිටල්කරණය යි. ඒ අනුව 2026 වර්ෂයේදී, සුවිශේෂී ගනුදෙනුකාර සේවාවක් සලසන අතරතුරදීම, ගනුදෙනුකාර අත්දැකීම් තවදුරටත් උසස් කිරීමට සහ තිරසාර වර්ධනයක් ළඟා කර ගැනීම සඳහා මෙහෙයුම් විශිෂ්ටත්වයට ප්‍රමුඛත්වය දෙමින් බැංකුවේ ඩිජිටල් පරිවර්තනය වේගවත් කිරීමට අපි කටයුතු කරන්නෙමු.

වෘත්තිකයන්ගෙන් සැදුම්ලත් සමූහයක් ලෙස, අපගේ සෑම ව්‍යාපාරික අංශයක්ම 2026 වර්ෂය සඳහා වන ඔවුන්ගේ සුවිශේෂී සැලසුම් 102 වන පිටුවෙන් ආරම්භ වන “ව්‍යාපාර සමාලෝචන” පරිච්ඡේදයෙහි සවිස්තරාත්මකව ඉදිරිපත් කර ඇත.

ව්‍යාපාරික හවුල්කාර ප්‍රාග්ධනය

අපගේ ව්‍යාපාරික හවුල්කරුවන් අතරට, සේවා සපයන්නන්, සැපයුම්කරුවන්, උපායමාර්ගික හවුල්කාරිත්වයන් සහ ක්ෂේත්‍රයේ විවිධ සංසදයන් (Industry forums) ඇතුළත් වීම නිසා අපට බැංකු ව්‍යාපාරය තුළ අර්ථවත් ලෙස නියැලෙන අතරම ජාතික සංවර්ධනය සඳහා දායක වීමටද අවස්ථාව සැලසී ඇත. ස්පර්ශ්‍ය සහ අස්පෘශ්‍ය යන ද්විත්ව ආකාරයෙන්ම අපගේ ව්‍යාපාරයට වටිනාකමක් එක් කරමින්, කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට, අඛණ්ඩ සේවාවක් සහතික කිරීමට සහ වඩාත් සාර්ථක ලෙස පාරිභෝගිකයා වෙත වටිනාකම් බෙදා හැරීමට ඔවුහු සහාය වෙති.

ව්‍යාපාරික හවුල්කාර වර්ගීකරණය

GRI 2-6

ව්‍යාපාරික වර්ධන හවුල්කරුවන්	සහභාගී බැංකු	වොස්ට්‍රෝ (Vostro) නියෝජිතයන්	බලයලත් හවුල්කරුවන්	රාජ්‍ය ආයතන
	දේශසීමා බැංකුකරණයේ (Cross-border banking) අත්‍යවශ්‍ය අංගයන් වන ජාත්‍යන්තර වෙළඳාම, විදේශ විනිමය ගනුදෙනු සහ දේශසීමා ගනුදෙනු සඳහා පහසුකම් සැලසීමෙහිලා මෙම හවුල්කාරිත්වයන් ඉතා වැදගත් මෙහෙයක් ඉටු කරයි.	අපගේ ජාත්‍යන්තර බැංකු හවුල්කරුවන් සමඟ පවත්වාගෙන යනු ලබන මෙම සබඳතාවන්, විදුහුත් මුදල් හුවමාරු, විදේශ විනිමය ගනුදෙනු, තැන්පතු සහ මුදල් ආපසු ගැනීම් සඳහා අත්‍යවශ්‍ය වන අතර, එමඟින් ජාත්‍යන්තර වෙළඳාම තවදුරටත් පහසු කරයි.	අපගේ දෛනික ව්‍යාපාරික කටයුතු මෙහෙයවීමේදී බලයලත් (Franchise) හවුල්කරුවන් විවිධ අයුරින් අපට සහාය වන අතර, ඔවුන් අපගේ මෙහෙයුම් ව්‍යුහයේ අත්‍යවශ්‍යම අංගයකි.	රජයට අයත් බැංකුවක් ලෙස, රාජ්‍ය ව්‍යවසායන් යනු අපගේ පාරිභෝගික කළඹෙහි සැලකිය යුතු මෙන්ම ප්‍රධානතම කොටසකි.
සැපයුම්කරුවන්	පොදු උපයෝගිතා සේවා සපයන්නන්	අමුද්‍රව්‍ය සැපයුම්කරුවන්	ස්ථාවර වත්කම් සැපයුම්කරුවන්	සංචාරක සහ ප්‍රවාහන සේවා සැපයුම්කරුවන්
	විදුලිය, ජලය සහ විදුලි සංදේශ සේවා සපයන්නන්ගේ සේවාවන් අපගේ ව්‍යාපාරික ව්‍යුහය සමඟ බද්ධ වී පවතින අතර, ඒවා නොමැතිව අපගේ මෙහෙයුම් පවත්වාගෙන යා නොහැක.	අපගේ මෙහෙයුම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සහතික කෙරෙන, සදාචාරාත්මක මූලාශ්‍රයන්ගෙන් ලබාගත් උසස් තත්ත්වයේ අමුද්‍රව්‍ය සපයමින් අපගේ මෙහෙයුම් ක්‍රියාවලිය තුළ අතිශය තීරණාත්මක කාර්යභාරයක් ඉටු කිරීමට අමුද්‍රව්‍ය සැපයුම්කරුවෝ සමත්ව සිටිති. එමඟින් අපගේ පාරිසරික හා සමාජීය වගකීම තවදුරටත් ශක්තිමත් වන අතර, බැංකුවේ තිරසාරභාවය සඳහා වන ප්‍රවේශයන්ටද මනා රුකුලක් ලැබේ.	අමුද්‍රව්‍ය, උපකරණ, ගෘහ භාණ්ඩ, සවිකිරීම් සහ උපාංග මෙන්ම තාක්ෂණික සේවා සපයන්නන්ද, වාහන අලෙවිකරුවන් සහ දේපළ වෙළඳාම් ආයතනද යනු අපගේ සියලුම පාර්ශ්වකරුවන් වෙත සාර්ථක ලෙස වටිනාකම් ළඟා කර දීම සඳහා මනා රුකුලක් වන සක්‍රීය හවුල්කරුවන්ය.	කාර්ය මණ්ඩලයේ ගමන් බිමන් සඳහා පමණක් නොව, දිවයින පුරා සිටින අපගේ ගනුදෙනුකරුවන් හමුවීමට යන සංචාරයන් සඳහා ද භාවිත වන සංචාරක සහ ප්‍රවාහන සේවා සැපයුම්කරුවන් යනු අපගේ මෙහෙයුම් ක්‍රියාවලිය හා බද්ධ වූ අනිවාර්ය කොටසකි.

නඩත්තු හවුල්කරුවන්	මෘදුකාංග සැපයුම්කරුවන්	සන්නිවේදන	අපද්‍රව්‍ය කළමනාකරණ	ණය අයකරගැනීමේ නියෝජිතායතන	මානව සම්පත් සේවා සම්පාදකයෝ
	බැංකුවේ අභිලාෂකාමී ඩිජිටල් ප්‍රයත්නයන් සාර්ථක කර ගැනීම සඳහා අපගේ මෘදුකාංග සැපයුම්කරුවන්ගෙන් මනා සහයෝගයක් ලැබේ.	වර්තමාන අන්තර්ක්‍රියාකාරී සන්නිවේදන කටයුතු මෙම ක්ෂේත්‍රයේ පවතින උසස් යටිතල පහසුකම් මත බෙහෙවින් රඳා පවතින බැවින්, අපගේ සන්නිවේදන උපකරණ නඩත්තු කිරීම ප්‍රමුඛතම අවශ්‍යතාවයකි.	මහ නගර සභා සහ නගර සභාවන් සමඟ එක්ව කටයුතු කරන බාහිර ප්‍රතිචක්‍රීකරණ ආයතන, අපගේ කාර්යාල පරිශ්‍රයන් ඉතා යහපත් තත්ත්වයෙන් පවත්වාගෙන යාම සහතික කරන අතර, එමඟින් අපගේ සේවකයින්ගේ සහ අමුත්තන්ගේ සෞඛ්‍යය හා ආරක්ෂාව සුරැකීමටද දායක වේ.	අභියෝගාත්මක කාලපරිච්ඡේදයන්හිදී ණය අයකරගැනීමේ නියෝජිතායතන අප වෙත අමිල සහයෝගයක් ලබා දුන් අතර, 2025 වර්ෂයේදී අප ලැබූ විශිෂ්ට සාර්ථකත්වය සඳහා ඔවුන්ගේ උත්සාහයද සැලකිය යුතු ලෙස දායක විය.	බැංකුවේ පර්යන්ත රාජකාරි (Peripheral duties) බාහිර මූලාශ්‍රිත සේවකයින් විසින් කාර්යක්ෂමව ඉටු කිරීම හේතුවෙන්, අපගේ ස්ථිර කාර්ය මණ්ඩලයට පාර්ශ්වීක සබඳතා සහ වැඩි අගය එකතු කළ සේවාවන් (Value-adding services) සඳහා සිය කාලය පූර්ණ වශයෙන් යෙදවීමට අවස්ථාව උදා විය.

වෙනත්	කොන්ත්‍රාත්කරුවන්	පරිශ්‍ර සපයන්නන්
	මනා ලෙස නඩත්තු කරන ලද සහ උපායමාර්ගිකව පිහිටා ඇති පරිශ්‍රයන් අපගේ ප්‍රමුඛ පෙළේ සන්නාමය අඛණ්ඩව පවත්වාගෙන යාමට විශාල රුකුලක් වන අතර, එය අපගේ ව්‍යාපාරයට නොපෙනෙන නමුත් ප්‍රත්‍යක්ෂ වටිනාකමක් එක් කරයි. සෞඛ්‍ය හා ආරක්ෂිත ප්‍රමිතීන්ට මුල් තැන දෙමින්, අපගේ දේපළ ඉහළ මට්ටමකින් පවත්වාගෙන යාම සඳහා අපගේ කොන්ත්‍රාත්කරුවන් සහ පරිශ්‍ර සපයන්නන් නොපසුබට උත්සාහයක නිරත වෙති.	

ජාත්‍යන්තර ව්‍යාපාරික හවුල්කරුවන්

භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය අපගේ ව්‍යාපාරික ක්‍රියාවලියේ මූලිකාංගයකි. ලොව පුරා විහිදුණු අපගේ ජාත්‍යන්තර හවුල්කාරිත්වයන් හරහා සැපයුම් දාමයේ කාර්යක්ෂමතාව තහවුරු කිරීමට අපි සමත්ව සිටිමු. භූ-දේශපාලනික අස්ථාවරත්වයන් සහ ගෝලීය ආර්ථික අභියෝග මධ්‍යයේ වුවද, බැංකුව විසින් ගොඩනඟා ඇති මෙම දීර්ඝකාලීන විශ්වාසනීය සබඳතා අපගේ වර්ධනය ස්ථාවර කිරීමට මනා පිටිවහලක් වී ඇත.

වසර ගණනාවක් පුරා බැංකුව සිය ජාත්‍යන්තර ව්‍යාපාරික හවුල්කරුවන් සමඟ ගොඩනඟා ගත් ශක්තිමත් සබඳතා, භූ-දේශපාලනික අස්ථාවරත්වයන් සහ ගෝලීය අර්බුද හමුවේ වුවද අපගේ වර්ධනය ස්ථාවර කර ගැනීමට මහඟු රුකුලක් විය.

පාරදෘෂ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලිය

මිලදී ගැනීමේ තීරණවල ස්ථාවරත්වය සහ වගවීම මත පදනම් වූ අපගේ ප්‍රසම්පාදන ප්‍රතිපත්තිය, සියලු නීති සහ රෙගුලාසිවලට අනුකූල වන අතරම, පිරිවැය ප්‍රශස්තකරණය සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට කටයුතු කරයි. මෙම ක්‍රියාවලියේ විනිවිදභාවය සහ සාධාරණත්වය තුළින් බැංකුවේ තීරණ ගැනීමේ පරිපාටිය සතු සදාචාරාත්මක ප්‍රමිතීන් මනාව පිළිබිඹු වේ.

දැඩි අධීක්ෂණයකට යටත් වන අපගේ ටෙන්ඩර් ක්‍රියාවලියේදී, සියලු තාක්ෂණික පිරිවිතරයන් ඇගයීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව (TEC) ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ගෙන් සන්නද්ධ කර ඇත. මෙහෙයුම් සහ ප්‍රාග්ධන අයවැය (OPEX සහ CAPEX) සකස් කරමින් වසර පුරා සිදු කෙරෙන ප්‍රසම්පාදන කටයුතු සඳහා පදනම දමන්නේ මෙම කමිටුවයි. එමඟින් පිරිවැය කාර්යක්ෂමව පාලනය කරමින් බැංකුවේ සාර්ථකත්වයට සුවිශේෂී දායකත්වයක් ලබා දෙයි.

සැපයුම්කරුවන් සමඟ සෞභාග්‍යය වෙත

GRI 204-1

කාණ්ඩය	2025	2024
ලියාපදිංචි සැපයුම්කරුවන් සංඛ්‍යාව	මෙය ටෙන්ඩරයෙන් ටෙන්ඩරයට වෙනස් වන අතර, විද්‍යුත් ප්‍රසම්පාදන ක්‍රියාවලිය (e-procurement) මුදල් අමාත්‍යාංශය මඟින් සිදු කරනු ලබයි.	අප භාවිතා කරන්නේ 2020 වසරේදී මුදල් අමාත්‍යාංශය හඳුන්වා දුන් විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතියයි. සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමක් අප විසින් සිදුකරනු නොලැබේ.
සහභාගී බැංකු සංඛ්‍යාව (correspondent banks)	42	42
වොස්ට්‍රෝ නියෝජිතයන් සංඛ්‍යාව	94	88
සැපයුම්කරුවන්ට ගෙවීම් (රු. බිලියන)	28.3	22.3
දේශීය	27.2 (96.11%)	20.9 (93.7%)
විදේශීය	1.1 (3.89%)	1.4 (6.3%)

අගය එකතු කිරීමේ ක්‍රමෝපායන්

සාමාජිකත්වයන් සහ සංගම්

GRI 2-28

අපගේ වගකීම් විෂය පථයට මහජන සුභසාධනය ඇතුළත් වන අතර, විවිධ කර්මාන්ත සංසදයන්හි අප සතු ක්‍රියාකාරී සහභාගීත්වය, රජයේ ජාතික සංවර්ධන න්‍යාය පත්‍රය සාර්ථක කර ගැනීම සඳහා රජය සමඟ සහයෝගයෙන් ක්‍රියාත්මක කිරීමට සැලකිය යුතු ලෙස උපකාරීවේ. නාගරික, අර්ධ නාගරික, ග්‍රාමීය මෙන්ම කෘෂිකාර්මික ප්‍රජාවන්ගේ අපේක්ෂාවන් පිළිබඳව අප සතු පුළුල් අත්දැකීම් සහ අවබෝධය තුළින් නැගුණු සාමූහික හඬ, අනාගතවාදී බැංකු රෙගුලාසි සහ මාර්ගෝපදේශ සම්පාදනය කිරීම සඳහා දායක වීමට අපට ශක්තිමත් වේදිකාවක් නිර්මාණය කර දුන්නේය.

අප පහත ගෞරවනීය ආයතන සමඟ සාමාජිකත්වයෙන් බැඳී සිටින්නෙමු:

- ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය (IBSL)
- ලංකා වාණිජ මණ්ඩලය
- ශ්‍රී ලංකා බැංකු සංගමය (ඇපකර) සමාගම
- ශ්‍රී ලංකා බැංකු අංශයේ අවදානම් කළමනාකරණ වෘත්තිකයන්ගේ සංගමය
- ආසියා-පැසිෆික් ග්‍රාමීය සහ කෘෂිකාර්මික ණය සංගමය (APRACA)
- ශ්‍රී ලංකා බැංකු අනුකූලතා නිලධාරීන්ගේ සංගමය
- ශ්‍රී ලංකා මූල්‍ය ඔම්බුඩ්ස්මන් (ඇපකර) සමාගම
- බැංකුකරුවන්ගේ නිෂ්කාශන සංගමය
- ලංකා සේවායෝජක සම්මේලනය
- ප්‍රාථමික අලෙවිකරුවන්ගේ සංගමය
- ශ්‍රී ලංකා විදේශ විනිමය (ෆොරෙක්ස්) සංගමය
- ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලය
- ස්විෆ්ට් (SWIFT)
- ලංකාපේ (පුද්ගලික) සමාගම

අගය එකතු කිරීමේ ක්‍රමෝපායන්

- සාමාජිකත්වයන් සහ සංගම්
- සැපයුම්කරුවන් පිරික්සීම සහ පාරිසරික තක්සේරුව
- ප්‍රසම්පාදන ක්‍රියාවලිය

සැපයුම්කරුවන් පිරික්සීම සහ පාරිසරික තක්සේරුව

GRI 308-1, 414-1

මහජන සුබසාධනය සහ ප්‍රජා සංවර්ධනය වෙනුවෙන් පෙනී සිටින ආයතනයක් ලෙස, බැංකුව අනුගමනය කරනු ලබන තිරසාර පිළිවෙත්වලට අනුකූලව සැපයුම් මූලාශ්‍ර ලබා ගැනීම, නිෂ්පාදනය, අගය එකතු කිරීම සහ බෙදා හැරීම යන සියලු ක්ෂේත්‍රවලදී දේශීය හිති සහ රෙගුලාසිවලට අනුකූල වීම සියලු සැපයුම්කරුවන්ගෙන් අපේක්ෂා කෙරෙන අතර එය අනිවාර්ය කර ඇත. සැපයුම්කරුවන් තම නිෂ්පාදන ක්‍රියාවලියේදී මධ්‍යම පරිසර අධිකාරිය (CEA) විසින් පනවා ඇති රෙගුලාසිවලට අනුකූල වීම අතිශයින් වැදගත් වන අතරම, ළමා ශ්‍රමය සහ බලහත්කාර ශ්‍රමය භාවිතය සම්බන්ධ තහනම් කිරීම් ඇතුළු කම්කරු රෙගුලාසි දැඩි ලෙස පිළිපැදීම ද අත්‍යවශ්‍ය වේ.

ප්‍රසම්පාදන ක්‍රියාවලිය

- ටෙන්ඩර් ක්‍රියා පටිපාටි සඳහා ප්‍රථමයෙන් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගන්නා අතර, නව සැපයුම්කරුවන්ගේ හරිත සහ සදාචාරාත්මක සුදුසුකම් තහවුරු කර ගැනීම සඳහා ඔවුන් දැඩි පරීක්ෂාවකට ලක් කරනු ලැබේ. බැංකු කාඩ්පත් (DI cards) සහ තොරතුරු තාක්ෂණ (IT) උපකරණ වැනි තීරණාත්මක මෙන්ම ඉහළ වටිනාකමකින් යුත් අයිතම, ගෝලීය ටෙන්ඩර් පටිපාටියක් හරහා මිලදී ගන්නා අතර, එහිදී තෝරාගත් ජාත්‍යන්තර සැපයුම්කරුවන් සමඟ බැංකුව දිගුකාලීන හවුල්කාරිත්වයක් පවත්වාගෙන යනු ලබයි.
- සියලුම සැපයුම් දාමයන් මධ්‍යම පරිසර අධිකාරියේ නිර්ණායකවලට සහ අනෙකුත් අනිවාර්ය පිළිවෙත්වලට (නිදසුනක් ලෙස භාණ්ඩ නිෂ්පාදනයේදී ළමා ශ්‍රමය හෝ බලහත්කාර ශ්‍රමය භාවිත නොකිරීම වැනි) අනුකූල වන බව සහතික කිරීම සඳහා, සියලුම නව සැපයුම්කරුවන් පාරිසරික හා සමාජීය අනුකූලතාව සම්බන්ධයෙන් පරීක්ෂාවට ලක් කෙරේ.
- ඩිජිටල් ප්‍රසම්පාදන ක්‍රියාවලියේ විනිවිදභාවය සහතික කරනු වස් මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ ටෙන්ඩර් කැඳවීම් වැඩි වැඩියෙන් සිදු කරනු ලැබේ.
- සියලුම සැපයුම්කරුවන් ඉලෙක්ට්‍රොනික රජයේ ප්‍රසම්පාදන (e-GP) පද්ධතියේ ලියාපදිංචි වීම මුදල් අමාත්‍යාංශය විසින් පනවා ඇති අනිවාර්ය අවශ්‍යතාවයකි.

2026 සඳහා ඉදිරි දැක්ම

අපගේ සියලුම ව්‍යාපාරික හවුල්කරුවන් සමඟ පවතින සබඳතා තවදුරටත් ශක්තිමත් කරන අතරම, දේශීය මූලාශ්‍රවලින් සැපයුම් ලබා ගැනීමට ප්‍රමුඛත්වය ලබා දෙනු ඇත. බැංකුවේ අනාගත අවශ්‍යතා මත පදනම්ව සහ අනුමත මෙහෙයුම් වියදම් (OPEX) සීමාවන් තුළ රැඳී සිටිමින්, ව්‍යාපාරික හවුල්කාර පරාසය පුළුල් කිරීමට අවශ්‍ය අවස්ථාවලදී පියවර ගනු ලැබේ. බැංකුවේ මෙහෙයුම් කටයුතු වඩාත් සරල හා පරිසර හිතකාමී පරිවර්තනය වෙමින් පවතින බැවින්, සම්පත් භාවිතය උපරිම කිරීමටත්, පිරිවැය කාර්යක්ෂමතාව ඉහළ නැංවීම මගින් තිරසාර ව්‍යාපාරික මෙහෙයුම් සහතික කිරීමටත් අපි කටයුතු කරන්නෙමු.

ප්‍රජා ප්‍රාග්ධනය

රාජ්‍ය ආයතනයක් ලෙස මහජන බැංකුව, තිරසාර සමාජ-ආර්ථික සංවර්ධනය, අන්තර්කරණ වර්ධනය (Inclusive growth) සහ සිය සේවාවන් ලබාගන්නා ප්‍රජාවන් සවිබල ගැන්වීම සඳහා ප්‍රමුඛත්වයක් ලබා දෙයි. අපගේ මූල්‍ය විචක්ෂණභාවය සහ මහජන සුබසාධන මෙහෙවර (Public welfare mandate) උපයෝගී කරගනිමින්, සමානාත්මතාවය සහ ප්‍රජා සමෘද්ධිය උදෙසා අර්ථවත් දායකත්වයක් ලබා දීම සඳහා වගකීම් සහගත ණය ලබා දීම, මූල්‍ය සාක්ෂරතා වැඩසටහන්, ධාරිතා වර්ධනය සහ ආයෝජන යන ක්ෂේත්‍රයන්හි අපි සක්‍රීයව නිරත වන්නෙමු.

සවිබල ගැන්වීමේ ක්‍රමවේදයන්

වගකීම් සහගත සංවර්ධන ණය ලබාදීම

GRI 203-1

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය (SME) සහ ක්ෂුද්‍ර මූල්‍ය අංශවල ආර්ථික ක්‍රියාකාරකම් දිගුකාලීනව ප්‍රධාන ධාරාවේ බැංකු පද්ධතියට අනුගත කිරීමේ අරමුණින්, එම අංශ සඳහා සංවර්ධන ණය ලබා දීමට ප්‍රමුඛත්වය ලබා දෙන ලදී. මෙතෙක් අවිධිමත් මූල්‍ය ආයතන මත යැපුණු නවක ව්‍යාපාර රැසක් නගාසිටුවීම සඳහා ඔවුන්ව දැනුවත් කිරීමටත්, මූල්‍ය සාක්ෂරතාවය (Financial literacy) ලබා දීමටත් මෙන්ම අවශ්‍ය අරමුදල් සහ සහාය සැපයීමටත් අපි ඒකාබද්ධ උත්සාහයක නිරත වූවෙමු. මෙය විශේෂයෙන්ම සංචාරක ක්ෂේත්‍රයේ පිබිදීමත් සමඟ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය දියුණු කිරීමට රජය ගෙන යන වැඩපිළිවෙළට ද මහත් රුකුලක් විය. ග්‍රාමීය සහ අර්ධ ග්‍රාමීය ප්‍රජාවන් සමඟ සමීපව කටයුතු කිරීමේ දිගුකාලීන ඉතිහාසයක් ඇති බැංකුවක් ලෙස, තිරසාරත්වය පෙරදැරි කරගනිමින් එම ප්‍රජාවන් නගාසිටුවීම සඳහා අපගේ පවීණත්වය ආයෝජනය කිරීමට අපි මැනවින් සූදානම්ව සිටියෙමු.

සවිබල ගැන්වීමේ ක්‍රමවේදයන්

- වගකීම් සහගත සංවර්ධන ණය දීම
- වක්‍ර ආර්ථික බලපෑම
- ආයතනික සමාජ වගකීම
- ප්‍රජා සහභාගිත්වය

2025 දෙසැම්බර් 31 දින වන විට පවතින ප්‍රජා මූලික සංවර්ධන ණය ලබාදීම්

අවදානම් කාණ්ඩය	බැංකුව මගින් අරමුදල් සපයන ලද		ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රම මගින් අරමුදල් සපයන ලද	
	ණය සංඛ්‍යාව	ණය ප්‍රමාණය රු.මි.	ණය සංඛ්‍යාව	ණය ප්‍රමාණය රු.මි.
කෘෂිකර්මාන්තය	14,335	7,043.55	2,453	775.95
වාණිජ	3,448	2,283.20	273	95.49
පරිභෝජන	15	10.75	–	0
මූල්‍ය	157	3,755.12	7	0.46
නිවාස සහ දේපළ සංවර්ධනය	183	114.95	23	23.27
කාර්මාන්ත	1,489	783.05	133	30.7
වෙනත් ආර්ථික කටයුතු	2,114	362.06	369	38.68
සේවා	608	350.13	58	2.79
සංචාරක කාර්මාන්තය	67	70.53	15	53.44
මුළු එකතුව	22,416	14,773.34	3,331	1,020.78

වක්‍ර ආර්ථික බලපෑම

GRI 203-2

මූල්‍ය අන්තර්ගතභාවය අපගේ බැංකු සේවාවන්හි තීරණාත්මක අංගයකි. බැංකුවේ පුළුල් ව්‍යාප්තිය සහ උපායමාර්ගිකව ස්ථානගත කර ඇති ශාඛා හා සේවා මධ්‍යස්ථාන ජාලය, ග්‍රාමීය සහ අවම පහසුකම් සහිත ප්‍රජාවන් වෙත අත්‍යවශ්‍ය මූල්‍ය සේවාවන් සමීප කරවීමට මනා පිටුවහලක් විය. සහනදායී ණය පහසුකම් සහ උපදේශන සේවාවන් මගින් සුළු පරිමාණ ක්ෂුද්‍ර ව්‍යවසායකයින් සවිබල ගැන්වීම හරහා ඔවුන්ගේ ජීවනෝපාය මාර්ග දියුණු කිරීමටත් සාමූහික ආර්ථික සංවර්ධනයක් ඇති කිරීමටත් මග පෑදිණි.

රට පුරා විසිරී සිටින ආර්ථික වශයෙන් පීඩාවට පත් ප්‍රජාවන් සහ කාන්තා ව්‍යවසායකයින් වෙනුවෙන් බැංකු දොරටු විවෘත කිරීමේ ගෞරවය මහජන බැංකුව සතුය. යුද ගැටුම් පැවති වකවානුවල පවා අපගේ සේවාවන් අඛණ්ඩව පවත්වාගෙන ගිය අතර, ඉන් අනතුරුව එම සේවාවන් තවදුරටත් ව්‍යාප්ත කිරීමට කටයුතු කළෙමු.

සැමට සමාන අවස්ථා ලබාදීම අපගේ ප්‍රධාන උපායමාර්ගික අභිලාෂයක් වන බැවින්, උතුරු සහ නැගෙනහිර පළාත්වල සේවය කරන අපගේ කාර්ය මණ්ඩලය භාෂා ත්‍රිත්වයෙන්ම වැඩකිරීමේ හැකියාවෙන් යුක්ත අතර, එමඟින් පාරිභෝගිකයින් සමඟ ඵලදායී ලෙස සන්නිවේදනය කිරීමටත් ඔවුන්ගේ විශ්වාසය දිනා ගැනීමටත් අවස්ථාව සැලසේ. මීට අමතරව, අපගේ සියලුම අලෙවිකරණ සහ සන්නිවේදන ද්‍රව්‍ය භාෂා තුනෙන්ම සකස් කර ඇති අතර, එමඟින් පාරිභෝගිකයින්ට නිවැරැදි තොරතුරු මත පදනම්ව තීරණ ගැනීමටත්, අවශ්‍ය අවස්ථාවලදී උපදෙස් ලබාගැනීමටත්, පහසුකම් සලසා ඇත.

ආයතනික සමාජ වගකීම

GRI 411-1

දිවයින පුරා, විශේෂයෙන්ම දුෂ්කර ග්‍රාමීය ප්‍රදේශයන්හි බැංකුව සතු සුවිශේෂී ව්‍යාප්තිය, අප සේවය කරන ප්‍රජාවන් තුළ ධනාත්මක වෙනසක් ඇති කිරීමට මහත් රුකුලක් විය. මූල්‍ය ඇතුළත් කර ගැනීම ප්‍රවර්ධනය කරමින් ජීවනෝපායන් සවිබල ගැන්වීම හරහා, ජාතික සංවර්ධනය උදෙසා අත්‍යවශ්‍ය මෙන්ම විශ්වාසදායක හවුල්කරුවෙකු ලෙස අපගේ භූමිකාව තවදුරටත් තහවුරු කිරීමට අපට හැකි විය. 2025 වසරේදී ද විවිධ ක්‍රමවේද ඔස්සේ ප්‍රජා සත්කාරක කටයුතුවල නිරත වූ අතර, ආදිවාසී ජනතාවගේ (Indigenous people) අයිතිවාසිකම් උල්ලංඝනය වීම් සම්බන්ධ කිසිදු සිදුවීමක් වාර්තා වී නොමැත.

ප්‍රජා සහභාගිත්වය

GRI 413-1

සමාජීය වශයෙන් වගකීම් සහගත ආයතනයක් ලෙස සංස්කෘතික, ආගමික, අධ්‍යාපනික, මූල්‍ය සාක්ෂරතාව සහ සමාජ සුබසාධන යන ක්ෂේත්‍ර ඉලක්ක කරගත් විවිධ ක්‍රියාකාරකම් ඔස්සේ අපගේ ප්‍රජා සබඳතාවල තිරසාර බව තවදුරටත් තහවුරු කළෙමු. සිවිල් සමාජය සමඟ සහයෝගයෙන් කටයුතු කරමින්, තිරසාර අනාගතයක් වෙනුවෙන් සවිබල ගැන්වුණු ස්වයංපෝෂිත ප්‍රජාවන් ගොඩනැගීමේ අරමුණින් අවට පහසුකම් සහිත ජන කොටස් වෙත අපි ප්‍රායෝගික සහාය ලබා දුන්නෙමු. ජීවනෝපාය මාර්ග සංවර්ධනය සහ අභියෝගයන්ට ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීමේ අරමුණින් එම වැඩසටහන් සඳහා බැංකුව සැලකිය යුතු ආයෝජනයක් සිදු කරන ලදී.

සංස්කෘතික හා ආගමික කටයුතු

මහනුවර ඇසළ පෙරහැර 2025

විශාල දේශීය හා ජාත්‍යන්තර ජනකායක් ආකර්ෂණය කරගන්නා, ඉතා අලංකාරවත් හා සාම්ප්‍රදායික උත්සවයක් ලෙස ලෝක ප්‍රසිද්ධ මහනුවර ඇසළ පෙරහැර මංගල්‍යය සඳහා 2025 වසරේදී ද බැංකුව සිය අනුග්‍රහය ලබා දුන්නේය. ශ්‍රී ලාංකේය සංස්කෘතික උරුමයේ සුවිශේෂී සන්ධිස්ථානයක් බඳු වූ මෙම චේතිහාසික මංගල්‍යයට අනුග්‍රහය ලබා දීමට හැකි වීම පිළිබඳව අපි නිහතමානීව සතුටු වන්නෙමු.



අනුරාධපුර පූජනීය ජය ශ්‍රී මහා බෝ සමිඳුන් අභියස ඉදි කළ "පෙත්මඟ" සැදැහැවතුන් වෙනුවෙන් විවෘත කිරීම

අනුරාධපුර පූජනීය ජය ශ්‍රී මහා බෝධි පරිශ්‍රයේ බටහිර දොරටුව වෙත පිවිසෙන "පෙත්මඟ" ඉදිකිරීම් කටයුතු බැංකුව විසින් සාර්ථකව නිම කරන ලදී. මෙම පුණ්‍යකර්මය බැංකුවේ අඛණ්ඩව ක්‍රියාත්මක වන "මහජන මෙහෙවර" සමාජ සත්කාරක වැඩසටහන් මාලාව යටතේ සිදු කෙරිණි.



අනුරාධපුරයේ පොසොන් සැමරුම්

පූජනීය පොසොන් පුන් පොහෝ දිනය නිමිත්තෙන් ආගමික සහජීවනය උදෙසා වන අපගේ කැපවීම යළි තහවුරු කරමින් අනුරාධපුර පුදබිම කේන්ද්‍ර කරගනිමින් පිංකම් මාලාවක් සංවිධානය කරන ලදී. ඒ අනුව, පූජනීය ජය ශ්‍රී මහා බෝධි පරිශ්‍රයේදී සිල් සමාදන් වූ 25,000කට අධික බැතිමතුන් උදෙසා හීල් දානය පිරිනැමීමට අඛණ්ඩව 42වන වසරටත් බැංකුව කටයුතු කළේය. මීට අමතරව, 19 වන වරටත් පවත්වනු ලැබූ "පොසොන් බොදු ගී සරණිය" බැතිගී ප්‍රසංගය රුවන්වැලි මහා සෑ රඳුන් අභියසදී උත්කර්ෂවත් අන්දමින් පැවැත්වීමට මහජන බැංකුව පියවර ගත්තේය.

රටේ ජාතික හා ආගමික කටයුතු වෙනුවෙන් දායකත්වය ලබා දෙන අතරම, බැංකු කාර්ය මණ්ඩලයේ සෞන්දර්යාත්මක කුසලතාවන් ඇගයීමට හා පෝෂණය කිරීමට මහජන බැංකුව මෙම වැඩසටහන සංවිධානය කරයි. මෙහි සංගීත අධ්‍යක්ෂණය ප්‍රවීණ සංගීතවේදී කරුණාරත්න විජේවර්ධන මහතා විසින් සිදු කරන ලදී. අනුරාධපුර නිවත්තකවේතිය මහා විද්‍යාලයේ සිසුන් සහ මහජන බැංකුවේ කාර්ය මණ්ඩල සාමාජිකයින් එක්ව මෙහිදී බොදු ගී ගායනා ඉදිරිපත් කළහ. බැංකුවේ අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලය විසින් මෙම සමස්ත වැඩසටහනම ඉතා සාර්ථකව සංවිධානය කරන ලදී.



නත්තල් කැරොල් ගී සැමරුම

මහජන බැංකුවේ කිතුනු සංගමය මගින් සංවිධානය කරන ලද අලංකාරවත් නත්තල් කැරොල් ගී සැඳෑවක් නත්තල් උත්සවය නිමිත්තෙන් උත්කර්ෂවත් අන්දමින් පවත්වනු ලැබීය.

කාණ්ඩය	ආයෝජනය (රු.මි.)	ව්‍යාපෘති සංඛ්‍යාව	ප්‍රතිලාභය
සංස්කෘතික හා ආගමික	11.8	12	ප්‍රජාවන් අතර සහජීවනය සහ අන්‍යෝන්‍ය සහයෝගීතාව වර්ධනය කිරීම උදෙසා වාර්ගික හා ආගමික සමගිය ප්‍රවර්ධනය කිරීම.
අධ්‍යාපනික	11.7	02	නූතන ඉගෙනුම් ක්‍රමවේද සහ අර්ථවත් සහභාගීත්වයක් සඳහා අනාගත පරපුර සවිබල ගැන්වීම.
සෞඛ්‍ය හා අනෙකුත් සමාජ ක්‍රියාකාරකම්	3.2	05	නිරෝගී ජාතියක් උදෙසා සෞඛ්‍ය සම්පන්න ජීවිතයක්, දීර්ඝායුෂ සහ දරුවන්ගේ රැකවරණය සහතික කිරීම.

අධ්‍යාපනය

කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය

අධ්‍යාපනය සහ තරුණ පරපුරේ සංවර්ධනය උදෙසා වන බැංකුවේ කැපවීම යළිත් තහවුරු කරමින්, කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ වින්සන්ට් සුබසිංහ අනුස්මරණ නේවාසිකාගාර ගොඩනැගිල්ල, රු. මිලියන 11ක පිරිවැයක් දරමින් නවීකරණය කර විවෘත කිරීමට බැංකුව කටයුතු කළේය.



උපාධි අපේක්ෂිත සේවාස්ථ පුහුණුව

අනාගත රැකියා වෙළඳපොළට සාර්ථකව මුහුණ දීම සඳහාත්, ගතික ආර්ථික පරිසරයන්ට පහසුවෙන් අනුගත වීම සඳහාත් උපාධි අපේක්ෂිත සිසුන් සූදානම් කිරීමේ අරමුණින් අපි ඔවුන් වෙත සේවාස්ථ පුහුණු අවස්ථා පිරිනැමුවෙමු.

14	06	713	499
රජයේ විශ්වවිද්‍යාල	පෞද්ගලික විශ්වවිද්‍යාල	2025 දෙසැම්බර් 31 දින දක්වා ප්‍රතිලාභ ලබා ඇති සිසුන් සංඛ්‍යාව	2025 වසරේ අලුතින් එක්වූ සිසුන්

දැනුම බෙදා ගැනීම

ප්‍රජාවන්ගේ ධාරිතා වර්ධනය සඳහාත්, මූල්‍ය සාක්ෂරතාව සහ ප්‍රගතිය සඳහා අවශ්‍ය කුසලතාවන් ප්‍රවර්ධනය කිරීම සඳහාත් දැනුම හුවමාරු කර ගැනීමේ වැඩමුළු ප්‍රධාන වශයෙන්ම ග්‍රාමීය ප්‍රදේශ කේන්ද්‍ර කරගනිමින් පවත්වනු ලැබීය.

වැඩසටහන/ප්‍රවේශය	තේමාත්මක අරමුණ	විස්තරය	කලාපය/දිස්ත්‍රික්කය	සහභාගී වූ සංඛ්‍යාව
“Entrepreneur Glory” කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් (SME) සඳහා	කාන්තා ව්‍යවසායකයින් අතර මූල්‍ය සාක්ෂරතාවය වර්ධනය කිරීම	මූල්‍ය කළමනාකරණය සහ දේශගුණික විපර්යාස පිළිබඳ දැනුවත්භාවය ඇති කිරීම	කොළඹ උතුර, දකුණ, බස්නාහිර සහ නැගෙනහිර	32

පාරිසරික සංරක්ෂණය

අපගේ මෙහෙයුම් කටයුතුවල මූලික පදනම වන්නේ පාරිසරික, සමාජීය සහ පාලන අරමුණු සාක්ෂාත් කර ගැනීමයි. බැංකුවේ කඩිනම් ඩිජිටල් පරිවර්තනය, පරිසරය කෙරෙහි අවම බලපෑමක් ඇති කරමින් ව්‍යාපාරික කටයුතු මෙහෙයවීමට අප සතු උපායමාර්ගික අභිප්‍රාය මැනවින් විදහා දක්වන්නකි. මෙම ඩිජිටල්කරණ ක්‍රියාවලිය හේතුවෙන් කඩදාසි භාවිතය සහ අපද්‍රව්‍ය බැහැර කිරීම සැලකිය යුතු ලෙස අඩු වී ඇති අතර හරිත ගොඩනැගිලි සංකල්පය හරහා ජාලගත විදුලි බලය භාවිතය අවම කර ඇති අතර, හරිත ණය දීමනා මගින් පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සඳහා සහාය ලබා දේ.

පෙව විවිධත්ව සංරක්ෂණය උදෙසා අප දරන උත්සාහය, දේශීය ශාක විශේෂ වගා කිරීම සහ නඩත්තු කිරීම දිරිමත් කරන “පරිසර උද්‍යාන” සංකල්පය තුළින් පිළිබිඹු වේ. තර්ජනයට ලක්ව ඇති පෘථිවිය සුරැකීම සඳහා අපි සාකල්‍ය ප්‍රවේශයක් අනුගමනය කරන අතර, අපගේ ක්‍රියාවලීන් සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව නැවත නිර්මාණය කිරීම හරහා පරිසරයට ස්පර්ශ්‍ය සහ අස්පෘශ්‍ය අගයන් එක් කිරීමට කටයුතු කරන්නෙමු.

වැඩිදුර විස්තර සඳහා 94-95 පිටුවල ඇති අපගේ ESG අවධානය කොටස ද, 127 පිටුවෙන් ආරම්භ වන තොරතුරු තාක්ෂණ සහ ඩිජිටල් බැංකුකරණ කොටස සහ 198 පිටුවෙන් ආරම්භ වන ස්වාභාවික ප්‍රාග්ධනය කොටසෙහි ඇති පුනර්ජනනීය බලශක්ති දායකත්වයන් පිළිබඳ තොරතුරු ද පරිශීලනය කරන්න.

2026 සඳහා ඉදිරි දැක්ම

අපගේ සියලුම ආයතනික සමාජ වගකීම් (CSR) වැඩසටහන් “මහජන මෙහෙවර” යන මූලික සංකල්පය පෙරදැරි කරගෙන ක්‍රියාත්මක කරනු ලබයි. අප සතු අතිවිශාල සම්පත් සහ පුළුල් ශාඛා ජාලය උපයෝගී කරගනිමින්, අපගේ ප්‍රජාවන් මුහුණ දෙන මූලික ගැටලුවලට විසඳුම් ලබා දීමටත්, ඔවුන් සවිබල ගන්වමින් අනාගතය පිළිබඳ බලාපොරොත්තුවක් ඇති කිරීමටත් අපි කටයුතු කරන්නෙමු. බැංකුව සේවය සපයන භූමියට සහ ප්‍රජාවන්ට ධනාත්මක බලපෑමක් ඇති කරමින්, මූල්‍ය යහපැවැත්මේ කේන්ද්‍රස්ථානය ලෙස බැංකුව සහජයෙන්ම බැඳී සිටින ග්‍රාමීය හදබිම් වෙත සමීප වෙමින් අපි ජාතියට සේවය කරන්නෙමු.

ප්‍රජා ජීවිතයට පුළුල් හා අර්ථවත් බලපෑමක් ඇති කරන ප්‍රධාන වැඩසටහන් කිහිපයක් වෙනුවෙන් අපි අනාගතයේදී ආයෝජනය කිරීමට නියමිතය. මීට අමතරව, බැංකුවේ බෞද්ධ සංගමය, හින්දු සංගමය, මුස්ලිම් මජ්ලිසය සහ කිතුනු සංගමය 2026 වසරේදී විවිධ සමාජ සත්කාරක කටයුතුවල නිරත වීමට සූදානමින් සිටී. එමගින් ඕනෑම තිරසාර ආයතනයකට අත්‍යවශ්‍ය වන්නා වූ ආගමික හා වාර්ගික සහජීවනය මැනවින් පිළිබිඹු කරමින්, ප්‍රජාවට මෙන්ම එකිනෙකාට සහයෝගය දැක්වීමට එම සංගම් කැපවී සිටියි.

ආයෝජක ප්‍රාග්ධනය

රාජ්‍ය බැංකුවක් ලෙස, අපගේ ප්‍රධාන ආයෝජකයා සහ පාලන කොටස් හිමියා වන්නේ මුදල් අමාත්‍යාංශය මගින් නියෝජනය කරනු ලබන ශ්‍රී ලංකා රජයයි. 1961 අංක 29 දරන මහජන බැංකු පනත (2019 දී සංශෝධනය කරන ලද) යටතේ ස්ථාපිත මහජන බැංකුව, ශ්‍රී ලංකාවේ දෙවන විශාලතම රාජ්‍ය බැංකුව ලෙස කටයුතු කරයි. මෙහිදී බැංකුවේ සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනයෙන් 92.27%ක හිමිකාරිත්වය ශ්‍රී ලංකා රජය සතු වන අතර ඉතිරි 7.73%ක ප්‍රතිශතය සමුපකාර සමිති සතු වේ.

ආර්ථික දායකත්වය

GRI 201-1


2025 වසරේ උත්පාදනය කරන ලද සහ බෙදා හරින ලද සෘජු ආර්ථික වටිනාකම මඟින් අපගේ ව්‍යාපාරික මෙහෙයුම්වල සීඝ්‍ර වර්ධනය, පිරිවැය ඉතිරි කිරීමේ වැඩපිළිවෙළවල සඵලතාවය, අවදානම් කළමනාකරණයේ ශක්තිමත්භාවය සහ සදාචාරාත්මක පාලන ක්‍රියාවලීන් කෙරෙහි අප දක්වන අඛණ්ඩ කැපවීම මැනවින් පිළිබිඹු වේ.

දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා	2021 රු. '000	2022 රු. '000	2023 රු. '000	2024 රු. '000	2025 රු. '000	2024 සාපේක්ෂව 2025 වර්ධනය (%)
ආදායම් මූලාශ්‍ර						
පොලී ආදායම	197,330,011	321,935,983	394,794,898	349,292,146	356,669,240	2.1%
විදේශ විනිමය හුවමාරු ලාභ/අලාභ	(1,405,861)	17,053,885	8,584,947	(435,708)	3,344,122	667.5%
කොමිස් සහ ගාස්තු	8,268,168	16,397,745	13,806,168	14,923,343	18,312,109	22.7%
ප්‍රාග්ධන ලාභ	143,459	184,223	347,203	537,614	263,377	-51.0%
වෙනත්	2,914,043	1,656,773	4,708,927	3,660,594	3,420,314	-6.6%
එකතුව	207,249,820	357,228,609	422,242,143	367,977,989	382,009,162	3.8%
ආදායම උපයෝගීකර ගැනීම						
තැන්පත්කරුවන්ට/ණය ගැණුම්කරුවන් වෙත පොලී ලෙස	114,869,171	246,177,918	340,473,452	242,050,205	214,291,533	-11.5%
සේවක වැටුප් ලෙස	22,711,335	26,602,748	24,493,737	35,834,826	38,230,657	6.7%
භාණ්ඩ හා සේවා සපයන්නන්ට	12,276,709	15,882,049	21,352,264	21,265,446	22,865,436	7.5%
මූල්‍ය වත්කම් මත ශුද්ධ හානිකරණ අලාභය	14,472,820	33,346,451	7,437,572	5,450,173	15,993,696	193.5%
රජයට – බදු, විශේෂ බදු සහ ලාභාංශ	16,328,960	13,944,390	13,926,049	33,476,273	48,968,336	46.3%
ප්‍රජාව වෙනුවෙන්	12,665	38,213	40,721	35,964	26,886	-25.2%
වර්ධනය සඳහා රඳවා ගත් මුදල	26,578,159	21,236,840	14,518,348	29,865,102	41,632,619	39.4%
එකතුව	207,249,820	357,228,609	422,242,143	367,977,989	382,009,162	3.8%


දේශය සඳහා කළ වැදගත් දායකත්වය – 2025

ජාතික දායකත්වය	2025	2024
රජයට – බදු, විශේෂ බදු සහ ලාභාංශ (රු. බිලියන)	48.97	33.48
ස්කන්ධය මත ප්‍රතිලාභය (%)	20.1	14.7
වත්කම් මත ප්‍රතිලාභය (%)	1.8	1.3

ස්කන්ධය මත ප්‍රතිලාභය %



වත්කම් මත ප්‍රතිලාභය %



වැඩිදුර විස්තර සඳහා 142 වන පිටුවේ ඇති මූල්‍ය ප්‍රාග්ධනය (Financial Capital) පිළිබඳ පරිච්ඡේදය බලන්න

දේශය සඳහා සිදු කළ මූල්‍යමය නොවන දායකත්වය

බැංකුව විසින් රජයට ගෙවනු ලබන බදු මුදල්වලට අමතරව ලබාදෙන ලාභාංශ (Dividends), දිවයින පුරා විහිදුණු ශාඛා ජාලය හරහා විශ්‍රාම වැටුප් සහ "අස්වැසුම" වැනි මහජන සුබසාධන ප්‍රතිලාභ වශයෙන් ජනතාව වෙත මුදා හරිනු ලබයි. එමඟින් ග්‍රාමීය ප්‍රජාවගේ දෛනික ජීවනෝපාය ශක්තිමත් කිරීමට බැංකුව සෘජුවම දායක වේ. එමෙන්ම, බැංකුවේ ඩිජිටල් යටිතල පහසුකම්වල සහාය ඇතිව, මීට පෙර බැංකු සේවා නිසි ලෙස නොලැබුණු සහ බැංකු ක්ෂේත්‍රයෙන් බැහැරව සිටි සුළු හා මධ්‍ය පරිමාණ (SME) සහ ක්ෂුද්‍ර මූල්‍ය අංශයන් සවිබල ගැන්වීමටත්, එම අංශයන් තුළ මූල්‍ය ඇතුළත් වීමේ (Financial inclusivity) සංස්කෘතියක් ඇති කිරීමටත් අපගේ දීපව්‍යාප්ත ශාඛා ජාලය මඟින් විශාල සහයෝගයක් ලබා දී ඇත.

රාජ්‍ය ව්‍යවසායන් (SOEs) හරහා අත්‍යවශ්‍ය මහා පරිමාණ පොදු භාණ්ඩ හා සේවා ගනුදෙනුවල නියැලෙන ප්‍රධාන රාජ්‍ය බැංකු දෙකෙන් එකක් ලෙස, රටේ ආර්ථිකයේ කොඳු නාරටිය බඳු වූ පොහොර, ඖෂධ, බහිජ තෙල් සහ ගල් අඟුරු ඇතුළු අනෙකුත් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය තොග වශයෙන් මිලදී ගැනීමේදී ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කිරීමට බැංකුව කැපවී සිටී. එමෙන්ම, මූල්‍ය අන්තර්කරණය සහතික කරමින්, බැංකු පහසුකම් නිසි ලෙස නොලැබෙන අතිශය ග්‍රාමීය ජනතාවට විධිමත් සහ ආරක්ෂිත මූල්‍ය සේවාවන් වෙත ප්‍රවේශ වීමේ අවස්ථාව ද අපි සලසා දෙන්නෙමු.

බදුකරණය

GRI 207-1, 2, 3

වසර තුළ අපි ජාතික ආර්ථිකය වෙත බදු වශයෙන් රු. බිලියන 43.19ක දායකත්වයක් ලබා දුන්නෙමු. මින් රු. බිලියන 24.18ක් ආදායම් බදු (Income Tax) ලෙස ද, රු. බිලියන 19.01ක් මූල්‍ය සේවා බදු ලෙස ද ගෙවා ඇත.

බදුකරණය සහ ඒ ආශ්‍රිත කටයුතු පිළිබඳ විශේෂඥයින් බදු නීති පද්ධතියට අනුකූල වීම සහතික කරන අතර, ආදායම් බදු ගණනය කිරීම්, ගොනු කිරීම් සහ ඒ ආශ්‍රිත සංකීර්ණ කාර්යයන් සඳහා බාහිර උපදේශකයින්ගේ සහාය ද ලබා ගනු ලැබේ.

බැංකුවේ අභ්‍යන්තර විගණන සහ අනුකූලතා ඒකකය මඟින් මෙහෙයවන දැඩි අධීක්ෂණ යාන්ත්‍රණ හරහා බදු නීති සහ නියාමන විධිවිධානවලට අනුකූල වීම සහතික කෙරේ. මහජන බැංකුව සැමවිටම සදාචාරාත්මක හැසිරීම සහ සමාජ වගකීම පෙරදැරි කරගෙන කටයුතු කරන අතර, එම ක්ෂේත්‍රයේ බැංකුවේ දායකත්වය අතිවිශිෂ්ට වේ.

වෙනස්වෙමින් පවතින බදු ක්‍රමවේදයන්ට අනුකූලව කටයුතු කරමින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ මනා සහයෝගීතාවක් පවත්වා ගැනීමට බදු ඒකකය කටයුතු කරන අතර, කිසිදු පදනමක් යටතේ බදු පැහැර හැරීමක් හෝ අනුකූල නොවීමක් සිදු නොවන බවට අපි වගබලා ගන්නෙමු.

ස්වභාවික සම්පත් ප්‍රාග්ධනය



පාරිසරික කරුණු ප්‍රධාන අවදානම් කළමනාකරණ සහ වාර්තාකරණ රාමු සමඟ ඒකාබද්ධ කිරීමට බැංකුව අඛණ්ඩව කටයුතු කළේය. අප ස්වභාවික ප්‍රාග්ධනය වගකිවයුතු අයුරින් කළමනාකරණය කළ ආකාරයත්, එමඟින් ස්ථිරත්වය සම්බන්ධ මැනුම් මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සමඟ ඒකාබද්ධ කළ ආකාරයත් මෙම කොටසින් විස්තර කෙරේ.

අපගේ ප්‍රමුඛතාවය

ශ්‍රී ලංකාවේ විවිධ භූ දර්ශන පුරා විහිදුණු අපගේ පුළුල් ව්‍යාප්තිය, රටේ ස්වභාවික සම්පත් වගකීම් සහගත ලෙස සංරක්ෂණය කිරීම උදෙසා අප සතු නොසැලෙන කැපවීම මැනවින් විදහා දක්වයි. මහජන සුබසාධනය සුරැකීමේ අත්‍යවශ්‍ය අංගයක් ලෙස, ස්වභාවික සම්පත් සංරක්ෂණය කිරීම මඟින් අප සේවය කරන ප්‍රජාවන්ගේ සහ සමස්ත ආර්ථිකයේ යහපැවැත්ම තහවුරු කිරීම අපගේ ප්‍රමුඛතම වගකීමකි. ඒ අනුව, පාරිසරික සංරක්ෂණය ප්‍රවර්ධනය කිරීමටත්, වගකිවයුතු සම්පත් කළමනාකරණය තහවුරු කිරීමටත්, අපගේ පාරිසරික පියසටහන අවම කිරීමටත් අපි දරන උත්සාහයන් තවදුරටත් තීව්‍ර කර ඇත්තෙමු.

අපගේ උපායමාර්ග

ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) හරිත මූල්‍යකරණ වර්ගීකරණයට (Green Financing Taxonomy) අනුකූලව, ස්වාභාවික ප්‍රාග්ධන පරිභෝජනය කළමනාකරණය සඳහා වන අපගේ උත්සාහයන් තවදුරටත් තීව්‍ර කළෙමු. තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා අපගේ මූල්‍ය නිෂ්පාදන, සේවා සහ මෙහෙයුම් පද්ධතිවල මූලික රාමුව ලෙස අපි මෙම වර්ගීකරණය පිළිගත්තෙමු. ඒ අනුව, දේශගුණික විපර්යාස අවම කිරීම, අනුවර්තනය වීම, පෙව් විවිධත්ව සංරක්ෂණය සහ සම්පත් කාර්යක්ෂමතාව සඳහා දායක වන ව්‍යාපෘති වෙත ප්‍රමුඛත්වය ලබා දෙමින් හරිත ණයකරණ (Green lending) කටයුතු පුළුල් කරන ලදී. විශේෂයෙන්ම මෙම වර්ගීකරණය මඟින් නිර්දේශිත පුනර්ජනනීය බලශක්තිය, තිරසාර කෘෂිකර්මාන්තය සහ දූෂණ පාලනය වැනි අංශ සඳහා විශේෂිත මූල්‍ය විසඳුම් අපි හඳුන්වා දුන්නෙමු.

අපගේ පුළුල් පාර්ශ්වකරුවන් සමඟ ක්‍රියාකාරිව සම්බන්ධ වෙමින්, අන්තර්කරණ වර්ධනයක් වෙනුවෙන් රටේ ස්වාභාවික ප්‍රාග්ධනය ආරක්ෂා කිරීමට කැපවූ තිරසාර මූල්‍යකරණයේ ප්‍රමුඛයෙකු ලෙස අපගේ භූමිකාව අප තහවුරු කර ඇත. අපගේ ස්වාභාවික ප්‍රාග්ධන පරිභෝජනය ප්‍රධාන වශයෙන් සිදු වන්නේ දිවයින පුරා පවතින ශාඛා ජාලයේ මෙහෙයුම් කටයුතු හරහාය. මෙහිදී ජලය, බලශක්තිය සහ ඉන්ධන භාවිතය අවම කරමින් සහ අපද්‍රව්‍ය වගකීම් සහගතව කළමනාකරණය කරමින් පරිසරයට වන බලපෑම අවම කිරීමට අප පියවර ගෙන ඇත. පරිසරයට අහිතකර ලෙස බලපාන කිසිදු ක්‍රියාවලියක අපි නිරත නොවන අතර, හරිත ණයකරණය සඳහා සිදුකරන දැඩි ණය විශ්ලේෂණයන් (Stringent credit analysis) හරහා පාරිසරික අභිවර්ධනය සඳහා ධනාත්මක දායකත්වයක් ලබා දෙන්නෙමු.



2025 වසරේ ලබා දුන් හරිත මූල්‍ය ණය	**රු. බිලියන 3.6**
සූර්ය බලශක්ති සහිත මුළු ශාඛා සංඛ්‍යාව	**ශාඛා 141** **උත්පාදන ධාරිතාව මෙගාවොට්** **4.9**
අඩු කළ ජල පරිභෝජනය	**මෙගා ලීටර්** **0.9**
විදුලි පරිභෝජනය	**ගිගාජූල්** **8,191.4**
අවම කළ හරිතාගාර වායු විමෝචනය (GHG emission)	**3.0 tonCO$_2$e**
වසර තුළ ප්‍රතිචක්‍රීකරණය කළ කඩදාසි ප්‍රමාණය	**කිලෝග්‍රෑම්** **5,459**

දායකත්වය ලබාදුන් වූ ප්‍රමුඛ තේමා

ශ්‍රී ලංකා රජයේ ජාතික සංවර්ධන උපායමාර්ගයන්ට සහාය වන හවුල්කරුවෙකු ලෙස, සදාචාරාත්මක පාලනය, ශක්තිමත් අවදානම් කළමනාකරණය සහ පාරිසරික සංරක්ෂණය සහතික කිරීමට අප කැපවී සිටින අතර, ජාතියට චිරගින් දිගුකාලීන ප්‍රතිලාභ හිමිවනු ඇත. ගතික ව්‍යාපාරික පරිසරයකට අනුවර්තනය වෙමින් ජාතිය යළි ගොඩනැඟීමට සහ නැඟී සිටීමට ශක්තියක් වන මහජන සුබසාධනය අපගේ සෑම උපායමාර්ගයකම මූලික පදනම වේ.

අවදානම් කළමනාකරණය සහ පාලනය

පාරිසරික බලපෑම

සමාජ-ආර්ථික බලපෑම

N	O	I	S	E
අවශ්‍යතා NEEDS	**අවස්ථාවන්** OPPORTUNITIES	**වැඩිදියුණු කිරීම්** IMPROVEMENTS	**ශක්තීන්** STRENGTHS	**ව්‍යතිරේකයන්** EXCEPTIONS
ස්වාභාවික ප්‍රාග්ධන ගිණුම්කරණය, ප්‍රධාන ධාරාවේ මූල්‍ය වාර්තාකරණය සමඟ ඒකාබද්ධ කිරීම තවදුරටත් ශක්තිමත් කිරීම.	හරිත මූල්‍ය නිෂ්පාදන ව්‍යාප්ත කිරීම සඳහා පවතින ඉහළ විභවතාව.	මූල්‍ය වාර්තාකරණයට සමානව, ස්වාභාවික ප්‍රාග්ධන මිනුම්දඬු පිළිබඳ වාර්තාකරණය දියුණු කිරීම.	පවතින සවිමත් වත්කම් පදනම සහ අඛණ්ඩ තැන්පතු වර්ධනය, තිරසාර ආයෝජන සඳහා මනා ධාරිතාවක් සලසා දෙයි.	පාරිසරික බලපෑම අවම කිරීම කෙරෙහි පාර්ශ්වකරුවන් තුළ පවතින අපේක්ෂාවන්.
ස්වභාවික ප්‍රාග්ධනයට සම්බන්ධ මැනුම් (උදා: කාබන් පියසටහන, සම්පත් පරිභෝජනය සහ අපද්‍රව්‍ය කළමනාකරණය) මැනීම සඳහා වූ ශක්තිමත් යාන්ත්‍රණයක්.	සුළු හා මධ්‍ය පරිමාණ (SME) සහ ක්ෂුද්‍ර මූල්‍ය අංශ සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කර ඇති බැවින්, තිරසාර මූල්‍ය ක්ෂේත්‍රයේ ප්‍රමුඛයෙකු ලෙස බැංකුව ස්ථානගත වීමට ඇති හැකියාව.	ඉහළ පාරිසරික අවදානම් සහිත රාජ්‍ය ව්‍යවසායන් සමඟ පවතින ගනුදෙනු, බැංකුවේ තිරසාරත්ව ඉලක්කයන් කෙරෙහි අහිතකර ලෙස බලපෑමේ අවදානම.	ලාභදායීතාව පවත්වා ගනිමින් අක්‍රීය ණය කළමනාකරණය කිරීම පිළිබඳ මනා පළපුරුද්ද.	දේශගුණික අනුවර්තනය සහ ජාත්‍යන්තර තිරසාරත්ව ප්‍රමිතීන් වැළඳ ගැනීම කෙරෙහි ආයෝජකයන්ගේ සහ නියාමන ආයතනවල පවතින අපේක්ෂාව.
ආයෝජක අපේක්ෂාවන් සපුරාලීම සඳහා ගෝලීය රාමු සමඟ වඩාත් ශක්තිමත් ලෙස අනුගත වීම.	කඩදාසි භාවිතය සහ මෙහෙයුම් විමෝචනය අවම කිරීම සඳහා අප සතු ඩිජිටල් බැංකුකරණ හැකියාවන් උපරිමයෙන් ප්‍රයෝජනයට ගැනීම.	දේශගුණික බලපෑම්වලට අදාළ හෙළිදරව් කිරීම් සහ ණය ලබාදීමේ ක්‍රියාවලීන් වඩාත් දැඩි ලෙස අනුගමනය කිරීම කෙරෙහි නියාමන ආයතනවල අවධානය යොමු වීම.	රාජ්‍ය බැංකුවක් ලෙස ජනතාව තුළ තහවුරු වී ඇති ප්‍රබල විශ්වාසය සහ රට පුරා විහිදුණු ශක්තිමත් ශාඛා ජාලය.	පරිසර හිතකාමී බැංකුකරණ විසඳුම් සම්බන්ධයෙන් පාරිභෝගික අපේක්ෂාවන් දිනෙන් දින ඉහළ යාම.

එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන අරමුණු සඳහා බැංකුවේ දායකත්වය



පාරිසරික කැපවීම්වලට අනුකූලව ජලය සංරක්ෂණය කිරීමට බැංකුව පියවර ගනී.



බැංකු ශාඛා ගොඩනැගිලි හරිතකරණය.



දුරස්ථ ප්‍රදේශවල අඩු වරප්‍රසාදිත පාසල් සඳහා පිරිසිදු පානීය ජලය සහ සූර්ය බලශක්තිය ලබාදීමේ ප්‍රජා ව්‍යාපෘති හරහා, තිරසාර ප්‍රජාවන් ගොඩනැඟීමට බැංකුව දායකත්වය සපයයි.



ඩිජිටල් විසඳුම් ප්‍රවර්ධනය කිරීම මඟින් කඩදාසි භාවිතය අවම කිරීමටත්, සියලුම ගොඩනැගිලිවල විදුලි පරිභෝජනය සීමා කිරීමටත් පියවර ගනිමින් බැංකුව සම්පත් සංරක්ෂණය කරයි.



බැංකුව සිය හරිතාගාර වායු විමෝචනය (GHG Emissions) අඛණ්ඩව නිරීක්ෂණය කරයි.

බලශක්ති කළමනාකරණය

GRI 302-1, 3

බැංකුවේ ඩිජිටල්කරණය, ඉහළ යන විදුලි ඉල්ලුම සඳහා ප්‍රධාන හේතුවක් වනවා සේම, බලශක්ති ඉතිරිකිරීමේ ප්‍රබල මෙවලමක් ලෙස ද ක්‍රියා කරයි. දවසේ පැය 24 පුරා ක්‍රියාත්මක දත්ත මධ්‍යස්ථාන, ක්ලවුඩ් (Cloud) සේවා, කෘතිම බුද්ධියේ (AI) වර්ධනය සහ විවිධ ඩිජිටල් උපාංග භාවිතය ඉහළ යාම හේතුවෙන් විදුලි පරිභෝජනය යම් මට්ටමකින් ඉහළ ගොස් ඇත.

කෙසේ වෙතත්, බලශක්ති පරිභෝජනය ප්‍රශස්තිකරණය කිරීමට ඩිජිටල් පාලන පද්ධති බෙහෙවින් දායක විය. ස්වයංක්‍රීය පාලන ක්‍රම මගින් බලශක්ති භාවිතය කාර්යක්ෂම වූ අතර, කඩදාසි භාවිතය අවම වීම හේතුවෙන් ඒ ආශ්‍රිත ප්‍රවාහන හා බලශක්ති පිරිවැය අඩු කර ගැනීමට හැකි විය. "ස්මාර්ට් ග්‍රිඩ්" සහ ඉල්ලුමට සරිලන සැපයුම් පද්ධති හරහා පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් පද්ධතියට කාර්යක්ෂමව සම්බන්ධ කිරීමට ඩිජිටල් තාක්ෂණය උපකාරී වේ.

2025 වසරේදී ශාඛා 67ක් සඳහා සූර්ය බලශක්ති පද්ධති සවි කළ අතර, ඒ අනුව සූර්ය බලය භාවිතා කරන මුළු ශාඛා සංඛ්‍යාව 141 දක්වා ඉහළ ගොස් ඇත. සමාලෝචිත වර්ෂය තුළ සමස්ත සූර්ය බලශක්ති උත්පාදනය මෙගාවොට් (MW) 4.852කි. මීට අමතරව, සාමාන්‍ය විදුලි බල්බ වෙනුවට බලශක්ති ඉතිරිකරන LED විදුලි පද්ධති හඳුන්වා දීම සහ යල් පැන ගිය වායු සම්කරණ යන්ත්‍ර වෙනුවට ඉන්වර්ටර් මාදිලියේ යන්ත්‍ර ප්‍රතිස්ථාපනය කිරීම මගින් බැංකුවේ බලශක්ති කාර්යක්ෂමතාව තවදුරටත් ඉහළ නංවා ඇත.

හරිත මූල්‍යකරණය

අනාගතයට සූදානම් බැංකු ආයතනයක් ලෙස අප අඛණ්ඩව පරිණාමය වන අතරම, අපගේ මෙහෙයුම්වල මූලික පදනම ලෙස මහජන සුබසාධනය සලකන්නෙමු. එමෙන්ම, මිහිතලය සුරැකීමේ පුළුල් වගකීම පිළිබඳවද අප මැනවින් දැනුවත් වී සිටින්නෙමු. රට සෙමෙන් නමුත් ස්ථාවර ලෙස හරිත ආර්ථිකයක් කරා ගමන් කරමින් සිටින මොහොතක, අපගේ ප්‍රමුඛතාවයක් ලෙස හරිත මූල්‍යකරණ වැඩසටහන ක්‍රියාත්මක කළෙමු. ඒ යටතේ, කාබන් විමෝචනය අවම කිරීම සහ බලශක්ති සුරක්ෂිතතාව වේගවත් කිරීම උදෙසා රු. බිලියන 3.6ක වටිනාකමකින් යුතු ණය පහසුකම් 23ක් පිරිනමා ඇත.

වහල මත සවිකරන සූර්ය බලශක්ති පද්ධති	බිම සවිකරන සූර්ය බලශක්ති ව්‍යාපෘති
රු. බිලියන 0.84	**රු. බිලියන 2.52**

විද්‍යුත් වාහන භාවිතය ප්‍රවර්ධනය

රු. බිලියන 0.25

පාරිභෝගික කාබන් පියසටහන අවම කිරීමටත්, ජාතික බලශක්ති සුරක්ෂිතතාව ශක්තිමත් කිරීමටත්, මෙහෙයුම් පිරිවැය සැලකිය යුතු ලෙස අඩු කිරීමටත් සැලසුම් කර ඇති මෙම වැඩසටහන්, ආයතනික සහ සුළු හා මධ්‍ය පරිමාණ අංශයන්ට අවම කාබන් මෙහෙයුම් වලට අවතීර්ණ වීමට සහාය වේ.

අපගේ හරිත මූල්‍ය පියවරයන් සහ ඩිජිටල්කරණය පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු සඳහා, තොරතුරු තාක්ෂණ සහ ඩිජිටල් බැංකුකරණය පිළිබඳ 127-131 පිටු බලන්න.

බලශක්ති ප්‍රභවය	බලශක්ති වර්ගය	2025 පරිභෝජනය (ගිගාජූල්)	2024 පරිභෝජනය (ගිගාජූල්)
පුනර්ජනනීය නොවන	විදුලිය	8,191.4	6,235.7
පුනර්ජනනීය නොවන ඉන්ධන	පෙට්‍රල්	330.8	244.2
	ඩීසල්	1,646.2	2,292.9
මුළු එකතුව		10,168.4	8,772.9
සේවකයෙකු සඳහා බලශක්ති තීව්‍රතාව	ගිගාජූල් (GJ) 9.05		

අපගේ මෙහෙයුම් කටයුතු "පීපල්ස් ටවර්" (Peoplezs Tower) පරිශ්‍රය දක්වා පුළුල් කිරීමත් සමඟ, විදුලි පරිභෝජනය 2024 වසරේ පැවති ගිගාජූල් 6,235.7 සිට 2025 වසරේදී ගිගාජූල් 8,191.4 දක්වා ඉහළ ගොස් ඇත

දේශගුණික විපර්යාස සඳහා වන ක්‍රියාමාර්ග

GRI 201-2

ISO 14064-3:2019 සහතිකය

වාර්තාකරණ කාලසීමාව	2025 ජනවාරි 4 – 2025 දෙසැම්බර් 31
ආයතනය	මහජන බැංකුව, ශ්‍රී ලංකාව – ප්‍රධාන කාර්යාලය
ප්‍රකාශන අංකය	SL/PB/20260309
නිකුත් කළ දිනය	2026.03.09
සහතික කිරීමේ මට්ටම	සාධාරණ (Reasonable)
මුළු විමෝචනය	ටොන් (CO_2e) 1,901.71
ඍජු විමෝචනය	ටොන් (CO_2e) 408.31
මුළු වක්‍ර විමෝචනය	ටොන් (CO_2e) 1,493.40
ජීවජනක විමෝචනය (Biogenic)	අදාළ නොවේ

බලශක්ති පරිභෝජනය තවදුරටත් සීමා කිරීම සඳහා අප ක්‍රියාත්මක කළ ප්‍රවේශයන් කිහිපයක් පහත දැක්වේ:

- ශාඛා සහ ATM යන්ත්‍ර පිහිටි ගොඩනැගිලිවල වහල මත සූර්ය පැනල සවිකිරීම් වැඩි කිරීම.
- බලශක්ති ඉතිරිකිරීමේ ක්‍රමවේදයන් පිළිබඳව පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- "පීපල්ස් ටවර්" (Peoples Tower) පරිශ්‍රය සඳහා හරිත ගොඩනැගිලි ප්‍රමිතීන් හඳුන්වා දීම.
- විදුලි පරිභෝජනය අවම කිරීම සඳහා සියලුම නව යන්ත්‍රෝපකරණ සහ විද්‍යුත් උපකරණ මිලදී ගැනීමේදී ඒවායේ "බලශක්ති කාර්යක්ෂමතා අනුපාතය" සැලකිල්ලට ගැනීම.
- බලශක්තිය ඉතිරි කිරීම සඳහා ආලෝකකරණ කටයුතු වෙනුවෙන් LED බල්බ භාවිත කිරීම.
- බලශක්ති කාර්යක්ෂමව භාවිතා කරන බව සහතික කරන තුරු ලකුණු ශ්‍රේණිගත කිරීමක් සහිත තොරතුරු තාක්ෂණ උපකරණ මිලදී ගැනීම.
- දුරස්ථව නිරීක්ෂණය කළ හැකි, ශබ්දය අවම, අඩු විමෝචනයක් සහිත සහ ඉන්ධන කාර්යක්ෂමතාවයෙන් ඉහළ විදුලි ජනක යන්ත්‍ර ස්ථාපනය කිරීම.

බැංකුවේ අභ්‍යන්තර ක්‍රියාවලීන් මෙන්ම සමස්ත පාර්ශ්වකරුවන්ගේ ක්‍රියාකාරකම් ද වගකීම් සහගත පරිභෝජනයක් කරා යොමු කිරීමට අප දැක්වූ කැපවීම විවිධ අංශයන් ඔස්සේ මනාව තහවුරු විය.

වහල මත සවිකරන සහ වාණිජ මට්ටමේ සූර්ය බලශක්ති ව්‍යාපෘති සඳහා මූල්‍යකරණය	සූර්ය බලශක්ති භාවිතය වේගවත් කිරීම සඳහා වන හවුල්කාරිත්වයන්	ජාතික සූර්ය බලශක්ති ව්‍යාප්ති වැඩසටහන සමඟ අනුගත වීම	අභ්‍යන්තර ක්‍රියාමාර්ග
වහල මත සවිකරන සහ ජාලගත (Grid-connected) ව්‍යාපෘති සඳහාම වෙන්වූ "සූර්ය බලශක්ති" ණය පහසුකම් පිරිනමන ලදී. එමගින් පාරිභෝගිකයින්ට සහ ශාඛාවලට සිය පරිශ්‍රයන්හිම විදුලිය උත්පාදනය කිරීමටත්, ජාතික විදුලි බල පද්ධතිය මත යැපීම අවම කිරීමටත් අවස්ථාව ලැබිණි.	පාරිභෝගිකයින් සහ බැංකු පරිශ්‍රයන් සඳහා සූර්ය බලශක්ති පද්ධති හඳුන්වා දීම වේගවත් කිරීම උදෙසා, පුනර්ජනනීය බලශක්ති නිෂ්පාදකයින් සමඟ එක්ව විශේෂිත මූල්‍යකරණ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.	"සූර්ය බල සංග්‍රාමය" වැනි ජාතික වැඩසටහන් හරහා 2025 වසරේදී සූර්ය බලශක්ති ධාරිතාව පුළුල් වූ අතර, එය බැංකුව මෙහෙයවන පද්ධති වැඩිදියුණු කිරීමට මෙන්ම පහසු තීරුබදු සහ ජාල සම්බන්ධතා විකල්ප හරහා ව්‍යාපෘති වඩාත් ලාභදායී (Project economies) වීමට මග පාදයි.	විදුලි පරිභෝජනය අවම කිරීම සඳහා LED ආලෝකකරණය, කාර්යක්ෂම HVAC පද්ධති සහ ස්වයංක්‍රීය ගොඩනැගිලි කළමනාකරණ පද්ධති (BMS) වැනි බලශක්ති කාර්යක්ෂම ප්‍රතිසංස්කරණ කටයුතු අඛණ්ඩව සිදු කරන ලදී. ස්මාර්ට් පාලන පද්ධති සහ කාලරාමු (Timers) භාවිතයෙන් විදුලි පරිභෝජන රටාවන් කළමනාකරණය කරන ලද අතර, සූර්ය බලශක්ති උත්පාදනය උපරිම වන දිවා කාලය තුළදී අත්‍යවශ්‍ය නොවන මෙහෙයුම් කටයුතු සඳහා විදුලිය භාවිත කිරීමට ප්‍රමුඛතාව ලබා දෙන ලදී. ජාතික විදුලි පද්ධතියෙන් ලබාගන්නා පරිභෝජනය පියවා ගැනීම (Offset) සඳහා පුනර්ජනනීය බලශක්තිය හෝ බලශක්ති සහතික මිලදී ගැනීම. පහසුකම් සඳහා වැයවන බලශක්ති පරිභෝජනය අවම කිරීමේ අරමුණින්, "People's Pay" සහ "Wave" වැනි යෙදුම් (Apps) හරහා ඩිජිටල් බැංකුකරණය ප්‍රවර්ධනය කිරීම සහ ශාඛා මෙහෙයුම් තාර්කිකකරණය (Rationalisation) අඛණ්ඩව සිදු කරන ලදී.

වායු විමෝචන කළමනාකරණය

GRI 305-1, 2, 3, 4, 5

ISO 14064-3:2019 ජාත්‍යන්තර ප්‍රමිතිය යටතේ 2024 වසරේදී අප ලබාගත් සත්‍යාපනය (Verification), හරිතාගාර වායු විමෝචනය අවම කිරීම සඳහා අප ගෙන යන අඛණ්ඩ ප්‍රයත්නයට මනා පිටිවහලක් විය. අපගේ වායු විමෝචනය ප්‍රධාන වශයෙන් ප්‍රවාහන කටයුතු සහ යන්ත්‍රෝපකරණ මෙහෙයුම්වලට පමණක් සීමා වුවද, 2025 වසරේදී ද අප එම සහතිකකරණයේ අවශ්‍යතාවන් අකුරටම ඉටු කිරීමට කටයුතු කළෙමු. එහිදී කිසිදු ප්‍රමිතියක් උල්ලංඝනය වීමක් (Non-compliance) වාර්තා නොවූ අතර, වායු විමෝචන කළමනාකරණය සඳහා විධිමත් සහ ලේඛනගත හඳුනාගැනීමේ සහ ඇගයීමේ ක්‍රමවේදයන් අප අනුගමනය කළෙමු.

හඳුනාගැනීමේ නිර්ණායක

අදාළත්වය	සම්පූර්ණත්වය	ස්ථාවරත්වය/ඒකාකාරී බව	නිරවද්‍යතාව	විනිවිදභාවය
අපේක්ෂිත පරිශීලකයින්ගේ (පාරිභෝගිකයින්, සැපයුම්කරුවන්, ආයෝජකයින්, රජය, රාජ්‍ය නොවන සංවිධාන වැනි) අවශ්‍යතා සපුරාලීම සඳහා තනිව හෝ වෙනත් ප්‍රභවයන් හා සම්බන්ධිතව වාර්තා කළ යුතු වක්‍ර විමෝචනයන් හෝ ඉවත් කිරීම් මොනවාදැයි සලකා බැලීම.	විමෝචන ලේඛනය (Inventory) තුළ සියලුම අදාළ ප්‍රභවයන් අන්තර්ගත වන බව සහතික කිරීම සඳහා ඇතුළත් කළ යුතු වක්‍ර විමෝචන සහ ඉවත් කිරීම් හඳුනා ගැනීම.	පරිශීලකයෙකුට අර්ථවත් සැසඳීම් සිදු කිරීමට (උදා: විමෝචන ලේඛනයේ අඩංගු හරිතාගාර වායු තොරතුරු අතර) වක්‍ර විමෝචන සහ ඉවත් කිරීම් ඇතුළත් කිරීම අත්‍යවශ්‍ය දැයි සලකා බැලීම.	විමෝචන ලේඛනයේ සමස්ත අගයන් අවිනිශ්චිතතාවයෙන් තොරව නිවැරදිව පවත්වා ගැනීම සඳහා, වක්‍ර විමෝචන සහ ඉවත් කිරීම් තනිව හෝ වෙනත් ප්‍රභවයන් සමඟ ඒකාබද්ධව ඇතුළත් කිරීම අවශ්‍ය දැයි සලකා බැලීම.	නිසි හෙළිදරව් කිරීමකින් හෝ සාධාරණීකරණයකින් තොරව වක්‍ර විමෝචන සහ ඉවත් කිරීම් බැහැර කිරීම මඟින්, පරිශීලකයින්ට නිසි විශ්වාසයකින් යුතුව තීරණ ගැනීමට බාධාවක් වන්නේදැයි සලකා බැලීම.

ඇගයීම් නිර්ණායක

විශාලත්වය	බලපෑම් කළ හැකි මට්ටම	අවදානම් හෝ අවස්ථා	අංශයට අදාළ මඟපෙන්වීම්	බාහිර සේවා සපයා ගැනීම	සේවක සහභාගිත්වය
ප්‍රමාණාත්මකව සැලකිය යුතු මට්ටමක පවතිනු ඇතැයි උපකල්පනය කෙරෙන විමෝචනයන් හෝ ඉවත් කිරීම්.	විමෝචනයන් සහ ඉවත් කිරීම් නිරීක්ෂණය කිරීමට මෙන්ම ඒවා අවම කිරීමට සංවිධානය සතු හැකියාවේ ප්‍රමාණය (උදා: බලශක්ති කාර්යක්ෂමතාව, පරිසර හිතකාමී සැලසුම්, පාරිභෝගිකසහභාගිත්වය සහ යොමු නියමයන්).	සංවිධානය මුහුණ දෙන අවදානම්වලට (උදා: මූල්‍ය, නියාමන, සැපයුම් දාමය, කීර්තිනාමය හෝ නීතිමය අවදානම්) දායක වන විමෝචනයන් හෝ නව වෙළඳපොළවල් සහ ව්‍යාපාරික ආකෘතීන් වැනි ව්‍යාපාරික අවස්ථා උදාකර දෙන විමෝචනයන්.	අදාළ ව්‍යාපාරික අංශයේ මඟපෙන්වීම්වලට අනුව, එම ක්ෂේත්‍රයට අදාළව වැදගත් යැයි සැලකෙන හරිතාගාර වායු විමෝචනයන්.	සාමාන්‍යයෙන් ආයතනයේ මූලික ව්‍යාපාරික කටයුතුවලට අදාළ වන, බාහිර සේවා සපයා ගැනීම් හරහා සිදුවන විමෝචනයන් සහ ඉවත් කිරීම්.	බලශක්ති පරිභෝජනය අවම කිරීමට සේවකයින් දිරිමත් කළ හැකි හෝ දේශගුණික විපර්යාසයන්ට එරෙහිව පොදු අරමුණක් වටා සේවක කණ්ඩායම් ඒකරාශී කළ හැකි විමෝචනයන් (උදා: බලශක්ති සංරක්ෂණ දිරිගැන්වීම්, පොදු වාහන භාවිතය, අභ්‍යන්තර කාබන් මිලකරණය).

2025 හරිතාගාර වායු විමෝචන දත්ත සාරාංශය

පරාසය	විමෝචන ප්‍රභවයන්	හරිතාගාර වායු විමෝචනය ($tonCO_2e$)				මුළු විමෝචනය
		CO_2	CH_4	N_2O	HFC	$tonCO_2e$
පරාසය 1: සෘජු විමෝචනය	ස්ථාවර දහනය	17.835	0.131	0.000		17.967
	ජංගම දහනය	259.538	0.533	2.677		262.749
	පලායන විමෝචනය	0.022			127.572	127.594
	පරාසය 1 – එකතුව	277.373	0.665	2.677	127.572	408.309
පරාසය 2: වක්‍ර විමෝචනය	මිලදී ගත් විදුලිය	875.495				875.495
	පරාසය 2 – එකතුව	875.495				875.495
පරාසය 3: වෙනත් වක්‍ර විමෝචන	මිලදී ගත් භාණ්ඩ	0.710	0.002	0.007		0.720
	ව්‍යාපාරික සංචාර – ගොඩබිම්	0.136	0.002	0.002		0.139
	ව්‍යාපාරික සංචාර – ගුවන්	52.058				52.058
	සේවක ප්‍රවාහනය	464.100	1.090	2.472		467.662
	අපද්‍රව්‍ය උත්පාදනය	0.446				0.446
	සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ පාඩු	91.903				91.903
	මිලදී ගත් ජලය	4.971				4.971
	පරාසය 3 – එකතුව	614.324	1.094	2.481		617.899
මුළු විමෝචනය	**සමස්ත මුළු විමෝචනය**	1767.193	1.758	5.159	127.572	1901.704

2025 සහ 2024 වර්ෂ අතර හරිතාගාර වායු (GHG) විමෝචන සංසන්දනය-

මූල්‍ය වර්ෂය	මුළු විමෝචනය ($tonCO_2e$)	01 වන ප්‍රවර්ගය ($tonCO_2e$)	02 වන ප්‍රවර්ගය ($tonCO_2e$)	03 වන ප්‍රවර්ගය ($tonCO_2e$)	04 වන ප්‍රවර්ගය ($tonCO_2e$)	06 වන ප්‍රවර්ගය ($tonCO_2e$)
2024	1904.7	305.9	720.1	801.5	0.7	76.5
2025	1901.7	408.3	875.5	520.6	0.5	96.9

2024 වසරේ 2.6 tCO_2e ක් වූ සේවකයෙකුට සාපේක්ෂ හරිතාගාර වායු විමෝචන තීව්‍රතාවය, 2025 වර්ෂය වන විට 2.2 tCO_2e දක්වා පහත වැටී ඇත. ඒ අනුව, වාර්තාවට අදාළ වර්ෂය තුළ සමස්ත විමෝචනය tCO_2e 1,904.7 සිට tCO_2e 1,901.7 දක්වා වාර්තාගත ලෙස අඩු වී තිබේ.

කාබන් ඩයොක්සයිඩ් (CO2) කාන්දු වීම වැළැක්වීම සඳහා බැංකුව විසින් නිතිපතා ගිහි නිවන උපකරණ නිරීක්ෂණ කටයුතු සිදු කරනු ලබයි. එමෙන්ම, හරිතාගාර වායු විමෝචනය අවම කිරීම සඳහා බැංකුව සතු වාහන වෙනුවෙන් සාර්ථක මාර්ග සැලසුම් වැඩපිළිවෙළක් (Route plan programme) ක්‍රියාත්මක කරන ලදී.

අපගේ නිෂ්පාදන, සේවා සහ සම්පත් කළමනාකරණය හරහා හරිතාගාර වායු විමෝචන කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට ඇති කැපවීම පිළිබඳ වැඩිදුර තොරතුරු 94-95 පිටුවල "අපගේ ESG අවධානය" (Our ESG Focus) යටතේ දක්වා ඇත.

විමෝචන සංසන්දනය සඳහා පාදක වර්ෂය (Base year) ලෙස 2022 වසර භාවිත කරනු ලැබේ.

යොදාගත් ගෝලීය උණුසුම් වීමේ විභවතා (GWP) අගයන්

	වසර 100ක කාල පරාසය සඳහා GWP අගයන්
	භයවන තක්සේරු වාර්තාව (AR6)
CO_2	1
CH_4	29.8/27
N_2O	273
$CHCLF_2$	2,256

විමෝචන සාධකවලට අදාළ මූලාශ්‍ර

https://www.ipccnggip.iges.or.jp/public/2006gl/pdf/2_Volume2/V2_2_Ch2_Stationary_Combustion.pdf

https://ceypetco.gov.lk/wpcontent/uploads/Import-Specification.pdf

https://www.ipccnggip.iges.or.jp/public/pdf/2_Volume2/V2_3_Ch3_Mob ile_Combustion.pdf

https://ceypetco.gov.lk/wpcontent/uploads/Import-Specification.pdf

https://www.icao.int/environmental-protection/environmental-tools/ice

ජල සංරක්ෂණය

GRI 303-1, 5

අපි බොහෝ ශාඛා හරහා වැසි ජලය රැස් කිරීම (Rainwater harvesting), ජලය රඳවා තබා ගැනීම සහ නැවත භාවිත කිරීමේ ක්‍රියාවලිය අඛණ්ඩව කරගෙන ගියෙමු. 2024 වසරේදී ප්‍රධාන කාර්යාලයේ ජල පරිභෝජනය මෙගා ලීටර් 11.942ක් වූ අතර, 2025 වසරේදී එය මෙගා ලීටර් 11.010ක් දක්වා අඩු වී ඇත.

බැංකුව සහ එහි අනුබද්ධිත ආයතන ප්‍රධාන වශයෙන් මූල්‍ය සේවාවල නියැලී සිටින බැවින්, ජල පරිභෝජන අවශ්‍යතාවය සීමිත මට්ටමක පවතී. එම අවශ්‍යතා ප්‍රධාන වශයෙන් පානීය, පිරිසිදු කිරීම් සහ සනීපාරක්ෂක පහසුකම් සඳහා පමණක් සීමා වේ.

බැංකුවේ ජල භාවිත පිළිවෙත් පහත පරිදි වේ:

ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල

- **පානීය ජලය:** පානීය අවශ්‍යතා සඳහා බෝතල් කළ ජලය භාවිතා කෙරේ.
- **පිරිසිදු කිරීම්:** පිරිසිදු කිරීමේ කටයුතු සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ජලය භාවිතා කරනු ලැබේ.
- **අපජලය:** අපජලය නාගරික අපජල පද්ධතියට (Municipal line) මුදා හැරේ.

පාසිකුඩා කාර්ය මණ්ඩල පුහුණු මධ්‍යස්ථානය:

- **පානීය සහ පිරිසිදු කිරීම්:** පානීය සහ පිරිසිදු කිරීමේ අවශ්‍යතා සඳහා ළිං ජලය පිරිසිදු කිරීමට ප්‍රතිලෝම ආශ්‍රැති (Reverse Osmosis – R/O) පද්ධතියක් භාවිත කරනු ලැබේ.
- **අපජලය:** අපජලය පිරිසිදු කිරීම සඳහා අපජල පවිත්‍රාගාර (Sewer Treatment Plant) පහසුකම් පවතින අතර, පිරිසිදු කරන ලද එම ජලය පසුව ගෙවතු වගා කටයුතු සඳහා නැවත භාවිත කෙරේ.

තංගල්ල ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය (RHO):

- **අපජලය:** අනෙකුත් ස්ථානවලට සමානව, අපජලය පිරිසිදු කිරීම සඳහා මෙහි ද අපජල පවිත්‍රාගාර පහසුකම් ස්ථාපිත කර ඇත.

අම්පාර ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය (RHO):

- **අපජලය:** මෙම ස්ථානයේ අපජලය පිරිසිදු කිරීම සඳහා අපජල පිරිපහදු පද්ධතියක් ස්ථාපිත කර ඇත.

වවුනියාව ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය (RHO):

- **අපජලය:** අනෙකුත් ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලවලට සමානව, අපජලය පිරිසිදු කිරීම සඳහා අපජල පවිත්‍රාගාර පහසුකම් පවතී.

හක්මන ශාඛාව:

- **අපජලය:** අනෙකුත් ශාඛා සහ කාර්යාල මෙන්ම, අපජලය පිරිසිදු කිරීම සඳහා මෙහි ද අපජල පිරිපහදු පද්ධතියක් භාවිත කෙරේ.

අපද්‍රව්‍ය කළමනාකරණය

GRI 306-1

බැංකුවේ අපද්‍රව්‍යවලින් වැඩි ප්‍රමාණයක් සේවක ආහාර පාන සහ කඩදාසි භාවිතය නිසා හටගනී. මේවා නියාමන අවශ්‍යතාවලට අනුකූලව බැහැර කෙරෙන අතර, ඒවා එකතු කිරීම සහ ප්‍රතිචක්‍රීකරණය කිරීම මහ නගර සභා හෝ නගර සභා මගින් කළමනාකරණය කරනු ලබයි. මීට අමතරව, මධ්‍යම පරිසර අධිකාරිය විසින් අනුමත කරන ලද තෙවන පාර්ශවීය ප්‍රතිචක්‍රීකරණ ආයතන ද මේ සඳහා සම්බන්ධ කර ගනු ලැබේ.

අපජලය බැහැර කිරීමේදී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් නියම කර ඇති නිර්ණායකයන් දැඩි ලෙස අනුගමනය කරනු ලබයි.

විද්‍යුත් අපද්‍රව්‍ය (E-waste) කළමනාකරණය සඳහා බැංකුවේ ටෙන්ඩර් ක්‍රියා පටිපාටියට අනුකූලව ප්‍රතිචක්‍රීකරණ සේවා සපයන්නන් පත් කරනු ලැබේ. බලශක්ති පරිභෝජනය සහ සේවා කාලය කෙරෙහි අවධානය යොමු කරමින්, හැකි සෑම විටම ඉලෙක්ට්‍රොනික උපකරණ අලුත්වැඩියා කර නැවත භාවිත කිරීමට බැංකුව කටයුතු කරයි.

රහස්‍ය නොවන සියලුම කඩදාසි ප්‍රතිචක්‍රීකරණය සඳහා අනුමත බාහිර සේවා සපයන්නෙකු වෙත යොමු කෙරේ. මෙම සමස්ත ක්‍රියාවලියම විධිමත් ලෙස ලේඛනගත කර ඇති අතර, පාරිභෝගික දත්ත ආරක්ෂාව පිළිබඳ දැඩි මාර්ගෝපදේශවලට අනුකූලව වගකිවයුතු ලෙස ක්‍රියාත්මක කරනු ලැබේ.

රහස්‍ය දත්ත අඩංගු කල් ඉකුත් වූ ලේඛන, බැංකුවේ අධීක්ෂණය යටතේ අනාගත සංසරණයෙන් ඉවත් කර ආරක්ෂිතව සංරක්ෂණය කිරීම හෝ විනාශ කිරීම සිදු කෙරේ. දැනුම කළමනාකරණය, සූදානම සහ තොරතුරු සුරක්ෂිතතාවය පදනම් කරගත් ඩිජිටල් සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම සඳහා, තොරතුරු තාක්ෂණ අංශයේ මෙහෙයවීමෙන් බැංකුවේ ප්‍රධාන ලේඛන පද්ධතිය ඩිජිටල් අන්තර්ගත කළමනාකරණ පද්ධතියක් (CMS) සමඟ ඒකාබද්ධ කරන ලදී.

කඩදාසි භාවිතය අවම කිරීම

ඩිජිටල්කරණය පුළුල් කිරීම හරහා කඩදාසි පරිභෝජනය සැලකිය යුතු ලෙස අඩු කර ඇති අතර, එමගින් අපගේ පාරිසරික පියසටහන (Environmental footprint) යහපත් කර ගැනීමටත්, ලිපිද්‍රව්‍ය ප්‍රසම්පාදන පිරිවැය ප්‍රශස්තකරණය (Cost optimisation) කිරීමටත් හැකි විය. දිවයින පුරා විහිදුණු උපායමාර්ගික ව්‍යාපාරික ඒකක (SBU), කියෝස්ක් (Kiosks), ATM සහ CDM ජාලය මගින් ශක්තිමත් වූ බැංකුවේ ඩිජිටල් පරිවර්තනය, ශාඛා ජාලය තුළ කඩදාසි භාවිතය අවම කිරීමට ප්‍රධාන වශයෙන් දායක විය. මීට අමතරව, රහස්‍ය නොවන අපද්‍රව්‍ය කඩදාසි වගකීම් සහගත ලෙස කළමනාකරණය කිරීම සඳහා බාහිර සේවා සපයන්නෙකු සමඟ පවත්නා හවුල්කාරිත්වය අපි තවදුරටත් අඛණ්ඩව පවත්වාගෙන යන්නෙමු. 2024 වසරේ ප්‍රතිචක්‍රීකරණය කළ කිලෝග්‍රෑම් 2,122ක ප්‍රමාණයට සාපේක්ෂව, 2025 වසරේදී කඩදාසි කිලෝග්‍රෑම් 5,459ක් ප්‍රතිචක්‍රීකරණය කිරීමට අපට හැකි විය.

කාබන් පියසටහන අවම කිරීම

ඩිජිටල්කරණය, බලශක්ති සහ අපද්‍රව්‍ය කළමනාකරණය, පුනර්ජනනීය බලශක්ති උත්පාදනය සහ හරිත මූල්‍යකරණය යන අංශවල සාමූහික දායකත්වය 2025 වසරේදී අපගේ කාබන් පියසටහන (Carbon footprint) අවම කිරීමට බෙහෙවින් ඉවහල් විය. මෙම ක්‍රියාවලීන් සඳහා අවශ්‍ය පාලන රාමුව (Governance framework) සපයනු ලබන්නේ බැංකුවේ තිරසාර ප්‍රතිපත්තිය වන “Peoplezs Green Pulse” මගිනි. අපගේ නිෂ්පාදන සැලසුම්කරණය සහ රජයේ මූලිකත්වයෙන් ක්‍රියාත්මක වන වැඩසටහන් සඳහා දායක වීම හරහා, පුළුල් දේශගුණික මූල්‍ය උපායමාර්ගයන් සහ ජාතික පුනර්ජනනීය බලශක්ති ඉලක්ක සපුරා ගැනීමට අපි සහාය වන්නෙමු.

දේශගුණික විපර්යාස ආශ්‍රිත අවදානම් සහ අවස්ථා

GRI 201-2

අවදානම් (Risks)	අවස්ථා (Opportunities)
ණය කළඹේ නිරාවරණය (Loan portfolio exposure): ස්වභාවික විපත් සහ මුහුදු මට්ටම ඉහළ යාම හේතුවෙන් කෘෂිකර්මාන්තය, ධීවර කර්මාන්තය සහ වෙරළබඩ සංචාරක ව්‍යාපාරය වැනි ප්‍රධාන කර්මාන්ත ණය පැහැර හැරීමේ ඉහළ අවදානමකට මුහුණ දෙයි. මෙහිදී ණය පැහැර හැරීමේ සම්භාවිතාව ඉහළ මට්ටමක පවතී.	**පුනර්ජනනීය බලශක්තිය සඳහා ලබා දෙන ණය:** සූර්ය, සුළං සහ ජල විදුලි ව්‍යාපාර සඳහා අරමුදල් සැපයීම ශ්‍රී ලංකාවේ පුනර්ජනනීය බලශක්ති ඉලක්ක සමඟ සම්පාත වන අතර, එය අනාගතයේදී තවත් ව්‍යාපාරික අවස්ථා උදාකර දෙයි.
ශාඛා මෙහෙයුම් (Branch operations): ස්වභාවික විපත් නිසා ශාඛා ජාලයට බලපෑම් ඇති විය හැකි අතර, එමගින් නඩත්තු සහ ප්‍රතිසංස්කරණ පිරිවැය ඉහළ යයි.	**තිරසාර කෘෂිකාර්මික ණය (Sustainable agricultural credit):** දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දෙන ගොවිතැන් ක්‍රම සඳහා සහාය වීම මගින් ග්‍රාමීය සංවර්ධනය ඉහළ නංවන අතර ණය පැහැර හැරීමේ අවදානම අඩු කරයි.
සැපයුම් දාම බාධා (Supply chain disruptions): දේශගුණික විපර්යාස නිසා සැපයුම්කරුවන් මුහුණ දෙන බාධාවන් බැංකුවේ මෙහෙයුම්වලට බලපෑම් කළ හැකිය. එමෙන්ම, භූ-දේශපාලනික නොසන්සුන්තාවන් නිසා අඛණ්ඩ සේවාවක් සැපයීමට අත්‍යවශ්‍ය වන ද්‍රව්‍ය සපයා ගැනීමට ඇති බාධාවන් තවත් තීව්‍ර විය හැකිය.	**හරිත බැඳුම්කර (Sustainable agricultural credit):** තිරසාර යටිතල පහසුකම් සඳහා හරිත බැඳුම්කර නිකුත් කිරීම මගින් ESG (පාරිසරික, සමාජීය සහ පාලන) කෙරෙහි අවධානය යොමු කරන ආයෝජකයින් ආකර්ෂණය කර ගත හැකිය.

2026 සඳහා ඉදිරි දැක්ම

2026 වසරේදී මහජන බැංකුවේ උපායමාර්ගික ප්‍රමුඛතාව වනුයේ සිය හරිත මූල්‍යකරණ කළඹ (Green financing portfolio) තවදුරටත් පුළුල් කරමින්, තිරසාරභාවය බැංකුවේ වර්ධන ක්‍රියාවලියේ ප්‍රධානතම පදනම බවට පත් කිරීමයි. පුනර්ජනනීය බලශක්ති සහ දේශගුණික අවදානම්වලට ඔරොත්තු දීමේ ව්‍යාපෘති කෙරෙහි දක්වන සක්‍රීය අවධානය හේතුවෙන්, ශ්‍රී ලංකාවේ හරිත ආර්ථික පරිවර්තනය තුළ තීරණාත්මක බලපෑමක් සිදු කළ හැකි මූල්‍ය ආයතනයක් ලෙස මහජන බැංකුව පත්වනු ඇත.

දේශගුණික අවදානම් අවම කිරීම සඳහා හරිත මූල්‍යකරණය උපයෝගී කර ගනිමින්, තිරසාර ආර්ථික සංවර්ධනයක ප්‍රමුඛ ගාමක බලවේගයක් ලෙස කටයුතු කිරීමට බැංකුව සූදානම්ව සිටී. එමෙන්ම, මෙම තිරසාර වැඩපිළිවෙළ ඔස්සේ ජාත්‍යන්තර ආයෝජන අවස්ථා ආකර්ෂණය කර ගැනීමට ද අප අපේක්ෂා කරමු.

බැංකුවේ තිරසාර වැඩපිළිවෙළේ කොටසක් ලෙස, මෙහෙයුම් කටයුතු සඳහා සූර්ය බලශක්තිය ඒකාබද්ධ කිරීම, “Energy Star” ප්‍රමිතීන්ට අනුකූල තොරතුරු තාක්ෂණ පද්ධති භාවිත කිරීම සහ පොසිල ඉන්ධන භාවිත කරන වාහන වෙනුවට විදුලි වාහන (EV) භාවිතයට යොමු වීම සඳහා බැංකුව කැපවී සිටී.

2026 වසර වන විට සිය ශාඛා ජාලයෙන් බහුතරයක් හරිත ප්‍රමිතීන්ට (Green standards) අනුකූල කරමින්, තිරසාරභාවය බැංකුවේ මූලික මෙහෙයුම් මූලධර්මයක් බවට පත් කිරීම අපගේ අරමුණයි.

මෙම පරිපූර්ණ ප්‍රවේශය ශ්‍රී ලංකාවේ තිරසාර මූල්‍යකරණ ක්ෂේත්‍රයේ ප්‍රමුඛයෙකු ලෙස මහජන බැංකුව සතු විශ්වසනීයත්වය තහවුරු කරයි. මෙය බාහිර හරිත ව්‍යාපෘති සඳහා අරමුදල් සැපයීමට පමණක් සීමා නොවී, ආයතනය තුළ ද තිරසාරභාවය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේ ද්විත්ව උපායමාර්ගයක් වන අතර, එමගින් අනෙකුත් ආයතන සඳහා ද සම්මතයක් (Benchmark) සැපයෙනු ඇත.


EXIT
EXIT

පාලනය



208
අවදානම් කළමනාකරණ වාර්තාව

260
ආයතනික පාලනය

298
අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව

299
අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටු වාර්තාව

300
අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව

301
අධ්‍යක්ෂ මණ්ඩල විධායක ණය කමිටු වාර්තාව

302
අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා සහ පාලන කමිටු වාර්තාව

303
අධ්‍යක්ෂ මණ්ඩල ආයෝජන බැංකුකරණ කමිටු වාර්තාව


304
අධ්‍යක්ෂ මණ්ඩල උපායමාර්ගික සැලසුම් සමාලෝචන කමිටු වාර්තාව

305
සම්බන්ධිත පාර්ශ්වීය ගනුදෙනු සමාලෝචන කමිටු වාර්තාව

306
මූල්‍ය වාර්තාකරණය කෙරෙහි අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය

308
අභ්‍යන්තර පාලනයන් පිළිබඳ විගණකාධිපතිවරයාගේ සහතික කිරීමේ වාර්තාව

අවදානම් කළමනාකරණ වාර්තාව



මින් පෙර අත් නොවිඳි සාර්ව ආර්ථික පීඩනයකින් සහ ස්වෛරී ණය ප්‍රතිව්‍යුහගත කිරීමකින් අනතුරුව, සමාලෝචිත වර්ෂය ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රකෘතිය තුළ වැදගත් අවධියක් සනිටුහන් කළේය. ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ සහ මුදල් අමාත්‍යාංශයේ මඟ පෙන්වීම හා අධීක්ෂණය යටතේ දියත් කළ මූල්‍ය ස්ථායීකරණ වැඩපිළිවෙළ, මූල්‍ය ඒකාබද්ධකරණ ප්‍රයත්න සහ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ හේතුවෙන් දේශීය මූල්‍ය පද්ධතිය තුළ ක්‍රමික ස්ථාවරත්වයක් සහ නව්‍ය විශ්වාසයක් ගොඩනැගුණු බව දක්නට ලැබිණි.

අපගේ ප්‍රමුඛතා

වෙනස්වන සුළු මෙම පසුබිම හමුවේ, බැංකුව සිය අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය, ඔරොත්තුදීමේ හැකියාව (Resilience), ප්‍රාග්ධන සංරක්ෂණය, ද්‍රවශීලතා ශක්තිය සහ විනයගරුක අවදානම් පූර්වකතාව කෙරෙහි නොසැලෙන අවධානයකින් යුතුව කටයුතු කළේය. පසුගිය අර්බුදකාරී සමයෙන් උගත් පාඩම් පාදක කර ගනිමින්, මතුපිටින් පෙනෙන අවදානම්වලට එපිටින් ගිය ඉදිරි දැක්මක් සහිත අවදානම් පාලනයක්, විධාත් විචක්ෂණශීලී ශේෂ පත්‍ර කළමනාකරණයක් සහ ඕනෑම පීඩන තත්ත්වයකට ඔරොත්තු දිය හැකි ආතති පරීක්ෂණ (Stress testing) හැකියාවන් වර්ධනය කර ගැනීමට බැංකුව පියවර ගෙන ඇත.

අපගේ උපාය මාර්ගය

ආර්ථික අර්බුදයේ තීව්‍ර අවස්ථාව තුළ සිදු වූ ණය අවදානම ඉහළ යෑම, පොලී අනුපාතිකයන් හි අස්ථාවරත්වය, මුදල් අවප්‍රමාණය වීම සහ ද්‍රවශීලතාවය සීමා වීම හේතුවෙන් බැංකු අවදානම පිළිබඳ අර්ථ නිරූපණය තුළ සැලකිය යුතු වෙනස්කම් සිදුවිය. කෙසේ වෙතත්, සාර්ව ආර්ථික දර්ශක අනුව වසර තුළ ආර්ථිකය ස්ථාවරත්වයට පත්වීමේ ලකුණු පෙන්නුම් කළ බැවින්, විචක්ෂණශීලී අවදානම් පාලනය තුළින් වර්ධනය සඳහා වූ අවස්ථාවන් සමබර කරගනු ලැබූ ශුභවාදී, සැලකිලිමත් ස්ථාවරයක් බැංකුව විසින් අනුගමනය කරනු ලැබිණි.

වර්ෂය තුළ ප්‍රමුඛතාව ලබා දුන් කරුණු මෙසේය

- ණය ඇගයීම් හා විශ්ලේෂණ ප්‍රමිතීන් ශක්තිමත් කිරීම සහ ප්‍රතිව්‍යුහගත කරන ලද සහ අවදානමට ලක්විය හැකි ණය පිළිබඳ අධීක්ෂණය ඉහළ නංවාලීම.
- ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 9 යටතේ, ඉදිරි දැක්මක් සහිත සාර්ව ආර්ථික ආවරණයන් හරහා ප්‍රමාණවත් හානි පූරණ ප්‍රතිපාදන පවත්වා ගැනීම.
- ද්‍රවශීලතා ස්වාරක්ෂක සහ අරමුදල් සංකේන්ද්‍රණය සක්‍රීයව කළමනාකරණය කිරීම.



- නියාමන අපේක්ෂාවන්ට අනුකූලව ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය නිරීක්ෂණය කිරීම.
- ස්වෛර්භාවය, පොලී අනුපාතය සහ බාහිර අංශයේ කම්පන ඇතුළත් කිරීම සඳහා ආතති පරීක්ෂණ (stress testing frameworks) රාමු වැඩි දියුණු කිරීම.
- II වන කුළුණට අදාළ අවදානම් යටතේ දේශගුණික අවදානම් තක්සේරු ක්‍රියාවලීන් ඒකාබද්ධ කිරීම.
- තාක්ෂණික අවදානම් සහ සයිබර් ආරක්ෂාව පිළිබඳ ක්‍රියාවලින් වැඩිදියුණු කිරීම.
- සංවේදී තොරතුරු වල රහස්‍යභාවය, සුරක්ෂිත භාවිතය සහ අඛණ්ඩතාව සහතික කිරීම සඳහා දත්ත ආරක්ෂණ රාමුව සවිබල ගැන්වීම.

අපගේ ව්‍යාපාර උපායමාර්ගය ප්‍රාග්ධන ශක්‍යතාවය සහ ද්‍රවශීලතා ධාරිතාව හා සමගාමීව ක්‍රියාත්මක වන බවට සහතික වෙමින්, පැහැදිලිව නිර්වචනය කරනු ලැබූ, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අවදානම් රුචිකත්ව රාමුවක් (Risk Appetite Framework) තුළ බැංකුව අබණ්ඩව ක්‍රියාත්මක විය. එහිදී, අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC) විසින් නැගී එන අවදානම්, විශේෂයෙන් ස්වෛර්භාවයට අදාළ අවදානම්, ආංශික මුදල් නිධි ආශ්‍රිත අවදානම් සහ නැවත අයකරගැනීම හා සබැඳි ණය පිළිබඳ කාර්ය සාධන ප්‍රවණතා පිළිබඳව මනා අධීක්ෂණයක් සිදු කරනු ලැබීය.

උද්ධමනය

උද්ධමනය මධ්‍යස්ථ භාවයට පත්වීම, විනිමය අනුපාතික ස්ථායීතාව සහ පොලී අනුපාතික සාමාන්‍ය මට්ටමට පැමිණීම හේතුවෙන් ණය ගැතියන්ගේ ආපසු ගෙවීමේ ධාරිතාව ක්‍රමයෙන් යථා තත්ත්වයට පත් විය. එසේ වුවද, ව්‍යුහාත්මක අවදානම් සහ බාහිර අවිනිශ්චිතතා තවදුරටත් පවතින අතර, ඒ සම්බන්ධයෙන් අඛණ්ඩව සුපරීක්ෂාකාරී වීම සහ අවදානම් උපාය මාර්ග වගකීම් සහගතව ක්‍රියාවට නැංවීම අවශ්‍ය වේ. තැන්පතුකරුවන්ගේ විශ්වාසය ආරක්ෂා කිරීම, ණය ප්‍රසාරණයට සහාය වීම සහ ශ්‍රී ලංකා මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය සහ තිරසාර ප්‍රකෘතියට දායක වීම සඳහා බැංකුව කැපවී සිටී. මෑත කාලීන ආරවුල් අර්බුදය ඇසුරින් උගත් පාඩම් ඔස්සෙ ඔරොත්තු දීමේ හැකියාව, විනිවිදභාවය සහ වගවීම අපගේ මෙහෙයුම් ක්‍රියාවලිය තුළට ඇතුළත් කරමින් අපගේ අවදානම් සංස්කෘතිය තවදුරටත් ශක්තිමත් කොට ඇත.

පාරිසරික අවදානම් සහ කාලගුණික ගැටළු හේතුවෙන් ඇති වූ දේශගුණික අවදානම 2025 මූල්‍ය වර්ෂය සම්බන්ධයෙන් සැලකිය බලපෑමක් ඇති කළ සාධකයක් විය. දිට්වා සුළි කුණාටුව හේතුවෙන් රටපුරා අධික ගංවතුර තත්වයක් හටගත් අතර, කෘෂිකාර්මික ඉඩම් හානිවීම සහ කුඩා පරිමාණ වාණිජ කටයුතුවලට බාධා වීම සිදු විය. මෙම තත්ත්වය විශේෂයෙන් කෘෂි කර්මාන්තය තුළ සහ ක්ෂුද්‍ර හා කුඩා ව්‍යවසායන් තුළ වඩාත් අවදානමට ලක්විය හැකි අංශවල ණය ගැතියන්ගේ ආපසු ගෙවීමේ හැකියාව සහ වත්කම්වල ගුණාත්මක භාවය කෙරෙහි බලපෑමක් එල්ල වීමට හේතු විය. මූල්‍ය ස්ථාවරත්වය සහ දිගුකාලීන වත්කම්වල ගුණාත්මකභාවය උදෙසා දේශගුණික අවදානම් කළමනාකරණය කිරීමෙහි අවශ්‍යතාවය හඳුනා ගනිමින්, බැංකුව සමාලෝචිත වර්ෂය තුළ දී දේශගුණික අවදානම් කළමනාකරණය කිරීම සඳහා වූ තම ප්‍රවේශය අඛණ්ඩව කළමනාකරණය කළේය.

දේශගුණික අවදානම

දේශගුණික අවදානම මූලික මානයන් දෙකක් තුළින් තක්සේරු කරනු ලැබේ. එනම්, ගංවතුර සහ නියඟ වැනි ආන්තික කාලගුණික සිදුවීම්වල වාර ගණන සහ එහි බරපතලකම ඉහළ යාම හේතුවෙන් පැන නගින භෞතික අවදානම් සහ කාබන් විමෝචනය අවම කරගනු ලබන ආර්ථිකයක් උදෙසා වූ ප්‍රතිපත්ති, නියාමන, තාක්ෂණික සහ වෙළෙඳපොළ විතැන්වීම් තුළින් පැන නගින සංක්‍රාන්ති අවදානම් ය. ශ්‍රී ලංකාව විසින් කෘෂිකර්මාන්තය, සංචාරක ව්‍යාපාරය සහ වෙරළබඩ යටිතල පහසුකම් වැනි දේශගුණික සංවේදී අංශවලට මුහුණ පාන්නට සිදුවීම සැලකිල්ලට ගනිමින් බැංකුව ණය ඇගයීම, ආංශික අවදානම් තක්සේරු කිරීම් සහ ආතති පරීක්ෂණ රාමු තුළට දේශගුණික අවදානම් සලකා බැලීම් ඇතුළත් කර ඇත. බැංකු අධීක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඉදිරිපත් කරනු ලබන මාර්ගෝපදේශයන්ට අනුකූලව, බැංකුව දත්ත රැස් කිරීම, අවස්ථා විශ්ලේෂණය කිරීමේ හැකියාවන් සහ වත්කම් සහ ආයෝජනයන්ට බලපෑ හැකි මට්ටමෙහි දේශගුණික අවදානම් නිරීක්ෂණය ක්‍රමානුකූලව වැඩි දියුණු කරමින් සිටී.

දේශගුණික අවදානම පිළිබඳ ප්‍රමාණාත්මක මිනුම් ක්‍රමවේද අඛණ්ඩව විකාශනය වෙමින් පැවතියදී, බැංකුව දේශගුණික අවදානම එහි සමස්ත අවදානම් රුචිකත්ව රාමුවට ඒකාබද්ධ කිරීම හා රටේ දිගුකාලීන ආර්ථික ඔරොත්තු දීමේ හැකියාවට දායක වන වගකීවයුතු, තිරසාර මූල්‍යකරණක් නිර්මාණය කිරීම සඳහා සහාය වීමට කැපවී සිටී.

බැංකු අවදානම් කළමනාකරණ කාර්යය අරමුණු - දළ විශ්ලේෂණය

උපාය මාර්ගික අරමුණු

- මූල්‍ය ඔරොත්තුදීමේ හැකියාව ආරක්ෂා කිරීම
- අවදානම් භාර ගැනීම බැංකුවේ අවදානම් රුචිය සමඟ සමපාත කිරීම
- තිරසාර වර්ධනයට සහාය වීම.
- අවදානම්-ප්‍රතිලාභ ගතිකත්වය ප්‍රශස්ත කිරීම

පාලනය සහ අධීක්ෂණය

- අවදානම් පාලන රාමුව ශක්තිමත් කිරීම
- ස්වාධීන ඇගයීමක් සැපයීම
- ප්‍රතිපත්ති සහ සීමාවන්හි ඒකාබද්ධතාවය තහවුරු කිරීම
- අධ්‍යක්ෂ මණ්ඩලයට සහ කළමනාකාරිත්වයට විනිවිදභාවයෙන් යුත් වාර්තාකරණය පහසු කිරීම

නියාමන සහ අනුකූලතා

- නියාමන අනුකූලතාවය පවත්වා ගැනීම
- නව නියාමන වර්ධනයන් ඒකාබද්ධ කිරීම
- ඵලදායී අධීක්ෂණ සබඳතා සඳහා සහාය වීම

අවදානම් හඳුනාගැනීම

- අවදානම් පිළිබඳව පුළුල්ව හඳුනාගැනීම
- පූර්ව අනතුරු ඇඟවීමේ දර්ශක
- ඉදිරි දැක්මක් සහිත අවදානම් තක්සේරුකරණය

ණය සහ කළඹ සමූහ පිළිබඳ අවදානම

- වත්කම්වල ගුණාත්මකභාවය ආරක්ෂා කිරීම
- සංකේන්ද්‍රණ අවදානම කළමනාකරණය කිරීම
- ණය අනුමැතිය සහ අධීක්ෂණ ක්‍රියාවලීන් සවිබල ගැන්වීම
- පූර්ව අනතුරු ඇඟවීමේ දර්ශක

වෙළෙඳපොළ සහ ද්‍රවශීලතා අවදානම

- පොලී අනුපාතය, විදේශ විනිමය සහ වෙළඳ නිරාවරණයන් නිරීක්ෂණය කිරීම සහ පාලනය කිරීම
- ද්‍රවශීලතා සීමාවන් පවත්වා ගැනීම
- ආතතිය යටතේ ප්‍රාග්ධන ප්‍රමාණවත් බව ආරක්ෂා කිරීම

අවදානම් පැතිකඩ පිළිබඳ දැක්ම

2025 වසරේදී විවිධ සාධක රැසක් එකවර බලපෑම් කිරීම නිසා, පුළුල් මෙන්ම විවිධ පැතිකඩයන්ගෙන් යුත් සංකීර්ණ අවදානම් පසුබිමක් නිර්මාණය විය.

වැඩිදියුණු වූ ලාභදායීතාවය සහ තිරසාර ආදායම් වර්ධනය

2025 වසර මහජන බැංකුවට සුවිශේෂී වූයේ ඓතිහාසික ලාභාංශ සහ සුවිශේෂී ආදායම් වර්ධනයක් සනිටුහන් කරමිනි. පෙර වසරවලට සාපේක්ෂව සිය ශුද්ධ පොලී ආදායම මෙන්ම ගාස්තු ආදායම ද කැපී පෙනෙන ලෙස ඉහළ නංවාගත් බැංකුව, වාර්තාගත බදු පූර්ව ලාභයක් අත්පත් කර ගැනීමට සමත් විය. මෙම විශිෂ්ට ව්‍යාපාරික දක්ෂතාවය, බැංකුවේ පාඩු අවශෝෂණය කර ගැනීමේ ශක්තිය මෙන්ම ඉදිරි උපායමාර්ගික ඉලක්ක ජයගැනීමට අවශ්‍ය පදනම ද වඩාත් තහවුරු කරයි.

ශක්තිමත් ප්‍රාග්ධන සහ ද්‍රවශීලතා තත්ත්වය

2025 වසර පුරා මහජන බැංකුවේ නියාමන ප්‍රාග්ධන අනුපාත අවම සීමාවන් ඉක්මවා යමින් ඉතා සතුටුදායක මට්ටමක පැවති අතර, විශේෂයෙන්ම පළමු පෙළ (Tier I) සහ සමස්ත ප්‍රාග්ධන ප්‍රමාණවත්තා අනුපාත ස්ථාවර මට්ටමක පවත්වා ගැනීමට බැංකුව සමත් විය. එමෙන්ම, නියාමන අවශ්‍යතාවලට වඩා බෙහෙවින් ඉහළින් පැවති ද්‍රවශීලතා ආවරණ අනුපාතයන්, කෙටි කාලීන මූල්‍ය කම්පන හමුවේ නොසැලී සිටීමට බැංකුව සතු ශක්තිමත් ඔරොත්තු දීමේ හැකියාව මැනවින් පිළිබිඹු කරයි.

එසේ වුවද, බාහිර වෙළඳ අභියෝග ඇතුළු සාර්ව ආර්ථික ක්ෂේත්‍රයේ පවතින අවිනිශ්චිතතාවයන් හමුවේ, සුපරීක්ෂාකාරී පොලී අනුපාත අවදානම් කළමනාකරණය සහ ගතික ද්‍රවශීලතා හදිසි සැලසුම්කරණයේ (Dynamic liquidity contingency planning) ඇති අත්‍යාවශ්‍යතාවය තවදුරටත් තහවුරු විය. ඒ අනුව, අරමුදල් පිරිවැය ස්ථාවරව පවත්වා ගැනීමටත්, විභව ඉපැයීම්වල ඇති විය හැකි අස්ථාවරත්වය අවම කිරීමටත් මෙම ක්‍රියාමාර්ග කෙරෙහි මූලික අවධානයක් යොමු කෙරිණි.

මෙහෙයුම් සහ මූල්‍ය නොවන අවදානම

- මෙහෙයුම් ප්‍රත්‍යාස්ථිතිය (ඔරොත්තු දීමේ හැකියාව) ඉහළ නංවාලීම
- පාඩු සිදුවීම් අඩු කිරීම
- දත්ත පරිපූර්ණභාවය, එක්රැස් කිරීම සහ වාර්තාකරණය වැඩිදියුණු කිරීම
- ව්‍යාපාරයෙහි අඛණ්ඩතාව සහතික කිරීම

තාක්ෂණය සහ සයිබර් ආරක්ෂාව

- තොරතුරු තාක්ෂණ පාලනය වැඩිදියුණු කිරීම
- ඩිජිටල් යටිතල පහසුකම් ආරක්ෂා කිරීම
- සයිබර් පහසුකම ලබා ගැනීමේ හැකියාව සහ එහි විශ්වසනීය බව සහතික කිරීම

අවදානම පිළිබඳ සංස්කෘතිය සහ චර්යාව

- ශක්තිමත් අවදානම් සංස්කෘතියක් පවත්වා ගැනීම
- පළමු සහ දෙවන පෙළ වගකීම් පැහැදිලි කිරීම
- අවදානම් පිළිබඳ දැනුවත්භාවය සහ පුහුණුව ප්‍රවර්ධනය කිරීම

කාළගුණය සහ නැගී එන අවදානම්

- දේශගුණික විපර්යාස සහ සංක්‍රාන්ති අවදානම එකට යා කරගැනීම
- සාර්ව ආර්ථික, භූ දේශපාලනික සහ ආංශික අවදානම් නිරීක්ෂණය කිරීම
- නැගී එන තර්ජන වලට අනුවර්තන ප්‍රතිචාර දැක්වීමට හැකියාව ඇති කිරීම

කීර්තිනාමය පිළිබඳ අවදානම

- මහජනයාගේ සහ කොටස්කරුවන්ගේ වටහාගැනීම කළමනාකරණය කිරීම
- සන්නාමයෙහි කීර්තිය සහ පාරිභෝගික විශ්වාසය රැක ගැනීම.

ණය අවදානම

බැංකුව කෙරෙහි ඇති වන බලපෑම

ණය අවදානම යනු ණය ලබාදීමේ ක්‍රියාවලිය හරහා පැන නගින ප්‍රධානතම අවදානම වන අතර, දිවයින පුරා විහිදුණු අපගේ සුවිශාල ක්‍රියාකාරිත්වය හේතුවෙන් එය තීරණාත්මක සාධකයක් බවට පත්ව ඇත. බැංකුවේ සමස්ත වත්කම්වලින් 46.7%ක් සහ අවදානම් බර තැබූ වත්කම්වලින් 42.7%ක්ම නියෝජනය කරන්නේ අපගේ මෙම ණය කළඹයි.

බැංකුව විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග

- ණය තීරණ ගැනීමේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා, බැංකුව විසින් කලාපීය සහකාර සාමාන්‍යාධිකාරිවරුන් (Zonal AGMs) වෙත නිශ්චිත ණය අනුමත කිරීමේ බලතල පවරන ලදී. මෙම බලතල පැවරීම හරහා ණය යෝජනා කඩිනමින් තක්සේරු කිරීමට සහ අනුමත කිරීමට පහසුකම් සැලසෙන අතරම, ස්ථාපිත අධීක්ෂණ සහ නිරීක්ෂණ යාන්ත්‍රණ මඟින් ක්‍රියාවලියේ අබණ්ඩ විනිවිදභාවය සහතික කෙරේ.
- වාණිජ නොවන ආයතන වෙනුවෙන් නව අවදානම් ශ්‍රේණිගත කිරීමේ පත්‍රිකාවක් (Risk rating sheet) හඳුන්වා දෙන ලදී. රජයට සම්බන්ධ ආයතන සහ අනෙකුත් වාණිජ නොවන ණය ගැතියන්ගේ ණය ආපසු ගෙවීමේ හැකියාව ප්‍රමිතිගත ලෙස තක්සේරු කිරීමට මෙමඟින් අවස්ථාව සැලසේ. මෙය දැනුවත් ණය තීරණ ගැනීමට මෙන්ම සමස්ත කළඹ පුරා ස්ථාවර අවදානම් වර්ගීකරණයක් පවත්වා ගැනීමටද මහෝපකාරී වේ.
- ණය ගැණුම්කරුවන්ගේ ලාභදායීතාවය සහ මූල්‍ය ක්‍රියාකාරිත්වය වඩාත් නිවැරදිව ඇගයීම සඳහා, "වත්කම් මත ප්‍රතිලාභ" (ROA) ගණනය කිරීමේ වැඩිදියුණු කළ ක්‍රමවේදයක් බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලදී. මෙම මෙවලම, ශක්තිමත් ප්‍රමාණාත්මක විශ්ලේෂණයන් සහ අවදානම් ගැලපුම් කළ කාර්ය සාධන දර්ශක (Risk-adjusted performance metrics) හරහා ණය තීරණ ගැනීමේ ක්‍රියාවලිය තවදුරටත් සවිබල ගන්වයි.
- විභව ණය දුර්වලතා පෙන්නුම් කරන ණය ගැණුම්කරුවන් සඳහා ව්‍යුහගත නිරීක්ෂණ සහ වාර්තාකරණ පද්ධතියක් ඇතුළත් කරමින්, "සමීප නිරීක්ෂණ ලැයිස්තුගත කිරීමේ" (Watch listing) ක්‍රියාවලිය තවදුරටත් නවීකරණය කරන ලදී. මෙම නවීකරණය කළ ක්‍රියාවලිය මඟින් අවදානම් නිරාවරණයන් කල්තියා කළමනාකරණය කිරීමටත්, මූල්‍ය පීඩනයන් කලින් හඳුනාගෙන කාලෝචිත පිළියම් යෙදීමටත් අවස්ථාව සැලසේ.
- බැංකුවේ අවදානම් දරාගැනීමේ හැකියාව (Risk appetite) සහ නියාමන මාර්ගෝපදේශයන්ට අනුකූල වන පරිදි, විවිධ කර්මාන්ත ක්ෂේත්‍ර සහ තනි ණය ගැණුම්කරුවන් සඳහා වන ණය සීමාවන් (Credit limits) යාවත්කාලීන කරන ලදී. මෙම සීමාවන් මඟින් ණය කළඹ විවිධාංගීකරණය කිරීම ප්‍රවර්ධනය කරන අතර, ඇතැම් ක්ෂේත්‍රයන්හි අවදානම් කේන්ද්‍රගත වීම (Concentration risk) අවම කිරීමට ද උපකාරී වේ.
- තිරසාර මූල්‍ය කළමනාකරණය සහ පෞද්ගලික අංශයට ණය ලබාදීම පුළුල් කිරීමේ උපාය මාර්ගයකට අනුකූලව, 2025 වසර තුළ රාජ්‍ය ව්‍යවසායන් (SOEs) සඳහා වන නිරාවරණය තවදුරටත් අවම කිරීමට බැංකුව පියවර ගත්තේය. මෙහිදී විචක්ෂණශීලී අවදානම් කළමනාකරණය සහ ජාතියේ සමස්ත මූල්‍ය නැවත නගා සිටුවීමේ හැකියාව ඉහළ නැංවීම සඳහා බැංකුවේ ඇති කැපවීම මැනවින් ප්‍රදර්ශනය විය. දැනටමත් හඳුන්වා දී ඇති තනි ණය ගැතියෙකු සඳහා වන නියාමන සීමාවන් (Single borrower limits) සහ රාජ්‍ය ව්‍යවසායන් සඳහා වන දැඩි ණය සීමාවන් හේතුවෙන්, බැංකුව ලාභදායී සහ තිරසාර ව්‍යාපාරයක් ලෙස පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය නියාමන පසුබිම වඩාත් ශක්තිමත් වී ඇත.
- බැංකුවේ අවදානම් කළමනාකරණ ක්‍රියාවලියේදී අබණ්ඩ ණය අධීක්ෂණය සහ වාරික සමාලෝචන ක්‍රමවේදයන් ප්‍රමුඛත්වය ගනී. එහිදී, නැගී එන අවදානම් කල්තියා හඳුනා ගැනීමටත්, අභ්‍යන්තර ප්‍රතිපත්ති මෙන්ම නියාමන ප්‍රමිතීන්ට අනුකූල වීම සහතික කිරීමටත් ණය නිලධාරීන් මෙන්ම අවදානම් කළමනාකරණ සහ ණය පාලන දෙපාර්තමේන්තුව සක්‍රීයව කටයුතු කරනු ලැබේ.

මෙහෙයුම් අවදානම

බැංකුව කෙරෙහි ඇති වන බලපෑම

දිවයින පුරා විහිදුණු සුවිශාල ශාඛා ජාලය, පුළුල් පාරිභෝගික පදනම සහ සේවක ව්‍යාප්තිය හේතුවෙන් බැංකුව මෙහෙයුම් අවදානම් (Operational risk) තත්ත්වයන්ට නිරාවරණය වීමේ වැඩි ඉඩකඩක් පවතී. එවැනි බාධාවන් කාර්යක්ෂමව, කාලෝචිතව සහ සියලුම පාර්ශ්වකරුවන්ට අවම බලපෑමක් වන පරිදි කළමනාකරණය නොකළහොත්, බැංකුව කෙරෙහි පවතින විශ්වාසය දැඩි ලෙස පළුදු වීමටත්, සැලකිය යුතු මූල්‍ය අලාභයක් සිදු වීමටත් එය හේතු විය හැකිය.

බැංකුව විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග

- මෙහෙයුම් අවදානම් කළමනාකරණ රාමුව ශක්තිමත් කිරීමේ පියවරක් ලෙස, බැංකුව පුරා ක්‍රියාත්මක වන ව්‍යුහගත සිදුවීම් වාර්තා කිරීමේ සහ සමාලෝචනය කිරීමේ ක්‍රමවේදයක් 2025 වසරේදී හඳුන්වා දෙන ලදී. මෙමඟින් සිදුවීම් වාර්තා කිරීම සහ විශ්ලේෂණය විධිමත් වූ අතර, ඒ හරහා ආයතනික වගවීම සහ අධීක්ෂණ කටයුතු තවදුරටත් පුළුල් විය. එමෙන්ම, පවතින අවදානම් අවම කිරීමේ පියවරවල සඵලතාවය ඇගයීමට ලක් කරන මෙම ක්‍රියාවලිය, බැංකුවේ මෙහෙයුම් ඔරොත්තුදීමේ හැකියාවඉහළ නැංවීමට අවශ්‍ය ඉදිරි උපාය මාර්ග සඳහා ද මඟ පෙන්වයි.
- ශක්තිමත් අවදානම් සංස්කෘතියක් (Risk culture) ගොඩනැගීම සහ මෙහෙයුම් අවදානම් පිළිබඳ දැනුවත්භාවය ඉහළ නැංවීම වෙනුවෙන් 2025 වසරේදී නවක සේවකයින් සඳහා ව්‍යුහගත පුහුණු වැඩසටහන් මාලාවක් පවත්වන ලදී. මෙහිදී අභ්‍යන්තර පාලන විධිවිධාන සහ නියාමන අවශ්‍යතාවලට අනුකූල වීමේ වැදගත්කම අවධාරණය කෙරිණි.
- ප්‍රාදේශීය අවදානම් නිලධාරීන්ගේ (RROs) කුසලතා සහ නිපුණතා වර්ධනය කිරීම අරමුණු කරගනිමින් සාර්ථක නේවාසික පුහුණු වැඩසටහනක් සංවිධානය කරන ලදී. නියාමන අපේක්ෂාවන්ට අනුකූලව නැඟී එන අවදානම් අභියෝගවලට මුහුණ දීමට සහ බැංකුවේ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුවට අනුකූලව සිය රාජකාරී ඵලදායී ලෙස ඉටු කිරීමට අවශ්‍ය පසුබිම මෙහිදී සකස් කෙරිණි.
- ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුව (IRMF) යටතේ, 2025 වසරේදී මෙහෙයුම් අවදානම් කළමනාකරණය සඳහා ඉහළ ප්‍රමුඛතාවයක් ලබා දෙන ලදී. බැංකුවේ පුළුල් ශාඛා ජාලය, විවිධ පාරිභෝගික පදනම සහ දිවයින පුරා විහිදුණු සේවක සංයුතිය හේතුවෙන් මෙහෙයුම් අවදානම්වලට නිරාවරණය වීමේ වැඩි ඉඩකඩක් පැවතීම මෙයට හේතුවයි. මෙය සාර්ථකව පාලනය කිරීම සඳහා, සියලුම ව්‍යාපාරික සහ මෙහෙයුම් ඒකක වෙත ව්‍යුහගත ලෙස වගකීම් බෙදා හරිමින් මෙහෙයුම් අවදානම් පාලනය තවදුරටත් ශක්තිමත් කෙරිණි. හඳුනාගත් විශේෂිත අවදානම් සිදුවීම් (Trigger events), IRMF ප්‍රොටෝකෝලයන්ට අනුකූලව ක්‍රමානුකූලව වාර්තා කිරීම (Escalated) මඟින් ඒවා කාලෝචිත ලෙස නිරීක්ෂණය කිරීමට සහ විසඳීමට මඟ පෑදුණි. එමෙන්ම, විනිවිදභාවය සහ වගවීම තහවුරු කරමින් බාධා අවම කිරීමටත්, පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය ආරක්ෂා කිරීමටත් වැඩිදියුණු කළ ලුහුබැඳීමේ යාන්ත්‍රණ සහ තොරතුරු හෙළිදරව් කිරීම් පවත්වාගෙන යන ලදී.
- සමස්ත ශාඛා ජාලය තුළ අවදානම් පිළිබඳ දැනුවත්භාවය සහ අනුකූලිත පාලන සංස්කෘතියක් ගොඩනැංවීම සඳහා ප්‍රාදේශීය අවදානම් නිලධාරී (RRO) ජාලය සක්‍රීයව උපයෝගී කර ගන්නා ලදී. එමඟින් මෙහෙයුම් බාධාවන් අවම කරමින් ක්‍රියාශීලී අවදානම් කළමනාකරණයක් පවත්වා ගැනීමට හැකි විය.
- පාරිභෝගික පැමිණිලි ඩිජිටල්කරණය කිරීමේ ක්‍රියාවලිය තවදුරටත් සවිබල ගැන්වූ අතර, ඒ හරහා තත් කාලීන (Real-time) නිරීක්ෂණ හැකියාවන් ඉහළ නැංවිණි. මෙය පැමිණිලි කඩිනමින් විසඳීමට සහ සේවා සැපයීමේදී ස්ථාවර භාවයක් පවත්වා ගැනීමට ඉවහල් විය.
- දෙපාර්තමේන්තු මට්ටමින් අවදානම් හඳුනාගැනීමේ හැකියාව (Risk visibility), පාලන විධිවිධානවල සඵලතාවය සහ වගවීම ඉහළ නැංවීම සඳහා "අවදානම් සහ පාලන ස්වයං ඇගයීමේ" (RCSA) ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කරන ලදී.
- බැංකුවේ අවදානම් කළමනාකරණ රාමුවට අනුකූල වන පරිදි, මෙහෙයුම් අවදානම් ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි වාර්ෂික වශයෙන් සමාලෝචනය කිරීම සහ යාවත්කාලීන කිරීම අඛණ්ඩව සිදු කෙරිණි.

වෙළෙඳපොල අවදානම

බැංකුව කෙරෙහි ඇති වන බලපෑම

පොලී අනුපාත, විදේශ විනිමය අනුපාත සහ වෙළඳපොළ මිල ගණන්හි ඇති වන අහිතකර වෙනස්වීම් හේතුවෙන් උද්ගත වන "වෙළඳපොළ අවදානමට" (Market risk) බැංකුව තවදුරටත් නිරාවරණය වී පවතී. විශේෂයෙන්ම යථා තත්ත්වයට පත්වෙමින් පවතින දේශීය ආර්ථිකය සහ වර්ධනය වන ගෝලීය අවිනිශ්චිතතාවය හමුවේ මෙම තත්ත්වය තීරණාත්මක වේ. වසර තුළ ශ්‍රී ලංකාව සාපේක්ෂව ස්ථාවර නමුත් පරිණාමය වෙමින් පවතින මූල්‍ය තත්ත්වයන් අත්විඳි අතර, පොලී අනුපාත ස්ථාවර වීම සහ ද්‍රවශීලතාවය වර්ධනය වීම ද දක්නට ලැබුණි. ඒ අතරම, ආනයන ඉල්ලුම සහ බාහිර අංශයේ ගතිකත්වයන් (External sector dynamics) හේතුවෙන් විනිමය අනුපාතය වරින් වර අස්ථාවරත්වයට පත් වුවද, සමස්තයක් ලෙස මධ්‍යස්ථ අගයකින් ක්ෂය වීමක් (Modest depreciation) වාර්තා කළේය.

බැංකුව විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග

සමස්ත වෙළඳපොළ අවදානම් පසුබිම හැඩගැස්වීමෙහිලා අන්තර්-සම්බන්ධිත සාධක කිහිපයක ඒකාබද්ධ බලපෑම හේතු විය.

- ණය කේන්ද්‍රගත වීමේ මිනුම් ඉහළ නැංවීම
  - භූගෝලීය කේන්ද්‍රගත වීමේ අවදානම ඇතුළත් වන පරිදි හර්ෆින්ඩල්-හර්ෂ්මන් දර්ශක (HHI) රාමුව පුළුල් කළ අතර, එමඟින් විවිධ ප්‍රදේශ හරහා කළඹ විවිධාංගීකරණය පිළිබඳ වඩාත් සූක්ෂම තක්සේරුවක් කිරීමට අවස්ථාව සැලසුණි.
- දේශගුණික අවදානම ICAAP ක්‍රියාවලියට ඒකාබද්ධ කිරීම
  - ප්‍රාග්ධන ප්‍රමාණවත්තාවයට සහ වත්කම්වල ගුණාත්මකභාවයට බලපෑම් කළ හැකි භෞතික (Physical) සහ සංක්‍රාන්ති (Transition) අවදානම් හඳුනාගනිමින්, දේශගුණික අවදානම ICAAP රාමුවේ "II වන කුළුණ" (Pillar II) යටතට ඇතුළත් කරන ලදී. මෙමඟින් දේශගුණික විපර්යාසයන්ට අදාළ අවදානම් නිරාවරණයන් වඩාත් නිවැරදිව මැනීමට අවස්ථාව සැලසෙන අතර, නැගී එන තිරසාර අවදානම් සක්‍රීයව කළමනාකරණය කිරීමට සහ දිගුකාලීන මූල්‍ය ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීමට බැංකුව දක්වන කැපවීම මින් පිළිබිඹු වේ.
  - දේශගුණික විපර්යාසයන්ට අදාළ "භෞතික" සහ "සංක්‍රාන්ත" අවදානම් මඟින් බැංකුවේ අවදානම් පැතිකඩට ඇති විය හැකි බලපෑම ඇගයීම සඳහා ආතති පරීක්ෂණ ක්‍රමවේදයන් සකස් කරන ලදී.
  - සක්‍රීය අවදානම් කළමනාකරණයට සහාය වීම සඳහා විදේශ විනිමය නිරාවරණයන්හි "තත් කාලීන නිරීක්ෂණ හැකියාව" තවදුරටත් වර්ධනය කරන ලදී.
  - බැංකුවේ අවදානම් කළමනාකරණ රාමුවට අනුකූල වන පරිදි, වෙළඳපොළ අවදානමට අදාළ ප්‍රතිපත්ති සහ යොමු නියමයන් (Terms of Reference) අඛණ්ඩව සමාලෝචනය කර යාවත්කාලීන කෙරිණි.
  - බැංකුවේ අවදානම් රුචිකත්වය (Risk appetite), වෙළඳපොළ තත්ත්වයන් සහ නියාමන අපේක්ෂාවන්ට අනුකූල වන පරිදි අවදානම් සීමාවන් යළි සමාලෝචනය කර යාවත්කාලීන කිරීමට පියවර ගන්නා ලදී.
- භාණ්ඩ මිල අවදානම් තක්සේරු ක්‍රමය හඳුන්වාදීම
  - රන් මිලෙහි අස්ථාවරත්වය ප්‍රධාන වෙළඳපොළ අවදානම් සාධකයක් ලෙස හඳුනාගනිමින්, උකස් කළඹ ආශ්‍රිතව පැන නගින භාණ්ඩ අවදානම තක්සේරු කිරීමේ ක්‍රියාවලිය විධිමත් කරන ලදී.
- විශේෂිත ක්ෂේත්‍රයන් සඳහා ආතති පරීක්ෂණ
  - අවදානමට ලක්විය හැකි පහත සඳහන් ක්ෂේත්‍රයන් ඉලක්ක කරගනිමින් ආතති පරීක්ෂණ පවත්වන ලදී
    - ඉදිකිරීම් සහ ඉංජිනේරු ක්ෂේත්‍රය
    - හෝටල්, සංචාරක සහ විනෝද කටයුතු
    - නිෂ්පාදන ක්ෂේත්‍රය
  - මෙහිදී විභව ණය සහ වෙළඳපොළ අවදානම් බලපෑම් ඇගයීම සඳහා සාර්ව ආර්ථික තත්ත්වයන් මෙන්ම බැංකුවට ආවේණික අවදානම් සාධක ද සැලකිල්ලට ගන්නා ලදී.
- වත්කම් සහ වගකීම් අවදානම් විශ්ලේෂණය වැඩිදියුණු කිරීම
  - පහත සඳහන් අංශ පිළිබඳ සවිස්තරාත්මක විශ්ලේෂණයක් මඟින් වත්කම් සහ වගකීම් කළමනාකරණය තවදුරටත් ශක්තිමත් කරන ලදී
    - පරිණතීන් හි කාලීන නොගැලපීම් (Maturity mismatches – MAL)
    - සංවේදීතා පරතරයන් (Sensitivity gaps – SAL)
    - චර්යාත්මක උපකල්පන (Behavioural assumptions)

උකස් මෙහෙයුම් ආශ්‍රිත වෙළඳපොළ අවදානම

බැංකුව සෘජුවම භාණ්ඩ වෙළඳාමේ (Commodity trading) නිරත නොවන බැවින්, වෙළඳ භාණ්ඩ මිලෙහි සිදුවන වෙනස්වීම් බැංකුවට බලපාන්නේ එහි උකස් මෙහෙයුම් හරහා වක්‍රව පමණි. රන් මිලෙහි සිදුවන උච්චාවචනයන් කෙරෙහි උකස් මෙහෙයුම් සංවේදී වන බැවින්, රන් වෙළඳපොළේ අස්ථාවරත්වය බැංකුවේ අවදානම් පැතිකඩ සහ උකස් කළඹේ ක්‍රියාකාරිත්වය කෙරෙහි සෘජු බලපෑමක් ඇති කරයි.

උකස් මෙහෙයුම් ආශ්‍රිත වෙළඳපොළ අවදානම් අවම කිරීම සඳහා, බැංකුව තරඟකරුවන්ට සාපේක්ෂව අඩු අගයකින් යුත් රන් පවුමකට අදාළ උකස් අත්තිකාරම් මුදලක් (Advance per sovereign) පවත්වාගෙන යයි. එමෙන්ම, ණය-වටිනාකම (LTV) අනුපාතය 70% ට වඩා අඩු මට්ටමක පවත්වා ගනිමින්, ඇපයට තැබූ භාණ්ඩවල රන් අන්තර්ගතය පිළිබඳ දැඩි අවධානයක් යොමු කරන අතරම විචක්ෂණශීලී ණය අගයන් (Prudent loan values) පවත්වා ගැනීමට ද කටයුතු කරයි. බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද වැඩිදියුණු කළ "ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි විමර්ශනය" (Customer Due Diligence) මෙන්ම සොරකම් කරන ලද හෝ ව්‍යාජ භාණ්ඩ සඳහා වන පුළුල් රක්ෂණ ආවරණය ද මෙහිදී වැදගත් වේ. ණය මුදල් නිකුත් කිරීමෙන් පසුව ද භාණ්ඩ වටිනාකම ස්වාධීනව තක්සේරු කිරීම, දිනපතා තෝරාගත් නියැදි සත්‍යාපනය කිරීම සහ ණය ආපසු අයකර ගත නොහැකි අවස්ථාවලදී මුදවා නොගත් භාණ්ඩ වෙන්දේසි කිරීමේ ක්‍රියාවලිය බැංකුව අඛණ්ඩව සිදු කරයි.

තාක්ෂණික සහ සයිබර් ආරක්ෂණ අවදානම

බැංකුව කෙරෙහි ඇති වන බලපෑම

ශ්‍රී ලංකාව තුළ මෙන්ම ගෝලීය වශයෙන් ද මූල්‍ය සේවාවන් වේගයෙන් ඩිජිටල්කරණය වීම හමුවේ, තාක්ෂණික සහ සයිබර් ආරක්ෂණ අවදානම්වලට බැංකුව නිරාවරණය වීමේ වැඩි ප්‍රවණතාවක් පවතී. මාර්ගගත බැංකු පද්ධති, ඩිජිටල් ගෙවීම් සහ අන්තර්-සම්බන්ධිත පද්ධති මත යැපීම ඉහළ යාම හේතුවෙන් සයිබර් තර්ජන, දත්ත අවභාවිතය (Data breaches) සහ සේවා බාධාවන් ඇති වීමේ අවදානම තවදුරටත් ඉහළ යයි. මේවා පාරිභෝගික විශ්වාසයට, බැංකුවේ මෙහෙයුම් අඛණ්ඩතාවයට මෙන්ම මූල්‍ය ක්‍රියාකාරිත්වයට ද සෘජුව බලපෑ හැකිය. මීට අමතරව, නිරන්තරයෙන් වෙනස් වන නියාමන අපේක්ෂාවන් සහ ගෝලීය වශයෙන් සංකීර්ණ සයිබර් ප්‍රහාර ඉහළ යාම මෙම අවදානම් පසුබිම තවදුරටත් තීව්‍ර කරයි.

බැංකුව විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග

2025 වසරේදී ඩිජිටල් සේවා සඳහා පාරිභෝගිකයින් එක්කර ගැනීම (Digital onboarding) සහ ජංගම බැංකුකරණ භාවිතය අඛණ්ඩව වර්ධනය වූ අතර, එම පුළුල් වූ ඩිජිටල් මෙහෙයුම් සඳහා සහාය වීමටත්, සේවා බාධාවන් හෝ සයිබර් තර්ජනවලින් ආරක්ෂා වීමටත් ශක්තිමත් තොරතුරු තාක්ෂණ පද්ධති, සයිබර් ආරක්ෂණ පාලන විධිවිධාන සහ මෙහෙයුම් අවදානම් රාමු බැංකුව විසින් තහවුරු කරන ලදී.

ආරක්ෂිත මෙහෙයුම් පවත්වා ගනිමින් කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ උපාය මාර්ගයට අනුකූලව, ඩිජිටල් යටිතල පහසුකම් සහ ක්‍රියාවලි වැඩිදියුණු කිරීම සඳහා වූ ආයෝජනයන් 2025 වසරේදී ද අඛණ්ඩව සිදු කෙරිණි. මහා පරිමාණ ඩිජිටල් භාවිතය හා බැඳුණු මෙහෙයුම් අවදානම් (Operational risks) අවම කිරීම සඳහා මෙම ශක්තිමත් කළ පාලන පද්ධතීන් මහෝපකාරී විය

දේශගුණික අවදානම

බැංකුව කෙරෙහි ඇති වන බලපෑම

ශ්‍රී ලංකාව දරුණු දේශගුණික විපර්යාසයන්ට මුහුණ දීමේ අවදානම සහ ලොව පුරා වර්ධනය වන තිරසාර ප්‍රමිතීන් හමුවේ, බැංකුව "භෞතික" (Physical) සහ "සංක්‍රාන්ත" (Transition) යන දේශගුණික අවදානම්වලට නිරාවරණය වීමේ වැඩි ප්‍රවණතාවක් පවතී. නිරන්තරයෙන් සිදුවන ගංවතුර සහ නියඟය වැනි පාරිසරික බාධාවන් හේතුවෙන්, විශේෂයෙන්ම කෘෂිකාර්මික, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය (SME) සහ ප්‍රාදේශීය ණය කළඹයන්හි ණය ආපසු අයකර ගැනීමේ හැකියාව අඩාල වීමටත්, ඇප වත්කම්වල අගය පහත වැටීමටත් ඉඩකඩ ඇත. එමෙන්ම, නියාමන ප්‍රතිපත්ති සහ තිරසාර මූල්‍ය ක්‍රමවේද හරහා අඩු කාබන් ආර්ථිකයක් කරා යොමු වීමට දේශීය හා ගෝලීය වශයෙන් සිදුවන පරිවර්තනයන්, බැංකුවේ වත්කම්වල ගුණාත්මකභාවය මෙන්ම ක්ෂේත්‍රීය ණය නිකුත් කිරීම් හා අරමුදල් ප්‍රවේශයන් කෙරෙහි ද සෘජුව බලපෑ හැකිය.

බැංකුව විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග

2025 වසරේදී ද දේශගුණික අවදානම සිය ව්‍යවසාය අවදානම් රාමුවේ (Enterprise risk framework) තීරණාත්මක සාධකයක් ලෙස බැංකුව පිළිගත්තේය. දේශගුණික අස්ථාවරත්වය හේතුවෙන් ණය ගැණුම්කරුවන්ගේ ආදායම් මාර්ග සහ ඇප වත්කම්වල වටිනාකම සෘජුවම වෙනස් විය හැකි බැවින්, එය ඔවුන්ගේ ණය පියවීමේ හැකියාව කෙරෙහි මෙන්ම බැංකුවේ වත්කම්වල ගුණාත්මකභාවය කෙරෙහි ද බලපෑම් කළ හැකි බව හඳුනා ගන්නා ලදී. ණය ඇගයීම් සහ අධීක්ෂණ ක්‍රියාවලියට දේශගුණික අවදානම් සාධක ඒකාබද්ධ කිරීම හරහා, නැගී එන දේශගුණික පීඩනයන් හමුවේ අවදානමට ලක්විය හැකි නිරාවරණයන් කල්තියා තක්සේරු කිරීමට බැංකුවට අවස්ථාව සැලසුණි. මේ අනුව, බැංකුව සිය අවදානම් කළමනාකරණ ක්‍රියාවලීන්ට දැනටමත් ඇතුළත් කර ඇති තිරසාර මූල්‍ය මූලධර්ම සහ දේශගුණික අවදානම් පාලන පිළිවෙත් අඛණ්ඩව අනුගමනය කළේය.

ඒ අනුව, ලකුණු පුවරු පදනම් කරගත් (Scorecard-based) දේශගුණික අවදානම් තක්සේරු ක්‍රමවේදයක් හරහා, දේශගුණයට අදාළ නිරාවරණයන් හඳුනාගැනීම සහ මැනීම සඳහා වූ ක්‍රමවේදයන් ණය කළඹ අධීක්ෂණ ක්‍රියාවලියට ක්‍රමානුකූලව ඇතුළත් කරන ලදී. මෙම ක්‍රමවේදය මඟින් භෞතික (Physical) සහ සංක්‍රාන්ති (Transition) අවදානම් යන දෙකම සැලකිල්ලට ගනිමින්, අංශ-විශේෂිත දේශගුණික සංවේදීතාව (Sectoral climate sensitivity) මත පදනම්ව ණය කළඹ ඇගයීමට ලක් කරයි. මෙම දේශගුණික අවදානම් තක්සේරු ප්‍රතිඵල බැංකුවේ ICAAP සහ ආතති පරීක්ෂණ (Stress testing) පද්ධතීන් සමඟ ඒකාබද්ධ කර ඇති අතර, එමඟින් අවදානම් හඳුනාගැනීමටත් කාලෝචිත ලෙස ඒවා අවම කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමටත් බැංකුව සතු හැකියාව තවදුරටත් ශක්තිමත් විය.

වසර තුළ දේශගුණික අවදානම් නිරාවරණයන් (Climate-related exposures) අවම කිරීම සඳහා, බැංකුවේ ණය සහ අවදානම් කළමනාකරණ රාමුවට දැනටමත් ඇතුළත් කර ඇති තිරසාර මූල්‍ය මූලධර්ම සහ දේශගුණික අවදානම් කළමනාකරණ පිළිවෙත් අඛණ්ඩව අනුග මනය කරන ලදී. සමස්තයක් ලෙස මෙම ක්‍රියාමාර්ග මඟින් බැංකුවේ මූල්‍ය ඔරොත්තුදීමේ හැකියාව (Financial resilience) ශක්තිමත් වන අතර, පීඩනකාරී තත්ත්වයන් යටතේ වුවද ස්ථාවරත්වය පවත්වා ගැනීමටත්, දිගුකාලීන තිරසාරභාවය සහ නියාමන අපේක්ෂාවන් (Regulatory expectations) සමඟ අනුකූල වීමටත් බැංකුවට අවස්ථාව සැලසේ.

පාරිසරික, සමාජීය සහ පාලන අවදානම

බැංකුව කෙරෙහි ඇති වන බලපෑම

ESG (පාරිසරික, සමාජීය සහ පාලන) තොරතුරු හෙළිදරව් කිරීමේ අවශ්‍යතාව පුළුල් වීමත් සමඟ වාර්තාකරණ ක්‍රියාවලිය ද වඩාත් විස්තරාත්මක විය. එමෙන්ම, හරිත මූල්‍යකරණය (Green finance) සහ ප්‍රමුඛතා ක්ෂේත්‍ර සඳහා අරමුදල් ලබා දීම කෙරෙහි අවධානය යොමු කිරීම නිසා, ප්‍රාග්ධනය වෙන් කරන ආකාරය ද වෙනස් කිරීමට සිදු විය. මීට අමතරව, බැංකුවේ දිගුකාලීන උපායමාර්ගික සැලසුම්කරණය සඳහා ESG අවදානම් සාධක ද දැන් ඒකාබද්ධ කර ඇත.

බැංකුව විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග

දිගුකාලීන මූල්‍ය ක්‍රියාකාරිත්වය, කීර්තිනාමය සහ නියාමන අනුකූලතාවය කෙරෙහි පාරිසරික, සමාජීය සහ පාලන (ESG) අවදානම්වල බලපෑම හඳුනාගනිමින්, ඒවා කළමනාකරණය කිරීම සඳහා වූ විශේෂිත රාමුවක් බැංකුව විසින් ආරම්භ කරන ලදී.

මෙම ESG අවදානම් බැංකුවේ සමස්ත අවදානම් කළමනාකරණ ව්‍යුහය (Risk architecture) තුළට ඇතුළත් කර ඇති අතර, ණය, මෙහෙයුම්, අනුකූලතාවය සහ කීර්තිනාම අවදානම යන ප්‍රධාන අංශ යටතේ ඒවා තක්සේරු කෙරේ. මෙහිදී ණය ලබාදීමේදී පාරිසරික හා සමාජීය අවදානම් පරීක්ෂාව (Screening), ක්ෂේත්‍රීය කේන්ද්‍රගත වීම් නිරීක්ෂණය සහ ඉහළ අවදානම් සහිත කර්මාන්ත පිළිබඳව වැඩිදියුණු කළ නිසි විමර්ශනයන් (Enhanced due diligence) කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන ලදී.

ආයතනික පාලන දෘෂ්ටිකෝණයකින් බලන කල, ESG අධීක්ෂණ කටයුතු "මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව" හරහා ක්‍රියාත්මක වන අතර, උපායමාර්ගික තීරණ ගැනීමේදී වගවීම සහතික කිරීම සඳහා විවිධ කළමනාකරණ කමිටුවල සහාය ද ඒ සඳහා ලැබේ. වසර තුළ හඳුන්වා දුන් ESG පිළිබඳ අභ්‍යන්තර ප්‍රතිපත්තිය මඟින් වගකිවයුතු මූල්‍යකරණය (Responsible financing) තවදුරටත් ශක්තිමත් වූ අතර, දේශගුණික සහ තිරසාරභාවය පිළිබඳ සාධක බැංකුවේ ආතති පරීක්ෂණ (Stress testing) රාමුවලට ක්‍රමානුකූලව ඇතුළත් කිරීමට ද පියවර ගැනුණි. ශ්‍රී ලංකාවේ ආර්ථික පුනර්ජීවනය හමුවේ, තිරසාර ක්ෂේත්‍රයන්ට සහාය වෙමින් සහ විනයගරුක ESG අවදානම් කළමනාකරණය හරහා පාර්ශ්වකරුවන්ගේ දිගුකාලීන වටිනාකම සුරකිමින් වර්ධනය කරා යාමට බැංකුව කැපවී සිටී.

ESG අවදානම් සම්බන්ධයෙන් බැංකුව පහත සඳහන් ප්‍රධාන අංශ කෙරෙහි අවධානය යොමු කරයි.

පාරිසරික	සමාජයීය	පාලන
• දේශගුණික විපර්යාස සහ කාබන් විමෝචනය • බලශක්ති කාර්යක්ෂමතාව සහ පුනර්ජනනීය බලශක්ති භාවිතය • අපද්‍රව්‍ය කළමනාකරණය සහ දූෂණ පාලනය • ජල පරිභෝජනය සහ ජෛව විවිධත්ව සංරක්ෂණය • දේශගුණික සංක්‍රාන්ති සහ භෞතික අවදානම්වලට ඇති නිරාවරණය • හරිත ණයකරණය සහ තිරසාර මූල්‍යකරණය • දේශගුණික අවදානම් ආතති පරීක්ෂණ කළඹෙහි කාබන් පියසටහන මැනීම • ක්ෂේත්‍රීය නිරාවරණ සීමාවන්	• සේවක සුභසාධනය සහ විවිධත්වය • මූල්‍ය ඇතුළත් කිරීම් • පාරිභෝගික ආරක්ෂණය සහ සාධාරණ සැලකිල්ල • දත්ත පෞද්ගලිකත්වය සහ සයිබර් ආරක්ෂණය • ප්‍රජා ආයෝජන • මානව හිමිකම් අනුකූලතාවය • වගකීම්සහගත ණය ලබාදීමේ පිළිවෙත් • සුළු හා මධ්‍ය පරිමාණ සහ ක්ෂුද්‍ර මූල්‍ය ප්‍රවේශය • පාරිභෝගික පැමිණිලි කළමනාකරණය • සාධාරණ මිලකරණය සහ විනිවිදභාවය • අධික ණය බරින් පීඩාවට පත්වීම වැළැක්වීම්	• අධ්‍යක්ෂ මණ්ඩල ව්‍යුහය සහ ස්වාධීනත්වය • අවදානම් කළමනාකරණ රාමුව • අභ්‍යන්තර පාලන විධිවිධාන • දූෂණ විරෝධී සහ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ (AML) අනුකූලතාවය • විනිවිදභාවය සහ හෙළිදරව් කිරීම් • මණ්ඩල ඒකාබද්ධ අවදානම් කමිටු අධීක්ෂණය • ණය ප්‍රතිපත්තිය සඳහා ESG අවදානම් ඒකාබද්ධ කිරීම • ප්‍රතිලාභ නැවත අයකර ගැනීමේ විධිවිධාන (Claw back provisions) • සම්බන්ධිත පාර්ශ්වයන් (Related party) අතර සිදුවන ගනුදෙනු පාලනය • නියාමන අවශ්‍යතාවයන් සඳහා වන අනුකූලතාවය

දත්ත ආරක්ෂණය සහ රහස්‍යතා අධීක්ෂණය

වර්ධනය වන නියාමන අපේක්ෂාවන් සහ පුද්ගලික දත්ත සම්බන්ධයෙන් පවතින අවදානම් පසුබිම (Risk landscape) සැලකිල්ලට ගනිමින්, බැංකුව 2025 වසරේදී අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව යටතේ විශේෂිත "දත්ත ආරක්ෂණ ඒකකයක්" (DPU) ස්ථාපිත කරමින් සිය දත්ත පාලන ව්‍යුහය විධිමත් කළේය. 2022 අංක 09 දරන පුද්ගලික දත්ත ආරක්ෂණ පනතට අනුකූලව සකස් කර ඇති බැංකුවේ දත්ත ආරක්ෂණ ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම මෙම ඒකකයේ වගකීම වේ. මෙම ප්‍රතිපත්තිය "සාමාන්‍ය දත්ත ආරක්ෂණ නියාමනය" (GDPR) ඇතුළු ජාත්‍යන්තරව පිළිගත් දත්ත ආරක්ෂණ මූලධර්මවලට අනුකූලව සකස් කර ඇත.

මෙම ප්‍රතිපත්තියට අනුව, පුද්ගලික දත්ත නීත්‍යානුකූලව, සාධාරණව සහ ආරක්ෂිතව සැකසීම සහතික කිරීමේ ප්‍රමුඛ වගකීම බැංකුව සතු වේ. අනවසර ප්‍රවේශයන්, දත්ත අහිමි වීම්, අවභාවිතය හෝ වෙනස් කිරීම්වලින් දත්ත ආරක්ෂා කර ගැනීම සඳහා අවශ්‍ය තාක්ෂණික සහ සංවිධානාත්මක පියවර ගැනීම මෙහිදී අත්‍යාවශ්‍ය වේ. මෙම වගකීම බැංකුවේ අභ්‍යන්තර කටයුතුවලට පමණක් නොව, බැංකුව සමඟ කටයුතු කරන තෙවන පාර්ශවීය සේවා සපයන්නන් සහ වෙළෙන්දන් (Vendors) සඳහා ද අදාළ වන අතර, ඔවුන් ද බැංකුවේ දත්ත ආරක්ෂණ ප්‍රතිපත්ති සහ ගිවිසුම්ගත කොන්දේසිවලට අනුකූල විය යුතුය.

මීට අමතරව, දත්ත ආරක්ෂණ ඒකකය (DPU) විසින් බැංකුව සහ එහි සේවකයින් නීත්‍යානුකූලව දත්ත සැකසීම සහ පනතේ විධිවිධානවලට අනුකූල වීම පිළිබඳව අධීක්ෂණය කරනු ලබයි. එමෙන්ම, දත්ත සැකසීමේ කටයුතුවල නිරත කාර්ය මණ්ඩලය සඳහා දැනුවත් කිරීමේ සහ ධාරිතා වර්ධන වැඩසටහන් සංවිධානය කරන අතර, ඉහළ අවදානම් සහිත දත්ත සැකසුම් ක්‍රියාවලීන් සඳහා "දත්ත ආරක්ෂණ බලපෑම් තක්සේරු" (DPIA) පිළිබඳ මඟපෙන්වීම් සහ අධීක්ෂණය ද සපයනු ලැබේ. තවද, දත්ත ආරක්ෂණ අධිකාරිය මඟින් නිකුත් කරනු ලබන සියලුම උපදෙස් සහ නියෝගයන්ට අනුකූලව කටයුතු කිරීමට ද එම ඒකකය බැඳී සිටී. මෙම පාලන විධිවිධාන මඟින් බැංකුවේ සියලුම දෙපාර්තමේන්තු සහ ශාඛා ජාලය පුරා දත්ත ආරක්ෂණ රාමුව ශක්තිමත් වන අතර, නියාමන අනුකූලතාවය සහ දත්ත අවදානම්වලට එරෙහි මෙහෙයුම් ඔරොත්තු දීමේ හැකියාව (Operational resilience) ද තවදුරටත් තහවුරු වේ. බැංකුවේ සියලුම පුද්ගලික දත්ත සැකසීමේ කටයුතු බැංකුවේ දත්ත ආරක්ෂණ ප්‍රතිපත්තියට (DPP) අනුකූලව සිදු කිරීම අනිවාර්ය වේ.

දත්ත ආරක්ෂණ ඒකකය (DPU) පිහිටුවීම මඟින් නෛතික, නියාමන සහ කීර්තිනාම අවදානම් (Reputational risks) අවම වන අතරම, බැංකුවේ සමස්ත අවදානම් කළමනාකරණ රාමුවට අනුකූලව දත්ත වගකීම්සහගතව සහ සදාචාරාත්මකව භාවිත කිරීම තහවුරු වේ. එමඟින් බැංකුවේ පාලන පරිසරය සැලකිය යුතු ලෙස ශක්තිමත් කෙරේ.

නියාමනය සහ අනුකූලතාවය

මහජන බැංකුව සිය මෙහෙයුම් කටයුතු සිදු කළේ, පශ්චාත්-අර්බුද මූල්‍ය අංශ ප්‍රතිසංස්කරණවලට අනුකූලව විචක්ෂණශීලී අධීක්ෂණය (Prudential oversight) සහ නිරන්තරයෙන් විකාශනය වන නියාමන අපේක්ෂාවන් සහිත පරිසරයකය. බැංකුවේ ඉහළ ප්‍රාග්ධන ප්‍රමාණවත්තාවය සහ ශක්තිමත් ද්‍රවශීලතා තත්ත්වය ස්ථාවර නියාමන අවදානම් දැක්මක් (Risk outlook) පවත්වා ගැනීමට ඉවහල් විය. අවදානම් දත්ත එක්රැස් කිරීමේ ප්‍රමිතීන්, මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ රාමු (AML) සහ ඉහළ හෙළිදරව් කිරීමේ අවශ්‍යතා අනුගමනය කිරීම නියාමන විශ්වාසය තහවුරු කිරීමටත්, ජාත්‍යන්තර ප්‍රමිතීන් සමඟ අනුකූල වීමටත් අත්‍යවශ්‍ය සාධක විය.

කීර්තිනාම අවදානම සහ පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය

2025 වසරේ වාර්තාගත මූල්‍ය ප්‍රතිඵල ලබාදුන් ගම්‍යතාවය උපයෝගී කරගනිමින්, විශිෂ්ටත්වය සහ පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය තහවුරු කිරීමට බැංකුව කැපවී ක්‍රියා කළේය. විනිවිදභාවයෙන් යුත් අවදානම් කළමනාකරණය සහ සඵලදායී සන්නිවේදනය හේතුවෙන් පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය තවදුරටත් ශක්තිමත් වූ අතර, කළඹ අධීක්ෂණය සහ තිරසාර වර්ධනය උදෙසා බැංකුව අනුගමනය කළ විනයගරුක ප්‍රවේශය ද මින් මැනවින් පිළිබිඹු විය.

ගනුදෙනුකරුවන්, ආයෝජකයින් සහ නියාමකයින් අතර විශ්වසනීයත්වය පවත්වා ගැනීම සඳහා දැඩි හෙළිදරව් කිරීමේ පිළිවෙත් සහ නියමිත අවදානම් රුචිය (Risk appetite) තුළ හිඳිමින් අවදානම් නිරාවරණයන් මැනවින් කළමනාකරණය කිරීම ප්‍රධාන පදනම විය.

අවදානම් සංස්කෘතිය සහ ආයතනික පාලනය

2025 වසරේ පැවති බහුමානීය අවදානම් පසුබිම සාර්ථකව ජයගැනීම සඳහා බැංකුවේ ශක්තිමත් "අවදානම් සංස්කෘතිය" අත්‍යවශ්‍ය සාධකයක් විය. අවදානම් පිළිබඳ දැනුවත්භාවය, ආයතනික පාලන ප්‍රොටෝකෝලයන්ට අනුකූල වීම සහ විවිධ ව්‍යාපාරික අංශ හරහා අවදානම් වගකීම (Risk ownership) සහසම්බන්ධ කිරීම කෙරෙහි නිරන්තර අවධානය යොමු කරන ලදී. මෙමඟින් චක්‍රීය (Cyclical) සහ ව්‍යුහාත්මක (Structural) අවදානම් සාධක හමුවේ ඒකාබද්ධ හා සාර්ථක ප්‍රතිචාර දැක්වීමට බැංකුවට මනා සහයක් ලැබුණි.

බැංකුවේ තීරණාත්මක අවදානම් නිරාවරණයන් ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සඵලදායී ලෙස සන්නිවේදනය කිරීමට ස්වාධීන පරීක්ෂණාත්මක කාර්යයන් (Independent challenge functions) සක්‍රීය කිරීම සහ වාර්තාකරණ රාමු තවදුරටත් පුළුල් කිරීම හරහා අවස්ථාව සැලසුණි. මෙය සමස්ත අවදානම් අධීක්ෂණ ක්‍රියාවලිය තවදුරටත් සවිබල ගැන්වීමට මෙන්ම වඩාත් විනිවිදභාවයකින් යුත් තීරණ ගැනීමට ද මහෝපකාරී විය.

බැංකුවේ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුව

බැංකුවේ උපායමාර්ගික අරමුණු සහ නියාමන අවශ්‍යතාවලට අනුකූල වන පරිදි, සිය ව්‍යාපාරික කටයුතුවලදී පැන නගින අවදානම් හඳුනා ගැනීම, මැනීම, නිරීක්ෂණය කිරීම සහ පාලනය කිරීම සඳහා වූ විස්තීර්ණ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුවක් (IRMF) බැංකුව විසින් ස්ථාපිත කර ඇත. මෙම රාමුව, සඵලදායී අධීක්ෂණය සහ වගවීම සහතික කරන ශක්තිමත් පාලන ව්‍යුහයක් මත පදනම් වේ. ආයතනය පුරා පැහැදිලිව අර්ථ දක්වා ඇති භූමිකාවන් සහ වගකීම් මෙන්ම, අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමේ කමිටු සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය මඟින් සිදු කරනු ලබන අධීක්ෂණය ද අවදානම් පාලන ක්‍රියාවලියේ ප්‍රධාන පදනම වේ.

බැංකුවේ අවදානම් කළමනාකරණ රාමුව සියලුම තීරණාත්මක අවදානම් නිරාවරණයන් (Material risk exposures) ආවරණය කරන අතර, එය පැහැදිලි ආයතනික විධිවිධාන, නවීන තාක්ෂණික පද්ධති, කාර්යක්ෂම ක්‍රියාවලීන් සහ ජාත්‍යන්තරව පිළිගත් හොඳම භාවිතයන් (Best practices) මත ගොඩනැගුණු ව්‍යුහගත ක්‍රමවේදයකි. බැංකු මෙහෙයුම්වලදී ඇති විය හැකි විභව අවදානම්, අවිනිශ්චිතතා සහ අලාභයන් හඳුනා ගැනීමටත්, ඒවා කළමනාකරණය කිරීමට සහ අවම කිරීමටත් අවශ්‍ය විනයගරුක ප්‍රවේශයක් මෙම රාමුව මඟින් සලසා දෙයි.


ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුවේ ප්‍රධාන අංග

- අවදානම් පාලන ව්‍යුහය
- අවදානම් රුචිය (Risk appetite) නිර්වචනය කිරීම
- අවදානම් පරාසය නිර්වචනය කිරීම
- ආරක්ෂක වළලු තුනේ ක්‍රමවේදය
- ආපදා පරීක්ෂණ සහ අවදානම් ඇගයීමේ ආකෘති


අවදානම් පාලන රාමුව

බැංකුවේ අවදානම් රුචිකත්වය තීරණය කිරීම, අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති අනුමත කිරීම සහ අවදානම් නිරාවරණයන් සඵලදායී ලෙස කළමනාකරණය කිරීම ඇතුළු සමස්ත අවදානම් අධීක්ෂණ ක්‍රියාවලිය සඳහා වන පරම වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ. මෙම වගකීම් ඉටු කිරීමේදී, අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමේ උපකමිටු සහ කළමනාකරණ මට්ටමේ විධායක කමිටු මඟින් මණ්ඩලයට සහාය ලැබේ. මෙමඟින්, සඵලදායී මණ්ඩල අධීක්ෂණය පවත්වා ගන්නා අතරම, අවදානම් උත්පාදනය සහ අවදානම් අනුමත කිරීමේ කාර්යයන් අතර නිසි වෙන්වීමක් (Segregation) සහතික කෙරේ. අධ්‍යක්ෂ මණ්ඩලය සහ අදාළ අවදානම් කමිටු ක්‍රියාත්මක වන්නේ, ඔවුන්ගේ භූමිකාවන්, බලතල සහ වගකීම් පැහැදිලිව විග්‍රහ කරන ලද, විධිමත් ලෙස අනුමත කරන ලද ප්‍රඥප්ති (Charters) වලට අනුකූලවය.

අවදානම් පාලන රාමුව



ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුවේ ක්‍රියාකාරී ව්‍යුහය



අවදානම් රුචිය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද බැංකුවේ අවදානම් රුචිය පිළිබඳ ප්‍රකාශය (Risk Appetite Statement), බැංකුවේ උපායමාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා බැංකුව භාර ගැනීමට කැමති අවදානම් ස්වභාවය සහ මට්ටම නිර්වචනය කරයි. මෙය සීමාවන් (Limits), ද්වාර (Thresholds) සහ ප්‍රධාන අවදානම් දර්ශක (KRIs) ඇතුළු ගුණාත්මක මූලධර්ම සහ ප්‍රමාණාත්මක මිනුම් දඬු මඟින් ශක්තිමත් කර ඇත. මෙම අවදානම් රුචිය බැංකුවේ ප්‍රාග්ධන ප්‍රමාණවත් බව, ද්‍රවශීලතා තත්ත්වය සහ ඉපැයීම් ධාරිතාව සමඟ සමපාත කර ඇති අතර, ව්‍යාපාරික තීරණ ගැනීමේදී සහ අවදානම් සහගත ක්‍රියාකාරකම්වලදී කේන්ද්‍රීය යොමු ලක්ෂ්‍යයක් ලෙස ක්‍රියා කරයි. අනුමත අවදානම් රුචියට අනුකූලව කටයුතු කරන්නේ දැයි අඛණ්ඩව නිරීක්ෂණය කරනු ලබන අතර, එහි සිදුවන බැහැරවීම් හෝ කඩකිරීම් පිළිබඳව නිවැරදි කිරීමේ පියවර ද සහිතව ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයට සහ අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරනු ලැබේ.

අවදානම් පැතිකඩ

බැංකුවේ අවදානම් පැතිකඩ මඟින් කිසියම් නිශ්චිත අවස්ථාවකදී එහි ව්‍යාපාරික ක්‍රියාකාරකම්, නිෂ්පාදන, වෙළඳපොළ සහ මෙහෙයුම් පරිසරය තුළින් පැන නඟින අවදානම්වල සමස්ත මට්ටම සහ සංයුතිය පිළිබිඹු කරයි. මෙය අවදානම් මිනුම් මෙවලම්, ආතති පරීක්ෂණ, අවස්ථා විශ්ලේෂණය සහ කළමනාකාරිත්ව විනිශ්චයන්හි එකතුවක් මඟින් තක්සේරු කරනු ලැබේ. එමෙන්ම බැංකුවේ අවදානම් ඉවසීමේ සීමාවන් (Risk tolerance) සමඟ අනුකූලතාව සහතික කිරීම සඳහා එය අනුමත අවදානම් රුචියට සාපේක්ෂව ඇගයීමට ලක් කෙරේ. නැගී එන අවදානම්, සාන්ද්‍රණයන් (Concentrations) සහ ප්‍රවණතා හඳුනා ගැනීමටත්, අවදානම් නිරාවරණයන් පිළිගත හැකි මට්ටමක පවතින බව සහතික කිරීමටත් අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC) විසින් මෙම අවදානම් පැතිකඩ නිතිපතා සමාලෝචනය කරයි. අවශ්‍ය අවස්ථාවලදී බැංකුවේ උපායමාර්ගික අරමුණු සහ සමස්ත අවදානම් ධාරිතාව සමඟ සමපාත වීම පවත්වා ගැනීම සඳහා සුදුසු අවදානම් අවම කිරීමේ පියවර ක්‍රියාත්මක කරනු ලැබේ.

ණය අවදානම් රුචිය වර්ගීකරණය: 2025 දෙසැම්බර් 31 සහ 2024 දෙසැම්බර් 31 අතර සංසන්දනය

ණය අවදානම

අවදානම් වර්ගය	ණය අවදානම් රුචිය			පවතින තත්ත්වය	
	අවදානම ඉහළ	අවදානම මධ්‍යම	අවදානම අඩු	2025 දෙසැම්බර් 31 දිනට	2024 දෙසැම්බර් 31 දිනට
හානිකරණය වූ ණය (3 වන අදියර) අනුපාතිකය (%)	>7	3.5-7	<3.5	7.66	10.26
හානිකරණය (3 වන අදියර) සිට අදියර 3 ණය දක්වා අනුපාතිකය (%)	<30	30-50	>50	48.39	41.49
කල් ඉකුත් වූ ණය අනුපාතිකය (%)	>12	6-12	<6	8.40	16.84
ලාභ හා අලාභ ගිණුමට අයකිරීම (%)	>50	35-50	<35	24.94	13.11
සංකේන්ද්‍රණය (HHI ක්‍රමය)	>0.25	0.15-0.25	<0.15	0.12	0.11
අයකර ගැනීම් (%)	<10	10-20	>20	13.18	8.55
TOD අතිරික්ත (%)	>20	10-20	<10	10.09	8.68
අක්වෙරළ නිරාවරණය (OBU) (%)	>5	3-5	<3	1.12	1.55

මෙහෙයුම් අවදානම්

අවදානම් වර්ගය	මෙහෙයුම් අවදානම් රුචිය			පවතින තත්ත්වය	
	අවදානම ඉහළ	අවදානම මධ්‍යම	අවදානම අඩු	2025 දෙසැම්බර් 31 දිනට	2024 දෙසැම්බර් 31 දිනට
මෙහෙයුම් අලාභ – අභ්‍යන්තර වංචා	>5	1-5	0	3	1
මෙහෙයුම් අලාභ – බාහිර වංචා (උකස්)	>300	150-300	<150	214	135
මුළු මෙහෙයුම් වියදම්වලට සාපේක්ෂව මුළු මෙහෙයුම් අලාභ (%)	>1.0	0.5-1.0	<0.5	0.10	0.05
පද්ධති උපයෝජ්‍යතාව/ක්‍රියාකාරිත්වය					
ඉතා වැදගත්	<97.5	97.5-99.9	>99.9	100	100
සාමාන්‍ය/මධ්‍යම ලෙස වැදගත්	<95	95-97.5	>97.5	98.69	100
අඩුවෙන් වැදගත්	<87	87-90	>90	100	100
සාමාන්‍ය අගයට වඩා අඩුවෙන් ශ්‍රේණිගත වූ ශාඛා විගණන ප්‍රතිශතය	>10	5-10	<5	12.41%	7%

වෙළෙඳපොළ අවදානම

අවදානම් වර්ගය	වෙළෙඳපොළ අවදානම් රුචිය			පවතින තත්ත්වය	
	අවදානම ඉහළ	අවදානම මධ්‍යම	අවදානම අඩු	2025 දෙසැම්බර් 31 දිනට	2024 දෙසැම්බර් 31 දිනට
විදේශ විනිමය අලාභ	>10	5-10	<5	Nil	Nil
ස්ථාවර ආදායම් සුරකුම්පත් වෙළඳ අලාභ	>10	5-10	<5	Nil	Nil
අත්තිකාරම් හා තැන්පතු අනුපාතිකය	>85	75-85	<75	57%	56.10%
ද්‍රවශීලතා ආවරණ අනුපාතිකය (සියලුම ව්‍යවහාර මුදල්)	<90	90-100	>100	218.54%	279.52%
කල් පිරීම් නොගැලපීමේ අනුපාතිකය	> +/-35	+/-(25-35)	25	-33.25%	-49.44%

බැංකුවේ අවදානම් විෂය පථය



ණය අවදානම
- පැහැර හැරීමේ අවදානම
- සාන්ද්‍රණ අවදානම
- ශ්‍රේණිගත කිරීම් සංක්‍රමණ අවදානම
- දේශගුණික අවදානම

වෙළඳපොළ අවදානම
- විදේශ විනිමය අනුපාතික අවදානම
- පොලී අනුපාතික අවදානම
- කොටස් මිල අවදානම
- භාණ්ඩ මිල අවදානම (උකස් අවදානම ද ඇතුළුව)

ද්‍රවශීලතා අවදානම
- ද්‍රවශීලතා අවදානම (දේශීය ව්‍යවහාර මුදල්/විදේශ ව්‍යවහාර මුදල්)
- සියලුම ව්‍යවහාර මුදල් ද්‍රවශීලතා අවදානම

මෙහෙයුම් අවදානම
- පුද්ගල අවදානම
- තොරතුරු තාක්ෂණ/සයිබර්/තොරතුරු ආරක්ෂණ අවදානම
- ව්‍යාපාර අඛණ්ඩතා අවදානම

අනුකූලතා අවදානම
- නියාමන අනුකූලතා අවදානම
- මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මූල්‍යනය කිරීම වැළැක්වීමේ(AML/CFT) අවදානම
- නීතිමය අවදානම

උපායමාර්ගික අවදානම
- කීර්තිනාම අවදානම
- ව්‍යාපාරික අවදානම

අවදානම් සංස්කෘතිය

මූල්‍යමය ප්‍රත්‍යාස්ථතාව (Financial Resilience) තහවුරු කිරීම, පාර්ශ්වකරුවන්ගේ අභිලාෂයන් සුරක්ෂිත කිරීම, විචක්ෂණශීලී තීරණ ගැනීම ප්‍රවර්ධනය කිරීම සහ තිරසාර දිගුකාලීන වටිනාකම් නිර්මාණය සහතික කිරීම සඳහා යහපත් අවදානම් සංස්කෘතියක් අත්‍යවශ්‍ය බව බැංකුව පිළිගනී. මෙම සන්දර්භය තුළ, අවදානම් පිළිබඳ කරුණු සියලුම ව්‍යාපාරික ක්‍රියාකාරකම් තුළ ක්‍රමානුකූලව අන්තර්ගත කර ඇති අතර, එමඟින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අවදානම් රුචිය සමඟ සමපාත වීම සහතික කෙරේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ආයතනික චර්යාවන් සහ තීරණ ගැනීම් සඳහා වන මූලික ප්‍රමිතිය ලෙස මෙම අවදානම් රුචිය ප්‍රකාශයට පත් කර බලාත්මක කරනු ලබයි. ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය විසින් ප්‍රතිපත්ති, සීමාවන් සහ පාලන ක්‍රමවේදී ක්‍රියාවට නංවමින් අවදානම් නිරාවරණයන් අනුමත පරාමිතීන් තුළ පවත්වා ගනු ලබන අතර, එමඟින් මණ්ඩලයේ උපායමාර්ගික අභිප්‍රාය ඵලදායී ඵදිනෙදා අවදානම් පාලනයක් බවට පරිවර්තනය කෙරේ

පැහැදිලිව නිර්වචනය කරන ලද ආරක්ෂක වළලු තුනක (Three Lines of Defence) රාමුවක් මඟින්, සියලුම මට්ටම්වල සේවකයින් අවදානම් ඵලදායී ලෙස හඳුනා ගැනීම, තක්සේරු කිරීම සහ කළමනාකරණය කිරීමේදී තම වගකීම් සහ භූමිකාවන් නිසි ලෙස හඳුනාගෙන ඉටු කරන බව බැංකුව තහවුරු කරයි. අඛණ්ඩ දැනුවත් කිරීමේ වැඩසටහන්, ව්‍යුහගත පුහුණු මූලපිරීම් සහ විභිවිද පෙනෙන ඉහළට යොමු කිරීමේ යාන්ත්‍රණයන් සේවකයින්ගේ අවදානම් විඥානය තහවුරු කරන අතර ගැටළු කල්තියා හඳුනාගෙන වාර්තා කිරීම දිරිමත් කරයි. ස්වාධීන අධීක්ෂණය සහ අවදානම්වලට අනුකූලව සකස් කළ ක්‍රියාවලීන් මඟින් සහාය දක්වන මෙම ප්‍රවේශය, වගවීම, වගකිවයුතු ලෙස අවදානම් භාර ගැනීම මෙන්ම නියාමන අපේක්ෂාවන් සහ උපායමාර්ගික අරමුණු සමඟ සමපාත වීම තහවුරු කරයි.

ආරක්ෂක වළලු තුන

මෙම රාමුව ආරක්ෂක වළලු තුනක ආකෘතිය මත පදනම් වී ඇති අතර, එමඟින් අවදානම් හිමිකාරිත්වය (Risk ownership), ස්වාධීන අවදානම් අධීක්ෂණය (Independent risk oversight) සහ සහතික කිරීමේ කාර්යයන් (Assurance functions) පැහැදිලිව වෙන් කර දක්වයි. ඒ මඟින් යහපත් අවදානම් සංස්කෘතියක් සහ ඵලදායී අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ප්‍රවර්ධනය කරනු ලබයි.

පළමු ආරක්ෂක වළල්ල	දෙවන ආරක්ෂක වළල්ල	තුන්වන ආරක්ෂක වළල්ල
ව්‍යාපාරික අංශ/ආයතනික කාර්යයන්	අවදානම් කළමනාකරණය සහ පාලනයන්	සහතික කිරීම
අනුමත අවදානම් රුචිය සහ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිවලට යටත්ව අවදානම් හඳුනාගැනීම, ඒවායේ හිමිකාරිත්වය දැරීම සහ කළමනාකරණය කිරීම. – පුද්ගල කේන්ද්‍ර, ආයතනික සහ ව්‍යවසායක බැංකු කටයුතු – භාණ්ඩාගාර – ශාඛා මෙහෙයුම් – තොරතුරු තාක්ෂණ	අවදානම් කළමනාකරණය සහ අනුකූලතාව සඳහා මගපෙන්වීම ලබා දීම, ඵලදායී අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති රාමුවක් පවත්වාගෙන යාම සහ අවදානම් කළමනාකරණ රාමුව ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ස්වාධීන නිරීක්ෂණ කටයුතු සිදු කිරීම – අවදානම් කළමනාකරණ – අනුකූලතා – මූල්‍ය – මානව සම්පත්	පවතින අවදානම් නිරාවරණය, ක්‍රියාවලීන් සහ භාවිතයන් පිළිබඳව ස්වාධීන සහ වාස්තවික සහතිකයක් (Independent and objective assurance) ලබා දීම සහ ඉහළම මට්ටමේ ආයතනික පාලනය සහ අනුකූලතාව සහතික කිරීම – අභ්‍යන්තර විගණන – බාහිර විගණන – නියාමන අනුකූලතා
දෛනික මෙහෙයුම් සම්බන්ධයෙන් වගකීම සහ වගවීම දරනු ලබන ව්‍යාපාරික සහ ආයතනික මට්ටමේ අභ්‍යන්තර පාලනයන්.	**ස්වාධීන අවදානම් නිරීක්ෂණය, ප්‍රතිපත්ති සමාලෝචනය, අනුකූලතා පාලන තන්ත්‍රය සහ කාර්යසාධනයේ ඵලදායීතාවය මැනීම.**	**ස්වාධීන ගුණාත්මකභාවය සහ සහතික කිරීමේ පරීක්ෂාවන් ලබා දෙමින් ක්‍රියාත්මක වන අභ්‍යන්තර සහ බාහිර විගණන කාර්යයන්.**

අවදානම් කළමනාකරණ ක්‍රමවේදය

- බැංකුව පුරා ශක්තිමත් අවදානම් පාලන සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම සහ තහවුරු කිරීමෙහිලා සභාපති, ප්‍රධාන විධායක නිලධාරී සහ අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රමුඛත්වය ලබා දෙයි.
- ප්‍රාග්ධන ප්‍රමාණවත් බව සහ ද්‍රවශීලතා කළමනාකරණ රාමු සමඟ සෘජුව සමපාත වන පරිදි, බැංකුවේ අවදානම් නිරාවරණයන් නිරීක්ෂණය සඳහා වූ ඵලදායී පද්ධතියක් ක්‍රියාත්මක වේ.
- අදාළ සියලුම අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ පටිපාටි බැංකුවේ සෑම මට්ටමකටම නිසි ලෙස සන්නිවේදනය කිරීම සහ අවබෝධ කරවීම සහතික කිරීම සඳහා ශක්තිමත් යාන්ත්‍රණයක් ස්ථාපිත කර ඇත.
- අවදානම් කළමනාකරණය, අවදානම් අවම කිරීම සහ වාර්තාකරණ වගකීම් පිළිබඳ සේවක අවබෝධය නිරන්තරයෙන් වර්ධනය කිරීම උදෙසා නිතිපතා දැනුවත් කිරීමේ වැඩසටහන් සහ පුහුණු සැසි පවත්වනු ලැබේ.
- ආරක්ෂක වළලු තුනක (Three Lines of Defence) ආකෘතියේ විශ්වසනීයත්වය සහ ඵලදායීතාවය සුරැකීම සඳහා, පැහැදිලිව නිර්වචනය කරන ලද ස්වාධීන භූමිකාවන් සහ වගකීම් සමූහයක් පවත්වාගෙන යනු ලැබේ.
- යහපත් අවදානම් කළමනාකරණයක් සහ මෙහෙයුම් විනයක් සහතික කරනු වස්, ශක්තිමත් අභ්‍යන්තර පාලන රාමු අනුගමනය කරන අතර ඒ සඳහා අඛණ්ඩ සහාය ලබා දේ.
- අනුකූලතා සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම මෙන්ම කාලෝචිත, නිරවද්‍ය සහ විනිවිද පෙනෙන නියාමන වාර්තාකරණයක් සහතික කිරීම සඳහා ස්වාධීන සහ ඵලදායී අනුකූලතා කාර්යභාරයක් ක්‍රියාත්මක වේ.
- අදාළ නියාමන සහ වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූලව, අවශ්‍ය අවස්ථාවන්හිදී නිසි අනාවරණයක් සිදු කිරීමට බැංකුව බැඳී සිටී.
- නියාමන සහ නීතිමය අවශ්‍යතා මෙන්ම විකාශනය වන ක්ෂේත්‍රයේ විශිෂ්ටතම භාවිතයන් (Industry best practices) සමඟ අඛණ්ඩව සමපාත වීම තහවුරු කරනු වස්, අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ භාවිතයන් වරින් වර සමාලෝචනයට සහ වැඩිදියුණු කිරීමට යටත් කෙරේ.

ආතති පරීක්ෂාව

බැංකුව සිය ව්‍යවසාය අවදානම් කළමනාකරණ ව්‍යුහයේ අනිවාර්ය අංගයක් ලෙස පුළුල් ආතති පරීක්ෂණ රාමුවක් භාවිත කරයි. අහිතකර මෙන්ම විය හැකි සාර්ව ආර්ථික සහ විශේෂිත අවස්ථා යටතේ බැංකුවේ ප්‍රාග්ධනය, ද්‍රවශීලතාව සහ ඉපැයීම්වල මූල්‍යමය ප්‍රත්‍යාස්ථතාව ඇගයීම සඳහා මෙම ආතති පරීක්ෂණ පවත්වනු ලැබේ. මෙම රාමුව මඟින් ණය, වෙළඳපොළ, ද්‍රවශීලතාව, මෙහෙයුම් සහ සාන්ද්‍රණ අවදානම් යන ප්‍රධාන අවදානම් කාණ්ඩ ආවරණය කෙරෙන අතර, ඒ සඳහා සංවේදීතා විශ්ලේෂණයන්, අවස්ථා පාදක තක්සේරු කිරීම් සහ ප්‍රතිලෝම ආතති පරීක්ෂණ අන්තර්ගත කර ඇත. විභව අන්ත-අවදානම් නිරාවරණයන් නිසි ලෙස හඳුනා ගැනීම සහතික කරනු වස්, මෙහි උපකල්පනයන් ඉදිරි දැක්මක් සහිත සාර්ව ආර්ථික විචල්‍යයන් සහ අංශ-විශේෂිත අවදානම් සහගත තත්ත්වයන් මත පදනම්ව සකස් කර ඇත.

ආතති පරීක්ෂණ මඟින් ලබාගන්නා ප්‍රතිඵල බැංකුවේ උපායමාර්ගික සැලසුම්කරණය, ප්‍රාග්ධන ප්‍රමාණවත් බව තක්සේරු කිරීම සහ අවදානම් රුචිය ක්‍රමාංකනය කිරීමේ ක්‍රියාවලීන් සඳහා ක්‍රමානුකූලව උපයෝගී කර ගනු ලබයි. බැංකුවේ අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණවත් බව තක්සේරු කිරීමේ ක්‍රියාවලිය (ICAAP) සහ ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ පටිපාටි තහවුරු කිරීම සඳහා මෙම ප්‍රතිඵල භාවිත කෙරෙන අතර, එමඟින් බැංකුවේ ප්‍රාග්ධන සහ අරමුදල් ස්වාරක්ෂකයන් එහි අවදානම් පැතිකඩට අනුකූල මට්ටමක පවතින බව සහතික කෙරේ. ස්වාධීන වලංගුකරණය සහ වරින් වර සිදුකරන සමාලෝචනයන්ගේ සහාය ඇතිව, අධ්‍යක්ෂ මණ්ඩලය සහ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව මඟින් ආතති පරීක්ෂණ ක්‍රියාවලිය පිළිබඳ ශක්තිමත් අධීක්ෂණයක් සහ පාලනයක් පවත්වාගෙන යනු ලබයි.

ආතති අවස්ථා සැලසුම් කිරීම, ඒවායේ උපකල්පන සහ ප්‍රතිදානයන්හි ක්‍රමවේදීය නිරවද්‍යතාව සහ නියාමන අනුකූලතාව තහවුරු කරනු වස් ඒවා දැඩි විශ්ලේෂණයකට සහ අභියෝගයට ලක් කෙරේ. මෙම ආතති පරීක්ෂණ රාමුව අඛණ්ඩව යාවත්කාලීන කිරීම මඟින් විකාශනය වන ආර්ථික තත්ත්වයන්ට, පරිනාමනය වන අවදානම් සාධකයන්ට සහ නියාමන අපේක්ෂාවන්ට අනුවර්තනය වීමට බැංකුවට හැකියාව ලැබෙන අතර, එමඟින් බැංකුවේ මූල්‍යමය ප්‍රත්‍යාස්ථතාව සහ දිගුකාලීන තිරසාරභාවය තවදුරටත් ශක්තිමත් වේ.

ආතති පරීක්ෂාව



- වත්කම්වල ගුණාත්මකභාවය පිරිහීම
- අදියර අනුව වත්කම්වල සිදුවන වෙනස්වීම්
- ECL සාධකවල බලපෑම
- ප්‍රධාන ණය ගැතියන් 10 දෙනාගේ වත්කම් ගුණාත්මකභාවය පිරිහීම
- ප්‍රමුඛ කර්මාන්ත අංශ 3 හි වත්කම් ගුණාත්මකභාවය පිරිහීම
- යථාකරණය කරන ලද (HHI) දර්ශකයේ වර්ධනය
- ණය සාන්ද්‍රණය
- අවදානම් බරිත වත්කම් (ප්‍රාග්ධනය මත බලපෑම)

- වෙළඳපොළ පොලී අනුපාතිකයන්ගේ විචලනයන්
- වෙළඳපොළ විනිමය අනුපාතිකයන්ගේ විචලනයන්
- වෙළඳපොළ කොටස් මිල ගණන්වල විචලනයන්
- ආර්ථික අර්බුදයේ බලපෑම
- වෙළඳ පොළ රන් මිල මත පදනම් වූ උකස් අත්තිකාරම්

- "සීඝ්‍රයෙන් සංසරණය වන අරමුදල්" (Hot money) සහ සිල්ලර තැන්පතු ආපසු ගැනීම්වල බලපෑම
- වත්කම් සහ වගකීම් ප්‍රමාණයන්හි සිදුවන වෙනස්වීම්වල බලපෑම
- රජයේ සුරකුම්පත්වල වෙළඳපොළ වටිනාකමෙහි සිදුවන වෙනස්වීම්වල බලපෑම
- ඉහළ ගුණාත්මකභාවයකින් යුත් ද්‍රව වත්කම් (HQLA) සහ ශුද්ධ මුදල් පිටතට ගලායාන ප්‍රමාණයන්හි සිදුවන වෙනස්වීම්වල බලපෑම
- විදේශ ව්‍යවහාර මුදල් ආපසු ගැනීම් හමුවේ විදේශ ව්‍යවහාර මුදල් ද්‍රවශීලතාවයට සිදුවන බලපෑම

- පසුගිය වර්ෂ 3 තුල වාර්තාවූ මෙහෙයුම් අලාභ වටිනාකම මත පදනම්ව
- පසුගිය වර්ෂය තුල වාර්තාවූ මෙහෙයුම් අලාභ වටිනාකම මත පදනම්ව

පොලී අනුපාතික අවදානම සඳහා ආතති පරීක්ෂාව

	කම්පනයේ ප්‍රමාණය 0.25%	කම්පනයේ ප්‍රමාණය 0.5%	කම්පනයේ ප්‍රමාණය 1.00%
2025			
ඉපැයීම් මත බලපෑම (රු. මිලියන)	1,662	3,323	6,646
සංශෝධිත සමස්ත ප්‍රාග්ධන ප්‍රමාණවත් බවේ අනුපාතිකය (%)	16.34	16.21	15.95
2024			
ඉපැයීම් මත බලපෑම (රු. මිලියන)	1,437	2,874	5,748
සංශෝධිත සමස්ත ප්‍රාග්ධන ප්‍රමාණවත් බවේ අනුපාතිකය (%)	16.41	16.28	16.02

විදේශ විනිමය අනුපාතික අවදානම සඳහා ආතති පරීක්ෂාව

	කම්පනයේ ප්‍රමාණය 0.25%	කම්පනයේ ප්‍රමාණය 0.5%	කම්පනයේ ප්‍රමාණය 1.00%
2025			
ඉපැයීම් මත බලපෑම (රු. මිලියන)	175	350	526
සංශෝධිත සමස්ත ප්‍රාග්ධන ප්‍රමාණවත් බවේ අනුපාතිකය (%)	16.46	16.45	16.43
2024			
ඉපැයීම් මත බලපෑම (රු. මිලියන)	166	332	498
සංශෝධිත සමස්ත ප්‍රාග්ධන ප්‍රමාණවත් බවේ අනුපාතිකය (%)	16.52	16.51	16.49

කොටස් මිල අවදානම සඳහා ආතති පරීක්ෂාව

	කම්පනයේ ප්‍රමාණය 0.25%	කම්පනයේ ප්‍රමාණය 0.5%	කම්පනයේ ප්‍රමාණය 1.00%
2025			
කොටස් ආයෝජන කළඹේ උපරිම වෙළඳපොළ වටිනාකම මත බලපෑම (රු. මිලියන)	116	231	463
උපායමාර්ගික කොටස් ආයෝජනවල සාධාරණ වටිනාකම මත බලපෑම (රු. මිලියන)	36	72	143
මුළු බලපෑම (රු. මිලියන)	151	303	606

ද්‍රවශීලතාව සඳහා ආතති පරීක්ෂාව

	සියලුම ව්‍යවහාර මුදල් (රු. '000)			දේශීය ව්‍යවහාර මුදල් (රු. '000)		
	2025 දෙසැම්බර් 31 දිනට ශේෂය			2025 දෙසැම්බර් 31 දිනට ශේෂය		
ඉහළ ගුණාත්මකභාවයකින් යුත් ද්‍රවශීල වත්කම් (HQLA)	1,467,524,635			1,456,788,809		
මුළු මුදල් පිටතට ගලායාම	872,607,142			661,396,671		
මුළු මුදල් ඇතුළට ගලාඒම	201,087,231			108,156,477		
ශුද්ධ මුදල් පිටතට ගලායාම	671,519,911			553,240,194		
ද්‍රවශීලතා ආවරණ අනුපාතිකය (LCR) (%)	218.54			263.32		
	සුළු	මධ්‍යස්ථ	ප්‍රධාන	සුළු	මධ්‍යස්ථ	ප්‍රධාන
කම්පනයේ ප්‍රමාණය (%)	5	10	15	5	10	15
සිදුවීම 1 – උසස් තත්ත්වයේ ද්‍රවශීල වත්කම් (HQLA) පහත වැටීම						
කම්පනයෙන් පසු ද්‍රවශීල වත්කම් අනුපාතිකය (%)	207.61	196.68	185.76	250.15	236.99	223.82
සිදුවීම 2 – ශුද්ධ මුදල් පිටතට ගලායාම ඉහළ යාම						
කම්පනයෙන් පසු ද්‍රවශීල වත්කම් අනුපාතිකය (%)	208.13	198.67	190.03	250.78	239.38	228.97
සිදුවීම 3 – උසස් තත්ත්වයේ ද්‍රවශීල වත්කම් (HQLA) අඩුවීම සහ ශුද්ධ මුදල් පිටතට ගලායාම ඉහළ යාම (ආන්තික අවස්ථාව)						
කම්පනයෙන් පසු ද්‍රවශීල වත්කම් අනුපාතිකය (%)	192.72	178.80	161.53	238.24	215.44	194.63

ණය අවදානම

ණය ගැණුම්කරුවෙකු හෝ ප්‍රතිපාර්ශ්වකරුවෙකු විකඟ වූ කොන්දේසිවලට යටත්ව සිය ගිවිසුම්ගත බැඳීම් ඉටු කිරීමට අපොහොසත් වීම හේතුවෙන් සිදුවිය හැකි මූල්‍ය අලාභයන්හි විභවතාව "ණය අවදානම" මගින් නිරූපණය වේ. එය බැංකුව මුහුණ දෙන ප්‍රධානතම අවදානම් නිරාවරණය වන අතර, ප්‍රධාන වශයෙන් ණය සහ අත්තිකාරම්, වෙළඳ මූල්‍ය පහසුකම්, අන්තර් බැංකු තැන්පතු, ණය සුරැකුම්පත්, ශේෂ පත්‍රයෙන් බැහැර බැඳීම් සහ ව්‍යුත්පන්න ගනුදෙනු තුළින් මෙම අවදානම පැන නගී.

පුද්ගල කේන්ද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ, ආයතනික සහ සාමූහික ආයෝජන කළඹන්ගෙන් බැංකුවේ ණය අවදානම් පැතිකඩ සමන්විත වන අතර ඒවා ආංශික, භූගෝලීය, නිෂ්පාදන වර්ග සහ කල්පිරීම් පදනම මත විවිධාංගීකරණය වී පවතී. මීට අමතරව, ගෙවීම් පියවීමේ නිරාවරණයන්, භාණ්ඩාගාර මෙහෙයුම්වලදී ඇතිවන ප්‍රතිවිරුද්ධ පාර්ශවීය ණය අවදානම මෙන්ම ආංශික, තනි ණයගැති හෝ භූගෝලීය ඒකරාශී වීම් හරහා ඇතිවන සාන්ද්‍රණ අවදානම මගින් ද ණය අවදානම ජනනය වේ.

බැංකුවේ ණය අවදානම් රුචිය, ආංශික සීමාවන්, තනි ණයගැති නිරාවරණ සීමාවන් සහ කළඹ සාන්ද්‍රණ සීමාවන් අනුමත කරනු ලබන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහෙයවනු ලබන ශක්තිමත් පාලන රාමුවක් තුළ ණය අවදානම් කළමනාකරණය ස්ථාපිත කර ඇත. මේ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩල විධායක ණය කමිටුව මගින් අධීක්ෂණ සහාය ලබා දෙන අතර, එමඟින් සැලකිය යුතු නිරාවරණයන් ස්වාධීන සමාලෝචනයකට සහ විචාරාත්මක ඇගයීමකට ලක් කිරීම සහතික කෙරේ.

බැංකුව පහත සඳහන් අංගයන්ගෙන් සමන්විත විනයගරුක "ණය ජීවන චක්‍ර" (credit life cycle) ප්‍රවේශයක් අනුගමනය කරනු ලබයි:

- ව්‍යුහගත ණය ඇගයීම සහ අවදානම් ශ්‍රේණිගත කිරීම
- ස්වාධීන ණය අනුමත කිරීමේ ක්‍රියාවලීන්
- ඇපකර ඇගයීම සහ නෛතික බලාත්මකභාවය පිළිබඳ සමාලෝචනය
- අඛණ්ඩ කළඹ අධීක්ෂණය සහ පූර්ව අනතුරු ඇඟවීමේ සංඥා හඳුනා ගැනීම
- කාලීන ආතති පරීක්ෂණ (stress testing) සහ අවස්ථා විශ්ලේෂණය (scenario analysis)
- අපේක්ෂිත ණය අලාභ (ECL) ක්‍රමවේදයන්ට අනුකූලව වත්කම් දුර්වලතා තක්සේරු කිරීම


ණය පැහැර හැරීමේ සම්භාවිතාව (PD), ණය පැහැර හැරී අවස්ථාවක සිදුවන අලාභය (LGD), අවදානමට ලක්ව ඇති මුළු වටිනාකම (EAD) සහ අභ්‍යන්තර ශ්‍රේණිගත කිරීමේ ආකෘති ඇතුළු උසස් අවදානම් මිනුම් මෙවලම් මගින් කළඹ විග්‍රහය, අවදානම් මත පදනම් වූ මිලකරණය සහ ප්‍රාග්ධන වෙන් කිරීම සඳහා සහාය ලබා දෙයි. අහිතකර සාර්ව ආර්ථික සහ අංශ-විශේෂිත තත්ත්වයන් හමුවේ ණය කළඹේ ඔරොත්තු දීමේ හැකියාව (resilience) පරීක්ෂා කිරීම සඳහා නිතිපතා ආතති පරීක්ෂණ පවත්වනු ලැබේ.

විචක්ෂණශීලී ණය ප්‍රතිරක්ෂණ (underwriting) ප්‍රමිතීන්, කළඹ විවිධාංගීකරණය සහ අඛණ්ඩ අධීක්ෂණය මගින් වත්කම්වල ගුණාත්මකභාවය සහ ප්‍රාග්ධන ශක්තිය සුරක්ෂිත කරන අතරම, සමබර අවදානම්-ප්‍රතිලාභ පැතිකඩක් පවත්වා ගැනීමට බැංකුව කටයුතු කරයි.

ණය අවදානම් කළමනාකරණයේ පරමාර්ථ

වත්කම් ගුණාත්මකභාවය පවත්වා ගැනීම	ණය නිරාවරණයන් පිළිගත හැකි අවදානම් සීමාවන් තුළ පවත්වා ගනිමින්, අක්‍රිය වත්කම් ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සහ අවම මට්ටමක පවත්වා ගැනීම සහතික කිරීම
අවදානම්-ගැලපුම් ප්‍රතිලාභ උපරිම කිරීම	අදාළ ණය අවදානමට සාපේක්ෂව ණය පහසුකම් සඳහා නිවැරදි මිලකරණයක් සිදු කිරීම මගින් ව්‍යාපාරික වර්ධනය සහ ලාභදායීත්වය අතර සමබරතාවයක් පවත්වා ගැනීම.
කළඹ විවිධාංගීකරණය සහතික කිරීම	විවිධ අංශ, නිෂ්පාදන, භූගෝලීය කලාප සහ ප්‍රතිපාර්ශ්වකරුවන් අතර විචක්ෂණශීලී නිරාවරණ සීමාවන් පවත්වා ගනිමින්, ණය කළඹේ සාන්ද්‍රණ අවදානම අවම කිරීම
ප්‍රාග්ධනය සහ ද්‍රවශීලතාව සුරක්ෂිත කිරීම	ව්‍යවස්ථාපිත ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය ආරක්ෂා වන පරිදි සහ ද්‍රවශීලතා ඔරොත්තු දීමේ හැකියාවට සහාය වන පරිදි ණය නිරාවරණයන් කළමනාකරණය කිරීම.
පූර්ව අනතුරු ඇඟවීමේ සහ අධීක්ෂණ යාන්ත්‍රණ ශක්තිමත් කිරීම්	පද්ධතිගත අධීක්ෂණය, ගිවිසුම්ගත කොන්දේසි (covenants) නිරීක්ෂණය සහ කළඹ සමාලෝචන මගින් ණය තත්ත්වය පිරිහී යාමේ මුල් ලක්ෂණ කල්තබා හඳුනා ගැනීම
ආතති ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීම	ආතති පරීක්ෂණ සහ අවස්ථා විශ්ලේෂණය මගින් සාර්ව ආර්ථික කම්පනයන්හි බලපෑම ඇගයීම සහ එමඟින් අහිතකර තත්ත්වයන් යටතේ පවතින සූදානම සහතික කිරීම.
නියාමන අනුකූලතාවය සහතික කිරීම	අදාළ නියාමන අවශ්‍යතා, විචක්ෂණශීලී මාර්ගෝපදේශ සහ අභ්‍යන්තර ප්‍රතිපත්ති සමඟ ණය ක්‍රියාවලීන් අනුගත කිරීම.

ණය අවදානම් කළමනාකරණ පාලන ව්‍යුහය



අධ්‍යක්ෂ මණ්ඩල විධායක ණය කමිටුව

අධ්‍යක්ෂ මණ්ඩල විධායක ණය කමිටුව (BECC), බැංකුවේ ණය අවදානම් කළමනාකරණ කටයුතු අධීක්ෂණය කරයි

මණ්ඩල විධායක ණය කමිටුවේ (BECC) වගකීම්

- ව්‍යාපාරික අවශ්‍යතා සහ සාර්ව ආර්ථික තත්ත්වයන් සැලකිල්ලට ගනිමින්, අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදෙස් මත ණය ප්‍රතිපත්ති සම්පාදනය සහ යාවත්කාලීන කිරීම.
- අධ්‍යක්ෂ මණ්ඩලයේ එකඟතාවය ඇතිව, විශාල මට්ටමේ සහ ඉහළ අවදානමක් සහිත ණය නිරාවරණයන් කළමනාකරණය කිරීම සඳහා විධිමත් ණය අනුමත කිරීමේ ව්‍යුහයන් සකස් කිරීම.
- අනිසි ණය සාන්ද්‍රණයන් (undue risk concentrations) වළක්වා ගැනීම සඳහා තනි ණය නිරාවරණයන් සහ සමස්ත ණය කළඹ පිළිබඳව වරින් වර සමාලෝචන පැවැත්වීම.
- අවදානම් ශ්‍රේණිගත කිරීමේ පද්ධති (risk rating systems) සහ අවදානම් මත පදනම් වූ මිලකරණ ආකෘති (risk-based pricing models) සංවර්ධනය කිරීම සහ පවත්වාගෙන යාම.
- පූර්ව නිර්වචනය කරන ලද සීමාවන්ට ඉහළින් පවතින ණය යෝජනා ස්වාධීනව ඇගයීම, අනුමත කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම.
- බැංකුවේ අවදානම් රුචියට (risk appetite) අනුකූලව රාජ්‍ය ව්‍යවසායයන් සඳහා වන ණය නිරාවරණයන් විවක්ෂණශීලීව කළමනාකරණය කිරීම.

ණය අවදානම කළමනාකරණය කිරීම

ශක්තිමත් අවදානම් ප්‍රතිපත්ති සහ පාලන රාමුව

- **රාමුව සමාලෝචනය කිරීම:** අධ්‍යක්ෂ මණ්ඩල විධායක ණය කමිටුව මගින් ණය අවදානම් රාමුව සමාලෝචනය සහ යාවත්කාලීන කරනු ලබයි.
- **ණය සංස්කෘතිය:** අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ණය ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි උපදෙස් මාලාව

ණය අධීක්ෂණය සහ සමාලෝචනය

- අඛණ්ඩ අධීක්ෂණය සහ ස්වාධීන සමාලෝචනය
- අධ්‍යක්ෂ මණ්ඩල විධායක ණය කමිටුව (BECC) සහ අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC) වෙත නිතිපතා වාර්තා ඉදිරිපත් කිරීම

වගකීම් සහගත ණය දීමේ සංස්කෘතිය

- අවදානම් පිළිබඳ දැනුවත්භාවය සහ පුහුණුව
- ණය ඇගයීම සහ ණයගැතියන් තක්සේරු කිරීම

විචක්ෂණශීලී ණය සීමාවන්

- අංශ පදනම් කරගත් ණය සීමාවන්
- නියාමන අනුකූලතාවය

බලතල වෙන් කිරීම

- අධ්‍යක්ෂ මණ්ඩල අධීක්ෂණය සහ ණය බලතල පැවරීම
- අවදානම් පිළිගැනීමේ සහ අනුමත කිරීමේ නිර්ණායක
- ණය නිකුත් කිරීමෙන් පසු සිදුකරන වෙනස්කම්

අයකර ගැනීම සහ පුනරුත්ථාපනය

- සම්මත ණය අයකර ගැනීමේ ක්‍රියා පටිපාටිය
- විසඳීරණ පුනරුත්ථාපන ක්‍රියාවලිය

ණයගැතියන්ගේ අවදානම් ශ්‍රේණිගත කිරීම

- ණය ඇගයීමේ ප්‍රවේශයන්
- අවදානම් ශ්‍රේණිගත කිරීම සහ සමාලෝචනය

ණය දුර්වලතා සහ පුහුණුව

- ණය දුර්වලතා ප්‍රතිපත්තිය සහ තක්සේරු කිරීම්
- නිරන්තර ණය අංශ කාර්ය මණ්ඩල පුහුණුව

ණය අවදානම අවම කිරීම සහ ඇපකර කළමනාකරණය

- ණය අවදානම අවම කිරීමේ උපාය මාර්ග
- විසඳීරණ ඇපකර ප්‍රතිපත්තිය

ණය සංක්‍රමණ අවදානම

ණය සංක්‍රමණ අවදානම (Credit migration risk) යනු කාලයත් සමඟ ප්‍රතිපාර්ශ්වකරුවෙකුගේ ණය ගුණාත්මකභාවය පිරිහීමට හෝ වර්ධනය වීමට ඇති හැකියාවයි; මෙහි ප්‍රතිඵලයක් ලෙස අදාළ පාර්ශ්වයේ අභ්‍යන්තර හෝ බාහිර ණය ශ්‍රේණිගත කිරීම් වෙනස් විය හැකිය. සැබෑ ණය පාඩුවක් හැරීමක් සිදු නොවුවත්, එවැනි ශ්‍රේණිගත කිරීම්වල සිදුවන වෙනස්වීම් බැංකුවේ ණය සහ ආයෝජන කළඹවල වටිනාකම් තක්සේරු කිරීමට අහිතකර ලෙස බලපෑ හැකිය. ණය ශ්‍රේණිගත කිරීම් පහත වැටීම (Downgrade), අවදානම්-භරිත වත්කම් (Risk-weighted assets) ඉහළ යාමටත්, ඒ අනුව ප්‍රාග්ධන අවශ්‍යතා සහ ප්‍රතිපාදන මට්ටම් (Provisioning levels) ඉහළ නැංවීමටත් හේතු වේ. ණය අවදානම් අධීක්ෂණ රාමුවේ කොටසක් ලෙස බැංකුව විසින් ශ්‍රේණිගත කිරීම්වල සිදුවන සංක්‍රාන්ති (Rating transitions) අඛණ්ඩව නිරීක්ෂණය කරනු ලබයි. ස්ථාපිත අවදානම් පාලන ව්‍යුහයන් හරහා මෙන්ම, බැංකුවේ සමස්ත අවදානම් රුචිය සහ ප්‍රාග්ධන කළමනාකරණ රාමුවට අනුකූලව ණය සංක්‍රමණ අවදානම කළමනාකරණය කරනු ලැබේ.


2019-2025 කාලසීමාව තුළ ආයතනික ගනුදෙනුකරුවන්ගේ ශ්‍රේණිගත කිරීම් පහත වැටීම

වර්ෂය	සංක්‍රාන්ති අවස්ථාවේ පසුවන ගනුදෙනුකරුවන් සංඛ්‍යාව	ශ්‍රේණිගත කිරීම් පහත වැටුණු ගනුදෙනුකරුවන්ගේ ප්‍රතිශතය (%)
2019	318	20
2020	320	21
2021	321	11
2022	329	14
2023	300	37
2024	257	17
2025	246	15

උපරිම ණය නිරාවරණය

ආයතනික ගනුදෙනුකරුවන්ගේ අවදානම් පැතිකඩ

සංඛ්‍යාව



මට්ටම	ප්‍රතිපාදන ආවරණය 2025 (%)	2024 (%)
1 වන මට්ටම	0.61	1.31
2 වන මට්ටම	3.15	2.79
3 වන මට්ටම	48.88	41.92
සම්පූර්ණ	7.66	10.26

ණය සාන්ද්‍රණ අවදානම

ණය සාන්ද්‍රණ අවදානම යනු තනි ප්‍රතිපාර්ශ්වකරුවෙකු, සම්බන්ධිත ප්‍රතිපාර්ශ්වකරුවන්ගේ සමූහයක්, කාර්මික අංශයක්, භූගෝලීය කලාපයක් හෝ නිෂ්පාදන වර්ගයක් කෙරෙහි අධික ලෙස නිරාවරණය වීම හේතුවෙන් සිදුවිය හැකි මූල්‍ය අලාභයන්හි විභවතාවයි. එවැනි සාන්ද්‍රණයන් මඟින් අහිතකර ආර්ථික හෝ අංශ-විශේෂිත වර්ධනයන් හමුවේ බැංකුවේ වත්කම්වල ගුණාත්මකභාවය සහ ලාභදායීතාවය (Earnings) කෙරෙහි ඇති වන බලපෑම තීව්‍ර කළ හැකිය. මෙලෙස ඒකරාශී වූ (Concentrated) අංශයක සිදුවන පසුබෑමක් හේතුවෙන් ණය පැහැර හැරීම් ඉහළ යාම, වත්කම් දුර්වලතා (Impairments) වැඩි වීම සහ ප්‍රාග්ධන අවශ්‍යතා ඉහළ යාම සිදුවිය හැකිය.

නිර්වචනය කරන ලද නිරාවරණ සීමාවන්, ණය කළඹ අධීක්ෂණය සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයට මෙන්ම අධ්‍යක්ෂ මණ්ඩලයට නිතිපතා වාර්තා ඉදිරිපත් කිරීම මගින් බැංකුව ණය සාන්ද්‍රණ අවදානම කළමනාකරණය කරයි. ස්ථාපිත අවදානම් රුචියෙහි සීමාවන්ට (risk appetite thresholds) සාපේක්ෂව සාන්ද්‍රණ මිනුම් තක්සේරු කරනු ලබන අතර, අනිසි නිරාවරණයන් අවම කිරීම සඳහා විවිධ අංශ, ණයගැතියන් සහ භූගෝලීය කලාප හරහා ණය කළඹ විවිධාංගීකරණය කිරීම දිරිමත් කරනු ලැබේ. යම් සාන්ද්‍රණයක් හඳුනාගත් අවස්ථාවලදී, සමබර සහ ඔරොත්තු දෙන ණය කළඹක් පවත්වා ගැනීම සඳහා සුදුසු අවදානම් අවම කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරනු ලබයි.

බැංකුවේ ප්‍රධාන නිරාවරණයන් සිල්ලර හා පුද්ගලික ණය, ව්‍යවසාය ණය, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරික (SME) ණය, සංවර්ධන මූල්‍යකරණය, රාජ්‍ය ව්‍යවසාය (SOE) සහ උකස් පහසුකම් වලින් සමන්විත වේ. මෙම අංශ මගින් වඩාත් සමබර ණය කළඹක් නිර්මාණය කරන අතර එය අන්තර්වේදී ආර්ථික වර්ධනයට (inclusive economic growth) සහාය දක්වයි. සලකා බලනු ලබන වසර තුළ, ඇතැම් රාජ්‍ය ව්‍යවසායයන් (SOE) වෙත පවතින නිරාවරණයන් තවදුරටත් අඩු කිරීමටත්, සාන්ද්‍රණ මට්ටම් ක්‍රියාකාරීව අධීක්ෂණය කිරීමටත් බැංකුව පියවර ගත්තේය. එමෙන්ම, ණය නිරාවරණයන් අනුමත අවදානම් රුචියෙහි සීමාවන් තුළ පවත්වා ගැනීම සහතික කිරීම සඳහා ණය වෙන් කිරීමේ උපාය මාර්ගයන් (credit allocation strategy) සකස් කරන ලද අතර, එමඟින් සමස්ත ණය කළඹේ ඔරොත්තු දීමේ හැකියාව සහ තිරසාරභාවය ශක්තිමත් කරන ලදී.

විශාල ණය නිරාවරණයන්හි සාන්ද්‍රණය (රු. මිලියන 100 ට වැඩි)

2024 දෙසැම්බර් 31 දිනට	කර්මාන්ත අංශ සංඛ්‍යාව	තනි ගනුදෙනුකරුවන් සංඛ්‍යාව	ඍජු නිරාවරණය (රු.මි.)	වක්‍ර නිරාවරණය (රු.මි.)	එකතුව (රු.මි.)	ශේෂ පත්‍රයේ ප්‍රතිශතයක් ලෙස ඍජු නිරාවරණය (%)
රාජ්‍ය ව්‍යවසායයන් (SOE) සහිතව	18	433	698,922	69,035	767,957	21.19
රාජ්‍ය ව්‍යවසායයන් (SOE) රහිතව	17	395	254,155	43,584	297,739	9.03

2025 දෙසැම්බර් 31 දිනට	කර්මාන්ත අංශ සංඛ්‍යාව	තනි ගනුදෙනුකරුවන් සංඛ්‍යාව	ඍජු නිරාවරණය (රු.මි.)	වක්‍ර නිරාවරණය (රු.මි.)	එකතුව (රු.මි.)	ශේෂ පත්‍රයේ ප්‍රතිශතයක් ලෙස ඍජු නිරාවරණය (%)
රාජ්‍ය ව්‍යවසායයන් (SOE) සහිතව	18	481	732,838	87,458	820,296	20
රාජ්‍ය ව්‍යවසායයන් (SOE) රහිතව	16	454	387,689	63,786	451,475	10

බැංකුවේ ඉහළම ගනුදෙනුකරුවන් 20 දෙනාගේ තත්ත්වය

වර්ෂය	ඉහළම 3%	ඉහළම 5%	ඉහළම 10%	ඉහළම 20%
රාජ්‍ය ව්‍යවසාය ඇතුළත්ව				
2024	39	49	60	68
2025	32	40	51	62
රාජ්‍ය ව්‍යවසාය හැර				
2024	19	25	34	47
2025	18	23	32	45

එක් එක් සාන්ද්‍රණ මට්ටම් සඳහා අනුගත සීමා (Tolerance Levels)


මිනුම (Metrix)	අඩු සාන්ද්‍රණය	මධ්‍යස්ථ සාන්ද්‍රණය	ඉහළ සාන්ද්‍රණය
HHI	<0.15	0.15-0.25	>0.25

2025 වසර සඳහා කාර්තුමය තත්ත්වය

	2025 මාර්තු 31	2025 ජූනි 30	2025 සැප්තැම්බර් 30	2025 දෙසැම්බර් 31
නාමික සාන්ද්‍රණය (රාජ්‍ය ව්‍යවසාය ඇතුළත්ව)	0.07	0.07	0.06	0.06
නාමික සාන්ද්‍රණය (රාජ්‍ය ව්‍යවසාය රහිතව)	0.02	0.02	0.02	0.02
අංශීය සාන්ද්‍රණය (රාජ්‍ය ව්‍යවසාය ඇතුළත්ව)	0.11	0.11	0.11	0.12
අංශීය සාන්ද්‍රණය (රාජ්‍ය ව්‍යවසාය රහිතව)	0.13	0.13	0.15	0.17


පහත දැක්වෙන දෘශ්‍ය නිරූපණයන් මගින් ඉහළ සාන්ද්‍රණයක් සහිත ක්ෂේත්‍ර ඉස්මතු කර පෙන්වන අතර, එමගින් බැංකුවේ සමස්ත අවදානම් තත්ත්වය සහ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම සඳහා ක්‍රියාකාරී අවදානම් කළමනාකරණයකට සහ දැනුවත් උපායමාර්ගික තීරණ ගැනීමකට ඉඩ ප්‍රස්ථාව ලබා දෙයි.

බැංකු මට්ටමින් අනාවරණය/නිෂ්පාදිත පදනමින්




- පුද්ගලික ණය
- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය
- ව්‍යවසාය ණය
- මුදල් ඇප මත ලබාගත් ණය
- රාජ්‍ය ව්‍යවසාය ණය +DST
- උකස් සේවා
- සමස්ත ණය පත් (Credit Card) ශේෂය
- සමස්ත කාර්ය මණ්ඩල ණය
- වෙනත් (මහලේඛන අයකර ගැනීම්, OCS ආදිය)
- ස්ථාවර සමස්ත ශේෂය (Hard Core Total)

භූගෝලීය වශයෙන්/කලාපීය වශයෙන් අනාවරණය



- මධ්‍යම ව්‍යාපාරික දිස්ත්‍රික්කය (CBD)
- අක්වෙරළ ඒකකය
- අම්පාර
- අනුරාධපුරය
- බදුල්ල
- මඩකලපුව
- කොළඹ නැගෙනහිර
- කොළඹ උතුර
- කොළඹ දකුණ
- කොළඹ බටහිර
- ගාල්ල
- ගම්පහ
- හම්බන්තොට
- යාපනය
- කළුතර
- මහනුවර
- කෑගල්ල
- කුරුණෑගල
- මාතලේ
- මාතර
- මොණරාගල
- නුවරඑළිය
- පොළොන්නරුව
- පුත්තලම
- රත්නපුරය
- ත්‍රිකුණාමලය
- වව්නි

අංශීය පදනම්න් ණය අනාවරණය



ණය අවදානම් ආතති පරීක්ෂාව – 2025

	සුළු %	මධ්‍යස්ථ %	ප්‍රධාන %
ඉහළ අවදානම් සහිත පරිසරයකදී, 1 වන අදියරේ කාණ්ඩයේ සිට 2 වන අදියරේ කාණ්ඩය දක්වා සංක්‍රමණය වීම හේතුවෙන් ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවයේ අනුපාතය (CAR) මත හානිකරණ බලපෑම ඉහළ යාම.			
ප්‍රතිශෝධිත පළමු පෙළ ප්‍රාග්ධන අනුපාතය	12.12	12.05	11.98
ප්‍රතිශෝධිත සමස්ත ප්‍රාග්ධන අනුපාතය	16.41	16.34	16.28
2 වන අදියරේ කාණ්ඩයේ සිට 3 වන අදියරේ කාණ්ඩය දක්වා සංක්‍රමණය වීම			
ප්‍රතිශෝධිත පළමු පෙළ ප්‍රාග්ධන අනුපාතය	12.06	11.94	11.82
ප්‍රතිශෝධිත සමස්ත ප්‍රාග්ධන අනුපාතය	16.35	16.23	16.11
1 වන අදියරේ කාණ්ඩයේ සිට 2 වන අදියරේ කාණ්ඩය දක්වා සහ 2 වන අදියරේ කාණ්ඩයේ සිට 3 වන අදියරේ කාණ්ඩය දක්වා සිදුවන සමකාලීන සංක්‍රමණයන්			
ප්‍රතිශෝධිත පළමු පෙළ ප්‍රාග්ධන අනුපාතය	12.00	11.81	11.62
ප්‍රතිශෝධිත සමස්ත ප්‍රාග්ධන අනුපාතය	16.29	16.10	15.92
පැහැර හැරීමකදී සිදුවන අලාභය (LGD) මත කම්පනය			
ප්‍රතිශෝධිත පළමු පෙළ ප්‍රාග්ධන අනුපාතය	12.14	12.09	12.04
ප්‍රතිශෝධිත සමස්ත ප්‍රාග්ධන අනුපාතය	16.43	16.38	16.34
පැහැර හැරීමේ සම්භාවිතාව (PD) සහ පැහැර හැරීමකදී සිදුවන අලාභය (LGD) මත කම්පනය			
ප්‍රතිශෝධිත පළමු පෙළ ප්‍රාග්ධන අනුපාතය	11.89	11.57	11.22
ප්‍රතිශෝධිත සමස්ත ප්‍රාග්ධන අනුපාතය	16.18	15.86	15.51
විශාල පරිමාණයේ ණයගැතියන් විසින් ණය පැහැර හැරීම			
ප්‍රතිශෝධිත පළමු පෙළ ප්‍රාග්ධන අනුපාතය	11.92	11.80	11.67
ප්‍රතිශෝධිත සමස්ත ප්‍රාග්ධන අනුපාතය	16.22	16.09	15.96
ප්‍රධාන කර්මාන්ත තුනක් විසින් ණය පැහැර හැරීම			
ප්‍රතිශෝධිත පළමු පෙළ ප්‍රාග්ධන අනුපාතය	11.66	11.15	10.63
ප්‍රතිශෝධිත සමස්ත ප්‍රාග්ධන අනුපාතය	15.96	15.44	14.92

ඉදිරි මග

1
ණයගැති අවදානම් ශ්‍රේණිගත කිරීම් යාවත්කාලීන කිරීම

- සියලුම ව්‍යාපාරික කාණ්ඩ යටතේ ණයගැති අවදානම් ශ්‍රේණිගත කිරීම් පිළිබඳ පුළුල් යාවත්කාලීන කිරීමක් සිදු කිරීම.

2
LMS පුහුණු වැඩසටහන්

- ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය (LMS) හරහා පුහුණු කටයුතු තවදුරටත් ශක්තිමත් කිරීම.

3
ණය පටිපාටි උපදෙස් මාලාව විධිමත් කිරීම

- ණය ඇගයීම සඳහා වන මාර්ගෝපදේශ සහ පාලන ක්‍රමවේදයන් වැඩිදියුණු කිරීම.

4
ණය ඇගයීමේදී දේශගුණික අවදානම සලකා බැලීම

- ණය ඇගයීම් ක්‍රියාවලියට දේශගුණික අවදානම් සාධක ඒකාබද්ධ කිරීම.

5
වැඩිදියුණු කළ පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති

- පුරෝකථන අධීක්ෂණය සහ තොරතුරු ඉහළ කළමනාකාරිත්වයට වාර්තා කිරීමේ (Escalation) මෙවලම් වැඩිදියුණු කිරීම.

6
ආකෘති වලංගුකරණය (Model validation)

- ස්වාධීන වලංගුකරණය සහ පසුකාලීන පරීක්ෂාවන් (Back-testing) සිදු කිරීමේ ක්‍රියාවලීන්.

වෙළෙඳපොළ අවදානම

පොලී අනුපාත, විදේශ විනිමය අනුපාත, කොටස් මිල සහ භාණ්ඩ මිල වැනි වෙළෙඳපොළ විචල්‍යයන්හි අහිතකර වෙනස්වීම් හේතුවෙන් බැංකුවේ ගනුදෙනු සහ බැංකුකරණ අංශයන්හි (Trading and Banking Books) ඇති විය හැකි මූල්‍ය අලාභයන් වෙළෙඳපොළ අවදානම ලෙස අර්ථ දැක්වේ.

බැංකුවේ වෙළෙඳපොළ අවදානම් අනාවරණය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපාන්නේ ගනුදෙනු අංශයේ සහ බැංකුකරණ අංශයේ පැන නගින පොලී අනුපාත අවදානමයි. වෙළෙඳපොළ පොලී අනුපාතවල සිදුවන වෙනස්වීම්, බැංකුවේ ඉපැයීම් මෙන්ම වත්කම් සහ වගකීම්වල ආර්ථික වටිනාකම කෙරෙහි ද බලපෑම් කළ හැකි අතර, මෙම අනාවරණයන් අනුමත අවදානම් පරාමිතීන් තුළ සමීපව අධීක්ෂණය කරනු ලැබේ.


මීට අමතරව, බැංකුවේ උකස් කළඹ ආශ්‍රිතව රන් මිලෙහි සිදුවන උච්චාවචනයන් හේතුවෙන් බැංකුව භාණ්ඩ මිල අවදානමට ද නිරාවරණය වේ. වෙළෙඳපොළ ගතිකත්වයන්ට සාපේක්ෂව රන් මිලෙහි පවත්නා සංවේදීතාව සැලකිල්ලට ගෙන, සුදුසු අවදානම් අවම කිරීමේ පියවරයන්ට යටත් ව මෙම අනාවරණය අබණ්ඩව අධීක්ෂණය කරනු ලබයි.


ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කරන ලද නියාමන ශුද්ධ විවෘත ස්ථාවරය (Net Open Position) පිළිබඳ සීමාවන් දැඩි ලෙස අනුගමනය කිරීම මගින් සහ විදේශ විනිමය ගනුදෙනු පාලනය කිරීම සඳහා ස්ථාපිත කර ඇති පැහැදිලි අභ්‍යන්තර අනාවරණ සීමාවන් මගින් විදේශ විනිමය අවදානම කළමනාකරණය කරනු ලැබේ. බැංකුව විසින් තීරණය කර ඇති අවදානම් රුචිය තුළ විදේශ විනිමය ස්ථාවරයන් පවත්වාගෙන යාම අබණ්ඩ අධීක්ෂණය මගින් සහතික කෙරේ.

ලැයිස්තුගත සුරැකුම්පත්වල බැංකුවේ ගනුදෙනු කළඹ සාපේක්ෂව කුඩා බැවින්, කොටස් මිල අවදානම කෙරෙහි ඇති අනාවරණය අවම මට්ටමක පවතී. අනාවරණයන් ඵලදායී ලෙස හඳුනා ගැනීම, මැනීම, අධීක්ෂණය සහ පාලනය සහතික කිරීම සඳහා පුළුල් වෙළෙඳපොළ අවදානම් කළමනාකරණ රාමුවක් ක්‍රියාත්මක වේ. සංවේදීතා විශ්ලේෂණය, පරතර විශ්ලේෂණය, කාල සීමා විශ්ලේෂණය, ආතති පරීක්ෂාව සහ අවස්ථා විශ්ලේෂණය වැනි ප්‍රමාණාත්මක සහ ගුණාත්මක මෙවලම් භාවිතයෙන් අවදානම් තක්සේරු කරනු ලැබේ.

මෙම ක්‍රමවේදයන් මගින්, වෙළෙඳපොළ අස්ථාවරත්වය බැංකුවේ ඉපැයීම් සහ ආර්ථික වටිනාකම කෙරෙහි ඇති කළ හැකි බලපෑම ඇගයීමට බැංකුවට හැකියාව ලැබෙන අතර, මූල්‍ය ස්ථාවරත්වය සහ කොටස්හිමියන්ගේ වටිනාකම සුරක්ෂිත කරමින් සියලු අනාවරණයන් නියමිත අවදානම් රුචිය තුළ පවත්වා ගැනීමට ඉඩ සැලසේ.

වෙළෙඳපොළ අවදානම පිළිබඳ පාලන ව්‍යුහය





බැංකුවේ වෙළෙඳපොළ අවදානම් අනාවරණයන් අධීක්ෂණය කිරීම, ප්‍රතිපත්ති සහ අවදානම් රුචිය පිළිබඳ සීමාවන් සම්පාදනය කිරීම සහ වෙළෙඳපොළ අවදානම් කළමනාකරණය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම.

වෙළෙඳපොළ අවදානම් කළමනාකරණ රාමුව ක්‍රියාත්මක කිරීම, අනුමත අවදානම් රුචිය තුළ වෙළෙඳපොළ අවදානම් අනාවරණයන් පවත්වා ගැනීම, සුදුසු මිලකරණ ව්‍යුහයන් නිර්දේශ කිරීම සහ මූල්‍ය වෙළෙඳපොළවලින් පැන නගින අවදානම් විශ්ලේෂණය කර ඒවා අවම කිරීමේ පියවර නිර්දේශ කිරීම සඳහා වත්කම් සහ වගකීම් කළමනාකරණ කමිටුව (ALCO) වගකීම දරයි.

වෙළෙඳපොළ අවදානම් ඇගයීම, අධීක්ෂණය සහ වාර්තා කිරීම ඇතුළු දෛනික අවදානම් කළමනාකරණ කටයුතු සඳහා අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව (RMD) වගකීම දරයි.


භාණ්ඩාගාර මධ්‍ය කාර්යාලය (TMO), භාණ්ඩාගාරයේ ඉදිරිපස කාර්යාල සහ පසුපස කාර්යාල කටයුතුවලින් ස්වාධීනව, බැංකුවේ භාණ්ඩාගාර ගනුදෙනු මැනීම සහ අධීක්ෂණය කිරීම සිදු කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අවදානම් සීමාවන්ට අනුකූලව කටයුතු කිරීම භාණ්ඩාගාර මධ්‍ය කාර්යාලය (TMO) විසින් සහතික කරනු ලබයි.

2024 සහ 2025 සංසන්දනාත්මක වෙළෙඳපොළ අවදානම් අනාවරණය

	2025			2024		
	වෙනත් විස්තීර්ණ ආදායම හරහා සාධාරණ අගයෙන් මිණුම්ගත මූලය වත්කම් (රු.මි.)	ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගයෙන් මිණුම්ගත මූලය වත්කම් (රු.මි.)	ක්‍රමක්ෂය පිරිවැය මත මිණුම්ගත ණය උපකරණ (රු.මි.)	වෙනත් විස්තීර්ණ ආදායම හරහා සාධාරණ අගයෙන් මිණුම්ගත මූලය වත්කම් (රු.මි.)	ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගයෙන් මිණුම්ගත මූලය වත්කම් (රු.මි.)	ක්‍රමක්ෂය පිරිවැය මත මිණුම්ගත ණය උපකරණ (රු.මි.)
වත්කම්						167,697
භාණ්ඩාගාර බිල්පත්	–	303,124	276,531	–	325,061	948,540
භාණ්ඩාගාර බැඳුම්කර	–	3,816	945,251	–	4,441	10,799
ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර (SLDB)	–	–	–	–	–	–
ශ්‍රී ලංකා රජයේ බැඳුම්කර (GOSL Bonds)	–	–	–	–	–	–
වෙනත් ආයෝජන	10,181	–	–	9,423	308	–
වගකීම්	–	–	–	–	–	–
ණයකර	–	–	40,553	–	–	54,156
ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර (ISB)	–	–	11,060	–	–	–
දේශීය ඩොලර් බැඳුම්කර	–	–	932	–	–	–

වෙළෙඳපොළ අවදානම පිළිබඳ පාලන ව්‍යුහය

- නිෂ්පාදනය, අංශය, ණය ශ්‍රේණිගත කිරීම සහ භූගෝලීය පදනම මත අවදානම් සීමාවන් අධීක්ෂණය කරනු ලැබේ.
- භාණ්ඩාගාර මධ්‍යපෙළ කාර්යාලය (TMO) මගින් අනුමත සීමාවන්ට සාපේක්ෂව බැංකුවේ ක්‍රියාකාරිත්වය අධීක්ෂණය කර ඒ පිළිබඳව ALCO සහ BIRMC වෙත මාසිකව වාර්තා කරනු ලැබේ.
- මෙම සීමාවන් අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව මගින් වරින් වර සමාලෝචනය කරනු ලබන අතර, BIRMC සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබේ.
- භාණ්ඩාගාර කළමනාකරණ ප්‍රතිපත්තිය, ආයෝජන ප්‍රතිපත්තිය, අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය, ආතති පරීක්ෂණ ප්‍රතිපත්තිය සහ රටවල් සඳහා අනාවරණ සීමා පිළිබඳ ප්‍රතිපත්තිය සහ බැංකුවේ කොටස් වෙළෙඳපොළ අනාවරණයන් සඳහා වූ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය යන ප්‍රතිපත්තීන්ගෙන් බැංකුවේ වෙළඳපල අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති රාමුව සමන්විත වේ.



- වෙළෙඳපොළ අවදානම් ඇගයීම සඳහා භාවිත වන මෙවලම් අතරට පහත ඒවා ඇතුළත් වේ:
- අවදානමේ වටිනාකම (Value at Risk – VaR), කාලසීමා පරතරය (Duration gap), සංවේදීතා විශ්ලේෂණය (Sensitivity Analysis) සහ ආතති පරීක්ෂාව (Stress Testing)
- තක්සේරු අනුපාත සහ ක්‍රමවේදයන් ස්වාධීන සත්‍යාපනයකට යටත් වේ.
- වෙළෙඳපොළ අවදානම් අනාවරණයන්, අවදානම් රුචිකත්ව ප්‍රකාශය (Risk Appetite Statement) මගින් නියම කර ඇති මට්ටම් තුළ පවත්වා ගැනීම සහතික කරනු වස්, නිශ්චිත කළමනාකරණ ක්‍රියාමාර්ග ගැනීම සඳහා හේතු වන අවදානම් සීමාවන් (Risk thresholds) පනවා ඇත.

2025 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන වෙළෙඳපොළ අවදානම් සීමාවන් සහ තත්වයන්

වෙළෙඳපොළ අවදානම		වෙළෙඳපොළ අවදානම් රුචිය	
		අනුමත සීමාව	2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
විදේශ විනිමය ශුද්ධ විවෘත තත්වය		ඇ.ඩො.මි. +10/-25	අනුකූල වේ
අවදානමේ වටිනාකම (VaR) (99% විශ්වාසනීය මට්ටම, දින 1)	ව්‍යවහාර මුදල	ඇ.ඩො. 250,000	අනුකූල වේ
	පොළී අනුපාත	රු.බි. 3.4 (ගනුදෙනු)	අනුකූල වේ
සමුච්චිත අලාභ (උපලබ්ධි වූ) - FIS ගනුදෙනු	උපලබ්ධි වූ ගනුදෙනු	රු.මි. 3 (දිනකට)	අනුකූල වේ
	(උපලබ්ධි නොවූ)	රු.මි. 500	අනුකූල වේ
විදේශ විනිමය ඉදිරි පරතර සීමාව		ඇ.ඩො.මි. 600 මාස	අනුකූල වේ
රජයේ සුරැකුම්පත්	විකිණීම සඳහා පවතින	රු.බි. 450	අනුකූල වේ
	පිරිහී යන පිරිවැය මත පදනම් වූ ආයෝජන	රු.බි. 1,600	අනුකූල වේ
	අනෙකුත් විස්තීරණ ආදායම හරහා සාධාරණ අගය යටතේ වන අයෝජන	රු.බි. 20	අනුකූල වේ
ජාත්‍යන්තර ස්වෛර් බැඳුම්කර (ISB)	වෙළඳ	ඇ.ඩො.මි. 20	අනුකූල වේ
	ආයෝජන	ඇ.ඩො.මි. 55	අනුකූල වේ
ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර (SLDB)		ඇ.ඩො.මි. 50	අනුකූල වේ
අන්තර් බැංකු ණය ගැනීම්	සමස්ත සීමාව	ඇ.ඩො.මි. 1,046.68	අනුකූල වේ
	කෙටි කාලීන සීමාව	ඇ.ඩො.මි. 261.67	අනුකූල වේ
පවත්නා වටිනාකමේ පදනම් ස්ථාන (PVBP) සීමාව		රු.මි. 25	අනුකූල වේ
Guilt ඒකක භාර		රු.බි. 2.5	අනුකූල වේ
ආයතනික ණය සීමාව (ණයකර)		රු.බි. 15	අනුකූල වේ
බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරණ ඒකක සඳහා (PDU) ප්‍රති මූල්‍ය ගිවිසුම් සීමාව		රු.බි. 3.0	අනුකූල වේ
Haircut සීමාව		10%	අනුකූල වේ
Swap අරමුදල් සඳහා වන සීමාව		මාස 3කට අඩු කාලසීමාවන් සඳහා o/s වලින් 75%	අනුකූල වේ
පොළී අනුපාත අවදානම (D-Gap + VaR on Fwd.Fx)		රු.බි. 17.5	අනුකූල වේ
කොටස් ගනුදෙනු කළඹ තුළ ආයෝජන වටිනාකම		කළඹ 1: රු.බි. 1 කළඹ 2: රු.බි. 1	අනුකූල වේ
S&P SL20 දර්ශකය මත කොටස් ප්‍රතිශතය		25%	අනුකූල වේ

වෙළෙඳපොළ අවදානම් දළ විශ්ලේෂණය (උද්ධමනය)

දැඩි මුදල් ප්‍රතිපත්තිය, සැපයුම් තත්ත්වයන් වැඩිදියුණු වීම සහ මින් පෙර සිදු කරන ලද සාර්ව ආර්ථික ගැලපීම්වලින් පසුව පිරිවැය පීඩනය ලිහිල් වීම හේතුවෙන් 2025 වසරේදී උද්ධමනය පාලනය වූ මට්ටමක පැවතුණි. වසරේ මුල් භාගයේදී සම්පූර්ණ උද්ධමනය අඩු මට්ටමක පැවති අතර, බලශක්ති මිල පහත වැටීම සහ ඉල්ලුම සීමා වීම හේතුවෙන් උද්ධමනය අඩුවීමේ ප්‍රවණතාවක් නිරීක්ෂණය විය. වසර ගතවෙත්ම, දේශීය ඉල්ලුම ක්‍රමයෙන් ප්‍රකෘතිමත් වීම සහ පරිපාලිත මිල (Administered prices) සංශෝධනය කිරීම හේතුවෙන් උද්ධමනය ඉලක්කගත පරාසයට ළඟා විය. සමස්තයක් වශයෙන්, පසුගිය වසර තුළ මිල ස්ථායිතාව බොහෝ දුරට පවත්වා ගත් අතර එය ආර්ථික විශ්වාසය ඉහළ නැංවීමට දායක විය. කෙසේ වෙතත්, ගෝලීය වෙළෙඳ භාණ්ඩ මිල ගණන්, විනිමය අනුපාත විචලනයන් සහ දේශගුණික විපර්යාසයන් මත පදනම් වූ සැපයුම් බාධාවන්ගෙන් පැන නගින අවදානම් තවදුරටත් පැවතුණි.

පොළී අනුපාත උච්චාවචනය

මිල ස්ථායිතාව ආරක්ෂා කරන අතරම ආර්ථික ප්‍රතිසාධනයට සහාය වීම අරමුණු කරගත් සුපරීක්ෂාකාරී සහ මනාව සංතුලිත මුදල් ප්‍රතිපත්තිමය ස්ථාවරය පිළිබිඹු කරමින්, 2025 වසර තුළ පොළී අනුපාත පුළුල් ලෙස ස්ථාවර මට්ටමක පැවතුණි. පාලනය වූ උද්ධමනය සහ සාර්ව ආර්ථික තත්ත්වයන් වැඩිදියුණු වීම හමුවේ මහ බැංකුව සිය ප්‍රතිපත්ති පොළී අනුපාත ස්ථාවරව පවත්වා ගත් බැවින් ප්‍රතිපත්තිමය පොළී අනුපාතික පසුබිම අවම අස්ථාවරත්වයකින් යුක්ත විය. ද්‍රවශීලතාව ලිහිල් වීම සහ උද්ධමන අපේක්ෂාවන් මධ්‍යස්ථ වීමත් සමඟ වෙළෙඳපොළ පොළී අනුපාත ක්‍රමයෙන් සකස් වූ අතර, එය වසර පුරා ණය තත්ත්වයන් වැඩිදියුණු වීමට දායක විය. බාහිර සාධක සහ ගෝලීය මූල්‍ය තත්ත්වයන් හමුවේ පොළී අනුපාත ස්ථායිතාවයට බලපෑම් විල්ලවීමේ අවදානමක් නිරීක්ෂනය වුවද, සමස්ථයක් ලෙස වෙළඳපල පුරෝකථන හැකියාව ශක්තිමත් කරමින් පොළී අනුපාත උච්චාවචනය සීමා විය.

විනිමය අනුපාත උච්චාවචනය

පෙර පැවති අර්බුදකාරී කාලපරිච්ඡේදවල දක්නට ලැබුණු දැඩි උච්චාවචනයන්ට සාපේක්ෂව, පාලනය වූ මට්ටමක පැවති 2025 වසරේදී විනිමය අනුපාත උච්චාවචනය වඩාත් ස්ථාවර වෙළෙඳපොළ පරිසරයක් නිරූපණය කළේය. වැඩිදියුණු වූ විදේශ විනිමය ද්‍රවශීලතාව, මහ බැංකු මැදිහත්වීම් සහ ශුද්ධ විදේශ විනිමය මිලදී ගැනීම් හමුවේ ශ්‍රී ලංකා රුපියල සුළු වශයෙන් අවප්‍රමාණය වූ අතර, එය ක්‍රමවත් කෙටි කාලීන වෙළෙඳපොළ තත්ත්වයන් පවත්වා ගැනීමට දායක විය. මෙම පියවරයන් වෙළෙඳාම, ආයෝජන සහ මූල්‍ය සැලසුම්කරණය සඳහා අවශ්‍ය පුරෝකථන හැකියාව ඉහළ නැංවුවද, ආනයන ඉල්ලුමෙන් එල්ල වූ පීඩනය, සීමිත බාහිර සංචිත සහ ගෝලීය මූල්‍ය වර්ධනයන් මුදල් ඒකකයේ ස්ථාවරත්වයට තවදුරටත් අවදානම් මතු කළේය. සමස්තයක් ලෙස, කළමනාකරණය කරන ලද විනිමය අනුපාත රාමුව මගින් අධික විචල්‍යතාව අවම කිරීමට උපකාරී වූ අතර බාහිර අංශයේ ගතිකතාවයන් අධීක්ෂණය කිරීමේදී අඛණ්ඩ සුපරීක්ෂාකාරීත්වයේ වැදගත්කම එමගින් ඉස්මතු විය.

2025 වසරේ නිරීක්ෂණය වූ වෙළෙඳපොළ තත්ත්වයන්ට ප්‍රතිචාර වශයෙන්, වෙළෙඳපොළ අවදානම කළමනාකරණය කිරීමේදී බැංකුව විනයගරුක ප්‍රවේශයක් අනුගමනය කළේය. ස්ථාපිත පාලන රාමු, අභ්‍යන්තර සීමාවන් සහ විධිමත් වාර්තාකරණය හරහා පොලී අනුපාත, විදේශ විනිමය සහ භාණ්ඩ ආශ්‍රිත (උකස්) අවදානම් සඳහා වන අනාවරණයන් සක්‍රියව අධීක්ෂණය කරන ලදී. විභව වෙළෙඳපොළ වෙනස්වීම් අපේක්ෂා කරමින් කාලෝචිත වූ අවදානම් අවම කිරීමේ පියවර ක්‍රියාත්මක කිරීම සඳහා, ආතති පරීක්ෂාව සහ සංකල්පිත අවස්ථා විශ්ලේෂණය ඇතුළු අවදානම් මැනීමේ සහ අධීක්ෂණය කිරීමේ මෙවලම් තවදුරටත් ශක්තිමත් කිරීමට බැංකුව කටයුතු කළේය. මෙම ප්‍රයත්නයන් හරහා බැංකුව සිය නියමිත අවදානම් රුචිය (Risk appetite) තුළ රැඳී සිටීම, ස්ථාවර ඉපැයීම් පවත්වා ගැනීම සහ උච්චාවචනයන් හමුවේ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම සහතික වූ අතර, එය පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය දිනා ගැනීමට සහ නියාමන අපේක්ෂාවන් සමඟ අනුකූල වීමට ද හේතු විය.

පොලී අනුපාත අවදානම (IRR)

බැංකුපොතෙහි (Banking Book) සහ වෙළඳ පොතෙහි (Trading Book) පවතින වත්කම් සහ වගකීම්වල ප්‍රතිමිලකරණ කාලසීමාවන් (Repricing profiles) අතර පවතින නොගැලපීම් හේතුවෙන් බැංකුවේ පොලී අනුපාත අවදානම් අනාවරණය මූලික වශයෙන් පැන නගී. පොලී අනුපාතවල සිදුවන විචලනයන්, අරමුදල් පිරිවැය සහ වත්කම්වල ඵලදායීතාව (Yield) වෙනස් කිරීම මගින් ශුද්ධ පොලී ආදායමට බලපෑම් කළ හැකි අතර, පොලී අනුපාතවලට සංවේදී මූල්‍ය උපකරණවල සාධාරණ අගය කෙරෙහි ද බලපෑම් ඇති කරයි.

ව්‍යුහගත වත්කම් සහ වගකීම් කළමනාකරණ (ALM) රාමුවක් හරහා බැංකුව පොලී අනුපාත සඳහා වූ අවදානම කළමනාකරණය කරන අතර, ඒ සඳහා ප්‍රතිමිලකරණ පරතර විශ්ලේෂණය, කාලසීමාවන් අධීක්ෂණය කිරීම, අවදානම් සහිත ඉපැයීම් සහ ආර්ථික වටිනාකම් සංවේදීතා ඇගයීම් උපයෝගීකර ගනී. වෙළඳපොත (Banking Book) සඳහා වූ අනාවරණයන් සඳහා, අහිතකර වෙළෙඳපොළ විචලනයන්ගෙන් පැන නැගිය හැකි මූල්‍ය අලාභයන් මැනීමට අවදානම් සහිත අගය (VaR) ක්‍රමවේදයන් භාවිත කෙරේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අවදානම් රුචියට අනුකූලව අනාවරණ සීමාවන් පැනවීම සහ ඒවා අධීක්ෂණය කරනු ලබන අතර, අහිතකර පොලී අනුපාත කම්පන මගින් ප්‍රාග්ධනය සහ ලාභදායීතාව කෙරෙහි ඇති වන බලපෑම ඇගයීමට වරින් වර ආතති පරීක්ෂාවන් සිදු කරනු ලැබේ. වත්කම් සහ වගකීම් කළමනාකරණ කමිටුව (ALCO) මගින් මේ පිළිබඳ අධීක්ෂණය සිදු කරන අතර, අවශ්‍ය අවස්ථාවන්හිදී කාලෝචිත නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග සහතික කරනු ලබයි.

විවක්ෂණශීලී ශේෂ පත්‍ර කළමනාකරණය සහ විනයගරුක සීමාවන් අධීක්ෂණය කිරීම තුළින්, ස්ථාවර සහ තිරසාර මූල්‍ය කාර්යසාධනයක් පවත්වා ගනිමින් පොලී අනුපාත උච්චාවචනයන්ට අනවශ්‍ය ලෙස අනාවරණය වීම අවම කිරීම බැංකුවේ උත්සාහයයි.

වසරක කාලසීමාවක් සඳහා අවදානමට ලක්විය හැකි ඉපැයීම් (1%ක ශුද්ධ බලපෑම) – 2025

	මාස 1 දක්වා	මාස 1-3 දක්වා	මාස 3-6 දක්වා	මාස 6-12 දක්වා
ශුද්ධ වත්කම් (රු.මි.)	(112,847)	86,878	(81,169)	(1,169,480)
1% ක වෙනසක් සඳහා අලාභය (රු.මි.)	1,081	724	(507)	(2,924)


වත්කම් සහ වගකීම් සම්බන්ධයෙන් වූ නොගැලපීම් 2025

2025	මාස 1-3 දක්වා රු.මි.	මාස 3-6 දක්වා රු.මි.	මාස 6-12 දක්වා රු.මි.	වසර 1-3 දක්වා රු.මි.	වසර 3-5 දක්වා රු.මි.	වසර 5ට වැඩි රු.මි.
පොලී අනුපාත සංවේදී වත්කම්	408,053	398,252	347,667	594,274	374,419	855,782
පොලී අනුපාත සංවේදී වගකීම්	321,174	479,420	1,517,147	361,512	65,408	3,279
කාලපරිච්ඡේද පරතරය	86,878	(81,169)	(1,169,480)	232,762	309,011	852,503
සමුච්චිත පරතරය	(25,968)	(107,137)	(1,276,617)	(1,274,290)	(1,271,200)	(418,697)

2024	මාස 1 දක්වා රු.මි.	මාස 1-3 දක්වා රු.මි.	මාස 3-6 දක්වා රු.මි.	මාස 6-12 දක්වා රු.මි.	වසර 1-3 දක්වා රු.මි.	වසර 3-5 දක්වා රු.මි.	වසර 5ට වැඩි රු.මි.
පොලී අනුපාත සංවේදී වත්කම්	318,440	389,748	350,208	220,159	703,643	261,982	797,201
පොලී අනුපාත සංවේදී වගකීම්	278,190	375,584	436,269	1,357,803	267,501	192,382	3,490
කාලපරිච්ඡේද පරතරය	40,250	14,163	(86,061)	(1,137,644)	436,142	69,600	793,711
සමුච්චිත පරතරය	40,250	54,413	(31,648)	(1,169,292)	(733,150)	(663,550)	(130,161)

කාලසීමා පරතර විශ්ලේෂණය (DGap) ඇසුරින් පොලී අනුපාතවල 1% ක අහිතකර වෙනසක් හේතුවෙන් කොටස් ප්‍රාග්ධනයේ වෙළෙඳපොළ වටිනාකම (MV) මත බලපෑම

රු.මි.



පොලී අනුපාත අවදානම් ආතති පරීක්ෂාව

	කම්පනයේ ප්‍රමාණය 0.25%	කම්පනයේ ප්‍රමාණය 0.50%	කම්පනයේ ප්‍රමාණය 1.00%
2025			
ඉපැයීම් මත බලපෑම (රු.මි.)	1,662	3,323	6,646
සංශෝධිත සමස්ත ප්‍රාග්ධන ප්‍රමාණතා අනුපාතය (CAR) (%)	16.34	16.21	15.95
2024			
ඉපැයීම් මත බලපෑම (රු.මි.)	1,437	2,874	5,748
සංශෝධිත සමස්ත ප්‍රාග්ධන ප්‍රමාණතා අනුපාතය (CAR) (%)	16.41	16.28	16.02

විනිමය අනුපාත අවදානම

විදේශ විනිමය අනුපාතවල සිදුවන අහිතකර විචලනයන් හේතුවෙන් බැංකුවේ ඉපැයීම් සහ ප්‍රාග්ධනය කෙරෙහි ඇති විය හැකි බලපෑම විනිමය අනුපාත අවදානම මගින් නිරූපණය වේ. බැංකුවේ අවදානම් අනාවරණය ප්‍රධාන වශයෙන් පැන නගින්නේ පාරිභෝගික අවශ්‍යතා මත පදනම් වූ විදේශ විනිමය ගනුදෙනු, ස්වයං විවෘත තත්වයන් (Proprietary open positions) සහ විදේශ විනිමය මත පදනම් වූ වත්කම් සහ වගකීම් මගිනි. විනිමය අනුපාතවල සිදුවන උච්චාවචනයන් ශුද්ධ වෙළඳ ආදායම, ප්‍රතිප්‍රමාණික ලාභ හෝ අලාභ සහ බැංකුවේ සමස්ත මූල්‍ය තත්ත්වය කෙරෙහි බලපෑ හැකිය. ඒ අනුව, විදේශ විනිමය අනාවරණයන් පැහැදිලිව අර්ථ දක්වා ඇති නියාමන සහ අභ්‍යන්තර සීමාවන් තුළ කළමනාකරණය කරනු ලබන අතර, ශුද්ධ විවෘත තත්වයන් (Net open positions) සහ විනිමය වෙනස්වීම් කෙරෙහි පවත්නා සංවේදීතාව අඛණ්ඩව අධීක්ෂණය කිරීම මගින් එම කළමනාකරණ කටයුතු තහවුරු කෙරේ.

විදේශ විනිමය සම්බන්ධයෙන් වන වගකීම්/බැඳීම් විචක්ෂණශීලීව කළමනාකරණය කරමින් සහ පාරිභෝගික අවශ්‍යතා කාලෝචිත ලෙස සපුරාලමින්, වසර තුළ විදේශ විනිමය (FCY) ප්‍රේෂණ ක්ෂේත්‍රයේ සිය ස්ථාවරය ශක්තිමත් කර ගැනීමට බැංකුව සමත් විය. භාණ්ඩාගාර මෙහෙයුම් මගින් අනුමත නියාමන සහ අභ්‍යන්තර සීමාවන් තුළ සමස්ත ශුද්ධ විවෘත තත්ව (NOP) සහ එක් එක් විදේශ විනිමය ඒකක සඳහා වූ සීමාවන් පවත්වා ගැනීම ඇතුළුව, විදේශ විනිමය (FX) අනාවරණ සීමාවන්ට දැඩි ලෙස අනුකූල වීම සහතික කරන ලදී.

පැහැදිලිව නිර්වචනය කරන ලද අවදානම් දැරීමේ සීමාවන් දිනපතා ස්වාධීනව අධීක්ෂණය කරන ලද අතර, ඒ හරහා විදේශ විනිමය නිරාවරණයන්ගෙන් ඇති වන අවදානම් ඵලදායී ලෙස අවම කරමින්, ස්ථාපිත සීමාවන් තුළ ක්‍රියාත්මක වීමට භාණ්ඩාගාර වෙළෙඳුන්ට අවස්ථාව සැලසිනි. මෙම විනයගරුක ප්‍රවේශය විනිමය අනුපාත උච්චාවචනයන් හේතුවෙන් ඇති විය හැකි පාඩු අවම කිරීමට උපකාරී වූ අතර, නිරාවරණයන් බැංකුවේ අර්ථ දක්වා ඇති අවදානම් රුචිය තුළ පවතින බව සහතික කළේය.

මීට අමතරව, භාණ්ඩාගාර මධ්‍යගත කාර්යාලය මඟින් විදේශ විනිමය පාලන සීමාවන්ට අනුකූල වීම අඛණ්ඩව සත්‍යාපනය කිරීම සහ අධීක්ෂණය කිරීම මඟින් ස්වාධීන අධීක්ෂණයක් සැපයූ අතර, එමඟින් බැංකුවේ පාලන රාමුව සහ විදේශ විනිමය අවදානම් කළමනාකරණය තවදුරටත් ශක්තිමත් විය.


2025 දෙසැම්බර් 31 දිනට තත්ත්වය

	ශුද්ධ නිරාවරණය – විදේශ මුදල් සමාන අගයෙන් ('000)	ශුද්ධ නිරාවරණය – රුපියල් සමාන අගයෙන් ('000)
ඇමරිකානු ඩොලර්	1,048.95	324,964.84
යුරෝ	(128.30)	(46,640.40)
මහා බ්‍රිතාන්‍ය පවුම්	(974.66)	(405,701.99)
ජපන් යෙන්	13,069.74	25,844.99
සිංගප්පූරු ඩොලර්	50.27	12,110.32
චීන යුවාන්	806.55	35,756.77
ඕස්ට්‍රේලියානු ඩොලර්	260.46	53,933.90
වෙනත්	–	557,176.49

විනිමය අනුපාත අවදානම් ආතති පරීක්ෂාව

	කම්පනයේ ප්‍රමාණය 5%	කම්පනයේ ප්‍රමාණය 10%	කම්පනයේ ප්‍රමාණය 15%
2025			
ඉපැයීම් මත බලපෑම (රු.මි.)	175	350	526
සංශෝධිත සමස්ත ප්‍රාග්ධන ප්‍රමාණතා අනුපාතය (CAR) (%)	16.46	16.45	16.43
2024			
ඉපැයීම් මත බලපෑම (රු.මි.)	166	332	498
සංශෝධිත සමස්ත ප්‍රාග්ධන ප්‍රමාණතා අනුපාතය (CAR) (%)	16.52	16.51	16.49

මාස අවසාන විදේශ විනිමය ශුද්ධ විවෘතත්වයන්හි (FXNOP) සහ දෛනික අවදානම් වටිනාකම් (var) සාරාංශය – 2025



කොටස් (Equity) අවදානම

කොටස් අවදානම යනු බැංකුව සතු කොටස් වල මිල ගණන් අහිතකර ලෙස විචලනය වීම හේතුවෙන් පාඩු සිදුවීමට ඇති හැකියාවයි. වෙළඳ කළඹවල අඟය වෙළෙඳපොළ මිලට අනුව තක්සේරු කිරීමේදී (Mark-to-market) සිදුවන වෙනස්කම් මඟින් හෝ ආයෝජන කළඹ යටතේ ඇති කොටස් සුරැකුම්පත්වල සාධාරණ වටිනාකම උච්චාවචනය වීම මඟින් මෙම අවදානම බැංකුවේ ඉපැයීම් සහ ප්‍රාග්ධනය කෙරෙහි බලපෑම් කළ හැකිය

බැංකුවේ කොටස් වෙළෙඳපොළ ආයෝජන අවම මට්ටමක පැවතීම හේතුවෙන්, එහි කොටස් අවදානම් නිරාවරණය සීමිත මට්ටමක පවතී.

බැංකුවේ කොටස් අවදානම් නිරාවරණය කෙරෙහි ඇති විය හැකි බලපෑම් තක්සේරු කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල ආයෝජන බැංකුකරණ කමිටුව (BIBC) විසින් සාර්ව ආර්ථික වර්ධනයන්, කොටස් වෙළෙඳපොළ ප්‍රවණතා සහ ආයෝජිත ආයතනවල මූල්‍ය ක්‍රියාකාරිත්වය පිළිබඳව නිතිපතා සමාලෝචන පවත්වනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ආයෝජන බැංකු ප්‍රතිපත්ති අත්පොත මඟින් කොටස් අවදානම කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය පාලන රාමුව ස්ථාපිත කර ඇති අතර, ඒ යටතේ අනුගමනය කළ යුතු ක්‍රමවේද, පාලන යාන්ත්‍රණ සහ අවදානම් අවම කිරීමේ මෙවලම් දක්වා ඇත. විනයගරුක කළඹ කළමනාකරණයක් සහ බැංකුවේ සමස්ත අවදානම් රුචිය සමඟ අනුකූල වීම සහතික කිරීම සඳහා පැහැදිලිව අර්ථ දක්වා ඇති නිරාවරණ සීමාවන්, ප්‍රමාණ සීමාවන් සහ අලාභ පාලන සීමාවන් මෙහි ඇතුළත් වේ.

වෙළෙඳපොළ උච්චාවචනය කොටස් ආයෝජනවල වටිනාකමට ඇති කළ හැකි බලපෑම තක්සේරු කිරීම සඳහා ආතති පරීක්ෂණ ඇතුළු අවදානම් මැනීමේ ක්‍රමවේද යොදා ගැනේ. අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ ස්වාධීන අධීක්ෂණය මඟින් අභ්‍යන්තර නිරාවරණ සීමාවන් සහ අදාළ නියාමන අවශ්‍යතාවලට අනුකූල වීම සහතික කරයි. විනයගරුක කළඹ කළමනාකරණය සහ විචක්ෂණශීලී සීමා නිර්ණය හරහා ප්‍රාග්ධනය ආරක්ෂා කරමින් සහ මූල්‍ය ස්ථාවරත්වය පවත්වා ගනිමින්, කොටස් වෙළෙඳපොළ උච්චාවචනයන්ට අනවශ්‍ය ලෙස නිරාවරණය වීම අවම කිරීමට බැංකුව අපේක්ෂා කරයි.

වෙළඳ භාණ්ඩ අවදානම

බැංකුවේ මෙහෙයුම් කටයුතුවලදී වෙළඳ භාණ්ඩ මිල අවදානම පැන නගින්නේ ප්‍රධාන වශයෙන්ම එහි උකස් කළඹ ආශ්‍රිතවය. බැංකුව සෘජුවම වෙළඳ භාණ්ඩ ගනුදෙනුවල නිරත නොවුණද, රන් මිලෙහි ඇතිවන විචලනයන් එහි අවදානම් නිරාවරණය කෙරෙහි වක්‍ර ලෙස බලපායි. රන් ඇපකර මත පදනම්ව උකස් අත්තිකාරම් හිකුත් කරන බැවින්, වෙළඳපොළ රන් මිලෙහි වෙනස්වීම් එම ඇපකරවල වටිනාකමට සෘජුවම බලපාන අතර එමඟින් බැංකුවේ සමස්ත අවදානම් පැතිකඩ කෙරෙහි බලපෑමක් ඇති කරයි.

මෙම අවදානම් අවම කිරීම සඳහා බැංකුව විචක්ෂණශීලී ණය දීමේ ප්‍රතිපත්ති අනුගමනය කළ අතර, ඇපකර වටිනාකමට සාපේක්ෂව සුරක්ෂක අත්තිකාරම් අනුපාත (Conservative Advance Rates) පවත්වා ගැනීමටත්, උකස් කරනු ලබන භාණ්ඩවල රන් අන්තර්ගතය පිළිබඳව දැඩි අවධානයකින් තක්සේරු කිරීමටත් කටයුතු කළේය. සොරකම් සහ ව්‍යාජ භාණ්ඩවලට එරෙහිව පුළුල් රක්ෂණ ආවරණ ලබාගනිමින් පාරිභෝගික නිසි පරීක්ෂාව (Customer Due Diligence) තවදුරටත් ශක්තිමත් කරන ලදී. ණය මුදා හැරීමෙන් පසු සිදුකරන පාලන ක්‍රමවේද ලෙස ස්වාධීන තක්සේරුකරණ ක්‍රියාවලීන්, දෛනික නියැදි සත්‍යාපනය සහ දිගුකාලීනව අයකරගත නොහැකි වූ ණය වෙනුවෙන් ව්‍යුහගත වෙන්දේසි යාන්ත්‍රණ ක්‍රියාත්මක කරන ලදී.


වත්කම් සහ වගකීම් කමිටුව (ALCO) විසින් රන් මිල ප්‍රවණතා වරින් වර සමාලෝචනය කරමින් සහ තරඟකාරී වෙළඳපොළ තත්ත්වයන් ඇගයීමට ලක් කරමින් අබණ්ඩ අධීක්ෂණයක් ලබා දෙන ලදී. දියුණු රන් පරීක්ෂණ උපකරණ, විශේෂිත කාර්ය මණ්ඩල පුහුණුව සහ තාක්ෂණය පදනම් කරගත් සත්‍යාපන ක්‍රියාවලීන් හරහා බැංකුව සිය අවදානම් කළමනාකරණ රාමුව තවදුරටත් ශක්තිමත් කළේය. මෙම පියවරයන් සාමූහිකව ක්‍රියාත්මක කිරීම තුළින් 2025 වසරේදී තම උකස් මෙහෙයුම්වලින් පැන නැගුණු වෙළඳ භාණ්ඩ මිල අවදානම ඵලදායී ලෙස කළමනාකරණය කිරීමට සහ අවම කිරීමට බැංකුවට හැකි විය.

කොටස් මිල අවදානම සම්බන්ධ ආතති පරීක්ෂණය

	කම්පනයෙහි විශාලත්වය 5%	කම්පනයෙහි විශාලත්වය 10%	කම්පනයෙහි විශාලත්වය 20%
2025			
කොටස් කළඹේ උපරිම වෙළඳපොළ වටිනාකමට බලපෑම (රු.මි.)	116	231	463
උපායමාර්ගික කොටස්වල සාධාරණ වටිනාකමට බලපෑම (රු.මි.)	36	72	143
මුළු බලපෑම (රු.මි.)	151	303	606

2025 වසරේ රන් පවුමක මිලෙහි විචලනය

රු.



ද්‍රවශීලතා අවදානම් කළමනාකරණය

මූල්‍ය බැඳීම් නියමිත දිනට පියවීම සඳහා ප්‍රමාණවත් ද්‍රවශීලතාවක් පවත්වා ගැනීම බැංකුවේ අවදානම් කළමනාකරණ රාමුවෙහි තීරණාත්මක අංගයකි. ඵලදායී ද්‍රවශීලතා කළමනාකරණය මගින් මෙහෙයුම් අඛණ්ඩතාව සහතික කරන අතරම, තැන්පත්කරුවන්ගේ විශ්වාසය තහවුරු කරමින් සමස්ත මූල්‍ය ස්ථායිතාව ශක්තිමත් කරයි.

පැහැදිලිව අර්ථ දක්වා ඇති ප්‍රතිපත්ති සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අවදානම් රුචිකත්ව සීමාවන් මත පදනම් වූ පුළුල් වත්කම් සහ වගකීම් කළමනාකරණ රාමුවක් මගින් බැංකුව ද්‍රවශීලතා අවදානම කළමනාකරණය කරයි. ද්‍රවශීලතා ආවරණ අනුපාතය, ශුද්ධ ස්ථායී අරමුදල් අනුපාතය (NSFR), පරිණත කාල පරතර විශ්ලේෂණය (Maturity Gap Analysis) සහ සාමාන්‍ය මෙන්ම ආතති සහගත තත්ත්වයන් යටතේ සිදුකරන මුදල් ප්‍රවාහ ප්‍රක්ෂේපණයන් (Cash Flow Projections) වැනි නියාමන සහ අභ්‍යන්තර මිනුම් දර්ශක භාවිතයෙන් ද්‍රවශීලතා නිරාවරණයන් නිරන්තරයෙන් නිරීක්ෂණය කරනු ලැබේ.

පුද්ගල කේන්ද්‍ර තැන්පතු හා ආයතනික තැන්පතු, අන්තර් බැංකු ණය ගැනීම් සහ ප්‍රාග්ධන වෙළඳපොළ උපකරණ ඇතුළත් විවිධාංගීකරණය වූ අරමුදල් පදනමක් මගින් බැංකුවේ ද්‍රවශීලතා පැතිකඩ ශක්තිමත් වේ. කෙටි කාලීන ද්‍රවශීලතා පීඩනයන්ට ඔරොත්තු දීම සඳහා ප්‍රමාණවත් අතිරික්තයන් (Buffers) පවත්වා ගනු පිණිස බැංකුව උසස් තත්ත්වයේ ද්‍රවශීල වත්කම් (HQLA) කළඹක් ද පවත්වාගෙන යයි.

තැන්පතු මුදල් ආපසු ගැනීම්, වෙළඳපොළ බාධා කිරීම් සහ අරමුදල් ලබාගැනීමට ඇති බාධාවන් වැනි අහිතකර තත්ත්වයන් යටතේ බැංකුවේ ඔරොත්තු දීමේ හැකියාව තක්සේරු කිරීම සඳහා නිතිපතා ආතති පරීක්ෂණ පවත්වනු ලැබේ. ද්‍රවශීලතා ආතති සහගත අවස්ථාවන්හිදී ගත යුතු කළමනාකරණ ක්‍රියාමාර්ග මෙහෙයවීම සඳහා විධිමත් හදිසි අරමුදල් සැලැස්මක් (Contingency Funding Plan – CFP) ක්‍රියාත්මක වේ.

ද්‍රවශීලතාව පිළිබඳව අවදානම අධීක්ෂණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලය BIRMC මගින්ද, කළමනාකාරිත්වය ALCO මගින්ද සිදු කරනු ලබන අතර, නියාමන අවශ්‍යතා සහ අභ්‍යන්තර සීමාවන්ට අනුකූල වීම සහතික කිරීම සඳහා අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් ස්වාධීන නිරීක්ෂණ කටයුතු සිදු කරනු ලබයි. විචක්ෂණශීලී ද්‍රවශීලතා සැලසුම්කරණය සහ විනයගරුක අධීක්ෂණය මගින් ශක්තිමත් ද්‍රවශීලතා මට්ටමක් පවත්වා ගැනීමටත්, සිය මූල්‍ය බැඳීම් කාලෝචිතව සහ පිරිවැය-ඵලදායී අයුරින් ඉටු කිරීමේ හැකියාව තහවුරු කිරීමටත් බැංකුව අපේක්ෂා කරයි.

ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ රාමුව

සාමාන්‍ය සහ පීඩන තත්ත්වයන් යටතේ වගකීම් සපුරාලීමට ප්‍රමාණවත් අරමුදල් සැපයීම සහතික කරමින්, බැංකුව ශක්තිමත් ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි රාමුවක් තුළ ද්‍රවශීලතා අවදානම කළමනාකරණය කරයි.

ද්‍රවශීලතාවය මැනීම

ද්‍රවශීලතාව තක්සේරු කිරීම සඳහා බැංකුව "ප්‍රවාහ පදනම් කරගත්" (flow -based) සහ "සංචිත පදනම් කරගත්" (stock -based) යන ප්‍රවේශයන් ද්විත්වයම භාවිත කරයි. ප්‍රවාහ පදනම් කරගත් ක්‍රමය යටතේ, වත්කම් සහ වගකීම්වල කල්පිරීම් කාලසීමාවන් සැලකිල්ලට ගනිමින්, අපේක්ෂිත මුදල් ගලා ඒම් සහ පිටතට ගලා යාම් අතර පවතින අසමතුලිතතාවන් විශ්ලේෂණය කරනු ලබයි. සංචිත පදනම් කරගත් ක්‍රමයේදී, ණය – තැන්පතු අනුපාතය, බැඳීම් අනුපාතය (අනුමත විහෙත් ප්‍රයෝජනයට නොගත් අයිරා සහ අන්තර් බැංකු ණය පහසුකම්), ව්‍යවස්ථාපිත ද්‍රව වත්කම් අනුපාතය (SLAR) සහ සමුච්චිත කල්පිරීම් අසමතුලිතතාවන් වැනි ප්‍රධාන මූල්‍ය අනුපාතයන් මගින් ද්‍රවශීලතා තත්ත්වය ඇගයීමට ලක් කෙරේ.

විවිධාංගීකරණය වූ අරමුදල් පදනම

වෙළඳපොළ තත්ත්වයන්, නියාමන අවශ්‍යතා සහ පොලී අනුපාත ප්‍රවණතා මත පදනම්ව, විවිධ මූලාශ්‍ර ඔස්සේ බැංකුව සිය ද්‍රවශීලතාව සපයා ගනු ලබයි. බැංකුවේ සමස්ත වගකීම් සහ ප්‍රාග්ධනයෙන් 87.1%ක් නියෝජනය කරන තැන්පතු, ප්‍රධාන අරමුදල් මූලාශ්‍රය වන අතර, අනෙකුත් ණය ගැනීම් 7%ක් සහ කොටස් හිමියන්ගේ අරමුදල් 5.9%ක් වශයෙන් ඒ සඳහා දායක වේ. ඉතිරිකිරීමේ තැන්පතු හරහා හිමිවන ඉහළ ප්‍රතිශතය, බැංකුවට අර්ධ-ස්ථාවර හා විශ්වසනීය අරමුදල් පදනමක් ලබා දෙන අතර, එමගින් අරමුදල්වල ස්ථායීතාව තවදුරටත් තහවුරු වේ.

හදිසි අවස්ථා අරමුදල් සම්පාදන (Contingency Fund Plan)

බැංකුව සිය ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ රාමුවේ අනිවාර්ය අංගයක් ලෙස, ශක්තිමත් මෙන්ම අනාගත ප්‍රවණතා සැලකිල්ලට ගන්නා හදිසි අවස්ථා අරමුදල් සම්පාදන සැලැස්මක් (CFP) පවත්වාගෙන යනු ලබයි. ද්‍රවශීලතා පීඩනයන් පවතින අවස්ථාවන්හිදී මෙහෙයුම් සූදානම තහවුරු කිරීමටත්, පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා මෙන්ම වෙළඳපොළ විශ්වාසය සුරක්ෂිත කිරීමටත් මෙම සැලැස්ම සැලසුම් කර ඇත. එමඟින් පැහැදිලිව දක්වන ලද පියවරෙන් පියවර වාර්තා කිරීමේ ක්‍රියාපටිපාටියක්, නිශ්චිත කාර්යභාරයන් හා වගකීම් සහ පූර්ව හඳුනාගත් අරමුදල් මූලාශ්‍ර හරහා අරමුදල් පීඩනයන් කළමනාකරණය සඳහා ව්‍යුහගත මගපෙන්වීමක් ලබා දෙයි.

අහිතකර තත්ත්වයන් යටතේ අවදානම් අවම කිරීමේ උපාය මාර්ග කාලෝචිත ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා CFP මඟින් ප්‍රමාණාත්මක සහ ගුණාත්මක ප්‍රේරක/ක්‍රියාකාරී ලක්ෂ්‍ය (Trigger points) ස්ථාපිත කර ඇත. මේවාට ප්‍රධාන ද්‍රවශීලතා අනුපාත පිරිහීම, අසාමාන්‍ය ලෙස තැන්පතු ආපසු ගැනීම්, තොග අරමුදල් වෙළඳපොළට (Wholesale funding markets) ඇති ප්‍රවේශය සීමා වීම සහ නැගී එන පද්ධතිමය හෝ ආයතනික ආතති දර්ශක ඇතුළත් වේ. නිතිපතා සිදුකරන සමාලෝචන, පරීක්ෂාවන් සහ නියාමන අපේක්ෂාවන් සමඟ අනුගත වීම මඟින්, අවිනිශ්චිත කාල පරිච්ඡේදවලදී මූල්‍ය ඔරොත්තු දීමේ හැකියාව තහවුරු කළ හැකි ප්‍රායෝගික ක්‍රමවේදයක් ලෙස CFP පවතින බව බැංකුව සහතික කරයි.

CFP ක්‍රියාත්මක කිරීමට හේතු විය හැකි ප්‍රධාන අවස්ථා:

- ද්‍රවශීලතා ආවරණ අනුපාතය (LCR) මාසයක් පුරා 100%ට වඩා අඩු මට්ටමක පැවතීම.
- අන්තර් බැංකු ඇමතුම් දෙනික මුදල් අනුපාත (Interbank call money rates) අඛණ්ඩව දින හතක් පුරා 20% කින් ඉහළ යාම.
- අක්‍රීය ණය (NPL) අනුපාතය 50% කට වඩා වැඩි වීම.
- ඒකාබද්ධ අත්තිකාරම් වලට වූ තැන්පතු (AD) අනුපාතය අඛණ්ඩව දින 15කට වඩා වැඩි කාලයක් 105% ඉක්මවා පැවතීම.
- වෙළඳපොළ සහභාගිවන්නන් විසින් අන්තර් බැංකු දෛනික මුදල් පහසුකම් (Call facilities) අත්හිටුවීම හෝ බැංකුවේ අරමුදල් ලබා ගැනීම් මත පවතින වෙළඳපොළ අනුපාතයන්ට වඩා අධිමිලක් (Premium) අය කිරීම.
- බැංකුවේ ණය ශ්‍රේණිගත කිරීම (Credit Rating) මට්ටම් (Notches) දෙකකට වඩා පහත වැටීම.
- තැන්පතු ආපසු ගැනීම් අපේක්ෂිත මට්ටම් ඉක්මවා යාම.

මෙම හදිසි පියවරයන් ස්ථාපිත කිරීම මඟින්, ද්‍රවශීලතා අවදානම් සක්‍රීයව කළමනාකරණය කරන බවත්, පීඩන අවස්ථාවන්හිදී මූල්‍ය ස්ථායීතාව සුරක්ෂිත කිරීම සඳහා ශක්තිමත් යාන්ත්‍රණයක් ක්‍රියාත්මක වන බවත් බැංකුව සහතික කරයි.

2025 දෙසැම්බර් මස අවසානයට ප්‍රධාන ද්‍රවශීලතා දර්ශක

ප්‍රධාන දර්ශක		2025 දෙසැම්බර් 31 දිනට තත්ත්වය (%)
ණය – තැන්පතු අනුපාතය		
ශ්‍රී ලංකා රුපියල්		54.8
විදේශ ව්‍යවහාර මුදල්		85.6
බැඳීම් අනුපාතය		
ද්‍රවශීලතා ආවරණ අනුපාත	– රුපියල්	263.3
	– සියලුම ව්‍යවහාර මුදල්	218.5

	සියලුම ව්‍යවහාර මුදල් (රු. '000)			දේශීය ව්‍යවහාර මුදල් (රු. '000)		
	2025 දෙසැම්බර් 31 දිනට ශේෂය			2025 දෙසැම්බර් 31 දිනට ශේෂය		
උසස් තත්ත්වයේ ද්‍රවශීල වත්කම් (HQLA)	1,467,524,635			1,456,788,809		
මුළු මුදල් පිටතට ගලායාම	872,607,142			661,396,671		
මුළු මුදල් ඇතුළට ගලාඒම	201,087,231			108,156,477		
ශුද්ධ මුදල් පිටතට ගලායාම	671,519,911			553,240,194		
ද්‍රවශීලතා ආවරණ අනුපාතය (LCR) %	218.54			263.32		
	සුළු	මධ්‍යස්ථ	ප්‍රධාන	සුළු	මධ්‍යස්ථ	ප්‍රධාන
කම්පනයෙහි ප්‍රමාණය (%)	5	10	15	5	10	15
සිදුවීම 1 – උසස් තත්ත්වයේ ද්‍රව වත්කම් (HQLA) පහත වැටීම						
කම්පනයෙන් පසු ද්‍රවශීල වත්කම් අනුපාතය (%)	207.61	196.68	185.76	250.15	236.99	223.82
සිදුවීම 2 – ශුද්ධ මුදල් පිටතට ගලායාම ඉහළ යාම						
කම්පනයෙන් පසු ද්‍රවශීල වත්කම් අනුපාතය (%)	208.13	198.67	190.03	250.78	239.38	228.97
සිදුවීම 3 – උසස් තත්ත්වයේ ද්‍රව වත්කම් (HQLA) පහත වැටීම සහ ශුද්ධ මුදල් පිටතට ගලායාම ඉහළ යාම (ආන්තික අහිතකර අවස්ථාව)						
කම්පනයෙන් පසු ද්‍රවශීල වත්කම් අනුපාතය (%)	192.72	178.80	161.53	238.24	215.44	194.63

ඉදිරි ගමන

1 පළමු කුළුණේ අවදානම් පෙලගැස්වීම ශක්තිමත් කිරීම

- සැබෑ අවදානම් තත්ත්වය නිවැරදිව පිළිබිඹු වන පරිදි තොරතුරු ආරක්ෂණ ලකුණු පුවරුව නැවත ඇගයීමකට ලක් කිරීම
- අවශ්‍ය අවස්ථාවල දී තාක්ෂණය සහ සයිබර් සම්බන්ධ අවදානම් සඳහා අවදානම් සංවේදී ප්‍රාග්ධන වෙන් කිරීම් හඳුන්වාදීම

2 ණය කේන්ද්‍රගතවීමේ අවදානම් ඇගයීම පුළුල් කිරීම

බැංකුව ණය කේන්ද්‍රගතවීමේ අවදානම සඳහා වඩාත් විස්තීරණ ප්‍රවේශ මාර්ග යක් අනුගමනය කරයි. ඒ සඳහා පහත ක්‍රියාමාර්ග අනුගමනය ගනු ලැබේ.

- රාජ්‍ය ඇපකරයක් තිබුණද නැති වුව ද, රාජ්‍ය ව්‍යවසායයන්ට ලබා දී ඇති ණය හෝ පහසුකම් බැංකුවල ප්‍රාග්ධන ගාස්තු ගණනය කිරීමේදී අවදානම් සහිත වත්කම් ලෙස ඇතුළත් කිරීම.
- කේන්ද්‍රගතවීමේ මිනුම් පහත අංශ ආවරණය වන පරිදි පුළුල් කිරීම:
  - ආංශික කේනද්‍රගතවීම
  - තනි නාම නිරාවරණය
  - භූගෝලීය කේන්ද්‍රගතවීම
  - නිෂ්පාදන මට්ටමේ කේනද්‍රගතවීම
  - අක්‍රීය ණය කේනද්‍රගතවීම

3 සමස්ත අවදානම් සහ රාජ්‍ය ණය ආශ්‍රිත අවදානම් හඳුනා ගැනීම සඳහා ආතති පරීක්ෂණ ශක්තිමත් කිරීම

4 IRRBB රාමුව වැඩි දියුණු කිරීම

බැංකු පොතේ පොළී අනුපාත අවදානම වඩාත් යහපත් අයුරින් කළමනාකරණය කිරීම සඳහා බැංකුව පහත සඳහන් ක්‍රියාමාර්ග ගෙන ඇත.

- ප්‍රතිපත්ති අනුපාතිකවල ක්ෂණික වෙනස්වීම ඇතුළුව බහු සිදුවීම් පොළී අනුපාතික කම්පන ඇතුළත් කිරීම
- ප්‍රතිමිලකරණ පරතර විශ්ලේෂණය සහ චර්යාත්මක උපකල්පන වැඩිදියුණු කිරීම
- ආතති තත්ත්ව යටතේ ශුද්ධ පොළී සීමා සාවේදිතාව අධීක්ෂණය කිරීම ශක්තිමත් කිරීම

5 කීර්තිනාම අවදානම් තක්සේරුව පුළුල් කිරීම

- සමාජ මාධ්‍ය මනෝභාවය විශ්ලේෂණය, සයිබර් සිද්ධි සහ සේවා බිඳ වැටීම් ඇතුළත් කිරීම
- වත්කම් ගුණත්ව දර්ශක (උදා: 3 වන අදියරේ අනුපාත) සහ උපකාරක අවදානම් ඇතුළත් කිරීම
- තත් කාලීන කීර්තිනාම අවදානම් වඩාත් මැනවින් පිළිබිඹු වන සේ KRIs විශෝධනය කිරීම

6 අවශේෂ අවදානම් හඳුනාගැනීම ශක්තිමත් කිරීම

- විශේෂයෙන්ම භාණ්ඩාගාර ඇප සහතික සහ සහන ලිපිවල උපලබ්ධි හැකියාව නැවත තක්සේරු කිරීම
- යෝග්‍ය සුරැකුම් පිළිබඳ නියාමන නිර්වචන සමග ගැලපීම
- ප්‍රමාණාත්මක ණය හෝ පහසුකම් පවතින අවස්ථාවන්හි දී අවශේෂ අවදානම් සඳහා ප්‍රාග්ධන වෙන්කිරීම් හඳුන්වාදීම
- ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාකාරකම්වලින් පැන නගින අවදානම් ආවරණය කිරීම (උදා: ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ප්‍රතිව්‍යුහගත කිරීම)

ඉදිරි ගමන

7 ශක්තිමත් ආදර්ශ අවදානම් රාමුවක් ස්ථාපනය කිරීම

බැංකුව විසින් විධිමත් ආදර්ශ අවදානම් කළමනාකරණ රාමුවක් ක්‍රියාත්මක කරනු ලැබේ. එයට පහත සඳහන් කරුණු ද ඇතුළත් වේ.

- විස්තීරණ ආදර්ශ අවදානම් ලේඛනයක් හා අවදානම් වර්ගීකරණය
- ස්වාධීන තහවුරු කිරීම, පසුගාමී පරීක්ෂණය සහ සංවේදිතා විශ්ලේෂණය
- අදාල වන අවස්ථාවල ප්‍රමාණාත්මක ආදර්ශ අවදානම් සඳහා ප්‍රාග්ධන වෙන් කිරීම්.

8 ICAAP රාමුව පහත සඳහන් ක්‍රියාමාර්ග මගින් තවදුරටත් තියුණු කරනු ලැබේ.

විධිමත් ආකෘති අවදානම් කළමනාකරණ රාමුවක් ක්‍රියාත්මක කරනු ලැබේ, ඒවාට ඇතුළත් වන්නේ:

- සරල ඒකරාශි කිරීමේ ප්‍රවේශයෙන් ඔබ්බට යමින් විවිධාංගිකරණය කිරීමේ ප්‍රතිලාභ ඇතුලත් කිරීම
- අන්තර් අවදානම් සහසම්බන්ධතා වඩාත් මැනවින් පිළිබිඹු වන අයුරින් අවදානම් ප්‍රමාණිකරණ ක්‍රමවේද වැඩි දියුණු කිරීම.

9 ආතති පරීක්ෂණ රාමුව වැඩිදියුණු කිරීම

බැංකුව සිය ආතති පරීක්ෂණ හැකියාවන් පහත සඳහන් ක්‍රම මගින් සැලකිය යුතු ලෙස ශක්තිමත් කරනු ඇත.

(අ) විදේශ ව්‍යවහාර මුදල් ද්‍රවශීලතා අවදානම

- සාර්ව ආර්ථික සහ භූදේශපාලනික පුරෝකථන අවස්ථා ඇතුළත් කිරීම (උදා: ගෝලීය වෙළඳ කම්පන, තීරු බදු)
- තැන්පතුකරුවන් කේන්ද්‍රගතවීමේ පුරෝකථන අවස්ථා ඔබ්බට පුළුල් කිරීම

(ආ) මෙහෙයුම් අවදානම

- පහත සිද්ධි පුරෝකථන අවස්ථා මත පදනම් වූ ආතති පරීක්ෂණ හඳුන්වා දීම
  - සයිබර් පහරදීම්
  - පද්ධති බිඳ වැටීම්
  - ගෙවීම් පද්ධති ඇණ හිටීම්
- කර්මාන්ත ක්‍රියාමාර්ග (වෘත්තීය සමිති) මෙහෙයුම් ක්‍රියාවලිය හා වෙළඳපොල මත ඇති කරන බලපෑම තක්සේරු කිරීම

(ඇ) දේශගුණික අවදානම

- පහත කරුණු ඇතුළත් කර දේශගුණික ආතති පුරෝකථන අවස්ථා පුළුල් කිරීම,
  - අයහපත් කාලගුණික සිදුවීම්
  - ව්‍යාපාර අඩපනවීම් සහ වත්කම් හානි
  - විලම්බන කාල හේතු කොට ගෙන අක්‍රීය ණය සහ ආදායම් අහිමි වීම්

මෙහෙයුම් අවදානම

මෙහෙයුම් අවදානම, එනම් ප්‍රමාණවත් නොවන හෝ අසාර්ථක අභ්‍යන්තර ක්‍රියාවලි, ජනතාව, පද්ධති හෝ අයහපත් දේශගුණික තත්ත්ව වැනි බාහිර සිදුවීම් හේතු කොට ගෙන අලාභ සිදුවීමේ අවදානම සිය ව්‍යාපාරික ක්‍රියාකාරකම්වල ආවේනික පැතිකඩක් බව ද එමගින් සාමාන්‍ය පරිදි ක්‍රියාත්මක වීමට බලපෑමක් විල්ල වන බව ද බැංකුව හඳුනාගෙන ඇත. මෙහෙයුම් අවදානම් ඵලදායී ලෙස කළමනාකරණය කිරීම බැංකුවේ වත්කම් ආරක්ෂා කර ගැනීමට, පාර්ශ්වකරුවන් ආරක්ෂා කර ගැනීමට සහ මහජන විශ්වාසය පවත්වා ගැනීමට මූලික වේ.

අපගේ මෙහෙයුම් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය සහ රාමුව සකස් කර ඇත්තේ සියළුම ව්‍යාපාරික අංශ පුරා විහිදෙන මෙහෙයුම් අවදානම් කලින් හඳුනාගෙන, තක්සේරු කර, අධීක්ෂණය කර අවම කර ගැනීමටය. මෙම රාමුවට අවදානම් පාලනය, අවදානම් තක්සේරු ක්‍රමවේද, ප්‍රධාන අවදානම් දර්ශක (KRIs), සිද්ධි වාර්තාකරණය සහ ශක්තිමත් පාලන පරිසරයක් අයත් වේ. මෙමගින් මූල්‍යමය පාඩු සිදු වීම හා කීර්තිනාමයට වන බලපෑම අවම කර ගැනීම සඳහා බැංකුවට ඉදිරි අවදානම් හඳුනාගනිමින් නියමිත වෙලාවට පිළියම් ක්‍රියාමාර්ග ගැනීමේ හැකියාව ඇති කරයි.

බැංකුවේ මෙහෙයුම් අවදානම් කළමනාකරණයට අයත් ප්‍රධාන අංග වන්නේ:

- **අවදානම හඳුනා ගැනීම සහ තක්සේරු කිරීම:** මෙහෙයුම් අසාර්ථකභාවයට ලක් විය හැකි ක්ෂේත්‍ර හඳුනා ගැනීම සඳහා ක්‍රියාවලි, පද්ධති සහ ක්‍රියාකාරකම් අබණ්ඩව ඇගයීම.
- **පාලනය සහ අවදානම අවම කිරීම්:** නිරාවරණ අවම කිරීම සඳහා අභ්‍යන්තර පාලන ක්‍රම ක්‍රියාත්මක කිරීම, රාජකාරී කණ්ඩායම්වලට බෙදා දීම, ක්‍රියාවලි ප්‍රමිතිගත කිරීම, සහ කාර්ය මණ්ඩල පුහුණු කිරීම් සිදු කිරීම.

- **අධීක්ෂණය සහ වාර්තා කිරීම:** නියමිත වේලාවට තීරණ ගත හැකි වන පරිදි අවදානම් සිද්ධි, ආසන්න මගහැරීම් සහ මෙහෙයුම් පාඩු ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයට සහ අදාළ කමිටුවලට නිතිපතා වාර්තා කිරීම.
- **ව්‍යාපාරයේ අඛණ්ඩ පැවැත්ම සහ දරා ගැනීම:** අහිතකර සිදුවීම්වලදී අඛණ්ඩ සේවාවක් ලබා දීම තහවුරු කිරීම පිණිස විස්තීරණ අවිනිශ්චිත සහ ආපදා ප්‍රතිසාධන සැලසුම් පවත්වා ගැනීම.
- **නියාමන අනුකූලතාවය:** මෙහෙයුම් අඛණ්ඩතාව ශක්තිමත් කිරීම සඳහා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන රෙගුලාසි සහ මාර්ගෝපදේශ ඇතුළුව අදාළ සියළුම රෙගුලාසි සහ මාර්ගෝපදේශවලට අනුගත වීම.

අපගේ තිරසරභාවය මත ඍජු බලපෑමක් ඇති කරන සාධක කිහිපයක් තහවුරු කිරීම පිණිස අපි මෙහෙයුම් අවදානම කළමනාකරණය කරන්නෙමු.

- මෙහෙයුම් අසාර්ථකභාවයන් හේතු කොට ගෙන ඇති විය හැකි පාඩු අවම කර ගනිමින් ඉදිරියේ දී ඇති විය හැකි විශාල අවදානම් පාඩු මග හැර ගැනීම.
- බහු කාර්යයන් සහ ව්‍යාපාරික ඒකක පුරා මෙහෙයුම් අවදානම පිළිබඳව සාමාන්‍ය අවබෝධයක් ඇති කිරීම මගින් බැංකුව පුරා අවදානම පිරිවැය සාඵල්‍යතාවට අනුව කළමනාකරණය කිරීම.
- අභ්‍යන්තර හැකියාවන් ඉහළ නැංවීම හා වැඩි දියුණු කිරීම මගින් තීරණාත්මක මෙන් ම විනාශකාරී අවදානම්වලට එලදායී ලෙස ප්‍රතිචාර දැක්වීම.
- අභ්‍යන්තර සම්පත් මනාව කළමනාකරණය කිරීම සහ බැංකු මෙහෙයුම් කටයුතු එලදායී ලෙස පාලනය කිරීම තුළින් පිරිවැය ඉතිරි කිරීම් අත්පත් කර ගැනීම.
- බැංකුවේ කීර්තිනාමය සහ සන්නාම ප්‍රතිරූපය ආරක්ෂා කිරීම – බැංකුවේ ව්‍යාපාරික මෙහෙයුම් කටයුතුවල ක්‍රමවත් ක්‍රියාකාරිත්වයක් තහවුරු කර අවසාන ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට සහාය වීම.

පාලනය සහ වාර්තා කිරීම

බැංකුව මෙහෙයුම් අවදානම් පුළුල් ක්ෂේත්‍ර හතක් යටතේ වර්ගීකරණය කරනු ලබන BASEL රෙගුලාසි අනුගමනය කරයි.

මෙහෙයුම් අවදානම් කළමනාකරණ රාමුව මෙහෙයුම් අවදානම් නිරාවරණ කළමනාකරණය කිරීම පිණිස මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රතිපත්ති, ව්‍යුහ සහ ක්‍රියාවලි වලින් සමන්විත වේ.


මෙහෙයුම් අවදානම් පැතිකඩ සමීපව අධීක්ෂණය කිරීමෙන් සහ නියාමනය කිරීමෙන මණ්ඩල ඒකාබද්ධ කළමණාකරන කමිටුවට සහාය වේ.

මෙහෙයුම් අවදානම් පැන නගින මොහොතේම හඳුනාගෙන අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුවට වාර්තා කිරීම පිණිස බැංකුවේ ආරක්ෂාව හා සම්බන්ධ ප්‍රථම පෙළ එහි ශාඛා සහ ව්‍යාපාරික ඒකකවලින් සමන්විත වේ. මෙහෙයුම් අවදානම් නිරාවරණ හඳුනාගෙන තක්සේරු කිරීම පිණිස මුළු කාර්ය මණ්ඩලයම පුහුණු කර දැනුවත් කර ඇත.

සියළුම ව්‍යාපාරික ඒකක නිරාවරණ ඇගයීම සඳහා නිර්වචනය කරන ලද මෙහෙයුම් අවදානම් පරාමිතිවලට අනුකූලව අවදානම් සහ පාලන ස්වයං-තක්සේරු සිදු කරයි.

මණ්ඩලයට සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයට සහතික වීම පිණිස අභ්‍යන්තර විගණනය මගින් ශාඛා ජාලය පුරා සම්පූර්ණ මෙහෙයුම් අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය සම්බන්ධයෙන් කාලානුරූපී සමාලෝචන සිදු කරයි.

මෙහෙයුම් අවදානම් කළමනාකරණය පිළිබඳ පාලන ව්‍යුහය



ක්‍රියාත්මකව පැවතීමේ පදනම මත නව නිෂ්පාදන, ක්‍රියාවලි, සහ ක්‍රියාකාරකම් සඳහා මෙහෙයුම් අවදානම තක්සේරු කරනු ලැබේ.

සැළකිය යුතු අලාභ සිදුවීම්, මතු වෙමින් පවත්නා ගැටළු, අවදානම් නිරීක්ෂණය නොවීම, අධීක්ෂණය සහ අවදානම් සමාලෝචනය පිළිබඳ තොරතුරු අධ්‍යක්ෂ ඒකාබද්ධ අවධානම් කළමණාකරන කමිටුව (BIRMC) සහ/හෝ මෙහෙයුම් අවදානම් කළමනාකරණ කමිටුව (ORMC) වෙත ඉදිරිපත් කරනු ලබන අවදානම් කමිටු වාර්තා අතරින් කාර්තුමය වාර්තා මඟින් ඉදිරිපත් කරනු ලැබේ. ඉදිරි බලපෑම සහ අවදානම සිදු වන වාර සංඛ්‍යාව මත පදනම්ව පාලන අසාර්ථක වීම් මෙහෙයුම් අවදානම් කළමනාකරණ කමිටුව (ORMC) වෙත වාර්තා කරනු ලැබේ.


මෙහෙයුම් අවදානම් පිළිබඳ ගැටළු සම්පව නිරීක්ෂණය කිරීම සහ අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට ඒ පිළිබඳව වාර්තා කිරීම සඳහා කලාපීය මට්ටමේ අවදානම් නිලධාරීන්, විගණන නිලධාරීන් සහ අනුකූලතා නිලධාරීන් ස්ථානගත කර ඇත.

2025 වර්ෂය සඳහා වාර්තා වූ මුළු මෙහෙයුම් අලාභය රුපියල් මිලියන 66.53කි. බාහිර වංචාවන් (වටිනාකම අනුව) අලාභ සඳහා බලපෑ ප්‍රධානතම හේතුව විය.

පහත වගුව සහ ප්‍රස්ථාරය මඟින් බාසල් (Basel) රාමුවට අදාළව අලාභ සිදුවීම් වර්ගීකරණයට අනුව, පසුගිය වසර දෙක තුළ සිදු වූ මෙහෙයුම් අලාභ සංඛ්‍යාව සහ ඒවායේ වටිනාකම යන අංශ දෙකම සංසන්දනාත්මකව නිරූපණය කෙරේ.

අලාභ සිදුවීම්	2025				2024			
	සංඛ්‍යාව	එකතුවේ ප්‍රතිශතය (%)	වටිනාකම රු.මි.	මුළු වටිනාකමේ ප්‍රතිශතය (%)	සංඛ්‍යාව	එකතුවේ ප්‍රතිශතය (%)	වටිනාකම රු.මි.	මුළු වටිනාකමේ ප්‍රතිශතය (%)
අභ්‍යන්තර වංචා	3	1.01	11.73	17.63	1	0.41	0.02	0.07
බාහිර වංචා	215	72.14	47.87	71.95	139	56.97	20.64	68.98
රැකියා පරිචය සහ සේවා ස්ථානයේ ආරක්ෂාව	–	–	–	–	–	–	–	–
සේවාදායක, නිෂ්පාදනය සහ ව්‍යාපාර පරිචයන්	–	–	–	–	–	–	–	–
භෞතික වත්කම්වලට වූ හානි	1	0.34	0.09	0.14	2	0.82	0.13	0.43
ව්‍යාපාර අඩාල වීම් සහ පද්ධති බිඳ වැටීම්	1	0.34	0.49	0.74	1	0.41	0.14	0.47
ක්‍රියාත්මක කිරීම, බෙදා හැරීම සහ ක්‍රියාවලි කළමනාකරණය	78	26.17	6.35	9.54	101	41.39	8.99	30.05
එකතුව	298	100.00	66.53	100.00	244	100.00	29.92	100.00


2025 වර්ෂයේ සිදුවීම් වර්ගය අනුව මෙහෙයුම් අලාභ සංඛ්‍යාව 2025




- අභ්‍යන්තර වංචා
- බාහිර වංචා
- සේවාදායක, නිෂ්පාදනය සහ ව්‍යාපාර පරිචයන්
- රැකියා පරිචය සහ සේවා ස්ථානයේ ආරක්ෂාව
- භෞතික වත්කම්වලට වූ හානි
- ව්‍යාපාර අඩාල වීම් සහ පද්ධති බිඳ වැටීම්
- ක්‍රියාත්මක කිරීම, බෙදා හැරීම සහ ක්‍රියාවලි කළමනාකරණය

මෙහෙයුම් අලාභ

රු.මි.



2025 වර්ෂයේ සිදුවීම් වර්ගය අනුව මෙහෙයුම් අලාභ වටිනාකම



- අභ්‍යන්තර වංචා
- බාහිර වංචා
- සේවාදායක, නිෂ්පාදනය සහ ව්‍යාපාර පරිචයන්
- රැකියා පරිචය සහ සේවා ස්ථානයේ ආරක්ෂාව
- භෞතික වත්කම්වලට වූ හානි
- ව්‍යාපාර අඛාල වීම් සහ පද්ධති බිඳ වැටීම්
- ක්‍රියාත්මක කිරීම, බෙදා හැරීම සහ ක්‍රියාවලි කළමනාකරණය

මෙහෙයුම් අවදානම හඳුනාගැනීම සහ තක්සේරු කිරීම

බැංකුවේ සියළුම ව්‍යාපාරික කටයුතු හා සම්බන්ධ මෙහෙයුම් අවදානම හඳුනාගෙන තක්සේරු කිරීම සඳහා ව්‍යුහගත මෙන්ම ඉදිරි දැක්මක් සහිත ප්‍රවේශයක් අනුගමනය කරයි. මෙහෙයුම් කළමනාකරණ දෙපාර්තමේන්තුව ව්‍යාපාර ඒකක සමග සමීප සහයෝගිත්වයකින් කටයුතු කරමින් ක්‍රියාවලි, පද්ධති, නිෂ්පාදන, සහ දෛනික ක්‍රියාකාරකම් තුළ ගැබ්ව ඇති මෙහෙයුම් අවදානමේ විභවීය මූලාශ්‍ර ක්‍රමවත්ව හඳුනා ගනී.

අවදානම පිළිබඳව දැනුවත්ව සිටීමේ ශක්තිමත් සංස්කෘතියක් මුළු සංවිධානයම ආවරණය වන පරිදි ප්‍රවර්ධනය කරනු ලැබේ. සියළුම කාර්ය මණ්ඩල සාමාජිකයින්ට මෙහෙයුම් අවදානම් නිරාවරණ පිළිබඳ නිතිපතා පුහුණුවක් ලැබෙන අතර අවදානම් සිදුවීම් කල්තියා හඳුනා ගැනීමට, ඉහළ කළමනාකාරිත්වයට දැනුම් දීමට හා තක්සේරු කිරීමට ද පවත්නා දුර්වලතා තම තමන්ගේ වගකීම් ක්ෂේත්‍ර තුළ පාලනය කර ගැනීමට ද ඔවුන්ව ධෛර්යමත් කරයි. මෙම සාමූහික වගකීව යුතු බව බැංකුවේ පළමු ආරක්ෂක වළල්ල ශක්තිමත් කරයි.

සෑම ව්‍යාපාර ඒකකයක්ම නිර්වචනය කරන ලද මෙහෙයුම් අවදානම් පරාමිතීන්ට සාපේක්ෂව අවදානම් නිරාවරණ ඇගයීම සඳහා වාර්ෂික අවදානම් හා පාලන ස්වයං ඇගයීම් (RCSA) සිදු කරයි. මෙම ඇගයීම් හේතු කොට ගෙන පාලන අඩුපාඩු, ක්‍රියාවලි අකාර්යක්ෂමතා සහ මතු වෙමින් පවත්නා අවදානම් තත්ත්ව හඳුනා ගැනීමට හැකියාව ලැබේ. මේවායේ මූලික හේතු නිසි අයුරින් ආමන්ත්‍රණය කර නියමිත වේලාවට පිළියම් යෙදීම සඳහා ක්‍රියාකාරී සැලැසුම් ක්‍රියාත්මක කර තිබෙන බවට තහවුරු කර ගැනීම සඳහා වාර්තා වූ අලාභ සිදුවීම් හා ආසන්න අතපසුවීම් අවදානම් හා පාලන ස්වයං ඇගයීම් (RCSA) හා සමගාමීව විශ්ලේෂණය කරනු ලැබේ.

මෙයට අමතරව, ඉදිරියේ දී ඇති විය හැකි අර්බුදකාරී තත්ත්වයන් පාඩු දක්වා වර්ධනය වීමට පෙර හඳුනාගැනීමට කළමනාකාරිත්වයට හැකි වන පරිදි පූර්ව අවදානම් හඳුනා ගැනීමේ ක්‍රමවේදය සහ නැඹුරුතා විශ්ලේෂණය පුළුල් කිරීම පිණිස බැංකුව ප්‍රධාන අවදානම් දර්ශක (KRIs) සහ දත්ත විශ්ලේෂණය වැඩිදියුණු කොට ඇත.

මෙහෙයුම් අවදානම් ඇගයීම ද නිෂ්පාදන සංවර්ධනය සහ ක්‍රියාවලි වෙනස් කිරීමේ මූලපිරීම් තුළට අන්තර්ගත කර ඇත. නව නිෂ්පාදන, සේවා, පද්ධති සහ ප්‍රාමාණික ක්‍රියාවලි වැඩි දියුණු කිරීම් ක්‍රියාත්මක කිරීමට පෙර ව්‍යුහගත අවදානම් සමාලෝචනවලට භාජනය කරනු ලබන අතර ක්‍රියාත්මක කළ පසු ක්‍රියාකාරී අවධිය තුළ අධීක්ෂණයට බඳුන් කෙරේ.

මෙම ඒකාබද්ධ ප්‍රවේශය මගින් අවදානම් පිළිබඳ සළකා බැලීම් සැලසුම්කරණ අවධියේදීම ඇතුළත්ව ඇති බව තහවුරු කරයි. තවද, එමගින් පාර්ශ්වකරුවන්ගේ වටිනාකම ආරක්ෂා කරන අතරතුර මෙහෙයුම් ප්‍රත්‍යාස්ථතාව ප්‍රවර්ධනය කර, අභ්‍යන්තර පාලන ක්‍රම ශක්තිමත් කර, තිරසර වර්ධනයකට සහාය සලසයි.

මෙහෙයුම් අවදානම් දරා ගැනීමේ මට්ටම්

මණ්ඩලය විසින් මෙහෙයුම් අවදානම සඳහා බැංකුවේ අවදානම් රුචිකත්ව ප්‍රකාශය තුල පැහැදිලිව නිර්වචනය කරන ලද සීමා සහ දරාගැනීම වෙනස් වන සීමා විධිමත්ව ස්ථාපිත කර ඇත. මෙම වෙනස් වන සීමාවලින් බැංකුවේ ප්‍රාග්ධනය, කීර්තිනාමය සහ පාර්ශ්වකරුවන්ගේ සුභසිද්ධියේ ආරක්ෂාව තහවුරු කරමින් සිය උපායමාර්ගික අරමුණුවලට අනුකූලව බැංකුව භාර ගැනීමට සූදානම් අවදානම් මට්ටම පැහැදිලිව දක්වයි.

දරා ගැනීමේ මට්ටම් වෙනස් වන අනුමත මිනුම්වලට, අනෙකුත් මිනුම් අතර, මෙහෙයුම් අලාභවල මුළු වටිනාකම මුළු මෙහෙයුම් වියදම්වල අනුපාතයක් ලෙස, අභ්‍යන්තර සහ බාහිර මෙහෙයුම් පාඩු සිදුවීම්වල වාර ගණන, සහ පිළිගත හැකි ප්‍රමිති මට්ටමට වඩා අවම ශාඛා විගණන ඇගයුම් ප්‍රතිශතය ඇතුළත් වේ. මෙම දර්ශක මගින් මෙහෙයුම් කාර්ය සාධනය සහ පාලන සඵලදායිතාව සමඟ සැසඳීමට අදාලව දර්ශකයන් සපයනු ලබයි.

මෙම මිනුම් නිතිපතා ව්‍යුහගත ලෙස BIRMC වෙත දැනුම් දීම මගින් අධ්‍යක්ෂ මණ්ඩලය අඛණ්ඩ අධීක්ෂණය සහ වගවීම තහවුරු කරයි. දරා ගැනීම වෙනස් වන සීමා වලට ලඟා වන විට හෝ උල්ලංඝණය වන විට කළමනාකාරිත්වය විසින් පාලන දුර්වලතා ආමන්ත්‍රණය කිරීම පිණිස නියමිත වේලාවට පිළියම් ක්‍රියාමාර්ග සහිත සැලසුම් ක්‍රියාත්මක කර එම දුර්වලතා නැවත නැවත ඇතිවීම වැළැක්විය යුතු ය.

මෙයට අමතරව, විධිමත් සීමාවන් ඉක්මවීමට පෙර කළමනාකාරිත්වයට මැදිහත්වීමක් සිදු කළ හැකි වීම පහසු වීම සඳහා ප්‍රධාන මෙහෙයුම් අවදානම් දර්ශකවලට පූර්ව අනතුරු ඇඟවීමේ ලක්ෂණ ඇතුලත් කර ඇත.

බැංකුවේ විකසනය වන අවදානම් පැතිකඩ, නියාමන අපේක්ෂා සහ උපායමාර්ගික ප්‍රමුඛතා සමඟ ගැලපීම තහවුරු කිරීම පිණිස දරා ගැනීමේ මට්ටම් පිළිබඳ කාලානුරූපී සමාලෝචන සිදු කරනු ලැබේ.

මෙම ක්‍රමවත් ප්‍රවේශය මගින් ශක්තිමත් අවදානම් පාලන සංස්කෘතියක් සවිබල ගන්වා, අවදානම් ගැනීම තුල විනිවිදභාවය ප්‍රවර්ධනය කර මෙහෙයුම් ප්‍රත්‍යාස්ථතාව සහ මූල්‍ය ස්ථාවරත්වය පවත්වා ගැනීම කෙරෙහි බැංකුව දක්වන කැපවීමට සහයෝගය දක්වයි.

මෙහෙයුම් අවදානම් අවම කිරීමේ උපායමාර්ගය

නිර්වචනය කරන ලද අවදානම් රුචිය තුළ අවදානම් නිරාවරණ සඵලදායී ලෙස පාලනය වීම තහවුරු කරමින් බැංකුව අවදානම් අවම කිරීම පිණිස විස්තීරණ බහුස්තරීය උපායමාර්ගයක් යොදා ගනී. විවිධ අභිරුචීන් සඳහා මත ගැටුම් ඇති වීම සහ අනවසර ක්‍රියාකාරකම් වැළැක්වීම පිණිස රාජකාරී පැහැදිලිව කණ්ඩායම් අතර බෙදා දී සියළුම මෙහෙයුම් කටයුතු තුළ ආරක්ෂක ආකෘතියේ වළලු ත්‍රිත්වය පූර්ණ ලෙස ක්‍රියාත්මක කිරීම තුළින් බැංකුව ශක්තිමත් යහපාලන ව්‍යුහයක් පවත්වා ගනී.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද මෙහෙයුම් අවදානම් ප්‍රතිපත්ති සහ කාර්ය පටිපාටිවලින් සමන්විත දැඩි රාමුවක් මගින් සියළුම ව්‍යාපාර ක්‍රියාකාරකම් සඳහා මග පෙන්වයි. මෙම ප්‍රතිපත්ති මගින් මුළු බැංකු ක්ෂේත්‍රය පුරාම අවදානම් කළමනාකරණ පරිචයන් තුළ අනුකූලතාව හා විනය තහවුරු කිරීම සඳහා ප්‍රමිතිගත පාලන ක්‍රම, වගවීමේ ව්‍යුහයන් සහ උද්ගමන යාන්ත්‍රණ ස්ථාපිත කරයි.

ක්‍රියාවලි අඩාල වන වකවානු තුළ තීරණාත්මක මෙහෙයුම් ආරක්ෂා කර ගැනීම උදෙසා සැකසූ මනාව නිර්වචනය කරන ලද අර්බුද කළමනාකරණ ක්‍රියාපිළිවෙලවල් සහ ආපදා ප්‍රතිසාධන සැලසුම් තුළින් ව්‍යාපාරයේ අඛණ්ඩතාවයට සහාය හිමි වේ. ආතති සිදුවීම් පවතින අවස්ථාවල සූදානම්බව, සම්බන්ධීකරණය සහ නිසි වේලාවට ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වගකීම දරන නම් කරන ලද දෙපාර්තමේන්තු RCP (Recovery Plans) ක්‍රියාත්මක කිරීමේ කණ්ඩායම්වල සහාය ඇතිව බැංකුව සිය ප්‍රතිසාධන සැලසුමට පූර්ණ අනුකූලත්වයත දැක්වීම සහතික කරයි.

සමහර අවදානම් විස්තීරණ රක්ෂණ ආවරණ හරහා තුන්වන පාර්ශ්වයක් වෙත උපායමාර්ගිකව මාරු කිරීම තුළින් මෙහෙයුම් අවදානම් නිරාවරණ තවදුරටත් අවම කරනු ලබන අතර එමගින් අනපේක්ෂිත පාඩු සිදුවීම්වලින් උද්ගත වන මූල්‍ය බලපෑම අවම කරයි.

තුන්වන පාර්ශ්වයේ සේවා සපයන්නන් බැංකුවේ අවදානම්, අනුකූලතා සහ මෙහෙයුම් ප්‍රමිති සපුරාලන බව තහවුරු කර ගැනීම පිණිස එම බාහිර පාර්ශ්වයන් වෙතින් ඉටු කර ගනු ලබන කටයුතු දැඩි මූල්‍ය තත්ත්ව විශ්ලේෂණ කාර්ය පටිපාටි සහ ක්‍රියාකාරී කාර්යසාධන අධීක්ෂණ මගින් පාලනය කරනු ලැබේ.

බැංකුව පුද්ගල වගවීම සහ සමස්ත පාලන වාතාවරණයම ශක්තිමත් කරමින් කාර්ය මණ්ඩලය අඛණ්ඩව පුහුණු කිරීම තුළින් හා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම තුළින් අවදානම් පිළිබඳ දැනුවත් කිරීමේ ශක්තිමත් සංස්කෘතියක් පෝෂණය කරයි.

නව නිෂ්පාදන, සේවා, පද්ධති, හෝ ක්‍රියාවලිවල වෙනස්කම් හඳුන්වාදීමට පෙර විභවීය අවදානම් සහ පාලන අවශ්‍යතා ඇගයීම පිණිස ව්‍යුහගත මෙහෙයුම් අවදානම් තක්සේරු සිදු කරනු ලැබේ.

මීට අමතරව, දැඩි එහෙත් සත්‍යරූපී මෙහෙයුම් ඇණ හිටීම්වලට සාපේක්ෂව බැංකුවේ ප්‍රත්‍යාස්ථතාව තක්සේරු කිරීම පිණිස සිදුවීම් විශ්ලේෂණ හා ආතති අභ්‍යාසන නිතිපතා සිදු කරනු ලැබේ.

සමස්තයක් ලෙස, මෙම අවදානම් අවම කිරීමේ ක්‍රියාමාර්ග මෙහෙයුම් ප්‍රත්‍යාස්ථතාව වර්ධනය කර, විභවීය මූල්‍ය හා කීර්තිනාම හානිවීම් අවම කර බැංකුවේ දීර්ඝකාලීන උපායමාර්ගික තිරසරභාවයට සහාය දක්වයි.

ඉදිරි ගමන

ERCSA දියත් කිරීම

අවදානම් තක්සේරුවල නිරවද්‍යතාව හා අනුකූලතාව ඉහළ නැංවීම සඳහා ඉලෙක්ට්‍රොනික අවදානම් සහ පාලන ස්වයං ඇගයීම් (ERCSA) ආකෘතිය දියත් කර ක්‍රියාත්මක කිරීම තුළින් නිසි වේලාවට අවදානම් හඳුනාගැනීම, අවදානම් නිරාවරණ ඇගයීම ශක්තිමත් කර පද්ධතිය පදනම් කර ගත් අධීක්ෂණ සහ හඹා යෑමේ යාන්ත්‍රණය ක්ෂණිකව සම්පූර්ණ කිරීම තහවුරු කරයි.

තාක්ෂණික අවදානම

ඩිජිටල් පරිවර්තනයේ නායකයකු වශයෙන් බැංකුව සංකීර්ණ මෙන්ම පරිණාමනය වන තාක්ෂණය හා බැඳී අවදානම් පරාසයකට මුහුණ පායි. ඩිජිටල් මෙහෙයුම් කටයුතුවල ඉහළ යාමත් සමගම දත්ත උල්ලංඝණය වීම් (Data Breaches), අනවසරයෙන් ඇතුල් වීමට තැත් කිරීම් (Hacking Attempts), Phishing, සහ මෘදුකාංග අනිෂ්ට ප්‍රහාර (Malware Attacks) වැනි විවිධ සයිබර් තර්ජනවලට භාජනය වීමේ අවදානමට බැංකුව මුහුණ දේ. මෙම අවදානම් අවම කිරීම සඳහා සංවේදී දත්ත ආරක්ෂා කිරීම සහ ශක්තිමත් ආරක්ෂක ක්‍රමවේද පවත්වාගෙන යාම ඉතා වැදගත් වේ. ඊට අමතරව, අනපේක්ෂිත පද්ධති බිඳවැටීම් හෝ ඇණහිටීම් මගින් ව්‍යාපාර මෙහෙයුම්වලට බාධා ඇති වී එමගින් ගනුදෙනුකරුවන්ගේ අත්දැකීම්වලට බාධා වල්ල වී ඉදිරියේ දී සැළකිය යුතු අන්දමේ මූල්‍ය අලාභවලට හේතු විය හැකි ය.

පද්ධති ප්‍රත්‍යාස්ථතාවයෙන් යුක්ත බවටත් හදිසි බිඳවැටීම්වලදී අප්‍රමාදීව ප්‍රකෘතිමත්භාවයට පත් විය හැකිවීමත් ප්‍රධාන අවශ්‍යතාවයකි. තාක්ෂණය ඉතා වේගයෙන් පරිණාමනය වන බැවින් වර්තමාන පද්ධති, මෘදුකාංග සහ දෘඩාංග යල් පැන ගිය තත්ත්වයට හෝ නොගැලපෙන තත්ත්වයට හෝ පත්වීමේ අවදානමක් ඇති අතර ඒ හේතු කොට ගෙන නවීන තාක්ෂණීය සමග මෙහෙයුම් කාර්යක්ෂමතාව, ආරක්ෂාව සහ ගැලපීම පවත්වාගෙන යාමේ අභියෝග නිර්මාණය විය හැකි ය. තීරණාත්මක දෘඩාංග, දත්ත ගබඩා, හෝ සර්වර් කාමර තුළට අනවසරයෙන් ප්‍රවේශ වීම දත්ත පරිපූර්ණත්වයට සහ පෞද්ගලිකත්වයට අවදානමක් විල්ල කරන අතර ඩිජිටල් යුගයේ දී පවා භෞතික ආරක්ෂාව අවධානය යොමු කළ යුතු කරුණක් වශයෙන් පවතී. තවද, ව්‍යාපාරය වර්ධනය වීමේ දී දත්ත පරිමාව සහ තොරතුරු තාක්ෂණ සම්පත් සඳහා ඇති ඉල්ලීම ද එලෙසින්ම වර්ධනය වේ. ප්‍රමාණවත් නොවන යටිතල පහසුකම් උදාහරණ ලෙස සර්වර් ධාරිතාව, (Band-width) පරිමාණය කළ හැකි බවට බාධා වීල්ල කර කාර්යසාධනයට බලපෑමක් ඇති කළ හැකිය.

තාක්ෂණ අවදානම අවම කිරීම

මෙම තාක්ෂණික අවදානම් ආමන්ත්‍රණය කිරීම සඳහා බැංකුව ප්‍රධාන උපායමාර්ග සහ ක්‍රියාමාර්ග කිහිපයක් ක්‍රියාත්මක කරයි.

ආරක්ෂිත දත්ත මධ්‍යස්ථාන

බැංකුවේ මෙහෙවර සාක්ෂාත් කරගැනීමට අවශ්‍ය ඉතා වැදගත් සියළුම යෙදුම් සහ ආපදා ප්‍රතිසාධන පද්ධති අතිශය ආරක්ෂිත ISO සහතිකලත් දත්ත මධ්‍යස්ථානවල ගබඩා කර ඇත. ඉතා වැදගත් යටිතල ව්‍යුහයට අවසරලත් පුද්ගලයින්ට පමණක් ප්‍රවේශ විය හැකි වීම තහවුරු කිරීම පිණිස මෙම දත්ත මධ්‍යස්ථාන භෞතික ප්‍රවේශය පාලනය කිරීමේ ක්‍රම, ආවේක්ෂණ පද්ධති, සහ පෙවමිතික සත්‍යාපනය ඇතුළු අතිනවීන ආරක්ෂිත ක්‍රමවේදයන්ගෙන් සමන්විත වේ.

ව්‍යාපාරයේ අඛණ්ඩතාව සහ ආපදා ප්‍රතිසාධන පරීක්ෂණ

ව්‍යාපාරයේ අඛණ්ඩතාව සහ ආපදා ප්‍රතිසාධන සැලසුම්වල ඵලදායිතාව ඇගයීම පිණිස සියළුම තීරණාත්මක පද්ධති සඳහා නිතිපතා දැඩි පරීක්ෂණ සිදු කරනු ලැබේ. අර්බුදකාරී තත්වයක දී අක්‍රීයව පවතින කාලය අවම කර ක්ෂණිකව ප්‍රකෘතිමත් වීමට බැංකුව සූදානම් බව තහවුරු කිරීම පිණිස මෙම පරීක්ෂණ මගින් විවිධ ආපදා සිදුවීම් අනුකරණය කරයි.

විස්තීරණ තොරතුරු තාක්ෂණ පාලන රාමුව

ආපදා කළමනාකරණය, නියාමන අනුකූලතාව සහ දත්තවල පෞද්ගලිකත්වය කෙරෙහි අවධානය යොමු කරමින් බැංකුව ශක්තිමත් තොරතුරු තාක්ෂණ පාලන ව්‍යුහයක් ක්‍රියාත්මක කර ඇත. මෙම පාලන රාමුව දත්ත උල්ලංඝණය, මෙහෙයුම් කටයුතු අඩාලවීම් සහ අදාළ ප්‍රමිති සමග අනනුකූලවීමට ඇති හැකියාම අවම කිරීම පිණිස ප්‍රතිපත්ති, කාර්ය පටිපාටි සහ ප්‍රශස්ත පරිචයන් අනුගමනය කරන බව තහවුරු කරයි.

ගිනි නිවීමේ සහ දුම් හඳුනාගැනීමේ පද්ධති

ඉතා වැදගත් දෘඩාංග සහ දත්ත ගිනි හානිවලින් ආරක්ෂා කර ගැනීම පිණිස අතිනවීන ගිනි නිවීමේ සහ දුම් හඳුනාගැනීමේ පද්ධති සියළුම දත්ත මධ්‍යස්ථාන සහ අබණ්ඩ විදුලිබල සැපයුම් කාමරවල (ups) උපායමාර්ගිකව සවි කර ඇත. සංවේදී උපකරණවලට ගින්නකින් වන හානිය අවම කරමින් ඒවා ක්ෂණිකව හඳුනාගෙන අනතුර අවම කර ගැනීමට හැකි වන පරිදි මෙම පද්ධති සැලසුම් කර ඇත.

ආපදා ප්‍රතිසාධන කාර්ය පටිපාටි

හදිසි අවස්ථා සඳහා ප්‍රතිචාර දැක්වීමට පැහැදිලි ව්‍යුහගත ප්‍රවේශයක් ලබාදීම පිණිස සවිස්තරාත්මක නිතිපතා යාවත්කාලීන කරනු ලබන ආපදා ප්‍රතිසාධන සැලසුම් ක්‍රියාත්මක කර ඇත. තීව්‍ර සිදුවීම්වල දී හෝ ස්වාභාවික ආපදා හමුවේ පවා වේගවත්ව ප්‍රකෘතිමත් තත්ත්වයට පැමිණ ව්‍යාපාර අඩාලවීමේ කාල සීමා අවම කර සේවාවන් අඛණ්ඩව පවත්වාගෙන යාම තහවුරු කිරීම සඳහා මෙම සැලසුම් සකස් කර ඇත.

තාක්ෂණ අවදානම් සමාලෝචනය

බැංකුව ව්‍යුහගත විනිවිද පෙනෙන ක්‍රියාවලියක් තුළින් තාක්ෂණික අවදානම් සමාලෝචනය කර කළමනාකරණය කිරීම පිණිස පූර්ව ප්‍රවේශ ක්‍රමවේදයක් පවත්වාගෙන යයි.

ISO/IEC 27001:2022 සහතිකකරණය

බැංකුව සිය තොරතුරු ආරක්ෂණ කළමනාකරණ පද්ධතිය (ISMS) සඳහා ජාත්‍යන්තර වශයෙන් පිළිගත් ISO/IEC 27001:2022 සහතිකකරණය සාර්ථක ලෙස පවත්වාගෙන ගොස් ඇත. දත්තවල ආරක්ෂාව, රහසිගතභාවය සහ අඛණ්ඩතාව සියළුම මෙහෙයුම් කටයුතු පුරා ප්‍රමුඛතාගත කිරීම තහවුරු කරමින් තොරතුරු ආරක්ෂණයේ ඉහලම ප්‍රමිතීන්වලට අනුගතවීමට බැංකුව දක්වන කැපවීම මෙම සහතිකකරණයෙන් පෙන්නුම් කරයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියලත් තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්ති

බැංකුවේ ඉහලම මට්ටම්වලදී තොරතුරු ආරක්ෂණය ඉහලම ප්‍රමුඛත්වයක් හිමි වන කරුණකි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විස්තීරණ තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්ති සහ කාර්ය පටිපාටි අනුමත කර ඇති අතර එම ප්‍රතිපත්ති සහ කාර්ය පටිපාටි තිරණ ගැනීමේ ක්‍රියාවලියට මගපෙන්වමින් ඉහළ සිට පහළ දක්වා මුළු කාර්ය මණ්ඩලයම බැංකුවේ දත්ත ආරක්ෂා කිරීමේ වගකීම අවබෝධ කර ගෙන අවදානම් අවම කිරීමට කටයුතු කිරීම තහවුරු කරයි.

සක්‍රීය අවදානම් තක්සේරු

තොරතුරු තාක්ෂණය හා සම්බන්ධ සියළුම ක්‍රියාවලි ඇගයීම සඳහා සුපුරුදු පරිදි සිදු කරන අවදානම් තක්සේරු හා හදිසි අවදානම් තක්සේරු යන දෙවර්ගයම සිදු කරනු ලැබේ. මෙම තක්සේරු කිරීම් බැංකුවේ තාක්ෂණික යටිතල ව්‍යුහයට ඇති විය හැකි අවදානම් තත්ත්ව, ආරක්ෂණ අඩුලුහුඬුකම් සහ ඉදිරි තර්ජන හඳුනා ගැනීමට මහෝපකාරී වේ. තක්සේරු මගින් කරනු ලබන සොයා ගැනීම් ප්‍රවේශමෙන් සමාලෝචනය කර තොරතුරු ආරක්ෂණ මෙහෙයුම් කමිටුව හරහා ආමන්ත්‍රණය කරනු ලබන අතර එමගින් යම් හඳුනාගත් අවදානම් වෙතොත් ක්ෂණිකව අවම කිරීමට පියවර ගනු ලැබේ.

පද්ධතියේ පැවැත්ම සඳහා පැවතීමේ අවදානම් වර්ගීකරණ රාමුව

ඉතා ඉහළ මට්ටමක අවදානම් සහිත පද්ධති (මාර්ගගත සජීව පද්ධති)

වැඩ කරන මුළු පැය ගණනට සාපේක්ෂව පද්ධතියේ පැවැත්ම හා සීමාවන්

> 99.9%	අඩු අවදානම	කොළ
97.5% - 99.9%	මධ්‍යම මට්ටමේ අවදානම	ඇම්බර්
< 97.5%	වැඩි අවදානම	රතු

මධ්‍යම මට්ටමේ අවදානම් සහිත පද්ධති

වැඩ කරන මුළු පැය ගණනට සාපේක්ෂව පද්ධතියේ පැවැත්ම හා සීමාවන්

> 97.5%	අඩු අවදානම	කොළ
95% - 97.5%	මධ්‍යම මට්ටමේ අවදානම	ඇම්බර්
< 95%	වැඩි අවදානම	රතු

අඩු මට්ටමේ අවදානම් සහිත පද්ධති

වැඩ කරන මුළු පැය ගණනට සාපේක්ෂව පද්ධතියේ පැවැත්ම හා සීමාවන්

> 90%	අඩු අවදානම	කොළ
87% - 90%	මධ්‍යම මට්ටමේ අවදානම	ඇම්බර්
< 87%	වැඩි අවදානම	රතු

නම	ඉහළ මට්ටමේ RCSA වලට සාපේක්ෂව පවතින බව
තෙවන පාර්ශ්වයේ සැපයුම්කරුවන් සඳහා වන RCSA (ඉහළ අවදානම් පද්ධති)	>90% කොළ - අඩු අවදානම 70%-90% ඇම්බර් - මධ්‍යම මට්ටමේ අවදානම <70% Red - රතු - ඉහළ අවදානම

නම	මුළු ජාල නියෝජිත යෙදුම්වලට අනුව පැවැත්ම
ජාල නියෝජිත සහ ආරක්ෂක යෙදුම්	100% කොළ - අඩු අවදානම 99.9% ඇම්බර් - මධ්‍යම මට්ටමේ අවදානම <99.9% රතු - ඉහළ අවදානම

නම	ස්ථාපිත මුළු කළමනාකරණ එන්ජින් නියෝජිත ගණනට සාපේක්ෂව පැවැත්ම
කළමනාකරණ එන්ජින් නියෝජිතයා හා සාර්ථකව සම්බන්ධ උපාංග	100% කොළ - අඩු අවදානම 99.8% ඇම්බර් - මධ්‍යම මට්ටමේ අවදානම <99.8% රතු - ඉහළ අවදානම

නම	කිසිදා කල් ඉකුත් නොවන මුරපද සංඛ්‍යාව (සක්‍රීය නාමාවලිය)
සක්‍රීය නාමාවලිය (මුරපදය කිසිදා කල් ඉකුත් නොවේ)	0 කොළ - අඩු අවදානම >0 රතු - ඉහළ අවදානම

නම	ස්ථාපිත කර ඇති මෙහෙයුම් පද්ධති අනුව පරිගණක වර්ගීකරණය
මෙහෙයුම් පද්ධතිය අනුව පරිගණක	Windows 10 මෙහෙයුම් පද්ධතියට වඩා ඉහළ මෙහෙයුම් පද්ධති කොළ - අඩු අවදානම Windows 10 ඇම්බර් - මධ්‍යම මට්ටමේ අවදානම Windows 10 ඉහළ මෙහෙයුම් පද්ධතියට වඩා පහළ මෙහෙයුම් පද්ධති රතු - ඉහල අවදානම

නම	වර්ෂයකදී වාර්තා වූ මුළු සිදුවීම් ප්‍රමාණය
වර්ෂය තුළදී මෙහෙයුම් අලාභ ලෙස වාර්තා වූ ආරක්ෂාව හා සම්බන්ධ සිදුවීම්	< වසරකට සිදුවීම් 3ක් – අඩු අවදානම වසරකට සිදුවීම් 3-7ක් – මධ්‍යස්ථ අවදානම > වසරකට සිදුවීම් 7ක් – ඉහළ අවදානම
නම	**වර්ෂයකදී වාර්තා වූ මුළු සිදුවීම් ප්‍රමාණය**
ආපදා තත්ත්වයකදී පද්ධතිවල දරා ගැනීමේ හැකියාව	<95% අඩු 95% මධ්‍යම >95% ඉහළ
නම	**කාර්තුවක දී වාර්තා වූ මුළු සිදුවීම් ප්‍රමාණය**
ප්‍රතිශතයක් ලෙස ඉහළ වැදගත්කමක් ඇති පද්ධති පිවිසුම් නිසි ලෙස අවලංගු කිරීමේ සම්පූර්ණකරනය	98% අනුකූලතාව – අඩු 95%-97.9% – මධ්‍යම <95% ඉහළ
නම	**කාර්තුවක දී වාර්තා වූ මුළු සිදුවීම් ප්‍රමාණය**
තෙවන පාර්ශවීය සැපයුම්කරුවන් හා අදාළ ආරක්ෂාව සම්බන්ධ සිදුවීම්	අඩු: මසකට 0 මධ්‍යම: මසකට 1 ඉහළ: > මසකට 1
නම	**කාර්තුවක දී වාර්තා වූ මුළු සිදුවීම් ප්‍රමාණය**
මහජනතාව වෙත දුර්වලතාවයන් නිරාවරණය	අවම වශයෙන් 1 අවදානමක් හඳුනා ගැනීම තීරණාත්මක/ඉහළ – ඉහළ මධ්‍යම – මධ්‍යම අඩු – අඩු
නම	**කාර්තුවක දී වාර්තා වූ මුළු සිදුවීම් ප්‍රමාණය**
Phishing simulations අසාර්ථකවීම් සංඛ්‍යාව	අඩු: <10% අසාර්ථකත්ව අනුපාතය මධ්‍යස්ථ: 10%-20% ඉහළ: >20%

තොරතුරු ආරක්ෂණය, සයිබර් ඔරොත්තු දීමේ හැකියාව සහ දත්ත ආරක්ෂණය – 2025

2025 වසරේදී, වේගයෙන් විකාශනය වන ඩිජිටල් බැංකුකරණ ක්ෂේත්‍රයට ප්‍රතිචාර වශයෙන් මහජන බැංකුව සිය තොරතුරු ආරක්ෂණය, සයිබර් ඔරොත්තු දීමේ හැකියාව සහ දත්ත ආරක්ෂණ ශක්‍යතාවන් තවදුරටත් ශක්තිමත් කළේය. මූල්‍ය සේවා වැඩි වැඩියෙන් ඩිජිටල් වේදිකා මත පදනම් වන බැවින්, පාරිභෝගික තොරතුරු සුරක්ෂිත කිරීම, සේවා අඛණ්ඩතාව සහතික කිරීම සහ පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය පවත්වා ගැනීම මූලික උපායමාර්ගික ප්‍රමුඛතාවන් ලෙස පැවතුනි.

තොරතුරු ආරක්ෂණ අවදානම් කළමනාකරණය මහජන බැංකුවේ ව්‍යවසාය අවදානම් රාමුව තුළ අන්තර්ගත කර ඇති අතර, එය අධ්‍යක්ෂ මණ්ඩලය, මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC), තොරතුරු ආරක්ෂණ කමිටුව (ISC) සහ විධායක කළමනාකාරිත්වය යන ආයතනික ව්‍යුහයන් හරහා පාලනය වේ. මෙම පාලන ව්‍යුහය මගින් ස්වාධීන අධීක්ෂණය, අවදානම් මත පදනම් වූ තීරණ ගැනීම සහ සයිබර් මෙන්ම තාක්ෂණික අවදානම් අඛණ්ඩව නිරීක්ෂණය කිරීම සහතික කරයි.

තොරතුරු තාක්ෂණ අවදානම් කළමනාකරණය සහ සයිබර් අවදානම් පාලනය

මහජන බැංකුවේ තොරතුරු තාක්ෂණ අවදානම් කළමනාකරණ රාමුව යනු, තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්තියට අනුකූලව තාක්ෂණය ආශ්‍රිත අවදානම් හඳුනා ගැනීම, තක්සේරු කිරීම, අධීක්ෂණය කිරීම සහ අවම කිරීම සඳහා වූ ව්‍යුහගත යාන්ත්‍රණයකි. මෙයට අවදානම් පාලන ස්වයං-තක්සේරුකරණය (RCSA), සිදුවීම් වාර්තාකරණය (incident reporting), විගණන සමාලෝචන, අවදානම් දර්ශක, "රෙඩ් ටීමින්" (red teaming) කාර්යයන් සහ ශක්තිමත් කරන ලද තෙවන පාර්ශවීය ආරක්ෂණ තක්සේරු කිරීම් ඇතුළත් වේ. සැපයුම් දාම සයිබර් අවදානම් නිරාවරණය අවම කරන අතරම, වත්මන් තර්ජන කාලෝචිත ලෙස ඉහළ මට්ටම් වෙත වාර්තා කිරීම (escalation) සහ අවම කිරීම සහතික කරනු පිණිස, තොරතුරු ආරක්ෂණ කමිටුව (ISC) සහ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC) වෙත නිතිපතා වාර්තා කිරීම් සිදු කරනු ලැබේ.

බැංකුව සතු ISO 27001:2022 සහතිකකරණය මගින් එහි උසස් පාලන පරිණතභාවය, ශක්තිමත් සහ ක්‍රමානුකූල අවදානම් කළමනාකරණ රාමුව මෙන්ම ගෝලීය වශයෙන් පිළිගත් විකල්ප භාවිතයන්ට (best practices) අනුගත වීම තහවුරු කරයි.

නියාමන අනුකූලතාව සහ දත්ත ආරක්ෂණය

ජාතික අධීක්ෂණ මාර්ගෝපදේශ යටතේ පවතින ඔරොත්තු දීමේ හැකියාව සහ තාක්ෂණික අවදානම් කළමනාකරණ අවශ්‍යතා ඇතුළුව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද නියාමන අපේක්ෂාවන් (regulatory expectations) සමඟ මහජන බැංකුව මනා පෙළගැස්මක් පවත්වා ගෙන යනු ලබයි.

පාරිභෝගික දත්ත සහ ජාතික ගෙවීම් යටිතල පහසුකම් විශාල ප්‍රමාණයක් හසුරුවන රාජ්‍ය බැංකුවක් ලෙස, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද නියාමන අපේක්ෂාවන් සහ 2022 අංක 9 දරන පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත (PDPA) ඇතුළු අනෙකුත් අදාළ ව්‍යවස්ථාපිත හා නියාමන අවශ්‍යතාවලට අනුකූලව, පුද්ගලික සහ මූල්‍ය තොරතුරුවල ආරක්ෂාව සහතික කරනු පිණිස මහජන බැංකුව සිය දත්ත පාලන රාමුව අඛණ්ඩව ශක්තිමත් කරන ලදී.

සයිබර් ආරක්ෂණ සංස්කෘතිය සහ දැනුවත්භාවය

සයිබර් අවදානම් ඇති වීමට මිනිස් හැසිරීම් ප්‍රධාන සාධකයක් වන බැවින්, තොරතුරු ආරක්ෂණය (InfoSec) පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් මහජන බැංකුව විසින් තවදුරටත් පුළුල් කරන ලදී. මේ යටතේ ප්‍රායෝගික පෙරහුරු (Simulated exercises), ඉලක්කගත කාර්ය මණ්ඩල පුහුණු සහ දැනුවත් කිරීමේ ප්‍රචාරණ වැඩසටහන් ක්‍රියාත්මක කෙරිණි. මේ හරහා සේවකයින්ගේ සූදානම ඉහළ නැංවීමට මෙන්ම, සයිබර් වංචා (Social Engineering) වලට හසුවීමේ අවදානම අවම කිරීමට ද හැකි විය. මීට අමතරව, පාරිභෝගිකයින්ගේ විශ්වාසය තහවුරු කරමින් ආරක්ෂිත ඩිජිටල් බැංකුකරණ පිළිවෙත් ප්‍රවර්ධනය කිරීම සඳහා වන වැඩසටහන් ද ශක්තිමත් කරන ලදී.

අනුකූලතා අවදානම

නීති රීති, රෙගුලාසි සහ ව්‍යාත්තීය ප්‍රමිතීන්ට අනුකූල නොවීම නියාමන හා අනුකූලතා අවදානම් ඇති වීමට හේතු වේ. 2025 වසරේදී, විචක්ෂණශීලී රෙගුලාසි, මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ (AML) අවශ්‍යතා, පාරිභෝගික දත්ත ආරක්ෂණය සහ තිරසාරභාවය පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිතීන් කෙරෙහි දැඩි අවධානයක් යොමු කරමින්, නිරන්තරයෙන් වෙනස් වන නියාමන පරිසරය තුළ සාර්ථකව කටයුතු කිරීමට අපට හැකි විය. අපගේ අනුකූලතා දෙපාර්තමේන්තුව, ශක්තිමත් ප්‍රතිපත්ති සහ විනිවිදභාවයෙන් යුත් ක්‍රියාවලීන් ඔස්සේ මෙම අංශය අඛණ්ඩව අධීක්ෂණය කරයි.

ආයතනික පාලනය

අප සතු ශක්තිමත් පාලන ව්‍යුහය මගින් අනුකූලතාව මැනවින් සහතික කරන අතර, ඒ හේතුවෙන් 2025 වසර තුළ කිසිදු නියාමන උල්ලංඝනයක් හෝ දඩ මුදල් නියම වීමක් වාර්තා වී නොමැත.

අධ්‍යක්ෂ මණ්ඩලය	අනුකූලතා දෙපාර්තමේන්තුව
බාහිර රෙගුලාසි සහ අභ්‍යන්තර මාර්ගෝපදේශයන්ට අනුකූලව කටයුතු කිරීම සහතික කිරීමේ පරම වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වන අතර, ඒ සඳහා මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC) සහ මණ්ඩල විගණන කමිටුව (BAC) මගින් සහාය ලබා දෙයි.	• නීතිපතා සිදුකරන තක්සේරු කිරීම් මගින් බැංකුවේ අනුකූලතා මට්ටම අධීක්ෂණය කරන අතර, ඒ පිළිබඳව සෘජුවම BIRMC වෙත වාර්තා කරනු ලබයි. • ව්‍යවස්ථාපිත සහ අනිවාර්ය අවශ්‍යතා, අනුකූල නොවන අවස්ථා, සේවක පුහුණුව සහ ශාඛා ඇගයීම් පිළිබඳව දෙපාර්තමේන්තු සහ ශාඛා ප්‍රධානීන්ගේ සහතික කිරීම් (Sign-off) සහිතව මාසික අනුකූලතා වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරයි. මීට අමතරව, අදාළ කාර්තුව තුළ සිදුවන ඕනෑම විශේෂ අනුකූලතා සම්බන්ධ කරුණු BIRMC සහ BAC වෙත ද වාර්තා කරනු ලබයි. • අභ්‍යන්තර හොඳම භාවිතයන් සහ බාහිර රෙගුලාසිවලට අදාළව, ලකුණු පහක ශ්‍රේණිගත කිරීමේ ක්‍රමවේදයක් (Five-point rating scale) මගින් බැංකුවේ අනුකූලතා අවදානම තක්සේරු කරයි. මෙම ඇගයීම් වාර්තාව (Scorecard) BIRMC වෙත ඉදිරිපත් කරනු ලබයි.

අනිවාර්ය අනුකූලතා කාර්යභාරය

- නියාමන අවශ්‍යතා සපුරාලීමට අපොහොසත් වීමෙන් ඇති විය හැකි අවදානම් අවම කිරීම හෝ සම්පූර්ණයෙන්ම ඉවත් කිරීම සඳහා අදාළ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සකස් කිරීම මගින් බැංකුවේ කීර්තිනාමය ආරක්ෂා කිරීම.
- සියලුම සේවකයින් සඳහා ආචාර ධර්ම පද්ධතියක් (Code of Ethics) හඳුන්වා දීම සහ ආයතනයේ සෑම මට්ටමකදීම එය නිසි ලෙස ක්‍රියාත්මක වන්නේද යන්න අධීක්ෂණය කිරීම.
- "ඔබේ ගනුදෙනුකරු හඳුනාගැනීමේ" (KYC) රෙගුලාසිවලට අනුකූලව, මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීමේ ප්‍රතිපත්තියක් (AML/CFT Policy) සියලුම අංශ තුළ ක්‍රියාත්මක කිරීම.
- පැහැදිලි, කාලෝචිත සන්නිවේදනය සහ අන්‍යෝන්‍ය අවබෝධය පදනම් කරගනිමින් නියාමන ආයතන සමඟ සමීප සහ සුහද සබඳතා පවත්වා ගැනීම.
- බැංකුව තුළ ස්වයංක්‍රීයවම නීති රීතිවලට අනුගත වීමේ අනුකූලතා සංස්කෘතියක් (Culture of compliance) පෝෂණය කිරීම.
- අදාළ නෛතික හා නියාමන ක්ෂේත්‍රයන්හි සිදුවන නව වර්ධනයන් පිළිබඳව නිරන්තර අවධානයෙන් පසුවීම සහ ඒවා බැංකුව තුළ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පහසුකම් සැලසීම.
- අනුකූලතා ගැටලු ඇති වී හැකි සියලුම නියාමන සංශෝධන සහ නීතිමය වෙනස්කම් පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කිරීම.
- අනුකූලතාවයට පටහැනි ඕනෑම උල්ලංඝනය කිරීමක් වහාම පෙන්වා දීම සහ පිළිගත හැකි කාල රාමුවක් තුළ ඒවා නිවැරදි කිරීමට කළමනාකාරිත්වය සමඟ එක්ව කටයුතු කිරීම.
- ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝග සහ මාර්ගෝපදේශ මෙන්ම නීතියෙන් නියම කර ඇති පරිදි, සතිපතා, මාසික, කාර්තුමය සහ වාර්ෂික අනුකූලතා වාර්තා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ඉදිරිපත් කිරීම. තවද, මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC) සහ මණ්ඩල විගණන කමිටුව (BAC) වෙත අවශ්‍ය පරිදි වාර්තා ඉදිරිපත් කිරීම සහ මාසික අනුකූලතා වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම.
- ශ්‍රී ලංකා මහ බැංකුවේ නියමයන්ට අනුකූලව පාරිභෝගික ප්‍රඥප්තියක් (Customer Charter) ස්ථාපිත කිරීම.
- බලපත්‍රලාභී වාණිජ බැංකුවල ආයතනික පාලනය පිළිබඳ මහ බැංකු නියෝග මත පදනම්ව, ආයතනික පාලනය පිළිබඳ "යහපත් පරිච සංග්‍රහය" සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම.
- මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීම සඳහා ගනුදෙනු නිරීක්ෂණය කිරීමේ පද්ධති සහ පාලනයන් ස්ථාපිත කිරීම මෙන්ම සැකකටයුතු ගනුදෙනු පිළිබඳව මූල්‍ය බුද්ධි ඒකකය (FIU) වෙත වාර්තා කිරීම.
- මුදල් විශුද්ධිකරණය වැළැක්වීම ඇතුළු අනුකූලතා විෂය පථය පිළිබඳව කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සහ මුළු ශාඛා ජාලයම ආවරණය වන පරිදි විද්‍යුත් ඉගෙනුම් (e-learning) මොඩියුලයක් හඳුන්වා දීම.
- චර්යාධර්ම පද්ධතියක් (Code of Conduct) සකස් කිරීම ඇතුළුව, අනුකූලතා අවදානම සහ කීර්තිනාම අවදානම අවම කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සම්පාදනය කර ක්‍රියාත්මක කිරීම.
- ණය තොරතුරු කාර්යාංශය (CRIB) සමඟ සම්බන්ධ වෙමින් ගනුදෙනුකරුවන්ගේ ණය තොරතුරු නිරන්තරයෙන් යාවත්කාලීන කර පවත්වා ගැනීම.

අනුබද්ධ අනුකූලතා කාර්යභාරයන්

- නියාමන, කීර්තිනාම සහ සදාචාරාත්මක කරුණු සම්බන්ධයෙන් කළමනාකාරිත්වය සහ කාර්ය මණ්ඩලය වෙත උපදේශන සේවා සැපයීම මෙන්ම, ආයතනික සාර්ථකත්වය ළඟා කරදෙන ප්‍රධාන සාධකයක් ලෙස අනුකූලතාව ප්‍රවර්ධනය කිරීම.
- නව නිෂ්පාදන සහ පද්ධති සැලසුම් කිරීමේදී, දේශීය නියාමන අවශ්‍යතා, අභ්‍යන්තර අනුකූලතාව සහ සදාචාරාත්මක ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි අවශ්‍ය මඟපෙන්වීම් සහ නිර්දේශ (Input) ලබා දීම.
- නීතිපතා සිදුකරන තක්සේරු කිරීම් සහ සමාලෝචන මගින් අභ්‍යන්තර හා බාහිර රෙගුලාසිවලට අනුකූලව කටයුතු කරන්නේ දැයි තහවුරු කර ගැනීම.
- අදාළ අභ්‍යන්තර හා බාහිර කමිටුවලදී අනුකූලතා කාර්යභාරය (Compliance function) නියෝජනය කිරීම.
- අනුකූලතාව පිළිබඳ ප්‍රතිපත්ති, කළමනාකාරිත්වය සහ කාර්ය මණ්ඩලය වෙත පැහැදිලිව සන්නිවේදනය කිරීම.
- අනුකූලතා ගැටලු නිරාකරණය කරගැනීම සඳහා අභ්‍යන්තර සහ බාහිර විගණන අංශ සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.
- විගණන මගින් හඳුනාගනු ලබන අනුකූලතා ගැටලු සම්බන්ධයෙන් අඛණ්ඩව පසු විපරම් කිරීම.
- විගණකවරුන් සමඟ සම්බන්ධ වෙමින්, අවදානම් මත පදනම් වූ ඇගයීම් (Risk-based assessment) ඔස්සේ අහඹු අනුකූලතා විගණනයන් (Random compliance audits) සිදු කිරීම.

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුව

බැංකුවේ මූල්‍ය ස්ථාවරත්වය තහවුරු කරමින් දිගුකාලීන වටිනාකම් ජනනය කිරීම සඳහා, අපගේ උපායමාර්ගික සහ මෙහෙයුම් තීරණ ගැනීමේ ක්‍රියාවලියෙහි මූලික පදනම ලෙස අවදානම් කළමනාකරණය ඒකාබද්ධ කර ඇත. මෙය විනයගරුකභාවයෙන් සහ අනාගත දැක්මකින් යුත් ප්‍රවේශයක් පිළිබිඹු කරන අතර, ආර්ථික සහ තාක්ෂණික විපර්යාස මෙන්ම නියාමන හා පාරිසරික අභියෝගයන්ගෙන් පිරි සංකීර්ණ මෙහෙයුම් පරිසරයක බැංකුවට ශක්තියක් වේ. සියලුම ව්‍යාපාරික කටයුතු හා සම්බන්ධ අවදානම් හඳුනාගැනීම, අධීක්ෂණය කිරීම සහ අවම කිරීම උදෙසා අප අනුගමනය කරන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුව ඒ සඳහා මනා පදනමක් සපයයි.

විධිමත් ලෙස අනුමැතිය ලබා ඇති අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තියක් මත මෙම ඒකාබද්ධ රාමුව, පදනම් වී ඇත. එමගින් මුළු මහත් සංවිධානය පුරාම ව්‍යුහගත සහ ස්ථාවර අයුරින් අවදානම් කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය මූලික සිද්ධාන්ත, පාලන ව්‍යුහය (Governance architecture) සහ ක්‍රමවේද ප්‍රමිතීන් සපයයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද මෙම ප්‍රතිපත්තිය මගින් බැංකුවේ අවදානම් කළමනාකරණ දර්ශනය (Risk philosophy) පැහැදිලි කරන අතර, අවදානම් රුචියෙහි සීමාවන් නිර්වචනය කරමින් "ආරක්ෂක ස්ථර තුන" (Three Lines of Defence) පුරා පැහැදිලි වගවීමක් ස්ථාපිත කරයි. තවද, අවදානම් නිරාවරණයන් කාලෝචිත ලෙස අධීක්ෂණය කිරීම සහ ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සහතික කරනු වස්, ගැටලු ඉහළ මට්ටම් වෙත යොමු කිරීමේ ක්‍රමවේද, වාර්තාකරණ අවශ්‍යතා සහ සීමා කිරීමේ රාමු ද මෙහි අන්තර්ගත වේ.

මෙම ප්‍රතිපත්තිමය ප්‍රවේශය හරහා, අවදානම් පිළිබඳ විශ්ලේෂණයන් උපායමාර්ගික සැලසුම්කරණය, ප්‍රාග්ධන ප්‍රතිපාදන වෙන් කිරීම සහ එදිනෙදා මෙහෙයුම් ක්‍රියාවලියට ක්‍රමානුකූලව ඒකාබද්ධ කර ඇත. එමගින් අවදානම් අතර පවතින අන්‍යෝන්‍ය සබැඳියාවන් (Interdependencies) කාර්යක්ෂම ලෙස කළමනාකරණය කිරීමටත්, අහිතකර තත්ත්වයන් හමුවේ බැංකුවේ ඔරොත්තු දීමේ හැකියාව මැන බැලීම සඳහා "ආතති පරීක්ෂණ" සහ "අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය තක්සේරු කිරීමේ ක්‍රියාවලිය" (ICAAP) වැනි විශ්ලේෂණාත්මක මෙවලම් භාවිත කිරීමටත් මනා සහායක් ලැබේ. ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සහ මණ්ඩල මට්ටමේ කමිටු වෙත නිතිපතා වාර්තා ඉදිරිපත් කිරීම මගින් පාලන අධීක්ෂණය ශක්තිමත් කෙරෙන අතර, බැංකුවේ අවදානම් සහගත තීරණ ගැනීම් සැමවිටම උපායමාර්ගික අරමුණු සහ නියාමන අපේක්ෂාවන් සමඟ සමපාත වන බව එමගින් සහතික කෙරේ.

ඉදිරි දැක්ම

බැංකුවේ අවදානම් පාලනය සහ තීරණ ගැනීමේ ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කිරීම උදෙසා, ස්වයංක්‍රීය ඒකාබද්ධ අවදානම් කළමනාකරණ පද්ධතියක් (IRMS) ස්ථාපිත කිරීමට පියවර ගනිමින් සිටින අතර මෙම පද්ධතිය හරහා සියලුම ව්‍යාපාරික අංශයන්හි අවදානම් දත්ත ඒකාබද්ධ කරනු ලැබේ. එමගින් ප්‍රධාන අවදානම් දර්ශක (KRIs) තත් කාලයේදී (Real-time) නිරීක්ෂණය කිරීමටත්, බාධාවකින් තොරව වාර්තා සකස් කිරීමටත්, නියාමන අවශ්‍යතාවලට වඩාත් හොඳින් අනුගත වීමටත් අවස්ථාව සැලසේ. ණය, වෙළඳපොළ, මෙහෙයුම් මෙන්ම අලුතින් මතු වන අවදානම් ද එකට ගොනු කිරීම මගින් ඉදිරි අවදානම් දැකීමේ හැකියාව ඉහළ නැංවීමටත්, පූර්ව ක්‍රියාකාරී අවදානම් පාලන උපායමාර්ගයන්ට සහාය වීමටත්, සමස්ත ආයතනය පුරා විහිදුණු අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය බලගැන්වීමටත් බැංකුව අපේක්ෂා කරයි.

උපායමාර්ගික අවදානම

අප තෝරාගන්නා ව්‍යාපාරික උපායමාර්ගවල පවතින දුර්වලතා, ඒවා ක්‍රියාත්මක කිරීමේදී සිදුවන අතපසුවීම් හෝ බාහිර පරිසරයේ විපර්යාසයන්ට කාලෝචිත ලෙස ප්‍රතිචාර නොදැක්වීම හේතුවෙන් බැංකුවේ ආදායමට, ප්‍රාග්ධනයට සහ දිගුකාලීන පැවැත්මට එල්ල වන අවහිරතා උපායමාර්ගික අවදානම් ලෙස සැලකේ. සාර්ව ආර්ථික අස්ථාවරත්වය, තරඟකාරී බලපෑම්, නියාමන ක්ෂේත්‍රයේ නව ප්‍රවණතා සහ තාක්ෂණික පෙරළිය හමුවේ පාරිභෝගික අවශ්‍යතා නිරන්තරයෙන් වෙනස් වන බැවින්, මෙවැනි උපායමාර්ගික අවදානම් විචක්ෂණශීලීව පාලනය කිරීම කෙරෙහි බැංකුව ප්‍රමුඛතාවක් ලබා දෙයි.

බැංකුවේ දීර්ඝ කාලීන අරමුණු මෙන්ම ප්‍රාග්ධන ශක්තිය සහ වෙළඳපොළ ස්ථාවරත්වය කෙරෙහි අවධානය යොමු කරමින් ක්‍රමානුකූල සැලසුම්කරණ ක්‍රියාවලියක් හරහා මෙම අවදානම් කළමනාකරණය කරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලයේ සෘජු අධීක්ෂණය යටතේ සිදුකෙරෙන නව ව්‍යාපාරික මූලපිරීම්, ව්‍යාප්ති සැලසුම් නිමැවුම් නවෝත්පාදනය සහ ආයෝජන තීරණ සැමවිටම අනුමත අවදානම් රුචිය හා තිරසාර වර්ධන ඉලක්කයන් සමඟ සමපාත වන බව සහතික කෙරේ. තවද, සවිස්තරාත්මක මූල්‍ය පුරෝකථනයන් සහ විවිධ ආර්ථික පසුබිම් යටතේ බැංකුවේ ඔරොත්තු දීමේ හැකියාව මැන බැලෙන ඇගයීම් මගින් අපගේ උපායමාර්ගික සැලසුම්වල ශක්තිමත්භාවය තවදුරටත් තහවුරු කරයි.

උපායමාර්ගික ඉලක්ක, ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPIs) සහ අවදානම් සීමාවන්ට අනුකූලව බැංකුවේ ප්‍රගතිය ඇගයීම සඳහා අබණ්ඩ අධීක්ෂණ යාන්ත්‍රණ ක්‍රියාත්මක වේ. අනුමත සැලසුම්වලින් බැහැර වන ඕනෑම අවස්ථාවක් පිළිබඳව ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සහ අදාළ මණ්ඩල කමිටු මගින් සමාලෝචනය කර කාලෝචිත ලෙස සුදුසු නිවැරදි කිරීමේ පියවර ගනු ලබයි. අනාගතයට සාර්ථකව අනුවර්තනය වීමේ හැකියාව සහ දිගුකාලීන තරඟකාරිත්වය ඉහළ නැංවීම උදෙසා, ඩිජිටල් විපර්යාස, දේශගුණික වර්ධනයන්, නියාමන ප්‍රතිසංස්කරණ සහ භූ-දේශපාලනික අවිනිශ්චිතතාවන් වැනි අලුතින් මතු වන අවදානම් පිළිබඳ පූර්ව ඇගයීම් ද බැංකුව සිය උපායමාර්ගික සාකච්ඡාවලට අන්තර්ගත කර ඇත.

අහිතකර තත්ත්වයන් මෙන්ම උපායමාර්ගික තීරණ හමුවේ ප්‍රාග්ධනයට එල්ල විය හැකි බලපෑම ඇගයීම සඳහා “ආතති පරීක්ෂණ” (Stress testing) සහ “අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය තක්සේරු කිරීමේ ක්‍රියාවලිය” (ICAAP) මගින් උපායමාර්ගික අවදානම් කළමනාකරණයට වැඩිදුර සහාය ලබා දේ. මෙම ඒකාබද්ධ ප්‍රවේශය හරහා අපගේ වර්ධන අභිලාෂයන්, මූල්‍යමය ඔරොත්තු දීමේ හැකියාව සහ විචක්ෂණශීලී අවදානම් කළමනාකරණය සමඟ මනාව සමතුලිතව පවත්වා ගැනීමට හැකි වේ.

විනයගරුක පාලනය, දැඩි සැලසුම්කරණය සහ අබණ්ඩ අධීක්ෂණය ඔස්සේ උපායමාර්ගික අවදානම් අවම කිරීමට කටයුතු කරන අතරම, තිරසාර අවස්ථාවන්ගෙන් උපරිම ඵල නෙළා ගැනීමටත් අපගේ පාර්ශ්වකරුවන් වෙත කල් පවතින වටිනාකමක් ලබා දීමටත් බැංකුව සැමවිටම කැපවී සිටී.

කීර්තිනාම අවදානම

බැංකුව කෙරෙහි පවතින සෘණාත්මක ආකල්ප, දැඩි මහජන විවේචන හෝ ආයතනික චර්යාධර්මවල සිදුවන පලුදු වීම් හේතුවෙන් පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය, වෙළඳ නාම වටිනාකම සහ ව්‍යාපාරයේ දිගුකාලීන තිරසාරභාවය කෙරෙහි එල්ල විය හැකි අහිතකර බලපෑම කීර්තිනාම අවදානම ලෙස සැලකේ. තොරතුරු තාක්ෂණයෙන් සන්නද්ධ වර්තමාන ලෝකයේ, කීර්තිනාමයට සිදුවන හානියක් ඉතා ඉක්මනින් මූල්‍යමය, මෙහෙයුම් සම්බන්ධ හෝ උපායමාර්ගික පසුබෑමක් දක්වා වර්ධනය විය හැකි බැවින්, එය පූර්ව සූදානමකින් යුතුව කළමනාකරණය කිරීම බැංකුවේ ඔරොත්තු දීමේ හැකියාවට තීරණාත්මක සාධකයකි.

බැංකුවේ ආයතනික ගෞරවය සහ මහජන විශ්වාසය තහවුරු කිරීම උදෙසා ස්ථාපිත කොට ඇති පාලන ව්‍යුහයන්, ප්‍රතිපත්තිමය පදනම් සහ අධීක්ෂණ යාන්ත්‍රණයන්ගේ සුසංයෝගී එකතුවක් මගින් මෙම අවදානම කළමනාකරණය කරනු ලබයි. අවදානම් කළමනාකරණ පිළිවෙත්, ආයතනික චර්යාවන් සහ උපායමාර්ගික තීරණ සැමවිටම ආචාරධාර්මීය ප්‍රමිතීන්ට, නියාමන අවශ්‍යතාවන්ට සහ පාර්ශ්වකරුවන්ගේ අපේක්ෂාවන්ට අනුකූල වන බව සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය විසින් සෘජු අධීක්ෂණයක් සපයනු ලැබේ. තවද, සේවක හැසිරීම්, පාරිභෝගික සබඳතා සහ වෙළෙඳපොළ ක්‍රියාකාරිත්වය සඳහා පැහැදිලි ප්‍රමිතීන් හඳුන්වා දී ඇති අභ්‍යන්ත පාලන සහ අනුකූලතා රාමු මඟින් බැංකුවේ කීර්තිනාමයට එල්ල විය හැකි අවදානම් අවම කිරීමට පියවර ගෙන ඇත.

කීර්තිනාම අවදානම කළමනාකරණය කිරීම සඳහා පූර්ව අනතුරු ඇඟවීමේ දර්ශක, මාධ්‍ය සහ පාර්ශ්වකරුවන්ගේ මතිමතාන්තර විශ්ලේෂණය (Sentiment analysis), පාරිභෝගික ප්‍රතිපෝෂණ මෙන්ම අභ්‍යන්තර වාර්තාකරණ නාලිකා ඔස්සේ නිරන්තර අධීක්ෂණයක් පවත්වා ගනු ලබයි. තීරණාත්මක සිදුවීම් හෝ අලුතින් මතු වන ගැටලු පිළිබඳව

කාලෝචිත ලෙස සමාලෝචනය කර ප්‍රතිකර්ම යෙදීම සඳහා, එම කරුණු ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සහ මණ්ඩල මට්ටමේ කමිටු වෙත වාහාම යොමු කෙරේ. නීති, අනුකූලතා, අවදානම් සහ ආයතනික සන්නිවේදන අංශයන්හි ඒකාබද්ධ සම්බන්ධීකරණය මගින්, කීර්තිනාමයට වල්ල විය හැකි තර්ජන හමුවේ අප දක්වන ප්‍රතිචාර විනිවිදභාවයෙන් යුක්ත, ස්ථාවර සහ ඵලදායී වන බව සහතික කරයි.

කීර්තිනාම අවදානම බොහෝ විට මෙහෙයුම්, උපායමාර්ගික, අනුකූලතා සහ ESG (පාරිසරික, සමාජීය සහ පාලන) යන අවදානම් කාණ්ඩ සමඟ සෘජුවම අන්තර්-සම්බන්ධිතව පවතින බව බැංකුව අවබෝධ කරගෙන සිටී. ඒ අනුව, අපගේ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ පිළිවෙත්, සංදර්භ විශ්ලේෂණයන් (Scenario analyses) සහ ආතති පරීක්ෂණ ක්‍රියාවලීන්හිදී, මූල්‍ය හා මෙහෙයුම් ප්‍රතිවිපාකවලට අමතරව කීර්තිනාමයට වල්ල විය හැකි බලපෑම් පිළිබඳව ද විශේෂ අවධානයක් යොමු කරනු ලබයි.

විනයගරුක පාලනය, පූර්වගාමී අධීක්ෂණය මෙන්ම සදාචාරාත්මක සහ නියාමන ප්‍රමිතීන්ට අනුකූල වීම තුළින් පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය තහවුරු කිරීමටත්, බැංකුවේ ආයතනික ප්‍රතිරූපය සුරැකීමටත්, තිරසාර වර්ධනයක් අත්කර ගැනීමටත් අපි කැපවී සිටින්නෙමු. ඒ අනුව, මූල්‍ය හා මෙහෙයුම් අවදානම් මෙන්ම කීර්තිනාම අවදානම කළමනාකරණය කිරීම ද බැංකුවේ උපායමාර්ගික ප්‍රමුඛතාවක් ලෙස තවදුරටත් තහවුරු කර ඇත.

	2025 දෙසැම්බර් 31 දිනට තත්ත්වය	2024 දෙසැම්බර් 31 දිනට තත්ත්වය
බාහිර ශ්‍රේණිගත කිරීම (Fitch Rating)	AA-	AA-

පුද්ගල අවදානම

පුද්ගල අවදානම යනු සේවකයින්ගේ අයෝග්‍ය ක්‍රියාකලාපයන්, මානව සම්පත් හිඟතාවය හෝ කම්කරු රෙගුලාසිවලට අනුකූල නොවීම හේතුවෙන් මූල්‍යමය හෝ මෙහෙයුම්මය පාඩු සිදුවීමට ඇති ඉඩකඩයි. දිවයින පුරා විසිරුණු විශාල ශ්‍රම බලකායක් සහිත ආයතනයක් ලෙස, මෙහෙයුම් අඛණ්ඩතාවයට, සේවා ගුණාත්මකභාවයට සහ නියාමන අනුකූලතාවයට බලපෑම් කළ හැකි මෙවැනි අවදානම්වලට බැංකුව නිරන්තරයෙන් නිරාවරණය වේ.

2025 වසරේදී ද බැංකුව යම් මට්ටමකට දක්ෂ සේවකයින් ආයතනයෙන් ඉවත්වීමේ (Talent drain) අභියෝගයට මුහුණ දුන් අතර, එය ආයතනික තරඟකාරිත්වය, නිපුණතාව සහ ඵලදායිතාව පවත්වා ගැනීමට බාධාවක් විය. මෙම අවදානම් පාලනය කිරීම උදෙසා, සමස්ත ශාඛා ජාලය පුරාම සේවක කළමනාකරණය විධිමත් කෙරෙන පුළුල් මානව සම්පත් ප්‍රතිපත්ති සහ ක්‍රියාවලීන් බැංකුව විසින් ක්‍රියාත්මක කරනු ලබයි. මෙම ප්‍රතිපත්ති මඟින් සේවකයින් බඳවා ගැනීම, රඳවා ගැනීම සහ ශ්‍රම බලකා සැලසුම්කරණය (Workforce planning) සඳහා ඵලදායී ලෙස සහාය වන අතර, එමඟින් මෙහෙයුම් බාධා අවම කිරීමටත්, සේවක සුබසාධනය තහවුරු කිරීමටත්, සුරක්ෂිත සේවා පරිසරයක් පවත්වා ගැනීමටත් අවස්ථාව සැලසේ.

මානව සම්පත් පාලනය ශක්තිමත් කිරීම සහ ශ්‍රම බලකා කළමනාකරණය උපායමාර්ගික අරමුණු සමඟ ඒකාබද්ධ කිරීම හරහා සේවකයින් ඉවත්වීමේ අනුපාතය (Staff turnover) අවම කිරීමටත්, දක්ෂ සේවකයින් ආයතනය තුළ රඳවා ගැනීමටත් බැංකුව අපේක්ෂා කරයි. සේවක සංවර්ධනය, ඔවුන්ගේ කැපවීම සහ යහපැවැත්ම කෙරෙහි දක්වන අඛණ්ඩ අවධානය නිසා, මෙහෙයුම් ඔරොත්තු දීමේ හැකියාව සහ තිරසාර වර්ධනය තහවුරු කරමින් පුද්ගල අවදානම් ඵලදායී ලෙස කළමනාකරණය කිරීමට බැංකුවට හැකි වේ.

නීතිමය අවදානම

නීති රීති, රෙගුලාසි, ගිවිසුම්ගත බැඳීම් හෝ අභ්‍යන්තර ප්‍රතිපත්තිවලට අනුකූල නොවීම හේතුවෙන් මූල්‍යමය පාඩු, නියාමන සම්බාධක හෝ කීර්තිනාමයට හානි සිදුවීමට ඇති ඉඩකඩ නීතිමය අවදානමයි. දුර්වල කොන්ත්‍රාත් කළමනාකරණය, අධිකරණ ක්‍රියාමාර්ග (Litigation), නීති පද්ධතියේ වෙනස්කම්, නියාමන බලධාරීන්ගේ ක්‍රියාමාර්ග හෝ නීතිමය වගකීම් පැහැර හැරීම වැනි සාධක හේතුවෙන් මෙම අවදානම මතු විය හැකිය. බැංකුව වැනි විශාල හා සංකීර්ණ මෙහෙයුම් පද්ධතියක් පවතින ආයතනයක, නීතිමය අවදානම් ඵලදායී ලෙස පාලනය කිරීම බැංකුවේ පැවැත්ම තහවුරු කිරීමටත්, පාර්ශ්වකරුවන්ගේ අයිතීන් හා මහජන විශ්වාසය සුරැකීමටත් අතිශය වැදගත් වේ.

"බාසල්" (Basel) නියාමන මාර්ගෝපදේශයන්ට අනුව, නීතිමය අවදානම මෙහෙයුම් අවදානමේ (Operational risk) එක් අනු කොටසක් ලෙස සලකනු ලබයි. මෙහිදී බැංකුව පිළිගනු ලබන්නේ බොහෝ නීතිමය ගැටලු ඇති වන්නේ දුර්වල ක්‍රියාවලීන්, මානව දෝෂ හෝ පද්ධතිමය දෝෂයන්ගේ බලපෑමෙන් බවයි. ශක්තිමත් පාලන ක්‍රමවේද සහ විශේෂිත නීතිමය අධීක්ෂණයන්ගෙන් සමන්විත ව්‍යුහගත රාමුවක් ඔස්සේ බැංකුව මෙම අවදානම කළමනාකරණය කරයි. නීති දෙපාර්තමේන්තුව විසින් නියාමන අවශ්‍යතා පිළිබඳ මඟපෙන්වීම් ලබා දීම, ගිවිසුම් සමාලෝචනය කිරීම, ආරවුල් නිරාකරණය සඳහා උපදෙස් සැපයීම සහ කාලීන නීතිමය වෙනස්කම්වලට අනුගත වීම සඳහා අවශ්‍ය සහාය ලබා දෙයි. අනුකූලතා, අවදානම් සහ මෙහෙයුම් අංශයන්හි ඒකාබද්ධ සම්බන්ධීකරණය මගින්, නීතිමය වශයෙන් ඇති විය හැකි අවදානම් කලින් හඳුනාගෙන, ඒවා ගැඹුරින් ඇගයීමට ලක් කර කඩිනමින් විසඳුම් ලබා දීම සහතික කෙරේ.

ESG අවදානම (පරිසර, සමාජීය සහ පාලන අවදානම)

පරිසර, සමාජීය සහ පාලන (ESG) අවදානම් යනු පාරිසරික අභියෝග, සමාජීය සාධක හෝ පාලනයට අදාළ අඩුපාඩු හේතුවෙන් බැංකුවේ මූල්‍ය කාර්යසාධනය, කීර්තිනාමය සහ දිගුකාලීන තිරසාරභාවය කෙරෙහි වල්ල විය හැකි අහිතකර බලපෑම් වේ. නිරන්තරයෙන් විකාශනය වන වර්තමාන නියාමන, සමාජීය සහ පාරිසරික වටපිටාව තුළ, පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා සුරැකීමටත්, මෙහෙයුම් ඔරොත්තු දීමේ හැකියාව පවත්වා ගැනීමටත් ESG අවදානම් ඵලදායී ලෙස කළමනාකරණය කිරීම අතිශය තීරණාත්මක වේ.

ESG අවදානම් යනු ණය, මෙහෙයුම්, උපායමාර්ගික සහ කීර්තිනාම යන අවදානම් සාධක කෙරෙහි බලපෑම් කළ හැකි, ඒකාබද්ධ වූත්, එකිනෙකට අන්තර්-සම්බන්ධිත වූත් අවදානම් කාණ්ඩයක් බව බැංකුව පිළිගනී. පාරිසරික අවදානම්. යටතට දේශගුණික විපර්යාස, ස්වාභාවික විපත් සහ පාරිසරික හායනය වැනි සාධක ඇතුළත් වන අතර, එමගින් ණය ගැණුම්කරුවන්ට, වත්කම්වලට හෝ බැංකුවේ මෙහෙයුම්වලට බලපෑම් වල්ල විය හැකිය. සමාජීය අවදානම් ශ්‍රම බලකා කළමනාකරණය, මානව හිමිකම්, ප්‍රජා බලපෑම සහ පාරිභෝගික පිළිවෙත් සමඟ සම්බන්ධ වන අතර, පාලන අවදානම් යටතට අනුකූලතා අසාර්ථකත්වයන්, ආචාර ධර්ම පිරිහීම සහ දුර්වල අධීක්ෂණ ව්‍යුහයන් ඇතුළත් වේ.

ESG අවදානම් කළමනාකරණය කිරීම සඳහා, බැංකුව සිය උපායමාර්ගික සැලසුම්කරණය, ණය තක්සේරු කිරීම් සහ ආයෝජන තීරණ ඇතුළු සමස්ත අවදානම් කළමනාකරණ රාමුවට ESG සලකා බැලීම් ඒකාබද්ධ කර ඇත. සිදුවියහැකි අහිතකර බලපෑම් හඳුනාගෙන ඒවා අවම කිරීම සහතික කරනු වස්, ආංශික විශ්ලේෂණයන්, නිසි සුපරීක්ෂණය (Due diligence) සහ අවදානම් රුචියෙහි සීමාවන් නිර්වචනය කිරීමේදී ESG සාධක ද සැලකිල්ලට ගනු ලබයි. ESG අවදානම් නිරාවරණයන් සහ ඒවා පාලනය කිරීමට ගෙන ඇති පියවර, ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සහ මණ්ඩල මට්ටමේ කමිටු වෙත නිතිපතා වාර්තා කෙරේ. එමගින් මනා අධීක්ෂණයකට, දැනුවත් තීරණ ගැනීමකට සහ නියාමන අපේක්ෂාවන් සමඟ බැංකුවේ ක්‍රියාකාරිත්වය සමපාත කිරීමට සහාය ලැබේ.

බැංකුව සිය මෙහෙයුම් කටයුතු ජාතික සහ ගෝලීය තිරසාර ප්‍රමුඛතාවන් සමඟ සමපාත කරමින්, තිරසාර මූල්‍ය මුලපිරීම්, හරිත ණය ලබාදීම සහ සමාජීය වශයෙන් වගකිවයුතු ආයෝජන පිළිවෙත් ප්‍රවර්ධනය කරයි. අධීක්ෂණ හා වාර්තාකරණ යාන්ත්‍රණයන්, කාර්ය මණ්ඩල පුහුණුව සහ යහපාලන ප්‍රමිතීන් සමඟ ඒකාබද්ධ කිරීම මගින් ආයතනික විනිවිදභාවය සහ වගවීම ඉහළ නංවන අතරම, අලුතින් මතු වන ESG අවදානම් හඳුනා ගැනීමට සහ ඒවාට සාර්ථකව ප්‍රතිචාර දැක්වීමට බැංකුව සතු හැකියාව ද එමගින් වර්ධනය වේ. මෙම ක්‍රමානුකූල සහ පූර්ව අවධානයෙන් යුත් ප්‍රවේශය හරහා දිගුකාලීන වටිනාකම් සුරැකීමටත්, පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය තහවුරු කිරීමටත් බැංකුව අපේක්ෂා කරයි. එමෙන්ම, විචක්ෂණශීලී විනය සහ මෙහෙයුම් ස්ථාවරත්වය පවත්වා ගනිමින් තිරසාර ආර්ථික හා සමාජීය සංවර්ධනය උදෙසා දායක වීම ද අපගේ අරමුණයි.

දේශගුණික අවදානම

බැංකුවේ පුළුල් ESG අවදානම් රාමුවේ ප්‍රධාන අංගයක් ලෙස දේශගුණික අවදානම හඳුනාගෙන ඇති අතර, එය විශේෂයෙන්ම පාරිසරික මානය (Environmental dimension) යටතේ විග්‍රහ කෙරේ. ණය ගුණාත්මකභාවය, ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය, ද්‍රවශීලතාව සහ දිගුකාලීන උපායමාර්ගික ඔරොත්තු දීමේ හැකියාව කෙරෙහි මෙයින් වල්ල විය හැකි බලපෑම සලකා බලා, මෙය සුවිශේෂී මූල්‍ය අවදානම් සාධකයක් ලෙස කළමනාකරණය කරනු ලබයි

දේශගුණික විපර්යාසයන් සහ අඩු කාබන් ආර්ථිකයක් කරා වන සංක්‍රමණය හේතුවෙන් මතු විය හැකි මූල්‍යමය හා මූල්‍ය නොවන බලපෑම් දේශගුණික අවදානම මඟින් නිරූපණය කෙරේ. දේශගුණික විපර්යාසයන් තීව්‍ර වීමත් සමඟ අත්‍යන්ත කාලගුණික සිදුවීම්වල වාර ගණන සහ බරපතලකම ඉහළ යාම මෙන්ම, නිරන්තරයෙන් වෙනස් වන නියාමන අවශ්‍යතා, ප්‍රතිපත්තිමය ප්‍රතිචාර සහ වෙළෙඳපොළ අපේක්ෂාවන් හේතුවෙන් මූල්‍ය ආයතනවල මෙහෙයුම් වටපිටාව ද නව මුහුණුවරක් ගනිමින් පවතී. මෙම තත්ත්වය, පූර්වගාමී අවදානම් කළමනාකරණයක සහ උපායමාර්ගික අනුවර්තනයක අවශ්‍යතාව තවදුරටත් අවධාරණය කරයි.

දේශගුණික විපර්යාස මගින් සිය ව්‍යාපාරික ආකෘතියේ මූල්‍ය හා මෙහෙයුම් අංශ කෙරෙහි තීරණාත්මක බලපෑමක් වීල්ල වන බව බැංකුව පිළිගනී. ඒ අනුව, ණය කළඹේ කාර්යසාධනය, ප්‍රාග්ධන සැලසුම්කරණය, අරමුදල් සුරක්ෂිතතාව, ව්‍යාපාර අඛණ්ඩතාව සහ දිගුකාලීන උපායමාර්ගික දිශානතිය කෙරෙහි මෙයින් වීල්ල වන බලපෑම් සලකා බලා, දේශගුණික අවදානම භෞතික අවදානම සහ සංක්‍රාන්ති අවදානම ලෙස බැංකුව විසින් වර්ගීකරණය කර ඇත.

ගංවතුර, නියඟ සහ ආන්තික කාලගුණික තත්ත්වයන් වැනි උග්‍ර සිදුවීම් මෙන්ම, ණය ගැතියන්ගේ ආපසු ගෙවීමේ ශක්තිය හීන කළ හැකි හෝ මෙහෙයුම්වලට බාධා කළ හැකි දීර්ඝකාලීන පාරිසරික වෙනස්කම් හේතුවෙන් භෞතික අවදානම් පැන නගී. සංක්‍රාන්ති අවදානම් මතු වන්නේ අඩු කාබන් ආර්ථිකයක් කරා යන ගමනේදී සිදුවන ප්‍රතිපත්තිමය වෙනස්කම්, තාක්ෂණික දියුණුව, වෙළඳපොළ ප්‍රවණතාවල විපර්යාසයන් සහ පාර්ශ්වකරුවන්ගේ වෙනස් වන අපේක්ෂාවන් හේතුවෙන් වන අතර, එමගින් ඇතැම් ව්‍යාපාරික අංශ සහ ගනුදෙනුකාර පාර්ශ්වයන් වෙත බලපෑම් වල්ල විය හැකිය.

දේශගුණයට අදාළ අවදානම් ක්‍රමානුකූලව හඳුනා ගැනීම සහ මැන බැලීම සඳහා, බැංකුව විසින් ලකුණු කාඩ්පත් පදනම් කරගත් (Scorecard-based) තක්සේරු ක්‍රමවේදයක් අනුගමනය කර ඇත. මෙම ක්‍රමවේදය හරහා, භෞතික සහ සංක්‍රාන්ති අවදානම් යන අංශ ද්විත්වයම සැලකිල්ලට ගනිමින්, එක් එක් ව්‍යාපාරික අංශවල දේශගුණික සංවේදීතාව (Sectoral climate sensitivity) මත පදනම්ව ණය කළඹ ඇගයීමට ලක් කෙරේ. පූර්ව අවධානයෙන් යුත් අවදානම් කළමනාකරණයක් උදෙසා මෙම දේශගුණික අවදානම් තක්සේරු ප්‍රතිඵල, බැංකුවේ අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය තක්සේරු කිරීමේ ක්‍රියාවලිය (ICAAP) සහ ආතති පරීක්ෂණ (Stress testing) යන පද්ධති සමඟ ඒකාබද්ධ කර ඇත.

තම ණය කළඹේ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කරන අතරම, ජාතික දේශගුණික ප්‍රමුඛතාවයන්ට සහාය වෙමින් හරිත සහ තිරසාර මූල්‍යකරණ අවස්ථා හඳුනා ගැනීමට ද බැංකුව කැපවී සිටී.

පූර්ව අධීක්ෂණය, සංදර්භ විශ්ලේෂණය (Scenario analysμs) සහ උපායමාර්ගික ඒකාබද්ධතාවය හරහා, තිරසාර ආර්ථික සංවර්ධනයට සහ දිගුකාලීන වටිනාකම් නිර්මාණයට දායක වන අතරම, දේශගුණික අවිනිශ්චිතතාවයන්ට මුහුණ දීම සඳහා වන සූදානම තවදුරටත් ඉහළ නැංවීම බැංකුවේ අරමුණයි.

ප්‍රාග්ධන කළමනාකරණය සහ අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය පිළිබඳ රාමුව

බැංකුව සිය අවදානම් පැතිකඩ, නියාමන අවශ්‍යතා සහ දිගුකාලීන උපායමාර්ගික දිශානතියට අනුකූලව, ප්‍රමාණවත් ප්‍රාග්ධන ස්වාරක්ෂක (Capital buffers) පවත්වා ගැනීම සඳහා වූ ශක්තිමත් මෙන්ම විනයගරුක ප්‍රාග්ධන කළමනාකරණ රාමුවක් අනුගමනය කරයි. තිරසාර ව්‍යාපාරික වර්ධනයට සහාය වෙමින් සහ පාර්ශ්වකරුවන්ගේ අයිතීන් සුරක්ෂිත කරමින් බැංකුවේ ප්‍රාග්ධන ශක්තිමත්භාවය තහවුරු කරනු පිණිස, නියාමන සීමාවන් මෙන්ම අභ්‍යන්තරව පනවා ඇති සීමාවන්ට අනුකූලව ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය නිරන්තර අධීක්ෂණයට ලක් කෙරේ.

අවම නියාමන ප්‍රාග්ධන අවශ්‍යතාවලින් ඔබ්බට ගිය, බැංකුවට බලපාන සියලුම තීරණාත්මක අවදානම් පිළිබඳ පුළුල් තක්සේරුවක් ලබා දෙන "අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය තක්සේරු කිරීමේ ක්‍රියාවලිය" (ICAAP), සමස්ත ආයතනික අවදානම් කළමනාකරණ රාමුවේ පදනම ලෙස සැලකේ. මෙම ක්‍රියාවලිය යටතේ, බැංකුවේ උපායමාර්ගික සැලසුම්, වර්ධන ඉලක්ක සහ වෙනස් වන අවදානම් වටපිටාව සමඟ සමපාත වන පරිදි ඉදිරි වසර පහ සඳහා ප්‍රාග්ධන ප්‍රක්ෂේපණයන් සිදු කරනු ලබයි. මෙම ඉදිරි දැක්මක් සහිත ප්‍රවේශය මගින්, විචක්ෂණශීලී ලෙස අවදානම් ආවරණය කරමින් බැංකුවේ අනාගත ව්‍යාප්තිය සඳහා අවශ්‍ය ප්‍රාග්ධන ස්ථාවරත්වය සහතික කරයි. ICAAP හරහා බැංකුව ණය, වෙළඳපොළ, මෙහෙයුම්, ද්‍රවශීලතාව මෙන්ම අලුතින් මතු වන අවදානම් ද ක්‍රමානුකූලව ඇගයීමට ලක් කරන අතර, සාමාන්‍ය මෙන්ම ආතති සහගත තත්ත්වයන් යටතේ බැංකුවට අවශ්‍ය වන ප්‍රාග්ධන මට්ටම් විමගින් තීරණය කෙරේ.

මෙම රාමුව ආතති පරීක්ෂණ (Stress testing), සංදර්ශන විශ්ලේෂණය (Scenario analysis) සහ ප්‍රාග්ධන පුරෝකථනය (Capital forecasting) වැනි ශක්තිමත් ක්‍රමවේදයන් මත පදනම් වී ඇති අතර, විමගින් අහිතකර ආර්ථික හා මූල්‍ය තත්ත්වයන් යටතේ බැංකුවේ ඔරොත්තු දීමේ හැකියාව සාමූහිකව ඇගයීමට ලක් කෙරේ. සාර්ව ආර්ථික කම්පන, පොලී අනුපාත අස්ථාවරත්වය, ණය ගුණාත්මකභාවය පිරිහීම, ද්‍රවශීලතා සීමාවන් සහ දේශගුණික විපර්යාසයන් වැනි අලුතින් මතු වන අවදානම් සහගත තත්ත්වයන් මෙම විශ්ලේෂණයන් සඳහා උපයෝගී කර ගනු ලබයි. මෙම අභ්‍යාසවල ප්‍රතිඵල මගින් බැංකුවේ ඔරොත්තු දීමේ හැකියාව පිළිබඳ වටිනා අවබෝධයක් ලබා දෙන අතරම, බැංකුව මුහුණ දිය හැකි තීරණාත්මක අවදානම් (Vulnerabilities) හඳුනා ගැනීමටත්, ඒ සඳහා අවශ්‍ය හදිසි ක්‍රියාමාර්ග සහ ප්‍රමාණවත් ප්‍රාග්ධන ස්වාරක්ෂක (Capital buffers) සකස් කිරීමටත් මනා සහායක් ලබා දෙයි.

බැංකුවේ ව්‍යාපාරික උපායමාර්ගයන් සහ අවදානම් රුචිය එකිනෙක සමපාත කිරීමේදී ප්‍රධාන සාධකයක් ලෙස ක්‍රියා කරමින්, උපායමාර්ගික තීරණ ගැනීමේ ක්‍රියාවලියෙහිලා ICAAP තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. විමගින් උපායමාර්ගික මුලපිරීම්වල ප්‍රාග්ධනයට චිල්ල විය හැකි බලපෑම (Capital implications) ඇගයීමටත්, විවිධ ව්‍යාපාරික අංශයන් අතර ප්‍රාග්ධන ප්‍රතිපාදන වෙන් කිරීම ප්‍රශස්ත කිරීමටත්, බැංකුවේ වර්ධන සැලසුම් පිළිගත හැකි අවදානම් සීමාවන් තුළ පවතින බව සහතික කිරීමටත් බැංකුවට හැකියාව සැලසේ.

විකාශනය වන නියාමන අපේක්ෂාවන් සහ ක්ෂේත්‍රයේ යහපත් පරිචයන් සමඟ අනුගත වීම සහතික කරනු පිණිස, ICAAP රාමුව නිරන්තර විමර්ශනයට සහ යාවත්කාලීන කිරීම්වලට ලක් කෙරේ. මෙම අබණ්ඩ වර්ධන ක්‍රියාවලිය මගින් ශක්තිමත් ප්‍රාග්ධන මට්ටමක් පවත්වා ගැනීමටත්, අවදානම් දරාගැනීමේ හැකියාව (Risk absorption capacity) ඉහළ නැංවීමටත් බැංකුවට ශක්තියක් ලබා දෙයි. විමෙන්ම, වේගයෙන් වෙනස් වන අවදානම් වටපිටාවක වුව ද දිගුකාලීන මූල්‍ය ස්ථාවරත්වය තහවුරු කිරීමට මෙමගින් අවස්ථාව සැලසේ.

ස්ථාවරත්වය සහ යථා තත්ත්වයට පත්වීමේ සැලසුම්

අතිශය පීඩාකාරී තත්ත්වයන් යටතේ වුව ද තම තීරණාත්මක කාර්යයන් අබණ්ඩව පවත්වාගෙන යාම සහතික කිරීම සඳහා බැංකුව විසින් විස්තීර්ණ "යථා තත්ත්වයට පත්වීමේ සැලසුම් රාමුවක්" (Recovery planning framework) ස්ථාපිත කර ඇත. බාහිර සහයෝගය මත යැපීමකින් තොරව, අහිතකර තත්ත්වයන්ට ඵලදායී ලෙස ප්‍රතිචාර දැක්වීමට බැංකුව බලගැන්වීම හරහා මූල්‍ය ස්ථාවරත්වය සුරැකීම සහ පාර්ශ්වකරුවන්ගේ අයිතීන් ආරක්ෂා කිරීම මෙම සැලසුමෙහි ප්‍රධාන අරමුණයි.

බැංකුවේ ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යාමේ හැකියාව සැලකිය යුතු ලෙස පිරිහීමට ලක්වන අවස්ථාවකදී ක්‍රියාත්මක කිරීම සඳහා, විශ්වසනීය ප්‍රතිසාධන විකල්ප, පැහැදිලි පාලන ව්‍යුහයන්, පූර්ව අනතුරු ඇඟවීමේ දර්ශක සහ ගැටලු ඉහළ මට්ටම් වෙත යොමු කිරීමේ ක්‍රමවේද මෙම සැලසුම (RCP) මගින් ඉදිරිපත් කරයි. මෙම සැලසුම බැංකුවේ ICAAP, ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණ පද්ධතිය (BCMS), ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම්, ආපදා කළමනාකරණ සැලසුම් (BCP/DRP), අවදානම් කළමනාකරණ රාමුව හදිසි අවශ්‍යතා අරමුදල් සැලසුම් සහ අර්බුද කළමනාකරණ විධිවිධාන සමඟ සහජීවනයෙන් (Complement) ක්‍රියාත්මක වන පරිදි සකස් කර ඇත.

මෙම සැලැස්ම බැංකුවට පමණක් බලපාන, සමස්ත වෙළඳපොළටම බලපාන හෝ එම තත්ත්වයන් දෙකෙහිම එකතුවකින් සැදුම්ලත්, දැඩි වීහෙත් සිදුවිය හැකි ආතති සහගත අවස්ථා (Stress scenarios) කිහිපයක් මත පදනම් වී ඇත. මෙම අවස්ථා මගින් අහිතකර සාර්ව ආර්ථික තත්ත්වයන්, මූල්‍ය වෙළඳපොළ බාධාවන් සහ ආයතනයට පමණක් චිල්ල වන කම්පන හමුවේ බැංකුවේ ඔරොත්තු දීමේ හැකියාව ඇගයීමට ලක් කෙරේ. බැංකුව නියාමන අවම අවශ්‍යතා සපුරාලීමට අපොහොසත් වීමට පෙර, ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයට සහ අධ්‍යක්ෂ මණ්ඩලයට මැදිහත් වී කාලෝචිත පියවර ගත හැකි වන පරිදි, පැහැදිලි සීමාවන් සහිත ප්‍රමාණාත්මක සහ ගුණාත්මක ප්‍රතිසාධන දර්ශක (Recovery indicators) මෙහි අර්ථ දක්වා ඇත.

ප්‍රාග්ධනය, ද්‍රවශීලතාව, ශේෂ පත්‍රය සහ මෙහෙයුම් පැතිකඩ යන අංශ ඔස්සේ යථා තත්ත්වයට පත්වීමේ ශක්‍යතාව RCP මගින් හඳුනා ගන්නා අතර, පීඩාකාරී තත්ත්වයන් යටතේ එම පියවරවල සාර්ථකත්වය, ඵලදායීතාව සහ ක්‍රියාත්මක කිරීමේ වේගය ද ඇගයීමට ලක් කරයි. ප්‍රධාන ප්‍රතිසාධන පියවරයන්ට ප්‍රාග්ධනය ශක්තිමත් කිරීමේ ක්‍රියාමාර්ග, ද්‍රවශීලතාව ඉහළ නැංවීමේ උපායමාර්ග, ශේෂ පත්‍ර ප්‍රශස්තිකරණය, පිරිවැය තාර්කිකකරණය සහ බාධාවකින් තොර පාරිභෝගික සේවාවක් සහ සන්නාම වටිනාකම (Franchise Value) ඇතුළු බැංකුවේ මූලික මෙහෙයුම් සුරැකීම අරමුණු කරගත් උපායමාර්ගික පියවර ඇතුළත් වේ.

අභියෝග

සාර්ව ආර්ථික සහ පැරණි පද්ධතිමය පීඩනයන්

පසුගිය වසරවල පැවති දරුණු මූල්‍ය හා විනිමය අර්බුදයෙන් පසුව ශ්‍රී ලංකා ආර්ථිකය තවමත් යථා තත්ත්වයට පත්වීමේ අදියරක පවතී. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහාය ඇතිව ක්‍රියාත්මක වන වැඩසටහන යටතේ උද්ධමනය ස්ථාවර කිරීම සහ ණය ප්‍රතිව්‍යුහගතකරණය පිළිබඳ ප්‍රගතියක් සහිතව ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ අඛණ්ඩව සිදු වුවද, පුළුල් මූල්‍ය පරිසරය තවදුරටත් අභියෝගාත්මක විය. පවතින රාජ්‍ය මූල්‍ය සහ ව්‍යුහාත්මක පීඩනයන් මධ්‍යයේ, බැංකු පද්ධතිය මෙම සංකීර්ණ ආර්ථික වටපිටාව තුළ සිය ඔරොත්තු දීමේ හැකියාව සහ විචක්ෂණශීලී කළඹ අධීක්ෂණය කෙරෙහි අවධානය යොමු කළේය.

ඉහළ ණය අවදානම සහ රජය සතු ව්‍යවසාය (SOE) නිරාවරණයන්

වසර තුළ බැංකුව මුහුණ දුන් ප්‍රධානතම අභියෝගය වූයේ රජය සතු ව්‍යවසායන් (SOEs) වෙත ඇති පෙර පැවති නිරාවරණයන්ය. මේවායින් බොහොමයක් දුර්වල මෙහෙයුම් ක්‍රියාකාරිත්වය හේතුවෙන් ඉහළ ණය අවදානමකින් යුක්ත විය. වර්ෂය තුළ මෙම SOE නිරාවරණයන් උපායමාර්ගිකව අඩු කිරීමේදී, මහජන බැංකුව මුදල් අමාත්‍යාංශයේ සහයෝගීතාවයෙන් යුතුව ක්‍රමවත් ලෙස බේරුම්කරණ සිදු කළ අතර, ප්‍රාග්ධන සහ ඉපැයීම් මට්ටම්වල ස්ථාවරත්වය සුරකිමින් විනයගරුක අවදානම් කළමනාකරණයක් පවත්වා ගත්තේය.

විචක්ෂණශීලී ණය සඳහා උපායමාර්ග මගින් ණය කළඹේ ස්ථායීතාව වර්ධනය කිරීම

කළඹේ ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නංවන විචක්ෂණශීලී ණය දීමේ උපාය මාර්ගය අතිරික්ත ද්‍රවශීලතාව ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගැනීමේ අරමුණින්, උසස් තත්ත්වයේ ණය දීමේ අවස්ථා සඳහා අරමුදල් යොමු කිරීම කෙරෙහි බැංකුව අවධානය යොමු කළේය. මෙම උපාය මාර්ගයේ ප්‍රධාන අංගයක් වූයේ, රජය සතු ව්‍යවසායන් (SOEs) වෙත ඇති පෙර පැවති නිරාවරණයන්ගෙන් බැහැර වී පෞද්ගලික අංශයේ පුළුල් ගනුදෙනුකාර පදනමක් වෙත ප්‍රවේශමෙන් සංක්‍රමණය වීමයි. මෙම මාරුව දැඩි ණය තක්සේරු කිරීම් සහ විචක්ෂණශීලී කළඹ අධීක්ෂණය මඟින් මෙහෙයවන ලද අතර, ණය දීමේ ක්‍රියාකාරකම් බැංකුවේ අවදානම් කළමනාකරණ රාමුව සමඟ අනුකූල වන බව සහතික කෙරිණි. සාන්ද්‍රණ අවදානම අවම කිරීම සහ කළඹේ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම සඳහා විවිධ අංශ සහ භූගෝලීය කලාපීය විවිධාංගීකරණය කෙරෙහි මෙහිදී අවධානය යොමු විය.

පෙර පැවති SOE සබඳතා ඉලක්කගත බේරුම්කරණයන් හරහා ප්‍රවේශමෙන් කළමනාකරණය කරන ලද අතර, එමඟින් ඓතිහාසික නිරාවරණයන් ක්‍රමානුකූලව අඩු කිරීමට සහාය විය. එමෙන්ම, උසස් ණය ගුණාත්මකභාවය සුරැකීම සඳහා නව පෞද්ගලික අංශයේ සබඳතා විධිමත් නිසි කඩිසරභාවයකින් යුතුව වර්ධනය කරන ලදී. වැඩිදියුණු කළ වාර්තාකරණය, අධීක්ෂණය සහ සමාලෝචන ක්‍රියාවලීන් ඇතුළුව මෙම සංක්‍රාන්තියට සහාය වීම සඳහා මෙහෙයුම් සහ අවදානම් කළමනාකරණ රාමු තවදුරටත් ශක්තිමත් කෙරිණි. මෙම පියවර හරහා, බැංකුව සිය සමස්ත ණය පොතේ අඛණ්ඩතාව, ස්ථාවරත්වය සහ ඔරොත්තු දීමේ හැකියාව පවත්වා ගනිමින් පෞද්ගලික අංශයේ ණය කළඹ සාර්ථකව පුළුල් කළේය.

මෙහෙයුම් සහ ඩිජිටල් පරිවර්තන අභියෝග

ඩිජිටල් පරිවර්තනය කරා බැංකුව මෙහෙයවීම සහ මූල්‍ය අන්තර්කරණය පුළුල් කිරීම ප්‍රධාන උපායමාර්ගික ශක්තියක් වූ අතර, එමඟින් තාක්ෂණික අවදානම් කළමනාකරණය, දත්ත පාලනය සහ සයිබර් ආරක්ෂණ ඔරොත්තු දීමේ හැකියාව කෙරෙහි ඉහළ අවධානයක් යොමු කිරීමට සිදු විය. ඩිජිටල් පාරිභෝගිකයින් වික්කර ගැනීම (Digital onboarding) සහ ජංගම බැංකු භාවිතයේ සැලකිය යුතු වර්ධනය මඟින් පිළිබිඹු වන පරිදි, ඩිජිටල් භාවිතය ව්‍යාප්ත කිරීම සඳහා පද්ධති පුරා ශක්තිමත් මෙහෙයුම් සහ තාක්ෂණික පාලනයන් ස්ථාපිත කිරීමට බැංකුවට අවශ්‍ය විය. මෙම උත්සාහය සඳහා දක්ෂ ශ්‍රම බලකාය, ඔරොත්තු දෙන යටිතල පහසුකම් සහ පුළුල් පාලන රාමු වෙනුවෙන් තිරසාර ආයෝජනයක් අවශ්‍ය විය. මෙම හැකියාවන් ශක්තිමත් කිරීම මඟින්, මෙහෙයුම්වල අඛණ්ඩතාව, ආරක්ෂාව සහ විශ්වසනීයත්වය පවත්වා ගනිමින් පාරිභෝගිකයින්ට බාධාවකින් තොර ඩිජිටල් අත්දැකීමක් ලබා දීමට බැංකුවට හැකි විය.

දේශගුණික අවදානම් ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම

වැඩිවන කාලගුණික විචල්‍යතාව සහ වසරේ අග භාගයේ පැවති අහිතකර කාලගුණික තත්ත්වයන් වැනි දේශීය අත්‍යන්ත සිදුවීම් (Localised extreme events) හේතුවෙන්, 2025 වසර තුළ දේශගුණික අවදානම් කෙරෙහි අවධානය යොමු කිරීම අභියෝගාත්මක විය. මෙම වර්ධනයන් මඟින් බැංකුවේ ණය කළඹ තුළ පවතින ඇතැම් අංශ සහ පාරිභෝගික කාණ්ඩ කෙරෙහි භෞතික දේශගුණික අවදානම්වල (Physical climate risks) විභව බලපෑම අවධාරණය කෙරිණි. ඒ සමඟම, තිරසාර මූල්‍යකරණය සහ පාරිසරික වගකීම් පිළිබඳ වර්ධනය වන අපේක්ෂාවන් හේතුවෙන්, බැංකුවේ පුළුල් අවදානම් කළමනාකරණ රාමුව තුළ දේශගුණික අවදානම් ඒකාබද්ධ කිරීම අඛණ්ඩව වැඩිදියුණු කිරීමට අවශ්‍ය විය.

ඊට ප්‍රතිචාර වශයෙන්, ණය ඇගයීම් සහ ආංශික අවදානම් සමාලෝචන සඳහා පාරිසරික සාධක ඇතුළත් කිරීම මඟින් බැංකුව සිය දේශගුණික අවදානම් තක්සේරු ක්‍රියාවලීන් තවදුරටත් ශක්තිමත් කළේය. අවදානමට ලක්විය හැකි කර්මාන්ත සඳහා වැඩිදියුණු කළ අධීක්ෂණ යාන්ත්‍රණයන් ක්‍රියාත්මක කළ අතර, ඇති විය හැකි බාධාවන් වඩාත් හොඳින් පූර්ව නිගමනය කිරීම සඳහා ආතති සහගත තත්ත්වයන් (Stress considerations) කළඹ අධීක්ෂණයට අන්තර්ගත කරන ලදී. බැංකුව වගකීම් සහගත ණය දීමේ පිළිවෙත් ප්‍රවර්ධනය කළ අතර, ව්‍යාපාරික වර්ධනය දිගුකාලීන ඔරොත්තු දීමේ අරමුණු සමඟ සමපාත කරමින් පාරිසරික වශයෙන් තිරසාර මුලපිරීම් සඳහා හැකි සෑම විටම සහාය විය.

තාක්ෂණික අවදානම් කළමනාකරණ රාමුව ශක්තිමත් කිරීම

වඩ වඩාත් ගතික සහ අධි-අවදානම් සහිත තාක්ෂණික වටපිටාව වසර තුළ බැංකුවේ මෙහෙයුම් පරිසරය කෙරෙහි දැඩි බලපෑමක් එල්ල කළේය. මෙය සයිබර් තර්ජන ඉහළ යාම, වේගවත් ඩිජිටල් පරිවර්තන වැඩසටහන්, තෙවන පාර්ශ්වීය සේවා සපයන්නන් මත යැපීම පුළුල් වීම සහ දැඩි නියාමන පරීක්ෂාවන් (Regulatory scrutiny) මඟින් සංලක්ෂිත විය. ඩිජිටල් නාලිකා, පද්ධති ඒකාබද්ධ කිරීම් සහ දත්ත පදනම් කරගත් මෙහෙයුම් ව්‍යාප්ත වීම හේතුවෙන් සයිබර් අවදානම්, පද්ධති ඔරොත්තු දීමේ හැකියාව, දත්ත අඛණ්ඩතාව සහ තෙවන පාර්ශ්වීය තාක්ෂණික අවදානම් සඳහා බැංකුවේ නිරාවරණය ඉහළ ගියේය. මෙම වර්ධනයන් හමුවේ තාක්ෂණික අවදානම් අධීක්ෂණය සඳහා වඩාත් ව්‍යුහගත සහ ඉදිරි දැක්මක් සහිත ප්‍රවේශයක (Forward-looking approach) අවශ්‍යතාව මතු විය.

ඊට ප්‍රතිචාර වශයෙන්, අලුතින් මතුවන දුර්වලතාවන් කාලෝචිත ලෙස හඳුනා ගැනීම, තක්සේරු කිරීම සහ සමනය (Mitigate) කිරීම සහතික කරනු වස්, බැංකුව සිය තාක්ෂණික අවදානම් කළමනාකරණ රාමුව පුළුල් ලෙස වැඩිදියුණු කිරීමට පියවර ගත්තේය. වැඩිදියුණු කළ අවදානම් හඳුනාගැනීමේ සහ තක්සේරු කිරීමේ ක්‍රමවේද හඳුන්වාදීම, කාලානුරූපී තාක්ෂණික අවදානම් සහ පාලන ස්වයං-තක්සේරු (RCSAs) සිදු කිරීම, අවදානම් තක්සේරුකරණ සහ විනිවිද යාමේ පරීක්ෂණ (Penetration testing) පද්ධතීන් ශක්තිමත් කිරීම මෙන්ම තීරණාත්මක පද්ධති සහ යටිතල පහසුකම් අධීක්ෂණය වැඩිදියුණු කිරීම මෙහි ප්‍රධාන වැඩසටහන් අතර විය.

මෙම ව්‍යුහගත මැදිහත්වීම් හරහා, වසර තුළ මතු වූ තාක්ෂණය ආශ්‍රිත අභියෝග ඵලදායී ලෙස කළමනාකරණය කිරීමටත්, පාලන වටපිටාව ශක්තිමත් කරමින් මෙහෙයුම්හි ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීමටත් බැංකුවට හැකි විය. මෙම නවීකරණය කරන ලද රාමුව හරහා, බැංකුවේ අවදානම් රුචිය තුළ සිටිමින් පුළුල් ඩිජිටල් පරිවර්තන ක්‍රියාවලියට සහාය දෙන අතරම, පරිණාමය වන තාක්ෂණික අවදානම් සඳහා පූර්වගාමීව විසඳුම් සෙවීමට බැංකුව ස්ථානගත වී ඇත.

බාහිර සහ වෙළෙඳපොළ අවිනිශ්චිතතාවන්

2025 වසරේ පැවති ගෝලීය ආර්ථික අස්ථාවරත්වය මූල්‍ය ආයතන සඳහා අභියෝගාත්මක පසුබිමක් නිර්මාණය කළේය. එසේ වුවද, දේශීය මූල්‍ය තත්ත්වයන් ස්ථාවර වීමේ ලකුණු පෙන්නුම් කළ අතර, එමඟින් බැංකුවට වසර පුරා විචක්ෂණශීලීව කටයුතු කිරීමට ඉඩ සැලසිණි. පවතින බාහිර අවිනිශ්චිතතාවන් හේතුවෙන් ද්‍රවශීලතාව සහ පොලී අනුපාතික නිරාවරණයන් පිළිබඳව දැඩි අවධානයෙන් පසුවීමට සිදු වූ අතර, ස්ථාවරත්වය සුරැකීම සඳහා බැංකුව සිය අවදානම් කළමනාකරණ රාමු තවදුරටත් ශක්තිමත් කළේය. මෙම පියවරයන් හරහා මෙහෙයුම් ඔරොත්තු දීමේ හැකියාව සුරක්ෂිත කිරීමටත්, පාරිභෝගික සේවාවන් අඛණ්ඩව පවත්වා ගැනීමටත්, පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය දිනාගැනීමටත් බැංකුවට හැකි විය.

මෙම අභියෝග මධ්‍යයේ වුවද මහජන බැංකුව සිය ඔරොත්තු දීමේ හැකියාව සහ අනුවර්තනය වීමේ ශක්තිය මැනවින් ප්‍රදර්ශනය කළේය. බැංකුව වාර්තාගත ලාභාංශ අත්කර ගත් අතර, සිය වත්කම් පදනම සහ තැන්පතු පදනම පුළුල් කරමින් ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවයේ අනුපාතයන් ශක්තිමත් කිරීමට පියවර ගත්තේය. එමෙන්ම, ඉහළ අවදානම් සහිත නිරාවරණයන්හි ඝාන්ද්‍රණයන් අවම කිරීමට ද බැංකුව සමත් විය. 2025 වසර පුරා සාර්ව ආර්ථික සංකීර්ණතාවන් පැවති නමුදු, මෙම ප්‍රතිඵල මඟින් උපායමාර්ගික වර්ධන අවශ්‍යතා සහ විනයගරුක අවදානම් කළමනාකරණය අතර පවතින විචක්ෂණශීලී සමබරතාව (Judicious balance) පිළිබිඹු විය.

ආයතනික පාලනය

ව්‍යවස්ථාපිතව පිහිටුවන ලද රජයට අයත් බැංකුවක් ලෙස, මහජන බැංකුව පුද්ගලික අංශයේ බැංකුවලට වඩා නිතැතින්ම සංකීර්ණ වූ පාලන රාමුවක් තුළ ක්‍රියාත්මක වේ. බැංකු ක්ෂේත්‍රයට අදාළ දැඩි නියාමන අවශ්‍යතාවලට අනුකූල වීමට අමතරව, බැංකුවේ පාලන ව්‍යුහය 1961 අංක 29 දරන මහජන බැංකු පනත සහ එහි පසුකාලීන සංශෝධනවල විධිවිධාන මගින් මෙහෙයවනු ලැබේ.

මහජන බැංකුව කොටස් වෙළඳපොළේ ලැයිස්තුගත ආයතනයක් නොවුණ ද, වගවීම, විනිවිදභාවය සහ සදාචාරාත්මක හැසිරීම් පිළිබඳ ඉහළ ප්‍රමිතීන් පවත්වා ගැනීමට ඇති කැපවීම පෙන්නුම් කරමින්, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික පාලනය පිළිබඳ යහ පිළිවෙත් සංග්‍රහයට බැංකුව ස්වේච්ඡාවෙන්ම අනුකූල වේ.

බැංකුවේ ඉහළම පාලක මණ්ඩලය ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කරන අතර, එය අනුමත කරන ලද අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියකට (Board Charter) සහ අධ්‍යක්ෂවරුන් සඳහා වූ ආචාර ධර්ම පද්ධතියකට අනුකූලව ක්‍රියා කරයි. මෙම රාමු මගින් ඉහළම මට්ටමේ අධීක්ෂණයකදී අපේක්ෂා කරන කාර්යභාරයන්, වගකීම් සහ හැසිරීම් ප්‍රමිතීන් නිර්වචනය කරනු ලබයි. මෙයට සමාන්තරව, ආයතනයේ සෑම තලයකම අඛණ්ඩතාව සහ වෘත්තීයභාවය තහවුරු කිරීම සහතික කිරීම සඳහා බැංකුව විසින් සේවක ආචාර ධර්ම පද්ධතියක් ද ක්‍රියාත්මක කරනු ලබයි.

පොදු ජන යහපත වෙනුවෙන් විනිවිදභාවය සහ වගවීම තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා, බැංකුව ජාත්‍යන්තරව පිළිගත් පාරිසරික, සමාජීය සහ පාලන (ESG) වාර්තාකරණ රාමු අනුගමනය කර ඇත. මෙයට ජාත්‍යන්තර ඒකාබද්ධ වාර්තාකරණ කවුන්සිලයේ ඒකාබද්ධ වාර්තාකරණ රාමුව (2021) සහ ගෝලීය වාර්තාකරණ මූලපිරිම් (GRI) ප්‍රමිතීන් (2021) ඇතුළත් වන අතර, වාර්ෂික වාර්තාව සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා එමගින් මගපෙන්වීම් ලබාදෙයි.

අනුකූලතාව

බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සහ මූල්‍ය වාර්තාකරණය කෙරෙහි වන අභ්‍යන්තර පාලනයන් පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය (පිළිවෙළින් පිටු 313 සහ 315 හි පළ කර ඇති) සම්බන්ධයෙන් විගණකාධිපතිවරයා විසින් සහතිකයක් ලබා දෙනු ලබයි. ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL) විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා නිකුත් කරන ලද, ආයතනික පාලනය පිළිබඳ 2024 අංක 05 දරන බැංකු පනත් නියෝගවලට අනුකූල වීමේ මට්ටම පිළිබඳව ද ඔහු විසින් සහතික කරනු ලබයි.

2025 වසර සඳහා වන ප්‍රධාන ඉලක්ක

1. බැංකුවේ උපායමාර්ගික සැලැස්මට අනුකූලව අනුකූලතාවය සහ පාලනය සමාලෝචනය කිරීම සහ ශක්තිමත් කිරීම, සාර්ව ආර්ථික වෙනස්කම්වලට හැඩගැසීම, අවදානම් කළමනාකරණය ඉහළ නැංවීම සහ තිරසරත්වය ස්ථාපිත කිරීම.
2. මානව සම්පත් සහ ක්‍රියාවලි සංවර්ධනය හරහා විශිෂ්ට සේවා සැපයීම.
3. ක්‍රියාවලි වැඩිදියුණු කිරීම සහ පිරිවැය නායකත්වය සඳහා ව්‍යුහමය පරිවර්තනය.
4. සේවා සංස්කෘතියේ වෙනසක් හරහා පාරිභෝගික අත්දැකීම් ඉහළ නැංවීම.
5. හිතකර ණය කළඹක් සඳහා ශක්තිමත් කළ ණය කළමනාකරණය.
6. රජයේ ප්‍රතිපත්තිවලට අනුකූලව ජාතික ආර්ථික සංවර්ධනයට සහාය වීම.
7. තිරසර ව්‍යාපාරික වර්ධනයක් සඳහා වැඩිදියුණු කළ ඩිජිටල් නිපුණත්වය.
8. තරුණ සහ ඉහළ විභව්‍යතාවක් සහිත පාරිභෝගික කොටස් වෙත උපායමාර්ගිකව ළඟා වීම.
9. බැංකුවේ සමස්ත වර්ධනය කෙරෙහි පැහැදිලි උපායමාර්ගික දිශානතිය.

පාලන රාමුව

බාහිර පාලන අවශ්‍යතා

- 1988 අංක 30 දරන බැංකු පනත (සංශෝධිත)
- ශ්‍රී ලංකා මහ බැංකු නියාමන
- 1953 අංක 24 දරන විනිමය පාලන පනත
- 2006 අංක 6 දරන මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනත
- 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත
- බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා වන ආයතනික පාලනය පිළිබඳ 2024 අංක 05 දරන බැංකු පනත් නියෝගය
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් 2023 දෙසැම්බර් මස නිකුත් කරන ලද ආයතනික පාලනය පිළිබඳ යහපත් පිළිවෙත් සංග්‍රහය
- ගෝලීය වාර්තාකරණ මූලපිරුමේ (GRI) ගෝලීය වාර්තාකරණ ප්‍රමිතීන්
- එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන අරමුණු (SDGs)
- ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (IFRS) පදනමේ ඒකාබද්ධ වාර්තාකරණ රාමුව

අභ්‍යන්තර පාලන අවශ්‍යතා


- මහජන බැංකුව පිළිබඳ 1961 අංක 29 දරන පනත (සංශෝධිත)
- මණ්ඩල ප්‍රඥප්තිය
- අනුකමිටු සහ කළමනාකරණ කමිටුවල යොමුකිරීමේ අනුදේශ (Terms of Reference)
- අධ්‍යක්ෂවරුන් සඳහා වූ ව්‍යාපාරික චර්යාධර්ම සහ ආචාර ධර්ම පද්ධතිය
- විස්තීර්ණ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි
- සේවක ආචාර ධර්ම පද්ධතිය
- පාරිභෝගික ප්‍රඥප්තිය
- අභ්‍යන්තර විගණනය
- අභ්‍යන්තර පාලනයන්
- අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය ඇගයීමේ ක්‍රියාවලිය (ICAAP)

ප්‍රධාන පාලන මූලධර්ම



වගවීම | විනිවිදභාවය | සාධාරණත්වය | වගකීම

අපගේ ආයතනික වටිනාකම්



වටිනාකම් නිර්මාණය කිරීම


පාර්ශ්වකරුවන්ගේ අගය නිර්මාණය කිරීම | උපායමාර්ගික ප්‍රතිඵල

අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය

GRI 2-9, 405-1

ස්ත්‍රී පුරුෂ භාවයේ විවිධත්වය


කාලපරිච්ඡේදය – 2025 ජනවාරි 1 සිට 2025 සැප්තැම්බර් 16 දක්වා (2025 සැප්තැම්බර් 16 දිනට පැවති පරිදි) – 100%



පුරුෂ ස්ත්‍රී

ස්ත්‍රී පුරුෂ භාවයේ විවිධත්වය


කාලපරිච්ඡේදය – 2025 සැප්තැම්බර් 17 සිට 2025 දෙසැම්බර් 31 දක්වා (2025 දෙසැම්බර් 31 දිනට පැවති පරිදි)



පුරුෂ ස්ත්‍රී

අධ්‍යක්ෂ මණ්ඩලයේ සමබරතාවය


කාලපරිච්ඡේදය – 2025 ජනවාරි 1 සිට 2025 සැප්තැම්බර් 16 දක්වා (2025 සැප්තැම්බර් 16 දිනට පැවති පරිදි)



විධායක නොවන ස්වාධීන නොවන
ස්වාධීන විධායක

අධ්‍යක්ෂ මණ්ඩලයේ සමබරතාවය


කාලපරිච්ඡේදය – 2025 සැප්තැම්බර් 17 සිට 2025 දෙසැම්බර් 31 දක්වා (2025 දෙසැම්බර් 31 දිනට පැවති පරිදි)



විධායක නොවන ස්වාධීන නොවන
ස්වාධීන විධායක

වයස් විවිධත්වය


කාලපරිච්ඡේදය – 2025 ජනවාරි 1 සිට 2025 සැප්තැම්බර් 16 දක්වා (2025 සැප්තැම්බර් 16 දිනට පැවති පරිදි)



අවුරුදු 50ට වැඩි අවුරුදු 30-50 අතර අවුරුදු 30ට අඩු

වයස් විවිධත්වය

කාලපරිච්ඡේදය – 2025 සැප්තැම්බර් 17 සිට 2025 දෙසැම්බර් 31 දක්වා (2025 දෙසැම්බර් 31 දිනට පැවති පරිදි)



අවුරුදු 50ට වැඩි අවුරුදු 30-50 අතර අවුරුදු 30ට අඩු

සාමූහික නිපුණතා

GRI 2-17

කාලපරිච්ඡේදය – 2025 ජනවාරි 1 සිට 2025 සැප්තැම්බර් 16 දක්වා
(2025 සැප්තැම්බර් 16 දිනට පවතින පරිදි)

ක්ෂේත්‍රය/පසුබිම් අත්දැකීම්	විශේෂඥතාව සහිත අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව
බැංකු සහ මූල්‍ය/බැංකු කළමනාකරණය	2
මූල්‍ය සහ ගිණුම්කරණය/ව්‍යාපාර පරිපාලනය/කළමනාකරණය	4
ACA/FCMA/CGMA/CIMA	2
මානව සම්පත් සහ කළමනාකරණය	2
LLB/LLM/නීතිඥ	2
ආර්ථික විද්‍යාව/සංවර්ධන අධ්‍යයනය/පරිපාලනය/ජාත්‍යන්තර සබඳතා/මානව විද්‍යාව	3
තොරතුරු තාක්ෂණය/ඉංජිනේරු විද්‍යාව	2

කාලපරිච්ඡේදය – 2025 සැප්තැම්බර් 17 සිට 2025 දෙසැම්බර් 31 දක්වා
(2025 දෙසැම්බර් 31 දිනට පවතින පරිදි)

ක්ෂේත්‍රය/පසුබිම් අත්දැකීම්	විශේෂඥතාව සහිත අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව
බැංකු සහ මූල්‍ය/බැංකු කළමනාකරණය	3
මූල්‍ය සහ ගිණුම්කරණය/ව්‍යාපාර පරිපාලනය/කළමනාකරණය	7
ACA/FCMA/CGMA/CIMA	4
මානව සම්පත් සහ කළමනාකරණය	2
LLB/LLM/නීතිඥ	3
ආර්ථික විද්‍යාව/සංවර්ධන අධ්‍යයනය/පරිපාලනය/ජාත්‍යන්තර සබඳතා	3
තොරතුරු තාක්ෂණය	2
රක්ෂණ	1




පාලන ව්‍යුහය සහ සංයුතිය

GRI 2-9

බැංකුවේ ආයතනික පාලන රාමුව ප්‍රධාන ස්ථර දෙකකින් සමන්විත වේ: එනම්, අධීක්ෂණ කටයුතු සිදුකරමින් ක්‍රමෝපාය දිශානතිය, මූල්‍ය අරමුණු, සම්පත් බෙදා හැරීම සහ අවදානම් දරාගැනීමේ හැකියාව සම්බන්ධයෙන් ආයතනික කළමනාකාරිත්වය සමඟ සහයෝගයෙන් කටයුතු කරන අධ්‍යක්ෂ මණ්ඩලය සහ බැංකුවේ සියලුම පාර්ශ්වකරුවන්ට අන්‍යෝන්‍ය ප්‍රතිලාභ උත්පාදනය කිරීම සඳහා මණ්ඩල ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට බැඳී සිටින කළමනාකාරිත්වයයි.

මහජන බැංකුවේ ආයතනික පාලන රාමුව



අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ එහි කමිටුවල සංයුතිය

අධ්‍යක්ෂවරුන් දරනු ලබන අනෙකුත් වැදගත් තනතුරු, ධුර කාලයන් සහ අධ්‍යක්ෂවරුන්ගේ නිපුණතා වැනි අමතර තොරතුරු සඳහා කරුණාකර 38 සිට 43 දක්වා පිටුවල ඇති අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ ජීව දත්ත පැතිකඩ පරිශීලනය කරන්න.

කාලපරිච්ඡේදය - 2025 ජනවාරි 1 සිට 2025 සැප්තැම්බර් 16 දක්වා (2025 සැප්තැම්බර් 16 දිනට පැවති පරිදි)

	විධායක නොවන අධ්‍යක්ෂවරුන්	ස්වාධීන අධ්‍යක්ෂවරුන්	ස්ත්‍රී පුරුෂභාවය	අඩු නියෝජනයක් සහිත සමාජ කණ්ඩායම්	පාර්ශ්වකරුවන්ගේ නියෝජනය
අධ්‍යක්ෂ මණ්ඩලය	5	1	පුරුෂ 5 ස්ත්‍රී 0	රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ වෘත්තිකයන්	මුදල් අමාත්‍යාංශය මගින් පත්කළ සාමාජිකයන් 4 විශේෂ තේරීම් කමිටුව මගින් නම් කළ සාමාජිකයෙකු
අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව (BHRRC)	2025 ජනවාරි - 2025 ජූලි 7				
	3	0	පුරුෂ 3 ස්ත්‍රී 0		
	2025 ජූලි 8 - 2025 සැප්තැම්බර් 16				
	2	0	පුරුෂ 2 ස්ත්‍රී 0		
අධ්‍යක්ෂ මණ්ඩල විධායක ණය කමිටුව (BECC)	2025 ජනවාරි 1 - 2025 ජූලි 7				
	3	0	පුරුෂ 3 ස්ත්‍රී 0		
	2025 ජූලි 8 - 2025 සැප්තැම්බර් 16				
	2	0	පුරුෂ 2 ස්ත්‍රී 0		
අධ්‍යක්ෂ මණ්ඩල උපායමාර්ගික සැලසුම් සමාලෝචන කමිටුව (BSPRC)	2	0	පුරුෂ 2		

කාලසීමාව - 2025 සැප්තැම්බර් 17 සිට 2025 දෙසැම්බර් 31 දක්වා (2025 දෙසැම්බර් 31 දිනට පවතින පරිදි)

	විධායක නොවන අධ්‍යක්ෂවරුන්	ස්වාධීන අධ්‍යක්ෂවරුන්	ස්ත්‍රී පුරුෂ භාවය		පාර්ශ්වකරුවන්ගේ නියෝජනය
අධ්‍යක්ෂ මණ්ඩලය	10	7	පුරුෂ 8 ස්ත්‍රී 2	රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ වෘත්තිකයින්	මුදල් අමාත්‍යාංශය මගින් පත් කළ සාමාජිකයින් 3 විශේෂ තේරීම් කමිටුව මගින් නම් කළ සාමාජිකයන් 7
අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා සහ පාලන කමිටුව (BNGC)	3	1	පුරුෂ 3		
අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව (BHRRC)	3	2	පුරුෂ 3		
අධ්‍යක්ෂ මණ්ඩල ආයෝජන බැංකුකරණ කමිටුව (BIBC)	3	3	පුරුෂ 2 ස්ත්‍රී 1		
අධ්‍යක්ෂ මණ්ඩල විධායක ණය කමිටුව (BECC)	2025 සැප්තැම්බර් 17 - 2025 නොවැම්බර් 13				
	2	0	පුරුෂ 2 ස්ත්‍රී 0		
	2025 නොවැම්බර් 14 - 2025 දෙසැම්බර් 31				
	3	2	පුරුෂ 2 ස්ත්‍රී 1		
අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC)	3	2	පුරුෂ 3		
අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව (BAC)	3	3	පුරුෂ 2 ස්ත්‍රී 1		
අධ්‍යක්ෂ මණ්ඩල උපායමාර්ගික සැලසුම් සමාලෝචන කමිටුව (BSPRC)	3	2	පුරුෂ 3		

2025 දෙසැම්බර් 31 දිනට අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ අධ්‍යක්ෂක මණ්ඩල අනුකමිටුවල සංයුතිය

අධ්‍යක්ෂවරයාගේ නම	තනතුර	පත්වීම් ලැබූ දිනය	වයස (අවුරුදු)	ස්ත්‍රී/පුරුෂ භාවය (පුරුෂ/ස්ත්‍රී)	සාමාජිකත්ව තත්ත්වය	පාලක මණ්ඩල අනුකාරක සහ සාමාජිකත්වය								
						BAC	BHRCC	BIRMC	BECC	BNGC	BIBC	BITC	BSPRC	RPTRC
මහාචාර්ය පී එන් ඩී ප්‍රනාන්දු මයා	සභාපති	2024.11.13	56	පුරුෂ	ස්වාධීන නොවන							M	C	
එම් ජේ තිලකරත්න මයා	අධ්‍යක්ෂ	2024.11.18	59	පුරුෂ	ස්වාධීන නොවන		C	M	M	M				
ආර් බී ආර් එමර්සන් මයා	අධ්‍යක්ෂ	2024.11.27	69	පුරුෂ	ස්වාධීන නොවන		M		C				M	
ආචාර්ය ඒ ඒ කදිරගාමර්	අධ්‍යක්ෂ	2024.11.28	54	පුරුෂ	ස්වාධීන නොවන		M		M					
කේ ඒ විමලෙන්තිරරාජා මයා	අධ්‍යක්ෂ	2025.2.27	58	පුරුෂ	ස්වාධීන නොවන			M		M				
සී එස් ගුණියංගොඩ මයා	අධ්‍යක්ෂ	2025.8.21	51	පුරුෂ	ස්වාධීන			C			C	M	M	M
ජී ඒ එම් එඩ්වර්ඩ්ස් මිය	අධ්‍යක්ෂ	2025.9.17	59	ස්ත්‍රී	ස්වාධීන	M			C		M			C
එස් එම් එස් සංජය බණ්ඩාර මයා	අධ්‍යක්ෂ	2025.9.17	51	පුරුෂ	ස්වාධීන	C					M			
ඩී පී ලොකුආරච්චි මයා	අධ්‍යක්ෂ	2025.10.8	60	පුරුෂ	ස්වාධීන		M	M		C				
එන් එස් බී වල්ගම්පාය මයා	අධ්‍යක්ෂ	2025.10.15	46	පුරුෂ	ස්වාධීන	M						C		
එම් එච් එස් ගවුස් මයා	අධ්‍යක්ෂ	2025.10.31	63	පුරුෂ	ස්වාධීන		M		M				M	M
සී එච් ඩී අබේගුණවර්ධන මිය	අධ්‍යක්ෂ	2025.11.18	52	ස්ත්‍රී	ස්වාධීන									
						C – සභාපති					M – සාමාජික			

ආයතනික යහපාලනය සඳහා වන මනා පරිච්ඡේදය සමඟ අනුකූලතාව

අධ්‍යක්ෂ මණ්ඩලය (ප්‍රතිපත්තිය අ.1)

මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මුදල් අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබේ. 2024 අප්‍රේල් 8 සහ 2025 මැයි 19 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණවලට අනුව, ස්වාධීන අධ්‍යක්ෂවරුන් පත් කරනු ලබන්නේ විශේෂ තේරීම් කාරක සභාව විසින් කරනු ලබන නිර්දේශයන්ට අනුකූලවය. අධ්‍යක්ෂ මණ්ඩලය සභාපතිවරයාගෙන් සහ විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත වේ. සියලුම අධ්‍යක්ෂවරු රාජ්‍ය හා පෞද්ගලික අංශවල කීර්තිමත් වෘත්තිකයෝ වෙති. අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති, මහාචාර්ය පී එන් ඩී ප්‍රනාන්දු මහතා මූල්‍ය, බැංකු සහ උසස් අධ්‍යාපන යන ක්ෂේත්‍රයන්හි වසර 25කට වැඩි දීර්ඝ වෘත්තීය පළපුරුද්දක් සහිත ප්‍රවීණ විද්වතෙක් සහ මූල්‍ය විශේෂඥයෙක් වේ.

නිතිපතා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වීම

(ප්‍රතිපත්තිය අ.1.1)

අධ්‍යක්ෂ මණ්ඩලය අවම වශයෙන් මසකට වරක් රැස්වන අතර, අවශ්‍යතාවය මත අතිරේක රැස්වීම් කැඳවනු ලැබේ. 2025 වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩලය 21 වතාවක් රැස්වී ඇති අතර, එම සියලුම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ඉහළ සහභාගීත්වයකින්, ක්‍රියාකාරී දායකත්වයකින් සහ නිර්මාණාත්මක මෙන්ම විවෘත සාකච්ඡාවලින් සමන්විත විය.

අධ්‍යක්ෂවරුන් විසින් සියලුම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට සහ තමන් සාමාජිකත්වය දරන කමිටු රැස්වීම්වලට සහභාගී වීම අනිවාර්ය වේ.

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට සහභාගී නොවන අවස්ථා සාමාන්‍යයෙන් පෙර යොදා ගත් කටයුතු, පෞද්ගලික වගකීම් හෝ අසනීප තත්ත්වයන් හේතුවෙන් සිදු වූ කරුණු විය හැකිය.

මීට අමතරව, ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික නොවන නිලධාරීන්ට සහ උපදේශක සාමාජිකයන්ට, කැඳවනු ලැබූ විට න්‍යාය පත්‍රයේ ඇති විශේෂිත කරුණු සම්බන්ධයෙන් කරුණු දැක්වීමට රැස්වීම්වලට සහභාගී විය හැකිය. බැංකුවේ ක්‍රමෝපාය සම්බන්ධ කරුණු පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට සහ අනුකමිටුවලට නිතිපතා කරුණු ඉදිරිපත් කිරීම් (Presentations) සිදු කිරීමට ආයතනික කළමනාකාරිත්වයේ සාමාජිකයින් සහ/හෝ බාහිර විශේෂඥයන් වෙත අවසරය හිමි වේ.

2025 වර්ෂය තුළ එක් එක් අධ්‍යක්ෂවරයා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට සහ අදාළ කමිටු රැස්වීම්වලට සහභාගී වීම පිළිබඳ විස්තර පහත දැක්වේ:

අධ්‍යක්ෂවරයාගේ නම	තත්ත්වය	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්	අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව	අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව	අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව	අධ්‍යක්ෂ මණ්ඩල විධායක ණය කමිටුව	අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා සහ පාලන කමිටුව	අධ්‍යක්ෂ මණ්ඩල ආයෝජන බැංකුකරණ කමිටුව	අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ කමිටුව	අධ්‍යක්ෂ මණ්ඩල උපායමාර්ගික සැලසුම් සමාලෝචන කමිටුව	අදාළ පාර්ශ්වයන් අතර ගනුදෙනු විමර්ශන කමිටුව
මහාචාර්ය පී එන් ඩී ප්‍රනාන්දු මයා	ස්වාධීන නොවන	21/21	–	–	–	–	–	–	–	4/4	–
එම් ජේ තිලකරත්න මයා	ස්වාධීන නොවන	21/21	–	4/4	2/2	22/23	2/2	–	–		–
ආර් බී ආර් එමර්සන් මයා	ස්වාධීන නොවන	16/16	–	3/3	–	19/19	–	–	–	2/2	–
ආචාර්ය ඒ ඒ කදිරගාමර්	ස්වාධීන නොවන	11/11	–	2/2	–	12/13	–	–	–	–	–
කේ ඒ විමලෙන්තිරරාජා මයා	ස්වාධීන නොවන	18/21	–	–	3/3	–	2/2	–	–	–	–
සී එස් ගුණියංගොඩ මයා	ස්වාධීන	10/10	–	–	3/3	–	–	1/1	–	2/2	1/1
ජ ඒ එම් එඩ්වර්ඩ්ස් මිය	ස්වාධීන	6/6	4/4	–	–	4/4	–	1/1	–	–	1/1
එස් එම් එස් සංජය බණ්ඩාර මයා	ස්වාධීන	6/6	4/4	–	–	–	–	1/1	–	–	–
ඩී පී ලොකුආරච්චි මයා	ස්වාධීන	5/6	–	1/1	1/1	–	2/2			–	–
එන් එස් බී වල්ගම්පාය මයා	ස්වාධීන	6/6	4/4	–	–	–	–	–	–	–	–
එම් එච් එස් ගවුස් මයා	ස්වාධීන	5/5	–	1/1	–	4/4	–	–	–	2/2	1/1
සී එච් ඩී අබේගුණවර්ධන මිය	ස්වාධීන	4/4	–	–	–	–	–	–	–	–	–

පාරිසරික, සමාජීය සහ පාලන (ESG) අධීක්ෂණය

GRI 2-12

පාරිසරික, සමාජීය සහ පාලන (ESG) අවදානම් සහ අවස්ථාවන් ඇතුළුව, බැංකුවේ තිරසාරත්ව ක්‍රමෝපාය අධීක්ෂණය කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ. අධ්‍යක්ෂ මණ්ඩලය සහ එහි කමිටු හරහා පාරිසරික, සමාජීය සහ පාලන සලකා බැලීම් බැංකුවේ අවදානම් කළමනාකරණ සහ උපායමාර්ගික රාමුවට අනුකලනය කර ඇත.

සයිබර් ආරක්ෂණ ආශ්‍රිත අවදානම්, සමනය කිරීමේ පියවර සහ ආරක්ෂක උල්ලංඝනයන් පිළිබඳ වාර්තාව

මූල්‍ය ක්ෂේත්‍රය වඩ වඩාත් ඩිජිටල්කරණය වීමත් සමඟ, මහජන බැංකුව "සයිබර් අවදානම" (Cyber Risk) ප්‍රධාන අවදානම් කාණ්ඩයක් ලෙස හඳුනා ගනී. අපගේ උපායමාර්ගය, හුදෙක් වැළැක්වීම වන ප්‍රහාරවලට ප්‍රතිචාර දැක්වීමේ ආරක්ෂණ ක්‍රමවේදයක සිට "සයිබර් ප්‍රත්‍යස්ථතාව" (Cyber Resilience) දක්වා පරිවර්තනය වී ඇත. එමඟින්, බාධාවකින් තොරව පාරිභෝගික සේවාව පවත්වාගෙන යන අතරතුර, සංකීර්ණ සයිබර් විරුද්ධවාදීන්ගෙන් වැළැක්විය හැකි බලපෑම් කල්තියා හඳුනා ගැනීමටත්, ඒවාට ඔරොත්තු දීමටත් සහ ඉන් යථා තත්ත්වයට පත්වීමටත් බැංකුවට ඇති හැකියාව තහවුරු කරයි.

ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) නියාමන අවශ්‍යතාවලට අනුකූල වීම සහතික කරන අතරම, සයිබර් අවදානම් ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සහ සමනය කිරීම සඳහා, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි මඟින් ශක්තිමත් කරන ලද විස්තීර්ණ සයිබර් ආරක්ෂණ රාමුවක් මහජන බැංකුව විසින් පවත්වාගෙන යනු ලබයි. පැහැදිලිව අර්ථ දක්වන ලද භූමිකාවන් සහ වගකීම්, ව්‍යුහගත අවදානම් තක්සේරු කිරීමේ සහ ප්‍රතිකර්ම කිරීමේ ක්‍රමවේදයක් මෙන්ම, පද්ධති වෙනස් කිරීම් සහ නිකුත් කිරීම් (Change and release management) කළමනාකරණය පිළිබඳ ශක්තිමත් පාලනයක් ඇතුළත් විධිමත් පාලන ක්‍රමවේදයන් බැංකුව විසින් ස්ථාපිත කර ඇත. මීට අමතරව, තොරතුරු වත්කම්වල රහස්‍යභාවය (Confidentiality), අඛණ්ඩතාව (Integrity) සහ පවතින බව (Availability) සහතික කිරීම සඳහා භෞතික හා පාරිසරික ආරක්ෂාව, තොරතුරු වත්කම් කළමනාකරණය, පද්ධති ප්‍රවේශ පාලනය (Access control), මාධ්‍ය පරිහරණය, උපස්ථ පිටපත් ලබා ගැනීම (Backup) සහ යථා තත්ත්වයට පත් කිරීම (Recovery) සම්බන්ධ ප්‍රතිපත්ති ද ක්‍රියාත්මක වේ. ආරක්ෂක දුර්වලතාවන් අඛණ්ඩව හඳුනා ගැනීම, තක්සේරු කිරීම සහ පිළියම් යෙදීම සඳහා, අවදානම් මත පදනම් වූ නවීකරණ කටයුතු කළමනාකරණ (Patch management) ප්‍රවේශයකින් සහාය ලබන විධිමත් අනාරක්ෂිතතා තක්සේරු කිරීමේ සහ කළමනාකරණය කිරීමේ ක්‍රියාවලියක් ක්‍රියාත්මක වේ. තත්‍ය කාලීන තර්ජන හඳුනා ගැනීම, විශ්ලේෂණය සහ ඵලදායී සිදුවීම් ප්‍රතිචාර දැක්වීම සඳහා, දියුණු ආරක්ෂක තොරතුරු සහ සිදුවීම් කළමනාකරණ (SIEM) සහ ආරක්ෂක මෙහෙයුම් ස්වයංක්‍රියකරණ සහ ප්‍රතිචාර (SOAR) විසඳුම් මඟින් බලගැන්වුණු ආරක්ෂක මෙහෙයුම් මධ්‍යස්ථානයක් (SOC) බැංකුව විසින් පවත්වාගෙන යනු ලබයි. එමෙන්ම, දත්ත ගබඩා වන උපාංග (Endpoints), ජාල සහ සන්නිවේදන නාලිකා හරහා දත්ත සංසරණය වීම නිරීක්ෂණය සහ පාලනය කිරීම මඟින් සංවේදී තොරතුරු සුරක්ෂිත කිරීමටත්, එමඟින් අනවසර ප්‍රවේශයන් සහ දත්ත කාන්දු වීම වැළැක්වීමටත් දත්ත හානි වැළැක්වීමේ (DLP) විසඳුම් ක්‍රියාත්මක කර ඇත. මීට අමතරව, සියලුම නව යෙදුම් (Applications) සහ පද්ධති වැඩිදියුණු කිරීම්, ඒවා භාවිතයට ගැනීමට පූර්ව දැඩි ආරක්ෂක සමාලෝචන සහ පරීක්ෂණවලට භාජනය කෙරෙන අතර, හඳුනා ගන්නා ලද දුර්වලතාවලට ස්ථාපිත ආරක්ෂක ප්‍රතිකර්මවලට අනුකූලව කඩිනමින් පිළියම් යොදනු ලැබේ. තවද, බැංකුව විසින් විස්තීර්ණ තෙවන පාර්ශවීය සහ සැපයුම්කරු අවදානම් කළමනාකරණ රාමුවක් පවත්වාගෙන යනු ලබන අතර, එමඟින් සියලුම බාහිර සේවා සපයන්නන් නිසි පරීක්ෂාවකට (Due diligence), අවදානම් තක්සේරුවකට සහ ආරක්ෂක අවශ්‍යතා සපුරාලීම පිළිබඳ අඛණ්ඩ අධීක්ෂණයකට යටත් කිරීම සහතික කෙරේ. මීට අමතරව, සේවකයින්ගේ අවධානය සහ සුපරීක්ෂාකාරී බව ශක්තිමත් කිරීම සඳහාත්, ආයතනය පුරා ප්‍රබල සයිබර් ආරක්ෂණ සංස්කෘතියක් ගොඩනැගීම සඳහාත්, රැවටීමට ලක් කර තොරතුරු ගැනීම (Phishing) සමාකරණ අභ්‍යාස සහ දැනුවත් කිරීමේ ව්‍යාපාර ඇතුළු අඛණ්ඩ ආරක්ෂක දැනුවත් කිරීමේ සහ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යභාරය

GRI 2-12

(ප්‍රතිපත්තිය අ.1.2)

බැංකුවේ තිරසාරත්ව ක්‍රමෝපායයන් මෙහෙයවීම සහ ඒවායේ සඵලතාවය අධීක්ෂණය කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය මූලික වගකීම දරයි. මෙයට පාරිසරික, සමාජීය සහ ආයතනික පාලන (ESG) අවදානම් කළමනාකරණය මෙන්ම, බැංකුවේ දිගුකාලීන වටිනාකම් නිර්මාණය කිරීම සඳහා වන අවස්ථාවන් හඳුනා ගැනීම ද ඇතුළත් වේ. මණ්ඩලය විසින් බැංකුවේ දැක්ම සහ අරමුණු සමඟ සමපාත වන පරිදි ප්‍රතිපත්ති සම්පාදනය කරන අතර, එම උපායමාර්ගික රාමුව තුළ ආයතනික අරමුණු ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය මගපෙන්වීම් සහ සම්පත් ලබා දීම සහතික කරනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වෙන් කර ඇති (Matters reserved for the Board) කරුණු පිළිබඳ විධිමත් කාර්ය සටහනක් පවතින අතර, එය සැමවිටම යාවත්කාලීනව පවතින බව සහතික කිරීම සඳහා නිරන්තර සමාලෝචනයට භාජනය කෙරේ. අධ්‍යක්ෂ මණ්ඩලය සතු එම සුවිශේෂී වගකීම් සහ කරුණු පහත වගුවේ සාරාංශගත කර ඇත.

පාලනය	උපායමාර්ගය සහ දිශානතීන්	අවදානම් කළමනාකරණ වගවීම සහ පාලනය
පාලන විධිවිධාන සමාලෝචනය	උපායමාර්ගය සහ වාර්ෂික අයවැය අනුමත කිරීම	මූල්‍ය ප්‍රකාශන, වෙළෙඳපොළ වෙත ඉදිරිපත් කරන අනෙකුත් යාවත්කාලීනයන් සහ ලාභාංශ පිළිබඳ නිර්දේශ අනුමත කිරීම
අධ්‍යක්ෂ මණ්ඩල කමිටුවල සාමාජිකත්වය සඳහා වූ බලතල සහ කාර්යභාරයන්	අත්පත් කරගැනීම් සහ බැහැර කිරීම් කටයුතු සඳහා බලය පැවරීම	මූල්‍ය ප්‍රකාශන, වෙළෙඳපොළ වෙත ඉදිරිපත් කරන අනෙකුත් යාවත්කාලීනයන් සහ ලාභාංශ පිළිබඳ නිර්දේශ අනුමත කිරීම
	අවදානම් කළමනාකරණ ක්‍රමෝපාය සහ අවදානම් රුචිය තහවුරු කිරීම	අධිකාරිත්ව මට්ටම්, මූල්‍ය සහ භාණ්ඩාගාර ප්‍රතිපත්ති අනුමත කිරීම අභ්‍යන්තර පාලනය සහ අවදානම් කළමනාකරණය සමාලෝචනය කිරීම සෞඛ්‍ය හා ආරක්ෂණ ප්‍රතිපත්ති අනුමත කිරීම

බැංකුව අඛණ්ඩව පවත්වාගෙන යාම සහ එහි අභිවෘද්ධිය තහවුරු කිරීම සඳහා බැංකුවේ අරමුණු, වටිනාකම් සහ එම අරමුණු සාක්ෂාත් කර ගැනීමේ උපායමාර්ග තීරණය කිරීමත්, එම වටිනාකම් ක්‍රියාත්මක කිරීමත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදු කරනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුවේ ක්‍රමෝපාය අරමුණු සහ ආයතනික වටිනාකම් බැංකුවේ සෑම දෙනා වෙතම සන්නිවේදනය කිරීම තවදුරටත් සහතික කරනු ලබයි. ඒ අනුව, බැංකුවේ උපායමාර්ගික දිශානතිය මෙන්ම කළමනාකාරිත්වය සඳහා මඟපෙන්වීම සහ අධීක්ෂණය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරයි.

අභ්‍යන්තර හා බාහිර සම්බන්ධතා සහ සන්නිවේදනය සඳහා වන යාන්ත්‍රණයන් සැකසීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සහතික කරනු ලබයි.

එමෙන්ම බැංකුවේ ක්‍රියාකාරී විලාසය, බාහිර හා අභ්‍යන්තර සබඳතා, වෙළෙඳපොළ සහ ව්‍යාපාර, අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාත සහ කාර්යසාධන ප්‍රමිතීන්, වර්ධනය සහ වෙනස්වීම් පිළිබඳ ප්‍රතිපත්ති මෙන්ම අයවැය සැලසුම් කිරීමේ ක්‍රියා පටිපාටි ඇතුළත් බැංකු ප්‍රතිපත්ති සහ උපායමාර්ග සම්පාදනය කිරීම හා සන්නිවේදනය කිරීම සහතික කරනු ලබයි. මෙම ක්‍රියාවලියේදී, බැංකුව සිය සේවකයින් සහ බාහිර පාර්ශ්වයන් සමඟ එකම හඬකින් අදහස් දැක්විය යුතු බවත්, ප්‍රධාන විධායක නිලධාරි/සාමාන්‍යාධිකාරිවරයා හෝ ඔහු විසින් බලය පවරන ලද තැනැත්තෙකු මූලික ප්‍රකාශකයා ලෙස කටයුතු කළ යුතු බවත් පිළිගනු ලැබේ.

බැංකුවේ මූලික අරමුණ වන්නේ එහි ක්‍රමෝපාය රාමුව තුළ ප්‍රකාශිත අරමුණු වලට අනුකූලව වත්කම් නිර්මාණය කිරීමයි. මේ සම්බන්ධයෙන් බැංකුව විසින්:

- බැංකුවේ උපායමාර්ග, ප්‍රතිපත්ති, ව්‍යාපාර සැලසුම්, අවදානම් ප්‍රතිපත්තිය, අවදානම් කළමනාකරණ ක්‍රියා පටිපාටිය සහ යාන්ත්‍රණය මෙන්ම කළමනාකරණ කාර්යසාධන නිර්ණායක අනුමත කිරීමත්; ඉදිරි වසර තුන සඳහා මැනිය හැකි හෝ හඳුනාගත හැකි ඉලක්ක සහිත අර්ථවත් සැලසුම් අඛණ්ඩ පදනමක් මත සෑම මට්ටමක දී ම සකස් කිරීමට කටයුතු කිරීමත් සිදු කරනු ලබයි.
- නොසලකා හැරීමකින් තොරව හෝ බරපතල ප්‍රමාදයකින් තොරව කටයුතු කරන අතරම, යහපත් ව්‍යාපාරික මූලධර්ම සහ සුපරීක්ෂාකාරී බැංකු පරිචයන්ට අනුකූලව කටයුතු කරනු ලබයි.
- බැංකුවේ ප්‍රාග්ධනය සහ වත්කම් ආරක්ෂා කරනු ලබයි.
- සමස්ත ආර්ථිකය තුළ මෙන්ම කර්මාන්තය තුළ බැංකුව පිළිබඳ යහපත් ප්‍රතිරූපයක් පවත්වා ගනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එහි වගකීම්වලින් කොටසක් අධ්‍යක්ෂ මණ්ඩල කමිටු වෙත පවරා ඇත. එක් එක් කමිටුව වෙත පැවරී ඇති කාර්ය පරාසය සහ වසර තුළ ලබා ඇති ප්‍රගතිය මෙම වාර්තාවේ 298 සිට 305 දක්වා පිටුවල දක්වා ඇත.

බැංකුවේ අවදානම් කළමනාකරණ සහ අභ්‍යන්තර පාලන පද්ධතිවල සඵලතාවය අධීක්ෂණය කිරීමේ වගකීම, අධ්‍යක්ෂ මණ්ඩල විකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව වෙත පවරා ඇත. බැංකුවේ "අවදානම් දරාගැනීමේ සීමාව" තීරණය කිරීමේ අවසාන වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුවේ. හඳුනාගත් අවදානම් සහ අවිනිශ්චිතතාවයන් අධීක්ෂණය කිරීම, පාලනය කිරීම සහ වාර්තා කිරීම ඇතුළත් අවදානම් කළමනාකරණ වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කරනු ලබයි. මීට අමතරව, අවදානම් කළමනාකරණ කමිටුවේ සහ විගණන කමිටුවේ සභාපතිවරුන් විසින් ඉදිරිපත් කරනු ලබන අවදානම් කළමනාකරණයට අදාළ වාර්තා ද අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කරනු ලැබේ.

නීතිරීති වෙත අනුකූලතාව

GRI 2-27

(ප්‍රතිපත්තිය අ.1.3)

අධ්‍යක්ෂ මණ්ඩලය, සාමූහිකව සහ තනි තනිව, බැංකුව විසින් පවත්වාගෙන යනු ලබන ව්‍යාපාර කටයුතු සඳහා අදාළ වන රටේ නීති රීතිවලට අනුකූලව කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. එබැවින්, අදාළ සියලුම නීති සහ රීතිවලට අනුකූලතාවය පවත්වා ගැනීම සඳහා අවශ්‍ය සියලුම ක්‍රියා පටිපාටි සහ පාලන ක්‍රමවේදයන් ක්‍රියාත්මක බව සහතික කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුවේ.

තවද, ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) සියලුම නියාමනයන්ට අනුකූල වීම පහසු කිරීම සඳහා අනුමත කරන ලද ක්‍රියා පටිපාටියක් අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ. 2025 වසර තුළ බැංකුව යහපත් නියාමන අනුකූලතා මට්ටමක් පවත්වාගෙන ගිය අතර, අදාළ නියෝග හෝ රීති උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් බැංකුව කිසිදු දඩ මුදලකට යටත් නොවීය.

යම් යම් කරුණු සම්බන්ධයෙන් කලින් කලට ස්වාධීන විනිශ්චයක් ලබා ගැනීමේ අවශ්‍යතාවය අධ්‍යක්ෂ මණ්ඩලය පිළිගනු ලබයි. ඒ අනුව, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ට තමන්ගේ රාජකාරී සහ වගකීම් ඉටු කිරීමට අදාළ ඕනෑම කරුණක් සම්බන්ධයෙන්, බැංකුවේ වියදමින් ස්වාධීන වෘත්තීය උපදෙස් (නීතිමය, ගණකාධිකරණ සහ මූල්‍ය උපදෙස් ඇතුළුව නමුත් ඒවාට පමණක් සීමා නොවී) ලබා ගැනීමට හිමිකම් ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

(ප්‍රතිපත්තිය අ.1.4)

සියලුම අධ්‍යක්ෂවරුන්ට අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා වෙත ප්‍රවේශ වීමේ අවස්ථාව පවතී. එකඟ වූ සියලුම ක්‍රියා පටිපාටි මෙන්ම අදාළ රීති සහ නියාමනයන් පිළිපදින බව සහතික කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වගකීම දරනු ලබයි.

මීට අමතරව, අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා සියලුම අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටුවල ලේකම්වරයා ලෙස කටයුතු කරන අතර, සියලුම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල සහ කමිටු රැස්වීම්වල වාර්තා (minutes) පවත්වාගෙන යනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයාගේ අනෙකුත් වගකීම්වලට පහත දෑ ඇතුළත් වේ:

- අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සහ අනුකමිටු රැස්වීම් පැවැත්වීමට අදාළ කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- මහජන බැංකු පනත සහ අදාළ ව්‍යවස්ථාපිත නීතිවලට අනුකූලව කටයුතු මෙහෙයවීම. අදාළ ව්‍යවස්ථාපිත නීති සහ යහපත් පරිචයන්ට අනුකූලව, අධ්‍යක්ෂවරුන්ට ඔවුන්ගේ රාජකාරී සහ වගකීම් ඉටු කිරීමේදී සහාය වීම ඇතුළුව, ආයතනික පාලනය පිළිබඳ යහපත් පරිචයන් අනුගමනය කිරීම සඳහා පහසුකම් සැලසීම.
- විධායක නොවන අධ්‍යක්ෂවරුන් සහ කළමනාකාරිත්වය අතර සන්නිවේදන සම්බන්ධීකාරක ලෙස කටයුතු කිරීම.
- සම්බන්ධිත පාර්ශ්වයන් සහ සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු පිළිබඳ සුදුසු අනාවරණයන් නියාමන අවශ්‍යතාවලට අනුකූලව සිදු කිරීම සහතික කිරීම.
- අදාළ සියලුම නීති සහ රීතිවලට බැංකුවේ අනුකූලතාවය සහතික කිරීමේදී, මහජන බැංකු පනත සහ අනෙකුත් අදාළ ව්‍යවස්ථාපිත නීති පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය සමඟ සාකච්ඡා කර නීති උපදෙස් ලබා ගැනීම.

අධ්‍යක්ෂවරුන්ගේ ස්වාධීන විනිශ්චය

(ප්‍රතිපත්තිය අ.1.5)

බැංකුවේ තීරණ ගැනීමේදී ස්වාධීන විනිශ්චයකින් යුතුව කටයුතු කිරීමට අධ්‍යක්ෂවරුන් බැඳී සිටී. පළපුරුදු වෘත්තිකයන් ලෙස, ඔවුන්ගේ රාජකාරී වෙනත් පුද්ගලයින්ගේ කිසිදු බලපෑමකින් තොරව ඉටු කරනු ලබයි. විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් ක්‍රියාශීලී සහ නිර්මාණාත්මක දායකත්වයක් ලබා ගැනීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දිරිමත් කරනු ලබයි.

එක් එක් අධ්‍යක්ෂවරයා ආයතනික පාලන සංග්‍රහයට (Corporate Governance Code) අනුකූලව තම ස්වාධීනත්වය වාර්ෂිකව තහවුරු කරයි.

අධ්‍යක්ෂවරුන් ප්‍රමාණවත් කාලයක් සහ ප්‍රයත්නයක් වෙනුවෙන් කැපවීම

(ප්‍රතිපත්තිය අ.1.6)

රැස්වීම්වලට පෙර අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා සමාලෝචනය කිරීමටත්, අවශ්‍ය අවස්ථාවලදී අතිරේක තොරතුරු සහ පැහැදිලි කිරීම් ලබා ගැනීමටත්, පැන නැඟී ඇති කරුණු සම්බන්ධයෙන් පසු විපරම් කිරීමටත් අධ්‍යක්ෂවරුන් ප්‍රමාණවත් කාලයක් කැප කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

තවද, සියලුම වගකීම් සතුටුදායක ලෙස ඉටු කිරීම සහතික කිරීම සඳහා සෑම රැස්වීමක දී ම ප්‍රමාණවත් කාලයක් වෙන් කර ඇති බව සහතික කිරීමට ද අධ්‍යක්ෂවරුන් බැඳී සිටී.

අධ්‍යක්ෂවරුන් සඳහා පුහුණුව

GRI 2-17

(ප්‍රතිපත්තිය අ.1.7)

අඛණ්ඩ සංවර්ධනය සඳහා අදාළ පුහුණුව ලැබීමට සියලුම අධ්‍යක්ෂවරුන් හිමිකම් ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලය සහ කමිටු සඳහා අධ්‍යක්ෂවරුන්ගේ දායකත්වය කාලීනව පවත්වා ගැනීම සහතික කිරීම පිණිස, බැංකුව ක්‍රියාත්මක වන ව්‍යාපාරික ක්ෂේත්‍රය සහ වෙළඳපල පිළිබඳ ඔවුන්ගේ දැනුම, කුසලතා සහ අවබෝධය නිතිපතා යාවත්කාලීන කර ගැනීමට අඛණ්ඩ පුහුණුව සහ නව තොරතුරු ලබා දෙනු ලැබේ.

බැංකුවේ මෙහෙයුම් කටයුතු, ආයතනික පාලනය, නීතිමය සහ නියාමන වර්ධනයන් මෙන්ම අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යභාරය පිළිබඳ තිරසාර වාර්තාකරණය සම්බන්ධයෙන් ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන් හෝ උපදේශකයින් විසින් ඉදිරිපත් කරනු ලබන ලිඛිත වාර්තා සහ ඉදිරිපත් කිරීම් (presentations) මෙයට ඇතුළත් වේ.

අධ්‍යක්ෂවරුන් පුහුණු කිරීම සහ පත්කිරීම පිළිබඳ සලකා බැලීම

(ප්‍රතිපත්තිය අ.1.8)

අලුතින් පත් කරනු ලබන සියලුම අධ්‍යක්ෂවරුන් සඳහා පාලන වගකීම් සහ ක්ෂේත්‍රයට අදාළ කරුණු ආවරණය වන පරිදි විධිමත් හඳුන්වාදීමේ වැඩසටහනක් (induction) පවත්වන බවට බැංකුව සහතික වේ. අවශ්‍යතාවය අනුව අධ්‍යක්ෂවරුන් සඳහා අඛණ්ඩ පුහුණුව ද ලබා දෙනු ලැබේ. පත්වීමට පෙර, සෑම අධ්‍යක්ෂවරයෙකුම ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (CA Sri Lanka) 2023 සංග්‍රහයේ ප්‍රතිපත්තිය අ.1.8 සහ "ආ" උපලේඛනයට අනුකූලව, තමන්ට ප්‍රමාණවත් කාලයක් කැප කිරීමට ඇති හැකියාව, කිසිදු බැඳියා පිළිගැටුමක් (conflicts of interest) නොමැති බව සහ අවශ්‍ය නිපුණතාවලින් යුක්ත බව තහවුරු කළ යුතුය.

සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී

GRI 2-11

(ප්‍රතිපත්තිය අ.2)

මහජන බැංකුවේ නායකත්වය සැපයීම සහ උසස් මට්ටමේ අවංකභාවය හා සදාචාරාත්මක ප්‍රමිතීන් ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් සභාපතිවරයා සහ ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිනාරී සාමූහිකව වගකීම දරයි. එසේ වුවද, සභාපතිවරයා සහ ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍ය කළමනාකරු අතර වගවීම සහ වගකීම් පිළිබඳ පැහැදිලි හා ඵලදායී බෙදීමක් පවතී. බලය සහ අධිකාරිය සමතුලිතව පවත්වා ගැනීම සහතික කිරීමටත්, තීරණ ගැනීමේදී සහ පාලනය කිරීමේදී තනි පුද්ගලයෙකු සතු විය හැකි අසීමිත බලතල වළක්වා ගැනීමටත් ඔවුහු එකිනෙකාට අනුපූරක වන සුවිශේෂී කාර්යභාරයන් ඉටු කරති.

විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු වන සභාපතිවරයා මණ්ඩලයේ ඵලදායී මෙහෙයුම් සහතික කිරීම සහ එහි නෛතික හා නියාමන වගකීම් පූර්ණ වශයෙන් ඉටු කිරීම සඳහා මණ්ඩලය මෙහෙයවීම, මඟපෙන්වීම සහ කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් වගකීම් දරයි. බැංකුවේ එදිනෙදා මෙහෙයුම් කළමනාකරණය කිරීම ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරීවරයාගේ මූලික කාර්යභාරය යි.

(A.2.1 මූලධර්මය)

සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී තනතුරු එකිනෙකින් ස්වාධීනව පවත්වාගෙන යාම මගින්, කිසිදු පුද්ගලයෙකුට තනි තීරණ ගැනීමේ ඒකාධිකාරී බලයක් හිමි නොවන බව සහතික කෙරේ. සභාපතිවරයා සහ ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරීවරයා පිළිබඳව වාර්ෂික වාර්තාවේ 38 සහ 46 යන පිටුවල දක්වා ඇත .

සභාපතිවරයාගේ කාර්යභාරය

GRI 2-11, 12

(A.3 මූලධර්මය)

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රතිපත්ති සහ උපායමාර්ග, ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරීවරයා සහ කළමනාකාරිත්වය විසින් ඵලදායී ලෙස ක්‍රියාත්මක කරන බවට සහතික කිරීමේ වගකීම සභාපතිවරයා සතු වේ. එලෙසම, ආයතනය තුළ යහපාලන සංස්කෘතියක් පවත්වාගෙන යාමට නායකත්වය දෙන ඔහු, කොටස් හිමියන් ඇතුළු සියලුම පාර්ශ්වකරුවන් සමඟ පවතින සන්නිවේදනය ඵලදායී මට්ටමක පවත්වා ගැනීමට අවශ්‍ය අධීක්ෂණය සපයයි. විධායක නොවන භූමිකාවක් (Non-executive role) හොබවන සභාපතිවරයා මහජන බැංකුවේ කිසිදු විධායක තනතුරක් නොදරයි.

අධ්‍යක්ෂ මණ්ඩල කටයුතු නිසි පරිදි පවත්වාගෙන යාම

(ප්‍රතිපත්තිය අ.3.1)

සභාපතිවරයා නායකත්වය ලබා දීමට පමණක් නොව, බැංකුවේ සහ එහි කොටස් හිමියන්ගේ උපරිම යහපත ආරක්ෂා කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ ක්‍රියාකාරිත්වය අධීක්ෂණය කිරීම සම්බන්ධයෙන් ද වගකීම දරයි. ඒ අනුව, සභාපතිවරයා පහත සඳහන් කරුණු සඳහා වගකීම දරනු ලබයි:

- අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ඵලදායී ලෙස සැලසුම් කිරීම සහ පවත්වන බව සහතික කිරීම.
- අනෙකුත් අධ්‍යක්ෂවරුන්, විවිධ අනුකමිටු සාමාජිකයින් හෝ මණ්ඩල ලේකම්වරයා විසින් යෝජනා කරන ලද කරුණු පිළිබඳව අවධානය යොමු කරමින්, සෑම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් සඳහාම න්‍යාය පත්‍රය සැකසීම.
- අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් වෙත නිවැරදි, කාලීන සහ පැහැදිලි තොරතුරු ලැබෙන බව සහතික කිරීම.
- අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල වාර්තා (minutes) නිවැරදිව සටහන් කිරීම සහ ඒවා අධ්‍යක්ෂවරුන් අතර බෙදා හැරීම සහතික කිරීම.
- කාලීන ගැටලු සාකච්ඡා කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට සහ තනි තනි අධ්‍යක්ෂවරුන්ට හිතකර වාතාවරණයක් නිර්මාණය වන පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නායකත්වය සහ පාලනය ලබා දීම.
- විනිවිදභාවයෙන් යුත් සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ කරුණු සම්බන්ධයෙන් නිර්මාණාත්මක හා සෞඛ්‍ය සම්පන්න අදහස් හුවමාරු කර ගැනීමට විධායක නොවන අධ්‍යක්ෂවරුන් දිරිමත් කිරීම සහ එමඟින් අධ්‍යක්ෂ මණ්ඩලයේ සඵලදායී ක්‍රියාකාරිත්වයට දායක වීම සඳහා පහසුකම් සැලසීම
- සමූහයේ ක්‍රමෝපාය සහ ප්‍රතිපත්ති සැකසීමේදී සහ ඒවාට ප්‍රවේශ වීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය පූර්ණ හා නිර්මාණාත්මක කාර්යභාරයක් ඉටු කරන බව සහතික කිරීම මෙන්ම මණ්ඩලයේ තීරණ බැංකුවේ උපරිම යහපත උදෙසා ගන්නා බවත්, එමඟින් මණ්ඩලයේ පොදු එකඟතාවය සාධාරණ ලෙස පිළිබිඹු වන බවත් සහතික කිරීම.
- අධ්‍යක්ෂ මණ්ඩලයේ සඵලදායීතාවය තවදුරටත් ඉහළ නැංවීම සඳහා අර්ථවත් ප්‍රතිපෝෂණ ලබා ගැනීමට හැකි වන පරිදි ස්වයං ඇගයීම් සඳහා නායකත්වය ලබා දීම.

ප්‍රථම පත්වීමේදී සහ නිතිපතා (අවම වශයෙන් වසරකට වරක් හෝ තත්ත්වයන් වෙනස් වන ඕනෑම අවස්ථාවක), සියලුම අධ්‍යක්ෂවරුන් බැංකුව සමඟ ඇති විය හැකි බැඳියා පිළිගැටුමක් (conflict of interest) ඇති කිරීමට ඉඩ ඇති ඕනෑම ව්‍යාපාරික හෝ වෙනත් අවශ්‍යතාවයක් සුභ චේතනාවෙන් යුතුව වාර්තා කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අනාවරණය කළ යුතුය. ඒ යටතට පහත දෑ ඇතුළත් වේ:

- වෙනත් ඕනෑම සමාගමක, හවුල් ව්‍යාපාරයක හෝ වෙනත් ව්‍යාපාරික කටයුත්තක ඇති සියලුම ව්‍යාපාරික අවශ්‍යතා (ප්‍රත්‍යක්ෂ හෝ වක්‍ර).
- වෙළඳ, ව්‍යාපාරික හෝ වෙනත් ආර්ථික බැංකුවල සාමාජිකත්වය.
- ඕනෑම ගනුදෙනුවක පවතින ඕනෑම උනන්දුවක් හෝ අවශ්‍යතාවයක් (සෘජු හෝ වක්‍ර).

අධ්‍යක්ෂවරුන් අනෙකුත් බැංකු හෝ සම්බන්ධිත පාර්ශ්වයන් සමඟ සිදුකරන ක්‍රියාකාරකම්වලදී සහ බැඳීම්වලදී, ඕනෑම ආකාරයක බැඳියා පිළිගැටුමක් (conflict of interest) ඇතිවීම හෝ එවැනි ගැටුමක් පවතින බවට පෙනී යාම වළක්වා ගත යුතුය. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සලකා බලනු ලබන කරුණක් සම්බන්ධයෙන් යම් අධ්‍යක්ෂවරයෙකුට පවතින බැඳියා පිළිගැටුමක් ඉතා වැදගත් (material) බව අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරන්නේ නම්, එම කරුණ චක්‍රලේඛ මඟින් හෝ සාමාන්‍ය කම්ටුවක් මඟින් (අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී සම්මත කරන ලද යෝජනාවක් අනුව ඒ සඳහාම පිහිටුවන ලද විශේෂ මණ්ඩල කම්ටුවක් මඟින් හැර) විසඳනු නොලැබේ. එහෙත් ඒ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් පවත්වනු ලබයි. යම් අධ්‍යක්ෂවරයෙකුට හෝ ඔහුගේ ආශ්‍රිතයෙකුට වැදගත් බැඳියාවක් පවතින අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාවක දී, එම අධ්‍යක්ෂවරුන් ඡන්දය දීමෙන් වැළකී සිටිය යුතු අතර අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ ගණපූරණය (quorum) ගණනය කිරීමේ දී ද ඔවුන්ව සැලකිල්ලට නොගනු ලබයි.

අදාළ බැංකුව, මෙම බැංකුවේ අනුබද්ධ සමාගමක් (subsidiary company) හෝ ආශ්‍රිත සමාගමක් (associate company) වන අවස්ථාවකදී හැර, වෙනත් කිසිදු බැංකුවක අධ්‍යක්ෂවරයෙකු ලෙස පත්වීමට, තේරී පත්වීමට හෝ නම් කිරීමට කිසිදු අධ්‍යක්ෂවරයෙකුට අවසර දෙනු නොලැබේ.

මූල්‍ය විචක්ෂණභාවය

(ප්‍රතිපත්තිය අ.4)

මහජන බැංකු අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රමාණවත් මූල්‍ය ශක්තියක් සහ දැනුමක් සහිත සාමාජිකයන්ගෙන් සමන්විත වේ. මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් මගපෙන්වීම් සපයන ජ්‍යෙෂ්ඨ වරලත් ගණකාධිකාරිවරුන් සහ වරලත් කළමනාකරණ ගණකාධිකාරිවරුන්ට අමතරව, සෙසු අධ්‍යක්ෂවරුන් ද ඔවුන්ගේ පුළුල් වෘත්තීය පළපුරුද්ද හරහා උපයා ගත් ප්‍රමාණවත් මූල්‍ය දැනුමකින් සහ කුසලතාවයකින් යුක්ත වේ.

අධ්‍යක්ෂ මණ්ඩල සමතුලනය

(ප්‍රතිපත්තිය අ.5)

2025 සැප්තැම්බර් 16 දින වන විට, මහජන බැංකු අධ්‍යක්ෂ මණ්ඩලය විධායක නොවන අධ්‍යක්ෂවරුන් පස් දෙනෙකුගෙන් සමන්විත වූ අතර, ඔවුන් අතරින් එක් අයෙකු ස්වාධීන ධාරිතාවයකින් කටයුතු කරන ලදී. 2025 දෙසැම්බර් 31 දින වන විට, එය විධායක නොවන අධ්‍යක්ෂවරුන් දස දෙනෙකු දක්වා වෙනස් වූ අතර, ඔවුන්ගෙන් හත් දෙනෙකු ස්වාධීන ධාරිතාවයකින් කටයුතු කරන ලදී.

සියලුම ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් කළමනාකාරිත්වයෙන් ස්වාධීන වන අතර, ඔවුන්ගේ අපක්ෂපාති සහ ස්වාධීන විනිශ්චය ක්‍රියාත්මක කිරීමට ප්‍රබල ලෙස බාධා විය හැකි හෝ බාධා වන බවට සාධාරණ ලෙස උපකල්පනය කළ හැකි කිසිදු ව්‍යාපාරික හෝ වෙනත් සබඳතාවයකින් ඔවුන් නිදහස් වේ.

සෑම විධායක නොවන අධ්‍යක්ෂවරයෙකුම නිශ්චිත නිර්ණායකයන්ට අදාළව තම ස්වාධීනත්වය හෝ ස්වාධීන නොවන බව ප්‍රකාශ කරමින් අත්සන් කරන ලද ප්‍රකාශනයක් ඉදිරිපත් කරනු ලබන අතර, ස්වාධීනත්වය තීරණය කිරීමේ නිර්ණායකයන්ට අනුකූල බව සහතික කිරීම සඳහා ඔවුන්ව ඇගයීමට ලක් කරනු ලැබේ.

සලකා බලනු ලබන වර්ෂය තුළදී, විකල්ප අධ්‍යක්ෂවරුන් පත් කිරීමට අවශ්‍ය වන කිසිදු අවස්ථාවක් පැන නොනැගුණි. සභාපතිවරයා ස්වාධීන නොවන අධ්‍යක්ෂවරයෙකු වන බැවින්, ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු (Senior Independent Director) පත් කර ඇත.

ස්වාධීනත්වය තීරණය කිරීම

(ප්‍රතිපත්තිය අ.5.5)

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සියලුම විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ වාර්ෂික ප්‍රකාශන සමාලෝචනය කරන ලද අතර, 2023 ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (CA Sri Lanka) ආයතනික පාලනය පිළිබඳ යහපත් භාවිතයන් පිළිබඳ සංග්‍රහයට අනුකූලව ඔවුන්ගේ ස්වාධීනත්වය තීරණය කරන ලදී. ස්වාධීන යැයි සලකනු ලබන අධ්‍යක්ෂවරුන්ගේ නම් මෙම වාර්තාවේ අනාවරණය කර ඇති අතර, එකී සංග්‍රහයට අනුකූලව ස්වාධීන සහ ස්වාධීන නොවන අධ්‍යක්ෂවරුන් අතර නිසි සමතුලිතතාවයක් පවත්වාගෙන යන බව අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තහවුරු කරයි.

තොරතුරු සැපයීම

(ප්‍රතිපත්තිය අ.6)

අධ්‍යක්ෂවරුන්ට ප්‍රමාණවත් පූර්ව දැනුම්දීමක් ලබා දෙමින්, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් කලින් සැලසුම් කරනු ලැබේ. සෑම අධ්‍යක්ෂ මණ්ඩල හෝ කමිටු රැස්වීමකටම පෙර, රැස්වීම් න්‍යාය පත්‍රය, අන්තර්ගතය සහ කළමනාකරණ ඉදිරිපත් කිරීම්වල සාරාංශයක් ඇතුළුව සියලුම අදාළ ලේඛන රැස්වීමට වැඩ කරන දින හතකට පෙර සියලුම අධ්‍යක්ෂවරුන් වෙත ලබා දීමට අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා වගබලා ගනී. රැස්වීම් සඳහා සහභාගී වීමට නොහැකි වන අධ්‍යක්ෂවරුන් වාර්තාගත රැස්වීම් මිනිත්තු මගින් යාවත්කාලීන කරනු ලබන අතර, එම මිනිත්තු සහ ඒවායේ පසු විපරම් කළ යුතු කරුණු ඊළඟ රැස්වීමේදී සභාගත කරනු ලැබේ.

යම් මාසයකට අදාළ මාසික ගිණුම් වාර්තා, එක් එක් අංශයේ හෝ අනුබද්ධිත ආයතනයේ ප්‍රධාන මූල්‍ය කාර්යසාධන දර්ශක (KPIs) සමඟින් ඊළඟ මාසය තුළ අධ්‍යක්ෂවරුන් අතර බෙදා හරිනු ලැබේ. සපයනු ලබන තොරතුරු ප්‍රමාණවත් නොවන බව හෝ පැහැදිලි නොවන බව අධ්‍යක්ෂ මණ්ඩලයට හැඟෙන්නේ නම්, වැඩිදුර පැහැදිලි කිරීම් හෝ අමතර තොරතුරු ඉල්ලා සිටීමට ඔවුන්ට අයිතිය ඇත. වැඩිදුර තොරතුරු ලබා දීම සඳහා අවශ්‍ය යැයි හැඟෙන අවස්ථාවලදී අදාළ කළමනාකරණ කාර්ය මණ්ඩල නිලධාරීන් රැස්වීම් සඳහා කැඳවිය හැකිය.

2025 දෙසැම්බර් 31 දිනට අධ්‍යක්ෂ මණ්ඩලයේ තත්ත්වය

අධ්‍යක්ෂවරයාගේ නම	තත්ත්වය
මහාචාර්ය පී එන් ඩී ප්‍රනාන්දු	සභාපති – ස්වාධීන නොවන/විධායක නොවන
එම් ජේ තිලකරත්න මහතා	අධ්‍යක්ෂ – ස්වාධීන නොවන/විධායක නොවන
කේ ඒ විමලේන්තිරරාජා මහතා	අධ්‍යක්ෂ – ස්වාධීන නොවන/විධායක නොවන
සී එස් ගුණියංගොඩ මහතා	අධ්‍යක්ෂ – ස්වාධීන/විධායක නොවන
ජී ඒ එම් එඩිවර්ඩිස් මිය	අධ්‍යක්ෂ – ස්වාධීන/විධායක නොවන
එස් එම් එස් සංජය බණ්ඩාර මහතා	අධ්‍යක්ෂ – ස්වාධීන/විධායක නොවන
ඩී පී ලොකුආරච්චි මහතා	අධ්‍යක්ෂ – ස්වාධීන/විධායක නොවන
එන් එස් බී වල්ගම්පාය මහතා	අධ්‍යක්ෂ – ස්වාධීන/විධායක නොවන
එම් එච් එස් ගවුස් මහතා	අධ්‍යක්ෂ – ස්වාධීන/විධායක නොවන
සී එච් ඩී අබේගුණවර්ධන මිය	අධ්‍යක්ෂ – ස්වාධීන/විධායක නොවන

අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කිරීම්

GRI 2-10

(ප්‍රතිපත්තිය අ.7 සහ අ.8)

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද 2024 අංක 3 දරන බැංකු පනත් තීරණයට අනුව, අවම අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව 10 ක් විය යුතු අතර උපරිම අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව 13 ක් විය යුතුය.

තවද, රාජ්‍ය ව්‍යවසාය (SOE) ප්‍රතිසංස්කරණ පිළිබඳ 5/4/2024 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවට අනුව, මුළු අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවෙන් බහුතරය ස්වාධීන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත විය යුතු අතර, ස්වාධීන අධ්‍යක්ෂවරුන් සඳහා වන නිර්දේශ විශේෂ තේරීම් කාරක සභාව විසින් ඉදිරිපත් කළ යුතුය.

මීට අමතරව, මහජන බැංකු පනතට අනුකූලව, සමුපකාර විෂය භාර අදාළ අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු නම් කරනු ලැබේ.

අධ්‍යක්ෂ ධුර සඳහා වන සියලුම පත් කිරීම්, අධ්‍යක්ෂවරුන් සඳහා වන "සුදුසු සහ යෝග්‍ය" නිර්ණායක (Fit and Proper Criteria) යටතේ ඇගයීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

විවිධත්ව නියෝජනය සම්බන්ධයෙන් විශේෂිත වූ නිශ්චිත ඊතීන් පනවා නොමැත.

266 පිටුවේ දක්වා ඇති "අධ්‍යක්ෂවරුන් පත් කිරීම සහ විශ්‍රාම ගැන්වීම/ඉල්ලා අස්වීම" යන කොටස සහ 302 පිටුවේ ඇති අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා සහ ආයතනික පාලන කමිටු (BNGC) වාර්තාව බලන්න.

අධ්‍යක්ෂ මණ්ඩල කාර්යසාධනය ඇගයීම

GRI 2-18

(ප්‍රතිපත්තිය අ.9)

අධ්‍යක්ෂ මණ්ඩලයේ සෑම සාමාජිකයෙකුම, සංග්‍රහයේ (Code) අධ්‍යක්ෂ මණ්ඩල කාර්යසාධන ඇගයීම් පිරික්සුම් ලැයිස්තුවේ දක්වා ඇති සියලුම නිර්ණායක ඇතුළත් කරමින්, තම පෞද්ගලික කාර්යක්ෂමතාව මෙන්ම සමස්ත අධ්‍යක්ෂ මණ්ඩලය කණ්ඩායමක් ලෙස දක්වන කාර්යක්ෂමතාව පිළිබඳව වාර්ෂිකව ස්වයං ඇගයීමක් සිදු කරනු ලබයි. මෙම ප්‍රතිචාර අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා විසින් එක්රැස් කර සාරාංශ වාර්තාවක් ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබේ.

අධ්‍යක්ෂවරුන්ට අදාළ තොරතුරු අනාවරණය කිරීම

(ප්‍රතිපත්තිය අ.10)

ආයතනික පරිච සංග්‍රහයෙහි (Code) සඳහන් කර ඇති අධ්‍යක්ෂවරුන්ට අදාළ තොරතුරු මෙම වාර්ෂික වාර්තාවේ පහත පරිදි අනාවරණය කර ඇත:

- නම, සුදුසුකම්, කෙටි විස්තරයක් සහ විශේෂඥතාවයේ ස්වභාවය: 38-43 පිටුවල.
- 2025 වර්ෂය තුළ පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල සහ කමිටු රැස්වීම් සංඛ්‍යාව සහ සහභාගීත්වය: 267 පිටුවෙහි.
- අධ්‍යක්ෂවරයා සභාපති ලෙස හෝ සාමාජිකයෙකු ලෙස කටයුතු කරනු ලබන කමිටුවල නම්: 266 පිටුවෙහි
- සම්බන්ධිත පාර්ශවීය ගනුදෙනු: 294-297 පිටුවල.

ප්‍රධාන විධායක නිලධාරීවරයා සම්බන්ධ ඇගයීම

(ප්‍රතිපත්තිය අ.11)

මෙම ඇගයීම් ක්‍රියාවලිය මගින් ප්‍රධාන විධායක නිලධාරී /සාමාන්‍යාධිකාරීවරයාගේ කාර්යසාධනය සහ නායකත්වය පිළිබඳව ඵලදායී සංවාදයක නිරත වීමට අධ්‍යක්ෂ මණ්ඩලයට සහ ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරීවරයාට නිල අවස්ථාවක් සලසා දෙයි. උපායමාර්ගික සැලසුම්කරණය සහ කාර්යසාධන කළමනාකරණය යටතේ ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරීවරයා වෙනුවෙන් සකස් කරන ලද ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPIs), පරීක්ෂක මණ්ඩලයක් විසින් කාර්තුවකට වරක් සමාලෝචනය කරනු ලබන අතර, එම සමාලෝචනය මසකට වරක් අධ්‍යක්ෂ මණ්ඩලයේ නිරීක්ෂණය සඳහා ඉදිරිපත් කරනු ලැබේ.

මෙම ඉලක්ක අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්ථිර කරනු ලබන අතර, ඒවා වාර්ෂික ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී ඇගයීම් ක්‍රියාවලියේ පදනම ලෙස භාවිතා කරයි. ඕනෑම අහිතකර විචලනයන් (adverse variances) සම්බන්ධයෙන් පැහැදිලි කිරීම් සහ ඒ සඳහා ගත යුතු නිවැරදි කිරීමේ පියවර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරීවරයා බැඳී සිටී.

අධ්‍යක්ෂවරුන්ගේ සහ විධායක නිලධාරීන්ගේ පාරිශ්‍රමික ක්‍රියාපටිපාටිය

GRI 2-19, 2-20

(ප්‍රතිපත්තිය ආ.1 – ආ.3)

අධ්‍යක්ෂ මණ්ඩල පාරිශ්‍රමිකයන් තීරණය කරනු ලබන්නේ මුදල් අමාත්‍යාංශය විසින් පනවා ඇති මාර්ගෝපදේශවලට අනුකූලවය. කිසිදු අධ්‍යක්ෂවරයෙකු තම පාරිශ්‍රමිකය තීරණය කිරීමට සම්බන්ධ නොවේ.

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව (BHRRC), එකඟ වූ යොමු කිරීම් අනුදේශ (Terms of Reference) තුළ සහ බැංකුවේ පාරිශ්‍රමික ප්‍රතිපත්ති සහ සාමූහික ගිවිසුමට අනුකූලව, ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී සහ ප්‍රධාන කළමනාකාරීත්ව නිලධාරීන්ගේ පාරිශ්‍රමික හා ප්‍රතිලාභ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කරයි.

පාරිශ්‍රමිකයන් සැලසුම් කර ඇත්තේ බැංකුව වෙත ඉහළ කාර්යසාධනයක් සහිත, සුදුසුකම් ලත් සහ පළපුරුදු සේවකයින් ආකර්ෂණය කර ගැනීමට, රඳවා ගැනීමට සහ ඔවුන් දිරිමත් කිරීමටය. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඒ සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කරනු ලබන අතර, සාමූහික ගිවිසුම යටතේ ඔවුන්ගේ පාරිශ්‍රමික අනුමත කිරීමේ අවසාන අධිකාරිය වන්නේ මුදල් අමාත්‍යවරයාය.

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව (BHRRC) සිය වගකීම් ඉටු කිරීමේ දී අවශ්‍ය යැයි හැඟෙන අවස්ථාවලදී බාහිරින් ස්වාධීන උපදෙස් ලබා ගනී. පාරිශ්‍රමික ප්‍රතිපත්ති ප්‍රකාශය සහ අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව (BHRRC) හි සභාපති සහ සාමාජිකයින්ගේ නම් ඇතුළත් එම කමිටු වාර්තාව 299 පිටුවේ දක්වා ඇත. අධ්‍යක්ෂවරුන් වෙත ගෙවන ලද මුළු පාරිශ්‍රමිකය 350 පිටුවේ දක්වා ඇත.

ආ.3.2 බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරිතුමා/සාමාන්‍යාධිකාරිතුමා ආයතනික කළමනාකරණ සාමාජිකයෙක් වන අතර සියලු ආයතනික කළමනාකරණ සාමාජිකයින් ඔහුට සෘජුව වාර්තා කරයි. ආයතනික කළමනාකරණයට ගෙවනු ලබන සමස්ත වැටුප පිටු අංක 297 හි ප්‍රකාශ කර ඇත.

කොටස්හිමියන් සමඟ සබඳතා

(ප්‍රතිපත්තිය ඇ.1, ඇ.2)

රාජ්‍ය බැංකුවක් ලෙස, ශ්‍රී ලංකා රජය ප්‍රධාන කොටස්හිමියා වන බැවින්, මහජන බැංකුව සෘජුවම මුදල් අමාත්‍යාංශයේ විෂය පථයට අයත් වේ. රටේ සමාජ-ආර්ථික සංවර්ධන ඉලක්කයන් සමඟ අනුකූලතාවය සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කරයි.

වාර්ෂික වාර්තාව ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ භාෂාවලින් මුද්‍රණය කෙරෙන අතර එය මුදල් අමාත්‍යාංශය හරහා පාර්ලිමේන්තුව වෙත යොමු කරනු ලැබේ. අමාත්‍යාංශයට අදාළ කරුණු සම්බන්ධයෙන් බැංකුව මුදල් අමාත්‍යාංශය සමඟ සබඳතා පවත්වයි.

ප්‍රධාන සහ වැදගත් ගනුදෙනු

(ප්‍රතිපත්තිය ඇ.3)

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ 43 වන සටහනෙහි සහ 294-297 පිටුවල ඇති සම්බන්ධිත පාර්ශ්ව අනාවරණයන්හි දක්වා ඇති ගනුදෙනු හැර, බැංකුවේ හෝ සමූහයේ ශුද්ධ වත්කම් පදනම සැලකිය යුතු ලෙස වෙනස් කරන වෙනත් ගනුදෙනු කිසිවක් සිදු වී නොමැත. ආර්ථිකය, පරිසරය සහ ජනතාව කෙරෙහි සංවිධානය මගින් ඇති කරන බලපෑම් කළමනාකරණය කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවරා දෙනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරීවරයා පත් කරනු ලබයි. සියලුම ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්ව පත් කිරීම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය දායක වන අතර, බැංකුවට අත්‍යවශ්‍ය බුද්ධිමය ප්‍රාග්ධනය දිරිමත් කිරීම සහ සුරැකීම සහතික කිරීම, කළමනාකාරීත්වය සහ අනෙකුත් සේවකයින් සඳහා සුදුසු සහ ප්‍රමාණවත් පුහුණුවක් ලබා දීම සහතික කිරීම සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය සඳහා අනුප්‍රාප්තික සැලසුමක් (succession plan) ක්‍රියාත්මක කිරීම සහතික කරනු ලබයි.

මූල්‍ය වාර්තාකරණය

(ප්‍රතිපත්තිය ඇ.1)

වාර්ෂික වාර්තාව මගින් මූල්‍ය තත්ත්වය, කාර්යසාධනය සහ අනාගත අපේක්ෂාවන් පිළිබඳ සමබර සමාලෝචනයක් ඉදිරිපත් කරයි.

තොරතුරු ඉදිරිපත් කිරීමේ දී අවබෝධය සහ පැහැදිලි බව වැඩි දියුණු කිරීම සඳහා විස්තරාත්මක මෙන්ම දෘශ්‍ය අංග ද භාවිතා කර ඇත. මෙම වාර්තාවේ සහ මුදල් අමාත්‍යාංශය සහ නියාමන ආයතන ඇතුළු අදාළ බලධාරීන් වෙත ඉදිරිපත් කරන ලද අනෙකුත් සන්නිවේදනයන්හි අපගේ කාර්යසාධනය පිළිබඳ සමබර දැක්මක් අප විසින් ලබා දී ඇත. වාර්ෂික වාර්තාවේ දී සහ මූල්‍ය කාර්යසාධනය පිළිබඳ අතුරු සන්නිවේදනයන් නිකුත් කිරීමේ දී ව්‍යවස්ථාපිත අවශ්‍යතාවලට අනුකූල වීම සහතික කිරීමට බැංකුව සෑම උත්සාහයක්ම ගනු ලබයි.

ආයතනික පරිච සංග්‍රහය (Code) මගින් අවශ්‍ය කරනු ලබන පහත සඳහන් අනාවරණයන් මෙම වාර්තාවට ඇතුළත් වේ:

- මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පිළිබඳ ප්‍රකාශය: ඔවුන්ගේ වගකීම් පිළිබඳ ප්‍රකාශයක් 312 පිටුවට ඇතුළත් වේ.
- මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය: 306–307 පිටුවල දක්වා ඇත.
- කළමනාකරණ විවරණය (Management Commentary): 101 සිට 205 දක්වා පිටුවල ඇතුළත් වේ.
- සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රකාශය (Statement of Going Concern): මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් ප්‍රකාශය යටතේ 312 වන පිටුවේ දක්වා ඇත.
- සම්බන්ධිත පාර්ශ්වයන් අතර ගනුදෙනු (Related Party Transactions): අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාවේ 294-297 පිටුවල සහ මූල්‍ය ප්‍රකාශනවල 43 වන සටහනෙහි (Note 43) අනාවරණය කර ඇත.
- 94–95 පිටුවල සඳහන් පරිසර, සමාජීය සහ පාලන (ESG) තිරසාර වාර්තාකරණය.

ඇ.1.4 වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම සහ එම වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන සමස්තයක් ලෙස සාධාරණ, සමබර සහ තේරුම් ගත හැකි ආකාරයෙන් පවතින බව ඔවුන් සලකා බලන ආකාරය පිළිබඳව 312 වන පිටුවේ මූල්‍ය ප්‍රකාශන සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම යන කොටස යටතේ සාකච්ඡා කෙරේ.

තවද, වාර්ෂික වාර්තාව සහ විවිධ කාර්තුමය ප්‍රකාශන හරහා සමාගමේ මූල්‍ය තත්ත්වය, කාර්යසාධනය, ESG/තිරසාරත්වය, අවදානම් සහ අවස්ථා, ව්‍යාපාරික ආකෘතිය සහ අනාගත දැක්ම ඇගයීම සඳහා අවශ්‍ය තොරතුරු කොටස් හිමියන් වෙත ලබා දීමට අධ්‍යක්ෂවරුන් වගබලා ගනී.

අවදානම, අභ්‍යන්තර පාලන සහ විගණන කමිටුව

(ප්‍රතිපත්තිය ඇ.2, ඇ.3, ඇ.4 සහ ඇ.5)

සංග්‍රහයේ (Code) ඇමුණුමට අනුකූලව අවදානම් කළමනාකරණ ප්‍රකාශය එක් කිරීම සහ කමිටු යොමු කොන්දේසි (Terms of Reference) විස්තර කිරීම:

- පුළුල් අවදානම් රුචිය (Risk appetite) අනාවරණය කිරීම.
- අභ්‍යන්තර පාලනයේ ඵලදායීතාව.
- නිසි කමිටු ප්‍රඥප්ති

කොටස්හිමියන්ගේ අවශ්‍යතා සහ බැංකුවේ වත්කම් සුරක්ෂිත කිරීම සඳහා අවදානම් කළමනාකරණය සහ විධිමත් අභ්‍යන්තර පාලන පද්ධතීන් සඳහා උචිත හා ප්‍රමාණවත් ක්‍රියාවලීන් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් තම වගකීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය මැනවින් දැනුවත් වී සිටියි. අවදානම් කළමනාකරණය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව (BAC) අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වන අතර, අවදානම් කළමනාකරණය පිළිබඳ සිය රාජකාරී ඉටු කිරීමේ දී අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC) අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සහාය ලබා දෙයි. ඔවුන්ගේ කාර්යභාරයන් සහ වගකීම් 298–305 පිටුවල දක්වා ඇති කමිටු වාර්තාවල ඇතුළත් කර ඇත.

බැංකුවේ අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව මගින් අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC) වෙත සහාය ලබා දෙයි. බැංකුවේ අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් 208–259 පිටුවල ඇතුළත් කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව (BAC) වෙත බැංකුවේ අභ්‍යන්තර විගණන අංශය මගින් සහාය ලබා දේ. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් අභ්‍යන්තර පාලන පද්ධතිවල ප්‍රමාණවත් බව සහ ඵලදායීතාව සමාලෝචනය කර නිතිපතා අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව (BAC) වෙත වාර්තා කරනු ලබයි. එවැනි විගණනවල විෂය පථය, ප්‍රතිඵල සහ එහි ඵලදායීතාව සමාලෝචනය කර පවත්වාගෙන යාම එහි රාජකාරිවලට ඇතුළත් වේ. බැංකුවේ බාහිර විගණනය සිදු කරනු ලබන විගණකාධිපතිවරයා සමඟ සබඳතා පැවැත්වීමේ දී ද අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව (BAC) ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි.

බැංකුව දැනට 2023 ආයතනික යහපාලනය පිළිබඳ මනා පරිච පිළිබඳ සංග්‍රහයේ (Code of Best Practice on Corporate Governance 2023) අමුණා ඇති වගන්තියට අනුකූලව කටයුතු කරයි. කෙසේ වුවද, අෑ.4.2 වගන්තිය යටතේ වන පහත සඳහන් ක්ෂේත්‍ර පිළිබඳ විශේෂ අවධානයක් යොමු කරමින්

(vi) ආයතනයේ රක්ෂණ වැඩසටහන අධීක්ෂණය කිරීම සහ එය ප්‍රමාණවත් මෙන්ම ශක්තිමත් බව සහතික කිරීම – ප්‍රමාණවත් ආවරණයක් සහ ඵලදායී අධීක්ෂණයක් සහතික කිරීම සඳහා බැංකුව අභ්‍යන්තර චක්‍රලේඛ මගින් රක්ෂණ වැඩසටහන් මාර්ගෝපදේශ ස්ථාපිත කර ඇත.

(viii) ESG (පරිසර, සමාජීය සහ පාලන) අවදානම් නිරීක්ෂණය කිරීම සඳහා ක්‍රියාවලියක් පවතින බව සහතික කිරීම – වර්තමානයේදී, ESG අවදානම් නිරීක්ෂණය කිරීම සහ ඇගයීම ප්‍රධාන වශයෙන් බැංකුවේ දේශගුණික අවදානම් කළමනාකරණ රාමුව (Climate Risk Management Framework) හරහා සිදු කරනු ලබයි.

ව්‍යාපාරික චර්යාවන් සහ ආචාර ධර්ම සංග්‍රහය සහ ආයතනික යහපාලන වාර්තාව

(ප්‍රතිපත්තිය අෑ.6)

බැංකුව සතුව ව්‍යාපාරික චර්යාවන් සහ ආචාර ධර්ම සංග්‍රහයන් (Codes of Business Conduct and Ethics) දෙකක් පවතින අතර, ඉන් එකක් අධ්‍යක්ෂවරුන් සඳහා ද අනෙක් සේවකයින් සඳහා ද අදාළ වේ.

බැංකුවේ විකාශනය වන ව්‍යාපාරික මෙහෙයුම් සැලකිල්ලට ගනිමින්, අදාළ සංග්‍රහයන්හි යෝග්‍යතාවය සහ ප්‍රමාණවත් බව සහතික කිරීම සඳහා ඒවා නිරන්තරයෙන් සමාලෝචනය කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව (BHRRC) වෙත පැවරී ඇත.

මෙම ව්‍යාපාරික චර්යාවන් සහ ආචාර ධර්ම සංග්‍රහයන්, ආයතනික යහපාලනය පිළිබඳ යහපත් භාවිතයන් පිළිබඳ සංග්‍රහයේ I වන උපලේඛනයෙහි අවශ්‍යතාවයන්ට අනුකූලව සකස් කර ඇත.

- ආචාර ධර්ම පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල අධීක්ෂණය පිළිබඳ ප්‍රකාශය
- ලැබුණු සහ විමර්ශනය කර අවසන් කරන ලද අකටයුතුකම් හෙළිදරව් කිරීමේ සිද්ධීන් පිළිබඳ සාරාංශය
- අභිලාෂයන් අතර ගැටුම් ප්‍රකාශ කිරීමේ ක්‍රියාවලිය සහ එහි ප්‍රතිඵල
- කාර්ය මණ්ඩලය සහ අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා වූ ආචාර ධර්ම පුහුණු සංඛ්‍යාලේඛන; ඇතුළත් ආචාර ධර්ම පාලන ප්‍රකාශයක් එක් කිරීම.

ආයතනික පාලන අනාවරණයන්

(ප්‍රතිපත්තිය අෑ.7)

266–275 පිටුවල ඇතුළත් මෙම ආයතනික පාලන වාර්තාව, මූලධර්ම අෑ.7 හි දක්වා ඇති පරිදි ආයතනික යහපාලනය පිළිබඳ මනා පරිච සංග්‍රහය කෙතරම් දුරට අනුගමනය කර ඇත්ද යන්න අනාවරණය කිරීමේ අවශ්‍යතාවයට අනුකූල වේ.

අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කළ තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්තියේ සාරාංශය

තොරතුරු ආරක්ෂණය යනු බැංකුවේ සමස්ත අවදානම් කළමනාකරණ රාමුවේ තීරණාත්මක අංගයක් බව අධ්‍යක්ෂ මණ්ඩලය පිළිගනී. මේ වෙනුවෙන්, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පුළුල් තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්තියක් අනුමත කර ඇති අතර එය වරින් වර සමාලෝචනය කරනු ලබයි. මෙම ප්‍රතිපත්තිය ISO 27001:2022 ජාත්‍යන්තර ප්‍රමිතියට අනුකූලව සකස් කර ඇති අතර, ශ්‍රී ලංකා මහ බැංකුවේ තාක්ෂණික අවදානම් කළමනාකරණ උපදෙස් මාලාව දැඩි ලෙස අනුගමනය කරයි.

ප්‍රතිපත්තියේ ප්‍රධාන අරමුණු

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද මෙම ප්‍රතිපත්තිය පහත සඳහන් උපායමාර්ගික ස්ථම්භ (Pillars) මත පදනම් වී ඇත:

- රහස්‍යභාවය, අඛණ්ඩතාව සහ පවතින බව (CIA): සංවේදී පාරිභෝගික සහ ආයතනික දත්ත වෙත ප්‍රවේශ විය හැක්කේ බලයලත් පරිශීලකයින්ට පමණක් බව සහතික කිරීම, අනවසර වෙනස් කිරීම්වලින් දත්ත ආරක්ෂා කිරීම සහ ව්‍යාපාරික කටයුතු සඳහා අවශ්‍ය ඕනෑම අවස්ථාවක දත්ත ලබා ගැනීමට හැකි බව තහවුරු කිරීම.
- අවදානම් මත පදනම් වූ ආරක්ෂණය: පද්ධතිවල පවතින දුර්වලතා හඳුනා ගැනීම සඳහා නිරන්තර අවදානම් තක්සේරු කිරීම් සිදු කිරීම අනිවාර්ය කිරීම සහ විකාශනය වන තර්ජනයන්ට සාපේක්ෂව ආරක්ෂක ආයෝජන සඳහා ප්‍රමුඛතාවය ලබා දීම සහතික කිරීම.
- නියාමන අනුකූලතාව: නීතිමය සහ කීර්තිනාමය පිළිබඳ අවදානම් අවම කිරීම සඳහා ජාතික ඩිජිටල් නීති සහ මූල්‍ය අංශයේ රෙගුලාසිවලට 100% ක් අනුකූල වීම සහතික කිරීම.
- අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කළ සයිබර් ආරක්ෂණ ප්‍රතිපත්ති සාරාංශය: (මෙහිදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සයිබර් තර්ජන හඳුනාගැනීම, වැළැක්වීම සහ ඒවාට ප්‍රතිචාර දැක්වීම සඳහා වන මූලික මූලධර්ම අනුමත කර ඇති බව අවධාරණය කෙරේ).
- සයිබර් අවදානම් අධීක්ෂණය කරන පාලන යාන්ත්‍රණයන් ඇතුළත් කිරීම: සයිබර් අවදානම් කළමනාකරණය සඳහා වන වගකීම් සහ අධීක්ෂණ ක්‍රියාවලිය විනිවිදභාවයකින් යුතුව පවත්වාගෙන යාම සඳහා වන පාලන ව්‍යුහය මෙයට ඇතුළත් වේ.

කොටස් හිමිකාර සබඳතා

(ප්‍රතිපත්ති ඉ සහ ඊ)

මහජන බැංකුවේ ප්‍රධාන කොටස් හිමිකරු ශ්‍රී ලංකා රජය වන බැවින්, සංග්‍රහය ආශ්‍රිත විධිවිධාන මෙයට අදාළ නොවේ.

අභ්‍යන්තර සහ බාහිර පද්ධති සම්බන්ධීකරණය සහ සයිබර් ආරක්ෂණය

(ප්‍රතිපත්තිය උ.1)

විකාශනය වන (අලුතින් බිහිවන) පද්ධතිමය වටපිටාව හා සම්බන්ධ අවදානම් හඳුනා ගැනීම සහ කළමනාකරණය කිරීම සඳහා බැංකුව අනුගමනය කරන ක්‍රියාවලිය පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය සක්‍රීය අධීක්ෂණයක් පවත්වාගෙන යනු ලබයි. බැංකුවේ ආරක්ෂිත ජාලය සමඟ සම්බන්ධ වන සියලුම තොරතුරු තාක්ෂණ උපාංග, ඒවා අභ්‍යන්තර උපාංග වුවද, බාහිර පාර්ශ්වයන් සතු උපාංග වුවද, හෝ පාරිභෝගිකයින් භාවිතා කරන උපාංග වුවද, නිවැරදිව හඳුනාගෙන (mapped) නිරන්තර අධීක්ෂණයට ලක් කරන බව මෙම රාමුව මගින් සහතික කෙරේ. මෙම අන්තර් සම්බන්ධතා මගින් බැංකුවේ මෙහෙයුම් ඔරොත්තු දීමේ හැකියාවට විල්ල විය හැකි සයිබර් ආරක්ෂණ බලපෑම් පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය ඇගයීමක නිරත වේ. ස්ථාපිත කර ඇති ආරක්ෂක විධිවිධානවලින් සිදුවන ඕනෑම සැලකිය යුතු බැහැරවීමක් හෝ අනවසරයෙන් ඇතුළු වීමට ගන්නා උත්සාහයන්, කාලෝචිත උපායමාර්ගික මැදිහත්වීම් සහ අවදානම් අවම කිරීම සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කමිටුව වෙත සෘජුවම වාර්තා කරනු ලැබේ.

(ප්‍රතිපත්තිය උ.2)

අපගේ සයිබර් ආරක්ෂක උපායමාර්ගය මෙහෙයවීම සඳහා ප්‍රධාන තොරතුරු ආරක්ෂණ නිලධාරියෙකුට (CISO) බලතල පැවරීම මගින්, සුරක්ෂිත මූල්‍ය පද්ධතියක් පවත්වාගෙන යාමට අධ්‍යක්ෂ මණ්ඩලය කැපවී සිටී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සෘජුවම අනුමත කරන ලද මූල්‍ය ප්‍රතිපාදන සහ බලතල සහිතව, ප්‍රධාන තොරතුරු ආරක්ෂණ නිලධාරියා විසින් බැංකුවේ මූලික ව්‍යාපාරික ආකෘතිය සමඟ අවදානම් කළමනාකරණය ඒකාබද්ධ කෙරෙන පරිපූර්ණ තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරනු ලබයි.

අපගේ ආරක්ෂක තත්ත්වය, සිදුවීම් සඳහා ප්‍රතිචාර දැක්වීමේ පද්ධතිවල කාර්යක්ෂමතාව සහ ස්වාධීන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICT) විගණනවල ප්‍රතිඵල පිළිබඳව නිතිපතා වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලැබෙන බව මෙම පාලන ව්‍යුහය මගින් සහතික කෙරේ. තවද, බැංකුවේ බාහිර සේවා සපයන්නන් කළමනාකරණය සහ ආපදා පසුකාලීන ප්‍රකෘතිමත් වීමේ සූදානම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය අධීක්ෂණය කරයි. ඒ හරහා සයිබර් ආරක්ෂණ රක්ෂණාවරණ සහ ශක්තිමත් අභ්‍යන්තර පාලනයන් මගින්, විකාශනය වන ඩිජිටල් තර්ජනවලට එරෙහිව බහු-ස්ථර ආරක්ෂණයක් සපයන බව තහවුරු කෙරේ.

(ප්‍රතිපත්තිය උ.3)

ආයතනික පාලනයේ ඉහළම ප්‍රමිතීන් පවත්වා ගැනීම සඳහා, සයිබර්-අවදානම් කළමනාකරණය බැංකුවේ උපායමාර්ගික තීරණ ගැනීමේ ක්‍රියාවලියට ඒකාබද්ධ කර ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කරයි. සංකීර්ණ ඩිජිටල් තර්ජන පරිසරය පිළිබඳව අවධානය යොමු කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික දින දර්ශනය තුළ සැලකිය යුතු කාලයක් වෙන් කරනු ලැබේ.

මෙම සාකච්ඡා මගින් ප්‍රධාන තොරතුරු ආරක්ෂණ නිලධාරියාගේ (CISO) ආරක්ෂණ උපායමාර්ග විමර්ශනය කිරීමටත්, සයිබර් ආරක්ෂණ ආයෝජනවල ප්‍රගතිය මැන බැලීමටත්, නියාමන අවශ්‍යතාවලට සම්පූර්ණයෙන්ම අනුකූල වන බව සහතික කිරීමටත් අධ්‍යක්ෂ මණ්ඩලයට වේදිකාවක් සපයයි. තවද, මතුවන සයිබර් තර්ජන හමුවේ ආයතනයේ ඔරොත්තු දීමේ හැකියාව තහවුරු කරමින්, බැංකුවේ පාලන පරිසරයේ ඵලදායීතාවය තහවුරු කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදුවීම් වාර්තා (incident reports) සහ ස්වාධීන විගණන නිර්දේශයන් සමාලෝචනය කරනු ලබයි.

(ප්‍රතිපත්තිය උ.4)

ස්වාධීන වාර්ෂික සමාලෝචන සහ සහතික කිරීම් මගින්, සයිබර් ආරක්ෂණ අවදානම් කළමනාකරණයේ ඵලදායීතාවය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සහතික කරනු ලබයි.

මෙම ස්වාධීන වාර්ෂික සමාලෝචනවල විෂය පථය සහ වාර ගණන (සමාලෝචනය සිදු කරන කාල පරාසය), ක්ෂේත්‍රයේ පවතින අවදානම් සහගත බව (vulnerability), සමාගමේ ව්‍යාපාරික ආකෘතිය සහ අතීතයේ වාර්තා වූ සයිබර් සිදුවීම්වල සොයාගැනීම් මත පදනම්ව තීරණය කරනු ලැබේ.

(ප්‍රතිපත්තිය උ.5)

ශක්තිමත් ආයතනික පාලන මූලධර්මයන්ට අනුකූලව, සයිබර් ආරක්ෂණ අවදානම් හඳුනා ගැනීමට සහ කළමනාකරණය කිරීමට භාවිතා කරන විස්තීර්ණ ක්‍රමවේදයන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනාවරණය කරනු ලබයි. බැංකුවේ ආරක්ෂක තත්ත්වය අධීක්ෂණය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ සෘජු මැදිහත්වීම මෙයට ඇතුළත් වන අතර, එමඟින් සයිබර්-ඔරොත්තු දීමේ හැකියාව අපගේ සමස්ත උපායමාර්ගික අවදානම් කළමනාකරණ රාමුවට ඒකාබද්ධ කර ඇති බව සහතික කෙරේ.

තිරසාරභාවය

GRI 2-9,12,13,14

(ප්‍රතිපත්තිය ඌ)

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුව සඳහා තිරසාරත්ව ප්‍රතිපත්තියක් අනුමත කර ඇති අතර, එහි දර්ශනය, අරමුණු සහ සමාජීය හා පාරිසරික සංවර්ධනය සඳහා වූ උපායමාර්ගික ඉලක්ක ක්‍රියාත්මක වන බව සහතික කිරීම සඳහා පාලන ව්‍යුහයක් ස්ථාපිත කර ඇත.

ඒ අනුව, බැංකුවේ සියලුම භූගෝලීය කලාපයන්හි මෙහෙයුම් පුරා තෙවැදෑරුම් මාර්ගයේ වටිනාකම් අන්තර්ගත කර ඇත. බැංකුවේ තිරසාර ව්‍යාපාරික මූලපිරීම්, සංග්‍රහයේ මූලධර්මයන්ට අනුකූලව පහත පරිදි විස්තර කෙරේ:

ප්‍රතිපත්තිය 1 – ආර්ථික තිරසාරභාවය – මූල්‍ය ප්‍රාග්ධනය (පිටු 142-149).

ප්‍රතිපත්තිය 2 – පාරිසරික – ස්වභාවික ප්‍රාග්ධනය (පිටු 198-205).

ප්‍රතිපත්තිය 3 – ශ්‍රම පිළිවෙත් – මානව ප්‍රාග්ධනය (පිටු 162-179).

ප්‍රතිපත්තිය 4 – සමාජීය – සමාජ සහ සබඳතා ප්‍රාග්ධනය (පිටු 180-197).

ප්‍රතිපත්තිය 5 – නිෂ්පාදන වගකීම – සමාජ සහ සබඳතා ප්‍රාග්ධනය: පාරිභෝගිකයා (පිටු 183-188).

ප්‍රතිපත්තිය 6 – පාර්ශ්වකරුවන් හඳුනාගැනීම, සම්බන්ධ කරගැනීම සහ ඵලදායී සන්නිවේදනය, පාර්ශ්වකරුවන්ගේ සම්බන්ධීකරණය (පිටු 74-79).

ප්‍රතිපත්තිය 7 – තිරසාර වාර්තාකරණය, වාර්තාකරණ ක්‍රියාවලියේ විධිමත් කොටසක් ලෙස සකස් කිරීම සහ එය නිතිපතා සිදු කිරීම පිළිබඳව අපගේ ඒකාබද්ධ වාර්තාව (පිටු 4-7).

අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණ ගැනීමේ හැකියාව මෙන්ම, වාර්තාකරණය සහ මූල්‍ය ප්‍රතිඵලවල නිවැරදිභාවය සෑම විටම ඉහළම මට්ටමක පවත්වා ගැනීම සඳහා, අභ්‍යන්තර පාලන පද්ධතිවල ඵලදායීතාවය තහවුරු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව හරහා පද්ධති, ක්‍රියාවලි සහ ක්‍රියාපටිපාටි නිතිපතා සමාලෝචනය කරනු ලබයි.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද, ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී බැංකු සඳහා ආයතනික පාලනය පිළිබඳ 2024 අංක 05 දරන බැංකු පනත් නියෝගය සහ ඒ සඳහා සිදුකරන ලද සංශෝධන

කොටස	ප්‍රතිපත්තිය	අනුකූලතාවය සහ ක්‍රියාත්මක කිරීම	අනුකූලතාවය
1	**අධ්‍යක්ෂ මණ්ඩලයේ අවසන් වගකීම සහ වගවීම**	බැංකුවේ පාලනය, උපායමාර්ගය, මූල්‍ය ස්ථාවරතාවය සහ අවදානම් කළමනාකරණය සඳහා අවසාන වගවීම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පවතී. අධ්‍යක්ෂවරුන් විසින් සියලු මෙහෙයුම් සියලු හිතිවලට අනුකූල වන අතර ආරක්ෂිත බැංකුකරණ ක්‍රියාපටිපාටිවලට අනුගත වන බව සහතික කළ යුතුය. සියලු පාර්ශ්වකරුවන්ගේ යහපත සඳහා විෂය බද්ධ තීරණ ගැනීමට අධ්‍යක්ෂවරුන් කටයුතු කළ යුතුය. කිසියම් අධ්‍යක්ෂවරයෙකු විසින් තම විරෝධය විධිමත් ලෙස සටහන් නොකරන්නේ නම්, අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලු තීරණ සමූහ තීරණ ලෙස සැලකේ.	අනුකූල විය.
1.1	**අධ්‍යක්ෂ මණ්ඩලයට අදාළ වගකීම්**	පහත පරිදි බැංකුවේ ආරක්ෂාව සහ ස්ථාවරතාවය ශක්තිමත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය "සැලකිලිමත් වගකීම" හා "විශ්වාසභාර වගකීම" ක්‍රියාත්මක කර ඇත;	
(අ)	දිගුකාලීන උපායමාර්ගික අරමුණු සහ ආයතනික අගයන් ස්ථාපිත කිරීම, සහ ඒවා බැංකුව පුරා ප්‍රචාරණය කර අනුගමනය කරවීම	2025-2027 කාලසීමාව සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද උපායමාර්ගික සැලැස්ම ක්‍රියාත්මකව පවතී. උපායමාර්ගික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් 2025, 2026 සහ 2027 වසර සඳහා 2025-2027 උපායමාර්ගික සැලැස්මේ යළි ආයෝජනය කිරීමේ (rollover) සැලැස්ම දැනටමත් සකස් කර ඇත. අරමුණු පිළිබඳ සන්නිවේදනය සේවකයින් වෙත විද්‍යුත් තැපෑල මඟින් බෙදාහරින ලදී.	
(ආ)	අවදානම් ප්‍රතිපත්තිය සහ කළමනාකරණ ක්‍රියාපටිපාටි මෙන්ම මැනිය හැකි ඉලක්ක ඇතුළුව සමස්ත ව්‍යාපාර උපායමාර්ගය අනුමත කිරීම	උපායමාර්ගික සැලැස්ම බැංකුවේ අවදානම් රාමුව සමඟ සංගත කර ඇත. එසේම, අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC) විසින් බැංකුවේ නව උපායමාර්ග, එම නව උපායමාර්ගයන්ගෙන් උද්ගත වන අවදානම් සහ එම අවදානම් අවම කිරීම සඳහා ඇති ක්‍රම හා මාර්ග පිළිබඳව සාකච්ඡා කරනු ලබයි. එනම් 2025 සඳහා ප්‍රතිසාධන සැලසුම්, විදේශ විනිමය හිඟ සීමා සහ උප සීමා සංශෝධනය කිරීම වැනි කරුණු.	අනුකූල විය.
(ඇ)	ප්‍රථම, දෙවන සහ තෙවන ආරක්ෂක මට්ටම් සඳහා පැහැදිලි ලෙස නිර්වචනය කරන ලද වගකීම් සමඟ ශක්තිමත් අවදානම් පාලන සංස්කෘතියක් ස්ථාපිත කිරීම		අනුකූල විය.
	(i) ප්‍රධාන අවදානම් හඳුනාගැනීම සහ අවදානම් විචක්ෂණශීලීව කළමනාකරණය කිරීම සඳහා සුදුසු පද්ධති ක්‍රියාත්මක කිරීම සහතික කිරීම	ප්‍රධාන අවදානම් මැනීම, නිරීක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා පද්ධති ක්‍රියාත්මක කරමින් අවදානම් කළමනාකරණ ක්‍රියාපටිපාටි සහ යාන්ත්‍රණ ක්‍රියාත්මකව පවතී. එසේම, නව උපායමාර්ගයන්ගෙන් උද්ගත වන අවදානම් හඳුනාගැනීම සහ එම අවදානම් අවම කිරීම සඳහා ක්‍රම හා මාර්ග හඳුනාගෙන ඇත. අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC) විසින් බැංකුවේ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය සමාලෝචනය කර ඇත.	
	(ii) බැංකුවේ ප්‍රථම, දෙවන සහ තෙවන ආරක්ෂක මට්ටම් සඳහා, එනම් පැහැදිලි ලෙස නිර්වචනය කරන ලද ආයතනික වගකීම් ස්ථාපිත කිරීම	ප්‍රථම, දෙවන සහ තෙවන ආරක්ෂක මට්ටම් යටතේ ආයතනික වගකීම් ස්ථාපිත කිරීම සහ අවදානම් කළමනාකරණය, අනුකූලතාව සහ අභ්‍යන්තර විගණනය යන ක්ෂේත්‍රයන් නිසි ලෙස ශක්තිමත් කරමින්, කාර්ය මණ්ඩලය විසින් එම වගකීම් ස්වාධීනව හා කාර්යක්ෂමව ඉලක්කයන්ට අනුකූලව ඉටු කිරීම සහතික කිරීම.	
	(iii) අවදානම් කළමනාකරණය, අනුකූලතාව සහ අභ්‍යන්තර විගණන කාර්යයන් නිසි ලෙස ස්ථානගත කර ඇති බවත්, එම වගකීම් ස්වාධීනව, වෛෂයිකව සහ කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් සහ සම්පත් සපයා ඇති බවත් සහතික කිරීම. අවදානම් කළමනාකරණය, අනුකූලතාව සහ අභ්‍යන්තර විගණන කාර්යයන්හි වගකීම් පිළිවෙලින් II, III සහ IV උපලේඛනවල සඳහන් කර ඇත.	ප්‍රථම, දෙවන සහ තෙවන ආරක්ෂක මට්ටම් යටතේ ආයතනික වගකීම් ස්ථාපිත කිරීම සහ අවදානම් කළමනාකරණය, අනුකූලතාව සහ අභ්‍යන්තර විගණනය යන ක්ෂේත්‍රයන් කාර්ය මණ්ඩලය මඟින් නිසි ලෙස ශක්තිමත් කරමින්, එම වගකීම් ඉලක්කයන්ට අනුකූලව ස්වාධීනව හා කාර්යක්ෂමව ඉටු කිරීම සහතික කිරීම	
	(iv) බැංකුවේ උපායමාර්ගික, ප්‍රාග්ධන සහ මූල්‍ය සැලසුම් සමඟ සංගත කරමින් බැංකුවේ අවදානම් පිළිගැනීමේ සීමාව නිර්වචනය කිරීම, එය අවදානම් පිළිගැනීමේ ප්‍රකාශනය (Risk Appetite Statement) මඟින් ප්‍රකාශිත කරනු ලබයි.	බැංකුව විසින් බැංකුවේ අවදානම් පිළිගැනීමේ ප්‍රකාශනය සකස් කර ඇති අතර එය බැංකුවේ උපායමාර්ගික, ප්‍රාග්ධන සහ මූල්‍ය සැලසුම් සමඟ සංගතතාවය පැහැදිලිව ප්‍රකාශ කරයි.	

කොටස	ප්‍රතිපත්තිය	අනුකූලතාවය සහ ක්‍රියාත්මක කිරීම	අනුකූලතාවය
	(v) නිශ්චිත කර ඇති අවදානම් පිළිගැනීමේ සීමා ඉක්මවා යන අවස්ථාවලදී ගත යුතු ක්‍රියාමාර්ග, එනම් අධික අවදානම් ගැනීම සඳහා විනයානුකූල ක්‍රියාමාර්ග, උසස් මට්ටමට ඉදිරිපත් කිරීමේ ක්‍රියාපටිපාටි සහ අධ්‍යක්ෂ මණ්ඩලයට දැනුම්දීම් ඇතුළුව ගත යුතු ක්‍රියාමාර්ග විස්තර කිරීම	වසර තුළදී, අවදානම් පිළිගැනීමේ සීමා උල්ලංඝනය වූ අවස්ථා අධ්‍යක්ෂ මණ්ඩලයට දැනුම් දෙනු ලබන අතර, සීමා උල්ලංඝනයන් සඳහා වැළැක්වීමේ පියවරක් ලෙස විනයානුකූල ක්‍රියාමාර්ග ගනු ලැබේ.	
(අෑ)	අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්වාධීනත්වය සහ අනවශ්‍ය බලපෑම් වළක්වා ගැනීම	අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය සියලු අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රමාණවත් බල සම්තුලනයක් සහ සක්‍රීය දායකත්වයක් සහතික වන පරිදි ව්‍යුහගත කර ඇති අතර, ඒ අනුව කිසිදු තනි සාමාජිකයෙකුට හෝ කණ්ඩායමකට මණ්ඩලයේ ක්‍රියාවලිය ආධිපත්‍ය කිරීමට ඇති හැකියාව අවම කර ඇත. එබැවින්, අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණ පාර්ශ්වකරුවන්ට හානිකර හෝ අසාධාරණ නොවේ.	අනුකූල විය.
(ඉ)	සියලු පාර්ශ්වකරුවන් සමඟ සන්නිවේදනය	ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) නියාමන ආයතනය වන අතර, බැංකුව දෛනික, සතිපතා, මාසික, කාර්තුමය, අර්ධ වාර්ෂික සහ වාර්ෂික වශයෙන් CBSL විසින් ඉල්ලා සිටින විවිධ තොරතුරු දැඩිව අනුගමනය කරමින් සපයයි. එසේම වාර්ෂික පදනමින් සිදුකරන ස්ථානීය සහ ස්ථානබාහිර පරීක්ෂණ සඳහාද අවශ්‍ය තොරතුරු ලබාදෙයි. බැංකුව විසින් පාරිභෝගික මූල්‍ය ආරක්ෂණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කර ඇති අතර, එයට පාරිභෝගික පැමිණිලි කළමනාකරණ ප්‍රතිපත්තියද ඇතුළත් වේ. පාරිභෝගිකයන්ට බැංකුවේ පැමිණිලි කළමනාකරණ නිලධාරීන් වෙත සම්බන්ධ වීම සඳහා සම්බන්ධතා අංක සපයා ඇත. මේ සඳහා පැය 24 පුරා ක්‍රියාත්මක වන ත්‍රිභාෂා පාරිභෝගික හොට්ලයින් සේවාවක්ද ස්ථාපිත කර ඇත. තවද, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ආයතනික සන්නිවේදන ප්‍රතිපත්තියක්ද ක්‍රියාත්මක වේ.	අනුකූල විය.
(ඊ)	අභ්‍යන්තර පාලන පද්ධතිය සහ කළමනාකරණ තොරතුරු පද්ධති	මෙම කරුණ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වන්නේ විගණන කමිටුව (BAC) වන අතර, එම කමිටුව බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතියේ සහ කළමනාකරණ තොරතුරු පද්ධතියේ ප්‍රමාණවත්භාවය සහ අඛණ්ඩතාව සමාලෝචනය කරයි. විගණන කමිටුව මෙම කාර්යය ඉටු කිරීමේදී අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ සහ බාහිර විගණකවරුන්ගේ වාර්තා සමාලෝචනය කර ඇති අතර, ඒ සම්බන්ධ කළමනාකරණ ප්‍රතිචාර ද සමාලෝචනය කර ඇත.	අනුකූල විය.
(උ)	අදාළ පාර්ශ්ව ගනුදෙනු පාලනය හා පාලන ක්‍රමවේදය	පාරදෘශ්‍යතාව සහතික කිරීම සහ බැඳියා පිළිගැටුම් වළක්වා ගැනීම සඳහා, බැංකුව සහ එහි උප සමාගම් විසින් සිදුකරනු ලබන සියලුම අදාළ පාර්ශ්ව ගනුදෙනු (RPT) සමාලෝචනය කිරීම සඳහා අදාළ පාර්ශ්වයන් අතර ගනුදෙනු විමර්ශන කමිටුවට (RPTRC) සහාය වේ. කමිටුවේ කාර්යභාරය වන්නේ සමස්ත කොටස්කරුවන්ගේ හිතසම්පන්නතාව සලකා බැලීමත්, අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය (KMP) සහ ප්‍රධාන කොටස්කරුවන් තම තනතුරු මඟින් අනවශ්‍ය වාසියක් ලබා නොගන්නා බව සහතික කිරීමත් වේ. බැංකුවේ අදාළ පාර්ශ්ව ගනුදෙනු, 2025 වර්ෂයේදී පිහිටුවන ලද අදාළ පාර්ශ්ව ගනුදෙනු ප්‍රතිපත්තිය මඟින් පාලනය වේ. මෙම ක්‍රියාවලිය මඟින් අදාළ පාර්ශ්වයන් අතර ගනුදෙනු සම්බන්ධයෙන් පාරදෘශ්‍යතාව පවත්වා ගැනීම සඳහා අවශ්‍ය සියලු අනාවරණ සිදුකරන බවද සහතික කරයි.	අනුකූල විය.
(ඌ)	ආපදා අයකරවා ගැනීම සහ ව්‍යාපාර අඛණ්ඩතාව පාලනය	අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC) විසින් බැංකුවේ ව්‍යාපාර අඛණ්ඩතා සහ ආපදා ප්‍රතිසාධන සැලසුම් වාර්ෂිකව සමාලෝචනය කර, මූල්‍ය ස්ථාවරතාව ආරක්ෂා කිරීම, මෙහෙයුම් ප්‍රතිරෝධශීලීතාව සහතික කිරීම සහ විශේෂයෙන්ම නීතිමය නියමයන්ට අනුකූලව මූලික බැංකුකරණ පද්ධති (Core Banking Systems) ඇතුළුව අත්‍යවශ්‍ය මෙහෙයුම් පවත්වාගෙන යාම සඳහා ඒවායේ ප්‍රමාණවත්භාවය තහවුරු කරයි.	අනුකූල විය.

කොටස	ප්‍රතිපත්තිය	අනුකූලතාවය සහ ක්‍රියාත්මක කිරීම	අනුකූලතාවය
(ඒ)	අවදානම් පාලනය සමඟ සංගත වූ වැටුප් හා ප්‍රතිලාභ පාලනය	බැංකුව සතුව සුදුසුකම් සහිත හා පළපුරුදු කාර්ය මණ්ඩලය ආකර්ෂණය කර ගැනීම, උද්දීපනය කිරීම සහ රඳවා ගැනීම අරමුණු කරගත් සම්පූර්ණ වැටුප් හා ප්‍රතිලාභ පද්ධතියක් පවතී. එසේම, වාර්ෂික කාර්ය සාධන ඇගයීම් පද්ධතියක් ක්‍රියාත්මක කර ඇති අතර, එහි ප්‍රතිඵල KPI පදනම් වූ දීමනා සමඟ සම්බන්ධ කර ඇත. ඊට අමතරව, සේවකයින්ගේ ඇගයීම් සඳහා වාර්ෂික වැටුප් වර්ධන ක්‍රමවේදයක්ද ක්‍රියාත්මක වේ. අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව (BHRRC) විසින් ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ (KMP) ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPI) කාර්තුමය වශයෙන් සමාලෝචනය කරයි. අධ්‍යක්ෂ මණ්ඩලයේ වැටුප් හා ප්‍රතිලාභ මුදල් අමාත්‍යාංශය විසින් නියම කරන ලද මාර්ගෝපදේශ අනුව තීරණය කරනු ලබයි. ස්වාධීන අධ්‍යක්ෂවරුන්ගේ ගෙවීම් සම්බන්ධ අදාළ මාර්ගෝපදේශ, මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ උපදෙස් අනුව ක්‍රියාත්මක වේ.	අනුකූල විය.
(ඒ)	ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ (KMP) තනතුරු හඳුන්වා දීම	බැංකුවේ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය (KMP) ලෙස ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන් සහ සහකාර සාමාන්‍යාධිකාරිවරුන් හඳුනාගෙන ඇත. ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය යනු ප්‍රතිපත්ති සාර්ථකව බලපාන, ක්‍රියාකාරකම් මෙහෙයවන සහ ව්‍යාපාරික ක්‍රියාකාරකම්, මෙහෙයුම් සහ අවදානම් කළමනාකරණය මත පාලනය ක්‍රියාත්මක කරන පුද්ගලයින් වේ. නම් කරන ලද ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ සියලු පත්කිරීම් අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා සහ පාලන කමිටුව විසින් නිර්දේශ කර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබේ. බැංකුවේ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය, සියලු නියාමන අවශ්‍යතා සලකා බැලීමෙන් බැංකුවේ අදාළ පාර්ශ්ව ගනුදෙනු ප්‍රතිපත්තියේ අර්ථ දක්වා ඇත.	අනුකූල විය.
(ඕ)	පාලන රාමුව තුළ අධ්‍යක්ෂ මණ්ඩලයේ, ප්‍රධාන විධායක නිලධාරී (CEO)ගේ සහ කළමනාකාරිත්වයේ කාර්යභාරය	අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තිය මඟින් අධ්‍යක්ෂ මණ්ඩලයට වෙන් කර ඇති නිශ්චිත බලතල සහ වගකීම් පැහැදිලිව සීමා කර, එහි සහ කළමනාකරණයේ වගකීම සහ වගවීම විධිමත් ලෙස ස්ථාපිත කර ඇත. ඊට ප්‍රතිවිරුද්ධව, ආයතනික කළමනාකරණයේ එක් එක් සාමාජිකයන්ගේ බලතල සහ ප්‍රධාන වගකීම් ඔවුන්ගේ අදාළ රැකියා විස්තර තුළ විධිමත් ලෙස නිර්වචනය කර ඇත.	අනුකූල විය.
(ඕ)	කළමනාකාරිත්වයේ වගවීම සහ බැංකු කටයුතු උපායමාර්ගිකව ක්‍රියාත්මක කිරීම	අධ්‍යක්ෂ මණ්ඩලය, තම කමිටු විසින් පැවරූ වගකීම් සම්බන්ධයෙන් සපයන වාර්තා උපයෝගී කරගනිමින්, මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලන, අවදානම් කළමනාකරණය, ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ වෙනස්කම් සහ අනෙකුත් අදාළ කරුණු ආවරණය කරමින්, බැංකුවේ උපායමාර්ගික සැලැස්මට සාපේක්ෂව බැංකුවේ කාර්යසාධනය සක්‍රීයව සමාලෝචනය කරයි. තවද, ප්‍රධාන විධායක නිලධාරී සහ අනෙකුත් ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය වෙතින් ඔවුන්ගේ අදාළ ක්ෂේත්‍රයන් පිළිබඳව නිතිපතා ඉදිරිපත් කිරීම් සිදු කරන ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය ඉල්ලා සිටින අතර, අදාළ මෙහෙයුම් කරුණු සම්බන්ධයෙන් පැහැදිලි කිරීම් ලබාදෙන ලෙස ද ඔවුන් කැඳවනු ලැබේ. මහජන බැංකු පනතේ 8 වන වගන්තිය අනුව, අධ්‍යක්ෂවරුන්ගේ පත්කිරීම අමාත්‍යවරයා විසින් සිදු කරනු ලබයි. එහිදී අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු සමීපකාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලැබිය යුතුය. කෙසේ වෙතත්, ස්වාධීන අධ්‍යක්ෂවරුන්ගේ තෝරාගැනීම සහ නම් කිරීම විශේෂ තෝරාගැනීමේ කමිටුවක් මඟින් සිදු කරනු ලැබේ.	අනුකූල විය.
(ක)	තම පාලන ක්‍රියාපටිපාටිවල ඵලදායීතාවය ඇගයීම	ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය (KMP) තෝරාගැනීම සහ නම් කිරීම අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා සහ පාලන කමිටුව (BNGC) විසින් සිදු කර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබේ. 2025 වර්ෂය සඳහා (ස්වයං/අධ්‍යක්ෂ මණ්ඩල/කමිටු මට්ටමින්) සම්පූර්ණ කරන ලද අධ්‍යක්ෂ මණ්ඩල කාර්යසාධන ඇගයීම් පත්‍රිකා සියලුම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගෙන් සමාලෝචනය සඳහා ලබාගෙන ඇති අතර, එම ප්‍රතිචාර BNGC රැස්වීමේ දී සහ පසුව පැවැත්වූ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී සාකච්ඡා කර ඇත. හඳුනාගත් අවධානය යොමු කළ යුතු කරුණු වසර තුළ දී අනුගමනය කරමින්, බැංකුවේ පාලන ක්‍රියාපටිපාටි අඛණ්ඩව වැඩිදියුණු කර ඇත. මෙම ඇගයීම් ක්‍රියාවලිය මඟින් පාලන ප්‍රමිතීන් වැඩිදියුණු කිරීම සහ අධ්‍යක්ෂ මණ්ඩල කාර්යසාධනය උපායමාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීමේ දී යොදවා ගැනීම තහවුරු කරනු ලබයි.	අනුකූල විය.

කොටස	ප්‍රතිපත්තිය	අනුකූලතාවය සහ ක්‍රියාත්මක කිරීම	අනුකූලතාවය
(ග)	අධ්‍යක්ෂවරුන්ගේ ස්වයං ඇගයීම	සෑම අධ්‍යක්ෂවරයෙකු විසින්ම වාර්ෂිකව සිදු කළ යුතු ස්වයං ඇගයීම් පටිපාටියක් බැංකුව විසින් අනුගමනය කරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලයේ සෑම සාමාජිකයෙකුම, පුද්ගලයෙකු වශයෙන් තමන්ගේ කාර්යක්ෂමතාව මෙන්ම සමස්තයක් ලෙස අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යක්ෂමතාව පිළිබඳවද ස්වයං ඇගයීමක් සිදු කරන ලදී. තවද, සෑම අධ්‍යක්ෂවරයෙකුම අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කිරීම සඳහා වන "සුදුසු බව සහ යෝග්‍යතාව" (Fitness and Propriety) පිළිබඳ ඇගයීමක්ද සිදු කරනු ලබයි.	අනුකූල විය.
(ජ)	ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකාරිත්ව කාර්ය මණ්ඩලය සඳහා අනුප්‍රාප්තික සැලසුම	ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකාරිත්ව කාර්ය මණ්ඩල අනුප්‍රාප්තිකයන් සැලසුම් කිරීම සහ ඔවුන් ඇගයීමට ලක් කිරීම සඳහා වන සක්‍රීය ක්‍රියාවලියක්, ඔවුන්ගේ සූදානම් බව සහතික කෙරෙන සංවර්ධන සැලසුම් ද සමඟින් අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා සහ පාලන කමිටුව (BNGC) විසින් සකස් කර ඇත. ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකාරිත්ව කාර්ය මණ්ඩලය සඳහා වන අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලත් අනුප්‍රාප්තික සැලසුම් දැනට ක්‍රියාත්මකව පවතී.	අනුකූල විය.
(ට)	ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකාරිත්ව කාර්ය මණ්ඩලය සමඟ පවත්වනු ලබන නිත්‍ය රැස්වීම්	ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීමේ ප්‍රගතිය අධ්‍යක්ෂ මණ්ඩල න්‍යාය පත්‍රයේ නිත්‍ය අයිතමයක් වන අතර, ඒ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමින් පවත්වනු ලබන සාකච්ඡා සඳහා ආයතනික කළමනාකාරිත්වයේ සාමාජිකයෝ නිතිපතා දායක වෙති. මීට අමතරව, ප්‍රතිපත්තිමය කරුණු සහ ඔවුන්ගේ විෂය පථයන්ට අදාළ අනෙකුත් කරුණු සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී කෙරෙන සාකච්ඡා සහ එහි කමිටු ඉදිරිපත් කිරීම් සඳහා ද ඔවුන් නිතිපතා කැඳවනු ලැබේ.	අනුකූල විය.
(ඩ)	නියාමන පරිසරය සහ නියාමකයින් සමඟ ඵලදායී සබඳතාවක් පවත්වා ගැනීම	අධ්‍යක්ෂවරුන් විසින් සිය වගකීම් ඵලදායී ලෙස ඉටු කිරීම පහසු කරනු පිණිස, නියාමන ක්ෂේත්‍රයේ නව වර්ධනයන් පිළිබඳව ප්‍රධාන කළමනාකාරිත්ව කාර්ය මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල දී ඔවුන්ව දැනුවත් කරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ (BAC) සහ අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ (BIRMC) සාමාජිකයන්ව ද අභ්‍යන්තර විගණන, අවදානම් සහ අනුකූලතා අංශ ප්‍රධානීන් විසින් එම කමිටු රැස්වීම්වලදී නියාමන නව වර්ධනයන් පිළිබඳව දැනුවත් කරනු ලැබේ. තවද, ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL) විසින් සංවිධානය කරනු ලබන අධ්‍යක්ෂ සංසද සඳහා ද අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෝ සහභාගී වෙති.	අනුකූල විය.
(ණ)	බාහිර විගණකවරුන් පත් කිරීම	බැංකුවේ බාහිර විගණකවරයා වශයෙන් විගණකාධිපතිවරයා කටයුතු කරනු ලබයි.	අනුකූල විය.
(ත)	ත්‍යාග සහ දිරිගැන්වීම් පිළිබඳ මාර්ගෝපදේශ	මූල්‍ය හා මූල්‍ය නොවන ත්‍යාග, පක්ෂපාතිත්වයන් හෝ ඕනෑම ආකාරයක නීති විරෝධී පාරිතෝෂිකයන් ලබා ගැනීම සහ පිරිනැමීම සම්බන්ධයෙන් සවිස්තරාත්මක මාර්ගෝපදේශ බැංකුව විසින් ස්ථාපිත කර ඇත. පාලන චක්‍රලේඛවල දක්වා ඇති පරිදි, අරමුදල් රැස්කිරීමේ කටයුතු සහ සේවකයින්, පාර්ශෝගිකයින් හෝ සැපයුම්කරුවන් සමඟ පවත්වන පුද්ගලික සබඳතා ද මෙම මාර්ගෝපදේශ මඟින් පාලනය කරනු ලබයි. මෙය ආයතනික යහපාලනය පිළිබඳ සංශෝධිත යහපත් අභ්‍යාස පද්ධතිය සහ මහජන බැංකුවේ චාරිත්‍ර ධර්ම පද්ධතිය මඟින් ආවරණය කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩල අත්පොත (Board Manual) යටතේ ඇති "අධ්‍යක්ෂවරුන් සඳහා වූ ආචාර ධර්ම පද්ධතිය" යන කොටස ද අප විසින් සමාලෝචනය කර ඇත.	අනුකූල විය.
(ද)	වෘත්තීයමය, සදාචාරාත්මක සහ විචක්ෂණශීලී හැසිරීම් රටාවකින් යුත් සංස්කෘතිය	අධ්‍යක්ෂවරුන් සඳහා අදාළ වන්නා වූ ව්‍යාපාරික චර්යාධර්ම සහ ආචාර ධර්ම පද්ධතියක් ඇතුළත්, බැංකුව විසින් අභ්‍යන්තරව සකස් කරන ලද "අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියක්" (Board Charter) බැංකුව සතු වේ. ප්‍රධාන කළමනාකාරිත්ව කාර්ය මණ්ඩලය (KMPs) සහ අනෙකුත් සියලුම සේවකයින් සඳහා බැංකුව විසින් "විනය පටිපාටියක" ක්‍රියාත්මක කර ඇත. එමඟින් සදාචාරාත්මක හැසිරීම් පිළිබඳ පැහැදිලි අපේක්ෂාවන් ස්ථාපිත කර ඇති අතර, පාර්ශෝගික කේන්ද්‍රීය තීරණ ගැනීම, සේවා ස්ථානය තුළ ගෞරවනීය අන්තර් සබඳතා පවත්වා ගැනීම සහ නීතිමය හා නියාමන ප්‍රමිතීන්ට දැඩි ලෙස අනුකූල වීම සඳහා සේවකයින්ට මඟපෙන්වීම් ලබා දෙයි	අනුකූල විය.
(න)	අධීක්ෂණ ගැටලු/නිරීක්ෂණ නියමිත වේලාවට නිවැරදි කිරීම	නව නියාමන අවශ්‍යතා, අභ්‍යන්තර ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි සහ පාලන ක්‍රමවේදයන් සමඟ නියමිත වේලාවට ඒකාබද්ධ කිරීම සඳහා සහාය වීමට අනිවාර්ය අධ්‍යක්ෂ මණ්ඩල කමිටු පිහිටුවීම ඇතුළු ප්‍රධාන පියවර කිහිපයක් බැංකුව විසින් ක්‍රියාත්මක කර ඇත. තවද, අනුකූලතා ක්‍රියාකාරකම්වල අඛණ්ඩ අදාළත්වය සහ ඵලදායීතාවය සහතික කිරීම සඳහා මෙම කමිටු මඟින් නිත්‍ය සමාලෝචනයන් පවත්වනු ලබයි.	අනුකූල විය.

කොටස	ප්‍රතිපත්තිය	අනුකූලතාවය සහ ක්‍රියාත්මක කිරීම	අනුකූලතාවය
(ඌ)	පැමිණිලි කිරීමේ ප්‍රතිපත්තිය (Whistleblowing Policy)	බැංකුව සිය පැමිණිලි කිරීමේ ප්‍රඥප්තියේ (Whistleblower Charter) හරහා විනිවිදභාවය සහ වගවීමේ සංස්කෘතියක් තහවුරු කරන අතර, සදාචාරාත්මක උල්ලංඝනය කිරීම් සහ ගැටලු පිළිබඳව වාර්තා කිරීම සඳහා සේවකයින්ට ආරක්ෂිත, රහස්‍ය මෙන්ම නිර්නාමික වේදිකාවක් පවතින බව සහතික කරයි. වාර්තා කිරීමේ කටයුතු බාධාවකින් තොරව සිදුකිරීම සඳහා බැංකුව විසින් ක්ෂණික ඇමතුම් සේවා සහ අනුකූලතා නිලධාරී (Compliance Officer) වෙත සෘජුව පිවිසීමේ අවස්ථාව ඇතුළු බහුවිධ සන්නිවේදන මාර්ග සපයා ඇති අතර, අවශ්‍යතාවය පරිදි පාලන පද්ධතියේ ඉහළම මට්ටම දක්වා ගැටලු යොමු කිරීමේ හැකියාව ද සේවකයින්ට පවතී. මෙම පැමිණිලි කිරීමේ ප්‍රඥප්තිය වරින් වර සමාලෝචනයට ලක් කෙරේ.	අනුකූල විය.
(බ)	තිරසාරභාවය සහ පාරිසරික, සමාජීය සහ පාලන (ESG) ඒකාබද්ධතාවය	බැංකුවේ ව්‍යාපාරික උපායමාර්ගය තුළ පාරිසරික, සමාජීය සහ පාලන (ESG) මූලධර්ම පූර්ණ ලෙස ඒකාබද්ධ කිරීමේ අවශ්‍යතාවය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර අවධාරණය කරන ලද අතර, එය දිගුකාලීන තිරසාරභාවය සහ නියාමන අනුකූලතාවය ඇති කිරීමට මහෝපකාරී වනු ඇත. තිරසාර කෘෂිකර්මාන්තය සහ පාරිසරික වශයෙන් වගකිවයුතු ක්‍රියා පටිපාටීන් සඳහා පාරිභෝගිකයින් යොමු කිරීම ඇතුළුව; වඩාත් හරිත, දේශගුණික හිතකාමී සහ සමාජීය වශයෙන් ඇතුළත් කරගත් ආර්ථික ක්‍රියාකාරකම් සඳහා සහය වන අයුරින් ණය ලබාදීම, ආයෝජන සහ ශාඛා මෙහෙයුම් මෙහෙයවීම සඳහා මෙම ESG ප්‍රතිපත්තිය මඟ පෙන්විය යුතු බව අධ්‍යක්ෂවරුන් පෙන්වා දෙන ලදී. මෙම ප්‍රතිපත්තිය හුදු අනුකූලතා අභ්‍යාසයකින් ඔබ්බට ගොස් රජයේ ප්‍රමුඛතාවයන් සහ බැංකුවේ උපායමාර්ගික සැලැස්ම සමඟ අනුගත විය යුතු බවත්, සියලුම ව්‍යාපාරික තීරණ තුළ තිරසාරභාවය අන්තර්ගත කිරීම සඳහා නිසි පාලන ව්‍යුහයන්, සම්පත් වෙන් කිරීම සහ අඛණ්ඩ අනුකූලතා අධීක්ෂණය සහතික කළ යුතු බවත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වැඩිදුරටත් අවධාරණය කරන ලදී.	අනුකූල විය.
1.2	**සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරිවරයා පත් කිරීම**	මහජන බැංකු පනතේ 10 වැනි වගන්තියට අනුව, අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් අතුරින් මණ්ඩලයේ සභාපතිවරයා පත් කරනු ලැබේ. ඒ අනුව ස්වාධීන නොවන, විධායක නොවන අධ්‍යක්ෂ මහාචාර්ය පී එන් ඩී ප්‍රනාන්දු මහතා අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයා ලෙස පත් කර ඇත. ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ක්ලයිව් ෆොන්සේකා මහතා ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍ය අධිකාරී ලෙස පත් කරන ලදී. අධිකාරී බලය එක් පුද්ගලයෙකු වටා කේන්ද්‍රගත වීම වැළැක්වීම සඳහා සභාපතිවරයා සහ ප්‍රධාන විධායක නිලධාරියා අතර පැහැදිලි වෙන් කිරීමක් අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තිය මඟින් පවත්වාගෙන යනු ලබයි.	අනුකූල විය.
1.3	**අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පවත්වන වාර ගණන සහ පැවැත්වීම**	අධ්‍යක්ෂ මණ්ඩලය නිත්‍ය මාසික රැස්වීම් පවත්වන අතර, මතු වන කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා අවශ්‍ය පරිදි විශේෂ රැස්වීම් ද පවත්වනු ලැබේ. සමාලෝචනය සඳහා ඉදිරිපත් කරන ලද සියලුම කරුණු සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරු සක්‍රීය ලෙස සාකච්ඡා කරති. අඛණ්ඩ අධීක්ෂණය පවත්වාගෙන යාම සඳහා, චක්‍රලේඛ යෝජනා භාවිතය සුවිශේෂී අවස්ථාවන්ට පමණක් සීමා කිරීමට බැංකුව පියවර ගන්නා අතර, එවැනි යෝජනා මීළඟ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී විධිමත් ලෙස ස්ථිර කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සෘජු සහභාගීත්වයෙන් පවත්වන ලදී. සෘජුව සහභාගී වීමට නොහැකි ඕනෑම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකුට මාර්ගගත තාක්ෂණය ඔස්සේ (Virtually) රැස්වීම්වලට සහභාගී වීමටත්, සාකච්ඡා සඳහා සක්‍රීයව දායක වීමටත් අවස්ථාව පවතී. සවිස්තරාත්මක පැමිණීමේ වාර්තා සහ රැස්වීම් පැවැත්වූ මුළු වාර ගණන 267 වැනි පිටුවේ දක්වා ඇත.	අනුකූල විය.
1.4	**අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියාපටිපාටි**		
(අ)	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල නිත්‍ය න්‍යාය පත්‍රය සඳහා අධ්‍යක්ෂවරුන් විසින් යෝජනා ඉදිරිපත් කිරීම	අධ්‍යක්ෂවරුන් හට බැංකුවේ ව්‍යාපාරික මෙහෙයුම්, අවදානම් කළමනාකරණ රාමු හෝ සේවක චර්යාධර්මවලට අදාළ න්‍යාය පත්‍රයේ අයිතමයන්, සභාපතිවරයා සමඟ සාකච්ඡා කිරීම මඟින් යෝජනා කළ හැකිය.	අනුකූල විය.
(ආ)	රැස්වීම් නිවේදනය	අධ්‍යක්ෂ මණ්ඩලයට සමාලෝචනය සඳහා ප්‍රමාණවත් කාලයක් ලබා දීම සහතික කරනු වස්, රැස්වීම් නිවේදනය, න්‍යාය පත්‍රය සහ උපකාරක ලිපිලේඛනවලින් බහුතරයක් රැස්වීමට දින හතකට පෙර අධ්‍යක්ෂවරුන් වෙත යොමු කරනු ලැබේ. එමඟින් සවිස්තරාත්මක සූදානමකට ඉඩ සැලසෙන අතර, රැස්වීමට පෙර ඕනෑම හදිසි යෝජනාවක් ඉදිරිපත් කිරීමට ද අවස්ථාව සැලසේ.	අනුකූල විය.

කොටස	ප්‍රතිපත්තිය	අනුකූලතාවය සහ ක්‍රියාත්මක කිරීම	අනුකූලතාවය
(ඇ)	අධ්‍යක්ෂවරුන්ගේ පැමිණීම	අධ්‍යක්ෂවරුන්ගේ පැමිණීම නියාමන විධිවිධානවලට අනුකූලව අධීක්ෂණය කර ඇත. සියලුම අධ්‍යක්ෂවරුන් වසර තුළ පවත්වන ලද රැස්වීම්වලින් අවම වශයෙන් තුනෙන් දෙකක (2/3) ප්‍රමාණයකට සහභාගී වී ඇති අතර, කිසිදු අධ්‍යක්ෂවරයෙකු අඛණ්ඩව රැස්වීම් තුනකට වඩා නොපැමිණ සිට නැත. වැඩිදුර තොරතුරු සඳහා 267 වැනි පිටුවේ ඇති “නිත්‍ය අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වීම” යන කොටස බලන්න.	අනුකූල විය.
1.5	**සමාගම් ලේකම්වරයෙකු පත් කිරීම**		
(අ)	සමාගම් ලේකම්වරයා පත් කිරීම සහ වගකීම් නියම කිරීම	අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා 1988 අංක 30 දරන බැංකු පනතේ 43 වැනි වගන්තියේ විධිවිධාන සපුරාලන නීතිඥවරයෙක් වේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ශ්‍යාමා විජේකෝන් මිය, අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් ශ්‍රේණියට පත් කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයගේ වගකීම් රැකියා විස්තරයෙහි (Job Description) අර්ථ දක්වා ඇත.	අනුකූල විය.
(ආ)	සමාගම් ලේකම්වරයාගේ කාර්යභාරය සහ ඔහු/ඇය වෙත ප්‍රවේශය	අධ්‍යක්ෂ මණ්ඩලයේ කටයුතු සහ අදාළ නියාමන බැඳීම් ඵලදායී ලෙස ඉටු වන බව සහතික කරමින්, උසස් ආයතනික පාලන ප්‍රමිතීන් පවත්වාගෙන යාම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරිය වෘත්තීය උපදෙස් සහ සහයෝගය ලබා දෙමින් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ට සහාය වේ.	අනුකූල විය.
(ඇ)	අධ්‍යක්ෂවරුන් සඳහා වන අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.	අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරිය, අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා සහ පාලන කමිටුවේ (BNGC) හෝ අධ්‍යක්ෂ මණ්ඩලයේ නිර්දේශය මත පුහුණු කිරීම්, කුසලතා වර්ධනය සහ වෘත්තීය සංවර්ධන වැඩසටහන් සඳහා පහසුකම් සලසයි. මෙම වැඩසටහන් මඟින්, අධ්‍යක්ෂවරුන් විකාශනය වන ආයතනික පාලන ප්‍රමිතීන් සහ ක්ෂේත්‍රයේ නව ප්‍රවණතා පිළිබඳව නිරන්තරයෙන් දැනුවත් වන අතරම, ඔවුන්ගේ වගකීම් ඵලදායී ලෙස ඉටු කිරීමට අවශ්‍ය පූර්ණ සුදානම සහතික කෙරේ.	අනුකූල විය.
(ඈ)	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා පවත්වාගෙන යාම සහ පරීක්ෂා කිරීම	අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරිය සියලුම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල වාර්තා සකස් කර පවත්වාගෙන යනු ලබන අතර, ප්‍රධාන විධායක නිලධාරියා සහ සභාපතිවරයාගේ මූලික සමාලෝචනයෙන් පසුව එම වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත බෙදා හරිනු ලැබේ. මෙම රැස්වීම් වාර්තා ඊළඟ රැස්වීමේ දී විධිමත් ලෙස සමාලෝචනය කර අනුමත කරනු ලබන අතර, එහිදී අධ්‍යක්ෂවරුන් විසින් යෝජනා කරනු ලබන යම් සංශෝධන හෝ එකතු කිරීම් තිබේ නම් ඒවා ද ඇතුළත් කරනු ලැබේ. විනිවිදභාවය සහ අඛණ්ඩතාව සහතික කිරීම සඳහා, පසුගිය අධ්‍යක්ෂ මණ්ඩල ලිපිලේඛන සහ වාර්තා අඩංගු සංරක්ෂිත වෙත සුරක්ෂිත ඉලෙක්ට්‍රොනික ප්‍රවේශය අධ්‍යක්ෂවරුන්ට ලබා දී ඇත. තවද, අධ්‍යක්ෂ මණ්ඩලයේ සාකච්ඡා සහ තීරණ සඳහා මෙන්ම නියාමන ආයතනවල පරීශීලනය සඳහා යොමු මූලාශ්‍රයක් ලෙස භාවිත කළ හැකි පරිදි ප්‍රමාණවත් විස්තර සහිතව අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරිය මෙම වාර්තා පවත්වාගෙන යයි.	අනුකූල විය.
1.6	**අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා පවත්වාගෙන යාම**	අධ්‍යක්ෂ මණ්ඩලයේ සාකච්ඡා සඳහා උපයෝගී කරගත් දත්ත සහ තොරතුරුවල සාරාංශයක්, මණ්ඩලය විසින් සලකා බලන ලද කරුණු, කරුණු සොයා බැලීමේ සාකච්ඡා සහ මතභේදාත්මක හෝ විරුද්ධත්වයන් ප්‍රකාශ වූ කරුණු, බැංකුවේ උපායමාර්ග සහ ප්‍රතිපත්ති මෙන්ම අදාළ නීති සහ රෙගුලාසිවලට අනුකූල වීම සම්බන්ධයෙන් අදාළ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ (KMP) සාක්ෂි සහ තහවුරු කිරීම්, බැංකුව මුහුණ දෙන අවදානම් පිළිබඳ කරුණු සහ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ (BIRMC) වාර්තා ඇතුළු අවදානම් කළමනාකරණ ක්‍රියාමාර්ග පිළිබඳ දළ විශ්ලේෂණයක් සහ අධ්‍යක්ෂ මණ්ඩල තීරණ හා යෝජනා සම්මතයන්, අනෙකුත් දේ අතර මෙම රැස්වීම් වාර්තාවලට ඇතුළත් වේ.	අනුකූල විය.
1.7	**ස්වාධීන වෘත්තීය උපදෙස් ලබා ගැනීම**	උචිත අවස්ථාවන්හිදී බැංකුවේ වියදමින් ස්වාධීන වෘත්තීය උපදෙස් ලබා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක වේ. අධ්‍යක්ෂවරුන්ට තම වගකීම් ඉටු කිරීම සඳහා අවශ්‍ය ඕනෑම අවස්ථාවක ස්වාධීන වෘත්තීය උපදෙස් ලබා ගත හැකිය. මෙම ක්‍රියාවලිය සම්බන්ධීකරණය කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරිය සතු වේ.	අනුකූල විය.

කොටස	ප්‍රතිපත්තිය	අනුකූලතාවය සහ ක්‍රියාත්මක කිරීම	අනුකූලතාවය
1.8	**බැඳියා පිළිගැටුම් (Conflict of Interest) කළමනාකරණය කිරීම** **GRI 2-15** (අ) අධ්‍යක්ෂවරුන් අනෙකුත් ආයතන සමඟ සිදුකරන ක්‍රියාකාරකම් සහ ඒවාට දක්වන කැපවීම්වලදී ඇතිවන බැඳියා පිළිගැටුම් (Conflicts of Interest) හෝ එවැනි ගැටුම් ඇතිවීමට ඇති විභව්‍යතාවයන් මගහරවා ගනු ලබයි. (ආ) යම් කරුණක් සම්බන්ධයෙන් තමන්ට හෝ තම සමීපතම ඥාතියෙකුට හෝ තමන් සැලකිය යුතු උනන්දුවක් (Substantial Interest) දක්වන ව්‍යාපාරික ආයතනයකට සම්බන්ධතාවක් පවතින්නේ නම්, එම කරුණ සම්බන්ධ කිසිදු සාකච්ඡාවකට සහභාගී වීමෙන් අධ්‍යක්ෂවරයෙකු වැළකී සිටිය යුතුය. එමෙන්ම, භෞතිකව හෝ විද්‍යුත් ක්‍රමවේද ඔස්සේ එවැනි තොරතුරු ලබා ගැනීම ඇතුළුව, අදාළ කරුණට අදාළ තොරතුරු ලබා ගැනීමට ද ඔහුට හෝ ඇයට අවසර නොලැබේ. (ඇ) අධ්‍යක්ෂවරුන් අතර මෙන්ම, අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරියා සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය අතර පවතින සබඳතා, අධික හිතවත්කමකට, අනිසි බලපෑමකට හෝ බලපෑම් කිරීමකට (බලහත්කාරයකට) හේතු නොවන මට්ටමක පවතින බව අධ්‍යක්ෂවරුන් විසින් සහතික කරනු ලබයි. (ඈ) බැඳියා පිළිගැටුම් (Conflicts of Interests) හඳුනා ගැනීම සහ කළමනාකරණය කිරීම සඳහා වන ප්‍රතිපත්තියක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ යුතු අතර එහි ක්‍රියාත්මක වීම අධීක්ෂණය කළ යුතුය.	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු ප්‍රතිපත්තිය (Related Party Transactions Policy), ඇති විය හැකි බැඳියා පිළිගැටුම් හඳුනා ගැනීම සහ කළමනාකරණය කිරීම පිළිබඳ මගපෙන්වීම් සපයයි. අධ්‍යක්ෂවරුන් තම පත්වීමේදී ද, කාර්තුමය පදනමින් ද, සහ තත්ත්වයන්ගේ යම් වෙනසක් සිදු වූ සැණින් ද තම අවශ්‍යතා/සබඳතා ප්‍රකාශ කළ යුතුය. බැඳියා පිළිගැටුම් පවතින අවස්ථාවලදී අධ්‍යක්ෂවරුන් පහත සඳහන් දෑ අනුගමනය කරති: • අදාළ න්‍යාය පත්‍රයේ කරුණ සාකච්ඡා කරන කාලසීමාව තුළ රැස්වීමෙන් ඉවත් වීම. • සියලුම සාකච්ඡා, අදහස් ප්‍රකාශ කිරීම් සහ තීරණ ගැනීමේ ක්‍රියාවලියෙන් වැළකී සිටීම. • ගණපූරණය (Quorum) තීරණය කිරීමේ ගණනය කිරීම්වලින බැහැර කිරීම. • අදාළ ගනුදෙනුව සම්බන්ධ තොරතුරු භෞතිකව හෝ විද්‍යුත් ක්‍රමවේද මගින් ලබා නොගැනීම. අධ්‍යක්ෂවරුන් අතර මෙන්ම ප්‍රධාන විධායක නිලධාරියා සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය (KMP) අතර පවතින සබඳතා, අධික හිතවත්කමකට, අනිසි බලපෑමකට හෝ බලපෑම් කිරීමට හේතු නොවන මට්ටමක පවතින බව අධ්‍යක්ෂවරුන් විසින් සහතික කරනු ලබයි. අධ්‍යක්ෂවරුන් දරන බාහිර තනතුරු පිළිබඳ තොරතුරු 38-43 පිටුවල ඇති ඔවුන්ගේ පැතිකඩෙහි (Profiles) ඇතුළත් වේ. බැංකුව මේ වන විට බැඳියා පිළිගැටුම් පිළිබඳ ප්‍රතිපත්තියක් සකස් කරමින් පවතී.	අනුකූල විය.
1.9	**මූල්‍ය අර්බුදකාරී අවස්ථාවන්හි දී බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා දැනුවත් කිරීමේ වගකීම**	බැංකුව ස්ථාවර මූල්‍ය මට්ටමක (Solvent) පවතින අතර එහි මූල්‍ය තත්ත්වයට විල්ල වූ කිසිදු තර්ජනයකට මුහුණ දී නොමැත. යම් හෙයකින් සිදුවිය හැකි බංකොලොත්භාවයක් හෝ තැන්පත්කරුවන්ට සහ අනෙකුත් ණයහිමියන්ට ගෙවීම් අත්හිටුවීමක් සම්බන්ධයෙන් යම් තීරණයක් ගැනීමට පෙර, ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා ඒ පිළිබඳව දැනුවත් කිරීම සහතික කිරීම සඳහා විධිමත් ක්‍රියා පටිපාටියක් ස්ථාපිත කර ඇත.	අනුකූල විය.
1.10	**ව්‍යවස්ථාපිත ප්‍රාග්ධන මට්ටම් පවත්වාගෙන යාම**	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුවේ ප්‍රාග්ධන තත්ත්වය, නියාමන මිනුම්දඬු (Regulatory benchmarks) සහ අභ්‍යන්තර අවදානම් සීමාවන්ට සාපේක්ෂව ක්‍රියාකාරීව ඇගයීමට ලක් කරනු ලබයි. වසර තුළදී බැංකුව සියලුම අවම ප්‍රාග්ධන ප්‍රමාණාත්මක ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කර ඇත. කළමනාකාරිත්වය විසින් මාසික මූල්‍ය ක්‍රියාකාරිත්ව සමාලෝචනය (Finance Performance Review) මගින් බැංකුවේ ප්‍රාග්ධන තත්ත්වය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලබයි. 2016 අංක 1 දරන බැංකු පනතේ විධිවිධාන යටතේ අවශ්‍ය කෙරෙන සවිස්තරාත්මක බේසල් III (Basel III) ස්ථම්භ 3 (Pillar 3) අනාවරණයන්, 448-466 පිටුවල 2 වන ඇමුණුමෙහි දක්වා ඇත.	අනුකූල විය.

කොටස	ප්‍රතිපත්තිය	අනුකූලතාවය සහ ක්‍රියාත්මක කිරීම	අනුකූලතාවය
1.11	**වාර්ෂික ආයතනික පාලන වාර්තාව ප්‍රකාශයට පත් කිරීම**	බැංකුවේ වාර්ෂික ආයතනික පාලන වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ 260 සිට 309 දක්වා පිටුවල ඇතුළත් කර ඇත.	අනුකූල විය.
2.	**අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය සහ විවිධත්වය**	අධ්‍යක්ෂ මණ්ඩලය ස්වාධීන අධ්‍යක්ෂවරුන් 7 දෙනෙකු ඇතුළුව අධ්‍යක්ෂවරුන් 12 දෙනෙකුගෙන් සමන්විත වන අතර, එමඟින් ඉහළ මට්ටමේ ස්වාධීනත්වයක් සහ බැංකුවේ අභිලාෂයන් සමඟ කැපවීමෙන් යුතුව කටයුතු කිරීම සහතික කෙරේ. විවිධ විෂය පථයන්, ස්ත්‍රී පුරුෂ භාවය සහ වෘත්තීය පසුබිම්වලින් සැදුම්ලත් අධ්‍යක්ෂ මණ්ඩලයේ විවිධත්වය, අත්දැකීම් සහ තීක්ෂ්ණ බුද්ධියෙහි ශක්තිමත් සංකලනයක් සහතික කරයි. එක් එක් අධ්‍යක්ෂවරයා විවිධ වෘත්තීය ක්ෂේත්‍රයන් ඔස්සේ සතු කර ගෙන ඇති ප්‍රවීණත්වය, ආයතනික කළමනාකාරිත්වය (Corporate Management) වෙත සාධනීය අභියෝගයන් එල්ල කරන සංස්කෘතියක් පෝෂණය කිරීමටත්, සංකීර්ණ හා ගතික කරුණු සම්බන්ධයෙන් සිදුකරන සාකච්ඡා වඩාත් අර්ථවත් කිරීමටත් දායක වේ. බැංකු හා මූල්‍ය, ගිණුම්කරණය, ව්‍යාපාර පරිපාලනය/කළමනාකරණය, ඉංජිනේරු විද්‍යාව සහ මානව විද්‍යාව ඇතුළු විෂය පථයන් කිහිපයක් ඔස්සේ විශේෂඥ දැනුම ඒකාබද්ධ කරමින්, විවිධත්වය කෙරෙහි බැංකුව දක්වන කැපවීම අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් නවදුරටත් විදහා දක්වයි. වැඩිදුර තොරතුරු සඳහා 263 වන පිටුවේ ඇති 2025 දෙසැම්බර් 31 දිනට "සාමූහික කුසලතා" (Collective Skills) බලන්න.	අනුකූල විය.
2.1	**අධ්‍යක්ෂවරුන් පත් කිරීමේ ක්‍රියා පටිපාටිය**	1961 අංක 29 දරන මහජන බැංකු පනත අනුව මුදල් අමාත්‍යාංශය භාර අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩල පත්වීම් සිදු කරනු ලබයි. ස්වාධීන අධ්‍යක්ෂවරුන් පත් කරනු ලබන්නේ 2024 අප්‍රේල් 5 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයේ 3.8 වගන්තිය – 1 වන ඇමුණුම අනුව පත් කරන ලද විශේෂ තේරීම් කමිටුවේ නිර්දේශයට අනුකූලවය. බැංකුවේ කිසිදු අධ්‍යක්ෂවරයෙකු හෝ සේවකයෙකු වෙනත් බැංකුවක හෝ එහි අනුබද්ධ හෝ ආශ්‍රිත සමාගමක තනතුරකට පත් කර නොමැත.	අනුකූල විය.
2.2	**අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව** (i) අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව 7කට නොඅඩු සහ 13කට නොවැඩි විය යුතුය. අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව බැංකුවේ මෙහෙයුම්වල විශාලත්වය, පරිමාණය, විවිධත්වය සහ සංකීර්ණත්වයට අනුරූප විය යුතුය. (ii) 2025 දෙසැම්බර් 31 දින වන විට අධ්‍යක්ෂ මණ්ඩලයේ අවම වශයෙන් එක් කාන්තා නියෝජිතවරියක සිටිය යුතු අතර, සාමාජිකයින් 10කට වඩා වැඩි සංඛ්‍යාවකින් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලවල 2026 දෙසැම්බර් 31 වන විට අවම වශයෙන් කාන්තා නියෝජිතවරියන් දෙදෙනෙකු සිටිය යුතුය.	2025 සැප්තැම්බර් 17 සිට 2025 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ අධ්‍යක්ෂ මණ්ඩලය අධ්‍යක්ෂවරුන් හත් (7) දෙනෙකුට නොඅඩු සංඛ්‍යාවකින් සමන්විත වූ අතර, 2025 ජනවාරි 1 සිට 2025 සැප්තැම්බර් 16 දක්වා කාලය තුළ අධ්‍යක්ෂ මණ්ඩලය අධ්‍යක්ෂවරුන් පස් (5) දෙනෙකුගෙන් සමන්විත විය. 2025 දෙසැම්බර් 31 දින වන විට අධ්‍යක්ෂ මණ්ඩලය සතුව කාන්තා අධ්‍යක්ෂවරියන් දෙදෙනෙකු (2) සිටී. ● ජී ඒ එම් එඩ්වර්ඩ්ස් මිය ● සී එච් ඩී අබේගුණවර්ධන මිය	අර්ධ වශයෙන් අනුකූල වී ඇත.
2.3	**විධායක අධ්‍යක්ෂවරුන්**	අධ්‍යක්ෂ මණ්ඩලය තුළ විධායක අධ්‍යක්ෂවරුන් නොමැත.	අනුකූල විය.
2.4	**විධායක නොවන අධ්‍යක්ෂවරුන්**	විධායක නොවන අධ්‍යක්ෂවරුන් යනු බැංකුවේ උපායමාර්ගික කරුණු, කාර්ය සාධනය සහ සම්පත් කළමනාකරණය පිළිබඳ ස්වාධීන තීරණ ගැනීමට මෙන්ම බැංකුවේ තිරසාරභාවය සඳහා දායක වීමට අවශ්‍ය විශේෂඥ දැනුම සහ මනාව තහවුරු කරන ලද වෘත්තිමය ඉතිහාසයක් සහිත පළපුරුදු වෘත්තිකයෝ වෙති.	අනුකූල විය.

කොටස	ප්‍රතිපත්තිය	අනුකූලතාවය සහ ක්‍රියාත්මක කිරීම	අනුකූලතාවය
2.5	**ස්වාධීන අධ්‍යක්ෂවරුන්**	අධ්‍යක්ෂ මණ්ඩලය ස්වාධීන/විධායක නොවන අධ්‍යක්ෂවරුන් හත් (7) දෙනෙකුගෙන් සමන්විත වන අතර, එය මුළු සාමාජික සංඛ්‍යාවෙන් බහුතරයකි. 2025 සැප්තැම්බර් 16 දින දක්වා අධ්‍යක්ෂ මණ්ඩලය එක් ස්වාධීන අධ්‍යක්ෂවරයෙකුගෙන් පමණක් සමන්විත වූ අතර, 2025 සැප්තැම්බර් 16 දිනෙන් පසුව ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් හත් දෙනෙකු අධ්‍යක්ෂ මණ්ඩලයට ඇතුළත් කරන ලදී. 2025 වර්ෂය තුළ සේවය කළ ස්වාධීන අධ්‍යක්ෂවරුන් මෙසේය: ● සී එස් ගුණියංගොඩ මයා (ස්වාධීන/විධායක නොවන) ● ජ ඒ එම් එඩිවර්ඩිස් මිය (ස්වාධීන/විධායක නොවන) ● එස් එම් එස් සංජය බණ්ඩාර මයා (ස්වාධීන/විධායක නොවන) ● ඩී පී ලොකුආරච්චි මයා (ස්වාධීන/විධායක නොවන) ● එන් එස් බී වල්ගම්පාය මයා (ස්වාධීන/විධායක නොවන) ● එම් එච් එස් ගවුස් මයා (ස්වාධීන/විධායක නොවන) ● සී එච් ඩී අබේගුණවර්ධන මිය (ස්වාධීන/විධායක නොවන)	
(අ)	ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ (INEDs) සංයුතිය	අධ්‍යක්ෂ මණ්ඩලය ස්වාධීන/විධායක නොවන අධ්‍යක්ෂවරුන් හත් (7) දෙනෙකුගෙන් සමන්විත වන අතර, එය මුළු අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවෙන් බහුතරයකි.	අර්ධ වශයෙන් අනුකූල වී ඇත.
(ආ)	ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් (INED) තීරණය කිරීමේ නිර්ණායක (i) සිට (ix) තෙක්	විධායක නොවන අධ්‍යක්ෂවරුන් නියාමකයා විසින් නියම කරන ලද ස්වාධීනත්වයේ නිර්ණායක සාර්ථකව සපුරා ඇත. ● මහාචාර්ය පී එන් ඩී ප්‍රනාන්දු මහතා ● කේ ඒ විමලේන්තිරරාජා මහතා ● එම් ජේ තිලකරත්න මහතා ඉහත සඳහන් අමාත්‍යාංශ නියෝජිතයින් හැර මෙම නියාමන ප්‍රමිතීන්ට අඛණ්ඩව අනුකූල වන බව සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එක් එක් විධායක නොවන අධ්‍යක්ෂවරයා පිළිබඳ වාර්ෂික ඇගයීමක් සිදු කරනු ලබයි.	අනුකූල විය.
(ඇ)	ආයතනික සන්නිවේදනයන්හි දී ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් (INED) හඳුනා ගැනීම සහ අධ්‍යක්ෂවරුන්ගේ කාණ්ඩ හෙළිදරව් කිරීම.	බැංකු අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් ලැයිස්තුගත කර ඇති බැංකුවේ වෙබ් අඩවිය ඇතුළු සියලුම ආයතනික සන්නිවේදනයන්හි දී, ස්වාධීන/විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ තත්ත්වය බැංකුව විසින් පැහැදිලිව ප්‍රකාශ කරනු ලබයි. විධායක, විධායක නොවන සහ ස්වාධීනත්වය යන තත්ත්වයන් අනුව වර්ගීකරණය කරන ලද අධ්‍යක්ෂ මණ්ඩල සංයුතිය පිළිබඳ සවිස්තරාත්මක විග්‍රහයක් 271 වන පිටුවේ දක්වා ඇත.	අනුකූල විය.
2.6	ස්වාධීන මණ්ඩල සාමාජිකයන් නියෝජනය කිරීම සඳහා විකල්ප අධ්‍යක්ෂවරුන් නම් කිරීමේ ක්‍රියා පටිපාටිය.	මහජන බැංකු පනතේ අතිරේක අධ්‍යක්ෂවරුන් පත් කිරීම සඳහා වූ විධිවිධාන නොමැති අතර, 2025 වර්ෂය තුළ එවැනි තත්ත්වයක් උද්ගත නොවීය.	අනුකූල විය.
2.7	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා වන ගණපූරණය සහ සංයුතිය පිළිබඳ අවශ්‍යතා.	2025 මූල්‍ය වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ සහභාගිත්වයට අනුව, සියලුම මණ්ඩල රැස්වීම්වලදී අවශ්‍ය ගණපූරණය සපුරා ඇත.	අනුකූල විය.
3.	**අධ්‍යක්ෂවරුන්ගේ සුදුසුකම් ඇගයීමේ නිර්ණායක**		
3.1	**සුදුසු සහ යෝග්‍ය බව ඇගයීමේ නිර්ණායක**	බැංකුව සියලුම අධ්‍යක්ෂ මණ්ඩල පත්වීම් සම්බන්ධයෙන් 1988 අංක 30 දරන බැංකු පනතේ (සංශෝධිත) 42 වන වගන්තියට පූර්ණ අනුකූලතාවයක් පවත්වාගෙන යනු ලබයි. තවද, මුදල් අමාත්‍යාංශය විසින් පත් කරනු ලැබීමෙන් අනතුරුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයාගේ අනුමැතිය ලබා ගැනීම මගින් එක් එක් අධ්‍යක්ෂවරයාගේ සුදුසු සහ යෝග්‍ය බව බැංකුව විසින් සහතික කරනු ලබයි.	අනුකූල විය.
3.2	**අධ්‍යක්ෂවරුන්ගේ සුදුසුකම් සඳහා වන අතිරේක අවශ්‍යතා.**		
(අ)	අධ්‍යක්ෂවරයෙකුගේ වයස අවුරුදු 70 නොඉක්මවිය යුතුය.	වයස අවුරුදු 70 ඉක්මවූ කිසිදු අධ්‍යක්ෂවරයෙකු පත් කර නොමැත.	අනුකූල විය.
(ආ)	විධායක නොවන අධ්‍යක්ෂවරුන් සඳහා ධුර කාල සීමාවන්.	අධ්‍යක්ෂ මණ්ඩලයේ කිසිදු අධ්‍යක්ෂවරයෙකු වසර නවයක සේවා කාලය ඉක්මවා නොමැත.	අනුකූල විය.

කොටස	ප්‍රතිපත්තිය	අනුකූලතාවය සහ ක්‍රියාත්මක කිරීම	අනුකූලතාවය
(ඇ)	අධ්‍යක්ෂවරුන්, බැංකුවේ අනුබද්ධ හෝ ආශ්‍රිත සමාගම් ද ඇතුළුව සමාගම්/ආයතන/සංවිධාන 20කට වඩා වැඩි සංඛ්‍යාවක අධ්‍යක්ෂ ධුර දැරිය යුතු නොවේ.	බැංකුවේ අනුබද්ධ හෝ ආශ්‍රිත සමාගම් ද ඇතුළුව, කිසිදු අධ්‍යක්ෂවරයෙකු සමාගම්/ආයතන/සංවිධාන 20කට වඩා වැඩි සංඛ්‍යාවක අධ්‍යක්ෂ ධුර දරනු නොලබයි. අධ්‍යක්ෂ ධුර පිළිබඳ විස්තර 38-43 පිටුවල "අධ්‍යක්ෂ මණ්ඩලය සහ පැතිකඩ" යටතේ දක්වා ඇත.	අනුකූල විය.
(ඈ)	අධ්‍යක්ෂවරුන්ගේ කැපවීම සහ කාලය වෙන් කිරීම.	සියලුම අධ්‍යක්ෂවරුන් තමන් වෙත පැවරී ඇති වගකීම් ඉටු කිරීම සඳහා ප්‍රමාණවත් කාලයක් කැප කරමින්, තම කාර්යභාරය සම්බන්ධයෙන් දැඩි කැපවීමක් පෙන්නුම් කර ඇත.	අනුකූල විය.
3.3	**බැංකු අධ්‍යක්ෂවරුන් සහ ප්‍රධාන විධායක නිලධාරීන් පත් කිරීමේ විවේක කාලසීමාව** (Cooling Off period)	2025 වර්ෂය තුළ කිසිදු අධ්‍යක්ෂවරයෙකු ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන වෙනත් බලපත්‍රලාභී වාණිජ බැංකුවක (LCB) අධ්‍යක්ෂවරයෙකු හෝ ප්‍රධාන විධායක නිලධාරියෙකු ලෙස පත් වී නොමැත.	අනුකූල විය.
4.	**කාර්යභාර බෙදා වෙන් කිරීම**		
4.1	**වගකීම් බෙදා වෙන් කිරීම**	මහජන බැංකු පනතේ 32 වන වගන්තිය මගින් අධ්‍යක්ෂ මණ්ඩලයේ බලතල බැංකුවේ ඕනෑම නිලධාරියෙකු වෙත පැවරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට බලය ලබා දී ඇති අතර, අවස්ථාවෝචිත පරිදි එම බලතල සම්පූර්ණයෙන්ම හෝ කොටසක් වශයෙන් අවලංගු කිරීමට ද මණ්ඩලයට හැකියාව ඇත.	අනුකූල විය.
4.2	**අධ්‍යක්ෂ මණ්ඩල අධීක්ෂණය සහ වෙන් කර ඇති බලතල**	සියලුම ප්‍රධාන උපායමාර්ගික තීරණ අධ්‍යක්ෂ මණ්ඩලයේ සෘජු පාලනයට සහ අධීක්ෂණයට යටත් වන බව සහතික කිරීම සඳහා, මණ්ඩලය විසින් වෙන් කර ඇති කරුණු පිළිබඳ විධිමත් උපලේඛනයක් (formal schedule of reserved matters) භාවිතා කරනු ලබයි.	අනුකූල විය.
4.3	**බලතල පැවරීමේ සීමාවන්**	අධ්‍යක්ෂ මණ්ඩලය සහ අනෙකුත් ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් (KMP) වෙත බලතල පැවරීම ව්‍යුහගත කර ඇත්තේ, අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්වාධීන විනිශ්චය සහ උපායමාර්ගික අධීක්ෂණ ධාරිතාවයට බාධාවක් නොවන අයුරිනි.	අනුකූල විය.
4.4	**බලතල පැවරීමේ ක්‍රියාවලිය සමාලෝචනය කිරීම**	පවරා ඇති බලතල බැංකුවේ අවශ්‍යතාවන්ට අනුකූලව පවතින්නේ ද යන්න සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වරින් වර සමාලෝචනය කරනු ලබයි. මීට අමතරව, ණය අනුමත කිරීමේ ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා, පවරා ඇති ණය බලතල (DCA) සීමාවන් වර්තමාන ආර්ථික සන්දර්භයට අනුකූලව සංශෝධනය කර ඇත.	අනුකූල විය.
5.	**සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී**		
5.1	**සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී අතර වගකීම් බෙදා හැරීම**	සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී යන තනතුරු සඳහා පුද්ගලයන් දෙදෙනෙකු පත් කිරීම මගින් එම භූමිකාවන් අතර පැහැදිලි වෙනසක් පවත්වාගෙන යනු ලබයි. මෙම වගකීම් වෙන් කිරීම හරහා බලය සහ අධිකාරිය අතර සමබරතාවයක් සහතික කෙරෙන අතර, එමගින් කිසිදු තනි පුද්ගලයෙකුට අසීමිත තීරණ ගැනීමේ බලයක් හිමි නොවේ.	අනුකූල විය.
5.2	**සභාපතිවරයාගේ යෝග්‍යතාව**	අමාත්‍ය මණ්ඩල සංදේශයේ 2.3 වගන්තියට අනුව, අලුතින් පත් කරන ලද සභාපතිවරයාට සිය වසර තුනක සම්පූර්ණ ධුර කාලය සභාපති ලෙස කටයුතු කළ හැකිය. කෙසේ වෙතත්, සභාපතිවරයා ස්වාධීන නොවන අධ්‍යක්ෂවරයෙකු බැවින්, 2024 අංක 5 දරන බැංකු පනතේ නියෝගවල 5.2 වගන්තියට අනුකූලව ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු (සී එස් ගුණියංගොඩ මහතා) පත් කර ඇත.	
5.3	**සභාපතිවරයාගේ වගකීම්**		
(අ)		අධ්‍යක්ෂ මණ්ඩලය ආයතනික පාලනයේ ඉහළම ප්‍රමිතීන් පවත්වාගෙන යාමට කැපවී සිටී. එම කැපවීමේ කේන්ද්‍රීය සාධකය වනුයේ සභාපතිවරයාගේ කාර්යභාරය වන අතර, ඔහුගේ මූලික වගකීම වන්නේ අධ්‍යක්ෂ මණ්ඩලයට නායකත්වය ලබා දීම සහ එහි සමස්ත ඵලදායීතාවය සහතික කිරීමයි. සභාපතිවරයා ආයතනික පාලන රාමුවට (Governance Framework) අනුකූලව සිය රාජකාරි ඉටු කර ඇත.	අනුකූල විය.
(ආ)		සභාපතිවරයා විසින් උපායමාර්ගික නායකත්වය ලබා දුන් අතර, අධ්‍යක්ෂ මණ්ඩලය සිය වගකීම් ඵලදායී ලෙස ඉටු කරන බවත්, මණ්ඩලයේ අධීක්ෂණය සහ විධායක කළමනාකාරිත්වය අතර පැහැදිලි වෙනසක් පවත්වාගෙන යන බවත් සහතික කරන ලදී. තවද, සියලුම වැදගත් කරුණු පිළිබඳව නියමිත වේලාවට සාකච්ඡා කිරීම සභාපතිවරයා විසින් තහවුරු කරන ලදී.	අනුකූල විය.

කොටස	ප්‍රතිපත්තිය	අනුකූලනාවය සහ ක්‍රියාත්මක කිරීම	අනුකූලතාවය
(ඇ)		සියලුම රැස්වීම් න්‍යාය පත්‍ර සෙසු අධ්‍යක්ෂවරුන්ගේ අදහස් ද ඇතුළත් කරමින් සභාපතිවරයා විසින් පෞද්ගලිකවම අනුමත කරන ලදී. තවද, දැනුවත් තීරණ ගැනීම සඳහා පහසු වන පරිදි සවිස්තරාත්මක තොරතුරු වාර්තා (briefing papers) නියමිත වේලාවට බෙදා හැරීම සභාපතිවරයා විසින් සහතික කරන ලදී.	අනුකූල විය.
(ඈ)		රැස්වීමට දින හතකට පෙර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ප්‍රමාණවත් තොරතුරු ලැබෙන බව සහතික කරන ලදී. මණ්ඩල සාකච්ඡා සඳහා ස්වාධීන දෘෂ්ටිකෝණයන් ඇතුළත් කර ගැනීම තහවුරු කිරීම සඳහා සභාපතිවරයා විසින් අධ්‍යක්ෂවරුන්ගේ දායකත්වය සුවිශේෂී ලෙස දිරිමත් කරන ලදී.	අනුකූල විය.
(ඉ)		අධ්‍යක්ෂවරු මණ්ඩල රැස්වීම්වල සාකච්ඡා සඳහා ක්‍රියාකාරිව දායක වන අතර, බැංකුවේ උපරිම යහපත උදෙසා තීරණ ක්‍රියාත්මක කරති.	අනුකූල විය.
(ඊ)		අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලුම අධ්‍යක්ෂවරුන් විධායක නොවන අධ්‍යක්ෂවරුන් වන අතර, ඔවුහු මණ්ඩල රැස්වීම්වල දී හරවත් සාකච්ඡා සිදුවන බව සහතික කරති.	අනුකූල විය.
(උ)		සභාපතිවරයා විසින් විවේචනාත්මක සහ හරවත් විවාදයන් දිරිමත් කරන ලදී. තීරණ ගැනීමේ ක්‍රියාවලිය තුළදී විරුද්ධ අදහස් කිසිදු පූර්ව විනිශ්චයකින් තොරව නිදහසේ ප්‍රකාශ වූ බවත් ඒවා වාර්තාගත කළ බවත් මෙයින් තහවුරු කෙරේ.	අනුකූල විය.
(ඌ)		සභාපතිවරයා ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් (KMP) අධීක්ෂණය කිරීමේ කටයුතු හෝ වෙනත් කිසිදු විධායක රාජකාරියක සෘජුවම නිරත නොවේ.	අනුකූල විය.
(එ)		බැංකුවේ ප්‍රධාන කොටස් හිමිකාරිත්වය වන ශ්‍රී ලංකා රජය සමඟ අධ්‍යක්ෂ මණ්ඩලය ඵලදායී සන්නිවේදනයක් පවත්වාගෙන යනු ලබයි.	අනුකූල විය.
5.4	**ප්‍රධාන විධායක නිලධාරියාගේ කාර්‍යය භාරය**		
(අ)		ප්‍රධාන විධායක නිලධාරි/සාමාන්‍යාධිකාරිවරයා යනු බැංකුවේ මෙහෙයුම් සහ ව්‍යාපාරික කටයුතුවල දෛනික කළමනාකරණය භාරව සිටින ඉහළම විධායක නිලධාරියා වේ.	අනුකූල විය.
(ආ)		ප්‍රධාන විධායක නිලධාරි/සාමාන්‍යාධිකාරිවරයා වෙනත් කිසිදු බලපත්‍රලාභී බැංකුවක හෝ බාහිර ආයතනයක සේවකයෙකු හෝ අධ්‍යක්ෂවරයෙකු නොවේ.	
(ඇ)		ක්ෂේත්‍රයට අදාළ පත්වීම් හෝ බැංකුවේ අනුබද්ධිත (Subsidiaries) හෝ ආශ්‍රිත (Associate) සමාගම්වල විධායක නොවන අධ්‍යක්ෂ ධුරයන් හැර, ප්‍රධාන විධායක නිලධාරියා වෙනත් කිසිදු බලපත්‍රලාභී බැංකුවක හෝ වෙනත් ආයතනයක සේවකයෙකු හෝ අධ්‍යක්ෂවරයෙකු ලෙස තනතුරු දරනු නොලැබේ.	
5.5	**ප්‍රධාන විධායක නිලධාරිවරයාගේ යෝග්‍යතාව**	(සංශෝධිත) 1988 අංක 30 දරන බැංකු පනතේ 44අ වගන්තියට අනුකූලව, බැංකුවේ මෙහෙයුම් කටයුතුවල පරිමාණය, විවිධත්වය සහ සංකීර්ණත්වය සැලකිල්ලට ගනිමින්; ප්‍රධාන විධායක නිලධාරියාගේ අධිකාරිය, තත්ත්වය, දැනුම සහ නිපුණතාව යන අංශයන්හි යෝග්‍යතාවය සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය දැඩි ක්‍රියාවලියක් අනුගමනය කරනු ලබයි.	අනුකූල විය.
6.1	**අධ්‍යක්ෂ මණ්ඩල කමිටු සඳහා වන අවශ්‍යතා**		අනුකූල විය.
(අ)	සෑම කමිටුවක්ම සෘජුවම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කළ යුතුය.	බැංකුව විසින් BAC (අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව), BHRRC (අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව), BNGC (අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා සහ ආයතනික පාලන කමිටුව), BIRMC (අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව) සහ RPTRC (සම්බන්ධිත පාර්ශවීය ගනුදෙනු විමර්ශන කමිටුව) යන අනිවාර්ය අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු සභා 5 ක් පවත්වාගෙන යනු ලබයි. එක් එක් කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඇගයීමට ලක් කරන ලදී.	
(ආ)	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එක් එක් කමිටුව සතු අධිකාරිය තීරණය කළ යුතු අතර, විශේෂයෙන්ම එම කමිටුවට මණ්ඩලය වෙනුවෙන් ක්‍රියා කිරීමට බලය තිබේද නැතහොත් කිසියම් නිශ්චිත කරුණක් සම්බන්ධයෙන් පරීක්ෂා කර බලා නිර්දේශ සහිතව මණ්ඩලය වෙත වාර්තා කිරීමට පමණක් බලය තිබේද යන්න එහිදී පැහැදිලිව සඳහන් කළ යුතුය.	එක් එක් කමිටුව සතු අධිකාරී බලය සහ විෂය පථය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කර ඇති අතර, අදාළ කරුණු පරීක්ෂා කර බලා නිර්දේශ සහිතව මණ්ඩලය වෙත වාර්තා කිරීම එම කමිටු මගින් සිදු කෙරේ.	
(ඇ)	සෑම කමිටුවක් සඳහාම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද යොමු කොන්දේසි (Terms of Reference) තිබිය යුතුය.	සෑම කමිටුවක් සඳහාම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද යොමු කොන්දේසි (Terms of Reference) පවතින අතර, නියාමන අවශ්‍යතාවලට අනුකූල වීම සහතික කිරීම පිණිස ඒවා වරින් වර සමාලෝචනය කරනු ලැබේ.	

කොටස	ප්‍රතිපත්තිය	අනුකූලතාවය සහ ක්‍රියාත්මක කිරීම	අනුකූලතාවය
(ඈ)	අදාළ කමිටු සභාපතිවරුන්ගේ අධීක්ෂණය යටතේ රැස්වීම් සංවිධානය කිරීම සහ ප්‍රමාණවත් තොරතුරු ඇතුළත්ව රැස්වීම් වාර්තා හා ලේඛන පවත්වාගෙන යාම ඇතුළු කාර්යයන් ඉටු කිරීම සඳහා සෑම කමිටුවක් විසින්ම ලේකම්වරයෙකු පත් කළ යුතුය. තවද, සියලුම කමිටුවල රැස්වීම් වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.	සෑම කමිටුවක් සඳහාම රැස්වීම් වාර්තා සහ ලේඛන පවත්වාගෙන යාමේ වගකීම දරන ලේකම්වරයෙකු බැගින් පත් කර ඇත. එම සෑම කමිටුවකම රැස්වීම් වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලුම අනුකමිටුවල ලේකම්වරයා ලෙස අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා කටයුතු කරනු ලබයි.	
(ඉ)	සෑම කමිටුවකම ගණපූරණය සඳහා අවම වශයෙන් එම කමිටු සාමාජිකයින්ගෙන් අඩක සහභාගීත්වය තිබිය යුතුය.	සෑම කමිටුවකම ගණපූරණය, අවම වශයෙන් කමිටු සාමාජිකයින්ගෙන් අඩක සහභාගීත්වය සහිතව එම කමිටුවල යොමු නියමයන් (Terms of Reference) මගින් නියම කර ඇත.	
(ඊ)	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සෑම කමිටුවකම කාර්යසාධනය, රාජකාරී සහ කාර්යභාරයන් පිළිබඳ වාර්තාවක් වාර්ෂික මහා සභා රැස්වීමේ දී ඉදිරිපත් කළ යුතුය.	සෑම කමිටුවකම කාර්යසාධනය වාර්ෂිකව ඇගයීමට ලක් කෙරෙන අතර, එම වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලබයි.	
6.2	**විගණන කමිටුව**		
(අ)	කමිටුවේ සභාපතිවරයා ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු විය යුතු අතර, ඔහු අධ්‍යක්ෂ මණ්ඩලයේ හෝ වෙනත් කිසිදු මණ්ඩල අනුකමිටුවක සභාපතිවරයා නොවිය යුතුය. තවද, පිළිගත් වෘත්තීය ගණකාධිකාරී ආයතනයක සාමාජිකත්වය සහිතව, මූල්‍ය, ගණකාධිකරණය සහ/හෝ විගණනය පිළිබඳ සුදුසුකම් හා පළපුරුද්ද ඔහු සතු විය යුතුය.	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු කමිටුවේ සභාපතිවරයා ලෙස පත් කර ඇති අතර, ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ යාවජීව සාමාජිකයෙකු (Fellow Member) වේ. තවද, ඔහු අධ්‍යක්ෂ මණ්ඩලයේ හෝ වෙනත් කිසිදු අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටුවක සභාපතිත්වය දැරීමක් සිදු නොකරයි.	අනුකූල විය.
(ආ)	කමිටුවේ සියලුම සාමාජිකයින් විධායක නොවන අධ්‍යක්ෂවරුන් විය යුතු අතර, ඉන් බහුතරයක් ස්වාධීන අධ්‍යක්ෂවරුන් විය යුතුය. බැංකුවේ මෙහෙයුම්වල විශාලත්වය, පරිමාණය, විවිධත්වය සහ සංකීර්ණත්වයට අනුරූප වන පරිදි මූල්‍ය, ගණකාධිකරණය සහ විගණනය පිළිබඳ සාමූහික සමබරතාවයකින් යුත් කුසලතා සහ විශේෂඥ දැනුම එම සාමාජිකයින් සතු විය යුතුය.	කමිටුවේ සියලුම සාමාජිකයින් විධායක නොවන සහ ස්වාධීන අධ්‍යක්ෂවරුන් වන අතර, බැංකුවේ මෙහෙයුම්වල විශාලත්වය, පරිමාණය, විවිධත්වය සහ සංකීර්ණත්වයට අනුරූප වන පරිදි මූල්‍ය, ගණකාධිකරණය සහ විගණනය පිළිබඳ වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද ඔවුන් සතු වේ.	අනුකූල විය.
(ඇ)	විගණන කමිටුවේ සාමාජිකයින්ගෙන් බහුතරයක් ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ සාමාජිකයින් නොවිය යුතු අතර, ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ සාමාජිකයින්ගෙන් බහුතරයක් විගණන කමිටුවේ සාමාජිකයින් ද නොවිය යුතුය.	මෙම කමිටුවේ සාමාජිකයින් අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ සාමාජිකයින් ලෙස කටයුතු නොකරන අතර, ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ සාමාජිකයින් ද මෙම කමිටුවේ සාමාජිකයින් ලෙස කටයුතු නොකරයි.	අනුකූල විය.
(ඈ)	පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් කමිටුව විසින් නිර්දේශ ඉදිරිපත් කළ යුතුය:		අනුකූල විය.
	(i) අදාළ ව්‍යවස්ථාපිත විධිවිධානවලට අනුකූලව සැපයිය යුතු විගණන සේවාවන් සඳහා බාහිර විගණකවරයෙකු පත් කිරීම.	මහජන බැංකුව රජයට අයත් බැංකුවක් බැවින්, එහි වාර්ෂික විගණනය ජාතික විගණන කාර්යාලය මගින් හෝ විගණකාධිපතිවරයා විසින් පත් කරනු ලබන ස්වාධීන විගණන ආයතනයක් මගින් සිදු කරනු ලබයි.	
	(ii) බාහිර විගණකවරුන් වෙත කලින් කලට නිකුත් කරනු ලබන මහ බැංකු මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම.	බාහිර විගණකවරුන් වෙත කලින් කලට නිකුත් කරනු ලබන මහ බැංකු මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධ කරුණු පිළිබඳව කමිටුව විසින් නිර්දේශ ඉදිරිපත් කර ඇත.	
	(iii) අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන් අනුගමනය කිරීම.	ගිණුම්කරණ ප්‍රමිතීන්හි සිදු වූ වෙනස්කම් පිළිබඳව කමිටුව සමාලෝචනය කර සාකච්ඡා කර ඇති අතර, බැංකුව විසින් එම සංශෝධිත ප්‍රමිතීන් අනුගමනය කිරීම පිළිබඳව නිතිපතා සමාලෝචනය කරනු ලබයි.	
	(iv) බාහිර විගණකවරයාගේ සේවා කාලය, විගණන ගාස්තු සහ ඕනෑම ඉල්ලා අස්වීමක් හෝ සේවයෙන් ඉවත් කිරීමක් සම්බන්ධ කරුණු; මෙහිදී බාහිර විගණකවරයාගේ සේවා කාලය වසර හයක් නොඉක්මවිය යුතු අතර, සෑම වසර තුනකට වරක්ම අදාළ විගණන හවුල්කරු (Engagement Partner) වෙනස් කළ යුතුය.	සියලුම වාර්ෂික විගණන කටයුතු ශ්‍රී ලංකා ජාතික විගණන කාර්යාලය මගින් සිදු කරනු ලබයි. රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව, විගණකාධිපතිවරයා බැංකුවේ බාහිර විගණකවරයා වේ.	

කොටස	ප්‍රතිපත්තිය	අනුකූලතාවය සහ ක්‍රියාත්මක කිරීම	අනුකූලතාවය
(ඉ)	බාහිර විගණකවරයාගේ ස්වාධීනත්වය, අඛණ්ඩතාව සහ අපක්ෂපාතීත්වය මෙන්ම විගණන ක්‍රියාවලීන්හි ඵලදායීතාවය සමාලෝචනය කිරීම සහ අධීක්ෂණය කිරීම.	බැංකුවේ බාහිර විගණකවරයා වන්නේ විගණකාධිපතිවරයාය.	
(ඊ)	බාහිර විගණකවරයා විසින් විගණන නොවන සේවාවන් සැපයීම	බැංකුවේ විගණකවරයා විගණකාධිපතිවරයා බැවින් මෙය අදාළ නොවේ.	
(උ)	විගණන විෂය පථය තීරණය කිරීම	විගණනය ආරම්භ කිරීමට පෙර, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLAS) අනුකූලව විගණනයේ ස්වභාවය සහ විෂය පථය පිළිබඳව බාහිර විගණකවරුන් සමඟ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු (BAC) රැස්වීමේදී සාකච්ඡා කර අවසන් තීරණවලට එළඹෙන ලදී.	අනුකූල විය.
	(i) ආයතනික පාලනයට අදාළ නියෝගයන්ට බැංකුව අනුකූල වීම සහ මූල්‍ය වාර්තාකරණය කෙරෙහි කළමනාකාරිත්වයේ අභ්‍යන්තර පාලනයන්හි පවත්නා යෝග්‍යතාවය පිළිබඳ තක්සේරුවක්.	ආයතනික පාලනයට අදාළ නියෝගයන්ට බැංකුව අනුකූල වීම සහ මූල්‍ය වාර්තාකරණය කෙරෙහි කළමනාකාරිත්වයේ අභ්‍යන්තර පාලනයන්හි පවත්නා යෝග්‍යතාවය පිළිබඳව පුළුල් තක්සේරුවක් සිදු කර ඇත.	
	(ii) අදාළ ගිණුම්කරණ මූලධර්ම සහ වාර්තාකරණ බැඳීම්වලට අනුකූලව, බාහිර පාර්ශ්වයන්ගේ ප්‍රයෝජනය සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම.	අදාළ ගිණුම්කරණ මූලධර්ම සහ වාර්තාකරණ බැඳීම්වලට අනුකූලව, බාහිර පාර්ශ්වයන්ගේ ප්‍රයෝජනය සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම පිළිබඳව සාකච්ඡා කරන ලදී.	
	(iii) විගණන ආයතන එකකට වඩා වැඩි ගණනක් සම්බන්ධ වන අවස්ථාවලදී එම ආයතන අතර සම්බන්ධීකරණය පවත්වා ගැනීම.	රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන පරිදි, බැංකුවේ බාහිර විගණකවරයා වන්නේ විගණකාධිපතිවරයාය.	
(ඌ)	අභ්‍යන්තර පාලනය සහ මූල්‍ය වාර්තාකරණය පිළිබඳ වාර්තාව	බැංකුවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලියෙහි විනිවිදභාවය සහ අඛණ්ඩතාව සහතික කිරීම සඳහාත්, ගණකාධිකරණ හා අනෙකුත් අභ්‍යන්තර පාලනයන්හි ප්‍රමාණවත්භාවය තහවුරු කිරීම සඳහාත්, කමිටුව විසින් ගණකාධිකරණ ප්‍රතිපත්ති/පද්ධති සහ අභ්‍යන්තර පාලන රාමුව පිළිබඳව පුළුල් සමාලෝචනයන් සිදු කරනු ලබයි.	අනුකූල විය.
(එ)	මූල්‍ය වාර්තාකරණ අධීක්ෂණය	මහජන බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවල විශ්වාසනීයත්වය (Integrity) අධීක්ෂණය කිරීමේ වගකීම කමිටුව සතු වේ. බැංකුවේ කාර්තුමය සහ වාර්ෂික විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන මෙන්ම ප්‍රසිද්ධ කිරීම සඳහා සකස් කරන ලද වාර්තා කමිටුව වෙත ඉදිරිපත් කරන සෑම අවස්ථාවකදීම, බැංකුවේ මූල්‍ය තොරතුරු සමාලෝචනය කිරීම සඳහා විධිමත් ක්‍රියාවලියක් ක්‍රියාත්මක වේ. කමිටුවේ සමාලෝචනය මූලික වශයෙන් පහත සඳහන් අංශ කෙරෙහි අවධානය යොමු කරයි: (i) වාර්තා කර ඇති තොරතුරු කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කරන ඇස්තමේන්තු සහ උපකල්පන තක්සේරු කිරීම. (ii) ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිළිවෙත්වල සිදු වූ යම් වෙනස්වීම් සමාලෝචනය කිරීම. (iii) විගණනය හේතුවෙන් සිදු වූ සැලකිය යුතු ගැලපුම් (Adjustments) ඇගයීමට ලක් කිරීම. (iv) ගිණුම් සකස් කිරීමේදී "ව්‍යාපාරයේ අඛණ්ඩ පැවැත්ම" (Going concern) පිළිබඳ උපකල්පනයෙහි යෝග්‍යතාවය තහවුරු කිරීම. (v) අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන් සහ අනෙකුත් ව්‍යවස්ථාපිත හා නියාමන අවශ්‍යතාවලට අනුකූල වීම සහතික කිරීම.	අනුකූල විය.

කොටස	ප්‍රතිපත්තිය	අනුකූලතාවය සහ ක්‍රියාත්මක කිරීම	අනුකූලතාවය
(ඒ)	අතුරු සහ අවසාන විගණනයන් පිළිබඳව බාහිර විගණකවරයා සමඟ පැවැත්වූ සාකච්ඡා.	කමිටුව විසින් විගණකාධිපතිවරයාගේ නියෝජිතයා සමඟ සාකච්ඡාවක් පවත්වන ලදී.	අනුකූල විය.
(ඕ)	කළමනාකාරිත්ව ලිපිය සහ බැංකුවේ ප්‍රතිචාර සමාලෝචනය කිරීම.	අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව (BAC) විසින් කළමනාකාරිත්ව ලිපිය සහ කළමනාකාරිත්වය විසින් ලබා දෙන ලද ප්‍රතිචාර සමාලෝචනය කරන ලදී. 2024 වර්ෂය සඳහා වූ කළමනාකාරිත්ව ලිපිය අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු රැස්වීමේ දී සාකච්ඡාවට බඳුන් විය.	අනුකූල විය.
(ඕ)	අභ්‍යන්තර විගණන කාර්යභාරය අධීක්ෂණය කිරීම.		අනුකූල විය.
	(i) අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ විෂය පථය, කාර්යභාරයන් සහ සම්පත්වල ප්‍රමාණවත්භාවය සමාලෝචනය කිරීම සහ එම දෙපාර්තමේන්තුවේ කටයුතු කරගෙන යාම සඳහා අවශ්‍ය බලතල පවතින බවට තහවුරු කර ගැනීම.	අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ විෂය පථය සහ කාර්යභාරයන් මෙන්ම 2026 වර්ෂය සඳහා වූ විගණන සැලසුම පිළිබඳව කමිටුව විසින් සාකච්ඡා කරන ලද අතර ඒ සඳහා නිර්දේශ ලබා දෙන ලදී.	
	(ii) අභ්‍යන්තර විගණන වැඩසටහන සහ අභ්‍යන්තර විගණන ක්‍රියාවලියෙහි ප්‍රතිඵල සමාලෝචනය කිරීම සහ අවශ්‍ය අවස්ථාවලදී, අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ නිර්දේශයන මත පදනම්ව නිසි ක්‍රියාමාර්ග ගෙන ඇත බවට සහතික වීම.	2026 වර්ෂය සඳහා වූ විගණන සැලසුම අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව වෙත ඉදිරිපත් කර ඇති අතර, අභ්‍යන්තර විගණනයේ විෂය පථය පිළිබඳව එම කමිටුව විසින් සාකච්ඡා කරන ලදී.	
	(iii) ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයාගේ සහ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ කාර්ය සාධන ඇගයීම් හෝ තක්සේරු කිරීම් සමාලෝචනය කිරීම.	ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයාගේ (CIA) කාර්ය සාධන ඇගයීම අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව (BAC) වෙත ඉදිරිපත් කර ඇති අතර, විගණන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ කාර්ය සාධනය පිළිබඳ සාකච්ඡා අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු රැස්වීම්වල දී පවත්වන ලදී.	
	(iv) ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා, අභ්‍යන්තර විගණන කාර්යභාරයට අදාළ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ බාහිරින් සේවා සපයන්නන් පත් කිරීම හෝ ඔවුන්ගේ සේවය අවසන් කිරීම සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම.	2025 වර්ෂය තුළ දී ප්‍රධානියා හෝ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් පත් කිරීමක් හෝ සේවය අවසන් කිරීමක් සම්බන්ධ කිසිදු කරුණක් ඉදිරිපත් නොවීය. අභ්‍යන්තර විගණකවරයා විසින් බැංකුව වෙත කාර්යක්ෂම ලෙස සහතික කිරීම් (Assurance) සපයන බවට අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව (BAC) සහතික වේ.	
	(v) ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා ඇතුළු අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ සහ බාහිරින් සේවා සපයන්නන්ගේ ඉල්ලා අස්වීම් පිළිබඳව කමිටුව දැනුවත් කරන බවට සහතික වීම සහ එලෙස ඉල්ලා අස්වන ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට හා බාහිර සේවා සපයන්නන්ට ඔවුන්ගේ ඉල්ලා අස්වීමට හේතු ඉදිරිපත් කිරීමට අවස්ථාව සැලසීම.	2025 වර්ෂය තුළදී අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ (IAD) ප්‍රධානියාගේ හෝ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ කිසිදු ඉල්ලා අස්වීමක් සිදු නොවීය.	
	(vi) අභ්‍යන්තර විගණන කාර්යභාරය එය විසින් විගණනය කරනු ලබන ක්‍රියාකාරකම්වලින් ස්වාධීන බව සහතික කිරීම සහ එම කටයුතු අපක්ෂපාතීව, නිපුණත්වයෙන් හා නිසි වෘත්තීය සැලකිල්ලෙන් යුතුව ඉටු කරන බවට සහතික වීම.	බැංකුවේ අභ්‍යන්තර විගණන ප්‍රඥප්තියේ (Internal Audit Charter) විධිවිධානවලට අනුකූලව, අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව සිය විගණන කටයුතු සිදු කිරීමේදී ස්වාධීනව කටයුතු කරන අතර, එම කටයුතු අපක්ෂපාතීව, නිපුණත්වයෙන් හා නිසි වෘත්තීය සැලකිල්ලෙන් යුතුව ඉටු කරනු ලබයි.	
(ක)	අභ්‍යන්තර විමර්ශන	මේ සඳහා කළමනාකාරිත්වය ලබා දී ඇති ප්‍රතිචාර සලකා බලනු ලබන අතර, අවශ්‍ය අවස්ථාවලදී ඒ පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කරනු ලබයි.	අනුකූල විය.
(ග)	අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු (BAC) රැස්වීම්වලට සහභාගී වූවන්	ප්‍රධාන විධායක නිලධාරි/සාමාන්‍යාධිකාරි, ප්‍රධාන අභ්‍යන්තර විගණක, මුදල් ප්‍රධානී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (අවදානම් කළමනාකරණ), නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (අනුකූලතා), වෙනත් ඕනෑම ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය සහ බාහිර විගණකවරුන්ගේ නියෝජිතයෙක් අවස්තානුකූලව කැඳවීම පරිදි රැස්වීම්වලට සහභාගී වෙති.	අනුකූල විය.

කොටස	ප්‍රතිපත්තිය	අනුකූලතාවය සහ ක්‍රියාත්මක කිරීම	අනුකූලතාවය
(ජ)	බලතල, සම්පත් සහ තොරතුරු ලබාගැනීමේ හැකියාව	තම විමර්ශන යොමු නියමයන්ට (Terms of Reference) අදාළ ඕනෑම කරුණක් විමර්ශනය කිරීමේ බලය කමිටුව වෙත පවරා ඇති අතර, ඒ සඳහා අවශ්‍ය සම්පත් සහ තොරතුරු වෙත සෘජුව ප්‍රවේශ වීමේ පූර්ණ අයිතිය ද කමිටුව සතු වේ. තවද, අවශ්‍ය යැයි හැඟී යන අවස්ථාවලදී අදාළ පළපුරුද්ද සහ විශේෂඥ දැනුම සහිත බාහිර ස්වාධීන වෘත්තීය උපදෙස් ලබා ගැනීමට ද කමිටුවට බලය පවරා ඇත.	අනුකූල විය.
(ඣ)	නිතිපතා රැස්වීම්	අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව (BAC) නොවැම්බර් මාසයේදී පිහිටුවන ලද අතර, එතැන් සිට නිත්‍ය රැස්වීම් පවත්වන ලදී.	අනුකූල විය.
(ඤ)	රැස්වීම් වාර්තා පවත්වාගෙන යාම	රැස්වීම් වාර්තා (Minutes) පවත්වාගෙන යාම අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා විසින් සිදු කරනු ලබයි.	අනුකූල විය.
(ඥ)	තොරතුරු හෙළිදරව් කිරීමේ ප්‍රතිපත්තිය (Whistleblowing Policy)		අනුකූල විය.
	(i) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද තොරතුරු හෙළිදරව් කිරීමේ ප්‍රතිපත්තිය (Whistleblowing Policy) ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීම	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද තොරතුරු හෙළිදරව් කිරීමේ ප්‍රතිපත්තිය (Whistleblowing Policy) දැනට ක්‍රියාත්මකව පවතින අතර, එය වරින් වර සමාලෝචනයට ලක් කරනු ලබයි.	
	(ii) එවැනි කරුණු සම්බන්ධයෙන් සාධාරණ සහ ස්වාධීන විමර්ශනයක් පැවැත්වීමටත්, ඒ සඳහා සුදුසු පසුකාලීන ක්‍රියාමාර්ග (Follow-up action) ගැනීමටත් අවශ්‍ය නිසි විධිවිධාන සලසා ඇති බව සහතික කිරීම.	තොරතුරු හෙළිදරව් කරන්නන් (Whistleblowers) ඉදිරිපත් කරන කරුණු සම්බන්ධයෙන් සාධාරණ සහ ස්වාධීන විමර්ශනයක් පවත්වා, ඒ පිළිබඳව සුදුසු පසුකාලීන ක්‍රියාමාර්ග ගැනීම සඳහා වූ විධිමත් ක්‍රියාවලියක් බැංකුව සතුව පවතී	
6.3	**මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව** **GRI 2-19, 20**		
(අ)	කමිටු සභාපති	අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති ධුරය දරනු නොලබන අධ්‍යක්ෂවරයෙකු විසින් මෙම කමිටුවේ මූලාසනය දරනු ලබයි.	අනුකූල විය.
(ආ)	ස්වාධීන අධ්‍යක්ෂවරුන්ගේ දායකත්වය	කමිටුව නියෝජනය කරන අධ්‍යක්ෂවරුන්ගෙන් බහුතරය ස්වාධීන අධ්‍යක්ෂවරුන් ය.	අනුකූල විය.
(ඇ)	අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව (BHRRC) සඳහා ප්‍රධාන විධායක නිලධාරිවරයාගේ/සාමාන්‍යාධිකාරිවරයාගේ සහභාගිත්වය	ප්‍රධාන විධායක නිලධාරිවරයාට/සාමාන්‍යාධිකාරිවරයාට අදාළ කරුණු සාකච්ඡා කෙරෙන අවස්ථාවන්හිදී හැර, සෙසු රැස්වීම් සඳහා ඔහු ආරාධිතයෙකු වශයෙන් සහභාගී වේ.	අනුකූල විය.
(ඈ)	අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරිවරයා සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය සඳහා වූ පාරිශ්‍රමික ප්‍රතිපත්තිය තීරණය කිරීම	අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරියා සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ වැටුප්, දීමනා සහ අනෙකුත් මූල්‍ය ගෙවීම්වලට අදාළ පාරිශ්‍රමික ප්‍රතිපත්තිය කමිටුව විසින් තීරණය කරනු ලබයි. අධ්‍යක්ෂවරුන් සඳහා වූ පාරිශ්‍රමිකයන් තීරණය කරනු ලබන්නේ, රජය සතු ව්‍යවසායයන්ගේ (SOE) අධ්‍යක්ෂ මණ්ඩල පත්කිරීම සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද අංක 1/2020 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු (PED) චක්‍රලේඛයට අනුකූලවය.	අනුකූල විය.
(ඉ)	අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරිවරයා සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය සඳහා අරමුණු සහ ඉලක්කයන් නියම කිරීම.	ප්‍රධාන විධායක නිලධාරිවරයා සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය සඳහා වූ අරමුණු සහ ඉලක්කයන් කමිටුව විසින් නියම කරනු ලබයි.	අනුකූල විය.
(ඊ)	ප්‍රධාන විධායක නිලධාරිවරයාගේ සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ කාර්යසාධනය ඇගයීම.	ප්‍රධාන විධායක නිලධාරිවරයාගේ සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ කාර්යසාධනය, නියමිත ඉලක්ක සහ අරමුණු සමඟ සැසඳීමෙන් කමිටුව විසින් වරින් වර ඇගයීමට ලක් කරනු ලබයි. එමෙන්ම, පාරිශ්‍රමිකයන්, දීමනා සහ කාර්යසාධනය මත පදනම් වූ දිරි දීමනා සංශෝධනය කිරීමේ පදනම ද කමිටුව විසින් තීරණය කරනු ලබයි.	අනුකූල විය.
(උ)	අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරියා සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය සේවයෙන් ඉවත් වීමේදී හෝ විශ්‍රාම ලැබීමේ දී ලබා දෙන යම් සුවිශේෂී ගෙවීම්, මූල්‍ය හෝ මූල්‍ය නොවන ප්‍රතිලාභ සඳහා කොටස් හිමියන්ගේ පූර්ව ලිඛිත අනුමැතිය ලබාගෙන ඇති බව සහතික කිරීම.	ප්‍රධාන විධායක නිලධාරියා සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය සේවයෙන් ඉවත් වීමේ දී හෝ විශ්‍රාම ලැබීමේ දී ලබා දෙන යම් සුවිශේෂී ගෙවීම්, මූල්‍ය හෝ මූල්‍ය නොවන ප්‍රතිලාභ සම්බන්ධයෙන් අවශ්‍යතාව පරීදි අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ කරමින්, ඒ සඳහා භාණ්ඩාගාර ලේකම්වරයාගේ පූර්ව ලිඛිත අනුමැතිය ලබාගනු ලබයි. සමාලෝචිත වර්ෂය තුළ අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරිවරයා/සාමාන්‍යාධිකාරිවරයා හෝ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය සේවයෙන් ඉවත් වීමේදී හෝ විශ්‍රාම ලැබීමේදී එවැනි කිසිදු සුවිශේෂී ගෙවීමක් හෝ මූල්‍යමය හා මූල්‍යමය නොවන ප්‍රතිලාභයක් ලබා දී නොමැත.	අනුකූල විය.
(ඌ)	ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සමඟ සම්බන්ධීකරණ ක්‍රියා පටිපාටිය	සේවකයින් වෙත ලබා දෙන දිරි දීමනා තීරණය කිරීමේදී බැංකුවේ අවදානම් මට්ටම්, ප්‍රාග්ධනය, ද්‍රවශීලතාවය සහ ඉපැයීම් කෙරෙහි අවධානය යොමු කර ඇත්දැයි විමසා බැලීම සඳහා මෙම කමිටුව අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සමඟ සම්බන්ධීකරණයෙන් කටයුතු කරයි. කෙසේ වුවද, අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC) ස්ථාපිත කරන ලද්දේ 2025 ඔක්තෝබර් මාසයේදී ය.	අනුකූල විය.

කොටස	ප්‍රතිපත්තිය	අනුකූලතාවය සහ ක්‍රියාත්මක කිරීම	අනුකූලතාවය
(ඒ)	ප්‍රධාන විධායක නිලධාරියා සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය වෙත ලබා දෙනු ලබන කාර්යසාධනය මත පදනම් වූ ගෙවීම් නැවත අයකර ගැනීමේ (Claw-back) විධිවිධාන පිළිබඳ ප්‍රතිපත්තිය.	වංචාවක් හෝ අරමුදල් අනිසි ලෙස පරිහරණය කිරීමක් සිදු වූ අවස්ථාවකදී, ඒ හේතුවෙන් සිදු වූ මූල්‍ය අලාභයේ ප්‍රමාණය සැලකිල්ලට ගනිමින්, බැංකුවේ විනය පටිපාටියට අනුකූලව පියවර ගනු ලබයි.	අර්ධ වශයෙන් අනුකූල වී ඇත
6.4	**අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා සහ පාලන කමිටුව (BNGC)** **GRI 2-10**		
(අ)	සංයුතිය සහ ස්වාධීනත්වය	මණ්ඩලයේ සභාපතිවරයා නොවන, ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු විසින් මෙම කමිටුවේ සභාපතිත්වය දරනු ලබයි. ප්‍රධාන විධායක නිලධාරි/ සාමාන්‍යාධිකාරිවරයාට අදාළ කරුණු සාකච්ඡා වන අවස්ථාවලදී හැර, සෙසු අවස්ථාවලදී ආරාධිතයෙකු වශයෙන් ඔහු/ඇය කමිටු රැස්වීම් සඳහා සහභාගී වේ. 300වන පිටුවේ ඇති "අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව" බලන්න	අනුකූල විය.
(ආ)	අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරියා සහ ප්‍රධාන කළමනාකරිත්ව කාර්ය මණ්ඩලය පත් කිරීම	ප්‍රධාන විධායක නිලධාරිවරයා/සාමාන්‍යාධිකාරිවරයා සහ ප්‍රධාන කළමනාකරිත්ව කාර්ය මණ්ඩලය හඳුනා ගැනීම, නම් කිරීම සහ නිර්දේශ කිරීම සඳහා විධිමත් හා විනිවිදභාවයකින් යුත් ක්‍රියා පටිපාටියක් ක්‍රියාත්මක කිරීම කමිටුවේ ප්‍රධාන කාර්යයන්ගෙන් එකකි.	අනුකූල විය.
(ඇ)	යෝග්‍ය සහ සුදුසුකම්ලත් පුද්ගලයින් බව සහතික කිරීම	අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරිවරයා සහ ප්‍රධාන කළමනාකරිත්ව කාර්ය මණ්ඩලය, අංක 3 සහ 8.2 දරන බැංකු නියාමන උපදෙස්වල (Directions) සඳහන් නිර්ණායකයන්ට සහ අදාළ නීති රීති හා රෙගුලාසිවලට අනුකූලව, එම ධුර දැරීම සඳහා යෝග්‍ය සහ සුදුසුකම්ලත් (Fit and Proper) පුද්ගලයින් බව කමිටුව විසින් සහතික කරනු ලබයි.	අනුකූල විය.
(ඈ)	ප්‍රධාන අවදානම් නිලධාරි (CRO), නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි – කළමනාකරණ විගණන (DGM – MA) සහ අනුකූලතා නිලධාරි පත් කිරීම	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (අවදානම් කළමනාකරණ) සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (අනුකූලතා) තෝරා ගැනීමේදී අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ අදහස් ලබා ගන්නා අතර, අවශ්‍යතාවය පරිදි ප්‍රධාන අභ්‍යන්තර විගණක තෝරා ගැනීමේ දී මණ්ඩල විගණන කමිටුවේ අදහස් ද ලබා ගනු ලබයි.	අනුකූල විය.
(ඉ)	අධ්‍යක්ෂවරුන් නැවත පත් කර ගැනීම	අදාළ අධ්‍යක්ෂවරයා විසින් මණ්ඩලයේ වගකීම් සමස්තයක් ලෙස ඉටු කිරීමෙහිලා දක්වන ලද කාර්යසාධනය සහ දායකත්වය කාලානුරූපව ඇගයීමට ලක් කිරීම හරහා, වර්තමාන අධ්‍යක්ෂවරුන් නැවත පත් කර ගැනීම සඳහා නිර්දේශ කිරීම (හෝ නිර්දේශ නොකිරීම) පිළිබඳව කමිටුව විසින් සලකා බලනු ලබයි.	අනුකූල විය.
(ඊ)	ස්වාධීනත්වය නිරීක්ෂණය කිරීම	2025 අගෝස්තු මස සිට ක්‍රියාත්මක වන පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ස්වාධීන අධ්‍යක්ෂවරුන් පත් කිරීමත් සමඟ, 2025 ඔක්තෝබර් මාසයේදී අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා සහ පාලන කමිටුව (BNGC) පිහිටුවන ලදී.	අනුකූලතාවය දක්වා නොමැත.
(උ)	ප්‍රධාන විධායක නිලධාරි ඇතුළුව ප්‍රධාන කළමනාකරිත්ව කාර්ය මණ්ඩලයේ පත්වීම් සඳහා වන සුදුසුකම් නිර්ණායක	ප්‍රධාන විධායක නිලධාරි ධුරය සහ ප්‍රධාන කළමනාකරිත්ව තනතුරු සඳහා පත් කිරීම හෝ උසස් කිරීම සඳහා සලකා බැලීමට සුදුසුකම් ලැබීමට අවශ්‍ය වන්නා වූ අධ්‍යාපනික සුදුසුකම්, පළපුරුද්ද සහ ප්‍රධාන ලක්ෂණ වැනි නිර්ණායකයන් කමිටුව විසින් නියම කරනු ලබයි.	අනුකූල විය.
(ඌ)	අනුප්‍රාප්තික සැලසුම්කරණය සහ අධ්‍යක්ෂ මණ්ඩලයට නව විශේෂඥ දැනුම එක් කර ගැනීම	බැංකුවේ ප්‍රගතිය සඳහා අවශ්‍ය වන්නා වූ අතිරේක හෝ නව විශේෂඥ දැනුම පිළිබඳ අවශ්‍යතාවයන් වාර්ෂික වශයෙන් සලකා බලා නිර්දේශ කිරීම සහ ඇතිවන පුරප්පාඩු සඳහා අනුප්‍රාප්තික සැලසුම් සකස් කිරීම කමිටුවේ ප්‍රධාන කාර්යයන් වේ.	අනුකූල විය.
(එ)	ප්‍රධාන විධායක නිලධාරියා සහ ප්‍රධාන කළමනාකරිත්ව කාර්ය මණ්ඩලය සඳහා වන අනුප්‍රාප්තික සැලසුම	ප්‍රධාන විධායක නිලධාරියා සහ ප්‍රධාන කළමනාකරිත්ව කාර්ය මණ්ඩලය (KMPs) පත් කිරීම සඳහා බැංකුව සතුව ශක්තිමත් අනුප්‍රාප්තික සැලසුමක් පවතින බව කමිටුව විසින් සහතික කරනු ලබයි. එය පහත සඳහන් කරුණුවලින් සමන්විත වේ: (i) බැංකුවේ මෙහෙයුම් කටයුතුවල විශාලත්වය, පරිමාණය, විවිධත්වය සහ සංකීර්ණත්වය සැලකිල්ලට ගනිමින්; කෙටි, මධ්‍යම සහ දිගුකාලීන අනුප්‍රාප්තිකය සඳහා ප්‍රධාන විධායක නිලධාරි සහ ප්‍රධාන කළමනාකරිත්ව කාර්ය මණ්ඩල තනතුරු පිරවීමට සුදුසු සහ දක්ෂ පුද්ගලයින් (අභ්‍යන්තර/බාහිර) හඳුනා ගැනීම; (ii) අදාළ ක්ෂේත්‍රයන් සඳහා වන කුසලතා සහ දැනුමෙහි පවතින පරතරයන් හඳුනාගෙන ඒවා අවම කිරීම මඟින්, අදාළ තනතුරු සඳහා තෝරාගත් අනුප්‍රාප්තිකයින් පුහුණු කර සූදානම් කිරීම (Grooming); සහ, (iii) අනුප්‍රාප්තික සැලසුම වාර්ෂික පදනමින් සමාලෝචනය කිරීම.	අනුකූල විය.

කොටස	ප්‍රතිපත්තිය	අනුකූලනාවය සහ ක්‍රියාත්මක කිරීම	අනුකූලතාවය
(ඒ)	අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය	අදාළ නීති රීති, රෙගුලාසි, සාර්ව ආර්ථිකය, ප්‍රතිපත්ති, නවතම තාක්ෂණික වර්ධනයන් මෙන්ම බැංකු ක්ෂේත්‍රයට අදාළව නැගී එන මූල්‍ය අංශයේ සහ වෙළෙඳපොළ වර්ධනයන් පිළිබඳව අධ්‍යක්ෂවරුන් අඛණ්ඩ පදනමක් මත යාවත්කාලීන වන බව කමිටුව විසින් සහතික කරනු ලබයි.	අනුකූල විය.
(ඕ)	අධ්‍යක්ෂවරුන් සඳහා වන පුහුණු සහ සංවර්ධන කටයුතු	අධ්‍යක්ෂවරුන්ගේ පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම සහ ඔවුන් සඳහා වන පුහුණු, ධාරිතා වර්ධනය සහ වෘත්තීය සංවර්ධන වැඩසටහන් සම්බන්ධ නිර්දේශයන් නිත්‍ය පදනමක් මත අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම.	අර්ධ වශයෙන් අනුකූල වී ඇත.
(ඕ)	අධ්‍යක්ෂ මණ්ඩල ව්‍යුහය අධීක්ෂණය කිරීම	කටයුතු සහ වගකීම් ඵලදායී ලෙස ඉටු කිරීම සහතික කිරීම සඳහා, මණ්ඩලයේ සහ මණ්ඩල කමිටුවල ව්‍යුහය, ප්‍රමාණය, සුදුසුකම් සහ සංයුතිය පිළිබඳව කමිටුව විසින් සමාලෝචනය කරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා සහ පාලන කමිටුව (BNGC) 2025 ඔක්තෝබර් මාසයේදී පිහිටුවන ලදී.	අර්ධ වශයෙන් අනුකූල වී ඇත.
(ක)	පාලන රාමුව සමාලෝචනය කිරීම	සියලුම අදාළ නීති රීති, රෙගුලාසි සහ ක්ෂේත්‍රයේ/ජාත්‍යන්තර හොඳම පිළිවෙත් සැලකිල්ලට ගනිමින්, බැංකුවේ සමස්ත ආයතනික පාලන රාමුව සහ ප්‍රතිපත්ති සමාලෝචනය කිරීම, යාවත්කාලීන කිරීම සහ ඒවා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීම කමිටුව විසින් සිදු කරනු ලබයි.	අනුකූල විය.
6.5	**අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව**		
(අ)	සභාපතිවරයාගේ ස්වාධීනත්වය	අධ්‍යක්ෂ මණ්ඩලයේ හෝ වෙනත් කිසිදු අධ්‍යක්ෂ මණ්ඩල කමිටුවක සභාපතිත්වය නොදරන ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු විසින් මෙම කමිටුවේ සභාපතිත්වය දරනු ලබයි.	අනුකූල විය.
(ආ)	කමිටුවේ සංයුතිය	කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් (3) සමන්විත වන අතර, ඉන් දෙදෙනෙකු (2) බැංකු සහ මූල්‍ය සේවා අංශය තුළ අවදානම් කළමනාකරණ ගැටලු සහ පිළිවෙත් පිළිබඳ මනා සාමූහික අත්දැකීම් සහිත ස්වාධීන අධ්‍යක්ෂවරුන් වේ.	අනුකූල විය.
(ඇ)	අනෙකුත් කමිටුවලින් වෙන්ව පැවතීම	කමිටු සාමාජිකයන්ගෙන් බහුතරය අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ සාමාජිකයන් නොවන අතර, විගණන කමිටු සාමාජිකයන්ගෙන් බහුතරය මෙම කමිටුවේ සාමාජිකයන් ද නොවේ.	අනුකූල විය.
(ඈ)	ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ සහභාගිත්වය	ප්‍රධාන විධායක නිලධාරි/සාමාන්‍යාධිකාරි සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (අවදානම් කළමනාකරණ) ස්ථාවර ආරාධිතයන් ලෙස කමිටු රැස්වීම් සඳහා සහභාගී වේ. මීට අමතරව, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (අනුකූලතා) සහ අනෙකුත් ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය අවශ්‍යතාවය පරිදි රැස්වීම් සඳහා සහභාගී වේ.	අනුකූල විය.
(ඉ)	ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය සමඟ පවතින සමීප සහයෝගීතාව	කමිටුව ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය සමඟ සමීප වැඩ සබඳතාවක් පවත්වාගෙන යනු ලබන අතර, කමිටුවේ යොමු නියම (Terms of Reference) සීමාවන් තුළ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් තීරණ ගනු ලබයි.	අනුකූල විය.
(ඊ)	ස්වාධීන අවදානම් කළමනාකරණ කාර්යය	බැංකුවේ ඒකාබද්ධ අවදානම් කළමනාකරණය සම්බන්ධයෙන් වගකීම් දරනු ලබන ස්වාධීන අවදානම් කළමනාකරණ කාර්යය පද්ධතියක් ස්ථාපිත කර ඇත.	අනුකූල විය.
(උ)	අවදානම් ඇගයීම	අදාළ අවදානම් දර්ශක සහ කළමනාකරණ තොරතුරු හරහා බැංකුවේ ණය, වෙළෙඳපොළ, උපායමාර්ගික, මෙහෙයුම් සහ ද්‍රවශීලතා වැනි අවදානම් ඇගයීම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC) විසින් ක්‍රියාපටිපාටියක් ක්‍රියාත්මක කර ඇත. එම අවදානම් පිළිබඳව නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (අවදානම් කළමනාකරණ) විසින් ත්‍රෛමාසික අවදානම් වාර්තාව සහ අවදානම් නාසන වගුව (Risk Matrix) මඟින් කමිටුව වෙත වාර්තා කරනු ලබයි. තවද, අවදානම් රුචියෙහි සීමාවන් (Risk appetite limits) ඇතුළත් අවදානම් දර්ශක පුවරුව (Risk Dashboard) සාකච්ඡා කිරීමේදී අනුබද්ධ සහ උප-අනුබද්ධ ආයතන ද සැලකිල්ලට ගනු ලැබේ. සෑම කාර්තුවකටම අදාළ අනුබද්ධ ආයතනවල අවදානම් සමාලෝචනය කමිටුව වෙත ඉදිරිපත් කරනු ලබන අතර, කමිටුව විසින් එක් එක් අනුබද්ධ ආයතනයේ අවදානම් මට්ටම් සමාලෝචනය කර සටහන් කර ගනු ලබයි.	අනුකූල විය.
(ඌ)	අවදානම් රුචිය පිළිබඳ වාර්තා කිරීම	කමිටුවේ සාකච්ඡා සහ යෝජනා විස්තරාත්මකව ඇතුළත් කරනු ලැබූ, බැංකුවේ විස්තීර්ණ අවදානම් රුචිය පිළිබඳ ප්‍රකාශය (Risk Appetite Statement) අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලබයි.	අනුකූල විය.
(එ)	ප්‍රධාන අවදානම් නිලධාරිවරයාගේ කාර්යයන් අධීක්ෂණය කිරීම	කමිටුව විසින් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (අවදානම් කළමනාකරණ) ගේ කාර්යභාරයන් අධීක්ෂණය කරනු ලබන අතර, බැංකුවේ අවදානම් පැතිකඩ (Risk profile), ස්ථාපිත අවදානම් රුචියෙහි සීමාවන්ට සාපේක්ෂව පවතින අවදානම් නිරාවරණයන් (Exposures) සහ එම සීමාවන් ඉක්මවා යාම් (Limit breaches) පිළිබඳ නිත්‍ය වාර්තා ලබා ගනු ලබයි.	අනුකූල විය.

කොටස	ප්‍රතිපත්තිය	අනුකූලතාවය සහ ක්‍රියාත්මක කිරීම	අනුකූලතාවය
(ඒ)	උපායමාර්ගික අධීක්ෂණය	බැංකුවේ ප්‍රකාශිත අවදානම් රුචිය (Risk Appetite) සමඟ අනුකූලතාව තහවුරු කරනු පිණිස, ප්‍රධාන විධායක නිලධාරි/සාමාන්‍යාධිකාරි සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය විසින් ප්‍රාග්ධන හා ද්‍රවශීලතා කළමනාකරණය සඳහාත්, ණය, වෙළෙඳපොළ, මෙහෙයුම්, තොරතුරු ආරක්ෂණය සහ උපායමාර්ගික අවදානම් වැනි බැංකුවට අදාළ සියලුම අවදානම් කළමනාකරණය සඳහාත් ක්‍රියාත්මක කරනු ලබන උපායමාර්ග මෙම කමිටුවේ අධීක්ෂණයට ලක්වේ.	අනුකූල විය.
(ඕ)	අවදානම් පිළිබඳ කළමනාකරණ මට්ටමේ කමිටු සමාලෝචනය	නිශ්චිත අවදානම් හඳුනා ගැනීම සඳහාත්, කමිටුව විසින් නියම කර ඇති ප්‍රමාණාත්මක සහ ගුණාත්මක අවදානම් සීමාවන් තුළ එම අවදානම් කළමනාකරණය කිරීම සඳහාත්, ණය අවදානම් කළමනාකරණ කමිටුව, මෙහෙයුම් අවදානම් කළමනාකරණ කමිටුව, තොරතුරු ආරක්ෂණ කමිටුව සහ වත්කම් හා බැරකම් කමිටුව වැනි සියලුම කළමනාකරණ මට්ටමේ කමිටුවල ප්‍රමාණවත්භාවය සහ සඵලතාවය මෙම කමිටුව විසින් සමාලෝචනය කරනු ලබයි.	අනුකූල විය.
(ඖ)	විචක්ෂණ මට්ටම් ඉක්මවා යන අවදානම් අවම කිරීම සඳහා ගනු ලබන නිවැරදි කිරීමේ පියවර	බැංකුවේ ප්‍රතිපත්ති සහ නියාමන හා අධීක්ෂණ අවශ්‍යතා මත පදනම්ව, කමිටුව විසින් තීරණය කරනු ලැබූ විචක්ෂණ මට්ටම් (Prudent level) ඉක්මවා යන නිශ්චිත අවදානම් පවතින අවස්ථාවන්හිදී, එම අවදානම්වල බලපෑම අවම කිරීම සඳහා කමිටුව විසින් කඩිනම් නිවැරදි කිරීමේ පියවර ගනු ලබයි.	අනුකූල විය.
(ක)	රැස්වීම් වාර ගණන	වසර තුළදී රැස්වීම් දෙකක් පවත්වා ඇත.	අර්ධ වශයෙන් අනුකූල වී ඇත.
(ග)	නිශ්චිත අවදානම් හඳුනා ගැනීමට අපොහොසත් වීම හෝ නිවැරදි කිරීමේ පියවර ක්‍රියාත්මක නොකිරීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව ගනු ලබන ක්‍රියාමාර්ග	නිශ්චිත අවදානම් හඳුනා ගැනීමට අපොහොසත් වීම සහ එම අවදානම් අවම කිරීම සඳහා කමිටුව, මුදල් මණ්ඩලය, බැංකු විමර්ශන අධ්‍යක්ෂවරයා සහ අනෙකුත් අදාළ නියාමන හා අධීක්ෂණ බලධාරීන් විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ ඇතුළු කඩිනම් නිවැරදි කිරීමේ පියවර ගැනීමට අපොහොසත් වීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව කමිටුව විසින් සුදුසු ක්‍රියාමාර්ග ගනු ලබයි.	අනුකූල විය.
(ජ)	අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලබන අවදානම් ඇගයීම් වාර්තාව	සෑම රැස්වීමකින්ම සතියක් ඇතුළත, අධ්‍යක්ෂ මණ්ඩලයේ එකඟතාවය සහ/හෝ විශේෂිත උපදෙස් ලබා ගැනීම සඳහා කමිටුව විසින් අවදානම් ඇගයීම් වාර්තාවක් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලබයි.	අනුකූල විය.
(ඨ)	අනුකූලතා කාර්යය	බැංකුවේ ව්‍යාපාරික මෙහෙයුම්වලට අදාළ ක්ෂේත්‍රයන්හි නීති රීති, නියාමනයන්, නියාමන මාර්ගෝපදේශ, අභ්‍යන්තර පාලනයන් සහ අනුමත ප්‍රතිපත්ති සමඟ අනුකූලතාව පවතින්නේ ද යන්න අනුකූලතා කාර්යභාරය (Compliance function) මඟින් ඇගයීමට ලක්වන බව කමිටුව විසින් සහතික කරනු ලබයි. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (අනුකූලතා) විසින් මෙම අනුකූලතා කාර්යභාරය ඉටු කරනු ලබන අතර ඒ පිළිබඳව වරින් වර කමිටුව වෙත වාර්තා කරනු ලබයි.	අනුකූල විය.
(ඩ)	අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු සම්බන්ධීකරණය	නැඟී එන අවදානම් ඇතුළු සියලුම අවදානම් සඵලදායී ලෙස කළමනාකරණය කිරීම සහ බැංකුවේ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුවට අවශ්‍ය විය හැකි කිසියම් ගැලපුම් සිදු කිරීම සහතික කිරීම සඳහා, තොරතුරු හුවමාරු කර ගැනීමට හැකි වන පරිදි විගණන කමිටුව සමඟ සඵලදායී සන්නිවේදන සහ සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් පවත්වා ගෙන යනු ලබයි.	අනුකූල විය.
(ණ)	පාරිශ්‍රමික සමාලෝචනය	මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුවේ කාර්යයන්ට හානියක් නොවන පරිදි, සේවකයින් සඳහා ලබා දෙන දිරිගැන්වීම් (Incentives) තීරණය කිරීමේදී බැංකුවේ අවදානම් මට්ටම්, ප්‍රාග්ධනය, ද්‍රවශීලතාවය සහ උපයීම් පිළිබඳව අවධානය යොමු කර තිබේද යන්න මෙම කමිටුව විසින් පරීක්ෂා කරනු ලබයි.	අනුකූල විය.
6.6	**සම්බන්ධිත පාර්ශ්වීය ගනුදෙනු සමාලෝචන කමිටුව**		
(අ)	කමිටු නායකත්වය	අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයා හෝ වෙනත් කිසිදු අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටුවක සභාපතිවරයෙකු නොවන ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු විසින් කමිටුවේ සභාපතිත්වය දරනු ලබයි.	අනුකූල විය.
(ආ)	කමිටුවේ සංයුතිය	කමිටුව ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වේ. අදාළ න්‍යාය පත්‍රයේ කරුණු මත පදනම්ව අවශ්‍යතාවය පරිදි ප්‍රධාන විධායක නිලධාරි/සාමාන්‍යාධිකාරි සහ අදාළ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් මෙම රැස්වීම් සඳහා සහභාගී වේ.	අනුකූල විය.
(ඇ)	ප්‍රතිපත්ති සහ ක්‍රියාවලිය	අදාළ නීති සහ රීතිවලට අනුකූලව, සම්බන්ධිත පාර්ශ්වීය ගනුදෙනු අඛණ්ඩව හඳුනා ගැනීම, අධීක්ෂණය කිරීම සහ වාර්තා කිරීම සඳහා වන "සම්බන්ධිත පාර්ශ්වීය ප්‍රතිපත්තියක්" ක්‍රියාත්මක වේ.	අනුකූල විය.

කොටස	ප්‍රතිපත්තිය	අනුකූලතාවය සහ ක්‍රියාත්මක කිරීම	අනුකූලතාවය
(ඈ)	ගනුදෙනු සමාලෝචනය	අදාළ නීති සහ රෙගුලාසිවලට අනුකූලව, සම්බන්ධිත පාර්ශවීය ගනුදෙනු අඛණ්ඩව හඳුනාගැනීම, අධීක්ෂණය කිරීම සහ වාර්තා කිරීම සඳහා පැහැදිලි ප්‍රතිපත්තියක්, කාර්ය පටිපාටියක් සහ ක්‍රියාවලියක් ක්‍රියාත්මක වන බව කමිටුව සහතික කරයි.	අනුකූල විය.
(ඉ)	සම්බන්ධිත පාර්ශවීය ගනුදෙනු (RPTs) අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කිරීම.	සම්බන්ධිත පාර්ශ්වයන්, සම්බන්ධිත පාර්ශ්වීය ගනුදෙනු සහ එම ගනුදෙනුවලින් ඇති වන ආර්ථික ප්‍රතිඵල පිළිබඳ විස්තරාත්මක වාර්තාවක් කමිටුව විසින් කාර්තුවකට වරක් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලබයි.	අනුකූල විය.
(ඊ)	බැඳියා පිළිගැටුම GRI 2-15	කිසියම් අධ්‍යක්ෂවරයෙකුට, එම අධ්‍යක්ෂවරයාගේ සමීපතම ඥාතියෙකුට සම්බන්ධ ගනුදෙනුවලදී හෝ අධ්‍යක්ෂවරයාට සැලකිය යුතු උද්‍යෝගයක් (හිතාහිලාෂයක්) ඇති කරුණකදී, අදාළ අධ්‍යක්ෂවරයා එම තීරණ ගැනීමේ ක්‍රියාවලියට සහභාගී වීමෙන් වැළකී සිටින බව කමිටුව විසින් සහතික කරනු ලබයි.	අනුකූල විය.
(උ)	තහනම් කරන ලද ගනුදෙනු	බැංකුවේ අනෙකුත් ගනුදෙනුකරුවන්ට ලබාදෙන කොන්දේසිවලට වඩා "වැඩි වාසිදායක සැලකිල" (more favourable treatment) සම්බන්ධිත පාර්ශ්වයන් වෙත ලබාදෙන කිසිදු ගනුදෙනුවක බැංකුව නිරත නොවන බව කමිටුව සහතික කරයි. ඒවා පහත සඳහන් කරුණුවලින් සමන්විත වේ: (i) බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් (regulatory capital) ප්‍රවේශමී සහගත ප්‍රතිශතයකට වඩා වැඩි වන පරිදි, සම්බන්ධිත පාර්ශ්වයන් වෙත "මුළු ශුද්ධ පහසුකම්" (total net accommodation) ලබාදීම. (ii) සමාන ගනුදෙනුවක නිරත වන සම්බන්ධයක් නොමැති පාර්ශ්වයකට සාපේක්ෂව, බැංකුවේ අවම ණය පොලී අනුපාතයට වඩා අඩු පොලී අනුපාතයක් අය කිරීම හෝ බැංකුවේ තැන්පතු පොලී අනුපාතයට වඩා වැඩි පොලී අනුපාතයක් ගෙවීම. (iii) සම්බන්ධයක් නොමැති පාර්ශ්වයන් සමඟ සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලදී ලබාදෙන කොන්දේසි ඉක්මවා යන පරිදි, වාසිදායක කොන්දේසි සැපයීම, වෙළඳ අලාභ පියවීම සහ/හෝ ගාස්තු හා කොමිස් මුදල් නිදහස් කිරීම වැනි වරණීය සැලකිලි (preferential treatment) ලබාදීම. (iv) නිසි ඇගයීම් ක්‍රියාවලියකින් තොරව සම්බන්ධිත පාර්ශ්වයකට සේවාවන් සැපයීම හෝ එම පාර්ශ්වයකින් සේවාවන් ලබා ගැනීම. (v) නීත්‍යානුකූල රාජකාරි සහ කාර්යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය අවස්ථාවලදී හැර, හිමිකාරිත්වය සහිත (proprietary), රහස්‍ය හෝ වෙනත් සංවේදී තොරතුරු සම්බන්ධිත පාර්ශ්වයන් සමඟ බෙදා ගැනීමට ඉඩ සැලසෙන ආකාරයේ වාර්තාකරණ ක්‍රමවේද සහ තොරතුරු ගලායාම් පවත්වාගෙන යාම.	අනුකූල විය.
7.	**සම්බන්ධිත පාර්ශ්වීය ගනුදෙනු**		
7.1	**සම්බන්ධිත පාර්ශ්වයන් හඳුනාගැනීම**	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද සම්බන්ධිත පාර්ශ්වීය ගනුදෙනු පිළිබඳ ප්‍රතිපත්තිය මගින්, සියලුම ගණයන්ට අයත් සම්බන්ධිත පාර්ශ්වයන් අර්ථ දක්වා ඇත. (අදාළ නියෝගයන්ට අනුකූලව මෙම සම්බන්ධිත පාර්ශ්වයන් කවුද යන්න නිශ්චිතව දක්වා ඇත).	අනුකූල විය.
7.2	**පුනරාවර්තී සම්බන්ධිත පාර්ශ්වීය ගනුදෙනු**	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද සම්බන්ධිත පාර්ශ්වීය ගනුදෙනු පිළිබඳ ප්‍රතිපත්තිය පහත සඳහන් ගනුදෙනු ආවරණය කරයි; (a) බලපත්‍රලාභී බැංකුවල උපරිම පහසුකම් ප්‍රමාණය/විශාල නිරාවරණයන් (Large Exposures) පිළිබඳ බැංකු පනත් නියෝගවල අර්ථ දක්වා ඇති පරිදි, ඕනෑම ආකාරයක මූල්‍ය පහසුකම් (Accommodation) ලබා දීම. (b) තැන්පතු, ණය ගැනීම් සහ ආයෝජන යන ආකාරයෙන් බැංකුව තුළ කිසියම් බැරකම් (Liabilities) ඇති කිරීම. (c) බැංකුව වෙත ලබා දෙන හෝ බැංකුවෙන් ලබා ගන්නා මූල්‍ය හෝ මූල්‍ය නොවන ස්වභාවයේ ඕනෑම සේවාවක් සැපයීම. (d) බැංකුව සහ කිසියම් සම්බන්ධිත පාර්ශ්වයන් අතර වාර්තාකරණ ක්‍රමවේද සහ තොරතුරු ගලායාම් ඇති කිරීම හෝ පවත්වාගෙන යාම; මෙහිදී හිමිකාරිත්වය සහිත, රහස්‍ය හෝ වෙනත් සංවේදී තොරතුරු බෙදා ගැනීම හරහා එම සම්බන්ධිත පාර්ශ්වයන්ට වාසි සැලසීමට ඉඩ ඇති අවස්ථාවන් ද ඇතුළත් වේ.	අනුකූල විය.
7.3	**සම්බන්ධිත පාර්ශ්වයන් වෙත මූල්‍ය පහසුකම් ලබා දීම සම්බන්ධයෙන් බැංකු පනතේ 47 වන වගන්තියේ විධිවිධානවලට අනුකූල වීම.**	සම්බන්ධිත පාර්ශ්වීය ප්‍රතිපත්තියට අනුව, 7.1 නියෝගයෙහි අර්ථ දක්වා ඇති පරිදි ඕනෑම සම්බන්ධිත පාර්ශ්වයකට ලබා දෙනු ලබන මූල්‍ය පහසුකම් සම්බන්ධයෙන්, බැංකු පනතේ 47 වන වගන්තියේ සහ 76 "ඔ" වගන්තියේ සඳහන් විධිවිධාන පැහැදිලි කරන ලදී.	අනුකූල විය.

කොටස	ප්‍රතිපත්තිය	අනුකූලතාවය සහ ක්‍රියාත්මක කිරීම	අනුකූලතාවය
7.4	**අධ්‍යක්ෂවරුන් සහ/හෝ සබැඳි පාර්ශ්වයන් වෙත මූල්‍ය පහසුකම් ලබාදීම පිළිබඳ ප්‍රතිපත්තිය**	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද සම්බන්ධිත පාර්ශ්වීය ගනුදෙනු පිළිබඳ ප්‍රතිපත්තියට, බැංකුව විසින් අනුගමනය කරනු ලබන මෙම කරුණ සම්බන්ධ විධිවිධානයක් ඇතුළත් වේ: අධ්‍යක්ෂවරුන්, සමීප පවුලේ සාමාජිකයන් සහ සම්බන්ධිත ආයතන නමින් බැංකුවෙන් ලබාගෙන ඇති පහසුකම් වෙනුවෙන්, අදාළ පුද්ගලයා අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් වූ දින සිට වසරක් ඇතුළත, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලද අවශ්‍ය ඇප සුරැකුම් ලබා දිය යුතුය.	අනුකූල විය.
7.5	**සේවකයින් වෙත ලබාදෙන මූල්‍ය පහසුකම් පිළිබඳ ප්‍රතිපත්තිය**	ස්ථාපිත කාර්ය මණ්ඩල ප්‍රතිලාභවලින් ඔබ්බට ගිය කිසිදු වරණීය සැලකිල්ලක් හෝ විශේෂ මූල්‍ය පහසුකමක් බැංකුව විසින් තම සේවකයින් වෙත ලබා නොදේ.	අනුකූල විය.
7.6	**සම්බන්ධිත පාර්ශ්වයන් වෙත ලබාදුන් මූල්‍ය පහසුකම් කපා හැරීම**	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද සම්බන්ධිත පාර්ශ්වීය ගනුදෙනු පිළිබඳ ප්‍රතිපත්තියට, බැංකුව විසින් අනුගමනය කරනු ලබන මෙම කරුණ සම්බන්ධ විධිවිධානයක් ඇතුළත් වේ. 2025 වසර තුළ එවැනි කිසිදු තත්ත්වයක් පැන නැඟී නොමැත.	අනුකූල විය.
8.	**ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය**		
8.1	**ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය**	විධායක කාර්යයන්ට මැදිහත් නොවී, බැංකුවේ එදිනෙදා මෙහෙයුම් කටයුතු පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය ඉතා සුපරීක්ෂාකාරී අධීක්ෂණයක් පවත්වාගෙන යයි. බලතල සහ වගකීම් පැහැදිලිව අර්ථ දැක්වීම මගින් ද, ව්‍යාපාරික ඉලක්ක සහ ප්‍රතිපත්තිවලට අනුකූල වීම නිරීක්ෂණය කිරීම සඳහා නිතිපතා කාර්යසාධන ඇගයීම් පැවැත්වීම මගින් ද මෙය සාක්ෂාත් කර ගනු ලබයි.	අනුකූල විය.
8.2	**ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ සුදුසු බව සහ යෝග්‍යතාව ඇගයීම සඳහා වූ නිර්ණායක**	බැංකු පනතේ 42 (2), 44 අ සහ 76 ඌ වගන්ති ප්‍රකාරව, බැංකුවේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ සියලුම සාමාජිකයන් ඇගයීමට ලක් කර ඇති අතර, ඔවුන් අදාළ තනතුරු දැරීම සඳහා සුදුසු සහ යෝග්‍ය තැනැත්තන් (fit and proper persons) බවට තහවුරු වී ඇත.	අනුකූල විය.
8.3	**ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ වගකීම්**	බැංකුවේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය විසින් පහත සඳහන් ප්‍රධාන වගකීම් ඉටු කරන ලදී;	අනුකූල විය.
		(a) උචිත පෞද්ගලික හැසිරීම් රටාවන් තුළින් බැංකුවේ යහපත් ආයතනික පාලන රාමුව සඳහා සක්‍රීයව දායක වීම. (b) බැංකුවේ රාජකාරි ඉටු කිරීම සඳහා ප්‍රමාණවත් වෘත්තීය කාලයක් වෙන් කිරීම; තවද අනුබද්ධ හෝ අනුබද්ධිත සමාගමක විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කරන්නේ නම්, එම වගකීම් මගින් බැංකුව වෙත ඇති බැඳීම්වලට බාධාවක් නොවන බව සහතික කිරීම. (c) බැංකුවේ මූල්‍ය සහ මූල්‍ය නොවන අවදානම් කළමනාකරණය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ව්‍යාපාරික උපාය මාර්ග, අවදානම් කළමනාකරණ රාමු සහ අනුකූලතා පද්ධති ක්‍රියාත්මක කිරීම. (d) අවදානම් කළමනාකරණ, අනුකූලතා සහ අභ්‍යන්තර විගණන කාර්යයන්හි ස්වාධීනත්වය කිසිදු මැදිහත් වීමකින් තොරව ආරක්ෂා කිරීම සහ ඊට ගරු කිරීම. (e) නිපුණතා පවත්වා ගැනීම සඳහා සහ අදාළ නව වර්ධනයන් පිළිබඳව නිරන්තරයෙන් යාවත්කාලීන වීම සඳහා අඛණ්ඩ වෘත්තීය සංවර්ධන කටයුතුවල නිරත වීම. (f) වගකීම් නිසි පරිදි පැවරීම සහ එසේ පවරන ලද රාජකාරි පිළිබඳව ඵලදායී අධීක්ෂණයක් සහතික කිරීම. (g) බැංකුව පුරා වගකීම් සහගත බව සහ විනිවිදභාවය ප්‍රවර්ධනය කෙරෙන කළමනාකරණ ව්‍යුහයක් ස්ථාපිත කිරීම සහ පවත්වාගෙන යාම. (h) හඳුනාගත් රිති උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් කාලෝචිත සහ සුදුසු පිළියම් හෝ විනය ක්‍රියාමාර්ග ගැනීම සහතික කිරීම. (i) වැදගත් කරුණු පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට සහ අදාළ මණ්ඩල අනුකමිටුවලට කාලෝචිත තොරතුරු ලබා දීම. (j) යෝග්‍යතාවයට සහ සුදුසු බවට අහිතකර ලෙස බලපාන ඕනෑම වැදගත් තොරතුරක් පිළිබඳව බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා වෙත වහාම දැනුම් දීම.	

කොටස	ප්‍රතිපත්තිය	අනුකූලතාවය සහ ක්‍රියාත්මක කිරීම	අනුකූලතාවය
9.	**අනාවරණයන්**		
9.1	**අනාවරණයන් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම්**	ව්‍යාපාරික කටයුතුවල පරිමාණය සහ සංකීර්ණතාවයට අනුකූලව, විනිවිදභාවය සහ වෙළඳපොළ විනය ප්‍රවර්ධනය කිරීම සඳහා බැංකුවට අදාළ වැදගත් තොරතුරු එනම්; ප්‍රධාන කාර්යසාධන දර්ශක, ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය, ද්‍රවශීලතාවය, ව්‍යාපාරික ඒකාග්‍රතාවය, සම්බන්ධිත පාර්ශවීය ගනුදෙනු, ආයතනික පාලන භාවිතයන් සහ මූල්‍ය ප්‍රතිඵල ඇතුළු තොරතුරු කාලෝචිතව, නිවැරදිව සහ පුළුල් ලෙස ප්‍රසිද්ධ කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය සහතික වේ. තවද, වාර්ෂික විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ අතුරු මූල්‍ය ප්‍රකාශන, අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට සහ අදාළ අධීක්ෂණ හා නියාමන බලධාරීන් විසින් නියම කරන ලද ආකෘතිවලට අනුකූලව සකස් කර ප්‍රකාශයට පත් කරන බවට අධ්‍යක්ෂ මණ්ඩලය සහතික වේ. ඒ අනුව බැංකුව මූල්‍ය ප්‍රකාශන සකස් කර ප්‍රකාශයට පත් කරයි. කාර්තුවකට වරක් නිකුත් කරන මූල්‍ය ප්‍රකාශන සංක්ෂිප්ත ස්වරූපයෙන් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් පුවත්පත්වල පළ කර ඇත. ඒ අනුව 2025 වර්ෂය සඳහා වන කාර්තුමය මූල්‍ය ප්‍රකාශන පහත පරිදි ප්‍රකාශයට පත් කරන ලදී: 2025 පළමු කාර්තුව – 2025 මැයි 30 දින Daily FT, දිනපතා අරුණ සහ තිනකරන් පුවත්පත්වල. 2025 දෙවන කාර්තුව – 2025 අගෝස්තු 28 දින Daily FT, දිනපතා අරුණ සහ තිනකරන් පුවත්පත්වල. 2025 තෙවන කාර්තුව – 2025 නොවැම්බර් 27 දින Daily FT, දිනපතා අරුණ සහ තිනකරන් පුවත්පත්වල. 2025 සිව්වන කාර්තුව – 2026 පෙබරවාරි 27 දින Daily FT, දිනපතා අරුණ සහ තිනකරන් පුවත්පත්වල.	අනුකූල විය.
9.2	**වාර්ෂික වාර්තාවට අදාළ අනාවරණයන්**		
(අ)	ගිණුම්කරණ ප්‍රමිතීන් සහ නියාමන අවශ්‍යතාවලට අනුකූල වීම	වාර්ෂික විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සියලුම අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන් සහ නියාමන අවශ්‍යතාවලට අනුකූල වන අතර, නීතියෙන් නියම කර ඇති සියලුම විශේෂිත අනාවරණයන් ද ඊට ඇතුළත් කර ඇත. මෙම අනුකූලතාවය පිළිබඳ සවිස්තරාත්මක අනාවරණයන් 312 වන පිටුවේ ඇති "මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම්" යටතේ දක්වා ඇත.	අනුකූල විය.
(ආ)	අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයන් පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව	අධ්‍යක්ෂ මණ්ඩලයේ අභ්‍යන්තර පාලන යාන්ත්‍රණය පිළිබඳ සවිස්තරාත්මක දැක්ම, 306-307 පිටුවල ඇති "මූල්‍ය වාර්තාකරණය පිළිබඳ බැංකුවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය" යටතේ දක්වා ඇත.	අනුකූල විය.
(ඇ)	අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයේ ඵලදායීතාව පිළිබඳ බාහිර විගණකවරුන්ගේ සහතික කිරීම	මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනයන්හි ඵලදායීතාව සම්බන්ධයෙන් බැංකුව ස්වාධීන නිශ්චය කිරීමේ (assurance) වාර්තාවක් ලබාගෙන ඇත. මෙම වාර්තාව 308-309 පිටුවල දක්වා ඇත.	අනුකූල විය.
(ඈ)	අධ්‍යක්ෂවරුන්ගේ නම්, බැංකුව සමඟ සිදුකළ ගනුදෙනු සහ බැංකුව විසින් ගෙවන ලද මුළු ගාස්තු/පාර්ශ්‍රමිකයන් ඇතුළු විස්තර	අධ්‍යක්ෂ මණ්ඩලයේ විස්තරාත්මක පැතිකඩ (Profiles) 38-43 පිටුවල දක්වා ඇත. සම්බන්ධිත පාර්ශවීය ගනුදෙනු පිළිබඳ විස්තර 410-415 පිටුවල මූල්‍ය ප්‍රකාශනවලට අදාළ 43 වන සටහනේ දක්වා ඇත. අධ්‍යක්ෂවරුන් වෙත ගෙවන ලද පාර්ශ්‍රමික පිළිබඳ විස්තර 350 වන පිටුවේ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ 13 වන සටහනේ දක්වා ඇත.	අනුකූල විය.
(ඉ)	සම්බන්ධිත පාර්ශ්වයන්ගේ එක් එක් කාණ්ඩය වෙත ලබා දී ඇති ශුද්ධ අනුපූරක (net accommodation) බැංකුවේ නියාමන ප්‍රාග්ධනයේ ප්‍රතිශතයක් ලෙස.	2025 දෙසැම්බර් 31 දිනට සම්බන්ධිත පාර්ශ්වයන් වෙත ලබා දී ඇති ණය සහ වක්‍ර අනුපූරක (Accommodation) පහත පරිදි වේ:	අනුකූල විය.

	රු. '000	බැංකුවේ නියාමන ප්‍රාග්ධනයේ ප්‍රතිශතයක් ලෙස
අධ්‍යක්ෂවරුන්	110.47	0.0
අධ්‍යක්ෂවරුන්ගේ සමීපතම පවුලේ සාමාජිකයන්	–	–
ප්‍රධාන කළමනාකාරිත්ව කාර්ය මණ්ඩලය	83,235.47	0.1
ප්‍රධාන කළමනාකාරිත්ව කාර්ය මණ්ඩලයේ සමීපතම පවුලේ සාමාජිකයන්	17,205.66	0.0
අනුබද්ධ සමාගම්	470,705.30	0.3
අනු-අනුබද්ධ සමාගම්	511,762.04	0.3
රජය සහ රජයට සම්බන්ධ ආයතන	365,020,109.76	236.0
බැංකුවේ යම් අධ්‍යක්ෂවරයෙකුට හෝ එම අධ්‍යක්ෂවරයෙකුගේ සමීපතම පවුලේ සාමාජිකයෙකුට සැලකිය යුතු සම්බන්ධතාවක් (substantial interest) පවතින ආයතන	–	–

කොටස	ප්‍රතිපත්තිය	අනුකූලතාවය සහ ක්‍රියාත්මක කිරීම	අනුකූලතාවය
(ඊ)	ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ වැටුප් සහ ගනුදෙනු වල සමස්ත විටිනාකම්	2025 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ (KMP) වේතනයන්හි සමස්ත අගය සහ ඔවුන් සමඟ සිදුකළ ගනුදෙනු පහත පරිදි වේ:	අනුකූල විය.

වර්ෂය	රු. '000
කෙටි කාලීන සේවක ප්‍රතිලාභ	835,441.23
සේවය අවසානයේ ලබාදෙන විශ්‍රාම වැටුප්, සේවය අත්හිටුවීමේ ප්‍රතිලාභ, කොටස් මත පදනම් වූ ගෙවීම් සහ අනෙකුත් දිගුකාලීන ප්‍රතිලාභ	81,308.68
ණයපත් ඇතුළු ණය සහ අත්තිකාරම්	83,235.47
තැන්පතු	550,014.38
ආයෝජන	–

(උ)	මණ්ඩල කමිටුවලට අදාළ තොරතුරු අනාවරණය කිරීම්	මණ්ඩල විගණන කමිටුව පිළිබඳ සවිස්තරාත්මක අනාවරණයන් 298 වන පිටුවේ ඇති "අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාවේ" ඇතුළත් කර ඇත.	අනුකූල විය.
(ඌ)	අදාළ රෙගුලාසිවලට අනුකූලව වාර්ෂික ආයතනික පාලන වාර්තාවෙහි තොරතුරු අනාවරණය කිරීම	බැංකුව විසින් මෙම රෙගුලාසිවලට අනුකූලව වාර්ෂික ආයතනික පාලන වාර්තාවෙහි පහත තොරතුරු අනාවරණය කර ඇත. i. රෙගුලාසිවලට අනුකූල බව තහවුරු කිරීම සඳහා බැංකුව විසින් විගණකාධිපතිවරයාගෙන් සහතිකයක් ලබාගෙන ඇත. ii. අධ්‍යක්ෂවරුන්ගේ වර්ගීකරණය අනුව අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය 266 වන පිටුවේ අනාවරණය කර ඇත.	අනුකූල විය.
(එ)	විචක්ෂණශීලී අවශ්‍යතා, රෙගුලාසි, නීති සහ අභ්‍යන්තර පාලනයන් සමඟ අනුකූලතාවය තහවුරු කරන වාර්තාව	විචක්ෂණශීලී අවශ්‍යතා, රෙගුලාසි, නීති සහ අභ්‍යන්තර පාලනයන් සමඟ අනුකූලතාවය තහවුරු කරන වාර්තාව i. 312 වන පිටුවේ ඇති "මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම්". ii. 306 වන පිටුවේ ඇති "මූල්‍ය වාර්තාකරණය පිළිබඳ බැංකුවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය".	අනුකූල විය.
(ඒ)	අනුකූල නොවීම් පිළිබඳ වාර්තාව	බැංකුවේ අවදානම් කළමනාකරණයේ අඩුපාඩු හෝ මෙම නියාමනයන් (Direction) අනුකූල නොවීම් පිළිබඳ අධීක්ෂණමය ගැටලුවක් ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා විසින් පෙන්වා දී නොමැත.	අනුකූල විය.
(ඔ)	ව්‍යවස්ථාපිත නොවන විශේෂ ගෙවීම්	2025 වර්ෂය තුළ, සේවය අවසන් කිරීමේදී හෝ විශ්‍රාම යාමේදී අධ්‍යක්ෂවරුන්ට, ප්‍රධාන විධායක නිලධාරීන්ට සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ට මූල්‍ය ප්‍රතිලාභ ලෙස රුපියල් මිලියන 44.1ක් ගෙවා ඇත	අනුකූල විය.
9.3	**අනුකූල නොවීම් හේතුවෙන් සහ/හෝ අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය මත අධ්‍යක්ෂවරුන් ඉල්ලා අස්වීම, ඉවත් කිරීම හෝ ධුරය අත්හැරීම සම්බන්ධයෙන් කළ යුතු අනාවරණයන්**	2025 මූල්‍ය වර්ෂය තුළ එවැනි සිදුවීමක් සිදුවී නොමැත.	අනුකූල විය.

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව

බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව (BAC), බලපත්‍රලාභී බැංකුවල ආයතනික පාලනය පිළිබඳ 2024 අංක 5 දරන බැංකු පනතේ විධිවිධානවලට අනුකූලව පිහිටුවා ඇත. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ කටයුතු සිදු කරනු ලබන්නේ කමිටුවේ ක්‍රියාකාරිත්වය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රඥප්තිය මත පදනම්වය.

වසර අවසානය වන විට කමිටුව පහත සඳහන් ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනාගෙන් සමන්විත විය.

අධ්‍යක්ෂවරයාගේ නම	තනතුර
එස් එම් එස් සංජය බණ්ඩාර මහතා	සභාපති
ජී ඒ එම් එඩ්වර්ඩ්ස් මිය	සාමාජික
එන් එස් බී වල්ගම්පාය මහතා	සාමාජික

කමිටුවේ ගණපූරණය සඳහා අවම වශයෙන් කමිටු සාමාජිකයින්ගෙන් අඩක්වත් සහභාගී විය යුතුය.

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා, මණ්ඩල විගණන කමිටුවේ ලේකම්වරයා ලෙස කටයුතු කරයි. අනෙකුත් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්, ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී, ප්‍රධාන අභ්‍යන්තර විගණක (CIA), මූල්‍ය ප්‍රධානී (HOF), ප්‍රධාන අවදානම් නිලධාරී (CRO), ප්‍රධාන අනුකූලතා නිලධාරී (CCO), වෙනත් ඕනෑම ප්‍රධාන කළමනාකරණ නිලධාරියෙකු සහ බාහිර විගණකවරුන්ගේ නියෝජිතයෙකුට, අදාළ න්‍යාය පත්‍රයේ කරුණු සඳහා කමිටුවේ ආරාධනය මත රැස්වීම්වලට සහභාගී විය හැකිය. කෙසේ වෙතත්, අවම වශයෙන් වසරකට දෙවතාවක්වත්, විධායක අධ්‍යක්ෂවරුන් නොමැතිව බාහිර විගණකවරුන් හමුවීමට කමිටුව කටයුතු කළ යුතුය.

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විශේෂයෙන්ම:

- ප්‍රඥප්ති මගින් නියම කර ඇති මූල්‍ය වාර්තාකරණ අවශ්‍යතාවලට අනුකූල බව සහතික කිරීම සඳහා මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සමාලෝචනය කරයි.
- අභ්‍යන්තර පාලන පද්ධතිය සහ ව්‍යාපාරික අවදානම් කළමනාකරණය පිළිබඳව පරීක්ෂා කරයි.
- බාහිර හා අභ්‍යන්තර යන දෙඅංශයේම විගණන ක්‍රියාවලීන් සමාලෝචනය කරයි.
- නීති සහ රෙගුලාසිවලට අනුකූල වීම, විශේෂයෙන්ම ශ්‍රී ලංකා මහ බැංකුවේ මාර්ගෝපදේශ අනුගමනය කිරීම අධීක්ෂණය සඳහා පවතින ක්‍රියා පටිපාටි සමාලෝචනය කරයි.
- තොරතුරු පද්ධති ආරක්ෂාවට අදාළ ප්‍රතිපත්ති ඇතුළුව බැංකු මෙහෙයුම්වල විවිධ අංශයන්හි අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා, අදාළ පරිදි ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි සහ මෙහෙයුම් අත්පොත් (Operational manuals) සමාලෝචනය කර ඒවා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා නිර්දේශ කරයි.
- අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන වාර්ෂික විගණන මෙන්ම විශේෂ විගණන මත පදනම්ව ඉදිරිපත් කෙරෙන අභ්‍යන්තර විගණන වාර්තා සමාලෝචනය කරයි.
- ක්‍රියාත්මක කර ඇති අභ්‍යන්තර පාලනයන් සමාලෝචනය කිරීම සහ ඒවායේ ප්‍රමාණවත්භාවය හා සඵලදායීතාවය ඇගයීමට ලක් කිරීම මෙන්ම, අදාළ වන අවස්ථාවලදී අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම.

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ කමිටුව විසින් පහත සඳහන් කාර්යයන් ඉටු කරන ලදී:

(අ) නියාමන බලධාරීන් විසින් නියම කර ඇති අවශ්‍යතා සහ අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ඇති බව සහතික කිරීම සඳහා 2025 වර්ෂය වෙනුවෙන් බැංකුවේ ත්‍රෛමාසික මූල්‍ය කාර්ය සාධනය සමාලෝචනය කළ අතර, ඒවා අනුමත කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ කරන ලදී.

(ආ) අභ්‍යන්තර විගණන සැලසුම අනුමත කළ අතර, එය නියමිත වේලාවට සාක්ෂාත් කර ගැනීම සහතික කිරීම සඳහා අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ කාලීන කාර්ය සාධනය සමාලෝචනය කරන ලදී.

(ඇ) 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන සහ කළමනාකරණ ලිපිය ඇතුළුව මහජන බැංකුවේ කටයුතු පිළිබඳ විගණකාධිපතිවරයාගේ සවිස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව සමාලෝචනය කරන ලදී.

(ඈ) සංශෝධිත ශාඛා විගණන අත්පොත, සංශෝධිත තොරතුරු හෙළි කරන්නන්ගේ (Whistle Blowing) ප්‍රතිපත්තිය, අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ සේවක සංඛ්‍යා තක්සේරුව යනාදිය සමාලෝචනය කර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා නිර්දේශ කරන ලදී.

(ඉ) 2024 වර්ෂයේදී සිදු කරන ලද ශාඛා විගණනවලදී හඳුනාගත් සැලකිය යුතු අඩුපාඩුවල මූලික හේතු විශ්ලේෂණය ඇතුළත් විශේෂ විගණන වාර්තා සහ ශාඛා විගණනවලදී පොදුවේ හඳුනාගත් සැලකිය යුතු අඩුපාඩු සමාලෝචනය කරන ලදී.

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය තුළ රැස්වීම් හතරක් (4) පවත්වන ලදී. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් අභ්‍යන්තර විගණන වාර්තා සලකා බලන ලද අතර, ක්‍රියාවලීන්හි අභ්‍යන්තර පාලනයන්හි ප්‍රමාණවත්භාවය සහ සඵලදායීතාවය ඇගයීමට ලක් කරන ලදී. එහිදී හඳුනාගත් ප්‍රධාන ගැටලු සහ කරුණු නිවැරදි කිරීම සඳහා අදාළ නිලධාරීන් විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග ඇගයීමට ලක් කළ අතර, එම නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගනු ලබන ආකාරය පිළිබඳව නිරන්තර අධීක්ෂණය සිදු කරන ලදී. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු රැස්වීම්වල වාර්තා, තොරතුරු දැනගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබේ.

විගණන කටයුතු සඳහා සහ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී හා ඉදිරිපත් කිරීමේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වීම සඳහා විගණකාධිපතිවරයාට අවශ්‍ය සියලුම තොරතුරු සහ ලේඛන සැපයීම මණ්ඩල විගණන කමිටුව විසින් සහතික කරන ලදී. ප්‍රමාණවත් පාලනයන් සහ ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක වන බවත්, මණ්ඩල විගණන කමිටු ප්‍රඥප්තියේ සඳහන් සියලුම වැදගත් කරුණු අනුගමනය කර ඇති බවත් කමිටුවේ අදහසයි.

සංජය බණ්ඩාර
සභාපති
අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව
2025 දෙසැම්බර් 31

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටු වාර්තාව

GRI 2-19, 20

සංයුතිය

වසර අවසානය වන විට, අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව (BHRRC) විධායක නොවන අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකුට නොඅඩු සහ තිදෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත වේ. එමෙන්ම සෑම රැස්වීමක් සඳහාම ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරීවරයා සහභාගී විය යුතුය.

සභාපති

එම් ජේ තිලකරත්න මහතා (ස්වාධීන නොවන අධ්‍යක්ෂ)

අනෙකුත් සාමාජිකයින් (අධ්‍යක්ෂවරුන්)

ආර් බී ආර් එමර්සන් මහතා (ස්වාධීන නොවන අධ්‍යක්ෂ)
2025 ඔක්තෝබර් 22 දිනට

ආචාර්ය ඒ ඒ කදිරගාමර් (ස්වාධීන නොවන අධ්‍යක්ෂ)
2025 ජූලි 7 දිනට

ඩී පී ලොකුආරච්චි මහතා (ස්වාධීන අධ්‍යක්ෂ)
2025 ඔක්තෝබර් 22 දින සිට

එම් එච් එස් ගවුස් මහතා (ස්වාධීන අධ්‍යක්ෂ)
2025 ඔක්තෝබර් 22 දින සිට

ක්ලයිව් ෆොන්සේකා මහතා - ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී

ක්ලයිව් ෆොන්සේකා මහතා - ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත්) ආරාධනය මත රැස්වීම්වලට සහභාගී වන අතර, බැංකුවේ වෙනත් ඕනෑම නිලධාරියෙකුට ද ආරාධනා කළ අවස්ථාවකදී සහභාගී විය හැකිය.

කමිටුවේ ලේකම්

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා, අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුවේ (BHRRC) ලේකම්වරයා ලෙස කටයුතු කරයි.

රැස්වීම්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය තුළ රැස්වීම් හතරක් (4) පවත්වන ලදී.

ගණපූරණය

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටු රැස්වීමක ගණපූරණය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු සහ ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරීවරයා සහභාගී විය යුතුය.

කමිටුවේ කාර්යභාරය

- මානව සම්පත් සහ පාරිශ්‍රමික ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සහ මානව සම්පත් කළමනාකරණයට අදාළ උපාය මාර්ග ආරම්භ කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව වගකීමට බැඳී සිටී.
- බඳවා ගැනීම්, වැටුප් සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ තීරණය කිරීමේදී කමිටුව ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි.
- කමිටුව විසින් ආයතනික සහ විධායක කළමනාකාරිත්ව සාමාජිකයින්ගේ රැකියා ගිවිසුම් සමාලෝචනය කරනු ලබන අතර, ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී සහ ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින් (KMP) සඳහා ඉලක්ක සහ අරමුණු සකස් කරනු ලබයි.
- නියමිත ඉලක්ක සහ අරමුණු වලට සාපේක්ෂව ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී සහ ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින්ගේ කාර්ය සාධනය වරින් වර ඇගයීමට ලක් කරන අතර, පාරිශ්‍රමික සහ ප්‍රතිලාභ යනාදිය සංශෝධනය කිරීමේ පදනමද කමිටුව විසින් තීරණය කරනු ලබයි.

අනාගත අවධානය

සියලුම මානව සම්පත් සහ පාරිශ්‍රමික විධිවිධාන බැංකුවේ උපායමාර්ගික අරමුණු සඳහා සහය දක්වන බව අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව සහතික කරනු ඇත.



එම් ජේ තිලකරත්න
සභාපති - අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව

2025 දෙසැම්බර් 31

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව

සංයුතිය

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC), සභාපතිවරයා ඇතුළුව බහුතරයක් ස්වාධීන නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත වන පරිදි, අවම වශයෙන් විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වේ.

සභාපති

සී එස් ගුණියංගොඩ මහතා (ස්වාධීන අධ්‍යක්ෂ)
2025 අගෝස්තු 28 දින සිට.

අනෙකුත් සාමාජිකයින් (අධ්‍යක්ෂවරුන්)

එම් ජේ තිලකරත්න මහතා (ස්වාධීන නොවන අධ්‍යක්ෂ)
2025 අගෝස්තු 28 දිනට

කේ වී විමලේන්ද්‍රිරාජා මහතා (ස්වාධීන නොවන අධ්‍යක්ෂ)
2025 අගෝස්තු 28 දින සිට

ඩී පී ලොකුආරච්චි මහතා (ස්වාධීන අධ්‍යක්ෂ)
2025 ඔක්තෝබර් 22 දින සිට

අවශ්‍යතාවය මත සහභාගී වන්නන්

ක්ලයිව් ෆොන්සේකා මහතා – ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී

අනුර පෙරේරා මහතා – නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අවදානම් කළමනාකරණය)

සමන්ති සේනානායක මහත්මිය – නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අනුකූලතා)

කමිටුවේ ලේකම්

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා, මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ (BIRMC) ලේකම්වරයා ලෙස කටයුතු කරයි

රැස්වීම්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය තුළ රැස්වීම් දෙකක් (02) පවත්වන ලදී.

ගණපූරණය


අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු රැස්වීමක ගණපූරණය සඳහා අවම වශයෙන් විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු සහභාගී විය යුතුය.

කමිටුවේ කාර්යභාරය

- අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන අවදානම් පරාමිතීන් තුළ බැංකුවේ අවදානම් පැතිකඩ සමාලෝචනය කිරීම සම්බන්ධයෙන් කමිටුව වගකීම දරයි.
- සුදුසු අවදානම් දර්ශක සහ කළමනාකරණ තොරතුරු භාවිත කරමින් ණය, වෙළඳපල, ද්‍රවශීලතාවය, මෙහෙයුම්, තොරතුරු තාක්ෂණ, කීර්තිනාමය සහ උපායමාර්ගික අවදානම් වලට අදාළ සියලුම අවදානම් ඇගයීම සම්බන්ධයෙන් කමිටුව වගකීම දරයි.
- අවදානම් කළමනාකරණයට අදාළ අනෙකුත් වගකීම් අතර, සමස්ත බැංකුවම ආවරණය වන පරිදි ක්‍රියාත්මක අවදානම් කළමනාකරණය, අභ්‍යන්තර අනුකූලතාවය සහ පාලන පද්ධති ක්‍රියාත්මක කිරීම සහ සමාලෝචනය කිරීම කමිටුව විසින් අධීක්ෂණය කරනු ලබයි.
- විශේෂිත අවදානම්වලට විසඳුම් සෙවීම සඳහා සහ කමිටුව විසින් නිශ්චිතව දක්වා ඇති ප්‍රමාණාත්මක හා ගුණාත්මක අවදානම් සීමාවන් තුළ එම අවදානම් කළමනාකරණය කිරීම සඳහා ණය අවදානම් කළමනාකරණ කමිටුව, මෙහෙයුම් අවදානම් කළමනාකරණ කමිටුව, තොරතුරු ආරක්ෂණ කමිටුව සහ වත්කම් – වගකීම් කමිටුව වැනි සියලුම කළමනාකරණ මට්ටමේ කමිටුවල ප්‍රමාණවත්භාවය සහ සඵලතාවය කමිටුව විසින් සමාලෝචනය කරනු ලබයි.

අනාගත අවධානය

බැංකුවේ අවදානම් කළමනාකරණ රාමුවේ ප්‍රමාණවත්භාවය සහ සඵලතාවය සහතික කිරීම කෙරෙහි මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව අවධානය යොමු කරනු ඇත.



සී එස් ගුණියංගොඩ
සභාපති – අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව
2025 දෙසැම්බර් 31

අධ්‍යක්ෂ මණ්ඩල විධායක ණය කමිටු වාර්තාව

සංයුතිය

අධ්‍යක්ෂ මණ්ඩල විධායක ණය කමිටුව (BECC), අධ්‍යක්ෂ මණ්ඩලයේ අවම වශයෙන් විධායක නොවන අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකුගෙන් සහ ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරීවරයාගෙන් සමන්විත වේ.

සභාපති

බ්‍රැඩ්ලි එමර්සන් මහතා (ස්වාධීන නොවන අධ්‍යක්ෂ)
2025 ඔක්තෝබර් 22 දිනට

ජී ඒ එම් එඩ්වර්ඩ්ස් මහත්මිය (ස්වාධීන අධ්‍යක්ෂ)
2025 නොවැම්බර් 14 දින සිට

අනෙකුත් සාමාජිකයින් (අධ්‍යක්ෂවරුන්)

එම් ජේ තිලකරත්න මහතා (ස්වාධීන නොවන අධ්‍යක්ෂ)

ආචාර්ය ඒ ඒ කදිරගාමර් (ස්වාධීන නොවන අධ්‍යක්ෂ)
2025 ජූලි 8 දිනට

එම් එච් එස් ගවුස් මහතා (ස්වාධීන අධ්‍යක්ෂ)
2025 නොවැම්බර් 14 දින සිට

ක්ලයිව් ෆොන්සේකා මහතා – ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී

ස්ථිර ආරාධිතයින්

අනුර පෙරේරා මහතා – නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(අවදානම් කළමනාකරණය)

ආරාධනය මත සහභාගීවන්නන්

බැංකුවේ වෙනත් ඕනෑම ණය අංශයක නිලධාරියෙකු ආරාධනය මත BECC රැස්වීම්වලට සහභාගී වේ.

කමිටුවේ ලේකම්

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා, අධ්‍යක්ෂ මණ්ඩල විධායක ණය කමිටුවේ ලේකම්වරයා ලෙස කටයුතු කරයි.

රැස්වීම්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය තුළ රැස්වීම් විසිතුනක් (23) පවත්වන ලදී.

ගණපූරණය

අධ්‍යක්ෂ මණ්ඩල විධායක ණය කමිටුවේ රැස්වීමක ගණපූරණය සඳහා අවම වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙකු සහ ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරීවරයා සහභාගී විය යුතුය.

කමිටුවේ කාර්යභාරය

- බැංකුවේ ණය කළමනාකරණ ව්‍යුහය අනුමත කිරීම සහ බලතල පැවරීමේ මට්ටම් ඇතුළුව ණය අනුමත කිරීමේ අධිකාරීන් ස්ථාපිත කිරීම.
- ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරීවරයා වෙත පවරා ඇති සීමාවන් ඉක්මවා යන සියලුම ණය පහසුකම් අනුමත කිරීම සහ සුදුසු යැයි හැඟෙන අවස්ථාවලදී අතිරේක ගිවිසුම් කොන්දේසි සහ නියමයන් පැනවීම.
- ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරීවරයා වෙත පවරා ඇති අධිකාරී සීමාවන් ඉක්මවා යන ණය ප්‍රතිසංවිධානය කිරීම්, එකවර පියවීම් සහ පොළී සහන යෝජනා අනුමත කිරීම.
- ණය කළඹේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා ණය සම්බන්ධ පද්ධති, ඒවා ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය සහ ණය කළඹ මට්ටමේ අවදානම් කළමනාකරණය කිරීම සමාලෝචනය කිරීම.
- ණය අවදානම පාලනය කිරීම සඳහා අවශ්‍ය පූර්ව ආරක්ෂණ පියවරයන් නිර්දේශ කිරීම.

අනාගත අවධානය

බැංකුවේ සුවිලදායී ණය අවදානම් කළමනාකරණය සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල විධායක ණය කමිටුව කැපවී කටයුතු කරනු ඇත.



ජී ඒ එම් එඩ්වර්ඩ්ස්
සභාපති – අධ්‍යක්ෂ මණ්ඩල විධායක ණය කමිටුව

2025 දෙසැම්බර් 31

අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා සහ පාලන කමිටු වාර්තාව

GRI 2-10

සංයුතිය

අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා සහ පාලන කමිටුව (BNGC) 2025 ඔක්තෝබර් 22 දින පිහිටුවන ලද අතර එය විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වේ. 2025 දෙසැම්බර් 31 වන විට, කමිටුවේ සභාපතිවරයා ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු වන අතර ඔහු අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයා නොවේ.

සභාපති

ඩී පී ලොකුආරච්චි මහතා (ස්වාධීන අධ්‍යක්ෂ)
2025 ඔක්තෝබර් 22 දින සිට

අනෙකුත් සාමාජිකයින් (අධ්‍යක්ෂවරුන්)

කේ ඒ විමලේන්දිරරාජා මහතා (ස්වාධීන නොවන අධ්‍යක්ෂ)
2025 ඔක්තෝබර් 22 දින සිට

එම් ජේ තිලකරත්න මහතා (ස්වාධීන නොවන අධ්‍යක්ෂ)
2025 ඔක්තෝබර් 22 දින සිට

ආරාධනය මත සහභාගීවන්නන්

ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරීවරයා ආරාධනය මත රැස්වීම්වලට සහභාගී වේ.

කමිටුවේ ලේකම්

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා, අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා සහ පාලන කමිටුවේ ලේකම්වරයා ලෙස කටයුතු කරයි.

රැස්වීම්


2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය තුළ රැස්වීම් දෙකක් (2) පවත්වන ලදී.

කමිටුවේ කාර්යභාරය

- ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින් (KMP) හඳුනා ගැනීම, නාමයෝජනා කිරීම සහ නිර්දේශ කිරීම සඳහා විධිමත් හා විනිවිදභාවයකින් යුත් ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම.
- අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින් (KMP), 3 සහ 8.2 නියෝගයන්හි දක්වා ඇති නිර්ණායකවලට සහ අදාළ නීති හා රෙගුලාසිවලට අනුකූලව එම ධුරයන් දැරීමට සුදුසු සහ යෝග්‍ය පුද්ගලයින් බව සහතික කිරීම.
- ප්‍රධාන විධායක නිලධාරී තනතුර සහ ප්‍රධාන කළමනාකරණ තනතුරු සඳහා පත් කිරීම හෝ උසස් කිරීම සඳහා සලකා බැලීමට අවශ්‍ය සුදුසුකම්, පළපුරුද්ද සහ මූලික ගුණාංග වැනි නිර්ණායක නියම කිරීම. (ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින්ට (KMP) පහළ මට්ටමේ තනතුරු සඳහා පත් කිරීම් ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරීවරයා විසින් අනුමත කරනු ලැබේ).
  - බැංකුවේ මෙහෙයුම්වල විශාලත්වය, පරිමාණය, විවිධත්වය සහ සංකීර්ණත්වය සැලකිල්ලට ගනිමින්, කෙටි, මධ්‍යම සහ දිගුකාලීන අනුප්‍රාප්ති සැලසුම් සඳහා ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ පුද්ගල (KMP) තනතුරු පිරවීමට සුදුසු සහ දක්ෂ පුද්ගලයින් (අභ්‍යන්තර/බාහිර) හඳුනා ගැනීමට සඵලදායී සහ විනිවිදභාවයකින් යුත් ක්‍රියාවලියක් සහිත ශක්තිමත් අනුප්‍රාප්තික සැලැස්මක් බැංකුව සතුව ඇති බව සහතික කිරීම. ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින්ට (KMP) පහළ මට්ටමේ තනතුරු සඳහා පත් කිරීම් ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරීවරයා විසින් අනුමත කරනු ලැබේ.
  - අදාළ ක්ෂේත්‍රයන්හි පවතින කුසලතා/දැනුම පරතරයන් හඳුනාගෙන ඒවාට පිළියම් යෙදීම මගින් අදාළ තනතුරු සඳහා තෝරාගත් අනුප්‍රාප්තිකයින් පුහුණු කිරීම සූදානම් කිරීම.
  - අනුප්‍රාප්තික සැලැස්ම අවම වශයෙන් වාර්ෂික පදනමින් සමාලෝචනය කිරීම.
- බැංකු කර්මාන්තයට අදාළ වන නීති, රෙගුලාසි, සාර්ව ආර්ථික ප්‍රතිපත්ති, නවතම තාක්ෂණික වර්ධනයන් මෙන්ම මූල්‍ය ක්ෂේත්‍රයේ සහ වෙළඳපලේ ඇතිවන නැගී එන වර්ධනයන් පිළිබඳව අඛණ්ඩ පදනමින් අධ්‍යක්ෂවරුන්ව යාවත්කාලීන කිරීම සහතික කිරීම.
- අධ්‍යක්ෂවරුන්ගේ පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම සහ පුහුණුවීම්, ධාරිතා වර්ධනය සහ වෘත්තීය සංවර්ධන වැඩසටහන් සම්බන්ධයෙන් නිතිපතා අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කිරීම.
- අදාළ සියලුම නීති, රෙගුලාසි සහ කර්මාන්ත/ජාත්‍යන්තර හොඳම භාවිතයන් (Best practices) සැලකිල්ලට ගනිමින්, බැංකුවේ සමස්ත ආයතනික පාලන රාමුව සහ ප්‍රතිපත්ති සමාලෝචනය කිරීම, යාවත්කාලීන කිරීම සහ ඒවා සඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීම.

අනාගත අවධානය

අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරීවරයා මෙන්ම ආයතනික සහ විධායක කළමනාකාරීත්වයේ පත් කිරීම් බැංකුවේ ඉදිරි ගමන් මගට/දිශානතියට අනුකූල වන බව අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා සහ පාලන කමිටුව සහතික කරනු ඇත.



ඩී පී ලොකුආරච්චි
සභාපති – අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා සහ පාලන කමිටුව
2025 දෙසැම්බර් 31

අධ්‍යක්ෂ මණ්ඩල ආයෝජන බැංකුකරණ කමිටු වාර්තාව

සංයුතිය

අධ්‍යක්ෂ මණ්ඩල ආයෝජන බැංකුකරණ කමිටුව (BIBC), අධ්‍යක්ෂ මණ්ඩලයේ අවම වශයෙන් අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකුගෙන්, ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරීවරයාගෙන්, භාණ්ඩාගාර ප්‍රධානියාගෙන්, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අවදානම් කළමනාකරණය) සහ සහභාගී වීම සඳහා ආරාධනා කරනු ලබන වෙනත් ඕනෑම නිලධාරියෙකුගෙන් සමන්විත වේ.

සභාපති

සී එස් ගුණියංගොඩ මහතා (ස්වාධීන අධ්‍යක්ෂ) – 2025 ඔක්තෝබර් 22 දින සිට

අනෙකුත් සාමාජිකයින්

එස් එම් එස් සංජය බණ්ඩාර මහතා (ස්වාධීන අධ්‍යක්ෂ) – 2025 ඔක්තෝබර් 22 දින සිට

ජ ඒ එම් එඩිවර්ඩිස් මහත්මිය (ස්වාධීන අධ්‍යක්ෂ) – 2025 ඔක්තෝබර් 22 දින සිට

ක්ලයිව් ෆොන්සේකා මහතා – ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී

අනුර පෙරේරා මහතා – නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අවදානම් කළමනාකරණය)

ශමීලා ලොකු කළුගේ මහත්මිය – නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (භාණ්ඩාගාර, ආයෝජන සහ ජාත්‍යන්තර)

ආරාධනය මත සහභාගීවන්නන්

බැංකුවේ වෙනත් ඕනෑම නිලධාරියෙකුට ආරාධනය මත රැස්වීම් සඳහා සහභාගී විය හැකිය.

කමිටුවේ ලේකම්

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා, අධ්‍යක්ෂ මණ්ඩල ආයෝජන බැංකුකරණ කමිටුවේ ලේකම්වරයා ලෙස කටයුතු කරයි.

රැස්වීම්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය තුළ එක් (1) රැස්වීමක් පවත්වන ලදී.

ගණපූරණය

අධ්‍යක්ෂ මණ්ඩල ආයෝජන බැංකුකරණ කමිටු රැස්වීමක ගණපූරණය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු ඇතුළුව සාමාජිකයින් තිදෙනෙකු සහභාගී විය යුතුය.

කමිටුවේ කාර්යභාරය

- බැංකුවේ ආයෝජන බැංකුකරණ ආකෘතිය (Investment Banking model) නිතිපතා සමාලෝචනය කිරීම.
- ආයෝජන බැංකුකරණ ඒකකයේ (IBU) මෙහෙයුම් කටයුතු සමාලෝචනය කිරීම.
- විභව සේවාදායකයින්ගේ නම් පිළිබඳ අනුමැතිය (Name clearance) සහතික කිරීම.
- ඒකාබද්ධව කළමනාකරණය කරනු ලබන නිකුතුවලදී (Jointly managed issues) අදාළ අනුමැතිය ලබා ගැනීම.
- කළමනාකරණ ගාස්තු/තැරැව්කාර ගාස්තු බෙදාගැනීමේ ගිවිසුම් (Management fee/brokerage sharing agreements) සඳහා අනුමැතිය ලබා දීම.
- නව ආයෝජන සහ බැංකු නිෂ්පාදන හඳුන්වා දීම සහ ඒවා ඇතුළත් කිරීම සමාලෝචනය කිරීම.

අනාගත අවධානය

බැංකුව වෙනුවෙන් සඵලදායී ආයෝජනයන් සහතික කිරීම කෙරෙහි අධ්‍යක්ෂ මණ්ඩල ආයෝජන බැංකුකරණ කමිටුව අවධානය යොමු කරනු ඇත.



සී එස් ගුණියංගොඩ

සභාපති – අධ්‍යක්ෂ මණ්ඩල ආයෝජන බැංකුකරණ කමිටුව

2025 දෙසැම්බර් 31

අධ්‍යක්ෂ මණ්ඩල උපායමාර්ගික සැලසුම් සමාලෝචන කමිටු වාර්තාව

සංයුතිය

අධ්‍යක්ෂ මණ්ඩල උපායමාර්ගික සැලසුම් සමාලෝචන කමිටුව (BSPRC), මණ්ඩලයේ සභාපතිවරයා, විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු සහ ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරීවරයාගෙන් සමන්විත වේ.

සභාපති

මහාචාර්ය පී එන් ඩී ප්‍රනාන්දු (ස්වාධීන නොවන අධ්‍යක්ෂ)

අනෙකුත් සාමාජිකයින් (අධ්‍යක්ෂවරුන්)

ආර් බී ආර් වීමර්සන් මහතා (ස්වාධීන නොවන අධ්‍යක්ෂ) – 2025 ඔක්තෝබර් 22 දිනට

සී එස් ගුණියංගොඩ මහතා (ස්වාධීන අධ්‍යක්ෂ) – 2025 ඔක්තෝබර් 22 දින සිට

එම් එච් එස් ගවුස් මහතා (ස්වාධීන අධ්‍යක්ෂ) – 2025 නොවැම්බර් 14 දින සිට

ක්ලයිව් ෆොන්සේකා මහතා – ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී

ආරාධනය මත සහභාගීවන්නන්

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (උපායමාර්ගික සැලසුම්කරණය, කාර්යසාධන කළමනාකරණය සහ පර්යේෂණ) සහ බැංකුවේ වෙනත් ඕනෑම නිලධාරියෙකු ආරාධනය මත රැස්වීම් සඳහා සහභාගී විය හැකිය.

කමිටුවේ ලේකම්

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා, අධ්‍යක්ෂ මණ්ඩල උපායමාර්ගික සැලසුම් සමාලෝචන කමිටුවේ ලේකම්වරයා ලෙස කටයුතු කරයි.

රැස්වීම්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය තුළ රැස්වීම් හතරක් (4) පවත්වන ලදී.

ගණපූරණය


අධ්‍යක්ෂ මණ්ඩල උපායමාර්ගික සැලසුම් සමාලෝචන කමිටු රැස්වීමක ගණපූරණය සඳහා මණ්ඩල සාමාජිකයින් තිදෙනෙකු (3) සහභාගී විය යුතුය.

කමිටුවේ කාර්යභාරය

- උපායමාර්ගික සැලසුම (Strategic Plan), එහි ක්‍රියාවලීන්, ප්‍රගතිය සහ ඇගයීම් සමාලෝචනය කිරීම සහ අවශ්‍ය නිවැරදි කිරීමේ පියවර නිර්දේශ කිරීම.
- බැංකුවේ උපායමාර්ග, අරමුණු, සැලසුම් සහ අයවැය සැලකිල්ලට ගනිමින් බැංකුවේ කාර්යසාධනය සමාලෝචනය කිරීම සහ අවශ්‍ය අවස්ථාවලදී නිවැරදි කිරීමේ පියවර ක්‍රියාත්මක වන බව සහතික කිරීම.
- ප්‍රතිපත්තිමය තීරණ ගැනීම: කමිටුවේ කටයුතු කරගෙන යාම සඳහා අවශ්‍ය නිසි බලතල පවතින බව සහතික කිරීම පිණිස එහි විෂය පථය, නිපුනතාවයන් සහ සම්පත්වල ප්‍රමාණවත්භාවය සමාලෝචනය කිරීම; තවද ඊට අදාළව එම කාර්යයන් සඳහා වන විෂය පථය, කාර්ය සාධන ඇගයීම සහ අයවැය පිළිබඳව තීරණය කිරීම.
- උපායමාර්ගික සැලසුම්කරණය, කාර්යසාධන කළමනාකරණය සහ පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද නිරීක්ෂණ මත පදනම්ව, අදාළ දෙපාර්තමේන්තුව/දෙපාර්තමේන්තු සඳහා නිවැරදි කිරීමේ පියවරයන් සක්‍රීයව නිර්දේශ කිරීම.
- සාර්ව-පරිසරයේ (Macro-environment) සිදුවන වෙනස්කම් මත පදනම්ව, ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ හැකි උපායමාර්ග සකස් කිරීම සහ නිර්දේශ කිරීම සහතික කිරීම.

අනාගත අවධානය

බැංකුවේ දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා වූ විශ්වාසනීය වගකීම (Fiduciary Responsibility) ඉටුකිරීමෙහිලා අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වීම කෙරෙහි, මණ්ඩල උපායමාර්ගික සැලසුම් සමාලෝචන කමිටුව අවධානය යොමු කරනු ඇත.



මහාචාර්ය පී එන් ඩී ප්‍රනාන්දු
සභාපති
2025 දෙසැම්බර් 31

සම්බන්ධිත පාර්ශ්වීය ගනුදෙනු සමාලෝචන කමිටු වාර්තාව

සංයුතිය

සම්බන්ධිත පාර්ශ්වීය ගනුදෙනු සමාලෝචන කමිටුව (RPTRC) විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වන අතර, ඉන් බහුතරයක් ස්වාධීන අධ්‍යක්ෂවරුන් වේ. කමිටුවේ සභාපතිවරයා ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු විය යුතු අතර ඔහු අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයා නොවිය යුතුය. මෙම කමිටුව 2025 නොවැම්බර් 14 දින පිහිටුවන ලදී.

සභාපති

ජී ඒ එම් එඩිවර්ඩිස් මහත්මිය (ස්වාධීන අධ්‍යක්ෂ) – 2025 නොවැම්බර් 14 දින සිට.

අනෙකුත් සාමාජිකයින් (අධ්‍යක්ෂවරුන්)

සී එස් ගුණියංගොඩ මහතා (ස්වාධීන අධ්‍යක්ෂ) – 2025 නොවැම්බර් 14 දින සිට

එම් එච් එස් ගවුස් මහතා (ස්වාධීන අධ්‍යක්ෂ) – 2025 නොවැම්බර් 14 දින සිට

අවශ්‍යතාවය පරිදි සහභාගීවන්නන්

ක්ලයිව් ෆොන්සේකා මහතා – ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී

සමන්ති සේනානායක මහත්මිය – නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අනුකූලතාව)

කමිටුවේ ලේකම්

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා, සම්බන්ධිත පාර්ශ්වීය ගනුදෙනු සමාලෝචන කමිටුවේ ලේකම්වරයා ලෙස කටයුතු කරයි.

රැස්වීම්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය තුළ එක් (1) රැස්වීමක් පවත්වන ලදී.

ගණපූරණය

සම්බන්ධිත පාර්ශ්වීය ගනුදෙනු සමාලෝචන කමිටු රැස්වීමක ගණපූරණය සඳහා සාමාජිකයින් දෙදෙනෙකු (2) සහභාගී විය යුතුය.

කමිටුවේ කාර්යභාරය

- ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝගයන්ට සහ අනෙකුත් අදාළ ප්‍රමිතීන්, නීති සහ රෙගුලාසිවලට අනුකූලව සියලුම සම්බන්ධිත පාර්ශ්වීය ගනුදෙනු සමාලෝචනය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වීම.
- බැංකුවේ අනෙකුත් ගනුදෙනුකරුවන්ට ලබා නොදෙන ආකාරයේ "වඩාත් වාසිදායක සැලකිලි" (More favourable treatment) සම්බන්ධිත පාර්ශ්වයන් වෙත හිමිවන අයුරින් බැංකුව ඔවුන් සමඟ ගනුදෙනු නොකරන බව කමිටුව සහතික කරයි.

අනාගත අවධානය

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කලින් කලට නිකුත් කරනු ලබන සම්බන්ධිත පාර්ශ්වීය ගනුදෙනුවලට අදාළ මාර්ගෝපදේශවලට අනුකූලව බැංකුව කටයුතු කර ඇති බව සහතික කිරීමේ අරමුණින් සම්බන්ධිත පාර්ශ්වීය ගනුදෙනු සමාලෝචන කමිටුව පිහිටුවා ඇත.



ජී ඒ එම් එඩිවර්ඩිස්

සභාපති – සම්බන්ධිත පාර්ශ්වීය ගනුදෙනු සමාලෝචන කමිටුව

2025 දෙසැම්බර් 31

මූල්‍ය වාර්තාකරණය කෙරෙහි අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය

වගකීම

2024 අංක 5 දරන බැංකු පනතේ විධිවිධානවල 9.2 (ආ) වගන්තියට අනුකූලව, මහජන බැංකුවේ ("බැංකුව") මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනය සම්බන්ධ මෙම වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලබයි.

බැංකුව තුළ ක්‍රියාත්මක වන අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයේ ප්‍රමාණවත්භාවය සහ සඵලදායීතාවය පිළිබඳ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය ("මණ්ඩලය") සතු වේ. එවැනි ප්‍රමාණවත්භාවයක් සහ සඵලදායීතාවයක් පිළිබඳව සලකා බැලීමේදී, බැංකු ව්‍යාපාරයක පවතින අවදානම සහ ප්‍රතිලාභ කළමනාකරණය කළ පදනමක් මත සමබරව පවත්වා ගත යුතු බව මණ්ඩලය පිළිගනී. ඒ අනුව, අභ්‍යන්තර පාලන පද්ධති මූලික වශයෙන් සැලසුම් කර ඇත්තේ බැංකුවේ අවදානම් දරා ගැනීමේ සීමාවන් (Risk appetite) සහ දර්ශකයන්ගෙන් බැහැර වන ඕනෑම අවස්ථාවක් හඳුනා ගැනීම සඳහාය

ඉහත සඳහන් කරුණු සැලකිල්ලට ගැනීමේදී, මූල්‍ය ප්‍රකාශනවල සිදුවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ට එරෙහිව, අභ්‍යන්තර පාලන පද්ධතිය මගින් ලබා දිය හැක්කේ සාධාරණ සහතිකයක් වන නමුත් පරම සහතිකයක් නොවේ.

බැංකුව මුහුණ දෙන සැලකිය යුතු අවදානම් හඳුනා ගැනීම, ඇගයීම සහ කළමනාකරණය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අඛණ්ඩව ක්‍රියාත්මක වන ක්‍රියාවලියක් ස්ථාපිත කර ඇති අතර ව්‍යාපාරික පරිසරයේ හෝ නියාමන මාර්ගෝපදේශවල වෙනස්කම් සිදුවන අවස්ථාවලදී මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන පද්ධතිය තවදුරටත් ශක්තිමත් කිරීම ද මෙම ක්‍රියාවලියට ඇතුළත් වේ. මෙම ක්‍රියාවලිය, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද "අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය සම්බන්ධයෙන් බැංකු අධ්‍යක්ෂවරුන් සඳහා වන මාර්ගෝපදේශයට" අනුකූලව මණ්ඩලය විසින් නිරන්තරයෙන් සමාලෝචනය කරනු ලබයි. එම මාර්ගෝපදේශයෙහි දක්වා ඇති අභ්‍යන්තර පාලන පද්ධති ඇගයීමේ මූලධර්මයන් සැලකිල්ලට ගනිමින්, මණ්ඩලය විසින් මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනය තක්සේරු කර ඇත.

පවතින මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන පද්ධතිය මූල්‍ය වාර්තාකරණයේ විශ්වාසනීයත්වය සම්බන්ධයෙන් සාධාරණ සහතිකයක් ලබා දීමට තරම් ශක්තිමත් සහ ප්‍රමාණවත් බවත්, බාහිර අවශ්‍යතාවන් සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම අදාළ ගිණුම්කරණ මූලධර්ම සහ නියාමන අවශ්‍යතාවලට අනුකූල බවත් අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය වේ.

අවදානම් සහ පාලනය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක කිරීම සඳහා කළමනාකාරීත්වය අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වේ. එහිදී ඔවුන් මුහුණ දීමට සිදුවන අවදානම් හඳුනා ගැනීම සහ තක්සේරු කිරීම මෙන්ම, එම අවදානම් අවම කිරීම සහ පාලනය කිරීම සඳහා සුදුසු අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම සිදු කරනු ලබයි.

මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන පද්ධතියේ සැලසුම් සහ ඵලදායීතාවය සමාලෝචනය කිරීම සඳහා අනුගමනය කරන ලද ක්‍රියාවලියේ ප්‍රධාන ලක්ෂණ

මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලන පද්ධතියේ ප්‍රමාණවත්භාවය සහ සුපිළිපන්බව සමාලෝචනය කිරීම සඳහා ස්ථාපිත කර ඇති ප්‍රධාන ක්‍රියාවලීන්ට පහත සඳහන් කරුණු ඇතුළත් වේ:

- බැංකුවේ දෛනික මෙහෙයුම්වල ඵලදායීතාවය සහතික කිරීම සඳහාත්, බැංකුවේ මෙහෙයුම් ආයතනික අරමුණු, උපායමාර්ග සහ වාර්ෂික අයවැයට මෙන්ම අනුමත කරන ලද ප්‍රතිපත්ති සහ ව්‍යාපාරික දිශානතීන්ට අනුකූල සිදුවන බව සහතික කිරීම සඳහාත් අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වීම පිණිස මණ්ඩල අනුකමිටු ස්ථාපිත කිරීම.
- බැංකුවේ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටිවලට අනුකූල වීම සහ අභ්‍යන්තර පාලන පද්ධතිවල ඵලදායීතාවය, නියැදි සහ මාරුවෙන් මාරුවට සිදු කරන ක්‍රියා පටිපාටි භාවිත කරමින් අඛණ්ඩ පදනමක් මත පරීක්ෂා කරනු ලබන අතර කිසියම් අනනුකූලවීමක් සම්බන්ධයෙන් වන සැලකිය යුතු සොයා ගැනීම් ඉස්මතු කර දක්වයි. ස්වාධීන සහ අපක්ෂපාතී වාර්තාවක් ලබා දීම සඳහා, අනුමත අවදානම් ශ්‍රේණිගත කිරීමේ ක්‍රමවේදයන් භාවිතයෙන් තක්සේරු කරන ලද අවදානම් මට්ටම අනුව තීරණය කරනු ලබන වාර ගණනකට යටත්ව, සියලුම ඒකක සහ ශාඛා තුළ අභ්‍යන්තර විගණන කටයුතු සිදු කරනු ලැබේ. වාර්ෂික විගණන සැලසුම මණ්ඩල විගණන කමිටුව විසින් සමාලෝචනය කර අනුමත කරනු ලබයි. අනුමත වාර්ෂික විගණන සැලසුමට අනුකූලව, අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විවිධ ක්‍රමවේදයන් භාවිත කරමින් ස්ථානීය මෙන්ම ස්ථානීය නොවන අභ්‍යන්තර විගණන කටයුතු සිදු කරයි. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ සොයා ගැනීම් වරින් වර පවත්වනු ලබන රැස්වීම්වලදී සමාලෝචනය කිරීම සඳහා මණ්ඩල විගණන කමිටුව (BAC) වෙත ඉදිරිපත් කරනු ලබයි.
- බැංකුවේ මණ්ඩල විගණන කමිටුව (BAC) විසින් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව, බාහිර විගණකවරුන්, නියාමන බලධාරීන් සහ කළමනාකාරීත්වය විසින් හඳුනාගනු ලබන අභ්‍යන්තර පාලන ගැටලු සමාලෝචනය කරනු ලබන අතර, අවදානම් කළමනාකරණ සහ අභ්‍යන්තර පාලන පද්ධතිවල ප්‍රමාණවත්භාවය සහ සඵලදායීතාවය ඇගයීමට ලක් කරයි. එමෙන්ම, විගණන විෂය පථය සහ එහි ගුණාත්මකභාවය පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරමින් අභ්‍යන්තර විගණන කාර්යයන් ද ඔවුන් විසින් සමාලෝචනය කරනු ලබයි. මණ්ඩල විගණන කමිටු රැස්වීම්වල වාර්තා, වරින් වර පවත්වනු ලබන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වෙත ඉදිරිපත් කරනු ලැබේ. බැංකුවේ මණ්ඩල විගණන කමිටුව විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ විස්තර මණ්ඩල විගණන කමිටු වාර්තාවේ දක්වා ඇත (පිටුව 298 බලන්න).

- මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනයන් තක්සේරු කිරීමේදී, බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවල ඇති වැදගත් ගිණුම් සහ අනාවරණයන් හා සම්බන්ධ සියලුම ක්‍රියා පටිපාටි සහ පාලනයන් සමාලෝචනය කිරීම සහ යාවත්කාලීන කිරීම බැංකුවේ හඳුනාගත් නිලධාරීන් විසින් අඛණ්ඩව සිදු කරන ලදී. මෙම ක්‍රියා පටිපාටි සහ පාලනයන් සැලසුම් කිරීමේ යෝග්‍යතාවය සහ ඒවායේ සඵලදායීතාවය අඛණ්ඩ පදනමක් මත තහවුරු කිරීම බැංකුවේ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් තවදුරටත් සිදු කරන ලදී.
- LKAS සහ SLFR වලින් සමන්විත ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් අනුගමනය කිරීමේදී, හඳුනාගැනීම, මිනුම්කරණය, වර්ගීකරණය සහ අනාවරණය කිරීමේ අවශ්‍යතාවලට අනුකූල වීම සඳහා වන ක්‍රියාවලීන්හි ක්‍රමික දියුණුවක් ලබා ගනිමින් පවතින අතර; ණය සහ අත්තිකාරම් හානිකරණය, ණයපත් මෙහෙයුම්, කළමනාකරණ තොරතුරු පද්ධතිය සහ අවදානම් කළමනාකරණය හා සම්බන්ධිත පාර්ශ්වයන්ට අදාළ මූල්‍ය ප්‍රකාශන අනාවරණයන් සම්බන්ධ ක්‍රියාවලීන් තවදුරටත් ශක්තිමත් කිරීම සිදු කරනු ලැබේ. මෙම තක්සේරුව සඳහා බැංකුවේ අනුබද්ධ සමාගම් ඇතුළත් කර නොමැත.
- 2018 වර්ෂයේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය – SLFR 9 (මූල්‍ය මෙවලම්) හි අවශ්‍යතාවයන් ක්‍රියාත්මක කිරීමට බැංකුව අවශ්‍ය පියවර ගන්නා ලදී. ඒ සඳහා අවශ්‍ය ආකෘති ක්‍රියාත්මක කර ඇති අතර අදාළ ක්‍රියාවලීන් සහ පාලනයන් සැලසුම් කර ඇත. SLFR 9 ප්‍රමිතියට අනුකූලව සත්‍යාපනය සහ අනුකූලතාවය සඳහා අවශ්‍ය වන කළමනාකරණ තොරතුරු පද්ධතිය සහ වාර්තාකරණය පිළිබඳ ක්‍රියාවලීන් සහ පාලනයන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අඛණ්ඩව ශක්තිමත් කරනු ලැබේ.
- අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් මුළු ශාඛා ජාලයම ආවරණය වන පරිදි පරිගණක ආධාරක විගණන තාක්ෂණවේද/මෙවලම් (CAATs) භාවිත කරමින් බැංකුවේ තෝරාගත් ඇතැම් ක්‍රියාවලීන් පිළිබඳ දත්ත විශ්ලේෂණයන් සිදු කරන ලදී. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් හඳුනාගත් සියලුම සැලකිය යුතු සොයා ගැනීම් වරින් වර පවත්වනු ලබන රැස්වීම්වලදී සමාලෝචනය කිරීම සඳහා මණ්ඩල විගණන කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී.

තහවුරු කිරීම

ඉහත සඳහන් ක්‍රියාවලීන් මත පදනම්ව, බැංකුවේ මූල්‍ය වාර්තාකරණ පද්ධතියේ විශ්වාසනීයත්වය සම්බන්ධයෙන් සහ බාහිර අවශ්‍යතාවන් සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් සාධාරණ සහතිකයක් ලබා දෙන අයුරින් මූල්‍ය වාර්තාකරණ පද්ධතිය සැලසුම් කර ඇති බවත්; එය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමන අවශ්‍යතාවලට අනුකූලව සිදු කර ඇති බවත් අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තහවුරු කරයි

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

එස් එම් එස් සංජය බණ්ඩාර
අධ්‍යක්ෂ
2026 පෙබරවාරි 24

ජී ඒ එම් එඩිවර්ඩිස්
අධ්‍යක්ෂ
2026 පෙබරවාරි 24

අභ්‍යන්තර පාලනයන් පිළිබඳ විගණකාධිපතිවරයාගේ සහතික කිරීමේ වාර්තාව


ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. BAN/D/PB/IC/2025
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 24 March 2026

සභාපති
මහජන බැංකුව

මහජන බැංකුවේ මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් වූ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත විගණකාධිපතිවරයා ඉදිරිපත් කරන ස්වාධීන සහතික කිරීමේ වාර්තාව

හැඳින්වීම

මෙම වාර්තාවේ අරමුණ වන්නේ, 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති, මහජන බැංකුවේ ("බැංකුව") අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනයෙහි ("ප්‍රකාශනය") අන්තර්ගත මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනය සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය පිළිබඳ සහතිකයක් ලබා දීමයි.

කළමනාකාරිත්වයේ වගකීම

බලපත්‍රලාභී බැංකුවල ආයතනික පාලනය පිළිබඳ 2024 අංක 5 දරන බැංකු පනතේ විධිවිධානවල 9.2 (ආ) වගන්තියට අනුකූලව මෙම ප්‍රකාශය පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම කළමනාකාරිත්වයේ වගකීම වේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති 3050ට (සංශෝධිත) මගේ වගකීම සහ අනුකූලතාවය

මගේ වගකීම වන්නේ, අධ්‍යක්ෂවරුන් විසින් හෝ ඔවුන් වෙනුවෙන් පිළියෙල කරන ලද ලේඛන මගින් මෙම ප්‍රකාශනය තහවුරු වන්නේද යන්න සහ බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතියේ සැලසුම් සහ සඵලදායීතාවය සමාලෝචනය කිරීම සඳහා අධ්‍යක්ෂවරුන් අනුග මනය කර ඇති ක්‍රියාවලිය එමගින් නිසි පරිදි පිළිබිඹු කරන්නේද යන්න තක්සේරු කිරීමයි.

මම මෙම සහතික කිරීමේ කාර්යය, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය සම්බන්ධයෙන් බැංකු සඳහා වන සහතික කිරීමේ වාර්තාව වන ශ්‍රී ලංකා ප්‍රමිති (SLSAE) 3050ට (සංශෝධිත) අනුකූලව සිදු කළෙමි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

කළමනාකාරිත්වය විසින් මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන ප්‍රකාශය සියලුම සැලකිය යුතු අංශයන්ගෙන් නිසි පරිදි පිළියෙල කර තිබේද යන්න පිළිබඳව සීමිත සහතිකයක් ලබා ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියා පටිපාටි සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම මෙම ප්‍රමිතිය මගින් මා වෙත නියම කෙරේ.

මෙම සහතික කිරීමේ කාර්යයේ අරමුණ සඳහා, කිසිදු වාර්තාවක් යාවත්කාලීන කිරීමට හෝ නැවත නිකුත් කිරීමට මා වගකිව යුතු නොවන අතර, මෙම කාර්යය අතරතුර මම මූල්‍ය තොරතුරු පිළිබඳ විගණනයක් හෝ සමාලෝචනයක් සිදු කර නොමැත.

සිදු කරන ලද කාර්යයන් පිළිබඳ සාරාංශය

අධ්‍යක්ෂවරුන් විසින් හෝ ඔවුන් වෙනුවෙන් පිළියෙල කරන ලද ලේඛන මගින් මෙම ප්‍රකාශය තහවුරු වන්නේද යන්න සහ බැංකුවේ මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන පද්ධතිය සමාලෝචනය කිරීම සඳහා අධ්‍යක්ෂවරුන් අනුගමනය කර ඇති ක්‍රියාවලිය එමගින් නිසි පරිදි පිළිබිඹු කරන්නේද යන්න තක්සේරු කිරීම සඳහා මම මෙම සහතික කිරීමේ කාර්යය සිදු කළෙමි.

මෙහිදී අනුගමනය කරන ලද ක්‍රියා පටිපාටි මූලික වශයෙන් බැංකු කාර්ය මණ්ඩලයෙන් විමසීම් කිරීම සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ක්‍රියාවලිය සනාථ කරන ලේඛන පවතින්නේ ද යන්න පිළිබඳව නියැදි පදනමක් මත පරීක්ෂා කිරීමට සීමා විය.

මෙම ප්‍රකාශය මගින් බැංකුවේ සියලුම අවදානම් සහ පාලනයන් ආවරණය වන්නේද යන්න සලකා බැලීමට හෝ බැංකුවේ අවදානම් සහ පාලන ක්‍රියා පටිපාටිවල සඵලදායීතාවය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට SLSAE 3050 (සංශෝධිත) ප්‍රමිතිය මගින් මා වෙත නියම නොකෙරේ. එමෙන්ම, වාර්ෂික වාර්තාවේ අනාවරණය කර ඇති යම් සැලකිය යුතු ගැටලුවලට අදාළ මූල්‍ය පාලන අංශයන් හැසිරවීම සඳහා විස්තර කර ඇති ක්‍රියාවලීන් මගින් එම ගැටලු ඇත්ත වශයෙන්ම විසඳෙනු ඇත්ද යන්න සලකා බැලීමට ද SLSAE 3050 (සංශෝධිත) ප්‍රමිතිය මගින් මා වෙත නියම නොකෙරේ.

තෝරාගනු ලබන ක්‍රියා පටිපාටි, බැංකුවේ ස්වභාවය සහ මෙම ප්‍රකාශනය පිළියෙල කිරීමට පාදක වූ සිදුවීම් හෝ ගනුදෙනු පිළිබඳ මගේ අවබෝධය සැලකිල්ලට ගනිමින්, මගේ විනිශ්චය මත පදනම් වේ.

මගේ නිගමනය සඳහා පදනමක් සැපයීමට මා ලබාගෙන ඇති සාක්ෂි ප්‍රමාණවත් සහ යෝග්‍ය බව මම විශ්වාස කරමි.

නිගමනය

අනුගමනය කරන ලද ක්‍රියා පටිපාටි මත පදනම්ව, වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති ප්‍රකාශය, බැංකුවේ මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන පද්ධතියේ සැලසුම් සහසඵලදායීතාවය සමාලෝචනය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය අනුගමනය කර ඇති ක්‍රියාවලිය පිළිබඳ මගේ අවබෝධය සමඟ අනනුකූල බවට විශ්වාස කිරීමට හේතු වන කිසිදු කරුණක් මගේ අවධානයට ලක් වී නොමැත.

එල් එස් අයි ජයරත්න
විගණකාධිපති



මූල්‍ය වාර්තා



312
මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

313
මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව

316
ආදායම් ප්‍රකාශය

317
විස්තීර්ණ ආදායම් පිළිබඳ ප්‍රකාශය

318
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

320
ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශය - බැංකුව

322
ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශය - සමූහය

324
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

325
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

මහජන බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම සහ බැංකුවේ සහ එහි පරිපාලිත සමාගම්වල (සමූහය) ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පහත සඳහන් ප්‍රකාශ තුළ දක්වා ඇත.

මූල්‍ය ප්‍රකාශ

බැංකුවේ මූල්‍ය ප්‍රකාශන ආයතනික කළමනාකාරිත්වයේ ජ්‍යේෂ්ඨ සාමාජිකයෙක් වන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී/වැඩබලන මූල්‍ය ප්‍රධානීගේ අධීක්ෂණය යටතේ පිළියෙල කරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුවේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන මගින්:

- 2025 දෙසැම්බර් 31 දිනට බැංකුවේ සහ සමූහයේ කටයුතුවල තත්ත්වය, සහ
- 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා බැංකුවේ සහ සමූහයේ මූල්‍ය කාර්යසාධනය පිළිබඳ සත්‍ය හා සාධාරණ දැක්මක් ලබා දෙන බව සහතික කරයි.

අධ්‍යක්ෂ මණ්ඩලය මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට සහයවීම සඳහා පහත කරුණු තුළින් මූල්‍ය වාර්තාකරණය සඳහා කළමනාකරණ වගකීම් අධීක්ෂණය කරයි:

- යම් වැදගත් අපගමනයන් පිළිබඳ පැහැදිලි අනාවරණ සහ පැහැදිලි කිරීම් සමඟ සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ ඒවා ස්ථිරව යොදා ගැනීම.
- ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLFRS/LKAS) සහ එයට පාදක වූ ගිණුම් පොත්වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.
- සාධාරණ හා විවේකෂණ විනිශ්චයන් සහ ඇස්තමේන්තු සිදුකර ඇති අතර, ගනුදෙනුවල ස්වරූපය හා හරය විධිමත්ව පිළිබිඹු කෙරේ.
- මූල්‍ය ප්‍රකාශන මගින් 1988 අංක 30 දරණ බැංකු පනතේ සහ එහි සංශෝධනවල අවශ්‍යතාවන්ට අනුව තොරතුරු ලබා දේ.

අඛණ්ඩතා පැවැත්ම

බැංකුවට සහ සමූහයට සිය මෙහෙයුම් අඛණ්ඩව පවත්වාගෙන යාමට සහ මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අඛණ්ඩතා පැවැත්ම පදනම යොදාගැනීම සාධාරණය කිරීමට ප්‍රමාණවත් සම්පත් ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කර ඇත. 2025 මූල්‍ය වර්ෂය තුළ, බැංකුවේ සහ සමූහයේ ව්‍යාපාර මෙහෙයුම් කෙරෙහි පවත්නා දේශීය හා ගෝලීය ආර්ථික ගැටළු, දිත්වා සුළි කුණාටුව සහ එහි බලපෑම් අධ්‍යක්ෂවරු සලකා බලා ඇත.

අභ්‍යන්තර පාලනය, අවදානම් කළමනාකරණය සහ අනුකූලතාව

අධ්‍යක්ෂ මණ්ඩලය ඵලදායී සහ විස්තීර්ණ අභ්‍යන්තර පාලනයන් ස්ථාපිත කර ඇත. මෙය අභ්‍යන්තර පරීක්ෂාවන්, අභ්‍යන්තර විගණනය සහ නිසි ආකාරයෙන් බැංකු ව්‍යාපාරය කරගෙන යාමට සහ වත්කම් ආරක්ෂා කිරීමට සහ වාර්තාවල නිරවද්‍යතාව සහ විශ්වාසය ආරක්ෂා කිරීමට අවශ්‍ය මූල්‍ය සහ වෙනත් පාලනයන්ගෙන් සමන්විත වේ. අධ්‍යක්ෂ මණ්ඩලය අවදානම් පාලනය, අවදානම් රුචි මට්ටම් තීරණය කිරීම, අවදානම් ප්‍රතිපත්ති සකස් කිරීම සහ ක්‍රියාත්මක අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටිවල ඵලදායිත්වය සහතික කිරීම සඳහා වගකීමට බැඳී සිටී. අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC) අවදානම් ආශ්‍රිත රාජකාරී ඉටු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට සහයවන අතර අවදානම් පාලන ව්‍යූහය, ප්‍රතිපත්ති රාමුව, ප්‍රමිති සහ ක්‍රියාවලි ක්‍රියාත්මක කිරීම ප්‍රමාණාත්මතාව සහ ඵලදායිතාව සහතික කරමින් අවදානමට අදාළ සියලුම අංශවලට ස්වාධීනව පාලනය ලබා දේ. අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ වාර්තාව 300 පිටුවේ දැක්වේ. විවේක්ෂණ අවශ්‍යතාවයන්, රෙගුලාසි, නීති රීති හා අභ්‍යන්තර පාලන වලට අනුකූලව කටයුතු කරන ලද බවටත් ඕනෑම කරුණක පවතින අනනුකූලතාවය නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇති බවටත් අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කරයි.

විගණන වාර්තාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 154 ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුව විගණකාධිපති බැංකුවේ විගණකවරයා වන අතර, බැංකුවේ මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සහ මූල්‍ය වාර්තාකරණය සම්බන්ධව අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය පිළිබඳ අවසන් මතය නිකුත් කරන අතර, එය පිළිවෙලින් 306 සහ 307 යන පිටුවල ප්‍රකාශ කර ඇත. එමෙන්ම ඔහු ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කළ බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා ආයතනික පාලනය පිළිබඳ 2024 අංක 05 දරන බැංකු පනත් නියෝගය සමඟ අනුකූලතා මට්ටම් සහතික කරයි.

අනුකූලතාව

අධ්‍යක්ෂ මණ්ඩලය, සිය තක්සේරු කිරීම මත පදනම් වී, සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූලව ගිණුම්කරණ පාලනයන් ප්‍රමාණවත් බවට, සහ බැංකුවට යම් වැදගත් අලාභයන් ඇති කරවන යම් බිඳවැටීම් සඳහන් කිරීමට සිය අවධානය යොමු නොවූ බවට සහතික කරයි. එමෙන්ම, මෙහෙයුම්වල අඛණ්ඩතාව පවත්වා ගැනීමට සහ දැකියහැකි අනාගතය සඳහා අඛණ්ඩතා පැවැත්මක් ලෙස පවත්වා ගැනීමට බැංකුවට ප්‍රමාණවත් සම්පත් ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කර සිටී.

ඉහත ප්‍රකාශනයේ දක්වා ඇති පරිදි සිය වගකීම් මුදාහැර ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි



ශ්‍යාමා විජේකෝන්
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්
2026 පෙබරවාරි 25

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව


ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. BAN/D/PB/FA/2025 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 26 February 2026

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මහජන බැංකුවේ සහ එහි පරිපාලිත සමාගම්වල මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව විගණකාධිපති වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් හිඟුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මහජන බැංකුවේ (“බැංකුව”) මූල්‍ය ප්‍රකාශන සහ බැංකුව සහ එහි පරිපාලිත සමාගම්වල (“සමූහය”) ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණනය, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ සිදු කරන ලදී.

1971 අංක 38 දරන මුදල් පනතේ 5 (1) වගන්තිය අනුව මුදල් අමාත්‍යවරයාට පැවරෙන බලතල අනුව 1992 මැයි 14 දින අංක 715 දරන රජයේ ගැසට් පත්‍රයෙහි ප්‍රකාශයට පත්කරන ලද නියෝගයක් මඟින් එකී පනතේ 11 කොටසේ විධිවිධානවලින් බැංකුව නිදහස් කරනු ලැබ ඇත.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ. මෙම විගණනය කරගෙන යාමට, පොදු ව්‍යවහාරයේ වරලත් ගණකාධිකාරී ආයතනයක් මාහට සහය විය.

බැංකුවේ සහ සමූහයේ මෙම මූල්‍ය ප්‍රකාශනවලින් 2025 දෙසැම්බර් 31 දිනට බැංකුවේ සහ සමූහයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බවත් සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා හිඟුම්කරණ ප්‍රමිතිවලට අනුකූල බවත් මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන කොටසේ විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 බැංකුවේ 2025 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

අනෙකුත් තොරතුරු සමන්විත වන්නේ මූල්‍ය ප්‍රකාශන සහ විගණන වාර්තාවට අමතරව බැංකුවේ 2025 වාර්ෂික වාර්තාවේ ඇතුලත් අනෙකුත් තොරතුරු වන අතර, එම තොරතුරු මෙම විගණන වාර්තාවේ දිනයට පසු මා වෙත ලබාගැනීමට සැලැස්වීම අපේක්ෂා කෙරේ. එබැවින් අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකීමට බැඳී සිටී.

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර එහි අන්තර්ගතය පිළිබඳව කිසිදු සහතික කරන අදහසක් මම ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනය සම්බන්ධයෙන්, මගේ වගකීම වන්නේ අනෙකුත් තොරතුරු ලබාගැනීමට හැකි අවස්ථාවේදී හඳුනාගනු ලබන තොරතුරු කියවීම වන අතර, එසේ කරමින් අනෙකුත් තොරතුරු මූල්‍ය සමඟ සැලකියයුතු ලෙස නොගැලපේද යන්න සහ විගණනය තුළ හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම සැලකියයුතු ලෙස වැරදියට සඳහන් කර ඇති බව පෙන්නුම් කරන්නේද යන්න සලකා බැලීමයි.

බැංකුවේ 2025 වාර්ෂික වාර්තාව මම කියවීමේදී. එහි වැදගත් අවප්‍රකාශ ඇති බව මම පවසන්නේනම්, නිවැරදි කිරීම සඳහා පාලනය සඳහා වගකියන පුද්ගලයින්ට එම කරුණු දැනුම් දීම අවශ්‍ය වේ. තවදුරටත් වැදගත් නිවැරදි නොකළ අවප්‍රකාශ පවතීනම්, යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථා තුළ විධිවිධානවලට අනුව මගේ වාර්තාවට ඒවා ඇතුළත් කරනු ලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශ්වයන්ගේ වගකීම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ දැක්මක් ලබාදෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යයයි කළමනාකරණය තීරණය කරන අභ්‍යන්තර පාලනයන් සඳහා කළමනාකරණය වගකීමට බැඳී සිටී.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අඛණ්ඩ පැවැත්මක් ලෙස පවත්වා ගෙන යාමේ සමූහයේ හැකියාව තක්සේරු කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම්, හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමූහයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

බැංකුවේ හා සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය සඳහා පාලනය කරන පාර්ශ්වයන් වගකීම දරනු ලබයි.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතෙහි 16 (1) වගන්තිය ප්‍රකාරව, බැංකුව සහ සමූහය විසින් බැංකුවේ සහ සමූහයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අව ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අව ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් ඇති විය හැකි බවට අපේක්ෂා කෙරේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයක කොටසක් ලෙස, මා විසින් විගණනය තුළ වෘත්තීය විනිශ්චය ක්‍රියාත්මක කළ අතර වෘත්තීය සැක මුසු බව පවත්වා ගනු ලැබිය. තවද:

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගෙන හා තක්සේරු කර, එම අවදානම්වලට ප්‍රතිචාරාත්මකව විගණන ක්‍රියාපටිපාටි සැලසුම් කර ඉටු කරමින් මගේ විගණනය සඳහා පදනමක් ලබා ගැනීමට ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගතිමි. වංචාවකින් ඇතිවන වැදගත් සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සොයා නොගැනීමේ අවදානම දෝෂයෙන් සිදුවන බලපෑමට වඩා ඉහළ වන අතර, වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ, වංචාව දුස්සන්ධානය, ව්‍යාජ ලේඛණ සැකසීම, වේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට සම්බන්ධවන බැවිනි.
- අවස්ථානෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමූහයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබගන්නා ලද නමුත්, බැංකුවේ සහ සමූහයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරමි.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ කළමනාකරණය විසින් කරන ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ අදාළ හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගැයීමට ලක්කළෙමි.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදාගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම්, මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම්, මාගේ මතය විකරණය කළ යුතුය. මගේ නිගමනයන් මගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබාගෙන ඇති විගණන සාක්ෂිය මත පදනම් වේ. කෙසේවුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

- හෙළිදරව් කිරීම් ඇතුළු මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර එයට පාදක වූ සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.
- ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට සමූහය තුළ ආයතන හෝ ව්‍යාපාර කටයුතුවල මූල්‍ය තොරතුරු සම්බන්ධයෙන් ප්‍රමාණත් සුදුසු සාක්ෂි ලබා ගතිමි. සමූහ විගණනයේ අරමුණ වෙනුවෙන් ඉටුකළ උපදේශය, අධීක්ෂණය හා විගණන කාර්යය සමාලෝචනය සඳහා මම වගකියමි. මාගේ විගණන මතය සඳහා මම වගකීම තනිවම දරමි.

මාගේ විගණනය තුළදී වෙනත් කරුණු අතර, මා හඳුනාගත් අභ්‍යන්තර පාලනය තුළ සැලකියයුතු දුර්වලතා ඇතුළුව වැදගත් විගණන සොයාගැනීම් පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශ්වයන් දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ පහත අවශ්‍යතා සම්බන්ධයෙන් විශේෂිත විධිවිධාන ඇතුළත්ය.

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවයන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනීයන ආකාරයට නිසි මූල්‍ය වාර්තා බැංකුව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ විගණන පනතෙහි 6 (1) (අෑ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (අෑ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද සියලුම නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 1988 අංක 30 දරණ බැංකු පනතේ 39 වගන්තියට (2024 අංක 24 බැංකු පනතින් සංශෝධනය කළ පරිදි) පහත අවශ්‍යතා සඳහා විශේෂ විධිවිධාන ඇතුළත්ය.

2.2.1 ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල සිදුකරන ලද අනාවරණ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කළ 2024 අංක 05 දරණ චක්‍රලේඛයේ අවශ්‍යතාවන්ට අනුකූල වේ.


2.3 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබාගන්නා ලද සාක්ෂි මත ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය;

2.3.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අෑ) වගන්තියේ සඳහන් අවශ්‍යතාව අනුව, බැංකුවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයකුට බැංකුව සම්බන්ධ වූ යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව සඳහන් කිරීම;

2.3.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, යම් අදාළ ලිඛිත නීතියකට හෝ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව සඳහන් කිරීම;

2.3.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, බැංකුවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව සඳහන් කිරීම.

2.3.4 2018 අංක 19 දරණ විගණන පනතෙහි 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, බැංකුවේ සම්පත්, සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව සඳහන් කිරීම.



එල් එස් අයි ජයරත්න
විගණකාධිපති

ආදායම් ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා	සටහන්	බැංකුව 2025 රු. '000	බැංකුව 2024 රු. '000	බැංකුව වෙනස %	සමූහය 2025 රු. '000	සමූහය 2024 රු. '000	සමූහය වෙනස %
දළ ආදායම	6	382,009,162	367,977,989	3.8	424,026,916	399,968,041	6.0
පොලී ආදායම		356,669,240	349,292,146	2.1	395,088,492	376,974,975	4.8
පොලී වියදම්		(214,291,533)	(242,050,205)	-11.5	(230,424,375)	(254,089,257)	-9.3
ශුද්ධ පොලී ආදායම	7	142,377,707	107,241,941	32.8	164,664,117	122,885,718	34.0
ගාස්තු හා කොමිස් අදායම්		18,312,109	14,923,343	22.7	20,357,761	16,074,007	26.7
ගාස්තු හා කොමිස් වියදම්		(1,904,639)	(757,783)	151.3	(1,904,639)	(757,783)	151.3
ශුද්ධ ගාස්තු හා කොමිස් අදායම්	8	16,407,470	14,165,560	15.8	18,453,122	15,316,224	20.5
වෙළෙඳ කටයුතුවලින් ලද ශුද්ධ ලාභය/(අලාභය)	9	3,253,015	853,690	281.1	3,349,319	1,076,990	211.0
වෙනත් මෙහෙයුම් ආදායම් (ශුද්ධ)	10	3,774,798	2,908,810	29.8	5,231,344	5,842,069	-10.5
මුළු මෙහෙයුම් ආදායම්		165,812,990	125,170,001	32.5	191,697,902	145,121,001	32.1
හානිකරණ අලාභය	11	(15,993,696)	(5,450,173)	193.5	(16,112,228)	(4,426,337)	264.0
ශුද්ධ මෙහෙයුම් ආදායම්		149,819,294	119,719,828	25.1	175,585,674	140,694,664	24.8
සේවක මණ්ඩල වියදම්	12	(38,230,657)	(35,834,826)	6.7	(46,801,415)	(41,787,374)	12.0
වෙනත් වියදම්	13	(28,170,784)	(27,102,997)	3.9	(35,786,570)	(33,940,949)	5.4
මූල්‍ය සේවා මත බදුවලට පෙර මෙහෙයුම් ලාභය		83,417,853	56,782,005	46.9	92,997,689	64,966,341	43.1
මූල්‍ය සේවා මත බදු		(19,009,128)	(15,198,298)	25.1	(21,888,517)	(17,356,567)	26.1
බදුවලට පෙර ලාභය		64,408,725	41,583,707	54.9	71,109,172	47,609,774	49.4
ආදායම් බදු වියදම්	14	(24,179,211)	(16,495,347)	46.6	(27,625,463)	(18,833,907)	46.7
වසර සඳහා ලාභය		40,229,514	25,088,360	60.4	43,483,709	28,775,867	51.1
ලාභය බෙදියන ආකාරය:							
බැංකුවේ කොටස් හිමියන්		40,229,514	25,088,360	60.4	41,974,128	27,558,538	52.3
පාලනයට යටත් නොවන හිමිකම්		–	–		1,509,581	1,217,329	24.0
		40,229,514	25,088,360	60.4	43,483,709	28,775,867	51.1
ලාභය මත කොටසකට ඉපැයීම්	15						
සාමාන්‍ය කොටසකට මූලික ඉපැයුම් (රු.)	15.1	40,230	25,088	60.4	41,974	27,559	52.3
සාමාන්‍ය කොටසකට තනුක ඉපැයුම් (රු.)	15.2	165	103	60.4	172	113	52.3

පිටු අංක 325 සිට 441 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය අංගයකි.

විස්තීර්ණ ආදායම් පිළිබඳ ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා	බැංකුව		සමූහය	
	2025 රු. '000	2024 රු. '000	2025 රු. '000	2024 රු. '000
වසර සඳහා ලාභය	40,229,514	25,088,360	43,483,709	28,775,867
වෙනත් විස්තීර්ණ ආදායම්/(වියදම්)				
ආදායම් ප්‍රකාශය වෙත ප්‍රතිවර්ගීකරණය නොකරන වෙනත් විස්තීර්ණ ආදායම				
වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගයට ස්කන්ධ උපකරණ මත ශුද්ධ ලාභ/(අලාභ)	1,118,525	268,521	1,377,286	378,138
නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් මත ආයුගණක ලාභ/(අලාභ)	2,166,222	(7,693,746)	2,141,861	(7,841,796)
නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් මත ලාභ/(අලාභ) වල විලම්බිත බදු බලපෑම	(649,867)	2,308,124	(645,774)	2,351,888
ඉඩම් හා ගොඩනැගිලිවල ප්‍රත්‍යාගණනය මත ලාභ/අලාභ/ගැලපීම්	(3,235,999)	2,897,780	(2,788,213)	3,284,652
ඉඩම් හා ගොඩනැගිලිවල ප්‍රත්‍යාගණනය මත විලම්බිත බදු බලපෑම	970,800	(869,334)	804,685	(984,264)
	369,681	(3,088,655)	889,845	(2,811,382)
ආදායම් ප්‍රකාශය වෙත ප්‍රතිවර්ගීකරණය කරනු ලබන වෙනත් විස්තීර්ණ ආදායම				
වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගයට ණය උපකරණ මත ශුද්ධ ලාභ/(අලාභ) (අපේක්ෂිත ණය අලාභ (ECL) ඇතුළුව)	(9,129)	(60,740)	(9,129)	(134)
ඉහත කරුණු මත විලම්බිත බදු බලපෑම	–	–	(77,628)	(50,079)
විදේශ මෙහෙයුම් සම්බන්ධ මූල්‍ය ප්‍රකාශ පරිවර්තනය මත ශුද්ධ ලාභ/(අලාභ)	–	–	(140,750)	(512,493)
	(9,129)	(60,740)	(227,507)	(562,706)
වසර සඳහා වෙනත් විස්තීර්ණ ආදායම (බදු පසු)	360,552	(3,149,395)	662,338	(3,374,088)
වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම	40,590,066	21,938,965	44,146,047	25,401,779
ලාභය බෙදියන ආකාරය				
බැංකුවේ කොටස් හිමියන්	40,590,066	21,938,965	42,613,305	24,433,391
පාලනයට යටත් නොවන හිමිකම්	–	–	1,532,742	968,388
	40,590,066	21,938,965	44,146,047	25,401,779

පිටු අංක 325 සිට 441 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය අංගයකි.

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනට	සටහන්	බැංකුව 2025 රු. '000	බැංකුව 2024 රු. '000	බැංකුව වෙනස %	සමූහය 2025 රු. '000	සමූහය 2024 රු. '000	සමූහය වෙනස %
වත්කම්							
මුදල් හා මුදල් සමාන දෑ	17	109,138,690	71,694,016	52.2	110,598,346	72,398,306	52.8
ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ පවතින ශේෂය	18	38,417,296	33,798,107	13.7	38,417,296	33,798,107	13.7
බැංකුවල ඇති ස්ථාපන	19	85,166,913	59,831,807	42.3	89,852,936	62,005,136	44.9
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	20	4,524,930	5,842,194	-22.5	4,524,930	5,842,194	-22.5
මූල්‍ය වත්කම් – ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට	21	307,296,907	329,810,350	-6.8	308,444,628	330,597,382	-6.7
මූල්‍ය වත්කම් – ක්‍රමක්ෂය පිරිවැයට							
බැංකුවලට ණය හා අත්තිකාරම්	22	83,506,019	31,994,539	161.0	89,185,034	37,047,879	140.7
වෙනත් ගනුදෙනුකරුවන්ට ණය හා අත්තිකාරම්	23	1,730,671,216	1,521,965,020	13.7	2,000,085,410	1,665,027,784	20.1
ක්‍රමක්ෂය පිරිවැය අනුව මිනුම්ගත ණය උපකරණ	24	1,230,298,162	1,123,490,537	9.5	1,242,598,653	1,138,634,981	9.1
මූල්‍ය වත්කම් – වෙනත් විස්තීර්ණ ආදායම (OCI) ඔස්සේ සාධාරණ වටිනාකමට							
වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගයට ස්කන්ධ උපකරණ	25	3,431,075	2,313,187	48.3	3,704,427	2,668,358	38.8
වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගයට ණය උපකරණ	26	7,081,782	7,110,671	-0.4	8,051,542	8,576,912	-6.1
පරිපාලිතයන්හි ආයෝජන	27	6,153,102	5,191,712	18.5	–	–	–
දේපළ, පිරියත හා උපකරණ සහ වත්කම් පාවිච්චි කිරීමේ හිමිකම්	28	60,687,299	61,079,218	-0.6	74,045,961	73,034,985	1.4
අස්පෘශ්‍ය වත්කම් සහ කීර්තිනාමය	29	1,842,560	2,586,671	-28.8	2,090,486	2,760,806	-24.3
වෙනත් වත්කම්	30	40,188,540	41,091,078	-2.2	38,634,783	39,313,104	-1.7
මුළු වත්කම්		3,708,404,491	3,297,799,107	12.5	4,010,234,432	3,471,705,934	15.5
වගකීම්							
බැංකුවලට ගෙවිය යුතු	31	25,969,385	36,840,228	-29.5	96,287,432	46,871,380	105.4
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	20	93,407	168,266	-44.5	93,407	168,266	-44.5
වෙනත් ගනුදෙනුකරුවන් වෙත ගෙවිය යුතු	32	3,229,886,179	2,854,704,194	13.1	3,380,319,917	2,947,904,673	14.7
වෙනත් ණය ගැනීම්	33	100,014,574	75,545,595	32.4	99,787,574	75,482,595	32.2
ප්‍රවර්තන බදු බැරකම්		9,845,693	12,201,098	-19.3	11,372,189	12,977,145	-12.4
ශුද්ධ විලම්බිත බදු බැරකම්	34	6,787,488	5,627,973	20.6	9,581,574	7,591,958	26.2
වෙනත් බැරකම්	35	76,217,192	76,557,500	-0.4	97,169,725	91,692,859	6.0
යටත් කරන ලද කාල ණය	36	40,552,963	54,156,709	-25.1	45,508,349	59,065,269	-23.0
මුළු වගකීම්		3,489,366,881	3,115,801,563	12.0	3,740,120,167	3,241,754,145	15.4

දෙසැම්බර් 31 දිනට	සටහන්	බැංකුව 2025 රු. '000	බැංකුව 2024 රු. '000	බැංකුව වෙනස %	සමූහය 2025 රු. '000	සමූහය 2024 රු. '000	සමූහය වෙනස %
ස්කන්ධය							
ප්‍රකාශිත ප්‍රාග්ධනය/පවරන ලද ප්‍රාග්ධනය	37	12,201,998	12,201,998	0.0	12,201,998	12,201,998	0.0
ව්‍යවස්ථාපිත සංචිත අරමුදල	38	12,201,998	11,828,689	3.2	12,201,998	11,828,689	3.2
වෙනත් සංචිත	39	70,674,271	68,981,258	2.5	74,394,779	72,407,209	2.7
රඳවාගත් ඉපැයුම්	40	123,959,343	88,985,599	39.3	155,157,874	118,455,452	31.0
කොටස්හිමියන්ගේ මුළු හිමිකම්		219,037,610	181,997,544	20.4	253,956,649	214,893,348	18.2
පාලනයට යටත් නොවන හිමිකම්		–	–		16,157,616	15,058,441	7.3
මුළු හිමිකම්		219,037,610	181,997,544	20.4	270,114,265	229,951,789	17.5
මුළු හිමිකම් සහ වගකීම්		3,708,404,491	3,297,799,107	12.5	4,010,234,432	3,471,705,934	15.5
අසම්භාව්‍ය වගකීම් සහ බැඳීම්	41	248,762,020	233,829,736	6.4	277,222,334	250,318,916	10.7
සංදේශ තොරතුරු							
සේවකයින් ගණන		8,122	7,633		12,489	10,994	
ශාඛා ගණන		746	751		917	862	

මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය අංගයකි.

සහතික කිරීම

මෙම මූල්‍ය ප්‍රකාශ 2025 දෙසැම්බර් 31 දිනට බැංකුවේ සහ එහි පරිපාලිත සමාගම්වල කටයුතුවල තත්ත්වය සහ එදිනෙන් අවසන් වූ වසර සඳහා ලාභය පිළිබඳ සත්‍ය හා සාධාරණ දැක්මක් ලබා දේ.

නිල්මිණී ප්‍රේමලාල්
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී/වැඩබලන මූල්‍ය ප්‍රධානී

මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර ඔවුන් වෙනුවෙන් පහත අත්සන් යොදා ඇත.

නාරද ප්‍රනාන්දු
සභාපති

සංජය බණ්ඩාර
අධ්‍යක්ෂ

ක්ලයිව් ෆොන්සේකා
ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී

2026 පෙබරවාරි 25
කොළඹ

ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශය - බැංකුව

බැංකුව	ව්‍යවස්ථාපිත ප්‍රාග්ධනය/පවරන ලද ප්‍රාග්ධනය	
	සාමාන්‍ය කොටස් රු. '000	පැවරූ ප්‍රාග්ධනය රු. '000
2024 ජනවාරි 1 දිනට ශේෂය	49,998	12,152,000
වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම		
වසර සඳහා ලාභය	–	–
වෙනත් විස්තීර්ණ ආදායම්/(වියදම්) (ශුද්ධ) (බදු පසු)	–	–
මුළු විස්තීර්ණ ආදායම/(වියදම)	–	–
ස්කන්ධය තුළ සෘජුවම හඳුනාගත් ස්කන්ධහිමියන් සමඟ ගනුදෙනු		
වසර තුළ සංචිතයට මාරුකිරීම්	–	–
ස්කන්ධහිමියන් සමඟ මුළු ගනුදෙනු	–	–
2024 දෙසැම්බර් 31 දිනට ශේෂය	49,998	12,152,000
2025 ජනවාරි 1 දිනට ශේෂය	49,998	12,152,000
වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම		
වසර සඳහා ලාභය	–	–
වෙනත් විස්තීර්ණ ආදායම්/(වියදම්) (ශුද්ධ) (බදු පසු)	–	–
මුළු විස්තීර්ණ ආදායම/(වියදම)	–	–
ස්කන්ධය තුළ සෘජුවම හඳුනාගත් ස්කන්ධහිමියන් සමඟ ගනුදෙනු		
වසර තුළ සංචිතයට මාරුකිරීම්	–	–
සාධාරණ අගයට වෙනත් විස්තීර්ණ ආදායම් කොටස් බැහැර කිරීම මත මාරු කිරීම	–	–
භාණ්ඩාගාරයට විශේෂ බදු/ලාභාංශ	–	–
ස්කන්ධහිමියන් සමඟ මුළු ගනුදෙනු	–	–
2025 දෙසැම්බර් 31 දිනට ශේෂය	49,998	12,152,000

	සංචිත						
	ව්‍යවස්ථාපිත සංචිත අරමුදල රු. '000	ප්‍රතිකාගණන සංචිත රු. '000	වෙනත් සංචිත රු. '000	FVOCI සංචිතයේ මූල්‍ය වත්කම් රු. '000	විශේෂ සංචිත - ණය ප්‍රතිව්‍යුහගතකරණය රු. '000	රඳවාගත් ඉපයීම් රු. '000	එකතුව රු. '000
	10,574,271	27,367,238	14,141,373	575,973	–	95,197,726	160,058,579
	–	–	–	–	–	25,088,360	25,088,360
	–	2,028,446	–	207,781	–	(5,385,622)	(3,149,395)
	–	2,028,446	–	207,781	–	19,702,738	21,938,965
	1,254,418	–	–	–	24,660,447	(25,914,865)	–
	1,254,418	–	–	–	24,660,447	(25,914,865)	–
	11,828,689	29,395,684	14,141,373	783,754	24,660,447	88,985,599	181,997,544
	11,828,689	29,395,684	14,141,373	783,754	24,660,447	88,985,599	181,997,544
	–	–	–	–	–	40,229,514	40,229,514
	–	(2,265,199)	–	1,109,396	–	1,516,355	360,552
	–	(2,265,199)	–	1,109,396	–	41,745,869	40,590,066
	373,309	–	–	–	2,849,082	(3,222,390)	–
	–	–	–	(265)	–	265	–
	–	–	–	–	–	(3,550,000)	(3,550,000)
	373,309	–	–	(265)	2,849,082	(6,772,125)	(3,550,000)
	12,201,998	27,130,485	14,141,373	1,892,885	27,509,529	123,959,343	219,037,610

ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශය - සමූහය

සමූහය	ව්‍යවස්ථාපිත ප්‍රාග්ධනය/පවරන ලද ප්‍රාග්ධනය	
	සාමාන්‍ය කොටස් රු. '000	පැවරූ ප්‍රාග්ධනය රු. '000
2024 ජනවාරි1 දිනට ශේෂය	49,998	12,152,000
වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම		
වසර සඳහා ලාභය	–	–
වෙනත් විස්තීර්ණ ආදායම්/(වියදම්) (ශුද්ධ) (බදු පසු)	–	–
මුළු විස්තීර්ණ ආදායම/(වියදම)	–	–
ස්කන්ධය තුළ සෘජුවම හඳුනාගත් ස්කන්ධහිමියන් සමඟ ගනුදෙනු		
වසර තුළ සංචිතයට මාරුකිරීම්	–	–
ගෙවූ ලාභාංශ	–	–
ස්කන්ධහිමියන් සමඟ මුළු ගනුදෙනු	–	–
2024 දෙසැම්බර් 31 දිනට ශේෂය	49,998	12,152,000
2025 ජනවාරි 1 දිනට ශේෂය	49,998	12,152,000
වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම		
වසර සඳහා ලාභය	–	–
වෙනත් විස්තීර්ණ ආදායම්/(වියදම්) (ශුද්ධ) (බදු පසු)	–	–
මුළු විස්තීර්ණ ආදායම/(වියදම)	–	–
ස්කන්ධය තුළ සෘජුවම හඳුනාගත් ස්කන්ධහිමියන් සමඟ ගනුදෙනු		
වසර තුළ සංචිතයට මාරුකිරීම්	–	–
සාධාරණ අගයට වෙනත් විස්තීර්ණ ආදායම් කොටස් බැහැර කිරීම මත මාරු කිරීම	–	–
භාණ්ඩාගාරයට විශේෂ බදු/ලාභාංශ	–	–
ගෙවූ ලාභාංශ	–	–
ස්කන්ධහිමියන් සමඟ මුළු ගනුදෙනු	–	–
2025 දෙසැම්බර් 31 දිනට ශේෂය	49,998	12,152,000

සංචිත								
ව්‍යවස්ථාපිත සංචිත අරමුදල රු. '000	ප්‍රත්‍යාගණන සංචිත රු. '000	වෙනත් සංචිත රු. '000	FVOCI සංචිතයේ මූල්‍ය වත්කම් රු. '000	විශේෂ සංචිත – ණය ප්‍රතිව්‍යුහගතකරණය රු. '000	රඳවාගත් ඉපයීම් රු. '000	එකතුව රු. '000	පාලනය නොවන අයිතිය රු. '000	මුළු ස්කන්ධය රු. '000
10,574,271	30,110,540	14,834,562	462,452	–	122,276,138	190,459,961	14,524,428	204,984,389
–	–	–	–	–	27,558,538	27,558,538	1,217,329	28,775,867
–	2,232,403	(191,084)	297,889	–	(5,464,359)	(3,125,151)	(248,940)	(3,374,091)
–	2,232,403	(191,084)	297,889	–	22,094,179	24,433,387	968,389	25,401,776
1,254,418	–	–	–	24,660,447	(25,914,865)	–	–	–
–	–	–	–	–	–	–	(434,375)	(434,375)
1,254,418	–	–	–	24,660,447	(25,914,865)	–	(434,375)	(434,375)
11,828,689	32,342,943	14,643,478	760,341	24,660,447	118,455,452	214,893,348	15,058,441	229,951,789
11,828,689	32,342,943	14,643,478	760,341	24,660,447	118,455,452	214,893,348	15,058,441	229,951,789
–	–	–	–	–	41,974,128	41,974,128	1,509,581	43,483,709
–	(2,053,946)	(52,546)	1,245,246	–	1,500,419	639,173	23,162	662,335
–	(2,053,946)	(52,546)	1,245,246	–	43,474,547	42,613,301	1,532,743	44,146,044
373,309	–	–	–	2,849,082	(3,222,390)	–	–	–
–	–	–	(265)	–	265	–	–	–
–	–	–	–	–	(3,550,000)	(3,550,000)	–	(3,550,000)
–	–	–	–	–	–	–	(433,568)	(433,568)
373,309	–	–	(265)	2,849,082	(6,772,125)	(3,550,000)	(433,568)	(3,983,568)
12,201,998	30,288,998	14,590,932	2,005,322	27,509,529	155,157,874	253,956,649	16,157,616	270,114,265

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා	සටහන්	බැංකුව 2025 රු. '000	බැංකුව 2024 රු. '000	සමූහය 2025 රු. '000	සමූහය 2024 රු. '000
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන්					
බදු පෙර ලාභය		64,408,725	41,583,707	71,109,172	47,609,774
ගැලපීම්					
බදු පෙර ලාභවල ඇතුළත් මුදල් නොවන අයිතම	46	23,373,938	17,342,187	25,487,991	17,079,218
මෙහෙයුම් වත්කම්වල වෙනස්වීම්	47	(283,104,755)	(224,884,629)	(412,460,931)	(247,218,482)
මෙහෙයුම් බැරකම්වල වෙනස්වීම්	48	386,122,508	211,065,897	509,477,976	216,396,257
පරිපාලිත හා වෙනත් ව්‍යාපාර වෙතින් ලද ලාභාංශ ආදායම		(1,380,504)	(1,360,579)	(254,252)	(235,652)
යටත් කරන ලද ණය මත පොලී වියදම		5,697,460	6,115,011	6,129,230	6,827,434
නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්/පාරිතෝෂික වෙනුවෙන් දායක මුදල් ගෙවීම		2,456,402	1,243,790	2,638,565	1,437,776
ගෙවන ලද බදු		(25,054,168)	(3,442,268)	(27,159,520)	(5,411,727)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය කරන ලද ශුද්ධ මුදල් ප්‍රවාහයන්		172,519,606	47,663,116	174,968,231	36,484,598
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන්					
දේපළ පිරියත සහ උපකරණ මිලදී ගැනීම		(4,513,926)	(5,687,192)	(6,219,391)	(6,741,229)
දේපළ පිරියත සහ උපකරණ විකිණීමෙන් ලද මුදල්		125,420	109,926	137,730	162,475
මූල්‍ය ආයෝජන මිළදී ගැනීම්		(107,845,103)	(30,788,643)	(105,001,150)	(10,976,040)
අස්පෘශ්‍ය වත්කම් ශුද්ධ මිළදී ගැනීම්		(224,446)	(1,559,769)	(330,142)	(1,591,263)
පරිපාලිත සහ වෙනත් ව්‍යාපාරවල ආයෝජන තුළින් ලද ලාභාංශ		1,380,504	1,360,579	254,252	235,652
ආයෝජන ක්‍රියාකාරකම්වලින් (භාවිතාකළ) ලද ශුද්ධ මුදල		(111,077,551)	(36,565,099)	(111,158,701)	(18,910,405)
මූල්‍යකරණ ක්‍රියාකාරකම් වෙතින් මුදල් ප්‍රවාහ					
යටත් කරන ලද ණය මඟින් ලද මුදල		–	13,515,000	–	13,515,000
යටත් කරන ලද ණය ආපසු ගෙවීම		(12,900,000)	(6,563,000)	(12,900,000)	(6,563,000)
යටත් කරන ලද ණය මත පොලී ගෙවීම්		(6,401,206)	(5,907,592)	(6,786,150)	(12,520,648)
කල්බදු වගකීම් ආපසු ගෙවීම		(1,837,577)	(1,560,655)	(2,366,990)	(1,506,142)
කල්බදු වගකීම් මත ගෙවූ පොළිය		(858,598)	(777,336)	(1,122,782)	(973,828)
පාලනයට යටත් නොවන හිමිකම් වෙත ලාභාංශ ගෙවීම්		–	–	(433,568)	(434,375)
වෙනත් ස්කන්ධ හිමියන් වෙත ගෙවන ලද ලාභාංශ/බදු		(2,000,000)	–	(2,000,000)	–
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහයන්		(23,997,381)	(1,293,583)	(25,609,490)	(8,482,993)
මුදල් හා මුදල් සමාන දෑ හි ශුද්ධ වැඩිවීම/(අඩුවීම)		37,444,674	9,804,434	38,200,040	9,091,200
වසර ආරම්භයේදී මුදල් හා මුදල් සමාන දෑ		71,694,016	61,889,582	72,398,306	63,307,106
වසර අවසානයේදී මුදල් හා මුදල් සමාන දෑ		109,138,690	71,694,016	110,598,346	72,398,306

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

1. වාර්තාකරණ ආයතනය

GRI 2-1

1.1 ආයතනික තොරතුරු

මහජන බැංකුව ("බැංකුව") යනු 1961 අංක 29 දරන බැංකු පනත යටතේ 1961 ජූලි මස 01 වැනි දින පිහිටුවන ලද රජය සතු බැංකුවක් වන අතර, එය ශ්‍රී ලංකාවේ ලියාපදිංචි බැංකුවකි. බැංකුව 1988 අංක 30 දරන බැංකු පනත හා එහි සංශෝධන යටතේ ස්ථාපිත බලපත්‍රලාභී වාණිජ බැංකුවකි. බැංකුවේ ලියාපදිංචි කාර්යාලය "පීපල්ස් ටවර්" අංක 374, ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා මාවත, කොළඹ 02 යන ස්ථානයේ පිහිටා ඇත.

1.2 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සකස් කළ අතර, බැංකුවේ ("මව් සමාගම") හා එහි පරිපාලිතයන්හි ("සමූහය" ලෙස හැඳින්වෙන) මූල්‍ය තොරතුරුවලින් සමන්විත වේ.

මහජන බැංකුව සමූහයේ අවසාන මව් සමාගම වේ.

1.3 ප්‍රධාන ක්‍රියාකාරකම්

GRI 2-6

බැංකුව

අනෙකුත් කරුණු අතර, තැන්පතු භාරගැනීම, ණය පහසුකම් ලබාදීම, පුද්ගලික බැංකුකරණය, සංවර්ධන බැංකුකරණය, උකස් ගැනීම, වෙළෙඳ මූල්‍ය, ප්‍රාථමික ගනුදෙනු, ආයෝජන බැංකුකරණය සහ භාණ්ඩාගාර මෙහෙයුම්, ණය කාඩ්පත් පහසුකම්, අනුරූප බැංකුකරණය සහ මුදල් ප්‍රේෂණ සහ අක් වෙරළ බැංකුකරණ යනාදියෙන් බැංකුවේ ව්‍යාපාර කටයුතු සමන්විත වේ.

පරිපාලිත සමාගම්

බැංකුවේ පරිපාලිත සමාගම්වල ප්‍රධාන ක්‍රියාකාරකම් පහත පරිදි වේ.

සමාගමේ නම	ප්‍රධාන ව්‍යාපාර කටයුතු
පීපල්ස් ලීසිං සහ ෆිනෑන්ස් පීවිල්සී	මූල්‍ය කල්බදු, කුලිපිට ගැනීමේ වත්කම් මූල්‍යකරණය, වාර ණය, ඉස්ලාමීය මූල්‍ය, ආන්තික වෙළඳාම, කොටස් වෙළඳාම, ණය උපකරණ නිකුත් කිරීම, සාධ්‍යකරණය, රන් ණය, සහ පොදු තැන්පතු බලමුලු ගැන්වීම ප්‍රධාන ව්‍යාපාරික කටයුතු වේ.
පීපල්ස් ට්‍රැවල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	සංචාර සහ ගුවන් ටිකට්පත් සැකසීම (සංචාර නියෝජිතයා)

උප පරිපාලිත සමාගම්

බැංකුවේ උප පරිපාලිත සමාගම්වල ප්‍රධාන ක්‍රියාකාරකම් පහත පරිදි වේ;

සමාගමේ නම	ප්‍රධාන ව්‍යාපාර කටයුතු
පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් ලිමිටඩ්	රථවාහන කළමනාකරණය, රථවාහන තක්සේරු කිරීම, රථවාහන විකිණීම, රක්ෂණ තක්සේරුකරණය සහ රථවාහන අළුත්වැඩියා කිරීම.
පීපල්ස් ලීසිං ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් ලිමිටඩ්	මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතීන් පවත්වාගෙන යාම සහ දේපළ සංවර්ධන ක්‍රියාකාරකම්.
පීපල්ස් ඉන්ෂුරන්ස් පීවිල්සී	සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය කරගෙන යාම.
පීපල්ස් මයික්‍රෝ කොමර්ස් ලිමිටඩ්	අඩු ආදායම්ලාභීන් සහ ක්ෂුද්‍ර ව්‍යවසායන් වෙත බැංකු නොවන මූල්‍ය සේවාවන් සැපයීම.
පීපල්ස් ලීසින් හැව්ලොක් ප්‍රොපර්ටීස් සමාගම	කාර්යාල සංකීර්ණයක් ඉදිකිරීම හා පවත්වාගෙන යාම.
ලංකන් චිලායන්ස් ෆයිනෑන්ස් සමාගම	නිශ්චල හා චංචල දේපළ සඳහා කල්බදු සැපයීම සහ ණය සැපයීම.

2. ගිණුම්කරණයේ පදනම

2.1 අනුකූලතා ප්‍රකාශය

සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සහ බැංකුවේ වෙනම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (LKAS සහ SLFR) අනුව සකස් කර ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ අවශ්‍යතාවලට, 1988 අංක 30 දරන බැංකු පනතේ සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කළ නියාමන මාර්ගෝපදේශවල අවශ්‍යතාවලට ද අනුකූල වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා භාවිතාකළ ආකෘති සහ එහි සිදුකළ අනාවරණ "බලපත්‍රලාභී බැංකු විසින් වාර්ෂික සහ කාර්තුමය මූල්‍ය ප්‍රකාශය සහ වෙනත් අනාවරණ ප්‍රකාශයට පත් කිරීම" පිළිබඳ 2024 අංක 05 දරන චක්‍රලේඛයෙහි ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දක්වා ඇති ආකෘතියට අනුකූල වේ. එමෙන්ම බැංකුව ඉහත සඳහන් චක්‍රලේඛයට අනුකූලව පුවත්පත් සහ වෙබ් අඩවියේ වාර්ෂික සහ කාර්තුමය මූල්‍ය තොරතුරු සහ වෙනත් අනාවරණ ප්‍රකාශයට පත් කෙරේ.

2.2 මූල්‍ය ප්‍රකාශන සඳහා අධ්‍යක්ෂවරයාගේ වගකීම

1961 අංක 29 දරන මහජන බැංකු පනතේ අවශ්‍යතාවයන්ට ද 1988 අංක 30 දරන බැංකු පනත සහ එහි සංශෝධනයන් හී අවශ්‍යතාවන්ටද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (LKAS සහ SLFRS) ද අනුකූලව ඒකාබද්ධ සහ වෙන්කරන ලද මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇත. මෙම SLFRSs සහ LKASs ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ වෙබ් අඩවිය වන www.casrilanka.com ලබාගත හැකිය.

මෙම මූල්‍ය ප්‍රකාශවල පහත සඳහන් සංරචක ඇතුළත්ය.

ආදායම් ප්‍රකාශය සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය	සමාලෝචිත වසර සඳහා බැංකුවේ සහ සමූහයේ මූල්‍ය කාර්යසාධනය පිළිබඳ තොරතුරු ලබාදීම
මූල්‍ය තත්ත්ව ප්‍රකාශය	වසර අවසානයට බැංකුවේ සහ සමූහයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ තොරතුරු ලබාදීම
ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශය	සමාලෝචිත වසර තුළ “කොටස්හිමියන්ගේ සියලුම වෙනස්වීම් පෙන්නුම් කිරීම”
මුදල් ප්‍රවාහ ප්‍රකාශය	මුදල් හා මුදලට සමාන දෑ ජනනය කිරීමට සහ වීම මුදල් ප්‍රවාහ භාවිතා කිරීමට බැංකුවේ සහ සමූහයේ හැකියාව පිළිබඳ පරිශීලකයින්ට තොරතුරු ලබාදීම
මුදල් ප්‍රකාශනවලට සටහන්	සැලකියයුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වෙනත් පැහැදිළි කිරීමේ තොරතුරුවලින් සමන්විත වේ

2.3 මූල්‍ය ප්‍රකාශන අනුමත කිරීම

2024 සඳහා සන්සන්දනයන් ඇතුළුව 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමූහයේ සහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2026 පෙබරවාරි 25 දින අනුමත කර නිකුත් කිරීම සඳහා බලය ලබා දෙන ලදී.

3. මිණුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශ වෛතිහාසික පදනම යොදා ගනිමින් සකස් කොට ඇති අතර මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ පහත සඳහන් කරුණු හැර මූල්‍ය ප්‍රකාශ කෙරෙහි බලපාන උද්ධමන සාධක වෙනුවෙන් ගැලපීම් කිසිවකින් තොරව එය ඒකාකාර ලෙස ආදේශ කර ගනු ලැබ ඇත.

අයිතමය	මිණුම්කරණ පදනම	සටහන්
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	සාධාරණ අගයට	20
ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට මනින ලද මූල්‍ය උපකරණ	සාධාරණ අගයට	21
වෙනත් විස්තීර්ණ ආදායම් තුළින් සාධාරණ අගයට මනින ලද මූල්‍ය උපකරණ	සාධාරණ අගයට	25 සහ 26
ඉඩම් හා ගොඩනැගිලි	අත්පත් කරගනු ලබන අවස්ථාවේ පිරිවැයට මිනුම් කොට පසුකාලීනව ප්‍රත්‍යාගණන දිනයේ සාධාරණ වටිනාකම් වන ප්‍රත්‍යාගණිත අගයට මිනුම්කරණය කෙරේ.	28
නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්	බැරකම ආයුගණක පදනම්න් අගය කොට සැලසුම් වත්කම්වල මුළු සාධාරණ අගය අඩුකළ නිශ්චිත ප්‍රතිලාභ බැඳීමේ ප්‍රවර්තන අගයට හඳුනාගැනේ.	35

3.1 ව්‍යවහාරික හා ඉදිරිපත් කරන මුදල් ඒකකය

ඒකාබද්ධ සහ වෙන්කරන ලද මූල්‍ය ප්‍රකාශ බැංකුව ක්‍රියාත්මක මූලික ආර්ථික පරිසරයේ ව්‍යවහාරික මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කොට ඇත. ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කරනු ලැබ ඇති මූල්‍ය තොරතුරු වෙනත් ආකාරයකින් දක්වා ඇත්නම් හැර ආසන්නතම දහසට වටයනු ලැබ ඇත.

3.2 ගිණුම්කරණයේ උපචිත පදනම

මුදල් ප්‍රවාහ පිළිබඳ තොරතුරු හැර මෙම මූල්‍ය ප්‍රකාශ ගිණුම්කරණය පිළිබඳ උපචිත පදනම අනුගමනය කරමින් සකස් කර ඇත.

3.3 ප්‍රමාණාත්මකභාවය හා සමාහරණය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති – LKAS 1 – “මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම” අනුව, සමාන අයිතමවල එක් එක් ප්‍රමාණාත්මක වර්ගය මූල්‍ය ප්‍රකාශවල වෙන වෙනම ඉදිරිපත් කොට ඇත. අසමාන ස්වභාවයෙන් හෝ කෘත්‍යයෙන් යුතු අයිතම ඒවා ප්‍රමාණාත්මක නොවන්නේ නම් හැර, වෙන් වෙන්ව ඉදිරිපත් කොට ඇත.

සමූහයේ සහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවල අවබෝධය සහ සංසන්දනාත්මක බව වැඩි කිරීම සඳහා, වැදගත් තොරතුරු, වැදගත් නොවන විස්තර සමඟ සැඟවීමෙන් හෝ වෙනස් ස්වභාවයක හෝ ක්‍රියාකාරිත්වයක වැදගත් අයිතම එකතු කිරීමෙන් තොරව ක්‍රමානුකූලව ඉදිරිපත් කරනු ලැබේ.

3.4 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 07 – මුදල් ප්‍රවාහ ප්‍රකාශයට අනුකූලව මුදල් ප්‍රවාහ සකස් කිරීමේ "වතු ක්‍රමය"(එනම් මෙහෙයුම් කාර්යයන්ගෙන් මුදල් ප්‍රවාහ ජනනයවීමට ලාභය ගැලපීම) උපයෝගී කර ගනිමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කොට ඇත. මුදල් හා මුදල් සමාන දෑ දැනුවත් මුදලකට පහසුවෙන් හැරවිය හැකි කෙටි කාලීන අධිද්‍රවශීලතා ආයෝජනවලින් සමන්විත වන අතර, වටිනාකමේ නොසැලකියයුතු වෙනස්වීම්වලට යටත් වේ. අතැති මුදල්, බැංකු ශේෂ, ඇමතුම් සහ කෙටි දැන්වීම් මුදල්වලින් මුදල් හා සමාන දෑ සමන්විත වේ.

3.5 සංසන්දනාත්මක තොරතුරු

වර්තමාන කාලපරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ පරිශීලකයාගේ අවබෝධය වැඩි කිරීමට සහ අන්තර් කාලපරිච්ඡේදයේ සන්සන්දනය පහසු කිරීම සඳහා පූර්වගාමී කාලපරිච්ඡේදය සඳහා සංසන්දනාත්මක තොරතුරු අනාවරණය කෙරේ. වඩා යහපත් ඉදිරිපත් කිරීමක් ලබාදීමේ අරමුණින් වර්තමාන වසරේ ඉදිරිපත් කිරීම සමඟ අනුකූලවීමට අවශ්‍ය අවස්ථාවේදී සංසන්දනාත්මක තොරතුරු නැවත වර්ගීකරණය කෙරේ.

4. සැලකිය යුතු ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන

වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම්වල වාර්තාකළ ප්‍රමාණයන්ට බලපෑ හැකි සමූහයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගැනීමේ ක්‍රියාවලියේදී, මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනාගනු ලැබ ඇති අගයයන් නිශ්චය කිරීම සඳහා කළමනාකාරිත්වය විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන යොදා ගෙන ඇත. සැබෑ ප්‍රතිඵල මෙම ඇස්තමේන්තු වලින් වෙනස්විය හැක.

විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පන වෛතිහාසික පළපුරුද්ද සහ වතාවරණ යටතේ සාධාරණව සලකා බලන ලද වෙනත් සාධක මත පදනම් වන අතර, නිරන්තර පදනමක් මත සමාලෝචනයට ලක් කෙරේ. ගිණුම්කරණ ඇස්මේන්තුවලට අදාළ ප්‍රතිශෝධන ඇස්තමේන්තු ප්‍රතිශෝධිත කාලසීමාව තුළදී හා බලපෑමට ලක් වන කවර හෝ ඉදිරි කාලසීමාවන්හිදී හඳුනා ගනී.

සමූහයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගැනීමේදී, කළමනාකරණය විසින් මූල්‍ය ප්‍රකාශනයන් තුළ හඳුනාගනු ලැබ ඇති අගයන් මත බලපෑම ඇති කරන විනිශ්චයන්, උපකල්පන හා ඇස්තමේන්තු සිදුකර ඇත. ඒකාබද්ධ සහ වෙන්කරන ලද මූල්‍ය ප්‍රකාශනයන් තුළ හඳුනාගනු ලැබ ඇති අගයන් මත වඩාත්ම සැළකිය යුතු බලපෑම ඇති කරන විනිශ්චයන්, උපකල්පන හා ඇස්තමේන්තු පිළිබඳ තොරතුරු පහත දක්වා ඇත.

4.1 අඛණ්ඩතා පැවැත්ම

අඛණ්ඩ පැවැත්මක් ලෙස ඉදිරියට යාමට සමූහය සතු හැකියාව සම්බන්ධයෙන් තක්සේරුවක් කළමනාකාරිත්වය සිදුකොට ඇති අතර, දැකිය හැකි අනාගතය සඳහා සිය මෙහෙයුම් අඛණ්ඩව පවත්වාගෙන යාමට ප්‍රමාණවත් සම්පත් සමූහය සතු වන බවට සෑහීමකට පත්වේ. තවද, අඛණ්ඩ පැවැත්මක් ලෙස ඉදිරියට යාමට සමූහය සතු හැකියාව සම්බන්ධයෙන් සැළකිය යුතු සැකයක් ඉපදවිය හැකි ආකාරයේ කවර හෝ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පිළිබඳව කළමනාකාරිත්වය දැනුවත් නැත. එමනිසා මූල්‍ය ප්‍රකාශ සැකසීම අඛණ්ඩ පැවැත්ම යන පදනම මත සිදු කර ඇත.

4.2 නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්වල පිරිවැය ආයුගණක ඇගයීම් ශිල්ප ක්‍රමය භාවිත කරමින් නිර්ණය කරනු ලැබේ. වට්ටම් අනුපාත, සැලසුම් වත්කම් මත අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාත ප්‍රමාණය, අනාගත වැටුප් වැඩිවීම් සහ මරණ අනුපාතික සහ අනාගත විශ්‍රාම වැටුප් වැඩිවීම් තීරණය කිරීම ඇතුළුව විවිධ උපකල්පන සිදු කිරීම ආයුගණක ඇගයීම හා සම්බන්ධ වේ. මෙම සැලසුම්වල දීර්ඝ කාලීන ස්වභාවය හේතුවෙන් මෙබඳු ඇස්තමේන්තු සැලකියයුතු අවිනිශ්චිතතාවන්ට භාජනය වේ.

සුදුසු වට්ටම් අනුපාත තීරණය කිරීමේදී, නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වල අපේක්ෂිත කාලසීමාවට අනුරූප කල්පිරීම් සමඟ ශ්‍රී ලංකා රජයේ බැඳුම්කරවල පොලී අනුපාත සමූහය විසින් සලකා බලයි. මරණ අනුපාතික ප්‍රසිද්ධියේ ලබාගතහැකි මරණ අනුපාත වගු මත පදනම් වේ. අනාගත වැටුප් වැඩිවීම් සහ විශ්‍රාම වැටුප් වැඩිවීම් අපේක්ෂිත උද්ධමන අනුපාත හා සමූහයේ වෛතිහාසික හා අපේක්ෂිත වැටුප් වැඩිවීමේ රටාවන් මත පදනම් වී තීරණය කෙරේ. සියළු උපකල්පන සෑම වාර්තාකරණ දිනයකදීම සමාලෝචනය කෙරේ. මෙහිදී භාවිත කෙරෙන උපකල්පන සඳහා 35.1.5, සහ 35.2.5 සටහන් බලන්න.

4.3 දේපල, පිරියත සහ උපකරණවල සාධාරණ වටිනාකම

සමූහයේ සින්නක්කර ඉඩම් සහ ගොඩනැගිලි සහ බදු ඉඩම්වල පවතින ගොඩනැගිලි කවර හෝ සමුච්චිත ක්ෂය සහ හාණිකරණ අලාභයන් අඩු කිරීමෙන් අනතුරුව ප්‍රත්‍යාගණිත දිනයට සාධාරණ අගයට පිළිබිඹු කොට ඇත. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 13 "සාධාරණ අගය මැනීම" අනුකූලව එබඳු දේපළවල සාධාරණ අගය නිශ්චය කිරීම සඳහා සමූහය මගින් ස්වාධීන ඇගයීම් විශේෂඥයන් යොදවන ලදී. සමාන වත්කම්වල ප්‍රවර්තන වෙළෙඳපොළ මිල ගණන් ලබාගත හැකි විට, මෙවැනි වත්කම්වල අගය තක්සේරු කිරීමේදී එබඳු සාක්ෂි සළකා බලනු ලැබේ.

4.4 දේපල, පිරියත සහ උපකරණවල ප්‍රයෝජනවත් ජීවිත කාලය

සමූහය සෑම වාර්තාකරණ දිනයකදීම දේපළ, පිරියත සහ උපකරණවල අවශේෂ වටිනාකම්, ප්‍රයෝජ්‍ය ජීවිත කාලය සහ ක්ෂය වීමේ ක්‍රම සමාලෝචනය කරයි. මෙම වටිනාකම්, අනුපාතික හා ක්‍රම ඇස්තමේන්තු කිරීමේදී කළමනාකාරිත්වයෙහි විනිශ්චය යොදා ගනු ලබන බැවින් ඒවා අවිනිශ්චිතතාවන්ට යටත් වේ. එක් එක් වත්කම් වර්ගය සඳහා භාවිතා කරන ක්ෂයකිරීමේ ක්‍රම සහ අනුපාත පිළිබඳ විස්තර සටහන 28 හි දක්වා ඇත.

4.5 බදු

සමූහය ආදායම් බදු, එකතුකළ අගය මත බදු සහ වෙනත් අදාළ බදුවලට යටත් වේ. මෙම මූල්‍ය ප්‍රකාශ සකසනු ලබන අවස්ථාවේදී අදාළ කරගත හැකි බදු නීති සහ රෙගුලාසි අර්ථකථනය කිරීම සම්බන්ධයෙන් පවතින අවිනිශ්චිතතා හේතුවෙන් වර්තන බදු, විලම්බිත බදු හා වෙනත් බදු සඳහා මුළු ප්‍රතිපාදන තීරණය කිරීම සඳහා සැලකියයුතු විනිශ්චය අවශ්‍ය වේ.

4.6 බැඳීම් හා අසම්භව්‍යතා

සියලුම දැනුවත් වගකීම් ප්‍රමාණය නිගමනය කිරීමේදී ප්‍රත්‍යක්ෂ වශයෙන් පවත්නා අවදානම් ගණනය කෙරේ. අසම්භව්‍ය බැරකම් යනු ආර්ථික ප්‍රතිලාභ මාරුකිරීමේ සම්භාවිතාවක් නොපවතින හෝ විශ්වසනීය ආකාරයට මිනුම්කරණය කළ නොහැකි අවිනිශ්චිත අනාගත සිදුවීම් හෝ වර්තමාන බැඳීම් වලින් පමණක් පැවැත්ම තහවුරු වන උද්ගත විය හැකි වගකීම් වේ. අසම්භව්‍ය බැරකම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේදී හඳුනා නොගැනෙන නමුත් ඒවා දුරස්ථ වන්නේ නම් හැර හෙළිදරව් කරනු ලැබේ. බැඳීම් සහ අසම්භව්‍යතා පිළිබඳ විස්තර 41 සටහනෙහි දැක්වේ.

4.7 ආයෝජන දේපල වර්ගීකරණය

කිසියම් දේපළක් ආයෝජන දේපළක් වශයෙන් සුදුසුකම් ලබන්නේද යන්න තීරණය කිරීම සඳහා කළමනාකාරිත්වය විසින් සිය විනිශ්චය භාවිත කිරීම අවශ්‍යය. සිය විනිශ්චය නිත්‍ය ලෙස ක්‍රියාත්මක කළ හැකි වන පරිදි සමූහය මිනුම් දඩු සකස් කොට ඇත. එහිදී බදු කුලී උපයන හෝ ප්‍රාග්ධන අගය ඉහළ යාමෙන් ඉපැයීම් දරන හෝ දෙයාකාරයෙන්ම ඉපැයීම් දරන දේපළ ද, සමූහයේ වෙනත් වත්කම්වලින් විශාල වශයෙන් ස්වාධීනව මුදල් ගලන උත්පාදන ද ආයෝජන දේපළ ලෙස සලකනු ලබයි. වෙනත් ආකාරයකින් කිවහොත්, මෙහෙයුම් සඳහා හෝ සේවා සැපයුම් ක්‍රියාවලියේදී හෝ පරිපාලනමය කාර්යයන් සඳහා භාවිතා කළ හැකි දේපළක් ද, තනි වත්කමක් ලෙස සෘජු මුදල් ගලනයක් සිදුනොකරන දේපළක් ද දේපළක්, පිරියතක් සහ උපකරණයක් වශයෙන් සැළකේ. මෙවැනි දේපළවල වර්තමාන භාවිතය සැළකිල්ලට ගනිමින් වාර්ෂික පදනමක් මත සමූහය විසින් එහි දේපළවල ගිණුම්කරණ වර්ගීකරණය තක්සේරු කෙරේ.

4.8 වැදගත් ගිණුම්කරණ උපකල්පන සහ ඇස්තමේන්තු

සෑම වාර්තාකරණ දිනයකදීම සිදුකරනු ලබන උපකල්පනයන් එදිනට පවතින විශිෂ්ටතම ඇස්තමේන්තු මත පදනම් වේ. ඇස්තමේන්තු විශ්වසනීය ආකාරයෙන් මිනුම් ගත කරන බවට තහවුරු කිරීම සඳහා බැංකුවට අභ්‍යන්තර පාලන ක්‍රම අයත් වුවද, සැබෑ අගයයන් එකී ඇස්තමේන්තුවල අගයන්ගෙන් වෙනස් විය හැක. ඇස්තමේන්තු සහ එයට පාදක වූ උපකල්පනයන් නිරන්තර පදනමක් මත සමාලෝචනයට ලක් කෙරේ. ගිණුම්කරණ ඇස්මේන්තු වෙත ප්‍රතිශෝධනයන් අදාළ ඇස්තමේන්තු ප්‍රතිශෝධනයට ලක් වන කාලසීමාව තුළ සහ බලපෑමට ලක්වන කවර හෝ අනාගත කාලසීමාවකදී හඳුනා ගනී.

විනිශ්චය, ඇස්තමේන්තු සහ උපකල්පන කෙරෙහි වඩාත්ම සංවේදී ගිණුම්කරණ ප්‍රමිතීන් පහත විශේෂ කොට දක්වා ඇත.

(i) සාධාරණ අගය මිණුම්කරණය

මූල්‍යමය උපකරණවලින් සැළකිය යුතු ප්‍රමාණයක් මූල්‍යමය වාර්තාකරණ දිනයේ සාධාරණ අගය අනුව දක්වනු ලැබේ.

සාධාරණ අගය යනු අදාළ මිනුම්කරණ දිනයේදී වෙළෙඳපොළ සහභාගී වන්නන් අතර නිශ්චිත ගනුදෙනුවකදී වත්කමක් විකිණීමේදී හිමි වන හෝ බැරකමක් මාරු කිරීමේදී ගෙවීමට සිදු වන මිළ වේ.

කිසියම් වත්කමක හෝ බැරකමක වර්ගීකරණයෙහි ප්‍රතිඵලයක් වශයෙන් එය සාධාරණ අගය අනුව මිනුම්කරණයට ලක් වන අවස්ථාවකදී හැකි සෑම විටම සාධාරණ අගය තීරණය කරනු ලබන්නේ සමූහයට ආසන්නතම ප්‍රවේශය සහිත වඩාත්ම වාසිදායක ක්‍රියාකාරී වෙළෙඳපොළක තබන ලද ලංසුව හෝ ඉදිරිපත් කරන ලද මිළ සැළකිල්ලට ගනිමිනි. සුදුසු පරිදි සාධාරණ අගය වෙත ණය අවදානම සඳහා වන ගැළපුමක්ද ඇතුළත් කෙරේ.

ක්‍රියාකාරී වෙළෙඳපොළක් තුළ ලංසුගත මූල්‍ය බැරකමක ශුද්ධ විවෘත තත්ත්වයක් සඳහා සාධාරණ අගය ඉදිරිපත් කෙරෙන වර්තමාන මිළ වන අතර, මූල්‍ය වත්කමක් සඳහා සාධාරණ අගය ලංසුගත මිළ රඳවාගත් හෝ නිකුත් කරන ලද උපකරණයෙහි ඒකක සංඛ්‍යාවෙන් ගුණ කරන ලද අගය වේ.

කිසියම් වත්කමකට හෝ බැරකමකට සක්‍රීය වෙළෙඳපොලෙක් නොමැති අවස්ථාවක, සමූහය මගින් සාධාරණ අගය නිර්ණය කිරීම සඳහා යෝග්‍ය තක්සේරුකරණ ශිල්පීය ක්‍රම භාවිත කරනු ලබන අතර, එහිදී වාර්තාකරණ දිනයේ වෙළෙඳපොළ තත්ත්වයන් සහ අවදානම් මත පදනම්ව, ආසන්න නුදුරු කාලයකදී සිදුකරන ලද ගනුදෙනු වලින් ලබාගන්නා ලද මිළ ගණන් භාවිතය, වට්ටම්ගත මුදල් ප්‍රවාහ විමර්ශනයන්, වරණීය මිළකරණ ආකෘතීන් සහ වෙනත් තක්සේරුකරණ තාක්ෂණයන් ඇතුළත් කරගනී. එසේ කිරීමෙන්, නිරීක්ෂණය කළ හැකි වෙළෙඳපොළ යෙදවුම් උපරිම වශයෙන් යොදාගැනෙන සහ ආයතන විශේෂිත යෙදවුම් කෙරෙහි අවම විශ්වාසයක් තබනු ලබන තක්සේරුකරණ ක්‍රමවේදයක් භාවිතා කරමින් සාධාරණ අගය තක්සේරු කෙරේ.

ආරම්භක හඳුනා ගැනීමේදී මූල්‍ය උපකරණයක සාධාරණ අගය පිළිබඳ වඩාත් හොඳ සාක්ෂිය වන්නේ එම උපකරණයේ සාධාරණය අගය එම උපකරණය තුළ නිරීක්ෂණය කළ හැකි වෙනත් වර්තමාන වෙළෙඳපොළ ගනුදෙනු මගින් සන්සන්දනාත්මකව ඔප්පු කරන්නේනම් (උදා: නවීකරණය හෝ ප්‍රති ඇසුරුම්ගත කිරීමකින් තොරව), හෝ නිරීක්ෂණය කළ හැකි වෙළෙඳපොළක දත්ත පමණක් විචල්‍යයන් වශයෙන් ඇතුළත් වන තක්සේරුකරණ ක්‍රමවේදයක් මත පදනම් වන්නේනම් මිස ගනුදෙනු මිලය. එවැනි සාක්ෂි පවතින විටකදී බැංකුව මූලික හඳුනාගැනීමේදී ලාභ අලාභ සම්බන්ධයෙන් ගනුදෙනු මිළ සහ සාධාරණ අගය අතර වෙනස හඳුනාගනී. (උදා: පළමු දිනයේ සිට)

(ii) ණය සහ අත්තිකාරම් මත හානිකරණ අයකිරීම්

ණය හා අත්තිකාරම් සඳහා හානිකරණ අලාභ තීරණය කිරීමේදී කළමනාකාරිත්වය විසින් අනාගත මුදල් ප්‍රවාහවල ප්‍රමාණය සහ කාල ගණනය ඇස්තමේන්තු ගත කිරීමේදී විනිශ්චය වැදගත් වේ. මෙම මුදල් ප්‍රවාහ පිළිබඳව ඇස්තමේන්තු සිදුකිරීමේදී, බැංකුව ප්‍රධාන වශයෙන් ණයගැතියාගේ මූල්‍ය තත්ත්වය සහ එම ඇපවල උපලබ්ධි වටිනාකම පිළිබඳ විනිශ්චයන් සිදුකරයි. මෙම ඇස්තමේන්ත සාධක ගණනාවක් පිළිබඳ උපකල්පන මත පදනම්වන අතර, හානිකරණ දීමනාව වෙත අනාගත වෙනස්කම් ඇති කරමින් සැබෑ ප්‍රතිඵල එකිනෙකට වෙනස් විය හැකිය.

හානිකරණය සම්බන්ධ සාමූහික තක්සේරුකරණයකදී ණය සැලසුම් පෙළ ආශ්‍රිත දත්ත (ණය තත්ත්වය/හිඟ මුදල් මට්ටම්, ණය භාවිත කිරීම වැනි) සහ අවදානම පිළිබඳ අවධානය සහ ආර්ථික දත්ත (සේවා වියුක්ති මට්ටම්, උද්ධමනය, දළ දේශීය නිෂ්පාදිත අනුපාතය ඇතුළුව) සැළකිල්ලට ගනී.

5. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

මෙම ඒකාබද්ධ සහ වෙන්කරන ලද මූල්‍ය ප්‍රකාශන තුළ ඉදිරිපත් කරන සියලුම කාලසීමාවන් සඳහා සටහන 5.1 සිට සටහන 5.23 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සමූහය විසින් ස්ථිරවම යොදා ගෙන ඇත.

5.1 ඒකාබද්ධකරණ පදනම

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 10 "ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ" අනුකූලව සමූහයේ මූල්‍ය ප්‍රකාශ බැංකුවේ සහ එහි පරිපාලිත සමාගම්වල මූල්‍ය ප්‍රකාශවලින් සමන්විත වේ. බැංකුවේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා බැංකුවේ සහ එහි පරිපාලිත සමාගම්වල මූල්‍ය ප්‍රකාශවලින් සමන්විත වේ. ඒකාබද්ධකරණ කාර්යය සඳහා බැංකුවේ පරිපාලිත සමාගම්වල මූල්‍ය ප්‍රකාශ ඒකාකාර ගිණුම්කරණ ප්‍රමිතීන් භාවිත කරමින්, මහජන බැංකුවේ වාර්තාකරණ වර්ෂයන් වෙනුවෙන්ම පිළියෙල කරනු ලැබේ.

5.1.1 ව්‍යාපාර සංයෝජන

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 3 "ව්‍යාපාර සංයෝජන" නිර්වචනය යොදා ගනිමින් සමූහය යම් ගනුදෙනුවක් හෝ වෙනත් සිදුවීමක් ව්‍යාපාර සංයෝජනයක්ද යන්න තීරණය කරන අතර, එයට අත්පත් කරගත් වත්කම් සහ භාරගත් වගකීම් ව්‍යාපාරයක් ඇතුළත්වීම අවශ්‍යය. උදා: පාලනය සමූහය වෙත මාරුකරනු ලැබූ දිනට, අත්පත් කරගැනීමේ ක්‍රමය භාවිත කරමින් ව්‍යාපාර සංයෝජන සඳහා ගණන් දෙනු ලැබේ. අත්පත් කරගැනීමේදී මාරු කරන ලද ප්‍රතිශ්ධාව මෙන්ම අත්පත් කරගත් හඳුනාගත හැකි ශුද්ධ වත්කම් ද සාමාන්‍යයෙන් සාධාරණ අගයට මිනුම්කරණය කෙරේ. පැන නගින ඕනෑම කීර්තිනාමයක් හානිකරණය සඳහා වාර්ෂිකව පරීක්ෂාවට ලක් කෙරේ. මිලදී ගැනීම මත පැන නගින ලාභය වහාම ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගැනේ. ගනුදෙනු පිරිවැය ණය හෝ ස්කන්ධ සුරැකුම් නිකුත් කිරීම හා සම්බන්ධව ඇත්නම් හැර, දරන ලද වියදමක් ලෙස සලකනු ලබයි.

පෙර සිට පවතින සබඳතා පියවීමට අදාළ මුදල් ප්‍රමාණ මාරු කරන ලද ප්‍රතිශ්ධාවට ඇතුළත් නොවේ. එබඳු මුදල් ප්‍රමාණ සාමාන්‍යයෙන් ලාභ හෝ අලාභ තුළ හඳුනා ගනී.

ගෙවිය යුතු කවර හෝ අසම්භව්‍ය ප්‍රතිශ්ධාවක් අත්පත් කරගත් දිනට සාධාරණ අගය අනුව මිනුම්කරණය සිදු කෙරේ. අසම්භව්‍ය ප්‍රතිශ්ධාව ස්කන්ධය ලෙස වර්ග කෙරේ නම්, එය නැවත මිනුම්කරණය සිදු නොකරන අතර, ස්කන්ධ තුළ පියවීමට ගණන් දෙනු ලැබේ. නැතිනම් අසම්භව්‍ය ප්‍රතිශ්ධාවෙහි සාධාරණ අගයෙහි පසුකාලීන වෙනස්වීම් ආදායම් ප්‍රකාශයෙහි හඳුනා ගනී.

5.1.2 පාලනය යටත් නොවන හිමිකම් ("NCI")

පාලනයට යටත් නොවන හිමිකම් අත්පත් කරගැනීමේ දිනට අත්පත් කරන්නාගේ හඳුනාගත හැකි ශුද්ධ වත්කම්වල සමානුපාතික කොටසට මිනුම්කරණය කෙරේ. පාලනය අහිමිවීමට හේතු නොවන ආකාරයෙන් පරිපාලිත සමාගමක සමූහය සතු හිමිකම් වෙනස්වීම් ස්කන්ධ ගනුදෙනු ලෙස ගණන් දෙනු ලැබේ.

5.1.3 පරිපාලිත සමාගම්

"පරිපාලිත" සමාගම් යනු සමූහය විසින් පාලනය වනු ලබන ආයෝජිතයන් වේ. සමූහයට ආයෝජිතයා සමඟ මැදිහත් වීම හේතුවෙන් එය විචල්‍ය ප්‍රතිලාභවලට නිරාවරණය වේ නම් හෝ විචල්‍ය ප්‍රතිලාභවලට හිමිකම් ලැබේ නම් සහ ආයෝජිතයා මත සමූහය සතු බලතල හරහා බලපෑමක් කිරීමේ හැකියාව සමූහය සතු වේ නම්, එවිට සමූහය ආයෝජිතයා පාලනය කරයි. පාලනය ආරම්භ වන දින සිට අවසාන වන දින තෙක් පරිපාලිත සමාගම්වල මූල්‍ය ප්‍රකාශ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශවල ඇතුළත් කරනු ලබයි.

5.1.4 පාලනය අහිමි වීම

සමූහයට පරිපාලිත සමාගමක පාලනය අහිමි වූ විට, පරිපාලිත සමාගමෙහි වත්කම් හා බැරකම් සහ ස්කන්ධ හා සබැඳි කවර හෝ පාලනයට මැදිහත් නොවන හිමිකම් සහ වෙනත් සංරචකයන් හඳුනා නොගනී. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඇතිවන ලාභය හෝ අලාභය, ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගනී. පාලනය අහිමි වූ විට, පෙර පැවති පරිපාලිත සමාගමෙහි රඳවාගනු ලැබූ කවර හෝ හිමිකමක් සාධාරණ අගයට මිනුම්කරණය කරනු ලබයි.

5.1.5 ඒකාබද්ධකරණයේදී ඉවත් කෙරෙන ගනුදෙනු

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී අන්තර් සමූහ ශේෂ සහ ගනුදෙනු සහ අන්තර් සමූහ ගනුදෙනු තුළින් පැන නගින උපලබ්ධි නොවූ ආදායම් සහ වියදම් (විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු ලාභ සහ අලාභ හැර) ඉවත් කරනු ලැබේ. උපලබ්ධි නොවූ අලාභ ද උපලබ්ධි නොවූ ලාභ ඉවත් කෙරෙන ආකාරයටම ඉවත් කෙරෙන නමුත් හානිකරණය පිළිබඳ සාක්ෂි කිසිවක් නොපවතින තාක් දුරට එසේ කරනු ලැබේ.

5.2 විදේශ මුදල් පරිවර්තනය

විදේශ මුදල්වලින් සිදු වන ගනුදෙනු එම ගනුදෙනුව සිදු වූ දිනට බලපැවැත්වූ විනිමය තත්කාලීන අනුපාතිකය මත මූලිකව වාර්තා කෙරේ. විදේශ ව්‍යවහාර මුදලින් දක්වා ඇති මූල්‍යමය වත්කම් හා බැරකම් වාර්තාකරණ දිනට විනිමය තත්කාලීන අනුපාතිකය අනුව නැවත පරිවර්තනය කරනු ලැබේ. මෙවැනි වෙනස්වීම් ලාභ අලාභ ප්‍රකාශය තුළ හඳුනා ගනී.

විදේශ ව්‍යවහාර මුදලකින් ඓතිහාසික පිරිවැය අනුව මිනුම්කරණය කෙරෙන මූල්‍ය නොවන අයිතම, ඒවා හඳුනාගැනීමේ දිනට තත්කාලීන අනුපාතික භාවිත කරමින් පරිවර්තනය කෙරේ. විදේශ ව්‍යවහාර මුදලකින් සාධාරණ අගයට මිනුම්කරණය කෙරෙන මූල්‍ය නොවන අයිතම, සාධාරණ අගය නිශ්චය කෙරෙන දිනයට පවතින තත්කාලීන විනිමය අනුපාතික භාවිතා කරමින් පරිවර්තනය කෙරේ.

5.3 මූල්‍ය උපකරණ – මූල් වරට හඳුනා ගැනීම

5.3.1 හඳුනාගැනීමේ දිනය

මූල්‍යමය වත්කම් හෝ බැරකම් බැංකුව සාධන පත්‍රයෙහි ගිවිසුම්ගත විධිවිධානවලට පාර්ශ්වයක් බවට පත් වූ දින මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි හඳුනාගන්නා අතර එය සාමාන්‍යයෙන් වෙළෙඳාම් දිනය වේ. ණය සහ අත්තිකාරම් ණයගැතියන් වෙත මුදල් අත්තිකාරම් (හෝ බේරුම් කල) දිනයට හඳුනාගනී.

ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය මත මූල්‍ය වත්කම් මූලිකව සාධාරණ අගය අනුව හඳුනාගනී. අනෙකුත් සියළු මූල්‍ය වත්කම් මූලිකව සාධාරණ අගය සහ සෘජුව ආරෝපනය කළ හැකි ගනුදෙනු පිරිවැය අනුව හඳුනා ගනී.

මූල්‍ය වත්කම් සහ බැරකම් සම්බන්ධ විධිමත් නොවන මිලදී ගැනීම් වෙළෙඳාම් දිනට එනම් සමූහය සාධන පත්‍රයෙහි ගිවිසුම් විධිවිධානවලට පාර්ශ්වයක් බවට පත්වන දිනයේදී හඳුනා ගනී.

විධිමත් මිලදී ගැනීමක් යනු අදාළ වෙළෙඳපොලෙහි නියමයක් හෝ ප්‍රඥප්තියක් මගින් පොදුවේ ස්ථාපනය කරන ලද කාලරාමුව තුළ වත්කම් භාරදීම අවශ්‍ය වන නියමයන් සහිත ගිවිසුමක් යටතේ මූල්‍ය වත්කමක් මිලදී ගැනීමකි.

5.3.2 කාර්ය මණ්ඩල ණය සඳහා සංක්‍රමණික "දින 1" වෙනස

සියළු කාර්ය මණ්ඩල ණය වෙළෙඳපොළ පොලී අනුපාතවලට පහළ අගයකට පිරිනමන අතර, ඒවා සාධාරණ අගයට හඳුනාගනී. සාධාරණ අගය සහ මුදල් වියදම් කළ ප්‍රමාණය අතර වෙනස දින එක වෙනස ලෙස සළකා සළුල පොලී අනුපාතිකය යොදාගනිමින් ණය මුදලේ ඉතිරි කාලය තුළ ආදායම් ප්‍රකාශයෙහි සේවක පිරිවැය ලෙස ක්‍රමක්ෂය කෙරේ. මෙම ප්‍රමාණය පොලී ආදායමක් ලෙස ද පෙන්වනු ලැබේ. එමනිසා අදායම් ප්‍රකාශයෙහි ශුද්ධ ප්‍රතිඵලය ශූන්‍ය වේ.

5.4 මූල්‍ය උපකරණවල මුල් අවස්ථාවේදී මිණුම්කරණය

2018 ජනවාරි 1 දින සිට, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 9 "මූල්‍ය උපකරණ" අනුව, පහත සටහන් 5.4.1. සහ 5.4.2. හි දක්වා ඇති පරිදි මූලික හඳුනා ගැනීමේදී මූල්‍ය උපකරණවල වර්ගීකරණය ඒවායේ ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ තක්සේරුව සහ අදාළ උපකරණ කළමනාකරණය සඳහා වන ආකෘතිය මත රඳා පවතී. මූල්‍ය උපකරණ මූලිකවම සාධාරණ අගයට හඳුනා ගනී. වහාම දරන ලද ලාභය හෝ අලාභය ඔස්සේ සාධාරණ අගයට මනින ලද මූල්‍ය උපකරණ හැරුණුවිට මූල්‍ය උපකරණ මූලික මැනීමේදී ගනුදෙනු පිරිවැය ඇතුළත් කෙරේ.

5.4.1 ව්‍යාපාර ආකෘතිය තක්සේරු කිරීම

නිශ්චිත ව්‍යාපාර අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා මූල්‍ය වත්කම් සමූහය කළමනාකරණය කරන ආකාරය පිළිබිඹු කෙරෙන මට්ටමකින් සමූහයේ ව්‍යාපාර ආකෘතිය තීරණය කරයි. යම් උපකරණයක් සඳහා කළමනාකාරිත්වයේ අභිමතය මත සමූහයේ ව්‍යාපාර අකෘතිය රඳා නොපවතී. ඒ අනුව සමූහයේ ව්‍යාපාර ආකෘතිය වර්ගීකරණය සඳහා උපකරණයෙන් උපකරණයට වළඹුමක් නොවූවද ඉහළ මට්ටමේ එකතුකළ කළඹක් වන අතර පහත දැක්වෙන ආකාරයේ නිරීක්ෂණය කළ හැකි සාධක මත පදනම් වේ.

- අදාළ ව්‍යාපාර රටාව තුළ දරා සිටින ව්‍යාපාර අකෘතිය සහ මූල්‍ය වත්කම්වල කාර්යසාධනය තක්සේරු කරනු ලබන සහ සමූහයේ ප්‍රධාන කළමනාකාරිත්වය වෙත වාර්තා කරනු ලබන ආකාරය.
- ව්‍යාපාර ආකෘතියෙහි (සහ ව්‍යාපාර ආකෘතිය තුළ දරා සිටින මූල්‍ය වත්කම්වල) කාර්යසාධනය සඳහා බලපෑ හැකි අවදානම් සහ විශේෂයෙන් අදාළ අවදානම් කළමනාකරණය කර ගනු ලබන ආකාරය.
- ව්‍යාපාරයේ කළමනාකරුවන් වෙත වැටුප් ගෙවනු ලබන ආකාරය. (කළමනාකරණය කරනු ලබන වත්කම්වල සාධාරණ අගය හෝ එක්රැස් කරගත් ගිවිසුම්ගත මුදල් ප්‍රවාහය මත වැටුප් ගෙවීම පදනම් වනවාද යන්න).

"නරකම සිද්ධිය" හෝ "පීඩිතම සිද්ධිය" වශයෙන් සිද්ධීන් සැළකිල්ලට නොගෙන සැළකිය යුතු අපේක්ෂිත සිද්ධීන් මත ව්‍යාපාර ආකෘති තක්සේරුකරණය පදනම් වේ. සමූහයේ මුල් අපේක්ෂාවන්ට වෙනස් ආකාරයකින් මුදල් ප්‍රවාහ උපලබ්ධිවේනම්, එම ව්‍යාපාර ආකෘතිය තුළ දරන ලද ඉතිරි මූල්‍ය වත්කම් වර්ගීකරණය පූර්ව කාලසීමාවක ඇති නොවන අතර වෙනස්විමක්ද සිදු නොවේ. කෙසේවුවද, අලුතින් උත්පාදනය වූ හෝ අලුතින් මිලදී ගත් මූල්‍ය වත්කම් සඳහා සමූහය විසින් ව්‍යාපාර ආකෘතිය තක්සේරු කිරීමේදී, සමූහය මගින් අනෙකුත් අදාළ තොරතුරු සමඟ අතීතයේදී මුදල් ප්‍රවාහ උපලබ්ධි වූ ආකාරය පිළිබඳ තොරතුරු සැළකිල්ලට ගනු ලැබේ.

5.4.2 ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ පරීක්ෂණය – මුල් මුදල හා පොළිය පමණක් ගෙවීම (SPPI පරීක්ෂණය)

සමූහය මගින් මුල් මුදල හා පොළිය පමණක් ගෙවීමේ පරීක්ෂණය සපුරාලන්නේද යන්න හඳුනා ගැනීමට මූලික ණය වැඩපිළිවෙලෙහි ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ තක්සේරු කරයි. මෙහිදී ඒවා හිඟව පවත්නා මුල් මුදල මත මුල් මුදල සහ පොලී ගෙවීම් ලෙස සැලකේ.

මෙම කාර්යය සඳහා "මුල් මුදල" යනුවෙන් මූලික හඳුනාගැනීමේදී මූල්‍ය වත්කමේ සාධාරණ අගය ලෙස අර්ථකතනය කෙරේ. කෙසේවුවද, එම මුල් මුදල මූල්‍ය වත්කමේ ජීව කාලය තුළ වෙනස් විය හැක.

මෙම කාර්යය සඳහා "පොළිය" යන්න මුදලේ කාල අගය, නිශ්චිත කාලපරිච්ඡේදයක් තුළ හිඟ මුල් මුදල ආශ්‍රිත බැර අවදානම සහ වෙනත් මූලික ණය දිමේ අවදානම් හා පිරිවැය මෙන්ම ලාභ ආන්තිකය සඳහා ප්‍රතිශ්ඨාව සමන්විත වේ. සමූහය විනිශ්චයන් යොදා ගන්නා අතර මූල්‍ය වත්කම නම්කළ ව්‍යවහාර මුදල සහ පොලී අනුපාතය පිහිටුවන ලද කාලසීමාව ආදී අදාළ කරුණු සළකා බලනු ලැබේ.

5.5 මූල්‍ය වත්කම් හා බැරකම්වල මිනුම්කරණ කාණ්ඩ

වත්කම් සහ උපකරණවල ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලක්ෂණ කළමනාකරණය සඳහා ආයතනයේ ව්‍යාපාර ආදර්ශයේ සංයෝජනයක් මත පදනම් වී තක්සේරු කරන ස්කන්ධ උපකරණ සහ ව්‍යුත්පන්නයන් හැර, සියළුම මූල්‍ය වත්කම් පහත මිනුම්කරණ කාණ්ඩ මගින් මනිනු ලැබේ.

- ක්‍රමක්ෂය පිරිවැය (සටහන 5.5.1)
- වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගය අනුව (සටහන 5.5.2)
- ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගය (සටහන 5.5.3)

5.5.1 ක්‍රමක්ෂය පිරිවැය අනුව මිනුම්කරණය කරන ලද මූල්‍ය උපකරණ

ණය උපකරණ

පහත දැක්වෙන තත්ත්වයෙන් පවතින විට ණය උපකරණයන්හි ආයෝජන ක්‍රමක්ෂය පිරිවැය අනුව මිනුම්කරණය කෙරේ:

- හිඟව පවත්නා මුල් මුදල මත මුල් මුදල සහ පොලී පමණක් ගෙවීම් නියෝජනය කරන විශේෂ දිනවල මුදල් ප්‍රවාහ ඇතිකරන ගිවිසුම්ගත නියමයන්, සහ
- ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එක්රැස් කරගැනීමට රඳවා ගැනීම මගින් අරමුණ සාක්ෂාත් කර ගන්නා ව්‍යාපාර ආකෘතියක් තුළ දරා සිටින විට.

මෙම ණය උපකරණ මූලිකව සාධාරණ අගය සහ සෘජුව ආරෝපනය කළ හැකි ගනුදෙනු පිරිවැය අනුව හඳුනාගෙන ඇති අතර පසුව ක්‍රමක්ෂය පිරිවැය අනුව මිනුම්කරණය කෙරේ. ණය හානිකරණ මිනුම්කරණය පහත සටහන 5.6 මූල්‍ය වත්කම් හානිකරණය තුළ දක්වා ඇති ණය අලාභ ආදර්ශය හැර පියවර තුනක් මත පදනම් වේ.

බැංකු වෙත ණය හා අත්තිකාරම් සහ වෙනත් ගනුදෙනුකරුවන් වෙත ණය හා අත්තිකාරම්

පහත දැක්වෙන කොන්දේසි ද්විත්වයම සපුරාලන බැවින් සමූහය මගින් කල්බදු සහ කුලිපිට ගැනිමේ ගිවිසුම් ඇතුළුව බැංකු වෙත ණය හා අත්තිකාරම් සහ වෙනත් ගනුදෙනුකරුවන් වෙත ණය අත්තිකාරම් ක්‍රමක්ෂය පිරිවැය අනුව මිනුම්කරණය කරනු ලබයි.

- මූල්‍ය වත්කම ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එක්රැස් කරගැනීමට මූල්‍ය වත්කම් රඳවා ගැනීමේ අරමුණ සහිත ව්‍යාපාර ආකෘතියක් තුළ දරා සිටීම
- හිඟව පවත්නා මුල් මුදල මත මුල් මුදල සහ පොලී පමණක් ගෙවන මුදල් ප්‍රවාහවලට විශේෂ දිනවල ඇතිකරන මූල්‍ය වත්කම්වල ගිවිසුම්ගත නියමයන්.

5.5.2 අනෙකුත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගය අනුව මිනුම්කරණය කරන ලද මූල්‍ය උපකරණ

ස්කන්ධ උපකරණ

පහත දැක්වෙන තත්ත්වයෙන් පවතින විට ණය උපකරණයන්හි ආයෝජන අනෙකුත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගය අනුව මිනුම්කරණය කෙරේ.

- හිඟව පවත්නා මුල් මුදල මත මුල් මුදල සහ පොලී පමණක් ගෙවීම් නියෝජනය කරන විශේෂ දිනවල මුදල් ප්‍රවාහ ඇතිකරන ගිවිසුම්ගත නියමයන්, සහ
- ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එක්රැස් කරගැනීම සහ මූල්‍ය වත්කම් විකිණීම මගින් අරමුණ සාක්ෂාත් කර ගන්නා ව්‍යාපාර ආකෘතියක් තුළ දරා සිටින විට.

මෙම ණය උපකරණ මූලිකව සාධාරණ අගය සහ සෘජුව ආරෝපනය කළ හැකි ගනුදෙනු පිරිවැය අනුව හඳුනාගෙන, පසුව ක්‍රමක්ෂය පිරිවැය අනුව මිනුම්කරණය කෙරේ. සාධාරණ අගය වෙනස්වීමෙන් පැන නගින ලාභ හෝ අලාභ වෙන් වූ ස්කන්ධ සංරචකයක් ඇතුළත වෙනත් විස්තීර්ණ ආදායම තුළ ඇතුළත් කෙරේ. හානිකරණ අලාභයන් හෝ ප්‍රතිවර්තනයන්, පොලී ආදායම සහ විදේශ ව්‍යවහාර මුදල් ලාභ හෝ අලාභයන් ලාභ හා අලාභ තුළ හඳුනාගනී. බැහැර කිරීම මත, අනෙකුත් විස්තීර්ණ ආදායම තුළ මෙයට පෙර හඳුනාගත් සමුච්චිත ලාභ හෝ අලාභ ස්කන්ධයේ සිට ආදායම් ප්‍රකාශනයට ප්‍රතිවර්ගීකරණය කෙරේ.

ක්‍රමක්ෂය පිරිවැයේදී මූල්‍ය වත්කම්වලට යොදා ගත් පරිදි ණය හානිකරණය මැනීම අදියර තුනේ අපේක්ෂිත ණය අලාභවල ආකෘති මත පදනම් වේ. අපේක්ෂිත ණය අලාභ ආකෘතිය පහත සටහන 5.6 මූල්‍ය වත්කම් හානිකරණය හි දක්වා ඇත.

ස්කන්ධ උපකරණ

SLFRS 3 "ව්‍යාපාර සංයෝජන" ප්‍රමිතිය අදාළ වන ව්‍යාපාර සංයෝජනයක් තුළ බැංකුව විසින් හඳුනාගන්නා විකිණීම සඳහා දරා නොගන්නා හෝ අසම්භාව්‍ය ප්‍රතිශ්ධාවක් නොවන ස්කන්ධ උපකරණවල ආයෝජනය වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගය අනුව මිනුම්කරණය කරන අතර එහිදි වෙනස් කලනොහැකි තේරීමක් කළමනාකරණය විසින් සිදුකර ඇත. පැහැර හැරීමකින් අනෙතුත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගය යොදා ගැනීමට කළමනාකරණය විසින් වෙනස් කලනොහැකි තේරීමක් නොකරන කළඹ සඳහා, එවැනි ආයෝජන ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව මිනුම්කරණය කෙරේ.

අනෙකුත් විස්තීර්ණ ආදායම තුළ ඉදිරිපත් කෙරෙන මුදල් ප්‍රමාණයන් පසුව ලාභ හෝ අලාභ වෙත මාරු නොකෙරේ. කෙසේවෙතත්, සමුච්ඡිත ලාභ/අලාභ අනෙකුත් විස්තීර්ණ ආදායමේ සිට ස්කන්ධය තුළ රඳවාගත් ඉපයීම්වලට මාරු කරනු ලැබේ. එවැනි ආයෝජනයන්හි ලාභ අලාභ ප්‍රකාශයෙහි "වෙනත් මෙහෙයුම් ආදායම" (සටහන 10) තුළ හඳුනා ගනී.

5.5.3 ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමකින් යුත් මූල්‍ය වත්කම්

ලාභ හෝ අලාභ මත සාධාරණ අගය අනුව මූල්‍ය වත්කම් අනුව වන අයිතමයන් පහත දැක්වෙන කරුණුවලින් සමන්විත වේ:

(අ) වෙළෙඳාම පිණිස දරා සිටින.

(ආ) මුල් වරට හඳුනාගැනීම මත ලාභ හෝ අලාභ මත සාධාරණ අගය වශයෙන් විශේෂයෙන් නම් කරන ලද අයිතම; සහ

(ඇ) හුදෙක් මුල් මුදල හෝ පොලී ගෙවීම් නියෝජනය නොකරන ගිවිසුම්ගත කොන්දේසි සහිත ණය උපකරණ.

ලාභ හෝ අලාභ මත සාධාරණ අගය අනුව දරා සිටින මූල්‍ය උපකරණ දරා ඇති බවට ආදායම් ප්‍රකාශය තුල හඳුනාගත් ගනුදෙනු පිරිවැය සමඟ මූලිකව සාධාරණ අගය අනුව හඳුනාගනී. පසුව, ඒවා සාධාරණ අගය අනුව මිනුම්කරණය කොට කවර හෝ ලාභ හෝ අලාභ ඒවා පැන නගින අවස්ථාවේදී ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනී.

මූල්‍ය වත්කමක් සාධාරණ අගය අනුව මිනුම්කරණය කරනු ලබන අවස්ථාවේදී, ණය අවදානමෙහි වෙනස්වීම් වෙත ආරෝපනය කළ යුතු සාධාරණ අගයෙහි වෙනස්වීම නියෝජනය වන පරිදි, ප්‍රතිපාර්ශ්වයේ ණය වටිනාකම පිළිබිඹු වන අයුරින් ණය තක්සේරු ගැළපුමක් ඇතුළත් කෙරේ.

(අ) වෙළෙඳාම පිණිස දරා සිටින මූල්‍ය උපකරණ

මූල්‍ය උපකරණයක් වෙළෙඳාම පිණිස දරා සිටින බවට වර්ගීකරණයට ලක් වනුයේ එය නුදුරු කාලයේදී විකිණීම හෝ ප්‍රතිමිලදී ගැනීමේ මූලික අරමුණින් යුතුව අත්පත් කරගැනීම හෝ දරනු ලැබීම සිදුවූයේ නම්, හෝ එක්ව කළමනාකරණය කරනු ලබන මූල්‍ය උපකරණ කළඹක කොටසක් නිර්මාණය කරනු ලබයි නම්, එමගින් කෙටි කාලීන ලාභ ලැබීමේ සාක්ෂි සහිතනම් හෝ එය සුදුසුකම් ලබන ඉදිරි රැකුම් සබඳතාවයක නොවන ව්‍යුත්පන්නයක් වන්නේ නම් පමණි.

වෙළෙඳ ව්‍යුත්පන්නයන් සහ වෙළෙඳ සුරැකුම් වෙළෙඳාම පිණිස දරා සිටින වශයෙන් වර්ගීකරණය කෙරෙන අතර සාධාරණ අගය අනුව හඳුනාගනී.

(ආ) ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව මිනුම්කරණය කෙරෙන වශයෙන් නම් කරන ලද මූල්‍ය උපකරණ

මුල් වරට හඳුනාගැනීම මත, මූල්‍ය උපකරණ ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව මිනුම්කරණය කෙරෙන වශයෙන් නම් කෙරේ. කිසියම් මූල්‍ය වත්කමක් ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව නම් කරනු ලබන්නේ, එසේ කිරීම තුළින් වත්කම් හෝ බැරකම් වෙනස් වූ පදනම් මත මිනුම්කරණය ඔස්සේ පැන නැගිය හැකි මිනුම්කරණ සහ හඳුනාගැනීමේ අනනුකූලතාවයන් සම්පූර්ණයෙන් ඉවත් කරයිනම් හෝ සැළකිය යුතු මට්ටමින් අවප්‍රමාණය කෙරේ නම් පමණි. (එනම් ගිණුම්කරණ නොගැලපීම් ඉවත්කිරීම)

කිසියම් මූල්‍ය බැරකමක් ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව නම් කරනු ලබන්නේ එමගින් ගිණුම්කරණ නොගැළපීම ඉවත් කෙරේ නම් හෝ සැළකිය යුතු මට්ටමින් අවප්‍රමාණය කෙරේ නම් හෝ:

- ධාරක ගිවිසුමක් අන්තර්ගත ව්‍යුත්පන්න එකක් හෝ වැඩි ගණනකින් සමන්විත වන්නේ නම්, හෝ
- මූල්‍ය වත්කම් හා බැරකම් ද්විත්වයම කළමනාකරණය සහ ඒවායේ කාර්යසාධනය ලේඛණගත අවදානම් කළමනාකරණ හෝ ආයෝජන ක්‍රමෝපායකට අනුකූලව සාධාරණ අගය පදනමක් මත තක්සේරු කෙරෙන්නේ නම් පමණි.

මූල්‍ය බැරකමක් ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය නම් කරනු ලබන අවස්ථාවකදී, බැංකුවේ ස්වකීය බැරකම් තත්ත්වය තුළ ආරෝපනය කළ යුතු සාධාරණ අගයෙහි වෙනස්වීම නිරීක්ෂණය කළ හැකි වෙළෙඳපොළ පොලී අනුපාතිකයන්ට ඉහළින් බැරකම පැතිරීමේ වෙනස්වීම් නිර්ණය කිරීමෙන් ගණනය කරනු ලබන අතර, වෙනත් විස්තීර්ණ ආදායම තුළ වෙන වෙනම ඉදිරිපත් කෙරේ.

(අ) මුල් මුදල හා පොළිය පමණක් ගෙවීම නියෝජනය නොකරන ගිවිසුම්ගත නියමයන් සහිත මූල්‍ය ණය උපකරණ

මුල් මුදල හා පොළිය පමණක් ගෙවීම නියෝජනය නොකරන ගිවිසුම්ගත නියමයන් සහිත මූල්‍ය ණය උපකරණ ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට වර්ගීකරණය කරනු ලැබේ.

5.5.4 ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ සහ ඉදිරි රැකුම් ගිණුම්කරණය

ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ යනු ගිවිසුම් වන අතර ඒවායේ වටිනාකම එයට පාදක වූ මිල, දර්ශක හෝ වෙනත් විචල්‍යන් එකක් හෝ කිහිපයකින් ව්‍යුත්පන්න වන අතර, සාමාන්‍යයෙන් මේවා හුවමාරු, ඉදිරිගාමී අනුපාතික ගිවිසුම්, අනාගතයන් සහ විකල්පයන් ගෙන් සමන්විත වේ.

ව්‍යුත්පන්නයන් බලාත්මක ඉදිරි රැකුම් සබඳතාවයක කොටස් වූ සහ ඉදිරි රැකුම් ව්‍යුත්පන්නයන් වශයෙන් නම් කරන ලද අවස්ථාවක හැරුනු විට, සියළු ව්‍යුත්පන්නයන් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේදී සාධාරණ අගය අනුව හඳුනාගැනෙන අතර වෙළෙඳ කටයුතු වශයෙන් වර්ගීකරණය කෙරේ. ව්‍යුත්පන්නයක ධාරක අගය ගිවිසුමෙහි ජීව කාලය පුරා සාධාරණ අගයට ප්‍රතිමිනුම්කරණය කෙරේ. ව්‍යුත්පන්නයන් ඒවායේ සාධාරණ අගය ධනාත්මක වන විට වත්කම් වශයෙන්ද සාධාරණ අගය ඍණාත්මක වන විට බැරකම් වශයෙන්ද ඉදිරියට ගෙන යනු ලබයි (සටහන 20).

5.5.5 මූල්‍ය වත්කම් හා බැරකම් ප්‍රතිවර්ගීකරණය

SLFRS 9 ප්‍රමිතිය යොදා ගැනීමත් සමඟ, බැංකුව මගින් මුල් වරට හඳුනාගැනීමෙන් පසු එහි මූල්‍ය වත්කම් ප්‍රතිවර්ගීකරණ කරන ලද්දේ එබඳු මූල්‍ය වත්කමක් කළමනාකරණය සඳහා වන ව්‍යාපාර ආකෘතියෙහි වෙනසක් සිදුවුවහොත් පමණි. එබඳු ප්‍රතිවර්ගීකරණය ප්‍රතිවර්ගීකරණ දිනයේ සිට අනාගතයේ භාවිත කළ හැකි වශයෙන් යොදා ගනේ. මූල්‍ය වගකීම් ප්‍රතිවර්ගීකරණය නොකරනු ලැබේ.

5.6 මූල්‍ය වත්කම් හානිකරණය

ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට මිනුම්කරණය නොකෙරෙන පහත දැක්වෙන මූල්‍ය වත්කම් කාණ්ඩයන් සඳහා අපේක්ෂිත ණය අලාභය මැන බැලීම සඳහා සමූහය විසින් අදියර තුනක ප්‍රවේශයක් යොදා ගනු ලබයි:

- ක්‍රමක්ෂය පිරිවැයට සහ අනෙකුත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගය අනුව මිනුම්කරණය කෙරෙන ණය සාධන පත්‍ර;
- ණය බැඳීම්; සහ මූල්‍ය ඇපකර ගිවිසුම්.

ස්කන්ධ ආයෝජනයන් මත කිසිදු අපේක්ෂිත ණය අලාභයක් හඳුනාගනු නොලැබේ.

මූලික හඳුනාගැනීමේ සිට ණය අවදානම වෙනස්වීම මත පදනම්ව මූල්‍ය වත්කම් පහත දැක්වෙන අදියර තුන හරහා සංක්‍රමණය වේ.

අදියර 1: මාස 12 අපේක්ෂිත ණය අලාභය

මුල්වරට හඳුනාගැනීමේ සිට ණය අවදානමෙහි සැළකිය යුතු වැඩිවීමක් නොමැති වූ සහ ආරම්භයේ පටන් ණය හානිකරණය වී නොමැති නිරාවරණ සඳහා, ඊළඟ මාස 12 තුළ ඇති විය හැකි පැහැර හැරීමේ සිදුවීමේ සම්භාවිතාව ආශ්‍රිත ජීවකාල අපේක්ෂිත ණය අලාභ කොටස හඳුනා ගනී.

බැංකුව සැළකිය යුතු ණය පිරිහීමක් නොමැති ගනුදෙනුකරුවන් වෙතින් මාස 12 අපේක්ෂිත ණය අලාභය තීරණය කරයි. (එනම් පසුගිය හිඟ දින 30ට අඩු)

අදියර 2: ජීව කාල අපේක්ෂිත ණය අලාභය – ණය හානිකරණයට ලක් නොකල,

මුල්වරට හඳුනාගැනීමේ සිට ණය අවදානමෙහි සැළකිය යුතු වැඩිවීමක් සහිත එහෙත් ණය හානිකරණයක් නොමැති නිරාවරණ සඳහා, ජීව කාල අපේක්ෂිත ණය අලාභයක් (එනම් මූල්‍ය වත්කමෙහි ඉතිරි වූ ජීව කාලය පිළිබිඹු කරන) හඳුනා ගනී.

බැංකුවේ ප්‍රතිපත්තිවලට අනුකූලව, SLFRS 9 – "මූල්‍ය උපකරණ" අනුව නියමිත දිනයෙන් පසු දින 30 ක් ගතවූ යන නිශ්ප්‍රභාත්මක උපකල්පනය ඔස්සේ සැලකියයුතු හානිකරණය මිනුම්ගත කෙරේ.

බැංකුව ණය පහසුකම්/නිරාවරණ, ඉහළ අදියරක සිට පහළ අදියරක් වෙත ණය පහසුකම් අධිශ්‍රේණිගත කළ අවස්ථාවකදී හැරුනු විට, වාර දෙකක් දක්වා ප්‍රතිව්‍යුහගත කරන ලද සියළුම ප්‍රතිව්‍යුහගත ණය, මහ බැංකුව (CBSL) මගින් නිකුත් කරන ලද මාර්ගෝපදේශය අනුව අදියර 2 යටතේ සළකා බැලීම කෙරෙහිද බැංකුවේ අවධානය යොමුව ඇත.

අදියර 3: ජීව කාල අපේක්ෂිත ණය අලාභය – ණය හානිකරණයට ලක් වූ

කිසියම් වත්කමක ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ වෙත අහිතකර බලපෑමක් ඇති කරන ආකාරයේ සිදුවීම් එකක් හෝ වැඩි ගණනක් සිදු වී ඇති විට ණය හානිකරණයට ලක් වූ වශයෙන් නිරාවරණ තක්සේරු කෙරේ. ණය හානිකරණයට ලක් වූ නිරාවරණ සඳහා, ජීව කාල අපේක්ෂිත ණය අලාභය හඳුනාගන්නා අතර, පොළි ආදායම දළ ධාරණ වටිනාකමට වඩා ක්‍රමක්ෂය පිරිවැය අනුව සඵල පොලී අනුපාතිකය (දළ ප්‍රතිපාදන වලින් ශුද්ධව) යොදා ගනිමින් ගණනය කෙරේ.

SLFRS 9 – “මූල්‍ය උපකරණ” තුළ දක්වා ඇති නිශ්ප්‍රභාත්මක උපකල්පනය අනුව, සමුහය ගනුදෙනුකරුවකුගේ ගිවිසුම්ගත ගෙවීම් නියමිත දිනට වඩා දින 90 කට වැඩි ගණනක් කල් ගතව ඇති විට අදාළ ණය පහසුකම අදියර 3 ලෙස සලකනු ලැබේ. තවද, ඉහළ අදියරක සිට පහළ අදියරක් වෙත ණය පහසුකම් අධිශ්‍රේණිගත කළ අවස්ථාවකදී හැරුනු විට, වාර දෙකකට වඩා ප්‍රතිව්‍යුහගත කරන ලද සියළුම ප්‍රතිව්‍යුහගත කළ ණය සහ ප්‍රතිසැකසුම්ගත ණය අදියර 3 යටතේ වන ශ්‍රී ලංකා මහ බැංකුවේ නියමයන් අනුව අදාළ සියළුම ණය පහසුකම් අක්‍රීය වශයෙන් වර්ගීකරණයට ලක් කෙරේ.

5.6.1 මිලදීගත් හෝ උත්පාදිත ණය හානිකරණය වූ (POCI) මූල්‍ය වත්කම්

මූලික හඳුනාගැනීම මත ණය හානිකරණය වන මූල්‍ය වත්කම් අදියර 3 තුළ වර්ගීකරණය කෙරේ. වාර්තාකරණ දිනයේදී සමූහයට POCI ණය නොමැත.

5.6.2 හානිකරණයේ අදියර නිශ්චය කිරීම

එක් එක් වාර්තාකරණ දිනයේදී, වාර්තාකරණ දිනය හා මූලික හඳුනාගැනීමේ දිනය අතර අපේක්ෂිත ජීව කාලය මුළුල්ලේ ගෙවීම් පැහැරහැරීමක් සිදුවීමේ අවදානම හා සසඳමින්, සමුහය මූලික හඳුනාගැනීමේ වත්කම් සම්බන්ධ සැළකිය යුතු ණය අවදානමෙහි වැඩිවීමක් පවතීද යන්න තක්සේරු කරයි. බැංකුව මගින් මෙම අරමුණ උදෙසා අනවශ්‍ය පිරිවැයක් හෝ ප්‍රයත්නයක් නොමැතිව ලබාගත හැකි අදාළ වන සාධාරණ සහ සහයෝගී තොරතුරු මෙහිදී සළකා බලනු ලබයි. මෙයට ගුණාත්මක සහ ප්‍රමාණාත්මක තොරතුරු මෙන්ම අනාගතය දකින විශ්ලේෂණ ඇතුළත්ය.

වත්කම් තත්ත්වය පිරිහීමට ලක්වන බැවින් නිරාවරණයක් අපේක්ෂිත ණය අලාභයෙහි අදියර ඔස්සේ සංක්‍රමණය වේ. පසු කාලපරිච්ඡේදයකදී වත්කමෙහි තත්ත්වය වැඩිදියුණු වුවහොත් සහ කවර හෝ පෙර හඳුනාගත් ණය අවදානම් වැඩිවීමක් ප්‍රතිවර්තනය වුවහොත්, එවිට අඩමාන ණය සඳහා වෙන්කිරීම ජීව කාල අපේක්ෂිත ණය අලාභයෙහි සිට මාස 12 අපේක්ෂිත ණය අලාභය වෙත ප්‍රතිවර්තනය වේ. මූලික හඳුනාගැනීමේ සිට සැළකිය යුතු අන්දමින් පිරිහීමට ලක් නොවූ, හෝ පිරිහීම බැංකුවේ ආයෝජන ශ්‍රේණිගත කිරීමේ නිර්ණායක තුළ පවතින, හෝ පසුගිය හිඟ දින 30 කට අඩු නිරාවරණ පහළ ණය අවදානමක් සහිත ඒවා බවට සැළකේ. මෙවැනි මූල්‍ය වත්කම් සඳහා අඩමාන ණය වෙන්කිරීම මාස 12 අපේක්ෂිත ණය අලාභය මත පදනම් වේ.

බැංකුව යම් නිරාවරණයක ණය අවදානම කේවල හෝ සාමූහික පදනමක් මත සැළකිය යුතු මට්ටමින් ඉහළ ගොස් ඇතිද යන්න තක්සේරු කරයි. හානිකරණයේ සාමූහික තක්සේරුකරණ අරමුණු උදෙසා, මූල්‍ය සාධන පත්‍ර ගිණුම් සාධන පත්‍ර වර්ගය, ණය අවදානම් ශ්‍රේණිගත කිරීම්, මූලික හඳුනාගැනීමේ දිනය, කල්පිරීම දක්වා ඉතිරි කාලසීමාව, ක්ෂේත්‍රය සහ වෙනත් කරුණු සැළකිල්ලට ගනිමින්, පොදු ණය අවදානම් ලක්ෂණ අනුව කාණ්ඩගත කෙරේ.

5.6.3 මූල්‍ය වත්කම් කපා හැරීම

ණය සහ ණය සුරැකුම්පත් අයකරගැනීමේ යථාර්තවාදී අපේක්ෂාවක් නොමැති විට වාර්ෂිකව (අර්ධ වශයෙන් හෝ සම්පූර්ණයෙන්) කපා හරිනු ලබයි. වත්කමක් අයකළ නොහැකි අවස්ථාවක, එය අදාළ වෙන්කිරීම අනුව කපා හරිනු ලැබේ. එවැනි වත්කම් අවශ්‍ය සියලුම ක්‍රියාපටිපාටි අවසන් කිරීමෙන් සහ අලාභයේ ප්‍රමාණය තීරණය කිරීමෙන් පසු කපා හරිනු ලැබේ. පෙර කපාහරින ලද ප්‍රමාණයන් පසුකාලීන අයකිරීම් ආදායම් ප්‍රකාශය තුළ වියදම් ප්‍රමාණයෙන් අඩු කරයි.

මෙය පොදු අවස්ථාවක් වන්නේ කපාහැරීමට යටත් මුදල ආපසු ගෙවීමට ප්‍රමාණවත් මුදල් ප්‍රවාහ උත්පාදනය කළ හැකි වත්කම් හෝ ආදායම් මූලාශ්‍ර ණයකරුට නොමැති බව සමූහය තීරණය කරන අවස්ථාවේදීය. එසේ වුවත්, එම විශේෂ පහසුකම් කපාහැරීමට වසර දෙකකට වැනම් කිසිදු මුදලක් ආපසු නොගෙවන ලද වසර 2 පෙර (වැනම් බැංකුව පොදුවේ සෑම වසරකම ජූනි 30 ලෙස සලකා බලමින් කපා හැරීමට පෙර වසර 2) අක්‍රීය ණය වර්ගීකරණයට මාරු කරනු ලබයි. කෙසේවෙතත්, කපාහරින මූල්‍ය වත්කම් හිඟ මුදල අයකර ගැනීම සඳහා බැංකුවේ ක්‍රියාපටිපාටිවලට අනුකූල වීම සඳහා බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ගවලට යටත් වේ.

5.6.4 අපේක්ෂිත ණය අලාභ මිණුම්කරණය

අපේක්ෂිත ණය අලාභ අපක්ෂපාතී සහ සම්භාවිතාව මත බර තබන ලද අපේක්ෂිත අලාභවල ඇස්තමේන්තුවලින් ව්‍යුත්පන්න වන අතර, පහත පරිදි මිනුම්කරණය කෙරේ.

- වාර්තාකරණ දිනය වන විට ණය හානිකරණය නොවූ මූල්‍ය වත්කම්: සියළුම මුදල් හිඟයන්හි වර්තමාන වටිනාකම, මූල්‍ය වත්කමෙහි ජීව කාලය මුළුල්ලේ සඵල පොලී අනුපාතිකය අනුව වට්ටම් කෙරේ. මුදල් හිඟය යනු, ගිවිසුම අනුව සමහයට අය විය යුතු මුදල් ප්‍රවාහ සහ බැංකුව ලබාගැනීමට අපේක්ෂා කරන මුදල් ප්‍රවාහ අතර වෙනසය.
- වාර්තාකරණ දින වන විට ණය හානිකරණය නොවූ වත්කම්: දළ ධාරණ මුදල් ප්‍රමාණය සහ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්හි වර්තමාන වටිනාකම අතර වෙනස සඵල පොලී අනුපාතිකය අනුව වට්ටම් කෙරේ.
- ඉටුකරන ලද ණය බැඳීම්: බැඳීම ඉටු කළහොත් බැංකුව වෙත අය විය යුතු ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ සහ සමූහය ලබාගැනීමට අපේක්ෂා කරන මුදල් ප්‍රවාහ අතර වෙනසෙහි වර්තමාන වටිනාකම වේ.
- මූල්‍යමය ඇප ගිවිසුම්: සමූහය මගින් අය කර ගැනීමට අපේක්ෂා කරනු ලබන කවර හෝ මුදලක් අඩුකොට, දරන්නා වෙත ප්‍රතිපූර්ණය කිරීමට අපේක්ෂිත ගෙවීම් වශයෙන් වේ.

ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් සම්බන්ධයෙන්, අපේක්ෂිත ණය අලාභ අයකිරීම්/ආපසු හැරවීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ වත්කම්වල ධාරණ අගය තුළ අනුරූප අඩුකිරීම/වැඩි කිරීම සමඟ ලාභ සහ අලාභ තුළ හඳුනා ගනී.

අනෙකුත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගය අනුව ණය සාධන පත්‍ර සම්බන්ධයෙන්, අපේක්ෂිත ණය අලාභයන් මිනුම්කරණය ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම් සඳහා යොදාගත් තුන් අදියර ප්‍රවේශය මත පදනම් වේ. කෙසේවෙතත්, අපේක්ෂිත ණය අලාභ වෙනස්වීම මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය තුළ වත්කමෙහි ධාරණ වටිනාකමෙහි කිසිදු අඩුකිරීමක් නොකර අනෙකුත් විස්තීර්ණ ආදායම තුළ හඳුනාගත් අනුරූප ප්‍රමාණය සමඟ ලාභ සහ අලාභ තුළ හඳුනා ගනී.

5.7 මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් හඳුනාගැනීම බැහැර කිරීම

5.7.1 මූල්‍ය වත්කම්

වත්කමකින් මුදල් ප්‍රවාහයන් ලැබීමේ අයිතිය අවසන් වූ විට හෝ වත්කමකින් මුදල් ප්‍රවාහයන් ලැබීමට ඇති අයිතිය සමූහය වත්කමෙහි සියළු අවදානම් සහ ප්‍රතිලාභයන් නිත්‍ය වශයෙන් අන් අයට පවරා තිබීම යන අවස්ථාවන්හිදී සමූහය විසින් මූල්‍ය වත්කමක් හඳුනාගැනීම බැහැර කරනු ලැබේ. සමූහය විසින් නිර්මාණය කරනු ලබන හෝ රඳවාගෙන සිටින මාරු කරන ලද මූල්‍ය වත්කම කවර හෝ හිමිකමක් වෙනම වත්කමක් හෝ බැරකමක් වශයෙන් හඳුනාගනී.

5.7.2 මූල්‍ය වගකීම්

බැරකම යටතේ පවතින බැඳීම අත්හළ විට හෝ අදාළ ගිවිසුම අවලංගු වූ විට හෝ කල් ඉකුත් වූ විට සමූහය මගින් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙන් මූල්‍ය බැරකම හඳුනාගැනීම බැහැර කරනු ලැබේ.

5.7.3 මූල්‍ය උපකරණ හිලව් කිරීම

මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් හිලව් කර මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි ශුද්ධ වටිනාකම වාර්තා කරන්නේ, වටිනාකම් හිලව් කිරීමට බැංකුවට නීතිමය අයිතියක් ඇති සහ ශුද්ධ පදනමක් මත පියවීමට නැතහොත් වත්කම උපලබ්ධි කර ඒ සමඟම බැරකම් නිරවුල් කිරීමට අභිප්‍රායක් ඇති අවස්ථාවලදී පමණි.

5.8 කල්බදු

5.8.1 මූල්‍ය කල්බදු ආදායම

නෛතික හිමිකම හැර හිමිකාරිත්වය හා සබැඳි සියළුම අවදානම් හා ප්‍රතිලාභ සමූහය විසින් සැළකිය යුතු ලෙස ගනුදෙනුකරුවන් වෙත මාරුකරමින් ගනුදෙනුකරුවන් වෙත කල්බදු මත ලබාදෙන ලද වත්කම් මූල්‍ය කල්බදු වශයෙන් වර්ගීකරණය කෙරේ. මූල්‍ය කල්බදු යටතේ ලැබිය යුතු මුදල් ලැබිය යුතු කල්බදු කුලිය යටතේ ඇතුළත් කරනු ලබයි. ලැබුනු මූලික කුලිය අඩු කිරීමෙන් පසුව, කල්බදු ශේෂයන් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි ඉදිරිපත් කොට ඇත.

කල්බදු මත ලබාදී ඇති වත්කම්වල පිරිවැය ඉක්මවා ලැබිය යුතු සමුච්චිත කුලිවල අතිරික්තයෙන් මුළු නොපියවූ ආදායම සැදුම් ලබයි. කල්බදු දීම ක්‍රියාත්මක වූ මාසයෙන් ආරම්භ වූ බදු කාලසීමාව පුරා නොඉපයූ ආදායම, බද්දේ ඉතිරිව පවතින ලැබිය යුතු ශේෂයට සමානුපාතිකව ආදායමට ඇතුළත් කෙරේ.

5.8.2 SLFRS 16 – කල්බදු

SLFRS 16 – "කල්බදු" මගින් කල්බදු හඳුනාගැනීම, අගයකිරීම, ඉදිරිපත් කිරීම සහ අනාවරණය කිරීම පිළිබඳ මූලධර්ම නියම කරයි.

සමූහය කල්බදු ආරම්භ කරන දිනයට භාවිතයට අයිතිය ඇති වත්කම් සහ කල්බදු වගකීම් හඳුනාගනී. භාවිතයට අයිතිය ඇති වත්කම් මූලිකව ආරම්භක දිනයට හෝ ඊට පෙර සිදුකළ යම් කල්බදු ගෙවීම් සඳහා ගලපන ලද කල්බදු වගකීමේ මුල් මුදල ඇතුළත් පිරිවැයට මනිනු ලැබේ. භාවිතයට අයිතිය ඇති වත්කම් පසුව ආරම්භක දිනයේ සිට කල්බදු කාලය අවසන් වන දිනය දක්වා සරල මාර්ග ක්‍රමය භාවිතයෙන් ක්ෂය කරනු ලැබේ. ඊට අමතරව, භාවිතයට අයිතිය ඇති වත්කම හානිකරන අලාභ ඇත්නම් කලින් කල අඩුකරන අතර, කල්බදු වගකීමේ සමහර නැවත මැනීම් සඳහා ගලපනු ලැබේ.

කල්බදු වගකීම මූලිකවම ආරම්භක දිනයට ගෙවා නොමැති කල්බදු ගෙවීමේ වර්තමාන වටිනාකමට අගය කරන අතර කල්බද්දේ ගම්‍ය පොලී අනුපාතය හෝ එම අනුපාතය පහසුවෙන් තීරණය කර නොහැකිනම් සමූහයේ වර්ධක ණය අනුපාතය භාවිතයෙන් වට්ටම් කෙරේ. පොදුවේ, සමූහය එහි වර්ධක ණය අනුපාතය වට්ටම් අනුපාතය ලෙස භාවිතා කරයි. කල්බදු වගකීම පසුව ඵලදායී පොලී ක්‍රමය භාවිතයෙන් ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලබයි. අනාගත කල්බදු ගෙවීම්වල වෙනසක් ඇති අවස්ථාවේදී එය නැවත මනිනු ලැබේ.

ඊට අමතරව, බැංකුව විසින් LKAS 17 යටතේ මෙහෙයුම් කල්බදු ලෙස මෙයට පෙර වර්ගීකරණය කළ කල්බදුවල SLFRS 16 විසින් අවසර දෙන ලද පහත සඳහන් ප්‍රායෝගික ක්‍රියාමාර්ග යොදා ගනු ලැබීය.

- සාධාරණ සමාන ගතිලක්ෂණ සහිත කල්බදු කළඹකට තනි වට්ටම් අනුපාතයක් යොදා ගැනීම.
- මූලික යොදා ගැනීමේ දිනයට භාවිතයට අයිතිය ඇති වත්කම් අගය කිරීමේ මූලික සෘජු පිරිවැය ඉවත්කිරීම.

සමූහය මූල්‍ය ප්‍රකාශනවලට සටහන් 28 – දේපල, පිරියත හා උපකරණ යටතේ භාවිතයට අයිතිය ඇති වත්කම් ඉදිරිපත් කරන අතර අනුරූප කල්බදු වගකීම සටහන 35 "වෙනත් වගකීම්" හි ඉදිරිපත් කෙරේ.

5.9 මුදල් සහ මුදල් සමාන දෑ

මුදල් හා මුදලට සමාන දෑවලට අතැති මුදල්, බැංකුවල පවතින ශේෂයන්, ඒක්ෂණ මුදල් සහ කෙටිකාලීන දැන්වීම් මුදල් සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ස්ථාවර තැන්පතු ඇතුළත් වේ. මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් 17 හි මුදල් සහ මුදලට සමාන දෑ පිළිබඳ විස්තර දක්වා ඇත. මුදල් හා මුදලට සමාන දෑ ක්‍රමක්ෂය පිරිවැයට ගෙන යනු ලැබේ. හානිකරණයෙන් ඇතිවන අලාභ ලාභ හෝ අලාභ ප්‍රකාශයෙහි 11 සටහන තුළ හඳුනා ගනී.

5.10 අවදානම් කළමනාකරණ කාර්යය වෙනුවෙන් රඳවාගත් ව්‍යුත්පන්න

අවදානම් කළමනාකරණ කාර්යය වෙනුවෙන් රඳවාගත් ව්‍යුත්පන්නවලට වෙළෙඳ වත්කම් සහ බැරකම් වශයෙන් වර්ගීකරණය නොකරන ලද සියළුම ව්‍යුත්පන්න වත්කම් සහ බැරකම් ඇතුළත් වේ. අවදානම් කළමනාකරණ කාර්යය වෙනුවෙන් රඳවාගත් ව්‍යුත්පන්න මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි සාධාරණ අගයට මිනුම් කෙරේ.

5.11 ආයෝජන දේපල

කුලී ආදායම ඉපැයීම හෝ ප්‍රාග්ධන අගය වැඩිවීම හෝ මෙම කරුණු දෙකම වෙනුවෙන් දරා සිටින වනමුත් සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී විකිණීම සඳහා නොපවතින දේපළ ආයෝජන දේපළ වේ. මේවා භාණ්ඩ හා සේවා නිපැයුම හෝ සැපයුම හෝ පරිපාලන කාර්යයන් වෙනුවෙන් භාවිතා කෙරේ.

5.11.1 හඳුනාගැනීමේ පදනම

ආයෝජන දේපළ හා සබැඳි අනාගත ආර්ථික ප්‍රතිලාභ සමූහය තුළට ගලා ඒමේ සම්භාවිතාවක් පවතී නම් සහ ආයෝජන දේපලෙහි පිරිවැය විශ්වසනීය ලෙස මිනුම්කරණය කළ හැකි වේ නම් ආයෝජන දේපළ හඳුනාගනී.

5.11.2 මිනුම්කරණය

ආයෝජන දේපළක් මූලිකමව එහි පිරිවැයට මිනුම්කරණය කරනු ලැබේ. මිලට ගත් ආයෝජන දේපළක පිරිවැය, එය මිලදීගත් මිල සහ සෘජුවම ආරෝපනය වන වියදම් වලින් සැදුම් ලබයි. ස්වයං නිර්මිත ආයෝජන දේපළක පිරිවැය, ඉදිකිරීම හෝ සංවර්ධනය කිරීම අවසන් කරන ලද දිනට එහි පිරිවැය වේ.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති – LKAS 40 "අයෝජන දේපළ" අනුකූලව සමූහය ආයෝජන දේපළ පසුකාලීන මැනීම සඳහා ප්‍රත්‍යාගණන ආකෘතිය යොදා ගනී. ඒ අනුව, ආයෝජන දේපළ ලෙස වර්ගීකරණය කරන ලද ඉඩම් සමුච්චිත හානිකරණ අලාභ අඩුකළ පිරිවැයට සඳහන් කරන අතර, ආයෝජන දේපළ ලෙස වර්ගීකරණය කරන ලද ගොඩනැගිලි සමුච්චිත ක්ෂය හා සමුච්චිත හානිකරණ අලාභ අඩු කර පිරිවැයට සඳහන් කරනු ලැබේ.

5.12 අස්පෘශ්‍ය වත්කම් හා කීර්තිනාමය

අත්පත් කරගැනීමේ දිනට අත්පත් කරගත් පරිපාලිත සමාගමෙහි ශුද්ධ හඳුනාගත හැකි වත්කම්වල සමූහයේ කොටස සතු සාධාරණ අගය ඉක්මවන අත්පත් කරගැනීමේ පිරිවැයෙහි අතිරික්තය කීර්තිනාමය නියෝජනය කරයි. ව්‍යාපාර සංයෝජනයකදී අත්පත් කරගත් කීර්තිනාමය හානිකරණය සම්බන්ධයෙන් වාර්ෂිකව හෝ සිදුවීම් හෝ පවතින තත්ත්වයන් වෙනස්වීම් මගින් එය හානි වී ඇති බව හඟවයි නම්, සහ සමුච්චිත හානිකරණ අලාභ අඩු කර පිරිවැයට ගෙනයයිනම් නිතරම පරීක්ෂා කෙරේ. කීර්තිනාමය මත හානිකරණ අලාභ ප්‍රතිවර්තනය නොකෙරේ.

5.12.2 මෘදුකාංග

සමූහය විසින් අත්පත් කරගන්නා ලද මෘදුකාංග, සමුච්චිත ක්‍රමක්ෂය සහ හානිකරණ අලාභ අඩු කර පිරිවැයට මිනුම්කරණය කරනු ලැබේ.

සමූහය විසින් අදාළ සංවර්ධනය සම්පූර්ණ කිරීමේ සිය අභිප්‍රාය සහ හැකියාව විදහා දැක්වීමට, අනාගත ආර්ථික ප්‍රතිලාභ උපදවන ආකාරයෙන් මෘදුකාංගය භාවිතා කිරීමට සහ අදාළ සංවර්ධනය සම්පූර්ණ කිරීමේ පිරිවැය විශ්වසනීය අයුරින් මැනිය හැකි වූ විට, අභ්‍යන්තර වශයෙන් සකස් කරන ලද මෘදුකාංග මත වියදම වත්කමක් ලෙස හඳුනා ගනී. අභ්‍යන්තර වශයෙන් සකස් කරන ලද මෘදුකාංගවල ප්‍රාග්ධනිත පිරිවැයට එම මෘදුකාංගය සකස් කිරීම වෙනුවෙන් සෘජුවම පැවරිය හැකි සියළු පිරිවැය සහ ප්‍රාග්ධනිත ණය ගැනීම් පිරිවැය ඇතුළත් වන අතර, එම ප්‍රාග්ධනිත පිරිවැය එහි ප්‍රයෝජනවත් ආයු කාලය මුළුල්ලේ ක්‍රමක්ෂය කෙරේ. සමුච්චිත ක්‍රමක්ෂය සහ යම් හානිකරණය අඩු කළ ප්‍රාග්ධනිත පිරිවැයට අභ්‍යන්තර වශයෙන් සකස් කරන ලද මෘදුකාංග සඳහන් කරනු ලැබේ.

මෘදුකාංග වත්කම් වෙනුවෙන් පසුකාලීනව කෙරෙන වියදම් ප්‍රාග්ධනීයකරණය කරනු ලබන්නේ එය සම්බන්ධව ඇති නිශ්චිත වත්කමෙහි ගැබ්ව ඇති අනාගත ආර්ථික ප්‍රතිලාභ ඒ මගින් වැඩි වන විට පමණි. අනෙකුත් සියළුම වියදම් ඒවා දරන ලද ආකාරයට වියදම් කෙරේ.

5.12.3 ක්‍රමක්ෂය

මෘදුකාංග භාවිතයට ලබාගත හැකි දින සිට එහි ඇස්තමේන්තුගත ඵලදායී ජීව කාලය මුළුල්ලේ ආදායම් ප්‍රකාශය තුළ සරල මාර්ගික පදනමක් මත ක්‍රමක්ෂය කෙරේ. වර්තන හා සාපේක්ෂ කාලසීමාවන් සඳහා මෘදුකාංගයේ ඇස්තමේන්තුගත ඵලදායී ජීව කාලය වසර පහකි.

ක්‍රමක්ෂය ක්‍රම, ඵලදායී ජීව කාල සහ අවශේෂි අගයන් සෑම වාර්තා කරන දිනටම සමාලෝචනය කර යෝග්‍ය පරිදි ගැලපීම් කරනු ලැබේ.

5.13 මූල්‍ය නොවන වත්කම් හානිකරණය

5.12.1 හඳුනාගැනීමේ පදනම

වත්කමක් හානිකරණය පිළිබඳ හැඟවීමක් තිබේද යන්න සමූහය සෑම වාර්තාකරණ දිනටම තක්සේරු කරයි. කිසියම් හැඟවීමක් ඇති නම්, හෝ වත්කමක් වෙනුවෙන් වාර්ෂික හානිකරණ පරීක්ෂාව අවශ්‍ය වන්නේ නම්, බැංකුව වත්කමෙහි නැවත අයකර ගත හැකි වටිනාකම ඇස්මේන්තු කරයි. වත්කමේ නැවත අයකර ගත හැකි වටිනාකම යනු වත්කමක හෝ මුදල් ජනන ඒකකයක විකිණුම් පිරිවැය අඩු කළ සාධාරණ අගය සහ එහි භාවිත අගය යන දෙකෙන් වඩාත් වැඩි අගය වේ. වත්කමක හෝ මුදල් ජනන ඒකකයක ධාරණ අගය එහි නැවත අය කර ගත හැකි වටිනාකම ඉක්මවන අවස්ථාවක වත්කම හානිකරණ වූ ලෙස සලකනු ලබන අතර, එහි නැවත අය කරගත හැකි අගයට සටහන් කරනු ලැබේ. භාවිත අගය තක්සේරු කිරීමේදී, මුදලේ කාල අගය සහ වත්කමට සුවිශේෂී වූ අවදානම්වල ප්‍රවර්තන වෙළෙඳපොළ තක්සේරු පිළිබිඹු කරන බදු වලට පෙර වට්ටම් අනුපාතිකයක් භාවිත කරමින් ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ ඒවායේ වර්තමාන අගයට වට්ටම් කරනු ලැබේ. විකිණුම් පිරිවැය අඩු කළ සාධාරණ අගය නිශ්චය කිරීමේදී, සුදුසු තක්සේරු ක්‍රමයක් භාවිතා කෙරේ. තක්සේරු ගුණිත, ප්‍රසිද්ධියේ වෙළෙඳාම් කරන පරිපාලිත සමාගම්වල මිල ප්‍රකාශිත කොටස් මිල ගණන් හෝ වෙනත් පවතින සාධාරණ අගය දර්ශක මගින් මෙම ගණනය කිරීම් තහවුරු කරනු ලබයි.

5.13.2 මිනුම්කරණය

කීර්තිනාමය හැර වෙනත් වත්කම් සඳහා, පෙර හඳුනාගන්නා ලද හානිකරණ අලාභ තවදුරටත් නොපවතීද නැතහොත් අඩුවීද යන්න පිළිබඳ හැඟවීමක් තිබේද යන්න සම්බන්ධයෙන් සෑම වාර්තාකරන දිනටම තක්සේරුවක් කරනු ලැබේ. එවැනි හැඟවීමක් පවතී නම්, සමූහය වත්කමෙහි හෝ මුදල් ජනන ඒකකයෙහි නැවත අය කර ගත හැකි වටිනාකම ඇස්තමේන්තු කරයි. අවසන් වරට හානිකරණ අලාභය හඳුනාගැනීමේ සිට වත්කමෙහි නැවත අය කර ගත හැකි වටිනාකම නිශ්චය කිරීම පිණිස භාවිත කරන ලද උපකල්පනවල වෙනසක් සිදුවී තිබේ නම් පමණක් පූර්වයෙන් හඳුනාගනු ලැබූ හානිකරණයක් ප්‍රතිවර්තනය කෙරේ. පෙර වර්ෂයේදී වත්කම් වෙනුවෙන් කිසිදු හානිකරණයක් හඳුනාගෙන නොතිබිණි නම්, වත්කමෙහි ධාරණ අගය එහි නැවත අය කර ගත හැකි වටිනාකම නොඉක්මවන පරිදි ක්ෂය අඩු කළ නිශ්චය කළ හැකිව තිබූ ධාරණ අගය නොඉක්මවන පරිදි ප්‍රතිවර්තනය සීමා කරනු ලැබේ. එවැනි ප්‍රතිවර්තන ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනී.

කීර්තිනාමය සම්බන්ධ හානිකරණ අලාභ, අනාගත කාලපරිච්ඡේදයන් තුළ ප්‍රතිවර්තනය නොකෙරේ.

හානිකරණය වීම සම්බන්ධයෙන් කීර්තිනාමය වාර්ෂිකව හෝ සිදුවීම් හෝ තත්ත්වයන්හි වෙනස්වීම් මගින් ධාරණ අගය හානිකරණය වී ඇති බව හැඟවේ නම් එයට වැඩි වාරගණනක් සමලෝචනය සිදු කෙරේ. හානිකරණ පරීක්ෂා කිරීමේ කාර්යය වෙනුවෙන් ව්‍යාපාර සංයෝජනයකදී අත්පත් කරගත් කීර්තිනාමය, එම අත්පත් කරගැනීමේ දිනයේ සිට අත්පත් කරගනු ලැබූ සමාගමෙහි අනෙකුත් වත්කම් හා බැරකම් බැංකුවේ මුදල් ජනන ඒකක හෝ සමූහයේ මුදල් ජනන ඒකක කාණ්ඩ වලට පවරා තිබේද යන්න නොසළකා, එම සංයෝජනය සහ ක්‍රියාවන් වෙතින් ප්‍රතිලාභ ලැබීම අපේක්ෂිත එම එක් එක් ඒකකය වෙත පවරනු ලැබේ. කීර්තිනාමය පවරනු ලැබූ එක් එක් ඒකකය, අභ්‍යන්තර කළමනාකරණ කාර්යයන් වෙනුවෙන් කීර්තිනාමය අධීක්ෂණය කරනු ලබන අවම මට්ටම නියෝජනය කරන අතර, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 08 "මෙහෙයුම් බණ්ඩ" සමග අනුකූලව මෙහෙයුම් බණ්ඩයකට වඩා විශාල නොවේ.

කීර්තිනාමය මුදල් ජනන ඒකකයක (හෝ මුදල් ජනන ඒකක සමූහයක) කොටසක් සහ එම ඒකකය තුළ උපයෝජ්‍ය කෙරෙන මෙහෙයුම්වල කොටසක් නිර්මාණය කරන විට, එම මෙහෙයුම උපයෝජ්‍ය කිරීම මත ලාභය හෝ අලාභය නිශ්චය කිරීමේදී උපයෝජ්‍ය කෙරෙන මෙහෙයුම හා සබැඳි කීර්තිනාමය මෙහෙයුමෙහි ධාරණ අගයට ඇතුළත් කරනු ලැබේ.

මෙම තත්ත්වය තුළ උපයෝජ්‍ය කරනු ලබන කීර්තිනාමය, උපයෝජ්‍ය කෙරෙන මෙහෙයුමෙහි සහ රඳවාගත් මුදල් ජනන ඒකකවල කොටසෙහි සාපේක්ෂ අගයන් මත පදනම්ව මිනුම්කරණය කෙරේ.

පරිපාලිත සමාගම් විකිණීම සිදුකෙරෙන විට, විකුණුම් මිල සහ ශුද්ධ වත්කම් අතර වෙනස සහ සමුච්චිත පරිවර්තන වෙනස්කම් හා කීර්තිනාමය ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනී.

5.14 විශ්‍රාම ප්‍රතිලාභ

GRI 201-3

5.14.1 නිශ්චිත විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම්

5.14.1.1 1996 පෙර – විශ්‍රාම භාර අරමුදල

1996 ජනවාරි 1 දිනට පෙර බැංකුවේ සේවයට බඳවා ගත් ස්ථිර කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා නිශ්චිත ප්‍රතිලාභ විශ්‍රාම සැලසුමක් බැංකුව ක්‍රියාත්මක කරන අතර, ඒ සඳහා වෙනමම පරිපාලනය කෙරෙන අරමුදලක් වෙත දායකත්වය ලබාදීම අවශ්‍ය වේ. මෙම විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම යටතේ ප්‍රතිලාභ ලබාදීමේ වියදම, ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය භාවිතා කරමින් වෙනමම තීරණය කරනු ලැබේ.

අඩු කිරීම් නොමැතිව මෙතෙක් හඳුනාගෙන නොමැති අතීත සේවා පිරිවැය, බැඳීම් සෘජුවම පියවීමට ඇති සැලසුම් වත්කම්වල සාධාරණ අගය හා මෙතෙක් හඳුනාගෙන නොමැති ආයුගණක අලාභ අඩු කළ නිශ්චිත ප්‍රතිලාභ බැඳීමේ වර්තමාන අගයෙන් නිශ්චිත ප්‍රතිලාභ වත්කම් හෝ බැරකම් සමන්විත වේ. යම් වත්කමක අගය මෙතෙක් හඳුනාගෙන නොමැති ආයුගණක අලාභ සහ අතීත සේවා පිරිවැය වකතුව, සැලසුමෙන් ආපසු ගෙවීම් ආකාරයෙන් පවතින කවර හෝ ආර්ථික ප්‍රතිලාභ හෝ සැලසුම වෙත අනාගත දායකත්වයන්ගේ අඩු කිරීම්වලට සීමා කෙරේ.

නවතම ආයුගණක තක්සේරුව ඇමරිකානු ආයුගණක ඇකඩමියේ සාමාජික හා අයුගණානය පිළිබඳ උපදේශක පියල් එස් ගුණතිලක මහතා F.S.A (USA) විසින් 2025 දෙසැම්බර් 31 දිනට සිදුකරන ලදී.

විශ්‍රාම ගන්නා සේවකයින් වෙත බැංකුව පහත දැක්වෙන පදනම මත විශ්‍රාම වැටුපක් ලබා දේ. සේවකයකු වසර 10 සම්පූර්ණ කළ පසු හා සාමාන්‍ය විශ්‍රාම යාමේ වයස අවුරුදු 55 සම්පූර්ණ කල පසු විශ්‍රාම වැටුප් ලැබීමේ සුදුසුකම් ලබයි. ගෙවනු ලබන විශ්‍රාම වැටුපේ ප්‍රමාණය පහත පරිදි සේවා කාලය මත රඳා පවතී.

සේවා කාලය	විශ්‍රාම වැටුපේ ප්‍රමාණය
i. වසර 10 සිට 20 දක්වා	අවසන් වරට ලද දළ වැටුපෙන් 80%
ii. වසර 21 සිට 29 දක්වා	අවසන් වරට ලද දළ වැටුපෙන් 80% සහ වසර 20කට වැඩි එක් එක් අමතර වසර සඳහා 1%
iii. වසර 30 සහ ඉහළ	අවසන් වරට ලබාගත් දළ වැටුපෙන් 90%

1996ට පෙර - විශ්‍රාම වැටුප් භාර අරමුදලේ මූල්‍ය ප්‍රකාශන වෙනම පවත්වා ගෙන යනු ලබන අතර, එය ස්වාධීන බාහිර විගණකවරුන්ගේ වාර්ෂික විගණනයට යටත් වේ. මූල්‍ය ප්‍රකාශ මෙන්ම විගණකගේ වාර්තාවද ඉදිරිපත් කරනු ලබන අතර භාරකාර මණ්ඩලය විසින් ඒවා සමාලෝචනය කරනු ලබයි. අරමුදල අවශ්‍ය මට්ටම්වල සිදුකරන බව සහතික කිරීමේ බැඳීමක් බැංකුවට ඇති බැවින් මෙම මූල්‍ය ප්‍රකාශ හා විගණකගේ වාර්තාව බැංකුවේ නිරාවරණ පිළිබඳ සමාලෝචනය සඳහා ද ඉදිරිපත් කරනු ලැබේ. විශ්‍රාමිකයා ජීවත් වන තාක් විශ්‍රාම වැටුප මාසිකව ගෙවීමට නියමිතය.

5.14.1.2 පශ්චාත් – 1996 – විශ්‍රාම වැටුප් අරමුදල

1996 ජනවාරි 1 දිනෙන් පසුව බැංකුවේ සේවයට බැඳුනු ස්ථිර සේවකයින් සඳහා 2014 සිට ක්‍රියාත්මක නිශ්චිත ප්‍රතිලාභ සැලසුමක් වන අතර, ඒ සඳහා වෙනමම පරිපාලනය කෙරෙන අරමුදලක් වෙත දායකත්වය ලබාදීම අවශ්‍ය වේ. මෙම නිශ්චිත ප්‍රතිලාභ සැලසුම යටතේ ප්‍රතිලාභ ලබාදීමේ වියදම, ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය භාවිතා කරමින් වෙනමම තීරණය කරනු ලැබේ.

ශුද්ධ නිශ්චිත ප්‍රතිලාභ වත්කම හෝ වගකීම මෙතෙක් හඳුනා නොගත් පසුගිය සේවා පිරිවැය අඩුකළ සහ සැලසුම් වත්කම්වල සාධාරණ අගය අඩුකළ නිශ්චිත ප්‍රතිලාභ බැඳීමේ වර්තමාන අගය සමන්විත වන අතර, මෙතෙක් හඳුනා නොගත් අයුගණක අලාභ අඩුකර බැඳීම් සෘජුවම නිරවුල් කිරීමට නියමිතය. යම් ආයුගණක අලාභ, සහ මෙතෙක් හඳුනා නොගත් පසුගිය සේවා පිරිවැය සහ සැලැස්මකින් ආපසු ගෙවීම් ආකාරයෙන් ලබාගතහැකි යම් ආර්ථික ප්‍රතිලාභවල වර්තමාන අගය සහ සැලැස්මට අනාගත දායකත්වයන් හි අඩුකිරීම්වල එකතුවට යම් වත්කමක වටිනාකම සීමා කෙරේ.

නවතම ආයුගණක තක්සේරුව ඇමරිකානු ආයුගණක ඇකඩමියේ සාමාජික හා අයුගණනය පිළිබඳ උපදේශක පියල් එස් ගුණතිලක මහතා F.S.A (USA) විසින් 2025 දෙසැම්බර් 31 දිනට සිදුකරන ලදී.

බැංකුව පහත පදනම මත විශ්‍රාමික කාර්ය මණ්ඩලයට විශ්‍රාම වැටුපක් ලබා දේ. කාර්ය මණ්ඩලය වසර 10ක සේවයකින් පසු සහ වයස අවුරුදු 55 නාමික විශ්‍රාම වයසට ලඟාවීමෙන් පසු විශ්‍රාම වැටුපක් ලබා ගැනීමට සුදුසුකම් ලබයි. ගෙවන ලද විශ්‍රාම වැටුපේ ප්‍රමාණය පහත පරිදි සේවා කාලය මත රඳා පවතී:

සේවා කාලය	විශ්‍රාම වැටුපේ ප්‍රමාණය
i. වසර 10 සිට 25 දක්වා	විශ්‍රාම සහිත වැටුපෙන් 40%ක් සහ වසර 25 දක්වා වසර 10ට වැඩිවන එක් එක් අමතර වසර සඳහා 0.5%
ii. වසර 26 සිට 40 දක්වා	විශ්‍රාම සහිත වැටුපෙන් 47.5%ක් සහ වසර 40 දක්වා වසර 26ට වැඩිවන එක් එක් අමතර වසර සඳහා 1.5%
iii. වසර 41 සිට 42 දක්වා	විශ්‍රාම සහිත වැටුපෙන් 70%ක් සහ වසර 42 දක්වා වසර 41ට වැඩිවන එක් එක් අමතර වසර සඳහා 2.0%
iv. වසර 42 සහ ඉහළ	විශ්‍රාම සහිත වැටුපෙන් 74%

1996ට පසු – විශ්‍රාම වැටුප් භාර අරමුදලේ මූල්‍ය ප්‍රකාශන වෙනම පවත්වා ගෙන යනු ලබන අතර, එය ස්වාධීන බාහිර විගණකවරුන්ගේ වාර්ෂික විගණනයට යටත් වේ. මූල්‍ය ප්‍රකාශ මෙන්ම විගණකගේ වාර්තාවද ඉදිරිපත් කරනු ලබන අතර භාරකාර මණ්ඩලය විසින් ඒවා සමාලෝචනය කරනු ලබයි. අරමුදල අවශ්‍ය මට්ටම්වල සිදුකරන බව සහතික කිරීමේ බැඳීමක් බැංකුවට ඇති බැවින් මෙම මූල්‍ය ප්‍රකාශ හා විගණකගේ වාර්තාව බැංකුවේ නිරාවරණ පිළිබඳ සමාලෝචනය සඳහා ද ඉදිරිපත් කරනු ලැබේ. විශ්‍රාමිකයා ජීවත් වන තාක් විශ්‍රාම වැටුප මාසිකව ගෙවීමට නියමිතය.

5.14.1.3 පාරිතෝෂිතය

1996 ජනවාරි 1 දින හෝ පසුව බැංකුවේ සේවයට බැඳුනු සේවකයින් 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත යටතේ පාරිතෝෂික ලැබීමට සුදුසුකම් ලබන අතර, එසේ නැතහොත් යෝජිත පශ්චාත් 1996 නව විශ්‍රාම වැටුප් අරමුදලට එක්වීමට මනාපය පළ කළ හැකි අතර, එවිට පාරිතෝෂිකයට ඇති අයිතිය අහෝසි වේ.

විශ්‍රාම ගැනීම හැරුනු විට, අන් ආකාරයකින් සේවය අවසන් කරන ලද සෙසු සේවකයින්, 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත යටතේ වසර 5 කට වැඩි කාලයක් සේවය කර ඇති සේවකයින් සඳහා අඛණ්ඩව සේවය කළ සෑම වසරක් වෙනුවෙන් සේවය නතර කරන ලද මූල්‍ය වසරේ අවසන් මාසයට අදාළ දළ වැටුපෙන් එක් අර්ධයක අනුපාතයට සමාප්තික පාරිතෝෂිකය ලැබීමේ සුදුසුකම් ලබයි.

වසර පහකට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කොට ඇති සාමාජිකයෙක් පූර්ණ හා සදාකාලික ආබාධිත තත්ත්වයට පත් වුවහොත්, ඔහු ආබාධිත පාරිතෝෂික ලබාගැනීමට සුදුසුකම් ලබයි. තවද, වසර පහක අවම සේවා කාලයක් සහිත ක්‍රියාකාරී සාමාජිකයකු, සේවයේ නියුතුව සිටියදී වියෝ වුවහොත්, ඔහුගේ උරුමකරුවන් හට මරණ පාරිතෝෂික ප්‍රතිලාභයක් ගෙවනු ලැබේ.

බැංකුව එවැනි පාරිතෝෂික ගෙවීමේ බැරකම් වෙනුවෙන් මාසික වෙන්කිරීමක් සිදුකරන අතර මෙම වටිනාකම බැංකුවේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි පිළිබිඹු කෙරේ. බැංකුව මගින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුව ආයුගණක තක්සේරුව මත පදනම්ව වෙන් කිරීමක් සිදුකරන ලදී.

බැංකුවේ පරිපාලිත සහ ආශ්‍රිත සමාගම් ද 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත යටතේ පාරිතෝෂික ලබා දේ. එම සමාගම්වල වසරක සේවයක් සම්පූර්ණ කර ඇති සේවකයින් වෙනුවෙන් පාරිතෝෂික සඳහා වෙන්කිරීම් සිදු කරනු ලැබ ඇත. මෙම බැරකම් වෙනුවෙන් බාහිරව මුදල් යෙදවීමක් සිදු නොවේ.

5.14.2 නිශ්චිත දායකත්ව සැලසුම්

බැංකුව නිශ්චිත දායකත්ව සැලසුමක්ද ක්‍රියාත්මක කරයි. නිශ්චිත දායකත්ව සැලසුමක් වෙත ගෙවියයුතු දායකත්වය සේවකයින් විසින් බැංකුවට ඉටු කරනු ලබන සේවාවන්ට අනුව සිදුකෙරෙන අතර, එය කාර්යමණ්ඩල වියදම් යටතේ වියදමක් ලෙස ගිණුම්ගත කෙරේ. නොගෙවූ දායක මුදල් බැරකමක් ලෙස වාර්තා කෙරේ.

බැංකුව/සේවකයින් පහත සඳහන් සැලසුම් සඳහා දායකත්වය ලබා දේ:

5.14.2.1 සේවක අර්ථසාධක අරමුදල

බැංකුව සහ සේවකයින් සේවකයින්ගේ මාසික දළ වැටුපෙන් 12% ක් සහ 8% ක් ලෙස පිළිවෙලින් අර්ථසාධක අරමුදලට දායක වේ. බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ අනුමත අරමුදලක් වන අතර එය අභ්‍යන්තර වශයෙන් පවත්වාගෙන යනු ලැබේ.

5.14.2.2 සේවක භාර අරමුදල

සේවක භාරකාර අරමුදල් මණ්ඩලය විසින් පවත්වා ගෙන යනු ලබන සේවක භාරකාර අරමුදල වෙත බැංකුව සේවකයාගේ මාසික දළ වැටුපෙන් 3% ක් දායක වේ.

5.15 වැන්දඹු/වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් සැලසුම (1996 ට පෙර/1996 ට පසු)

සුදුසුකම් ලත් ආයුගණකවරයකුගේ උපදෙස් මත පදනම් වී, එක් එක් යෝජනා ක්‍රමයට යටතේ ඔවුන්ගේ ප්‍රතිලාභීන් අනුව අනාගත බැඳීම් සපුරාලීමට 1996 ජනවාරි 1 දිනට පෙර සහ හෝ 1996 ජනවාරි 1 දිනට පසු බැංකුව සමඟ එක් වූ ස්ථීර කාර්ය මණ්ඩල සාමාජිකයින් සම්බන්ධයෙන් බැංකුව වෙනම අරමුදල් දෙකක් පවත්වා ගෙන යයි. තවද, මෙම අරමුදල් සාමාජිකයින්/සේවකයින්ගේ දායකත්වය තුළින් පමණක් අරමුදල් ලබාගනී.

5.16 වෙන්කිරීම

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් බැංකුවට වර්තමාන බැඳීමක් (නෛතික හෝ සම්මුතික) පවතින විට, එම බැඳීම බේරුම් කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ගැබ් වූ සම්පත් බැහැරට ගලා යාමේ ඉඩකඩ පවතින විට හා බැඳීමේ ප්‍රමාණය පිළිබඳ විශ්වසනීය ඇස්තමේන්තුවක් කළ හැකි විට, වෙන් කිරීම් හඳුනාගනී. යම් වෙන් කිරීමකට අදාළ වියදම ප්‍රතිපූර්ණයක් වේ නම් එය අඩු කොට ආදායම් ප්‍රකාශය තුළ ඉදිරිපත් කෙරේ.

5.17 බැඳීම් සහ අසම්භාවතා

සියලුම දැනුවත් වගකීම් ප්‍රමාණය නිගමනය කිරීමේදී සියලුම ප්‍රත්‍යක්ෂ අවදානම් ගණනය කෙරේ. වෙන් වශයෙන් හෝ අන් ආකාරයකින් බැංකුව වගකීම් සහිත පරිපාලිත හෝ ආශ්‍රිත සමාගමක යම් අසම්භාව්‍යතා සහ ප්‍රාග්ධන බැඳීම්වල බැංකුවේ කොටස යෝග්‍ය අනාවරණයන් සමඟ ඇතුළත් කෙරේ.

5.17.1 හඳුනාගැනීමේ සහ මිණුම්කරණයේ පදනම

ණය බැඳීම්, ණයවර ලිපි, ඇප සුරැකුම් සහ ප්‍රතිග්‍රහනයන් සහ කාර්යසාධන බැඳුම්කර ඇතුළුව සාමාන්‍ය ව්‍යාපාර ව්‍යවහාරය තුළ සමූහය ශේෂ පත්‍රයෙන් පිටත විවිධ බැඳීම් සහ අසම්භාව්‍යතාවන්ට ඇතුළත් වේ.

බැඳීම්වලින් ණය ප්‍රසාරණයට හෝ මූල්‍ය ඇප ලබාදීමට ඇති ගිවිසුම්ගත බැඳීම් නියෝජනය කරන අතර, ඒවා ආරම්භයේදී මූල්‍ය වත්කමක හෝ වගකීමක පිළිබඳ නිර්වචනය සපුරාලීමට නොහැකි බැවින් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි හඳුනාගනු නොලැබේ. බැඳීම් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වල අනාවරණය කෙරේ.

බැඳීම් සහ අසම්භාව්‍යතා පහත අවස්ථාවල අනාවරණය කෙරේ:

- සමූහයේ සමස්ථ පාලනය තුළ නොව අවිනිශ්චිත අනාගත සිදුවීම් මගින් පමණක් පැවැත්ම තහවුරු කරනු ලබන අතීත සිදුවීම්වලින් වියහැකි බැඳීමක් ඇතිවන අවස්ථාව; හෝ
- වර්තමාන බැඳීමක් පැවති නමුත් එය LKAS 37 – වෙන් කිරීම්, අසම්භාව්‍ය බැරකම් සහ අසම්භාව්‍ය වත්කම් අනුව ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලායාම අවශ්‍යවන සහ ප්‍රමාණය විශ්වානීය ලෙස මැනිය නොහැකි වන අවස්ථාව.

මූල්‍ය ඇප, ණයවර ලිපි, ඇපකර ලිපි සහ නොලියවූ ණය බැඳීම් සම්බන්ධයෙන් ලද ගාස්තු සහ වාරික SLFRS 9 – මූල්‍ය උපකරණවලට අනුකූලව ගණනය කෙරේ.

- ඉදිරි සහ කාලීන ඇප ගාස්තු/වාරික විලම්භිත ආදායම ලෙස මූලිකවම හඳුනා ගනී.
- එවැනි ආදායම අවශ්‍ය අවස්ථාවලදී සඵල පොලී අනුපාත ක්‍රමය භාවිතයෙන් අදාළ බැඳීමේ හෝ ඇපයේ කාලසීමාව පුරා ලාභය හෝ අලාභයට ක්‍රමක්ෂය කෙරේ.
- මූල්‍ය උපකරණයට සඵල පොලී අනුපාතයේ අත්‍යවශ්‍ය කොටසක් වන ගාස්තු ඵලදායී පොලී අනුපාතය ගණනය කිරීමේදී ඇතුළත් කරන අතර උපකරණයේ අපේක්ෂිත ජීවකාලය පුරා හඳුනා ගනී.

ශේෂ පත්‍රයෙන් පිටත නිරාවරණයන් පිළිබඳ අපේක්ෂිත ණය අලාභ දීමනාව SLFRS 9 අනුකූලව සිදුකරන අතර,වෙන් කිරීමක් ලෙස හඳුනාගෙන මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වෙනත් වගකීම් යටතේ ඉදිරිපත් කෙරේ.

5.18 බදු

5.18.1 ප්‍රවර්තන බදුකරණය

ප්‍රවර්තන බදු වත්කම් සහ වගකීම්වලට ඇතුළත් වනුයේ අදාළ මූල්‍ය වර්ෂය සහ පෙර වර්ෂ වෙනුවෙන් ආදායම් බදු කොමසාරිස් ජනරාල්වරයා වෙතින් ලැබිය යුතු හෝ එම දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු මුදල් ප්‍රමාණයන්ය. මෙම ප්‍රමාණයන් ගණනය සඳහා යොදා ගන්නා බදු අනුපාත සහ බදු නීති මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දිනට පනවනු ලබන හෝ පසුකාලීනව පනවනු ලබන ඒවාය. ඒ අනුව, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත අනුකූලව මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් 14 හි දක්වා ඇති අනුපාතයකට බදු අරමුණු ගලපා ඇති වර්ෂයේ ලාභ පදනම මත බදුකරණ සඳහා වෙන්කිරීම් සිදු කෙරේ.

5.18.2 විලම්බිත බදුකරණය

බදු වාර්තාකරන අරමුණු සඳහා වත්කම් සහ වගකීම්වල බදු පදනම් සහ මූල්‍ය වාර්තාකරණ අරමුණු සඳහා ඒවායේ ධාරණ අගයන් අතර වෙනසේ ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දිනයට තාවකාලික වෙනස්වීම් සහ අඩුකළහැකි වෙනස්වීම් හේතුවෙන් විලම්භිත බදු ඇති වේ.

5.18.2.1 විලම්බිත බදු වගකීම

පහත සඳහන් අවස්ථාවලදී හැර සියළු තාවකාලික වෙනස්කම් වෙනුවෙන් විලම්බිත බදු බැරකම් හඳුනා ගනී:

- ව්‍යාපාර සංයෝජනයක් නොවන හා ගනුදෙනුව සිදුවන කාලයේදී ගිණුම්කරණ ලාභයටද බදු අයකර ගත හැකි ලාභයට හෝ අලාභයටද බලපෑමක් නොකරන ගනුදෙනුවක කීර්තිනාමය හෝ වත්කමක් හෝ බැරකමක් මූලික හඳුනාගැනීම තුළින් විලම්බිත බදු බැරකම පැහැනගින විට, සහ
- පරිපාලිත සමාගම්වල ආයෝජන හා සබැඳි බදු අය කළ හැකි තාවකාලික වෙනස්කම් සම්බන්ධයෙන්, තාවකාලික වෙනස්කම් ප්‍රතිවර්තනය සඳහා කාලය නියම කිරීම පාලනය කළ හැකි හා දැකියහැකි අනාගතයේදී එම තාවකාලික වෙනස්කම් ප්‍රතිවර්තනය නොවීමේ සම්භාවිතාවක් පවතින විට.

5.18.2.2 විලම්බිත බදු වත්කම්

සියළු අඩු කළ හැකි වෙනස්කම් වෙනුවෙන් විලම්බිත බදු වත්කම් හඳුනාගනු ලැබේ. පහත සඳහන් අවස්ථාවන්හිදී හැරුනු විට භාවිත නොකළ බදු ණය සහ භාවිත නොකළ බදු අලාභ වල අඩු කළ හැකි තාවකාලික වෙනස සහ ඉරිදියට ගෙනයාම උපයෝජනය කිරීම සඳහා යොදාගැනීමට බදු අය කළ හැකි ලාභ පැවතීමේ සම්භාවිතාව පවතින තාක් දුරට භාවිත නොකළ බදු ණය හා භාවිත නොකළ බදු අලාභ ඉදිරියට ගෙන යාමට හැකියාව ඇත:

- ව්‍යාපාර සංයෝජනයක් නොවන සහ ගනුදෙනුව සිදුවන අවස්ථාවේදී ගිණුම්කරණ ලාභයට හෝ බදුකළහැකි ලාභය හෝ අලාභයට බලපෑමක් නොවන ගනුදෙනුවක් තුළ වත්කමක් හෝ වගකීමක් මූලිකව හඳුනාගැනීමෙන් බදුකළහැකි තාවකාලික වෙනස්වීම්වලට අදාළ විලම්හිත බදු වත්කම් උද්ගත වන විට, සහ
- පරිපාලිත සමාගම්වල ආයෝජන හා සබැඳි අඩු කළ හැකි තාවකාලික වෙනස්කම් සම්බන්ධයෙන්, තාවකාලික වෙනස්වීම් දැකියහැකි අනාගතයේදී ප්‍රතිවර්තනය වීමේ සහ තාවකාලික වෙනස උපයෝජනය කිරීම පණිස බදු අය කළ හැකි ලාභ ලබාගැනීමේ හැකියාව පවතින තාක් දුරට විලම්බිත බදු වත්කම් හඳුනා ගනී.

සෑම මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශ දිනකටම විලම්බිත බදු වත්කමක ධාරණ අගය සමාලෝචනය කර, විලම්බිත බදු වත්කමෙන් කොටසක් හෝ එම වත්කම සම්පූර්ණයෙන්ම උපයෝජනය කිරීමට අවස්ථාව සැලසීම පිණිස ප්‍රමාණවත් බදු අය කළ හැකි ලාභ පැවතීමේ හැකියාවක් නොමැති තාක් දුරට අඩු කරනු ලැබේ. හඳුනා නොගත් විලම්බිත බදු වත්කම් සෑම මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශ දිනකටම යළි තක්සේරු කර අනාගත බදු අය කළ හැකි ලාභය විලම්බිත බදු වත්කම ආපසු අය කර ගැනීමට අවස්ථාව සැලසීමට හැකියාව පවතින තාක් දුරට හඳුනාගනු ලැබේ.

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශ දිනට පනවනු ලැබ ඇති හෝ පසුකාලීනව පනවනු ලැබ ඇති බදු අනුපාත සහ බදු නීති මත පදනම්ව වත්කම් උපලබ්ධි වීමට හෝ බැරකම් බේරුම් කිරීමට නියමිත වර්ෂයට අදාළ වනු ඇතැයි අපේක්ෂිත බදු අනුපාතිකවලට විලම්බිත බදු වත්කම් හා බැරකම් මිනුම්කරණය කරනු ලැබේ.

5.18.3 මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බද්ද (FSVAT)

2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 25 අ වගන්තිය හා එහි සංශෝධනයන්ට අනුකූලව බැංකුවේ මුළු වට්නාකම එකතුව 18%ක එකතු කළ අගය මත බද්දකට යටත් කරන ලදී.

5.18.4 එකතු කළ අගය මත බද්ද (VAT)

2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත හා එහි පසුකාලීන සංශෝධනයන්ට අනුකූලව එකතු කළ අගය මත බද්ද ගණනය කෙරේ. එකතු කළ අගය මත බදු 18%ක අනුපාතයකට ගෙවිය යුතුය.

5.18.5 ලාභාංශ මත රඳවා ගැනීමේ බද්ද (WHT)

දේශීය පරිපාලිත සමාගම්වල බදුකළහැකි ලාභයෙන් බෙදාහැරී ලාභාංශ මුලාශ්‍රයේ දී 15%ක අඩුකිරීමක් සිදු කරන අතර එය බැංකුවේ අවසාන බදු වගකීම වේ.

5.18.6 බෝග රක්ෂණ බදු (CIL)

2013 අංක 12 දරන මුදල් පනතේ 14 වන වගන්තියේ විධිවිධාන වලට අනුකූලව, 2013 අප්‍රේල් 1 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි බෝග රක්ෂණ බද්ද හඳුන්වා දෙන ලදී. ඒ අනුව එක් තක්සේරු වර්ෂයක් වෙනුවෙන් බැංකුව ජාතික රක්ෂණ භාර අරමුදල වෙත බදුවලට පසු ලාභයෙන් 1%ක් ගෙවීම අවශ්‍ය වේ.

5.18.7 සමාජ ආරක්ෂණ දායක බදු

2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායක බදු පනත යටතේ, වාර්ෂික බදුකළහැකි පිරිවැටුම රුපියල් මිලියන 60 ඉක්මවන පුද්ගලයින් මත 2.5%ක සමාජ ආරක්ෂණ බද්දක් පනවා ඇත.

5.19 ආදායම් සහ වියදම් හඳුනා ගැනීම

ආර්ථික ප්‍රතිලාභ බැංකුව වෙත ගලාඒන සහ ආදායම විශ්වසනීය ලෙස මිනුම්කරණය කළ හැකි තාක් දුරට ආදායම් හඳුනාගනු ලැබේ. එක් එක් වර්ගයේ ආදායම් සඳහා වන විශේෂිත හඳුනාගැනීමේ නිර්ණායක සටහන් 6 සිට 10 දක්වා ඉදිරිපත් කෙරේ.

5.19.1 රජයේ සුරුකුම්පත් හා ප්‍රතිවිකිණුම් ගිවිසුම් යටතේ මිලදී ගත් සුරුකුම්පත් වෙතින් ආදායම

ස්ථීර ආවර්තක ලාභ අනුපාතයක් පිළිබිඹු කිරීම උදෙසා භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර මත වට්ටම්/ආධික්‍යය අදාළ කාලපරිච්ඡේදය තුළ ක්‍රමක්ෂය කරනු ලැබේ. භාණ්ඩාගාර බැඳුම්කර මත කූපන් පොලිය උපචිත පදනමක් මත හඳුනාගනී. ප්‍රතිවිකිණුම් ගිවිසුම් යටතේ මිලදී ගත් සුරුකුම්පත් මත පොලී ආදායම ගිවිසුමෙහි කාලපරිච්ඡේදය මුළුල්ලේ සවල පොලී අනුපාතිකය මත ආදායම් ප්‍රකාශයෙහි හඳුනා ගනී.

5.19.2 කුලී ආදායම

මෙහෙයුම් කල්බදු මත ඇතිවන කුලී ආදායම ඉදිරියට යන කල්බදු කාලසීමාව පුරා සරල රේඛීය පදනමක් මත ගණනය කරන අතර, එය ආදායම් ප්‍රකාශයෙහි ''වෙනත් මෙහෙයුම් ආදායම'' යටතේ වාර්තා කෙරේ.

5.20 බණ්ඩ වාර්තාකරණය

බැංකුවේ බණ්ඩ වාර්තාකරණය පහත සඳහන් මෙහෙයුම් කාණ්ඩ ඒනම් පුද්ගල බැංකුකරණය, ආයතනික බැංකුකරණය, භාණ්ඩාගාරය සහ ප්‍රාථමික වෙළෙඳ ඒකකය, කල්බදු, රක්ෂණ, මූල්‍ය සහ සංචාර මත පදනම් වේ. බණ්ඩ වාර්තාකරණය සම්බන්ධ තොරතුරු සටහන 45හි අනාවරණය කෙරේ.

5.21 තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය

ශ්‍රී ලංකාව මූල්‍ය පද්ධතිය පිළිබඳ මහජන විශ්වාසය නඟා සිටුවීමට සහ ශ්‍රී ලංකාව මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය ප්‍රවර්ධනය කිරීමට සහ එයට දායකවීමට, ශ්‍රී ලංකා මහ බැංකුව 2023 සැප්තැම්බර් 15 වැනි දින නිකුත් කරන ලද 2023 අංක 17 දරන බැංකුකරණ පනත (විශේෂ විධිවිධාන) හා 2023 නොවැම්බර් 15 වැනි දින නිකුත් කරන ලද 2023 අංක 1 දරන බැංකුකරණ පනත (විශේෂ විධිවිධාන) යටතේ ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය නමින් හඳුන්වන යෝජනා ක්‍රමයක් ස්ථාපිත කළ යුතුය, මෙම යෝජනා ක්‍රමය යටතේ, සියලුම සාමාජික ආයතන වරින් වර මහ බැංකුව විසින් තීරණය කරන පරිදි උපරිම ප්‍රමාණයක් දක්වා සිය තැන්පතු වගකීම් රක්ෂණය කළ යුතුය. මෙම යෝජනා ක්‍රමයේ පරිපාලනය සහ කළමනාකරණය සඳහා මහ බැංකුව වගකිව යුතු අතර, මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා පනත යටතේ එයට ලබාදී ඇති හෝ පනවා ඇති හෝ පවරා ඇති සියලුම බලතල, රාජකාරි සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ ඉටු කිරීම සිදු කළ යුතුය.

යෝජනා ක්‍රමය යටතේ රක්ෂණය කළයුතු සුදුසුකම් ලබන තැන්පතුවලට පනතේ විශේෂයෙන් දක්වා ඇති තැන්පතු වගකීම් හැර ඉල්ලුම්, කාලීන සහ ඉතුරුම් තැන්පතු වගකීම් සහ පොරොන්දු නෝට්ටු, දෙමුහුන් ස්කන්ධය, ඇතුළු ණය උපකරණ සහ මහ බැංකුව විසින් තීරණය කල හැකි වෙනත් ඒවැනි ණය උපකරණ ඇතුළත් වේ.

පහත සඳහන් තැන්පතු බැරකම් සුදුසුකම් ලබන තැන්පතු ලෙස සලකනු නොලැබේ.

- සාමාජික ආයතන වෙත තැන්පතු බැරකම්.
- පුද්ගලිකව හෝ වෙනත් පාර්ශ්වයක් සමඟ හවුලේ හෝ සාමාජික ආයතනයක අධ්‍යක්ෂවරු සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් විසින්, ඒවැනි අධ්‍යක්ෂවරු සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ සමීප ඥාතීන්, සාමාජික ආයතනයක පරිපාලිත සමාගමක් හෝ ආශ්‍රිත සමාගමක, සහ සාමාජික ආයතනයක අධ්‍යක්ෂවරු සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ට හෝ ඒවැනි අධ්‍යක්ෂවරු සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ට යම් හිමිකමක් ඇති අයතනයක් විසින් පවත්වාගෙන යන තැන්පතු බැරකම්.
- වරින් වර මහ බැංකුව විසින් නිකුත් කළ උපදෙස් පරිදි මහ බැංකුවට මාරුකර ඇති බැංකු පනත යටතේ අත්හළ දේපලක අර්ථය යටතට වැටෙන තැන්පතු සහ මූල්‍ය ව්‍යාපාර පනත යටතේ අඛ්‍රීය තැන්පතු.
- අමාත්‍යංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා සහ පළාත් පාලන ආයතන ඇතුළුව යම් රජයේ ආයතනයක් විසින් දරන තැන්පතු
- යෝජනා ක්‍රමය යටතේ සුදුසුකම් නොලබන මහ බැංකුව විසින් තීරණය කරන පරිදි සාමාජික ආයතනයක යම් වෙනත් තැන්පතු බැරකම්.

ආසන්නතම පූර්ව මූල්‍ය වර්ෂය අවසානයේදී බලපත්‍රලාභී වාණිජ බැංකු 14% හෝ එයට වැඩි ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතිකයක් පවත්වා ගන්නේ නම්, බැංකුව සුදුසුකම්ලත් තැන්පතු බැරකම් මත 0.10% ක ආධික්‍යයක් ගෙවීම අවශ්‍ය වන අතර, අනෙකුත් සියළු වාණිජ බැංකු සඳහා (14% ට අඩු ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතිකයක් සහිත) කාර්තුව අවසානයට පවතින සුදුසුකම් ලත් තැන්පතුවල මුළු අගය මත ගණනය කෙරෙන හා කාර්තුව අවසාන වීමේ සිට දින 15 ක කාලපරිච්ඡේදයක් තුළ ගෙවිය යුතු 0.125% ක ආධික්‍යයක් ගෙවීම අවශ්‍ය වේ.

5.22 පසුකාලීන සිදුවීම්

වාර්තාකරණ දිනයට පසුව සිදුවන සිදුවීම් යනු වාර්තාකරණ දිනය සහ මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීමට අනුමැතිය ලබාදීමේ දිනය අතර, සිදුවන වාසිදායක හා අවාසිදායක සිදුවීම්ය.

වාර්තාකරණ දිනට පසුව සිදුවන සියළුම ප්‍රමාණාත්මක හා වැදගත් සිදුවීම් සළකා බලා අදාළ වන පරිදි ගැලපුම් කර මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් 42 හි අනාවරණය කෙරේ.

5.23 රක්ෂණ ක්ෂේත්‍රයට විශේෂිත ප්‍රතිපත්ති

5.23.1 වැදගත් ගිණුම්කරණ ඇස්තමේන්තු හා උපකල්පන

ජීවිත රක්ෂණ නොවන ගිවිසුම් බැරකම්

ජීවිත රක්ෂණ නොවන ගිවිසුම් සඳහා, වාර්තාකරණ දිනට වාර්තා වී ඇති හිමිකම්වල අපේක්ෂිත අවසාන පිරිවැය සහ හිමිකම්පෑම සිදුකර ඇති නමුත් වාර්තාකරණ දිනට වාර්තා වි නොමැති හිමිකම්වල අපේක්ෂිත අවසාන පිරිවැය යන දෙකටම ඇස්තමේන්තු සකස් කළ යුතුව ඇත. අවසාන හිමිකම් පිරිවැය නිශ්චිතව තහවුරු කළ හැකිවීමට පෙර සැළකිය යුතු කාලපරිච්ඡේදයක් ගතවීමට ඉඩ ඇති අතර, ඇතැම් වර්ගවල ඔප්පු වෙනුවෙන් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි බැරකම් වලින් වැඩි කොටස සිදුවූ නමුත් වාර්තා නොවූ හිමිකම්වලින් සැදුම් ලබයි.

චේන් ලැඩර් සහ බෝන්හෙවුටර් – ෆර්ගසන් ක්‍රම සහ සංඛ්‍යාත/තීව්‍රතා ක්‍රම වැනි සම්මත ආයුගණක හිමිකම් ප්‍රක්ෂේපන ශිල්පීය ක්‍රම රාශියක් භාවිත කරමින් නොගෙවූ හිමිකම්පෑම්වල අවසාන පිරිවැය ඇස්තමේන්තු කරනු ලබයි.

මෙම ශිල්පීය ක්‍රමවලට පාදක වන ප්‍රධාන උපකල්පන වනුයේ, සමාගමක අතීත හිමිකම්පෑම් විකාශන අත්දැකීම්, අනාගත හිමිකම්පෑම් විකාශනය ප්‍රක්ෂේපණය කර භාවිත කළ හැකි අතර, එබැවින් අවසාන හිමිකම් පිරිවැය ප්‍රක්ෂේපනයට භාවිත කළ හැකි බවයි. එබැවින්, මෙම ක්‍රම පෙර වර්ෂවල නිරීක්ෂණය කරන ලද විකාශනය හා අපේක්ෂිත අලාභ අනුපාතික මත පදනම්ව ගෙවූ හා සිදුවූ අලාභ, එක් හිමිකම්පෑමකට සාමාන්‍ය පිරිවැය හා හිමිකම්පෑම් සංඛ්‍යාව බහිර්නිර්වේෂණය කරයි. ඓතිහාසික හිමිකම්පෑම් විකාශනය ප්‍රධාන වශයෙන්ම අහඹු වර්ෂ මගින් විශ්ලේෂණය කෙරෙන නමුත්, භූගෝලීය ප්‍රදේශය මෙන්ම වැදගත් ව්‍යාපාර මාර්ග සහ හිමිකම් වර්ග අනුව තවදුරටත් විශ්ලේෂණය කරනු ලැබිය හැකිය. අලාභ ගැලපුම් ඇස්තමේන්තුවල මුහුණත් අගයට වෙන් කිරීමෙන් හෝ ඒවායේ අනාගත තත්ත්වය පිළිබිඹු කිරීම පිණිස වෙනම ප්‍රක්ෂේපණය කිරීමෙන් විශාල හිමිකම්පෑම් සාමාන්‍යයෙන් වෙනම ආමන්ත්‍රණය කරනු ලබයි. බොහෝ අවස්ථාවලදී, අනාගත හිමිකම්පෑම් උද්ධමන අනුපාතික හෝ අලාභ අනුපාතික සම්බන්ධයෙන් ප්‍රත්‍යක්ෂ උපකල්පන සිදු නොකෙරේ. ඒ වෙනුවට භාවිත කෙරෙන උපකල්පන වන්නේ ප්‍රක්ෂේපන පදනම් වන ඓතිහාසික හිමිකම් විකාශන දත්ත තුළ ගම්‍යවන ඒවාය.

සම්බන්ධ වී ඇති සියළු අවිනිශ්චිතතා සැළකිල්ලට ගනිමින් ඇති විය හැකි පුළුල් පරාසයක ප්‍රතිඵලය ඉදිරිපත් කෙරෙන හිමිකම්පෑමේ ඇස්තමේන්තුගත අවසාන පිරිවැය තීරණය කිරීම සඳහා අතීත ප්‍රවණතා අනාගතයේදී අදාළ නොවිය හැකි ප්‍රමාණය තක්සේරු කිරීම සඳහා අතිරේක ගුණාත්මක විනිශ්චය භාවිතා කරනු ලැබේ. (උදාහරණයක් ලෙස එක්වරක් පමණක් සිදුවන සිදුවීම්, හිමිකම්පැමි සම්බන්ධයෙන් ජනතා ආකල්පවල වෙනස්වීම් වැනි වෙළෙඳපොළ සාධකවල වෙනස්වීම්, ආර්ථික තත්ත්වයන්, උද්ධමන මට්ටම්, අධිකරණ තීන්දු හා නීති වැනි බාහිර හෝ වෙළෙඳපොළ සාධකවල වෙනස්වීම් මෙන්ම කළඹ මිශ්‍රණය ඔප්පු ලක්ෂණ හා හිමිකම් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ ක්‍රියාපටිපාටි)

නොඉපැයූ වාරිකය වෙනුවෙන් වෙන්කිරීම්වල ප්‍රමාණවත් බව තක්සේරු කිරීමේදී සමාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන යොදාගනු ලැබේ. ගිවිසුමක් මගින් සැපයෙන රක්ෂණ සේවා රටාවට, කාල බෙදා වෙන්කිරීම හැර වෙනත් පදනමකින් නොඉපැයූ වාරිකය ක්‍රමක්ෂය කිරීම අවශ්‍ය වන්නේද යන්න තීරණය කිරීමේදී ද විනිශ්චය අවශ්‍ය වේ.

5.23.2 ආදායම් හඳුනා ගැනීම

දළ ලිඛිත රක්ෂණ වාරිකය

ගිණුම්කරණ කාලසීමාව තුළදී එළඹී ගිවිසුම් සමගින් සැපයෙන සම්පූර්ණ ආවරණ කාලසීමාව වෙනුවෙන් ලැබිය යුතු මුළු රක්ෂණ වාරිකයෙන් ජීවිත රක්ෂණ නොවන දළ ලිඛිත වාරිකය සමන්විත වන අතර, ඔප්පුව ආරම්භ වන දිනට ඒවා හඳුනාගනු ලබයි.

ප්‍රතිරක්ෂණ රක්ෂණ වාරිකය

ගිණුම්කරණ කාලසීමාව තුළදී එළඹී ගිවිසුම් සමගින් සැපයෙන සම්පූර්ණ ආවරණ කාලසීමාව වෙනුවෙන් ගෙවිය යුතු මුළු රක්ෂණ වාරිකයෙන් ජීවිත රක්ෂණ නොවන දළ ප්‍රතිරක්ෂණ වාරිකය සමන්විත වන අතර, ඔප්පුව ආරම්භ වන දිනට ඒවා හඳුනාගනු ලැබේ. පූර්ව ගිණුම්කරණ කාලපරිච්ඡේදයක් තුළ ආරම්භ වන ප්‍රතිරක්ෂණ ගිවිසුම් සම්බන්ධයෙන් ගිණුම්කරණ කාලපරිච්ඡේදය තුළ පැනනගින කවර හෝ ගැලපුම් රක්ෂණ වාරිකයට ඇතුළත් වේ.

නොඉපැයූ ප්‍රතිරක්ෂණ රක්ෂණ වාරිකය යනු වර්ෂයක වාර්තාකරණ දිනට පසුව අවදානම් කාලපරිච්ඡේද හා සබැඳි ලිඛිත රක්ෂණ වාරික කොටස වේ. නොඉපැයූ ප්‍රතිරක්ෂණ වාරිකය එයට පාදක වන සෘජු රක්ෂණ ඔප්පුවල කාලසීමාව පුරා විලම්බනය කරනු ලැබේ.

5.24 නිකුත්කළ නමුත් මෙතෙක් බලාත්මක නොවූ ප්‍රමිති

මෙම මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීමේ දිනයට නිකුත් කළ නමුත් එතෙක් බලාත්මක නොවූ නව සහ සංශෝධිත ප්‍රමිති පහත අනාවරණය කෙරේ.

- **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය – SLFRS 17 – රක්ෂණ ගිවිසුම්**

  SLFRS 17 යනු රක්ෂණ ගිවිසුම් සඳහා හඳුනාගැනීම සහ මැනීම, ඉදිරිපත් කිරීම සහ අනාවරණය ආවරණය කරන නව විස්තරාත්මක ගිණුම්කරණ ප්‍රමිතියකි. SLFRS 17 හි සමස්ත පරමාර්ථය වන්නේ රක්ෂණ සඳහා වඩාත් අනුරූප සහ ප්‍රයෝජනවත් වන රක්ෂණ ගිවිසුම් සඳහා ගිණුම්කරණ ආදර්ශයක් ලබා ලබාදීමයි.

  බලාත්මක වූ පසු, SLFRS 17 2005 දී නිකුත් කරන ලද SLFRS 4 රක්ෂණ ගිවිසුම් ප්‍රතිස්ථාපනය කරනු ඇත.

  SLFRS 17 2026 ජනවාරි 1 හෝ ඊට පසුව ආරම්භ වන වාර්ෂික වාර්තාකරණ කාල සීමාවන් සඳහා බලාත්මක වේ.

- **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය – SLFRS 18 – මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සහ අනාවරණයි**

  LKAS 1 වෙනුවට ක්‍රියාත්මක SLFRS 18 – "මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සහ අනාවරණය", 2027 ජනවාරි 1 හෝ ඊට පසුව ආරම්භ වන වාර්ෂික වාර්තාකරණ කාල සීමාවන් සඳහා බලාත්මක වේ. මෙම ප්‍රමිතියෙන් නිශ්චිත වර්ගීකරණ සහ අනුගම්‍ය උපවර්කතු ඇතුළුව ලාභ හෝ අලාභ ප්‍රකාශයේ ව්‍යුහය සඳහා නව අවශ්‍යතා සහ නිශ්චිත කාර්යසාධන ක්‍රියාමාර්ග කළමනාකරණය සඳහා ශක්තිමත් අනාවරණ අවශ්‍යතා හඳුන්වා දේ. මෙම ප්‍රමිතිය ඉදිරිපත් කිරීම සහ අනාවරණය කෙරෙහි පමණක් බලපාන අතර, හඳුනාගැනීම සහ මිණුම්කරරණය සඳහා බල නොපායි. සමූහය/සමාගම මෙය යොදා ගැනීමේ බලපෑම් තක්සේරු කරමින් සිටී.

6. දළ ආදායම

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

බැංකුව/සමූහය වෙත ආර්ථික ප්‍රතිලාභය (ප්‍රතිලාභ) ප්‍රවාහ වීමේ හැකියාවක් පවතීද සහ ආදායම විශ්වසනීය ලෙස මිනුම්ගත කළ හැකිද යන්න පදනම් කර ගනිමින් ආදායම හඳුනා ගනී. එක් එක් වර්ගයේ ආදායම සඳහා විශේෂ හඳුනාගැනීමේ නිර්ණායක අදාළ ආදායම් සටහන්වල සම්පූර්ණයෙන් දක්වා ඇත.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා	සටහන්	බැංකුව 2025 රු. '000	බැංකුව 2024 රු. '000	සමූහය 2025 රු. '000	සමූහය 2024 රු. '000
පොලී ආදායම	7.1	356,669,240	349,292,146	395,088,492	376,974,975
ගාස්තු සහ කොමිස් ආදායම	8.1	18,312,109	14,923,343	20,357,761	16,074,007
වෙළෙඳ කටයුතු වලින් ලද ශුද්ධ ලාභ/(අලාභ)	9	3,253,015	853,690	3,349,319	1,076,990
වෙනත් මෙහෙයම් ආදායුම් (ශුද්ධ)	10	3,774,798	2,908,810	5,231,344	5,842,069
		382,009,162	367,977,989	424,026,916	399,968,041

7. ශුද්ධ පොලී ආදායම

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

ණය හානිකරණය වූ වත්කම් හැර මූල්‍යමය වත්කම්/බැරකම්වල ක්‍රමක්ෂය පිරිවැයට සඵල පොලී අනුපාතිකය යොදා ගනිමින් බැංකුව/සමූහය මඟින් පොලී ආදායම/වියදම ගණනය කරනු ලැබේ.

සඵල පොලී අනුපාතික ක්‍රමය

SLFRS 9 යටතේ, ක්‍රමක්ෂය පිරිවැයට අඟයකළ සියලුම මූල්‍ය උපකරණ, ලාභ හෝ අලාභ තුළින් සාධාරණය අඟයට අඟයකළ මූල්‍ය උපකරණ (FVPL) සහ අනෙකුත් විස්තීර්ණ ආදායම තුළින් සාධාරණ අඟයට අඟය කළ පොළිය දරණ මූල්‍ය වත්කම් (FVOCI) සඳහා සඵල පොලී අනුපාතය (EIR) භාවිතා කරමින් පොළී ආදායම වාර්තා කරනු ලබයි. බැංකුවලට ගෙවියයුතු දෑ, අනෙකුත් ගනුදෙනුකරුවන්ට ගෙවියයුතු දෑ සහ අනෙකුත් ණය වැනි වාර්තාකළ වගකීම් සඳහා සඵල පොළී අනුපාතය (EIR) භාවිතා කරමින් පොලී වියදම වාර්තා කරනු ලබයි.

සඵල පොලී අනුපාතිකය යනු මූල්‍යමය වත්කමෙහි හෝ මූල්‍ය උපකරණයේ අපේක්ෂිත ජීව කාලය මුළුල්ලේ හෝ එයට වඩා කෙටි කාලපරිච්ඡේදයක් තුළ ඇස්තමේන්තුගත අනාගත මුදල් ගෙවීම් හෝ ලැබීම් මූල්‍යමය වත්කමෙහි හෝ බැරකමෙහි ශුද්ධ ධාරණ අඟයට තත්ත්වාකාරයෙන් වට්ටම් කරනු ලබන අනුපාතිකයයි. මෙම ආගණනය මූල්‍ය උපකරණයෙහි සියළු ගිවිසුම්ගත නියමයන් සැළකිල්ලට ගන්නා අතර, මූල්‍ය උපකරණය වෙත සෘජුවම පැවරිය හැකි සහ සඵල පොලී අනුපාතිකයෙහි වැදගත් කොටසක් වන යම් ගාස්තු හෝ වර්ධනීය පිරිවැය ඇතුළත් කරගන්නා නමුත් අනාගත ණය අලාභ ඇතුළත් කර නොගනී.

හානිකරණ අලාභයන් හේතුවෙන් මූල්‍යමය වත්කමක හෝ සමාන මූල්‍යමය වත්කම් සමූහයක වාර්තාගත අගය අඩු කරනු ලැබූ පසු, හානිකරණ අලාභය මිනුම්කරණ කාර්යය වෙනුවෙන් අනාගත මුදල් ප්‍රවාහ වට්ටම් කිරීම පිණිස භාවිත කරන ලද පොලී අනාපාතිකයම තවදුරටත් භාවිත කරමින් පොලී ආදායම හඳුනාගැනීම සිදු කෙරේ.

7.1 පොලී ආදායම

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා	සටහන්	බැංකුව 2025 රු. '000	බැංකුව 2024 රු. '000	සමූහය 2025 රු. '000	සමූහය 2024 රු. '000
මුදල් හා මුදල් සමාන දෑ		996,358	673,321	1,397,706	564,508
බැංකුවල පවතින ශේෂයන්		3,715,868	3,385,155	4,180,636	7,656,285
ණය සහ අත්තිකාරම් – බැංකු		2,229,732	2,304,706	2,196,875	2,247,473
මූල්‍යමය වත්කම් – ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව		20,002,701	22,170,089	20,002,701	22,170,089
අනෙකුත් ගනුදෙනුකරුවන් සඳහා ණය සහ අත්තිකාරම්		194,624,349	210,078,561	231,213,345	233,656,306
ක්‍රමක්ෂය පිරිවැය අනුව මිනුම්ගත ණය උපකරණ	7.1.1	132,778,999	109,076,169	133,775,996	109,076,169
අනෙකුත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ වටිනාකම මනිනු ලබන ණය උපකරණ		671,808	664,419	671,808	664,419
කාර්ය මණ්ඩල ණය මත පලමු දින වෙනස		1,649,425	939,726	1,649,425	939,726
මුළු පොලී ආදායම		356,669,240	349,292,146	395,088,492	376,974,975

7.1.1 2024 දෙසැම්බර් ජාත්‍යන්තර බැඳුම්කර ප්‍රතිව්‍යුහගතකරණයට සමගාමීව, රු. මිලියන 3,547.0ක් වූ පලමු දින අලාභය ක්‍රමක්ෂය පිරිවැයට මනින් ලද ණය උපකරණ මත පොලී ආදායම් තුළින් හඳුනා ගනී. (එනම් පොලී ආදායම හරකරමින්). 2025 තුළදී, මෙම පලමු දින අලාභය ක්‍රමක්ෂය පිරිවැයට මනින ලද ණය උපකරණ මත පොලී ආදායම් තුළින් හඳුනා ගත් අනුරූප ප්‍රමාණය සමඟ රු. මිලියන 258.2කින් අර්ධ වශයෙන් කපා හරින ලදී. (එනම් පොලී ආදායම බැරකරමින්).

7.2 පොලී වියදම්

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා	බැංකුව 2025 රු. '000	බැංකුව 2024 රු. '000	සමූහය 2025 රු. '000	සමූහය 2024 රු. '000
බැංකුවලට ගෙවිය යුතු	1,879,771	4,716,390	4,228,808	4,794,877
අනෙකුත් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු	200,348,225	223,886,874	213,465,857	234,992,756
වෙනත් ණය ගැනීම්	5,507,479	6,554,594	5,477,698	6,500,362
නිකුත් කරන ලද ණය සුරැකුම්	5,697,460	6,115,011	6,129,230	6,827,434
කල්බදු වගකීම් මත පොළිය	858,598	777,336	1,122,782	973,828
මුළු පොලී වියදම	214,291,533	242,050,205	230,424,375	254,089,257
ශුද්ධ පොලී ආදායම	142,377,707	107,241,941	164,664,117	122,885,718

8. ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

බැංකුව/සමූහය ස්වකීය ගනුදෙනුකරුවන් වෙත ලබාදෙන පුළුල් පරාසයට පැතිරුනු විවිධාකාර සේවාවන් සැපයීම මගින් ගාස්තු හා කොමිස් මුදල් ආදායම් උපයයි. සේවය ඉටු කරනු ලැබූ විට ගාස්තු හා කොමිස් මුදල් හඳුනාගනී. කිසියම් කාලපරිච්ඡේදයක් මුළුල්ලේ සේවා සැපයීම වෙනුවෙන් උපයන ලද ගාස්තු අදාළ කාලපරිච්ඡේදයට උපචිත කෙරේ.

8.1 ගාස්තු සහ කොමිස් ආදායම

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා	බැංකුව		සමූහය	
	2025 රු. '000	2024 රු. '000	2025 රු. '000	2024 රු. '000
ණය	1,750,763	1,065,527	1,750,763	1,065,527
කාඩ්පත්	5,886,283	4,416,238	5,886,283	4,416,238
වෙළෙඳ හා ප්‍රේෂණ	2,374,747	1,737,289	2,374,747	1,737,289
ආයෝජන බැංකුකරණය	24,733	7,980	24,733	7,980
තැන්පතු	6,776,953	6,292,765	6,776,953	6,292,765
ඇපකර	889,795	699,121	889,795	699,121
වෙනත්	608,835	704,423	2,654,487	1,855,087
එකතුව	18,312,109	14,923,343	20,357,761	16,074,007

8.2 ගාස්තු සහ කොමිස් වියදම්

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා	බැංකුව		සමූහය	
	2025 රු. '000	2024 රු. '000	2025 රු. '000	2024 රු. '000
කාඩ්පත්	1,667,307	553,872	1,667,307	553,872
වෙළෙඳ හා ප්‍රේෂණ	1,014	723	1,014	723
ආයෝජන බැංකුකරණය	74,569	68,197	74,569	68,197
ඇපකර	20,712	11,428	20,712	11,428
වෙනත්	141,037	123,563	141,037	123,563
එකතුව	1,904,639	757,783	1,904,639	757,783
ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම	16,407,470	14,165,560	18,453,122	15,316,224

9. වෙළඳාමෙන් ශුද්ධ ලාභය (අලාභය)

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

වෙළඳාමෙන් ශුද්ධ ලාභය/(අලාභය), වෙළෙඳ කටයුතු වලින් පැන නගින විදේශ විනිමය ලාභ හෝ අලාභ,"මූල්‍යමය වත්කම් - ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව" වශයෙන් වර්ගීකරණය කරන ලද හිමිකම් සහ ස්ථාවර ආදායම් සුරැකුම් වල ආයෝජන තුළින් උපලබ්ධි කර ගත් ලාභ හෝ අලාභ සහ මූල්‍ය වත්කම් සහ බැරකම්වල සාධාරණ අගය වෙනස්වීම් හේතුවෙන් පැන නගින උපලබ්ධි නොවූ ලාභ සහ අලාභවලින් සමන්විත වේ.

ඉහත දක්වන ලද උපකරණවල සාධාරණ අගය වෙනස්වීම හේතුවෙන් පැන නගින ලාභ හෝ අලාභ ඒවා පැන නගින කාලපරිච්ඡේදයේ ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගැනෙන අතර, ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ එක් එක් වාර්තාකරණ දිනයේදී සාධාරණ අගය අනුව ගණනය කෙරේ.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා	සටහන්	බැංකුව		සමූහය	
		2025 රු. '000	2024 රු. '000	2025 රු. '000	2024 රු. '000
වෙළඳාමෙන් ශුද්ධ ලාභය/(අලාභ)					
වෙළෙඳාමෙන් ලාභය	9.1	4,966,639	5,749,051	5,062,943	5,972,351
ශුද්ධ සාධාරණ අගය අනුව ලාභ/(අලාභ)	9.2	(1,713,624)	(4,895,361)	(1,713,624)	(4,895,361)
එකතුව		3,253,015	853,690	3,349,319	1,076,990

9.1 වෙළඳාමෙන් ලාභය (අලාභය)

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා	බැංකුව		සමූහය	
	2025 රු. '000	2024 රු. '000	2025 රු. '000	2024 රු. '000
විදේශ විනිමය	4,586,528	5,113,766	4,586,528	5,113,766
රජයේ සුරැකුම්පත් (භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර)	263,365	537,614	263,365	537,614
ස්කන්ධ	116,746	97,671	213,050	320,971
එකතුව	4,966,639	5,749,051	5,062,943	5,972,351

9.2 ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමින් මූල්‍ය වත්කම්වල ශුද්ධ සාධාරණ වටිනාකම් ලාභය/(අලාභය)

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා	බැංකුව		සමූහය	
	2025 රු. '000	2024 රු. '000	2025 රු. '000	2024 රු. '000
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ				
අන්තර් බැංකු	(1,242,406)	(5,549,474)	(1,242,406)	(5,549,474)
රජයේ සුරැකුම්පත්				
භාණ්ඩාගාර බිල්පත්	(496,486)	520,620	(496,486)	520,620
භාණ්ඩාගාර බැඳුම්කර	25,268	133,493	25,268	133,493
	(1,713,624)	(4,895,361)	(1,713,624)	(4,895,361)

10. වෙනත් මෙහෙයුම් ආදායම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

දේපළ, පිරියත සහ උපකරණ විකිණීම මත ලාභය/(අලාභය)

දේපළ, පිරියත සහ උපකරණ විකිණීම මත ලාභය/(අලාභය) දේපල, පිරියත සහ උපකරණ පාලනය අහිත් පාර්ශ්වය වෙත මාරුකරන ලද අවස්ථාවේදී හඳුනා ගනී.

ආයෝජන වෙතින් ලාභාංශ

ලාභාංශ ආදායම අදාළ ගෙවීම ලබාගැනීමේ බැංකුවේ/සමූහයේ අයිතිය තහවුරු කෙරෙන අවස්ථාවේදී හඳුනා ගනී.

කපා හරින ලද බොල් ණය පියවා ගැනීම

බොල් ණය වශයෙන් කපාහරින ලද මුදල් ප්‍රමාණයන් අයකිරීම අදාළ මුදල ලද පසු හඳුනා ගනී.

ශුද්ධ ඉපැයුම් වාරිකය

ශුද්ධ ඉපැයුම් වාරිකය යනු, දළ ලිඛිත වාරිකයෙන් ප්‍රතිරක්ෂණය සඳහා පවරන ලද වාරිකය සහ සංචිත නොඉපැයූ වාරික අඩු කිරීමෙන් ලැබෙන අගය වන අතර, මෙම මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන 5.23 යටතේ සම්පූර්ණයෙන් විස්තර කෙරේ.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා	බැංකුව		සමූහය	
	2025 රු. '000	2024 රු. '000	2025 රු. '000	2024 රු. '000
දේපළ, පිරියත සහ උපකරණ සහ භාවිතයට අයිතිය ඇති වත්කම් විකිණීම මත ලාභය	125,420	109,927	137,735	162,481
ආයෝජන වෙතින් ලාභාංශ				
ලැයිස්තුගත කළ	67,255	55,309	69,586	65,131
ලැයිස්තුගත නොකළ	182,202	169,983	184,666	170,521
පරිපාලිත ආයතන	2,262,095	1,135,287	–	–
කපා හරින ලද බොල් ණය අයකිරීම	38,858	35,449	38,858	35,449
ශුද්ධ ඉපැයුම් වාරිකය	–	–	3,544,009	3,772,419
වෙනත්	1,098,969	1,402,855	1,256,490	1,636,068
එකතුව	3,774,798	2,908,810	5,231,344	5,842,069

11. හානිකරණ අලාභ

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

සටහන 5.6 මූල්‍ය වත්කම් හානිකරණය යටතේ විස්තරාත්මකව දක්වා ඇති, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති SLFRS 9 – "මූල්‍යමය උපකරණ" යටතේ අපේක්ෂිත ණය අලාභ මිනුම්කරණය සඳහා පියවර තුනක ප්‍රවේශය යොදා ගනිමින් බැංකුව/සමූහය මූල්‍යමය වත්කම්වල හානිකරණ අලාභ හඳුනාගනි.

තවද, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති LKAS 36 "වත්කම් හානිකරණය" අනුව මූල්‍යමය නොවන වත්කමක ධාරක වටිනාකම අදාළ වත්කම භාවිතයෙන් හෝ විකිණීමෙන් ඇස්තමේන්තුගත අයකරගත හැකි වටිනාකම ඉක්මවා ගිය අවස්ථාවේදි බැංකුව/සමූහය මගින් හානිකරණ අලාභයක් හඳුනාගනු ලබයි. මෙයට සම්බන්ධ විස්තර මෙම මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන 5.13 යටතේ විස්තරාත්මකව දක්වා ඇත.

11.1 බැංකුව

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා	සටහන්	2025			
		අදියර 1 රු. '000	අදියර 2 රු. '000	අදියර 3 රු. '000	එකතුව රු. '000
මුදල් හා මුදල් සමාන දෑ	17.4	2,071	16,056	–	18,126
බැංකු සමඟ ස්ථාපන	19.2	14,380	9,917	–	24,297
බැංකු වෙත ණය සහ අත්තිකාරම්	22.2	(130)	–	–	(130)
අනෙකුත් ගනුදෙනුකරුවන්ට ණය සහ අත්තිකාරම්	23.2.1	1,997,136	(461,832)	14,768,288	16,303,592
ක්‍රමක්ෂය පිරිවැයට මනින ලද ණය උපකරණ	24.3	–	186,476	–	186,476
අනෙකුත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ වටිනාකමට මනිනු ලබන ණය උපකරණ	26.2	(6,761)	–	–	(6,761)
අනෙකුත් ලැබියයුතු දෑ		–	–	(414,072)	(414,072)
අසම්භාව්‍ය බැරකම් සහ බැඳීම්	41.3	2,330	(81,402)	(38,763)	(117,835)
මූල්‍යමය වත්කම් මත මුළු හානිකරණ අලාභ		2,009,028	(330,785)	14,315,453	15,993,696
මුළු හානිකරණ අලාභය					15,993,696

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා	සටහන්	2024			
		අදියර 1 රු. '000	අදියර 2 රු. '000	අදියර 3 රු. '000	එකතුව රු. '000
මුදල් හා මුදල් සමාන දෑ	17.4	(272)	(7,717)	–	(7,990)
බැංකු සමඟ ස්ථාපන	19.2	(19,869)	–	–	(19,869)
බැංකු වෙත ණය සහ අත්තිකාරම්	22.2	(21,749)	–	–	(21,749)
අනෙකුත් ගනුදෙනුකරුවන්ට ණය සහ අත්තිකාරම්	23.2.1	5,771,061	(3,996,428)	11,049,752	12,824,385
ක්‍රමක්ෂය පිරිවැයට මනින ලද ණය උපකරණ	24.2	–	(8,399,460)	–	(8,399,460)
අනෙකුත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ වටිනාකමට මනිනු ලබන ණය උපකරණ	26.2	7,460	(361,503)	296,009	(58,034)
අනෙකුත් ලැබියයුතු දෑ	11.3	–	–	1,402,628	1,402,628
අසම්භාව්‍ය බැරකම් සහ බැඳීම්	41.3	(4,863)	(187,363)	(77,513)	(269,738)
මූල්‍යමය වත්කම් මත මුළු හානිකරණ අලාභ		5,731,768	(12,952,472)	12,670,877	5,450,173
මුළු හානිකරණ අලාභය					5,450,173

11.2 සමූහය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා	සටහන්	2025 අදියර 1 රු. '000	2025 අදියර 2 රු. '000	2025 අදියර 3 රු. '000	2025 එකතුව රු. '000
මුදල් හා මුදල් සමාන දෑ	17.4	2,071	16,056	–	18,126
බැංකු සමඟ ස්ථාපන	19.2	14,380	9,917	–	24,297
බැංකු වෙත ණය සහ අත්තිකාරම්	22.2	(130)	–	–	(130)
අනෙකුත් ගනුදෙනුකරුවන්ට ණය සහ අත්තිකාරම්	23.2.1	2,499,166	75,926	13,928,874	16,503,966
ක්‍රමක්ෂය පිරිවැයට මනින ලද ණය උපකරණ	24.2	–	186,476	–	186,476
අනෙකුත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ වටිනාකමට මනිනු ලබන ණය උපකරණ	26.2	(6,761)	–	–	(6,761)
අනෙකුත් ලැබියයුතු දෑ		–	–	(414,072)	(414,072)
අසම්භාව්‍ය බැරකම් සහ බැඳීම්	41.3	2,330	(81,402)	(38,763)	(117,835)
මූල්‍යමය වත්කම් මත මුළු හානිකරණ අලාභ		2,511,056	206,973	13,476,039	16,194,067
වෙනත්					
කපාහැරීම් ඇතුළුව ඇප බැහැර කිරීම මත අලාභ					(81,839)
මුළු හානිකරණ අලාභය					16,112,228

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා	සටහන්	2024 අදියර 1 රු. '000	2024 අදියර 2 රු. '000	2024 අදියර 3 රු. '000	2024 එකතුව රු. '000
මුදල් හා මුදල් සමාන දෑ	17.4	(272)	(7,717)	–	(7,990)
බැංකු සමඟ ස්ථාපන	19.2	(19,869)	–	–	(19,869)
බැංකු වෙත ණය සහ අත්තිකාරම්	22.2	(21,749)	–	–	(21,749)
අනෙකුත් ගනුදෙනුකරුවන්ට ණය සහ අත්තිකාරම්	23.2.1	5,749,259	(4,508,490)	10,349,553	11,590,322
ක්‍රමක්ෂය පිරිවැයට මනින ලද ණය උපකරණ	24.2	–	(8,399,460)	–	(8,399,460)
අනෙකුත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ වටිනාකමට මනිනු ලබන ණය උපකරණ	26.2	7,460	(361,503)	296,009	(58,034)
අනෙකුත් ලැබියයුතු දෑ	11.3	–	–	1,391,092	1,391,092
අසම්භාව්‍ය බැරකම් සහ බැඳීම්	41.3	(4,863)	(187,363)	(77,513)	(269,738)
මූල්‍යමය වත්කම් මත මුළු හානිකරණ අලාභ		5,709,966	(13,464,534)	11,959,141	4,204,572
වෙනත්					
කපාහැරීම් ඇතුළුව ඇප බැහැර කිරීම මත අලාභ					221,765
මුළු හානිකරණ අලාභය					4,426,337

11.3 "ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා ස්ථිර තැන්පතු මත විශේෂ පොලී යෝජනා ක්‍රම සහ වෙනත් යෝජනා ක්‍රම" සම්බන්ධයෙන් මහ භාණ්ඩාගාරයෙන් ලැබියයුතු පොළිය මත සිදුකළ අපේක්ෂිත ණය (ECL) අලාභ වෙන් කිරීම් මෙයට ඇතුළත් වේ. මහා භාණ්ඩාගාරය විසින් සිදුකරන ඒවැනි ප්‍රතිපූරණයන් හි ප්‍රමාදය සලකා බලමින්, 2025 පෙබරවාරි 14 දිනැති ලිපිය තුළ මහ බැංකුවෙන් ලද උපදෙස්වලට ප්‍රතිචාරාත්මකව මෙය සිදු කරන ලදී.

12. සේවක මණ්ඩල වියදම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

සේවක මණ්ඩල වියදම් ප්‍රධාන වශයෙන් කාර්ය මණ්ඩල වැටුප්, ප්‍රසාද දීමනා, නිශ්චිත දායකත්ව/ප්‍රතිලාභ සැලසුම් වෙත දායකත්වයන් සහ සෙසු කාර්ය මණ්ඩලය ආශ්‍රිත වියදම්වලින් සමන්විත වේ. කෙටි කාලීන සේවක බැඳීම් වට්ටම් රහිත පදනමක් මත මිනුම්ගත කෙරෙන අතර අදාළ සේවාව සපයන ලද අවස්ථාවේදී අදාළ වියදම් දරනු ලැබේ. සේවකයා විසින් සපයනලද පසුගිය සේවාවක ප්‍රතිඵලයක් ලෙස බැංකුව/සමූහය සතුව කිසියම් මුදලක් ගෙවීම සඳහා නීතිමය හෝ ගිවිසුම්ගත බැඳීමක් පවතී නම් සහ එකී බැඳීම විශ්වසනීය අයුරින් මිනුම්ගත කළ හැකි නම් අදාළ ගෙවීමට අපේක්ෂිත මුදල සඳහා කෙටි කාලීන මුදල් දීමනා යටතේ බැරකමක් ලෙස හඳුනා ගනී.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා	සටහන්	බැංකුව		සමූහය	
		2025 රු. '000	2024 රු. '000	2025 රු. '000	2024 රු. '000
වැටුප්, ප්‍රසාද දීමනා සහ ආශ්‍රිත වියදම්		31,108,248	30,406,220	39,496,843	36,164,782
නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් වෙත දායකත්වය – විශ්‍රාම අරමුදල	12.1	2,220,557	1,081,848	2,220,557	1,081,848
නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් වෙත දායකත්වය – පාරිතෝෂිකය	12.2	235,845	161,942	418,008	355,928
පෙර ගෙවුම් කාර්ය මණ්ඩල පිරිවැය ක්‍රමක්ෂය		1,649,425	939,726	1,649,425	939,726
වෙනත්		3,016,582	3,245,090	3,016,582	3,245,090
එකතුව		38,230,657	35,834,826	46,801,415	41,787,374

12.1 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් වෙත දායකත්වය - විශ්‍රාම අරමුදල්

බැංකුව මගින් 1996 ජනවාරි 1 දිනට පෙර සේවයට බැඳුනු සහ 1996 ජනවාරි 1 දිනට පසු සේවයට බැඳුනු ස්ථිර සේවකයින් සඳහා, වෙන් වෙන්ව පරිපාලනය කෙරෙන අරමුදල් සඳහා දායකත්වය සැපයීම අවශ්‍ය වන නිශ්චිත විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් දෙකක් පවත්වා ගෙන යනු ලබයි. බැංකුව මගින් මෙම විශ්‍රාම අරමුදල් වෙතින් පැන නගින ආයුගණක ලාභ සහ අලාභ අනෙකුත් විස්තීර්ණ ආදායම් යටතේ හඳුනා ගැනෙන අතර, මෙම අරමුදල් ආශ්‍රිත වියදම් ආදායම් ප්‍රකාශයෙහි සේවක මණ්ඩල වියදම් යටතේ වාර්තා කෙරේ. මෙම නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් පිළිබඳ විස්තර "සේවක විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම්" (සටහන 37.1 සහ 37.2) හි දක්වා ඇත.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා	සටහන්	බැංකුව		සමූහය	
		2025 රු. '000	2024 රු. '000	2025 රු. '000	2024 රු. '000
ආදායම් ප්‍රකාශනය තුළ හඳුනාගත් ශුද්ධ වියදම					
නිශ්චිත ප්‍රතිලාභ සැලස්ම – 1996 ට පෙර විශ්‍රාම භාර අරමුදල	35.1.3	1,533,420	894,843	1,533,420	894,843
නිශ්චිත ප්‍රතිලාභ සැලස්ම – 1996 පසු විශ්‍රාම අරමුදල	35.2.3	687,137	187,005	687,137	187,005
		2,220,557	1,081,848	2,220,557	1,081,848

12.2 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් වෙත දායකත්වය - පාරිතෝෂිකය (සටහන 35.3)

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා	බැංකුව		සමූහය	
	2025 රු. '000	2024 රු. '000	2025 රු. '000	2024 රු. '000
ආදායම් ප්‍රකාශනය තුළ හඳුනාගත් ශුද්ධ වියදම				
වර්තමාන සේවා පිරිවැය	98,730	66,059	181,278	185,925
පොලී පිරිවැය	137,115	95,883	236,730	170,003
ශුද්ධ වියදම	235,845	161,942	418,008	355,928

13. අනෙකුත් වියදම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

අනෙකුත් වියදම් ඒවාට අදාළ කාලපරිච්ඡේදය තුළ එම වියදම් දරනු ලබන අවස්ථාවේදී ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගෙන ඇත. ව්‍යාපාරය පවත්වාගෙන යාමට සහ දේපළ, පිරියත සහ උපකරණ කාර්යක්ෂම තත්ත්වයෙන් නඩත්තු කිරීමට වැය කෙරෙන සියළු වියදම් වසර සඳහා ලාභය ගණනය කිරීමේදී ආදායම් ප්‍රකාශයෙන් අය කරනු ලැබේ.

ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය ක්‍රමවේදයන් සහ අනුපාතයන් පිළිබඳ සටහන 28 (දේපළ, පිරියත හා උපකරණ හා භාවිතයට අයිතිය ඇති වත්කම්) හි නියම කොට දක්වා ඇති පරිදි වේ.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා	සටහන්	බැංකුව		සමූහය	
		2025 රු. '000	2024 රු. '000	2025 රු. '000	2024 රු. '000
අධ්‍යක්ෂවරුන්ගේ සංවේතන		10,245	7,065	94,852	7,065
විගණකවරුන්ගේ පාරිශ්‍රමික		15,460	11,582	32,933	11,582
විගණකවරුන් වෙත විගණන නොවන ගාස්තු		–	–	15,140	–
වෘත්තික සහ නෛතික වියදම්		323,189	250,537	468,567	250,537
ක්ෂයකිරීම සහ ක්‍රමක්ෂය	13.1	4,953,105	4,776,742	5,735,366	5,393,670
කාර්යාල පරිපාලන හා ආයතනික වියදම්		13,806,288	13,895,860	17,413,994	17,010,441
ප්‍රතිලාභ හිමිකම් හා ප්‍රාරක්ෂණ වියදම්		–	–	2,587,358	3,041,460
තැන්පතු රක්ෂණ වාරිකය		2,902,287	2,734,339	3,093,772	2,734,339
වෙනත්		6,160,210	5,426,872	6,344,588	5,491,855
එකතුව		28,170,784	27,102,997	35,786,570	33,940,949

13.1 ක්ෂයකිරීම සහ ක්‍රමක්ෂය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා	සටහන්	බැංකුව		සමූහය	
		2025 රු. '000	2024 රු. '000	2025 රු. '000	2024 රු. '000
දේපල, පිරියත සහ උපකරණවල ක්ෂයකිරීම	28	1,825,865	2,196,844	2,103,289	2,459,150
භාවිතයට අයිතිය ඇති වත්කම් ක්‍රමක්ෂය	28	2,158,683	1,843,513	2,631,615	2,173,275
අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය	29	968,557	736,385	1,000,462	761,245
		4,953,105	4,776,742	5,735,366	5,393,670

14. බදු වියදම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

වර්තන බදුකරණය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති LKAS 12 – "ආදායම් බදු" වලට අනුව, බදු වියදම යනු ප්‍රවර්තන සහ විලම්බිත බදු සම්බන්ධයෙන් අදාළ කාලපරිච්ඡේදය සඳහා ලාභය හෝ අලාභය තීරණය කිරීමේදී ඇතුළත් කෙරෙන සමස්ත මුදල් ප්‍රමාණයයි. ආදායම් බදු වියදම අනෙකුත් විස්තීරණ ආදායම් හි සෘජුව හඳුනාගැනෙන අයිතමයන්ට සම්බන්ධ නොවන්නේ නම් ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගැනේ. ඉහත දක්වන ලද ආකාරයේ අවස්ථාවන්හිදී එය අනෙකුත් විස්තීරණ ආදායම් තුළ හඳුනා ගනී.

ඒ අනුව, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධානවලට අනුකූල වන බදුකරණ අරමුණු සඳහා ගළපන ලද වර්ෂයේ ලාභයේ පදනම මත බදුකරණ වෙන්කිරීම් සිදු කෙරේ. අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන් පිළිබඳ විස්තරාත්මක අනාවරණය මෙම මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් 5.18 හි දක්වා ඇත.

විලම්බිත බදුකරණය

මූල්‍ය වාර්තාකරණ කාර්යයන් වෙනුවෙන් වත්කම් සහ වගකීම්වල බදු පදනම් සහ ඒවායේ ධාරණ අගයන් අතර වාර්තාකරන දිනයට තාවකාලික වෙනස මත බැරකම් ක්‍රමය භාවිත කරමින් විලම්බිත බදු ප්‍රතිපාදනය කෙරේ. විලම්බිත බදු පිළිබඳ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ඇස්තමේන්තු සම්බන්ධයෙන් විස්තරාත්මක අනාවරණය මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් 5.18.2 හි දක්වා ඇත.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා	සටහන්	බැංකුව 2025 රු. '000	බැංකුව 2024 රු. '000	සමූහය 2025 රු. '000	සමූහය 2024 රු. '000
ප්‍රවර්තන වර්ෂයේ බදු වියදම්					
ආදායම් බදු වියදම	14.1	21,158,783	13,402,649	23,972,997	14,835,204
පෙර වර්ෂයේ (අධි)/ඌන වෙන්කිරීම		1,539,980	1,055,845	1,519,246	1,055,845
විලම්බිත බදු අයකිරීම/(බැර)	14.2	1,480,448	2,036,853	2,133,220	2,942,858
මුළු බදු වියදම		24,179,211	16,495,347	27,625,463	18,833,907
සඵල බදු අනුපාතිකය		37.5%	39.7%	38.8%	39.6%

14.1 බදු වියදම් සැසඳීම

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා	බැංකුව 2025 රු. '000	බැංකුව 2024 රු. '000	සමූහය 2025 රු. '000	සමූහය 2024 රු. '000
වසර සඳහා බදු පෙර ලාභය	64,408,725	41,583,707	71,109,172	47,609,774
කාලපරිච්ඡේදය සඳහා ආදායම් බදු (අදාළ වන බදු අනුපාතිකයට ගිණුම්කරණ ලාභය)	19,322,617	12,475,114	21,332,751	14,282,934
එකතු කළා:				
බදු කාර්යයන් සඳහා අඩු කළ නොහැකි වියදම්වල බදු බලපෑම	14,301,672	9,531,177	15,117,345	10,087,182
(අඩු කළා):				
බදු කාර්යයන් සඳහා අඩු කළ හැකි වියදම්වල බදු බලපෑම	(12,465,506)	(8,603,642)	(12,477,099)	(9,534,912)
කාලපරිච්ඡේදය සඳහා අදායම් බදු වියදම	21,158,783	13,402,649	23,972,997	14,835,204

14.2 ලාභය/(අලාභය) තුල විලම්බිත බදු අය කිරීම්/(බැරකම) පහත සඳහන් දෑ වලින් සමන්විත වේ:

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා	බැංකුව		සමූහය	
	2025 රු. '000	2024 රු. '000	2025 රු. '000	2024 රු. '000
විලම්බිත බදු වත්කම්	1,658,580	(291,815)	2,226,205	(770,815)
විලම්බිත බදු වගකීම්	(178,132)	2,328,668	(92,985)	3,713,673
ලාභයට/(අලාභයට) විලම්බිත බදු (බැරකම්)/අය කිරීම්	1,480,448	2,036,853	2,133,220	2,942,858

14.3 අනෙකුත් විස්තීර්ණ ආදායම්වල විලම්බිත බදු ගාස්තුව/(බැරකම) පහත සඳහන් දෑ වලින් සමන්විත වේ:

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා	බැංකුව		සමූහය	
	2025 රු. '000	2024 රු. '000	2025 රු. '000	2024 රු. '000
විශ්‍රාම ප්‍රතිලාභ	649,867	(2,308,124)	645,774	(2,351,888)
ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය	(970,800)	869,334	(804,685)	984,264
අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් සාධාරණ අගයට උපකරණවලින් ලාභය (අලාභය)	–	–	77,628	50,079
අනෙකුත් විස්තරාත්මක ආදායමට විලම්බිත බදු අයකිරීම/(බැරකම)	(320,933)	(1,438,790)	(81,283)	(1,317,545)
වර්ෂය සඳහා ශුද්ධ විලම්බිත බදු	1,159,515	598,063	2,051,937	1,625,313

14.4 ආදායම් බදු මත ලබා දී ඇති අදාළ සහන අනුපාත හෝ නිවාඩු

	සමූහය	
	2025 %	2024 %
බැංකුවේ දේශීය මෙහෙයුම්	30	30
අක් වෙරළ බැංකුකරණ ඒකකයෙහි දේශීය බැංකුකරණ මෙහෙයුම්	30	30
අක් වෙරළ බැංකුකරණ ඒකකයෙහි අක් වෙරළ බැංකුකරණ මෙහෙයුම්	30	30
පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී	30	30
පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් ලිමිටඩ්	30	30
පීපල්ස් ලීසිං ප්‍රොපර්ටි ඩිවෙලොප්මන්ට් ලිමිටඩ්	20 සහ 30	20 සහ 30
පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපර්ටීස් ලිමිටඩ්	20	10
පීපල්ස් මයික්‍රෝ ෆයිනෑන්ස් ලිමිටඩ්	30	30
පීපල්ස් ඉන්ෂුරන්ස් පීඑල්සී	30	30
පීපල්ස් ට්‍රැවල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	30	30
ලංකන් එලායන්ස් ෆිනෑන්ස් ලිමිටඩ්	40	40

15. කොටසකට ඉපයීම්

15.1 කොටසකට මූලික ඉපයීම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති LKAS 33 – "කොටසකට ඉපැයීම්" අනුව, කොටසකට මූලික ඉපැයීම් ගණනය කිරීම සාමාන්‍ය කොටස් හිමියන්ට අදාළ වන ලාභය සහ වසර තුළ පවත්නා සාමාන්‍ය කොටස්වල බර තැබූ සාමාන්‍යය මත පදනම් වී ඇත.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා	බැංකුව		සමූහය	
	2025 රු. '000	2024 රු. '000	2025 රු. '000	2024 රු. '000
සාමාන්‍ය කොටස් හිමියන්ට පැවරිය හැකි ශුද්ධ ලාභය (රු.'000)	40,229,514	25,088,360	41,974,128	27,558,538
නිකුත් කර ඇති සාමාන්‍ය කොටස් වල බරතබන ලද සාමාන්‍යය (රු.'000)	1,000	1,000	1,000	1,000
කොටසකට මූලික ඉපැයීම් (රු.)	40,230	25,088	41,974	27,559

15.2 කොටසකට තනුක ඉපයීම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති LKAS 33 – "කොටසකට ඉපැයීම්" අනුව, කොටසකට තනුක ඉපැයීම් ගණනය කිරීම සියළු තනුක විභවය සහිත සාමාන්‍ය කොටස්වල බලපෑම සඳහා ගැළපුම් කිරීමෙන් පසුව සාමාන්‍ය කොටස් හිමියන්ට අදාළ වන සහ වසර තුළ පවත්නා සාමාන්‍ය කොටස්වල බර තැබූ සාමාන්‍යය මත පදනම් වී ඇත.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා	බැංකුව		සමූහය	
	2025 රු. '000	2024 රු. '000	2025 රු. '000	2024 රු. '000
සාමාන්‍ය කොටස් හිමියන්ට ආරෝපනය කළ හැකි ශුද්ධ ලාභය (රු. '000)	40,229,514	25,088,360	41,974,128	27,558,538
නිකුත් කර ඇති සාමාන්‍ය කොටස් වල බරතබන ලද සාමාන්‍යය (රු. '000)	1,000	1,000	1,000	1,000
විභජනය සඳහා වෙන් කර ඇති ප්‍රාග්ධනයේ සාමාන්‍ය කොටස් සංඛ්‍යාව (රු. '000)	243,040	243,040	243,040	243,040
විභජනය සඳහා වෙන් කර ඇති නිකුත් කර ඇති මුළු කොටස් සංඛ්‍යාව (රු. '000)	244,040	244,040	244,040	244,040
කොටසකට තනුක ඉපැයීම් (රු.)	165	103	172	113

16. මූල්‍ය උපකරණ මිනුම්කරණය

පහත දැක්වෙන වගුව මගින් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දැක්වෙන මාතෘකා යටතේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති SLFRS 9 (මූල්‍ය උපකරණ) වල නිර්වචනය කොට ඇති පරිදි කාණ්ඩ වශයෙන් මූල්‍ය වත්කම්වල ධාරණ අගයන් විශ්ලේෂණය කොට ඇත.

16.1 බැංකුව – 2025 දෙසැම්බර් 31

	FVTPL[1]	FVOCI[2]	AC[3]	එකතුව
වත්කම්				
මුදල් හා මුදල් සමාන දෑ	–	–	109,138,690	109,138,690
ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ පවතින ශේෂය	–	–	38,417,296	38,417,296
බැංකුවල ඇති ස්ථාපන	–	–	85,166,913	85,166,913
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	4,524,930	–	–	4,524,930
මූල්‍ය වත්කම් – ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව	307,296,907	–	–	307,296,907
මූල්‍ය වත්කම් – ක්‍රමක්ෂය පිරිවැය අනුව				
බැංකුවලට ණය හා අත්තිකාරම්	–	–	83,506,019	83,506,019
අනෙකුත් ගනුදෙනුකරුවන්ට ණය හා අත්තිකාරම්	–	–	1,730,671,216	1,730,671,216
ක්‍රමක්ෂය පිරිවැය අනුව මිනුම්ගත ණය උපකරණ	–	–	1,230,298,162	1,230,298,162
මූල්‍ය වත්කම් – අනෙකුත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගය අනුව				
අනෙකුත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගය අනුව ස්කන්ධ උපකරණ	–	3,431,075	–	3,431,075
අනෙකුත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගය අනුව ණය උපකරණ	–	7,081,782	–	7,081,782
මුළු මූල්‍ය වත්කම්	311,821,837	10,512,857	3,277,198,296	3,599,532,990

	FVTPL[1]	FVOCI[2]	AC[3]	එකතුව
වගකීම්				
බැංකුවලට ගෙවිය යුතු	–	–	25,969,385	25,969,385
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	93,407	–	–	93,407
අනෙකුත් ගනුදෙනුකරුවන් වෙත ගෙවිය යුතු දෑ	–	–	3,229,886,179	3,229,886,179
වෙනත් ණය ගැනීම්	–	–	100,014,574	100,014,574
යටත් කරන ලද කාල ණය	–	–	40,552,963	40,552,963
මුළු මූල්‍ය වගකීම්	93,407	–	3,396,423,101	3,396,516,508

බැංකුව - 2024 දෙසැම්බර් 31

	FVTPL[1]	FVOCI[2]	AC[3]	එකතුව
වත්කම්				
මුදල් හා මුදල් සමාන දෑ	–	–	71,694,016	71,694,016
ශ්‍රී ලංකා මහ බැංකුව සමග පවතින ශේෂය	–	–	33,798,107	33,798,107
බැංකුවල ඇති ස්ථාපන	–	–	59,831,807	59,831,807
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	5,842,194	–	–	5,842,194
මූල්‍ය වත්කම් – ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව	329,810,350	–	–	329,810,350
මූල්‍ය වත්කම් - ක්‍රමක්ෂය පිරිවැය අනුව				
බැංකුවලට ණය හා අත්තිකාරම්	–	–	31,994,539	31,994,539
අනෙකුත් ගනුදෙනුකරුවන්ට ණය හා අත්තිකාරම්	–	–	1,521,965,020	1,521,965,020
ක්‍රමක්ෂය පිරිවැය අනුව මිනුම්ගත ණය උපකරණ	–	–	1,123,490,537	1,123,490,537
මූල්‍ය වත්කම් – අනෙකුත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගයට				
අනෙකුත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගය අනුව ස්කන්ධ උපකරණ	–	2,313,187	–	2,313,187
අනෙකුත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගය අනුව ණය උපකරණ	–	7,110,671	–	7,110,671
මුළු මූල්‍ය වත්කම්	335,652,544	9,423,858	2,842,774,026	3,187,850,428

	FVTPL[1]	FVOCI[2]	AC[3]	එකතුව
වගකීම්				
බැංකුවලට ගෙවිය යුතු	–	–	36,840,228	36,840,228
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	168,266	–	–	168,266
අනෙකුත් ගනුදෙනුකරුවන් වෙත ගෙවිය යුතු දෑ	–	–	2,854,704,194	2,854,704,194
වෙනත් ණය ගැනීම්	–	–	75,545,595	75,545,595
යටත් කරන ලද කාල ණය	–	–	54,156,709	54,156,709
මුළු මූල්‍ය වගකීම්	168,266	–	3,021,246,726	3,021,414,992

1 ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගය

2 අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගය

3 ක්‍රමක්ෂය පිරිවැය

16.2 සමූහය – 2025 දෙසැම්බර් 31

	FVTPL[1]	FVOCI[2]	AC[3]	එකතුව
වත්කම්				
මුදල් හා මුදල් සමාන දෑ	–	–	110,598,346	110,598,346
ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ පවතින ශේෂය	–	–	38,417,296	38,417,296
බැංකුවල ඇති ස්ථාපන	–	–	89,852,936	89,852,936
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	4,524,930	–	–	4,524,930
මූල්‍ය වත්කම් – ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව	308,444,628	–	–	308,444,628
මූල්‍ය වත්කම් – ක්‍රමක්ෂය පිරිවැය අනුව				
බැංකුවලට ණය හා අත්තිකාරම්	–	–	89,185,034	89,185,034
අනෙකුත් ගනුදෙනුකරුවන්ට ණය හා අත්තිකාරම්	–	–	2,000,085,410	2,000,085,410
ක්‍රමක්ෂය පිරිවැය අනුව මිනුම්ගත ණය උපකරණ	–	–	1,242,598,653	1,242,598,653
මූල්‍ය වත්කම් – අනෙකුත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගය අනුව				
අනෙකුත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගය අනුව ස්කන්ධ උපකරණ	–	3,704,427	–	3,704,427
අනෙකුත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගය අනුව ණය උපකරණ	–	8,051,542	–	8,051,542
මුළු මූල්‍ය වත්කම්	312,969,558	11,755,969	3,570,737,675	3,895,463,202

	FVTPL[1]	FVOCI[2]	AC[3]	එකතුව
වගකීම්				
බැංකුවලට ගෙවිය යුතු	–	–	96,287,432	96,287,432
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	93,407	–	–	93,407
අනෙකුත් ගනුදෙනුකරුවන් වෙත ගෙවිය යුතු දෑ	–	–	3,380,319,917	3,380,319,917
වෙනත් ණය ගැහීම්	–	–	99,787,574	99,787,574
යටත් කරන ලද කාල ණය	–	–	45,508,349	45,508,349
මුළු මූල්‍ය වගකීම්	93,407	–	3,621,903,272	3,621,996,679

සමූහය - 31 දෙසැම්බර් 2024

	FVTPL[1]	FVOCI[2]	AC[3]	එකතුව
වත්කම්				
මුදල් හා මුදල් සමාන දෑ	–	–	72,398,306	72,398,306
ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ පවතින ශේෂය	–	–	33,798,107	33,798,107
බැංකුවල ඇති ස්ථාපන	–	–	62,005,136	62,005,136
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	5,842,194	–	–	5,842,194
මූල්‍ය වත්කම් – ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව	330,597,382	–	–	330,597,382
මූල්‍ය වත්කම් – ක්‍රමක්ෂය පිරිවැය අනුව				
බැංකුවලට ණය හා අත්තිකාරම්	–	–	37,047,879	37,047,879
අනෙකුත් ගනුදෙනුකරුවන්ට ණය හා අත්තිකාරම්	–	–	1,665,027,784	1,665,027,784
ක්‍රමක්ෂය පිරිවැය අනුව මිනුම්ගත ණය උපකරණ	–	–	1,138,634,981	1,138,634,981
මූල්‍ය වත්කම් – අනෙකුත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගයට				
අනෙකුත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගය අනුව ස්කන්ධ උපකරණ	–	2,668,358	–	2,668,358
අනෙකුත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගය අනුව ණය උපකරණ	–	8,576,912	–	8,576,912
මුළු මූල්‍ය වත්කම්	336,439,576	11,245,270	3,008,912,193	3,356,597,039

	FVTPL[1]	FVOCI[2]	AC[3]	එකතුව
වගකීම්				
බැංකුවලට ගෙවිය යුතු	–	–	46,871,380	46,871,380
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	168,266	–	–	168,266
අනෙකුත් ගනුදෙනුකරුවන් වෙත ගෙවිය යුතු දෑ	–	–	2,947,904,673	2,947,904,673
වෙනත් ණය ගැනීම්	–	–	75,482,595	75,482,595
යටත් කරන ලද කාල ණය	–	–	59,065,269	59,065,269
මුළු මූල්‍ය වගකීම්	168,266	–	3,129,323,917	3,129,492,183

1 ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගය

2 අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගය

3 ක්‍රමක්ෂය පිරිවැය

17. මුදල් සහ මුදල් සමාන දෑ

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

අතැති මුදල්, බැංකුවල පවතින ශේෂයන්, ඒක්ෂණ සහ කෙටිකාලීන දැන්වීම් මුදල් සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ස්ථාවර තැන්පතු පහසුකම මුදල් සහ මුදල් සමාන දෑ වෙත ඇතුළත් වේ. මුදල් සහ මුදල් සමාන දෑ මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශයෙහි ක්‍රමක්ෂය පිරිවැය අනුව ඉදිරිපත් කෙරේ.

17.1 මුදල්

දෙසැම්බර් 31 දිනට	බැංකුව		සමූහය	
	2025 රු. '000	2024 රු. '000	2025 රු. '000	2024 රු. '000
අතැති මුදල	59,633,677	61,007,554	61,269,018	61,980,002
	59,633,677	61,007,554	61,269,018	61,980,002

17.2 මුදල් සමාන දෑ

දෙසැම්බර් 31 දිනට	සටහන්	බැංකුව		සමූහය	
		2025 රු. '000	2024 රු. '000	2025 රු. '000	2024 රු. '000
බැංකුවල පවතින ශේෂයන්		29,534,500	6,100,818	29,358,815	5,832,660
ඒක්ෂණ සහ කෙටිකාලීන දැන්වීම් මුදල්		7,501,654	–	7,501,654	–
මහ බැංකුවේ ස්ථාවර තැන්පතු පහසුකම		12,502,241	4,600,900	12,502,241	4,600,900
		49,538,395	10,701,718	49,362,710	10,433,560
අඩුකළා: අපේක්ෂිත ණය අලාභ සඳහා දීමනාව	17.4	(33,382)	(15,256)	(33,382)	(15,256)
		49,505,013	10,686,462	49,329,328	10,418,304
මුළු මුදල් හා මුදල් සමාන දෑ		109,138,690	71,694,016	110,598,346	72,398,306

17.3 ණය අවදානමට නිරාවරණය මත පදනම් මුදල් සමාන දෑ පිළිබඳ විශ්ලේෂණය

බැංකුව

දෙසැම්බර් 31 දිනට	2025			
	අදියර 1 රු. '000	අදියර 2 රු. '000	අදියර 3 රු. '000	එකතුව රු. '000
බැංකුවල පවතින ශේෂයන්	28,934,613	599,887	–	29,534,500
වීක්ෂණ සහ කෙටිකාලීන දැන්වීම් මුදල්	7,501,654	–	–	7,501,654
මහ බැංකුවේ ස්ථාවර තැන්පතු පහසුකම	12,502,241	–	–	12,502,241
එකතුව	48,938,508	599,887	–	49,538,395

දෙසැම්බර් 31 දිනට	2024			
	අදියර 1 රු. '000	අදියර 2 රු. '000	අදියර 3 රු. '000	එකතුව රු. '000
බැංකුවල පවතින ශේෂයන්	5,900,502	200,316	–	6,100,818
මහ බැංකුවේ ස්ථාවර තැන්පතු පහසුකම	4,600,900	–	–	4,600,900
එකතුව	10,501,402	200,316	–	10,701,718

සමූහය

දෙසැම්බර් 31 දිනට	2025			
	අදියර 1 රු. '000	අදියර 2 රු. '000	අදියර 3 රු. '000	එකතුව රු. '000
බැංකුවල පවතින ශේෂයන්	28,758,928	599,887	–	29,358,815
වීක්ෂණ සහ කෙටිකාලීන දැන්වීම් මුදල්	7,501,654	–	–	7,501,654
මහ බැංකුවේ ස්ථාවර තැන්පතු පහසුකම	12,502,241	–	–	12,502,241
එකතුව	48,762,823	599,887	–	49,362,710

දෙසැම්බර් 31 දිනට	2024			
	අදියර 1 රු. '000	අදියර 2 රු. '000	අදියර 3 රු. '000	එකතුව රු. '000
බැංකුවල පවතින ශේෂයන්	5,632,344	200,316	–	5,832,660
මහ බැංකුවේ ස්ථාවර තැන්පතු පහසුකම	4,600,900	–	–	4,600,900
මූල්‍ය වත්කම් - ලාභ හෝ අලාභය තුළින් සාධාරණ අගයට								
භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර	329,502,756	–	–	329,502,756	329,502,756	–	–	329,502,756
මිල සඳහන් කළ - ස්කන්ධ සුරැකුම්	301,121	–	–	301,121	699,088	–	–	699,088
- ණය සුරැකුම්පත්	6,473	–	–	6,473	6,473	–	–	6,473
- ඒකක භාර	–	–	–	–		389,065	–	389,065
අනෙකුත් විස්තිර්ණ ආදායම තුළින් සාධාරණ අගයට ස්කන්ධ උපකරණ								
ලැයිස්තුගත නොකළ ස්කන්ධ සුරැකුම්පත්	–	–	715,911	715,911	–	–	715,921	715,921
ලැයිස්තුගත කළ ස්කන්ධ සුරැකුම්පත්	1,597,276	–	–	1,597,276	1,952,437	–	–	1,952,437
අනෙකුත් විස්තිර්ණ ආදායම තුළින් සාධාරණ අගයට ණය උපකරණ								
භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර	26,145	–	–	26,145	26,145	522,472	–	548,617
ණය සුරැකුම්පත්	6,788,517	296,009	–	7,084,526	6,788,517	1,239,778	–	8,028,295
සාධාරණ අගයට මනින ලද මූල්‍ය නොවන වත්කම්								
ඉඩම් හා ගොඩනැගිලි	–	–	40,755,638	40,755,638	–	–	50,892,750	50,892,750
	338,222,288	6,138,203	41,471,549	385,832,040	338,975,416	7,993,509	51,608,671	398,577,596
මූල්‍ය වගකීම්								
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ								
ඉදිරි විදේශ විනිමය ගිවිසුම්	–	168,266	–	168,266	–	168,266	–	168,266

44.4 සාධාරණ අගය අනුව මිනුම්කරණය කළ මට්ටම 3 වත්කම්වල වෙනස්වීම

සාධාරණ අගය අනුව වාර්තා කරන 3 වන මට්ටමේ මූල්‍ය වත්කම් සහ බැරකම්වල ආරම්භක සහ අවසාන මුදල් ප්‍රමාණයන් පිළිබඳ සැසඳීමක් පහත සඳහන් වගුවෙහි පෙන්නුම් කරයි.

	බැංකුව					සමූහය				
	2025 ජනවාරි 1 දිනට රු. '000	ලාභය හෝ අලාභය තුළ වාර්තා වූ මුළු ලාභය/ (අලාභය) රු. '000	අනෙකුත් විස්තීර්ණ ආදායම තුළ වාර්තා වූ මුළු ලාභය/ (අලාභය) රු. '000	මිලදීගැනීම්/ (විකුණුම්) රු. '000	2025 දෙසැම්බර් 31 දිනට රු. '000	2025 ජනවාරි 1 දිනට රු. '000	ලාභය හෝ අලාභය තුළ වාර්තා වූ මුළු ලාභය/ (අලාභය) රු. '000	අනෙකුත් විස්තීර්ණ ආදායම තුළ වාර්තා වූ මුළු ලාභය/ (අලාභය) රු. '000	මිලදීගැනීම්/ (විකුණුම්) රු. '000	2025 දෙසැම්බර් 31 දිනට රු. '000
මූල්‍ය වත්කම්										
අලෙවියට තබා ඇති මූල්‍ය ආයෝජන										
මිල සඳහන් නොකළ ස්කන්ධ සුරැකුම්පත්	715,911	–	284,414	–	1,000,325	715,921	–	284,414	–	1,000,335
මට්ටම 3 මුළු මූල්‍ය වත්කම්	715,911	–	284,414	–	1,000,325	715,921	–	284,414	–	1,000,335
මූල්‍ය වගකීම්										
මට්ටම 3 මුළු මූල්‍ය වගකීම්	–	–	–	–	–	–	–	–	–	–
මුළු මට්ටම 3 ශුද්ධ වත්කම්/ (බැරකම්)	715,911	–	284,414	–	1,000,325	715,921	–	284,414	–	1,000,335

	බැංකුව					සමූහය				
	2024 ජනවාරි 1 දිනට රු. '000	ලාභය හෝ අලාභය තුළ වාර්තා වූ මුළු ලාභය/ (අලාභය) රු. '000	අනෙකුත් විස්තීර්ණ ආදායම තුළ වාර්තා වූ මුළු ලාභය/ (අලාභය) රු. '000	මිලදීගැනීම්/ (විකුණුම්) රු. '000	2024 දෙසැම්බර් 31 දිනට රු. '000	2024 ජනවාරි 1 දිනට රු. '000	ලාභය හෝ අලාභය තුළ වාර්තා වූ මුළු ලාභය/ (අලාභය) රු. '000	අනෙකුත් විස්තීර්ණ ආදායම තුළ වාර්තා වූ මුළු ලාභය/ (අලාභය) රු. '000	මිලදීගැනීම්/ (විකුණුම් රු. '000	2024 දෙසැම්බර් 31 දිනට රු. '000
මූල්‍ය වත්කම්										
අලෙවියට තබා ඇති මූල්‍ය ආයෝජන										
මිල සඳහන් නොකළ ස්කන්ධ සුරැකුම්පත්	397,072	–	168,195	150,645	715,911	397,082	–	168,195	150,645	715,921
මට්ටම 3 මුළු මූල්‍ය වත්කම්	397,072	–	168,195	150,645	715,911	397,082	–	168,195	150,645	715,921
මූල්‍ය වගකීම්										
මට්ටම 3 මුළු මූල්‍ය වගකීම්	–	–	–	–	–	–	–	–	–	–
මුළු මට්ටම 3 ශුද්ධ වත්කම්/ (බැරකම්)	397,072	–	168,195	150,645	715,911	397,082	–	168,195	150,645	715,921

44.5 සාධාරණ අගය අනුව මිනුම්කරණය නොකළ වත්කම් සහ බැරකම්වල සාධාරණ අගය

මූල්‍ය ප්‍රකාශවල සාධාරණ අගය මත දැනටමත් වර්තා කර නොමැති, මූල්‍ය උපකරණවල සාධාරණ අගයන් නිශ්චය කිරීම සඳහා භාවිතා කර ඇති ක්‍රමවේදයන් සහ උපකල්පනයන් පහත විස්තර කෙරේ.

සාධාරණ අගය, ධාරණ අගයට ආසන්න වත්කම්

කෙටිකාලීන කල්පිරීමක් (මුල් කල්පිරීම වසරකට අඩු වූ) සහිත මූල්‍ය වත්කම් සහ මූල්‍ය බැරකම් සඳහා, ධාරණ අගය, ඒවායේ සාධාරණ අගයන්ට ආසන්න බව උපකල්පනය කෙරේ. මෙම උපකල්පනය නිශ්චිත කල්පිරීමක් නොමැති ඉල්ලුම් තැන්පතු, වීක්ෂණ තැන්පතු සහ ඉතුරුම් තැන්පතුවලට ද අදාළ වේ.

ස්ථාවර අනුපාත මූල්‍ය උපකරණ

ස්ථිර පොලී අනුපාත සහිත ණය සහ අත්තිකාරම්, වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසානයේදී වෙළෙඳපොල අනුපාත භාවිතා කරමින් අගය කරන ලද අතර, සෙසු විචල්‍ය පොලී දරන ණය මුදල්, සාධාරණ අගයට සමාන වෙන ධාරණ අගය ලෙස සළකනු ලබයි. මෙයට ප්‍රතිවිරුද්ධ වශයෙන්, එක් වසරකට වැඩි මුල් කාලසීමාවක් සහිත සහ කල්පිරීමේදී පොලිය ගෙවනු ලබන ස්ථාවර තැන්පතු, වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසානයේදී ගනුදෙනුකරුවන්ට ලබාදෙන ප්‍රවර්තන වෙළෙඳපොල අනුපාතයන් භාවිත කරමින් වට්ටම් කරනු ලබයි.

පහත දක්වා ඇත්තේ මූල්‍ය ප්‍රකාශවල සාධාරණ අගයට ඉදිරියට ගෙන නොමැති බැංකුවේ මූල්‍ය උපකරණවල සාධාරණ අගයන් සහ ධාරණ අගයන් අතර අදාළ පංතියට අනුව සන්සන්දනයකි. මූල්‍ය නොවන වත්කම් සහ මූල්‍ය නොවන බැරකම්වල සාධාරණ අගයන් මෙම වගුවේ ඇතුළත් නොවේ.

	බැංකුව				සමූහය			
	2025		2024		2025		2024	
	ධාරණ අගය රු. '000	සාධාරණ අගය රු. '000	ධාරණ අගය රු. '000	සාධාරණ අගය රු. '000	ධාරණ අගය රු. '000	සාධාරණ අගය රු. '000	ධාරණ අගය රු. '000	සාධාරණ අගය රු. '000
මූල්‍ය වත්කම්								
මුදල් සහ මුදල් සමාන දෑ	109,138,690	109,138,690	71,694,016	71,694,016	110,598,346	110,598,346	72,398,306	72,398,306
මහ බැංකුව සමග ශේෂය	38,417,296	38,417,296	33,798,107	33,798,107	38,417,296	38,417,296	33,798,107	33,798,107
බැංකුවල ඇති ස්ථාපන	85,166,913	85,166,913	59,831,807	59,831,807	89,852,936	89,852,936	62,005,136	62,005,136
බැංකුවලට ණය සහ ලැබිය යුතු දෑ	83,506,019	83,506,019	31,994,539	31,994,539	89,185,034	89,185,034	37,047,879	37,047,879
වෙනත් ගනුදෙනුකරුවන්ට ණය සහ ලැබිය යුතු දෑ	1,730,671,216	1,826,296,375	1,521,965,020	1,522,080,689	2,000,085,410	2,095,710,569	1,665,027,784	1,665,143,453
ක්‍රමක්ෂය පිරිවැයට මිනුම් කරන ලද ණය උපකරණ	1,230,298,162	1,200,335,929	1,123,490,537	1,113,535,174	1,242,598,653	1,210,371,097	1,138,634,981	1,128,700,974
මූල්‍ය බැරකම්								
බැංකු වෙත ගෙවිය යුතු	25,969,385	25,969,385	36,840,228	36,840,228	96,287,432	96,287,432	46,871,380	46,871,380
වෙනත් ගනුදෙනුකරුවන් වෙත ගෙවිය යුතු	3,229,886,179	3,168,859,227	2,854,704,194	2,829,854,645	3,380,319,917	3,319,292,965	2,947,904,673	2,923,055,124
වෙනත් ණය ගැහීම්	100,014,574	100,014,574	75,545,595	75,545,595	99,787,574	99,787,574	75,482,595	75,482,595
යටත් කරන ලද කාලීන ණය	40,552,963	40,552,963	54,156,709	54,156,709	45,508,349	45,508,349	59,065,269	59,065,269

45. බණ්ඩ අනුව මූල්‍ය වාර්තාකරණය

මෙහෙයුම් බණ්ඩයක් යනු ආදායම උපයන්නා වූ සහ වියදම් දරන්නා වූ ව්‍යාපාරික කටයුතුවල නිරතවන සමූහයේ සංරචකයක් වන අතර (සමූහයේ වෙනත් සංරචකයන් සමග ගනුදෙනුවලට අදාළ ආදායම් සහ වියදම් ද ඇතුළුව) එහිදී එක් එක් බණ්ඩය වෙත සම්පත් වෙන් කිරීම සහ ඒවායේ කාර්යසාධනය තක්සේරු කිරීම සහ විචාරශීලී මූල්‍ය තොරතුරු ලබාගැනීම උදෙසා ප්‍රධාන මෙහෙයුම් තීරක විසින් අදාළ බණ්ඩයේ මෙහෙයුම් ප්‍රතිඵල නිරන්තරයෙන් සමාලෝචනය කෙරේ.

සමූහයේ බණ්ඩ වාර්තාකරණය පහත දැක්වෙන මෙහෙයුම් බණ්ඩ මත පදනම් වේ.

පාරිභෝගික බැංකුකරණය
රක්ෂණය

ආයතනික බැංකුකරණය
මූල්‍ය

භාණ්ඩාගාර සහ ප්‍රාථමික වෙළෙඳ ඒකකය

කල්බදු
සංචාර

පහත දැක්වෙන වගුව මගින් සමූහයේ මෙහෙයුම් ඛණ්ඩවල ආදායම, ලාභය, මුළු වත්කම්, මුළු බැරකම් ඉදිරිපත් කරයි.

	පාරිභෝගික බැංකුකරණය		ආයතනික බැංකුකරණය		භාණ්ඩාගාර සහ ප්‍රා. වෙ. ඒ		බැංකුවේ සමස්ථය	
	2025	2024	2025	2024	2025	2024	2025	2024
බාහිර ගනුදෙනුකරුවන්ගෙන් ආදායම								
ශුද්ධ පොළී ආදායම	97,212,051	102,237,101	20,885,380	19,370,452	24,057,317	(14,511,392)	142,154,748	107,096,161
ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම	14,848,441	12,766,773	1,604,602	1,501,622	(45,574)	(102,835)	16,407,470	14,165,560
වෙළඳාමෙන් ශුද්ධ ලාභය/(අලාභය)	2,441,177	(722,270)	695,325	213,543	116,513	1,362,417	3,253,015	853,690
වෙනත්	3,489,344	2,679,979	123,761	113,213	(2,194,840)	(1,076,728)	1,418,265	1,716,464
බාහිර ගනුදෙනුකරුවන්ගෙන් මුළු මෙහෙයුම් ආදායම	117,991,013	116,961,583	23,309,069	21,198,830	21,933,416	(14,328,538)	163,233,498	123,831,875
අන්තර් ඛණ්ඩ ආදායම								
ශුද්ධ පොළී ආදායම	–	–	222,959	145,780	–	–	222,959	145,780
වෙනත්	94,438	60,309	–	–	2,262,095	1,132,037	2,356,533	1,192,346
මුළු අන්තර් ඛණ්ඩ ආදායම	94,438	60,309	222,959	145,780	2,262,095	1,132,037	2,579,492	1,338,126
මුළු මෙහෙයුම් ආදායම	118,085,452	117,021,892	23,532,028	21,344,610	24,195,510	(13,196,501)	165,812,990	125,170,001
මුළු දරන ලද වියදම්	–	–	–	–	–	–	(101,404,265)	(83,586,294)
ආදායම් බදු වියදම්	–	–	–	–	–	–	(24,179,211)	(16,495,347)
වසර සඳහා ලාභය	–	–	–	–	–	–	40,229,514	25,088,360
පාලනයට යටත් නොවන හිමිකම්	–	–	–	–	–	–	–	–
බැංකුවේ සාමාන්‍ය කොටස් හිමියන් සඳහා ලාභය	–	–	–	–	–	–	–	–
අනෙකුත් විස්තීර්ණ ආදායම ශුද්ධ	–	–	–	–	–	–	–	–
මුළු විස්තීර්ණ ආදායම	–	–	–	–	–	–	–	–
පාලනයට යටත් නොවන හිමිකම්	–	–	–	–	–	–	–	–
බැංකුවේ සාමාන්‍ය කොටස් හිමියන් සඳහා ලාභය	–	–	–	–	–	–	–	–
බණ්ඩ වත්කම්	938,361,990	843,899,785	608,274,378	628,616,504	2,161,768,123	1,825,282,818	3,708,404,491	3,297,799,107
මුළු වත්කම්	938,361,990	843,899,785	608,274,378	628,616,504	2,161,768,123	1,825,282,818	3,708,404,491	3,297,799,107
බණ්ඩ බැරකම්	2,798,545,759	2,613,425,341	202,296,924	158,644,050	488,524,197	343,732,171	3,489,366,881	3,115,801,563
මුළු බැරකම්	2,798,545,759	2,613,425,341	202,296,924	158,644,050	488,524,197	343,732,171	3,489,366,881	3,115,801,563
මුළු ස්කන්ධය සහ බැරකම්	938,361,990	843,899,785	608,274,378	628,616,504	2,161,768,123	1,825,282,818	3,708,404,491	3,297,799,107

කල්බදු		රක්ෂණය		සංචාර		වෙන් නොකළ		ඉවත්කිරීම්		සමූහය	
2025	2024	2025	2024	2025	2024	2025	2024	2025	2024	2025	2024
21,741,287	14,597,601	753,648	1,178,785	14,434	13,171	–	–	–	–	164,664,117	122,885,718
2,045,652	1,051,776	–	98,888	–	–	–	–	–	–	18,453,122	15,316,224
38,758	205,235	57,546	18,065	–	–	–	–	–	–	3,349,319	1,076,990
741,524	(582,217)	2,956,098	4,632,465	115,456	75,357	–	–	–	–	5,231,344	5,842,069
24,567,221	15,272,395	3,767,292	5,928,202	129,890	88,528	–	–	–	–	191,697,902	145,121,001
(214,415)	(140,772)	–	–	(8,544)	(5,008)	–	–	–	–	–	–
125,920	124,730	733,245	692,422	–	–	–	–	(3,215,698)	(2,009,498)	–	–
(88,495)	(16,043)	733,245	692,422	(8,544)	(5,008)	–	–	(3,215,698)	(2,009,498)	–	–
24,478,726	15,256,352	4,500,537	6,620,624	121,346	83,520	–	–	(3,215,698)	(2,009,498)	191,697,902	145,121,001
(15,854,693)	(8,816,475)	(4,215,486)	(5,919,009)	(67,888)	(66,908)	–	–	953,603	877,460	(120,588,730)	(97,511,227)
(3,387,631)	(2,055,554)	(61,824)	(272,229)	3,203	(10,777)	–	–	–	–	(27,625,463)	(18,833,907)
5,236,402	4,384,323	223,227	429,386	56,661	5,835	–	–	(2,262,095)	(1,132,037)	43,483,709	28,775,867
–	–	–	–	–	–	–	–	–	–	1,509,581	1,217,329
–	–	–	–	–	–	–	–	–	–	41,974,129	27,558,540
–	–	–	–	–	–	–	–	–	–	662,338	(3,374,088)
–	–	–	–	–	–	–	–	–	–	44,146,049	25,401,780
–	–	–	–	–	–	–	–	–	–	1,532,742	968,388
–	–	–	–	–	–	–	–	–	–	42,613,307	24,433,392
305,736,635	177,069,906	15,673,908	12,689,455	237,545	149,019	–	–	(19,818,138)	(16,001,551)	4,010,234,432	3,471,705,934
305,736,635	177,069,906	15,673,908	12,689,455	237,545	149,019	–	–	(19,818,138)	(16,001,551)	4,010,234,432	3,471,705,934
254,637,835	129,669,065	9,703,776	7,051,544	76,711	41,790			(13,665,037)	(10,809,821)	3,740,120,167	3,241,754,145
254,637,835	129,669,065	9,703,776	7,051,544	76,711	41,790	–	–	(13,665,037)	(10,809,821)	3,740,120,167	3,241,754,145
305,736,635	177,069,906	15,673,908	12,689,455	237,545	149,019	–	–	(19,818,138)	(16,001,551)	4,010,234,432	3,471,705,934

46. බදු පෙර ලාභයෙහි ඇතුළත් මූල්‍ය නොවන අයිතම

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා	බැංකුව		සමූහය	
	2025 රු. '000	2024 රු. '000	2025 රු. '000	2024 රු. '000
දේපල, පිරියත හා උපකරණවල ක්ෂයවීම	1,825,864	2,196,844	2,103,288	2,459,150
භාවිතයට අයිතිය ඇති වත්කම්වල ක්‍රමක්ෂය	2,158,684	1,843,513	2,631,616	2,173,275
අස්පෘශ්‍ය වත්කම්වල ක්‍රමක්ෂය	968,557	736,385	1,000,462	761,245
මූල්‍ය වත්කම්වල හානිකරණ අලාභ	15,993,696	5,450,173	16,194,067	4,204,573
අනෙකුත් හානිකරණ	–	–	(81,839)	221,765
ස්ථාවර වත්කම් විකිණීම මත ලාභය	(125,420)	(109,927)	(137,735)	(162,481)
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණවල වෙනස්වීම්	1,242,406	5,549,474	1,242,406	5,549,474
වෙළෙඳ සුරැකුම්පත්වල සාධාරණ අගයේදී වෙනස්වීම	375,466	(730,503)	375,466	(730,503)
කොටස් ලාභාංශ ආදායම	(961,391)	–	–	–
කල්පිරෙන තෙක් රඳවාගන්නා ආයෝජනවල වාරික ක්‍රමක්ෂය	1,037,478	1,628,892	1,037,478	1,628,892
කල්බදු වගකීම්වල පොළී වියදම	858,598	777,336	1,122,782	973,828
එකතුව	23,373,938	17,342,187	25,487,991	17,079,218

47. මෙහෙයුම් වත්කම්වල වෙනස්වීම්

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා	බැංකුව		සමූහය	
	2025 රු. '000	2024 රු. '000	2025 රු. '000	2024 රු. '000
ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව රඳවාගත්	22,137,977	(184,895,099)	21,777,288	(184,244,422)
මහ බැංකුව සමග ශේෂයෙහි ශුද්ධ වැඩිවීම	(4,619,189)	(2,794,888)	(4,619,189)	(2,794,888)
බැංකුව සමග ස්ථාපනවල ශුද්ධ වැඩිවීම	(25,335,106)	6,395,218	(27,847,800)	14,867,438
බැංකු වෙතින් ණය සහ ලැබිය යුතු දෑ වල ශුද්ධ වැඩිවීම	(51,511,480)	22,027,584	(52,137,155)	17,374,459
ගනුදෙනුකරුවන් වෙතින් ණය සහ ලැබිය යුතු දෑ වල ශුද්ධ වැඩිවීම	(224,699,892)	(80,540,321)	(351,251,693)	(108,045,008)
අනෙකුත් විස්තරාත්මක ආදායම තුළින් සාධාරණ අගයට මූල්‍ය ආයෝජනවල ශුද්ධ වැඩිවීම/(අඩුවීම)	20,397	964,572	857,458	942,090
වෙනත් වත්කම්වල වෙනස	902,538	13,958,305	760,159	14,681,849
එකතුව	(283,104,755)	(224,884,629)	(412,460,932)	(247,218,482)

48. මෙහෙයුම් වගකීම්වල වෙනස්වීම්

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා	බැංකුව		සමූහය	
	2025 රු. '000	2024 රු. '000	2025 රු. '000	2024 රු. '000
බැංකු වෙත ගෙවිය යුතු දෑ වෙනස්වීම	(10,870,843)	(40,383,911)	49,416,052	(38,774,887)
බැංකුවල හා ගනුදෙනුකරුවන්ගේ තැන්පතු සහ නිකුත්කළ ණය සුරැකුම්පත්වල වෙනස	375,181,985	201,598,648	432,415,244	202,743,063
වෙනත් ණය ගැනීම් වෙනස්වීම	24,468,979	11,267,152	24,304,979	11,259,152
වෙනත් බැරකම් වෙනස්වීම	(2,657,613)	38,584,008	3,341,701	41,168,929
එකතුව	386,122,508	211,065,897	509,477,976	216,396,257

49. මූල්‍ය අවදානම් කළමනාකරණය

හැඳින්වීම

මූල්‍යමය අතරමැදියකු වශයෙන්, සිය දෛනික මෙහෙයුම් තුළින් අවදානම් රැසකට බැංකුව නිරාවරණය වේ. බැංකුවේ ප්‍රධාන අවදානම් නිරාවරණයන්ට ණය, වෙළෙඳපොල, ද්‍රවශීලතා, මෙහෙයුම්, අනුකූලතා හා නියාමන, සහ තොරතුරු තාක්ෂණ සහ සයිබර්, කාලගුණ, උපායමාර්ගික හා කීර්තිනාම වැනි අවදානම් ඇතුළත් වේ. බැංකුවේ තිරසාරත්වය සහ ලාභදායීතාවය සහතික කරනු වස් ඵවැනි අවදානම් නිරාවරණ සක්‍රීයව හඳුනාගැනීමද අතිශය වැදගත් වේ. වැඩිවන වේගවත් සහ තරඟකාරී මෙහෙයුම් පරිසරයකට මෙන්ම වෙනස්වන අවදානම් සහ වැදගත් නියාමන සංවර්ධනයන්ට ප්‍රතිචාර වශයෙන්, බැංකුව තුළ අඛණ්ඩව අවදානම් කළමනාකරණය ශක්තිමත් කිරීමට ඉදිරියට යන වැඩ පිළිවෙලක් ඇත. ඒ වෙනුවෙන් ක්‍රියාත්මක ශක්තිමත් අවදානම් කළමනාකරණ රාමුවක් මගින් එකී අවදානම් නිරාවරණය කාර්යක්ෂමව කළමනාකරණය කර ගනිමින් අවම කර ගැනීමට සහය වේ.

අවදානම් කළමනාකරණ රාමුව

සමූහය පුරාවටම බලපැවැත්වෙන අවදානම් කළමනාකරණ රාමුවෙහි කොටසක් වශයෙන් අවදානම් හඳුනාගෙන කළමනාකරණය කෙරේ. මෙලෙස අවදානම් අධීක්ෂණය කිරීම, අවදානම් අභිරුචි මට්ටම් තීරණය කිරීම, අවදානම් ප්‍රතිපත්ති සකස් කිරීම හා ක්‍රියාත්මක වෙමින් පවතින අවදානම් කළමනාකරණ ක්‍රියාවලීන් හා ක්‍රමවේදයන්හි ඵලදායිකත්වය තහවුරු කිරීම ආදීයේ අවසාන වගකීම් සමූහයේ අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ. අවදානම් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සතු වගකීම් ඉටු කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC) සහාය දක්වන අතර අවදානම් පාලන ව්‍යුහයන්, ප්‍රතිපත්ති රාමු, ප්‍රමිතීන් හා ක්‍රියාවලීන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාණවත්බව සහ ඵලදායිකත්වය සහතික කිරීම තුළින් අවදානම්වලට අදාළ සෘජු අංගයක් සම්බන්ධයෙන් ස්වාධීන අධීක්ෂණයක් ලබා දේ. මෙයට අමතරව, අධ්‍යක්ෂ මණ්ඩල විධායක ණය කමිටුව (BECC), අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව (BAC) සහ අධ්‍යක්ෂ මණ්ඩල ආයෝජන බැංකුකරණ කමිටුව (BIBC) විසින්ද අවදානම් සබැඳි වගකීම් ඉටු කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සහාය දක්වනු ලැබේ. බැංකුවේ අවදානම් කළමනාකරණ ක්‍රියාවලීන් සාර්ථක ලෙස ක්‍රියාත්මක වන බවට සහතික කිරීමේදී විධායක කමිටු වනම් වත්කම් හා වගකීම් කළමනාකරණ කමිටුව (ALCO) සහ මෙහෙයුම් අවදානම් කළමනාකරණ කමිටුව (ORMC), තොරතුරු ආරක්ෂක කමිටුව (ISC) සහ ණය අවදානම් කළමනාකරණ කමිටුව (CRMC) විසින්ද ප්‍රමුඛ කාර්යභාරයක් ඉටුකරයි.

මහජන බැංකු සමූහයේ අවදානම් කළමනාකරණ රාමුව විසින් අවදානම් කළමනාකරණය සඳහා පදනම සකස් කර සමූහයේ අවදානම් කළමනාකරණ පරාසය, අවදානම් පරාමිති නියම කරන අතර, අවදානම් කළමනාකරණය සහ අධීක්ෂණය සඳහා වගකීම විධායකය සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පවරා වර්ධන සහ අවදානම් ප්‍රතිඵලවන් සුදුසු පරිදි තුලනය කෙරෙන බව සහතික කරයි. වෙළෙඳපොල තත්ත්වයන්හි අහිතකරතාවන් සහ සමූහයේ කාර්යභාරයන් හි වෙනස්කම් සඳහා හේතු සොයා බැලීම සඳහා බැංකුවේ අවදානම් කළමනාකරණ රාමුව හා සබැඳි ප්‍රතිපත්ති හා පද්ධතීන් අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය කරනු ලබයි.

මෙම රාමුව විශේෂයෙන්ම ව්‍යාපාරික මාර්ගය, අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර විගණනය යන ත්‍රිත්ව ආරක්ෂණ මාර්ගය මත පදනම් වේ.

අවදානම් අභිරුචිය

"අවදානම් අභිරුචිය" යන්නෙන් අදහස් වන්නේ සිය ව්‍යාපාරික උපායමාර්ග ක්‍රියාත්මක කිරීමේදී මහජන බැංකු සමූහය භාරගැනීමට කැමැත්තක් දක්වන අවදානම් වර්ග සහ අවදානම් සීමාවයි. විචල්‍යයන් රැසක් මත අවදානම් දරා සිටීමේ සීමාවන් සහ අවදානම් ප්‍රේරක ලක්ෂ්‍ය ඇසුරින් එය ප්‍රකාශයට පත් කෙරේ. සමූහයේ අවදානම් අභිරුචිය ස්ථාපනය කිරීමේ අවසන් වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරෙන අතර එකී අනුමත මට්ටම් ඇතුළත නිරාවරණ සහ අවදානම පවත්වාගෙන යනු ලබන බවට එමගින් සහතික කරයි.

අවදානම අවම කිරීම

බැංකුව පරීක්ෂාකාරීව අවදානම් අවම කිරීමේ ක්‍රියාමාර්ග විශ්ලේෂණය කර නියම කරයි. එමෙන්ම අඛණ්ඩ නියාමනය සහ අධ්‍යක්ෂ මණ්ඩලයට/කළමනාකරණ කමිටුවලට වාර්තා කරයි. තවද, විවිධ වර්ගයේ ඇප ලබාගෙන විවිධ අවදානම් අවම කිරීම සඳහා උපරිම විචක්ෂණ සීමා තීරණය කරයි.

අවදානම් කළමනාකරණ සහ ණය පාලන දෙපාර්තමේන්තුව

අවදානම් කළමනාකරණ සහ ණය පාලන දෙපාර්තමේන්තුව බැංකුවේ අවදානම් කළමනාකරණ කාර්යයන් සඳහා සමස්ථ විධායක වගකීම දරයි. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අවදානම් කළමනාකරණ විසින් මෙම අංශය මෙහෙයවනු ලබන වන අතර, ඔහු අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත සෘජුවම වාර්තා කර බැංකුවේ ව්‍යාපාරික ඒකක සහ ලාභ ඉලක්කවලින් ස්වාධීනව ක්‍රියාත්මක වේ. ණය, වෙළෙඳපොල, මෙහෙයුම් අවදානම් සහ තාක්ෂණික අවදානම් පාලනය කිරීම සඳහා විශේෂ වගකීම් සහිතව නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – අවදානම් කළමනාකරණගේ මඟපෙන්වීම යටතේ ණය පූර්ව සමාලෝචන ඒකකය, ණය පශ්චාත් සමාලෝචනය ඒකකය, භාණ්ඩාගාර මැදි කාර්යාලය සහ මෙහෙයුම් අවදානම්,තාක්ෂණික අවදානම් ඒකකය, දත්ත ආරක්ෂක ඒකකය වෙන වෙනම පිහිටුවා ඇත.

ණය අවදානම

ණය අවදානම යනු මූල්‍ය උපකරණයකට අදාළ ණයකරුවෙක් හෝ ප්‍රතිපාර්ශ්වයක් විසින් සිය මූල්‍ය හෝ ගිවිසුම්ගත බැඳීම් ඉටු කිරීමට අපොහොසත් වන්නේනම් බැංකුවට ඇතිවිය හැකි අවදානම වන අතර, ගනුදෙනුකරුවන්/වෙනත් බැංකුවලට බැංකුවේ ණය සහ අත්තිකාරම්, සහ ණය සුරැකුම්පත්වල ආයෝජනවලින් මෙම අවධානම මූලිකවම ඇති වේ. සෘජු අරමුදල් නිරාවරණවලින් ඇතිවන ණය අවදානමට අමතරව, බැංකුව ණය අවදානම දරනු ලබන ණයවර ලිපි සහ ඇප වැනි වකු වගකීම්වලට බැංකුව නිරාවරණය විය හැකි අතර මෙය ණය අවදානම පැහැරහැරීමේ අවදානම/ණය පියවීමේ අවදානම, සංකේන්ද්‍රණ අවදානම සහ ප්‍රතිපාර්ශ්ව අවදානම යනාදියෙන් සමන්විත වේ.

බැංකවේ ණය අවදානම් කළමනාකරණ රාමුව ක්‍රියාත්මක කිරීමේ සමස්ත වගකීම සහිත මෙහෙයුම් කමිටුව වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩල විධායක ණය කමිටුව ක්‍රියා කරයි. ණය පාලන ඒකකය ව්‍යාපාරික මාර්ගවලින් ස්වාධීනව කටයුතු කරමින් සියළුම ණය අවදානම් ප්‍රයත්න ක්‍රියාත්මක කරනු ලබයි. ණය අවදානම් කළමනාකරණ කිරීමේ මූලික වගකීම ඒ ඒ ව්‍යාපාරික ඒකක සතු වන අතර ණය පාලන ඒකකය විසින් සිදුකරනු ලබන ස්වාධීන සමාලෝචනයක් ඇසුරින් එය සිදු සිදුකරයි.

සමූහයේ ණය ප්‍රතිපත්තිවල ප්‍රධාන අංගයන්ට අනෙකුත් කරුණු අතර විවිධ මට්ටම්වලදී පවරන ලද අනුමත කිරීමේ බලතල, නිශ්චිත අවදානම් අභිරුචියට සමගාමීව ඉතා හොඳින් නිශ්චය කොට ඇති ණය නිර්ණායක සහ විචක්ෂණ සීමාවන් ඇතුළත් වන විස්තීර්ණ ණය අනුමත කිරීමේ යාන්ත්‍රණයක් ඇතුළත් වේ. ණයකරුවන් මූලිකවම ආපසු ගෙවීමේ හැකියාව සහ අභ්‍යන්තරව සංවර්ධිත අවදානම් ශ්‍රේණිගතකරණ ලකුණු කාඩ් අනුව අගය කරනු ලබන අතර ලකුණු 9 ශ්‍රේණිකරණ පරිමාණය ණයවල යෝග්‍යතාව තක්සේරු කිරීම සඳහා භාවිතා කෙරේ.

පිළිවෙලට සකස්කළ ලකුණු කාඩ් ආයතනික, සුළු හා මධ්‍ය පරිමාණ ණය ගන්නන්, මූල්‍ය ආයතන මෙන්ම පාරිභෝගික ණයගන්නන් තක්සේරු කිරීම සඳහා සංවර්ධනය කර ඇත. දැනට ක්‍රියාත්මක වෙමින් පවතින අභ්‍යන්තර ණය ශ්‍රේණිකරණ ආකෘති මගින් විවිධ අවදානම් සාධක නියෝජනය වීමක් සිදුවන අතර, පැහැර හැරීමේ සම්භාවිතාව සහ පැහැර හැරීමෙන් වන අලාභය පුරෝකථනය කිරීමට එයට හැකියාව ඇත.

හානිකරණ තක්සේරුව
ණය වර්ගීකරණය, පැහැර හැරීම සහ පිළියම පිළිබඳ නිර්වචනය

අදාළ ශ්‍රී ලංකා මහ බැංකුවේ මාර්ගෝපදේශ සහ SLFRS 9 විධිවිධාන මත පදනම වී බැංකුව මූල්‍ය උපකරණ වර්ගීකරණයක් සලකා බලයි. සියලුම ණය පහසුකම් අදියර 1, අදියර 2 සහ අදියර 3 යටතේ වර්ගීකරණය කරයි. තවද, අපේක්ෂිත ණය අලාභය තනිපුද්ගල පදනමක් (රු. මිලියන 25 ට වැඩි නිරාවරණය) හෝ සාමූහික පදනමක් මත ගණනය කරන අතර, සියලුම පහසුකම් තනිපුද්ගල හෝ සාමූහික හානිකරණයට යටත් වේ. ණයගැතියා දින 90 වැඩි කාලයක් පැහැර හැරියොත් අදියර 3 යටතේ වර්ගීකරණය කර අයකිරීමේ ක්‍රියාවන් හෝ ප්‍රතිසාධන ක්‍රියාවලිය ආරම්භ කිරීමට අක්‍රිය ලෙස සලකනු ලබයි. තනි පුද්ගල ගිවිසුම්වල දක්වා ඇති පරිදි ව්‍යාපාරය අවසානය වන විට අවශ්‍ය අභ්‍යන්තර දින ගෙවීම් පියවනු ලැබ නොමැති නම් බැංකුව මගින් අදාළ භාණ්ඩාගාර සහ අන්තර්බැංකු ශේෂයන් පැහැර හරින ලද බවට සැළකෙන අතර ඒ පිළිබඳ වහාම අදාළ පියවර ගනු ලැබේ.

තනි තනිව තක්සේරු කෙරෙන දීමනා

අනාගත අලාභයක් සම්බන්ධ විෂය මූලික සාක්ෂියක් ඇති නම්, බැංකුව මගින් තනි තනි වශයෙන් සැළකිය යුතු ණය හෝ අත්තිකාරම් තනි පුද්ගල පදනමක් මත යෝග්‍ය දීමනා තීරණය කෙරේ. බැංකුව මගින් වර්තමානය වන විට තනි තනි වශයෙන් සැළකිය යුතු සීමාව රුපියල් මිලියන 25 වශයෙන් නියම කර ඇති අතර, එම සීමාවට ඉහළ සමස්ත නිරාවරණයක් සහිත සෑම ගනුදෙනුකරුවකුම දරන ලද අලාභවල විෂය මූලික සාක්ෂි වෙනුවෙන් තනි තනිව ඇගයීමට ලක් කෙරේ. දීමනා ප්‍රමාණයන් තීරණය කිරීමේදී සළකා බැලෙන අයිතම ප්‍රතිපාර්ශ්වයෙහි ව්‍යාපාර සැලසුමෙහි තිරසාරබව, මූල්‍යමය අසීරුතාවයකදී එහි කාර්යසාධනය වර්ධනය කරගැනීමේ හැකියාව, නුබුන්භාවය උද්ගත වුවහොත් ප්‍රක්ෂේපිත ලැබීම් සහ අපේක්ෂිත ගෙවීම්, වෙනත් මූල්‍යමය සහාය ලබාගතහැකිවීම, ඇපවල උපලබ්ධි කරගත හැකි වටිනාකම සහ අපේක්ෂිත මුදල් ප්‍රවාහයන්හි කාලය යන අංග වලින් සමන්විත වේ.

සාමූහිකව තක්සේරු කෙරෙන දීමනා

තනි තනි වශයෙන් තක්සේරු කරන ලද සහ හානිකරණය ලක්වී නොමැති බව සොයාගත් ගනුදෙනුකරුවන් සමාන අවදානම් ලක්ෂණ සහිත ණය කාණ්ඩ තුළ තනි පුද්ගල සීමාවට පහළ ණය සමඟ එකට සාමූහිකව තක්සේරු කරනු ලැබේ. සීමාවට ඉහළ වුවත් තත්ත්වය විෂයමූලික සාක්ෂි යටතේ නොමැති ගනුදෙනුකාර නිරාවරණ සාමූහික හානිකරණ තක්සේරුකරණය යටතේ සලකනු ලැබේ. ප්‍රමිතියේ අවශ්‍යතාවයට අනුව, පොදු ප්‍රවේශය යටතේ අපේක්ෂිත ණය අලාභ තීරණය කිරීමේදී කළමනාකරණය විසින් තක්සේරු කිහිපයක් සාධක කරගෙන ඇත.

අදියර 1: මාස 12 අපේක්ෂිත ණය අලාභ

මුල්වරට හඳුනාගැනීමේ සිට ණය අවදානමෙහි සැළකිය යුතු වැඩිවීමක් නොමැති වූ සහ ආරම්භයේ පටන් ණය පිරිහීමක් නොමැති නිරාවරණ සඳහා, ඊළඟ මාස 12 තුළ ඇති විය හැකි පැහැර හැරීමේ සිදුවීමේ සම්භාවිතාව ආශ්‍රිත ජීවකාල අපේක්ෂිත ණය අලාභ කොටස හඳුනා ගනී. බැංකුව සැළකිය යුතු ණය පිරිහීමක් නොමැති ගනුදෙනුකරුවන් වෙතින් මාස 12 අපේක්ෂිත බැරකම් අලාභය තීරණය කරයි. (හිඟ කාලය දවස් 30ට අඩු හෝ සමාන)

අදියර 2: ජීවකාල අපේක්ෂිත ණය අලාභ – ණය හානිකරණය නොකළ

මුල්වරට හඳුනාගැනීමේ සිට ණය අවදානමෙහි සැළකිය යුතු වැඩිවීමක් සහිත නමුත් ණය හානිකරණයක් නොමැති නිරාවරණ සඳහා, ජීව කාල අපේක්ෂිත ණය අලාභයක් (උදා: මූල්‍ය වත්කමෙහි ඉතිරි වූ ජීව කාලය පාදක කර ගනිමින්) හඳුනාගනී. බැංකුවේ ප්‍රතිපත්තිවලට අනුකූලව, අදියර 3 යටතේ වර්ගීකරණය කරන ලද ණය පහසුකම් හැරුනු විට, සැළකිය යුතු පිරිහීමක් නියමිත දිනයෙන් පසු දින 30 ක් ගතවූ යන නිශ්ප්‍රභාත්මක උපකල්පනය සමඟ මිනුම්ගත කෙරේ. බැංකුව විසින් අදියර 2 යටතේ ඉහළ අදියරක සිට පහළ අදියරක් වෙත යාවත්කළ ණය පහසුකම්/නිරාවරණ හැරුනු විට වාර දෙකක් දක්වා ප්‍රතිව්‍යුහගත කරන ලද සියළුම ප්‍රතිව්‍යුහගත ණය සලකනු ලැබ ඇත. මෙය කරනු ලබන්නේ 2021 අංක 13 දරන බැංකු පනත් නියෝගය – බලපත්‍රලාභී බැංකුවල ණය පහසුකම් වර්ගීකරණය, හඳුනා ගැනීම සහ මැනීම අනුවයි.

අදියර 3: ජීවකාල අපේක්ෂිත ණය අලාභ – ණය හානිකරණය කළ

ණය හානිකරණයට ලක් වූ කිසියම් වත්කමක ඇස්තමේන්තු ගත අනාගත මුදල් ප්‍රවාහයන් වෙත අහිතකර බලපෑමක් ඇති කරන ආකාරයේ සිදුවීම් එකක් හෝ වැඩි ගණනක් පවතින විට නිරාවරණ ණය හානිකරණයට ලක් වූ වශයෙන් තක්සේරු කෙරේ. ණය හානිකරණයට ලක් වූ නිරාවරණ සඳහා, ජීව කාල අපේක්ෂිත බැරකම් අලාභයන් හඳුනා ගන්නා අතර දළ ධාරණ වටිනාකමට නොව ක්‍රමක්ෂය පිරිවැය අනුව සවිල පොලී අනුපාතිකය (දළ ප්‍රතිපාදන වලින් ශුද්ධව) යොදා ගනිමින් පොළී ආදායම ගණනය කෙරේ. බැංකුව ගනුදෙනුකරුවකුගේ ගිවිසුම්ගත ගෙවීම් SLFRS 9 ප්‍රමිතියෙහි දක්වා ඇති පරිදි නියමිත දිනට වඩා දින 90කට වැඩි සංඛ්‍යාවක් කල් ගතව ඇති අවස්ථාවක, මහ බැංකුවේ වර්ගීකරණය පරිදි සියලුම අක්‍රීය ණය වාර දෙකකට වඩා ප්‍රතිව්‍යුහගත කරන සියළුම ප්‍රතිව්‍යුහගත කළ ණය සහ ඉහළ අදියරක සිට පහළ අදියරක් වෙත යාවත්කළ ණය පහසුකම්/නිරාවරණ හැරුනු විට, සියලුම ප්‍රතිඋපලේඛනගත ණය මේ යටතේ වරගීකරණය කරයි.

දෙසැම්බර් 31 දිනට	2025 රු. '000	2024 රු. '000
තනි තනිව සැළකිය යුතු හානිකරණය වූ ණය		
ක්‍රමක්ෂය පිරිවැය	264,851,653	253,897,913
හානිකරණය සඳහා දීමනා	(127,878,059)	(112,723,895)
දෙසැම්බර් 31 දිනට ධාරණ අගය	136,973,594	141,174,018
සාමූහිකව තක්සේරු කළ ණය		
ක්‍රමක්ෂය පිරිවැය	1,621,483,974	1,417,281,927
හානිකරණය සඳහා දීමනා	(27,786,354)	(36,490,925)
දෙසැම්බර් 31 දිනට ධාරණ අගය	1,593,697,620	1,380,791,002

පැහැර හැරීමේ සම්භාවිතාවය (PD) ඇස්තමේන්තු ක්‍රියාවලිය

ගෙවීමේ පැහැර හැරීමේ සම්භාවිතාව යනු බැඳීමෙන් මාස 12ක කාලයක් (එනම් මාස 12ක පැහැර හැරීමේ සම්භාවිතාව) හෝ පවත්නා ඉතිරිකාලය පුරා (එනම් ජීවකාල පැහැර හැරීමේ අවදානම) ණයකරුවෙක් ඔහුගේ මූල්‍ය බැඳීම් පැහැර හැරීමේ සම්භාවිතාවයයි. පැහැර හැරීමේ සම්භාවිතාව පිළිබඳ ඇස්තමේන්තු යනු නිශ්චිත දිනයක ඇස්තමේන්තු වන අතර නියමිත දින පසුවූ දින (එනම් නියමිත දිනයේ සිට පසු වූ දින ගණන) යනු පැහැර හැරීමේ සම්භාවිතාව පිළිබඳ ඇස්තමේන්තු ක්‍රියාවලියේ ප්‍රධාන නිර්ණායකය වේ. මෙම ක්‍රියාවලිය තුළ, වසර පහකට අදාළ වෙතිහාසික තොරතුරු නිෂ්පාදනයේ ස්වභාවය මත පදනම් වෙමින් භාවිතා කර ඇත. ඒ අනුව, නිරාවරණ පැහැර හැරීමේ සම්භාවිතාව මත පදනම් වී කාණ්ඩ පහක් අතර පහත පරිදි වර්ගීකරණය කෙරේ:

- නියමිත දින පසුවී දින ශූන්‍ය
- නියමිත දින පසුවී දින 1-30
- නියමිත දින පසුවී දින 31-60
- නියමිත දින පසුවී දින 61-90
- නියමිත දින පසුවී දින 90 ට වැඩි

පැහැර හැරීමේදී නිරාවරණය (EAD)

පැහැර හැරීමේදී නිරාවරණය යන්නෙන් පැහැර හැරීමේ අවස්ථාවක දී අපේක්ෂිත නිරාවරණය නියෝජනය වේ. මෙහිදී බැංකුව ණය පරිවර්තන සාධක භාවිත කරන අතර ඒ මගින්, ගනුදෙනුකරුට සිය නිරාවරණය වැඩි කිරීමට හැකියාව ඇති චක්‍රීය ණය පහසුකම්වල පැහැර හැරීමේදී නිරාවරණය ගණනය කිරීමට පැහැරහැරි අවස්ථාවේදී පැහැරහැරි පහසුකමේ වෙතිහාසික භාවිතය පැහැදිලි කරයි. චක්‍රීය නොවන ණය පහසුකම් සඳහා, දැනටමත් භාවිතාකළ ප්‍රමාණය සහ යම් බෙදා නොදුන් ප්‍රමාණය සහ ඒ මත උපචිත පොළී ගෙවීම පැහැර හැරීමේදී නිරාවරණය ලෙස සලකනු ලැබේ.

පැහැර හැරීමෙන් වන අලාභය (LGD)

ගෙවීම පැහැර හැරීමෙන් අලාභය යනු නිරාවරණය මත සිදුවිය හැකි අලාභයෙහි විශාලනය වන අතර, එය නිරාවරණයේ ප්‍රතිශතයක් වශයෙන් ප්‍රකාශ කෙරේ. මෙම ගෙවීම පැහැර හැරීමෙන් අලාභ අනුපාත මගින් රඳවාගත් කවර හෝ ඇපයක් මගින් අයකර ගැනීමට හෝ උපලබ්ධි කර ගැනීමට අපේක්ෂිත මුදලට සාපේක්ෂව අපේක්ෂිත ගෙවීම පැහැර හැරීමේදී නිරාවරණය සැළකිල්ලට ගනු ලබයි. අනාගත මුදල් ප්‍රවාහ පිළිබඳ ඇස්තමේන්තුවලට අදාළ වන ප්‍රධාන ගති ලක්ෂණ මත පදනම්ව, බැංකුව ස්වකීය පාරිභෝගික ණය නිෂ්පාදන වඩාත් කුඩා සමජාතීය කළඹ වශයෙන් කාණ්ඩ ගත කරයි. යොදාගත් දත්ත වෙතිහාසිකව එක්රැස් කරගත් අලාභ දත්ත මත පදනම් වන අතර, එයට වඩාත් පුළුල් පරාසයක පැතිරුණු ගනුදෙනු ගති ලක්ෂණ (උදා: නිෂ්පාදන වර්ගය, වඩාත් පුළුල් පරාසයක ඇප වර්ග) මෙන්ම ණයගැතියන්ගේ ගතිලක්ෂණ සමූහයක් හා සම්බන්ධ වේ.

එක් එක් වසර සඳහා, සිය ජීව කාලය තුළ අවම වශයෙන් එක් වරක් හෝ දින 90න් ඉහළ සීමාව ඉක්මවා ගිය අවසන් කරන ලද ගිවිසුම් සළකා බලයි. ණය මුදලෙහි සම්පූර්ණ පියවීම දක්වා ගෙවීම පැහැර හැරීමේ අවස්ථාවට පසු සියළු මුදල් ප්‍රවාහ ගෙවීම්, පැහැර හැරීමේ අලාභය මගින් සාධනය කෙරේ. මුළුමනින්ම පාහේ අවසන් කරන ලද ගිවිසුම්ද පැහැර හැරීමෙන් අලාභය ගණනය කිරීම තුළ සලකනු ලබයි. මුළුමනින්ම පාහේ අවසන් කරන ලද ණය යනු දිගු කලක් තිස්සේ හිඟව පවතින සක්‍රීය ණය වේ. මුදල් ප්‍රවාහ අවසන්ව ඇති බවට බැංකුව විසින් තීරණය කරනු ලබන අවස්ථාවේදී ගිවිසුමක් මුළුමනින්ම පාහේ අවසන් කරන ලද ගිවිසුමක් බවට තීරණය කෙරේ.

අපේක්ෂිත ණය අලාභ සඳහා මුළු හානිකරණ පිළිබඳ විශ්ලේෂණය

දෙසැම්බර් 31 දිනට 2025	සටහන්	අදියර 1 රු. '000	අදියර 2 රු. '000	අදියර 3 රු. '000	එකතුව රු. '000
මුදල් සහ මුදල් සමාන දෑ	17.4	2,530.78	30,851.44	–	33,382.22
බැංකුවල පවතින ශේෂ	19.2	55,334.00	9,917.00	–	65,251.00
බැංකුවලට ණය සහ ලැබිය යුතු දෑ	22.2	12,450.52	–	–	12,450.52
වෙනත් ගනුදෙනුකරුවන් වෙත ණය සහ ලැබිය යුතු දෑ	23.2	8,756,123.00	4,657,650.00	143,727,923.24	157,141,696.24
ක්‍රමක්ෂය පිරිවැයට ණය උපකරණ	24.2	–	3,289,172.00	–	3,289,172.00
අනාකූත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගයට ණය උපකරණ	26.2	1,307.00	–	296,009.00	297,316.00
අපේක්ෂිත ණය අලාභය සඳහා මුළු හානිකරණය		8,827,745.30	7,987,590.44	144,023,932.24	160,839,267.98

දෙසැම්බර් 31 දිනට 2024	සටහන්	අදියර 1 රු. '000	අදියර 2 රු. '000	අදියර 3 රු. '000	එකතුව රු. '000
මුදල් සහ මුදල් සමාන දෑ	17.4	460.00	14,796.00	–	15,256.00
බැංකුවල පවතින ශේෂ	19.2	40,954.00	–	–	40,954.00
බැංකුවලට ණය සහ ලැබිය යුතු දෑ	22.2	12,581.00	–	–	12,581.00
වෙනත් ගනුදෙනුකරුවන් වෙත ණය සහ ලැබිය යුතු දෑ	23.2	15,406,686.00	5,119,482.00	128,688,652.47	149,214,820.47
ක්‍රමක්ෂය පිරිවැයට ණය උපකරණ	24.2	–	3,547,398.00	–	3,547,398.00
අනාකූත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගයට ණය උපකරණ	26.2	8,068.00	–	296,009.00	304,077.00
අපේක්ෂිත ණය අලාභය සඳහා මුළු හානිකරණය		15,468,749.00	8,681,676.00	128,984,661.47	153,135,086.47

බහුවිධ ආර්ථික තත්ත්වයන් යටතේ අපේක්ෂිත ණය අලාභ ආකෘතියේ තොරතුරු පිළිබඳ ඉදිරි දැක්ම

බැංකුව විසි අපේක්ෂිත ණය අලාභවල මිණුම්කරණය හොඳම තත්ත්වය, පදනම් තත්ත්වය සහ නරක තත්ත්වය යන ප්‍රධාන ක්‍රියාදාමයන් යටතේ ඉදිරිය දකින තොරතුරු ඇතුළත් වේ.

ක්‍රියාදාමයන් සඳහා සම්භාවිතාව බර තැබීම

දෙසැම්බර් 31 දිනට	2025 %	2024 %
හොඳම තත්ත්වය	15	20
පදනම් තත්ත්වය	15	20
නරක තත්ත්වය	70	60

පදනම් තත්ත්වය යන්නෙන් බොහෝ විට ප්‍රතිඵලය සඳහන් වන අතර, බැංකුව විසින් එහි මෙහෙයුම් අරමුණ සඳහා භාවිතා කරන තොරතුරු සමඟ සම්බන්ධ වේ. එහි හානිකරණ තක්සේරුව තුළ ප්‍රමාණාත්මක සහ ගුණාත්මක ණය අවදානම්වල ප්‍රධාන ධාවකයින් පහත පරිදි වේ. ප්‍රමාණාත්මක ආර්ථික සාධක මහ බැංකුව විසින් ප්‍රකාශිත ආර්ථික දත්ත සහ පුරෝකථන සහ ආසියානු සංවර්ධන බැංකුව සහ ලෝක බැංකුව යනාදී වෙනත් විශ්වාසී මූලාශ්‍ර මත පදනම් වේ.

ණය අවදානමේ ප්‍රමාණාත්මක ධාවකයන්	ණය අවදානමේ ගුණාත්මක ධාවකයින්
දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය	ක්ෂේත්‍රයේ ව්‍යාපාරවල තත්ත්වය
උද්ධමනය	නියාමන බලපෑම
පොළී අනුපාතය (AWPLR)	රජයේ ප්‍රතිපත්ති
විනිමය අනුපාතිකය	කාලගුණ අවදානම
විරැකියා අනුපාතය	

වෙනත් ගනුදෙනුකරුවන්ට ණය හා අත්තිකාරම් මත හානිකරණ වෙන් කිරීමේ සංවේදිතාව

බැංකුව විවිධ උපකල්පන මත පදනම් වී 2025 දෙසැම්බර් 31 දිනට වෙනත් ගනුදෙනුකරුවන්ට අපේක්ෂිත ණය අලාභ මත එහි වෙන් කිරීම තක්සේරු කර ඇත. එකී උපකල්පනවල වෙනස්වීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි වාර්තාකළ හානිකරණ වෙන්කිරීම තුළ වෙනස්වීම්වලට හේතු විය හැකිය.

පැහැර හැරීමේ අවදානම්, පැහැර හැරීමෙන් අලාභ සහ ඉදිරිය දකින සාර්ව ආර්ථික තොරතුරුවල වියහැකි වෙනස්වීම්වලට 2025 දෙසැම්බර් 31 දිනට වෙනත් ගනුදෙනුකරුවන් වෙත අපේක්ෂිත ණය අලාභ මත වෙන් කිරීමේ සංවේදිතාව පහත වගුවෙන් පෙන්නුම් කෙරේ.

	මූල්‍ය තත්ත්ව ප්‍රකාශය මත සංවේදිතා බලපෑම [හානිකරණ වෙන්කිරීමේ වැඩිවීම/(අඩුවීම)]				ආදායමේ ප්‍රකාශය මත සංවේදිතා බලපෑම
	අදියර 1 රු. '000	අදියර 2 රු. '000	අදියර 3 රු. '000	එකතුව රු. '000	
පැහැර හැරීමේ අවදානම (PD)					
සියලු වයස් කාණ්ඩ අතර PD 1% වැඩිවීම	3,018,366	142,218	–	3,160,584	(3,160,584)
සියලු වයස් කාණ්ඩ අතර PD 1% අඩුවීම	(2,248,465)	(142,218)	–	(2,390,683)	2,390,683
පැහැර හැරීමෙන් අලාභය					
LGD 5% වැඩිවීම	944,128	706,215	825,821	2,476,164	(2,476,164)
LGD 5% අඩුවීම	(944,128)	(706,215)	(825,821)	(2,476,164)	2,476,164
සම්භාවිතාව බරතබනලද ඉදිරිය දකින සාර්ව ආර්ථික දර්ශක					
නරකම තත්ත්වය 10% වැඩිවීමල පදනම් තත්ත්වය 5% අඩුවීම සහ හොඳම තත්ත්වය 5% අඩුවීම	188,449	62,700	–	251,150	(251,150)
නරකම තත්ත්වය 10% අඩුවීමල පදනම් තත්ත්වය 5% වැඩිවීම සහ හොඳම තත්තවය 5% වැඩිවීම	(188,449)	(62,700)	–	(251,150)	251,150

ණය හානිකරණය වූ (අදියර 3) ණය සහ අත්තිකාරම්වල වෙනස්වීම් සැසඳීම

	2025 රු. '000
ජනවාරි1 දිනට වෙනත් ගනුදෙනුකරුවන්ට අදියර 3 ණය හා අත්තිකාරම්	307,001,261
වසර තුළ අලුතින් හාරකරණය වූ ලෙස වර්ගීකරණය කළ ණය හා අත්තිකාරම්	8,757,595
වසර තුළ දැනට හානිකරණය වූ ණය හා අත්තිකාරම්වල ශුද්ධ වෙනස	(3,377,883)
වසර තුළ යාවත් කිරීම් ඇතුළුව ශුද්ධ ගෙවීම, කපාහැරීම සහ අයකිරීම් සහ වෙනත් වෙනස්වීම්	(69,726,675)
දෙසැම්බර් 31 දිනට ගනුදෙනුකරුවන්ට හානිකරණය වූ ණය හා අත්තිකාරම්	242,654,298

හානිකරණ වෙනස්වීම් වෙන්කිරීම (ECL)

වෙනත් ගනුදෙනුකරුවන් වෙත ණය හා අත්තිකාරම්වල හානිකරණයේ ආරම්භක අවස්ථාවේ සිට සහ අවසාන ශේෂය දක්වා සැසඳීම පහත වගුවෙන් පෙන්නුම් කෙරේ.

	මාස 12 අපේක්ෂිත ණය අලාභ (අදියර 1) රු. '000	ජීවකාල අපේක්ෂිත ණය අලාභ – ණය හානිකරණය නොවූ (අදියර 2) රු. '000	ජීවකාල අපේක්ෂිත ණය අලාභ – ණය හානිකරණය වූ (අදියර 3) රු. '000	එකතුව රු. '000
2025 ජනවාරි 1 දිනට හානිකරණය සඳහා වෙන් කිරීම	15,406,685	5,119,483	128,688,652	149,214,820
අදියර 1 වෙත මාරු කිරීම	274,730	(182,920)	(91,810)	–
අදියර 2 වෙත මාරු කිරීම	(161,067)	503,137	(342,070)	–
අදියර 3 වෙත මාරු කිරීම	(104,356)	(97,639)	201,995	–
හානිකරණයේ ශුද්ධ නැවත මැනීම	(589,244)	353,115	14,178,870	13,942,741
උත්පාදිත හෝ මිලදීගත් නව වත්කම්	5,377,368	661,870	4,165,011	10,204,249
හඳුනා නොගත් හෝ නැවත ගෙවූ මූල්‍ය වත්කම් (කපාහැරීම් නොමැතිව)	(2,800,295)	(1,545,784)	(4,974,600)	(9,320,679)
විදේශ විනිමය ගැලපීම්	–	–	270,982	270,982
2025 දෙසැම්බර් 31 දිනට හානිකරණය සඳහා වෙන් කිරීම	8,756,122	4,811,262	142,097,030	155,664,413

සුරැකුම් සහ වෙනත් ණය වැඩිදියුණු කිරීම

ණය අවදානමට ශුද්ධ නිරාවරණය

අවශ්‍ය වන සුරැකුම සහ ප්‍රමාණය ඇපකරුගේ ණය අවදානම් පිළිබඳ තක්සේරුව මත රඳා පවතී. එක් එක් සුරැකුම ප්‍රතිග්‍රහණය සහ තක්සේරුව ආවරණය කරමින් බැංකුවේ ණය ප්‍රතිපත්ති මාර්ගෝපදේශ සහ ණය ක්‍රියාපටිපාටි අත්පොතේ මාර්ගෝපදේශ ස්ථාපනය කෙරේ. සුරැකුම තක්සේරුකරණය සඳහා දැඩි ප්‍රවේශයක් අපි අනුගමනය කරන අතර, තක්සේරුකරණ මගින් වෙළෙඳපොල තත්ත්වයන් පිළිබිඹු වන බවට තහවුරු කිරීම සඳහා ඒවා නිරන්තරයෙන් සමාලෝචනය සහ යාවත්කාලීන කෙරේ. බැංකුවේ සාපේක්ෂව විවිධාංගීකරණය කළ සුරැකුම් කළඹ මගින් නිශ්චිත වත්කම් පන්තියක් තුළ අනාගත මිල පහත වැටීම්වල බලපෑම අවම කරයි.

ලබා ගනු ලබන ප්‍රධාන සුරැකුම් වර්ග පහත පරිදි වේ.

- වාණිජමය ණය ලබාදීම් සඳහා – නිශ්චල දේපළ, ජංගම, වෙළෙඳ ලැබිය යුතු දෑ, ණය සුරැකුම්, තොග, මුදල් තැන්පතු ආයතනික සහ පුද්ගලික ඇප මත අය කිරීම්
- පාරිභෝගික ණය ලබාදීම් සඳහා – නේවාසික දේපළ, මෝටර් රථ, රත්‍රන්, මුදල් තැන්පතු සහ පුද්ගල ඇප මත උකස්
- රජය සහ රජයට අයත් ව්‍යවසාය සඳහා – රජය/භාණ්ඩාගාර ඇප, භාරගැනීමේ ලිපි, පහසුකම පිළිබඳ ලිපි සහ මහ භාණ්ඩාගාර විසින් නිකුත්කළ අයවැය වෙන්කිරීම පිළිබඳ සහතික කිරීම

පහත දැක්වෙන වගුව මගින් මූල්‍ය වත්කම් පංතිය අනුව ණය අවදානම කෙරෙහි උපරිම නිරාවරණය හා ශුද්ධ නිරාවරණය (රඳවා ගත් කවර හෝ ඇප වල සාධාරණ අගයෙන් ශුද්ධව) පෙන්නුම් කෙරේ.

දෙසැම්බර් 31 දිනට 2025	ණය අවදානම කෙරෙහි උපරිම නිරාවරණ රු. '000	ශුද්ධ නිරාවරණය රු. '000
මුදල් හා මුදල් සමාන දෑ	109,138,690	49,538,395
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	4,524,930	4,524,930
ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට මූල්‍ය උපකරණ	307,296,907	307,296,907
බැංකුවලට ණය සහ ලැබිය යුතු දෑ	83,506,019	83,506,019
අනෙකුත් ගනුදෙනුකරුවන්ට ණය සහ ලැබිය යුතු දෑ	1,730,671,216	447,843,724
අනෙකුත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගය අනුව ස්කන්ධ උපකරණ	3,431,075	3,431,075
අනෙකුත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගය අනුව ණය උපකරණ	7,081,782	7,081,782
ක්‍රමක්ෂය පිරිවැයට මනින ලද ණය උපකරණ	1,230,298,162	1,230,298,162
එකතුව	3,475,948,781	2,133,520,994

2024 දෙසැම්බර් 31 දිනට	ණය අවදානම කෙරෙහි උපරිම නිරාවරණ රු. '000	ශුද්ධ නිරාවරණය රු. '000
මුදල් හා මුදල් සමාන දෑ	71,694,016	10,701,718
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	5,842,194	5,842,194
ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට මූල්‍ය උපකරණ	329,810,350	329,810,350
බැංකුවලට ණය සහ ලැබිය යුතු දෑ	31,994,539	31,994,539
අනෙකුත් ගනුදෙනුකරුවන්ට ණය සහ ලැබිය යුතු දෑ	1,521,965,020	431,316,258
අනෙකුත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගය අනුව ස්කන්ධ උපකරණ	2,313,187	2,313,187
අනෙකුත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගය අනුව ණය උපකරණ	7,110,671	7,110,671
ක්‍රමක්ෂය පිරිවැයට මනින ලද ණය උපකරණ	1,123,490,537	1,123,490,537
එකතුව	3,094,220,514	1,942,579,454

ණය අවදානම් සංකේන්ද්‍රණය

සංකේන්ද්‍රණ අවදානම කිසියම් නිශ්චිත අංශයක්, නිෂ්පාදනයක්, ප්‍රදේශයක්, ගනුදෙනුකරුවකු/සමූහයක් වෙත අධික ලෙස ණය ලබාදීමෙන් ඉස්මතු වේ. බැංකුවේ අවදානම් අභිරුචිය මගින් වී වී අංශ සහ නිෂ්පාදන සඳහා නිරාවරණය විය හැකි සීමාවන් පැහැදිලිව දක්වන අතර, මෙහෙයුම් පරිසරය මගින් ඇති කරන අවදානම් සහ අවස්ථා ඉස්මතු කිරීමේ සන්දර්භය තුළ එකී සීමාවන් සමාලෝචනය කර සංශෝධනය කෙරේ. තනි ණයකරු සීමාවට අනුකූල වීමට අමතරව, ණය සංකේන්ද්‍රණය නියාමනය කොට පාලනය කිරීම සඳහා බැංකුව Herfindahl-Hirschman (HHI) දර්ශකයද යොදාගනී. මෙකී සීමාවන් අබණ්ඩ පදනමක් මත අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව, අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියාමනය කරනු ලබයි. රජයට අයත් ව්‍යවසාය (SOE) නිරාවරණය තුළ සංකේන්ද්‍රණ අවදානම කළමනාකරණය කිරීමේ අරමුණ ඇතිව රජයට අයත් ව්‍යවසාය සඳහා පුද්ගල සහ අංශ අනුව උපරිම ණය සීමා බැංකුව පනවා ඇත.

ක්ෂේත්‍රය අනුව මූල්‍ය වත්කම් සඳහා අවදානම් සංකේන්ද්‍රණය පිළිබඳ විශ්ලේෂණයක් (රුපියල්වලින් '000) පහත පහත දැක්වේ.

දෙසැම්බර් 31 දිනට 2025	රජය	වාණිජ	මූල්‍ය	කෘෂිකර්ම
මූල්‍ය වත්කම්				
මුදල් හා මුදල් සමාන දෑ	–	–	109,138,690	–
ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ ශේෂ	38,417,296	–	–	–
බැංකුවවල පවතින ශේෂ	–	–	85,232,164	–
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	–	–	4,524,930	–
ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට මූල්‍ය උපකරණ	306,939,838	137,789	–	8,775
බැංකුවලට ණය සහ ලැබිය යුතු දෑ	83,518,470	–	–	–
වෙනත් ගනුදෙනුකරුවන්ට ණය සහ ලැබිය යුතු දෑ	333,073,981	136,895,469	149,762,319	415,805,526
ක්‍රමක්ෂය පිරිවැයට මනින ලද ණය උපකරණ	1,233,773,810	–	–	–
අනෙකුත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගය අනුව ස්කන්ධ උපකරණ	–	1,181,828	1,132,276	–
අනෙකුත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගය අනුව ණය උපකරණ	296,009	–	545,852	–
එකතුව	1,996,019,404	138,215,086	350,336,231	415,814,301

2024 දෙසැම්බර් 31 දිනට	රජය	වාණිජ	මූල්‍ය	කෘෂිකර්ම
මූල්‍ය වත්කම්				
මුදල් හා මුදල් සමාන දෑ	–	–	71,709,272	–
ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ ශේෂ	33,798,107	–	–	–
බැංකුවල පවතින ශේෂ	–	–	59,872,761	–
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	–	–	5,842,194	–
ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට මූල්‍ය උපකරණ	329,502,756	87,274	–	6,473
බැංකුවලට ණය සහ ලැබිය යුතු දෑ	32,007,120	–	–	–
වෙනත් ගනුදෙනුකරුවන්ට ණය සහ ලැබිය යුතු දෑ	457,839,117	191,868,143	25,194,139	17,825,803
ක්‍රමක්ෂය පිරිවැයට මනින ලද ණය උපකරණ	1,127,037,935	–	–	–
අනෙකුත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගය අනුව ස්කන්ධ උපකරණ	–	748,186	733,736	–
අනෙකුත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගය අනුව ණය උපකරණ	2,959,325	296,009	3,306,885	–
එකතුව	1,983,144,360	192,999,612	166,658,987	17,832,276

ද්‍රවශීලතා අවදානම

ද්‍රවශීලතා අවදානම යන්නෙන් අදහස් වන්නේ බැංකුවේ ගිවිසුම්ගත මූල්‍ය බැඳීම් ගෙවිය යුතු වන විට සහ අවස්ථාවේදී එය ඉටු කිරීමට අපොහොසත් වීම තුළ ඇතිවන ඉපැයීම් ආශ්‍රිත අලාභ/ප්‍රාග්ධන අලාභ ඇතිවීමේ ඉඩකඩයි. වත්කම් හා වගකීම් අතර නොගැලපීම්වලින් ඇතිවන ද්‍රවශීලතාව සහ නුඹුන්වත් ගැටළුවලට බැංකුවලට මුහුණ දීමට සිදුවේ. මේ නිසා ද්‍රවශීලතාව අවදානම් පිළිබඳ ඵලදායී කළමනාකරණය බැංකුවේ සමස්ත අවදානම් කළමනාකරණ රාමුවේ තීරණාත්මක අංගයකි.

බැංකුව සතු ගිවිසුම්ගත බැඳීම් නිසි කලට ඉටු කිරීම සඳහා අවශ්‍ය අරමුදල් තක්සේරු කිරීම/ප්‍රමාණනය කිරීම සහ ලබාගැනීමේ හැකියාව සහතික කිරීම බැංකුවේ ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ රාමුව මගින් අරමුණු කෙරේ. බැංකුවේ ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ රාමුව කාලීන ආකාරයෙන් බැංකුවේ ගිවිසුම්ගත බැඳීම් ඉටු කිරීම සඳහා අරමුදල් තක්සේරු කිරීම/ප්‍රමාණනය කිරීම සහ ලබාගැනීමේ හැකියාව සහතික කිරීම පිණිස නිර්මාණය කෙරේ. මෙය සාමාන්‍ය මෙන්ම පීඩන තත්ත්වයන් යටතේ සාක්ෂාත් කර ගනී. ද්‍රවශීලතා අවදානම කළමනාකරණය සඳහා බැංකුවේ භාණ්ඩාගාර දෙපාර්තමේන්තුව මූලිකවම වගකීමට බැඳී ඇති අතර, අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් ස්ථාපිත සීමා, නියාමන අනුපාත සහ වෙනත් අදාළ විශ්ලේෂණ සමඟ අනුකූලතාවය දක්වන්නේද සහතික කරයි. ඊට අමතරව. අභ්‍යන්තර ඉලක්කවලට මෙන්ම නියාමන අවශ්‍යතාවන්ට අනුකූලතාව සහතික කිරීම සඳහා වත්කම් හා වගකීම් කම්ටුවද බැංකුවේ ද්‍රවශීලතා තත්ත්වය අබණ්ඩව නියාමනය කරමින් එහි කළමනාකරණය පාලනය කරයි.

කාර්මික	සංචාරක	නිවාස හා දේපල සංවර්ධනය	පරිභෝජනය	සේවා	වෙනත්	අපේක්ෂිත ණය අලාභ	එකතුව
–	–	–	–	–	–	(33,382)	109,105,308
–	–	–	–	–	–	–	38,417,296
–	–	–	–	–	–	(65,251)	85,166,913
–	–	–	–	–	–	–	4,524,930
17,500	–	114,779	78,226	–	–	–	307,296,907
–	–	–	–	–	–	(12,451)	83,506,019
137,330,186	–	220,595,424	221,769,481	–	272,580,526	(157,141,696)	1,730,671,216
–	–	–	–	–	–	(3,475,648)	1,230,298,162
–	–	–	–	1,116,970	–	–	3,431,075
–	–	–	–	2,933,180	3,306,741	–	7,081,782
137,347,686	–	220,710,203	221,847,708	4,050,150	275,887,267	(160,728,428)	3,599,499,607

කාර්මික	සංචාරක	නිවාස හා දේපල සංවර්ධනය	පරිභෝජනය	සේවා	වෙනත්	අපේක්ෂිත ණය අලාභ	එකතුව
–	–	–	–	–	–	(15,256)	71,694,016
–	–	–	–	–	–	–	33,798,107
–	–	–	–	–	–	(40,954)	59,831,807
–	–	–	–	–	–	–	5,842,194
147,547	–	–	15,710	50,590	–	–	329,810,350
–	–	–	–	–	–	(12,581)	31,994,539
57,387,031	26,312,350	379,692,889	417,944,273	30,589,563	66,526,534	(149,214,820)	1,521,965,020
–	–	–	–	–	–	(3,547,398)	1,123,490,537
–	–	–	–	831,265	–	–	2,313,187
–	–	–	–	548,452	–	–	7,110,671
57,534,578	26,312,350	379,692,889	417,959,983	31,471,418	66,526,534	(152,831,009)	3,187,850,428

බැංකුව, නියාමන මාර්ගෝපදේශ සහ ජාත්‍යන්තර මනා පරිචයන්ට අනුකූලව ද්‍රවශීලතා අවදානම කළමනාකරණය කරන අතර, ප්‍රවාහ සහ ව්‍යාපාර වස්තු යන ද්විත්ව ප්‍රවේශ හරහා ද්‍රවශීලතාව මිනුම්ගත කරයි. ප්‍රවාහ ක්‍රමවේදය මගින් වත්කම් හා වගකීම්වල කල්පිරීම මත පදනම් වෙමින් විවිධ කාල පරාශයන් හී අභ්‍යන්තර මුදල් ප්‍රවාහයන් හා බාහිර ගලා ඒම් සහ ගලා යෑම් අතර පවතින නොගැලපීම් විශ්ලේෂණය කිරීම මගින් ද්‍රවශීලතාව මිනුම්ගත කරනු ලබයි. ව්‍යාපාර වස්තු ක්‍රමවේදය මගින් තැන්පතුවලට ණය අනුපාතය, වගකීම් අනුපාතය (භාවිතයට නොගත් අයිරාවන්/භාවිතයට නොගත් අන්තර් බැංකු ව්‍යාපාර), ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය, ද්‍රවශීලතා ආවරණ අනුපාතය සහ සමුච්චිත නොගැලපීම් ආදි ප්‍රධාන අනුපාත ඇසුරින් ද්‍රවශීලතාව මිනුම්ගත කෙරේ.මෙවැනි ප්‍රවේශයන් ශක්තිමත් ද්‍රවශීලතා තත්ත්වයක් පවත්වා ගැනීමට බැංකුවට සහයවන අතර, අහිතකර තත්ත්වයන් යටතේ වුවද සිය බැඳීම් ඉටු කිරීමට බැංකුවට හැකි බව සහතික කරයි.

2025 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම්වල (රු. 000) කල්පිරීම් පැතිකඩ

	මාස 3 දක්වා රු. '000	මාස 3-12 රු. '000	අවුරුදු 1-3 රු. '000
වත්කම්			
මුදල් හා මුදල් සමාන දෑ	109,138,690	–	–
ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ ශේෂ	18,707,578	14,297,636	5,024,720
බැංකුවල පවතින ශේෂ	85,164,759	–	–
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	4,524,930	–	–
ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට මූල්‍ය උපකරණ	307,296,903	–	–
ක්‍රමක්ෂය පිරිවැයට ණය උපකරණ			
බැංකුවලට ණය සහ ලැබිය යුතු දෑ	–	83,506,019	–
වෙනත් ගනුදෙනුකරුවන්ට ණය සහ ලැබිය යුතු දෑ	475,160,043	243,693,017	183,507,484
ක්‍රමක්ෂය පිරිවැයට මනින ලද ණය උපකරණ	374,379,668	340,526,212	200,247,383
අනෙකුත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගය අනුව ස්කන්ධ උපකරණ	3,431,447	–	–
අනෙකුත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගය අනුව ණය උපකරණ	7,081,782	–	–
පරිපාලිත සමාගම්වල ආයෝජන	–	–	–
දේපල, පිරියත හා උපකරණ	–	–	–
අස්පෘශ්‍ය වත්කම් සහ කීර්තිනාමය	–	–	–
වෙනත් වත්කම්	39,599,123	156,474	14,259
මුළු වත්කම් 2025	1,424,484,924	682,179,358	388,793,846
මුළු වත්කම් 2024	1,027,554,441	795,314,478	396,022,982
වගකීම්			
බැංකුවලට ගෙවිය යුතු	13,928,487	11,983,576	–
බැංකුවල ව්‍යුත්පන්න	93,407	–	–
වෙනත් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු	1,886,290,535	970,301,646	375,692,168
වෙනත් ණය ගැහීම්	60,223,548	39,791,026	–
ප්‍රවර්තන බදු වගකීම්	11,669,601	–	–
ශුද්ධ විලම්බිත බදු වගකීම්	–	–	–
වෙනත් වෙන්කිරීම්	13,667,169	37,039,416	26,181,683
යටත් කරන ලද කාලීන ණය	–	–	–
ප්‍රකාශිත ප්‍රාග්ධනය/පැවරූ ප්‍රාග්ධනය	–	–	–
ව්‍යවස්ථාපිත සංචිත අරමුදල	–	–	–
වෙනත් සංචිත	–	–	–
රඳවාගත් ඉපැයුම්	–	–	–
මුළු වගකීම් 2025	1,985,872,747	1,059,115,664	401,873,851
මුළු වගකීම් 2024	1,634,209,055	1,074,266,284	231,317,560
ශුද්ධ පරතරය 2025	(561,387,823)	(376,936,306)	(13,080,005)
ශුද්ධ පරතරය 2024	(606,654,614)	(278,951,806)	164,705,422
මුළු ස්කන්ධය හා වගකීම 2025	1,424,484,924	682,179,358	388,793,846
මුළු ස්කන්ධය හා වගකීම 2024	1,027,554,441	795,314,478	396,022,982

			එකතුව	
	අවුරුදු 3-5 රු. '000	අවුරුදු 5ට රු. '000	2025 රු. '000	2024 රු. '000
	–	–	109,138,690	71,694,016
	342,236	45,125	38,417,296	33,798,107
	–	–	85,164,759	59,831,807
	–	–	4,524,930	5,842,194
	–	–	307,296,903	329,810,350
	–	–	83,506,019	31,994,539
	245,888,094	617,883,839	1,766,132,478	1,521,965,020
	125,139,920	190,004,979	1,230,298,162	1,123,490,537
	–	–	3,431,447	2,313,187
	–	–	7,081,782	7,110,671
	–	6,152,362	6,152,362	5,191,712
	–	1,841,674	1,841,674	61,079,218
	–	61,608,429	61,608,429	2,586,671
	15,560	241,428	40,026,844	41,091,078
	371,385,810	877,777,836	3,744,621,775	–
	219,772,079	859,135,127	–	3,297,799,108
	–	–	25,912,063	36,840,228
	–	–	93,407	168,266
	26,584,453	3,525,935	3,262,394,738	2,854,704,194
	–	–	100,014,574	75,545,595
	–	–	11,669,601	12,651,620
	–	5,346,308	5,346,308	5,207,184
	460,025	–	77,348,293	76,557,256
	–	40,669,151	40,669,151	54,156,709
	–	12,201,998	12,201,998	12,201,998
	–	11,828,689	11,828,689	11,827,215
	–	71,651,346	71,651,346	68,981,258
	–	125,491,607	125,491,607	88,957,584
	27,044,478	270,715,034	3,744,621,775	–
	113,206,194	244,800,014	–	3,297,799,107
	344,341,332	607,062,802	–	–
	106,565,885	614,335,113	–	–
	371,385,810	877,777,836	3,744,621,775	–
	219,772,079	859,135,127	–	3,297,799,108

2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වගකීම්වල වට්ටම් නොකළ මුදල් ප්‍රවාහයේ කල්පිරීමේ පැතිකඩ (රු. 000)

මූල්‍ය වගකීම්	ඉල්ලුම් අනුව	මාස 3 ට අඩු	මාස 3-12	අවුරුදු 1-5	අවුරුදු 5 ට වැඩි	එකතුව
බැංකුවලට ගෙවිය යුතු	24,514,220	1,403,268	–	–	–	25,917,488
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	93,407	–	–	–	–	93,407
වෙනත් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු	1,177,521,244	222,458,384	1,363,107,744	626,567,972	5,052,505	3,394,707,848
වෙනත් ණය ගැනීම්	–	108,938,790	–	–	11,215,554	120,154,344
යටත් කරන ලද කාලීන ණය	–	–	5,937,950	40,852,159	11,709,375	58,499,484
මුළු වට්ටම් නොකළ මූල්‍ය වගකීම්	1,202,128,871	332,800,442	1,369,045,694	667,420,131	27,977,434	3,599,372,572

2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වගකීම්වල වට්ටම් නොකළ මුදල් ප්‍රවාහයේ කල්පිරීමේ පැතිකඩ (රු. 000)

මූල්‍ය වගකීම්	ඉල්ලුම අනුව	මාස 3 ට අඩු	මාස 3-12	අවුරුදු 1-5	අවුරුදු 5 ට වැඩි	එකතුව
බැංකුවලට ගෙවිය යුතු	3,085,069	–	–	15,993,855	–	19,078,924
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	–	27,958,426	3,960,742	7,957,193	–	39,876,362
වෙනත් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු	990,097,016	594,072,354	1,044,806,451	421,905,560	3,846,467	3,054,727,849
වෙනත් ණය ගැනීම්	–	46,946,783	24,938,770	–	8,468,382	80,353,936
යටත් කරන ලද කාලීන ණය	–	499,212	3,627,293	34,485,490	17,097,100	55,709,095
මුළු වට්ටම් නොකළ මූල්‍ය වගකීම්	993,182,085	669,476,776	1,077,333,256	480,342,098	29,411,949	3,249,746,165

වෙළෙඳපොළ අවදානම

වෙළෙඳපොළ අවදානම යනුවෙන් අදහස් වන්නේ පොලී අනුපාත, කොටස් මිළ ගණන්, විදේශ විනිමය අනුපාත, බැඳුම්කර හා වෙළෙඳ ද්‍රව්‍ය මිළ ගණන් ආදී වෙළෙඳපොළ විචල්‍යයන් ආශ්‍රිත අහිතකර වෙනස්වීම් හේතුවෙන් ඉපයීම්, වෙළෙඳපොළ හෝ මූල්‍ය උපකරණ කළඹ ආශ්‍රිත අනාගත මුදල් ප්‍රවාහ ආදියට සිදුවිය හැකි වෙනස්කම් හේතුවෙන් අලාභ සිදුවීමට ඇති ඉඩකඩයි. බැංකුවේ මෙහෙයුම්වලින් අති බහුතරය වෙළෙඳපොළ අවදානමේ කොටස් වේකක් හෝ වැඩි ගණනක් වෙත නිරාවරණය වෙයි. මූලික වශයෙන්ම වෙළෙඳපොළ අවදානම වෙළෙඳ හා වෙළෙඳ නොවන කළඹවල පොලී අනුපාත අවදානම තුළින් සහ උකස් කළඹ හේතුවෙන් රත්‍රං මිල වෙනස්වීමට නිරාවරණ තුළින් ඉස්මතු වේ.

වෙළෙඳපොළ අවදානම් වෙත බැංකුව නිරාවරණය වීම, අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමින් අධ්‍යක්ෂ මණ්ඩල වේකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් සිදුකෙරෙන අතර, බැංකුවේ වෙළෙඳපොළ අවදානම් කළමනාකරණ රාමුව, ප්‍රතිපත්ති හා අවදානම් අභිරුචි සීමාවන් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා ද මෙම කමිටුව වගකීමට බැඳී සිටී. වෙළෙඳපොළ අවදානම් කළමනාකරණ රාමුව විධායක මට්ටමින් ක්‍රියාත්මක කිරීමේ වගකීම වත්කම් හා වගකීම් කමිටුව වෙත පැවරෙන අතර, එම කමිටුව බැංකුවේ වෙළෙඳපොළ අවදානම් නිරාවරණ නිශ්චිත අවදානම අභිරුචිය තුළ පවත්නා බවට සහතික වේ. බැංකුවේ වෙළෙඳපොළ අවදානම පාලනය කරනු ලබන ප්‍රතිපත්තිවලට අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය, භාණ්ඩාගාර ප්‍රතිපත්තිය, පීඩන පරීක්ෂා ප්‍රතිපත්තිය, රටේ සීමිත ප්‍රතිපත්තිය හා සක්‍රීය වෙළෙඳපොළ වෙත බැංකුවේ නිරාවරණය සඳහා අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය ඇතුළත් වේ. මෙවැනි රාමු සියළුම ආකාරයේ වෙළෙඳපොළ අවදානම් හඳුනා ගැනීම, තක්සේරු කිරීම, අවම කිරීම, නියාමනය කිරීම හා වාර්තාකරණය සඳහා අවශ්‍ය පද්ධති, ක්‍රියාපටිපාටි, මෙවලම් සහ ශිල්ප ක්‍රම සම්බන්ධයෙන් මගපෙන්වීම සාමූහිකව සපයනු ලැබේ. උද්ගත වන වෙළෙඳපොළ අවදානම් පෙරදැරි කොට ගෙන මෙකී ප්‍රතිපත්ති නිරන්තරයෙන් සමාලෝචනය කොට යාවත්කාලීන කරනු ලබයි. වෙළෙඳපොළ අවදානම් කළමනාකරණය කිරීමේ වගකීම බැංකුවේ භාණ්ඩාගාරය වෙත පැවරෙන අතර, එහි නියමානයන් හා විශ්ලේෂණයන් හරහා අවදානම් කළමනාකරණය සහතික කරයි.

බැංකුවේ වෙළෙඳපොළ අවදානම් නිරාවරණය වෙළෙඳ හා බැංකුකරණ කළඹ තුළ වර්ගීකරණය කර වෙන වෙනම කළමනාකරණය කෙරේ. කළඹේ සංවේදිතාව සහ ක්‍රියාදාම විශ්ලේෂණ වෙළෙඳපොළ විචල්‍යතා සහ වෙළෙඳපොළ වෙනස්වීමට කළඹේ සංවේදිතාව පිළිබිඹු කරන කාල විශ්ලේෂණය සමඟ එකට පවත්වනු ලැබේ. බැංකුවේ වෙළෙඳ කළඹ තුළ අවදානම මිනුම්ගත කරමින් පාලනය කිරීම සඳහා යොදා ගනු ලබන මූලික උපකරණය වන්නේ අවදානමේදී වටිනාකමයි. (VaR) වෙළෙඳ කළඹක අවදානමේදී වටිනාකම යනුවෙන් අදහස් වන්නේ නිශ්චිත විභවතාවයක් (විශ්වාස මට්ටම) සහිතව අහිතකර වෙළෙඳපොළ වෙනස්වීම්කින් නිශ්චිත කාලසීමාවක් (දරනු ලබන කාලය) තුළ කළඹ මත උද්ගත වන තක්සේරු කරන ලද අලාභයකි. බැංකුව විසින් යොදා ගනු ලබන අවදානමේදී වටිනාකම ආකෘතිය 99%ක විශ්වසනීයත්ව මට්ටමක් මත පදනම් වන අතර දින එකක රඳාසිටීමේ කාලසීමාවක් උපකල්පනය කරයි. භාවිතා කරන VaR ආදර්ශය ප්‍රධාන වශයෙන් විවිධ විචල්‍ය ක්‍රමය මත පදනම් වේ.

බැංකුව විශේෂයෙන් විදේශ විනිමය අනුපාත සහ පොලී අනුපාත නියාමනය කර කළමනාකරණය කිරීමට වටිනාකමේදී අවදානම් සීමා භාවිතා කරයි. අවදානමේදී වටිනාකමේ සීමාවන් හී සමස්ත ව්‍යුහය අධ්‍යක්ෂ මණ්ඩල වේකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ

සමාලෝචනයට සහ අනුමැතියට යටත් වේ. අවදානමේදී වටිනාකම් සීමාවන් වෙළෙඳ කළඹ සඳහා වෙන් කෙරේ. අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුවට අනුයුක්ත භාණ්ඩාගාර මධ්‍ය කාර්යාලය විසින් අවම වශයෙන් දිනකට වරක්වත් එහි සීමා අනුව අවදානමේදී වටිනාකම මිනුම්ගත කොට නිරීක්ෂණය කරනු ලැබේ.

පොලී අනුපාත අවදානම

පොලී අනුපාත අවදානම යනුවෙන් අදහස් වන්නේ පොලී අනුපාත සංවේදී වත්කම් වෙත බැංකුව නිරාවරණය වීම නිසා ඉපයීම් සහ ප්‍රාග්ධනය ආශ්‍රිතව ඇතිවියහැකි අලාභයයි. පොලී අනුපාත සහ ණය විස්තාරණයන් ආශ්‍රිත වෙනස්කම් මත එකී වත්කම්වල වෙළෙඳපොල වටිනාකම උච්චාවචනය වෙයි. පොලී අනුපාත අවදානම් වෙත බැංකුව නිරාවරණය වීම එහි ණය කළඹ, වෙළෙඳ සුරුකුම්පත් හා තැන්පතු වගකීම්වලින් ඇති වේ.

පොලී අනුපාත අවදානම මිනුම්ගත කිරීම සඳහා භාවිතා කරන ශිල්ප ක්‍රමවලට කාලසීමා පරතර විශ්ලේෂණය, අවදානමේදී වටිනාකම සහ අවදානමේදී ඉපයීම් ඇතුළත් වේ. කාලසීමා පරතරය සහ පොලී අනුපාත අවදානම වෙත ඇති සමස්ථ නිරාවරණය නිශ්චය කිරීම සඳහා අනුපාත සංවේදී වත්කම් සහ වගකීම් ව්‍යාපෘතියේ කල්පිරීමේ කාලසීමාවන් මත පදනම් වී කාල කාණ්ඩයන්ට ඇතුළත් වේ.

විදේශ විනිමය අවදානම

විනිමය අනුපාතවල අහිතකර උච්චාවචන හේතුවෙන් ඉපයීම් සහ/හෝ ප්‍රාග්ධනය වෙත වියහැකි බලපෑම විදේශ විනිමය අවදානම ලෙස හැඳින්වේ. බැංකුවේ එවැනි නිරාවරණ හිමිකම් අලෙවි කිරීම, ආනයන/අපනයන ගනුදෙනු හා විදේශ මුදල් ප්‍රේෂණ යනාදී විදේශ විනිමයෙන් නම්කරනු ලබන ගනුදෙනු භාර ගැනීමෙන් ඉස්මතු වේ. මහ බැංකුවේ නියාමන සීමා සහ අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත සීමා විනිමය තත්ත්වයන් මත ක්‍රියාවට නංවා ඇති අතර දෛනික පදනමක් මත නියාමනයට කෙරේ. ස්ථාපිත සීමාවන් තුළ තත්ත්වයන් පවත්වා ගන්නා බව සහතික කිරීමට වැටයීම් උපායමාර්ග භාවිතා කෙරේ.

විදේශ විනිමය අවදානමට යටත් වන කළඹ මත අවදානමේදී වටිනාකම් ගණනය කිරීම් සහ පීඩන පරීක්ෂාව බැංකුව පවත්වනු ලබයි. බැංකුවේ ලාභදායීතාව සහ ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා මට්ටම් කෙරෙහි එල්ල විය හැකි බලපෑම මිනුම්ගත කිරීම සඳහා අනුපාත කම්පන යොදා ගනිමින් පීඩන පරීක්ෂාව සිදු කෙරේ.

ස්කන්ධ අවදානම

බැංකුව විසින් දරන ස්කන්ධ ආයෝජනවල වටිනාකම තුළ උච්ඡාවචනයන්හී වෙනස්වීම්වලට නිරාවරණය වීමෙන් ස්කන්ධ අවදානම ඇතිවේ. ලාභය හෝ අලාභය තුළින් එහි සාධාරණ අගයෙන් සහ අනෙකුත් විස්තීරණ ආදායම ආයෝජන කළඹ තුළින් සාධාරණ අගයෙන් මෙය මූලිකවම ඇති වන අතර, බැංකුව විසින් පරිපාලිත සමාගම්වල ක්‍රමෝපායික ආයෝජන ඉවත් කරනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩල ආයෝජන බැංකුකරණ කමිටුව (BIBC) ආයෝජනයට අදාළ සියලුම ප්‍රතිපත්ති සකස් කිරීම සඳහා සහ බැංකුවේ ආයෝජන අවදානම් නිශ්චිත අවදානම් අභිරුචියට අනුව කළමනාකරණය කරන බව සහතික කිරීම සඳහා වගකීමට බැඳී සිටී. අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත ආයෝජන බැංකුකරණ ප්‍රතිපත්ති සංග්‍රහය ස්කන්ධ අවදානම කළමනාකරණය සඳහා මෙන්ම පරිමාව සහ අවසන් අලාභ සීමා සඳහා ක්‍රියාපටිපාටිය, මෙවලම් සහ ශිල්ප පැහැදිලිව දක්වා ඇත.

මෙහෙයුම් අවදානම

මෙහෙයුම් අවදානම යනු අසමත් අභ්‍යන්තර ක්‍රියාවලීන්, පද්ධති දෝෂ, පුද්ගල දෝෂ, වංචා හෝ බාහිර සිදුවීම්වලින් ඉස්මතු විය හැකි අලාභයන් පිළිබඳ අවදානමයි. මෙහෙයුම් අවදානම ව්‍යාපාරික කටයුතු, නිෂ්පාදන සහ ක්‍රියාවලි හේතුවෙන් ඇති වේ. පාලනයන් ක්‍රියාත්මක වීමට අසමත් වන අවස්ථාවන්හිදී, මෙහෙයුම් අවදානම මගින් කීර්තිනාමයට හානි සිදුවීම, නෛතික හෝ නියාමන ගැටළු හෝ මූල්‍යමය අලාභයන්ට හේතු විය හැක. මෙහෙයුම් අවදානම සම්පූර්ණයෙන්ම ඉවත් කළ නොහැකිය. කෙසේවෙතත්, බැංකුවේ පරමාර්ථය වන්නේ මූල්‍ය අලාභ සහ සමස්ථ පිරිවැය ඵලදායිත්වය, නවෝත්පාදනය සමඟ බැංකුවේ කීර්තිනාමය ඇතිවන හානි වලක්වා ගැනීම පිණිස මෙහෙයුම් අවදානම කළමනාකරණය කර බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරන පරිදි පිළිගතහැකි මට්ටම්වල පවත්වා ගැනීමයි.

විවිධ ආකාරයේ මෙහෙයුම් අවදානම් නිරාවරණය කළමනාකරණ කිරීම ක්‍රියාත්මක ප්‍රතිපත්ති, පාලන ව්‍යුහයන් හා ක්‍රියාවලීන් බැංකුවේ මෙහෙයුම් අවදානම් කළමනාකරණ රාමුව තුළ පැහැදිලිව දක්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කමිටුවේ සහාය ලබා ගනිමින් අදාළ ප්‍රතිපත්ති සම්පාදනය සඳහා සහ මෙහෙයුම් අවදානම් කළමනාකරණ රාමුවෙහි කාර්යක්ෂමතාවය සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමට බැඳී සිටී. අවදානම් කළමනාකරණ ඒකකය විසින් අලාභ සිදුවීම් සටහන් කරගෙන කලින් කල මෙහෙයුම් අවදානම් කළමනාකරණ කමිටුව වෙත වාර්තා කරයි. ඒ අතරම, අභ්‍යන්තර විගණනය විසින් බැංකුව තුළ ක්‍රියාත්මක වන මෙහෙයුම් අවදානම් ක්‍රියාවලියෙහි කාර්යක්ෂමතාව සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සහතික කිරීම ලබා දේ.

ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව සහ අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා තක්සේරු කිරීමේ ක්‍රියාවලිය (ICAAP)

ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාවය

ප්‍රාග්ධන ප්‍රමාණවත්තාවය යනු බැංකුවේ අවදානම බර තබන ලද වත්කම්වල ප්‍රතිශතයක් ලෙස බැංකුවක පවතින ප්‍රාග්ධනය මැනීමකි. ප්‍රාග්ධන ප්‍රමාණවත්තා අනුපාතය අවදානමට බර තබන ලද වත්කම්වලට ප්‍රාග්ධනය ලෙස හැඳින්වේ. යහපත් ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව තැන්පත්කරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන අතර, බැංකුවේ ස්ථාවරත්වය සහ කාර්යක්ෂමතාව සහතික කරයි. තැන්පත්කරුවන්ගේ සහ පාර්ශ්වකරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා පාඩු අවශෝෂණය කර ගත හැකි ස්ථර-1 ප්‍රාග්ධන සහ ස්ථර-2 ප්‍රාග්ධන අවශ්‍යතා වන බාසල් මාර්ගෝපදේශ යටතේ ප්‍රාග්ධන මිනුම් වර්ග දෙකක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවනු ලබයි.

